මිනින්දෝරු දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි

6 වන සංස්කරණය 2019

දැක්ම

ඉඩම් තොරතුරු සැපයීමේ සදාකාලික ප්‍රමුඛයා වීම

මෙහෙවර

වෘත්තීය නිපුණත්වයෙන් යුත්

සේවා ලැදි පිරිසක් මඟින් ගුණාත්මක

භූමි තොරතුරු නිපැයුම් සහ සේවාවන් සැපයීම

පෙරවදන

දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන මැනුම් සඳහා සහ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදුකරනු ලබන මැනුම් කටයුතු සඳහා වලංගු වේ.

මෙම මැනුම් රෙගුලාසි දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග සහ තාක්ෂණික උපදෙස් සමඟ පරිශීලනය කිරීම සුදුසුය. මීට පෙර චක්‍රලේඛ මඟින් නිකුත් කර ඇති රෙගුලාසිද නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුගත වීමට සමගාමීව ප්‍රායෝගික අත්හදා බැලීම් මත වැඩිදියුණු කරන ලද භූමිතික මැනුම්, අංකිත දත්ත කළමනාකරණය හා ඉඩම් විස්තර දත්ත පද්ධතිය හා සම්බන්ධ විශේෂිත කරුණු මෙම සංස්කරණයට බොහෝ සේ ඇතුලත් කර ඇත. කාලීනව ඉදිරියේදී සිදු කළ යුතු වන සංශෝධන හෝ නව රෙගුලාසි ශුද්ධි පත්‍රිකා මඟින් නිකුත් කෙරෙනු ඇත.

උපදේශකත්වය	-	සර්වේයර් ජනරාල් / එස්.එම්.පී.පී. සංගක්කාර මයා
සංස්කාරක මණ්ඩලය	-	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/ ඒ.එල්.එස්.සී. පෙරේරා මිය
	-	ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි / සී.ඩී.පී.ආර්. බස්නායක මයා
		ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි / ඩී.යුරේකා පරණවිතාන මිය
		මිනින්දෝරු අධිකාරි / පී.එම්.සුනීතා පෙරේරා මිය

පරිච්ඡේදය	**සංස්කරණ සහාය**
01 වැනි පරිච්ඡේදය - දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හැඳින්වීම	ඒ.එල්.එස්.සී. පෙරේරා මිය
02 වැනි පරිච්ඡේදය - භූමිතික පාලන මැනුම්	ටී.එම්.පී.යූ. තෙන්නකෝන් මයා / ටී.එච්. අමරාංගනී මිය
03 වැනි පරිච්ඡේදය - කුඤ්ඤු සහ මායිම්ගල්	ජේ.එම්.පී.පී. ජයසූරිය මයා
04වැනි පරිච්ඡේදය - විකිර්ණ මැනුම්	කේ.ඩී. පැරකුම්ශාන්ත මයා/ උපාලි ජේ. විතාරනගේ මයා
05 වැනි පරිච්ඡේදය - අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම්	කේ.කේ.එස්.රත්නායක මයා / පී.එම්.සුනීතා පෙරේරා මිය
06 වැනි පරිච්ඡේදය - අත්කර ගැනීමේ මැනුම්	ඊ.එම්.ඩී.එම්. ඒකනායක මයා
07 වැනි පරිච්ඡේදය - ඉංජිනේරු මැනුම්	ඊ.එම්.ඩී.එම්. ඒකනායක මයා/ ඩී. යුරේකා පරණවිතාන මිය
08 වැනි පරිච්ඡේදය - මායිම් නියම කිරිමේ මැනුම්	යූ.කේ.එස්.පී. විජේසිංහ මයා
09 වැනි පරිච්ඡේදය - විස්තර මැනීම	ජේ.එම්.පී.පී. ජයසූරිය මයා / පී.එම්.සුනීතා පෙරේරා මිය
10 වැනි පරිච්ඡේදය - වෙන් කල බිම	ජේ.එම්.පී.පී. ජයසූරිය මයා
11වැනි පරිච්ඡේදය - ක්ෂෙත්‍ර මැනුම් දත්ත රැස් කිරීම හා සටහන් තැබීම	වයි.ජී.ඥාණතිලක මයා / ඕ.ටී.එම් අයි.තිලකරත්න මිය / බී.එච්.බී. සිරිල්ශාන්ත මයා / ඩී. යුරේකා පරණවිතාන මිය
12 වැනි පරිච්ඡේදය - පිඹුරු වැඩ	
13 වැනි පරිච්ඡේදය - ක්ෂෙත්‍රඵලය ගණනය කිරීම	-
14වැනි පරිච්ඡේදය - සිතියම්,රේඛා චිත්‍ර සහ වාර්තා	මහින්ද හේමසිරි මයා / ඩී. යුරේකා පරණවිතාන මිය
15 වැනි පරිච්ඡේදය - කට්ටි කැඩීමේ සැලසුම් පිළියෙල කිරිමේ සහ කුඤ්ඤු ගැසීමේ මැනුම්	ඩබ්ලිව්.එම්. අබේරත්න බණ්ඩා මයා / පී.එම්.සුනීතා පෙරේරා මිය
16 වැනි පරිච්ඡේදය - නගර මැනුම්	එම්.ඒ.එම්. සෝමලතා මිය / ඒ.එම්.එන්.බණ්ඩාර මයා
17 වැනි පරිච්ඡේදය - විවිධ	ඒ.එල්.එස්.සී. පෙරේරා මිය / සී.ඩී.පී.ආර්. බස්නායක මයා / ඩී. යුරේකා පරණවිතාන මිය
18 වැනි පරිච්ඡේදය - සභාධිපත්‍ය දේපළ මැනුම්	ඒ.එල්.එස්.සී. පෙරේරා මිය /කේ.ආර්. සරත් මයා
19 වැනි පරිච්ඡේදය - සිතියම්කරණය	කේ. සිවනන්දරාජා මයා / කේ.කේ.බී.එන්. ප්‍රනාන්දු මිය
20 වැනි පරිච්ඡේදය - බිම් මැනීම සඳහා යෙදෙන ව්‍යවස්ථාපිත නීතීන්	කේ.ඩී. පැරකුම්ශාන්ත මයා
21 වැනි පරිච්ඡේදය - කැඩැස්තර මැනුම්	කේ.ජී. එස්. පද්මිණි මිය / බී.එච්.බී. සිරිල්ශාන්ත මයා / පී.එම්.සුනීතා පෙරේරා මිය
22 වැනි පරිච්ඡේදය - අංකිත දත්ත කළමනාකරණය	ඩබ්ලිව්.ටී.එම්.එස්.බී. තෙන්නකෝන් මයා / ජී.ඩී.පී. ආරියතිලක මයා / කේ.ඩී. පැරකුම්ශාන්ත මයා

පටුන

1. වැනි පරිච්ඡේදය - දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හැඳින්වීම
2. වැනි පරිච්ඡේදය - භූමිතික පාලන මැනුම්
3. වැනි පරිච්ඡේදය - කුඤ්ඤු සහ මායිම්ගල්
4. වැනි පරිච්ඡේදය - විකිර්ණ මැනුම්
5. වැනි පරිච්ඡේදය - අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම්
6. වැනි පරිච්ඡේදය - අත්කර ගැනීමේ මැනුම්
7. වැනි පරිච්ඡේදය - ඉංජිනේරු මැනුම්
8. වැනි පරිච්ඡේදය - මායිම් නියම කිරීමේ මැනුම්
9. වැනි පරිච්ඡේදය - විස්තර මැනීම
10. වැනි පරිච්ඡේදය - වෙන් කල බිම්
11. වැනි පරිච්ඡේදය - ක්ෂේත්‍ර මැනුම් දත්ත රැස් කිරීම හා සටහන් තැබීම
12. වැනි පරිච්ඡේදය - පිඹුරු වැඩ
13. වැනි පරිච්ඡේදය - ක්ෂේත්‍රඵලය ගණනය කිරීම
14. වැනි පරිච්ඡේදය - සිතියම්, රේඛාචිත්‍ර සහ වාර්තා
15. වැනි පරිච්ඡේදය - කට්ටි කැඩීමේ සැලසුම් පිළියෙල කිරීමේ සහ කුඤ්ඤු ගැසීමේ මැනුම්
16. වැනි පරිච්ඡේදය - නගර මැනුම්
17. වැනි පරිච්ඡේදය - විවිධ
18. වැනි පරිච්ඡේදය - සහාධිපත්‍ය දේපළ මැනුම්
19. වැනි පරිච්ඡේදය - සිතියම්කරණය
20. වැනි පරිච්ඡේදය - බිම් මැනීම සඳහා යෙදෙන ව්‍යවස්ථාපිත නීතීන්
21. වැනි පරිච්ඡේදය - කැඩැස්තර මැනුම්
22. වැනි පරිච්ඡේදය - අංකිත දත්ත කළමනාකරණය

1 වැනි පරිච්ඡේදය

දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හැඳින්වීම

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	හැඳින්වීම	
1.1.	හැඳින්වීම	1
	මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන මැනුම්	
1.2.	මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන මැනුම්	1
	මැනුම් වර්ග	
1.3.	දීමනා පත්‍ර ලබාදීම සඳහා කරනු ලබන මැනුම්	1
1.4.	අත්කර ගැනීමේ මැනුම්	2
1.5.	අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම්	2
1.6.	කැඩැස්තර මැනුම්	2
1.7.	නගර මැනුම්	2
1.8.	මායිම් නියම කිරීමේ මැනුම්	3
1.9.	අනවසර අල්ලා ගැනීම් පිළිබඳ කෙරෙන මැනුම්	3
1.10.	ඉංජිනේරු මැනුම්	3
1.11.	කට්ටි කැඩීමේ මැනුම්	3
1.12.	විවිධ මැනුම්	4
1.13.	මාර්ග හා ඇළ මාර්ග මැනුම්	4
1.14.	පාලන මැනුම්	4
1.15.	භූලක්ෂණාත්මක සිතියම් සඳහා කරන මැනුම්	4
1.16.	සභාධිපත්‍ය දේපළ මැනුම්	4
1.17.	ලංකා මැනුම්	4
	මැනුම් වැඩ සඳහා බලය	
1.18.	මැනුම් වැඩ සඳහා බලය	5

1 වැනි පරිච්ඡේදය

දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හැඳින්වීම

හැඳින්වීම

1.1. හැඳින්වීම

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සියළුම මැනුම් කටයුතු ශ්‍රී ලංකාව තුල ගුණාත්මකව හා ඒකාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම මැනුම් රෙගුලාසි සකස් කර ඇත.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් භාර ගන්නා මැනුම්

1.2. ප්‍රධාන වශයෙන් පහත සඳහන් මැනුම් වර්ග මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි.

i. දීමනා පත්‍ර ලබාදීම සඳහා කරනු ලබන මැනුම්
ii. අත්කර ගැනීමේ මැනුම්
iii. අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම්
iv. කැඩැස්තර මැනුම්
v. නගර මැනුම්
vi. මායිම් නියම කිරීමේ මැනුම්
vii. අනවසර අල්ලා ගැනීම් පිළිබඳ මැනුම්
viii. ඉංජිනේරු මැනුම්
ix. කට්ටි කැඩීමේ මැනුම්
x. විවිධ මැනුම්
xi. මාර්ග හා ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම්
xii. පාලන මැනුම්
xiii. භූලක්ෂණාත්මක සිතියම් සඳහා කරන මැනුම්
xiv. සභාධිපත්‍ය දේපළ මැනුම්
xv. ලංකා මැනුම්

මැනුම් වර්ග

1.3. දීමනා පත්‍ර ලබාදීම සඳහා කරනු ලබන මැනුම්

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ සහ රජයේ ඉඩම් ආඥාපනත යටතේ කරනු ලබන මැනුම් මඟින් දීමනා පත්‍ර සැකසීම සිදු කරනු ලබයි.

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ සිදු කරන මැනුම්:

ප්‍රාදේශීය ලේකම්වරුන් තම බල ප්‍රදේශයේ පිහිටි වගා කිරීමට සුදුසු රජයේ ඉඩම් මෙම පනත යටතේ ඉඩම් කව්චේරි පවත්වා සුදුස්සන් තෝරාගෙන බලපත්‍ර මත ඉඩම් සංවර්ධනය කිරීම සඳහා රජයේ ඉඩම් පවරා දෙනු ලබයි.

ඉඩම් සංවර්ධනය කළ පසු නීත්‍යානුකූල ප්‍රධාන පත්‍රයක් මඟින් ඉඩම් අයිතිය පවරා දීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබෙන මැනුම් ඉල්ලීම් සඳහා ව්‍යවස්ථාපිත පිඹුරු සකස් කිරීමට කරනු ලබන මැනුම් මෙයට අදාළවේ.

රජයේ ඉඩම් ආඥාපනත යටතේ සිදු කරනු ලබන මැනුම්:
ඉඩම් සංවර්ධන ආඥාපනතින් ආවරණය නොවන ආයතන සහ පුද්ගලයන් වෙත වෙන් කරනු ලබන රජයේ ඉඩම් මැනීම මෙම පනත යටතේ සිදු කරනු ලබයි.
උදාහරණ වශයෙන් රජයේ ආයතන වලට ඉඩම් වෙන් කිරීම, මධ්‍යම ආදායම් ලබන පුද්ගලයින්ට සහ පුද්ගලික ආයතන වෙත දීර්ඝ කාලීන බදු බලපත්‍ර නිකුත් කිරීමට, පූර්ණ අයිතිය ලැබෙන පරිදි පැවරීම සිදු කිරීමට සහ රක්ෂිත ලෙස ඉඩම් වෙන් කිරීමට ඉඩම් මැනීම මින් අදහස් කෙරේ.

1.4. අත්කර ගැනීමේ මැනුම්

මෙම මැනුම් කරනුයේ අත්කර ගැනීමේ නිලධාරියාගේ ඉල්ලීමක් ඇති විටකය. එහිදී

(අ) ඉඩමක ප්‍රකාශිත මහජන අරමුණු සඳහා ඇති සුදුසුකම නිශ්චය කර ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ සිදු කරන මැනුම්. මෙම අවස්ථාවේදී අනුරේඛනයක් පමණක් පිළියෙල කරනු ලැබේ.

(ආ) ප්‍රකාශිත ඉඩම, ප්‍රකාශිත මහජන අවශ්‍යතාවය සඳහා සුදුසු යැයි තීරණය කළ විට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 6 වන හෝ 38 (අ) අතුරු විධානය යටතේ සිදු කරන මැනුම්. මෙහිදී මායිම්ගල් යොදා පිඹුරක් පිළියෙල කරනු ලැබේ.

1.5. අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම්

සාමාන්‍යයෙන් උසාවිය මඟින් කොමිෂන් නිකුත් කරන්නේ බලයලත් මිනින්දෝරුවරයෙකුගේ වැඩ පරීක්ෂා කිරීමට හෝ ඔවුන්ගේ පිඹුරු මත රජයේ මායිම් අධිස්ථාපනය කිරීමට වේ. මෙම මැනුම් උසාවි මඟින් ලබාදී ඇති උපදෙස් අනුවම කරගෙන යා යුතුවේ.

1.6. කැඩැස්තර මැනුම්

යම් බිම් කොටසක් හෝ යම් පරිශ්‍රයක් නැතහොත් ඊට සම්බන්ධ යම් නෛතික අයිතිවාසිකමකට හෝ සම්බන්ධතාවයක මායිම් තීරණය කිරීමේ හෝ අර්ථකථනය කිරීමේ කාර්යය සඳහා වන මැනුම්ය. මෙයින් ගම්‍ය වන්නේ එය පැහැදිළිව හා එක් එක් ඉඩම් ඒකකය (ඉඩම් කැබැල්ල) සමඟ දෙන ලද ප්‍රදේශයක් තුල ස්ථානීය නිරවද්‍යතාවක් ඇතිව සෑම ඉඩම් කැබැල්ලක්ම එක් එක් ඉඩම් කැබලි සඳහා සංගතව ස්ථාපිත කිරීම වේ. එම නිසා කැඩැස්තර මැනුම් යනු යම් ප්‍රකාශිත ප්‍රදේශයක එක් එක් ඉඩම් කැබලිවල මායිම් සංගත ක්‍රමයකට භූගෝලීය පිහිටීම නිශ්චිත වන පරිදි ස්ථාපිත කිරීම, ප්‍රමාණය වෙන්කොට දැක්වීම, ඉඩම් කැබලි හා මායිම් බැහැර කිරීම හා සම්බන්ධ ක්‍රියාවලියකි. එසේම පැරණි මායිම් නැවත පිහිටුවීම, මායිම් මත ඇතිවූ ආරවුල් නිරාකරණය හා ඉඩමට සම්බන්ධ අනෙකුත් හිමිකම් නිශ්චය කිරීමටද යොදා ගැනේ.

1.7. නගර මැනුම්

මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් මෙම මැනුම් කරගෙන යනු ලබන්නේ නාගරික ප්‍රදේශ තුල හෝ සංවර්ධිත ප්‍රදේශ තුල ඇති මාර්ග, ජල මාර්ග හා අනෙකුත් ස්වභාවික ලක්ෂණ, දේපළ මායිම් හා ගොඩනැගිලි සමඟ ඇති අනෙකුත් විස්තර පෙන්වීම සඳහා වේ. මෙහි ප්‍රතිඵලය ලෙස භූමිය මත ඇති දේවල්හි, ඇති සැටියෙන් විස්තර සටහනක් ලැබෙන අතර මෙහි අරමුණ වනුයේ තක්සේරු කටයුතු හා සැලසුම් කටයුතු සඳහා යොදා ගැනීම පමණි. මෙහිදී පැරණි මැනුම් සම්බන්ධයෙන් කටයුතු නොකරන අතර, ඉඩම් විස්තර ලේඛනයක් ද පිළියෙල නොකෙරේ. සේවාලාභියාගේ අවශ්‍යතාවය අනුව සමෝච්ඡ රේඛා අඳිනු ලැබේ.

1.8. මායිම් නියම කිරීමේ මැනුම්

මායිම් නියම කිරීමේ මැනුම් දෙවර්ගයක් ඇත.

1. **ලංකා මැනුම් ප්‍රදේශ තුල කෙරෙන මායිම් නියම කිරීමේ මැනුම්**

   ගමක නිරවුල් කරන නිලධාරියා විසින් ඔහුගේ නිරවුල් කිරීම් අවසන් කළ විට, නිරවුල් කළ ප්‍රදේශ වෙන් කර දැක්වීමේ අරමුණු ඇතිව මෙම මැනුම් කරනු ලබයි. මෙහිදී නිරවුල් කිරීමේ නිලධාරියාගේ වෙන් කිරීමේ මෑමෝ පත්‍රයට අනුකූලව මෙම මැනුම් කරනු ලැබේ.

2. **ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ ප්‍රදේශ තුල කෙරෙන කැඩැස්තර මැනුම්**

   හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ අවශ්‍යතාවය අනුව මෙම මැනුම් කරනු ලබන්නේ නිරවුල් කළ ඉඩම් කැබලිවල මායිම් වෙන් කර දැක්වීමටයි. මායිම් වෙන්කර දැක්වීමේ මැනුම් වලින් පසු පිළියෙල කරන කැඩැස්තර සිතියම් හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා මූලික වශයෙන් යොදා ගැනේ.

1.9. අනවසර අල්ලා ගැනීම් පිළිබඳ කෙරෙන මැනුම්

ප්‍රාදේශීය ලේකම්වරු, ඉඩම් කොමසාරිස් ජනරාල්, වන සංරක්ෂණ ජනරාල් ආදී විවිධ පාර්ශව වල අවශ්‍යතාවය හා ඉල්ලීම පරිදි රජයේ ඉඩම්වල කෙරෙන අනවසර අල්ලා ගැනීම් මෙහිදී මැනුම් කරනු ලැබේ. මෙම මැනුම් වල අරමුණ වන්නේ අනවසර අල්ලා ගැනීම් විධිමත් කිරීම හෝ අනවසරකරුවන් ඉවත් කිරීම සඳහාය. බොහෝවිට පිටත මායිම මැනුම් කිරීම සඳහා විකෝණමාන පරික්‍රමණයක් හෝ වෙනත් පාලන ක්‍රමයක් යොදා ගනු ලබන අතර, අනෙකුත් විස්තර මැනීම සඳහාද අවශ්‍ය නම් විකෝණමානයම හෝ මිහිතැන් ගැන්වුම් වන්ද්‍රිකා (සූසැටි) පද්ධති (GNSS) යොදා ගත හැක. මෙහිදී අනුරේඛනයක් පිළියෙල කර අනවසරකරුවන්ගේ ලැයිස්තුවක් සමඟ යවන අතර, එම ලැයිස්තුව එම අනුරේඛනය මතම හෝ වෙනත් පත්‍රයක් භාවිතා කර සටහන් කරනු ලැබේ.

ඊට අමතරව අත්කර ගැනීමේ මැනුම්, මාර්ග මැනුම්, මායිම්ගල් දමා මනින මැනුම් ආදී වෙනත් ඕනෑම මැනුම් කිරීමකදී අනවසර අල්ලා ගැනීම් දැන ගන්නට ලැබුණු විට ඒ පිළිබඳ වාර්තා කළ යුතුවේ. මෙවැනි අනවසර අල්ලා ගැනීම් පිළිබඳව ක්‍රියා කළ හැකි විවිධ ආකාර පවතින අතර, මේ පිළිබඳ විස්තර අදාළ මැනුම් වර්ගයට විශේෂිතවූ පරිච්ඡේදවල දක්වා ඇත.

1.10. ඉංජිනේරු මැනුම්

විවිධ වර්ගයේ ඉංජිනේරුමය ව්‍යාපෘති සැලසුම් කිරීමේ අරමුණු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මෙම මැනුම් භාර ගනු ලැබේ. මෙහිදී සමෝච්ඡ රේඛා සහිත පිඹුරක් සකස් කෙරෙන අතර එය වාරි මාර්ග, ජලාපවාහනය හා කසල බැහැර කිරීම සහ ගංවතුර කළමනාකරණය ආදිය සඳහා භාවිතා කළ හැක. විවිධ යෝජනා ක්‍රමවල මැනුම් අවශ්‍යතාවයන් එකින් එකට වෙනස් විය හැකි අතර එක් එක් මැනුම් වර්ගය සඳහා දෙපාර්තමේන්තු සම්මත පිරවිතරයන් ඇත.

1.11. කට්ටි කැඩීමේ මැනුම්

මූලික වට මායිම් මැනුම් හා ඉල්ලුම් කරන ආයතනයේ අවශ්‍යතාවයන් සම්පූර්ණ වන පරිදි අදාළ ප්‍රදේශයේ විස්තර මැනුම් කර කට්ටි කැඩීමේ සැලැස්මක් (BOD) පිළියෙල කරනු ලැබේ. අදාළ ඉල්ලුම් කරන ආයතනය විසින් කට්ටි කැඩීමේ සැලැස්ම අනුමත කළ විට කට්ටි කැඩීම, විකෝණමාන මැනුමක් හෝ පූර්ණමාන මැනුමක් මඟින් කරනු ලැබේ. මෙම මායිම් සාමාන්‍යයෙන් ලී කුඤ්ඤ මඟින් ලකුණු කරන අතර, ඒවා කට්ටිකරුවන්ට හා ග්‍රාම නිලධාරීන්ට/ අදාළ නිලධාරීන්ට පෙන්වා දෙනු ලැබේ.

1.12. විවිධ මැනුම්

විවිධ රජයේ ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් නිසා සිදු කරන මැනුම්, විවිධ වර්ගයේ මැනුම් යටතේ සලකනු ලැබේ. මෙම මැනුම්, මායිම් නැවත සලකුණු කර දැක්වීමේ සිට විශාල ප්‍රදේශයක සේවා දායකයාගේ යම් විශේෂිත අවශ්‍යතාවයන් නිසැකව හඳුනා ගැනීමට කරන මැනුම් සහ ආරවුල් සහිත මායිමක මායිම් පෙන්වාදීම දක්වා වෙනස් විය හැකිය.

1.13. මාර්ග හා ඇළ මාර්ග මැනුම්

මාර්ග හා ඇළ මාර්ග සාමාන්‍යයෙන් සමෝච්ඡ සිතියම් මත සැලසුම් කරනු ලැබේ. ගණනය කරන ලද දුරවල් හා දිගංශ සමඟ භූමිය මත මධ්‍ය රේඛාව පළමුව පිහිටවනු ලැබේ. එම මධ්‍ය රේඛාව පිහිටුවීමෙන් පසු එය විස්තර මැනුම් සඳහා වූ නිරවද්‍යතාවයෙන් මනිනු ලැබේ. තීරු මැනුම්, දික්කඩ මැනුම් (LS) හා හරස්කඩ මැනුම්ද (CS) පසුව කරනු ලැබේ.

1.14. පාලන මැනුම්

පාලන ජාලය පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා මෙම මැනුම් කරනු ලැබේ. මෙය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූලික වගකීම් වලින් එකකි. විද්‍යුත් චුම්භක දුර මැනීමේ උපකරණ (EDM), (GNSS) උපකරණ, මට්ටම් (Level) උපකරණ හා CORS ආදී විවිධ උපකරණ හා විවිධ ක්‍රම මෙම මැනුම් සඳහා භාවිතා කරනු ලැබේ.

1.15. භූලක්ෂණාත්මක සිතියම් සඳහා කරන මැනුම්

මෙවැනි මැනුම් සාමාන්‍යයෙන් ඡායාරේඛණමිතික ක්‍රම මඟින් කරනු ලබන අතර ඒ සඳහා ගුවන් ඡායාරූප හෝ , ඉතා ඉහල විභේදනයක් (High Resolution) ඇති චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කරනු ලැබේ. කෙසේ වෙතත් සිතියම් මුද්‍රණය කිරීමට පෙර භූමිය මත මැනුම් හා ක්ෂේත්‍ර විමර්ශනය මඟින් නිරවද්‍යතාව තහවුරු කර ගැනීම අවශ්‍ය වේ.

1.16. සහාධිපත්‍ය දේපළ මැනුම්

සහාධිපත්‍ය දේපළ යනු ඉඩම සමඟ මහල් එකකට වැඩි ගණනක් ඇති ගොඩනැගිලි හා පදිංචි හෝ පදිංචි වීමට භාවිතා නොකරන ස්වාධීන ඒකක එකට වැඩි ගණනක් ඇති දේපළ වේ. මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සාමාන්‍යයෙන් මෙම සහාධිපත්‍ය දේපළ මැනුම් කර ගෙන යනු ලබන්නේ රජයේ පාලනයේ පවතින ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආදී ආයතන සඳහා වේ.

1.17. ලංකා මැනුම්

ලංකා මැනුම්වල ප්‍රධාන පරමාර්ථය වූයේ නිරවුල් කිරීමේ නිලධාරියා මඟින් හා නිරවුල් කිරීම මඟින් අයිතිවාසිකම් කියන ඉඩම් හා රජයේ ඉඩම් වෙන් කිරීමයි. එකවිටම පුද්ගලික යැයි තීරණය කළ හැකි වූ ඉඩම්, එනම් පැරණි වගාවන් ඇති හා හිමිකම් පිඹුරු ඇති ඉඩම් එක් කලාපයක් (Block) ලෙස මැනුම් කර දැක්වෙන අතර, විවිධ වගාවන් වෙන් වෙන්ව දක්වා ඇත. මෙහිදී බැලූ බැල්මට පුද්ගලික බව නොපෙනෙන නමුත් වගා කර තිබූ ඉඩම් පොදුවේ අයිතිවාසිකම් නොකීවේ නම් වෙන් වෙන්ව මායිම්ගල් දමා මැනුම් කර දක්වා ඇත.

හේන් හා රජයේ ඉඩම් අතර මායිම් මැනීමේදී පුද්ගලික වගාවන්ට එදිරිව මායිම්ගල් දමා මනින ලද අතර මෙම මැනුම් නිරවුල් කිරීමේ නිලධාරියාගේ අවශ්‍යතාවයට අනුකූලව කරන ලදි. එසේම ලංකා

මැනුම් පිඹුරු හා සටහන් සඳහා ගමක් ඒකකයක් ලෙස සලකන ලද අතර මෙම පිඹුරු ගම් වශයෙන් මුද්‍රණය කර නිකුත් කර ඇත. ලංකා මැනුම් දැනට සම්පූර්ණ කර ඇති බැවින්, තව දුරටත් ලංකා මැනුම් ප්‍රදේශ මැනීමට ඉතිරිවී නැත.

මැනුම් වැඩ සඳහා බලය

1.18. පළාත් සර්වේයර් ජනරාල් හා/හෝ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින්, තමන්ට බලය දී නැති මැනුම් වැඩ භාර නොගත යුතුය. ක්ෂෙත්‍රයේ දී තමාගේ සීමාවෙන් පරිබාහිර යම් කටයුත්තක් ඉටුකිරීමට ක්‍රියා කරන්නේ නම් පළාත් සර්වේයර් ජනරාල්වරයාගෙන් ඒ පිළිබඳව අනිවාර්යයෙන්ම උපදෙස් ගත යුතුය. හදිසි අවස්ථාවලදී විශේෂ අනුමැතිය සඳහා නැවත පැමිණීමට සිදුවන්නේ නම් හා වෙනත් සුළු කාරණා සම්බන්ධයෙන් පළාත් සර්වේයර් ජනරාල්ගේ ආවරණ අනුමැතියට යටත්ව ක්ෂෙත්‍රයේදී අවශ්‍යතාවයන් පෙන්වාදීමට අනුමැතිය දී ඇති කෙනෙකුගේ ලිපියක් පිළිගනු ලැබේ. නමුත් ඉන් පසුව හැකි ඉක්මනින් මෙම තොරතුරු පළාත් සර්වේයර් ජනරාල් වෙත සපයා ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය. විශේෂ ව්‍යාපෘති මැනුම් වලදි එම ඉල්ලීම් සර්වේයර් ජනරාල්වරයා වෙත හරවා යැවිය යුතුයි.

ශුද්ධි පත්‍රය

2 වැනි පරිච්ඡේදය

භූමිතික පාලන මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	ඓතිහාසික පසුබිම	
2.1.	ශ්‍රී ලංකාවේ ත්‍රිකෝණීකරණය	1
	ශ්‍රී ලංකාවේ භූමිතික පාලන ජාලය (SLD 99)	
2.2.	SLD 99 පාලන ලක්ෂ්‍ය පිහිටුවීම	1
2.3.	SLD 99 වලට අදාළ පරාමිතීන්	1
2.4.	SLD 99 වලට අදාළ පාලන ලක්ෂ්‍ය වල නිවැරදිතාවය අනුව වර්ගීකරණය	3
	මිහිතැන් ගැන්වුම් වන්දිකා (සූසැටි) පද්ධති (Global Navigation Satelite System-GNSS)	
2.5.	GNSS පාලන ලක්ෂ්‍ය පිහිටුවීම සඳහා පිරිවිතරයන්	3
2.6.	GNSS පාලන ලක්ෂ්‍ය සඳහා ස්ථිර සලකුණු භාවිතා කරන අන්දම	3
	ස්ථිර පාලන ලක්ෂ්‍ය (සලකුණු වර්ග) වල වර්ගීකරණය	
2.7.	ස්ථිර පාලන ලක්ෂ්‍ය වර්ග	4
	GNSS පාලන ලක්ෂ්‍ය අංකනය කිරීම	
2.8.	GNSS පාලන ලක්ෂ්‍ය අංක කිරීම	7
	භූමිතික පාලන ලක්ෂ්‍ය පිහිටුවීම	
2.9.	ද්විතියික භූමිතික පාලන ලක්ෂ්‍ය වල අවශ්‍යතාවය	8
2.10.	තෘතියික භූමිතික පාලන ලක්ෂ්‍ය වල අවශ්‍යතාවය	8
2.11.	තෘතියික භූමිතික පාලන ලක්ෂ්‍ය පිහිටුවීමේ ක්‍රියාවලිය	8
	භූමිතික පාලන ලක්ෂ්‍ය (GCP) පිහිටුවීමට සුදුසු ස්ථාන තෝරා ගැනීම	
2.12.	භූමිතික පාලන ලක්ෂ්‍ය පිහිටුවීමට සුදුසු ස්ථාන	8
	පරික්‍රමණ පාලන ලක්ෂ්‍ය	
2.13.	ස්ථිර සලකුණු පිහිටුවීම හා පිහිටුම් සටහන් පිළියෙල කිරීම	9
	භූමිතික පාලන ලක්ෂ්‍ය නිරීක්ෂණය කිරීමට ඉල්ලුම් කිරීම	
2.14.	ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැනුමක් ඉල්ලුම් කරන ආකාරය	9
	භූමිතික මැනුම් අංශයේ ක්‍රියාවලිය	
2.15.	පාලන ලක්ෂ්‍ය මැනුම් ඉල්ලීමක් ලද පසු ක්‍රියාකරන ආකාරය	9
2.16.	දත්ත රැස් කිරීම හා අවසන් ඛණ්ඩාංක	10
	පාලන පරික්‍රමණ	
2.17.	නිරවද්‍යතාවය අනුව පාලන පරික්‍රමණ වර්ගීකරණය	10
2.18.	පාලන පරික්‍රමණ සඳහා ස්ථිර සලකුණු භාවිතය	11
2.19.	පාලන පරික්‍රමණ සඳහා පිරිවිතරයන්	11
	පාලන පරික්‍රමණ පිහිටුවීම	
2.20.	පරික්‍රමණ අංක ලබා ගැනීම හා රේඛාචිත්‍ර පිළියෙල කිරීම	12

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
2.21.	ස්ථිර සලකුණු පිහිටුවීමේදී සැලකිය යුතු කරුණු	12
2.22.	ක්ෂෙත්‍ර සටහන් යෙදීම	12
	කෝණික හා දිග මැනීම	
2.23.	උපකරණ භාවිතයේදී සැලකිය යුතු කරුණු	12
2.24.	උපකරණ සීරුමාරු කිරීම පිළිබඳ උපදෙස්	12
2.25.	තිරස් හා සිරස් කෝණ මැනීම	13
	පරික්‍රමණ නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය	
2.26.	පරික්‍රමණ නිරීක්ෂණය කිරීම	13
2.27.	පලමු ස්ථායත්ථ කෝණය මැනීම	13
2.28.	දෙවන ස්ථායත්ථ කෝණය මැනීම	14
2.29.	පියවීමේ දෝෂය තුල තිබේදැයි පරීක්ෂා කිරීම	14
	දත්ත ඌණනය, ආගණනය සහ අනුකූලනය කිරීම	
2.30.	කෝණ සඳහා දෝෂයන් ගණනය කිරීම	14
2.31.	දිගංශයේ දෝෂයන් ගණනය කිරීම	14
2.32.	පරික්‍රමණ සඳහා ඉඩදෙන දෝෂ සීමාව ගණනය කිරීම	14
2.33.	පරික්‍රමණය අනුකූලනය සහ ආගණනය	14
	පරික්‍රමණ හා භූමිතික පාලන ස්ථාන අංක කිරීමේ ක්‍රමය	
2.34.	පරික්‍රමණ අංක කිරීම	15
2.35.	පරික්‍රමණයක ස්ථාන අංකය යෙදීම	15
	පූර්ණමාන උපකරණ සීරුමාරු කිරීම	
2.36.	පූර්ණමාන උපකරණ සීරුමාරු කිරීමේ ක්‍රියාදාමය	15
	සිරස් පාලන ජාලය	
2.37.	සිරස් පාලන ජාලයෙහි ඉතිහාසය	16
2.38.	ආරම්භක මට්ටම (පාදම -Datum)	17
2.39.	මූලික පිල් ලකුණු.(FBM)	17
2.40.	සම්මත පිල් ලකුණු (SBM)	17
2.41.	ප්‍රධාන මට්ටම් ජාලය	17
	මට්ටම් ගැනීම	
2.42.	ද්විතියික හා තෘතියික මට්ටම් ගැනීම	20
2.43.	මට්ටම් රේඛා අංකනය කිරීම	20
2.44.	පිල් ලකුණු අංකනය කිරීම	20
2.45.	භූමිතික මට්ටම් ගැනීම සඳහා පිරිවිතර	20
2.46.	ප්‍රාථමික, ද්විතියික, තෘතියික මට්ටම් රේඛා පිහිටුවීම	21
2.47.	පැරණි ක්‍රමය සඳහා පිරිවිතර	23
2.48.	මූලික පිල් ලකුණු පරීක්ෂා කිරීම	24
	ශ්‍රී ලංකා අඛණ්ඩ මෙහෙයුම් යොමු පද්ධති ජාල(SLCORS net) භාවිතයෙන් මැනුම් පාලන ලක්ෂ්‍ය පිහිටුවීම	
2.49.	ශ්‍රී ලංකා අඛණ්ඩ මෙහෙයුම් යොමු පද්ධති ජාලය {(Sri Lanka Continuously Operating Reference Station Network) SLCORSnet} මඟින් මැනුම් කිරීම	24

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	ස්ථාපිත SLCORSnet සහ යෝජිත SLCORSnet	
2.50.	SLCORSnet භාවිතා කරන ආකාරය	25
	ජාල තත්කාලීන චාලක මැනුම් (Network RTK – Network Real Time Kinematic)	
2.51.	SLCORSnet මඟින් සිදු කරන ජාල තත්කාලීන චාලක මැනුම් (Network RTK – Network Real Time Kinematic)	25
2.52.	සජීවී අන්තර්ජාල RINEX සැපයුම : GNWEB:	25
2.53.	SLCORSnet හි ජාලගත අථත්‍ය චාලක (NRTK) විසඳුම භාවිතා කර පාලන ලක්ෂ්‍ය ස්ථාපිත කිරීමේ ක්‍රමවේදය	26
2.54.	ස්ථිර සලකුණු (Monument)	26
2.55.	පාලන ලක්ෂ්‍ය සඳහා අංක කිරීමේ ක්‍රමවේදය	26
2.56.	පිහිටුම් රූප සටහන	26
	SLCORSnet ජාල මඟින් RTK විසඳුම භාවිතා කර සවිස්තරාත්මක මැනුම් කිරීමේ ක්‍රමවේදය	
2.57.	ජාලගත RTK භාවිතා කර විස්තර මැනීම	27
2.58.	දත්ත ගබඩා කිරීමේ වර්ග	27
2.59.	වන්ද්‍රිකා ආවරණයක් නොමැති ස්ථාන සඳහා නිරීක්ෂණ ගැනීම	27
2.60.	තොරතුරු විස්තර කිරීමේ ක්‍රම	27
	පවත්නා GNSS ග්‍රාහක භාවිතා කිරීම සඳහා උපදෙස්	
2.61.	SLCORS ජාලය ස්ථාපනය කිරීමේ මූලික සංකල්පය	28
	ඇමුණුම්	
ඇමුණුම 01	පාලන ලක්ෂ්‍ය සඳහා පිහිටුම් සටහන් පිළියෙල කිරීමේ ආකෘතිය	29
ඇමුණුම 02	GNSS දත්ත පත්‍රය	30
ඇමුණුම 03	අනුකූලනය කරන ලද බණ්ඩාංක සටහන් පත්‍රය	32
ඇමුණුම 04	EDM ක්ෂේත්‍ර පොතෙහි පිහිටුවීමේ සටහන් හා නිරීක්ෂණ දක්වන ආකාරය	33
ඇමුණුම 05	දෝෂ ඉවත් කිරීමෙන් පසු ගණනය කරන ලද දත්ත සටහන් පත්‍රය	34
ඇමුණුම 06	මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පිල් ලකුණු වර්ග	35
ඇමුණුම 07	භූමිතික මට්ටම් ගැනීමේ එක් එක් කොටසෙහි දත්ත (Raw Data) සටහන් කිරීමේ ආකෘති පත්‍රය (Raw data of Geodetic Levelling)	36
ඇමුණුම 08	ඉදිරිපස හා පිටුපස පාඨාංකවල වෙනස සටහන් කරන ආකෘති පත්‍රය (Abstract sheet for Precise Levelling)	37
ඇමුණුම 09	ඉඩදෙන දෝෂය තුල පිහිටි සියළු මට්ටම් රේඛා අනුකූලනය කිරීම සඳහා යොදා ගන්නා ආකෘති පත්‍රය (Adjustment sheet for Precise Levelling)	38
ඇමුණුම 10	පිල් ලකුණු පිළිබඳ විස්තරය	39
ඇමුණුම 11	මූලික පිල් ලකුණේ වාර්තාව	40
ඇමුණුම 12	GNSS නිරීක්ෂණ වාර්තා කිරීමේ අකෘතිය	42

2 වැනි පරිච්ඡේදය

භූමිතික පාලන මැනුම්

ඓතිහාසික පසුබිම

2.1. වර්ෂ 1857 දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ ත්‍රිකෝණීකරණය 1933 දී සහකාර මිනින්දෝරු අධිකාරී ජේ.ඊ. ජැක්සන් මහතා විසින් නැවත ආගණනය කරන ලදී. මෙම ජාලයෙහි ප්‍රාථමික ත්‍රිකෝණමිතික ස්ථාන 110 ක් ඇත. පාලන ජාලයෙහි නිරවද්‍යතාවය 1:20,000 පමණ විය. පසුව ද්විතියික ත්‍රිකෝණමිතික ස්ථාන, තෘතියික ත්‍රිකෝණමිතික ස්ථාන සහ සුළු ත්‍රිකෝණමිතික ස්ථාන හරහා මෙම ජාලයෙහි ඝනත්වය වැඩි කරන ලදී. තවදුරටත් පාලන ජාලය පතුරුවා හැරීම සඳහා ත්‍රිකෝණමිතික ස්ථාන අතර ප්‍රාථමික, ද්විතියික හා තෘතියික පරික්‍රමණ ජාල පිහිටුවන ලදී.

කැඩැස්තර මැනුම්, ඉදිකිරීම් මැනුම්, ඉංජිනේරු මැනුම්, ඉඩම් තොරතුරු පද්ධතිය (LIS) සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) වැනි මැනුම් ක්ෂේත්‍රයේ බිහිවූ නව තාක්ෂණික දියුණුවත් සමඟ ඇතිවූ අභියෝගවලට මුහුණ දීමට ඉහත භූමිතික ජාලයෙන් සැපයූ නිරවද්‍යතාවය ප්‍රමාණවත් නොවන බව 1980 වර්ෂය පමණ වන විට පැහැදිලිව පෙනීයන ලදී. එබැවින් ඉහත ගැටළුවලට විසඳුම් සෙවීම සඳහා 1992 පෙබරවාරි මාසයේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පවතින පාලන ජාලය, ත්‍රිකෝණීකරණය (Triangulation), ත්‍රයංශනය (Trilateration) හා ගෝලීය පිහිටුම් පද්ධති (GPS) නිරීක්ෂණ යොදාගනිමින් වැඩි දියුණු කිරීමට තීරණය කරන ලදී.

ශ්‍රී ලංකාවේ භූමිතික පාලන ජාලය (SLD 99)

2.2. 1992 දී ත්‍රිකෝණීකරණය (Triangulation), ත්‍රයංශනය (Trilateration) හා ගෝලීය පිහිටුම් පද්ධති (GPS) භාවිතයෙන් ශ්‍රී ලංකාවේ පාලන ජාලය වැඩිදියුණු කිරීමේ භාරදූර ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. 1999 වර්ෂයේදී සම්පූර්ණ තිරස් ජාලය වැඩිදියුණු කිරීම අවසන් කර නව පාලන ජාලය පිහිටුවන ලදී. එය පහත වර්ගවල පාලන ලක්ෂ්‍ය 273 කින් සමන්විත විය.

1)	මූලික පාලන ලක්ෂ්‍යය (Base Station) - ISMD	- 01
2)	ප්‍රධාන පාලන ලක්ෂ්‍ය (Principal GPS Station) - AA)	- 10
3)	ප්‍රාථමික පාලන ලක්ෂ්‍ය (Primary GPS Station) – A	- 194
4)	පැරණි හා නව ත්‍රිකෝණමිතික ස්ථාන (TO, TN)	- 48
5)	මූලික පිල් ලකුණු (FBM)	- 20
	එකතුව	- 273

2.3. ඉහත පද්ධතිය SLD 99 ලෙස නම් කළ අතර එයට අදාළ පරාමිතීන් පහත දැක්වේ.

I. භාවිතා කරනු ලබන ඉලිප්සාභය - එවරස්ට් 1830

අර්ධ මහා අක්ෂය a - මීටර් 6377276.3450

අර්ධ සුළු අක්ෂය b - මීටර් 6356075.4131

1/f - 300.801699999584

{ සටහන: f= (a-b)/a }

II. පාදම ප්‍රක්ෂේපණය (Datum Transformation)

අ) පරාමිතීන් හතකින් සමන්විත පරිවර්තනය (WGS 84 ඉලිප්සාභය එවරස්ට් ඉලිප්සාභයට හැරවීම)

ප්‍රක්ෂේපණ ක්‍රමය	=	Bursa Wolf
ΔX විස්ථාපනය	=	මීටර් 0.2933
ΔY විස්ථාපනය	=	මීටර් - 766.9499
ΔZ විස්ථාපනය	=	මීටර් - 87.7131
X අක්ෂය වටා භ්‍රමණය	=	0.1957040”
Y අක්ෂය වටා භ්‍රමණය	=	1.6950677”
Z අක්ෂය වටා භ්‍රමණය	=	3.4730161”
පරිමාණ සාධකය	=	1.0000000393 හෝ 0.0393 ppm

ආ.) පරාමිතීන් තුනකින් සමන්විත පරිවර්තනය (WGS84 ඉලිප්සාභය එවරස්ට් ඉලිප්සාභයට පරිවර්තනය කිරීම)

සමහර අත් මිහිතැන් ගැන්වුම් (Hand Held GPS) උපකරණවල පරාමිතීන් හත වෙනුවට පරාමිතීන් තුනක් පමණක් භාවිතා කර පරිවර්තනය සිදු කෙරේ.

ΔX විස්ථාපනය	=	මීටර් 97.000
ΔY විස්ථාපනය	=	මීටර් - 787.000
ΔZ විස්ථාපනය	=	මීටර් - 86.0000

III. සිතියම් ප්‍රක්ෂේපණ පරාමිතීන්

අ.) තීර්යක් මර්කේටර් සිතියම් ප්‍රක්ෂේපණ පරාමිතීන්

සිතියම් ප්‍රක්ෂේපණය	- තීර්යක් මර්කේටර් ප්‍රක්ෂේපණය
කේන්ද්‍රයේ දේශාංශය	- 80º 46´ 18.16710’’ නැ
කේන්ද්‍රයේ අක්ෂාංශ	- 07º 00´ 1.69750’’ උ
පරිමාණ සාධකය	- 0.9999238418
උතුරු ඛණ්ඩාංකය	- මීටර් 500,000.00
නැගෙනහිර ඛණ්ඩාංකය	- මීටර් 500,000.00

පැරණි ත්‍රිකෝණමිතික ජාලයේ මූල ලක්ෂ්‍යය වූ පිදුරුතලාගල ත්‍රිකෝණමිතික ස්ථානය, ප්‍රක්ෂේපණයේ මූල ලක්ෂ්‍යය ලෙස භාවිතා කරන ලදී. මෙම ප්‍රක්ෂේපණ ඛණ්ඩාංක පද්ධතිය ජාතික ඛණ්ඩාංක පද්ධතිය (ජාතික ග්‍රිඩ් ඛණ්ඩාංක පද්ධතිය) ලෙස හැඳින්වේ.

ආ.) සර්වත්‍ර තීර්යක් මර්කේටර් (Universal Transverse Mercator) ප්‍රක්ෂේපණ පරාමිතීන්

ග්‍රිඩ් ඛණ්ඩාංක ලබාගැනීමට අත් මිහිතැන් ගැන්වුම් (Hand Held GPS) උපකරණ භාවිතා කරන අතර, ඉහත සඳහන් කරන ලද පරාමිතීන් වෙනුවට එහිදී සර්වත්‍ර (UTM) ප්‍රක්ෂේපණ පරාමිතීන් පමණක් භාවිතා කෙරේ.

සිතියම් ප්‍රක්ෂේපණය	- සර්වත්‍ර තීර්යක් මර්කේටර් (UTM) ප්‍රක්ෂේපණය
කේන්ද්‍රයේ දේශාංශය	- 80º 46´ 18.16710’’ නැ
පරිමාණ සාධකය	- 0.9999238418
උතුරු ඛණ්ඩාංකය	- මීටර් -273,992.00
නැගෙනහිර ඛණ්ඩාංකය	- මීටර් 500,000.00

2.4. SLD99 වලට අදාළ පාලන ලක්ෂ්‍ය ඒවායේ නිවැරදිතාවයන් අනුව පහත සඳහන් පරිදි වර්ගීකරණය කරන ලදි.

වර්ගය	නිරවද්‍යතාවය
ප්‍රධාන පාලන ලක්ෂ්‍යය (AA)	1:700,000
ප්‍රාථමික පාලන ලක්ෂ්‍යය (A)	1:200,000
ද්විතියික පාලන ලක්ෂ්‍යය (B)	1:100,000
තෘතියික පාලන ලක්ෂ්‍යය (C)	1:50,000

මිහිතැන් ගැන්වුම් චන්ද්‍රිකා (සූසැටි) පද්ධති (Global Navigation Satelite System-GNSS)

2.5. GNSS පාලන ලක්ෂ්‍ය පිහිටුවීම සඳහා භාවිතා කළයුතු පිරිවිතරයන් පහත දැක්වේ.

	මිහිතැන් ගැන්වුම් චන්ද්‍රිකා (සූසැටි) පද්ධති (GNSS) පිහිටුවීම	ප්‍රධාන	ප්‍රාථමික	ද්විතියික	තෘතියික
1	නිරවද්‍යතාව	1:700,000	1:200,000	1:100,000	1:50,000
2	නිරීක්ෂණ ක්‍රමය	ස්ථිතික	ස්ථිතික	ස්ථිතික	ස්ථිතික
3	නිරීක්ෂණ සැසියෙහි අවම කාලය	පැය 8 බැගින් තුන් වරක්	පැය 3	පැය 3	මිනිත්තු 45
4	GDOP	< 4	< 4	< 6	< 6
5	මිහිතැන් ගැන්වුම් චන්ද්‍රිකා(සූසැටි) පද්ධති (GNSS) ග්‍රාහක	ද්විත්ව සංඛ්‍යාත	ද්විත්ව සංඛ්‍යාත	ද්විත්ව සංඛ්‍යාත	ද්විත්ව සංඛ්‍යාත
6	අනුකූලනය	ජාලය	ජාලය	ජාලය	ජාලය
7	පරිපථය පියවීම	1:1,000,000	1:200,000	1:100,000 හෝ < සෙ.මී.3	1:50,000 හෝ < සෙ.මී.5
8	පාදක ස්ථාන	3	3	3	2
9	ස්ථාන අතර අවම දුර	කි.මී. 50-100	කි.මී. 15-30	කි.මී. 4-8	මී 100-මී.500 අතර අනුයාත ලක්ෂ්‍ය 3 සහ කි.මී. 2 අතර කට්ටල 2

2.6. GNSS පාලන ලක්ෂ්‍ය සඳහා ස්ථිර සලකුණු භාවිතා කරන අන්දම පහත දැක්වේ.

පාලන ලක්ෂ්‍ය කාණ්ඩ	භාවිතා කළ යුතු ස්ථිර සළකුණු වර්ගය
ප්‍රධාන ලක්ෂ්‍ය	A3, B1, B2, B3
ප්‍රාථමික පාලන ලක්ෂ්‍ය	A3, B1, B2, B3
ද්විතියික පාලන ලක්ෂ්‍ය	A4, B1, B2, B3
තෘතියික පාලන ලක්ෂ්‍ය	A5, A6, B1, B2, B3

ස්ථිර පාලන ලක්ෂ්‍ය (සලකුණු වර්ග) වල වර්ගීකරණය

2.7. පහත සඳහන් පරිදි ස්ථිර පාලන ලක්ෂ්‍ය වර්ග කළ හැක.

1. ස්ථිර සලකුණු වර්ගය : A3

පහත සඳහන් දිග, පළල ඇති විශාල කොන්ක්‍රීට් කැටයක් මත පිත්තල ඇණය ස්ථිර සලකුණ ලෙස භාවිතා වන ස්ථම්භය එම ස්ථානයේදීම සෑදිය යුතුය.



විස්තරය- විශාල කොන්ක්‍රීට් ස්ථම්භයක් මත පිත්තල ඇණය

2. ස්ථිර සලකුණු වර්ගය : A4

පහත සඳහන් දිග, පළල ඇති කොන්ක්‍රීට් ස්ථම්භය මත පිත්තල ඇණය - (A4)



පිත්තල ඇණයේ හරස්කඩ

විස්තරය- විශාල කොන්ක්‍රීට් ස්ථම්භය මත පිත්තල ඇණය

3. ස්ථිර සලකුණු වර්ගය : (A5)

පහත සඳහන් දිග, පළල ඇති කොන්ක්‍රීට් ස්ථම්භය තුලට ගිල්වූ පිත්තල කූර - (A5)



විස්තරය- කොන්ක්‍රීට් ස්ථම්භය තුලට ගිල්වූ පිත්තල කූර (පිත්තල කූරෙහි විශ්කම්භය මි.මී. 3)

4. ස්ථිර සලකුණු වර්ගය : (A6)

පහත සඳහන් දිග, පළල ඇති කොන්ක්‍රීට් ස්ථම්භය මත පිත්තල ඇණය



පිත්තල ඇණයේ හරස්කඩ

විස්තරය- කොන්ක්‍රීට් ස්ථම්භය මත පිත්තල ඇණය.

5. ස්ථිර සලකුණු වර්ගය : B1 & B2

පොළව මට්ටමට යටින් පිහිටි (B1) හෝ පොළව මතුපිටින් ඉහල පිහිටියාවූ ස්වාභාවික ගලක් මත **(B2)** පහත රූපයෙහි පෙන්වා ඇති පරිදි වූ තලයක මධ්‍යය ලක්ෂ්‍යයෙහි සෙ.මී. 7.5ක පිත්තල ඇණයක් සවිකළ යුතුය.



විස්තරය- ස්වාභාවික ගලක් මත පිත්තල ඇණය

6. ස්ථිර සලකුණු වර්ගය : B3

මැනුම් ලක්ෂ්‍ය කොන්ක්‍රීට් තට්ටුවක් මත හෝ පදික වේදිකාව මත පිහිට වූ විට මධ්‍ය ලක්ෂ්‍ය සඳහා සෙ.මී. 7 ක් ගැඹුරට පිත්තල ඇණයක් සවිකළ යුතුය.



විස්තරය-කොන්ක්‍රීට් තට්ටුවක් හෝ පදික වේදිකාව මත පිත්තල ඇණය (B3)

7. ස්ථීර සලකුණු වර්ගය : B4

පහත සඳහන් දිග, පළල ඇති කොන්ක්‍රීට් ස්ථම්භය මත පිත්තල ඇණය **(මතුපිට ලක්ෂ්‍ය)**

පොළව මතුපිට සිට ප්‍රක්ෂේපණය සෙ.මී. 10 ක් වන පරිදි හා සෙ.මී. 30×සෙ.මී. 30 කොන්ක්‍රීට් ඇතිරූ පාදමකින් ආවරණය වන පරිදි පොළව යට වැළලිය යුතුය.



Diameter of the rod is 3mm and length 30 cm

GNSS පාලන ලක්ෂ්‍ය අංකනය කිරීම

2.8. ප්‍රධාන පාලන ලක්ෂ්‍ය හා ප්‍රාථමික පාලන ලක්ෂ්‍ය අංක කිරීමේ ක්‍රමය පහත දැක්වේ.

ස්ථානය	**ලක්ෂ්‍ය අංකය**
මූලික පාලන ලක්ෂ්‍යය -දියතලාව	ISMD
ප්‍රධාන පාලන ලක්ෂ්‍ය	AA01-AA10
ප්‍රාථමික පාලන ලක්ෂ්‍ය	A001,A002,…..
පැරණි ත්‍රිකෝණමිතික ලක්ෂ්‍ය	TO034, TO037,……
නව ත්‍රිකෝණමිතික ලක්ෂ්‍ය	TN036, TN048,…

GNSS ද්විතියික (B Type) හා තෘතියික (C Type) පාලන ලක්ෂ්‍ය අංකනය කිරීමේ වගකීම භූමිතික මැනුම් අංශය (මැ.සි.ආ, ස.ජ.කා) හා පළාත් භූමිතික මැනුම් ඒකක සතුවේ. එක් එක් ඒකකයට එකාකාරී අංක කිරීමේ ක්‍රමයක් පවත්වාගෙන යෑම හා නිරවද්‍යතා මට්ටම (ද්විතියික හා තෘතියික) හඳුනාගැනීමට හැකිවන පරිදි පහත සඳහන් ක්‍රමය අනුගමනය කළ යුතුය.

ද්විතියික පාලන ලක්ෂ්‍ය : PQBXXXX තෘතියික පාලන ලක්ෂ්‍ය : PQCXXXX

PQ - කැඩැස්තර සිතියම්වල භාවිතා වන දිස්ත්‍රික්ක අංකය (**21 වැනි පරිච්ඡේදයෙහි ඇමුණුම 04 බලන්න**)

තුන්වන අංකය - ද්විතියික පාලන ලක්ෂ්‍ය සඳහා **B** ද තෘතියික පාලන ලක්ෂ්‍ය සඳහා **C** ද භාවිතා කරන්න

භූමිතික මැනුම් අංශය - දියතලාව	00001 - 40000
බස්නාහිර පළාත් / ස.ජ.කා. භූමිතික මැනුම් ඒකකය	40001 - 50000
වයඹ පළාත් භූමිතික මැනුම් ඒකකය	50001 - 60000
දකුණු පළාත් භූමිතික මැනුම් ඒකකය	60001 - 70000
මධ්‍යම පළාත් භූමිතික මැනුම් ඒකකය	70001 – 80000
උතුරු පළාත් භූමිතික මැනුම් ඒකකය	80001 – 90000

භූමිතික පාලන ලක්ෂ්‍ය පිහිටුවීම

2.9. ද්විතියික භූමිතික පාලන ලක්ෂ්‍ය (B-වර්ගයේ) පිහිටුවීමේ අවශ්‍යතාවය නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූමිතික මැනුම්) විසින් හඳුනාගනු ලබන අතර, අදාළ දිස්ත්‍රික්කය හරහා ක්‍රියාත්මක කළ යුතුය.

2.10. තෘතියික භූමිතික පාලන ලක්ෂ්‍ය (C-වර්ගයේ) දිස්ත්‍රික් මට්ටමේ අවශ්‍යතා අනුව පිහිටුවනු ලැබේ. තෘතියික භූමිතික පාලන ලක්ෂ්‍යයක් සමඟම තවත් අනුයාත භූමිතික පාලන ලක්ෂ්‍ය දෙකක් එකිනෙකට දර්ශනය වන පරිදි අවම වශයෙන් එකිනෙකට මීටර් 100 ක දුරින් පිහිටුවිය යුතුය. මෙය එම පාලන ලක්ෂ්‍ය මඟින් ආරම්භ කරන පරික්‍රමණ සඳහා දිගංශ පාලනයටත් පාලන ලක්ෂ්‍ය නිවැරදිව හඳුනාගත් බව තහවුරු කර ගැනීම සඳහාත් අවශ්‍ය වේ. ඒ අනුව භූමිතික පාලන ස්ථාන යන්නෙන් අදහස් කරන්නේ මෙවැනි භූමිතික පාලන ලක්ෂ්‍ය තුනකින් යුත් පාලන ලක්ෂ්‍ය කට්ටලයක් වන අතර, එම පාලන ලක්ෂ්‍යයන් තුන සඳහාම වන්ද්‍රිකා දර්ශනය වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ විය යුතුය.

2.11. තම තම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි අවශ්‍ය ප්‍රමාණයට මැනුම් සඳහා අවශ්‍ය වන පාලන ලක්ෂ්‍ය පවත්වා ගෙන යාමට කටයුතු කිරීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි ගේ වගකීම වේ. දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පාලන ලක්ෂ්‍ය දත්ත බැංකුව (Control Points) මෙනුව මඟින් මේ පිළිබඳව පරීක්ෂා කළ හැකිය. මෙසේ පරීක්ෂා කර බැලීමේදී මෙම පැරණි පාලන ලක්ෂ්‍ය ක්ෂෙත්‍රයේ පරීක්ෂා කිරීමෙන් ක්ෂෙත්‍රයේ භෞතිකව නොමැති සහ භාවිතා කළ නොහැකි පාලන ලක්ෂ්‍ය පිළිබඳවද නිරතුරුව සොයා බැලීමද ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් කළ යුතුය. ඒ අනුව සෑම වර්ෂයක් ආරම්භයේදීම පාලන ලක්ෂ්‍ය නොමැති බව තහවුරු කර ගත් හා මැනුම් වලට අදාළව නවතම GPS ලක්ෂ්‍ය පිහිටුවිය යුතු ස්ථාන හඳුනා ගත යුතුය.

පාලන ලක්ෂ්‍ය පිහිටුවීමට සුදුසු ස්ථාන තෝරා 1:50,000 පරිමාණයට අනුරේඛනයක් මිනින්දෝරු අධිකාරි විසින් 2.12 ඡේදයේ නිර්ණායක අනුව සකස් කළ යුතුය.

මෙම අනුරේඛනය දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අනුමත කළ පසු අදාළ ස්ථානවල 2.7 ඡේදයෙහි සඳහන් පරිදි සුදුසු පාලන ලක්ෂ්‍ය පිහිටුවීමට මැනුම් ඉල්ලීමක් ක්ෂෙත්‍රයට නිකුත් කළ යුතුය.

භූමිතික පාලන ලක්ෂ්‍ය (GCP) පිහිටුවීමට සුදුසු ස්ථාන තෝරා ගැනීම

2.12. භූමිතික පාලන ලක්ෂ්‍ය (GCP) තෝරා ගැනීමේ සාමාන්‍ය නිර්නායකයන් පහත දැක්වේ.

(i) වන්ද්‍රිකා දර්ශනය වීමේ අවශ්‍යතාවය (ක්ෂිතිජයේ සිට 15° කෝණයකින් ඉහළ) තිබිය යුතුය.
(ii) මිනිස් ක්‍රියාකාරකම් හා ස්වාභාවික බාධක වලින් තොර සහ රජයේ ඉඩම්වල හෝ රජයේ දේපළ පිහිටි ස්ථාන තෝරා ගත යුතුය.
(iii) භූමිතික පාලන ලක්ෂ්‍ය කරා පහසුවෙන් ලඟා වීමට හැකි ස්ථාන විය යුතුය.
(iv) ඕනෑම වර්ගයක මැනුම් උපකරණයක් ස්ථාන ගත කළ හැකි විය යුතුය.
(v) අධිබලැති විදුලි රැහැන්, සම්ප්‍රේෂණ කුළුණු සහ සංඥා පරාවර්තනය විය හැකි ස්ථාන ආදිය මඟ හැරිය යුතුය.

පරික්‍රමණ පාලන ලක්ෂ්‍ය

2.13. පරික්‍රමණ පාලන ලක්ෂ්‍ය ලෙස ස්ථිර සලකුණු පිහිටුවීම හා පිහිටුම් සටහන් පිළියෙල කිරීම කළ යුතුය. එහිදී,

(අ) පාලන ලක්ෂ්‍ය පිහිටුවීමට හා එයට අදාළ දළ සටහන් පිළියෙල කිරීම සඳහා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් නිකුත් කරන ලද මැනුම් ඉල්ලීමට අනුව තෝරාගත් ස්ථානවල 2.7 ඡේදයෙහි සඳහන් පරිදි නිවැරදි වර්ගයේ ස්ථිර සලකුණු වැළලීම/සෑදීම කළ යුතුය.

(ආ) ඇමුණුම 01 හි දැක්වෙන පරිදි සියළුම නව පාලන ලක්ෂ්‍ය සඳහා සවිස්තරාත්මක ක්ෂේත්‍ර සටහන් ක්ෂේත්‍ර පොතෙහි ඇඳීමේදී සෑම පාලන ලක්ෂ්‍යයකටම තාවකාලික යොමු අංකයක් යෙදිය යුතුය.

(ඇ) ක්ෂේත්‍රයේදී අවම වශයෙන් ස්ථිර ලක්ෂ්‍ය තුනකට දුරද, අත් මිහිතැන් ගැන්වුම් (Hand Held GPS) උපකරණ මඟින් දළ බණ්ඩාංකද ලබාගෙන ක්ෂේත්‍ර සටහනෙහි දැක්විය යුතුය.

(ඈ) මැනුම් ඉල්ලීමෙහි වැඩ අවසන් කිරීමේදී මැනුම් ඉල්ලීම් අංකය දළ සටහනෙහි සඳහන් කිරීමද ඉතා වැදගත් වන අතර සෑම දළ සටහන් පත්‍රයකම රජයේ මිනින්දෝරු සහ මිනින්දෝරු අධිකාරි අත්සන් තැබීම අනිවාර්යයෙන් සිදු කළ යුතුය.

(ඉ) ස්ථාපනය කරන ලද පාලන ලක්ෂ්‍ය වල පිහිටීම දැක්වීමට සකස් කරන ලද kml ගොනුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත email මඟින් යොමු කළ යුතුය.

භූමිතික පාලන ලක්ෂ්‍ය නිරීක්ෂණය කිරීමට ඉල්ලුම් කිරීම

2.14. ක්ෂේත්‍ර සටහන් අනුව නිරීක්ෂණය කළ යුතු පාලන ලක්ෂ්‍ය වල දළ සටහන් සූදානම් කළ පසු දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූමිතික) වෙත පාලන මැනුම් සඳහා මැනුම් ඉල්ලීම යොමු කළ යුතුය.

මේ සඳහා කාර්ය මණ්ඩල ප්‍රවේශයෙහි (Staff Access) ඇති Geo SRIMS මෙනුව හරහා ඇතුළුවීමට ලබාදී ඇති පරිශීලක නාමය (User Name) හා මුර පදය (Pass Word) භාවිතා කළ යුතුය. එහිදී මැනුමට අදාළව ඉල්ලා ඇති තොරතුරු නිවැරදිව ඇතුලත් කිරීමෙන් මැනුම සඳහා ඉල්ලීම සම්පූර්ණවේ.

භූමිතික මැනුම් අංශයේ ක්‍රියාවලිය

2.15. භූමිතික මැනුම් අංශය වෙත පාලන ලක්ෂ්‍ය මැනුම් ඉල්ලීමක් ලද පසු පහත ක්‍රියාවලිය සිදු කළ යුතුය.

(අ) අදාළ දළ සටහන් (දෘඪ පිටපත්) සහ kml ගොනුව ලද පසු දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි හෝ භූමිතික මැනුම් කාර්යාලයක මිනින්දෝරු අධිකාරි විසින් GEOSRIMS මඟින් මැනුමක් ඉල්ලුම් කළ විට නි.ස.ජ. (භූමිතික) විසින් මැනුම් ඉල්ලීම් අංකයක් නිකුත් කරමින් අදාළ භූමිතික මැනුම් කාර්යාලයට (පළාත්/මැ.සි.ආ/ස.ජ.කා) GEOSRIMS මඟින් මැනුම යොමු කළ යුතුය.
GEOSRIMS මඟින් අදාළ මැනුම් ඉල්ලීම යොමු කළ භූමිතික කාර්යාලය හඳුනා ගෙන දළ සටහන් වල දෘඪ පිටපත් සහ kml ගොනුව මැනුම ඉල්ලුම් කළ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් යැවිය යුතුය.
සෑම භූමිතික මැනුම් කාර්යාලයක් මඟින් මැනුම් ඉල්ලීම් ලෙජරයක්ද පවත්වා ගෙන යායුතුය.

(ආ) GEOSRIMS මඟින් අදාළ භූමිතික මැනුම් කාර්යාලයට (පළාත්/මැ.සි.ආ/ස.ජ.කා) දළ සටහන් වල දෘඪ පිටපත් සහ kml ගොනුව ලද පසු භූමිතික අංශය විසින් මැනුම් වැඩ සටහනක් පිළියෙල කර හැකි ඉක්මනින් මැනුම ක්‍රියාත්මක කළ යුතුය.

(ඇ) දත්ත ලබාගන්නා කාලය තුල ඇමුණුම 02 හි සඳහන් GNSS දත්ත පත්‍රය සම්පූර්ණ කර ගත යුතුය.

(ඈ) දත්ත සැකසීම (process) සිදු කර ලබා ගන්නා ලද ඛණ්ඩාංක මිනින්දෝරු අධිකාරී (භූමිතික) විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නියමිත ආකාරයට ලබා ගැනීමට හැකියාව ඇති පාලන ලක්ෂ්‍ය පමණක් 2.8 ඡේදයේ සඳහන් පරිදි GPS ලක්ෂ්‍ය අංකනය කළ යුතුය. ඉන් පසු රජයේ මිනින්දෝරු විසින් ඇමුණුම 03 හි පරිදි දත්ත පත්‍ර පිළියෙල කළ යුතුය.

(ඉ) GEOSRIMS මැනුම් ඉල්ලීම් අංකය දළ සටහනෙහි රූපයට ඉහලින් වම් කෙලවරෙහි සටහන් කර එක් එක් පාලන ලක්ෂ්‍ය සඳහා ලබාදී ඇති GPS අංකයද දළ සටහනෙහි රතු වර්ණයෙන් සටහන් කළ යුතුය. දළ සටහනෙහි ඛණ්ඩාංක සඳහා වෙන් කර ඇති ස්ථානයෙහි උතුරු හා නැගෙනහිර ඛණ්ඩාංක වල වටයන පූර්ණ සංඛ්‍යාව පමණක් රතු වර්ණයෙන් සටහන් කළ යුතුය.

(ඊ) දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම සඳහා මෙලෙස සම්පූර්ණ කරන ලද දළ සටහන රජයේ මිනින්දෝරුවරයා විසින් Control Database එකට උඩුගත කළ යුතුය.

(උ) මිනින්දෝරුවරයා විසින් ඇමුණුම 03 හි පරිදි සකස් කරන ලද දත්ත පත්‍රය උඩුගත කළ පසු මිනින්දෝරු අධිකාරී විසින් එම සියළුම දත්ත පරීක්ෂා කර නිවැරදි බවට තහවුරු කර ගැනීමෙන් පසු අත්සන් කර එය නි.ස.ජ.(භූමිතික) වෙත යොමු කළ යුතුය.

2.16. දත්ත රැස් කිරීම හා අවසන් ඛණ්ඩාංක සැකසීමේදී ;

(අ) GNSS නිරීක්ෂණ දත්ත සහ සකසන ලද දත්ත (අංකිත හා දෘඪ පිටපත් ලෙස) අදාළ පළාත් භූමිතික මැනුම් ඒකකයෙහි ගබඩා කළ යුතුය.

(ආ) පළාත්/ මැ.සි.ආ/ ස.ජ.කා භූමිතික අංශ යටතේ මනින ලද ද්විතියික හා තෘතියික GPS පාලන ලක්ෂ්‍ය වල පිහිටුම් සටහන් අදාළ කාර්යාලවල ගබඩා කළ යුතුය.

(ඇ) මිනින්දෝරු අධිකාරී විසින් පරීක්ෂා කර එවන ලද දත්ත පත්‍රය නි.ස.ජ. (භූමිතික) විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමත කළ යුතුය.

(ඈ) අවසන් ඛණ්ඩාංක හා දත්ත පත්‍රිකා නි.ස.ජ.(භූමිතික) අංශයේ තැන්පත් කිරීමට නි.ස.ජ. (භූමිතික) විසින් පියවර ගත යුතුය.

(ඉ) නි.ස.ජ. (භූමිතික) විසින් අනුමත කිරීමෙන් පසු පමණක් Control Points දත්ත පද්ධතිය හරහා අදාළ GPS ලක්ෂ්‍ය වල දත්ත නිරීක්ෂණය කිරීමට හා මුද්‍රිත පිටපත් ලබා ගැනීමේ පහසුකම ලැබේ.

(ඊ) සියළුම භූමිතික කාර්යාල වලින් එවනු ලබන දත්ත පත්‍ර හා අංකිත දත්ත කාර්යාල අනුව ගොනු කර සුරක්ෂිතව පවත්වා ගත යුතුය.

(උ) නි.ස.ජ. (භූමිතික) විසින් එක් එක් පාලන ලක්ෂ්‍ය වලට අදාළ ඛණ්ඩාංක දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත නිකුත් කළ යුතුය. දිස්ත්‍රික් කාර්යාල තුලද මෙම ඛණ්ඩාංක පත්‍ර හා ඊට අදාළ දළ සටහන් ලෙජර ආකාරයෙන් සකස් කර ලේඛනාගාරයෙහි ගබඩා කළ යුතුය.

(ඌ) දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබෙන ඉල්ලීම් සඳහා ඛණ්ඩාංක නිකුත් කිරීමට Control Database පද්ධතිය තුලට පිවිසීමට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් වෙත නිකුත් කර ඇති පරිශීලක නාමය (user name) හා මුර පදය (password) භාවිතා කළ යුතුය.

පාලන පරික්‍රමණ

2.17. තිරස් භූමිතික පාලනය සඳහා ගෝලීය පිහිටුම් පද්ධති (GNSS) තාක්ෂණය හඳුන්වාදීමත් සමඟ දීර්ඝ පරික්‍රමණ පිහිටුවීමේ අවශ්‍යතාවය අවම විය. කෙසේ නමුත් පරික්‍රමණවල නිරවද්‍යතාව අනුව ඒවා ප්‍රධාන වර්ග තුනකට වෙන් කරන ලදී.

පාලන පරික්‍රමණය	**නිරවද්‍යතාව**
ප්‍රාථමික පරික්‍රමණ පාලන ලක්‍ෂ්‍ය	1:50,000
ද්විතියික පරික්‍රමණ පාලන ලක්‍ෂ්‍ය	1:30,000
තෘතියික පරික්‍රමණ පාලන ලක්‍ෂ්‍ය	1:20,000

2.18. පාලන පරික්‍රමණ සඳහා ස්ථිර සලකුණු භාවිතය පහත පරිදිවේ.

පාලන පරික්‍රමණ වර්ගය	**භාවිතා කළ යුතු ස්ථිර සලකුණු වර්ගය**
ප්‍රාථමික	A6, B1, B2, B3
ද්විතියික	A6, B1, B2, B3
තෘතියික	A6, B1, B2, B3, පිහිටි ගල මත කැපූ මායිම්ගල

2.19. ඉතා ඉහල ප්‍රමිතීන් යටතේ නිරවද්‍යතාවය පවත්වාගෙන යෑම සඳහා උපරිම පූර්වෝපායන් යෙදිය යුතුය. මැනුම් ඉල්ලීම්වල අවශ්‍යතාවය අනුව ස්ථාපිත කරනු ලබන පරික්‍රමණ වර්ගය තීරණය කරනු ලැබේ. එක් එක් පරික්‍රමණ වර්ගයේ බලාපොරොත්තු වූ නිරවද්‍යතාවය ලබා ගැනීම සඳහා පහත සඳහන් පිරිවිතර භාවිතා කරනු ලැබේ.

		පරික්‍රමණ වර්ගය			
		ප්‍රාථමික I	**ද්විතියික II**	**තෘතියික III**	**පූර්ණමාන විස්තර මැනීම්**
කෝණික මැනුම්	කෝණික නිරීක්ෂණ නිරවද්‍යතාවය ආසන්න	1”	3”	5“	5´
	කෝණ පියවීමේ දෝෂ සීමාව	30”	1´	2´	3´
	කෝණ මැනීමේ ක්‍රමය	අභ්‍යන්තර කෝණ	අභ්‍යන්තර කෝණ	අභ්‍යන්තර කෝණ	දිගාංශ
	තිරස් මූලාංක (0) ගණන (Hz)	6 (0^0, 30^0, 60^0, 90^0, 120^0,$150^{0)}$	4 (0^0, 45^0, 90^0, $135^{0)}$	2($0^{0,}$ $90^{0)}$	
	සිරස් මූලාංක (0) ගණන (V)	4	2	1	
	මුහුණත්	2	2	2	
	උපරිම තිරස් විචලනය (Hz)	±4’’	±8’’	±12’’	
	උපරිම සිරස් විචලනය (V)	±8”	±20”	±30”	
දුර මැනුම්		.			
	ස්ථාන අතර දුර	200-800 මී	100-300 මී.	50-100 මී.	
	දිග මැනීම	දිසා දෙකටම	දිසා දෙකටම	දිසා දෙකටම	එක් දිසාවකට
	මැනීම අතර ඉඩ දිය හැකි වෙනස මි.මී. වලින්	මි.මී.5	මි.මී.5	මි.මී.5	අදාළ නොවේ
	මධ්‍යන්‍ය දුරෙහි සම්මත අපගමනය මි.මී. වලින්	මි.මී.5	මි.මී.5	මි.මී.5	
	සම්මත ශුද්ධිය (උෂ්ණත්වය හා පීඩනය නිරීක්ෂණ ගැනීමේදී ඇතුලත් කළ යුතුය)	යෙදිය යුතුය	යෙදිය යුතුය	යෙදිය යුතුය	
	උපකරණ හා ඉලක්ක /සංඥා උස	යෙදිය යුතුය	යෙදිය යුතුය	යෙදිය යුතුය	

		පරික්‍රමණ වර්ගය			
		ප්‍රාථමික I	**ද්විතියික II**	**තෘතියික III**	**පූර්ණමාන විස්තර මැනීම්**
	උපකරණ හා ඉලක්ක /සංඥා උසෙහි නිරවද්‍යතාව	±මි.මි.10	±මි.මි.10	±මි.මි.10	
	උෂ්ණත්වය නිරවද්‍යතාව	$\pm 1^0$C	$\pm 1^0$C	$\pm 1^0$C	
	පීඩනය නිරවද්‍යතාව	± 5 mbar	± 5 mbar	± 5 mbar	
නිරවද්‍යතාව	දිගාංශ (Az) පාලනය	ස්ථාන 20	ස්ථාන 25	ස්ථාන 30	
		ඉහත සීමාවන් ඉක්මවන විට තෙවන ගණයේ අන්තර් භූමිතික ලක්ෂ්‍ය 3ක් පිහිටුවිය යුතුය.			
	දිගාංශ (Az) පියවීම	5”√N, N යනු ස්ථාන ගණනයි	10”√N, N යනු ස්ථාන ගණනයි	20”√N, N යනු ස්ථාන ගණනයි	
	මධ්‍යන්‍ය මුහුදු මට්ටම සඳහා ශෝධනය	යෙදිය යුතුය	යෙදිය යුතුය	යෙදිය යුතුය	
	ඛණ්ඩාංක පියවීමේ දෝෂයේ සීමාවන් C හි අගය (C√K සූත්‍රය K යනු පරික්‍රමණයේ දිග Km වලින්)	0.2	0.3	0.4	

පාලන පරික්‍රමණ පිහිටුවීම

2.20. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයාගේ උපදෙස් මත පරික්‍රමණ මැනීම ආරම්භ කිරීමට පෙර, පරික්‍රමණ අංක ලබා ගැනීම හා යෝජිත පරික්‍රමණ ජාලයෙහි 1:50,000 පරිමාණයෙන් රේඛා චිත්‍රයක් පිළියෙල කළ යුතුය. සෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකම ප්‍රාථමික, ද්විතියික හා තෘතියික පරික්‍රමණ සඳහා අංක නිකුත් කිරීමට ලේඛනයක් පවත්වා ගෙන යායුතුය.

2.21. ස්ථිර සලකුණු පිහිටුවීම සඳහා සුදුසු ප්‍රදේශ තෝරා ගැනීමේදී ඒවා පහසුවෙන් හඳුනාගත හැකිවීම, ස්ථායි බව හා බාධක වලින් තොර වීම යන කරුණු ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. **3.1 ඡේදයේ** පරිදි නිවැරදි වර්ගයේ පිරිවිතර සහිත ස්ථිර සලකුණු තෝරාගත් ස්ථාන වල වැළලිය යුතුය. ක්ෂෙත්‍ර වැඩ සඳහා මිනින්දෝරුවන් දෙදෙනෙකු යොදා ගැනේ. නිරීක්ෂණ ගැනීමට එක් අයෙකුත් සටහන් කර ගැනීමට තවත් අයෙකුත් ලෙස යෙදවීම කරයි.

2.22. EDM පරික්‍රමණ ක්ෂෙත්‍ර පොතෙහි එක් එක් පරික්‍රමණ ලක්ෂ්‍ය සඳහා පැහැදිලි සටහනක් ඇඳිය යුතුය. අවම වශයෙන් ස්ථිර ලක්ෂ්‍ය තුනකට පෙන්වීම සහ බෝක්කු හෝ හඳුනාගත හැකි ගස් වලට දුර ආදී ස්ථානය හඳුනාගැනීමට අවශ්‍ය විස්තර ද පෙන්වීම කළ යුතුය. **ඇමුණුම 04** හි සඳහන් පරිදි පිහිටුවීමේ සටහන් හා නිරීක්ෂණ EDM ක්ෂෙත්‍ර පොතෙහි සටහන් කළ යුතුය.

කෝණික හා දිග මැනීම

2.23. පරික්‍රමණ වල අපේක්ෂිත නිරවද්‍යතාව ලබාගැනීමට සුදුසු මැනුම් උපකරණ භාවිතය හා සුදුසු ක්ෂෙත්‍ර ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය. කෙසේ නමුත් පරික්‍රමණ වල ක්ෂෙත්‍ර වැඩ ආරම්භ කිරීමට පෙර සියළුම උපකරණ හා අතිරේක උපාංග ක්‍රමාංකනය කර සීරුමාරු කර තිබිය යුතුය.

2.24. උපකරණය සහ සංඥා (target) ස්ථානගත කිරීමට ප්‍රකාශ ලඹ හෝ ලේසර් කිරණ භාවිතා කළ යුතුය. මැනුම් සලකුණු වල සිට ±2 mm ඇතුලත උපකරණ සහ සංඥා කේන්ද්‍ර ගත කළ යුතුය. ප්‍රකාශ ලඹ සෑම ස්ථානයකදීම 360^0 කින් සිරස් හා තිරස්ව කරකවා පරීක්ෂා කළ යුතුය. කේන්ද්‍රය ස්ථිර සලකුණෙහි මධ්‍ය ලක්ෂ්‍ය සමඟ සෑම අවස්ථාවකදීම සමානගත විය යුතුය.

180^0 කින් මාරුකර ලබාගන්නා වාමාවර්ත හා දක්ෂිණාවර්ත පාඨාංක වල වෙනස 30" ට වැඩි වන විට, සමාන්තරණය (collimation) සඳහා උපකරණය සීරුමාරු කළ යුතුය. එසේම 360^0 කින් මාරු කර ලබා ගන්නා සිරස් වාමාවර්ත හා දක්ෂිණාවර්ත පාඨාංක වල වෙනස 30" ට වැඩි වන්නේ නම්ද උපකරණය සීරුමාරු කළ යුතුය. සීරුමාරු කිරීම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ අධික්ෂණය යටතේ සිදු කළ යුතුය.

2.25. එක් එක් ස්ථානයේදී කෝණ හා දුර සඳහා වන මිනුම් එකිනෙකට ස්වායත්ථව ගත යුතුය. 2.19 ඡේදයේ දක්වා ඇති එක් එක් ගණයේ පරික්‍රමණ සඳහා පිරිවිතර අනුව තිරස් හා සිරස් කෝණ සඳහා පාඨාංක කට්ටල (zero) අවශ්‍ය ප්‍රමාණ ලබාගත යුතුය.

නිරීක්ෂණ ගන්නා අවස්ථාවේදී උෂ්ණත්වය හා පීඩනය උපකරණයට ඇතුලත් කළ යුතු අතර ppm අගය සටහන් කරගත යුතුය. උපකරණය සහ සංඥා උස ආසන්න මී.මී.10 ට මැන සටහන් කර ගත යුතුය. දුර මැනීමට පෙර ප්‍රිස්ම නියතය උපකරණයට ඇතුලත් කළ යුතුය.

පරික්‍රමණ නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය

2.26. සෑම විටම පරික්‍රමණ නිරීක්ෂණ සඳහා ත්‍රිපාද තුනක පද්ධතියක් භාවිතා කළ යුතුය. ත්‍රිපාද පරික්‍රමණ ලක්ෂ්‍ය මත කේන්ද්‍රගත කළ යුතුය. සියළුම පාලන පරික්‍රමණ සඳහා අන්තර් කෝණ මැනීමේ ක්‍රමය භාවිතා කළ යුතුය. මෙම ක්‍රමයේදී පිටුපස රේඛාවේ සිට ඉදිරිපස රේඛාව දක්වා මුහුණත් දෙකෙන්ම කෝණ දක්ෂිණාවර්තව මනිනු ලැබේ.

මෙම ක්‍රමයේදී පිටු පස රේඛාවේ සිට ඉදිරිපස රේඛාව දක්වා කෝණය දක්ෂිණාවර්තව වම් මුහුණත භාවිතයෙන්ද, ඉදිරිපස සිට පිටුපස රේඛාව දක්වා කෝණය වාමාර්තව දකුණු මුහුණත භාවිතයෙන් ද මනිනු ලැබේ.



2.27. පළමු ස්වායත්ථ කෝණය (ශීර්ෂය) මැනීමට පහත සඳහන් පියවර 4 සම්පූර්ණ කළ යුතුය.

(අ) උපකරණය 0^0 සකසා වම් මුහුණත භාවිතා කර පිටු පස රේඛාව නිරීක්ෂණය කරන්න. තිරස් කෝණය, සිරස් කෝණය හා පිටුපස සංඥාවට ඇති බෑවුම් දුර වම් මුහුණත භාවිතා කර නිරීක්ෂණය කර සටහන් කර ගන්න.

(ආ) දුරේක්ෂය දක්ෂිණාවර්තව කරකවා ඉදිරි පස සංඥාව ඉක්මවා නොයනසේ යොමු කර නිරීක්ෂණය කරන්න. තිරස් කෝණය, සිරස් කෝණය හා ඉදිරිපස සංඥාවට ඇති බෑවුම් දුර නිරීක්ෂණය කර සටහන් කරන්න.

(ඇ) දුරේක්ෂය ඉදිරිපස සංඥාව යාන්තමින් පසුකර යන ලෙස කරකවා දුරේක්ෂයේ මුහුණත දකුණු මුහුණට මාරු කරන්න. ඉදිරිපස සංඥාව පසු කර නොයනසේ දුරේක්ෂය වාමාවර්තව කරකවා සංඥාවට යොමුකර නිරීක්ෂණය කර තිරස් කෝණය, සිරස් කෝණය හා ඉදිරිපස සංඥාවට ඇති බෑවුම් දුර සටහන් කරගන්න.

(ඈ) දැන් දුරේක්ෂය වාමාවර්තව කරකවා පිටුපස සංඥාව පසුකර නොයන සේ සංඥාව නිරීක්ෂණය කර තිරස් කෝණය, සිරස් කෝණය හා පිටුපස සංඥාවට අති බෑවුම් දුර සටහන් කර ගන්න.

2.28. මුහුණත, වම් මුහුණතට මාරු කර උඩ තට්ටුව බුරුල් කර දක්ෂිණාවර්තව ඊළඟ ශීර්ෂ (zero) අගයට [(n-1)*180^0 /N - ; N ශීර්ෂ ගණන, n – n වැනි ශීර්ෂය]ආසන්න වනතුරු කරකවන්න. උඩ තට්ටුව තදකර පහල තට්ටුව බුරුල් කර උපකරණය දක්ෂිණාවර්තව පිටුපස සංඥාව දක්වා කරවන්න. දෙවන ශීර්ෂය සම්පූර්ණ කිරීම සඳහා ඉහත (අ) - (ඈ) දක්වා පියවර සිදු කරන්න.

අවශ්‍ය ශීර්ෂ ගණන සම්පූර්ණ කිරීම සඳහා ඉහත පියවර නැවත සිදු කරන්න.

2.29. එක් එක් ශීර්ෂ නිරීක්ෂණය අවසානයේදී නිරීක්ෂකයා විසින් EDM පරික්‍රමණ සඳහා සම්මත අපගමනය සහ මධ්‍යන්‍ය අගය පරීක්ෂා කර එය පිරිවිතරවල සඳහන් පියවීමේ දෝෂය තුල තිබේදැයි බැලිය යුතුය. දෝෂය පියවීමේ දෝෂය ඉක්මවා යයි නම් නැවත නව නිරීක්ෂණ ගත යුතුය.

දත්ත ඌණනය, ආගණනය සහ අනුකූලනය කිරීම

2.30. එක් එක් ස්ථානය සඳහා ක්ෂෙත්‍ර පොතෙහි සටහන් කර ඇති නිරීක්ෂණ එක් එක් ශූන්‍ය අගය සඳහා ඌණනය කර තිරස් කෝණය, මධ්‍යන්‍ය සිරස් කෝණය සහ මධ්‍යන්‍ය දුර ගණනය කළ යුතුය. දෝෂ ඉවත් කිරීමෙන් පසු ගණනය කරන ලද දත්ත **ඇමුණුම 05** හි සඳහන් ආදර්ශයෙහි ආකාරයට සාරංශ පත්‍රයකට ගත යුතුය.
සාරංශයේ සඳහන් අභ්‍යන්තර කෝණ, සිරස් කෝණ හා දිගෙහි මධ්‍යන්‍ය අගයන් ගණනය කළ යුතු අතර, ආදර්ශයන්හි සීමාවන් ඉක්මවා යන්නේ නම් එය ඉවත් කළ යුතුය.

ප්‍රාථමික, ද්විතියික හා තෘතියික පරික්‍රමණ වලට පිළිවෙලින් 5”$\sqrt{N}$, 10”$\sqrt{N}$, 20”$\sqrt{N}$ සූත්‍ර භාවිතා කර දිගාංශයේ ඉඩදෙන දෝෂය ගණනය කළ යුතුය. මෙහි N යනු පරික්‍රමණයේ ස්ථාන සංඛ්‍යාවයි.

2.31. එක් එක් පරික්‍රමණ පාදයේ දිගාංශයේ මධ්‍යන්‍ය කෝණ, පියවීමේ පරික්‍රමණ පාදයේ දිගාංශයේ පියවීමේ දෝෂය භාවිතයෙන් ගණනය කළ යුතුය. පියවීමේ දෝෂය පරීක්ෂා කළ යුතු අතර, දෝෂය අවසර දිය හැකි සීමාවන් තුල වේ නම් සමානව බෙදා හැරිය යුතුය.

ක්‍රමාංකන දෝෂය සහ පරිමාණ දෝෂය යොදා මධ්‍යන්‍ය දුරවල් නිවැරදි කළ යුතුය.

2.32. පරික්‍රමණ සඳහා ඉඩදෙන උපරිම දෝෂය ගණනය කරනුයේ $C\sqrt{K}$ සූත්‍රය මඟින් වන අතර K යනු පරික්‍රමණයේ දිග කිලෝමීටර් වලිනි . එක් එක් පරික්‍රමණ වර්ගය සඳහා C හි අගය 2.19 ඡේදයේ සඳහන් කර ඇත.

පරික්‍රමණයේ දිග සඳහා ඉඩ දෙන දෝෂය අවසර දිය හැකි සීමාව තුල වේ නම් **බෝඩිච් නීතිය** හෝ වෙනත් සුදුසු ක්‍රමයක් මඟින් දෝෂය බෙදා හරිනු ලැබේ.

2.33. අවසානයේ දී අනුකූලනය කරන ලද දිගාංශ හා දුරවල් හෝ අභ්‍යන්තර කෝණ සහ දුරවල්, පරික්‍රමණය අනුකූලනය හා ආගණනය කිරීමට යොදා ගනු ලැබේ .

පරික්‍රමණය ආගණනය හා අනුකූලනය SDCAD මෘදුකාංගය මඟින් හෝ දෙපාර්තමේන්තුවේ භාවිතා වන වෙනත් මෘදුකාංගයක් මඟින් හෝ සිදු කළ හැක.

මෙම පරිච්ඡේදයේ ප්‍රාථමික, ද්විතියික හා තෘතියික පාලන පරික්‍රමණ විස්තර කර ඇති අතර, 11 වැනි පරිච්ඡේදයේ විස්තර පරික්‍රමණ විස්තර කර ඇත.

පරික්‍රමණ හා භූමිතික පාලන ස්ථාන අංක කිරීමේ ක්‍රමය

2.34. එක් එක් දිස්ත්‍රික්කය සඳහා එක් එක් වර්ගයේ පරික්‍රමණ අනුගාමී ලෙස අංකනය කරනු ලබයි. පළමු අංක දෙක පාලන පරික්‍රමණයේ පන්තිය දැක්වීමට යොදනු ලබන අතර, කෙටි ඉරකට පසු දෙවන අංක දෙක දිස්ත්‍රික්කය හැඳින්වීමටද, කෙටි ඉරකට පසු තුන්වන අංක හතර පරික්‍රමණය හැඳින්වීම සඳහාද වේ. (කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාථමික ගණයේ පූර්ණමාන පරික්‍රමණයක පහළොස් වන පරික්‍රමණය EI-42-0015 ලෙස අංකනය කරනු ලබයි.) එක් එක් පරික්‍රමණය සඳහා මෙම අංක දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගෙන් ලබා ගත යුතුය.

2.35. පරික්‍රමණයක ස්ථාන අංකය, පරික්‍රමණයක අංකය හා අනුගාමීව ස්ථානය හඳුනා ගැනීමට අංක දෙකකින් යුත් අංකයක් දෙනු ලැබේ. (මහනුවර දිස්ත්‍රික්කයේ ද්විතියික ගණයේ දහ අටවන පරික්‍රමණයක විසිහතර වන ස්ථානය E2-32-0018-24 ලෙස අංකනය කරනු ලබයි.) නම් කර ඇති දිස්ත්‍රික් කේත 21 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 04 හි සඳහන් කර ඇත.

පූර්ණමාන උපකරණ සීරුමාරු කිරීම

2.36. දුර මැනීමේ නිවැරදිතාවය සඳහා පූර්ණමාන උපකරණ කාලානුරූපව සීරුමාරු කිරීම අත්‍යවශ්‍ය නමුත්, සම්පූර්ණ සීරුමාරුව දිගුකාලයක් වැයවන වෙහෙසකාරී ක්‍රියාවලියකි. උපකරණය දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය හෝ ප්‍රධාන කාර්යාලයේ, විශේෂයෙන් පිහිටුවා ඇති සීරුමාරු **පාදක රේඛාව** වෙත ගෙන යා යුතුය.

මෙම අපහසුකාරී තත්වය මහහරවා ගැනීම සඳහා සෑම උපකරණයක්ම මසකට වරක් හෝ සෑම මැනුම් රේඛා 500 කට වරක් හෝ ඉන් පළමුව එළඹෙන අවස්ථාවේදී හෝ ක්‍රියාකාරිත්ව පරීක්ෂාව සිදු කළ යුතුය.



(I - උපකරණ ස්ථාන, R1,R2,R3,R4 - පරාවර්තක ස්ථාන)

මෙම කාර්යය සඳහා සෑම ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයකට ආසන්නවම පරීක්ෂා කිරීමේ ක්ෂේත්‍රයක් පිහිටුවිය යුතුය. සෑම පරීක්ෂා කිරීමේ ක්ෂේත්‍රයක් සඳහාම කාර්යාලයට ආසන්නව පිහිටි එක් උපකරණ ස්ථානයක් සහ ඊට ආසන්න වශයෙන් මීටර් 50, 100, 200 සහ 400 දුරින් පිහිටි පහසුවෙන් ලභා විය හැකි පරාවර්තක ස්ථාන හතරකින් සමන්විත විය යුතුය. මෙම ස්ථාන පාරක් වැනි සෘජු රේඛාවක හෝ ඉහත සඳහන් රූප සටහනෙහි පරිදි පිහිටුවිය හැකිය. මෙම කාර්යය සඳහා A4 වර්ගයේ ස්ථීර සලකුණු (Monument) භාවිතා කළ හැක. කි.මී. 1ක පමණ දුරින් අමතර පරාවර්තක ස්ථානයක් පිහිටුවා ගත හැකි නම් වඩාත් නිවැරදිව උපකරණයේ නිවැරදිතාවය පරීක්ෂා කළ හැකිවනු

ඇත. දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ හෝ ප්‍රධාන කාර්යාලයේ සීරුමාරු **පාදක රේඛාව** උපයෝගි කරගෙන සම්පූර්ණයෙන්ම සීරුමාරු කළ පූර්ණමාන උපකරණයක් භාවිතා කර පරාවර්තක දුර මැන ගත යුතුය. මෙමඟින් සම්මත අගයන් ලබාගත හැකි අතර ඉදිරියේදී භාවිතා කිරීම සඳහා ලොග් පොතක සටහන් කර තැබිය යුතුය.

උපකරණ ස්ථානයේ සිට අවරෝහනය හෝ ආරෝහනය 5^0 නොඉක්මවන පරිදි පරාවර්තක ස්ථාන තෝරා ගත යුතුය.

පූර්ණමාන උපකරණය භාවිතා කරන මිනින්දෝරුවරයා විසින් අදාළ රේඛා මැනිය යුතු අතර එම අගයන් ලොග් පොතෙහි ඇතුලත් කළ යුතුය. තිරස් දුර මැන වමත් මුහුණතෙහි හා දකුණත් මුහුණතෙහි පිහිටීම ක්ෂෙත්‍ර සටහන් පත්‍රයේ වාර්තා කළ යුතුය. උෂ්ණත්වය හා පීඩනය සටහන් කළ යුතු අතර සෑම රේඛාවක්ම මැනීමේදී එම අගයන් උපකරණයට ඇතුලත් කළ යුතුය. සම්පූර්ණයෙන් සීරුමාරු කරන ලද උපකරණයෙහි සීරුමාරු පරාමිතීන් සඳහා තිරස් දුරෙහි මධ්‍යඅන්‍ය අගය නිවැරදි කළ යුතුය. අවසානයේදී සීරුමාරු කළ තිරස් දුරවල් ලොග් පොතෙහි සටහන් කළ යුතුය.

ක්ෂෙත්‍ර සටහන් පත්‍ර සහ එක් ක්ෂෙත්‍ර රේඛා කට්ටලයක් සඳහා ක්ෂෙත්‍ර පත්‍ර සටහන් අඩංගු ලොග් පොත මිනින්දෝරු අධිකාරි විසින් නඩත්තු කළ යුතුය. සම්මත දුරවල් අතර ඇතිවන වෙනස්වීම් මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කළ යුතු අතර, උපකරණය පිළිබඳ ඔහුගේ අදහස් ලොග් පොතෙහි සටහන් කළ යුතුය. මනින ලද සියළුම දුරවල් හා සම්මත දුරවල් අතර වෙනස මීටර් ± 0.020 හෝ ඊට වැඩි වන විට නැවත ඉතා පරීක්ෂාකාරීව පරීක්ෂණය සිදු කළ යුතුය. දෙවන පරීක්ෂණයේදී ද පළමු ප්‍රතිඵලයම ලැබේ නම් සම්පූර්ණ සීරුමාරුවක් සිදු කිරීම අත්‍යවශ්‍ය වන අතර එසේ නොමැති නම් උපකරණය නිවැරදිව ක්‍රියා නොකරන බවට සැලකිය යුතුය.

දිස්ත්‍රික්/පළාත් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි සහ පළාත් සර්වේයර් ජනරාල්වරුන්ගේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල පරීක්ෂණ වලදී මෙම ලොග් පොත සියුම් ලෙස පරීක්ෂා කළ යුතුවේ.

සිරස් පාලන ජාලය

2.37. මුලින්ම සැතපුම් 1000 දිග තනි මට්ටම් රේඛාවක් 1865 දී ආරම්භ කර වසර 44 කදී නිම කර ඇත. පැරණි මට්ටම් රේඛා ජාලයක් නොතිබූ අතර, අවශ්‍ය වූ විට මට්ටම් ගැනීම සිදු කරන ලදී. 1904 සිට 1909 දක්වා කාලය තුල මට්ටම් ගැනීම දියුණු කරන ලද අතර, ස්ථිර පිල් ලකුණු සෑදීම සඳහා අවධානය යොමු කරන ලදී. 1909 දී මෙම ක්‍රියාවලිය සඳහා ක්‍රමවත් පරිදි වැඩිපුර කාර්ය මණ්ඩලයක් යොදවන ලදී. මෙහි ආරම්භයක් ලෙස ඉන්දියානු ත්‍රිකෝණමිතික මැනුම් ආයතනය 1884 සිට 1895 කාලය තුල කොළඹ , ගාල්ල සහ ත්‍රිකුණාමලයෙහි මධ්‍යන්‍ය මුහුදු මට්ටම තීරණය කර නව ජාලය පිහිටුවන ලදී.

1909-1914 කාලය තුල ද්විතියික පිල් ලකුණු පිහිටුවන ලද අතර, සැතපුම් 650ක් ද්විත්ව මට්ටම් ගැනීම සම්පූර්ණ කරන ලදී. 1914 දී පළමු ලෝක යුද්ධය නිසා වැඩ නවත්වනු ලැබූ අතර, නැවත 1923දී ආරම්භ කර 1924 දී සැතපුම් 200ක් නිම කරන ලදී.

1925 දී මට්ටම් ගැනීමේ මුළු ක්‍රියාවලිය විග්‍රහ කර බලා නවීන උපකරණ හා යථාතථ්‍ය ක්‍රම භාවිතා කර නැවත සිදුකිරීමට තීරණය කරන ලදී. මට්ටම් ගැනීම යථාතථ්‍ය මට්ටම් උපකරණ හා ඉන්වාර් මට්ටම් රිටි භාවිතා කර උසස් නිරවද්‍යතාවයක් ලබාගැනීමට විශේෂ අවධානයකින් සිදු කරන ලදී. භූමිතික මට්ටම් ජාලය මූලික පිල් ලකුණු 59ක්, ද්විතියික පිල් ලකුණු 5ක් සහ කි.මී. 4000 ක් දිග ද්විතියික සංවෘත මට්ටම් රේඛා 27කින් යුක්ත විය. මූලික මට්ටම් ජාලය මඟින් මුළු රටම ආවරණය වන අතර ලෝකයේ අනෙක් රටවල් හා සසඳන විට උසස් නිරවද්‍යතාවයකින් යුක්ත වේ.

එතැන් සිට ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා උස පාලනය කිරීමට ද්විතියික , තෘතියික හා සුළු මට්ටම් රේඛා දක්වා මට්ටම් ජාලය පුළුල් කරන ලදී. මෙම ක්‍රියාවලියේදී 1924 දී මූලික පිල් ලකුණු 6 ක්ද, 1925 දී මූලික පිල් ලකුණු 31ක්ද, 1926 දී මූලික පිල් ලකුණු 22 ක්ද පිහිටුවා 1928 දී ප්‍රධාන ජාලය නිම කරන ලදී.

1925-1930 කාලය තුලදී භූමිතික මට්ටම් අනුකූලනය කිරීම නිම කර ප්‍රතිඵල 1932 දී සර්වේයර් ජනරාල් විසින් "ලංකාවේ භූමිතික මට්ටම් ගැනීම- වෙළුම 1, II හා III " මඟින් ප්‍රසිද්ධියට පත් කරන ලදී.

2.38. ආරම්භක මට්ටම (පාදම -Datum)

මධ්‍යන්‍ය මුහුදු මට්ටම ශ්‍රී ලංකාවේ යථාමානි මට්ටම් ගැනීමේ ආරම්භක මට්ටම (පාදම) ලෙස තීරණය කරන ලදී. සියළුම භූමිතික මට්ටම් ගැනීම් මෙම පාදම මත රඳා පවතී.

2.39. මූලික පිල් ලකුණු (FBM)

එක්සත් රාජධානියේ ජාතික සිතියම් නියෝජිත ආයතනයෙහි පිල් ලකුණු වලට සමාන ආකාරයේ පොළව යට කුහරයක් තුල පිත්තල බෝල්ට් ඇණයක්ද (Lower Bolt), මතු පිට මට්ටමේ කුළුණ මත පිත්තල බෝල්ට් ඇණයක් සහිත (Upper Bolt) විශාල ප්‍රමාණයේ ගල් කුට්ටි වලින් මූලික පිල් ලකුණු 59ක් පිහිටුවා ඇත. නිරීක්ෂන ගැනීමේදී පොළව යට කුහරය තුල වන ලක්ෂ්‍යය පදනම් කරගෙන මට්ටම් ගැනීම සිදු කළ යුතුය.

2.40. සම්මත පිල් ලකුණු (SBM)

පොළව මතුපිට මීටර 1ක් ඉහලින් තනන ලද විශාල කොන්ක්‍රීට් කැටයක් මත සවිකරන ලද පිත්තල බෝල්ට් ඇණයක් සහිත සම්මත පිල් ලකුණු 5ක් සාදන ලදී. මූලික පිල් ලකුණු සඳහා ගල් පාදම සොයාගත නොහැකි ස්ථාන වල සම්මත පිල් ලකුණු පිහිටුවන ලදී. මේවා සම්මත පිල් ලකුණු ලෙස නම් කළ ද ඒවායේ නිරවද්‍යතාවය මූලික පිල් ලකුණු වලට සමාන වේ.

2.41. ප්‍රධාන මට්ටම් ජාලය

ප්‍රධාන මට්ටම් ජාලය මූලික පිල් ලකුණු සහ ඒවා අතර වූ ප්‍රධාන මට්ටම් රේඛා සමුහයකින් යුක්ත වන අතර මෙම මට්ටම් ජාලය දැනටමත් ස්ථාපනය කර ඇත. භූමිතික මට්ටම ගැනීම වාර්තාවේ වෙළුම I හි මෙම ජාලය පිහිටුවීම පිළිබඳව විස්තර කර ඇත. මූලික පිල් ලකුණු වල විස්තර සහ අගයන් එම වාර්තාවේ වෙළුම II හි සඳහන් කර ඇත. පහත දැක්වෙන රූප සටහනෙන් මූලික පිල් ලකුණු (FBM), සම්මත පිල් ලකුණු (SBM) සහ ප්‍රධාන මට්ටම් රේඛා හා ඒවායේ අංක පෙන්වා දී ඇත. මට්ටම් ගැනීම සඳහා භාවිතා කළ පිල් ලකුණු ඇමුණුම 06 හි සහ වර්ථමානයේ භාවිතා වන පිල් ලකුණු වර්ග පරිච්ඡේද අංක 2.7 හි දක්වා ඇත.

FUNDAMENTAL BENCH MARK






THE CEYLON LEVEL NET
REFERENCE
FEET
100 to 500
500 to 1000
1000 to 3000
3000 to 5000
Above 5000
Fundamental Bench Marks
Standard ..... ,, ... ,,
Primary Lines
The figures appearing below circuit letters are orthometric clockwise misclosures in feet and perimeters in miles.
PULOLI
Z -·0070 77
KAITHADI
SORANPATTU
PARANTHAN
MULLAITTIVU
MULANKAVIL
MANKULAM
Y +·2041 161
TALLADI
ARIPPU FERRY
PARAIYANALANKULAM
VAVUNIYA
MARICHCHUKKADDI
X +·3425 213
W +·1044 94
HOROWUPOTANA
TRINCOMALEE
TIDE GAUGE
KINNIYAI FERRY
UPPARU FERRY
MAHAWELI GANGA FERRY
MUTUR FERRY
ANURADHAPURA
I -·2874 168
KILIVEDDI FERRY
VAPPIYA
VERUGAL FERRY
KARUWALAKUDA
KALA-OYA
ALUT-OYA
J -·0191 178
PANICHCHANKENI FERRY
G -·0348 125
H -·0434 153
HABARANA
KALLADI
GALGOMUWA
NASUVANTIVU
TOPA WEWA
DAMBULLA
KODUWAMADU
BATTICALOA
KALLADI FERRY
NIKAWERATIYA
BANDARAHENA
F -·1165 138
K -·0362 268
T +·0817 107
MAHA-OYA
UDABADDAWA
KURUNEGALA
S -·0073 86
E +·0653 111
KANDY
MADUGODA
PALAMUNAI
ALAWWA FERRY
ALUTNUWARA FERRY
DUNAGAHA
KEGALLA
AMBEPUSSA
ANDA-ULPOTA
L -·0799 211
BIBILE
D +·0074 80
R -·0120 111
GAMPOLA
U -·1386 166
V +·0259 78
C -·1161 106
Q +·0506 99
KARAWANELLA
BADULLA
COLOMBO
TIDE GAUGE
AVISAWELLA
GINIGATHENA
NUWARA-ELIYA
M +·0276 138
POTTUVIL
MUPPANE
B -·0033 120
P +·1316 221
BERRAGALA
DIYATALAWA
HORANA
WELLAWAYA
PANADURE
IMBULPE
RATNAPURA
KALAWELLAWA FERRY
PELMADULLA
A -·0743 74
MADAMPE
N +·0828 180
BENTOTA
A +·0578 249
HAYES
EMBILIPITIYA
WIRAWILA
MORAWAKA
O +·1666 179
PAYIBOKKA
GALLE
DONDRA

මට්ටම් ගැනීම

2.42. ද්විතියික හා තෘතියික මට්ටම් ගැනීම

ප්‍රධාන ජාලය කොටස් වලට කැඩීම සහ සිරස් පාලනය පුළුල් කිරීම සඳහා ද්විතියික මට්ටම් ගැනීම සිදු කෙරේ. ජාලය තවදුරටත් පුළුල් කිරීම සඳහා තෘතියික හා සුළු මට්ටම් ගැනීම සිදු කෙරේ. අවශ්‍ය ලක්ෂ්‍ය වල ස්ථාන උස නිර්ණය කිරීම සඳහා විස්තර මට්ටම් ගැනීම සිදු කෙරේ.

2.43. මට්ටම් රේඛා අංක කිරීම

ප්‍රධාන රේඛාව සඳහා "ප්‍ර.රේ. (PL)" ලෙසද , ද්විතියික රේඛාව සඳහා "ද්වි.රේ. (SL)" ලෙසද, තෘතියික රේඛාව සඳහා "තෘ.රේ. (TL)" ලෙසද, සුළු රේඛාව සඳහා "සු.රේ. (ML)" ලෙසද එක් එක් රේඛාව ඉදිරියෙන් අක්ෂරයක් මුලට යෙදීමෙන් රේඛාව වර්ග කර පෙන්විය යුතුය. භූමිතික මට්ටම් ගැනීම සඳහා භූමිතික අංශය මඟින් මට්ටම් රේඛා අංක ("ප්‍ර.රේ. (PL)", "ද්වි.රේ. (SL)", "තෘ.රේ. (TL)" , "සු.රේ. (ML)") නිකුත් කරයි. සුළු හා විස්තර මට්ටම් රේඛා අදාළ දිස්ත්‍රික්ක අනුව අංක කෙරේ. මෙම අංක මට්ටම් පොත්, රේඛා චිත්‍ර හා අදාළ ලේඛනවල සඳහන් කළ යුතුය.

2.44. පිල් ලකුණු අංක කිරීම

පිල් ලකුණු අංකය ඉලක්කම් 3 කින් යුත් මට්ටම් රේඛාවේ සහ ස්ථානය හඳුනා ගැනීමේ ඉලක්කම් 3 ක අංකයකින් ද යුක්ත වේ. (උදා: 18 වැනි තෘතියික මට්ටම් රේඛාවේ 134 වැනි පිල් ලකුණු TL-018-134 ලෙස අංක කෙරේ.)

සුළු හා විස්තර මට්ටම් රේඛා වල පිල් ලකුණු දිස්ත්‍රික්ක අනුව අංක කෙරේ. ඒවා දිස්ත්‍රික් අංකය, ඉලක්කම් තුනකින් යුත් මට්ටම් රේඛා අංකය හා අනුයාත ඉලක්කම් තුනකින් යුත් ස්ථාන අංකය ලෙස අංක කෙරේ.

උදා: මාතර දිස්ත්‍රික්කයේ 15 වැනි සුළු මට්ටම් රේඛාවේ 120 වැනි පිල් ලකුණු ML-82-015-120 ලෙස අංක කෙරේ.

මාතර දිස්ත්‍රික්කයේ 15 වැනි විස්තර මට්ටම් රේඛාවේ 120 වැනි පිල් ලකුණු DL-82-015-120 ලෙස අංක කෙරේ.

2.45. භූමිතික මට්ටම් ගැනීම සඳහා පිරිවිතර

	භූමිතික මට්ටම් රේඛා වර්ගය	**ප්‍රධාන රේඛාව"ප්‍ර.රේ ." -PL**	**ද්විතියික රේඛාව සඳහා "ද්වි.රේ." - SL**	**තෘතියික රේඛාව සඳහා "තෘ.රේ. "-TL**	**සුළු රේඛාව සඳහා "සු.රේ. " -ML**	**විස්තර මට්ටම් රේඛා**
1	උපකරණය	කි.මී. 1 ක ද්විත්ව රේඛා සඳහා මි. මී. 0.2 හෝ වැඩි නිරවද්‍යතාවක් ඇති අංකිත ලෙවලය	කි.මී. 1 ක ද්විත්ව රේඛා සඳහා මි. මී. 0.2 හෝ වැඩි නිරවද්‍යතාවක් ඇති අංකිත ලෙවලය	කි.මී. 1 ක ද්විත්ව රේඛා සඳහා මි. මී. 1.0 හෝ වැඩි නිරවද්‍යතාවක් ඇති අංකිත ලෙවලය	කි.මී. 1 ක ද්විත්ව රේඛා සඳහා මි. මී. 1.5 හෝ වැඩි නිරවද්‍යතාවක් ඇති අංකිත ලෙවලය	කි.මී. 1 ක ද්විත්ව රේඛා සඳහා මි. මී. 1.5 හෝ වැඩි නිරවද්‍යතාවක් ඇති අංකිත ලෙවලය
2	පිල් ලකුණු වර්ගය	A4, B1, B2	A4, B1, B2	A6	A6	E
3	ආරම්භක ලක්ෂ්‍යය	LB of FBM / SBM	LB of FBM / SBM / PL	SL හෝ ඉහල	TL හෝ ඉහල	
	අවසාන ලක්ෂ්‍යය	LB of FBM / SBM	LB of FBM / SBM /PL/ SL	TL හෝ ඉහල	ML හෝ ඉහල	

	භූමිතික මට්ටම් රේඛා වර්ගය	ප්‍රධාන රේඛාව"ප්‍ර.රේ." -PL	ද්විතියික රේඛාව සඳහා "ද්වි.රේ." -SL	තෘතියික රේඛාව සඳහා "තෘ.රේ. "-TL	සුළු රේඛාව සඳහා "සු.රේ. " -ML	විස්තර මට්ටම් රේඛා
3	ක්‍රමය	යථාතථ්‍ය	යථාතථ්‍ය	යථාතථ්‍ය සාමාන්‍ය	සාමාන්‍ය	සාමාන්‍ය
4	නිරීක්ෂණ ක්‍රමය (B-පසු දැක්ම, F – ඉදිරි දැක්ම)	BFFB	BFFB	BF	BF	BF
5	ඉදිරි දැක්ම පාඨාංක 2ක් හා පසු දැක්ම පාඨාංක 2ක් අතර ඉඩදෙන දුර වෙනස	මි. මී. 0.05	මි. මී.0.05	-	-	-
6	ඉදිරි දැක්ම හා පසු දැක්ම අතර ඉඩදෙන දුර වෙනස	මී. 0.5	මී. 0.5	මී. 1	මී. 2	මී.2
7	මට්ටම් රේඛාවේ උපරිම දිග	-	-	කි.මී. 20	කි.මී. 12	කි.මී.5
8	මට්ටම් යටිය හා උපකරණය අතර අවම දුර	මී. 7	මී. 7	-	-	-
9	මට්ටම් යටිය හා උපකරණය අතර උපරිම දුර	මී. 50	මී. 50	මී. 60	මී. 60	මී.60
10	ඉඩදෙන දෝෂය(මී)	0.00276√K ; K: යනු රේඛාවේ දිග කි.මී. වලින්	0.004√K ; K: යනු රේඛාවේ දිග කි.මී. වලින්	0.006√K K: යනු රේඛාවේ දිග කි.මී. වලින්	0.010√K K: යනු රේඛාවේ දිග කි.මී. වලින්	0.024√K K: යනු රේඛාවේ දිග කි.මී. වලින්

2.46. ප්‍රාථමික, ද්විතියික, තෘතියික මට්ටම් රේඛා පිහිටුවීම

නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූමිතික මැනුම්) විසින් සියළුම ප්‍රාථමික, ද්විතියික, තෘතියික මට්ටම් ගැනීම මෙහෙයවනු ලැබේ. භූමිතික අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් ක්ෂේත්‍ර කටයුතු කරනු ලැබේ. කෙසේ නමුත් අදාළ දිස්ත්‍රික්කය මඟින් මට්ටම් රේඛාව සඳහා පිල් ලකුණු පිහිටුවීම සිදු කරයි. සියළුම මට්ටම් රේඛා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුව පිහිටුවිය යුතුය.

අ) සෑම මීටර් 500 ක දුරකින්ම පිල් ලකුණක් පිහිටුවිය යුතු අතර, එහි පාදමට සහ මුදුනෙහි දෙපසට පහත රූපයේ පරිදි කොන්ක්‍රීට් යෙදිය යුතු වේ.



මුදුනෙහි දෙපසට සහ පාදමට කොන්ක්‍රීට් යෙදූ A4 වර්ගයේ පිල් ලකුණ

ආ) පිල් ලකුණු මත මට්ටම් යටිය සිරස්ව සිටුවීමට බාධා නොතිබිය යුතු අතර ඕනෑම මැනුම් උපකරණයක් හෝ ද්විත්ව පාද ආධාරක (bipod) ස්ථාන ගතකර පහසුවෙන් වැඩ කිරීමට හැකිවන ස්ථානයක් විය යුතුය.

ඇ) පිල් ලකුණ මත මට්ටම් රේඛාව නිදහස්ව හැසිරවිය හැකි වන පරිදි පිත්තල බෝල්ට් ඇණය (bolt) මි.මී 5 ක් පමණ උස විය යුතුය.

සාර්ථක පිල් ලකුණු පිහිටුවීමේ ක්‍රියාවලියක අවසානයේදී, පහත සඳහන් ලේඛන පිළියෙල කර නි.ස.ජ. (භූමිතික) වෙත ඉදිරි කටයුතු සඳහා යැවිය යුතුය.

අ) ඇමුණුම 10 හි පෙන්වා ඇති පරිදි එක් එක් පිල් ලකුණු සඳහා සම්පූර්ණ රේඛා චිත්‍රයක් ක්ෂෙත්‍ර පොතෙහි ඇඳිය යුතුය. මෙම සටහනෙහි අඩු වශයෙන් ස්ථිර ලක්ෂ්‍ය 3 කට ගත් මිනුම් තිබිය යුතුය. අත් මිහිතැන් ගැන්වුම් (HHGPS) උපකරණ මඟින් ආසන්න බණ්ඩාංක ලබා ගෙන ක්ෂෙත්‍ර සටහනෙහි දැක්විය යුතුය.

ආ) අළුත් පාලන ලක්ෂ්‍ය සඳහා 1:50,000 පිහිටුම් සටහනක්/Kml file එකක් පිළියෙල කළ යුතුය.

ඇ) එක් එක් පිල් ලකුණු සඳහා අදාළ ක්ෂෙත්‍ර පොත් පිටු පරිලෝකනය කර අනුපිළිවෙළට නම් කළ යුතුය.

මෙම සම්පූර්ණ කරන ලද ලේඛන ලැබීමෙන් අනතුරුව හා පිල් ලකුණු ස්ථායි වීමට ප්‍රමාණවත් කාලයක් ගත වූ පසු මට්ටම් ගැනීම ආරම්භ කළ හැක.
පැරණි ස්ථිර පිල් ලකුණකින් (මූලික පිල් ලකුණක් නොවන) අළුත් මට්ටම් රේඛාවක් ආරම්භ කරනු ලැබුවහොත් හෝ එවැනි ලකුණකින් මට්ටම් රේඛාවක් අවසන් කරනු ලැබුවහොත්, එකී පැරණි පිල් ලකුණ ආසන්නයේ ඇති වටිනාකම දන්නා පිල් ලකුණක් හරහා පරීක්ෂණ මට්ටම් ගැනීමක් මඟින් පරීක්ෂා කර බැලිය යුතුය.

ක්ෂෙත්‍ර ක්‍රියාවලිය ආරම්භ වීමත් සමඟ ඇමුණුම 07 හි දක්වා ඇති ආදර්ශ පත්‍රයෙහි ආකාරයට භූමිතික මට්ටම් ගැනීමේ එක් එක් කොටසෙහි දත්ත බාගත කිරීමෙන් අනතුරුව මුද්‍රණය කර මට්ටම් පොතෙහි ඇලවිය යුතුය. කෙසේ නමුත් මෙම ආදර්ශය උපකරණයෙන් උපකරණයට වෙනස් විය හැක.

එක් එක් කොටසෙහි ඉදිරි හා පිටුපස පාඨාංක වෙනස ඇමුණුම 08 හි පෙන්වා ඇති උධෘතයෙහි ඇතුලත් කරනු ලැබේ. උධෘත වල සඳහන් ප්‍රතිඵල ඉඩදෙන දෝෂය සඳහා පරීක්ෂා කර බලා පියවී නොමැති කොටස් නැවත මට්ටම් ගැනීමට තීරණය කරනු ලැබේ. ඉඩදෙන දෝෂය තුල පිහිටි සියළුම මට්ටම් රේඛා ඇමුණුම 09 හි සඳහන් ආදර්ශය අනුව අනුකූලනය කරනු ලැබේ.

නි.ස.ජ. (භූමිතික) විසින් ස්ථිර ලක්ෂ්‍ය වලට මිනුම් , ආසන්න ඛණ්ඩාංක සහ උස ඇතුලත් පිහිටීම දැක්වෙන පැහැදිලි සටහනක් ඇමුණුම 10 හි පරිදි මට්ටම් රේඛාවේ සෑම පිල් ලකුණක් සඳහාම පිළියෙල කර ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2.47. පැරණි ක්‍රමය සඳහා පිරිවිතර

වර්තමානයේ අංකිත මට්ටම් උපකරණ හා තීරු සංකේත (bar corded) ක්‍රමාංකිත මට්ටම් රිටි භූමිතික මට්ටම් ගැනීම සඳහා යොදා ගනී. එබැවින් පුරාණයේ භාවිතා කළ ක්‍රම වැඩි ප්‍රමාණයක් අතහැර දමා ඇත (භාවිතා නොවේ). එසේ නමුත්, අවශ්‍ය කරනු ලබන සම්මතයන් ලභා කර ගැනීම සඳහා වූ නිරවද්‍යතාව සහ උපකරණ වර්ග අනුව ඒවා සඳහා විවිධ සැකසුම් යෙදිය යුතුය.
පැරණි ක්‍රමය අනුව ප්‍රාථමික හා ද්විතියික මට්ටම් ගැනීම සඳහා පහත දැක්වෙන ගැලපීම් පිළිබඳ කොන්දේසි භාවිතා කෙරේ. තාක්ෂණික උපදෙස්හි V වන පරිච්ඡේදයේ යථාතථ්‍ය මට්ටම් ගැනීම සඳහා වූ සාමාන්‍ය ක්‍රමය සම්පූර්ණයෙන් විස්තර කර ඇත.

	ගැලපීම් පිළිබඳ කොන්දේසි	වැඩි නොවිය යුතුය.	
		ප්‍රාථමික	ද්විතියික
(අ)	ස්ථාත්‍රක කේස කියවීම් අතර වෙනස ...	0.006096m	0.012192m
(ආ)	එක මට්ටම් යටියක් මත, මට්ටම් කේස කියවීමේ වෙනස (ඉදිරි සහ පසු)	0.000457m	0.000610m
(ඇ)	ස්ථාත්‍රක කේස කියවීම් වල එකඅයත්, මට්ටම් කේස කියවීම් වල එකඅයත් අතර වෙනස ...	0.001067m	0.001524m
(ඈ)	ස්ථාත්‍රක දුර	38.1m	41.1m
(ඉ)	එක් එක් රේඛාව සඳහා එක් එක් කොටසක පසු සහ ඉදිරි මට්ටම් ගැනීමේ වෙනස	$0.00276\sqrt{K}$	$0.00386\sqrt{K}$

අනිකුත් මට්ටම් ගැනීම් වර්ග සඳහා පහත සඳහන් වන නිරවද්‍යතා නොවෙනස්ව පවත්වා ගත යුතුය. රේඛා පියවීමේ දෝෂ සීමාවන් පහත පරිදි වේ.

තෘතියික ... ... $0.006\sqrt{K}$
සුළු ... ... $0.010\sqrt{K}$
විස්තර ... ... $0.024\sqrt{K}$
ස්ථාන උස නිරීක්ෂණය සඳහා කරන
විස්තර මට්ටම් ගැනීම ... කි.මී. 1 කින් නැතහොත් කි.මී. 1 කින් කොටසක් සඳහා 0.02m (2cm) යි.

මෙහි, K යනු මට්ටම් රේඛාවේ පර්යන්ත අතර දුර කි.මී. වලිනි.

2.48. මූලික පිල් ලකුණු පරීක්ෂා කිරීම

දිස්ත්‍රික්/ පළාත් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ඔවුන්ගේ දිස්ත්‍රික්කය තුල ඇති සියළුම මූලික පිල් ලකුණු, අවස්ථාව ලැබෙන පරිදි පරීක්ෂා කර බැලීම නැතහොත් කාර්යක්ෂම නිලධාරියෙක් ලවා ඒවා පරීක්ෂා කරවීමට කටයුතු පිළියෙල කළ යුතු අතර ඉදිරි කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (භූමිතික) විසින් සපයා ඇති පෝරමය මඟින් අදාළ පළාත් සර්වේයර් ජනරාල්ට පිටපත් සහිතව වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. යම් මූලික පිල් ලකුණක් සම්බන්ධයෙන් විශේෂ ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතු බව පළාත් සර්වේයර් ජනරාල් සලකන්නේ නම් ඒ ගැන ඔහු විසින් අවශ්‍ය ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතුය. තම දිස්ත්‍රික්කය තුල පවතින කිනම් හෝ මූලික, ද්විතියික හෝ තෘතියික පිල් ලකුණක් සම්බන්ධයෙන් යම් අලාභයක් සිදුව ඇති බව හෝ අස්ථාන ගතවී ඇති බව සොයා ගත් විගස, ඒ බව නි.ස.ජ. (භූමිතික) වෙත අදාළ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් දැනුම් දිය යුතුය. වාර්ෂික සමීක්ෂණ වාර්තාව සඳහා ඇමුණුම 11 බලන්න.

ශ්‍රී ලංකා අඛණ්ඩ මෙහෙයුම් යොමු පද්ධති ජාලය (SLCORS net) භාවිතයෙන් මැනුම් පාලන ලක්ෂ්‍ය පිහිටුවීම

2.49. ශ්‍රී ලංකා අඛණ්ඩ මෙහෙයුම් යොමු පද්ධති ජාලය{(Sri Lanka Continuously Operating Reference Station Network) SLCORSnet} මඟින් මැනුම් කිරීම

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් පාලනය කරනු ලබන අඛණ්ඩ මෙහෙයුම් යොමු ලක්ෂ්‍ය ජාලය, "SLCORSnet" ලෙස හඳුන්වනු ලැබේ. SLCORSnet මඟින් දුරස්ථව ස්ථානගත කර ඇති භෞතික මිහිතැන් ගැන්වුම් චන්ද්‍රිකා (සූසැටි) පද්ධතියේ (GNSS) පාලන ලක්ෂ්‍ය වලින් රැස් කරන GNSS අමු (සකස් නොකරන ලද) දත්ත, සර්වේයර් ජනරාල් කාර්යාලයේ පිහිටි පාලන මධ්‍යස්ථානයට සජීවීව සම්ප්‍රේෂණය කරනු ලැබේ. සකස් නොකරන ලද දත්ත සැකසීම පාලන මධ්‍යස්ථානයෙහි ඇති GNSS ජාල සැකසුම් මෘදුකාංගයක් අනුසාරයෙන් සිදු කරනු ලබන අතර ඒවායේ භූලක්ෂණාත්මක පිහිටීමට අදාළ දෝෂය ගණනය කර RTCM ආකෘතියෙන් අන්තර් ජාලය හරහා ක්ෂේත්‍රයේ භාවිතා කරනු ලබන අය වෙත සම්ප්‍රේෂණය කරනු ලැබේ. SLCORSnet මඟින් සපයනු ලබන තත්කාලීන අන්තර්ජාල සේවාවන් ලෙස RINEX අමු දත්ත අන්තර්ජාලය මඟින් සජීවීව ලබා දීම සහ අන්තර්ජාලය මඟින් පසු සැකසුම් සේවාව ලබා දීම ලෙස දැක්විය හැකිය.

මිහිතැන් ගැන්වුම් චන්ද්‍රිකා (සූසැටි) පද්ධති (GNSS) තාක්ෂණය භාවිතයෙන් ඉතා නිවැරදි ස්ථානීය පිහිටීම ලබා දීම සිදු කරනු ලැබේ. සේවාදායකයින්ට පිවිසීමට සහ ස්ථානීය පිහිටීමේ නිවැරදිතාව වැඩිකර ගැනීම සඳහා RTK නිවැරදි කිරීම් දෝෂ ලබා ගැනීමට හැකි වන පරිදි පාලන ලක්ෂ්‍ය කිහිපයක් සම්බන්ධ කිරීම මඟින් අතථ්‍ය පාලන ජාලයක් (Virtual reference network) ලෙස ක්‍රියා කිරීමට ජාලයක් සකසා ඇත.



අදියර 1: ස්ථාන 6 අදියර 2 : ස්ථාන 42



යෝජිත SLCORSnet

ස්ථාපිත SLCORSnet සහ යෝජිත SLCORSnet

2.50. SLCORSnet අදියර දෙකකින් යුක්ත වන අතර පළමු අදියර යටතේ කොළඹ, අවිස්සාවේල්ල, කටාන, රත්නපුර, කෑගල්ල සහ කළුතර යන ප්‍රදේශයන් ආවරණය වන පරිදි CORS ස්ථාන හයක් ස්ථාපනය කර ඇත.

SLCORSnet භාවිතයෙන් වැඩ කිරීමට, දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ සෘජුවම www.slcorsnet.survey.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් පරිශීලක පිවිසුම නිර්මාණය කරන්න. SLCORSnet යටතේ ලියාපදිංචි වීමෙන් පසු, දෙන ලද පරිශීලක දත්ත භාවිතා කිරීමෙන් සියළු සේවා ලබා ගත හැක.

වින්‍යාස කිරීමේදී පහත දැක්වෙන පරිදි අවශ්‍ය විස්තර ලබා දීමෙන් ව්‍යාපෘතියේ වැඩ මාදිලිය සකසා ගත හැක.

වසම/IP ලිපිනය (Domain/IP) : 222.165.190.67

කවුළුව (Port) : 2101

මූලාශ්‍රය (Source) : VRS or VRS_BDS

පරිශීලක නම : geoTest

මුරපදය : XXXXXXX

SLCORSnet හි පරිශීලක නාමය සහ මුර පදය ලබා ගන්න
උදා : පරිශීලක නාමය : geoTest

ජාල තත්කාලීන චාලක මැනුම් (Network RTK – Network Real Time Kinematic)

2.51. SLCORSnet මඟින් සිදු කරන ජාල තත්කාලීන චාලක මැනුම් (Network RTK – Network Real Time Kinematic)

සෙන්ටිමීටර මට්ටමට ලභාවීම සඳහා හෝ වඩා හොඳ ස්ථානගත කිරීමේ නිරවද්‍යතාවට ප්‍රවේශ වීම සඳහා, සාමාන්‍යයෙන් ද්වි-සංඛ්‍යාත වාහක අවධි (Precise dual frequency carrier phase) නිරීක්ෂණයන් භාවිතා කිරීම අවශ්‍යවේ. එපමණක් නොව මෙම දත්ත, සාමාන්‍යයෙන් තත්කාලීන චාලක (Real Time Kinematic) හෝ පශ්චාත් සැකසුම් (Post Processing) වැනි විවිධාකාර සාපේක්ෂ මිහිතැන් ගැන්වුම් වන්දිකා (සුසැටි) (DGNSS) ඇල්ගොරිතම භාවිතයෙන් සකසනු ලැබේ. අතථ්‍ය පාලන ස්ථාන සංකල්පය (Virtual reference Station) මඟින් මෙම අවශ්‍යතාව පාලන ස්ථාන ජාලයක් භාවිතයෙන් සපුරා ගත හැක.

2.52. සජීව් අන්තර්ජාල RINEX සැපයුම :GNWEB:

SLCORSnet Geo ++® GNWEB යනු SLCORSnet පාලන ලක්ෂ්‍ය ජාලයෙන් RINEX & (අථත්‍ය) Virtual RINEX ලෙස ලබා දෙන අන්තර්ජාල සේවාදායකයා වේ. GNWEB මඟින් SLCORSnet සේවාව භාවිතා කරන්නන්ට සෑම CORS මධ්‍යස්ථානයකම දත්ත RINEX 2.23 ලෙස හෝ පරිශීලකයා අර්ථ දක්වා ඇති දුරස්ථ GNSS දෝශ අවම ස්ථානයක Virtual RINEX දත්ත ලබා දේ. බාගත කිරීමට පෙර පරිශීලකයා විසින් දත්ත වල යෝග්‍යතාව ඔහුට ලැබෙන වාර්තා අනුව පරීක්ෂා කළ හැකිය. පරිශීලකයන් විසින් ඉල්ලා සිටින දත්ත බාගත කරගැනීම සඳහා GNWEB (Server) සේවාදායකය තුල නිශ්චිත කාලසීමාවක් සඳහා සපයනු ලැබේ.

2.53. SLCORSnet හි ජාලගත අථත්‍ය චාලක (NRTK) විසඳුම භාවිතා කර පාලන ලක්ෂ්‍ය ස්ථාපිත කිරීමේ ක්‍රමවේදය

පාලන ලක්ෂ්‍ය පිහිටුවීම සඳහා පහත පියවර අනුගමනය කළ යුතුය.

- ❖ පැහැදිලි ලෙස අහස දෘශ්‍යතාවයකින් යුත් ස්ථානයක ස්ථාපිත කළ යුතුය.
- ❖ GNSS ග්‍රාහකය (GNSS Receiver) ස්ථානගත කිරීම සඳහා ත්‍රිපාදය සවි කළ හැකි විය යුතුය.
- ❖ වින්‍යාසයේ නිශ්චිත විසඳුම තෝරා නිරවද්‍යතාව HRMS = 0.015 & VRMS = 0.030 ලෙස සකසන්න.
- ❖ Network RTK සහ VRS දෝශ නිවැරදි කිරීමේ ක්‍රමය තෝරන්න. (VRS or VRS_DBS)
- ❖ මධ්‍යන්‍ය නිරීක්ෂණ ගණන ලෙස 25 යොදන්න.
- ❖ දෝෂ ස්ථිර වන තෙක් රැඳී සිටින්න.
- ❖ දත්ත ගබඩා කිරීම ආරම්භ කිරීමට පෙර ඇන්ටනාවේ උස නිවැරදිව මැන පාලකය වෙත ඇතුළත් කළ යුතුය.

2.54. ස්ථිර සලකුණු (Monument)

මායිම්ගල් හෝ පිහිටි මායිම්ගල් Network RTK GNSS පාලන ලක්ෂ්‍ය සඳහා භාවිතා කළ යුතු වේ.

2.55. පාලන ලක්ෂ්‍ය අංකනය

ජාලගත අථත්‍ය චාලක (NRTK) GNSS පාලන ලක්ෂ්‍ය අංකනය කිරීම සහ වාර්තා පවත්වා ගෙන යාම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල විසින් සිදු කළ යුතුය. සෑම දිස්ත්‍රික්කයක් සඳහාම ඒකාකාරී ක්‍රමයක් අනුගමනය කිරීම සඳහා සහ නිරවද්‍යතා මට්ටම හඳුනා ගැනීම සඳහා ජාලගත අථත්‍ය චාලක (NRTK) පාලන ලක්ෂ්‍ය පහත දැක්වෙන ආකාරයෙන් අංකනය කළ යුතුය.

ජාලගත අථත්‍ය චාලක පාලන අංකය (Network RTK Control Point No): *PQRSTU***N***XXX*

PQ	-	කැඩැස්තර සිතියම්වල භාවිතා වන දිස්ත්‍රික් කේත අංකය
RSTU	-	කැඩැස්තර සිතියම්වල භාවිතා වන ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංකය
N	-	**N** අකුර ජාලගත අථත්‍ය චාලක (Network RTK GNSS) පාලන ලක්ෂ්‍ය හැඳින්වීම සඳහා
XXX	-	පාලන ලක්ෂ්‍ය අංකය

2.56. පිහිටුම් රූප සටහන

මිනින්දෝරුවරයා විසින් දත්ත වාර්තාගත කරන අවස්ථාවේදීම පහත සඳහන් පරිදි පිහිටුම් රූප සටහන සකස් කළ යුතුය. පිහිටුම් රූප සටහන් කාර්යාලයේදී ප්‍රතිනිර්මාණය නොකළ යුතුය.
ඇමුණුම 12 බලන්න

SLCORSnet ජාල RTK විසඳුම භාවිතා කර සවිස්තරාත්මක මැනුම් කිරීමේ ක්‍රමවේදය

2.57. යෝජිත මැනුම් ප්‍රදේශයේ නිවැරදි පිරික්සුම් සටහනක් භාවිතයෙන් විස්තරාත්මක මැනුම් ස්ථාන සහ මැනුම් ස්ථාන මැනීම සඳහා පහත පියවරයන් අනුගමනය කළ යුතුය.

ජාලගත RTK විසඳුම භාවිතා කර විස්තර මැනීම

අ) ජාල RTK සහ VRS නිවැරදි කිරීමේ ක්‍රමය තෝරන්න. (VRS හෝ VRS_BDS)

ආ) වින්‍යාස කිරීමේදී ඉතා නිවැරදි විසඳුමද නිරවද්‍යතාව HRMS = 0.050 සහ VRMS = 0.1 ලෙසද සකසන්න.

ඇ) නිරීක්ෂණ වල සාමාන්‍ය 5 ලෙස තෝරන්න.

ඈ) ලෙවල් බුබුල භාවිතයෙන් ග්‍රාහකය ලක්ෂ්‍යයට ඉහලින් සිරස්ව පිහිටුවන්න.

ඉ) විස්තර ගබඩා කිරීම සඳහා දෝෂ ස්ථාවර වන තෙක් දත්ත ගබඩා කිරීමට බලා සිටින්න.

2.58. දත්ත ගබඩා කිරීමේ වර්ග තුනක් ඇත.

1. ස්වයංක්‍රීය (Auto)
2. අස්ථාවර (Float)
3. ස්ථාවර (Fixed)

ස්වයංක්‍රීය සහ අස්ථාවර (Float) නිවැරදි නොවන අතර ඒවා භාවිතා කිරීමට අවසර නැත. එම දත්ත ගබඩා නොකළ යුතුය.

2.59. අහස පැහැදිලිව දර්ශනය නොවීම වැනි භූමියේ පවතින තත්වයන් යටතේ (ක්ෂිතිජ කැපුම් කෝණය 15^0 ට වැඩි) GNSS ප්‍රතිග්‍රාහක භාවිතා කර සියළු ලක්ෂ්‍ය වල විස්තර නිරීක්ෂණය කළ නොහැකි බව පැහැදිලිය. චන්ද්‍රිකා ආවරණය නොමැති මායිම් ලක්ෂ්‍ය වලදී, එම ලක්ෂ්‍ය හා එකිනෙක දෘශ්‍යවන පරිදි ස්වයං පාලිත ස්ථාන (NRTK Controlpoints) ක්‍රමය භාවිතයෙන් පාලන ලක්ෂ්‍ය දෙකක් හෝ තුනක් පිහිටුවන්න. එම පාලන ලක්ෂ්‍ය පූර්ණමානයක් භාවිතයෙන් මැනුම් කළ හැක. මෙම පාලන ලක්ෂ්‍යයන් අනාගත කාර්යයන් සඳහා ඕනෑම වර්ගයක මැනුම් උපකරණයක් පිහිටුවීම සඳහා සුදුසු ස්ථානයක් හා යෝග්‍යතාවයක් ඇති වන ආකාරයෙන් ස්ථාපනය කළ යුතුය.

2.60. පහත සඳහන් අවස්ථාවලදී තොරතුරු විස්තර කිරීම සඳහා බොහෝ ක්‍රම යොදා ගත හැකිය.

1. NRTK පාලන ලක්ෂ්‍යයට සම්බන්ධ වන රේඛාවේ සිට මීටර් 10 ක් ඇතුලත විස්තර ලක්ෂ්‍යයක් නම්, දම්වැල් සහ ටේප් භාවිතා කර ක්ෂේත්‍ර සටහන් තබන්න.
2. NRTK පාලන ලක්ෂ්‍ය මත පූර්ණමානයක් පිහිටුවා විකිර්ණ මැනීම කර ක්ෂේත්‍ර පොත් තබන්න.
3. NRTK පාලන ලක්ෂ්‍ය තුනක් හෝ ඊට වඩා වැඩි නම් පූර්ණමාන භාවිතයෙන් ප්‍රතිඡේදන ක්‍රමය මඟින් මැනුම් කර ක්ෂේත්‍ර පොත් තබන්න.
4. පූර්ණමාන භාවිතයෙන් NRTK පාලන ලක්ෂ්‍ය යොදා ගෙන සාමාන්‍ය මැනුම් කරන ලෙස මැන ක්ෂේත්‍ර පොත් තබන්න.

පවත්නා GNSS ග්‍රාහක භාවිතා කිරීම සඳහා උපදෙස්

2.61. SLCORS ජාලය ස්ථාපනය කිරීමේ මූලික සංකල්පයක් වන්නේ SLCORS ජාලය සමඟ කටයුතු කිරීමට අනුකූල වන පරිදි GNSS ග්‍රාහක භාවිතා කර විස්තරාත්මක මට්ටම් ගැනීමේ කටයුතු කඩිනම් කිරීම වේ .
සටහන: කාර්යාලයෙන් බැහැර වීමට පෙර, ජාලගත අථත්‍ය චාලක (NRTK) ක්‍රමවේදය භාවිතා කර දත්තා ලක්ෂ්‍යයක් නිරීක්ෂණය කළ යුතුය. මේ සඳහා ඔබේ කාර්යාල පරිශ්‍රයේ පාලන ලක්ෂ්‍ය කිහිපයක් ස්ථාපනය කළ හැකිය.

Topcon GR-5 සහ CHC i80 ග්‍රාහක භාවිතා කිරීම සඳහා පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කරන්න.

පරිශීලකයන් / මිනින්දෝරුවරුන් විසින් භාවිතා කරන ග්‍රාහකය (Receiver) අනුව සැකසුම් සමඟ ජාල පාලන ලක්ෂ්‍ය සහ විස්තර (භූ ලක්ෂණාත්මක) ලක්ෂ්‍ය සඳහා අවශ්‍ය නිවැරදිතාව පවත්වා ගැනීමට 2.55, 2.57 සහ 2.58 ඡේදයන් අනුව කටයුතු කළ යුතුය.

2.13 ඡේදය ඇමුණුම 01

DESCRIPTION OF GPS CONTROL POINT		Geodetic Point ID: (For Geodetic Survey Unit use only)	
Client Requisition No:		Client Point ID:	
Handheld Coordinates	Northing :	Monument Type	
	Easting :	Depth(m)	
Province	North western	District	Kurunegala
D.S.Division	Kotawehera	Village	Kotawehera
Prepared by		Checked by	
Name		Name	
Designation		Designation/ Div.SO	
Date		Date	



Means of access to the point :

For Geodetic Survey Unit use only	
GeoSRIM Requisition No:	Geodetic Point ID:
Observed by :	Northing:
Processed by:	Easting:
Checked by:	Project:
Date:	

2.15 ඡේදය ඇමුණුම 02

Annexure II

GNSS OBSERVATION RECORD SHEET

Geodetic Survey Unit

Location Diagram

	From Point	EDM DISTANCE To Point	Distance (m)	Grid Distance (m)	Difference (m)
1.	.....	.....	.....	.....	.....
2.	.....	.....	.....	.....	.....
3.	.....	.....	.....	.....	.....

MISSION: *TGPS / SGPS / TITLE / GCP / MISC/*..... *Reqn. No.:*.....

PROJECT:..... **JOB** *(STATION NAME)*:.....

OBSERVATION TYPE: *STATIC / KINEMATIC / REALTIME*

RECEIVER TYPE: *STS.500 / STS.1200*

SERIAL NO:..... **PICKET NO:**.....

DESCRIPTION OF POINT :.....

SKY VISIBILITY: *GOOD / FAIR / POOR*

SATS AVAILABLE			GDOP	PDOP	BAT LEVEL		FREE MEMORY
L1	*L2*	*TOTAL*			A	B	
							MB
							MB

OBSERVER : ..... **RECORDER/OTHERS :** .....

OBSERVATION : ***START :*** ..... ***END :*** .....

HEIGHT READING (m) : **1**..... **2**..... ***MEAN:***.....

REFERENCE ELLIPSOID : *WGS84 / EVEREST*

APPROXIMATE:	*D*	*M*	*S*
Latitude			
Longitude			
Height (m)			

REMARKS : .....

PHOTO No:..... **DATE : 20**.....

PREPARED BY : ..... **CHECKED BY :** .....

Page 1 of 2

Annexure II

GPS OBSERVATION RECORD FORM

Geodetic Survey Unit

- **SATELLITE AVAILABILITY , GEOMETRY AND BATTERY LEVEL**

TIME	SATELLITE	GDOP	BAT. LEVEL	REMARKS

- **EQUIPMENT CHECK LIST AND FIELD PROCEDURES**

ACTIVITY	*DESCRIPTION*	*DONE*	*REMARKS*
Departure to site	Batteries		Fully charged. Back-up available
	Tripod		
	Try Brach		
	Try Brach Adaptor		
	Tape Measure		
	Pen/Pencil		
	Compass		For orienting sensors
	Observation schedule		Allow enough time to at 1st site early
	Routes, site access verified		Dead measurement sketches
	Station sheet		
	Station description		
	Network Map		If required
	Flashlight		If necessary
	Equipment manuals		If necessary
	GPS receiver		Make sure there is enough memory
	GPS battery cable		If external battery used.
	Vehicle gassed up		
On site	Set up Equipment		
	Measure Ht. and record		
	Measure antenna offset and record		
	Start survey		Verify settings
	Receiver normal		Does it behave as expected? If any malfunction on port error and error message time.
	Expected satellites tracked		
	Cycle slips only where expected		E.g. Satellite(s) behind building
	Battery strength OK?		
	Field sheet filled?		
End of session	Plan move to next site		
	Measure Height and record		
	Verify antenna offset		
	Stop session, take down equipment		
	Is battery good for next session		If not start next session with backup
	Field sheet turned in		
Return at end	Field sheet return		
	Equipment cleaned and stored		
	De-briefing		Anything peculiar has happened
	Batteries on charge		
	Vehicle gassed up		

Page 2 of 2

Client Requisition No: KA/DSO/2019/171 — **Geo SRIM Reqn. No: 2019/125**

Client ID	SD Point ID	Requisition.No	Latitude (WGS84)		Longitude (WGS84)		Height (WGS84) (Meter)	Latitude (EVERES T)		Longitude (EVERES T)		Elip.Height (EVERES T) (Meter)	Northing (Meter)	Easting (Meter)	Elevation (MSL) (Meter)	Hz quality	Ht quality
KA841G003	53C40154	2019/125 & KA/DSO/2019/171		N		E	62.843		N		E	160.414			-100	TGPS	nodef
KA841G001	53C40155	2019/125 & KA/DSO/2019/171		N		E	65.228		N		E	162.797			-100	TGPS	nodef
KA841G002	53C40156	2019/125 & KA/DSO/2019/171		N		E	67.984		N		E	165.554			-100	TGPS	nodef

Observed and Processed by :

A.B.C. .....
...
Govt.surveyor

Checked by:

A.B.C. .....
.
SS (Geodetic/ PRO., ISM, SGO)

Certified by:

A.B.C.....
.....
Snr.SS (Geodetic/ PRO., ISM, SGO)

2.22 ජේදය **ඇමුණුම 04**

Station Observed		32E20042			E13200102			32E20042			E13200102		
Ht. of Target :		1·58 m			1·60 m			1·58 m			1·60 m		
VERTICAL ANGLES AND DISTANCES													
Face Left :	° 91	' 52	" 35	° 65	' 19	" 24	° 91	' 52	" 29	° 88	' 19	" 27
Face Right :	268	07	59	274	41	03	268	07	55	274	41	04
Sum :												
Angle :	01	59	18	04	40	49.5	01	59	17	04	40	48.5
Slope Distance : 1	91·026			140·901			91·026			140·902		
2	91·026			140·901			91·027			140·901		
Mean Slope Distance :	91·026			140·901			91·027			140·902		
Horiz. Distance :												
Elevation :												
HORIZONTAL ANGLES													
Face Left :	° 00	' 00	" 00	° 157	' 50	" 16	° 30	' 00	" 30	° 187	' 50	" 58
Face Right :	179	59	40	337	50	11	210	00	22	07	50	48
Mean :	359	59	50	157	50	13.5	30	00	26	187	50	53
Angle :				157	50	23.5				157	50	27
Face Right:												
Face Left :												
Mean :												
Angle :												
Face Left :												
Face Right :												
Mean :												
Angle :												
Face Right :												
Face Left :												
Mean :												
Angle :												
Mean Angle :												

2.30 ඡේදය ඇමුණුම 05

Job: ISM/2014/KN/23	Traverse No: E1-32-0012	FB No: : GEO 0104	Prepared by: J.M.K.R. Jayasekara	Page 9 of 10 Pages

Instrument Station: E13200120I Instrument Height = 1.40 m FB Page No: 2-6

Zero Position	REF Station	REF T.H.	VA to Ref. d m s	Dist to Ref. mean FL/FR	Target Stn 1	Stn 1 T.H.	VA to Stn 1 d m s	Dist. to Stn 1 mean FL/FR	HA to Stn 1 from Ref. d m s	Target Stn 2	Stn 2 T.H.	VA to Stn 2 d m s	Dist. To Stn 2 mean FL/FR	HA to Stn 2 from Ref. d m s
		m		m		m		m						
0° 00'	32020049	1.58	91 52 18.0	91.026	E13200109	1.60	04 40 49.5	140.901	157 50 23.5					
45° 00'	"	"	91 52 17.0	91.027	"	"	04 40 48.5	140.902	157 50 27.0					
90° 00'	"	"	91 51 18.5	91.027	"	"	04 40 49.0	140.903	157 50 14.5					
135° 00'	"	"	91 52 17.5	91.028	"	"	04 40 50.0	140.902	157 50 26.0					
MEAN			91 52 17.75	91.027			04 40 49.25	140.902	157 50 22.75					
Std. Div.														

Instrument Station: Instrument Height = m FB Page No:

Zero Position	REF Station	REF T.H.	VA to Ref. d m s	Dist to Ref. mean FL/FR	Target Stn 1	Stn 1 T.H.	VA to Stn 1 d m s	Dist. To Stn 1 mean FL/FR	HA to Stn 1 from Ref. d m s	Target Stn 2	Stn 2 T.H.	VA to Stn 2 d m s	Dist. To Stn 2 mean FL/FR	HA to Stn 2 from Ref. d m s
MEAN														
Std. Div.														

2.41 ඡේදය 7.20 ඡේදය ඇමුණුම 06

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පිල් ලකුණු වර්ග



ඒ වර්ගය

පොළව මට්ටමේ සිට
45cm ක් යටින්

සාමාන්‍යයෙන් පොළොවේ 65cm ක් පමණ යට වැළලූ කොන්ක්‍රීට් ගලෙහි සවිකළ ලෝකඩ බෝල්ට් ඇණය. මෙහි 'සී' වර්ගයේ මෙන් ලකුණු කිරීම් කර ඇත. ගලේ දිග පළල හා හැඩය වෙනස් විය හැකි නමුදු පරිමාව ඝන 45cm ට වැඩි විය යුතුය.

ඒඒ වර්ගය



පොළව මට්ටමේ සිට
45cm ක් යටින්



බී වර්ගය

පොළව මට්ටමින් යට පිහිටියාවූ ගලේ මට්ටම් කළ තලයෙහි සිමෙන්තියෙන් සවිකළ ලෝකඩ බෝල්ට් ඇණය. මට්ටම් කළ නලය 15cm චතුරස්‍රයක් විය යුතුය. මෙහි 'සී' වර්ගයේ මෙන් ලකුණු කිරීම් කළ යුතුය.

ලෝකඩ ඇණය පොළව මට්ටමින් උඩ, සිමෙන්තියෙහි පිහිටි නලෙහි, ක්‍රොන්ක්‍රීට් ගලෙහි හෝ සිමෙන්ති බැම්මෙහි සවිකරණු ලැබේ. එහි S.D. යන අකුරු හා පිල් ලකුණු සලකුණ ද මුද්‍රණය කරනු ලැබේ.

ඩී වර්ගය (භාවිතා නොකෙරේ)

භූමිතික මට්ටම් වාර්තාවේ III වැනි චිත්‍රය බලන්න.

ඊ වර්ගය



සෘජුකෝණාස්‍ර පෘෂ්ඨයේ (විශාල) සවිකරන ලද ලෝකඩ බොල්ට් ඇණය. පෘෂ්ඨයෙහි තලය පොළොව මට්ටමින් 8cm උසට තිබිය යුතුය.

එෆ් වර්ගය

සෘජුකෝණාස්‍ර පෘෂ්ඨයේ (කුඩා) සවිකරන ලද ලෝකඩ බොල්ට් ඇණය. මට්ටම් කළ නලය ඊ වර්ගයේ මෙන් විය යුතුය.

ජී වර්ගය (තාවකාලික)

විශ්කම්භය 8cm හා දිග 30cm වූ ලී කුඹ්ඤ්ඤය හෝ විශ්කම්භය 8cm හා දිග 20cm වූ සිමෙන්ති කුඹ්ඤ්ඤය.

එච් වර්ගය

මුදුන 8cm චතුරස්‍රයකින්ද පාදය 10cm චතුරස්‍රයකින්ද හෙබි උස 20cm වූ කොන්ක්‍රීට් පෘෂ්ඨය. කාකපාදය මුදුන මතුපිට මුද්‍රණය කර ඇත. මධ්‍ය ලක්ෂය 2cm විෂ්කම්භයකින් විය යුතුය. බෝල්ට් ඇණයක් නැත. පොළොව මට්ටමට වළලනු ලැබේ.

2.46 ජේදය ඇමුණුම 07

Annexure VII

Raw data of Geodetic Leveling

P.L No. ..... Fore Levelling from B M No. ..... to B M No. .....

Pt. No.	Staff Readings		Re. Level	Distance		Remarks
	BS	FS		BS	FS	
0	1.30215		0.00000	20.526		BM1
1	0.04880	2.99458	-1.69243	12.188	20.472	TP
2	0.45838	2.54939	-4.19302	14.942	11.926	TP
3	0.61600	2.20561	-5.94025	14.958	14.854	TP
4	0.14893	2.55015	-7.87440	14.937	15.061	TP
5	0.20297	2.67234	-10.39781	13.077	14.935	TP
6	0.17229	2.63815	-12.83299	19.763	12.872	TP
7	0.21460	2.97552	-15.63622	19.993	19.510	TP
8	0.40782	2.69809	-18.11971	19.896	19.854	TP
9	0.05798	2.63592	-20.34781	24.926	19.964	TP
10	0.06857	2.75626	-23.04609	21.975	24.815	TP
11	0.90832	2.25248	-25.23000	26.808	21.893	TP
12	0.85436	2.04324	-26.36492	24.949	26.364	TP
13	0.66622	2.06810	-27.57866	51.467	24.872	TP
14		1.69857	-28.61101		51.465	BM2
		Total Distance		300.405	298.857	

No. of Stations - .....
Distance Leveled - .....
Traveled - .....
Weather - .....
Date - .....
Time - .....

.....
Signature

[2.46 ජේදය](#)

[ඇමුණුම 08](#)

ABSTRACT SHEET FOR PRECISE LEVELING

From Kandy FBM to Dambulla FBM

P. L. No:- GPL-4 (2012)

Loops No.	Line No	Levelling Book No.	Levelling Book Page	No. of Instrument Stations	Direction	Difference of Height (m) +	Difference of Height (m) -	Mean Difference of Height with Sign of Forward Levelling +	Mean Difference of Height with Sign of Forward Levelling -	Distance (m)	Discrepancies (mm) Allowable	Discrepancies (mm) Actual	Discrepancies (m) (Forword - Backward)	Cum. Of Discrepancies (m)	Total Distance (Km)	Remarks	Height
1	FBM-BM1	PL. 30	1	8	Forward		17.36559	-	17.365825	340	1.60934	-0.47	-0.00047	-0.00047	0.34	FBM Kandy	557.19912
	BM1-FBM	PL. 30	2	10	Backward	17.36606											
2	BM1-BM2	PL. 30	3	14	Forward		28.61101	-	28.611655	600	2.13789	-1.29	-0.00129	-0.00176	0.94		511.22164
	BM2-BM1	PL. 30	4	14	Backward	28.61230											
3	BM2-BM3	PL. 30	5	16	Forward		0.72019	-	0.720675	800	2.46862	-0.97	-0.00097	-0.00273	1.74		510.50097
	BM3-BM2	PL. 30	6	16	Backward	0.72116											
4	BM3-BM4	PL. 30	7	34	Forward		34.06674	-	34.067500	1620	3.51291	-1.52	-0.00152	-0.00425	3.36		476.43347
	BM4-BM3	PL. 30	9	34	Backward	34.06826											
5	BM4-BM5	PL. 30	11	18	Forward		22.33158	-	22.332080	1200	3.02343	-1.00	-0.00100	-0.00525	4.56		454.10139
	BM5-BM4	PL. 30	12	18	Backward	22.33258											
6	BM5-BM6	PL. 30	13	20	Forward		6.68559	-	6.686505	1060	2.84159	-1.83	-0.00183	-0.00708	5.62		447.41488
	BM6-BM5	PL. 30	14	20	Backward	6.68742											
7	BM6-BM7	PL. 30	15	16	Forward		3.89742	-	3.897760	1250	3.08577	-0.68	-0.00068	-0.00776	6.87	4	443.51712
	BM7-BM6	PL. 30	16	16	Backward	3.89810											
99	BM98-BM99	PL. 42	10	8	Forward		1.33618	1.335730	-	640	2.20800	0.90	0.00090	-0.00785	67.54		182.458200
	BM99-BM98	PL. 42	11	8	Backward	1.33618											
100	BM99-BM100	PL. 42	12	10	Forward	9.15053		9.150100	-	480	1.91218	0.86	0.00086	-0.00699	68.02		191.608300
	BM100-BM99	PL. 42	13	10	Backward		9.14967										
101	BM100-BM101	PL. 42	14	8	Forward		6.51541	-	6.515450	540	2.02818	-0.08	-0.00008	-0.00707	68.56		185.092850
	BM101-BM100	PL. 42	15	8	Backward	6.51549											
102	BM101-BM102	PL. 42	16	8	Forward	1.82659		1.826390	-	630	2.19068	0.40	0.00040	-0.00667	69.19		186.919240
	BM102-BM101	PL. 42	16	8	Backward		1.82619										
103	BM102-BM103	PL. 43	1	6	Forward		3.21853	-	3.218690	360	1.65600	-0.32	-0.00032	-0.00699	69.55		183.700550
	BM103-BM102	PL. 43	1	6	Backward	3.21885											
104	BM103-BM104	PL. 43	2	8	Forward		0.14489	-	0.145030	460	1.87192	-0.28	-0.00028	-0.00727	70.01		183.555520
	BM104-BM103	PL. 43	2	8	Backward	0.14517											
105	BM104-BM105	PL. 43	3	10	Forward		1.30603	-	1.306435	530	2.00931	-0.81	-0.00081	-0.00808	70.54		182.249085
	BM105-BM104	PL. 43	3	10	Backward	1.30684											
106	BM105-BM106	PL. 43	4	8	Forward		5.38823	-	5.388505	500	1.95161	-0.55	-0.00055	-0.00863	71.04		176.860580
	BM106-BM105	PL. 43	4	8	Backward	5.38878											
107	BM106-BM107	PL. 43	5	8	Forward		6.72912	-	6.729320	540	2.02818	-0.40	-0.00040	-0.00903	71.58		170.131260
	BM107-BM106	PL. 43	5	8	Backward	6.72952											
108	BM107-BM108	PL. 43	6	12	Forward	3.62357		3.623125	-	1000	2.76000	0.89	0.00089	-0.00814	72.58		173.754385
	BM108-BM107	PL. 43	7	12	Backward		3.62268										
109	BM108-FBM	PL. 43	8	16	Forward		9.53266	-	9.533460	1120	2.92091	-1.60	-0.00160	-0.00974	73.70	FBM Dambulla	164.220925
	FBM-BM108	PL. 43	9	16	Backward	9.53426											
				2546				345.073530	738.0551725	73.190	23.61212	-9.74	-0.00974				164.2171
									MSL Height =	-392.9781195							0.003825

Prepared by : .....
Name :
Designation :
Date :

Checked by : .....
Name :
Designation :
Date :

Certified by : .....
Name :
Designation :
Date :

ANNNEXURE X

ADJUSTMENT SHEET FOR PRECISE LEVELING

P.L No: GPL- 4 (2012) From Kandy FBM to Dambulla FBM

Date:- 24/01/2013

B.M	Mean Height Difference (m)	Distance (m)	Obtain Height Before Adjutment(m)	*Correction(m)	Adjusted BM Height (m)	BM ID
Kandy FBM			557.199120	0.000000	557.199120	FBM Kandy LB
FBM-BM1	-17.365825	340	539.833295	-0.000035	539.833260	PL-004-001
BM1-BM2	-28.611655	600	511.221640	-0.000070	511.221570	PL-004-002
BM2-BM3	-0.720675	800	510.500965	-0.000105	510.500860	PL-004-003
BM3-BM4	-34.067500	1620	476.433465	-0.000140	476.433325	PL-004-004
BM4-BM5	-22.332080	1200	454.101385	-0.000175	454.101210	PL-004-005
BM5-BM6	-6.686505	1060	447.414880	-0.000211	447.414669	PL-004-006
BM6-BM7	-3.897760	1250	443.517120	-0.000246	443.516874	PL-004-007
BM7-BM8	2.181800	970	445.698920	-0.000281	445.698639	PL-004-008
BM8-BM9	0.095340	900	445.794260	-0.000316	445.793944	PL-004-009
BM9-BM10	2.380250	1350	448.174510	-0.000351	448.174159	PL-004-010
BM10-BM11	3.151150	1100	451.325660	-0.000386	451.325274	PL-004-011
BM11-BM12	4.797185	1180	456.122845	-0.000421	456.122424	PL-004-012
BM12-BM13	25.170565	770	481.293410	-0.000456	481.292954	PL-004-013
-----	-----	-----	-----	-----	-----	-----
-----	-----	-----	-----	-----	-----	-----
BM97-BM98	-6.771490	350	181.122470	-0.003439	181.119031	PL-004-098
BM98-BM99	1.335730	640	182.458200	-0.003474	182.454726	PL-004-099
BM99-BM100	9.150100	480	191.608300	-0.003509	191.604791	PL-004-100
BM100-BM101	-6.515450	540	185.092850	-0.003544	185.089306	PL-004-101
BM101-BM102	1.826390	630	186.919240	-0.003579	186.915661	PL-004-102
BM102-BM103	-3.218690	360	183.700550	-0.003614	183.696936	PL-004-103
BM103-BM104	-0.145030	460	183.555520	-0.003650	183.551870	PL-004-104
BM104-BM105	-1.306435	530	182.249085	-0.003685	182.245400	PL-004-105
BM105-BM106	-5.388505	500	176.860580	-0.003720	176.856860	PL-004-106
BM106-BM107	-6.729320	540	170.131260	-0.003755	170.127505	PL-004-107
BM107-BM108	3.623125	1000	173.754385	-0.003790	173.750595	PL-004-108
BM108-FBM	-9.533460	1120	164.220925	-0.003825	164.217100	FBM Dambulla LB
		73,700				

$$\text{*Correction} = \frac{\text{(Actual value-Obtained value)}}{\text{No. of Stations}} \times \text{Station No.}$$

FBM Kandy= 557.199120 m
Obtained error = -0.003825 m
Allowable error = 0.023694 m

Prepared by: ..... Checked By: ..... Certified by: .....

Name: Name: Name:
Designation: Designation: Designation:
Date: Date: Date:

2.46 ඡේදය ඇමුණුම 10



මැනුම් Survey 115 ඇල්206 L 206
(F 2*S.& E)2/61

මූලික පිල් ලකුණේ වාර්තාව
FUNDAMENTAL BENCH MARK REPORT

සැළකිය යුතු - (1) දුර බැහැර පෙදෙස්හි පිහිටි මූලික පිල් ලකුණු පිළිබඳව අවුරුද්දකට වරක් ද : අවහිරකම් සිදුවීමට ඉඩ ඇති , නගර වල හෝ ජනාවාස ප්‍රදේශවල ඒවා පිළිබඳව, හයමාසයක් පාසාද වාර්තාකළ යුතු වේ.

(2) **අවවාද යි,** කාණු බිලේ මාර්ගයෙන් සුද්ධ කළ නොහැකි තැන්පත් ජලය හෝ වැඩෙන ගස් මුල් ඇති බවට සැක කළහොත් මිස, කුටිය ආවරණය හෝ විවෘත නොකළ යුතුය.

Note – (1) Fundamental Bench Marks in out of the way places are to be reported on annually; those in towns or in inhabited areas where interference is likely, every six months.

(2) CAUTION – The chamber should *not* be uncovered or opened unless it is suspected to contain the growing roots of trees or stagnant water which cannot be cleared through the drain hole.

මූලික පිල් ලකුණේ නම
NAME OF FUNDAMENTAL BENCH MARK .....

පරීක්ෂා කරන නිලධාරීගේ වාර්තාව
Report by Inspecting Officer

(1) (අ) ඉහළ බෝල්ට් ඇණයේ සහ කළඟල් කණුවේ තත්ත්වය.
(a) Condition of granite pillar and upper bolt.

(ආ) කානු බිලය හිර වී තිබුණාද? එය සුද්ධ කෙළෙහිද?
(b) Was the drain hole found block ? Has it been cleared out ?

(ඇ) කුහරයෙහි ජලය, මුල් යනාදිය ඇති බවට සැක කෙළෙහිද? එසේ නම්, එය විවෘත කර සුද්ධ කෙළෙහිද?
(c) Is chamber suspected to contain water, roots, &e.? If so, has it been opened and cleared?

(ඈ) කොරටුවේ වැටෙහි සහ දම්වැල්වල තත්ත්වය.
(d) Condition of fencing and wring of enclosure.

(ඉ) පස්කණ්ඩියෙහි සහ පනා බැම්මෙහි තත්ත්වය
(e) Condition of earth embankment and any retaining walls.

(ඒ) මතුපිට කාණුවල තත්ත්වය
(f) Condition of surface drains.

(උ) මුල් වැඩීමෙන් පිල් ලකුණට කිසියම් හානියක් ගෙනදිය හැකි ගස් සමීපයෙහි තිබේද?
(g) Are there any tree in the vicinity the growth of the roots of which is likely to cause any damage to the bench mark?

(ඌ) කොරටුව සහ අවට සුද්ද කළෙහිද?
(h) Have the enclosure and surrounding been cleared?

(ඕ) පිල් ලකුණු සමීපයෙහි පිපිරවීම තහනම් කෙරෙමින් දැන්වීමක් තැබුවෙහිද?
(i) Has a notice been posted prohibiting in the vicinity of the bench mark ?

(ඔ) පිල් ලකුණට වෙන්කළ බිමෙහි හෝ අවට ප්‍රදේශයෙහි මෑතකදී කිසියම් ගලක් කඩා හෝ පුපුරවා තිබේද?
(j) Has any stone been blasted or broken recently in the neighborhood of the bench mark or within its reservation?

(II) දෝෂ මහහැරීමට ගත් පියවර.
Step taken to remedy defects'

(III) අවශ්‍ය යයි තීරණය කළ කිසියම් වැඩිපුර ක්‍රියාකිරීමක් සඳහා නිර්දේශ.
Recommendations for any further action considered necessary'

අත්සන
signature .....

දිනය
Date .....

2.56 ඡේදය ඇමුණුම 12

GNSS නිරීක්ෂණ වාර්තා කිරීමේ අකෘතිය
SLCORSnet හි ජාල RTK භාවිතා කරමින් පාලන පිහිටුවීම

දිස්ත්‍රික්කය: …….. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: ……
ග්‍රාම නිලධාරී කොට්ඨාශය:…….. පාලන ලක්ෂ්‍ය අංකය: ……

පිහිටීමේ සටහන

ජාල RTK ක්‍රමය

1. VRS ☐ 2. VRS - BDS ☐

ජාල RTK විසඳුම:

ඵ –
නැ –
ඵස–

සටහන: වාර්තා කිරීම සඳහා RTK විසඳුම ස්ථාවර විය යුතුය.

මිනින්දෝරුවරයාගේ අත්සන: ……*මිනින්දෝරුවරයාගේ නම*:

……

දිනය: ……

ශුද්ධි පත්‍රය

ශුද්ධි පත්‍රය

3 වැනි පරිච්ඡේදය

කූඤ්ඤ සහ මායිම්ගල්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	මායිම්ගල් හා කූඤ්ඤ වර්ග	
3.1.	මායිම්ගල් හා කූඤ්ඤ වර්ග සහ ඒවායේ සම්මත සලකුණු	1
	සිමෙන්ති හෝ මැටි කූඤ්ඤ	
3.2.	සිමෙන්ති කූඤ්ඤ සඳහා මිශ්‍රණය	3
	පිහිටි මායිම්ගල් හා පිහිටි ගල් කූඤ්ඤ	
3.3.	පිහිටි මායිම්ගල් හා පිහිටි ගල් කූඤ්ඤ විශාල ස්ථිර ගල්කූට මත කැපිය යුතු බව	3
3.4.	පිහිටි මායිම්ගල් හා පිහිටි ගල් කූඤ්ඤ පිහිටුවීමට වැඩි ප්‍රමුඛතාවය දිය යුතු බව	3
	වැළලූ ගල	
3.5.	වැළලූ ගලෙහි භාවිතය	3
	ස්ථිර කූඤ්ඤ භාවිතා කිරීම	
3.6.	පොළව අධික බෑවුම් සහිත විට ස්ථිර කූඤ්ඤ භාවිතා කිරීම	3
3.7.	ක්ෂේත්‍රයේදී ස්ථිර කූඤ්ඤ හඳුනා ගැනීම	3
3.8.	අනාගතයේදී සිදු කරනු ලබන වැඩ සඳහා ස්ථිර කූඤ්ඤ හතරක පෙළක් පිහිටුවීම	3
	මාර්ග මත අනවශ්‍ය ලෙස කූඤ්ඤ වැළලීම	
3.9.	මාර්ග මත අනවශ්‍ය ලෙස කූඤ්ඤ වැළලීම වළක්වා ගැනීම	4
3.10.	පවතින ස්ථිර කූඤ්ඤ පිහිටි තැන් සොයා ගැනීමට පැරණි මාර්ග මැනුම් ක්ෂේත්‍ර පත්‍ර ලබා ගැනීම	4
3.11.	අලාභ හානි වළක්වා ගැනීමට යකඩ ඇණ භාවිතා කිරීම	4
3.12.	මාර්ගය දිගේ කූඤ්ඤ වැළලීමේදී මිනින්දෝරුවන්ගේ වගකීම	4

3 වැනි පරිච්ඡේදය

කූඤ්ඤ සහ මායිම්ගල්

මායිම්ගල් හා කූඤ්ඤ වර්ග

3.1. මායිම්ගල් හා කූඤ්ඤ වර්ග සහ ඒවායේ සම්මත සලකුණු

පහත සඳහන් කූඤ්ඤ සහ මායිම්ගල් මැනුම් කටයුතු වලදී භාවිතා කරනු ලැබේ.: -

		පිඹුරේ සහ ක්ෂේත්‍ර පොතේ කළුපාටින් සටහන් කරන සම්මත සලකුණ
(i)	කළු ගලින් කපන ලද හෝ කොන්ක්‍රීට්වලින් සෑදූ මායිම්ගල්, පහත (අ) හා (ආ) හි සඳහන් පරිදි මුදුන සහිත සමචතුරස්‍රාකාර හැඩයෙන්ද, මධ්‍ය ලක්ෂ්‍යයක් හා එයට යොමුකළ පුළුල් ඊ හිසකින්ද යුක්ත වන අතර පොළව මට්ටමේ සිට සෙ.මී.10 ක් උඩට මතුවන සේ වළලනු ලැබේ. (අ) කළු ගලින් කපන ලද මායිම්ගල්: - දිග සෙ.මී.50කට වඩා නොඅඩු, පතුල සෙ.මී.15ක් පමණ වන සමචතුරස්‍රාකාර හැඩයෙන්ද, මුදුන සෙ.මී.10ක සමචතුරස්‍රාකාර හැඩයෙන්ද යුක්ත වන අතර මුදුනෙහි සිට සෙ.මී. 10ක් පහළට පැති මට්ටම් කර ඇත. (ආ)කොන්ක්‍රීට් මායිම්ගල් : - දිගින් සෙ.මී.30කට වඩා නොඅඩු පතුල සෙ.මී.10ක් පමණ වන සමචතුරස්‍රාකාර හැඩයෙන් සහ මුදුන සෙ.මී. 8ක සමචතුරස්‍රාකාර හැඩයෙන්ද යුක්ත වේ.	ග
(ii)	පිහිටි මායිම්ගල : - පිහිටි ගලේ කොටන ලද සෙ.මී.10ක පැති සහිත සමචතුරස්‍රයකින් වටවූ පුළුල් ඊ හිස සහිත මධ්‍ය ලක්ෂ්‍යයක් ඇති.	පිග
(iii)	මීටර් 1500 දේශගුණ සමෝච්ඡ රේඛා මායිම්ගල් : - දිග සෙ.මී.80ක් වන සෙ.මී.8ක විශ්කම්භයක් සහිත කොන්ක්‍රීට් වලින් පුරවන ලද ප්ලාස්ටික් බටයක් සෙ.මී.50ක් පොළවෙන් උඩට සිටිනසේ ද සෙ.මී.30ක් ගැඹුරට සිටිනසේ ද වළලනු ලැබේ. එහි මුදුනෙහි “මී.1500”සහ “මී.දෙ.” යන අකුරු කපනු ලැබේ.	දේසග
(iv)	පැරණි මායිම්ගල:-	පිඹුර මත **ග** ක්ෂේත්‍ර පොතෙහි **පැග**
(v)	පැරණි පිහිටි මායිම්ගල : -	පිඹුර මත **පිග** ක්ෂේත්‍ර පොතෙහි **පැපිග**
(vi)	දුම්රිය මාර්ග සඳහා වෙන් කරන ලද බිමෙහි මායිම් වල පිහිටුවන ලද යකඩ රේල් කණු	**යක**

(vii) මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ස්ථාපනය කරන ලද සිමෙන්ති හෝ ගල් ස්ථම්භය — **මාසංඅ**

(viii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ස්ථාපනය කරන ලද සිමෙන්ති හෝ ගල් ස්ථම්භය — **පුග**

(ix) වෙනස් කර තිබෙන බව සොයාගත් පැරණි මායිම්ගලක් — ක්ෂේත්‍ර පොතෙහි **වෙපැග**

(1) මායිම්ගල එම ස්ථානයේම තිබෙන්නට හැරියහොත් — පිඹුර මත **ග**

(2) මායිම්ගල නිවැරදි ස්ථානයේ නැවත ස්ථාපනය කළහොත් ක්ෂේත්‍ර පොතෙහි ඒ පිළිබඳව යොමු සටහනක් කළ යුතුය. — පිඹුර මත **ග**

ක්ෂේත්‍ර පොතේ කළු පාටින් සටහන් කරන සම්මත සලකුණු.

(x) මායිම්ගල් කෘඤ්ඤය : -
3.1(i) ඡේදයට සමාන නමුත් පොළව මතුපිට සිට සෙ.මී.15ක් ගැඹුරට වළලන ලද ස්ථිර පරික්‍රමණ ලක්ෂ්‍යයක් ලෙස යොදා ගැනෙන මායිම්ගල. — **ගකු**

(xi) පිහිටි ගල් කෘඤ්ඤය : -
පිහිටි ගලේ කොටන ලද පුළුල් ඊ හිස (කාක පාදය) හා එහි මුදුනත ගැඹුරට කොටන ලද මධ්‍ය ලක්ෂ්‍යය — **පිගකු**

(xii) වැළලූ ගල : -
මුදුනත පුළුල් ඊ හිස (කාක පාදය) හා මධ්‍ය ලක්ෂ්‍යයක් කොටන ලද සෙ.මී. 15කට නොඅඩු සමචතුරස්‍රාකාර පැතිවලින් යුත් සෙ.මී.10ක් උස ගල. මෙය අවම වශයෙන් පොළව මතුපිට සිට සෙ.මී.05ක් ගැඹුරට සිටින සේ වැළලිය යුතුය. — **වැග**

(xiii) (අ) සිමෙන්ති හෝ මැටි කෘඤ්ඤය : -
විශ්කම්භය සෙ.මී.04 ක්සහ පහලට සෙ.මී.10ක් වන සේ පහතට උල්ව සිටිනසේ සිමෙන්ති හෝ මැටිවලින් සෑදූ මධ්‍ය ලක්ෂ්‍යයක් කොටන ලද පොළව මතුපිට සිට සෙ.මී.05කට නොඅඩු වනසේ වළලන ලද කෘඤ්ඤය. — **සිකු**

(ආ) පරික්‍රමණ සිමෙන්ති හෝ මැටි කෘඤ්ඤය : -
මුදුනත සෙ.මී.05ක් සහ පතුල සෙ.මී.10ක් විශ්කම්භය සහිත උස සෙ.මී.20ක් වූ පොළව මට්ටමේ සිට සෙ.මී.10ක් ගැඹුරට වළලනු ලබන සිමෙන්ති හෝ මැටියෙන් සාදන ලද කෘඤ්ඤය. — **පසිකු**

(xiv) ලී කෘඤ්ඤ : -
ලීයෙන් කපන ලද කෘඤ්ඤ වේ. මේවා කිසිම අවස්ථාවක මැනුම් කෘඤ්ඤ ලෙස භාවිතා නොකළ යුතු අතර තාවකාලික ලකුණු වශයෙන් භාවිතා කළ හැක. — -

(xv) යකඩ ඇණය : - — **ඇ**

9.38 ඡේදය බලන්න.

සටහන : -

(අ) (i) සිට (xi) යටතේ ඇති කූඤ්ඤ ස්ථිර ලෙස සලකනු ලබන අතර (xii) සිට (xiii) අර්ධ- ස්ථිර වේ.

(ආ) පැරණි කූඤ්ඤ හෝ මායිම්ගල් සඳහා ක්ෂෙත්‍ර පොතෙහි සටහන් කරන "පැ" අක්ෂරය පිඹුර මත දක්වනු නොලැබේ.

සිමෙන්ති හෝ මැටි කූඤ්ඤ

3.2. අවශ්‍ය වන සිමෙන්ති හෝ මැටි කූඤ්ඤ සියල්ලම සැපයීමට ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය භාර මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කරනු ඇත. ශුද්ධ කළ සිනිදු වැලි කොටස් දෙකකට සිමෙන්ති කොටස් එකක් යොදා සාදා ගනු ලබන මිශ්‍රණය සිමෙන්ති කූඤ්ඤ සඳහා යෝග්‍ය වේ.

පිහිටි මායිම්ගල් හා පිහිටි ගල් කූඤ්ඤ

3.3. පිහිටි මායිම්ගල් හා පිහිටි ගල් කූඤ්ඤ කෙටීම කළ යුත්තේ සෝදා යෑමෙන් හා වගාකිරීම නිසා විනාශ වී යා නොහැකි ලොකු ගල්වල හෝ වලනය විය නොහැකි විශාල ගල් පර්වතවල පමණි. ගලේ දිරා ගිය කොටසක් වේ නම් එය කපා දැමිය යුතු අතර, සෙ.මී. 01ක් පමණ පළල ඉරිවලින් සෙ.මී. 01ක් පමණ ගැඹුරට සිටින සේ මෙම ලකුණ කොටනු ලැබේ.

3.4. පිහිටි මායිම්ගල් හා පිහිටි ගල් කූඤ්ඤ වඩාත් ස්ථිරව පවත්නා බැවින් මේවා භාවිතා කිරීම මායිම්ගල් හා මායිම්ගල් කූඤ්ඤ වලට වඩා සුදුසු වන්නේය.

වැළලූ ගල

3.5. වැළලූ ගල් භාවිතා කළ යුත්තේ භූමිය අනුව මැටි හෝ සිමෙන්ති කූඤ්ඤ නුසුදුසු නම් පමණි.

ස්ථිර කූඤ්ඤ භාවිතා කිරීම

3.6. යම් කිසි බිමක් තද බෑවුමකින් යුක්ත නම් හා එහි පස් කැපීමට කටයුතු පිළියෙල කර ඇත්නම්, ස්ථිර කූඤ්ඤ වැළලිය යුත්තේ ඒවා අවහිරවීම හෝ වෙනස්වීම අවම වේ යැයි සිතිය හැකි ස්ථාන වලය.

3.7. පොළවේ වළලනු ලබන ස්ථිර කූඤ්ඤ මතුවට කරන වැඩ සඳහා ප්‍රයෝජනයට ගැනීමට හැකිවන පරිදි ඒවා ගල් ගොඩකින් පෙන්නුම් කිරීමෙන් සහ ක්ෂෙත්‍රයෙහි දීර්ඝ කාලයක් පවතින විශේෂිත වූ ගස් හෝ ස්ථිර වස්තූන් වලට බැඳි මිනුම් ගැනීමෙන් විස්තර කළ යුතු වේ. මෙසේ භාවිතා කරනු ලබන ගස් පහසුවෙන් තෝරා ගැනීමට නොහැකි නම් ද, වගා කර තිබෙන හෝ විශේෂ වටිනාකමකින් යුතු ගස් නොවේ නම් ද , ඒවා හඳුනා ගැනීම සඳහා කටට කපා ලකුණු කළ යුතුය.

කූඤ්ඤ ඇති ස්ථාන හඳුනා ගැනීමට පහසුවන පරිදි අසල තිබෙන බෝක්කු හෝ ගෙවතු මායිම්වලට ඇති දුර ප්‍රමාණ වැනි අතිරේක තොරතුරු ක්ෂෙත්‍ර පොතේ සටහන් කළ යුතුය.

3.8. මතුවට කෙරෙන මැනුම් වැඩ සඳහා නිශ්ක්‍රමණ (point of departure) ලක්ෂ්‍යයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීම පිණිස ස්ථිර කූඤ්ඤ 04 ක් එක පෙළට සිටුවිය යුතුය. විශාල මැනුම්වලදී මෙම

කුඤ්ඤ ස්ථාන මැනුම් රේඛා 10 ට නොඅඩු පරතරයකින් පිහිටුවිය යුතු අතර රජයේ ඉඩම්වල මායිමට ආසන්නව සිටුවීම වඩාත් සුදුසුය.

මාර්ග මත අනවශ්‍ය ලෙස කුඤ්ඤ වැළලීම

3.9. මාර්ග වල අනවශ්‍ය ලෙස කුඤ්ඤ වැළලීම වලකනු වස් පාරෙහි හෝ ඒ අසල දැනට තිබෙන ස්ථීර කුඤ්ඤ නව මැනුම් සඳහා නැවත භාවිතා කළ යුතුය.

3.10. පාරක හෝ පාරක් අසල මැනුම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම මිනින්දෝරුවන්ට භාවිතා කළ හැකි ස්ථීර කුඤ්ඤ කිසිවක් තිබේදැයි දැනගැනීම සඳහා පැරණි මැනුම්වල පිඹුරු හෝ දම්වැල් 16 රේඛා සටහන් ලබා ගෙන පරීක්ෂා කළ යුතුය .

3.11. මාර්ග වල සහ තදාසන්න ප්‍රදේශවල කුඤ්ඤ වැළලීමේදී මිනින්දෝරුවන් විසින් මාර්ගයෙහි පැත්තක, සුදුසු ස්ථාන වල කුඤ්ඤ වැළලීම හෝ මාර්ග සහ පදික වේදිකාවල සිදුවන හානි අවම වන සේ හැකිතාක් දුරට යකඩ ඇණ (9.38 ඡේදය බලන්න) භාවිතා කිරීම සිදු කළ යුතුය. කුමන හේතුවක් නිසාවත් මාර්ගය තුල කුඤ්ඤ වැලලීම නොකළ යුතුය.

3.12. මැනුම යටතට වැටෙන මාර්ග දිගේ පොළව යට දිවෙන රැහැන් හෝ නළ කිසිවක් තිබේදැයි මිනින්දෝරුවන් විසින්, ශ්‍රී ලංකා ටෙලිකොම්, ජාතික ජල සැපයුම් හා ජලාපවාහන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනයෙන් අසා දැනගත යුතුය. කුඤ්ඤ සෙවීමේ සහ පිහිටුවීමේ ක්‍රියාවලියේදී මෙම රැහැන්වලට හෝ නළවලට කිසිදු අලාභ හානියක් සිදු නොකිරීමට විශේෂයෙන් වගබලා ගත යුතුය. හදිසියේ සිදුවන අලාභ හානි කිසිවක් වෙතොත් එය අදාළ ආයතනයට නොපමාව වාර්තා කළ යුතු අතර වාර්තාවේ පිටපතක් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි හරහා පළාත් සර්වේයර් ජනරාල් වෙත යැවිය යුතුය.

ශුද්ධි පත්‍රය

ශුද්ධි පත්‍රය

4 වැනි පරිච්ඡේදය

විකිර්ණ මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	මැනුම් සඳහා කරනු ලබන ඉල්ලීම්	
4.1.	මැනුම් සඳහා කරනු ලබන ඉල්ලීම්	1
4.2.	සර්වේයර් ජනරාල් වෙත ලැබෙන මැනුම් ඉල්ලීම්	1
4.3.	දීස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට ලැබෙන මැනුම් ඉල්ලීම්	1
4.4.	ඉ.කොා.දෙ. මිනින්දෝරුවන් විසින් කළ යුතු මැනුම්	1
	මැනුම් ඉල්ලීම් ක්ෂෙත්‍රයට නිකුත් කිරීම	
4.5.	මැනුම් ඉල්ලීමක් ලද විට දි.මි.කා. ක්‍රියා කළ යුතු ආකාරය	1
4.6.	අමතර මිනින්දෝරුවන් සහ මුදල් යෙදවිය යුතු මැනුම්	2
4.7.	ඉඩම් කට්ටි කැඩීමේ සැලසුම්, ඉඩම් කට්ටි කැඩීම සහ අත්කරගැනීමේ මැනුම් නොපමාව ක්ෂෙත්‍රයට නිකුත් කළ යුතු බව	2
4.8.	අනෙකුත් මැනුම් ඉල්ලීම් වර්ගීකරණය	2
4.9.	මැනුම් ඉල්ලීමේ පිහිටීම සොයා ගත නොහැකිවිට මී.අ.(මූලස්ථාන) ක්‍රියා කළ යුතු ආකාරය	2
4.10.	උපමැනුම් ඉල්ලීම් ලබා ගැනීම	2
	මැනුම් ගාස්තු අය කර ගැනීම	
4.11.	මැනුම් ගාස්තු අය කිරීම	2
	විකිර්ණ මැනුම් වර්ගීකරණය හා සංවිධානය	
4.12.	SRIMS පද්ධතියට දත්ත ඇතුලත් කිරීම	2
4.13.	මැනුම් ඉල්ලීම් අංකය සඳහා දිස්ත්‍රික් උපසර්ග කේත	3
4.14.	මැනුම් ඉල්ලීම් වර්ගීකරණය	4
4.15.	ප්‍රමුඛතාවය අනුව මැනුම් ඉල්ලීම් වර්ගීකරණය	6
4.16.	මැනුම් ඉල්ලීම් වර්ගීකරණය දිස්ත්‍රික් ජ්‍යෙ.මි. අ. විසින් පරීක්ෂා කිරීම	7
4.17.	ප්‍රා. මී. කා. වෙත මැනුම් ඉල්ලීම් යොමු කිරීම	7
4.18.	වැඩ ආරම්භ කළ මැනුම් ඉල්ලීම් පිළිබඳව මිනින්දෝරු අධිකාරිගේ වගකීම	7
4.19.	සංශෝධන සඳහා ක්ෂෙත්‍රයට යවන ලද මැනුම් ඉල්ලීම්	7
4.20.	නිමකළ පිඹුරු සමඟ සියළු ලේඛන දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට යැවිය යුතු බව	8
4.21.	සිතියම් යොමු පත්‍රය සටහන් කිරීම	8
4.22.	ඉඩම පිහිටි ස්ථානය ක්ෂෙත්‍රයේ සොයා ගත නොහැකි විට ක්‍රියා කළ යුතු ආකාරය	8
	කාර්යාලීය පරීක්ෂණය හා අනුගමණය කළ යුතු කරුණු	
4.23.	පරීක්ෂා කළ මැනුම් ඉල්ලීම් සඳහා ලේඛන ඉල්ලුම් කිරීම	8
4.24.	මැනුම් ඉල්ලීම් කීපයක් එක් අවස්ථාවකදී පරීක්ෂා කිරීමට සැලසුම් කිරීම	8
4.25.	විශාල මැනුම් ඉල්ලීම් වලදී ක්‍රියා කළ යුතු ආකාරය	8
4.26.	පැරණි පිඹුරු සහ ඉ.වි.ලැ. DMS දත්ත පද්ධතියෙන් ලබා ගැනීම	8
4.27.	L 96 සහ L 96A මඟින් ඉඩම් තොරතුරු ලබා ගැනීම	9
4.28.	SRIMS දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම	9

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
4.29.	මැනුම සඳහා ඇස්තමේන්තුගත කාලය වෙනස් වීම	9
4.30.	එක් එක් මැනුම් කටයුතු ඉටු කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබාදීම	9
	ක්ෂේත්‍ර වැඩ සහ පිඹුරු වැඩ සඳහා වැදගත් වන කරුණු	
4.31.	ඉඩම් එළිකිරීමේදී සැලකිය යුතු කරුණු	9
4.32.	බෙදා වෙන් කිරීම පිණිස නිර්දේශ කර ඇති ඉඩම් මැනීම	9
4.33.	නිරවුල් නොකරන ලද ඉඩම්වල මායිම් මැනීම	9
4.34.	බිම් ප්‍රමාණයන් නියමිත කර ඇති විට සීමාවන්	10
4.35.	අළුත් මැනුමට ඇතුලත් වන කුඩා බිම් ප්‍රමාණ සහිත රජයේ ඉඩම්	10
4.36.	අ.ග.පි. ප්‍රදේශ තුල හෙක්ටයාර් 1ට අඩු ඉතිරි බිම් ප්‍රදේශ සම්බන්ධව කටයුතු කිරීම	10
4.37.	වෙන්වී ගිය කැබැල්ල	10
4.38.	දිය පාරක පරණ හා අළුත් මැනුම්වල කුඩා වෙනස්කම් ඇතිවිට	10
4.39.	ස්වාභාවික හේතූන් නිසා වන ගොඩබිම් පිළිබඳ ආඥා පනත	10
4.40.	රක්ෂිත සහිත ප්‍රදේශවල මැනුම්වලදී විශේෂ අවධානයක් යොමු කිරීම	10
4.41.	ගම් පිඹුරු, හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර, රේඛා චිත්‍ර පිඹුරු හා ඉංජිනේරු මැනුම් පිඹුරු සහිත ප්‍රදේශ තුල හෝ යාබදව කරන අළුත් මැනුම් ඇතුලත් කිරීම	10
4.42.	හිමිකම් පිඹුරුවල අනුරේඛන සහ තොරතුරු දැනගැනීම සඳහා කරන ඉල්ලීම්	10
4.43.	1910ට පෙර කරන ලද මූලික පිඹුරු සම්බන්ධව කටයුතු කිරීම	11
4.44.	මුඩුබිම් ආඥා පනත, අවසාන නැතහොත් නිරවුල් කිරීමේ නියෝගයකට ඇතුලත් බිම් කැබලි සම්බන්ධව කටයුතු කිරීම	11
4.45.	භුක්ති අවසර පත්‍රයක් මත ලබාගෙන ඇති ඉඩම් සම්බන්ධව කටයුතු කිරීම	11
4.46.	බදුකර පිඹුරු සහ බදුකර රේඛා චිත්‍ර නිකුත් කරන ලද බිම් කැබලි සම්බන්ධයෙන් කටයුතු කිරීම	11
4.47.	මැනුම් කටයුතු කළ ප්‍රදේශය අනුව අවසන් විස්තර ලබා ගැනීම	11
	අධීක්ෂණ කටයුතු	
4.48.	විකිර්ණ මැනුම්වල නිරත මිනින්දෝරුවරුන් අධීක්ෂණය කිරීම	12
	ක්ෂේත්‍ර වැඩ, පිඹුරු වැඩ සහ ඉඩම් විස්තර ලැයිස්තු	
4.49.	ඉඩම් විස්තර ලැයිස්තු ලිවීම	12
	බිම් ප්‍රමාණ ගණන් බැලීම	
4.50.	බිම් ප්‍රමාණ ආගණනය කිරීම	13
	අධිස්ථාපනය කිරීම	
4.51.	මායිම් අධිස්ථාපනය	13
	පැරණි මැනුම් ප්‍රදේශයන් තුල අළුත් මැනුම් සිදුකිරීම	
4.52.	මායිම්ගල් යෙදූ මූලික පිඹුරු තුල අළුත් මැනුම්	13
	ක්ෂේත්‍රයේ බිම් කැබලි නැවත හඳුනාගැනීම	
4.53.	හඳුනාගත් බිම් කැබලිවල පිඹුරු වැඩ	13
	අත්කර ගැනීමේ මැනුම්	
4.54.	අ.ග.පි / අ.භූ.පි. ප්‍රදේශවල අත්කර ගැනීමේ මැනුම්	13
	ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතට යටත් කළ ඉඩම්	
4.55.	ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ ඉඩම් මැනීම	14
	ජාතික සිතියම් යොමුව	
4.56.	යොමු පත්‍ර අංකය යෙදීම	14

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	මිනින්දෝරුවරයාගේ අවධානය යොමුවිය යුතු කරුණු	
4.57.	පිඹුරුවල භාවිතා කරන භාෂාව	14
4.58.	මැනුම් ඉල්ලීමක් අවසන් කළ විට යොදන සටහන	14
4.59.	මැනීම සහ ඇඳීම පිළිබඳව පිඹුරේ සහ ඉ.වි.ලැ. හි මිනින්දෝරුවරයාගේ අත්සන යෙදීම	15
	පිඹුරු අත්සන් කිරීම	
4.60.	මී.අ. විසින් පිඹුරු අත්සන් කිරීම	15
4.61.	ජේ‍ය.මී.අ. විසින් පිඹුරු අත්සන් කිරීම	16
4.62.	පිඹුර දෝෂ සහිතව පිළියෙල කර ඇතිවිට ගතයුතු ක්‍රියාමාර්ග	16
	යොමු පත්‍ර (Key Sheet)	
4.63.	යොමු රේඛා චිත්‍රය සංශෝධනය කිරීම	16
	පැරණි ලේඛන සංශෝධනය කිරීම	
4.64.	පැරණි ලේඛන සංශෝධනය කිරීම	17
4.65.	විවිධ වර්ගවල පිඹුරු සංශෝධනය කරන ආකාරය	17
	සංශෝධන සහ තහනම් කිරීමේ අනුරේඛන	
4.66.	සංශෝධන/ තහනම් කිරීමේ අනුරේඛන වල ඇතුලත් විය යුතු කරුණු	18
4.67.	දම්වැල් 16 රේඛා චිත්‍ර සංශෝධන අනුරේඛන වල ඇතුලත් විය යුතු කරුණු	18
4.68.	සංශෝධන සහ තහනම් කිරීමේ අනුරේඛන ස.ජ.කා. වෙත යැවීම	19
	පැරණි මැනුම් තුල නව මැනුම් සිදුකිරීමේදී වැදගත් වන කරුණු	
4.69.	මායිම්ගල් නොයෙදූ මූලික පිඹුරු හෝ මූලික පිඹුරු කැබලි තුල අළුත් මැනුම්	19
4.70.	එක් එක් ගම සඳහා වෙන වෙනම අතුරු/ අතිරේක පිඹුරු පිළියෙල කිරීම	19
4.71.	අ.භූ.පි. තුල රජය සතු ඉඩම් සඳහා අළුත් මැනුමක් කර අතුරු පිඹුරක් පිළියෙල කිරීම	19
4.72.	අ.ග.පි. තුල සෑම මැනුමක් සඳහාම අතිරේකයක් පිළියෙල කළ යුතු බව	19
4.73.	දි. මී. කා. තුල පැරණි පිඹුරු සංශෝධනය කිරීමේ වගකීම	19
4.74.	පිටපත් නිකුත්කළ ව්‍යවස්ථාපිත පිඹුරක් සංශෝධනය කිරීම	19
	පිඹුරු වල මුද්‍රිත පිටපත් නිකුත් කිරීම	
4.75.	සහතික කරන ලද පිඹුරු පිටපත් ස.ජ. වෙත යැවීම	20
4.76.	අත්කරගැනීමේ පිඹුරු වල පිටපත් යැවීම	20
4.77.	වෙනත් මැනුම් පිඹුරුවල පිටපත් නිකුත් කිරීම	21
4.78.	රජයේ දෙපාර්තමේන්තු සඳහා පිටපත් යැවීම	21
	වනාන්තර මැනුම්	
4.79.	අ.ග.පි. ප්‍රදේශවල වනාන්තර මැනුම්	22
4.80.	අ.භූ.පි. ප්‍රදේශවල වනාන්තර මැනුම්	22
4.81.	අ.ග.පි./ අ.භූ.පි. ප්‍රදේශ පිටස්තර වනාන්තර මැනුම්	22
4.82.	වනාන්තර මැනුම් සඳහා පිඹුරු පත්‍ර	22
4.83.	ලංකා මැනුම්/ භූලක්ෂණාත්මක මූලික පිඹුරු තුලට ඇතුලත් වන වනාන්තර මැනුම්	22
4.84.	වනාන්තර මැනුම් තුල අනවසර අල්ලා ගැනීම් පිළිබඳව කටයුතු කිරීම	22
4.85.	විවිධ වර්ගයේ ප්‍රදේශ තුලට කොටස් වශයෙන් වනාන්තර මැනුම් ඇතුලත් වන විට	22
4.86.	රක්ෂිත වනාන්තර ප්‍රදේශයකට හෝ යෝජිත රක්ෂිත වනාන්තර ප්‍රදේශයකට වෙනම පිඹුරක් පිළියෙල කිරීම	22
4.87.	අවසාන නිරවුල් කළ මූලික පිඹුරුවල කැබලි අංක යෙදීම	23

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	මැනුම් වාර්තා ආකෘති පත්‍ර	
4.88.	විකිර්ණ මැනුම් සඳහා විවිධ වර්ගයේ වාර්තා	23
4.89.	මිනින්දෝරුවරුන් විසින් මැනුම් වාර්තා සම්පූර්ණ කිරීම	23
4.90.	මිනින්දෝරු අධිකාරින් විසින් මැනුම් වාර්තා පරීක්ෂා කිරීම	23
4.91.	දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී මැනුම් වාර්තාව සම්පූර්ණ කිරීම	24
	ලිපිගොනු විනාශ කිරීම	
4.92.	මැනුම් ඉල්ලීම් ගොනු විනාශ කිරීම	24
	මැනුම් ඉල්ලීම් පිළිබඳ උප ලේඛනය	
4.93.	මිනින්දෝරුවන් විසින් පවත්වා ගත යුතු මැනුම් ඉල්ලීම් උපලේඛනය	24
4.94.	සියළුම මැනුම් ඉල්ලීම් සඳහා එක් උපලේඛනයක් භාවිතා කළ යුතු බව	24
4.95.	මැනුම් ඉල්ලීම් සම්මත කළ පසු උපලේඛනයේ ඇතුලත් කිරීම	24
4.96.	මැනුම් ඉල්ලීම් උපලේඛනයේ මුල් සටහන් වෙනස් නොකළ යුතු බව	25
4.97.	මිනින්දෝරු අධිකාරිට මැනුම් ඉල්ලීම් උපලේඛනය ඉදිරිපත් කිරීම	25
4.98.	දිස්ත්‍රික් කාර්යාලයේදී මැනුම් ඉල්ලීම් උපලේඛනය පවත්වා ගැනීම	25
4.99.	මී. අ. විසින් උපලේඛනයේ තොරතුරු මත දී. මී. කා. වෙත වාර්තා එවීම	25
4.100.	පිටපත් නිකුත් කිරීම සඳහා වෙන වෙනම ලේඛන පවත්වා ගත යුතු බව	25
	මිනින්දෝරුවරයාගේ වාර්තාව	
4.101.	මිනින්දෝරු වාර්තාවේ උද්ධෘතයක් යැවිය යුතු බව	25
	ලේඛන විධිමත්ව ගොනු කර තැබීම	
4.102.	සියළු ලේඛන දී. මී. කා. හි ගොනුකර තැබිය යුතු බව	26
4.103.	සියළු ව්‍යවස්ථාපිත පිඹුරු වල සහතික පිටපත් ලේ.ක. හා වෘ.ප්‍ර (ස. ජ. කා.) හි ගොනුකර තැබිය යුතු බව	26
4.104.	අ.ජ.පි./ අ.න.පි./ වා.මැ.මූ.පි./ වනාන්තර මැනුම් මූ.පි යනාදිය සිදු නොකරන බව	26
	ඇමුණුම්	
ඇමුණුම 01	ඉ.සං.ආ යටතේ දීමනාපත්‍ර ලබාදීමට සිදුකරන මැනුම් සඳහා ඉඩම් බෙදාදීම	27

4 වැනි පරිච්ඡේදය

විකිර්ණ මැනුම්

මැනුම් සඳහා කරනු ලබන ඉල්ලීම්

4.1 ප්‍රාදේශීය ලේකම් විසින් තම මැනුම් අවශ්‍යතාවයන් සඳහා මැනුම් ඉල්ලීම් අදාළ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යවනු ලැබේ. වෙනත් රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ ආයතන සහ දිස්ත්‍රික් උසාවි විසින්ද තම මැනුම් අවශ්‍යතාවයන් සඳහා මැනුම් ඉල්ලීම් අදාළ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යවනු ලැබේ.

4.2 වෙනත් රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ ආයතන සහ දිස්ත්‍රික් උසාවි විසින් මැනුම් සඳහා කරන ඉල්ලීම් සර්වේයර් ජනරාල් වෙත ලැබුන හොත් ඒවා අදාළ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යවනු ලැබේ. විශේෂ ව්‍යාපෘති සඳහා මැනුම් සාමාන්‍යයෙන් සර්වේයර් ජනරාල් වෙත ලැබෙන අතර අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර) විසින් අවශ්‍ය උපදෙස් සමඟ අදාළ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යවනු ලැබේ.

4.3 මැනුම් ඉල්ලීමක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත ලැබුනු පසුව එය අපහසුතාවයකින් තොරව ඉටුකළ හැකි ඉල්ලීමක්ද, අවශ්‍ය තොරතුරු අමුණා තිබේද යන්න හා එහි අඩුපාඩු නොමැති බව පරීක්ෂාකර බැලිය යුතුය. අඩුපාඩු තිබේ නම් එම අඩුපාඩු සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය කටයුතු කිරීම හෝ ඉල්ලුම්කරු වෙත ආපසු යැවීම කළ යුතුය.

4.4 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් මඟින් පහත සඳහන් මැනුම් කරවා ගැනීමට අපේක්ෂා කෙරේ.

a. අනවසරයෙන් අල්ලාගෙන ඇති රජයේ ඉඩම් බෙදාදීමට නියමානුකූල කිරීම සඳහා කරනු ලබන මැනුම්
b. කට්ටි කැඩීමේ සැලසුම් පිළියෙල කිරීම සඳහා කරනු ලබන මැනුම්
c. කුඤ්ඤ ගැසීම සඳහා කරනු ලබන මැනුම්
d. රජයේ ඉඩම් හඳුනාගැනීම සඳහා කරනු ලබන මැනුම්
e. දීමනා පත්‍ර නිකුත් කර ඇති ඉඩම් වල මායිම් ගැටළු සම්බන්ධයෙන් කරනු ලබන මැනුම්

කෙසේ නමුත්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර නොමැති අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් විසින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයා වෙත ඉල්ලීම් කළ විට එවැනි මැනුම් කටයුතු සඳහා ලැබෙන ඉල්ලීම්ද ඉටු කළ යුතුය.

මැනුම් ඉල්ලීම් ක්ෂේත්‍රයට නිකුත් කිරීම

4.5 මැනුම් ඉල්ලීමක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත ලැබුනු වහාම එය ක්‍රියාත්මක කළ හැකි එකක් නම් ඉල්ලුම්කරු හා ඉල්ලුම්කරුගේ ලිපි යොමුව ද ඇතුළුව එහි සඳහන් තොරතුරු අදාළ පරිදි මැනුම් ඉල්ලීම් දත්ත පද්ධතිය (SRIMS) ට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. ඉන්පසු එම මැනුම සඳහා මැනුම් ගාස්තු අය කළ යුතුද යන්න පරීක්ෂාකර බලා එය මැනුම් ගාස්තු අයකළ යුතු මැනුම් ඉල්ලීමක් නම් අදාළ ඇස්තමේන්තුව 4.11 ඡේදය අනුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අදාළ මුදල් මැනීම ආරම්භ කිරීමට පෙර ගෙවිය යුතු බව මැනුම් ඉල්ලීම ඉදිරිපත් කළ දෙපාර්තමේන්තුව හෝ ආයතනය වෙත දන්වා යැවිය යුතුය. අවශ්‍ය නම් පිටපත් අදාළ පාර්ශවයන්ටද යැවිය යුතුය.

දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට මැනුම් ගාස්තුව තැන්පත් කරන තුරු මෙම මැනුම් ඉල්ලීම සම්බන්ධව වැඩිදුර ක්‍රියා නොකළ යුතු අතර ගෙවීම් ලද පසු 4.12 ඡේදය අනුව ක්‍රියාකර, හැකි ඉක්මනින් මැනුම් කටයුතු ආරම්භ කිරීම සඳහා ක්ෂේත්‍රයට යැවිය යුතුය.

4.6 කිසියම් මැනුම් ඉල්ලීමක් ඉටුකිරීම සඳහා අමතර මිනින්දෝරුවරුන්, මුදල්, වාහන වැනි සම්පත් අවශ්‍ය වේ නම් හෝ සීමිත කාලයක් තුල කඩිනමින් නිමකිරීමට සිදුව ඇත්නම්, එය ඉටුකිරීමට සුදුසු යෝජනා හෝ වෙනත් විකල්ප යෝජනා හේතු සහිතව අදාළ පළාත් සර්වේයර් ජනරාල් වෙත යොමු කළ යුතුය.

4.7. අත්කරගැනීමේ මැනුම් ඉල්ලීම්, ඉඩම් කට්ටි කැඩීමේ සැලසුම් සකස් කිරීමේ මැනුම් ඉල්ලීම් සහ ඉඩම් කට්ටි කැඩීමේ මැනුම් නිසි පරිදි ලේඛන ගතකිරීමෙන් පසු කෙලින්ම අදාළ ප්‍රාදේශීය මිනිදෝරු කාර්යාලය වෙත හැකි ඉක්මනින්ම නිකුත් කළ යුතු වේ.

4.8. අනිකුත් මැනුම් ඉල්ලීම් මූලස්ථාන මිනින්දෝරු අධිකාරි විසින් වර්ගීකරණය කළ යුතු අතර ඒවායේ පිහිටීම, අදාළ දම්වැල් 16 රේඛා චිත්‍ර හෝ 1:10,000 සිතියම, 4x2.5 කි.මී. මෙට්‍රික් යොමු පත්‍රය, අ.ග.පි. හෝ අ.භූ.පි. තුල සොයා, මැනුම් ඉල්ලීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය ලේඛනවල ලැයිස්තුවක් පිළියෙල කර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත දින 03ක් ඇතුලත භාර දිය යුතුය.

4.9. මූලස්ථාන මිනින්දෝරු අධිකාරිවරයාට, අදාළ මැනුම් ඉල්ලීමේ පිහිටීම සොයාගැනීමට හෝ ලේඛන ලැයිස්තුවක් පිළියෙල කළ නොහැකි නම් ඔහු විසින් එය දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත වාර්තා කළ යුතුය. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් එම මැනුම් ඉල්ලීමට අදාළ උපදෙස් සමඟ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය භාර මිනින්දෝරු අධිකාරිවරයාට නිකුත් කළ යුතුය.

4.10. ක්ෂෙත්‍රයට නිකුත් කරන ලද මැනුම් ඉල්ලීමක් සඳහා උප මැනුම් ඉල්ලීමක් ඉල්ලුම් කිරීමේදී එම උප මැනුම් ඉල්ලීමෙන් ආවරණය කිරීමට අපේක්ෂා කරන මුල් මැනුම් ඉල්ලීමේ කැබලි ගණන, ඇස්තමේන්තු වැඩ ප්‍රමාණය සහ බිම් ප්‍රමාණය සඳහන් කළ යුතුය. ඒ අනුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් උප මැනුම් ඉල්ලීමක් නිකුත් කිරීමේදී එම ඉල්ලීම SRIMS පද්ධතියට ඇතුලත් කර පද්ධතිය මඟින් ජනනය (System generated) වන නව මැනුම් ඉල්ලීමක් ලෙස උප මැනුම් ඉල්ලීම අදාළ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය වෙත යොමු කළ යුතුය. SRIMS පද්ධතියේ මුල් මැනුම් තොරතුරු වල කැබලි ගණන, ඇස්තමේන්තු වැඩ ප්‍රමාණය සහ බිම් ප්‍රමාණය මෙන්ම වෙනත් කිවයුතු කරුණු තීරයේ උප මැනුම් ඉල්ලීම් අංකය නිකුත් කළ බවට හරස් සටහන් යෙදීමත්, ඒ සමඟම නව මැනුම් ඉල්ලීම් පෝරමයේ වෙනත් කිවයුතු කරුණු තීරයේ මුල් මැනුමේ අංකය සටහන් කිරීමත් කළ යුතුය.

මැනුම් ගාස්තු අය කර ගැනීම

4.11 මැනුම් ගාස්තු තීරණය කළ යුතු වන්නේ සර්වේයර් ජනරාල් විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ වලට අනුකූලවය. කිසියම් විශේෂ අවස්ථාවකදී ගාස්තු තීරණය කිරීම ගැටළු සහගත වුවහොත් ඒ සම්බන්ධයෙන් අදාළ ප.ස.ජ. මඟින් අති .ස.ජ. (ක්ෂෙත්‍ර) වෙත වාර්තා කොට අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය.

විකිරණ මැනුම් වර්ගීකරණය හා සංවිධානය

4.12 මැනුම් ගාස්තු අය නොකළ යුතු මැනුම් ඉල්ලීම්/මැනුම් ගාස්තු අය කළ යුතු මැනුම් ඉල්ලීම් පිළිබඳ සියළු තොරතුරු SRIMS පද්ධතියට ඇතුලත් කළ විට, එම පද්ධතියෙන් ජනනය වන අංකය, මැනුම් ඉල්ලීමේ අංකය ලෙස භාවිතා කළ යුතුය. මැනුම් ඉල්ලීමක් SRIMS පද්ධතියට ඇතුලත් කිරීමේදී ම එහි වර්ගය 4.14 ඡේදයට අනුකූලවද ප්‍රමුඛතාවය 4.15 ඡේදයට අනුකූලවද තෝරා ගත යුතුය.

සියළු මැනුම් ඉල්ලීම් අදාළ ප්‍රාදේශීය කාර්යාලයන්ට SRIMS මඟින් යොමු කළ යුතුය. කෙසේ වුවද, ඒවායේ දෘඩ පිටපත් SRIMS තුලින් ජනනය වන ආවරණ ලිපිය සමඟ ප්‍රාදේශීය කාර්යාලයටද, ආවරණ ලිපියේ පිටපත් අදාළ ආයතනයන්ටද තැපැල් කළ යුතුය.

දිස්ත්‍රික් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන මැනුම් ඉල්ලීම් ලේඛනයේද SRIMS පද්ධතියෙන් ජනනය වන මෙම මැනුම් ඉල්ලීම් අංකයම ස.ජ.ගේ අංකය ලෙස හා අදාළ තොරතුරු සමඟ සටහන් කර යාවත්කාලීන කළ යුතුය.

4.13 මෙම මැනුම් ඉල්ලීමේ අංකය දිස්ත්‍රික් කේතය / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කේතය/ නිකුත්කළ වර්ෂය/ අනුක්‍රමික අංකය සහිතව SRIMS පද්ධතියෙන් පිළියෙල වනු ඇත. දිස්ත්‍රික් හා ප්‍රා.ලේ. කේතයන් සඳහා ඉංග්‍රීසි අක්ෂර පමණක් භාවිතා කළ යුතුය.
උදා - MA/ RAT/ 2011/180 (දිස්ත්‍රික්කය - මාතලේ, ප්‍රා.ලේ.කොට්ඨාශය - රත්තොට)

එක් එක් දිස්ත්‍රික්ක මඟින් පිළියෙල කරනු ලබන මූලික පිඹුරු සඳහා මූලික පිඹුරු අංකය දිස්ත්‍රික් උපසර්ගය සමඟ යෙදිය යුතුය. දිස්ත්‍රික් උපසර්ග ලෙස පහත කේත යොදා ගත යුතු අතර මෙම කේතයන් ලිවීමේදී සිංහල අක්ෂර පමණක් භාවිතා කළ යුතුය. උදා: යාපනය - යා 1358 .

SRIMS දත්ත පද්ධතියට මූලික පිඹුරු අංක යෙදීම සඳහා ඉංග්‍රීසි කැපිටල් අක්ෂර පහත පරිදි යොදා ගත යුතුය. උදා: යාපනය - YA 1358.

පළාත	දිස්ත්‍රික්කය	මැනුම් ඉල්ලීම් සඳහා දිස්ත්‍රික් කේත	මූලික පිඹුරු සඳහා දිස්ත්‍රික් කේත	
බස්නාහිර	කොළඹ	CO	කො	CO
	කළුතර	KA	ක	KA
	ගම්පහ	GA	ගම්	GAM
වයඹ	කුරුණෑගල	KU	කු	KU
	පුත්තලම	PU	පු	PU
උතුර	යාපනය	YA	යා	YA
	වවුනියාව	VA	ව	VA
	මන්නාරම	MA	මන්	MAN
	මුලතිව්	MUL	මු	MU
	කිලිනොච්චි	KI	කි	KI
උතුරු මැද	අනුරාධපුරය	AA	අ	AA
	පොලොන්නරුව	PO	පො	PO
මධ්‍යම	මහනුවර	MAHA	මහ	MAHA
	මාතලේ	MA	මා	MA
	නුවරඑලිය	NU	නු	NU
නැගෙනහිර	ත්‍රිකුණාමලය	TRI	ත්‍රි	TRI
	මඩකළපුව	BT	මඩ	MADA
	අම්පාර	AM	අම්	AM
දකුණ	ගාල්ල	GA	ගා	GA
	මාතර	MA	මාර	MA
	හම්බන්තොට	HA	හ	HA

සබරගමුව	කෑගල්ල	KE	කෑ	KE
	රත්නපුර	R	ර	R
ඌව	බදුල්ල	B	බ	B
	මොණරාගල	MO	මො	MO

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අංක කේතයද අනන්‍ය වන පරිදි SRIMS දත්ත පද්ධතියෙන් නිකුත් කරනු ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක නම වෙනස් කිරීමක් සිදුවුවහොත් හෝ නව කොට්ඨාශයක් ස්ථාපනය කළහොත් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් SRIMS දත්ත පද්ධතිය යථාවත් කිරීමට ඒ බව තොරතුරු තාක්ෂණ අංශයට ලිඛිතව දැන්විය යුතුය.

දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් නිකුත් කරනු ලබන මැනුම් ඉල්ලීම් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කේත අංකය වෙනුවට SRIMS හි DSO ලෙස මැනුම් ඉල්ලීම් අංකයට භාවිතා කළ යුතුය.

උදා: MO/DSO/2018/125 (මොනරාගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය මඟින් 2018 වසරේ නිකුත් කරන ලද 125 වැනි මැනුම් ඉල්ලීම)

4.14 විවිධ වාර්තාවල මැනුම් ප්‍රගතිය වාර්තා කිරීම සඳහා පහත පරිදි මැනුම් ඉල්ලීම් ප්‍රධාන කාණ්ඩ 08 කට වෙන්කර ඇත. ඒ අනුව මැනුම ඇතුලත් වන මැනුම් උප කාණ්ඩය මැනුම් ඉල්ලීමේ සඳහන් කළ යුතුය.

ප්‍රධාන කාණ්ඩය	**උප කාණ්ඩය**	**හඳුනාගැනීමේ විස්තරය**
2. මායිම්ගල් දමා මැනීම	2.1	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දීමනා පත්‍ර ලබාදීම
	2.2	ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් පැවරීම
	2.3	ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ දීමනාපත්‍ර ලබාදීම
	2.4	විවිධ වර්ගවල අන්සතු කිරීම සඳහා මායිම්ගල් දමා මැනීම
	2.5	ඉ.ප්‍ර.කොා. සඳහා ව්‍යවස්ථාපිත නිශ්චය
	2.6	ජනාවාස පිහිටුවීමට මායිම්ගල් දමා මැනීම
	2.7	කුඹුරු සහ ගෙවතු මායිම්ගල් දමා මැනීම
	2.8	මායිම් නියම කිරීමේ මැනුම්
	2.9	වනාන්තර මායිම්ගල් දමා මැනීම
	2.10	වතු වගාවන් මායිම්ගල් දමා මැනීම
	2.11	සභාධිපත්‍ය මැනුම්

ප්‍රධාන කාණ්ඩය	උප කාණ්ඩය	හඳුනාගැනීමේ විස්තරය
2. මායිම්ගල් දමා මැනීම	2.12	මායිම්ගල් දමා වට මැනීම
	2.13	මායිම්ගල් දමා මායිම් නැවත පිහිටුවීම
	2.14	මායිම්ගල් දමා මැනීම- වෙනත් විවිධ වර්ගවල
3. විවිධ වර්ගවල මැනුම්	3.1	රජයේ ඉඩම් ගෙවතු- අන්සතු කිරීම සඳහා කුඤ්ඤ දමා මැනීම
	3.2	රජයේ ඉඩම් කුඹුරු- අන්සතු කිරීම සඳහා කුඤ්ඤ දමා මැනීම
	3.3	වනාන්තර මැනීම (මායිම්ගල්/සමෝච්ඡ රේඛා රහිතව)
	3.4	නගර මැනීම (මායිම්ගල්/සමෝච්ඡ රේඛා රහිතව)
	3.5	වට මැනීම (මායිම්ගල් රහිතව)
	3.6	ඉඩම් කට්ටි කැඩීම් සැලැස්ම පිළියෙල කිරීම
	3.7	උපරිම ජල මට්ටමේ පිහිටීම සලකුණු කිරීම
	3.8	ජනාවාස පිහිටුවීමට කුඤ්ඤ දමා මැනීම (මහවැලි)
	3.9	ජනාවාස පිහිටුවීමට අදාළ වෙනත් මැනුම් (මහවැලි)
	3.10	කුඹුරු සහ ගෙවතු සඳහා කුඤ්ඤ දමා මැනීම (මහවැලි)
	3.11	කුඹුරු සහ ගෙවතු පිහිටුවීමට අදාළ වෙනත් මැනුම් (මහවැලි)
	3.12	පවතින තත්වය පෙන්නුම් කිරීම සඳහා මැනීම (පිහිටීම මැනීම)
	3.13	පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු
	3.14	අනෙකුත් විවිධ වර්ගවල මැනුම්
4. අත්කරගැනීමේ මැනුම්	4.1	2 වන වගන්තිය යටතේ (මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා නොවන)
	4.2	6 වන වගන්තිය යටතේ (මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා නොවන)
	4.3	2 වන වගන්තිය යටතේ (මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා)
	4.4	6 වන වගන්තිය යටතේ (මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා)

ප්‍රධාන කාණ්ඩය	උප කාණ්ඩය	හඳුනාගැනීමේ විස්තරය
5. ඉංජිනේරු මැනුම්	5.1	විස්තර හා සමෝච්ඡ රේඛා මැනුම් (ඉංජිනේරු මැනුම්)
	5.2	ඇළ මාර්ග හඳුනාගැනීමේ මැනුම් (තීරු මැනුම්)
	5.3	අවසාන ඇළ මාර්ග පිහිටුවීමේ මැනුම් (මධ්‍ය රේඛා පිහිටුවීමේ මැනුම්)
	5.4	මාර්ග මැනුම් (තීරු සහ විශාල තීරු මැනුම්)
	5.5	ඇළ මාර්ග පිහිටුවීමේ මැනුම්
	5.6	සමීප සමෝච්ඡ රේඛා මැනුම්
	5.7	සමෝච්ඡ රේඛා සහිතව නගර මැනීම
	5.8	පවතින/ පිහිටි මාර්ග මැනීම
6. සිතියම්කරණය	6.1	සිතියම් පුනරීක්ෂණය
7. අධිකාරි පත්‍ර (උසාවිකොමිෂන්) මැනුම්	7.1	අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම්
8 කැඩැස්තර මැනුම්	8.1	හිමිකම් ලියාපදිංචිය සඳහා කැඩැස්තර මැනුම්
	8.2	හිමිකම් ලියාපදිංචිය සඳහා කැඩැස්තර මැනුම්වල පසුකාලීන මැනුම්
9. ගෝලීය පිහිටුම් පද්ධති පාලන මැනුම්	9.1	ගෝලීය පිහිටුම් පද්ධති පාලන මැනුම් (බස්නාහිර පළාත, දකුණු පළාත, වයඹ පළාත, මධ්‍යම පළාත, උතුරු පළාත සහ මැනුම් සහ සිතියම්ගත කිරීමේ ආයතනයෙහි භූමිතික අංශය)
	9.2	ගෝලීය පිහිටුම් පද්ධති පාලන ලක්ෂ්‍ය මැනුම් හා මට්ටම් ගැනීම - මැනුම් ලක්ෂ්‍ය තෝරා දළ සටහන් සකස් කිරීම, මැනීම, මට්ටම් ගැනීම ආදිය
	9.3	පූර්ණමාන පරික්‍රමණ / මට්ටම් රේඛා
	9.4	යථාතත්‍ය මට්ටම් ගැනීම

4.15. මැනුම් ඉල්ලීම්වල එහි ප්‍රමුඛතාව අනුව මැනුම් කළ යුතුය. මැනුම් ඉල්ලීම් වර්ගීකරණය මැනුමේ අවශ්‍යතාවය හා ප්‍රමුඛතාවය අනුව සිදු කළ යුතුය. ඒ අනුව සෑම මැනුම් ඉල්ලීමක්ම එක් පන්තියකට වර්ගීකරණය කළ යුතුය.

පන්තිය "අ" වැදගත්, හදිසි සහ මුදල් අය කළ යුතු මැනුම් ඉල්ලීම් මෙම පන්තියට අයත් වේ. ඒවා ලද වහාම නිම කළ යුතුය. වෙනත් මැනුම් ඉල්ලීම්වල වැඩ නවතා හෝ කළ යුතුය. සාමාන්‍ය රීතියක් ලෙස "අ" පන්තියේ මැනුම් ඉල්ලීම් ලැබී මාස 03ක් තුලදී නිම කළ යුතුය.

පන්තිය "ආ" ඉතා කඩිනමින් නිම කිරීමක් අවශ්‍ය නොවන නමුත් අනවශ්‍ය ලෙස පමා නොකළ යුතු මැනුම් ඉල්ලීම් මෙම පන්තියට අයත් වේ. සාමාන්‍ය රීතියක් ලෙස "ආ" පන්තියේ මැනුම් ඉල්ලීම් එය ලැබී මාස 06 ක් තුලදී නිම කළ යුතුය.

පන්තිය "ඇ" මෙම පන්තියට අයත් වන්නේ සාමාන්‍ය පරිදි කරනු ලබන අනිකුත් මැනුම් ඉල්ලීම්ය. "ඇ" පන්තියේ මැනුම් ඉල්ලීම් ලැබී මාස 12 ක් තුලදී නිම කළ යුතුය.

මෙහි 'අ' සහ 'ආ' යටතේ වන මැනුම් ඉල්ලීම්වල දත්ත SRIMS දත්ත පද්ධතියට ඇතුලත් කිරීමේදී 'priority – high' ලෙස තෝරා ගත යුතු අතර 'ඇ' යන්න 'priority – normal' ලෙස තෝරා ගත යුතුය. තවද මැනුම් ඉල්ලීමක් SRIMS හි ඇතුලත් කිරීමේදී එහි කාණ්ඩය, උප කාණ්ඩයද 4.14 ඡේදයට අනුකූලව තෝරා ගත යුතුය.

4.16. අඩුම තරමින් මාස හයකට වරක්වත් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින්, නිමකිරීමට ඉතිරිව ඇති මැනුම් ඉල්ලීම් වල ප්‍රමුඛතාවයේ වර්ගීකරණය පිළිබඳව පරීක්ෂා කර, අවශ්‍ය විට දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්/අදාළ ආයතන සමඟ සාකච්ඡා කර සංශෝධනයන් කළ යුතුය. එම සංශෝධන අනුව SRIMS දත්ත පද්ධතියට අඩංගු කරන ලද තොරතුරු ද යථාවත් කළ යුතුය.

4.17. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ලබා දෙන ලද පහත සඳහන් තොරතුරු සමඟ මැනුම් ඉල්ලීම අදාළ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය භාර මිනින්දෝරු අධිකාරි වෙත නිකුත් කළ යුතුය.

(අ) අවසාන නිරවුල් කළ ප්‍රදේශයකින් පිටත

(i) මූලික පිඹුරක් පිළියෙල කළ යුතු බව හෝ එසේ නැතහොත්,

(ii) පිළියෙල කර ඇති මූලික පිඹුරු කැබලි සංශෝධනය කළ යුතු බව

සහ පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවක් පිළියෙල කළ යුතු බව

(ආ) අවසාන නිරවුල් කළ ප්‍රදේශයක් තුල,

(i) අතිරේකයක් නිකුත් කිරීමට ඇති බව එසේ නැතහොත්,

(ii) පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවක් නිකුත් කළ යුතු බව සහ අ.ග.පි. පත්‍ර අංකයක් සමඟ අ.ග.පි. සංශෝධනයක් කළ යුතු බව

(ඇ) SRIMS හි සඳහන් ඇස්තමේන්තු කාලය වෙනස් විය යුතු නම් සංශෝධනයන් කිරීම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය භාර මිනින්දෝරු අධිකාරිවරයාගේ වගකීමක් වේ.

4.18. ආරම්භ කළ මැනුම් කටයුතු නොපමාව නිම කිරීම පිළිබඳව මිනින්දෝරු අධිකාරි විසින් සොයා බැලිය යුතුය. මිනින්දෝරුවරුන් විසින් වැඩ නිම කර ඇති, එහෙත් සම්මත නොකළ පිඹුරු දිගු කලක් තිස්සේ ලහ තබා ගැනීමට සහ අර්ධ වශයෙන් අවසන් කළ වැඩ එක්රැස් කර ගැනීමට ඉඩ නොදිය යුතුය.

4.19. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පෙන්වා දෙනු ලබන සංශෝධන සඳහන් පිඹුරු, දිස්ත්‍රික් කාර්යාලයෙන් ප්‍රාදේශීය කාර්යාලයට යොමු කිරීමේදී ඒ බව SRIMS පද්ධතියට ඇතුලත් කළ යුතු අතර, එම මැනුම් ඉල්ලීම ආපසු ක්ෂේත්‍රයට ලැබී සති 2 ක් ඇතුලත නිමකර මිනින්දෝරු අධිකාරි විසින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත භාරදිය යුතුය. විශේෂම හේතුවක් හෝ නොවැලැක්විය හැකි හේතුවක් නිසා හෝ හැර වෙන කරුණක් හේතුවෙන් එම සංශෝධන නිම කර යැවීමට සති 2 ක කාලය නොඉක්මවන බවට මිනින්දෝරු අධිකාරි වගබලා ගත යුතුය. ඉඩම් විස්තර ලැයිස්තුවේ සංශෝධන වෙනම් TLDMS පද්ධතිය තුලින්ම සංශෝධන සඳහා හරවා යැවිය යුතුය.

4.20. මැනුම් ඉල්ලීමක් ක්‍රියාත්මක කර අවසන් කිරීමෙන් පසු පිළියෙල කරන ලද පිඹුර සමඟ අදාළ පැරණි ලේඛන සහ ක්ෂෙත්‍ර පොත් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට ආපසු භාරදිය යුතුය. කෙසේ වෙතත් තමා ලඟ ඇති වෙනත් වැඩ සඳහා අවශ්‍ය පැරණි ලේඛන තව දුරටත් මිනින්දෝරුවරයා භාරයේ තබා ගත හැක.

4.21. මැනුම් ඉල්ලීමේ සඳහන් ඉඩමේ පිහිටීමට අදාළ 1:50,000 සිතියමෙහි, 1:10,000 සිතියම් පත්‍ර කොටු අංකය සටහන් කළ යුතුය. ඉන්පසු 1:10,000 සිතියම් පත්‍ර කොටුව 4 ට බෙදා ලැබෙන කොටු අංකය යොමු පත්‍ර (මෙට්‍රික් යොමු පත්‍ර අංකය Metric Key Sheet No) අංකය **4.56 ඡේදයෙහි** දක්වා ඇති පරිදි සටහන් කළ යුතුය.

4.22. මැනුම් ඉල්ලීමේ සඳහන් ඉඩම පිහිටි ස්ථානය සොයා ගැනීම අපහසු වූ විට ඒ බව මිනින්දෝරු අධිකාරි (මූලස්ථාන) ට වාර්තා කර ඔහුගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. දැනට මැනුම් සිදුකර අංකිත දත්ත වශයෙන් පවත්වාගෙන යන තොරතුරු ද වෙබ් අඩවිගත කර ඇති ඉඩම් තොරතුරු පද්ධතියෙන් බාගත කර මැනුම් ඉල්ලීමට අදාළ ප්‍රදේශය සොයා ගැනීමේදී භාවිතා කළ හැක. තව දුරටත් අවශ්‍ය නම් පමණක් මිනින්දෝරුවරයකු ක්ෂෙත්‍රයට යවා එහි පිහිටීම සොයා ගැනීමට කටයුතු කළ යුතුය.

කාර්යාලීය පරීක්ෂණය හා අනුගමණය කළ යුතු කරුණු

4.23 මැනුම් ඉල්ලීමක් මැනුම් කටයුතු සඳහා ලැබුනු පසුව මිනින්දෝරුවරයා විසින් එම මැනුම පිහිටි ස්ථානය දම්වැල් 16 රේඛා චිත්‍රයේ හෝ 1:10,000 පත්‍රයේ නිවැරදිව සොයා ගත යුතුය. එම මැනුම අවසාන ගම් පිඹුරකින් (අ.ග.පි.) පිටතට වැටේ නම් අවශ්‍ය සියළුම ක්ෂෙත්‍ර පත් නිවැරදිව හඳුනාගත යුතුය. අ.ග.පි. හෝ අ.භූ.පි. ප්‍රදේශයක් තුල මැනුම් කටයුතු කරන විට මිනින්දෝරුවරයා විසින් අ.ග.පි. හෝ අ.භූ.පි. ඉඩම් විස්තර ලැයිස්තු හා අවසාන වාර්තාද අදාළ ගමේ අ.ග.පි. හා අ.භූ.පි. පත්‍රද මැනුමට අවශ්‍ය වන ක්ෂෙත්‍ර පොත් පමණක් ලබාගත යුතු අතර අදාළ ක්ෂෙත්‍ර පොත් හඳුනා ගැනීමෙන් පසු ඒවා පමණක් ඉල්ලුම් කළ යුතුය. ලංකා මැනුම් ක්ෂෙත්‍ර පත්‍රවල පහතින් දක්වා ඇති ක්ෂෙත්‍ර පොත් සියල්ලම ඉල්ලුම් නොකළ යුතුය.

4.24. මිනින්දෝරුවරයෙකු විසින් එකම ප්‍රදේශයක ඇති මැනුම් ඉල්ලීම් කිහිපයක් එක් අවස්ථාවකදී පරීක්ෂා කිරීමට සැලසුම් කර ගත යුතුය.

සටහන : වැඩෙහි යෙදෙන මිනින්දෝරුවරයා විසින් අවශ්‍ය වන වැඩිදුර තොරතුරු මායිම් පෙන්වා දෙන පුද්ගලයා මඟින් හෝ ප්‍රාදේශීය ලේකම් මඟින් හෝ අදාළ දෙපාර්තමේන්තුව මඟින් හෝ ලබා ගත යුතුය.

4.25. වැඩ නිමකිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවන විශාල මැනුම් ඉල්ලීම්වලදී සහ මැනුම භූමියේ විවිධ ස්ථානවලට විසිරී ඇති මැනුම් ඉල්ලීම්වලදී මිනින්දෝරු අධිකාරි සමඟ සාකච්ඡා කර ඒවා සුදුසු පරිදි කුඩා මැනුම් ඉල්ලීම් කීපයකට බෙදා ගත යුතුය.

ඒ සඳහා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත 4.10 ඡේදය පරිදි අදාළ තොරතුරු සමඟ උප මැනුම් ඉල්ලීම් ඉල්ලුම් කළ යුතුය.

4.26. මිනින්දෝරුවරුන් විසින් සෑම මැනුම් ඉල්ලීමකම ක්ෂෙත්‍ර වැඩ ආරම්භ කිරීමට සති දෙකකට පෙර සියළු ලේඛන ලබාගත යුතුය. මේ සඳහා LIS දත්ත පද්ධතිය තුලින් අවශ්‍ය මූලික තොරතුරු සපයා ගැනීමටත්, පරිලෝකනය කරන ලද පැරණි පිඹුරු හා ඉඩම් විස්තර ලැයිස්තු තොරතුරු දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි මඟින් දෙපාර්තමේන්තු නව DMS දත්ත පද්ධතියෙන් ලබා ගැනීමටත් කටයුතු කළ යුතුය. එහි නොමැති පිඹුරුවල අනුරේඛන පමණක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (ලේ.ක. හා වෘ. ප්‍රමිතීන්) වෙතින් ඉල්ලුම් කළ යුතුය.

4.27. මිනින්දෝරුවරයා විසින් පැරණි මූලික පිඹුරු බිම් කැබලිවලට ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර, එල් 96 ආකෘති පත්‍රය මඟින් ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගත යුතු අතර ඒවා ජ්‍යෙෂ්ඨ නි.ස.ජ. (ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන්) වෙතින් ලබාගන්නා ලද එල් 96A විස්තර සමඟ සසඳා බැලිය යුතුය. එම ආකෘති පත්‍ර වල වාර්තා කර ඇති ක්‍රියාමාර්ගයන්හි යම් වෙනසක් ඇත්නම් වහාම ජ්‍යෙෂ්ඨ නි.ස.ජ. (ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන්) වෙත හරි වැරදි බලා ආපසු එවීම සඳහා යැවිය යුතුය. සම්පූර්ණ කරන ලද මැනුම් ඉල්ලීම් ගොනුවට එම ආකෘති පත්‍ර දෙකම ගොනු කළ යුතුය.

අ.ග.පි. ප්‍රදේශයන් සඳහා එල් 96 හි සපයා ඇති තොරතුරු අ.ග.පි. හෝ අ.භූ.පි. සහ ඉඩම් විස්තර ලැයිස්තු සමඟ නොගැලපේ නම් ඒ බවද ඉහත පරිදි ජ්‍යෙෂ්ඨ නි.ස.ජ. (ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන්) වෙත වාර්තා කළ යුතුය.

එල් 96 හි කරුණු පරීක්ෂා කර බැලීමෙන් පසුව මැනුමට යම් කිසි විරුද්ධත්වයක් ප්‍රකාශ කරන බව දැන ගන්නට තිබේ නම් හෝ ලැබී ඇති උපදෙස් ප්‍රමාණවත් නොවේ නම් මිනින්දෝරුවරයා විසින් එම කාරණය සම්බන්ධව උපදෙස් සඳහා මිනින්දෝරු අධිකාරි වෙත වාර්තා කළ යුතුය.

4.28. රජයේ මිනින්දෝරුවරුන් විසින් මැනුම් ඉල්ලීමක් ක්‍රියාත්මක කිරීමේදී කරන ලද වැඩ ප්‍රමාණ සහ අනෙකුත් අදාළ තොරතුරු SRIMS දත්ත පද්ධතියේද සෑම දිනකම යාවත්කාලීන කළ යුතුය.

ප්‍රාදේශීය කාර්යාලය භාර මිනින්දෝරු අධිකාරි විසින් මෙහි නිරවද්‍යතාව නිතිපතා පරීක්ෂා කළ යුතු වන අතර මිනින්දෝරු අධිකාරිගේ පරීක්ෂණවලදී SRIMS හි තොරතුරු අනුව මැනුම් ඉල්ලීම් වල ප්‍රගතිය පසු විපරම් කර යථාවත් කිරීමද කළ යුතුය.

4.29. කිසියම් මැනුම් කටයුත්තක් නිමකිරීමට සාමාන්‍ය ඇස්තමේන්තු ගත කාලයට වඩා වැඩි කාලයක් ගතවී ඇතිවිට මිනින්දෝරු අධිකාරි විසින් පිඹුරු සම්මත කරන අවස්ථාවේ එම ඇස්තමේන්තු ගත කාලය සහ සත්‍ය වශයෙන්ම ගතවූ කාලය අතර වෙනසට හේතු මැනුම් වාර්තාවේ සඳහන් කළ යුතු අතර ඊට සමගාමීව SRIMS හි මැනුම් ඉල්ලීමේ ඇස්තමේන්තු කාලයද යාවත්කාලීන කිරීම අනිවාර්යයෙන් සිදු කළ යුතුය.

4.30. මිනින්දෝරු අධිකාරිවරයා විසින් එක් එක් මැනුම් ඉල්ලීම ඉටු කළ යුතු පිළිවෙල සම්බන්ධව මූලික හා වැදගත් උපදෙස් අදාළ මිනින්දෝරුවරයාට ලිඛිතව ලබා දිය යුතුය. ඊට අමතරව මිනින්දෝරුවරයා අවශ්‍ය අවස්ථාවලදී මිනින්දෝරු අධිකාරිවරයා වෙතින් විස්තරාත්මක උපදෙස් ලබාගත යුතුය. සැලසුම් කළ පරිදි වැඩ වල ප්‍රගතිය තිබේද යන වග දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින්ද සොයා බැලිය යුතුය. මේ සඳහා SRIMS හි තොරතුරු උපයෝගී කර ගත හැක.

ක්ෂේත්‍ර වැඩ සහ පිඹුරු වැඩ සඳහා වැදගත් වන කරුණු

4.31. මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් එළි කිරීම, කුඤ්ඤ දැමීම සහ මායිම්ගල් වැළලීම වැනි කාර්යයන්හි යෙදෙනවිට එම කටයුතු නිවැරදිව කරන බවටත් වගාවන්ට අනවශ්‍ය හානි නොකරන බවටත් ඉඩම් හිමියන්ගේ විරෝධතා නොමැතිව කරන බවටත් මිනින්දෝරුවරයා විසින් වග බලාගත යුතුය. තවද මැනුම්වලට ඇති බාධාවන් අවම කර ගැනීමටත්, ක්ෂේත්‍ර වැඩ ඉක්මන් කිරීමටත් ක්ෂේත්‍රයට අනවශ්‍ය ගමන් අවම කිරීමටත් කටයුතු කළ යුතුය.

4.32. භූමියෙහි මායිම් පෙන්වා දෙනු ලබන ඉඩම, බෙදා වෙන් කිරීම පිණිස නිර්දේශ කර ඇති ඉඩමට වෙනස් බව පැහැදිලිවම පෙනේ නම් එහි මැනුම් කටයුතු සිදු නොකළ යුතුය. එම විෂමතාවය පෙන්වීමට සකස් කරන ලද අනුරේඛනයක් සමඟ මිනින්දෝරුවරයා විසින් වාර්තාවක් පිළියෙල කර මිනින්දෝරු අධිකාරි මඟින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

4.33. නිරවුල් නොකරන ලද හා භූමියෙහි මායිම් නිරූපණය කර නොමැති හෝ ස්වභාවික ලක්ෂණ දිගේ හෝ නොගිය මායිම් හැකි තාක් දුරට ඍජු රේඛා ලෙස සකස් කොට මැනිය යුතුය. මායිම් එසේ

මැනීමට පෙර මිනින්දෝරුවරුන් විසින් ඒ සඳහා ඉඩම් හිමිකම්පාන්නන් එකඟ කර ගැනීමට උත්සාහ කළ යුතුය.

4.34. ඉඩම්වල ප්‍රමාණයන් නියම කර ඇති විට, මායිම් නියම කිරීමේ මැනුම් සඳහා **8.12 ඡේදය** සහ 8.13 ඡේදයද ඉ.සං.ආ යටතේ සිදුකරන මැනුම් සඳහා **ඇමුණුම 01** හි දක්වා ඇති පරිදි ද, අනෙකුත් අවස්ථා සඳහා පහත දක්වා ඇති පරිදි ද ඉඩම් බෙදා වෙන්කළ යුතුය.

4.35. අළුත් මැනීමට සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ අයත්වන හෙක්ටයාර 1 ට හෝ ඊට අඩු රජය සතු කුඩා ඉඩම් නැවත මැනුමකට යටත් නොකර කටයුතු කරගෙන යාමට හැකි වන පරිදි භූමියේ බිම් නිශ්චය කර අවශ්‍ය වෙතොත් රක්ෂිත බිම් කොටස් යොදා කැබලි අංක යෙදිය යුතුය. ඉඩම් විස්තර දත්ත පද්ධතියට තොරතුරු එක් කිරීමේදී "පිඹුර සම්පූර්ණ කිරීම සඳහා කැබලි අංක යොදන ලදී" යන්න තෝරා ගත යුතුය.

4.36. අවසාන ගම් පිඹුරු ප්‍රදේශයකට අයත් වන රජයේ ඉඩමක කොටසක් බෙදා වෙන් කරනු ලබන විට එහි ඉතිරිව තිබෙන ප්‍රදේශය හෙක්ටයාර 1 ක් හෝ ඊට අඩු හෝ වන විටද, එහි මායිම්ගල් නොසිටුවා තිබෙන විටද නැවත මැන භූමියෙහි ලකුණු කර, අවසාන ගම් පිඹුරු ක්ෂේත්‍ර පත්‍රයෙහි ඇඳ දැක්විය යුතුය. එහිදීද ඉඩම් විස්තර දත්ත පද්ධතියේ "පිඹුර සම්පූර්ණ කිරීමට කැබලි අංක යොදන ලදී" යන්න සඳහන් කළ යුතුය. වෙන්කළ බිමක්, මාවතක්, ඇළක් නැතහොත් බෙදා දෙනු නොලබන රජයේ වෙනත් ඉඩමක් වන්නේ නම් ඒවා ශේෂ ප්‍රදේශයට ඇතුලත් නොකළ යුතුය. එසේ නොකළ හැකි විශේෂ අවස්ථාවලදී දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

4.37. අළුත් මැනුමක් නිසා මුල් ඉඩම් කැබැල්ල කැඩී ගියා වුවද, පහසුවෙන්ම අළුත් මැනුමට ඇතුළත් කළ හැකි කැබලි වේ නම් එයට කැබලි අංක යොදා පිඹුර සම්පූර්ණ කර ඉඩම් දත්ත පද්ධතියේ එය 'වෙන්වී ගිය කැබැල්ල' යනුවෙන් තෝරා ගත යුතුය. අවසාන ගම් පිඹුරු ඉඩම් කැබලිවලට හා මායිම්ගල් සිටුවන ලද අවලංගු කළ නොහැකි මූලික පිඹුරු ඉඩම් කැබලිවලට පමණක් මෙම රෙගුලාසිය අදාළ වේ.

4.38. දිය පාරක පරණ මැනුම සහ අළුත් මැනුම් අතර සුළු වෙනසක් ඇතොත් අළුතෙන් මනින ලද මායිම් පිළිගත යුතුය. ගම් පිඹුරක හෝ අවසාන ගම් පිඹුරක මායිම වශයෙන් ඇති දිය පාරකට යාබදව මැනුම් වැඩ ඇතොත් හා දිය පාරේ පරණ හා අළුත් මායිම් එකිනෙකට වෙනස් වුවහොත් ඒවා ඇඳ පෙන්වා පරණ මායිම යොදා ගත යුතුය.

4.39. ස්වාභාවික හේතූන් නිසා ඉඩමක් ගොඩ වී ඇති විටක 1947 රජයේ ඉඩම් ආඥා පනතේ 108 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. එහි උපුටනයක් පහත දක්වා ඇත.

> "ගොඩ බිම් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක වීමට පෙර හෝ පසුව යම් කිසි පැවරුම් මාර්ගයකින් රජය විසින් අභිමත ලෙස ක්‍රියා කරන ලද ඕනෑම ඉඩමක බොර පස් හෝ අනිකුත් ස්වාභාවික හේතූන් නිසා වන ගොඩවීම් හෝ එවැනි ඉඩම් ගොඩබිම් පිළිබඳ හෝ අදාළ වන අයිතිවාසිකම් සියල්ල හා එලෙස සිදුවූ ගොඩවීම රජය සතු වන අතර රජය වෙත පැවරී ඇති බවට මෙයින් දැනුම් දෙනු ලැබේ".

4.40. රක්ෂිත බිම්, යෝජිත රක්ෂිත බිම් හෝ වෙනත් අරමුණු සඳහා වෙන් කර තිබෙන ප්‍රදේශ ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුය. විශේෂ උපදෙස් නොමැතිව මෙම කොටස් අඩංගු මැනුම් ඉල්ලීමක් හා සම්බන්ධ මැනුම් වැඩ නොකළ යුතුය. රක්ෂිත බිම් ප්‍රදේශ සඳහා 10 වැනි පරිච්ඡේදය බලන්න.

4.41. අළුත් මැනුමට ඇතුලත් කර තිබෙන හෝ එයට යාව තිබෙන ගම් පිඹුරු, හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර, රේඛා චිත්‍ර පිඹුරු, බදුකර පිඹුරු හා ඉංජිනේරු මැනුම් පිඹුරු ගැන සොයා බලා ක්‍රියා කළ යුතුය.

4.42. හිමිකම් පිඹුරු වල අනුරේඛන ලබාගැනීම සහ ඒවා හා සම්බන්ධ තොරතුරු දැන ගැනීම සඳහා පරිලෝකනය කරන ලද පැරණි පිඹුරු හා ඉඩම් විස්තර ලැයිස්තු තොරතුරු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි මඟින් දෙපාර්තමේන්තු නව DMS දත්ත පද්ධතියෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එහි

නොමැති පිඹුරුවල අනුරේඛන පමණක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (ලේ.ක. හා වෘ.ප්‍රමිතීන්) වෙතින් ඉල්ලුම් කළ යුතුය.

4.43. වර්ෂ 1910 ට (රජයේ මායිම්ගල් ආඥා පණත වලංගු වූ අවුරුද්දට) පෙර කරන ලද මැනුම් පෙන්නුම් කරන සියළුම මූලික පිඹුරු වලට අයත් ඉඩම්වල විකිණීම හෝ නිරවුල් කිරීම කර නැත්නම් ඒවා අවලංගු කරන ලද පිඹුරු වශයෙන් සැලකිය යුතුය. ඒවා ප්‍රයෝජනයට ගත යුත්තේ කරුණු සොයා බැලීම සඳහා පමණකි. විකුණන ලද හෝ නිරවුල් කරන ලද හෝ ඉඩම් කැබලි පෞද්ගලික ඉඩම් වශයෙන් සැලකිය යුතුය. අවසාන වශයෙන් නොවිකුණා හා නිරවුල් නොකර තිබෙන ඉඩම් කැබලි නැවත මැනිය යුතුය. අවුරුදු 30කට වඩා පැරණි වැවිලි තිබෙන නිරවුල් නොකළ ඉඩම් කැබලි මාර්ග සඳහා වෙන් කළ බිම්වලට අයත් නොවේ නම් පෞද්ගලික ඉඩම් වශයෙන් සැලකිය යුතුය.

4.44. මුඩු බිම් ආඥා පණතට හෝ අවසාන නැතහොත් නිරවුල් කිරීමේ නියෝගයකට හෝ අයත් සෑම ඉඩම් කැබැල්ලකම මුල් ක්ෂෙත්‍ර පත්‍රයෙහි නිල් පාටින් පහත පරිදි යොමු සටහන් යෙදිය යුතුය.

- ❖ අවසාන නියෝගය (රජයේ) (අ.නි/ර)
- ❖ නිරවුල් කිරීමේ නියෝග (රජයේ) (නි.නි/ර)

යනුවෙන් ප්‍රකාශිත ඉඩම් කැබැල්ලක් රජයේ ලෙස සලකනු ලබන අතර

- ❖ අවසාන නියෝගය (පෞද්ගලික) (අ.නි/පෞ)
- ❖ නිරවුල් කිරීමේ නියෝග (පෞද්ගලික) (නි.නි/පෞ)

යනුවෙන් ප්‍රකාශ කරන ලද ඉඩම් කැබැල්ලක් පෞද්ගලික ලෙස සලකනු ලැබේ.

මෙම අක්ෂර ඉඩම් කැබලි අංකයට හා එහි විස්තරයට පසෙකින් ඉඩම් කැබැල්ල තුල පැහැදිලිව ලියනු ලැබේ.

(අ) පෞද්ගලික යයි ප්‍රකාශිත ඉඩම් කැබලිවල මායිම් හා බිම් ප්‍රමාණ හිමිකම් පිඹුරුවල පරිද්දෙන්ම වෙනස් නොකොට තබා ගත යුතුය.
(ආ) අධිකරණයක් මඟින් පෞද්ගලික යයි තීන්දු කරන ලද ඉඩම් කැබලි කෙරෙහි හිමිකම් පිඹුරු කෙරෙහි දක්වන සැලකිල්ලම දැක්විය යුතුය.
(ඇ) 'රජයේ යයි ප්‍රකාශිත' ඉඩම් කැබලිවල මායිම් හැකි පමණින් එලෙසම තබාගත යුතුය.

4.45. 'භුක්ති අවසර පත්‍රයක්' පිට ලබා ගෙන තිබෙන ඉඩම්වල මායිම් වෙනම මැනීමට අවශ්‍ය නොවන්නේය. එහෙත්, ඉඩම් විස්තර ලැයිස්තුවෙහි භුක්ති අවසර පත්‍රයේ විස්තර සඳහන් කළ යුතුය.

4.46. බදුකර පිඹුරු සහ බදුකර රේඛා චිත්‍ර නිකුත් කරන ලද බිම් කැබලි සම්බන්ධයෙන් 'බපි' සහ 'බ' යන උපසර්ග අක්ෂර සහිත අංක පිළිවෙලින් කළු හා රතු පාටින් ක්ෂෙත්‍ර පත්‍රවල යොදා පෙන්වනු ලැබේ. සියළුම අ.ග.පි. පිටපත්වල මෙම බිම් කැබලි වටේට ලා රතු පටියක් අඳිනු ලැබේ. මෙම ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කරන විට 'බද්ද අවසන් වී තිබේද' යන්න වරහන් තුල යොදා ආකෘති පත්‍ර එල් 96 මඟින් ප්‍රාදේශීය ලේකම්ගෙන් විමසා බැලිය යුතුය.

බද්ද අවසන් නොවූ බදුකර පිඹුරුවලට නැතහොත් බදුකර රේඛා චිත්‍ර වලට අයත් වන ඉඩම් කැබලිවල මායිම් හිමිකම් පිඹුරුවල තිබෙන පරිදිම තබා ගත යුතුය.

4.47. අවසාන විස්තර ලබා ගැනීමේදී මිනින්දෝරුවරයා විසින් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් එක් එක් මැනුම් ඉල්ලීම සඳහා වෙන වෙනම අවසාන විස්තර ලබා ගත යුතුය. මැනුම් සිදු කළ ප්‍රදේශය අනුව ලබා ගත යුතු අවසාන විස්තර වෙනස් වන බැවින් පහත පරිදි දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙතින් ලිඛිතව ඉල්ලුම්කර එම විස්තර ලබාගත යුතුය.

අ.ග.පි. ප්‍රදේශ	අ.භූ.පි. ප්‍රදේශයක් තුල රජයේ ඉඩම් සඳහා	අ.භූ.පි. වල අතුරු පිඹුරක් තුල මැනුම් සඳහා	මූලික පිඹුරු සඳහා
භාවිතා කරන ලද (i) අවසාන අතිරේක අංකය (ii) අවසාන පත්‍ර අංකය (iii) අවසාන කැබලි අංකය (iv) අවසාන ඉ.වි.ලැ. පිටු අංකය (v) ශේෂ ප්‍රදේශ කැබලි අංකය (vi) ශේෂ ප්‍රදේශ බිම් ප්‍රමාණය	**භාවිතා කරන ලද** (i) අවසාන අතුරු පිඹුරු අංකය (ii) අවසාන පත්‍ර අංකය (iii)අවසාන කැබලි අංකය (iv)අවසාන ඉ.වි.ලැ. පිටු අංකය (v) ශේෂ ප්‍රදේශ කැබලි අංකය (vi) ශේෂ ප්‍රදේශ බිම් ප්‍රමාණය	**භාවිතා කරන ලද** (i) අවසාන අතිරේක අංකය (ii) අවසාන පත්‍ර අංකය (iii) අවසාන කැබලි අංකය (iv) අවසාන ඉ.වි.ලැ. පිටු අංකය	අළුත් මූලික පිඹුරු අංකය

අධීක්ෂණ කටයුතු

4.48. මිනින්දෝරු අධිකාරින් විසින් තමන් යටතේ සිටින මිනින්දෝරුවරුන් අධීක්ෂණය කළ යුතු අන්දම විස්තරාත්මකව දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 10 වන පරිච්ඡේදයේ දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කළ යුතුය. ඊට අමතරව 4.26 සිට 4.30 ඡේදයන් දක්වා වූ කරුණු සම්බන්ධයෙන්ද කටයුතු කළ යුතුවේ.

විශේෂයෙන් විකිරණ මැනුම්වල නිරත මිනින්දෝරුවරුන්ගේ ජර්නලවල ඊලඟ සතියේ වැඩ සටහන සූක්ෂම ලෙස පරීක්ෂා කර බැලිය යුතු අතර, අවම වශයෙන් සතියකට දින දෙකක් වත් සත්‍ය වශයෙන්ම මැනුම් වැඩවල යෙදෙන බවට නිශ්චය වශයෙන් දැනගත යුතුය.

ක්ෂේත්‍ර වැඩ, පිඹුරු වැඩ සහ ඉඩම් විස්තර ලැයිස්තු

4.49. (අ) ක්ෂේත්‍ර හා පිඹුරු වැඩ සඳහා 11, 12 වැනි පරිච්ඡේද බලන්න.

(ආ) ඉඩම් විස්තර සඳහා **12.60 සිට 12.84** ඡේදයන් බලන්න.

(ආ) ඉඩම් විස්තර ලැයිස්තු මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති මෘදුකාංග භාවිතයෙන් සකස් කළ යුතුය.

(ඇ) ඉඩම් විස්තර ලැයිස්තුවේ සෑම පිටුවකටම අනුයාත අංකයක් යෙදිය යුතුය. ඉඩම් විස්තර ලැයිස්තුවේ අත්සන් තැබීම සම්බන්ධව 4.59 (අ) සහ 4.61 (අ, ආ) ඡේදයන් අනුව සිදු කළ යුතුය.

(ඈ) ඉඩම් විස්තර දත්ත පද්ධතියෙන් පිළියෙල කරන ලද ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තු 12 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 01 හි දක්වා ඇත.

බිම් ප්‍රමාණ ගණන් බැලීම

4.50. පිඹුරක ඇති බිම් කැබලිවල බිම් ප්‍රමාණ ගණන් බැලීම 13 වැනි පරිච්ඡේදය අනුව සිදු කළ යුතුය.

අධිස්ථාපනය කිරීම

4.51. නව මැනුම් මත පැරණි මැනුම් සංසන්දනය කර සලකුණු කිරීම අධිස්ථාපනය නම් වේ. පැරණි පිඹුරෙහි දැක්වෙන මුල් මායිම් නව මැනුමෙහි මායිම් හා නොසැසඳෙන විට අධිස්ථාපන අනුරේඛන ආධාරයෙන් පැරණි මායිම් නව පිඹුරෙහි රතු පාටින් පෙන්විය යුතුය.

(අ) මතුවට කෙරෙන මැනුම් වැඩ සඳහා ලංකා මැනුම් පත්‍රවල දී ඇති අධිස්ථාපනයන් පිළිගත යුතුය. මිනින්දෝරුවරුන් විසින් මුල් මැනුම අඩංගු ක්ෂෙත්‍ර පත්‍ර සඳහා ඉල්ලුම් නොකළ යුතුය.

(ආ) අළුත් වැඩ හා සම්බන්ධ නොමැති සහ මැන නොමැති අධිස්ථාපිත විස්තර තීන්තෙන් නොඇඳිය යුතුය.

පැරණි මැනුම් ප්‍රදේශයන් තුල අළුත් මැනුම් සිදුකිරීම

4.52. (අ) **මූලික පිඹුරු ප්‍රදේශ තුල:** කලින් මායිම්ගල් දැමූ මූලික පිඹුරක අලුතෙන් මැනුම් වැඩ විවිධ අවශ්‍යතාවයන් සඳහා සිදුකරන විට, අළුත් මූලික පිඹුරු A3 ක්ෂෙත්‍ර පත්‍රවල පිළියෙල කරන අතර මුල් මූලික පිඹුරේ අදාළ කොටස් තහනම් කරනු ලැබේ. වාරි මාර්ග මැනුම් මූලික පිඹුරු, විවිධ මැනුම් මූලික පිඹුරු, නගර මැනුම් මූලික පිඹුරු සහ ඉඩම් සංවර්ධන මැනුම් මූලික පිඹුරු යන මූලික පිඹුරු මතු කාලයේදී නිකුත් කරනු නොලැබේ.

ඉහත අවස්ථාවන්හිදී බිම් කැබලිවල ප්‍රමාණයන් එසේම පවත්වා ගත යුතු අතර, බිම් ප්‍රමාණවල එකතුව මුල් බිම් ප්‍රමාණයට යොමු කිරීම මෙසේ විය යුතුය. "..... වැනි පිටුවේ .....වැනි බිම් කැබැල්ල බලන්න ." දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ පිටපත් නොමැති පැරණි මූලික පිඹුරුවල මෙම පිටු අංකය ප්‍රධාන කාර්යාලයෙන් ලබාගෙන ඇතුලත් කළ යුතුය.

(ආ) **අවසන් නිරවුල් ප්‍රදේශ තුල**: එලෙසම අ.ග.පි./ අ.භූ.පි වල කෙරෙන අළුත් වැඩ අළුත් A3 ක්ෂෙත්‍ර පත්‍රවල පිළියෙල කර මුල් අ.ග.පි. පිඹුරට අතිරේකයක් සමඟ අළුත් ඉඩම් විස්තර ලැයිස්තු සකස් කළ යුතුය. මුල් අ.ග.පි./ අ.භූ.පි. පිඹුරු වල අළුත් පිඹුරු අංකය රතු පාටින් පෙන්වා සංශෝධනය කරනු ලැබේ.

ක්ෂෙත්‍රයේ බිම් කැබලි නැවත හඳුනාගැනීම

4.53. අ.ග.පි. අළුතින් මැනීමක් නොකර ඉඩම ක්ෂෙත්‍රයේ පරීක්ෂාවෙන් පසු හෝ පැරණි මැනීම් නැවත මායිම් විවෘත කිරීමෙන් පසු හඳුනා ගන්නා ඉඩම් කැබලි සඳහා, පැරණි බිම් කැබලි අංකයට අදාළ ඉඩම් විස්තර වර්තමාන තත්ත්වයට අනුව දක්වමින් පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු පමණක් පිළියෙල කළ යුතුය. 4.52 (අ) ඡේදයට අනුව බිම් ප්‍රමාණයන් මුල් බිම් කැබැල්ලට යොමු කළ යුතුය..

අත්කර ගැනීමේ මැනුම්

4.54. අ.ග.පි. / අ.භූ.පි. ප්‍රදේශවල අත්කර ගැනීම් සඳහා ඇතුලත් වන රජයේ ඉඩම්, අත්කර ගැනීමේ පිඹුරුවලට ඇතුලත් කරනු ලැබේ. එම අත්කර ගැනීමේ ඉඩම් විස්තර ලැයිස්තු වල අත්කර ගැනීමට නියමිත පුද්ගලික බිම් කැබලිවලට අදාළ තොරතුරු සහ ඒවායේ ප්‍රමාණයන් පමණක් දැක්විය යුතුය.

අත්කර ගැනීමට අදාළ වන රජයේ බිම් කැබලිවල අ.ග.පි./ අ.භූ.පි. ක්ෂෙත්‍ර පත්‍රවල ඉතිරි වන අතිරේක ප්‍රදේශ සඳහා කැබලි අංක යොදා අනතුරුව ඒවා සඳහා පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කළ යුතුය. එම පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවලද, ඉඩම් අත්කර ගැනීමේ පිඹුරුවල සඳහන් අත්කරගත් බිම් කැබලි අංක සහ ඒවායේ ප්‍රමාණයන් පමණක් දැක්විය යුතුය. විස්තරාත්මක කරුණු සඳහා 6 වැනි පරිච්ඡේදය බලන්න.

ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතට යටත් කළ ඉඩම්

4.55. ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතට යටත් කළ ඉඩමක් මැනීම සඳහා නිරවුල් කිරීමේ නිලධාරියකු මැමෝ පත්‍රයක් ඉදිරිපත් කර ඇතිවිට ඉඩමේ නම විස්තර සහ හිමිකම් කියන්නවුන් පිළිබඳ විස්තරවලට අමතරව යාබද ඉඩම් කැබලිවල හිමිකම් පිඹුරු අංක, රේඛා චිත්‍ර අංක මූලික පිඹුරු අංකද ඇතුලත් කළ යුතුය. විස්තරාත්මක කරුණු සඳහා 8 වැනි පරිච්ඡේදය බලන්න.

ජාතික සිතියම් යොමුව

4.56. පිඹුරේ තීරු විස්තරයේ ජාතික සිතියම් යොමු අංකය සටහන් කළ යුතුය. එය පහත පරිදි 1:50,000 මෙට්‍රික් සිතියමේ පිඹුර පතිතවන ස්ථානයට අනුකූල යොමු පත්‍ර අංකය ගණනය කිරීමෙන් ලබා ගත යුතුය. උදා:- මෙට්‍රික් පත්‍ර අංකය :- 55/1/1 සහ 55/1/3



මිනින්දෝරුවරයාගේ අවධානය යොමු විය යුතු කරුණු

4.57. පිඹුරු සිංහල භාෂාවෙන් පිළියෙල කළ යුතුය. අදාළ ක්ෂෙත්‍ර පොත් අනිවාර්යයෙන්ම සිංහල භාෂාවෙන් පවත්වා ගෙන යා යුතුය. ඒ හැරුණු කොට විශේෂ අවසථාවලදී ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ ලිඛිත අනුමැතිය මත පමණක් ඉංග්‍රීසි භාෂාවෙන් පිඹුරු පිළියෙල කළ හැක. ලිඛිත භාෂාව සිංහල නොවන මිනින්දෝරුවරුන් ඉංග්‍රීසි භාෂාවෙන් පිඹුරු පිළියෙල කිරීම හා ක්ෂෙත්‍ර සටහන් ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වා ගෙන යා යුතුය.

එක් මිනින්දෝරුවරයෙකුට වඩා වැඩි ගණනක් සම්බන්ධ වූ විශාල මැනුම්වලදී ඒවා එකම භාෂාවකින් වඩාත් සතුටුදායක ලෙස කිරීමට මිනින්දෝරු අධිකාරින් විසින් අවශ්‍ය කටයුතු පිළියෙල කළ යුතුය. තවද පිඹුරේ මුළු වැඩ ප්‍රමාණයම ගැන යම් නිලධාරියෙක් වගකිව යුතු නොවන්නේ නම් එම වගකිව යුතු වන කොටස පැහැදිලිව සඳහන් කළ යුතුය. පිඹුරු අත්සන් කරන, පරීක්ෂා කරන සහ අනුමත කරන නිලධාරීන්ගේ නම් සහ තනතුරු නාම පැහැදිලිව පිඹුරෙහි දැක්විය යුතුය.

4.58. පිඹුර පිළියෙල කිරීම සඳහා රැස් කරන ක්ෂෙත්‍ර මැනුම් දත්ත ඉඩම් විස්තර දත්ත පද්ධතිය සඳහා නිවැරදිව ඇතුලත් කිරීම හා නිවැරදි අංකිත දත්ත ස්ථර වල මැනුම් දත්ත ගබඩා කිරීම මිනින්දෝරුවරයාගේ වගකීම වේ. පිඹුරේ හා ඉ.වි.ලැ. හි නිරවද්‍යතාවය සඳහා මිනින්දෝරුවරයා වගකිව යුතු වන අතර 4.60 ඡේදයෙහි දක්වා ඇති පරිදි පරීක්ෂා කිරීම සිදුකර මිනින්දෝරු අධිකාරි

විසින් අත්සන් තැබිය යුතුය. 4.59 ඡේදයෙහි පරිදි මැනුම් ඉල්ලීමක වැඩ නිම කිරීමෙන් පසුව මිනින්දෝරුවරයා විසින් මැනුම් ඉල්ලීම් ආකෘති පත්‍රය මත සපයා ඇති ඉඩ ප්‍රමාණයේ පහත දැක්වෙන විස්තර රතුපාටින් ලියා අත්සන යොදා මැනුම් ඉල්ලීම අවලංගු කළ යුතුය.

- මනින ලද වර්ෂය සහ මාසය,
- අතිරේක අංකය, පත්‍ර අංකය, අතුරු පිඹුරු අංකය ආදිය ඇතුලත් පිඹුරු අංකය
- මෙට්‍රික් ක්ෂෙත්‍ර පත්‍ර අංකය,
- බිම් කැබලි අංක
- වර්ග ප්‍රමාණය

ඉඩම කලින් මැන නිරූපණය කර ඇති බව හඳුනා ගතහොත් පහත දැක්වෙන විස්තර රතුපාටින් ලියා අත්සන යෙදිය යුතුය.

" ක්ෂෙත්‍රයේ පරීක්ෂා කිරීමෙන් / මැනීමෙන් පසු පිඹුරු අංක ..... හි බිම් කැබලි අංක .....බව හඳුනා ගන්නා ලදී."

4.59. (අ) පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය සියළු කරුණු සම්මත ආකාරයට තිබේද යන්න නිශ්චය වශයෙන් දැනගත් පසුව, මැනුම කරන ලද වර්ෂය සහ මාසය සඳහන් කොට මිනින්දෝරුවරයා විසින් මැනීම සහ ඇඳීම සම්බන්ධයෙන් පිඹුරෙහි සෑම කොටසකම අත්සන යෙදිය යුතුය. එලෙසම ඉඩම් විස්තර ලැයිස්තුවෙහි සියළුම පිටුවල අත්සන යෙදිය යුතුය. අත්සනට යටින් නම මුද්‍රණය වී ඇත්ද යන්න තහවුරු කර ගත යුතුය. ශ්‍රේණිය සහ අත්සන් කළ දිනය ඇතුලත් නොකළ යුතුය.

(ආ) සේවාදායකයා හෝ ඉල්ලීම්කරන ලද අයතනයේ අවධානය වෙත යොමු කළ යුතු වන ලිපිවල ඡායා පිටපත් මැනුම් ඉල්ලීම් ගොනුවට ඇතුලත් කර මුල් පිටපත් අදාළ අයවෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) ක්ෂෙත්‍ර පොත්ද, මැනුම් ඉල්ලීම් ගොනුවද නිසි පිළිවෙලට සකසා පිඹුරු පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතුය. මිනින්දෝරුවරයා විසින් කාලානුක්‍රමිකව මැනුම් ඉල්ලීම් ගොනුව සැකසීම කළ යුතුය. එනම් මැනුම් ඉල්ලීම ක්‍රියාත්මක වන අනුපිළිවෙලට අදාළ වාර්තා පෝරමය, අවලංගු කරන ලද මැනුම් ඉල්ලීම, කට්ටිකරු නාම ලේඛනය, ග්‍රාම නිළධාරී පෝරමය, L 96 හා L96A විස්තර, වෙනත් ලියකියවිලි හෝ එහි ඡායා පිටපත්, අවසාන විස්තර, බිම් ප්‍රමාණ ගණන් බැලීමේ පෝරමය, කට්ටිකරු අත්සන් පත්‍ර, අදාළ වන පරිදි සංශෝධන හා තහනම් කිරීමේ අනුරේඛන, මිනින්දෝරු වාර්තාව ආදි ලෙස ගොණු කළ යුතුය.

(ඈ) පරීක්ෂා කිරීම සඳහා පිඹුරුපත් මිනින්දෝරු අධිකාරි වෙත භාරදෙන අවස්ථාවේදීම මැනුමට අදාළව SRIMS දත්ත පද්ධතියේ තොරතුරු යථාවත් කිරීම මිනින්දෝරුවරයාගේ වගකීමකි.

පිඹුරු අත්සන් කිරීම

4.60. මිනින්දෝරු අධිකාරිවරයා පිඹුර පරීක්ෂා කිරීමේදී, මැනුම් කාර්යය සේවා දායකයාගේ අවශ්‍යතාවය පරිදි සහ සම්මත නිවැරදිතාවයන් සහිතව සකස්කර ඇති බවට සැහීමකට පත්විය යුතුය. තවද ක්ෂෙත්‍ර පොත්, මැනුම් ඉල්ලීම අවලංගු කිරීම, මැනුමට අදාළ ලිපි ගණුදෙනු, මිනින්දෝරුවරුන්ගේ වාර්තා, බිම් ප්‍රමාණ ගණන් බැලීම්, අදාළ අනුරේඛන සහ වෙනත් වැදගත් ලියකියවිලි, මිනින්දෝරු අධිකාරිවරයා විසින් පරීක්ෂා කළ යුතුය. ඊට අමතරව **12 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 02** හි සඳහන් සියළුම කරුණුද පරීක්ෂා කළ බවට තහවුරු කර ගත් පසු සියළු ලේඛන අත්සන් කළ යුතුය.

4.61. (අ) මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කරන ලද වැඩ අවසන් කරන ලද පිඹුරුවල නම, තනතුරු නාමය සහ දිනය යොදා සෑම කොටසකම සහ ඉඩම් විස්තර ලැයිස්තුවේ සෑම පිටුවකම අත්සන් කළ පසු ක්ෂෙත්‍ර පොත්ද සමඟ මැනුම් ඉල්ලීම් ගොණුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) පිඹුර අනුමත කරන ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිද ඉහත පරිදි සැහීමකට පත්වීමෙන් පසු පිඹුරේ සහ ඉඩම් විස්තර ලැයිස්තුවේ සර්වේයර් ජනරාල් වෙනුවට තම අත්සන යෙදිය යුතුය. කොටස් ගණන එකකට වැඩි පිඹුරක අත්සනට ඉහලින් කොටස් ගණන "උදා:- කොටස් 1 සිට 4 දක්වා" පළමු කොටසේද පිටු එකකට වැඩි ඉඩම් විස්තර ලැයිස්තුවේ පිටු ගණන "පිටු 1 සිට 12 දක්වා " අවසාන පිටුවේද සටහන් කර අත්සන් කළ යුතුය. සෑම විටම අත්සනට පහලින් නම හා තනතුර පහත පරිදි මුද්‍රණය කළ යුතුය.

(නම)
ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි ..... දිස්ත්‍රික්කය
සර්වේයර් ජනරාල් වෙනුවට
දිනය

4.62. එක් බිම් කැබැල්ලක් පමණක් හා සම්බන්ධ වුවද මිනින්දෝරුවරයකු සකස් කළ පිඹුර දෝෂ සහිත නම් හෝ බිම් ප්‍රමාණ ගණන් බැලීම දෝෂ සහිත නම් හෝ හරි වැරදි බැලීම දෝෂ සහිත නම් හෝ එම දෝෂය තුලින් ඇතිවන බලපෑම සැලකිය යුතු මට්ටමක පවතීනම් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මිනින්දෝරු අධිකාරිවරයා සහ මිනින්දෝරුවරයා සඳහා විනයානුකූලව ක්‍රියා කළ යුතුය. ඒ අනුව ගන්නා ලද ක්‍රියාමාර්ගවලදී ගනුදෙනු වූ ලිපිවල පිටපත් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ඇති එම මිනින්දෝරුවරයා සඳහා වූ පුද්ගලික ලිපි ගොනුවෙහි ගොනුකර තබා ගත යුතුය. පිඹුරු සකස් කිරීමේදී මිනින්දෝරුවරයා විසින් තවදුරටත් එවැනි වැරදි කර ගෙන ගියහොත් සුදුසු පරිදි ක්‍රියා කිරීම පිණිස ඔහු ගැන පළාත් සර්වේයර් ජනරාල් වෙත වාර්තා කළ යුතුය.

යොමු පත්‍ර (Key Sheet)

4.63. (අ) තම දිස්ත්‍රික්කයේ ක්‍රමවත් මැනුම් වලින් ආවරණය නොවන ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි සෑම කි.මී. 4 x 2.5 කොටුවක් සඳහාම 1: 4,000 යොමු පත්‍ර (Key Sheet) දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පවත්වාගෙන යා යුතුය. අදාළ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි තම දිස්ත්‍රික්කයට අයත්වන යොමු පත්‍ර පැහැදිලිව සඳහන් කර ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (සිතියම්) ගෙන් ලබාගැනීමට කටයුතු කළ යුතුය. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (සිතියම්) විසින් 1:10,000 සිතියම් පත්‍ර විශාලනය කර හෝ 1:10,000 සිතියම් පත්‍ර නොමැති ප්‍රදේශ වල 1:50,000 සිතියම් පත්‍ර විශාලනය කර හෝ මෙම 1:4,000 යොමු පත්‍ර මුද්‍රණය කර ලබාදිය යුතුය.

(ආ) යොමු පත්‍ර අංකය වශයෙන් 'යොමු' යන ප්‍රත්‍ය සමඟ 1: 4,000, කි.මී. 4 x 2.5 යොමු පත්‍ර කොටු අංකය උඩ දකුණු කෙළවරේ යොදනු ලැබේ. යොමු පත්‍රය නිකුත් කරනු ලබන දිස්ත්‍රික්කයේ නමද, උඩ වම් කෙළවරේ මුද්‍රණය කරනු ලැබේ.

(ඇ) මිනින්දෝරුවරයා විසින් නව මැනුමේ පිටස්තර මායිම 1:4,000 යොමු පත්‍රයේ (Key Sheet) ලකුණු කර තීන්තෙන් ඇඳිය යුතු අතර මූලික පිඹුරු අංකයද ඒ තුල තීන්තෙන් සටහන් කළ යුතුය. මෙම යොමු පත්‍ර දිර්ඝ කාලයක් භාවිතා කළ යුතු බැවින් ආරක්ෂිතව පවත්වාගෙන යා යුතුය.

(ඈ) යොමු පත්‍රය මත පෙන්වනු ලබන මැනුම මධ්‍යයේ මූලික පිඹුරු අංකය ඇතුලත් කළ යුතුය. යම් මූලික පිඹුරක් යොමු පත්‍ර කීපයක් තුළට වැටෙන විට එක් එක් යොමු පත්‍රය තුලට වැටෙන කොටස ඊට අදාළ යොමු පත්‍රය තුල පෙන්විය යුතු අතර සෑම යොමු පත්‍රයක් තුලම මූලික පිඹුරු අංකය ඇතුලත් කර දැක්විය යුතුය.

පැරණි ලේඛන සංශෝධනය කිරීම

4.64. (අ) මූලික පිඹුරක වට මායිම්, භිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර, රේඛා චිත්‍ර පිඹුරු හෝ නිරවුල් කිරීමේ නියෝගයකට අයත් පෞද්ගලික බිම් කැබලි නව මැනුමකට අයත් වන විට එම කැබලි අඩංගු මුල් ක්ෂෙත්‍ර පත්‍ර මත පැන්සලෙන් ඇතුලත් කර යුතුය. නව මැනුමට අදාළ මූලික පිඹුරු අංක පැරණි ක්ෂෙත්‍ර පත්‍ර මත දක්වමින් නව පිඹුරට යොමු සටහන් යෙදිය යුතුය.

(ආ) යම් මැනුමක් සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් නගර මැනුම් ප්‍රදේශයක් තුල වැටේ නම් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ පිටපත් රතුපාටින් සංශෝධනය කළ යුතුය. එම පිටපත් වලින් ගත් සංශෝධන අනුරේඛන සර්වේයර් ජනරාල්ගේ නගර මැනුම් පිටපත් සංශෝධනය කිරීම පිණිස ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයට ඉදිරිපත් කළ යුතුය.

(ඇ) වාරිමාර්ග මැනුම් මූලික පිඹුරු, වනාන්තර මැනුම් මූලික පිඹුරු, ඉඩම් සංවර්ධන මැනුම් මූලික පිඹුරු සහ විවිධ මැනුම් පිළිබඳ මූලික පිඹුරු තුල වැටෙන මැනුම් සඳහා එවැනිම ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතුය.

4.65. (අ) අවසන් නිරවුල් ප්‍රදේශ තුල සහ 4.66 ඡේදය අනුව පිළියෙල කරන සංශෝධන අනුරේඛන ආධාරයෙන් සියළුම අ.ග.පි/අ.භූ.පි./අ.ජ.පි. ආදී අවසන් නිරවුල් ප්‍රදේශ තුල පිළියෙල කර ඇති මුල් පිඹුරු වල වට මායිම රතු පාටින් දක්වා එහි අභ්‍යන්තර මායිම් තීරුව කහ පැහැයෙන් වර්ණ ගැන්විය යුතු අතර එය තුල නව අතිරේක පිඹුරට හෝ අතුරු පිඹුරට යොමුව රතු පාටින් දැක්විය යුතුය. එම සංශෝධන ප්‍රදේශය තුල ඇති අභ්‍යන්තර මායිම් රතු පාටින් යා ලකුණු යෙදීමෙන් එක් කළ යුතු වන අතර පැරණි කැබලි අංකය රතු පාටින් අංකය කියවීමට හැකිවන පරිදි තනි ඉරකින් කපා හැරිය යුතුය. ඊට අමතරව ක්ෂෙත්‍ර පත්‍ර වල එම සංශෝධන පැන්සලයෙන් ඒ ආකාරයටම සිදු කළ යුතුය.

පැරණි ඉඩම් විස්තර ලැයිස්තු මුල් පිටපත් වල සහ අනිකුත් සියළුම පිටපත්වල රතු පාටින් අදාළ කැබලි මත – ¦ – සලකුණ යොදා පැරණි පිඹුරට යොමුව තීරයේ නව කැබලි අංක වලට යොමුව දැක්විය යුතුය. මෙම සංශෝධන දිස්ත්‍රික් කාර්යාලයේ හා ප්‍රධාන කාර්යාලයේ ඇති පිටපත්වලද සිදු කළ යුතුය.

(ආ) මූලික පිඹුරු ප්‍රදේශ තුල පිළියෙල කරනු ලබන තහනම් කිරීමේ අනුරේඛන ආධාරයෙන් අදාළ මුල් පිඹුර (හෝ නව මැනුමට අයත් කොටස) මත නව මැනුමේ වට මායිම පැන්සලයෙන් දක්වා එහි අභ්‍යන්තර මායිම් තීරුව දිගේ ඉරි සෙවන කර දැක්විය යුතුය. අනතුරුව එහි ඇති පැරණි අභ්‍යන්තර මායිම් මත පැන්සලයෙන් යා ලකුණු යොදා එක් කළ යුතු වන අතර පැරණි කැබලි අංකයද තනි ඉරකින් කපා හැර සුදුසු තැනක නව මූලික පිඹුරට යොමුව දිය යුතුය. ඉඩම් විස්තර ලැයිස්තුවේ මුල් පිටපත් වල කැබලි අංක මත – ¦ – සලකුණ පැන්සලයෙන්ද ඒවායේ පිටපත්වල එම ලකුණ රතු පාටින්ද දක්වා නව කැබලි අංක වලට යොමුව ලෙස “මූලික පිඹුරු අංක .....මඟින් තහනම් කරන ලදී ” යනුවෙන් ලිවිය යුතුය.

සංශෝධන සහ තහනම් කිරීමේ අනුරේඛන

4.66. සංශෝධන සහ තහනම් කිරීමේ අනුරේඛන පිළියෙල කරනු ලබන්නේ පැරණි පිඹුර නිවැරදිව හඳුනාගෙන එය මත නව මැනුමේ තොරතුරු නිවැරදිව සලකුණු කර අදාළ යොමු සටහන් යොදා පැරණි පිඹුරු සංශෝධන කිරීම සඳහා වේ. එමඟින් බලාපොරොත්තු වන්නේ පැරණි පිඹුර පරිශීලනය කිරීමේදී, එය තුල සිදුකර ඇති නව මැනුම් පහසුවෙන් හඳුනා ගැනීමට වේ. එබැවින් ඒවා සකස් කිරීමේදී උතුරු දිසාව, පරිමාණය, මෙන්ම පැරණි පිඹුරු/ ක්ෂෙත්‍ර පත්‍ර වල පැරණි පිඹුරු මායිම් පැන්සලෙන්ද නව පිඹුරු මායිම් නිවැරදිව රතු පාටින් පෙන්වීම කර ප්‍රමාණවත් අධිස්ථාපිත තොරතුරු ද පැන්සලෙන් ඇතුලත් කර පිටපත් දෙකකින් පිළියෙල කළ යුතුය. මෙම තොරතුරු වලට අමතරව විවිධ සංශෝධන සහ තහනම් කිරීමේ අනුරේඛනවල පහත වගුවේ දැක්වෙන තොරතුරු වගුවක ආකාරයෙන් රතු පාටින් දැක්විය යුතුය.

සංශෝධන අනුරේඛන			**තහනම් කිරීමේ අනුරේඛන**
අ.ග.පි./අ.ජ.පි ප්‍රදේශ තුල	**අ.භූ.පි. හි ශේෂ ප්‍රදේශ තුල**	**අ.භූ.පි. හි ප්‍රදේශ තුල (අතුරු පිඹුරක් තුල)**	**මැනුම් නොකරන ලද ප්‍රදේශ තුල (මූලික පිඹුරු)**
මැ.ඉ.අංකය	මැ.ඉ.අංකය	මැ.ඉ.අංකය	මැ.ඉ.අංකය
අ.ග.පි. අංකය	අ.භූ.පි. අංකය	අ.භූ.පි. අංකය	පරීක්ෂා කළ දිනය
අතිරේක අංකය	අතුරු පිඹුරු අංකය		ක්ෂෙත්‍ර පත්‍ර අංකය
පත්‍ර අංකය	පත්‍ර අංකය	අතිරේක අංකය	මෙට්‍රික් යොමු පත්‍ර අංකය
බිම් කැබලි අංක	බිම් කැබලි අංක	පත්‍ර අංකය	මුල් මූ.පි.අංකය
ඉ.වි.ලෑ.පිටු අංක	ඉ.වි.ලෑ.පිටු අංක	බිම් කැබලි අංක	නව මූ.පි.අංකය
ක්ෂෙත්‍ර පොත් අංක	ශේෂ ප්‍රදේශයේ කැබලි අංකය	ඉ.වි.ලෑ.පිටු අංක	ක්ෂෙත්‍ර පොත් අංක
පිඹුර අනුමත කළ දිනය	ශේෂ ප්‍රදේශයේ බිම් ප්‍රමාණය	ක්ෂෙත්‍ර පොත් අංක	කැබලි ගණන
	ක්ෂෙත්‍ර පොත් අංක	පිඹුර අනුමත කළ දිනය	පිඹුර අනුමත කළ දිනය
	පිඹුර අනුමත කළ දිනය		

4.67. අවසාන නිරවුල් කිරීම් නොකරන ලද (උදා:- අ.ග.පි./ අ.භූ.පි./අ.ජ.පි.) ප්‍රදේශවලින් පිටස්තර ප්‍රදේශ තුල අළුතින් මැන නිම කළ පිඹුරු සමඟ දම්වැල් 16 රේඛා චිත්‍රයේ සංශෝධන අනුරේඛන පිටපත් දෙකක් යැවිය යුතුය. එම අනුරේඛන මත පහත දැක්වෙන විස්තර සැපයිය යුතුය.

1. දම්වැල් 16 රේඛා චිත්‍ර අංකය, කොටු අංකය සහ ග්‍රිඩ් රේඛා සලකුණු
2. මැනුම් ඉල්ලීම් අංකය
3. අනුමත කළ දිනය
4. මූලික පිඹුරු අංකය
5. ක්ෂෙත්‍ර පත්‍ර අංකය
6. මෙට්‍රික් යොමු පත්‍ර අංකය (1:4,000)
7. බිම් කැබලි ගණන
8. බිම් ප්‍රමාණය

දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් එක් අනුරේඛන පිටපතක් ප්‍රධාන කාර්යාලයේ දම්වැල් 16 රේඛා චිත්‍රය සංශෝධනය කිරීම සඳහා ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයට ඉදිරිපත් කළ යුතුය.

4.68. සංශෝධන සහ තහනම් කිරීමේ අනුරේඛන වලද එක් පිටපතක් සර්වේයර් ජනරාල්ගේ පැරණි වාර්තා සටහන්වල පිටපත් සංශෝධනය කිරීම සඳහා සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය වෙත ඉදිරිපත් කළ යුතුය. අනෙක් පිටපත මැනුම් ඉල්ලීම් ගොනුවට ඇතුලත් කළ යුතුය.

පැරණි මැනුම් තුල නව මැනුම් සිදුකිරීමේදී වැදගත් වන කරුණු

4.69. මායිම්ගල් නොදැමූ මූලික පිඹුරු ප්‍රදේශයකින් හෝ මූලික පිඹුරක බිම් කැබැල්ලකින් ආවරණය වන ප්‍රදේශයක් තුල අළුත් මැනුමක් කරන සෑම අවස්ථාවකදීම අළුත් මූලික පිඹුරක් නිකුත් කර පැරණි මූලික පිඹුරු තහනම් කළ යුතුය. එවැනි මූලික පිඹුරු මත යම් ක්‍රියා මාර්ගයක් අනුගමනය කර නොමැති නම් ඒවා අවලංගු කිරීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන්) වෙතින් අවසර ලබාගෙන සිදු කළ හැකිය.

4.70. අතුරු පිඹුරක/අතිරේක පිඹුරක සිදුකරන වැඩ ගම් දෙකක් තුල හෝ කීපයක් තුල වැටේ නම් එම වැඩ වෙන් වෙන් වශයෙන් එක් එක් ගම් සඳහා වූ ක්ෂෙත්‍ර පොත්වල පෙන්විය යුතු අතර, එක් එක් ගම් සඳහා වෙන වෙනම අතුරු පිඹුරු/අතිරේක පිඹුරු පිළියෙල කළ යුතුය.

4.71. අ.භූ.පි. තුල රජය සතු ප්‍රදේශයකින් ඉඩම් වෙන් කරන අවස්ථාවන්හිදී අළුත් අතුරු පිඹුරු නිකුත් කරනු ඇත. අ.භූ.පි. ප්‍රදේශවල අළුතින් කරනු ලබන වැඩ දැනට පවතින අතුරු පිඹුරක් තුල වැටේ නම්, අතුරු පිඹුරට අතිරේකයක් නිකුත් කළ යුතුය.

4.72. අ.ග.පි. තුල සිදුකරන සෑම නව මැනුමක් සඳහාම අතිරේක පිඹුරක් නිකුත් කළ යුතුය.

4.73. ක්ෂෙත්‍රයෙන් වැඩ නිමකර ලැබෙන සෑම පිඹුරකටම අදාළ මුල්/ පැරණි ක්ෂෙත්‍ර පත්‍ර, රේඛා චිත්‍ර, යොමු පත්‍ර වැනි ලේඛන දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී සංශෝධනය කර ඇති බවට පරීක්ෂා කිරීම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ වගකීමක් වන අතර අදාළ පිඹුරු අනුමත කිරීමට හා සහතික කිරීමට පෙර මෙය තහවුරු කරගත යුතුය.

4.74. (අ) ව්‍යවස්ථාපිත පිඹුරු සංශෝධනය කරන හෝ අවලංගු කරන හෝ අවස්ථාවලදී එවැනි සංශෝධන හෝ අවලංගු කිරීම් හෝ සඳහා ඉල්ලුම් කර ඇති අමාත්‍යාංශ ලිපියෙහි හෝ ප්‍රාදේශීය ලේකම්ගේ ලිපියෙහි සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ලිපියේ යොමු අංකයට යොමු සටහන් ලබාදී මුල් ක්ෂෙත්‍ර පත්‍රවල සහතිකයක් ඇතුලත් කළ යුතුය. එම ක්ෂෙත්‍ර පත්‍රවල අදාළ ව්‍යවස්ථාපිත පිඹුරු වල යවන ලද සහතික කරන ලද පිඹුරු පිටපත් ආපසු ගෙන්වාගෙන ඒවායේද එම සහතිකයන් ඇතුලත් කළ යුතුය. නමුත් සර්වේයර් ජනරාල් වෙත යවන ලද සහතික කරන ලද පිඹුරු පිටපත් කිසිදු හේතුවක් නිසාවෙන් නැවත ලබා නොදෙන බැවින්, සංශෝධන සහතිකයන් ඇතුලත් කිරීමට එම පිටපත් ආපසු එවන ලෙසට ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයට ඉල්ලීම් නොකළ යුතු වන්නේය. සර්වේයර් ජනරාල්ගේ පිටපත් සංශෝධනය කිරීම සඳහා මෙම යොමු අංක සහිත අනුරේඛනයක් සහ සංශෝධිත පිඹුරේ සත්‍ය පිටපතක් ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයට යවනු ලැබේ.

(ආ) අස්ථානගතවූ මායිම්ගල් නැවත පිහිටුවීමේ ක්‍රියාවලියේදීද ඉහත පරිදි ක්‍රියා කරනු ලැබේ.

(ඇ) නැවත මැනීමෙන් හෝ පැරණි මායිම් නැවත සෙවීමෙන් හෝ බිම් කැබලි හඳුනා ගත් විට, පැරණි බිම් කැබලි අංකයට අදාළ වූ අළුත් ඉඩම් විස්තර දක්වන පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු නිකුත් කරනු ඇත.

(ඈ) සර්වේයර් ජනරාල්ගේ පැරණි වාර්තා සටහන් සහිත සහතික පිටපත් නිකුත් කිරීම සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ වගකීමකි.

(ඉ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයාගේ අවශ්‍යතාවයන් සඳහා පිළියෙල කරන ගොඩනැගිලි සඳහා වන එක් එක් බිම් කට්ටියේ සියළුම පිටපත් සහතික පිටපත් බවට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අත්සන් කළ යුතුය.

(ඊ) ප්‍රාදේශීය ලේකම්ගේ සහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ මූලික පිඹුරු සහ අ.ග.පි. පිටපත් වල යම් සංශෝධනයක් කිරීමට සිදුවූ අවස්ථාවකදී එය සම්පූර්ණයෙන්ම ලේඛන පරීක්ෂාවෙන් පමණක් සිදුකළ හැකි නම් එම ඉල්ලීම ක්ෂෙත්‍රයට නිකුත් නොකොට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදීම ඉටු කරදීම කළ යුතුය. එසේ සිදු කළ බවට කලුපාටින් සටහනක් යොදා අදාළ සංශෝධන රතෙන් කළ යුතු අතර ඒ බවට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි හා මිනින්දෝරු අධිකාරිවරයෙකු අත්සන් යොදා සහතික කිරීමේදී සම්පූර්ණ පදවි නාමය සමඟ දිනය යෙදිය යුතුය.

(උ) ඉඩම් විස්තර ලැයිස්තුවේ ඉඩමේ නම, අයිතිකරුවන්ගේ හෝ ඉල්ලුම්කරුවන්ගේ නම් සම්පූර්ණයෙන්ම වෙනස් කරන අවස්ථාවකදී එය ක්ෂෙත්‍රයේදී පරීක්ෂා කළ යුතු බැවින් මිනින්දෝරුවරයෙකු මඟින්ම නව ඉඩම් විස්තර ලැයිස්තුවක් පිළියෙල කරවා දිය යුතුය.

පිඹුරු වල මුද්‍රිත පිටපත් නිකුත් කිරීම

4.75 අදාළ ආයතන වෙත නිකුත් කිරීම සඳහා අලුතෙන් පිළියෙල කරන ලද පිඹුරු සහ ඉ.වි.ලැ. වල ඡායා පිටපත් මුද්‍රණය කරගත් පසු දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් විසින් සේවා දායකයාට වැදගත් යයි හැඟෙන තොරතුරු සහිත වාර්තාවක් පිළියෙල කර, එය සමඟ පහත 4.76 සිට 4.78 ඡේදයන්හි දක්වා ඇති ආකාරයට මුද්‍රිත පිටපත් යැවිය යුතුය.

සහතික කරන ලද සර්වේයර් ජනරාල්ගේ පිටපත සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය වෙත යැවීම සඳහා පළාත් සර්වේයර් ජනරාල් වෙත යැවිය යුතුය. මෙසේ එවන සර්වේයර් ජනරාල් ගේ පිටපත් ලද බව පසු විපරම් කිරීම සඳහා SRIMS හි පිළියෙල කර ඇති INFODM මඟින් පසු විපරම් කිරීමෙන් තහවුරු කරගත හැක.

දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිඹුර අනුමත කිරීමෙන් පසු පරිලෝකනය කර ADITS දත්ත පද්ධතියට ඇතුලත් කිරීම මෙන්ම පරිලෝකනය කරන ලද පිඹුරේ මෘදු (scanned copy) පිටපතක් අදාළ රජයේ මිනින්දෝරුවරයා වෙත email මඟින් යැවීමට දිස්ත්‍රික් ජ්‍යෙ. මි.අ. විසින් කටයුතු කළ යුතුය.

පිඹුරක අංකිත දත්ත නිසි පරිදි සකස් කිරීමෙන් අනතුරුව ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත දෙපාර්තමේන්තු Web සේවාව හරහා දත්ත යැවිය යුතුය. මෙහිදී SRIMS භාවිතා කර අදාළ ගොනුව ඉඩම් තොරතුරු පද්ධති අංශයට යොමු විය යුතුය. මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය විස්තරාත්මකව 22 වැනි පරිච්ඡේදයෙහි (අංකිත දත්ත කළමනාකරණය) දක්වා ඇත.

4.76. අත්කර ගැනීමේ මූලික පිඹුරු වල පිටපත් නිකුත් කිරීම පහත පරිදි කළ යුතුය.

(අ) සංවර්ධන කාර්යයන් සඳහා අත්කර ගැනීම

සර්වේයර් ජනරාල්	1 (සහතික පිටපතක්)
ප්‍රාදේශීය ලේකම්	2 (එක් පිටපතක් සහතික කර)
ප්‍රධාන තක්සේරුකරු	1

ඉඩම් අමාත්‍යාංශය	1
අදාළ රේඛීය අමාත්‍යාංශය	1
අදාළ දෙපාර්තමේන්තුවට හෝ ආයතනයට	1

(ආ) ගම් පුළුල් කිරීම සඳහා අත්කර ගැනීම්

සර්වේයර් ජනරාල්	1 (සහතික පිටපතක්)
ප්‍රාදේශීය ලේකම්	2 (එක් පිටපතක් සහතික කර)
ඉඩම් අමාත්‍යාංශය	1
පළාත් ඉඩම් කොමසාරිස්	1

4.77. අනෙකුත් පිඹුරු වල පිටපත් නිකුත් කිරීම පහත පරිදි කළ යුතුය.

(අ) ප්‍රදානයන් නිකුත් කිරීමට අදාළව පිළියෙල කළ පිඹුරු පිටපත්

සර්වේයර් ජනරාල්	1 (සහතික පිටපතක්)
ප්‍රාදේශීය ලේකම්	2 (එක් පිටපතක් සහතික කර)
පළාත් ඉඩම් කොමසාරිස්	1

(ආ) ඉඩම් පැවරීම් හෝ බදු දීම් කිරීමට අදාළව පිළියෙල කළ පිඹුරු පිටපත්

සර්වේයර් ජනරාල්	1 (සහතික පිටපතක්)
ප්‍රාදේශීය ලේකම්	2 (එක් පිටපතක් සහතික කර)
අදාළ ආයතනය	1
පළාත් ඉඩම් කොමසාරිස්	1

(ඇ) කැඩැස්තර සිතියම් සඳහා පිළියෙල කළ පිඹුරු පිටපත්

21.77 ඡේදය අනුව කටයුතු කළ යුතුය.

(ඈ) ජාතික නිවස සංවර්ධන අධිකාරිය සඳහා මායිම්ගල් යොදා කට්ටි කැඩීමට පිළියෙල කළ පිඹුරු පිටපත්

සර්වේයර් ජනරාල්	1 (සහතික පිටපතක්)
ජාතික නිවස සංවර්ධන අධිකාරිය	1(එක් පිටපතක් සහතික කර)
පළාත් ඉඩම් කොමසාරිස්	1

(ඉ) අතිරේක ඉ.වි.ලැ. නිකුත් කිරීම

සර්වේයර් ජනරාල්	1 (සහතික පිටපතක්)
ප්‍රාදේශීය ලේකම්	2 (එක් පිටපතක් සහතික කර)

4.78. රජයේ දෙපාර්තමේන්තුවකට භාර දීම සඳහා ඇති රජයේ බිම් කැබැල්ලක් සඳහා පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවක් නිකුත් කර ඇත්නම්, එහි මුද්‍රිත පිටපත් පහත පරිදි නිකුත් කළ යුතුය.

සර්වේයර් ජනරාල්	1 (සහතික පිටපතක්)
ප්‍රාදේශීය ලේකම්	2 (එක් පිටපතක් සහතික කර)

අදාළ දෙපාර්තමේන්තුව	1
පළාත් ඉඩම් කොමසාරිස්	1

වනාන්තර මැනුම්

4.79. අ.ග.පි. ප්‍රදේශ තුල වැටෙන වනාන්තර මැනුම් වල පිඹුරු අ.ග.පි.වලට අතිරේක පිඹුරු ලෙස පිළියෙළ කරනු ලබන අතර එම අ.ග.පි. සඳහා අවසන් වරට භාවිතා කර තිබෙන බිම් කැබලි අංකයේ සිට කැබලි අංක යොදනු ලැබේ. අ.ග.පි. මත වනාන්තර මැනුමෙන් ආවරණය වූ ප්‍රදේශයේ පිට මායිම දිගේ කහපාට පටියක් ඇඳ පෙන්වා, අතිරේක අංකය සහ රක්ෂිත වනාන්තරයේ නම යොදමින් වනාන්තර මැනුමට "..... රක්ෂිත වනාන්තර මැනුම" ලෙස යොමු සටහනක් යෙදිය යුතුය.

4.80. අ.භූ.පි. ප්‍රදේශ තුල වනාන්තර මැනුම් කරනු ලබන්නේ අ.භූ.පි.වලට අතුරු පිඹුරු වශයෙන් වන අතර අ.භූ.පි. හි අන්තිමට භාවිතා කර ඇති බිම් කැබලි අංකයේ සිට කැබලි අංක යොදනු ලැබේ.

4.81. (අ) වනාන්තර මැනුම අ.ග.පි./අ.භූ.පි. ප්‍රදේශවලින් පිටස්තර නම් මැනුම් කර මූලික පිඹුරු සකස් කළ යුතුය.

(ආ) භූ.මූ.පි. තුල මැනුම් කිරීමට ප්‍රථම නිරවුල් කිරීමේ නිලධාරිගෙන් ඒ සඳහා එකඟතාවය ලබා ගත යුතුය.

(ඇ) වනාන්තර මැනුම් පිඹුරු 1:4,000 පරිමාණයට සකස් කරනු ලැබේ. විශාල ප්‍රදේශයක් නම්, ඊට අමතරව 1:10,000 දක්වා පරිමාණයට සංයුක්ත පිඹුරක් සකස් කළ යුතුය. සෑමවිටම සියළු භූලක්ෂණාත්මක විස්තර මැන පිඹුරේ පෙන්විය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ ගම් මායිම් තීන්තෙන් ඇඳ අදාළ සංකේත මඟින් පෙන්වනු ලැබේ. එක් එක් ගම තුළ වැටෙන කොටස් සඳහා වෙන් වෙන්ව බිම් කැබලි අංක යොදනු ඇත. 1:10,000 පරිමාණයේ පිඹුරු සඳහා ඇතුලත මායිම් මැනීමට අවශ්‍ය නොවන අතර පැරණි පිඹුරු භාවිතයෙන් සලකුණු කර තීන්තෙන් අඳිනු ලැබේ.

4.82. වනාන්තර මැනුම්ද අනෙකුත් පිඹුරු මෙන් A3 ක්ෂෙත්‍ර පත්වල අඳිනු ලැබේ.

4.83. ලංකා මැනුම් සහ භූ.මූ.පි. ප්‍රදේශ තුල වැටෙන වනාන්තර මැනුම් අදාළ ලංකා මැනුමට හෝ භූ.මූ.පි. මැනුමට අදාළ ක්ෂෙත්‍ර පත්‍ර වල පැන්සලෙන් ඇඳ දක්වා නව පිඹුරට යොමුව දිය යුතුය.

4.84. අ.ග.පි./ අ.භූ.පි. ප්‍රදේශවල ඇති යෝජිත වනාන්තර රක්ෂිත බිම් තුල අයුතු ලෙස අල්ලා ගත් කොටස් ඇතොත් වන සංරක්ෂණ ජනරාල් විසින් ඒවා රක්ෂිත භූමියෙන් බැහැර කිරීමට අනුමැතිය දී ඇත්තේ නම් එම කොටස් මායිම්ගල් දමා මැන ප්‍රාදේශීය ලේකම්ට ක්‍රියා කිරීමට හැකි වන පරිදි අ.ග.පි. / අ.භූ.පි. අතිරේක පිඹුරු සහ ඉ.වි.ලැ. සමඟ පිළියෙල කරනු ලැබේ. අ.ග.පි./ අ.භූ.පි. ප්‍රදේශවලින් පිටස්තර නම්, ඒවා මූ.පි./ක.සි. වශයෙන් පිළියෙල කරනු ලැබේ.

4.85. වනාන්තර මැනුමක් කොටස් වශයෙන් ලංකා මැනුම් ප්‍රදේශයක් තුල, අ.ග.පි. ප්‍රදේශයක් තුල, අ.ග.පි. ප්‍රදේශයකින් පිටස්තරව වැටේ නම්, 4.79, 4.80 සහ 4.81 ඡේදයන් අනුව, පිඹුර කොටස් 3ට පිළියෙල කර, එකිනෙකට යොමු සටහන් යෙදිය යුතුය.

4.86. එයට අමතරව, රක්ෂිත වනාන්තර ප්‍රදේශයේ හෝ යෝජිත රක්ෂිත වනාන්තර ප්‍රදේශයේ වෙනම පිඹුරක් 1:10,000 පරිමාණයට පිළියෙල කරනු ලැබේ. මනින ලද අළුත් මායිම්ගල් ලකුණු කර වට මායිම පෙන්වා ඊට අමතරව මනින ලද ප්‍රදේශය තුල ඇති අවශ්‍ය භූමිතික ලක්ෂණයන්ද පිඹුරේ

පෙන්විය යුතුය. පිඹුරු වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ ගම් මායිම් 1:10,000 පරිමාණයට A3 පත්‍රවල අඳිනු ලැබේ. වනාන්තර ප්‍රදේශයකට යාව ඇති ගම්වල මායිම් ද වනාන්තර පිඹුරේ පෙන්විය යුතුය. මෙම පත්‍රවල බිම් කැබලි අංක යෙදීම, අ.ග.පි. පරිපූරකයන්, භූ.මූ.පි. ලංකා මැනුම් ආදියෙහි අංක යොදන පිළිවෙලට 4.79, 4.80, 4.81 සහ 4.84 ඡේදයන්හි සඳහන් පරිදි ඊට අනුකූලව කරනු ලැබේ.

1:10,000 සිතියම් පත්‍ර අංක අනුව මෙම A3 පත්‍ර අංක කරනු ලැබේ. රක්ෂිත වනාන්තර ප්‍රදේශයේ හෝ යෝජිත රක්ෂිත ප්‍රදේශයේ නමද පිඹුරේ දකුණු ඉහළ කෙලවරේ පෙන්විය යුතුය.

4.87. දැනටමත් නිකුත් කර ඇති අ.නි.මූ.පි. වල බිම් කැබලි අංක යෙදීමේදී අදාළ අ.නි.මූ.පි. වල අවසානයට භාවිතා කර ඇති බිම් කැබලි අංකයේ සිට කැබලි අංක කිරීම කළ යුතුය.

මැනුම් වාර්තා ආකෘති පත්‍ර

4.88. පහත දක්වා ඇති පරිදි විකිර්ණ මැනුම් සඳහා වාර්තා ආකෘති පත්‍ර වර්ග 8ක් හා කැඩැස්තර මැනුම් සඳහා වාර්තා ආකෘතියක් ඇත. මෙම වාර්තා ආකෘති පත්‍රවල මිනින්දෝරුවරයාගේ වාර්තාව හා මිනින්දෝරු අධිකාරිගේ පරීක්ෂණ සටහන් ඇතුළත්ය.

භාවිතා කළ යුතු ආකෘති පත්‍ර පහත දක්වා ඇත.

එස් 411 -	අවසාන නිරවුල් ප්‍රදේශවලින් පිටස්තර ප්‍රදේශවල අත්කර ගැනීමේ මැනුම්
එස් 412 -	අවසාන නිරවුල් ප්‍රදේශ තුල අත්කර ගැනීමේ මැනුම්
එස් 413 -	අවසාන නිරවුල් ප්‍රදේශවලින් පිටස්තර ප්‍රදේශවල විවිධ මැනුම්
එස් 414 -	අවසාන ගම් පිඹුරු ප්‍රදේශ තුල ඉ.සං.ආ. යටතේ මායිම්ගල් දමා මැනීම
එස් 415 -	අවසාන නිරවුල් ප්‍රදේශවලින් පිටස්තර ප්‍රදේශවල ඉ.සං.ආ. යටතේ මායිම්ගල් දැමීම
එස් 416 -	අවසාන නිරවුල් ප්‍රදේශ තුල විවිධ මැනුම්
එස් 417 -	අවසාන නිරවුල් ප්‍රදේශවලින් පිටස්තර ප්‍රදේශ තුල ලී කුඤ්ඤ ගසා කට්ටි වෙන් කිරීම
එස් 418 -	අවසාන නිරවුල් ප්‍රදේශ තුල ලී කුඤ්ඤ ගසා කට්ටි වෙන් කිරීම
එස් 419 -	කැඩැස්තර මැනුම් සඳහා

4.89. මිනින්දෝරුවරයා විසින් මෙම ආකෘති පත්‍රවල තුන්වන පිටුව පුරවනු ලබන අතර එය ඔහුගේ වාර්තාව වනු ඇත. මිනින්දෝරුවරයා විසින් එහි සඳහන් සෑම කරුණක්ම ඉතා පරීක්ෂාවෙන් කියවා බලා ඔහුගේ වාර්තාව ප්‍රවේශමෙන් ලිවිය යුතුය. මැනුමට අදාළ නොවන කරුණු කපා හැරිය යුතුය. සමහර කරුණු සඳහා නොගැලපෙන වචන කපා හැර සුදුසු වචන භාවිතා කළ යුතුය. ආකෘති පත්‍රයේ නොමැති එහෙත් සඳහන් කළයුතු වැදගත් කරුණු වේ නම් තුන්වන පිටුවේ අන්තිම කරුණට දී ඇති අංකයේ සිට පිළිවෙලින් අංක යොදා අනිත් පැත්තේද සඳහන් කළ හැකිය. අවසානයේදී මිනින්දෝරුවරයා විසින් ඔහුගේ තනතුර සහ දිනය සඳහන් කරමින් වාර්තාවේ සිය අත්සන යෙදිය යුතුය. මීට අමතරව මිනින්දෝරුවරයා විසින් මැනුම් ඉල්ලීම එවා ඇති සේවා දායකයා වෙත වාර්තා කළ යුතු කරුණු අඩංගු වාර්තාවක්ද පිළියෙල කළ යුතුය.

4.90. මෙම ආකෘති පත්‍රයේ දෙවෙනි පිටුවේ මිනින්දෝරු අධිකාරිගේ පරීක්ෂණ සටහන් ඇත. මිනින්දෝරු අධිකාරි විසින් එහි සඳහන් සෑම කරුණකටම අනුව පිඹුරු පරීක්ෂා කරන අතර යම්කිසි පිඹුරක් වෙනුවෙන් අදාළ නොවන කරුණු ඇති විට ඒවා කපා දමනු ලැබේ.
මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කරන ලද සියළු කරුණු වෙනුවෙන් ඉදිරියෙන් ඇති කොටුව තුල තීන්තෙන් හරි ලකුණක් දමා තනතුර සහ දිනය යොදමින් පිටුවේ පහත අත්සන් කළ යුතුය.

4.91. වාර්තාවේ මුල් පිටුවේ අදාළ කොටස් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී සම්පූර්ණ කළ යුතු අතර ඇස්තමේන්තු කාලය සහ වැඩ නිම කිරීමට බලාපොරොත්තු වන දිනය මිනින්දෝරුවරයා විසින් ඇතුලත් කළ යුතුය. එයට සමගාමීව SRIMS දත්ත පද්ධතියද යථාවත් කළ යුතුය. ඒවා මිනින්දෝරු අධිකාරි විසින්ම පරීක්ෂා කළ යුතුය. පිඹුර අවසන් කළ දිනයේ සිට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට පිඹුරු යැවූ දිනය දක්වා වූ කොටස මිනින්දෝරුවරයා විසින් වාර්තාවේ සහ SRIMS හි පුරවනු ලබන අතර ලියකියවිලි ලැබුන පසුව මිනින්දෝරු අධිකාරි විසින් එහි හරි වැරදි බලනු ලැබේ.

වාර්තාවට අමතරව මිනින්දෝරු අධිකාරි විසින් සම්පූර්ණ කරන ලද පරීක්ෂණ පත්‍රය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලට ලැබුණු පසු දිස්ත්‍රික් ජ්‍යෙෂඨ මිනින්දෝරු අධිකාරි වෙනුවෙන් විෂය භාර සිතියම් තාක්ෂණ නිලධාරි විසින් පරීක්ෂණ පත්‍රයේ සඳහන් තොරතුරු සම්පූර්ණ කළ යුතුය. මෙහිදී සංශෝධන වේ නම් නිවැරදි කිරීමට මිනින්දෝරු අධිකාරි වෙත නැවත යොමු කරනු ලැබේ. මෙසේ සම්පූර්ණ කරන ලද පරීක්ෂණ පත්‍රයන් මැනුම් ඉල්ලීම් ගොනුවට ගොනු කළ යුතු වේ.
වාර්තාවේ හරි වැරදි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලට අනුයුක්ත කර ඇති මිනින්දෝරු අධිකාරි (මූලස්ථාන) හෝ විෂය භාර සි.තා.නි. විසින් බැලීමෙන් පසුව ආකෘති පත්‍රය දිස්ත්‍රික් ජ්‍යෙෂඨ මිනින්දෝරු අධිකාරි විසින් අත්සන් කරනු ලැබේ. මැනුමට අදාළ නොවන මෙම පිටුවේ ඇති අනෙකුත් කරුණු කපා දමනු ලැබේ. 'ජ්‍යෙෂඨ මිනින්දෝරු අධිකාරි' යන්නට පසුව ඇති 'වෙනුවට' යන වචනය කපා දැමිය යුතුය.

ලිපිගොනු විනාශ කිරීම

4.92. මැනුම් ඉල්ලීම් හා සම්බන්ධ ඉතිරි අදාළ ලියකියවිලි අඩංගු මැනුම් ඉල්ලීම් ගොනු ක්‍රමවත්ව පහසුවෙන් සොයාගත හැකි පරිදි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ලේඛනාගාරයේ ගබඩාකර තැබිය යුතුය. අවුරුදු පහකට පසු තවදුරටත් තබාගැනීමට අනවශ්‍ය මැනුම් ඉල්ලීම් ලිපිගොනු සහ තබාගත යුතු මැනුම් ඉල්ලීම් ගොනු තුල අනවශ්‍ය ලිපි වාර්ෂිකව විධිමත් ගර්හිත ක්‍රියාවලියකින් පසු විනාශ කර දැමිය යුතුය. අත්කර ගැනීමේ මැනුම් ඉල්ලීම් ලිපිගොනු සහ උසාවි මැනුම් ඉල්ලීම් ලිපිගොනු කිසිවිටෙකත් විනාශ නොකල යුතුය.

විනාශ කිරීම සඳහා වන ගර්හිත මණ්ඩලය පළාත් සර්වේයර් ජනරාල් විසින් පත්කරනු ඇත. මණ්ඩලයට දිස්ත්‍රික් භාර ජ්‍යෙෂඨ මිනින්දෝරු අධිකාරි සහ තවත් මිනින්දෝරු අධිකාරිවරුන් දෙදෙනෙක් පත් කළ යුතුය. මෙහිදී තොරතුරු පනතේ සඳහන් පැරණි ලිපි ලේඛන ඉවත් කිරීම සම්බන්ධ උපදෙස් අනුව කටයුතු කිරීම සිදු කළ යුතුය මෙම ගර්හිත ක්‍රියාවලිය වාර්ෂිකව සිදු කළ යුතුය. මීට අමතරව විනාශ කරන ලද මැනුම් ඉල්ලීම් ගොනු පිළිබඳ ලේඛනයක් ලේඛනාගාරයේද නිසි පරිදි පවත්වා ගෙන යා යුතුය.

මැනුම් ඉල්ලීම් පිළිබඳ උප ලේඛනය

4.93. මිනින්දෝරුවරු විසින් ඔවුන් වෙත නිකුත් කර ඇති සියළුම මැනුම් ඉල්ලීම් පිළිබඳව උප ලේඛන (මැනුම් 426) පවත්වාගෙන යා යුතු අතර, අමාත්‍යාංශයේ යොමු අංකය ඇතුළු සියළුම විස්තර එහි සටහන් කළ යුතුය. සංශෝධන කටයුතු කිරීම සඳහා නැවත ලැබී ඇති මැනුම් ඉල්ලීම් මෙම උපලේඛනයේ රතු පාටින් සටහන් කළ යුතුය.

4.94. සියළුම මැනුම් ඉල්ලීම් සඳහා එක උපලේඛනයක් පමණක් පවත්වාගෙන යා යුතුය.

4.95. මිනින්දෝරු අධිකාරි විසින් මැනුම් ඉල්ලීමක් පරීක්ෂා කළ පසු, මිනින්දෝරුවරයා විසින් උප ලේඛනයේ ඇති සටහන් රතු පාට රේඛාවකින් කපා හැර, මිනින්දෝරු අධිකාරි විසින් මැනුම් ඉල්ලීම පරීක්ෂා කරන ලද දිනය අවසාන කෙළවරෙහි සඳහන් කරනු ලැබේ. තවත් මිනින්දෝරුවරයෙකුට හෝ ප්‍රා.මි.කා. ට මැනුම් ඉල්ලීමක් මාරු කිරීමේදී උපලේඛනයේ සටහන අවලංගු කරමින් එසේ

සඳහන් කළ යුතු අතර, මාරු කළ දිනය සහිතව එය මාරු කිරීමෙන් පසු ලැබූ මිනින්දෝරුවරයාගේ නම උපලේඛනයේ සඳහන් කළ යුතුය. මෙම තත්ත්වයන් SRIMS හිදී වාර්තා කළ යුතුය.

4.96. කලින් ඇතුලත් කරන ලද සටහන් වෙනස් නොකළ යුතු අතර සෑහෙන හේතු නොමැතිව දැනටමත් භාවිතයට ගෙන ඇති ආකෘති පත්‍ර වෙනුවට අළුත් ආකෘති පත්‍ර ආදේශ නොකළ යුතුය. කෙසේ වුවද අළුත් ආකෘති පත්‍ර ආදේශ කළහොත් පැරණි ආකෘති පත්‍රද අළුත් ආකෘති පත්‍රවලට අමුණා තැබිය යුතුය.

4.97. සෑම මාසයක් අවසානයේදීම මෙම ආකෘති පත්‍ර මිනින්දෝරු අධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

4.98. මිනින්දෝරු අධිකාරි විසින් මැනුම් ඉල්ලීම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යායුතුය. මෙයට, මිනින්දෝරුවරු විසින් සෑම මාසයක් අවසානයේදීම එවන මැනුම් ඉල්ලීම් පිළිබඳව උප ලේඛනයේ තොරතුරු සහ අළුතෙන් ලැබෙන හා පරීක්ෂා කෙරෙන මැනුම් ඉල්ලීම්වලින් ලබා ගන්නා තොරතුරු ඇතුලත් කර සංතතිකව හා යාවත්කාලීනව පවත්වාගෙන යායුතුය. මෙම ලේඛනය භාවිතයෙන් කිසියම් මැනුම් ඉල්ලීමක පවතින තත්වය නිවැරදිව පැවසීමේ හැකියාව තිබිය යුතුය. SRIMS දත්ත පද්ධතියේද මෙම තොරතුරු ඇතුලත් කරන බැවින් මැනුම් ඉල්ලීම් උප ලේඛනය හරස් පරීක්ෂාවක්ද සිදුවේ. (cross examination)

4.99. සෑම මාසයක් අවසානයේදීම මිනින්දෝරු අධිකාරි විසින් මිනින්දෝරුවරුන්ගේ උපලේඛන වලින් ලබා ගත් තොරතුරු ආධාරයෙන් මැනුම් ඉල්ලීම් වැඩ නිමකිරීම පිළිබඳ ප්‍රගතිය සාරාංශයක් පිළියෙල කර ඊලඟ මාසයේ 2 වන වැඩකරන දිනයේ දී දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත යැවිය යුතුය. මෙම තොරතුරු SRIMS දත්ත පද්ධතියෙන්ද ලබාගෙන පරීක්ෂා කිරීම සුදුසුය.

දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින්ද තම දිස්ත්‍රික්කයේ සියළුම මිනින්දෝරු අධිකාරිවරුන්ගේ වාර්තා භාවිතයෙන් සකස්කළ ප්‍රගති වාර්තාවක් ඊලඟ මාසයේ 10 වන වැඩකරන දිනයට පෙර පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය වෙත යැවිය යුතුය.

4.100. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැනුම් ඉල්ලීම් ලේඛනයට අමතරව තමන් විසින් සම්මත කරන ලද පිඹුරු පිළිබඳ විස්තර අඩංගු ලේඛනයක් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහාම පවත්වාගෙන යායුතුය. එහි මැනුම් ඉල්ලීමට අදාළ මූලික තොරතුරුවලට අමතරව පිඹුරු අංකය, පිටපත් නිකුත්කිරීම වැනි වැදගත් තොරතුරු ඇතුලත් කළ යුතුය. SRIMS දත්ත පද්ධතියෙන් මෙම තොරතුරු ඕනෑම වෙලාවක කළමනාකරණයට ලබාගැනීමට හැකිවන පරිදි යාවත්කාලීන කර තිබේද යන්න පරීක්ෂා කළ යුතුය.
දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි හට තම කාර්යාලයේ පවත්වාගෙන යන ලේඛන සහ දත්ත ගබඩා භාවිතයෙන් කිසියම් මැනුම් ඉල්ලීමක පවතින තත්වය නිවැරදිව පැවසීමේ හැකියාව තිබිය යුතුය.

මිනින්දෝරුවරයාගේ වාර්තාව

4.101. පිඹුරුවල සහතික කළ පිටපත් ප්‍රාදේශීය ලේකම්ට යැවීමේදී අවශ්‍ය සෑම අවස්ථාවකදීම ඒවා සමඟ විශේෂ අවධානය යොමු විය යුතු කරුණු ගැන විස්තර දක්වමින් වාර්තාවක් යැවිය යුතුය. අදාළ මිනින්දෝරුවරයා විසින් සකස් කරනු ලබන එම වාර්තාව මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂාකර ඉදිරිපත් කළ යුතු අතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහතික කළ යුතුය.

ලේඛන විධිමත්ව ගොනු කර තැබීම

4.102. මූලික පිඹුරු වල A3 ක්ෂෙත්‍ර පත්‍ර සමඟ මුල් ඉඩම් විස්තර ලැයිස්තු වෙන වෙනම මූලික පිඹුරු 25 බැගින් වන කොටස් වශයෙන් ගෙන ගොනු කර ඉතා ආරක්ෂාකාරීව තැන්පත් කළ යුතුය.
අ.ග.පි./ අ.භූ.පි. අදාළ පිඹුරු සහ ඒවායේ ඉඩම් විස්තර ලැයිස්තු (මුල්) සහ සහතික කරන ලද පිටපත් එක් එක් පිඹුරු අංක යටතේ (උදා. අ.ග.පි./ අ.භූ.පි. අංක) වෙන් වශයෙන් ගොනු කර තැන්පත් කළ යුතුය.

4.103. මිනින්දෝරු දෙපාර්තමේතුව විසින් සියළුම ආකාරයේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සඳහා සකස් කරන පිඹුරුවල මුල් පිටපතෙහි සහතික කරන ලද පිටපත් සහ ඒවායේ ඉඩම් විස්තර ලැයිස්තු, ස.ජ.කාර්යාලයේ ලේඛන කළමණාකරන හා වෘත්තීය ප්‍රමිතීන් අංශයෙහි ගොනු කර තබනු ලැබේ.

4.104. අවසාන ජනපද පිඹුරු, ජනපද පිඹුරු, අවසාන නගර පිඹුරු, නගර පිඹුරු, ඉඩම් සංවර්ධන මූලික පිඹුරු, වාරිමාර්ග මැනුම් මූලික පිඹුරු, වනාන්තර මැනුම් මූලික පිඹුරු යනාදිය තව දුරටත් පිළියෙල කරනු නොලබන අතර, එවැනි අවශ්‍යතාවයක් උද්ගතවූ අවස්ථාවකදී ඒ සෑම විටකදීම කැඩැස්තර සිතියම් පිළියෙල කළ යුතුය.
දැනට නිපදවා ඇති ඉහත සඳහන් පිඹුරු ප්‍රදේශයක් තුල යම් මැනුමක් සිදුකිරීමට වුවහොත් එම අවස්ථාවලදී අ.ග.පි. හෝ ග.පි. ප්‍රදේශවල කටයුතු කරන ආකාරයට සිදු කළ යුතුය.

කැඩැස්තර මැනුමක පසුකාලීන මැනුම් සඳහා 21.81 – 21.108 ඡේදයන්හි සඳහන් ආකාරයට කටයුතු කළ යුතුය.

4.34 ඡේදය **ඇමුණුම 01**

ඉ.සං.ආඥාපනත යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා මැනුම් කිරීමේදී අංක 02/2013 හා 2013.11.25 දිනැති අධිකාරි චක්‍රලේඛය හා බැඳි ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2013/02 හා 2013.10.31 දිනැති චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස පහත පරිදි මැනුම් සිදු කළ යුතුය.

01.භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා වැඩි වන අවස්ථාවලදී

I. භුක්ති විඳින ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% නොඉක්මවන අවස්ථාවලදී, එම වෙනස පර්චස් 10කට වඩා වැඩි නොවේනම්, භුක්ති විඳින ප්‍රමාණයම මැනුම් කිරීම

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණ අතර වෙනස 10% නොඉක්මවයිනම්, එම වෙනස පර්චස් 10කට වඩා වැඩි වේ නම් , එම වැඩි වන ඉඩම් ප්‍රමාණය වෙනම බිම් කැබැල්ලක් ලෙස වෙන් කිරීම

III. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% ඉක්මවන අවස්ථා වලදී බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය මැනුම් කිරීම. එහෙත් මෙම වැඩි වූ බිම් ප්‍රමාණය ඉඩම් පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ අවම බෙදුම් සීමාවට වඩා අඩු වේ නම් භුක්ති විඳින ප්‍රමාණය මැනුම් කිරීම

02. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථා වලදී,

I. භුක්ති විඳින ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% නොඉක්මවන අවස්ථාවලදී, භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය මැනුම් කිරීම

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණ අතර වෙනස 10% වඩා වැඩි වේ ඒ සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ පළාත් ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතියක් ගෙන භුක්ති විඳින ප්‍රමාණයට මැනුම් කිරීම

03. වාරි පහසුකම් සහිත මඩ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඉහත උපදේශයන්ට අමතරව පහත සඳහන් කරුණු කෙරෙහිද සැලකිල්ලක් දැක්විය යුතු යි.

I. භුක්ති විඳින ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථා වලදී එම ඉඩම සඳහා නිශ්චිත ජල සැපයුමක් තිබේ නම් පමණක් භුක්ති විඳින ප්‍රමාණය මැනුම් කිරීම

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථා වලදී එම වැඩි වන ප්‍රමාණය රූඩ් 02කට වඩා අඩු වේ නම් භුක්ති විඳින ප්‍රමාණය මැනුම් කිරීම

III. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථා වලදී එම වැඩි වන ප්‍රමාණය රූඩ් 02කට වඩා වැඩි වේ නම් බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය මැනුම් කිරීම. එසේ වැඩි වන බිම් ප්‍රමාණය වෙන් කර මැනීමට කටයුතු කළ යුතු අතර එම බිම් ප්‍රමාණය සඳහා නිශ්චිත ජල පහසුකමක් ලබාගත හැකි වන පරිදි මැනුම් කිරීමට කටයුතු කළ යුතුය.

ශුද්ධි පත්‍රය

5 වැනි පරිච්ඡේදය

අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	අධිකාරිපත්‍ර නිකුත් කරන අවස්ථා	
5.1.	සර්වේයර් ජනරාල් වෙත නිකුත් කරනු ලබන අධිකාරිපත්‍රයන්හි නීතිමය ස්වභාවය	1
5.2.	අධිකරණ මඟින් නිකුත් කරන අධිකරණ නියෝග	1
5.3.	අධිකාරිපත්‍ර නිකුත් කිරීමේ අවශ්‍යතාවය	1
	මැනුම් ගාස්තු අයකිරීම	
5.4.	අධිකාරිපත්‍ර ක්‍රියාත්මක කිරීමට මැනුම් ගාස්තු අය කරන අවස්ථා	1
5.5.	අධිකාරිපත්‍ර ක්‍රියාත්මක කිරීමට මැනුම් ගාස්තු අය නොකරන අවස්ථා	1
	අධිකාරිපත්‍ර ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු විශේෂ කරුණු	
5.6.	අධිකාරිපත්‍රයේ සඳහන් කරුණු මනාව අවබෝධ කර ගැනීම	2
5.7.	සර්වේයර් ජනරාල් කාර්යාලය වෙත ලැබෙන අධිකාරි පත්‍ර	2
5.8.	අධිකාරිපත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා ඉහල ප්‍රමුඛතාව ලබාදීම	2
5.9.	අධිකාරිපත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරින් යෙදවීම	2
5.10.	වැඩ නිමකිරීම සඳහා කාලය ඇස්තමේන්තු කිරීම	2
	මැනුම් කටයුතු පිළිබඳ දැනුම් දීම	
5.11.	සියළුම පාර්ශවකරුවන් වෙත සහ ග්‍රාම නිලධාරිවරයා වෙත දැනුම් දීම	2
	ක්ෂේත්‍ර වැඩ	
5.12.	මනින ලද ඉඩම් සඳහා ලී කුඤ්ඤ ගසා මායිම් පෙන්වා දීම	2
5.13.	පාර්ශවකරුවකු නොවන හිමිකම්පාන්නකු සම්බන්ධව කටයුතු කිරීම	3
5.14.	නිරවද්‍යතාවය තීරණය කිරීම	3
5.15.	භාවිතා කළ යුතු ක්ෂේත්‍ර පොත්	3
	අධිස්ථාපන අනුරේඛන පිළියෙල කිරීම	
5.16.	අධිස්ථාපන අනුරේඛන පිළියෙල කිරීම	3
5.17.	අධිස්ථාපනය කිරීම	3
	පිඹුරු වැඩ	
5.18.	මුල් පිඹුරේ පරිමාණයට නව පිඹුර ඇඳිය යුතු බව	3
5.19.	අනුරේඛන පිළියෙල කිරීමේදී විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු	3
5.20.	පිඹුරෙහි කැබලි අංක යෙදීම	4
5.21.	පිඹුරෙහි වර්ණ භාවිතය හා පිඹුරු පිටපත් මුද්‍රණය	4
5.22.	කැබලි විස්තර ලේඛනයට ඇතුලත් විය යුතු කරුණු	4
	මැනුම් වාර්තාව පිළියෙල කිරීම	
5.23.	වාර්තාව පිළියෙල කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු	5
	පිඹුරු පරීක්ෂා කිරීම	
5.24.	මිනින්දෝරු අධිකාරි විසින් පිඹුරු පරීක්ෂා කිරීම	5
	පිඹුර අනුමත කිරීම සහ පිටපත් යැවීම	
5.25.	අධිකරණයට යැවීම සඳහා සංක්ෂිප්ත වාර්තාවක් සකසා පිඹුර අනුමත	5

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	කිරීම	
5.26.	පිටපත් යැවීම	5
	ලේඛන සුරක්ෂිත කිරීම	
5.27.	අධිකාරිපත්‍ර මැනුමට අදාළ ලිපි ලේඛන ආරක්ෂා කිරීම	6
5.28.	අධිකාරිපත්‍ර මැනුමට අදාළ ලේඛන පිටපත් නිකුත් කිරීම	6
	ලිපි ගනුදෙනු කිරීම	
5.29.	අධිකරණය සමඟ ලිපි ගනුදෙනු කිරීම	6
5.30.	අධිකාරිපත්‍ර මැනුම ප්‍රමාද වීමට අදාළ විස්තර	6
	ඇමුණුම්	
ඇමුණුම 01	18(3) වන වගන්තිය යටතේ නව පාර්ශවකරුවන් සඳහා ලබාදිය යුතු පෝරමය	7
ඇමුණුම 02	අධිකාරිපත්‍ර මැනුම් පිඹුරක ආදර්ශය	8
ඇමුණුම 03	අධිකාරිපත්‍ර මැනුම් ඉඩම් විස්තර ලැයිස්තුවක ආදර්ශය	9
ඇමුණුම 04	අධිකාරිපත්‍ර සම්බන්ධ මැනුම් වලට අදාළ අනුරේඛනය පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු	10
ඇමුණුම 05	18(1)(අ) වන වගන්තිය යටතේ මිනින්දෝරු වාර්තාවේ ආකෘතිය	12

5 වැනි පරිච්ඡේදය

අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම්

අධිකාරිපත්‍ර නිකුත් කරන අවස්ථා

5.1. දිස්ත්‍රික් අධිකරණයකින් සර්වේයර් ජනරාල් වෙත අධිකාරිපත්‍ර නිකුත් කරන අවස්ථා පහත පරිදි වේ.

(අ) දිස්ත්‍රික් අධිකරණයක විභාග වන ඉඩම් සම්බන්ධ නඩුවකට අදාළව එහි මොනයම් හෝ පාර්ශවයක ඉල්ලීමකට හෝ අධිකරණය විසින් සිය මෙහෙයවීමෙන්ම හෝ පිඹුරු හා මැනුම් වාර්තා ඉදිරිපත් කිරීම සඳහා

(ආ) නඩුවේ විෂය වස්තුව සඳහා රජයේ ඉඩමක් ඇතුලත් වන හෝ ඇතුලත් වේ යැයි සැක කරනු ලබන සෑම අවස්ථාවකදීම, රජයේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා නීතිපතිවරයා ද පාර්ශවකරුවකු බවට පත්වන අතර, මේ අවස්ථාවේදී නීතිපතිවරයාගේ ඉල්ලීම අනුව දිස්ත්‍රික් අධිකරණයකින් සර්වේයර් ජනරාල් වෙත අධිකාරිපත්‍ර නිකුත් කරනු ලැබේ.

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරණ බෙදුම් නඩු පනතේ 18(3)(අ) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් අධිකරණයේ නියෝග අනුව (ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 82 වන පරිච්ඡේදය)

5.2. අමතරව මහේස්ත්‍රාත් අධිකරණ, මහාධිකරණ, අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ද තමා අභිමුවෙහි විසඳීමට ඇති නඩුවකට අදාළව එහි මොනයම් හෝ පාර්ශවයක ඉල්ලීමකට හෝ අධිකරණය විසින් සිය මෙහෙයවීමෙන්ම හෝ පිඹුරු හා මැනුම් වාර්තා ඉදිරිපත් කිරීම සඳහා සර්වේයර් ජනරාල්වරයා වෙත නියෝග නිකුත් කිරීම සිදු කරනු ලැබේ. නමුත් එහිදී අධිකාරිපත්‍රයක් නිකුත් නොකරන අතර එය හුදෙක් අධිකරණ නියෝගයක් වශයෙන් නිකුත් වේ.

5.3. ඉහත 5.1 ඡේදයෙහි සඳහන් අධිකාරිපත්‍ර සම්බන්ධව මැනුම් සිදු කිරීමේදී ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ පිඹුරු සහ අදාළ ක්ෂෙත්‍ර සටහන් අධිකරණය විසින් පිළිගැනීමට ප්‍රථම ඒවායෙහි නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා අළුතින් මැනුමක් සිදුකර පිඹුරක්, ක්ෂෙත්‍ර සටහන් සහ වාර්තාවක් පිළියෙල කිරීම හෝ බලයලත් මිනින්දෝරුවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු විසින් සිදු කර ඇති මැනුමක් සම්බන්ධව අළුතින් මැනුමක් සිදු කර අනුරේඛනයක්, ඉඩම් විස්තර ලැයිස්තුවක් සහ වාර්තාවක් පිළියෙළ කිරීමට හෝ ඉඩම් සම්බන්ධ නඩුවකට අදාළව එහි මොනයම් හෝ පාර්ශවයක ඉල්ලීමකට හෝ අධිකරණය විසින් සිය මෙහෙයවීමෙන්ම හෝ නිකුත් කරන නියෝග අනුව පිඹුරු හා වාර්තා පිළියෙල කළ යුතුය.

අධිකරණය විසින් බෙදුම් නඩු පනත යටතේ මුල් මැනුමක් සඳහා අධිකාරිපත්‍රයක් නිකුත් කළේ නම් ඒ සඳහා ද කටයුතු කිරීම හා 5.2 ඡේදයෙහි සඳහන් අවස්ථාවලදී නිකුත් වන අධිකරණ නියෝගය අනුව අදාළ මැනුම් හෝ වාර්තාවන් ද පිළියෙල කළ යුතුය.

මැනුම් ගාස්තු අයකිරීම

5.4. අධිකාරිපත්‍රයක් ලැබුනු වහාම ඉදිරි කටයුතු කිරීමට පෙර අදාළ පාර්ශවකරුවන්ගෙන් මුදල් අය කළ යුතු මැනුමක්ද නැද්ද යන්න ප්‍රථමයෙන්ම පරීක්ෂාකර බැලිය යුතුය. මුදල් අය කළ යුතු මැනුමක් නම් මැනුම් ගාස්තු අයකිරීමට අදාළ තත්කාලීන චක්‍රලේඛ අනුව මැනුම් ගාස්තු ඇස්තමේන්තු කළ යුතුය.

අධිකාරිපත්‍රයේ සඳහන්ව ඇති මැනුම් ගාස්තු ගෙවන පාර්ශවයන් හට මැනුම් ගාස්තු ගෙවන ලෙස අදාළ පාර්ශව දැනුවත් කරන ලෙසත් මැනුම් ගාස්තු ලැබුන පසු පමණක් වැඩ ආරම්භ කරන බවත් අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත මැනුම් ගාස්තුව සමඟ දැන්විය යුතුය. තවද එම ලිපියෙහි පිටපත් අදාළ පාර්ශවකරුවන් වෙතද යැවිය යුතුය.

5.5. බෙදුම් නඩු පනතේ 18(3) (අ) යටතේ අධිකාරිපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ බලයලත් මිනින්දෝරුවරයකු විසින් කරන ලද බෙදුම් පිඹුරක නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට හෝ වෙනස්

කිරීමක් සිදු කිරීමට හෝ යනාදී කරුණු හේතුවෙනි. මෙහිදී අධිකාරිපත්‍රය සමඟ බ.මී.පිඹුර, ක්ෂේත්‍ර සටහන් ආදී අදාළ සියළු ලේඛන එවනු ලැබේ.
මෙවැනි අධිකාරිපත්‍ර සඳහා මැනුම් ගාස්තු ගෙවීම සඳහා දැනුම් නොදිය යුතු අතර මැනුමට අදාළ පිඹුරු හා වාර්තා සමඟ මැනුම් ගාස්තුද දැන්වීම කළ යුතුය. එහිදී අධිකරණය විසින් සුදුසු පරිදි තීරණය කර මැනුම් ගාස්තු ගෙවීමක් සිදු කළ යුතු වන්නේ නම් අදාළ පාර්ශව වෙත නියෝග කරනු ඇත.

අදාළ අධිකාරිපත්‍රය නිකුත්කර ඇත්තේ නීතිපතිවරයාගේ ඉල්ලීමක් මත නම් එය මුදල් අයකිරීමෙන් තොරව සිදුකළ යුතුය.

අධිකාරිපත්‍ර ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු විශේෂ කරුණු

5.6. අධිකාරිපත්‍රයන්ට අදාළ මැනුම් සෑම විටම එකී අධිකාරිපත්‍රයේ සඳහන් කරුණු මනාව අවබෝධ කර ගැනීමෙන් පසුව ඊට අනුකූලවම ක්‍රියාත්මක කළ යුතුය.

5.7. සර්වේයර් ජනරාල්වරයා වෙත ලැබෙන අධිකාරිපත්‍ර ලේඛන කළමනාකරණ සහ වෘත්තීය ප්‍රමිතීන් (ලේ.ක. සහ වෘ.ප්‍ර.) අංශය විසින් අදාළ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කරනු ලැබේ. බොහෝ අවස්ථාවලදී අධිකරණය විසින් සෘජුවම දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත කොමිෂන් / අධිකාරි පත්‍ර එවනු ලබයි.

5.8. අදාළ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මෙම මැනුම් නිම කිරීම සඳහා ඉහලම ප්‍රමුඛතාව ලබාදිය යුතු අතර සෑම අධිකාරිපත්‍රයකම වැඩ නිමවන තුරු ඒවායෙහි ප්‍රගතිය සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතුය. අධිකාරිපත්‍රයෙහි සඳහන් දිනට සතියකට පෙර නිමකරන ලද මැනුම් ඉල්ලීම අධිකරණය වෙත යැවීම සිදු කළ යුතුය.

5.9. මෙම මැනුම් සඳහා සෑම විටම ජ්‍යෙෂ්ඨ හෝ පළපුරුදු මිනින්දෝරුවරයකු යෙදවීම වඩා යෝග්‍ය වේ. මෙම අවශ්‍යතාවය සපුරාලීමට නොහැකි ස්ථාන හෝ අවස්ථාවලදී නවක මිනින්දෝරුවරයෙකුට වුවද අධිකරණ මැනුමක නිරත විය හැකි අතර, එවන් අවස්ථාවලදී මිනින්දෝරු අධිකාරි විසින් මෙම මැනුමට අදාළ කටයුතු සමීප අධීක්ෂණයට ලක් කළ යුතුය.

5.10. මිනින්දෝරුවරයා විසින් වැඩ නිම කිරීමට අදාළ ඇස්තමේන්තුවක් කල් වේලා ඇතිව පිළියෙල කර තම මිනින්දෝරු අධිකාරි මඟින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය. එම දිනය අධිකාරිපත්‍රයෙහි සඳහන් වැඩනිම කළයුතු දිනයට වඩා සෑහෙන තරමක කල්වේලා ඇති දිනයක් වේ ද යන්න ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

මැනුම් කටයුතු පිළිබඳ දැනුම් දීම

5.11. මැනුම් කටයුතු ආරම්භ කිරීමට අවම වශයෙන් සති දෙකකටවත් පෙර මිනින්දෝරුවරයා විසින් සියළුම පාර්ශවකරුවන් වෙත සහ අදාළ වන පරිදි සියළුම රජයේ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකි වන පරිදි ග්‍රාම නිලධාරිවරයා වෙතටද ඒ බව ලිඛිතව දැනුම් දිය යුතුය.

ක්ෂේත්‍ර වැඩ

5.12. අධිකාරිපත්‍රයෙහි මායිම් පෙන්වා දීමට සඳහන් කර ඇති පාර්ශවකරුවන් විසින් පෙන්වා දෙනු ලබන මායිම් අනුව මැනුම් කළ යුතුය. අධිස්ථාපනයකින් පසු ඇතිවන මායිම් ලී කුඤ්ඤ ගසා එම මායිම් සියළුම පාර්ශවකරුවන් වෙත සහ රජයේ ඉඩම් ඇතුලත්ව ඇති අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකි වන පරිදි ග්‍රාම නිලධාරිවරයා වෙතටද පෙන්වාදිය යුතුය. එම මායිම්වල මායිම්ගල් යෙදීමක් සිදු නොකළ යුතුය.

5.13. බෙදුම් නඩු පනතේ 18(3) (අ) යටතේ නිකුත් කර ඇති අධිකාරිපත්‍රයක මැනුම් කටයුතු 5.1(ඇ) ඡේදය අනුව පනත ප්‍රකාරවම ක්‍රියාත්මක කිරීමේදී අධිකාරිපත්‍රයේ සඳහන් බලයලත් මිනින්දෝරුවරුන්ගේ පිඹුරු අධිස්ථාපනය මඟින් යාබද ඉඩම්වල කොටස් විෂය වස්තුවට ඇතුලත්වන්නේ නම් එම කැබලිද වෙනමම අංක කර පිඹුරේ දැක්විය යුතුය. එම හිමිකම් කියන්නන් පාර්ශවකරුවන් ලෙස අධිකාරිපත්‍රයේ සඳහන් නොවන අවස්ථාවලදී නව පාර්ශවකරුවන් ලෙස ඉදිරිපත්වීමට කැමැත්ත දක්වන්නේනම් බෙදුම් පනතේ අංක 32 දරණ සංශෝධනයේ 16 වන වගන්තිය යටතේ ඊළඟ කැඳවීම් දිනයේදී උසාවියේ පෙනී සිටින ලෙස දැන්වීමට 16(3) දරන වගන්තියට අදාළ පෝරමය (**ඇමුණුම 01**) මිනින්දෝරුවරයා විසින් බාරදිය යුතුය. තවද පාර්ශවකරුවන් නොවන හිමිකම් පාන්නන් , ඔවුන්ගේ ලිපිනයන් සහ හිමිකම් පෑම් වල ස්වභාවය මිනින්දෝරුවරයා විසින් පිළියෙල කරනු ලබන 18(1) (අ) වාර්තාවේ viii ඡේදය යටතේ සඳහන් කළ යුතුය.

5.14. නව පිඹුරු වැඩ මුල් පිඹුරෙහි (අධිකාරි පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති පිඹුරේ) පරිමාණයට සිදු කළ යුතු බැවින් මැනුම් කටයුතු එම නිරවද්යතාවයට සරිලන පරිදි කළ යුතුය.

5.15. ක්ෂේත්‍ර වැඩ සඳහා අංක යෙදූ ක්ෂේත්‍ර පොත් භාවිතා කළ යුතුය.

අධිස්ථාපන අනුරේඛන පිළියෙල කිරීම

5.16. අධිකාරිපත්‍ර සමඟ අදාළ පිඹුරුවල මුල් පිටපත් එවා ඇති අවස්ථාවලදී අධිස්ථාපන අනුරේඛන පිළියෙල කිරීම සඳහා ඒවා භාවිතා කළ හැක. එසේ නොමැති සෑම අවස්ථාවකදීම රජයේ මිනින්දෝරුවරයා විසින් අධිකරණයේ ලේඛනාගාරයෙන් පෞද්ගලිකවම අදාළ පිඹුරුවල මුල් පිටපත් ලබා ගෙන අධිස්ථාපන අනුරේඛන පිළියෙල කර ගත යුතුය. එලෙස පිළියෙල කරන ලද අනුරේඛන "මවිසින් පෞද්ගලිකවම මුල් පිටපත් වලින් අනුරේඛනය කර ලබාගන්නා ලද සත්‍ය පිටපත් බව සහතික කරමි" ලෙස සහතිකයක් තබා රජයේ මිනින්දෝරුවරයා විසින් අත්සන් තැබිය යුතු අතර මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කළ බවට අනු අත්සන් තැබිය යුතුය.

5.17. සියළුම අධිස්ථාපනයන් යථාතථ්‍ය වියයුතු අතර, යම් වෙනසක් ඇතොත් එය විස්තරාත්මකව වාර්තා කළ යුතුය. අධිස්ථාපන අනුරේඛනයෙහි, අධිස්ථාපනය සඳහා භාවිතා කරන ලද අධිස්ථාපන නිර්දිෂ්ඨයන් සලකුණු කිරීමට කුඩා ප්‍රමාණයේ (√) සලකුණක් යෙදිය යුතු අතර අධිස්ථාපන වර්ගයද සඳහන් කළ යුතුය. මිනින්දෝරු අධිකාරිවරයා විසින් අධිස්ථාපනය පරීක්ෂා කර **9.67 ඡේදය** අනුව අධිස්ථාපනය වර්ග කර පරීක්ෂා කළ බවට අත්සන් කළ යුතුය.

පිඹුරු වැඩ

5.18. පිඹුරු වැඩ මුල් පිඹුරෙහි (කොමිෂන් සමඟ ඉදිරිපත් කර ඇති පිඹුරේ) පරිමාණයට සිදු කළ යුතුවේ. කෙසේ නමුත් වෙනස්කම් පෙන්නුම් කිරීම සඳහා විශාල පරිමාණයක් භාවිතා කළ හැකි අතර, අවශ්‍ය වෙතොත් එම වැඩ අතුරු පිඹුරක් වශයෙන් පෙන්නුම් කළ හැක.

5.19. අධිකාරි පත්‍ර (උසාවි කොමිෂන්) මැනුම් වල අනුරේඛන පිළියෙල කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. (**ඇමුණුම 2** බලන්න.)

- " ..... දිසා/මහා අධිකරණයේ නඩු අංක ....." ලෙස අනුරේඛනයේ ඉහලින්ම ද මැද ඊට පහලින් වරහන් තුල ස.ජ.ගේ යොමු අංක .... ලෙසද, ඊටත් පහලින් පරිමාණයද සඳහන් කිරීමට
- මැනුමට අදාළ ඉඩමේ පිහිටීම අනුරේඛනයේ දකුණු ඉහල කෙලවරේ දැක්වීමට ..... පළාතේ,

..... දිස්ත්‍රික්කයේ,
..... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ,
..... නගර සභා සීමාව ඇතුලත,
අංක ....., ... කොට්ඨාශය,
..... ගම

- උතුරු රේඛාව සුදුසු පරිදි දැක්වීමට
- යොමුව යටතේ අනුරේඛනයේ භාවිතා කරන ලද සංක්ෂිප්ත නාම මැනුමට අදාල ඉඩමේ පිහිටීමට පහලින් දැක්වීමට

5.20. ලියාපදිංචි බලයලත් මිනිදෝරුවරුන්ගේ පිඹුරු මඟින් දැක්වෙන ඉඩම් තුළට වැටෙන සියළුම රජයේ ඉඩම් මැන වෙනම කැබලි අංක යෙදිය යුතුය.
එක් එක් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා ගේ පිඹුරු අධිස්ථාපනය කිරීමෙන් අනතුරුව සෑදෙන සියළුම බිම් කැබලි කොමිෂමෙහි අවශ්‍යතාවයට අනුකූලවන පරිදි අංකනය කර උපලේඛන ගත කළ යුතුය. බලයලත් මිනින්දෝරුවරයා විසින් පිඹුරෙහි කොටස් අංක යෙදීමේදී අකාරාදී අක්ෂර යොදනු ලැබේ. එම අක්ෂරම අනුරේඛනයේ නැවත භාවිතා නොකළ යුතුය. උදාහරණයක් වශයෙන් බලයලත් මිනින්දෝරුවරයා විසින් A සිට P දක්වා අක්ෂර යොදා ඇත්නම් රජයේ මිනින්දෝරුවරයා විසින් Q අක්ෂරයෙන් ආරම්භ කර Z දක්වා පැමිණීමෙන් පසු AA , AB යනුවෙන් පිළිවෙලින් අංක කළ යුතුය. අංක යෙදීම සඳහා ඉංග්‍රීසි අක්ෂර භාවිතා කරන්නේ නම්, පිඹුර අපැහැදිලිවීම වලක්වා ගැනීම සඳහා I , L සහ O අක්ෂර, කැබලි අංක ලෙස භාවිතා නොකළ යුතුය.

5.21. පිඹුරු A3 ප්‍රමාණයේ පත්‍රයක් මත ඇඳිය යුතු අතර, එක් එක් ලියාපදිංචි බලයලත් මිනිදෝරුවරයා විසින් පිළියෙල කරන ලද පිඹුරුවල මායිම් පෙන්වීම සඳහා එකිනෙකට වෙනස් වූ වර්ණ භාවිතා කළ යුතුය. අධිකාරි පත්‍රයේ අවශ්‍යතාවයට අනුව කරනු ලබන මැනුමට අදාල මායිම්, බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් පිළියෙල කරන ලද පිඹුර මත අධිස්ථාපනය කිරීම සඳහා ඉල්ලුම් කිරීම බොහෝ විට අධිකාරි පත්‍රයේ අවශ්‍යතාවය වන අතර අනුරේඛනය සකස් කිරීමේදී මෙම බලයලත් මිනින්දෝරුවරයාගේ පිඹුරෙහි දැක්වෙන සියළුම මායිම් කොල පාටින් ප්‍රථමයෙන්ම පෙන්විය යුතුය. දෙපාර්තමේන්තුව මඟින් පිළියෙල කරන ලද පිඹුරුවල මායිම් අධිස්ථාපනය කර පෙන්වීම සඳහා රතු වර්ණය භාවිතා කළ යුතුවේ. බලයලත් මිනින්දෝරුවරුන් කිහිපදෙනෙකුගේ පිඹුරුද අධිස්ථාපනය කිරීමට ඇතිවිට එකිනෙකට වෙනස් වර්ණයන් භාවිතා කළ යුතුය. තව ද අළුතින් මනින ලද මායිම් ඇතොත් ඒවා ඉහත සඳහන් කවර හෝ මායිමක් සමඟ ඒකීභූත නොවන විට එම මායිම් කළුපාටින් ඇඳ පෙන්විය යුතු අතර, භාවිතා කරන ලද වර්ණ පිළිබඳව පැහැදිලිව විස්තර කර අනුරේඛනයේ වම්පස පහලින් පහත සඳහන් පරිදි සටහනක් යෙදිය යුතුය. මෙසේ සකස් කර ගනු ලබන ඇඳීම් පත්‍රයෙන් අවශ්‍ය වන දත්ත පමණක් ඇතුලත් අනුරේඛන පිටපත් අවශ්‍ය වන ප්‍රමාණයෙන් මුද්‍රණය කර ගත යුතුය.

<u>සටහන :</u>
බලයලත් මිනින්දෝරු ..... මයාගේ අංක ..... දරන පිඹුරේ මායිම් කොල පාටින් පෙන්වා ඇත.
එහි අධිස්ථාපිත බලයලත් මිනින්දෝරු ..... මයාගේ අංක ..... දරන පිඹුරේ මායිම් ඉහත මායිම් සමඟ ඒකීභූත නොවන කළ ..... පාටින් පෙන්වා ඇත. එහි අධිස්ථාපිත මූ.පි.....මායිම් බලයලත් මිනින්දෝරු මයාගේ මායිම් සමඟ ඒකීභූත නොවන කළ රතු පාටින් පෙන්වා ඇත. අළුතින් මනින ලද මායිම්, ඉහත සඳහන් කවර හෝ මායිමක් සමඟ ඒකීභූත නොවන කළ කළු පාටින් පෙන්වා ඇත.

5.22. රජයේ මිනින්දෝරුවරයා විසින් පිළියෙල කරනු ලබන බිම් කැබලි උපලේඛනයේ බිම් කැබලි අංකය, බිම් ප්‍රමාණය , ඉඩමේ නම, ගස් ගණන සහ ඒවායෙහි වයසද සමඟ වගාව පිළිබඳ විස්තර හා ගොඩනැගිලි පිළිබඳ විස්තරාත්මක සටහනක්, හිමිකම් කියන්නන්ගේ නම් සහ පදිංචි ලිපිනයන් ද අදාළ ඉඩම බදුදී තිබේද, වෙන් කළ බිමක් වේද, අනවසරයෙන් අල්ලා ගෙන තිබේද යනාදී විස්තරද ඇතුලත් විය යුතුය. පැරණි පිඹුරට යොමුව යටතේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ පිඹුරු වල බිම් කැබලි, රජයේ පිඹුරු වල බිම් කැබලි සඳහා යොමුව සඳහන් කළ යුතුය. (ඇමුණුම 3 බලන්න)

මැනුම් වාර්තාව පිළියෙල කිරීම

5.23. අධිකරණයට අතිශය වැදගත් වේ යැයි හැඟෙන කරුණු ඇතුලත් විස්තරාත්මක මුද්‍රිත වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා, රජයේ මිනින්දෝරුවරයා විසින් අධිකාරිපත්‍රයේ සඳහන් අවශ්‍යතාවයන් අනුව පිළියෙල කළ යුතුවේ. මැනුම පිළිබඳව විශ්වාසනීයත්වය ගිලිහීයන ආකාරයේ වචන වාර්තාවට ඇතුලත් නොකළ යුතුය. කිසිවිටෙක සැකසහිත කරුණු වාර්තා නොකළ යුතුය. **අධිකාරිපත්‍රයන්හි මැනුම්වලට අදාළ අනුරේඛනය, ඉඩම් විස්තර ලැයිස්තුව හා වාර්තාව පිලියෙල කිරීමේදී අවධානයට යොමු විය යුතු කරුණු ඇමුණුම 04 හි විස්තරාත්මකව දක්වා ඇත.**

බෙදුම් නඩු සඳහා නිකුත් කර ඇති අධිකාරිපත්‍ර වල මුල් මැනුමට අදාළව වාර්තාව පිළියෙළ කිරීමේදී බෙදුම් නඩු පනතේ 18.1(අ) වගන්තියට අදාළ ආකෘතියට අනුව (ඇමුණුම 05) වාර්තාව පිළියෙළ කළ යුතුය.

පිඹුරු පරීක්ෂා කිරීම

5.24. මිනින්දෝරුවරයා විසින් අධිකාරිපත්‍රයේ සඳහන් අවශ්‍යතාවය අනුව සකස් කළ සියළුම පිඹුරුවල මුල් පිටපත්, අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා වූ වාර්තාව සහ මැනුමට අදාළ අනිකුත් සම්බන්ධිත ලේඛන වල තමාගේ නම සහ තනතුර සඳහන් කර අත්සන් කළ යුතුවේ. මිනින්දෝරු අධිකාරි විසින් ඒවා පරීක්ෂාකර බලා නිවැරදිතාවය සහ මැනුම් ඉල්ලීමේ අවශ්‍යතාවයන් ඉටුවී ඇති බව තහවුරු වූ පසු, පරීක්ෂා කළ බවට අත්සන් තබා, අංකිත දත්ත ගොනුව සහ අනෙකුත් සම්පූර්ණ කරන ලද සියළුම ලේඛන සමඟ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කළ යුතුය. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පෙන්නුම් කරනු ලබන සංශෝධන ඉතා ඉක්මණින් නිමකර පිඹුර ආපසු බාරදීම කළ යුතුවේ.

පිඹුර අනුමත කිරීම සහ පිටපත් යැවීම

5.25. 5.5 ඡේදය අනුව අධිකාරි පත්‍රයට අදාළව සිදුකරන ලද මැනුම සම්බන්ධයෙන් එහි ඉල්ලුම් කර ඇති කරුණු ඇතුලත් වන පරිදි මිනින්දෝරුවරයා විසින් පිළියෙල කරනු ලබන මැනුම් වාර්තාව මිනින්දෝරු අධිකාරි සහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් එය අධිකරණයේ අවශ්‍යතාවය නිවැරදිව ඉටු කර ඇති බවට නැවතත් තහවුරු කර ගත යුතුය.

මිනින්දෝරුවරයා විසින් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා A3 ප්‍රමාණයේ දෙපාර්තමේන්තු මුද්‍රණ කඩදාසි මත 5.21 ඡේදය පරිදි වර්ණ භාවිතාකර පිළියෙල කරන ලද අනුරේඛන / පිඹුරු පිටපත් 2 ක්, බිම් කැබලි උප ලේඛනය, මැනුම් වාර්තාව, මැනුම් ගොනුව හා ක්ෂේත්‍ර පොත් මිනින්දෝරු අධිකාරි පරීක්ෂා කිරීමෙන් පසු සර්වේයර් ජනරාල්වරයා වෙනුවෙන් අනුමත කිරීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුවේ.

5.26. මිනින්දෝරුවරයාගේ වාර්තාවේ සඳහන් කරුණු පදනම් කරගෙන අධිකරණයෙහි අවධානය යොමුවිය යුතු සියළුම කරුණු ඇතුලත් විස්තරාත්මක මුද්‍රිත වාර්තාවක් වෙනම පිළියෙල කර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සර්වේයර් ජනරාල් වෙනුවට අත්සන් කර අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාවේ මැනීම හා ඇඳීම කළ රජයේ මිනින්දෝරුවරයාගේ සහ පරීක්ෂා කළ මිනින්දෝරු අධිකාරි ගේ නම් හා තනතුරු ඇතුලත් කළ යුතුය. ඒ සමඟ අනුමත කරන ලද අනුරේඛන / පිඹුරු පිටපත් සහ බිම් කැබලි උපලේඛනය අධිකරණය වෙත යැවීම කළ යුතුය.

නීතිපතිවරයා අදාළ නඩුවේ පාර්ශවකරුවකු වන අවස්ථාවලදී අතිරේක අනුරේඛන / පිඹුරු පිටපතක්, බිම් කැබලි උප ලේඛනය සමඟ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි පිටපතක් අමතර වශයෙන් නීතිපතිවරයා වෙත ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ඉදිරිපත් කළ යුතුය.

ලේඛන සුරක්ෂිත කිරීම

5.27. අධිකරණය වෙත සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා හෝ නීතිපති දෙපාර්තමේන්තුවෙහි රජයේ නීතීඥවරයා වෙත පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය විය හැකි බැවින්, A3 ප්‍රමාණයේ මුල් පිඹුර සහ අධිකරණය වෙත යවන ලද සියළුම වාර්තාවල පිටපත් සහිත මැනුමට අදාළ ගොනුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ලේඛනාගාරයෙහි සුරක්ෂිතව තැබිය යුතුය.

5.28. අධිකරණ මැනුම්වලට අදාළ සියළුම ලේඛන මහජනතාවට සෘජුවම නිකුත් කරනු නොලැබේ. නඩුවේ පාර්ශවකරුවෙකුට හෝ ඉල්ලුම්කරුවෙකුට එහි පිටපතක් නිකුත් කරන්නේ නම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කළ ලිඛිත ඉල්ලීමකට අනුව පමණක් නියමිත ගාස්තු අයකරගෙන අදාළ ලේඛන නිකුත් කළ යුතුය.
දැනට තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක බැවින් මෙම නඩුවට සම්බන්ධ සියළු පාර්ශවකරුවන්ට මෙහි පිටපත් ඉල්ලුම් කිරීමට හිමිකම ඇති අතර එම නඩුවට අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශය මත පමණක් නියමිත ගාස්තු ලබාගෙන නිකුත් කළ යුතුය.

ලිපි ගනුදෙනු කිරීම

5.29. අධිකරණය සමඟ සිදුකරනු ලබන සියළුම ලිපි ගනුදෙනු අදාළ උසාවියේ රෙජිස්ට්‍රාර්වරයා වෙත පමණක් යොමු කළ යුතුය.

5.30. අධිකාරිපත්‍රයෙහි සඳහන් දිනයට ප්‍රථම වැඩ නිමකර පිළියෙල කරන ලද අනුරේඛනය/ පිඹුර, බිම් කැබලි උප ලේඛනය සහ වාර්තාව අධිකරණය වෙත ඉදිරිපත් කිරීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයාගේ වගකීමක් වේ. 5.10 ඡේදයේ සඳහන් කරුණ හෝ වෙනත් නොවැලැක්විය හැකි සාධාරණ හා විශ්වාසනීය හේතුවක් නිසා වැඩ ප්‍රමාද වේ නම්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයා විසින් අධිකාරිපත්‍රයෙහි සඳහන් නියමිත දිනයට බොහෝ කල් වේලා ඇතිව ඒ සම්බන්ධව කෙටි වාර්තාවක් සමඟින් ප්‍රමාදය පිළිබඳව අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දී දින දිර්ඝයක් ලබාගත යුතුවේ. එවැනි දින දිර්ඝ ලබාගැනීම් දිගින් දිගටම සිදු නොකිරීමටද වගබලා ගත යුතුය.

1977 අංක 21 දරණ බෙදුම් පනත
හිමිකම් පා සිටින තැනැත්තා වෙත හෝ අනුයෝජිතයා වෙත
මිනින්දෝරුවරයා විසින් භාර දිය යුතු දැන්වීමේ අකෘතිය
16 (3) වන වගන්තිය)

.....දිසා අධිකරණයේදිය.
නඩු අංකය.....
.....

පැමිණිළිකරු
එදිරිව

.....

විත්තිකරුවෝ
සහ තවත් අය
..... වෙතටය.

(හිමිකම් පා සිටින තැනැත්තාගේ හෝ අනුයෝජිතයාගේ නම ඇතුළත් කරන්න)
.....
යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද ..... දිස්ත්‍රික්කයේ ..... ගමේ/ගම්වල පිහිටා ඇත්තා වූ ද ඉඩම/ඉඩම් බෙදා වෙන් කිරීම/විකිණීම සඳහා 1987 අංක 32 දරණ පනතින් සංශෝධිත රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරණ බෙදුම් නව පනත යටතේ .....දිසා අධිකරණයෙහි අංක ..... දරණ නඩුව පවරා ඇති බව ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම ඉඩම/ඉඩම් පිළිබඳව යම් සම්බන්ධතාවයකට ඔබ හිමිකම් පා සිටින්නේ නම්, ඉහත කී නඩුවේ පාර්ශවකරුවකු වශයෙන් එකතු කරනු ලැබීම සඳහා 20.....මස.....දින හෝ එදිනට පෙර මෝසමක් මඟින් ඒ සඳහා ඉල්ලුම් කරන ලෙස ද , ඔබගේ හිමිකම් පෑමේ ප්‍රකාශය ගොනු කරන ලෙසද 19 වන වගන්තියේ නියමයන් අනුව ක්‍රියා කරන ලෙසද ඔබට මෙයින් නියම කරනු ලැබේ. මේ නඩුව 20..... මස ..... දින විවෘත අධිකරණයේ දී නැවත අඩ ගසනු ලැබේ.

අත්සන.....

අධිකාරිපත්‍රලාභි

[5.19 ඡේදය](#) [ඇමුණුම 02](#)



මහාධිපති දෙපාර්තමේන්තුව
කළුතර දිස්ත්‍රික්කය
බේරුවල ප්‍රා.ලේ. කොට්ඨාසය
සීනවත්ත ගම

සිදු 6 සේ 6 වැනි සිලුව

ඒනුවේඛණ අංක KA/DSO/18/123 හි ඉඩම් විස්තර ලැයිස්තුව

කළුතර දිස්ත්‍රික් අධිකරණයේ නඩු අංක සී 1345

(ඉ. ප .ගේ අංක KA/DSO/18/123)

පක්ෂ පොත් අංකය සහ පිටුව Field Book No. & Page No.	භූමි කොටස් අංකය Lot No.	ඉඩම Land		ගම Village	අධිකාරීගේ කොපි අංකය සහ මැනුම් ඉල්ලීම් අංකය Reference No. of the Commission & Survey Requisition No.	ඉල්ලුම්කරුගේ නම Name of Aplicant	ප්‍රමාණය හෙක්ටයාර් Extent Hectare	මිනුම් සටහන Remarks
		නම Name	විස්තරය Description					
ක-5236 II	T	පිදුරුවත්ත පෙරේත පිදුරුවත්ත	කෙවෙල	කිරිවත්ත		සී 1345 නඩුවේ පාර්ශවකරුවන්	0.0003	මෙහෙත් මිනින්දෝරු සී.කේ.රණසිංහ මහතා අංක 695 දරණ පිඹුරේ කොටස් 2B හි කොටසක් 15(අ) වැනි විස්තරයක් වන පත්තිල විහාරයේ නුවන් ආරාමස්ථ බුදුරජාණන් වහන්සේ හිමිකම් කියන ඉඩමෙහි වයඹ දිග මායිමේ පිහිටා ඇති ගඩොල් පවුරු සහිත ඉඩම වේ. (මූර්ත මිනුම් 3) (අ.0 රූ.0 පර්.0.12)
ක-5236 II	U	පිදුරුවත්ත	කෙවෙල	කිරිවත්ත		- එම -	0.0001	18 වැනි විස්තරයේ වන කන්දක් අයිකරණ් කුණ්ඩ විදිමින් හිමිකම් කියයි. (මූර්ත මිනුම් 1) (අ.0 රූ.0 පර්.0.04)
ක-5236 II	V	පිදුරුවත්ත	කෙවෙල	කිරිවත්ත		- එම -	0.0011	මෙහෙත් මිනින්දෝරු ඒ.බී.පියරත්න මහතා අංක 11 දරණ පිඹුරේ කොටස් අංක 2 හි කොටසක් මෙහෙත් මිනින්දෝරු ජී.ඒ.හෙවේරා මහතා අංක 218 දරණ පිඹුරේ කොටස් අංක 2E හි කොටසක් මෙහෙත් මිනින්දෝරු බී.ඇලහරන මහතා අංක 546 දරණ පිඹුරේ කොටස් අංක 2E හි කොටසක් 18 වැනි විස්තරයේ වන කන්දක් අයිකරණ් කුණ්ඩ විදිමින් හිමිකම් කියයි. (මූර්ත මිනුම් 11) (අ.0 රූ.0 පර්.0.43)
ක-5236 II	W	-	ඇටකෑල(මූර්ත කංවර්තන අයිකරණ්ය)	කිරිවත්ත	ඒ.ඩී. 4323	රජය	0.0004	ඇටකෑලේ පොරොත්තේ මු.පි.ය 71 හි කොටසක් මෙහෙත් මිනින්දෝරු ඒ.බී.පියරත්න මහතා අංක 11 දරණ පිඹුරේ කොටස් අංක 2 හි කොටසක් මෙහෙත් මිනින්දෝරු ජී.ඒ.හෙවේරා මහතා අංක 218 දරණ පිඹුරේ කොටස් අංක 2E හි කොටසක් මෙහෙත් මිනින්දෝරු බී.ඇලහරන මහතා අංක 546 දරණ පිඹුරේ කොටස් අංක 2E හි කොටසක් (මූර්ත මිනුම් 4) (අ.0 රූ.0 පර්.0.16)
						එකතුව	0.4693	(අ.1 රූ.0 පර්.25.55)

මැනීම හා ඇඳීම කළේ :
Surveyed & Drawn By:

කේ. බී.සිල්වා (K.B.Silva)
රජයේ මිනින්දෝරු (Govt. Surveyor)

2018 මාර්තු - සැප්තැම්බර් මාසවලදිය.

පරීක්ෂා කළේ :
Checked By:

පී.ගුණවර්ධන (P.Gunawardhana)
මිනින්දෝරු අධිකාරී (Supdt. of Surveys)

අනුමත කළේ :
Approved By:

කේ.කේ.අබේරත්න (K.K.Abeyrathna)
පරීක්ෂක මිනින්දෝරු අධිකාරී සේවයේ ප්‍රධානියා
Senior Supdt. of Surveys – Kalutara District
මහාධිපති වෙනුවට
On behalf of the Surveyor General
2018

මායිම් පෙන්වා දුන් අය
Boundaries Pointed Out By:
} පක්ෂිනිකෙරු, 1, 1(අ), 2, 4, 5, 6 7, 8, 9, 15(අ), 16, 17, 18, 22 සහ 23 දරණ හිමිකරුවන්

මායිම් පෙන්වන ලද අය
Boundaries Pointed Out To:

උසාවි අධිකාරිපත්‍ර සම්බන්ධ මැනුම් වලට අදාළ

අනුරේඛනය පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

1. උතුරු රේඛාව සහ පරිමාණය සඳහන් කිරීම
2. පළාත, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ ගම නිවැරදිව සඳහන් කිරීම
3. අනුරේඛන අංකය, නඩු අංකය සහ අධිකරණයේ නම නිවැරදිව සඳහන් කිරීම
4. ක්ෂේත්‍ර පොත් අංකයන් නිවැරදිව සඳහන් කිරීම
5. අනුරේඛනයේ පෙන්වා ඇති සියළු විස්තර යොමුවට නිසි පරිදි ඇතුලත් කිරීම
6. මායිම් පෙන්වා දුන්, මායිම් බලාගත් අය පිළිබඳ විස්තර නිවැරදිව සඳහන් කිරීම
7. අධිස්ථාපිත මායිම් සඳහා වර්ණයන් නිවැරදිව තෝරා ගැනීම සහ ඊට අදාළ විස්තරය සටහන යටතේ සඳහන් කිරීම
8. අධිස්ථාපිත මායිම් එකිනෙකට වෙන් කර හඳුනා ගැනීමට නොහැකිවන අවස්ථා වල දී අතුරු පිඹුරු ලෙස පෙන්වා තැබීම
9. යාබද මායිම් විස්තර නිවැරදිව සඳහන් කිරීම
10. මැනුම සිදු කළ කාල පරිච්ඡේදය නිවැරදිව සඳහන් කිරීම
11. මැනීම හා ඇඳීම කළේ, පරීක්ෂා කළේ, අනුමත කළේ යන්න නිවැරදිව සඳහන් කිරීම

අධිකාරිපත්‍ර සම්බන්ධ මැනුම් වලට අදාළ
ඉඩම් විස්තර ලැයිස්තුව පිළියෙල කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

1. පළාත, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ ගම නිවැරදිව අනුරේඛනයේ පෙන්වා ඇති පරිදිම සඳහන් කිරීම
2. අනුරේඛන අංකය, නඩු අංකය සහ අධිකරණයේ නම අනුරේඛනයේ පරිදිම සඳහන් කිරීම
3. ක්ෂේත්‍ර පොත් අංකයන් අනුරේඛනයේ පෙන්වා ඇති පරිදිම සඳහන් කිරීම
4. මායිම් පෙන්වා දුන්, මායිම් බලාගත් අය පිළිබඳ විස්තර අනුරේඛනයේ ඇති පරිදිම සඳහන් කිරීම
5. ප්‍රමාණය අක්කර, රූඩ්, පර්චස් වලින් සඳහන් කිරීමේ දී හෙක්. 1 = අක්. 2.4711 ලෙස ගෙන සඳහන් කිරීම
6. ඉල්ලුම්කරුගේ නම සහ කිවයුතු කරුණු තීරය නිවැරදිව සඳහන් කිරීම
7. මැනුම සිදු කළ කාල පරිච්ඡේදය, මැනීම හා ඇඳීම කළේ, පරීක්ෂා කළේ සහ අනුමත කළේ යන විස්තර අනුරේඛනයේ පෙන්වා ඇති පරිදිම සඳහන් කිරීම

අධිකාරිපත්‍ර සම්බන්ධ මැනුම් වලට අදාළ

වාර්තාව පිළියෙල කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

1. මැනුම කුමන වර්ගයට අයත්ද යන්න අනුව නිවැරදි වාර්තාව පිළියෙල කිරීම
2. එක් එක් ඡේද යටතේ මැනුමට අදාළ සියළු විස්තර වාර්තාවට ඇතුලත් කළ යුතුය.
3. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ පිඹුරු වල කැබලි තුලනය කර වගුවක් මඟින් පෙන්වා තැබීම වඩාත් සුදුසුය.
4. මැනුම පිළිබඳව විශ්වාසයක් ඇති නොවන වචන වාර්තාවට ඇතුලත් නොකළ යුතුය. සැකසහිත කරුණු වාර්තා නොකළ යුතුය.
5. අධිකාරීපත්‍රය ක්‍රියාත්මක කිරීමෙන් පසු අධිකරණය විසින් ඉල්ලා ඇති කරුණු පිළිබඳව තොරතුරු නිශ්චිතව සටහන් කර යැවිය යුතුය. මෙම තොරතුරු සම්බන්ධව මිනින්දෝරු අධිකාරි හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් විශේෂ අවධානයක් යොමු කළ යුතුය (එනම් කොමිෂම නිවැරදිව ක්‍රියාත්මක කල බව තහවුරු කරගත යුතුය).
6. අධිකාරිපත්‍රයට පටහැනි හෝ යම් විශේෂ විස්තරයක් වේ නම්, ඒ පිළිබඳව විශේෂ සටහන් යටතේ සඳහන් කළ යුතුය.
7. අධිකාරිපත්‍රයේ අවශ්‍යතා ඉටු කර ඇති බවත්, සකස් කළේ, පරීක්ෂා කළේ, යනාදි විස්තර නිවැරදිව සඳහන් කළ යුතුය.
8. වාර්තාවට ගොනු කර ඇති සියළුම ලිපි අංක කර, අමුණා තැබිය යුතු අතර, වාර්තාව පිටුපස ගොනුවේ සඳහන් ලිපි සම්බන්ධව සඳහන් කළ යුතුය.
9. ක්ෂෙත්‍ර පොත සම්පූර්ණ කර තැබිය යුතු අතර, අදාළ සටහන් සහ සහතික එහි සඳහන් කළ යුතුය.
10. සියළු සංශෝධන නිම කරන ලද අනුරේඛනයේ සහ ඉඩම් විස්තර ලැයිස්තුවේ අංකිත දත්ත වාර්තාව සමඟ නොවරදවාම භාර දිය යුතුය.

5.23 ඡේදය ඇමුණුම 05

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත

මිනින්දෝරුවරයාගේ වාර්තාවේ ආකෘතිය
18 (1) (අ) වන වගන්තිය

.....දිසා අධිකරණයේ දී ය.
නඩු අංකය:
.....පැමිණිලිකරු,
එරෙහිව
.....විත්තිකරුවන්,
.....වන දින අංක..... අංක දරන පිඹුර.

(i) මැනීම ආරම්භ කිරීම සඳහා නියම කරන ලද දිනය:
(ii) (අ) මැනීම පිළිබඳ දැන්වීම පාර්ශවකරුවන් වෙත නිකුත් කරන ලද දිනය:
(ආ) මැනීම පිළිබඳ වාචික ප්‍රකාශය කරන ලද දිනය:
(iii) මැනීම් කරන ලද දිනය:
(iv) ඉඩමෙහි වූ ගොඩනැගිලි, තාප්ප, වැටවල්, ළිං, ගස්, වැවිලි, සහ වෙනත් වැඩි දියුණු කිරීම් පිළිබඳ විස්තර ද සමඟ මනින ලද ඉඩමේ ස්වාභාවය:
(v) මනින ලද ඉඩම, පැමිණිල්ලේ උපලේඛනයේ විස්තර කර ඇති පරිදි බෙදීමට අපේක්ෂිත ඉඩමම ද නැද්ද යන වග:
(vi) පැමිණ සිටි පාර්ශවකරුවෝ:
(vii) මැනීමට ඇති ඉඩම් පෙන්නුම් කළ තැනැත්තෝ:
(viii) පාර්ශවකරුවන් නොවන හිමිකම් පාන්නන්, ඔවුන්ගේ ලිපිනය සහ හිමිකම් වල ස්වාභාවය
(ix) අධිකාරිපත්‍රයේ නිශ්චිතව සඳහන් යම් විශේෂ කරුණක් හෝ දෙයක් පිළිබඳව කරන ලද විමර්ශනයේ ප්‍රතිඵලය:
(x) ළඟම තිබෙන ප්‍රසිද්ධ පාරේ සිට ඉඩමට දැනට තිබෙන ප්‍රවේශ මාර්ගය:
(xi) බෙදුම් නඩුව විනිශ්චය කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ ඊට ආධාර විය හැකි මැනීමට අදාළ හෝ මනින ලද ඉඩමට අදාළ කරුණු, දේවල් සහ පරිවේශ්ඨයන්:

.....වන මම ගෞරව බහුමානයෙන් යුක්තව ද අවංකව ද සත්‍ය ලෙස ද මෙයින් ප්‍රතිඥා/දිවුරුම් දී පහත සඳහන් පරිදි ප්‍රකාශ කර සිටිමි:-

(1) ඉහත සඳහන් නඩුවේ පත් කරන ලද අධිකාරිපත්‍රලාභියා මම වෙමි.
(2) ඉහත සඳහන් නඩුවේ දී මාවෙත නිකුත් කරන ලද අධිකාපත්‍රය එහි වූ විධානවලට අනුකූලව මා විසින් යථා පරිදි ක්‍රියාවෙහි යොදවනු ලැබූ අතර මගේ උපරිම දැනුම සහ මට ලැබුණු උපරිම තොරතුරු හා මගේ උපරිම විශ්වාසය අනුව ඉහත සඳහන් විස්තර සහ .....වන දින දරන හා අංක .....දරන මගේ පිඹුර සහ ඉඩම් විස්තර උපලේඛනයේ සහතික පිටපත සත්‍ය හා නිවැරදි බව මම ප්‍රකාශ කරමි.

සකස් කළේ: පරීක්ෂා කළේ:

....
රජයේ මිනින්දෝරු මිනින්දෝරු අධිකාරි

ඉහත දක්වා ඇත්තේ රජයේ මිනින්දෝරු ..... විසින් සකස්කරන ලද මිනින්දෝරු වාර්තාවේ සත්‍ය උද්ධෘතයක් වන අතර, එය ගරු අධිකරණය වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

.....

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි

..... දිස්ත්‍රික්කය

ශුද්ධි පත්‍රය

6 වැනි පරිච්ඡේදය

අත්කර ගැනීමේ මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය	
6.1.	ඉඩම් අත්කර ගැනීමේ පනතේ මැනුම් හා සම්බන්ධ වගන්ති	1
	2 වන වගන්තිය යටතේ කටයුතු කිරීම	
6.2.	අත්කර ගැනීමේ පනතේ 2(2) වගන්ති දැන්වීම ප්‍රදර්ශනය හා මැනුම් සඳහා ඉල්ලීම	1
6.3.	මැනුම් ඉල්ලීම හා මායිම් පෙන්වා දීම සම්බන්ධ කරුණු	1
6.4.	මැනුමට ප්‍රමුඛතාවය ලබාදීම	1
	මැනුම් කටයුතු සඳහා දැනුම් දීම	
6.5.	ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවීම	1
6.6.	සති දෙකකට කලින් දැනුම් දීම කළ යුතු අවස්ථා	2
	මැනීම සඳහා මායිම් පෙන්වීම	
6.7.	නම් කරන ලද නිලධාරි හෝ බලය දී සිටින අයෙකු මායිම් පෙන්වීම	2
6.8.	මායිම් පෙන්වීමට නිලධාරියෙකු නොපැමිණි විට කටයුතු කිරීම	2
	මැනීමට විරෝධතා දැක්වීම	
6.9.	මැනීමට විරෝධතා ඇති විට කටයුතු කිරීම	2
	2 වන වගන්තිය යටතේ සිදු කරන මැනුම්වල ක්ෂේත්‍ර වැඩ	
6.10.	කිසිදු හානියක් නොකිරීමට වග බලා ගැනීම	2
6.11.	හානියක් වීම වැලැක්විය නොහැකි විට කටයුතු කිරීම	2
6.12.	අත්කර ගැනීමේ මැනුම් කටයුතු සඳහා ඉඩමකට ඇතුල්වීමට ඇති බලය	2
6.13.	මායිම් පෙන්වීමට නිලධාරින්ගේ පැමිණීම	2
6.14.	ඉල්ලුම්කාර ආයතනයේ හා අයිතිකරුවන්ගේ ඉල්ලීම් පිළිබඳව සැලකිලිමත් වීම	3
6.15.	සුදුසු මැනුම් ක්‍රමයක් භාවිතා කිරීම	3
6.16.	සෑම මැනුමක්ම ජාතික භූමිතික පාලන ජාලයට සම්බන්ධ කර මැනීම	3
6.17.	මැනුමට භූලක්ෂණාත්මක තොරතුරු ඇතුලත් කළ යුතු බව	3
6.18.	විශේෂිත කරුණු ක්ෂේත්‍ර පොතේ සටහන් කිරීම	3
	2 වන වගන්තිය යටතේ මැනුමට අදාළ ප්‍රගමණ අනුරේඛනය පිළියෙල කිරීම	
6.19.	මැනුමට අදාළ ඉඩම, විශාල ඉඩමක කොටසක් වූයේ නම් කටයුතු කරන ආකාරය	3
6.20.	මායිම් පෙන්වා දීම හා බලා ගැනීම පිළිබඳව අනුරේඛනයේ සඳහන් කිරීම	3
6.21.	ප්‍රගමන අනුරේඛනය පිළියෙල කිරීම	3
6.22.	ප්‍රගමණ අනුරේඛනයේ ශීර්ෂය හා මැනුම් ඉල්ලීම් අංක ඇතුලත් කිරීම	3
6.23.	ගම් පුළුල් කිරීම සඳහා අත්කර ගැනීම් වලදී ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකයද ලිවීම	3
6.24.	ඉඩමේ පිහිටීම දැක්වීම	4
6.25.	හිමිකම් පෙන්වීමේදී කැබලි අංක යෙදීම	4

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
6.26.	රජයේ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කර නොමැති බවට අනු සටහන යෙදීම	4
6.27.	ප්‍රගමන අනුරේඛනයට අදාළ ඉඩම් විස්තර ලැයිස්තුව	4
6.28.	ප්‍රගමන අනුරේඛනය පරීක්ෂා කිරීම හා අනුමත කිරීම	4
6.29.	පිඹුරු පිටපත් නිකුත් කිරීම	4
6.30.	6 වන වගන්තිය යටතේ මැනුම් සඳහා භාවිතයට මැනුම් ගොනුව ලේඛනාගාරයේ ගබඩා කිරීම	4
	6 වන වගන්තිය යටතේ මැනුම් සිදුකිරීම	
6.31.	5 වගන්ති ගැසට් නිවේදනය හා 6 වගන්තිය යටතේ මැනුම	4
6.32.	6 වන වගන්තිය යටතේ අවසන් මැනුම් කටයුතු පැවරීම	4
	6 වන වගන්තිය යටතේ මැනුම්වල ක්ෂේත්‍රවැඩ	
6.33.	6 වන වගන්තිය යටතේ මැනුම සඳහා 2 වන වගන්තිය යටතේ මැනුමට අදාළ අංකිත දත්ත භාවිතා කිරීම	4
6.34.	අංකිත දත්ත භාවිතා කිරීමේ අපේක්ෂිත අරමුණු	5
6.35.	මාර්ග රක්ෂිත වෙන් නොකළ යුතු බව	5
6.36.	ඉඩම තුල හෝ මායිමේ වන ගොඩනැගිලි පිළිබඳව කටයුතු කිරීම	5
6.37.	වතු යාය තුල ඇති පුද්ගලික පාරවල් පිළිබඳව කටයුතු කිරීම	5
6.38.	වටිනා වගාවන් හා සියළුම ගොඩනැගිලි පිළිබඳ විස්තර සැපයීම	5
	පිඹුරුවල පරිමාණය	
6.39.	අත්කර ගැනීමේ පිඹුරුවල පරිමාණය තීරණය කිරීම	5
	6 වන වගන්තිය යටතේ මැනුම් වල පිඹුරු වැඩ	
6.40.	මැනුම් ප්‍රදේශයන් අනුව පිඹුරු පිළියෙල කිරීම	5
6.41.	මායිම්ගල් යොදන ලද මූලික පිඹුරු ප්‍රදේශ තුල හෝ යාව ඇති විට කටයුතු කිරීම	5
6.42.	හිමිකම් කියන්නන් එක් අයෙකුට වඩා වැඩි අවස්ථාවලදි කටයුතු කිරීම	6
6.43.	හිමිකම් පිඹුරු, නිදහස් දීමනා පත්‍ර සහ වෙනත් පිඹුරු පවතින අවස්ථාවලදි කටයුතු කිරීම	6
6.44.	අ.ග.පි./ අ.භූ.පි/ ප්‍රදේශ වල පුද්ගලික ඉඩම් මායිමක්, ස්ථාපනය කිරීමට අවශ්‍ය වූ විට කටයුතු කිරීම	6
6.45.	දීමනා පත්‍ර නිකුත්කිරීම සඳහා මැන ඇති ඉඩම් තුල වන විට කටයුතු කිරීම	6
	ඉඩම් විස්තර ලැයිස්තු	
6.46.	ඉඩම් විස්තර ලැයිස්තුවේ පෙර මැනුම් තොරතුරු දැක්වීම	6
6.47.	හිමිකම් කියන්නන් කිහිපදෙනෙකු සිටින විට ඉඩම් විස්තර ලැයිස්තුවේ තොරතුරු දැක්වීම	6
6.48.	ආගමික සිද්ධස්ථාන පවත්වාගෙන යනු ලබන ඉඩම් සඳහා ඉඩම් විස්තර ලැයිස්තුවේ තොරතුරු දැක්වීම	6
6.49.	නගරබද ප්‍රදේශ වල ඉඩම් සඳහා ඉඩම් විස්තර ලැයිස්තුවේ තොරතුරු දැක්වීම	6
6.50.	අත්කර ගැනීම සඳහා මැන ඇති ඉඩම් වල නම් ඉඩම් විස්තර ලැයිස්තුවේ දැක්වීම	6
6.51.	කටයුතු කිරීම සඳහා ඇති ඉඩම් ගැන පමණක් ඉඩම් විස්තර ලැයිස්තුවේ දැක්වීම	7
6.52.	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ ඉඩම් විස්තර ලැයිස්තුව පිළියෙල කිරීම	7

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
6.53.	මැනුම් ඉල්ලීම් අංකය හා අවශ්‍යතාවය ඉඩම් විස්තර ලැයිස්තුවේ ලිවීම	7
6.54.	රජයේ ඉඩම් සහ අයුතු අල්ලා ගැනීම් වලදී පිඹුරු සකස් කළ යුතු ආකාරය	7
6.55.	අ.ග.පි./ අ.භූ.පි/ කැඩැස්තර මැනුම් ප්‍රදේශයන්හි පුද්ගලික ඉඩම් වල ඉතිරි බිම් ප්‍රමාණය සඳහා කටයුතු කිරීම	7
6.56.	අ.ග.පි./ අ.භූ.පි. ප්‍රදේශ වල රජයේ ඉඩම් පිළිබඳව කටයුතු කිරීම	7
	පැරණි ලේඛන සංශෝධනය	
6.57.	පැරණි පිඹුරු වල අළුත් පිඹුරු සලකුණු කර යොමු සටහන් යෙදීම	7
6.58.	අත්කර ගැනීමේ කටයුතු නිම කර ඇති විට බිම් කැබැල්ල අවලංගු කිරීම නොකළ යුතු බව හා එවිට ක්‍රියා කළ යුතු ආකාරය	8
	අත්කර ගැනීමේ (සංශෝධන) පනත අනුව කටයුතු කිරීම	
6.59.	අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් ඉඩමක් අත්කර ගැනීමෙන් අනතුරුව ක්‍රියා කිරීමට ඇති අවස්ථාවන් තුන පිළිබඳව	8
6.60.	ඉහත පිඹුරු සංශෝධනය සඳහා මැනුම් ඉල්ලීම්	8
6.61.	සංශෝධිත පිඹුරුපත් යැවීම	8
6.62.	මැනුම් ඉල්ලීම් සමඟ ගැසට් නිවේදනය එවීම අවශ්‍ය නොවන බව	9
	ඇමුණුම්	
ඇමුණුම 01	ඉඩම් අත්කර ගැනීමේ පනතේ එක් එක් වගන්තිය යටතේ සිදුකෙරෙන කාර්යයන්	10
ඇමුණුම 02	**2 වන** හා **6 වන** වගන්ති යටතේ මැනුම් වලදී ඉඩමේ මායිම් බලාගැනීමට හෝ මනින අවස්ථාවේ පෙනී සිටීමට ඉඩම් හිමියාට යවන ලිපිවල ආකෘති	12

6 වැනි පරිච්ඡේදය

අත්කර ගැනීමේ මැනුම්

ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය

6.1. රජයට කිසියම් පොදු අවශ්‍යතාවයක් සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය වූවිට ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අදාළ සියළු බලධාරීන් විසින් කටයුතු කළ යුතුවේ. එබැවින් ඉඩම් අත්කරගැනීමේ මැනුම් කටයුතුවල යෙදෙන මිනින්දෝරුවරුන් විසින්ද ඉඩම් අත්කර ගැනීමේ පනතේ එක් එක් වගන්තිය යටතේ සිදුකෙරෙන කාර්යයන් සහ අදාළ නියෝග පිළිබඳ මනා දැනුමක් සහ අවබෝධයක් ලබාගැනීමට කටයුතු කිරීම ඉතා වැදගත් කාර්යයක් වේ (**ඇමුණුම 01**). ඉඩම් අත්කර ගැනීමට අදාළව මැනුම් කටයුතු සම්බන්ධයෙන් බලපැවැත්වෙන එම පනතේ 2, 3, 4, 5, 6 සහ 38 (අ) අතුරු විධානය යටතේ සහ ඉඩම් සන්තකය සත්‍ය වශයෙන් භාරගෙන නොමැති අවස්ථාවලදී සතු කිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නියම සන්තකය භාරගෙන ඇති අවස්ථාවන්හිදී එම ඉඩම අවසතු කිරීම හා අත්කර ගැනීමේ නීති කෘත්‍යය අත්හැර දැමීම සඳහා පිළිවෙලින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1), 39 අ (1) සහ 50 වගන්ති යටතේ කටයුතු කළ යුතුය. මැනුම් කාර්යයන් ඉටුකිරීමේදී අත්කරගැනීමේ නිලධාරියාගේ පහසුව පිණිසත්, ගැටළු පැන නැඟීම අවම කරගැනීම පිණිසත් නීත්‍යානුකූලභාවය ආරක්ෂා කර ගැනීමටත් මෙහි දැක්වෙන නියෝග පිළිපැදිය යුතුය.

2 වන වගන්තිය යටතේ කටයුතු කිරීම

6.2. යම් ප්‍රදේශයක ඉඩමක් පොදු කාර්යයක් සඳහා අවශ්‍ය බව ඉඩම් විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි 2(2) වගන්තියට අනුකූල වන පරිදි දැන්වීමක් අදාළ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත පිටපතක් සහිතව, ඉඩම පිහිටි ප්‍රදේශයේ ප්‍රකට ස්ථානවල ප්‍රදර්ශනය කරන ලෙස අදාළ ප්‍රදේශයේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා වෙත ඉඩම් විෂය භාර අමාත්‍යවරයා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2(1) වගන්තිය යටතේ නියම කරනු ලබයි.

අත්කර ගැනීමේ නිලධාරියා විසින්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2(2) වන ඡේදය යටතේ දැන්වීමක් අදාළ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් අනතුරුව, අත්කර ගැනීමට යෝජිත ඉඩම් මැන ප්‍රගමන අනුරේඛනයක් සකස් කිරීම සඳහා මැනුම් ඉල්ලීම සමග අත්කර ගැනීමේ පනතේ 2(2) වන ඡේදය යටතේ දැන්වීමද ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත එවනු ලැබේ.

6.3. දෙවන වගන්තිය යටතේ මැනීම සඳහා අදාළ මැනුම් ඉල්ලීම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කරන අවස්ථාවේදී, අත්කරගැනීමේ නිලධාරියා විසින් ඉල්ලුම්කාර ආයතනයේ ප්‍රාදේශීය නියෝජිතයින්ට, මැනුම් කටයුතු පවරනු ලබන මිනින්දෝරුවරයාට ඉඩම සොයා ගැනීමට සහ එහි මායිම් නිරූපණය කර ගැනීමට සහාය ලබා දෙන ලෙස දන්වා යවනු ලබයි.

6.4. මෙම මැනුම් ප්‍රමුඛතාවය මත හැකි තරම් කෙටි කාලයක් තුලදී නිම කළ යුතුය.

මැනුම් කටයුතු සඳහා දැනුම් දීම

6.5. ඉඩම් හිමිකම්පාන්නන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට ඉඩමේ මායිම් බලාගැනීමට/පෙන්වීමට මැනුම් කරන අවස්ථාවේ පෙනී සිටීමට හැකිවන පරිදි , ඉඩම මැනුම් කරන දිනයට අවම වශයෙන් දින 7 කට කලින් ලියාපදිංචි තැපෑලෙන් **ඇමුණුම 02** හි පරිදි දන්වා සිටිය යුතුය. ඒ සඳහා තැපැල් කාර්යාලය විසින් නිකුත් කරනු ලබන ලදුපත වැඩ නිම කර ඉදිරිපත් කරන මැනුම් ඉල්ලීම් ගොනුවට ඇතුලත් කළ යුතුය.

6.6. දුම්රිය දෙපාර්තමේන්තුව වැනි, ඉල්ලුම්කාර ආයතනවල නිලධාරින්ට තම තමන්ගේ මූලස්ථාන වල සිට පැමිණීමට සිදුවන බැවින්, ලිපියක් මඟින් සති දෙකකට කලින් දැනුම් දීම කළ යුතුය. ලිඛිත දැනුම් දීමට අමතරව දුරකථන, විද්‍යුත් තැපෑල වැනි අනෙකුත් නවීන සන්නිවේදන ක්‍රමවේදයන් භාවිතයෙන් එවැනි නිලධාරින් සම්බන්ධ කරගෙන දෙපාර්ශවයටම පහසුවන පරිදි මැනුම් වැඩ සංවිධානය කරගත යුතුය.

මැනීම සඳහා මායිම් පෙන්වීම

6.7. සියළුම අත්කර ගැනීමේ මැනුම් වල මායිම්, ඒවා පෙන්නුම් කර දීමට නම් කරන ලද නිලධාරි නැතහොත් ඔහු විසින් ලිපියක් මඟින් බලය දී සිටින තැනැත්තා විසින් භූමියෙහි පෙන්නුම් කළ යුතුය. මැනුම් ඉල්ලීම් ගොණුවේ නිම කරන ලද ලියකියවිලි සමඟ මෙම බලය පවරන ලද ලිපි ද අමුණා තිබිය යුතුය.

6.8. මායිම් පෙන්වා දීමට බලය දී ඇති කෙනෙකු නියම කරන ලද දිනයෙහි නොපැමිණි විට මිනින්දෝරුවරයා විසින් ඒ බව මිනින්දෝරු අධිකාරි වෙත වාර්තා කළ යුතු අතර මිනින්දෝරු අධිකාරි විසින් අදාළ ආයතන සමඟ සාකච්ඡා කර සුදුසු පරිදි පවතින ගැටළු විසඳා දීමට කටයුතු කළ යුතුය. මිනින්දෝරු අධිකාරිවරයාට විසඳුමක් ලබාදීමට අපහසු වන අවස්ථාවක ඒ බව අත්කර ගැනීමට ඉල්ලීම් කර ඇති අමාත්‍යාංශය සමඟ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි සහ පළාත් සර්වේයර් ජනරාල් මඟින් සර්වේයර් ජනරාල් වෙත අප්‍රමාදව දැන්විය යුතුය.

මැනීමට විරෝධතා දැක්වීම

6.9. විරෝධතා හෝ අවහිරකම් ඇතිවුවහොත් එවැනි කරුණු අත්කර ගැනීමේ නිලධාරියා වෙත දන්වා පොලිස් ආරක්ෂාව යටතේ ක්ෂෙත්‍ර කටයුතු නිම කළ යුතුය.

2 වන වගන්තිය යටතේ සිදු කරන මැනුම්වල ක්ෂෙත්‍රවැඩ

6.10. අත්කර ගැනීමට අදහස් කරනු ලබන ඉඩමේ මායිම් හෙලිකිරීමේදී සහ මැනීමේදී වගාවන්ට, දේපළ වලට හෝ මායිම් වලට කිසිදු හානියක් නොකිරීමට මිනින්දෝරුවරුන් වගබලා ගත යුතුය.

6.11. එහෙත් යම් වටිනාකමින් යුත් කිසියම් අලාභ හානියක් වීම නොවැලැක්විය හැකි නම්, එවැනි විටෙක ඉඩම් හිමියා හෝ ඔහුගේ නියෝජිතයා අත්සන් තැබූ, අලාභයේ ප්‍රමාණය විස්තර කරන ප්‍රකාශයක් මිනින්දෝරුවරයා විසින් ලබා ගත යුතුය.

6.12. මැනුම් කටයුතු කරනු ලබන මිනින්දෝරුවරයා ඕනෑම පදිංචි ගොඩනැගිල්ලකට හෝ ඊට සම්බන්ධ කොටු කර ඇති අංගනයකට හෝ ගෙවත්තකට ඇතුළුවීමට අත්කර ගැනීමේ පනතේ 2 වන ඡේදයේ අනුඡේද (3) න් බලය පවරා ඇත. ඒ බව ඔහු විසින් එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවන් වෙත දින 7 කට කලින් ලිඛිතව දන්වා යැවීමට වග බලා ගත යුතුය.

6.13. දැනුම් දීම මත අත්කර ගැනීම සඳහා යෝජිත ඉඩමෙහි මායිම් පෙන්වාදීම සහ බලාගැනීම සඳහා නම්කර ඇති ඉල්ලුම්කාර ආයතනයේ ප්‍රාදේශීය නියෝජිතයන් සහ ඉඩම්වල හිමිකම්පාන්නන්, ඔවුනොවුන්ම වශයෙන් පෙනී සිටි බවටත්, නැතහොත් ඒ වෙනුවට බලය පවරන ලද නියෝජිතයන් සහභාගි වී ඇති බවටත් තහවුරු කරගත යුතු අතර මායිම් පෙන්වා දුන් බවට සහ බලාගත් බවට අත්සන් ලේඛනයක් ලබා ගත යුතුය. තවද එම අත්සන් ලේඛනය මැනුම් ඉල්ලීම් ගොණුවට අමුණා තැබිය යුතුය.

6.14. මිනින්දෝරුවරයා විසින් පෙන්වා දෙනු ලබන මායිම් ලී කුඹුක්කු යොදා සලකුණු කරන අවස්ථාවේදී, එමඟින් ඉල්ලුම්කාර ආයතනයේ අවශ්‍යතාවයන් ඉටුවීම මෙන්ම ඉඩම් වල හිමිකම්පාන්නන්ගේ අයිතිවාසිකම් හැකිතාක් දුරට නිවැරදිව මැන පෙන්වා දීමට හැකි වන පරිදි කටයුතු කළ යුතුය.

6.15. දෙවන වගන්තිය යටතේ ප්‍රගමණ අනුරේඛන පිළියෙල කිරීම සඳහා කරනු ලබන මැනුම් විකෝනමාණය/පූර්ණමානය හෝ වෙනත් සුදුසු මැනුම් ක්‍රමයක් භාවිතයෙන් කළ හැකිය. අත්කර ගැනීමට අදාළ ඉඩමේ පිටස්තර මායිම්, ඉඩම අභ්‍යන්තරයේ ඇති හිමිකම් කියනු ලබන සියළුම ඉඩම්වල මායිම් හා හඳුනාගත් විට රජයේ ඉඩම් වල මායිම්ද ලී කුඹුක්කු ගසා වෙන් කර මැනිය යුතුය.

6.16. දෙවන වගන්තිය යටතේ මැනුම් වලදී පැරණි මැනුම් වැඩ පිළිබඳව සොයා බැලීම් කිරීම අත්‍යවශ්‍ය නොවන බැවින් පැරණි මැනුම් වැඩ ගැන සොයා බැලීම් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී සිදු නොකර මැනුම් ඉල්ලීම කඩිනමින් ක්ෂේත්‍රයට නිකුත් කළ යුතුය. හැකි සෑම අවස්ථාවකදීම මෙම මැනුම් ජාතික භූමිතික පාලන ජාලයට සම්බන්ධ කර මැනීම කළ යුතුය.

6.17. අත්කර ගැනීමට නියමිත ඉඩම, ඉඩම් හිමිකම්පාන්නන්ට හා ඉල්ලුම්කාර ආයතනයට නිවැරදිව සොයා ගැනීමට හැකිවන පිණිස, හැකි සෑම අවස්ථාවන්හිදීම අවට ඇති පාරවල්, ගොඩනැගිලි , බෝක්කු, ළිං, වැනි ප්‍රධාන භූලක්ෂණාත්මක අංග ලක්ෂණයන් ප්‍රගමණ අනුරේඛනය මත පෙන්විය යුතු හෙයින් ඒවාද මැනුම් කළ යුතුය.

6.18. මිනින්දෝරුවරයා විසින් අදාළ හිමිකම්පාන්නන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් වශයෙන් පැමිණ සිටියාද, නැතහොත් නොපැමිණියාද යන්න, අත්කර ගැනීම සඳහා වන ප්‍රදේශය පෙන්නුම් කිරීම සඳහා ඇති ලී කුඹුක්කු ඔවුන්ට පෙන්වා දුන්නේද යන්න සහ ඔවුන් ඉඩමේ මුළු බිම් ප්‍රමාණයම සඳහා ගත් තීරණයන්ට එකඟ වූයේද යන්න ගැනද ක්ෂේත්‍ර පොතේ සටහන් කළ යුතුය.

2 වන වගන්තිය යටතේ මැනුමට අදාළ ප්‍රගමණ අනුරේඛනය පිළියෙල කිරීම

6.19. අත්කර ගැනීම සඳහා ඇති ඉඩම, විශාල ඉඩමක බිම් කොටසක් වූයේ නම්, එම විශාල ඉඩම සම්පූර්ණයෙන්ම හෝ අර්ධව පිටත මායිම කටු සටහනක් වශයෙන් කුඩා පරිමාණයකින් ප්‍රගමණ අනුරේඛනය මත පෙන්විය යුතුය. එමඟින් අත්කර ගැනීම සඳහා වූ කොටස සොයා ගැනීමට පහසු වනු ඇත.

6.20. අත්කර ගැනීමට යෝජිත ඉඩමට අදාළ ග්‍රාම නිලධාරීන්ගේ නම් සහ මායිම් ලකුණු කරන අවස්ථාවේදී පැමිණ සිටි ඉඩම් හිමිකම්පාන්නන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ නම් පිළිබඳව පැහැදිලි විස්තරයක් ප්‍රගමන අනුරේඛනයේ දැක්විය යුතුය.

6.21. මනින ලද දත්ත ඇසුරින් A3 ප්‍රමාණයේ පිඹුරු කඩදාසි මත නියැකීම් කර ප්‍රගමන අනුරේඛනය පිළියෙල කළ යුතුය.

6.22. ප්‍රගමණ අනුරේඛනයේ ශීර්ෂයෙහි මැනුම් ඉල්ලීම් අංකය ඇතුලත් කරමින් ප්‍රගමණ අනුරේඛනය ලෙස විස්තර කළ යුතු අතර ඉඩම අත්කර ගැනීමේ අරමුණද ඊට පහලින් සඳහන් කළ යුතුය. එයට අමතරව, ප්‍රාදේශීය ලේකම්ගේ මැනුම් ඉල්ලීම් අංකය, ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය, ඉල්ලුම්කාර අමාත්‍යාංශයේ/ආයතනයේ යොමු අංකය (ඇත්නම්) සහ ස.ජ. ගේ යොමු අංකය සෑම විටම අනුරේඛනයේ ඊට පහලින් පෙන්විය යුතුය.

6.23. ගම් පුළුල් කරගැනීම සඳහා අත්කර ගැනීමේ මැනුම් වලදී ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා ගේ අංකය ද අනුරේඛනයේ දැක්විය යුතුය.

6.24. තවද එහි මූලික පිඹුරක මෙන්, පිහිටීම (ගම, සුළු නගරසභා/ නගර සභා සීමාව තුලට අයත්වේ නම් අදාළ කොට්ඨාශ අංකය සහ එහි නමද සහිතව ගමට යටින් වරහන් තුල ද, ග්‍රාම නිලධාරි කොට්ඨාශය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, දිස්ත්‍රික්කය සහ පළාත) අනුරේඛනයේ ඊසාන දිග පැත්තේ පෙන්විය යුතුය.

6.25. හිමිකම් කියා සිටින පරිදි ඉඩම මනිනු ලබන අතර, සෑම වෙනස් හිමිකමක් සඳහාම වෙන් වෙන් වශයෙන් ඉංග්‍රීසි හෝඩියේ අකාරාදී පිළිවෙලට ‘ I ’ සහ ‘ O ’ අක්ෂර හැර කැබලි අංක යෙදිය යුතුය.

6.26. ඊට අමතරව “අනුරේඛනයේ පෙන්වා ඇති ප්‍රදේශය තුල ඇති රජයේ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කර නොමැත.” යනුවෙන් අනු සටහනක්ද යෙදිය යුතුය.

6.27. අනුරේඛනය මත හෝ එහි ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනත් A3 ප්‍රමාණයේ කඩදාසියක, බිම් කැබලි අංකය, ඉඩමේ නම, ප්‍රමාණය, හිමිකම් කියනු ලබන අයගේ නම සමඟ ලිපිනය සහ මායිම් විස්තර උප ලේඛනය (එනම් උතුරට, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට) වශයෙන් තොරතුරු ඉඩම් විස්තර ලැයිස්තුවට ඇතුලත් විය යුතුය.

6.28. ප්‍රගමන අනුරේඛනය මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කළ වහාම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත අනුමත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

6.29. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් එය අනුමත කිරීමෙන් අනතුරුව, ප්‍රාදේශීය ලේකම් , ඉඩම් අමාත්‍යාංශය සහ ඉල්ලුම්කාර දෙපාර්තමේන්තුව/ආයතනය අයත් වන අමාත්‍යාංශයට 4.76 ඡේදය අනුව පිටපත් නිකුත් කළ යුතුය. හිමිකම් කියන්නන්ද පිඹුරු පිටපත් ඉල්ලුම් කරන්නේ නම් මුදල් අයකර පිටපත් නිකුත් කළ හැකිය.

6.30. A3 ප්‍රමාණයේ මූලික ක්ෂෙත්‍ර පත්‍රය, 1:10,000 ප්‍රමාණයෙහි ස්ථානය දැක්වෙන අනුරේඛනය සහ අදාළ සියළු ලිපි ලේඛන ඇතුලත් මැනුම් ඉල්ලීම් ලිපි ගොනුව ක්‍රමවත්ව සකස් කොට අංකිත දත්ත සමඟ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගොනුකර තැබීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කළ යුතුය. 6 වන වගන්තිය යටතේ මැනුම් කරන අවස්ථාවේදී පැරණි මැනුම් වැඩ ගැන සොයාබැලීම් කිරීමට මෙම ලේඛන උපයෝගී කරගත යුතුය.

6 වන වගන්තිය යටතේ මැනුම් සිදු කිරීම

6.31. ඉඩම් අමාත්‍යවරයා විසින් 5 වැනි වගන්තිය යටතේ ගැසට් නිවේදනය නිකුත් කළ වහාම ප්‍රාදේශීය ලේකම් විසින් 6 වැනි වගන්තිය යටතේ මැනීමේ ඉල්ලීම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත නිකුත් කරනු ලැබේ. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අවශ්‍ය කටයුතු වලින් අනතුරුව ප්‍රමුඛතා මත එය කඩිනමින් අවසන් කළයුතු බවට උපදෙස් සමඟ ක්ෂෙත්‍රයට අප්‍රමාදව නිකුත් කළ යුතුය.

6.32. මේ සඳහා ඉහලම ප්‍රමුඛතාව දී කටයුතු කළ යුතු අතර හැකි සෑමවිටම ප්‍රගමණ අනුරේඛනය පිළියෙල කළ මිනින්දෝරුවරයා වෙත 6 වන වගන්තිය යටතේ අවසන් මැනුම් කටයුතු පැවරීමට අදාළ මිනින්දෝරු අධිකාරිවරයා කටයුතු කළ යුතුය.

6 වන වගන්තිය යටතේ මැනුම්වල ක්ෂෙත්‍රවැඩ

6.33. 2 වන වගන්තිය යටතේ පිළියෙල කරන ලද ප්‍රගමණ අනුරේඛනයට අදාළ අංකිත දත්ත භාවිතා කර වට මායිමේ පමණක් මායිම්ගල් දමා මැනුම් ඉල්ලීමෙහි අවශ්‍යතාවය අනුව මැන අත්කර ගැනීමේ පිඹුරක් සකස් කරනු ලැබේ. මෙහි ක්ෂෙත්‍ර සටහන් තැබීම 11 වැනි පරිච්ඡේදය අනුව සිදු කළ යුතුය.

6.34. මෙහිදී පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

(අ) අත්කර ගැනීමට නියමිත ඉඩම ප්‍රගමණ අනුරේඛනයේ දැක්වෙන පරිදිම නිවැරදිව මැන පෙන්වීම

(ආ) අත්කර ගැනීමේ මැනුම් ඉතා කෙටි කාලයක් තුලදී නිම කිරීමට හැකි වීම

6.35. අත්කර ගැනීම සඳහා මනින ලද ඉඩම තුල ඇති මාර්ග සඳහා වෙන් කළ බිම් (රක්ෂිත) භූමියෙහි ලකුණු නොකළ යුතුය.

6.36. අත්කර ගැනීමේ මැනුමකට මායිම් වන ගොඩනැගිල්ලක් ඇතිවිට හෝ අත්කර ගැනීමේ මැනුමකට ගොඩනැගිල්ලක කොටසක් ඇතුලත් වන විට හෝ එය සම්පූර්ණයෙන්ම මැන පිඹුරෙහි පෙන්නුම් කළ යුතුය.

6.37. අත්කර ගැනීම සඳහා ඇති වතු යායවල් තුළ ඇති පුද්ගලික පාරවල් මැනිය යුතු නොවේ.

6.38. සියළුම ගොඩනැගිලි සහ වටිනා වගාවන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු සැපයිය යුතුය. හෙක්ටයාර් 2කට වැඩි බිම් කැබලි තුළ ඇති ගස්, තැනින් තැන විසිරී ඇතිවිට හෝ ගණනින් ස්වල්ප විට පමණක් ඒවා ගණන් ගත යුතු නොවේ. නමුත් නගර සභා තුළ ඇති ඉඩම් සඳහා, එම ඉඩම් වල ප්‍රමාණයන් ගැන නොසලකා සියළුම ගස් ගණන් ගත යුතුය.

පිඹුරුවල පරිමාණය

6.39. හෙක්ටයාර් 4 ට වඩා වැඩි අත්කර ගැනීමේ මැනුම් සහ ගම් පුළුල් කිරීම සඳහා වූ අත්කර ගැනීමේ මැනුම් පිඹුරු හැර අත්කර ගැනීමේ මැනුම් පිඹුරු අඳිනු ලබන්නේ බිම් කැබලි වල ප්‍රමාණයන්ට ගැලපෙන ලෙස සහ ඉඩම් වල වටිනාකම් අනුව, 1:2,000, 1:1000 හෝ 1:500 පරිමාණයන්ටය. ගම් පුළුල් කිරීම සඳහා වූ අත්කර ගැනීමේ මැනුම් පිඹුරු ඇඳීම 1:4,000 පරිමාණයට කළ හැකිය. මේ සම්බන්ධයෙන් මිනින්දෝරු අධිකාරීගේ උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

6 වන වගන්තිය යටතේ මැනුම් වල පිඹුරු වැඩ

6.40. (අ) ලංකා මැනුම් ප්‍රදේශ වල හෝ භූලක්ෂණාත්මක මූලික පිඹුරු ප්‍රදේශ වල හෝ අවසාන නිරවුල් ප්‍රදේශ වල හෝ නිරවුල් නොකරන ලද ප්‍රදේශ වල හෝ අත්කර ගැනීමේ මැනුම් A3 ප්‍රමාණයේ පත්‍ර වල අතිරේකයක් හෝ අතුරු පිඹුරක් ලෙස ඇඳිය යුතුය.

(ආ) ලංකා මැනුමක් කර ඇති සහ නිරවුල් කිරීමක් බලාපොරොත්තු වන හෝ නිරවුල් කිරීමේ නිලධාරීගේ අවසාන වාර්තාව නිකුත් කිරීම බලාපොරොත්තු වන ප්‍රදේශවල අත්කර ගැනීමේ මැනුම් කරන විටදී , එක් එක් කැබැල්ලේ ප්‍රමාණය වෙන වෙනම පියවීම කළ යුතු අතර ශේෂ ප්‍රදේශය හෙක්: 2ට වැඩි අවස්ථා වලදී මුල් පිඹුරේ වට මායිම ඇඳ පෙන්විය යුතුය.

(ඇ) කැඩැස්තර ප්‍රදේශ සඳහා **21.49- 21.53** ඡේදයන් බලන්න.

6.41. අත්කර ගැනීමේ මැනුමකට ඇතුලත් වන හෝ යාවන හෝ මායිම්ගල් යෙදූ මූලික පිඹුරු මායිම් මැන, අළුත් පිඹුරෙහි පෙන්විය යුතුය. ක්‍රියා කරන ලද බැවින් අවලංගු කළ නොහැකි පැරණි මූලික පිඹුරු වල මායිම්, මායිම්ගල් යෙදූ මූලික පිඹුරු මෙන් පෙන්වා සඳහන් කළ යුතුය. එහෙත් ඒවා දැනට තිබෙන අයුරු නැවත මැනිය හැක.

6.42. ඉඩම සඳහා අයිතිවාසිකම් එකකට වැඩිය ඇත්නම් ඉඩම බෙදුම් නඩුවකට සම්බන්ධ වී ඇතිද පිළිබඳව මිනින්දෝරුවරයා විසින් හිමිකම්පාන්නන්ගෙන් හා/ හෝ ග්‍රාම නිලධාරීගෙන් විමසා දැන ගත යුතුය. බෙදුම් නඩු පිඹුරක් ලබා ගත හැකිව තිබේ නම් හා මායිම් පිළිබඳ අරගලයක් ඇතිවන්නට ඉඩ තිබේ නම් ඔහු විසින් අභ්‍යන්තර මායිම් අධිස්ථාපනය කළ යුතුය. සැලකිය යුතු වෙනස් වීම් නොමැති නම් දැනට තිබෙන මායිම් පිළිගනු ලැබේ. එසේ නැතිනම් බෙදුම් නඩු පිඹුරෙහි වූ මායිම් ලකුණු කර මෙම මායිම් හා දැනට තිබෙන මායිම් අතර ඇති කොටස් සඳහා වෙනම කැබලි අංක යෙදිය යුතුය.

6.43. අත්කර ගැනීමට නියමිත ඉඩම් තුළට, හිමිකම් පිඹුරු සහිත ඉඩම්, මුළුමනින්ම පැවරූ රේඛා චිත්‍ර මඟින් දැක්වෙන ඉඩම් හෝ නිරවුල් කිරීමේදී පෞද්ගලික යයි නියෝග නිකුත් කළ ඉඩම් ඇතුලත් වන විට, ඒ පිලිබඳව **12.42 වැනි ඡේදය** අනුව කටයුතු කළ යුතුය.

6.44. අවසාන නිරවුල් ප්‍රදේශ තුළ (උදා: අ.ග.පි, අ.භූ.පි.) රජය/ පෞද්ගලික සතු මායිමක්, ස්ථාපනය කිරීමට අවශ්‍ය වූ විට , අ.ග.පි/ අ.භූ.පි. මායිම නැවත ලකුණු කර, එය **9.57 වැනි ඡේදයෙහි** සඳහන් ප්‍රකාර විශාල කර ඇඳීමකින් හරි වැරදි බැලිය යුතුය.

6.45. අත්කර ගැනීමට නියමිත ඉඩම් තුළ තිබෙන දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා මැන ඇති ඉඩම් මායිම් ස්ථීර රතු රේඛා වලින් පෙන්විය යුතු අතර, එක් එක් රේඛා චිත්‍ර පිඹුරට නැතහොත් සීමිත දීමනා රේඛා චිත්‍රයට අයත් වන ඉඩම් කොටස් "රජය විසින් හිමිකම් කියා සිටී " යනුවෙන් විස්තර කොට වෙනම කැබලි අංක යොදා පෙන්නුම් කළ යුතුය. ඉතිරි කැබැල්ල සඳහා කැබලි අංකයක් ලබා දී මුල් අනන්‍යතාවයට අදාළ විස්තර සඳහන් කළ යුතුය.

ඉඩම් විස්තර ලැයිස්තු

6.46. අත්කර ගැනීමට නියමිත බිම් කැබලි වලට හි.පි., රේඛා චිත්‍ර පිඹුරු හෝ හි.පි. කොටස් ඇතුලත් වන විටෙක ඉඩම් විස්තර ලැයිස්තුවේ පැරණි බිම් කැබලි වලට යොමුව තීරයේ එකී සෑම බිම් කැබැල්ලක් සඳහා, අදාළ හි.පි.අංකය /රේ.චි. අංකය පිඹුරේ පැරණි කැබලි අංකයට පසුව වරහන් තුල සඳහන් කළ යුතුය. කලින් අවලංගු කළ නැතහොත් අවලංගු කළ හැකි පරණ මු.පි. ගැනද සඳහන් කළ යුතුය. එහෙත් ඒවායේ මායිම් පිඹුරේ පෙන්වනු නොලැබේ.

ඉහත සඳහන් විස්තර වලින් පසු ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීමේදී " ..... හි ..... විසින් අයිතිවාසිකම් කියනු ලැබේ. " යනුවෙන් අ.ග.පි. / අ.භූ.පි. තුළ සිටින අයිතිවාසිකම් කියන්නවුන්ගේ නම් සහ ඔවුන්ගේ ලිපිනයන් ඇතුළත් කරනු ලැබේ.

6.47. යම් බිම් කැබැල්ලක් සඳහා එක් හිමිකම් කියන්නකුට වඩා වැඩියෙන් සිටින විටෙක සියළුම හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් ඉඩම් විස්තර ලැයිස්තුවේ සටහන් කළ යුතුය.

6.48. ආගමික සිද්ධස්ථාන පවත්වාගෙන යනු ලබන ඉඩම් සඳහා එම සිද්ධස්ථාන භාරකරුගේ නම ඉඩම් විස්තර ලැයිස්තුවේ යෙදිය යුතුය.

6.49. නගරබද ප්‍රදේශ වල , වරිපනම් අංක ඇතුලත් කිරීමේ දී , ඉඩමේ නමට පසුව , පාරවල් වල නම් සමඟ වරිපනම් අංක ..... පාර නැතහොත් වරිපනම් අංක ..... දරණ ඉඩම හෝ වරිපනම් අංක ..... දරණ ඉඩමෙන් කොටසක් යනුවෙන් යෝග්‍ය පරිදි ඇතුලත් කළ යුතුය.

6.50. අත්කර ගැනීම සඳහා මැන ඇති සියළුම ඉඩම් වල නම් සඳහන් කළ යුතුය. "යනාදිය" යන භාෂිත භාවිතා නොකළ යුතුය.

6.51. අත්කර ගැනීම සඳහා ඇති ඉඩම් කැබලි හැර අන් කිසිවක් අත්කර ගැනීමේ ඉඩම් විස්තර ලැයිස්තු වල දැක්විය යුතු නොවේ. එනම් :

(1) ප්‍රකාශයට පත් කිරීම අනුව අත්කර ගැනීමට නැතහොත් වෙන් වී ගිය කොටසක් ඇතිවූ නිසා අත්කර ගැනීමක් අවශ්‍ය වූවිට,
(2) හුවමාරු කිරීමක් සඳහා දීමට,
(3) අත්කර ගැනීමේ දළ සටහනේ පෙන්වා ඇති එහෙත් රජය සතු බව සොයාගනු ලැබූ ඉඩම්
යනාදිය අත්කර ගැනීමේ ඉඩම් විස්තර ලැයිස්තු වලට ඇතුලත් නොකළ යුතු අතර ඒවා පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවට ඇතුලත් කළ යුතුය.

6.52. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්කර ගත් විට, දැනටමත් එම ඉඩම් රජය වෙත පවරා ඇති බව සිහි තබා ගත යුතුය. එබැවින් ඉඩම් විස්තර ලැයිස්තු ලියනු ලබන විට හිමිකම් කියන්නාගේ නම "රජය" යනුවෙන් ලිවිය යුතුය. එවැනි බිම් කැබලි ඉදිරියෙන් පහත දක්වා ඇති කරුණුද සඳහන් කළ යුතුය.

" ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදි. මුල් හිමිකම් පාන්නේ ..... (මෙහි මුල් හිමිකම් පාන්නන්ගේ නම් සහ ලිපිනයන් ඇතුලත් කරන්න.) ..... අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා. "

6.53. ප්‍රාදේශීය ලේකම්ගේ මැනුම් ඉල්ලීම් අංකය, අත්කර ගැනීමේ අරමුණ, ඉඩම් අමාත්‍යාංශයේ සහ ඉල්ලුම්කාර දෙපාර්තමේන්තුව / ආයතනය අයත්වන අමාත්‍යාංශයේ යොමු අංකය සහ දිනයන්ද සහ සර්වේයර් ජනරාල්ගේ යොමු අංකය සහ දිනය පිළිවෙලින් ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කළ යුතුය.

6.54. අත්කර ගැනීමේ ප්‍රගමණ අනුරේඛනයේ වෙන් වෙන් වශයෙන් පෙන්වා නොමැති, එහෙත් අදාළ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ අවශ්‍යතාවය සඳහා වෙන් කර සලකුණු කර ඇති රජය සතු බිම් කැබලි සහ මැනුමට යාව පිහිටි ඕනෑම අයුතු ලෙස අල්ලා ගත් ඉඩම්, අත්කර ගැනීමේ පිඹුරෙහි පෙන්වන්නේ නැත. එවැනි බිම් කැබලි සඳහා **4.54** ඡේදයේ පරිදි වෙනම මූලික පිඹුරු සමඟ ඊට සම්බන්ධව ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කළ යුතුය.

6.55. (අ) අ.ග.පි./ අ.භූ.පි. තුළ ඇති පෞද්ගලික ඉඩම් වල ශේෂ ප්‍රදේශ සඳහා ඉතිරි බිම් ප්‍රමාණ සහ කැබලි අංක අවශ්‍ය නොවේ. පෞද්ගලික ඉඩම් වල ඉතිරි කොටස් සඳහා ඒවායේ මුල් බිම් කැබලි අංක වෙනස් නොකළ යුතු අතර හෝ ඒවායේ බිම් ප්‍රමාණයන් ද සංශෝධනය කරනු නොලැබේ.

(ආ) කැඩැස්තර මැනුම් ප්‍රදේශ තුළ ඉතිරි බිම් ප්‍රමාණ එක් එක් කැබැල්ල සඳහා වෙන වෙනම ඇඳ කැබලි කර පිඹුරේ පෙන්වා දිය යුතුය. **21.49 - 21.53 ඡේදයන්** බලන්න.

6.56. අත්කර ගැනීමේ ප්‍රගමන අනුරේඛනයේ වෙන් වෙන් වශයෙන් පෙන්වා නොමැති රජයේ ඉඩමක් අත්කර ගැනීමක් සම්බන්ධයෙන් මැන, මායිම් සලකුණු කර ඇතොත්, එවැනි බිම් කැබලි අ.ග.පි. අතිරේකයක ඇඳ, අ.ග.පි. සංශෝධනය කර ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කරනු ලැබේ. අ.ග.පි. ඉඩම් විස්තර ලැයිස්තුවේ මුල් බිම් කැබැල්ලට නව අතිරේකය පිළිබඳව යොමුව දැක්විය යුතුය.

පැරණි ලේඛන සංශෝධනය

6.57. අත්කර ගැනීමේ මැනුමට ඇතුලත් විය හැකි මූලික පිඹුරු, හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර, රේඛා චිත්‍ර පිඹුරු, නි.නි./පෞ. බිම් කැබලි වල මුල් ක්ෂේත්‍ර පත් මත අත්කර ගැනීමේ මැනුමේ පිටස්තර මායිම්

පැන්සලෙන් ඇඳ පෙන්වනු ලැබේ. මෙම ක්ෂෙත්‍ර පත් මත අත්කර ගැනීමේ පිඹුරේ අළුත් පිඹුරු අංකය යොදමින් යොමු සටහනක් යෙදිය යුතුය.

6.58. (අ) අත්කර ගැනීමේ මැනුම් පිඹුරක අත්කර ගැනීමේ කටයුතු නිම කර ඇති විට, එහි කිසිදු බිම් කැබැල්ලක් අවලංගු කිරීම නැතහොත් සංශෝධනය කිරීම නොකළ යුතුය. එවැනි බිම් කැබැල්ලක් තුල කරන අළුත් වැඩ සඳහා අළුත් මූලික පිඹුරක් හෝ අ.ග.පි/ අ.භූ.පි. සඳහා පරිපූරකයක් නිකුත් කරනු ලැබේ. එවැනි බිම් කැබලි සඳහා ඉඩම් විස්තර ලැයිස්තුවේ වෙනත් කිවයුතු කරුණු තීරයෙහි " අත්කර ගන්නා ලද …….. කැබැල්ලෙන් කොටසක් " යනුවෙන් සඳහන් කරනු ලැබේ. කිනම් අවස්ථාවකදී හෝ අත්කර ගැනීමේ පිඹුරක් තුළ නව පිඹුරෙහි වට මායිම් **4.65 වැනි ඡේදය** අනුව ඇඳ සංශෝධනය කරනු නොලැබේ. නමුත් මූලික පිඹුරක පරිදි පැන්සලෙන් තහනම් කරනු ලැබේ.

(ආ) කෙසේ වෙතත් අත්කර ගැනීමේ කටයුතු කරගෙන යන අවස්ථාවේ දී අත්කර ගැනීමේ නිලධාරියාගේ ඉල්ලීම මත අත්කර ගැනීමේ පිඹුරක් සංශෝධනය කිරීමේ වරදක් නොමැත. එවැනි සංශෝධනයක් පළමුවෙන්ම, මුල් කාලේ ක්ෂෙත්‍ර පත්‍රවලම සිදු කරනු ලැබේ.

මුල් බිම් කැබැල්ලක් අතුරු කොටස් වලට බෙදීමට අවශ්‍ය වුවහොත් එසේ අතුරු බෙදීම් කළ මායිම් එම මුල් පිඹුරේම ඇඳ, පිඹුර මත වූ මුල් බිම් කැබලි අංක කපා හැර, පිඹුරේ භාවිතා කර ඇති අන්තිම කැබලි අංකයේ සිට අතුරු කොටස් වලට කැබලි අංක යොදනු ලැබේ. අළුතින් ඉඩම් විස්තර ලැයිස්තුවක් පිළියෙල කර එහි මුද්‍රණයක් ලබා ගත යුතුය. මුල් ඉඩම් විස්තර ලැයිස්තුවේ ඇති පරණ කැබලි අංකය හරහා, ලොකු කුරුස ලකුණක් රතු වර්ණයෙන් යොදා, වෙනත් කිවයුතු කරුණු තීරයෙහි " …… වන පිටුවේ කැබලි අංක …… බලන්න. " යනුවෙන් රතු වර්ණයෙන් සටහනක් යෙදිය යුතු ය.

(ඇ) නිකුත් කර ඇති මුද්‍රණයේ සියළුම පිටපත් ආපසු කැඳවා දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ දී මුල් පිටපත සමඟ ගැලපෙන සේ රතු වර්ණයෙන් සංශෝධනය කළ යුතුය. " කැබලි අංක ..... සංශෝධනය කරන ලදී. කැබලි අංක .....සහ ..... ඇතුළත් කරන ලදී. ප්‍රාදේශීය ලේකම්ගේ අංක ..... හා ..... දාතම ලිපියට අනුව " යනුවෙන් සටහනක් යොදා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් "සර්වේයර් ජනරාල් වෙනුවට" ලෙස සඳහන් කර සහතිකය යෙදිය යුතුය.

අත්කර ගැනීමේ (සංශෝධන) පනත අනුව කටයුතු කිරීම

6.59. 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි යම්කිසි ඉඩමක් අත්කර ගැනීමෙන් අනතුරුව පහත දැක්වෙන අවස්ථාවන් තුන යටතේ ක්‍රියා කිරීමේ බලය ඉඩම් විෂයභාර අමාත්‍යවරයා සතු වේ.

1) සතුකිරීමේ ආඥාව 39 (1) වගන්තිය යටතේ ප්‍රත්‍යදිෂ්ට කිරීම
2) නියම සන්තකය ලබාගෙන ඇතිවිට 39 (අ) 1 වගන්තිය යටතේ අවසතු කිරීම
3) 50 වගන්තිය යටතේ අත්කර ගැනීමේ නීති කෘත්‍ය අත්හැර දැමීම

6.60. ඉහත අවස්ථා තුන යටතේ කටයුතු කිරීමට ඉඩම් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසු ඉඩම් අමාත්‍යාංශය අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දෙනු ලැබේ. ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් විසින් උක්ත කරුණට අදාළ පිඹුරු සංශෝධනය සඳහා මැනුම් ඉල්ලීම් දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත නිකුත් කරනු ලබයි.

6.61. ඒ අනුව කටයුතු කර සංශෝධිත පිඹුරුපත් ඉඩම් අමාත්‍යාංශය, ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන වලට යැවීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කළ යුතුය.

6.62. උක්ත සංශෝධන වලින් පසු අදාළ ගැසට් නිවේදනය නිකුත් කරනු ලබන හෙයින්, පිඹුර සංශෝධනය සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් මැනුම් ඉල්ලීම් එවන අවස්ථාවේදී ගැසට් නිවේදනය එවීම අවශ්‍ය නොවන අතර ඉහත සංශෝධන සිදු කළ යුත්තේද නව අතිරේකයක හෝ නව මූලික පිඹුරක් තුලය. **4.74 වැනි ඡේදය** බලන්න.

6.1 ඡේදය ඇමුණුම 01

අත්කර ගැනීමේ ක්‍රියාවලිය




38 ආඥාව නිකුත් කිරීම
භූක්තිය භාරදීම
ඉඩමේ අයිතිකරු
භූක්තිය භාර ගැනීම/ භූක්තිය භාරදීම
ප්‍රාදේශිය ලේකම්
භූක්තිය භාර ගැනීම
ඉල්ලුම්කාර අමාත්‍යාංශය
රජයේ ඉඩමක් ලෙස ඉඩමේ අයිතිය ලියා පදිංචි කිරීම
ප්‍රාදේශිය ලේකම්
ඉඩම් සඳහා අත්කරගත් ආයතන වෙත නීත්‍යානුකූල ලේඛන නිකුත් කිරීම
ප්‍රාදේශිය ලේකම්

6.5 ඡේදය 9.22 ඡේදය ඇමුණුම 02

ආකෘති 01

(2 වන ඡේදයට අදාළ නිවේදනය හෝ 4 වන ඡේදයට අදාළ නිවේදනය යටතේ අනුගමනය කිරීම සඳහා මිනින්දෝරුවරුන් විසින් භාවිතා කළ යුතුය.)

දැන්වීම

..... හි
..... වෙත

ව්‍යවස්ථාදායකය විසින් පනවන ලද 1956 ප්‍රතිශෝධිත නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 460 වන පරිච්ඡේදයේ ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතේ 2(3)/4(2) ඡේදයට අදාළ කොන්දේසි යටතේ ..... පළාතේ/දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධාරියා වෙනුවෙන් සර්වේයර් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලය ප්‍රකාරව මා වෙත ලබාදී ඇති උපදෙස් අනුව පහත අත්සන් තබා ඇති මා සමඟ ..... කාර්ය මණ්ඩලය ඉහත සඳහන් පළාතේ/ දිස්ත්‍රික්කයේ ..... ගමෙහි පිහිටා ඇති ..... දරණ ඉඩමට ..... 20.....හි ..... වන දින සහ පසු දිනවල මැනුම් කටයුතු සඳහා ඉහත සඳහන් ඉඩමට ඇතුළු වන බව මෙමඟින් දන්වනු ලැබේ.

…….....
රජයේ මිනින්දෝරු

ආකෘති 02

(5 වන ඡේදයට අදාළ නිවේදනය අනුගමනය කිරීම සඳහා මිනින්දෝරුවරුන් විසින් භාවිතා කළ යුතුය)

දැන්වීම

.....හි
.....වෙත

ව්‍යවස්ථාදායකය විසින් පනවන ලද නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 456 වන පරිච්ඡේදයේ ඉඩම් මැනුම් පනතේ 4 ඡේදය යටතේ සර්වේයර් ජනරාල් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව පහත අත්සන් තබා ඇති මා සමඟ ……..... කාර්ය මණ්ඩලය .....පළාතේ ..... දිස්ත්‍රික්කයේ ..... ගමෙහි පිහිටා ඇති ..... දරණ ඉඩමට 20.....හි .....දින සහ පසු දිනවල අත්කර ගැනීමේ මැනුම් කටයුතු සඳහා ව්‍යවස්ථාදායකය විසින් පනවන ලද නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 460 වන පරිච්ඡේදයේ ඉඩම් අත්කර ගැනීමේ පනත (1956 ප්‍රතිශෝධිත) යටතේ ඇතුළු වන බව මෙමඟින් දන්වනු ලැබේ.

.....
රජයේ මිනින්දෝරු
දිනය : .....

ශුද්ධි පත්‍රය

7 වැනි පරිච්ඡේදය

ඉංජිනේරු මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	ඉංජිනේරු මැනුම් සැලසුම් කිරීම	
7.1.	දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මූලික සැලසුම් සකස් කිරීම	1
7.2.	දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතු උපදෙස් සහ ලියකියවිලි	1
7.3.	භූමිතික මැනුම් පාලන ලක්ෂ්‍ය පිහිටුවීම	1
7.4.	තිරස් සහ සිරස් පාලන ජාල තොරතුරු සම්බන්ධයෙන් කටයුතු කිරීම	2
7.5.	මිනින්දෝරු අධිකාරිගේ කාර්යභාරය	2
7.6.	මට්ටම් රේඛා සහ විස්තර පරීක්‍රමණ සඳහා මිනින්දෝරුවන් යෙදවීම	2
7.7.	බිම් කට්ටි සඳහා යොදවන ලද මිනින්දෝරුවන්ගේ කාර්යභාරය	2
	ක්ෂේත්‍ර වැඩ	
7.8.	ක්ෂේත්‍ර සටහන් ක්ෂේත්‍ර පොත්වල ඇතුලත් කිරීම	2
7.9.	ඉංජිනේරු මැනුම් සඳහා ක්ෂේත්‍ර පොත්	2
	පරීක්‍රමණ	
7.10.	ග්‍රිඩ් රේඛා දිගේ පාලන පරීක්‍රමණ මැනුම් කිරීම	2
7.11.	විස්තර පරීක්‍රමණවල ඛණ්ඩාංක පත්‍ර ක්ෂේත්‍ර පොත්වල ඇතුලත් කිරීම	2
7.12.	ග්‍රිඩ් මායිම් දිගේ හා පොදු මායිම දිගේ විස්තර මැනුම් පෙන්වීම	2
	එළිකිරීම	
7.13.	මිනින්දෝරු අධිකාරි පළමු පරීක්ෂාවේදී උපදෙස් ලබාදීම	3
7.14.	ග්‍රිඩ් රේඛා එළිකිරීම	3
7.15.	එළිකිරීමට ඇති ස්ථාන උස රේඛාවල දිශාවන් අනුව ස්ථාන උස රේඛා පොළොවේ ලකුණු කිරීම	3
7.16.	අතිරේක ස්ථාන උස රේඛාවක් එළිකිරීම	3
7.17.	එළිකිරීම් දෛනික ප්‍රගතිය පරීක්ෂා කිරීම	3
7.18.	එළිකිරීම් සඳහා මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් යෙදවීම	3
7.19.	එළිකිරීමේ ප්‍රගතිය දැක්වෙන සටහන් පවත්වාගෙන යාම	3
	පිල් ලකුණු පිහිටුවීම	
7.20.	පිල් ලකුණු පිහිටුවීම සහ ඒවා අංක කිරීම	4
7.21.	ස්ථාන උස රේඛාවේ කෙලවර තාවකාලික පිල් ලකුණු යෙදීම	4
	විස්තර මැනුම්	
7.22.	විස්තර මැනුම් සඳහා උපදෙස්	4
7.23.	අළුතින් කරන ලද මැනුම් තොරතුරු භාවිතා කිරීම	4
7.24.	වගාවන් අනුව මැනුම් කිරීම	4
7.25.	කැලෑ මායිම්වල දළ සටහන් සකස් කිරීම	4
7.26.	ගම් මායිම් මැනුම් කිරීම	4
7.27.	මැනුම් වාර්තාව සැකසීමට ග්‍රාමනිලධාරි වෙතින් අවශ්‍ය විස්තර ලබා ගැනීම	5
7.28.	ඉ.සං.ආ. යටතේ බැහැර කළ ඉඩම් වල වට මායිම් පෙන්වීම	5
7.29.	ස්වාභාවික ලක්ෂණ හා සියළු ඉදිකිරීම් මැනුම් කිරීමේ වැදගත්කම	5

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	ප්‍රගමණ මට්ටම් ගැනීම	
7.30.	පිල් ලකුණු කටු සටහන් සහ මට්ටම් රේඛා වල විස්තර පිළියෙල කිරීම	5
7.31.	විස්තර මට්ටම් ගැනීම	5
7.32.	හැරවුම් ලක්‍ෂ්‍ය (වර්තන ලක්‍ෂ්‍ය)	5
7.33.	ස්ථාන උස රේඛාවලට සමාන්තරව ඇති ලක්ෂණ සම්බන්ධයෙන් කටයුතු කිරීම	5
7.34.	ගල් කඳු මත උස	5
7.35.	දියමාර්ග වල මට්ටම් ගැනීම	5
7.36.	ඇළ මධ්‍යයේ හෝ ඇතුලත උස	5
7.37.	ඉහලම ගං වතුර මට්ටම්	5
7.38.	මීටර් 1 සමෝච්ඡ රේඛා සඳහා අමතර ස්ථාන උස	6
7.39.	මට්ටම් පොත් පිටු සඳහා රේඛා චිත්‍රමය සූචකය	6
7.40.	මට්ටම් පොත් ගණනය කිරීම හා පියවීම	6
7.41.	දෝෂ බෙදා හැරීම	6
	පිල් ලකුණු ලැයිස්තුව	
7.42.	පිල් ලකුණු ලැයිස්තුව	6
7.43.	මිනින්දෝරු අධිකාරි විසින් පවත්වාගෙන යන පිල් ලකුණු ලැයිස්තුව	6
7.44.	පිල් ලකුණු ලැයිස්තුව වෙනස් කිරීම	6
7.45.	මට්ටම් පොත් විනාශ කිරීම	6
	ක්ෂේත්‍ර පරීක්ෂණ	
7.46.	දෛනික එළිකිරීම් ප්‍රමාණයන් ඇස්තමේන්තු කිරීම	6
7.47.	මට්ටම් ගැනීම ක්ෂේත්‍රයේ පරීක්ෂා කිරීම	6
7.48.	සමෝච්ඡ රේඛාවල පිහිටීම නිර්ණය කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ	7
7.49.	විස්තර මැනුම් හා පරික්‍රමණ සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සටහන් යෙදීම	7
	පිඹුරු වැඩ	
7.50.	ඉංජිනේරු මැනුම් සඳහා සංක්ෂිප්ත නාම භාවිතය	7
7.51.	සංක්ෂිප්ත නාම ලේඛනය ක්ෂේත්‍ර පොත්වල යෙදීම	7
7.52.	පිඹුරු වැඩ සඳහා මෘදුකාංග භාවිතා කිරීම	7
7.53.	පිඹුරු මුද්‍රණයේදී පරිමාණය, ක්ෂේත්‍ර පත්‍ර සහ වර්ණ තෝරා ගැනීම	7
7.54.	යාබද ක්ෂේත්‍ර පත්‍ර සමඟ මායිම් සංසන්දනය	7
7.55.	යාබද පත්‍ර පෙන්වන සුචිය සකස් කිරීම	7
7.56.	පත්‍ර මත ග්‍රිඩ් රේඛා අඟයන් යෙදීම	7
	පිටපත් මුද්‍රණය	
7.57.	දි.මී.කා. සඳහා අතිරේක ක්ෂේත්‍ර පත්‍ර සකස් කිරීම	7
7.58.	අතිරේක අංකිත පිටපත් සකස් කිරීම	8
	පැරණි මැනුම්	
7.59.	පැරණි මැනුම් නැවත නියැකීම හෝ අධිස්ථාපනය	8
7.60.	අයුතු අල්ලා ගැනීම් පිළිබඳව කටයුතු කිරීම	8
7.61.	පෞද්ගලික ඉඩම් පිළිබඳව කටයුතු කිරීම	8

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
7.62.	පැරණි මැනුම් පෙන්වීම	8
	සමෝච්ඡ රේඛා	
7.63.	සමෝච්ඡ රේඛා අන්තර් නිවේශණය	8
7.64.	සමෝච්ඡ රේඛා ඇඳීම	8
7.65.	භූමියේ විස්තර හරහා සමෝච්ඡ රේඛා ඇඳීම	8
7.66.	පත්‍ර මත ස්ථාන උස මුද්‍රණය	8
7.67.	පත්‍ර මත පිල් ලකුණු විස්තර දැක්වීම	8
7.68.	පත්‍ර මත සමෝච්ඡ රේඛා උස දැක්වීම	8
	ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පත්‍ර අංක කිරීම	
7.69.	ක්ෂෙත්‍ර පත්‍ර අංක දැක්වීම	9
7.70.	ක්ෂෙත්‍ර පත්‍ර දෙකක් සඳහා එකම අංක ඇතිවිට	9
	ඉංජිනේරු මැනුම් පිඹුරු මත මුද්‍රණය කිරීම	
7.71.	ඇළ/ඔය ආදියේ නම් මුද්‍රණය	9
7.72.	හිමිකම් විස්තර මුද්‍රණය	9
	යොමු රේඛා චිත්‍ර	
7.73.	මිනින්දෝරුවරයා විසින් යොමු රේඛා චිත්‍ර පවත්වාගෙන යාම	9
7.74.	යොමු රේඛා චිත්‍ර පිළියෙල කිරීම	9
7.75.	යොමු රේඛා චිත්‍රවල පරිමාණය	9
7.76.	සංයුක්ත යොමු රේඛා චිත්‍ර පිළියෙල කිරීම	9
7.77.	ප්‍රත්‍යයන් යොදා වෙන්කර යොමු රේඛා චිත්‍ර පිළියෙල කරන අවස්ථා	9
	ඉංජිනේරු මැනුම් ප්‍රගති වාර්තා	
7.78.	වාර්තා පිළියෙල කිරීමට සම්මත පෝර්ම	10
7.79.	මිනින්දෝරුවන් විසින් මිනින්දෝරු අධිකාරිට යවන වාර්තා	10
7.80.	මිනින්දෝරු අධිකාරි විසින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යවන වාර්තා	10
7.81.	ක්ෂෙත්‍ර ප්‍රගති වාර්තා පිටපත	10
7.82.	මතු දැන ගැනීම සඳහා වාර්තා	10
7.83.	දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පවත්වාගෙන යා යුතු රේඛා චිත්‍ර	10
7.84.	දිස්ත්‍රික් මැනුම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන භූලක්ෂණාත්මක සිතියම් මත ඉංජිනේරු මැනුම් පෙන්වීම	10
	ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම්	
7.85.	ඇළ මාර්ග මැනුමේ අරමුණු	11
7.86.	ඇළවල් තැනීමේ හා වැඩ සැලසුම් කිරීමේ ඒකක වෙන්කිරීම	11
7.87.	ප්‍රධාන ඇළ සහ අතු ඇළ	11
7.88.	යාය සහ ඇළ අංක කිරීම	11
7.89.	ඇළ මාර්ග මැනුම් සඳහා යෝජිත ඇළ මාර්ග ඇතුලත් මුද්‍රණ (Ozalid මුද්‍රණ)	11
7.90.	ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් ඉල්ලීම් ක්ෂෙත්‍රයට නිකුත් කිරීම	11
7.91.	ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් කටයුතු සම්බන්ධීකරණය	11
7.92.	ඇළ මාර්ග මැනුමේ අනුරේඛන ලබා ගැනීම	11
7.93.	ඇළ මාර්ගවල මධ්‍ය රේඛා අධිස්ථාපනය	12

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	මධ්‍ය රේඛා පොළොවේ ලකුණු කිරීම	
7.94.	මධ්‍ය රේඛාව පොළොවේ සලකුණු කිරීම	12
7.95.	මධ්‍ය රේඛාව මැනුම් කිරීම සහ නියැකීම	12
7.96.	මධ්‍ය රේඛාවට ලම්භක හරස්කඩ පොළොවේ ලකුණු කිරීම	12
7.97.	ඇළ මාර්ග ලකුණු කිරීමේ මුද්‍රණයේ පෙන්වා ඇති චක්‍ර ලකුණු කිරීම	12
7.98.	මධ්‍ය රේඛාවට ලම්භක හරස්කඩ පොළොවේ ලකුණු කිරීමේ ක්‍රමවේදය	12
7.99.	මධ්‍ය රේඛාව ඔස්සේ මට්ටම් ගැනීම	13
7.100.	මධ්‍ය රේඛාවට ලම්භක හරස්කඩ මට්ටම් ගැනීම	13
7.101.	ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් වල පිඹුරු වැඩ	13
7.102.	ඇළ මාර්ග අනුරේඛනයේ උතුරු දිශාව දැක්වීම	13
7.103.	ඇළ මාර්ග අනුරේඛනයේ විස්තර දැක්වීම	13
7.104.	ඇළ මාර්ග අනුරේඛනයේ නිල් ග්‍රිඩ් රේඛා සළකුණු අගයන් දැක්වීම	13
7.105.	ඇළ මාර්ගයේ හරස්කඩ සහ සිරස්කඩ	13
7.106.	පවතින සහ අතහැර දමන ලද ඇළ මාර්ගවල පිඹුරු වැඩ	13
7.107.	ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් අනුරේඛන පරීක්ෂා කිරීම හා අනුමත කිරීම	13
7.108.	ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් සඳහා යොමු රේඛා චිත්‍ර	14
7.109.	ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් සඳහා වාර්තා	14
	ගම් වැව් මැනුම්	
7.110.	ගම් වැව් මැනුම් හැඳින්වීම	14
7.111.	මැනුම් කිරීමේදී සැලකිය යුතු කරුණු	14
7.112.	ආධාරක රේඛා සහ ස්ථාන උස රේඛා	14
7.113.	වැව ආශ්‍රිත ඇළ සහ ගල් පර්වත මැනුම් කිරීම / මට්ටම් ගැනීම	14
7.114.	ස්ථිර පිල්ලකුණු පිහිටුවීම	14
7.115.	පිඹුරු වැඩ සම්බන්ධ උපදෙස්	15
	වේලි අක්ෂ මැනුම්	
7.116.	වේලි හැඳින්වීම	15
7.117.	වේලි ඉදිකිරීමේදී සැලකිය යුතු සාධක	15
7.118.	වේල්ල පිහිටුවන ප්‍රදේශය තීරණය කිරීමට අවශ්‍ය පිඹුරු	15
7.119.	වේලි අක්ෂ මැනුම් අර්ථ දැක්වීම	15
7.120.	වේලි අක්ෂ මැනුම් ක්‍රමවේදය	15
7.121.	ගං වතුර මට්ටම් හා ගංවතුර පිටාර ස්ථානයේ වැදගත්කම	15
7.122.	පිඹුරු වැඩ සඳහා පිරිවිතරයන්	15
	ඇමුණුම්	
ඇමුණුම 01	පිල් ලකුණු වල විස්තරාත්මක කටු සටහනක ආදර්ශය	16
ඇමුණුම 02	පිල් ලකුණු ලැයිස්තුව	17
ඇමුණුම 03	ඉංජිනේරු මැනුම් යොමු රේඛා චිත්‍ර සඳහා සාම්ප්‍රදායික ලකුණු	18
ඇමුණුම 04	පිඹුරු වැඩ ප්‍රගති සටහන	19
ඇමුණුම 05	මට්ටම් ප්‍රගති සටහන	21
ඇමුණුම 06	ඉංජිනේරු මැනුම් සඳහා ක්ෂේත්‍ර ප්‍රගති වාර්තා	22
ඇමුණුම 07	ඉංජිනේරු මැනුම් සඳහා ඇළ මාර්ග ලකුණු කිරීම් ක්ෂේත්‍ර ප්‍රගති වාර්තා	24

7 වැනි පරිච්ඡේදය

ඉංජිනේරු මැනුම්

ඉංජිනේරු මැනුම් සැලසුම් කිරීම

7.1 දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ඉංජිනේරු මැනුම සඳහා අවශ්‍ය සැලසුම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ සකස් කර අදාළ අංශ වලට පිටපත් සහිතව පළාත් සර්වේයර් ජනරාල් මඟින් අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂෙත්‍ර) වෙත එවිය යුතුය.

(i) **තිරස් මැනුම** - අළුත් තිරස් පාලන ජාලයක් මිහිතැන් ගැන්වුම් චන්ද්‍රිකා (සූසැටි) පද්ධති (GNSS) භාවිතයෙන් පිහිටුවීමට අවශ්‍ය නම් ඒ සඳහා සැලසුමක් පිළියෙල කර නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූමිතික) වෙත යැවිය යුතුය.

(ii) **පිල් ලකුණු දැමීම සහ මට්ටම් ගැනීම** - ද්විතියික හෝ තෘතියික මට්ටම් ගැනීම කළ යුතු වේනම්, ඉහත (i) හි සඳහන් පරිදි සැලසුමක් සකස්කර පිටපතක් නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූමිතික) වෙත යැවිය යුතුය.

(iii) **මූලික කටයුතු** - පරික්‍රමණ මාර්ග එළි කිරීම සහ කුඤ්ඤ දැමීම, මට්ටම් රේඛා සහ කිලෝමීටර එක බැගින් දුරින්වූ හා කිලෝමීටර භාගය බැගින් දුරින්වූ ග්‍රිඩ් රේඛා පිහිටුවා එළි කිරීම සහ පිල් ලකුණු දැමීම සඳහා මැනුම් ක්ෂෙත්‍ර සහායකයන් ප්‍රයෝජනවත් පරිදි සේවයේ යෙදවීමට සැලසුම් කළ යුතුය.
මූලික කටයුතු නිම කිරීම සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවයේ ඇස්තමේන්තුවක් සියළුම කරුණු සැලකිල්ලට ගෙන ඉතා පරීක්ෂාවෙන් පිළියෙල කළ යුතුය.

(iv) දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ඉංජිනේරු මැනුම ඉල්ලුම්කර ඇති ආයතනයෙන් ලබා ගැනීමට අවශ්‍ය සියළුම සම්පත් දායකත්වයන් සහ වෙනත් සහායන් හඳුනාගත යුතුය. ඉන් පසු ඒවා ලබාගැනීම සඳහා එම ආයතන සහ ඒවායේ ප්‍රාදේශීය ප්‍රධානීන් සමඟ සමීපව කටයුතු කළ යුතුය.

(v) කාර්ය මණ්ඩල සහ අනිකුත් සම්පත් අවශ්‍යතාවයන් ලැයිස්තුගත කළ යුතුය.

7.2 දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ සැලසුම අනුමත කිරීමෙන් පසුව, පහත දැක්වෙන ලියකියවිලි මිනින්දෝරු අධිකාරි (මූලස්ථාන) විසින් සකස් කළ යුතුය. ඉන්පසු අවශ්‍ය උපදෙස් සමඟ අදාළ මිනින්දෝරු අධිකාරි වෙත මැනුම පැවරිය යුතුය.

(i) පාලන ලක්ෂ්‍ය, පරික්‍රමණ සහ මට්ටම් රේඛා චිත්‍ර අඩංගු 1:50,000 සිතියමක්
(ii) දැනටමත් නිමකර ඇති ප්‍රධාන මැනුම් සහ මැනීමට ඇති ප්‍රදේශයට යාව පිහිටි ප්‍රධාන මැනුම් පෙන්වන 1:50,000 පරිමාණයට පිළියෙල කළ රේඛා චිත්‍රයක්. මෙම යාබඳව ඇති ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පත් වල අංක සමඟ ඒවා මනින ලද වර්ෂයද සඳහන් කළ යුතුය.
(iii) අදාළ ප්‍රදේශය ආවරනය වන අළුත් ගූවන් ඡායාරූප හෝ චන්ද්‍රිකා ඡායාරූප
(iv) 1:50,000 සිතියමක මිනින්දෝරුවරුන් වෙත වැඩ අනුයුක්ත කිරීම සඳහා ඉංජිනේරු මැනුම් ප්‍රදේශය ආවරණය වන පරිදි කි.මී. 1 ග්‍රිඩ් කොටු දැක්වෙන යොමු පත්‍රයක්
(iv) මැනුම සඳහා පිරිවිතර

7.3 කිලෝමීටර 1 බැගින් දුරින්වූ ග්‍රිඩ් රේඛා එළිකර පිල් ලකුණු දැමීම/භූමිතික මැනුම් පාලන ලක්ෂ්‍ය පිහිටුවීම හැකි ඉක්මනින්ම සිදු කළ යුතුය. එය සිදු කළ වහාම නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූමිතික) වෙත දන්වා එම ලක්ෂ්‍යවල මිහිතැන් ගැන්වුම් චන්ද්‍රිකා (සූසැටි) පද්ධති (GNSS) භාවිතයෙන් නිරීක්ෂණ

ලබාගෙන තිරස් පාලන ජාලය පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතුය. ඊට සමගාමීව පිල් ලකුණු මට්ටම් කිරීමද සිදුකළ යුතුය. මෙම කාර්යයන් සඳහා මිනින්දෝරු අධිකාරි විසින් ඔහුගේ මුළු සේවක මණ්ඩලයම ක්‍රමවත් සැලසුමකට අනුව යෙදවිය යුතුය.

7.4 මෙම තිරස් සහ සිරස් පාලන ජාලය පිහිටුවීමෙන් පසුව, මිනින්දෝරු අධිකාරි විසින් පිහිටුවන ලද පිල් ලකුණු, පාලන ලක්‍ෂ්‍ය සටහන් සහ ඒවායේ අගයයන් (බණ්ඩාංක), සහ හතරැස් (ග්‍රිඩ්) රේඛා 1:50,000 සිතියමක ලකුණු කර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය.

7.5 මිනින්දෝරු අධිකාරි වෙත 7.2 ඡේදයෙහි සඳහන් ලේඛන ලැබුනු පසු එක් එක් මිනින්දෝරුවරයා වෙත අනුයුක්ත කිරීම සඳහා බිම් ප්‍රදේශවල මායිම් දිගේ විස්තර රේඛා සහ මට්ටම් රේඛා සැලසුම් කළ යුතුය.

7.6 මිනින්දෝරු අධිකාරි විසින් එක් එක් බිම් ප්‍රදේශය (ග්‍රිඩ් කොටුව) සඳහා මිනින්දෝරුවරයෙකු බැගින් අනුයුක්ත කිරීමේදී ඉංජිනේරු මැනුම් පත්‍රයේ අනු පිළිවෙලට ඇති ප්‍රදේශවලට යෙදවීමට හැකි සෑම අවස්ථාවකදීම කටයුතු කළ යුතුය. එකම ඉංජිනේරු මැනුම් වැඩ සඳහා මිනින්දෝරුවරුන් දෙදෙනෙක් යෙදවීමට අවශ්‍ය වුවහොත්, එක් අයෙකුට මට්ටම් වැඩත් අනෙක් අයට විස්තර මැනීමේ වැඩත් නියම කළ යුතුය.

7.7 මිනින්දෝරුවරයා විසින් තමාට ලැබී ඇති බිම් ප්‍රදේශය භෞතිකව සහ ඊට අදාළ ගුවන් ඡායාරූප හෝ චන්ද්‍රිකා ඡායාරූප මඟින් හොඳින් අධ්‍යයනය කර බිම් ප්‍රදේශවල මායිම් දිගේ සහ ග්‍රිඩ් බිම් කට්ටි තුල විස්තර මැනීමට අවශ්‍ය පරික්‍රමණ සැලසුම් කළ යුතුය. එසේම බිම් ප්‍රදේශවල මායිම් දිගේ සහ ඒ තුල පිහිටුවිය යුතු මට්ටම් රේඛා ක්‍රමයක් සැලසුම් කළ යුතුය. වැඩ ආරම්භ කිරීමට පෙර වැඩ සැලැස්ම මිනින්දෝරු අධිකාරි වෙතින් අනුමත කරවා ගත යුතුය.

ක්ෂේත්‍ර වැඩ

7.8 ක්ෂේත්‍ර සටහන් පවත්වාගෙනයාමේදී 11 වැනි පරිච්ඡේදය සහ 22 වැනි පරිච්ඡේදයන්හි පරිදි කටයුතු කළ යුතුය. ක්ෂේත්‍ර පොත්හි ආදර්ශයන් 11 වැනි පරිච්ඡේදයෙහි ඇමුණුම් 01 සිට 09 දක්වා ඇතුලත් කර ඇත.

7.9 හැකිතාක් දුරට එක් ප්‍රදේශයක් තුල ඇති මැනුම් සඳහා අනුගාමී අංක සහිත ක්ෂේත්‍ර පොත් භාවිතා කළ යුතුය.

පරික්‍රමණ

(විස්තර සඳහා 2 වැනි පරිච්ඡේදය බලන්න)

7.10 ග්‍රිඩ් රේඛා දිගේ මනිනු ලබන පාලන පරික්‍රමණ ගැන ඉතාමත් සැලකිලිමත් විය යුත්තේ, යම් වරදක් සිදුවුවහොත් එය අක්ෂාංශ වල හෝ අපයාන වල අනුරූප වරදක් ලෙස පරාවර්තනය වන බැවිනි.

7.11 සියළුම පරික්‍රමණ වල බණ්ඩාංක ක්ෂේත්‍ර පොත් වල අලවා අත්සන තැබිය යුතුය. එවිට ඉංජිනේරු මැනුම් ක්ෂේත්‍ර පොත් ආශ්‍රයෙන් විකීර්ණ මැනුම් වල නිරත මිනින්දෝරුවන්ට ඒ සඳහා අවශ්‍ය කරුණු සොයා දැන ගැනීමට හැකි වේ.

7.12 ග්‍රිඩ් මායිම් වල විස්තර මැනීම එක් මිනින්දෝරුවරයෙක් විසින් පමණක් සිදු කළ යුතු අතර ඒ අනුව පොදු මායිම්හි නැගෙනහිර හා දකුණු මායිම් මැනීම සාමාන්‍යයෙන් සිදු කළ යුතුය.

එළි කිරීම

7.13 මිනින්දෝරු අධිකාරි විසින් මිනින්දෝරුවරයාගේ වැඩ පළමුවරට පරීක්ෂා කර බැලීමේදී, එම වැඩ සැලසුම අධ්‍යයනය කර එළි කිරීමට ඇති ස්ථාන උස රේඛා ගත යුතු දිශාව ගැන මිනින්දෝරුවරයාට දැන්විය යුතුය. මෙය තීරණය කරනු ලබන්නේ ගුවන් ඡායාරූප/චන්ද්‍රිකා ඡායාරූප විමර්ශනය කර බැලීමෙන් පසුය.

7.14 එළි කිරීම රේඛාවේ දෙපැත්තෙන්ම සිදු කරනු ලබන අතර, සෑම මැදිහත් කි.මී ½ ග්‍රිඩ් රේඛාවකදීම එහි නිවැරදිතාවය පරීක්ෂා කර බලනු ලැබේ. කි.මී. ½ ක කොටසක් තුල මීටර් 5 කට වැඩි දෝෂයක් ඇති බව දැනගත් විට, එය නැවත නිවැරදි කර එළි කරනු ලැබේ.

7.15 මිනින්දෝරු අධිකාරි විසින් පෙන්නුම් කර දුන් පරිදි, මිනින්දෝරුවරයා විසින් ස්ථාන උස රේඛා පොළොවේ ලකුණු කළ යුතුය. ඒවා මීටර් 100 /මීටර් 50 පරතරයකින් යුක්ත වන අතර, රේඛාව කි.මී. 1 කට වැඩි නම් දෙපැත්තෙන්මද, කි.මී 1 ට අඩු නම් එක් පැත්තකින් පමණක් පොළොවේ ලකුණු කිරීම කළ යුතුය. පොළොවේ දිශාව ලකුණු කරන දිනයේදීම, සෑම ස්ථාන උස රේඛාවකම දෙපැත්තෙන්ම මීටර් 50/මීටර් 20 ක දුර ප්‍රමාණයක් එළි කරනු ලැබේ. මෙම පරතරයන් සේවා දායකයාගේ අවශ්‍යතාවය අනුව වෙනස්විය හැකි අතර පිරිවිතරයන්හි දක්වා ඇති අන්දමට සිදු කළ යුතුය.

7.16 ස්ථාන උස රේඛා මීටර් 50 කින් දික් කිරීම හෝ යාබද ප්‍රදේශය කලින් මැන නොමැති නම්, යම් වර්ෂයක මැනීමට ගන්නා ප්‍රදේශයේ පිටස්තර මායිම ඉක්මවා යන සේ අතිරේක ස්ථාන උස රේඛාවක් එළි කිරීම කළ යුතුය. මෙය අවශ්‍ය වන්නේ පිටස්තර මායිමේ සමෝච්ඡ රේඛාවල නිවැරදිතාවය ගැන වගබලා ගැනීම සඳහාය.

7.17 ඉංජිනේරු මැනුම් වල නිරත මිනින්දෝරුවරයාගේ ක්‍රියාශීලීභාවය වැඩි වශයෙන් රඳා පවත්නේ, වැඩිම එළිකිරීමේ ප්‍රමාණයක් ලබාදෙන පරිදි ඔහුගේ මැනුම් ක්ෂෙත්‍ර සහායක කණ්ඩායමේ මෙහෙයවීමේ හැකියාව මතය. මෙය පවත්වා ගැනීම සඳහා, මිනින්දෝරුවරුන්ගේ එළි කිරීමේ දෛනික ප්‍රගතිය සියුම් ලෙස පරීක්ෂා කර බැලිය යුතුය. වැඩ කර ඇති අඩු එළි කිරීම් ප්‍රමාණයට හේතුව, සත්‍ය වශයෙන්ම එළිකිරීමට ඇති ප්‍රදේශයේ ස්වාභාවය හේතුකොට ගෙන සිදු වූවක් ද නැතිද යන්න මිනින්දෝරුවරු විසින්ම සතුටුදායක ලෙස දැන ගැනීම සඳහා ක්ෂෙත්‍රයේදී පරීක්ෂා කර බැලිය යුතුය.

7.18 මැනුම් ක්ෂෙත්‍ර සහායකයින් තුන්දෙනා හෝ හතර දෙනා බැගින් කණ්ඩායම් වලට බෙදා එළිකිරීම් කටයුතුවල යෙදවිය යුතුය.

7.19 1:50,000 පරිමාණයේ එළිකිරීමේ ප්‍රගති රේඛා චිත්‍රයක් පවත්වාගෙන යා යුතු අතර එහි සතියේ එක් එක් දිනවල කරන ලද එළිකිරීම් වෙන් වෙන් පාටින් පෙන්විය යුතුය. ප්‍රධාන මැනුම් ක්ෂෙත්‍ර සහායක විසින් 1:10,000 පරිමාණයේ එළි කිරීමේ ප්‍රගති රේඛා චිත්‍රය පවත්වා ගෙන යා යුතුය. එය ඔහු විසින් සෑම දිනයක් අවසානයේදීම මිනින්දෝරුවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මිනින්දෝරුවරයා විසින් ඔහුගේ රේඛා චිත්‍රයට එයින් දත්ත පිටපත් කිරීමෙන් පසු, එහි කෙටි අත්සන යොදනු ලැබේ. නව පරිසණක තාක්ෂණය උපයෝගි කරගෙන මෙය අංකිත දත්ත සටහනක් ලෙසද පවත්වාගෙන යාම කළ හැකිය. සෑම සතියක් අවසානයේදීම මිනින්දෝරුවරයා විසින් ඔහුගේ එළිකිරීමේ ප්‍රගති රේඛා චිත්‍රය මිනින්දෝරු අධිකාරි වෙත ජර්නල් පෝරමයත් සමඟ යැවිය යුතු අතර අංකිත දත්ත සටහන විද්‍යුත් තැපෑල මඟින් යැවිය හැකිය.

බිම් කට්ටි පෙන්වා ඇති රේඛා චිත්‍රයේ නියමිත ස්ථානයන්හි, එළිකරන ලද රේඛා පෙන්වනු ලැබේ. යොදා ගත යුතු සම්මත පාට පහත පරිදි වේ.

සතියේ 1වැනි දින	-	රතු
සතියේ 2 වැනි දින	-	නිල්
සතියේ 3 වැනි දින	-	කහ
සතියේ 4 වැනි දින	-	දුඹුරු
සතියේ 5 වැනි දින	-	කොල
සතියේ 6 වැනි දින	-	කළු
සතියේ 7 වැනි දින	-	දුඹුරු

පිල් ලකුණු පිහිටුවීම

7.20 කිලෝමීටර 1 හි ග්‍රිඩ් රේඛා කැපෙන ස්ථානවල, පිත්තල ඇණය රහිත "E" වර්ගයේ පිල් ලකුණු (**2 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 06**) ආරක්ෂා සහිත තැන්වල තනනු ලැබේ. කොන්ක්‍රීට් බදාම තෙත්ව තිබෙන විටදී, පිල් ලකුණු මත පිල් ලකුණු අංක කපා/ ලියා පෙන්වනු ලැබේ. අකුරු සහ අංක ග්‍රීඩ් රේඛාවේ බටහිර සිට නැගෙනහිර දිශාවට විය යුතුය.

7.21 මිනින්දෝරුවරයෙකු වෙත පවරා ඇති ඕනෑම බිම් ප්‍රදේශයක ස්ථාන උස රේඛාවල කෙලවර තාවකාලික පිල් ලකුණු ලෙස උඩු පැත්ත ටෙපර හැඩයට කපන ලද තද පළල් ලී කුෂ්ඨ දමනු ලැබේ. මේවාට අංක යොදනු ලබන්නේ ශිල්පීය උපදෙස් පොතේ 25 වැනි උප ග්‍රන්ථයට අනුවය. මෙම තාවකාලික පිල් ලකුණු වලට උස ලබාදීම සඳහා මට්ටම් රේඛා පිහිටුවීමේදී ඒවා හැරවුම් ස්ථාන ලෙස ගෙන උස ලබාදිය යුතු අතර විස්තර හෝ අතරමැදි ලක්ෂ්‍යයක් ලෙස නොගත යුතුය.

විස්තර මැනුම්

(විස්තර සඳහා 9 වැනි පරිච්ඡේදය බලන්න)

7.22 ස්ථාන උස රේඛා වල විස්තර මට්ටම් ගැනීමට පෙර ඒවායේ විස්තර මැනුම කළ යුතුය. දුම්රිය මාර්ග, මාර්ග, පටු පාරවල්, ඇළවල්, බැම්, ගල් පර්වත සහ වැදගත් ගොඩනැගිලි වැනි සියළුම භූ ලක්ෂණාත්මක අංග ලක්ෂණ මැන නැතහොත් වෙනත් පිඹුරකින් මාරු කරගත යුතුය.

7.23 ඉංජිනේරු මැනුම් ප්‍රදේශ තුල ඇති ඇළ, මාර්ග, පටු පාරවල් සහ ආදායම් මායිම් මෑත කාලයකදී මැන තිබේනම් ඒවා එලදායි ලෙස යොදා ගත යුතුය.

7.24 වෙනස් වගාවන් අතර ඇති මායිම් සහ රජය හා පෞද්ගලික ඉඩම් අතර ඇති මායිම් මැන කට්ටි වශයෙන් පෙන්වනු ලැබේ.

7.25 රජයේ ඉඩම් තුල ඇති, මූකළුන්, ලඳු කැලෑ සහ දමන වල දළ මායිම්, විශාල පරිමාණයේ සමෝච්ඡ පිඹුරු මත තීත් ඉරි වලින් කටු සටහන් කර පෙන්විය යුතුය. ඒවායේ බිම් ප්‍රමාණයන් කිට්ටුම හෙක්ටයාරය දක්වා ගණන් බැලිය යුතු අතර, එය ඉංජිනේරු මැනුම් පත්‍රයකට ඇතුලත් කොට, වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතුය.

7.26 සියළුම ගම් මායිම් මැන හෝ කලින් කරන ලද මැනුම් ඇතොත්, ඒවායේ පරණ ක්ෂේත්‍ර පොත් වලින් නැවත නියැකීම් කර හෝ ග්‍රීඩ් රේඛා කැපෙන තැන් ආධාරයෙන් කටු සටහන් කර පෙන්විය යුතුය. එලෙස කටු සටහන් කළ මායිම්, ගම් මායිම් හෝ ආදායම් මායිම් සඳහා වූ සම්මත ලකුණු යෙදීමෙන් විස්තර ඇඳ ඇති ඉංජිනේරු මැනුම් පත්‍රය මත පෙන්වනු ලැබේ.

7.27 ග්‍රාම නිලධාරි සමඟ ක්ෂේත්‍රයේදී අදහස් විමසීමෙන් පසුව, එක් එක් ගමේ ඇති නිවාස ගණන, පවුල් ගණන හා දළ ජනගහනය ගැන විස්තර දැනගෙන, ඒවා උපලේඛනයක ඇතුලත් කර මිනින්දෝරුවරයා විසින් වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතුය.

7.28 ඉ.සං.ආ. යටතේ බලපත්‍ර ලබා දී ඇති, එහෙත් සංවර්ධනය කර නොමැති ඉඩම් වල පිටත දළ මායිම් ක්ෂේත්‍ර පත්‍රයේ තිත් ඉරි වලින් පෙන්වා විස්තර කළ යුතුය.

7.29 ඉංජිනේරු ශිල්පින්ට ප්‍රදේශයේ ස්වාභාවය හඳුනාගැනීම සඳහා වැදගත්වන තොරතුරු/අංග ලක්ෂණයන් සහ සියළු ඉදිකිරීම් මැන පෙන්වීම ඉතා වැදගත්ය.
උදා: ඔය, ඇළ, වියලි ඇළ මෙන්ම බැම්, කැණීම් සහ වේලි, ගල් සහිත ප්‍රදේශවල මායිම් ආදිය.

ප්‍රගමණ මට්ටම් ගැනීම

7.30 1:50,000 පරිමාණයට පිළියෙල කරන ලද අනුරේඛනයක, අළුතින් පිහිටුවන ලද මට්ටම් රේඛා මාර්ග (සුළු හෝ ඊට වඩා වැඩි), පිල් ලකුණු වල වර්ග, ඒවායේ අංක සහ වටිනාකම්, ක්ෂේත්‍ර පොත් සහ මට්ටම් පොත් වල අංක ඇතුලත් කර තිබිය යුතුය. පිල් ලකුණු කටු සටහන්ද (**ඇමුණුම 01**) සමඟ අවස්ථාවට ගැලපෙන පරිදි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට හෝ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූමිතික) වෙත හෝ යවනු ලැබේ. මට්ටම් පොතේ අන්තිම පිටුවේ පිල් ලකුණු පිළිබඳ කටු සටහන් පෙන්වනු ලබන අතර, සුචකය සහිත පිටුවෙහි නිසි පරිදි සහතික සටහන් යෙදිය යුතුය.

7.31 **විස්තර මට්ටම් ගැනීම** - විස්තර මට්ටම් ගැනීම යනු අදාළ ප්‍රදේශය ආවරනය වන පරිදි ක්‍රමවත් ආකාරයකට ස්ථානීය උස ලබාගැනීම සහ ස්වාභාවික හෝ කෘත්‍රිම අංග ලක්ෂණයන් මත හෝ ඒවා දිගේ උස ලබාගැනීමට කරනු ලබන මට්ටම් ගැනීම වේ.

7.32 මට්ටම් රේඛාවක් පටන් ගැනීමේදී හෝ පියවීමේදී භාවිතා කරනු ලබන ලක්ෂ්‍යයන්හි තාවකාලික පිල් ලකුණු පිහිටුවිය යුතු අතර ඒවායේ උස පිහිටුවිය යුත්තේ මට්ටම් රේඛාවක එම ලක්ෂ්‍යය වර්තන ලක්ෂ්‍යයක් ලෙස භාවිතා කිරීමෙනි.

7.33 ස්ථාන උස රේඛා වලට සමාන්තරව ඇති භූ ලක්ෂණයන් මත හෝ ඒවා දිගේ උස ලබාගැනීමට විශේෂ සැලකිල්ල යොමු කළ යුතුය.

7.34 ඉංජිනේරු ශිල්පින්ට, ගල් පර්වත වල ප්‍රමාණය සහ ඒවායේ හැඩය අනුමාන වශයෙන් දැන ගැනීම සඳහා, ඒවා මත උස, සෑහෙන තරම් ලබාගත යුතුය. වැඩිම උස් ස්ථානයේ උස නිරීක්ෂණය කළ යුතුය. වැඩිම උස් ස්ථානයේ උස ලබා ගැනීම, සාමාන්‍ය මට්ටම් ක්‍රමයට කළ නොහැකිනම්, විකෝණමානයෙන් උස නිරීක්ෂණය කිරීමේ ක්‍රමය හෝ ලිනන් ටේප් පටියක් ආධාරයෙන් පියගැට මැනුම් ක්‍රමය වුවද ප්‍රයෝජනයට ගත හැකිය.

7.35 දිය මාර්ග වල කොටස් හා සම්බන්ධයෙන් යම් ක්‍රමයකට ස්ථාන උස රේඛා සකස් කොට ඇත්නම් හා ඔය දිගේ සාමාන්‍යයෙන් මීටර් 100 පරතරයකින් යුක්තව උස නිරීක්ෂණය කිරීමට නොහැකි නම්, ඇති තරම් උසවල් ලබාදීම සඳහා එවැනි කොටස් මට්ටම් ගත යුතුය.

7.36 වතුරේ ගැඹුරුකම නිසා පතුලේ උස නිරීක්ෂණය කිරීමට නොහැකි නම්, වතුරේ හැකිතාක් දුරට ගැඹුර නිරීක්ෂණය කර එම උස පිඹුරේ නියමිත ස්ථානයෙහි පෙන්විය යුතුය.

7.37 ඉහළම ගං වතුර මට්ටම දැනගත හැකිනම්, එය සෑම කි.මී. ½ කොටුවකම අවම වශයෙන් ස්ථාන 4 ක වත් පෙන්විය යුතුය. ගං වතුරෙන් යට නොවන පරිදි සුදුසු තැන් වල, ජනපද වාසීන් සඳහා කුඩා ගෙවල් සෑදීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මෙම වටිනාකම් අවශ්‍ය වේ. එවැනි උස ලබාගැනීමේදී මිනින්දෝරුවරු විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

7.38 මීටර් 1 සමෝච්ඡ රේඛා දළ වශයෙන් ඇඳීමෙන් පසු, අවශ්‍ය තැන්වල අතිරේක ස්ථාන උස නිරීක්ෂණය කළ යුතුය. එකම වටිනාකමකින් යුත් සමෝච්ඡ රේඛා දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකට යාව පිහිටියේ නම්, ඒවායින් ස්වයං-සමෝච්ඡ රේඛාවන් සෑදී ඇත්තේද යන්න තීරණය කිරීම සඳහා අවශ්‍ය තරම් අමතර ස්ථාන උස නිරීක්ෂණය කළ යුතුය.

7.39 මට්ටම් පොතක සෑම පිටුවකම අඩංගු දේ ගැන රේඛා චිත්‍රමය සුචකයක්, මිනින්දෝරුවරයා විසින් පවත්වාගෙන යා යුතුය. මෙය මට්ටම් පොතේ කවරයේ ඇතුල් පැත්තේ අලවනු ලැබේ.

7.40 මට්ටම් පොත් දිනපතාම ගණනය කොට "පියවීම" ගණන් බැලිය යුතුය.

7.41 ස්ථාන උස සඳහා මට්ටම් ගැනීම් වල දෝෂය බෙදා හැරීමට අවශ්‍ය නැත. එහෙත් පිල් ලකුණු වල උස පිහිටුවීම සඳහා මට්ටම් ගැනීම් වලදී දෝෂ බෙදා හැරීම සිදු කළ යුතුය.

පිල් ලකුණු ලැයිස්තුව

7.42 පිල් ලකුණු වටිනාකම් අවසන් වශයෙන් නිශ්චය කිරීමෙන් පසු, පිල් ලකුණු ලැයිස්තු පෝරමයට (**ඇමුණුම 02**) ඇතුලත් කරනු ලැබේ. මිනින්දෝරු අධිකාරි විසින් මට්ටම් පොත හා ඉංජිනේරු මැනුම් පත්‍රය සමඟ එලෙස ඇතුලත් කරනු ලබන වටිනාකම් වල හරි වැරදි බලා කෙටි අත්සන යොදනු ලැබේ.

7.43 අමුණා ඇති ආකෘති පත්‍රයෙහි සඳහන් පරිදි, මිනින්දෝරු අධිකාරි විසින් මුළු ප්‍රදේශය සඳහා පිල් ලකුණු ලැයිස්තු පවත්වා ගෙන යනු ලැබේ. මිනින්දෝරුවරයාගේ පිල් ලකුණු ලැයිස්තුව අනුව එය සම්පාදනය කරනු ලැබේ. එලෙස ඇතුලත් කරනු ලබන වටිනාකම් අවසාන වටිනාකම් වන අතර, ඒවා යොමු චිත්‍ර සඳහා භාවිතා කරනු ඇත.

7.44 මිනින්දෝරුවරයාගේ පිල් ලකුණු ලැයිස්තුව මත කෙටි අත්සන් තැබීමෙන් පසුව, ඔහු විසින් මිනින්දෝරු අධිකාරිට නොදන්වා පිල් ලකුණු වල වටිනාකම් වෙනස් නොකළ යුතුය.

7.45 ඉංජිනේරු මැනුම් පිඹුරු මුද්‍රණය කර දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිටපත් නිකුත් කිරීමෙන් පසු දෘඪ පිටපත් ප්‍රධාන කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය වෙතද, අදාළ අංකිත ගොනු වල ආරක්ෂිත පිටපත් ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙතද යැවිය යුතුය. විස්තර මට්ටම් ගැනීම සඳහා භාවිතා කළ සියළුම මට්ටම් පොත් වසර පහකින් පසු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය විසින් විනාශ කර දමනු ඇත.

ක්ෂේත්‍ර පරීක්ෂණ

7.46 ක්ෂේත්‍ර වැඩ ආරම්භයේදීම, මිනින්දෝරු අධිකාරි විසින්, එක් එක් මැනුම් ක්ෂේත්‍ර සහායක කණ්ඩායම් වල එළි කිරීමේ සීඝ්‍රතාවය ගැන පරීක්ෂා කර බැලිය යුතුය. එළි කිරීමේ සාමාන්‍ය ප්‍රමාණය කෙසේද යන්න සාධාරණව ඇස්තමේන්තුගත කිරීම සඳහා එළි කරනු ලබන අවස්ථාවේදී අඩු වශයෙන් පැය දෙකක්වත් එහි රැඳී සිටිය යුතුය. දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් එළි කිරීම් සඳහා වැඩ ප්‍රමාණයන් නියම කරනු ලැබේ.

7.47 හරි වැරදි බැලීමේදී , දැනටමත් නිමකර ඇති රේඛා නැවත මට්ටම් ගැනීම් හෝ වෙනමම රේඛා මට්ටම් ගැනීම් සිදු කළ යුතුය. තම පාලනය යටතේ කරන ලද සියළුම මට්ටම් වැඩ නියමිත ඉඩදෙන ලද දෝෂ සීමාවන් ඇතුලත පියවී තිබීම ගැන මිනින්දෝරු අධිකාරි වග කිව යුතුය.

7.48 ස්ථානයේදී පරීක්ෂා කර බැලීමෙන්, සමෝච්ඡ රේඛා පිහිටා ඇති දිශාව කැපී යන සේ අතිරේක රේඛා මට්ටම් ගැනීමෙන්, හෝ සෑම අවස්ථාවලදීම අවිනිශ්චිත යයි හැඟෙන සමෝච්ඡ රේඛා භූමියෙහි පිහිටුවා ගැනීමෙන්, සමෝච්ඡ රේඛා මාර්ගයෙන් පෙන්නුම් කරනු ලබන භූමි තොරතුරුවල

නිවැරදිතාවය ගැන මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කර බැලිය යුතුය. මෙයට අමතර මී.අ. විසින් සෑම ඉංජිනේරු මැනුම් පත්‍රයකම පෙන්නුම් කර තිබෙන වඩාත් විවෘත ඒකාකාර නොවන බිම් ප්‍රදේශ හා අවශ්‍ය නම් අනෙකුත් ප්‍රදේශද පරීක්ෂා කර බැලිය යුතුය.

7.49 මිනින්දෝරු අධිකාරි විසින් මැනුම් ක්ෂෙත්‍ර සහායක කණ්ඩායමේ මට්ටම් වැඩවල පරික්‍රමණ සහ විස්තර මැනුම් වල සෑහෙන ප්‍රමාණයක් පරීක්ෂාකර හරි වැරදි බැලිය යුතු අතර, මට්ටම් පොත්වල මෙන්ම සෑම ඉංජිනේරු මැනුම් පත්‍රයකම ඒ පිළිබඳ සහතිකයක් යොදා අත්සන් කළ යුතුය. එම සහතිකයේ පරීක්ෂණ සඳහා භාවිතා කරන ලද මට්ටම් පොත්වලට යොමුවද ඇතුලත් කළ යුතුය. සෑම ඉංජිනේරු මැනුම් පත්‍රයකම පරීක්ෂාකර බැලූ බවට සහතිකයක් ලියා අත්සන් කළ යුතුය. ක්ෂෙත්‍රයේදී කරන ලද හරි වැරදි බැලීම් අඩංගු වන ක්ෂෙත්‍ර පොත් වලට යොමු කිරීම්, එම සහතිකයේ ඇතුලත් විය යුතුය. ශිල්පීය උපදෙස් පොතේ 4 වැනි පරිච්ඡේදයෙන් නියම කර ඇති ඕනෑම ක්‍රමයක් අනුගමනය කළහැකි අතර, මිනින්දෝරු අධිකාරිගේ පාලනය යටතේ කරන ලද සියළුම මැනුම්, 2.23 ඡේදයෙන් නියමකර ඇති අවශ්‍ය නිරවද්‍යතාවයෙන් යුක්ත බවට වගකිව යුතුය. අවම වශයෙන් වැඩ වලින් 10% ප්‍රමාණයක හරි වැරදි බැලිය යුතුය.

පිඹුරු වැඩ

7.50 ඉංජිනේරු මැනුම්වලට අදාළ පිඹුරු සහ ක්ෂෙත්‍ර පොත්වල, මැනුම් විස්තර දැක්වීම සඳහා 11 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 10 හි කෙටි යෙදුම් භාවිතා කළ යුතුය.

7.51 එම සංක්ෂිප්ත නාමයන්ට යොමු දැක්වීමක්, සෑම ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පොතක මුල් පිටුවට මුහුණ ලා, පිට කවරයේ ඇතුල් පැත්තේ අලවා තැබිය යුතුය. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී ඉංජිනේරු මැනුම් සඳහා නිකුත් කරනු ලබන සියළුම ක්ෂෙත්‍ර පොත්වල මෙය ඇලවිය යුතුය.

7.52 පිඹුරු වැඩ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති මෘදුකාංග භාවිතයෙන් සිදු කළ යුතුය.

7.53 පිඹුරු මුද්‍රණය කිරීම සේවා දායකයාගේ පිරිවිතරයන්ට අනුව සුදුසු පරිමාණයකට සුදුසු වර්ණ යොදා සිදු කළ යුතුය. සාමාන්‍ය කටයුතුවලදී 1:5,000 පරිමාණයට A3 ප්‍රමාණයේ ක්ෂෙත්‍ර පත්‍ර මත තොරතුරු කළු වර්ණයෙන් සහ සමෝච්ඡ රේඛා දුඹුරු වර්ණයෙන් මුද්‍රණය කර පිඹුරු ඇඳීම කරනු ලැබේ.

7.54 මායිම් සැසඳීමේ අනුරේඛන ආධාරයෙන් හෝ මෘදු පිටපත් භාවිතා කර එක් එක් ක්ෂෙත්‍ර පත්‍රයක මායිම් යාබද ක්ෂෙත්‍ර පත්‍රවල මායිම් සමඟ සසඳා බැලිය යුතුය. දෙපැත්තේ ඇති බිම් කැබලි වල විස්තරද සසඳා බැලිය යුතුය. පිඹුරු පත්‍ර සහතික කිරීමට කලින් මෙම සැසඳීම් කර වැරදි නිවැරදි කළ යුතුය.

7.55 යාබද ක්ෂෙත්‍ර පත්‍ර දක්වන සුවියක්, පිටපත් කිරීම සඳහා අඳිනු ලබන අතර මෙය ඉංජිනේරු මැනුම් පත්‍රයේ මුද්‍රණය කිරීම සඳහා දකුණු පස වෙන් කළ තීරුව මධ්‍යයේ පෙන්වනු ලැබේ. (මෙම සුවිය 1:50,000 භූ ලක්ෂණාත්මක සිතියම් වල සපයා ඇති සුවිය හා සමානය. යොමුවේ රේඛා චිත්‍රයක් නොමැතිව යාබද ක්ෂෙත්‍ර පත්‍රවල අංක බලා ගැනීමට අවශ්‍ය වූ විට, මෙය මිනින්දෝරුවරුන්ට හා සේවා දායකයාට ප්‍රයෝජනවත් වේ.) එය අඳිනු ලබන්නේ 1:50,000 පරිමාණයෙනි.

7.56 වෙනත් විස්තර මත නොවැටෙන ලෙස, දකුණු සහ නැගෙනහිර මායිම් දිගේ ග්‍රිඩ් රේඛා අංක කළු පාටින් මුද්‍රණය කරනු ඇත.

පිටපත් මුද්‍රණය

7.57 සේවාදායකයා වෙත ලබාදෙන පිටපත් කට්ටලයට අමතරව සම්පූර්ණ පිටපත් කට්ටලයක් මුද්‍රණය කර දිස්ත්‍රික් මිනිදෝරු කාර්යාලයේ ලේඛනාගාරයේ තැන්පත් කළ යුතුය.

7.58 සේවාදායකයා වෙත ලබාදෙන අංකිත සිතියමේ අමතර පිටපත් දෙකක් සකස් කර එකක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ලේඛනාගාරයේ තැන්පත් කළ යුතුය. අනෙක් පිටපත ප්‍රධාන කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතින් අංශය වෙත යැවිය යුතුය. අදාළ අංකිත ගොනුව SRIMS දත්ත පද්ධතිය හරහාද උඩුගත කළ යුතුය. ඉංජිනේරු මැනුම් පිඹුරු මුද්‍රණය කර දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී විසින් පිටපත් නිකුත් කිරීමෙන් පසු දෘඪ පිටපතක්ද දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ආරක්ෂිතව තැබිය යුතුය.

පැරණි මැනුම්

7.59 සෑම මිනින්දෝරුවරයෙකු විසින්ම, අදාළ දම්. 16 යේ සටහන්/යොමු චිත්‍ර ආශ්‍රයෙන්, එම බිම් කට්ටිය හා සම්බන්ධ සියළුම පැරණි ක්ෂේත්‍ර පත්‍ර ලබාගෙන, නැවත නියැකීමෙන් හෝ සුදුසු අධිස්ථාපන ක්‍රමවේදයක් භාවිතා කර පෞද්ගලික ඉඩම් වෙන් කර පෙන්විය යුතුය.

7.60 අයුතු ලෙස අල්ලා ගත් ඉඩම් සාමූහික වශයෙන් මනිනු ලැබේ.

7.61 ඉංජිනේරු මැනුම් පිඹුරු, ආදායම් පිඹුරු නොවන නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව/ මහවැලි අධිකාරිය ඒවා බෙදා දීමට, ඉඩම් කට්ටි කැඩීමට හා වාරිමාර්ග සැලසුම් කිරීමට යොදාගන්නා බව සිහි තබා ගත යුතුය. එබැවින් බෙදා දෙනු ලබන රජයේ ඉඩම්වලට ඇතුල්වීම වැලකීම සඳහා සියළුම පුද්ගලික ඉඩම් වෙන වෙනම පෙන්විය යුතුය.

7.62 ඉංජිනේරු මැනුම් පිඹුරුවල පැරණි මැනුම් පෙන්වීම සඳහා කුඩා/විශාලනය කරන ලද ඡායා පිටපත් භාවිතා කිරීම ප්‍රමාණවත්වේ.

සමෝච්ඡ රේඛා

7.63 සමෝච්ඡ රේඛා අන්තර නිවේශනය මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති මෘදුකාංග භාවිතයෙන් සිදු කළ යුතුය. සමෝච්ඡ රේඛා වල අඛණ්ඩත්වය පවත්වාගෙන යා යුතු අතර ඒ සඳහා අමතර උස ලබා ගැනීම් අවශ්‍ය වේද යන්න ගැන සැලකිලිමත් විය යුතුය. රේඛා අන්තර නිවේශනය නිවැරදිව සිදු කළ යුතු අතර ඉංජිනේරු මැනුම් පත්‍රය මුද්‍රණය කිරීමට පෙර මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කළ යුතුය.

7.64 සුළු සහ ප්‍රධාන සමෝච්ඡ රේඛා 1:2,000 පරිමාණයට අනුව පිළිවෙලින් 0.3m සහ 0.8m ඝනකමකින් ඇඳිය යුතුය.

7.65 සමෝච්ඡ රේඛා සහ විස්තර තව දුරටත් පහසුවෙන් වෙන්කර බලා ගැනීමට හැකිවීම සඳහා, විස්තර ඇඳ ඇති ස්ථානයන්හි සමෝච්ඡ රේඛා කඩකර අඳිනු ලැබේ.

7.66 වැදගත් සහ අවශ්‍ය යැයි හැඟෙන ස්ථාන උස ඉංජිනේරු මැනුම් පත්‍රය මත මුද්‍රණය කළ යුතුය. 7.34, 7.36 සහ 7.38 ඡේදයන්හි සඳහන් කර ඇති අමතර උසද ඉංජිනේරු මැනුම් පත්‍ර මත මුද්‍රණය කළ යුතුය.

7.67 පිල් ලකුණක් පිහිටුවා ඇති ස්ථානයක්, 1.5 mm ක ඉරි සෙවන කරන ලද සමචතුරශ්‍රයකින් (වර්ණ ගන්වන ලද) පෙන්විය යුතු අතර, එම පිල් ලකුණේ භූමිතික උස (අගය) දශම ස්ථාන තුනකට මුද්‍රණය කළ යුතුය (උදා:-51.517).

7.68 ප්‍රධාන සමෝච්ඡ රේඛා වල අගයන් පෙන්වන අංක බෑවුමේ උස පැත්තට මුහුණලා කියවෙන දිශාවට මුද්‍රණය කළ යුතුය.

ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පත්‍ර අංක යෙදීම

7.69 සෑම ක්ෂෙත්‍ර පත්‍රයක්ම හැඳින්වෙන්නේ, එය මතට හෝ එය මැදට ඉතා කිට්ටුවෙන්ම ඊශාන දිග කෙලවර වැටෙන 4 x 2.5 km පත්‍රයෙහි අංකයෙන්ය.

7.70 ක්ෂෙත්‍ර පත්‍ර දෙකක් සඳහා එකම අංකය යෙදිය යුතුව ඇති විට පළමුවන පතෙහි අංකයට පසුව "A" අක්ෂරය යෙදීමෙන් ද, දෙවැන්නෙහි අංකයට පසුව "B" අක්ෂරය යෙදීමෙන් ද හඳුන්වනු ඇත.

ඉංජිනේරු මැනුම් පිඹුරු මත මුද්‍රණය කිරීම

7.71 ඇළ, ඔය ආදියෙහි නම් සහ සියළු විස්තර කළු පාටින්, අනෙකුත් විස්තර මත නොගැවෙන පරිදි මුද්‍රණය කළ යුතුය.

7.72 දත්ත විස්තර සහ හිමිකම් විස්තර කිරීම් කළු පාටින් මුද්‍රණය කළ යුතුය.

යොමු රේඛා චිත්‍ර

7.73 මිනින්දෝරුවරයා විසින් එල්. 403 (ඇමුණුම 06) හි පිට පැත්තේ 1:50,000 පරිමාණයට රේඛා චිත්‍ර පවත්වාගෙන යා යුතුය.

7.74 මිනින්දෝරු අධිකාරි විසින් මැනුම් ක්ෂෙත්‍ර සහායක කණ්ඩායමේ සහාය ඇතිව **යොමු රේඛා චිත්‍රයක්** පිළියෙල කළ යුතු අතර, එහි පහත සඳහන් දෑ ඇතුලත් විය යුතුය.

(i) සියළුම පිල් ලකුණු (**ඇමුණුම 03 හි පරිදි**) නියම ස්ථානවල, ඒවායේ වටිනාකම් ද සහිතව
(ii) භාවිතයට ගත් ක්ෂෙත්‍ර පත්‍රවල මායිම් ඒවායේ අංක සමඟ
(iii) පිටස්තර මායිමෙන් පිටත වැටෙන සේ කිලෝමීටර 1හි ග්‍රිඩ් රේඛා අංක
(iv) 1:50,000 භූ ලක්ෂණාත්මක සිතියම මත යොමු රේඛා චිත්‍රය දිශාභිමුඛ කිරීම පහසුවීම සඳහා, ස්වාභාවික අංග ලක්ෂණයක් හෝ ඊට වැඩි ගණනක්
(v) පරිපාලන මායිම් සහ නම්
(vi) යාබද වාරිමාර්ග යෝජනා ක්‍රම වලට යොමු කිරීම් සමඟ ඒවායේ මැනීම කළ වර්ෂය, අදාළ පැරණි යොමු රේඛා චිත්‍රය ගෙන එය ආශ්‍රයෙන් යාබද මායිම් දැක්විය යුතුය.
(vii) රේඛා චිත්‍රයේ අන්තර්ගතයට පිටතින් ඉහල වම් කෙලවරෙහි ඉංජිනේරු මැනුම් යෝජනා ක්‍රමයේ නම, මැනීම කළ වර්ෂය සහ පරිමාණය, වඩාත් සුදුසු ලෙස මුද්‍රණය කර දැක්විය යුතුය.

7.75 මැනීම කළ ප්‍රදේශයේ ප්‍රමාණය කොතරම් වුවද, යොමු රේඛා චිත්‍රය 1:10,000 හෝ අවශ්‍ය අවස්ථාවක ඊට කුඩා පරිමාණයෙන් යුක්ත වනු ඇත.

7.76 යම් යෝජනා ක්‍රමයක මැනුම් වැඩ සඳහා කණ්ඩායම් දෙකක් හෝ වැඩි ගණනක් යෙදී සිටි විට, හැකි සෑම අවස්ථාවන්හිදීම, සංයුක්ත යොමු රේඛා චිත්‍රයක් පිළියෙල කළ යුතුය. සංයුක්ත යොමු රේඛා චිත්‍රය යනු, එක් කණ්ඩායමකට වඩා වැඩි ගණනක් විසින් මනිනු ලැබූ ප්‍රදේශයක් ආවරණය කරන්නකි. (**ඇමුණුම 04**)

7.77 එක් වසරක් තුලදී/ව්‍යාපෘතියක් සඳහා මනින ලද සම්පූර්ණ ප්‍රදේශය වෙනුවෙන් එකම යොමු රේඛා චිත්‍රයක් පිළියෙල කිරීමට නොහැකි නම්, වෙන වෙනම රේඛා චිත්‍ර පිළියෙල කර ඒවාට A, B, ...ආදී

වශයෙන් ප්‍රත්‍යයන් යොදා වෙන් කොට හඳුන්වනු ලැබේ . (උදා :- කවුඩුල්ල ඉංජිනේරු මැනුම්, 1965 – A)

ඉංජිනේරු මැනුම් ප්‍රගති වාර්තා

7.78 සම්මත පෝරම මත, මිනින්දෝරුවරු විසින් ඔවුන්ගේ වැඩ ගැන වෙන වෙනම වාර්තා පිළියෙල කළ යුතුය. මැනීම කරනු ලබන මුළු ප්‍රදේශයටම, නියම වශයෙන් ඇත්තේ එකම යෝජනා ක්‍රමයක් බැවින්, එක් එක් මිනින්දෝරු අධිකාරි විසින්, මුළු ප්‍රදේශය සඳහා සම්පූර්ණ විස්තර අඩංගු වාර්තාවක් බැගින් පිළියෙල කළ යුතුය.

7.79 මිනින්දෝරුවරයා විසින් ඔහුගේ මිනින්දෝරු අධිකාරි වෙත පහත දැක්වන වාර්තා යැවිය යුතුය.

(i) මිනින්දෝරුවරයා විසින් 1:50,000 පරිමාණයට පරික්‍රමණ රේඛා චිත්‍රයක් පවත්වාගෙන යායුතුය. එමඟින් යාවත්කාලීන කර මාසයේ වැඩකරන අවසන් දින වන විට මිනින්දෝරුවරයා විසින් පරික්‍රමණ සහ මට්ටම් ප්‍රගති රේඛා චිත්‍ර හා පෝරම එල් 403 (ඇමුණුම 06) මඟින් ක්ෂෙත්‍ර ප්‍රගති වාර්තාව.

(ii) සෑම සතියකදීම එළි කිරීමේ ප්‍රගති රේඛා චිත්‍ර සමඟ ජර්නලය

7.80 මිනින්දෝරු අධිකාරි විසින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරින් වෙත පහත දක්වන වාර්තා යැවිය යුතුය.

i. සෑම දෙසතියකට වරක් එළි කිරීමේ ප්‍රගති රේඛා චිත්‍ර

ii. මාසයේ 2 වන වැඩ කරන දිනට පරික්‍රමණ සහ මට්ටම් රේඛා චිත්‍ර හා ක්ෂෙත්‍ර ප්‍රගති රේඛා චිත්‍ර (**ඇමුණුම 05**).

7.81 තවද මිනින්දෝරු අධිකාරින් විසින් ඔවුන්ගේ දැනගැනීම සඳහා සහ පරීක්ෂා කිරීම සඳහා එන නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා ක්ෂෙත්‍ර ප්‍රගති වාර්තාවේ පිටපතක් පවත්වාගෙන යා යුතුය.

7.82 **මතු දැන ගැනීම සඳහා වාර්තා** - පිඹුරු වැඩ නිම කළ පසු, මිනින්දෝරු අධිකාරින් විසින් ඔවුන්ගේ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත පහත දැක්වන දේ ඉදිරිපත් කළ යුතුය.

(i) මනින ලද ප්‍රදේශයේ 1:50,000 අනුරේඛනයක්

(ii) 1:250,000 පරිමාණයට අනුරේඛනයක්

(iii) මට්ටම් රේඛා සහ පිල් ලකුණු, ඒවායේ වටිනාකම් හා ක්ෂෙත්‍ර පොත් හා මට්ටම් පොත් අංක සහ පිටු, දැක්වන අනුරේඛනයක්

7.83 දිස්ත්‍රික්කය තුල සියළුම ඉංජිනේරු සහ ගම් වැව් මැනුම් වල 1:250,000 පරිමාණයේ රේඛා චිත්‍ර (ෆ්ලෙක්ස් මුද්‍රණ යනාදී ලෙස), සුදුසු පරිදි දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරින් විසින් තබාගත යුතුය. මනිනු ලබන ප්‍රදේශය, කොළ පාට කඩ ඉරි සහිත තීරුවකින් හා නිම කරන ලද යෝජනා ක්‍රම කොළ පාට තනි ඉරි සහිත තීරුවකින් ඇඳීමෙන් හා එය තුල යෝජනා ක්‍රමයේ නම ලිවීමෙන් පෙන්වනු ලැබේ.

7.84 දිස්ත්‍රික්කයට අදාළව 1:50,000 භූලක්ෂණාත්මක සිතියම් සහිත සංග්‍රහ පොත් ද දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරින් විසින් පවත්වාගනු ලබන අතර, එය මත සෑම ඉංජිනේරු මැනුමක්ම නියම

ස්ථානයෙහි පෙන්වනු ලැබේ. එක් එක් අවුරුදු වල මැනීමට ගනු ලබන ප්‍රදේශයේ පිටස්තර මායිම මත වැටෙන පත්‍ර වල අංක සමඟ ග්‍රිඩ් රේඛා අංක ද, වටිනාකම් ද, ප්‍රධාන පරික්‍රමණ සහ මට්ටම් රේඛා ද පෙන්වනු ලබන්නේ, වෙනත් ලිය කියවිලි නොබලා යාබද ප්‍රදේශ වල මැනුම් වැඩ සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රයෝජනවත් වන පරිදිය.

ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම්

7.85 1:50,000 පරිමාණයේ සමෝච්ඡ රේඛා මුද්‍රිත පිටපත් වල පෙන්නුම් කරන සමෝච්ඡ රේඛා හා උස ගණන්, ඇළවල් තැනීමේදී අවශ්‍ය වන පස් වැඩ ප්‍රමාණ නිවැරදිව ඇස්තමේන්තු කිරීම සඳහා ඇළවල් වල නියම මාර්ගය තීරණය කිරීමට ප්‍රමාණවත් නොවේ. සේවාදායකයාගේ ඉල්ලීම පරිදි යෝජිත ඇළ දෙපැත්තේ ඉඩම් තීරු වල මැනුමක් කළ යුතුය.

7.86 සාමාන්‍ය වශයෙන් ඇළවල් තැනීමේ වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන්/ මහවැලි අධිකාරියෙන් සේවයේ යොදවන කොන්ත්‍රාත්කරුවන් විසින් කරනු ලබන අතර, සැලසුම් කිරීමේ සහ ඒකකවල වැඩ පාලනය කිරීමේ පහසුකම් නිසා, ඇළේ එක් එක් කිලෝ මීටරයේ වැඩ වෙන් වෙන් ඒකකයක් ලෙස සලකනු ලැබේ .

7.87 ප්‍රධාන ඉංජිනේරු යෝජනා ක්‍රම බොහොමයක, දකුණු ඉවුර ප්‍රධාන ඇළ සහ වම් ඉවුර ප්‍රධාන ඇළ යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රධාන ඇළ වර්ග දෙකක් ඇති අතර ප්‍රධාන ඇළ, අතු ඇළ, බෙදාහැරීමේ ඇළ සමඟ පිළිවෙලින් අතු ඇළ, බෙදා හැරීමේ ඇළ හා කෙත් ඇළ ගණනාවක් සම්බන්ධ වේ.

7.88 යම් යෝජනා ක්‍රමයක, කුඹුරු වශයෙන් ගැණෙන සම්පූර්ණ ප්‍රදේශයම වාරිමාර්ග දෙපාර්තමේන්තුව/ මහවැලි අධිකාරිය විසින් යායවල් ගණනාවකට බෙදා ඇති අතර ඒවා යාය 1,2,3 යනාදි වශයෙන් හඳුන්වනු ලැබේ. යම් යායක බෙදා හැරීමේ ඇළවල් සහ කෙත් ඇළවල් සඳහා එකේ සිට අංක යොදා ඇත. ඒවා හඳුන්වනු ලබන්නේ අංක. 1, 2, 3, යනාදි වශයෙන් බෙදා හැරීමේ නැතහොත් කෙත් ඇළ යනුවෙනි .

7.89 ඉංජිනේරු මැනුම් පත්‍රය මත ඇළ මාර්ග සැලසුම් කිරීමෙන් පසු යෝජිත ඇළේ , එක් එක් කි.මී. කොටස් වල මුද්‍රිත පිටපත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව/ මහවැලි අධිකාරිය විසින් සකස්කරනු ලබන අතර, එහිදී මිනින්දෝරුවරයාට එම මුද්‍රිතයන් ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පත්‍ර මත දිශානිමුඛ කිරීමට පහසු වන පරිදි ස්වාභාවික අංග ලක්ෂණ කීපයක් සහ අංක සමඟ ග්‍රිඩ් රේඛා හා වෙනත් විස්තරද ඇතුලත් කරනු ලැබේ. සාමාන්‍යයෙන් එම මුද්‍රිතයන් මත සමෝච්ඡ රේඛා පෙන්වනු නොලැබේ .

7.90 ඇළ මාර්ග ලකුණු කිරීමේ මුද්‍රිතයන් සහ මැනුම් වැඩ පිරිවිතර පත්‍රිකාව දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි වෙත ලැබුණු පසු මැනුම් ඉල්ලීම් සමඟ ක්ෂෙත්‍රයට නිකුත් කරනු ලැබේ .

7.91 සියළුම ලියකියවිලි පසුව ගෙන්වා ගැනීමේදී සිදුවිය හැකි ප්‍රමාද වැලැක්වීම පිණිස ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම්වල නිරත මැනුම් ක්ෂෙත්‍ර සහායක කණ්ඩායම භාර මිනින්දෝරු අධිකාරි විසින් යෝජනා ක්‍රමය හා සම්බන්ධ ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පත්‍ර, යොමු රේඛා චිත්‍ර සහ පිල් ලකුණු කටු සටහන් කල් තබාම ගෙන්වා ගත යුතුය.

7.92 ඇළ මාර්ග ලකුණු කිරීමේ මුද්‍රිතයන් මිනින්දෝරුවරයා වෙත ලැබුන පසු ඔහු විසින් එක් එක් මුද්‍රණයේ අනුරේඛන ගෙන ඇළේ මධ්‍ය රේඛාව, අදාළ ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පත්‍රය මත මාරු කිරීමකින් පෙන්වනු ලැබේ. සතුටුදායක අධිස්ථාපනයක් ලබාගැනීම සඳහා එක් එක් මුද්‍රණයේ පෙන්වා ඇති තොරතුරු ප්‍රමාණවත් විය යුතුය. හැකි සෑම විටම යෝජිත ඇළ මාර්ගය දැක්වෙන අංකිත සිතියම අදාළ සේවාදායකයාගෙන් ලබාගැනීමට කටයුතු කළ යුතු අතර එය මැනුම් කටයුතු සඳහා වඩාත් පහසුවනවා ඇත.

7.93 මධ්‍ය රේඛා මාරු කිරීම් වලදී එක් කිලෝමීටරයක අවසාන ලක්ෂ්‍යයේ සිට ඊළඟ කි.මී. පටන් ගන්නා ලක්ෂ්‍ය අතර හිස් පරතරයක් නොතිබෙන ලෙසට වග බලා ගත යුතුය.

මධ්‍ය රේඛා පොළවේ ලකුණු කිරීම

7.94 පරණ කුඤ්ඤ වලින් පටන් ගැනීම සහ පියවීම ඇතිවන ලෙස දිගංශ සම්පාදනය කර, විකෝණමානය/පූර්ණමානය ආධාරයෙන් ක්ෂෙත්‍රයේදී මධ්‍ය රේඛාව පොළොවේ ලකුණු කළ යුතුය . එහෙත් පරණ කුඤ්ඤ මත නොපියවා, ඇළ මාර්ගයේ කි.මී 3 කට වඩා වැඩිදුරක් ලකුණු නොකළ යුතුය.

7.95 මධ්‍ය රේඛාව ලකුණු කිරීම නිම කළ පසු, එය සවිස්තර පරික්‍රමණ නිරවද්‍යතාවයට මැන ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පත්‍රය මත මැනුම් රේඛා රහිතව ලකුණු කළ යුතුය.

7.96 වක්‍රයට ලම්බකව පිහිටිය යුතු හරස්කඩ හැර, අනිකුත් හරස්කඩ ක්ෂෙත්‍රයේදී ලකුණු කිරීම් ප්‍රධාන මැනුම් ක්ෂෙත්‍ර සහායක වෙත පැවරිය හැකිය.

7.97 විශේෂ ඉල්ලීමක දී හැර, යෝජිත ඇළවල් වල මධ්‍ය රේඛා ලකුණු කිරීමේදී ඇළ මාර්ග ලකුණු කිරීමේ මුද්‍රණයේ පෙන්වා ඇති වක්‍ර ලකුණු කිරීම අවශ්‍ය නොවේ.

7.98 මුද්‍රණය මත පෙන්වා ඇති ඇළ මාර්ගය අවසාන ඇළ මාර්ගය නොවන මුත්, එය යෝජිත ඇළ මාර්ගය වේ. මැනුමක් කරනු ලබන්නේ නියම ඇළ මාර්ගය තීරණය කිරීම සඳහා වේ. හරස්කඩ ලකුණු කිරීම, ඇළ මාර්ගයට ලම්බකව සිටින සේ කළ යුතු අතර පහත දක්වන පිළිවෙත අනුගමනය කරනු ලැබේ.



ඉහත සඳහන් රේඛා චිත්‍රයට අනුව - හරස්කඩ ලකුණු කිරීම කළයුත්තේ B හරහා නම් , B හරහා ස්පර්ශකයක් ඇඳ, ඉන්පසු සමාන්තර කෝදුවක් හා අනුලම්බන කෝදුවක් ආධාරයෙන් හෝ අංකික දත්ත භාවිතා කර එම ස්පර්ශකයට ලම්බකව සිටින සේ QBP රේඛාව අඳිනු ලැබේ. QP රේඛාවේ දිශංශය පිඹුරෙන් ලබාගත හැකිය. කලින් ලකුණු කරන ලද හරස්කඩේ සිට දුර පිඹුර මත මැන බැලීමෙන්, Q ලක්ෂ්‍යය ක්ෂෙත්‍රයේ ලකුණු කළ හැකිය.

දැන් හරස්කඩ පොළවේ ලකුණු කිරීම කළ හැකිය.

මට්ටම් ගැනීම

7.99 කලින් පිහිටුවන ලද පිල් ලකුණුවලින් පටන් ගැනීම සහ පියවීම කිරීමෙන්, මධ්‍ය රේඛාව විස්තර මට්ටම් රේඛා නිරවද්‍යතාවයට මට්ටම් ගනු ලැබේ. පිල් ලකුණු මත නොපියවා, කි.මී. 3 කට වැඩි දුරක් මට්ටම් ගනු නොලැබේ. මධ්‍ය රේඛාව හා හරස්කඩ රේඛා කැපෙන ස්ථානවල, මධ්‍ය රේඛාව දිගේ වළලා ඇති පිල් ලකුණු සහ කුඤ්ඤ, වර්ථන ලක්ෂ්‍යයන් ලෙස ප්‍රයෝජනයට ගනු ලැබේ.

7.100 කුඤ්ඤ මත පටන් ගැනීම සහ පියවීම කරමින්, හරස්කඩ රේඛා මට්ටම් ගනු ලැබේ. එම කුඤ්ඤ මධ්‍ය රේඛා මත හරස්කඩ රේඛා ඇති තැන්වල ඇත. දික්කඩ හා හරස්කඩ මට්ටම් ගැනීම අතර සැලකිය යුතු කාලයක් ගතවේ නම්, නැතහොත් හරස්කඩ කුඤ්ඤ වෙනස් වේ යැයි සැකකිරීමට කරුණු ඇතොත් හරස්කඩ රේඛාවක් මට්ටම් ගැනීම, ඊට ප්‍රථම කුඤ්ඤයෙන් පටන් ගෙන වෙනස්වී ඇතැයි සැක කරන කුඤ්ඤයට ඉදිරියෙන් ඇති කුඤ්ඤය මත පියවිය යුතුය.

පිඹුරු වැඩ

7.101 අදාළ පිඹුරු වැඩ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති මෘදුකාංග භාවිතයෙන් සිදු කළ යුතුය. වෙනත් ආකාරයකට කිරීමට යැයි සඳහන් කර නොමැති නම්, සිතියම් 1:5,000 පරිමාණයට අනුරේඛන කඩදාසි මත මුද්‍රණය කළ යුතු අතර අංකිත සිතියම් ක්‍රමවත් ආකාරයකට නම් කර දෘඪ තැටියට අමතරව සංගත තැටියක ගබඩා කළ යුතුය. අමතර පිටපතක් ලේඛනාගාරයේ තැන්පත් කිරීම සඳහා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය.

7.102 හැකි සෑම අවස්ථාවකදීම, ඇළ මාර්ගය A3 පත්‍රයේ දික් අතට දිශාභිමුඛ කළ යුතුය. අනුරේඛනයේ ඊසාන දිග කෙළවරෙහි උතුරු දිශාව පෙන්වන රේඛාවක් කළු පාටින් අඳිනු ලබන අතර, එය සෙ.මී 4 ක් දිග වනු ඇත.

7.103 වැඩ තීරුව තුල වැටෙන, ඉංජිනේරු මැනුම් ක්ෂෙත්‍ර පත්‍රයේ පෙන්වා ඇති සියළුම විස්තර අනුරේඛනයේ පෙන්වනු ලැබේ.

(i) සියළුම ස්ථාන උස කළු පාටින් පෙන්වනු ලැබේ. කොන්ක්‍රීට් කුඤ්ඤ කළු තිත් වශයෙන් ඒවායේ නියම අංක සහිතව මී.මී. 0.8 ප්‍රමාණයට පෙන්වනු ලැබේ.

(ii) ඉංජිනේරු මැනුම් පිඹුරු වල මෙන් පිල් ලකුණු පෙන්නුම් කරනු ලැබේ.

7.104 A3 ක්ෂෙත්‍ර පත්‍ර වල නිල් ග්‍රිඩ් රේඛා, පිඹුරේ මැනුම් වැඩ පෙන්වා ඇති ප්‍රධාන කොටසට දුරින් එහි මුළු හතරේ පිටපත් කර වටිනාකම් සමඟ පෙන්වනු ලැබේ.

7.105 ඉල්ලුම් කර ඇති විටදී හැර, හරස්කඩ හා දිග් කඩ අඳිනු නොලැබේ. නමුත් සෑම පිඹුරකම පහලින් දිග් කඩ ඇඳීම සඳහා සෑහෙන තරම් ඉඩ ප්‍රමාණයක් තබනු ලැබේ.

7.106 දැනට පවතින හා අත් හැර දැමූ ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් කරන විට, මිනින්දෝරුවරයා විසින් හරස්කඩද ඇඳ පෙන්විය යුතුය. එක් එක් හරස්කඩය වෙන වෙනම අඳිනු ලබන අතර සේවාදායකයා සඳහන් කරනු ලබන පරිමාණයට (සාමන්‍ය වශයෙන් 1:100 /10 feet to 1 inch) ප්‍රස්ථාර - උස හා ඊට සම්බන්ධ දුර යොදා හරස්කඩ ලකුණු කරනු ලැබේ.

7.107 පිඹුර නිම කිරීමෙන් පසු මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිම කරන ලද මැනුම් ඉල්ලීම් ගොනුවද සමඟ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අනුමත කර මෘදු හා දෘඪ පිටපත් සේවාදායකයා වෙත නිකුත් කළ යුතුය.

7.108 අළුතින් පිහිටුවන ලද සියළුම පිල් ලකුණු අනුරූප ඉංජිනේරු මැනුම් යොමු රේඛා චිත්‍රයෙහි නියමිත ස්ථාන වල රතු පාටින් පෙන්නුම් කර සහතික කරනු ලැබේ. යොමු රේඛා චිත්‍ර සමඟ සහතික කළ පිල් ලකුණු ලැයිස්තුවක් යවනු ලැබේ.

<u>වාර්තා</u>

7.109 සාමාන්‍ය වාර්තා වලට අමතරව එක් එක් මිනින්දෝරුවරයා විසින් පහත දැක්වෙන වාර්තා පවත්වාගෙන යා යුතුය.

(i) 1:5,000 පරිමාණයට එළිකිරීමේ ප්‍රගති වාර්තාව (මෙය සෑම සතියක් පාසාම ජර්නලය සමඟ මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය)

(ii) එල් 403 පෝරම මඟින් ක්ෂේත්‍ර ප්‍රගති වාර්තාව. (**ඇමුණුම 06**)

(iii) ප්‍රගතිය පෙන්නුම් කරන, ඇළේ 1:50,000 අනුරේඛනයක්.

සම්මත වාර්තාවලට අමතරව මිනින්දෝරු අධිකාරි විසින් පහත සඳහන් වාර්තාද පවත්වාගෙන යා යුතුය.

(iv) වෙන් වෙන් වර්ගවල ඇළවල් වර්ග කර මැනුම් කණ්ඩායම සඳහා පවරන ලද මැනුම් ඉල්ලීම්වල ලැයිස්තුවක්.

(v) මුළු මැනුම් කණ්ඩායම සඳහා ක්ෂේත්‍ර ප්‍රගති වාර්තාවක් (**ඇමුණුම 06** හා **ඇමුණුම 07**).

මෙය මාසයේ වැඩ කරන 2 වැනි දින වන විට දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ලැබෙන ලෙස ඉදිරිපත් කළ යුතුය. ක්ෂේත්‍ර ප්‍රගති වාර්තාව මාසයේ 10 වන දිනට ප්‍රථම පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලැබෙන සේ යැවිය යුතුය.

ගම් වැව් මැනුම්

7.110 ස්ථාන උස රේඛා කලින් තීරණය කරනු ලබන ආධාරක රේඛාවකට ලම්බකව ගැනීමේ කරුණු හැර, මෙම මැනුම් 1:5,000 සමෝච්ඡ රේඛා මැනුම් හා සමානය.

7.111 මැනුම් ඉල්ලීම සමඟ යවන කටු සටහනේ පෙන්නුම් කර තිබෙන ප්‍රදේශයට පමණක් තිරස් මැනුම සීමා කළ යුතුය. පෞද්ගලික හා රජයේ ඉඩම්ද භූමි ලක්ෂණ ද මැනිය යුතුය.

7.112 සුදුසු ආධාරක රේඛාවක් පිහිටුවා, සුළු මට්ටම් රේඛාවක නිරවද්‍යතාවයට මට්ටම් ගැනීම කළ යුතුය.
බිම් ප්‍රමාණය හෙක්ටයාර් 400 කට වැඩි නම් රේඛාව තෘතියික රේඛාවක් වශයෙන් සැළකිය යුතුය.
ස්ථාන උස රේඛා මීටර් 100 පරතරයන් අතර ආධාරක රේඛාවට ලම්භකව දිය යුතු අතර, මීටර් 50 දුර ප්‍රමාණ වලදී ලබාගත යුතුය.

7.113 සියළුම ඇළවල් මැනීමට හා අදාළ කුඤ්ඤ අසල හෝ අවශ්‍ය නම් ඊට කිට්ටු පරතරයන් අතර ඉවුරෙහි උස අවශ්‍ය අවස්ථාවලදී සටහන් කළ යුතුය.
පොළවෙන් උඩට මතුවී තිබෙන ගල් පර්වත වෙනම මැන ඒවායේ උසම ස්ථානය ඇතුළුවන පරිදි , අහඹු ලෙස උස ප්‍රමාණ ගැනීම් ද කළ යුතුය.

7.114 කණ්ඩිය උඩ හෝ කණ්ඩිය අසල ස්ථිර පිල් ලකුණු දෙකක් පිහිටුවිය යුතුය.

7.115 මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති මෘදුකාංග භාවිතා කර පිඹුරු වැඩ සිදුකළ යුතුය. සියළුම විස්තරද, පිල් ලකුණු ද, ආධාරක රේඛා සහ ග්‍රිඩ් රේඛා ඇතොත් ඒවාද, සමෝච්ඡ රේඛා සහ සැලකිය යුතු ස්ථාන උසවල්ද, කළු පාටින් පෙන්විය යුතුය. මෙම ගම් වැව් මැනුම් ක්ෂෙත්‍ර පත්‍ර මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කළ යුතු අතර දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් අනුමත කළ යුතුය.

වේලි අක්ෂ මැනුම්

7.116 ජලාශ තැනීම වැනි කෘත්‍රිම ක්‍රම නොමැතිව, ඔය හෝ ගංගා වැනි නිත්‍ය ජල සැපයුම් මාර්ග, වාරි මාර්ග කටයුතු සඳහා සුදුසු ලෙස යෙදවීමට නොහැක. මේ සම්බන්ධයෙන් ජලාශ තැනීම කරනුයේ ගංගාව හරහා වේල්ලක් තැනීමෙනි.

7.117 ගංගාව දිගේ සුදුසු ස්ථානයක වේල්ල තැනීම සැලසුම් කරනුයේ, ගංගාව තුල ගලා යන ජල ප්‍රමාණයේ සන එලය, වේල්ල තැනෙන භූමි ප්‍රදේශය තුල හා ඒ අවට භූමි වල පිහිටීම සහ ජලය සැපයිය හැකි ප්‍රදේශයේ බිම් ප්‍රමාණය ගැන නිසි සැළකිල්ල යොමු කිරීමෙනි.

7.118 ප්‍රදේශයේ ඉංජිනේරු මැනුම් පිඹුරු තිබේ නම්, වාරි මාර්ග දෙපාර්තමේන්තුව/මහවැලි අධිකාරියට වේල්ල බඳින ස්ථානයේ පිහිටීම දළ වශයෙන් දැන ගැනීමට හැකි වනු ඇත.

එම ඉංජිනේරු මැනුම් පිඹුරු නොමැතිනම්, වේල්ල තැනෙන භූමි ප්‍රදේශයේ මැනුමක් කර දෙන ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරනු ලැබේ. විශේෂයෙන් සඳහන් කර නොමැති නම්, මෙම මැනුම සාමාන්‍යයෙන් 1:5,000 සංවෘත සමෝච්ඡ රේඛා මැනුම (close contours) හා සමාන වැඩ නිර්දේශ වලින් සමන්විත වනු ඇත. මැනුම කළයුතු බිම් ප්‍රමාණය රඳා පවතින්නේ වේල්ල තැනෙන භූමි ප්‍රදේශයේ පිහිටීම සොයා ගැනීම සඳහා ලබාගත හැකි පිඹුරු වල ස්වාභාවය අනුව වේ.

7.119 වාරි මාර්ග දෙපාර්තමේන්තුව/ මහවැලි අධිකාරිය විසින් වේල්ල බඳින ස්ථානයේ පිහිටීම දළ වශයෙන් තීරණය කළ පසු, එහි මධ්‍ය රේඛාව නියම කරනු ලැබේ. මෙය "වේලි අක්ෂය " යනුවෙන් හඳුන්වනු ලැබේ. ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් වල මෙන් මෙම වේලි අක්ෂය, අස්ථිර එකක් වනු ලබන අතර, අවසාන වේලි අක්ෂය තීරණය කරනු ලබන්නේ, යෝජිත අක්ෂය දෙපැත්තේ භූමියේ තීරු මැනුමක් කිරීමෙන් පසුය.

7.120 වේලි අක්ෂයේ එක් එක් කෙළවරේ සහ අක්ෂයේ දිශාව වෙනස්වන ස්ථානයන්හි සංඥා සළකුණු ඉදි කිරීම හැර වේලි අක්ෂ මැනුම් සඳහා අනුගමනය කළ යුතු මැනුම් පිළිවෙත ඇළ මාර්ග ලකුණු කිරීමේ මැනුම් සඳහා අනුගමනය කරන මැනුම් පිළිවෙතට සමාන වනු ඇත. වෙනත් විශේෂ අවශ්‍යතාවයන්, මැනුම පිළිබඳ වැඩ විස්තර පත්‍රයෙහි සඳහන් වනු ඇත.

7.121 ගං වතුර මට්ටම සැපයීම සහ ගං වතුර පිටාරය යන ස්ථාන පෙන්වීම ද අත්‍යාවශ්‍ය වන අතර, වේල්ල සැලසුම් කිරීමේදී එම කරුණු ඉතා වැදගත් වනු ඇත.

7.122 පිඹුරු අදාළ පිරිවිතරයන්ට අනුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති මෘදුකාංග භාවිතයෙන් සිදු කළ යුතුය.

7.30 ඡේදය **ඇමුණුම 01**

පිල් ලකුණක් විස්තර කර පෙන්වන ආදර්ශ කටු සටහනක්



'සී' වර්ගය : 70cm ගැඹුරින්, 7 km කණුව අසල

7.42 ඡේදය ඇමුණුම 02

යෝජනා ක්‍රමය :- **ඉංජිනේරු මැනුම් පත්‍රය :-**

පිල් ලකුණු ලැයිස්තුව

පිල් ලකුණු පිහිටීම (උ/දෙ)	පිල් ලකුණු පිහිටීම (නැ/බ)	මාධ්‍යම මුහුදු මට්ටම වටිනාකම	මට්ටම් පොත් අංකය	පිටු අංකය	පරීක්ෂා කලේ		වෙනත් කිව යුතු කරුණු

ඉහත සඳහන් පිල් ලකුණු අගයන් අදාළ මට්ටම් පොත සහ පිඹුර සමඟ පරීක්ෂා කරන ලද බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

.....
මිනින්දෝරු අධිකාරි

7.74 ඡේදය **ඇමුණුම 03**

ඉංජිනේරු මැනුම් යොමු රේඛා චිත්‍රවල භාවිතා කළ යුතු සම්මත සලකුණු



ප්‍රාථමික පිල් ලකුණු

ද්විතීයික සහ තෘතියික පිල් ලකුණු

සුළු මට්ටම් පිල් ලකුණු

විස්තර මට්ටම් පිල් ලකුණු

සටහන

1. සලකුණු කළු පාටින් පෙන්නුම් කරනු ලැබේ.
2. යොමුරේඛා චිත්‍රය සඳහා භාවිතයට ගනු ලබන පරිමාණය අනුව ප්‍රමාණයන් වෙනස් කර ගත හැක.
   මෙහි පෙන්නුම් කර තිබෙන ප්‍රමාණයන් 1: 10000 පරිමාණයට අනුව වේ.

පිඹුරු වැඩ ප්‍රගති රේඛා චිත්‍රය
අඹන්ගහ තෝපාවැව ඉංජිනේරු මැනුම් උ.මැ.ප.
..... මයා. ..... කණ්ඩායම
නිම කිරීමට යෝජිත දිනය .....

<u>පරිමාණය 1 : 50,000</u>



වැඩ ආරම්භ කරන ලද කේෂත්‍ර පත්‍රය කවයෙන් පෙන්නුම් කෙරේ.

ඉරි වලින් පාට කළ 1 වැනි කොටස - විස්තර ලකුණු කිරීම නිම කරන ලදී.
ඉරි වලින් පාට කළ 2 වැනි කොටස - සමෝච්ඡ රේඛා අන්තර් නිවේශනය නිම කරන ලදී.
ඉරි වලින් පාට කළ 3 වැනි කොටස - පැතලි පිඹුර තීන්තෙන් ඇඳීම නිම කරන ලදී.
ඉරි වලින් පාට කළ 4 වැනි කොටස - සමෝච්ඡ රේඛා තීන්තෙන් ඇඳීම නිම කරන ලදී.

	කෙටි අත්සන්				
මාසය	මී.අ.	ජෝ.මී.අ.	නි.ස.ජ.(පළාත්)	නි.ස.ජ. (ජෝ.)	ස.ජ.
නොවැම්බර්					
දෙසැම්බර්					
ජනවාරි					

ඇමුණුම 4 (පසුපිට හා සම්බන්ධයි)

පිඹුරු වැඩ ප්‍රගති රේඛා චිත්‍රය
අඹන්ගහ තෝපාවැව ඉංජිනේරු මැනුම් උ.මැ.ප.
..... මයා. ..... කණ්ඩායම
නිම කිරීමට යෝජිත දිනය .....

පරිමාණය 1 : 50,000



<u>යොමුව</u>
වැඩ සඳහා ගන්නා ලද ක්ෂෙත්‍ර පත්‍රය කවයෙන් පෙන්නුම් කෙරේ.

1 2
3 4

ඉරි වලින් පාට කළ 1 වැනි කොටස - තිරස් පිඹුර නිම කරන ලදී.
ඉරි වලින් පාට කළ 2 වැනි කොටස - දික්කඩ නිම කරන ලදී.
ඉරි වලින් පාට කළ 3 වැනි කොටස - හරස්කඩ නිම කරන ලදී.
ඉරි වලින් පාට කළ 4 වැනි කොටස - තීන්තෙන් ඇඳ කි.මී ය නිම කරනු ලදී.
(වැව් කණ්ඩි කැඩුණු තැන්වලට අයත් පිඹුරු තිබෙනම් ඒවාද ඇතුලුව)

	මූලකුරු				
මාසය	මී.අ.	ජෝ.මී.අ.	නි.ස.ජ. (පළාත්)	නි.ස.ජ. (ජෝ.)	ස.ජ.
නොවැම්බර්					
දෙසැම්බර්					
ජනවාරි					

මට්ටම් ගැනීම් ප්‍රගති සටහන

ඇල්ල ඉංජිනේරු මැනුම් ප්‍රදේශය - 2006

..... මයා. ..... කණ්ඩායම



දිනය	යෝජිත	නිමකරන ලද	කාර්ය මණ්ඩල පැමිණි
ප්‍රාථමික රේඛා 2006.02.10			E.Y. ඩයස් මයා, I ශ්‍රේණිය
ද්විතියික රේඛා			P.R. ද මෙල්, IIශ්‍රේණිය 2006.02.20
තෘතීයික රේඛා			S.N. පෙරේරා, IIIශ්‍රේණිය 2006.02.13
සුළු රේඛා			

තෘ.රේ.	දුර	මී. තැනගේ කෙටි අත්සන	දෝෂ	ඉඩදෙන දෝෂය	සු.රේ.	දුර	මී. තැනගේ කෙටි අත්සන	දෝෂ	ඉඩදෙන දෝෂය

ප්‍රගතිය (කි.මී. වලින්)											
2006	තෘතීයික රේඛා			සුළු රේඛා							
මාසය	එළිකරන ලද ප්‍රමාණය	පිල් ලකුණු පිහිට වූ දුර	මට්ටම් ගැනීම් කළ ප්‍රමාණය	එළිකරන ලද ප්‍රමාණය	පිල් ලකුණු පිහිට වූ දුර	මට්ටම් ගැනීම් කළ ප්‍රමාණය	මී. අ.	ජ්‍යෝ.මී. අ.	නි.ස.ජ. (පළාත්)	නි.ස.ජ. (ජ්‍යෝ.)	ස. ජ.

[7.109 ඡේදය](#) [ඇමුණුම 06](#)

..... ඉංජිනේරු මැනුම් - 20.....

..... මහින්දෝරු අධිකාරි ප්‍රමාණය ..... මෙක්ටයාර් නිමකිරීමට යෝජිත දිනය.....

..... මහින්දෝරුවරයා නිමකිරීමට යෝජිත සංශෝධිත දිනය .....

- එම -

.....

ඉංජිනේරු මැනුම් සඳහා ක්ෂේත්‍ර ප්‍රගති වාර්තාව

මාසය	එළි කරන ලද කි.මී	මහින ලද කි.මී	මටටම කළ කි.මී	එළි කිරීමට ඇති කි.මී.	මැනීමට ඇති කි.මී	ගමන්කළ යුතු දුර කි.මී	කිරයුතු කරුණු	මී.අ.	ජෙෂ.මී.අ.	ප.ඉ.ප.	අති.ඉ.ප. (ක්ෂෙත්‍ර)	ඉ.ප
ජනවාරි 20.....												
පෙබරවාරි												
මාර්තු												
අප්‍රේල්												
මැයි												
ජූනි												
ජූලි												
අගෝස්තු												
සැප්තැම්බර්												
ඔක්තෝම්බර්												
නොවැම්බර්												
දෙසැම්බර්												

ඇමුණුම 6 හා සම්බන්ධයි



7.109 ඡේදය **ඇමුණුම 07**

කණ්ඩායම .... ඇළ මාර්ග ලකුණු කිරීම - 20.....

..... මිනින්දෝරු අධිකාරි ප්‍රමාණය ..... භෞෂ්ටයාර් නිමකිරීමට යෝජිත දිනය .....

..... මිනින්දෝරුවරයා (පසුපිට බලන්න) නිමකිරීමට යෝජිත සංශෝධිත දිනය .....

- එම -

ඉංජිනේරු මැනුම් සඳහා ඇළ මාර්ග ලකුණු කිරීම සඳහා පුහුණු වර්ගය

මාසය	එළි කරන ලද කි.මී	මනින ලද කි.මී	මටටම් කළ කි.මී	එළි කිරීමට ඇති කි.මී.	මැනීමට ඇති කි.මී	ගමන්කළ යුතු දුර කි.මී	කිඹුතු කරුණු	මී.ඡ.	ඡාය.මී.ඡ.	ප.මැ.	අධි.ස.ප. (ක්ෂෙත්‍ර)	ස.ප
ජනවාරි 20....												
පෙබරවාරි												
මාර්තු												
අප්‍රේල්												
මැයි												
ජූනි												
ජූලි												
අගෝස්තු												
සැප්තැම්බර්												
ඔක්තෝම්බර්												
නොවැම්බර්												
දෙසැම්බර්												

ඇමුණුම 7 හා සම්බන්ධයි

මිනින්දෝරුකැන්න ශ්‍රේණිය පැමිණි දිනය

1. .....
2. .....
3. .....
4. .....
5. .....
6. .....
7. .....
8. .....
9. .....
10. .....

යොමුව

ආරම්භ කළ කි.මී කවයෙන් පෙන්නුම් කෙරේ.

පාට කළ 1 වැහි කොටස - නියස මැනුම නිම කරන ලදී.
පාට කළ 2 වැහි කොටස - මධ්‍ය මර්කාව මැන හරස්කඩ පිහිටුවා ඒඩි කරන ලදී.
පාට කළ 3 වැහි කොටස - දීක්කඩ මනින ලදී.
පාට කළ 4 වැහි කොටස - හරස්කඩවල් මැන කි.මී ය සම්පූර්ණ කරන ලදී.

සටහන :-

1. ඇමුණුම 3 අනුව වර්ණ යොදා ඇත.
2. මිනින්දෝරු කැන්ට හාරදී නිමෙන කි.මී ය ඔහුගේ මූලකාර යොදා පෙන්විය යුතුය.

පරිමාණය 1 : 50,000

ශුද්ධි පත්‍රය

8 වැනි පරිච්ඡේදය

මායිම් නියම කිරීමේ මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	මායිම් නියම කිරීමේ මූලික විමර්ශන කටයුතු	
8.1.	මායිම් නියම කිරීමේ මැනුම් පිළිබඳ මැමෝ පත්‍රය	1
8.2.	අමතර මැනුම් කටයුතු	1
8.3.	ක්ෂේත්‍ර නිලධාරීන් සහ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී අතර කෙරෙන ලිපි ගනුදෙනු	1
8.4.	සහකාර ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී සමඟ සාකච්ඡා පැවැත්වීම	1
	ක්ෂේත්‍ර කටයුතු	
8.5.	මැනුම් කිරීමේදී ඇති වන දුෂ්කරතා පිළිබඳව ඉ. නි. නිලධාරී සමඟ ලිපි ගනුදෙනු කිරීම	1
8.6.	මිනින්දෝරුවරුන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් මැනුම් කටයුතු සඳහා යෙදවීම	1
8.7.	ඉඩම් ලැබුම්කරුවන්ට මායිම් පෙන්වා දීම	1
8.8.	මුල් ලංකා මැනුමේ කුඤ්ඤම භාවිතා කිරීම	2
8.9.	පැරණි මැනුම් රේඛා නැවත පිහිටුවීම	2
8.10.	පැරණි කුඤ්ඤ මත දක්නට ලැබෙන කෝණික හා රේඛීය නොපියවීම්	2
8.11.	පැරණි මායිම් ක්ෂේත්‍රයේ පිහිටුවීම	2
	නිරවුල් කර දෙන බිම් ප්‍රමාණ දෝෂ සීමාවන්	
8.12.	නිරවුල් කළ යුතු ඉඩම් කට්ටිවල වර්ග ප්‍රමාණය වැඩි හෝ අඩු වූ විට කටයුතු කරන ආකාරය	2
8.13.	වැඩිපුර වගාව සඳහා කටයුතු කරන ආකාරය	2
	මුල් බිම් ප්‍රමාණය වෙනස් කළ හැකි අවස්ථා	
8.14.	ලංකා මැනුමේ ඉඩම් කැබැල්ලක මුල් බිම් ප්‍රමාණය වෙනස් කළ හැකි අවස්ථා	2
8.15.	8.14 (අ) හි සංශෝධනයන් ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම	3
	නිරවුල් කිරීමේ නියෝග හා සම්බන්ධ ගිවිසුම්	
8.16.	නිරවුල් කිරීමේ නිලධාරී හා ඉඩම් හිමිකම් කියන්නන් අතර ඇති කර ගන්නා ගිවිසුම්	3
8.17.	ගිවිසුම - උදාහරණය (i)	3
8.18.	ගිවිසුම - උදාහරණය (ii)	3
8.19.	මායිම් නියම කිරීමේ මැනුම් වලදී නියම කර ඇති කරුණු	4
8.20.	නිරවුල් කළ යුතු ඉඩම ලංකා මැනුමෙහි ඉඩම් කැබලි දෙකකට ඇතුළත්වූ විට කටයුතු කිරීම	4
8.21.	මායිම් නියම කිරීමේ නියමයන් හා දළ සටහන් අතර වෙනස්කම් වාර්තා කිරීම	4
	අයුතු ලෙස අල්ලා ගැනීම්	
8.22.	ඉ.නි. ආඥාපනත යටතේ අයුතු අල්ලා ගැනීම්	4
	වෙන්කල බිම් ලකුණු කිරීම	

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
8.23.	ඉ.නි. ආඥාපනත යටතේ නිරවුල් කරන ලද ඉඩම් සඳහා වෙන් කළ බිම්	4
8.24.	ඉ.නි. ආඥාපනත යටතේ පිටස්තරව විකුණන ඉඩම් සඳහා වෙන් කළ බිම්	4
8.25.	අයුතු ලෙස අල්ලා ගත් ඉඩම් සඳහා වෙන් කළ බිම්	5
	පිඹුරු වැඩ	
8.26.	මායිම් නියම කිරීමේ මැනුම් සඳහා ක්ෂෙත්‍ර පත්‍ර ගැනීම	5
8.27.	පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු	5
8.28.	මායිම් නියම කිරීමේ මැනුම් කරන කාලය තුල කරන අනෙකුත් මැනීම්	5
8.29.	පසුකාලීන මැනුම් වලදී ලංකා මැනුම් පත්‍රයේ සාවද්‍ය කොටස් හඳුනා ගැනීම	5
8.30.	වැරදිව ඇඳ තිබෙන හෝ අසම්පූර්ණ කැබලි වල වැරදි නිවැරදි කිරීම	5
	පිඹුරු පරීක්ෂා කිරීම	
8.31.	එක් එක් මැනුම සඳහා වාර්තාවන් පිළියෙල කිරීම	5
8.32.	මැනුම් ඉල්ලීම් අවලංගු කිරීම සහ ආපසු යැවීම	5
8.33.	මායිම් නියම කිරීමේ මැනුම් පරීක්ෂා කිරීම	5
	ලේඛන සංශෝධන කිරීම	
8.34.	ලංකා මැනුම් ක්ෂෙත්‍ර පොත්, පිඹුර හා ඉ. වි. ලැයිස්තුව සංශෝධනය කිරීම	6
8.35.	අළුත් මැනුමකදී පොදු ගම් මායිමක මායිම්ගල් යෙදීම	6
	පිරිවැය බිල් සකස් කිරීම	
8.36.	පිරිවැය බිල් පත්‍ර පිළියෙල කිරීම	6
8.37.	මැනුම් වැඩ සඳහා ගාස්තු පරීක්ෂා කිරීම	6
	ඉ.නි. ආඥාපනත යටතේ වගන්ති	
8.38.	මායිම් නියම කිරීමේ මැනුම් ඉල්ලීමක සඳහන් විශේෂිත වගන්ති	6
	ප්‍රගති වාර්තා	
8.39.	ප්‍රගති වාර්තා	7
8.40.	පිඹුරු පිටපත්, ඉඩම් විස්තර ලැයිස්තු හා සවිස්තරාත්මක වාර්තාවක් යැවීම	7
	ඇමුණුම්	
ඇමුණුම 01	ප්‍රගති වාර්තා පෝර්මය	8
ඇමුණුම 02	මායිම් නියම කිරීමේ මැනුම් වලට අදාළ මැනුම් ඉල්ලීම් ලෙජරය	9

8 වැනි පරිච්ඡේදය

මායිම් නියම කිරීමේ මැනුම්

මායිම් නියම කිරීමේ මූලික විමර්ශන කටයුතු

8.1. ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි වෙත ලංකා මැනුම් පිඹුරු වල මුද්‍රිත පිටපත් ලැබුණු පසු ඔහු විසින් ක්ෂෙත්‍රයේ දී පරීක්ෂණ පවත්වා ගම් පිඹුරු පිටපතක් මත ඇඳි දළ සටහනක් පිළියෙල කර එය සමඟ මායිම් නියම කිරීමේ මැනුම් පිළිබඳ මැමෝ පත්‍රයක් සර්වේයර් ජනරාල් වෙත එවනු ලැබේ. සර්වේයර් ජනරාල් විසින් ජ්‍යෙ. නි.ස.ජ (ලේ.ක. හා වෘ.ප්‍ර.) වෙත මැනුම් ඉල්ලීම යොමු කළ පසු එය අදාළ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කරනු ලබයි. ඉන් පසු දිස්ත්‍රික් ජ්‍යෙ.මි.අ. විසින් මැනුම් ඉල්ලීමක් පිළියෙල කර අවශ්‍ය පරිදි රජයේ මිනින්දෝරුවරයෙකු අනුයුක්ත කළ යුතුය.

8.2. අමතර මැනුම් කටයුතු ප්‍රධාන කාර්යාලයෙන් විමසා බලා මිස ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියාගේ තනි ඉල්ලීම මත නොකළ යුතුය. ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරින්ට මෙම දෙපාර්තමේන්තුව විසින් සෑම ආධාරයක්ම දිය යුතු නමුදු , ඔවුන් විසින් ඉල්ලා සිටින අමතර කටයුත්තක් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අභිමතය පරිදි යුක්ති සහගත නොවන්නේ නම් හා ඒ සඳහා දිගු කාලයක් අවශ්‍ය වන්නේ නම්, ඒ ගැන වහාම ප්‍රධාන කාර්යාලයට දන්වා උපදෙස් ලබා ගත යුතුය.

8.3. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ක්ෂෙත්‍ර නිලධාරින් හා ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරින් අතර කෙරෙන සෑම වැදගත් ලිපි ගනුදෙනුවක් පිළිබඳ සම්පූර්ණ තොරතුරු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ප්‍රධාන කාර්යාලයට දන්වා යැවිය යුතුය.

8.4. ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි පළාතේ සිටින කාලය තුළ ඔහු සමඟ සාකච්ඡා කර ඒවා පැහැදිලි කර ගත යුතුය. යම් කිසි විශේෂ ගමක් භාරව කටයුතු කරන සහකාර නිරවුල් කිරීමේ නිලධාරි නැවත එම ගමෙහි සංචාරක කටයුතු සඳහා පැමිණෙන දිනය ඔහු සමඟ කෙළින්ම ලියුම් ගනුදෙනු කර ගැනීමෙන් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිට දැන ගත හැකිය. එවිට මේ සම්බන්ධයෙන් දිනයක් හා වේලාවක් නියම කර ගත හැකි වේ.

ක්ෂෙත්‍ර කටයුතු

8.5. දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලට පටහැනි නොවේද යන වග හා අවශ්‍ය බිම් ප්‍රමාණය තිබේ ද යන වගත් දැන ගැනීම සඳහා ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිගේ අවශ්‍යතාවයන් ක්ෂෙත්‍රයේදී සූක්ෂම ලෙස පරීක්ෂා කර බැලිය යුතුය. අයුතු ලෙස අල්ලා ගැනීම්, අවශ්‍ය බිම් ප්‍රමාණ නොමැතිකම, ප්‍රවේශ මාර්ග නැතහොත් හිමිකම් කියන්නන් පිළිබඳව පැන නගින දුෂ්කරතා ආදිය සම්බන්ධයෙන් මිනින්දෝරු අධිකාරි හට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අනුමැතිය ඇතිව සෘජුවම නිරවුල් කිරීමේ නිලධාරි සමඟ ලිපි ගනුදෙනු කළ හැකි අතර අදාළ ලිපිවල සහ අනුරේඛනයේ පිටපත් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත යැවිය යුතුය. එවිට කරුණු පැහැදිලි කරන අනුරේඛන සමඟ තමන්ගේ යෝජනා ද ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි වල පිටපත් සම්පූර්ණ කරන ලද පිඹුරු සමඟ ප්‍රධාන කාර්යාලයට යැවිය යුතු අතර, මිනින්දෝරුතැනගේ වාර්තාවේ ඒවා ගැන සඳහන් කළ යුතුය.

8.6. ගමකට අයත් මායිම් නියම කිරීමේ විශාල මැනුම් මිනින්දෝරුවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අතරේ සුදුසු අන්දමින් බෙදා කොටස් වශයෙන් කටයුතු කිරීමට හැකිවන පරිදි සංවිධානය කළ යුතුය. එක් එක් කොටස සම්බන්ධයෙන් වෙන වෙනම වාර්තා පිළියෙල කළ යුතුය.

8.7. ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියාගේ අවශ්‍යතාවයන් අනුව හා ඔහුගේ දළ සටහන් වල පෙන්නුම් කර තිබෙන පරිදි මායිම් මැනිය යුතුය. ග්‍රාම නිලධාරි හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට බලයලත් කෙනෙකු තොරතුරු සැපයීම සඳහා මැනුම කරන වේලාවේදී පෙනී සිටිය යුතුය. එක් එක් මායිම් නියම

කිරීමේ මැනුම් ඉල්ලීම් වල පිඹුරු සමඟ ග්‍රාම නිලධාරිගේ සහතිකයද යැවිය යුතුය. ග්‍රාම නිලධාරි හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින්නා හෝ ඉදිරියට ඉඩම් ලැබුම්කරුවන්ට ඉඩම් කැබලි වල මායිම් පෙන්වා දිය යුතුය. එහි වාසය නොකරන ලැබුම්කරුවන්ගේ ලිපිනයන් මායිම් නියම කිරීමේ මැමෝ පත්‍රයෙන් ලබා ගත හැක. යම්කිසි ලැබුම්කරුවෙකුට මායිම් පෙන්වා නොදුනහොත් ඊට හේතුව වාර්තාවේ සඳහන් කළ යුතුය.

8.8. පැරණි ලංකා මැනුම් මායිම් නැවත මනින විට මුල් ලංකා මැනුමේ කුඤ්ඤයන්ම ප්‍රයෝජනයට ගත යුතුය.

8.9. රේඛාවන් නැවත පිහිටුවීම අවශ්‍ය වන විට ඒවා පැරණි ක්ෂේත්‍ර පොතෙන් අළුත් ක්ෂේත්‍ර පොතට පැන්සලෙන් පිටපත් කරගෙන රේඛා නැවත පිහිටුවීමත් සමඟ කළු තීන්තෙන් ඇඳිය යුතුය.

8.10. රේඛා නැවත පිහිටුවීමෙන් පසු පැරණි කුඤ්ඤයන් මත දක්නට ලැබෙන කෝණික හා රේඛීය නොපියවීම් අළුත් ක්ෂේත්‍ර පොතේ පෙන්නුම් කළ යුතුය.

8.11. පිඹුරකින් පරිමාණ කර ගත් මායිම ලකුණු කිරීමේ දී එය **9.81 – 9.85 ඡේදයන්හි** දක්වා ඇති පරිදි කළ යුතුය.

නිරවුල් කර දෙන බිම් ප්‍රමාණ දෝෂ සීමාවන්

8.12. ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් මායිම් ලකුණු කිරීමේ බිම් ප්‍රමාණය "වැඩි හෝ අඩු" ලෙස ඉල්ලා සිටින විට එහි යම් කිසි අඩුවක් ඇත්නම් එය ආගණනය කිරීමේදී ඉඩ දී තිබෙන අනුක්‍රම පරිමාණ දෝෂ සීමාව තුළ තිබිය යුතුය. යම් කිසි වැඩි වීමක් ඇත්නම් එය එම සීමාවේ දෙගුණයකට වැඩි නොවිය යුතුය. ඉඩම් වල වටිනාකම අඩු පෙදෙස් වල ඉඩම් කැබැල්ලේ බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.2023 (රූඩ් 2) ට වඩා වැඩි වන විට මෙම අඩු වීම ඉඩ දී ඇති දෝෂ සීමාව මෙන් දෙගුණයක් තෙක් වැඩි කළ හැකිය. යම් හෙයකින් ඉඩම් කැබැල්ලේ බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.4047 (අක්කර 01) ක් හෝ ඊට අඩු නම් හා ඉතිරි ප්‍රදේශයක් ලබා ගත හැකිව තිබේ නම් වැඩි වූ ප්‍රමාණය ඉඩ දී ඇති දෝෂ සීමාව මෙන් සිවු ගුණයක් තෙක් වැඩි කළ හැකිය. එහෙත් මෙය මිනින්දෝරු අධිකාරිගේ අවසරය නොමැතිව සිදු නොකළ යුතුය.

8.13. ඉඩම් ලැබුවකු ඔහුට නිරවුල් කර දෙන ලද ප්‍රමාණයට වැඩි ඉඩම් ප්‍රමාණයක් වගා කර තිබෙන විට, ඉඩ දී තිබෙන දෝෂ සීමාව මෙන් සිවු ගුණයක් වන තුරු වැඩි කොට ද එසේ නැතහොත්, ඉඩම වැඩි වටිනාකමක් නොමැති විට නිරවුල් කිරීමේ නිලධාරිගේ ඉඩම් කොටස මෙන් සියයට 15 ක ඉඩම් ප්‍රමාණයක් මෙන් ද යන මෙයින් වැඩි බිම් ප්‍රමාණය තෙක් විය යුතුය. එම වැඩියෙන් වගා කර තිබෙන කොටස ඇතුළත් වන සේ වැඩි කළ හැකිය. මෙසේ වැඩි කළ හැක්කේ ඉතිරි වන ප්‍රදේශය තුළ ඉඩම තිබේ නම් වන අතර එවිට ඒ සඳහා මායිම්ගල් දමා, වෙනම බිම් කැබලි අංකයක් යොදා , වාර්තා කළ යුතුය.

මුල් බිම් ප්‍රමාණය වෙනස් කල හැකි අවස්ථා

8.14. ලංකා මැනුම් බිම් කොටස් වල මුල් බිම් ප්‍රමාණය හැකි පමණ එලෙසම තබා ගත යුතුය. ඒවා වෙනස් කළ යුත්තේ පහත සඳහන් අවස්ථාවන්හි දී පමණකි.

(අ) අළුත් මැනුම ප්‍රවේශමෙන් හා සූක්ෂම ලෙස නැවත ආගණනය කිරීමේ දී මුල් බිම් ප්‍රමාණය ඉඩ දෙන දෝෂ සීමාව තුල නොමැති විට,

(ආ) ඉඩම් කැබැල්ලක මායිම බිමෙහි හා පිඹුරෙහි නියත වශයෙන්ම වෙනස් කරන විට ඊට අදාළ සියළු ඉඩම් වල බිම් ප්‍රමාණයද සංශෝධනය කළ යුතුය. බිම් ප්‍රමාණය සම්බන්ධයෙන් කරන වෙනස අනුක්‍රම පරිමාණයෙන් ඉඩ ලැබෙන දෝෂ සීමාවට ඇතුළත් වීම මෙය ඉටු කිරීමට බාධකයක් නොවිය යුතුය.

8.15. මෙවැනි සංශෝධන කිරීමේ දී ඒ ඒ අවස්ථාවන්ට සුදුසු පරිදි එවැනි සංශෝධන යෝග්‍ය දැයි පරීක්ෂා කර බලා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් තමන්ගේ අභිමතය පරිදි කටයුතු කළ යුතුය. ලියකියවිලි නිතරම සංශෝධනය නොකළ යුතුය. ඡේදය 8.14 (අ) හි සඳහන් කර ඇති අවස්ථාවකදී ඒ බව වහාම ප්‍රධාන කාර්යාලයට දන්වා යැවිය යුතුය.

නිරවුල් කිරීමේ නියෝග හා සම්බන්ධ ගිවිසුම්

8.16. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ නිකුත් කරන නිරවුල් කිරීම් නියෝග සම්බන්ධයෙන් කරන මායිම් නියම කිරීම් නිරවුල් කිරීමේ නිලධාරියා හා හිමිකම් කියන්නන් අතර ඇති කරගත් ගිවිසුම අනුව කළ යුතුය. මෙම ගිවිසුම් සඳහා දෙපක්ෂයම අත්සන් තබන අතර , ඒවාට දෙපක්ෂයම බැඳී සිටිති. ගිවිසුමකට දෙපක්ෂයම අත්සන් තැබූ පසු එහි කිසිම වගන්තියක් වෙනස් කළ නොහැකිය. වෙනසක් කිරීමට අවශ්‍ය නම් ගිවිසුමට භාජනය වී ඇති කරුණ නැවත සාකච්ඡා කර බලා එම වෙනස් කිරීමට දෙපක්ෂයම අත්සන් තැබිය යුතුය. මේ සම්බන්ධයෙන් ඇටෝර්නි ජනරාල්ගේ තීරණය තරයේම පිළිපැදිය යුතුය. එහෙයින්, ගිවිසුම් වල වගන්ති වෙනස් කිරීමට සිදු වන කිසිම මායිම් ලකුණු කිරීමක් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් භාර නොගනී.

8.17. උදාහරණ : 1. හිමිකම් කියන්නාට 21 වන හා 22 වන ඉඩම් කැබලි වලින් හෙක්ටයාර් 2.0234 ක් (අක්කර පහක්) ලැබෙන පරිදි හිමිකම් කියන්නෙකු හා නිරවුල් කිරීමේ නිලධාරියකු අතර ඇති කරගත් ගිවිසුමකට දෙපක්ෂයම අත්සන් තබන ලදැයි සිතමු. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ කරන නිරවුල් කිරීමේ නියෝගයක මාර්ගයෙන් එය පෞද්ගලික ඉඩමක් වන බව ප්‍රකාශ කිරීම සඳහා නිරවුල් කිරීමේ නිලධාරි එහි මායිම් ලකුණු කරන ලෙස මෙම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනු ඇත. හෙක්ටයාර 2.0234 (අක්කර 5) පිහිටා තිබෙන ආකාරය හිමිකම් කියන්නා නිවැරදිව දන්නා අතර, එය ඉඩම් කැබලි දෙකටම අයත් වන බව කටු සටහනකින්ද පැහැදිලිව පෙන්නුම් කෙරේ.

මේ සම්බන්ධයෙන් මැනුමක් කරන විට හිමිකම් කියන්නාගේ ඉල්ලීම පරිදි එම හෙක්ටයාර 2.0234 (අක්කර 5) 21 වන ඉඩම් කැබැල්ලෙන්ම මනිනු ලැබුව හොත් එය ගිවිසුම් වගන්ති වලට අනුකූල නොවන්නේය. මෙවැනි අවස්ථාවකදී මායිම් ලකුණු කිරීම වෙනස් කළ යුතුය. එසේ නැත්නම් ‘22 වැනි ඉඩම් කැබැල්ල’ යන්න කපා දමා ගිවිසුම වෙනස් කළ යුතුය. මින් පසුව සඳහන් කළ ක්‍රමය අනුගමනය කරනු ලැබුවහොත් විමසුම නැවත ආරම්භ කර හිමිකම් කියන්නා ද කැඳවීමට සිදුවේ. එවිට, නිරවුල් කිරීමේ නිලධාරියාටද මේ සඳහා විශේෂයෙන්ම පැමිණීමට සිදු වේ. ඉන් පසු වෙනස් කළ ගිවිසුම දෙපක්ෂය විසින් නැවත අත්සන් කළ යුතු අතර නිරවුල් කිරීමේ නිලධාරි විසින් අළුත් වාර්තාවක් පිළියෙල කළ යුතුය. ඇතැම් විට, අනුමත කිරීමට ප්‍රථම මෙම වාර්තාව ඇටෝර්නි ජනරාල් විසින් අනුමත කළ යුතුය.

8.18. උදාහරණ : 2. හිමිකම් කියන්නවුන් කිහිපදෙනෙකුට 4 වන ඉඩම් කැබැල්ලෙන් හෙක්ටයාර් 491.3736 ක් (අක්කර 1214 පර්චස් 34 ක්) අඩු හෝ වැඩිව අයිති වන පරිදි හිමිකම් කියන්නන් හා නිරවුල් කිරීමේ නිලධාරි අතර ඇති කරගත් ගිවිසුමකට දෙපක්ෂයම අත්සන් තබන ලදැයි සිතමු. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ සිදුකරන නිරවුල් කිරීමේ නියෝගයක මාර්ගයෙන් එය පෞද්ගලික ඉඩමක් බව ප්‍රකාශ කිරීම සඳහා නිරවුල් කිරීමේ නිලධාරි එහි මායිම් ලකුණු කරන ලෙස මෙම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනු ඇත. මායිම් නියම කිරීමේ කටු සටහනේ ද මෙම ප්‍රදේශය 4 වැනි ඉඩම් කැබැල්ලට අයත් වී තිබෙන බව පෙන්නුම් කරයි. එහෙත් මායිම් ලකුණු කිරීමේ දී මිනින්දෝරුවරයා විසින් 4 වැනි හා 5 වැනි ඉඩම් කැබලි වලට අයත් පොදු මායිම සෘජු කිරීමට යෑමෙන් ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ රජයේ යැයි ප්‍රකාශිත 5 වැනි ඉඩම් කැබැල්ලේ කොටස් ද දැනට පෞද්ගලික යැයි ප්‍රකාශ කිරීමට තීරණය කර තිබෙන බිම් ප්‍රදේශයට ඇතුළත් වනු ඇත.

කලින් රජයේ යැයි ප්‍රකාශ කරනු ලැබූ 5 වන ඉඩම් කැබැල්ලේ කිසියම් කොටසක් පෞද්ගලික ඉඩමක් යැයි නියෝග කිරීමට නිරවුල් කිරීමේ නිලධාරියාට අවසරයක් නොමැති බැවින්, ඔහුට මෙම ලකුණු කිරීම භාර ගත නොහැකි වනු ඇත. තව ද, 4 වැනි ඉඩම් කැබැල්ලෙන්ම මෙම කොටස ලකුණු කළ යුතු බව පෙන්නුම් කරන ගිවිසුමේ වගන්ති වලට ඔහු නීත්‍යානුකූලව තරයේම බැඳී ඇත්තේය.

8.19. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ හෝ මුඩු බිම් ආඥාපනත යටතේ හෝ මායිම් ලකුණු කිරීමේ දී ඒ සඳහා නියම කර ඇති කරුණු තරයේ අකුරටම පිළිපැදිය යුතු බව ඉහත සඳහන් කළ උදාහරණ වලින් මොනවට පැහැදිලි වේ. මායිම් නියම කිරීමේ මැනුම් ඒ සඳහා නම් කරන ලද බිම් කැබලි තුළම පිහිටිය යුතුය. අත්සන් කර මුද්‍රා තබා , භාර දෙන ලද හිමිකම් පිඹුරක් හා රජයේ දීමනා ඔප්පුවක් සම්බන්ධයෙන් මෙන්ම මිනින්දෝරුවරයා හා ලැබුම්කරුවා අතර සාමදානයෙන් බෙරුම් කරගෙන හෝ නොගෙන මායිම් සම්බන්ධයෙන් පසුව කරන වෙනස් කිරීමක් හෝ වෙනත් ඉඩම් කැබලි වලින් කොටස් ඇතුලත් කිරීමක් හෝ පිළිගනු නොලැබේ. ක්ෂෙත්‍රයේ දී ඉතා පහසුවෙන් කළ හැකි යයි පෙනෙන්නට තිබෙන වෙනස් කිරීමක් නීතිය අනුව ක්‍රියාවේ යෙදවීම කළ නොහැකි වනු ඇත. එසේ නැත්නම් එය නීතිය අනුව ක්‍රියාවේ යෙදවීම ඉතා දුෂ්කර වනු ඇත.

8.20. එක් එක් ලංකා මැනුම් බිම් කැබැල්ලේ සම්පූර්ණත්වය එලෙසම පවත්වා ගත යුතුය. ලංකා මැනුම් බිම් කොටස් දෙකකට ඇතුළත් වන ඉඩම් කැබැල්ලකට එක එකෙහි වෙන වෙනම කැබලි අංක යෙදිය යුතුය. ග.පි. හි බිම් කැබලි ඒකාබද්ධ කර තුලනය කළ නොහැක.

8.21. ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉල්ලා සිටින කරුණු ඉටු කිරීමට නොහැකි වන යම් කිසි විශේෂ දුෂ්කරතාවයක් උද්ගත වී ඇත්නම් එය වාර්තා කළ යුතුය. ඒ පිළිබඳව උපදෙස් ලැබෙන තුරු මායිම් ලකුණු කිරීම ප්‍රමාද කළ යුතුය. මෙම මැනුම ගිවිසුමේ සඳහන් පරිදි සාධාරණ අන්දමින් හා පිහිටීම අනුව කරගෙන යෑමට නොහැකි නම් විමසුම නැවත ආරම්භ කිරීමට අවශ්‍ය වන කටයුතු සූදානම් කිරීමටත්, මේ සම්බන්ධයෙන් අවශ්‍ය වන සංශෝධන කිරීමටත් අවශ්‍ය විධිවිධාන නිරවුල් කිරීමේ නිලධාරි විසින් යෙදිය යුතුය. හිමිකම් කියන්නවුන්ගේ පසු අදහස් අනුව හෝ මිනින්දෝරුවරුන්ගේ යෝජනා අනුව හෝ මැනුම් වෙනස් කිරීමට නිරවුල් කිරීමේ නිලධාරිට එකඟවිය නොහැකිය.

දළ සටහන් සහ නිරවුල් කිරීමේ නිලධාරියාගේ මායිම් නියම කිරීමේ නියමයන් අතර ඇති විෂමතා ගැන අවශ්‍ය නම් ප්‍රධාන කාර්යාලයෙන් විමසා බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත දන්වා යැවිය යුතුය.

අයුතු ලෙස අල්ලා ගැනීම්

8.22. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ නිරවුල් කරන ලද ඉඩම් හා එම ආඥා පනතට පිටස්තරව විකුණන්නට අදහස් කර ඇති ඉඩම් අයුතු ලෙස අල්ලා ගෙන ඇත්නම් එම ඉඩම්වල ආසන්නතම බිම් ප්‍රමාණය, ඒවායෙහි තිබෙන වැවිලිවල වයස හා අයුතු ලෙස අල්ලා ගත් අයවලුන්ගේ නම් ආදී සම්පූර්ණ විස්තර සෑම විටම නිරවුල් කිරීමේ නිලධාරියාට වාර්තා කර යවා ඒවා මැනීම පිළිබඳ උපදෙස් ඔහුගෙන් ලබා ගත යුතුය.

වෙනත් ප්‍රදේශ වල තිබෙන සියළුම අයුතු අල්ලා ගැනීම් **9.90 - 9.99 ඡේදයන්හි** නියම කර ඇති අන්දමට මැනිය යුතුය.

වෙන්කල බිම් ලකුණු කිරීම

8.23. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ නිරවුල් කරන ලද ඉඩම්වල හෝ රජය විසින් අයිතිවාසිකම් නොකියන ලදැයි ප්‍රකාශිත ඉඩම් වල වෙන් කල බිම්, දැනට තිබෙන බිම් ප්‍රමාණය අනුව මිස නිරවුල් කිරීමට හෝ රජය විසින් අයිතිවාසිකම් නොකියන ලදැයි ප්‍රකාශිත කිරීමට තිබෙන බිම් ප්‍රමාණය අඩුවන පරිදි මැනීම හෝ ලකුණු කිරීම නොකළ යුතුය. කෙසේ වුවද දළ සටහනෙහි වෙන්කල බිම් පෙන්නුම් කර නොමැති විට වෙන් කල බිම් ලකුණු කිරීම සඳහා ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිගේ අනුමැතිය ලබා ගත යුතුය.

8.24. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතට පිටස්තරව විකිණීමට අදහස් කරන ඉඩම් වලට යාව තිබෙන ඇළවල් වලට සෑම විටම සම්මත වෙන් කළ බිම් ලකුණු කළ යුතුය. මේ සඳහා ඉතිරි බිම් පෙදෙසක්

නොමැති නම් නිරවුල් කිරීමේ නිලධාරියාගෙන් නොවිමසාම විකිණීමට තිබෙන ප්‍රමාණය අඩු කළ හැකිය. යම් හෙයකින් ඉතිරි වන බිම් පෙදෙසක් ඇත්නම් විකිණීමට අදහස් කරන ඉඩම මැනිය යුත්තේ කවර ස්ථානයෙන් ද යන්න නිරවුල් කිරීමේ නිලධාරියාගෙන් විමසිය යුතුය.

8.25. අයුතු අල්ලා ගැනීම් මනින විට යාව තිබෙන ඇළවල් සඳහා සම්මත වෙන් කළ බිම් ලකුණු කළ යුතුය.

පිඹුරු වැඩ

8.26. පෙර කාලයේ මායිම් නියම කිරීමේ මැනුම් ලංකා මැනුම් ක්ෂෙත්‍ර පත්වල ක්ෂෙත්‍රයේ දීම අඳින ලද අතර ඒවා මුල් ලංකා මැනුම් පිඹුරු සකස් කළ නියමිත පිළිවෙලටම අඳින ලදී. බිම් කැබලි අංක යෙදීමේ ක්‍රමය සඳහා **12.43 – 12.46 ඡේදයන්** බලන්න. වර්තමානයේ මායිම් නියම කිරීමේ මැනුම් වල පිඹුරු සකස් කිරීම සඳහා වෙනම A3 ක්ෂෙත්‍ර පත් භාවිතා කළ යුතුය.

8.27. මුල් ලංකා මැනුම් ඉඩම් විස්තර ලැයිස්තුවල දක්නට ලැබෙන පරිදිම ග්‍රාම නිලධාරිගේ නම A3 ප්‍රමාණයේ පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කළ යුතුය. කලින් භාවිතා කරන ලද ඉඩම් විස්තර ලැයිස්තු පෝරම 242 වර්තමානයේ භාවිතා කරනු නොලැබේ.

8.28. මායිම් නියම කිරීමේ මැනුම් කරන ලද කාලය තුල ලැබෙන මැනුම් ඉල්ලීම් A3 ප්‍රමාණයේ ක්ෂෙත්‍ර පත්‍ර වල අඳින අතර (පැරණි දම්වැල් පරිමාණයේ ලංකා මැනුම් පත්‍ර මත නොවේ) පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු A3 ප්‍රමාණයේ ඉඩම් විස්තර ලැයිස්තු වල පිළියෙල කරනු ලැබේ.

8.29. පසුව කරන මැනුම් වලදී මුල් ලංකා මැනුමේ කොටසක් සාවද්‍ය බව පෙනී ගිය හොත් හෝ ලංකා මැනුම් පත්‍රයේ කොටස් උවමනාවට වඩා තදබද වී ඇඳ ඇත්නම් හෝ නරක් වී ඇත්නම් ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා සවිස්තර වාර්තාවක් ප්‍රධාන කාර්යාලයට වහාම යැවිය යුතුය.

8.30. බිම් කැබැල්ලක් වැරදිව ඇඳ තිබෙන බව හෝ සම්පූර්ණ නොකර තිබෙන බව හෝ පෙනී ගිය හොත් ඒ බව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සවිස්තරව ප්‍රධාන කාර්යාලයට වාර්තා කළ යුතුය. ඔහුගේ අභිමතය පරිදි මෙම වැරදි නිවැරදි කරගත යුතු හොඳම ක්‍රමය සඳහන් කර එය පැහැදිලි කිරීමේ අනුරේඛනයක්ද සමඟ යැවිය යුතුය. එවිට නිරවුල් කිරීමේ නිලධාරි හා සාකච්ඡා කර එම වරද නිවැරදි කිරීම සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කරනු ලැබේ.

පිඹුරු පරීක්ෂා කිරීම

8.31. සම්පූර්ණ කරන ලද එක් එක් මැනුම සමඟ වාර්තාවක් ද යැවිය යුතුය.

8.32. නිරවුල් කිරීමේ නිලධාරිගේ මැනීමේ ඉල්ලීම හා අනෙකුත් මැනීමේ ඉල්ලීම් පිටසන් කර පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුව හා සර්වේයර් ජනරාල්ගේ ගම් පිඹුරු පිටපතද සමඟ ප්‍රධාන කාර්යාලයට ආපසු යැවිය යුතුය.

8.33. මායිම් නියම කිරීමේ මැනුම් පරීක්ෂා කර බැලීමේ දී ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරින්, මිනින්දෝරු අධිකාරින් හා මිනින්දෝරුවරුන් විසින් පහත සඳහන් දේ සම්පූර්ණ කර ඇද්දැයි සොයා බැලිය යුතුය.

i. නිරවුල් කිරීමේ නිලධාරිගේ අවශ්‍යතාවයන් ඉටු කර ඇද්ද යන වග,
ii. බිම් ප්‍රමාණ ආගණනය නිවැරදිව අනුකූලනය කර ඇද්ද යන වග,
iii. පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුව නිවැරදිව ලියා ඇද්ද යන වග,
iv. අළුත් හා පරණ මැනුම් ගැන ඒවා එකිනෙකහි සඳහන් කර තිබේ ද යන වග,

v. ඉඩම් විස්තර ලැයිස්තු සංශෝධනය කර තිබේද යන වග, හා
vi. ලේඛන වල හා රේඛා චිත්‍ර වල මැනීමේ නියමයන් අවලංගු කර තිබේ ද යන වග.

ලේඛන සංශෝධනය කිරීම

8.34. මුල් ලංකා මැනුම් පිඹුරකින්, මායිම් අක්ෂර හෝ ඉලක්කම් මකා නොදැමිය යුතුය. ඒවා සංශෝධනය කළ යුතු නම් ඒවා හරහා පැහැදිලිව ඉරක් ඇඳ කපා දැමිය යුතුය. එසේ නැත්නම් යා ලකුණු යොදා සංශෝධනය කළ යුතුය.
ලංකා මැනුම් පිඹුරේ හෝ ක්ෂෙත්‍ර පොතේ ඇති හැම දෝෂයක් ගැනම අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිට යොමු කළ යුතුය.

ඉඩම් විස්තර ලැයිස්තු සංශෝධනය කිරීම සඳහා නිරවුල් කිරීමේ නිලධාරිගේ ඉල්ලීම් ක්‍රියාත්මක කරනුයේ, ඒවා ගැන ක්ෂෙත්‍රයේදී විමර්ශනය කිරීමෙන් හා අවශ්‍ය අවස්ථාවන්හී දී ක්ෂෙත්‍ර පොත් සංශෝධන කිරීමෙන් අනතුරුවය. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට ඒ පිළිබඳ දැන්වීම් ලැබී සති දෙකක් ඇතුළත ක්ෂෙත්‍ර විමර්ශනය කළ යුතුය. මෙම කටයුතු සඳහා සාමාන්‍ය ක්ෂෙත්‍ර පරීක්ෂණයක් හා බිම් කැබලි වල පිහිටීම සෙවීම ප්‍රමාණවත්ය. මායිම් නැවත විවෘත කිරීමක් අවශ්‍ය නොවේ.

8.35. අළුත් මැනුමක් සම්බන්ධයෙන් මායිම්ගල් පොදු ගම් මායිමක යෙදූ විට ඒවා ලංකා මැනුම් ක්ෂෙත්‍ර පත්‍රයේ පෙන්නුම් කර යාබදව පිහිටි ගම් වලට අයත් ගම් පිඹුරු හෝ අවසාන ගම් පිඹුරු වල පිටපත් සංශෝධනය කිරීම සඳහා එහි අනුරේඛන ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

පිරිවැය බිල් සකස් කිරීම

8.36. යම් කිසි මැනුමක් සම්බන්ධයෙන් ගිය වියදම් පිළියෙල කිරීමට අවශ්‍ය වන විශේෂ අවස්ථාවන් හී දී ඒ සඳහා වන පිරිවැය බිල්පත්‍රය පිළියෙල කිරීම, සර්වේයර් ජනරාල් විසින් මේ සම්බන්ධව කාලීනව නිකුත් කරන ලද චක්‍රලේඛ වල සඳහන් උපදෙස් අනුව සිදු කළ යුතුය.

8.37. පිරිවැය බිල්පත්‍රයේ සඳහන් කර තිබෙන එක් එක් කරුණ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ප්‍රවේශමෙන් පරීක්ෂා කර බලා, කරන ලද වැඩ ප්‍රමාණය අනුව ගාස්තු ඇතුළත් කර ඇද්ද යන වග සොයා බැලිය යුතුය. එසේම පෝරමයේ සඳහන් කර තිබෙන විශේෂ මැනුම සඳහා දරන්නට සිදු වූ සැබෑ වියදම් පමණක් ඇතුලත් වන පරිදි මිනින්දෝරු තැන විසින් බිල් පත්‍රය ප්‍රවේශමෙන් පිළියෙල කර තිබේද යන වගත් සොයා බැලිය යුතුය.

ඉ.නි. ආඥාපනත යටතේ වගන්ති

8.38. මායිම් නියම කිරීමේ මැනුම් නියෝගයක දැක්වෙන ඇතැම් පාඨ මෙහි පහත විග්‍රහ කර පෙන්වනු ලැබේ.

(අ) ඉ.නි. ආඥාපනත (L.S.O.) යටතේ නිරවුල් කරන ලදී.

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 5 (4) ඈ) ඡේදයේ විධි විධාන අනුව පෞද්ගලික පක්ෂයක් හෝ පක්ෂ සමඟ එකඟ වී හිමිකමක් නිරවුල් කිරීමෙන්, මුදලක් ගෙවීමෙන් හෝ නොගෙවීමෙන් හෝ කෙනෙක් හෝ කීපදෙනෙක් හෝ යම්කිසි ඉඩමකට හිමිකම් කියන්නන් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(ආ) ඉ.නි. ආඥාපනත (L.S.O.) යටතේ පිටස්තරව විකුණන ලදී.

රජයට කැමැත්තක් කළ හැකි ඉඩමක් සම්බන්ධයෙන් රජයට අයත් හිමිකම් ,ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ විධිවිධාන වලට පිටස්තරව විකිණීම.

(ඇ) රජය විසින් හිමිකම් නොකියන ලදැයි ප්‍රකාශිත

ඉඩමකට රජයේ අයිතිවාසිකම් නොමැති බව කියා සිටින්නා වූ ද ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 5(4) (අ) ඡේදය යටතේ කරන ලද්දා වූ ද ප්‍රකාශය. මෙයින් හිමිකම් කිසියම් විශේෂ පක්ෂයක් මත නොපැවරේ.

(ඈ) ඉ.නි. ආඥාපනත (L.S.O.) කටයුතු කරගෙන යන්නක් නොවීම

ඉඩම් නිරවුල් කිරීමේ දැන්වීමක සඳහන් කර තිබෙන ඉඩමක් ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ විධිවිධාන වලින් බැහැර කෙරෙන ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 5(7) වැනි වගන්ති යටතේ කරන ප්‍රකාශය.

ප්‍රගති වාර්තා

8.39. ප්‍රගති වාර්තා ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි පිළියෙළ කළ යුතුය. රේඛා චිත්‍ර පවත්වාගෙන යාමට අවශ්‍ය නැත. මිනින්දෝරුවරුන් විසින් ඔවුන්ගේ වාර්තා ඊළඟ මාසයේ පළමු වැනි දින වන විට මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය. මිනින්දෝරු අධිකාරි විසින් මාසයේ 5 වැනි දින වන විට මැනුම් කණ්ඩායම වෙනුවෙන් ඔහුගේ වාර්තාව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිට යැවිය යුතුය.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ඔහුගේ කොට්ඨාශය වෙනුවෙන් එවැනිම වාර්තාවක් මාසයේ 10 වන දින වන විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (ඉ.තො.ප.) වෙත පිටපතක් සහිතව පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට යැවිය යුතුය.

මිනින්දෝරු අධිකාරින් විසින් ඇමුණුම 02 හි පෙන්වා ඇති පරිදි ලේඛනයක් ද පවත්වා ගෙන යා යුතුය.

8.40. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහතික කරන ලද පිඹුරු පිටපත්, පරිපූරක ඉ.වි.ලැ. සමඟ සම්පූර්ණ වාර්තාවක් නිරවුල් කිරීමේ නිලධාරියා වෙත යැවිය යුතුය.
සර්වේයර් ජනරාල්ගේ පිඹුරු පිටපත් හා ඉ.වි.ලැ. පිටපත් සමඟ මැනුම් ඉල්ලීමේ පිටපත්, වැදගත් ලිපි හා වාර්තා සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය වෙත යැවිය යුතුය.

8.39 ජේදය ඇමුණුම 01

මායිම් නියම කිරීමේ මැනුම්

සිල්වා මහතාගේ 2007 වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව

මාසය	ග්‍රා පිහුරු අංකය	පළාත	ශේෂ ප්‍රදේශ, ප්‍රවේශ මාර්ග වෙත් කළ බිම් හා අසුනු අල්ලා ගැනීම් හැර නිවැල් කිරීමට භාජනා කර නිමවා බිම් කැබලි ගණන					කිවුසුනු කරුණු
			නි.නි.ගේ මැමේ පත්‍රයේ නිමවා මුල් බිම් කැබලි ගණන	මාසය තුළ මනින ලද බිම් කැබලි ගණන	ප්‍රමාණය (අක්කර)	මාසය තුළ නිම කරන පිහුරු වැඩ	කවමත් මැනීමට නොහැකි වූ බිම් කැබලි ගණන	
2007 ජනවාරි	2996	වයඹ	249	40	25	–	59	
	3025	"	85	–	–	28	–	
පෙබරවාරි	2996	"	249	40	28	–	18	
	3025	"	86	–	–	30	–	
	2991	"	76	–	–	–	–	භූමියේ දී පරීක්ෂා කර බලා අසුනු අල්ලා ගැනීම හා විරුද්ධවාදීකම් නි.නිලයාරියාට වාර්තා කරන ලදි.
මාර්තු	2996	"	249	19	30	60	–	දින 5 ක අසනීප නිවාඩු.
	2991	"	76	–	–	–	–	

සංක්ෂේපය:-

මෙම පෙරමය මිනින්දෝරුවරුන් හා මිනින්දෝරු අධිකාරීන් විසින් ප්‍රයෝජනයට ගත යුතුය. මිනින්දෝරුවරුයා විසින් තමාගේ නම හා වර්ෂය පෙරමයේ ශීර්ෂයෙහි වාර්ෂය මෙහි පළමුවැනි තීරුවෙහි සඳහන් කළ යුතුය.
මිනින්දෝරු අධිකාරි විසින් කෂ්ඨායම හා මාසය ශීර්ෂයෙහි ද මිනින්දෝරුවරුන්ගේ නම පළමුවැනි තොටුවෙහි ඇතුළත් කළ යුතුය.
සංශෝධනය සඳහා ලැබුණු මැනුම් ඉල්ලීම් උපලේඛනයේ රහු පාවිච්චි කරන්නේ කළ යුතුය.

මායිම් නියම කිරීමේ මැනුම් සඳහා වූ මැනුම් ඉල්ලීම් ලේඛනය								
නිරවුල් කිරීමේ නිලධාරීගේ අංකය හා දිනය	බිම් ප්‍රමාණය අක්ෂර වලින්	ල.ම.ගැ.ගි.අංකය	කෝරළය	දි.මැ.කා. වෙතින් ලැබුණු දිනය	නිකුත් කළා		සිඹුරු අනුමත කර දි.මැ.කා. හා ස.ප.කා. වෙත යැවීම	කිවයුතු කරුණු
					දිනය	කාටද		

ශුද්ධි පත්‍රය

9 වැනි පරිච්ඡේදය

විස්තර මැනීම

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	මායිම් එලි කිරීමේ කටයුතු	
9.1.	මායිම් එලි කිරීමේදි වගාවන්ට හානියක් නොවන ලෙස කටයුතු කිරීම	1
9.2.	රජයේ ඉඩම් වල මායිම් එළිකිරීම	1
9.3.	ආගමික ගොඩනැගිලි හා නටඹුන් තිබෙන ස්ථාන මැනීම	1
9.4.	පුරාවිද්‍යා නෂ්ඨාවශේෂ හෝ ගල් ගොඩවල් කුඤ්ඤ ලෙස භාවිතා කිරීමෙන් වැලකීම	1
9.5.	එළිකිරීමේ දළ සැලැස්මක් සැකසීම	1
9.6.	අනවශ්‍ය එළිකිරීම් වලින් වැලකීම	1
	ග්‍රාම නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම	
9.7.	ග්‍රාම නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම සහ ඔවුනට අයත් රාජකාරි	1
9.8.	ගම් වලට අදාල ග්‍රාම නිලධාරීන්ගේ ලැයිස්තුවක් ලබා ගැනීම	1
9.9.	මායිම් හා ඒවා ලකුණු කිරීමට යොදා ඇති මායිම්ගල් පෙන්වා දීම	1
9.10.	ග්‍රාම නිලධාරීන්ට දන්වා යැවීමට මැනුම් 70 පෝර්මය භාවිතා කිරීම	2
9.11.	මැනුම් 70 පෝර්මයේ එක් මැනුමකට වඩා සඳහන් කර ඇති විට	2
9.12.	මායිම් පෙන්වා දීම සඳහා වෙනත් අයට දන්වා යැවීම	2
9.13.	ප්‍රාදේශීය ලේකම්වරුන්ට මැනුම් සම්බන්ධයෙන් දැන්වීම	2
9.14.	ආදායම් මායිම් වල වෙනස්කම් ඇති විට කටයුතු කිරීම	2
	ග්‍රාම නිලධාරීන්ගෙන් හා වෙනත් අයගෙන් ලබාගත් තොරතුරු	
9.15.	ඉඩම් පිලිබඳ නිවැරදි තොරතුරු ලබාගැනීම	2
9.16.	ඉඩම් සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු හාර නොගැනීම	2
9.17.	ක්ෂේත්‍ර පොතේ තොරතුරු සටහන් කිරීම	2
9.18.	වැදගත් තොරතුරු සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය	3
9.19.	මායිම් නියම කිරීමේ මැනුම් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය	3
	මැනුමක් සම්බන්ධයෙන් දක්වන විරෝධතා	
9.20.	මැනුමක් සම්බන්ධයෙන් දැනුම් දීම	3
9.21.	මැනුමක් කිරීමේදී විරෝධතාවය දක්වන විට ක්‍රියා කළ යුතු ආකාරය	3
9.22.	අත්කර ගැනීමේ මැනුමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය	3
9.23.	වැරදි ක්‍රියා හෝ විෂමාචාරවලින් වැලකීම	3
	මායිම්ගල් සිටුවීම	
9.24.	මායිම්ගල් සිටුවීම	4
9.25.	අළුත් මායිම් වල මායිම්ගල් සිටුවීම	4
9.26.	පැරණි මායිම් වල මායිම්ගල් සිටුවීම	4
9.27.	පරික්‍රමණයක් මඟින් මායිම්ගල් මැනීම	4
9.28.	භූමියේ පැහැදිලිව ලකුණු කර නොමැති මායිම් පිහිටුවීම	4
9.29.	මායිම්ගල් දෙකක් අතර පරතරය	4
9.30.	කැලෑ ,ඝේන් හෝ පතන අතර මායිම් වල මායිම්ගල් සිටුවීම	4
9.31.	මායිම්ගල් එකිනෙකට පෙනෙන්නට සිටුවීම	4
9.32.	මායිම්ගල් සිටුවීම අවශ්‍ය නොවන මායිම්	4
9.33.	කුඹුරු හා වතු මායිම් වල මායිම්ගල් සිටුවීම	4
9.34.	ගම් මායිම් හා වෙනත් ආදායම් මායිම් වල මායිම්ගල් සිටුවීම	4
9.35.	මායිම්ගල් සිටුවීමට පෙර මායිම් සෘජුව සකස් කිරීම	4

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
9.36.	මායිම්ගල් සුරක්ෂිතව වැලලීම	5
9.37.	මායිම්ගල් පිහිටුවිය නොහැකි භූමියක මායිම් ලකුණු කිරීම	5
9.38.	ගොඩනැගිල්ල හරහා වන මායිමක් ලකුණු කිරීම	5
9.39.	අනුලම්භ ගැනීම හෝ පූර්ණමානයෙන් හෝ විස්තර මැනීම	5
9.40.	විස්තර මැනීමේ නිරවද්‍යතාව	5
9.41.	අවිනිශ්චිත ලක්ෂණ වලින් යුත් මායිම් නිරීක්ෂණය කිරීම	5
9.42.	අනුලම්භ ගැනීමේ නිරවද්‍යතාව	5
9.43.	විකෝණමානයෙන් අනුලම්භ ගැනීම	5
9.44.	මායිම් විස්තර මැනීම	6
9.45.	ඇළ මායිම් අනුලම්භ ගණනය කිරීම	6
9.46.	මාර්ග සහ අඩි පාරවල් මැනීම	6
9.47.	මාර්ග සහ අඩි පාරවල් සඳහා නිශ්චිත මායිම් නොමැති විට මැනීම	6
9.48.	නියර සහ කණ්ඩි මැනීම	6
9.49.	ඇළ සහ ගංගා මැනීම	6
9.50.	හුදකලාව තිබෙන ඇළවල් මැනීම	6
9.51.	දුම්රිය මාර්ග මැනීම	6
9.52.	අනුම්භ ගැනීම පිළිබඳ වැඩිදුර උපදෙස්	6
	ගොඩනැගිලි	
9.53.	මැනුම් වලදී ගොඩනැගිලි මැනීම	6
	පැරණි මායිම් අධිස්ථාපනය කිරීම	
9.54.	පැරණි මායිම් අධිස්ථාපනය කිරීම	7
9.55.	පැරණි පිඹුරු සඳහා අධිස්ථාපනය	7
9.56.	පැරණි පිඹුරු හෝ ක්ෂෙත්‍ර පත් හෝ සොයා ගත නොහැකි විශේෂ අවස්ථා වලදී ක්‍රියා කළ යුතු ආකාරය	7
9.57.	අධිස්ථාපනය සඳහා අනුරේඛන පිළියෙල කිරීම	7
9.58.	විශාල ප්‍රමාණයක නැවත ලකුණු කිරීම් ඇතිවිට අධිස්ථාපනය සඳහා ක්‍රමවේදය	7
9.59.	හිමිකම් පිඹුරු ආදිය අධිස්ථාපනය කිරීමේ නිරවද්‍යතාවය	7
9.60.	නිර්දිෂ්ටයන් තෝරා ගැනීමේදි සැලකිය යුතු කරුණු	7
9.61.	අධිස්ථාපන අනුරේඛන පිළියෙල කිරීම	8
9.62.	නිරාපද බිම් කොටස්	8
9.63.	නිරාපද බිම් කොටස් සඳහා අවසර ලබා ගැනීම	8
9.64.	නිරාපද රේඛාව ඇදීම	8
9.65.	නිරාපද බිම් කොටස තුල බිම්කැබලි අංක යෙදීම	8
9.66.	අධිස්ථාපනයක් කළ නොහැකි විට උපදෙස් ලබා ගැනීම	8
9.67.	අධිස්ථාපනයන් වර්ග කිරීම	8
9.68.	සියළුම අධිස්ථාපනයන්ගේ නිරවද්‍යතාවය	8
9.69.	අධිස්ථාපිත මායිමක් භූමියෙහි ලකුණු කිරීම	8
9.70.	හිමිකම් පිඹුරක හෝ රේඛා චිත්‍රයක හෝ අධිස්ථාපිත පිහිටීම හා ස්ථිර මායිම	8
9.71.	මාර්ග තුල ඇති වැවිලි මැනීම	9
9.72.	හිමිකම් පිඹුරක හෝ රේඛා චිත්‍රයක මායිමේ හෝ මායිම් ඇතුලත හෝ පිහිටි ඇළක් අළුතෙන් මැනීම	9
9.73.	පැරණි ඇළ මායිම් යොදා ගැනීම	9
9.74.	හිමිකම් පිඹුරක හෝ රේඛා චිත්‍රයක හෝ මායිමක් දිගේ හෝ ඒවා හරහා හෝ පාරක් වැටී තිබෙන විට පැරණි පාරට වඩා අළුත් පාර වෙනස් වීම	9
9.75.	හිමිකම් පිඹුරකින් හෝ රේඛා චිත්‍රයකින් හෝ මාර්ගයක නිශ්චිත කොටසක් ආවරණය වී ඇති විට කැබලි අංක යෙදීම	9
9.76.	මාර්ග කොන්ත්‍රාත්තු පිඹුරු වල පෙන්වා ඇති මාර්ග වල මායිම්	9
9.77.	මාර්ග කොන්ත්‍රාත්තු පිඹුරු වලට යොමු සටහන් කිරීම	9
9.78.	මාර්ග කොන්ත්‍රාත්තු මැනුම් කෑෂ්ඤ වලට අළුත් මැනුම් සම්බන්ධ කිරීම	9

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
9.79.	මාර්ග කොන්ත්‍රාත්තු පිඹුරු වල තිබී සොයාගනු ලබන වැරදි සම්බන්ධයෙන් කටයුතු කිරීම	9
9.80.	දුම්රිය දෙපාර්තමේන්තුවට ඉඩම් අත්කර ගැනීමේ මුල් පිඹුරු වලට අයත් මායිම සම්බන්ධයෙන් කටයුතු කිරීම	9
	පැරණි මායිම් භූමියෙහි ලකුණු කිරීම	
9.81.	පැරණි මායිම් භූමියෙහි ලකුණු කිරීම	9
9.82.	භූමියේ ලකුණු කරන ලද මායිම්ගල් මැනීම	9
9.83.	බෑවුම් රේඛා වලදී අනුගමනය කළ යුතු ක්‍රමවේදයන්	10
9.84.	පරිමාණය කරගත් මායිම් සහ භූමියේ පෙනෙන්නට තිබෙන මායිම් අතර වෙනස	10
9.85.	කුඤ්ඤයක් වෙනුවට මායිම්ගලක් වැලලීමේදී එයට අදාළ වන මැනුම් රේඛා නැවත මැනීම	10
9.86.	නැතිවූ හෝ කැඩුණු මායිම්ගල් වෙනුවට අළුත් මායිම්ගල් නැවත පිහිටුවීම	10
9.87.	පැරණි මායිම්ගල් භූමියේ ඇත්දැයි පරීක්ෂා කර බැලීම	10
	අළුත් මායිම් භූමියෙහි ලකුණු කිරීම	
9.88.	අළුත් මායිම් භූමියේ ලකුණු කිරීම	10
9.89.	අළුත් මැනුම් වල මායිම් පැහැදිලිව භූමියේ ලකුණු කිරීම	10
	අයුතු ලෙස අල්ලා ගැනීම්	
9.90.	අයුතු ලෙස අල්ලා ගැනීම් සලකුණු කිරීම	10
9.91.	අයුතු ලෙස අල්ලා ගැනීම් සම්බන්ධයෙන් තීරණය කිරීම	10
9.92.	අයුතු අල්ලා ගැනීම කුඩා ඉඩම් කොටස් වූ විට කටයුතු කිරීම	10
9.93.	වටිනා ඉඩම්වල කුඩා අයුතු ලෙස අල්ලාගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	11
9.94.	මාර්ග සහ අතුරු මාර්ග වලට අයත් පැරණි වෙන්කළ ඉඩම් ඇතුලත පිහිටි අයුතු ලෙස අල්ලා ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	11
9.95.	ඇළවල් වලට අයත් වෙන්කළ ඉඩම් ඇතුලත පිහිටි අයුතු ලෙස අල්ලා ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	11
9.96.	ඕනෑම මැනුමකට ආසන්නයේ ඇති අයුතු ලෙස අල්ලා ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	11
9.97.	අයුතු ලෙස අල්ලා ගැනීම් වල මායිම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම	11
9.98.	මායිම්ගල් එහා මෙහා කර ඇති විට ක්‍රියා කිරීම	11
9.99.	අයුතු ලෙස අල්ලා ගැනීම් වල වගාවන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම	11
9.100.	මායිම් නියම කිරීමේ මැනුම් තුල ඇති අයුතු ලෙස අල්ලා ගැනීම් සම්බන්ධයෙන් උපදෙස්	11
	ඇමුණුම්	
ඇමුණුම 01	මායිම් පෙන්වා දීම සඳහා වෙනත් අයට දන්වා යැවීමේ ලිපියක ආකෘතිය	12
ඇමුණුම 02	හිමිකම් පිඹුරක හෝ රේඛා චිත්‍රයක මායිමේ හෝ මායිම් ඇතුලත හෝ පිහිටි ඇළක් අළුතෙන් මැනීම	13
ඇමුණුම 03	හිමිකම් පිඹුරකින් හෝ රේඛා චිත්‍රයකින් හෝ මාර්ගයක නිශ්චිත කොටසක් ආවරණය වී ඇති විට කැබලි අංක යෙදීම	14

9 වැනි පරිච්ඡේදය

විස්තර මැනීම

මායිම් එළි කිරීමේ කටයුතු

9.1. වැවිලි අයිතිකරුවන් ගෙන් කලින් අවසර ලබා ගෙන නොතිබෙන විට මැනුම් ක්ෂෙත්‍ර සහායකයින් විසින් මායිම් එළි කිරීමේදි වැවිලි වලට හානියක් නොකරන බවට මිනින්දෝරුවන් වග බලා ගත යුතුය. හානියක් සිදු වූ විට එහි ස්වභාවය හා එහි තක්සේරු කළ වටිනාකම ද වහාම තම මිනින්දෝරු අධිකාරි මඟින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙතට ලිඛිතව දන්වා යැවිය යුතුය.

9.2. රජයේ ඉඩම් වල එළි කිරීමේ කටයුතු කරගෙන යාමේදී වටිනා ගස් කපා දැමීමට සිදු වන විට ඒ බව වහාම ප්‍රාදේශිය වන නිලධාරිට හා බීට්ටු වන නිලධාරිට ද දැන්විය යුතුය.

9.3. ආගමික ගොඩනැගිලි හා නටඹුන් තිබෙන ස්ථාන මැනීමේදි මිනින්දෝරුවරයා බෙහෙවින්ම ආරක්ෂාකාරී විය යුතු අතර එවැනි ගොඩනැගිලි හා භූමි තුල කිසිදු සලකුණක් නොයෙදීමටත්, මායිම්ගල් නොසිටුවීමටත් වග බලා ගත යුතුය. මෙවැනි ස්ථාන මැනීමට පෙර සෑම විටම එම ස්ථාන අයත් බලධාරීන්ගෙන් අවසර ලබාගත යුතුය.

9.4. පුරාවිද්‍යා නෂ්ඨාවශේෂ වලට අයත් ගල්, ගඩොල් හා ගල් ගොඩවල් කුඤ්ඤ වශයෙන් ප්‍රයෝජනයට නොගත යුතුය.

9.5. එක් එක් දිනයට අයත් එළි කිරීමේ කටයුතු අවසන් වූ විට එළි කරන ලද ප්‍රදේශය හා සොයාගන්නා ලද පැරණි සලකුණු පෙන්වන කටු සටහනක් ප්‍රධාන මැනුම් ක්ෂෙත්‍ර සහායක විසින් ඉදිරිපත් කළ යුතුය. එවිට මැනුම පටන් ගැනිමට ප්‍රථම, අළුත් මැනුමෙහි පැරණි මැනුම් වලට ඇති සම්බන්ධතා නිශ්චය කිරීමටත්, සෑහෙන පමණ යා කිරීම් තිබේද යන වග හා අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ඉඩම කොටස් කර ඇත්ද යන්න මිනින්දෝරුවරයාට තීරණය කර ගත හැකිය.

9.6. යම්කිසි බිම් කැබැල්ලක් අනුබෙදුම් කිරීමේදී භූමියේ පවත්නා මායිම් හැකිතරම් දුරට ඒ ආකාරයෙන් පවත්වා ගැනීමට උත්සාහ කළ යුතුය. මේ මඟින් අනවශ්‍ය එළි කිරීම් හා එළි කළ මැනුම් රේඛා හා මායිම් අතර ඇතිවන දෝෂ මග හරවා ගත හැකිය.

ග්‍රාම නිලධාරින්ගේ සේවය ලබා ගැනීම

9.7. මායිම් පෙන්වා දීමට, ඉඩම් වල නම් හා හිමිකම් කියා සිටින්නන්ගේ නම් සපයා දීමට සහ එළි කිරීමේදී හා මැනීමේදී අවශ්‍ය වන වෙනත් තොරතුරු සපයා ගැනීමට හෝ මැනීමට අදාළ දැනුවත් කිරීම් සඳහා ග්‍රාම නිලධාරිවරයෙකු ගේ සේවය ලබා ගත යුතුය.

9.8. නොයෙකුත් ගම්වල කරන මැනුම් කටයුතු වලට සහාය වීමට පත්කරන ලද ග්‍රාම නිලධාරි ඇතුළු නම් කරන ලද වෙනත් නිලධාරින්ගේ නම, වසම, දුරකථන අංකය ආදී තොරතුරු ප්‍රාදේශීය ලේකම් විසින් මැනුම් ඉල්ලීමේ සඳහන් කළයුතුය.

9.9. මැනීමෙන් පසු මායිම් හා ඒවා ලකුණු කිරීමට යොදා ඇති මායිම්ගල්, හිමිකම් කියන්නන්ට හා ග්‍රාම නිලධාරින්ට ද පෙන්වා දිය යුතුය. මෙම මායිම්ගල්, ගම් මායිමක යොදා ඇත්නම් එම මායිම දෙපැත්තේ තිබෙන ගම් දෙකෙහිම ග්‍රාම නිලධාරින්ට පෙන්වා දිය යුතුය.
එසේ පෙන්වා දෙන ලද මායිම්ගල් පසු අවස්ථාවක ගලවා දැමීමට සිදු වුවහොත්, ග්‍රාම නිලධාරි දැන්වීම් පෝරමයේ ඒ ගැන සටහනක් කළ යුතු අතර එයට ග්‍රාම නිලධාරි ගේ අත්සනද ලබා ගත යුතුය.

9.10. මැනුම් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරිට දන්වා යැවිය යුත්තේ මැනුම් 70 වැනි පෝර්මය මඟිනි. මැනුම අවසන් කළ පසු ග්‍රාම නිලධාරිගේ අත්සන ගැනීමට ප්‍රථම පෝරමයේ සඳහන් කර තිබෙන වගන්ති/ තොරතුරු සම්පූර්ණ කළ යුතුය. ග්‍රාම නිලධාරිගේ අත්සන ඉදිරියෙන් ග්‍රාම නිලධාරි කොට්ඨාශ අංකය ද සඳහන් කළ යුතුය. සම්පූර්ණ කරන ලද පෝරමය මැනුම් ගොනුවට අමුණා යැවිය යුතුය.

9.11. එක් මැනුමකට අදාළව පිඹුරු එකකට වැඩි ගණනක් පිළියෙල කිරීමට සිදුවූ අවස්ථාවලදී (උදා. අ.ග.පි.කිහිපයක විට) , එම මැනුමට අදාළව ලබා ගන්නා ලද ග්‍රාම නිලධාරි දැන්වීම් පෝරමයේ ඡායා පිටපත් භාවිතා කළ යුතුය. අදාළ මැනුම් ඉල්ලීමේ අංකය පෝරමයේ රතු තීන්තෙන් සඳහන් කර මෙම පෝරමය අදාළ මැනුම් ඉල්ලීම් ගොනුවට ඇතුලත් කළ යුතුය. සෙසු වාර්තා වල මුල් පිටපත අමුණන ලද මැනුම් ඉල්ලීම් අංකය, යොමු සටහනක් ලෙස ලියා ඡායා පිටපතක් ඇතුලත් කළ යුතුය.

9.12. මායිම් පෙන්වා දීමට ග්‍රාම නිලධාරි හැර තවත් කෙනෙකු නම් කර ඇත්නම්, ඔහුටද මායිම් එළි කිරීමේදී හා මැනීමේදී පැමිණ සිටින ලෙස දැන්විය යුතුය. (ඇමුණුම 01 බලන්න). ඔහු එසේ නොපැමිණිය හොත් ඊට හේතුව විමසා වාර්තා කර සිටිය යුතුය.

9.13. ප්‍රාදේශීය ලේකම්ට හා වෙනත් පුද්ගලයින්ට මායිම් පෙන්වා දීමට පැමිණෙන ලෙස දැන්වීම සඳහා මැනුම් 70 වැනි පෝරමය කිසිවිටෙකත් භාවිතා නොකළ යුතුය.

9.14. ආදායම් මායිමක පිහිටීම සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් තොරතුරු පෙර මැනුම් වල සඳහන් මායිමේ පිහිටීමට වඩා වෙනස් විය හැකිය. එවැනි අවස්ථාවකදී ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරින් සමඟ ඒ පිළිබඳව එම ස්ථානයේදීම ප්‍රවේශමෙන් කරුණු සොයා බැලිය යුතුය. පිළිගත් මායිමේ නිරවද්‍යතාවය සහතික කෙරෙන අත්සන් කළ ලියවිලි සම්පූර්ණ කළ පිඹුරු සමඟ එවිය යුතුය. ආදායම් කොට්ඨාශ දෙකේම ග්‍රාම නිලධාරින් සමඟ හා පළාත් මායිමක් සම්බන්ධයෙන් නම් අදාළ දිස්ත්‍රික් ඡ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීන්, පළාත් දෙකේම ප්‍රාදේශීය ලේකම්වරුන් දෙදෙනාද සමඟ සාකච්ඡා කර බැලීම මේ සම්බන්ධයෙන් ඉතා අවශ්‍ය වේ. අවසන් තීරණයන් සර්වේයර් ජනරාල් මඟින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත දැන්විය යුතුය.

ග්‍රාම නිලධාරින්ගෙන් හා වෙනත් අයගෙන් ලබාගත් තොරතුරු

9.15. ක්ෂේත්‍ර පොතේ ඇතුළත් කළ යුතු ඉඩම් පිළිබඳ නිවැරදි තොරතුරු තීරණය කර ගැනීමට මිනින්දෝරුවන්ට අවශ්‍ය නම් ගම්වාසීන් හා ග්‍රාම නිලධාරින් ද සමඟ සාකච්ඡා කළ හැකිය. මෙහි ඇතුලත් කරන විස්තර මෙම සාකච්ඡා වලට හා එම ස්ථානයේ පවත්වන ලද පරීක්ෂණ වලට අනතුරුව මිනින්දෝරුවරයා විසින් තීරණය කළ යුතුය. (**12.86-12.89 ඡේදයන්** බලන්න.)

9.16. ඉඩම් පිළිබඳ තොරතුරු සම්බන්ධයෙන් අධිකරණයෙන් හෝ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අසා එවන විමසීම් සම්බන්ධයෙන් එම තොරතුරු තමා විසින්ම කරන ලද විමසීම් හා එම ස්ථානයේ කරන ලද පරීක්ෂණ පදනම් කර ගත් ඒකමතික පෞද්ගලික තීරණ විනා අධිකරණයකදී 'ශ්‍රැති මාත්‍ර සාක්ෂී' වශයෙන් ප්‍රතික්ෂේප කළ හැකි ග්‍රාම නිලධාරි හෝ වෙනත් කෙනෙකුගේ මත නොවන බව ප්‍රකාශ කිරීමට මිනින්දෝරුවරයා සමත් විය යුතුය. එම ඉඩම් වලට සම්බන්ධ අය විසින් සපයනු ලබන සාවද්‍ය තොරතුරු භාර නොගැනීමට මිනින්දෝරුවරුන් ප්‍රවේශම් විය යුතුය.

9.17. ක්ෂේත්‍ර පොතේ සටහන් කරනු ලබන තොරතුරු වල විස්තර එම සටහන කරන දිනයෙහි එම ස්ථානයෙහි පැවති යථා තත්වය පෙන්වා දිය යුතුය. අවශ්‍ය වන විට පහත සඳහන් වන පාඨ යොදා මෙම විස්තර සටහන් කළ යුතුය. එනම්, '..... සඳහා එළි කිරීම', 'අත්හැර දමන ලද .....''..... වගාකර ඇත.' යනාදි වශයෙනි. අවිනිශ්චිත වැකි විස්තර ලෙස එනම් '..... යි කියනු ලැබේ' නැතහොත් '..... සේ පෙනේ' වැනි අවිනිශ්චිත වැකි විස්තර සටහන් කිරීමේදී නොයෙදිය යුතුය.

9.18. වැදගත් තොරතුරු සම්බන්ධයෙන් විශාල සැකයක් ඇති වුවහොත් එම තොරතුරු ක්ෂෙත්‍ර පොතේ සටහන් කරන්නට ප්‍රථම ඒ බව මිනින්දෝරුවරයා තම මිනින්දෝරු අධිකාරිට වාර්තා කළ යුතුය. එවිට ඒ සම්බන්ධයෙන් ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිගෙන් නැතහොත් දිස්ත්‍රික් ලේකම්ගෙන් කරුණු විමසා බැලීම සඳහා අවශ්‍ය නම්, මිනින්දෝරු අධිකාරි විසින් ඒ බව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි ට දන්වා යැවිය යුතුය.

9.19. මායිම් නියම කිරීමේ හා වෙනත් මැනුම් සම්බන්ධයෙන් ඉඩම් කැබැල්ලක් නැතහොත් මායිමක් පිළිබඳ මුල් විස්තරය එසේ තබාගත යුතු අවස්ථාද එළඹෙනු ඇත. එවැනි අවස්ථාවකදී විශේෂ උපදෙස් නොමැතිව කිසිදු වෙනස් කිරීමක් නොකළ යුතුය.

මැනුමක් සම්බන්ධයෙන් දක්වන විරෝධතා

9.20. 2002 අංක 17 දරණ මැනුම් පනතේ 16 වන වගන්තිය යටතේ දැන්වීම් ලියා, ඉඩමට ඇතුළුවීමට අඩුම වශයෙන් දින 3 කට පෙර භාර දිය යුතු අතර මෙම දැන්වීම **ඇමුණුම 01** හි සඳහන් කර තිබෙන පෝරමයෙහි ලියා යැවිය යුතුය. එම ඉඩමකට ඇතුළුවී මැනුමක් කිරීමට හෝ වෙනයම් රාජකාරි කටයුත්තක් කිරීමට පෞද්ගලික ඉඩම් හිමියන් විරුද්ධත්වයක් පෙන්වතොත් හෝ විරුද්ධත්වයක් පෙන්වතැයි සැක කරනු ලැබුවහොත් එම ඉඩම් වලට ප්‍රවේශ වීමට 2002 අංක 17 දරණ මැනුම් පනතේ 16 වන වගන්තිය යටතේ බලය පැවරී ඇති බවට ඔවුන් දැනුවත් කළ යුතුය. තවදුරටත් විරෝධතාවයක් පැන නඟී නම් 9.21 ඡේදය යටතේ කටයුතු කළ යුතුය.

9.21. මැනුමකට විරුද්ධතා දක්වා ඇති අවස්ථාවකදී, රාජකාරි කටයුතු කිරීමට තැත් කිරීමේදී මිනින්දෝරුවරයාට විරුද්ධතා දක්වන්නන් විරුද්ධතා සිදු කළ බවට, ග්‍රාම නිලධාරිගෙන්ද, මායිම් පෙන්වා දීමට පත් කළ නිලධාරියාගෙන් හා මැනුම් ක්ෂෙත්‍ර සහායකයින් දෙදෙනෙකු ගෙන්ද, ගත් ප්‍රකාශ සමඟ, මිනින්දෝරුවරයා විසින් මිනින්දෝරු අධිකාරි මඟින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ලැබුණු පසුව ඔහු විසින් එම වාර්තාවේ පිටපතක් දිස්ත්‍රික් ලේකම්වරු වෙත ඉදිරිපත් කරමින්, නීති මාර්ගයෙන් විරෝධතාවය මහහැර ගන්නට හැකිවේද යන්න හා එසේ නම් මැනුම සඳහා නැවත කරනු ලබන උත්සාහයකදී යම්කිසි විරුද්ධතාවයක් දැක්වූ විට මිනින්දෝරුවරයා පොලිස් ආරක්ෂාව බලාපොරොත්තු වුවහොත් ඊට විරුද්ධත්වයක් ඇද්ද යන්න ගැන දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් ලිඛිතව විමසා සිටිය යුතුය. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරයාගේ විරුද්ධත්වයක් නොමැති නම්, 2002 අංක 17 දරණ මැනුම් පනතේ 16 වෙනි වගන්තිය යටතේ මිනින්දෝරුවරයාට ඉඩමට ප්‍රවේශ වීමට බලය දෙන ලිපියක් සඳහා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සර්වේයර් ජනරාල්ගෙන් ඉල්ලුම් කළ යුතුය. මෙම ලිපිය ලැබුණු පසු, පොලිස් ආරක්ෂාව යටතේ ඉඩම නැවත මනින ලෙස දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මිනින්දෝරු අධිකාරි මඟින් මිනින්දෝරුවරයාට උපදෙස් දෙනු ලැබේ. කෙසේ වෙතත් තවදුරටත් මිනින්දෝරුවරයාට විරෝධතා ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් අපරාධ නඩුවක් පැවරීමේ අරමුණ ඇතිව පරීක්ෂා කිරීම කරන ලෙස පොලීසියෙන් ඉල්ලුම් කළ යුතුය.

9.22. අත්කර ගැනීමේ මැනුම් වලදී අනුගමනය කළ යුතු පිළිවෙල ඉහත සඳහන් පරිදිමය. එහෙත් **6 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 02** හි ආකෘති 01 හා 02 හි පෙන්නුම් කර තිබෙන පෝරමවල ලියා අඩුම ගණනේ දින 7 කට පෙර දැන්වීමක් කළ යුතුය.

9.23. වැරදි ක්‍රියා හෝ විෂමාචාරවලින් වැලකීම සඳහා 2002 අංක 17 දරණ මැනුම් පනතේ 17 වැනි වගන්තිය කෙරෙහි මිනින්දෝරුවරුන්ගේ සැලකිල්ල යොමු කරවනු ලැබේ.

මායිම්ගල් සිටුවීම

9.24. භූමියෙහි අන් විදියකින් පෙනෙන්නට නොතිබෙන මායිමක් දැනගත යුතු සියළු දෙනාට පැහැදිළිව පෙන්වා දීම සඳහා මායිම්ගල් සිටුවනු ලැබේ. එබැවින් සෑහෙන පමණ මායිම් සලකුණු නොකළහොත් තවත් මැනුමක් සඳහා වියදම් දරන්නට සිදුවනු ඇත.

9.25. අළුත් මායිම් වල මායිම්ගල් සිටුවීම රීතියක් වශයෙන් මැනුමට ප්‍රථම කළ යුතුය.

9.26. මැනුමකින් සොයාගන්නා ලද පැරණි මායිම් වල මායිම්ගල් නැවත සිටුවිය යුත්තේ මිනින්දෝරුවරයා ඉදිරිපිට දීය.

9.27. දම්වැල් රේඛාවේ සිට එම රේඛාවට ලම්බකව මනිනවිට මීටර් 10 ට වඩා ඈතින් පිහිටි මායිම්ගල් පරික්‍රමණයක මාර්ගයෙන් මැනිය යුතුය. පූර්ණමානයෙන් මනින විට උපකරණයේ සිට මායිම්ගලට තිබිය හැකි උපරිම දුර මීටර් 100කි.

9.28. ස්ථිර මායිම් වලින් භූමියේ පැහැදිලිව පෙන්නුම් කර නොතිබෙන විට මායිම් භූමියෙහි පිහිටුවා මායිම්ගලෙන් මායිම්ගලට එළි කළ යුතුය.

9.29. සාමාන්‍යයෙන් මායිම්ගල් දෙකක් අතර පරතරය මීටර් 100 ට වැඩි නොවිය යුතු අතර ඒවා එකිනෙකට දර්ශණය විය යුතුය. මායිම්ගල් පිහිටුවීමේදී මිනින්දෝරුවරයා තමාගේ අභිමතය පරිදි කටයුතු කළ යුතුය. නගර බද ඉඩමක සිටුවන මායිම්ගල්, කැලෑබද ප්‍රදේශයේ ගමක තිබෙන හේනක සිටුවන මායිම්ගල් වලට වඩා ආසන්නයෙන් සිටුවිය යුතු බව මීට නිදසුනක් වශයෙන් පෙන්වා දිය හැකිය. මීටර් 100 නියමය දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අවසරය නොමැතිව උල්ලංඝනය නොකළ යුතුය. එය තීරණය කිරීමේදී දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මායිම්ගල් එකින් එකට පෙනේද, ඉඩම වල ගොඩැලි සහිතද නැතහොත් සමතලාද යන වග හා එම මායිම වැවිල්ලක් නොමැති බිම් ප්‍රදේශයක් ඔස්සේ වැටී තිබේද යන්න සලකා බැලිය යුතුය.

9.30. මැනීමට නියමිත විස්තර වල විශේෂයෙන් සඳහන් කර නොමැති නම් කැලෑ හෝ හේන් හෝ පතන් බිම් හෝ අතර මායිම් වල මායිම්ගල් නොයෙදිය යුතුය.

9.31. භූමියක පිහිටි මායිමක අඛණ්ඩභාවය දැන ගැනීම සඳහා අනුගාමී මායිම්ගල් එකිනෙකට පෙනෙන්නට සිටුවිය යුතුය.

9.32. ස්ථිර, ස්වභාවික හෝ කෘත්‍රිම ලක්ෂණ වලින් සෑදුණු මායිම් වල මායිම්ගල් නොයෙදිය යුතුය.

9.33. එසේද වුවත්, කුඹුරු වල හා වතුවල මායිම් ස්ථිරව පිහිටා තිබෙන කළ මතු කාලයකදී කරන අයුතු අයුතු අල්ලා ගැනීම් වැළැක්වීම නැතහොත් සොයා ගැනීම සඳහා අතරින් පතර මායිම්ගල් කිහිපයක් සිටුවිය යුතුය.

9.34. පෞද්ගලික ඉඩම් ඔස්සේ වැටී තිබෙන ගම් මායිම් හා වෙනත් ආදායම් දිස්ත්‍රික්ක මායිම් පරිපාලන අවශ්‍යතාවයන් සඳහා සෑම මීටර් 400ක් හා ප්‍රධාන නැමීමක් පාසාම මායිම්ගල් දමා ලකුණු කළ යුතුය.

9.35. රජයේ ඉඩම් වලට යාව තිබෙන අයිතිවාසිකම් කියා සිටින ලද නැතහොත් වගා කරන ලද ඉඩම් කැබලි වල අවිනිශ්චිත මායිම්, ඒවා ලකුණු කිරීමට පෙර සෘජුව සකස් කළ යුතුය. එහෙත් අයිතිවාසිකම් කියා සිටින නැතහොත් වගා කළ කවර ඉඩම් කොටසක් වුවද එම මායිමෙන් පිටට නොදැමීමට ප්‍රවේශම් විය යුතුය.

සෑම විටම නැමී ඇති ස්ථානවලට මායිම්ගල් සිටුවිය යුතු අතර ඒ අනුව මායිම සෑමවිටම සෘජු රේඛාවක් සේ භූමියේ තිබිය යුතුය. එසේ නොමැති වුවහොත් මතු කාලයකදී අනුබෙදුම් කිරීමේදී වර්ගඵල තුලනය කිරීමට නොහැකි වේ.

9.36. මායිම්ගල් ස්ථිරව හා සුරක්ෂිතව වැළලිය යුතුය. යම්කිසි බාධාවක් නිසා එසේ කිරීමට නොහැකි වූ විට ඒවා මායිමෙහි ඒ ඒ ස්ථාන වලට හැකි පමණ ආසන්නයෙන් වැළලිය යුතුය.

9.37. මායිම්ගල් නැතහොත් පිහිටි මායිම්ගල් නොයෙදිය හැකි භූමියක මායිම් ලකුණු කිරීම සඳහා ගල් ගොඩවල් හෝ ලී කුඤ්ඤු හෝ භාවිතයට ගත යුතුය. *නීති ප්‍රඥප්ති* සංග්‍රහයේ (1956 ප්‍රතිශෝධනයේ) 456 වැනි පරිච්ඡේදය වන රජයේ මායිම්ගල් ආඥාපනතින් උපුටා ගත් 4 වන කොටස කෙරෙහි විශේෂ අවධානය යොමු කරවනු ලබන මිනින්දෝරු අධිකාරි විසින් ගල් ගොඩවල් හා ලී කුඤ්ඤු හැකි පමණ අඩුවෙන් ප්‍රයෝජනයට ගෙන ඇත්දැයි සොයා බැලිය යුතුය. මේවා ගැන ක්ෂෙත්‍ර පොතෙහි තීන්තෙන්ද විස්තර කළ යුතු වන අතර පිඹුරෙහි ගල් ගොඩක් සඳහා 'ගගො' යන්නද, ලී කුඤ්ඤයක් සඳහා 'ලී' යන්නද සඳහන් කළ යුතුය.

9.38. ගඩොල් බිත්ති, කොන්ක්‍රීට් වලින් තැනූ බිම් ආදිය නිසා නිවසක හෝ ගොඩනැගිල්ලක හෝ තුල හෝ ඒවා අසල හෝ මායිම්ගල් වැළලීමට නොහැකි වන විට ඒ සඳහා සෙ.මී. 15 පැතලි නැතහොත් කුඤ්ඤු හැඩයෙන් යුත් යකඩ ඇණ ප්‍රයෝජනයට ගත යුතුය. එම ලකුණ වටා සෙ.මී.11ක චතුරස්‍රාකාර කොටුවක් නොමැකෙන තීන්තෙන් ඇඳිය යුතුය. එහි ඇතුලත ඇණය මධ්‍යගත වන සේ පුළුල් ඊ හිස යෙදිය යුතුය.

විස්තර මැනීම

9.39. විකෝණමානය සහ දම්වැල භාවිතයෙන් මැනුම් කරන විට සියළුම අනුලම්භ ටේප් පටියෙන් ලබා ගත යුතුය. පූර්ණමානයෙන් මැනුම් කරන විට විස්තර නිරීක්ෂණ ලක්ෂ්‍යයන් මැනීම සඳහා ප්‍රිස්මය සහිත පෝලක් භාවිතා කළ යුතුය.

9.40. මිනුම් ගැනීමේ නිරවද්‍යතාව මැනුමේ අවශ්‍යතාවය, වස්තූන්ගේ ස්වාභාවය සහ පිඹුරේ පරිමාණය මත රඳා පවතී.

9.41. අවිනිශ්චිත ලක්ෂණ වලින් යුත් වස්තූන් කෙරෙහි අනුලම්භ/විස්තර මැනීම් ලක්ෂ්‍ය නිරීක්ෂණයන් (shots) ගන්නා විට ප්‍රවේශම් විය යුතුය. සාමාන්‍ය තත්ත්වයන් යටතේ පූර්ණමානයකින් විස්තර නිරීක්ෂණයේදී ස්ථිර මායිම් ලක්ෂ්‍යයකට ඇති දුර මීටර් 100 නොඉක්මවිය යුතුය. ඇළ ඉවුරු වැනි අවිනිශ්චිත මායිම් කෙරෙහි අනුලම්භ/විස්තර මැනීම් ලක්ෂ්‍යයන් (shots) ගන්නා විට තමන්ගේ අභිමතය පරිදි කටයුතු කළ යුතුය. කෙසේ වුවද පූර්ණමානයකින් විස්තර නිරීක්ෂණයේදී ජල මාර්ග මායිම් හෝ ස්වාභාවික මායිම් සඳහා මීටර් 200ක දුරක් දක්වා නිරීක්ෂණයන් ලබා ගැනීම කළ හැකිය.

9.42. අනුලම්භ ගැනීමේ අවශ්‍ය නිරවද්‍යතාව මීටරයෙන් දෙවන දශම ස්ථානයට එනම් සෙන්ටි මීටරයට විය යුතුය.

9.43. කිසියම් හේතුවක් නිසාවෙන් පූර්ණමානය භාවිතා නොකර විකෝණමානය හා දම්වැල භාවිතයෙන් වැඩි නිරවද්‍යතාවයක් අවශ්‍ය නොවන මැනුම් කටයුතු වලදී මීටර් 10 ට අඩු අනුලම්භ ගත හැකිය. කෙසේ වෙතත් ඉඩමේ වටිනාකම වැඩිවන විට අනුලම්භ දුර තව දුරටත් නිරවද්‍යව ගැනීමට උපදෙස් ලබා දිය යුතුය. මේ සම්බන්ධයෙන් මිනින්දෝරු අධිකාරි විසින් මිනින්දෝරුවරුන්ට උපදෙස් ලබා දිය යුතුය. දම්වැල් රේඛාවේ සිට මීටර් 10 ට වැඩි වූ අනුලම්භන වලට දිගංශයක් හා දුරක්ද මැනිය යුතුය. එසේ මනින ලද දිගංශයෙහි හා දුරෙහි හරි වැරදි බලා ගැනීම සඳහා අමතර වශයෙන් ඍජුකෝණාස්‍ර අනුලම්භයක් ලබා ගත යුතුය.

9.44. (අ) අනුලම්භ/විස්තර නිරීක්ෂණ ලක්ෂ්‍යයන් (shots) සේ මැනුම් කරන මායිම්, මැනීම කරන අවස්ථාවේ සැබැවින්ම පිහිටි මායිම් විය යුතුය.

(ආ) කාණුවක්, අගල් ගැට්ටක්, ඉවුරක් හෝ වැටක් යනාදි ලක්ෂණ වලින් එකකට වැඩි ගණනකින්, අයිතිවාසිකම් දෙකක් වෙන් කෙරෙන විට එම අයිතිවාසිකම් දෙක අතර නියම මායිම ඒවායින් කවර ලක්ෂණයකින් වෙන් වන්නේදැයි තීරණය කර, එය පිළිගැනීම මිනින්දෝරුවරයාගේ වගකීම වන්නේය. මෙම තොරතුරු ලබා ගත යුත්තේ මායිම් පෙන්වීමට නම් කරනු ලබන තැනැත්තාගෙන්ය. එහෙත් ඔහුට ඒ ගැන අවිශ්වාස නම්, එම තොරතුරු ඉඩම් හිමියන්ගෙන්ම ලබා ගත යුතුය.

9.45. ඇළක මායිම ඇළ ඉවුරේ මුදුනය. දිය ඉම නොමැනිය යුතුය. ඇළ පත්ලේ පළල ක්ෂේත්‍ර පොතේ ඇතුලත් කළ යුතුය.

9.46. මාර්ගයක් නැතහොත් අඩි පාරක් මැනීමේදී පවතින මාර්ග කොටසෙහි දෙපස මායිමට අනුලම්භ/විස්තර නිරීක්ෂණ ලක්ෂ්‍යයන් (shots) සඳහා නිරීක්ෂණයන් ලබාගත යුතුය. මාර්ගයේ ගල් ඇල්ලු අයිනට හෝ තණකොළ වැවී ඇති අයිනට හෝ අනුලම්භ/විස්තර නිරීක්ෂණ ලක්ෂ්‍යයන් (shots) නොගත යුතුය. එසේ කළ යුත්තේ පැරණි මායිම් නිශ්චය කිරීමේ කටයුතු සඳහා හෝ අයිතිවාසිකම් පෙන්වා සිටින මායිමක් හෝ සම්බන්ධයෙන් එලෙස අනුලම්භ/විස්තර නිරීක්ෂණ ලක්ෂ්‍යයන් (shot) ගැනීම අවශ්‍ය වුවහොත් පමණකි.

9.47. මාර්ගයක හෝ අඩි පාරක නියම මායිමක් නොමැති විට **10.16 ඡේදයෙහි** සඳහන් කර ඇති පරිදි, මාර්ගය සඳහා වෙන් කරන ලද සම්පූර්ණ බිම් කොටස මැනිය යුතුය. ඊට අමතරව මාර්ගවල ඇති බෝක්කු සහ පාලම් ද මැනීම් කර පරිමාණයට පෙන්වා ඒවායේ සම්මත ලකුණ යෙදිය යුතුය.

9.48. නියරක මුදුනද බැම්මක නැතහොත් කණ්ඩියක පාමුලද මායිම් වශයෙන් ගත යුතුය.

9.49. ගංගා, ඇළ හා මාර්ග යන භූලක්ෂණවල දෙපසම මායිම් මැනිය යුතුය. කුඩා මැනුම් වලදී හමුවන යම්කිසි ඇළක් පළල ඉතා වැඩි නම් (හෝ විශාල නම්) හෝ එයින් එතෙර වීමට නොහැකි තරම් ගැඹුරු නම් හෝ එතෙර ඉවුර ඡේදනයන් ගේ හෝ තැනින් තැනට ගත් අනුලම්භ/පූර්ණමාන නිරීක්ෂන ලක්ෂ්‍යයන් (shots) භාවිතා කර අනෙක් පස නිශ්චය කර කැඩුණු ඉරි වලින් එය පෙන්නුම් කළ යුතුය.

9.50. විශාල කැලෑ ප්‍රදේශවල භූදකලාව තිබෙන ඇළ මාර්ග මැනීමේදී දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ අවසර ඇතිව පැරණි කුඤ්ඤ දිගේම ආපසු විත් පියවිය හැකිය.

9.51. දුම්රිය මාර්ග, මහා මාර්ග හා සුළු මාර්ග වල මායිම් 1:2,000 පරිමාණයට ලකුණු කිරීමට හැකිවන තරම් අවශ්‍ය නිරවද්‍යතාවයකින් මැනිය යුතුය.

9.52. අනුලම්භ ගැනීම පිළිබඳ වැඩිදුර උපදෙස් සඳහා ශිල්පීය උපදේශ පොතේ IV වැනි පරිච්ඡේදය බලන්න.

ගොඩනැගිලි

9.53. වෙනත් මැනුම් වලදී සාමාන්‍යයෙන් සියළුම ගොඩනැගිලි මැන පිඹුරෙහි පෙන්නුම් කිරීම සිරිතක් වශයෙන් කළ යුතුය. මෙවැනි අවස්ථාවන්හිදී දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරින්ට සිය අභිමතය පරිදි කටයුතු කළ හැකිය. ඔවුන් විසින් මෙහිදී ගනු ලබන තීරණය රඳා පවතින්නේ මැනුම කරනුයේ කුමන කරුණක් සඳහාද යන්න මතය. යම්කිසි සැකයක් ඇති වුවහොත් එය මැනීමේ ඉල්ලීම නිකුත් කරන නිලධාරියාගෙන් විමසා බැලිය යුතුය. අත්කර ගැනීමේ මැනුම් වලදී සියළුම ගොඩනැගිලි අත්‍යවශ්‍යයෙන්ම මැනිය යුතුය.

පැරණි මායිම් අධිස්ථාපනය කිරීම

9.54. 'අධිස්ථාපනය' යනු හි.පි, රේඛා චිත්‍ර පිඹුරු, රේඛා චිත්‍ර, මු.පි. සහ ආදායම් මායිම් වැනි පැරණි පිඹුරු වල මායිම් අළුත් පිඹුරු මත පතිත කිරීමයි.

9.55. පැරණි පිඹුරු වල පෙන්වා ඇති මායිම් එසේම තබා ගැනීම සඳහාද, එම පිඹුරු වලට යාව පිහිටියා වූද ඉඩම් සඳහා, පැරණි පිඹුරු මායිම්වලට ඉතා හොඳ අධිස්ථාපනයක් කළ යුතුය.

9.56. දෙපාර්තමේන්තුව විසින් පැරණි පිඹුරු පරිලෝකනය කර පවත්වාගෙන යන DMS දත්ත පද්ධතියෙන් පැරණි පිඹුරු පිටපත් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙතින් ලබාගත හැකි අතර එම පද්ධතියේ නොමැති පැරණි පිඹුරු හෝ ක්ෂෙත්‍ර පත් හෝ සොයා ගත නොහැකි විශේෂ අවස්ථාවලදී අවශ්‍ය ලේඛන සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයෙන් ලබා ගත යුතුය.

9.57. ඉතාම හොඳ අධිස්ථාපනය නම්, පැරණි කුඤ්ඤ තවමත් තිබෙන විට, ඒවා අළුත් වැඩ වලට සම්බන්ධ කිරීමෙන් පසු නැවත ලකුණු කර පෙන්වීමයි. අළුත් පිඹුරු පැරණි පිඹුරු මෙන් එකම පරිමාණයෙන් යුක්ත වන්නේ නම්, පැරණි පිඹුරෙන් අනුරේඛනයක් ගෙන අළුතින් කරන ලද වැඩ සමඟ සසඳා බැලිය යුතුය. පරිමාණය එකිනෙකට වෙනස් නම්, පැරණි පිඹුරේ විශාල කරන ලද නැතහොත් කුඩා කරන ලද අනුරේඛනයක් පිළියෙල කළ යුතු අතර, එය අළුත් පිඹුරේ ලකුණු කිරීම සමඟ සැසඳිය යුතුය.

පරිලෝකනය කරන ලද පිඹුරුපත් භාවිතා කිරීමේදී **22.44 ඡේදයෙහි** සඳහන් පරිදි ජ්‍යාමිතික නිවැරදි කිරීම් හා මුල් පිඹුරේ පරිමාණය සැලකිල්ලට ගෙන අධිස්ථාපන අනුරේඛන පිළියෙල කළ යුතුය.

9.58. මෙම ක්‍රමය නිසා විශාල ප්‍රමාණයක නැවත ලකුණු කිරීම් සිදු කිරීමට වන විට, මෙහි පහත සඳහන් ක්‍රම දෙකෙන් කුමන ක්‍රමයක් අනුගමනය කළ යුතුද පිළිබඳව මිනින්දෝරු අධිකාරි විසින් උපදෙස් දිය යුතුය.

(අ) මායිම්ගල් දමා ඇති මැනුමක් සම්බන්ධයෙන්, හැකි සෑම අවස්ථාවේදීම අළුත් මැනුමට විරුද්ධ පැතිවල ඇති මායිම්ගල් කිහිපයක් මැන ඒවා අළුත් පිඹුරේ ලකුණු කළ යුතුය. මෙම මායිම්ගල් උපයෝගී කොට ගෙන, පැරණි පිඹුරෙන් ලබා ගත් නිරවද්‍ය අනුරේඛනයක මාර්ගයෙන් පැරණි මායිම් අධිස්ථාපනය කළ යුතුය.

(ආ) පැරණි කුඤ්ඤ සොයා ගැනීමට නොමැති නම් හා මැනුම මායිම්ගල් නොයෙදූ මැනුමක් නම්, දැනට භූමියෙහි සොයාගත හැකි පැරණි පිඹුරේ පෙන්වා තිබෙන නිර්මිත අංග ලක්ෂණ හා ස්වාභාවික භූලක්ෂණ වල මායිම් නැවත මැන ඒවා අළුත් පිඹුරේ ලකුණු කළ යුතුය. ඉන්පසු පැරණි පිඹුරෙන් ලබාගත් නිවැරදි අනුරේඛනයක් මාර්ගයෙන් ඉතා හොඳ අධිස්ථාපනයක් ලබා ගත යුතුය. පැරණි වැඩ 'අධිස්ථාපනය' කිරීම සඳහා මනිනු ලබන විස්තර 'අධිස්ථාපන නිර්දිෂ්ටයන්' යනුවෙන් හැඳින්වේ.

9.59. හිමිකම් පිඹුරු ආදිය අධිස්ථාපනය කිරීමේ නිරවද්‍යතාවය රඳා පවත්නේ අළුත් පිඹුරක මැන පෙන්නුම් කළ හැකි පැරණි පිඹුරේ අධිස්ථාපන නිර්දිෂ්ටයන් මතය. එබැවින් හැකි පමණ නිර්දිෂ්ටයන් සොයා ගැනීමත් අධිස්ථාපනය සඳහා ඉතා සුදුසු හා විශ්වාසදායක නිර්දිෂ්ටයන් ප්‍රයෝජනයට ගැනීමත් අවශ්‍ය වන්නේය.

9.60. ප්‍රයෝජනයට ගන්නා නිර්දිෂ්ටයන් තෝරා ගැනීමේදී ඒවා ගැන සලකා බැලිය යුතුය. සොයාගත් නිර්දිෂ්ටයන් අධිස්ථාපනය කරනු ලබන මායිමට ලංවූ තරමට ඒවා අධිස්ථාපනය සඳහා විශ්වාසදායක වන්නේය. නිදසුනක් වශයෙන් විශාල හිමිකම් පිඹුරක ඇළක වෙන් කළ බිමක මායිමක් අධිස්ථාපනය කිරීමට අවශ්‍ය වූ විට, ළඟම පිහිටි ලක්ෂණය වන ඇළ සෑහෙන දුරකින් එහා පිහිටි හිමිකම් පිඹුරේ

ප්‍රතිවිරුද්ධ මායිමේ ගස් හා වෙනත් වස්තූන්ට වඩා සුදුසු වන්නේය. එලෙසම, ස්ථිරව පිහිටි ඉවුරක් හෝ බිත්තියක් හෝ වෙනස් කළ හැකි කම්බි වැටකට වඩා විශ්වාසදායක වන්නේය.

9.61. අධිස්ථාපනය සඳහා අවශ්‍ය වන පැරණි පිඹුරු වලින් අනුරේඛනයක් ලබා ගත යුත්තේ අධිස්ථාපනය කිරීමට ස්වල්ප වේලාවකට කලින්ය.

9.62. යම් අධිස්ථාපනයක් අනුමාන (“ද” අධිස්ථාපනයක්) නම් ‘නිරාපද බිම් කොටස්’ ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතුය. එසේ කිරීමේ පරමාර්ථය නම් යොදා ගනු ලැබූ මායිමකට ඕනෑම යුක්ති සහගත අධිස්ථාපනයකින් පෞද්ගලික ඉඩමකට අයත් සෑම ඉඩම් කොටසක්ම ඇතුලත් කරවීමයි.

9.63. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී ගෙන් අවසරය ලැබුණ විට පමණක් ‘නිරාපද බිම් කොටස් ’ යොදා ගත යුතුය.

9.64. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් හැකි පමණ නිවැරදිව පැරණි මායිම් අධිස්ථාපනය කළ පසු පෞද්ගලික ඉඩම් පිටතට නොවැටේ යැයි ඔහු සිතන විදියට දැක්වෙන නිරාපද රේඛාවක් පිඹුරෙහි ඇඳිය යුතුය. මෙම රේඛාව අවශ්‍ය වන තැන් වලදී සෘජු කිරීමෙන් පසු එය භූමියෙහි ලකුණු කළ යුතුය. මෙම රේඛාව හා අධිස්ථාපිත මායිම අතර තිබෙන ඉඩම් තීරුව ‘නිරාපද බිම් කොටස’ වශයෙන් කැබලි අංක යොදා ‘රජය විසින් අයිතිවාසිකම් නො කියනු ලැබේ’ යනුවෙන් විස්තර කරනු ලැබේ.

9.65. නිරාපද බිම් කොටසක් තුල පිහිටි අයිතිවාසිකම් කියා සිටින නොයෙක් කොටස් වලට හා වෙන වෙන වැවිලි වලට වෙන වෙනම කැබලි අංක යොදනු නොලැබේ.

9.66. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන්ට පැරණි මායිමක් අධිස්ථාපනය කිරීමට නොහැකි වුවහොත් උපදෙස් ලබා ගනු පිණිස සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයට දන්වා යැවිය යුතුය.

9.67. අධිස්ථාපනය පහත සඳහන් පරිදි වර්ග කරනු ලැබේ.

යථාතත්‍ය හෙවත් “ය” (P) අධිස්ථාපනය - ස්ථිර අධිස්ථාපනය

ප්‍රශ්න කළ හැකි හෙවත් “ප්‍ර” (Q) අධිස්ථාපනය - යම් විදියක ගැටළුවක් ඇති කරන නමුදු මිනින්දෝරු අධිකාරිගේ විශ්වාසයේ හැටියට සතුටුදායක ලෙස බේරුම් කරන ලදැයි සිතන අධිස්ථාපනය.

දළ හෙවත් “ද” (R) අධිස්ථාපනය - අධිස්ථාපනය සඳහා ප්‍රමාණවත් දත්ත නොමැති අවස්ථා වල

9.68. සියළුම අධිස්ථාපන වල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් මිනින්දෝරු අධිකාරින් වග කිව යුතුය. මෙම අධිස්ථාපනවල හරි වැරදි බැලීම හා වර්ග කිරීම මිනින්දෝරු අධිකාරි විසින්ම කළ යුතු අතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ තීරණය අවසාන හා බලාත්මක වන්නේය.

9.69. මීට ඉහත දී කරන ලද අධිස්ථාපන සාවද්‍ය යයි විශ්වාස කිරීමට ඉඩ ඇත්නම් විනා, මායිම්ගල් යෙදූ මැනුම් සම්බන්ධයෙන් භාවිතයට ගෙන තිබෙන පැරණි මායිම්වල අධිස්ථාපන පිහිටීම වෙනස් නොකළ යුතුය. යම්කිසි අළුතින් කරන මායිම් පිහිටුවීමක් ඇත්නම්, එය පෞද්ගලික භූමියාට අවාසි නොවන පරිදි කළ යුතුය.
එසේ වෙනස් කළ යුතුම වන්නේ නම් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ ලිඛිත අවසරය ඇතිව සිදු කළ යුතුය.

9.70. භූමිකම් පිඹුරක නැතහොත් රේඛා චිත්‍රයක අධිස්ථාපිත මායිම් පිහිටුවීමෙහි හා භූමිකම් කියා සිටින ලද ස්ථිර මායිමක් අතර සුළු වෙනසක් ඇති විට ස්ථිර මායිම පිළිගත යුතුය. මේ ක්‍රමය නිසා ඉඩම් ඉතා කුඩා කැබලි වලට වෙන්වීම වැලකේ .

9.71. මාර්ගයක් හෝ අතුරු පාරක් හෝ කණ්ඩියක් හෝ තුළ කිසියම් වැවිල්ලක් ඇත්නම් එය මැන වෙන වෙනම කැබලි අංකයන් යෙදිය යුතුය.

9.72. හිමිකම් පිඹුරක නැතහොත් රේඛා චිත්‍රයක මායිමේ හෝ මායිම ඇතුළත හෝ පිහිටි ඇළක් අළුතින් මැනීමේදී මුලින් කරන ලද මැනුමෙන් අනතුරුව ස්වාභාවික වෙනස්කම් විශාල වශයෙන් සිදුවී ඇතැයි දැන ගන්නට ලැබුණු විට එම ඇළේ අළුත් මැනුම ප්‍රයෝජනයට ගත යුතුය. ඇමුණුම 02 හි සඳහන් නිදර්ශනය බලන්න.

9.73. යම්කිසි ඇළක් කෘතිම ලෙස විශාල වශයෙන් වෙනස් වී තිබෙන බව දැන ගන්නට ලැබුණහොත් හා අයුතු ලෙස වෙනස් කර ඇතැයි සැක කරනු ලැබුවහොත් ඇළේ පැරණි මායිම අධිස්ථාපනය කර එයට වෙනම කැබලි අංකයක් යෙදිය යුතුය.

9.74. හිමිකම් පිඹුරක හෝ රේඛා චිත්‍රයක හෝ මායිමක් දිගේ හෝ ඒවා හරහා හෝ පාරක් වැටී තිබෙන විට පැරණි පාර අළුත් පාරට වඩා වෙනස් නම්, අළුත් පාරෙන් වෙනස් වූ පැරණි පාරට වෙනම කැබලි අංක යෙදිය යුතුය.

9.75. මාර්ග, අතුරු මාර්ග හා ඇළ ආදියෙහි නියම කොටස් හිමිකම් පිඹුරකට නැතහොත් රේඛා චිත්‍රයට ඇතුලත්ව තිබේ නම් ඒවාට වෙන් වෙන්ව කොටස් අංක යොදා "හි.පි. (TP) /රේඛාචිත්‍ර ..... යෙන් කොටසක් " යනුවෙන් ඉඩම් විස්තර ලැයිස්තුවේ විස්තර කළ යුතුය. ඇමුණුම 03 හි සඳහන් නිදර්ශනය බලන්න.

9.76. 'මාර්ග කොන්ත්‍රාත්තු පිඹුරුවල' දැක්වෙන මාර්ග මායිම් නිවැරදි මායිම් ලෙසට සැලකිය නොහැකි බැවින් ඒවා අළුත් මැනුම් වලට මාරුකර ගත යුතු නොවේ.

9.77. අළුත් මැනුමක් මෙම මාර්ග වලට යාවන විට 'මාර්ග කොන්ත්‍රාත්තු පිඹුරෙහි' අළුත් මැනුමේ ක්ෂේත්‍ර පත පිළිබඳව යොමු සටහනක් කළ යුතුය. අළුත් මැනුම මාර්ග කොන්ත්‍රාත්තු පිඹුරට මාරු නොකළ යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වන්නේ අළුත් ක්ෂේත්‍ර පත පිළිබඳව යොමු සටහනක් යෙදීම පමණි.

9.78. හැකි සෑම විටම අළුත් මැනුම් මාර්ග කොන්ත්‍රාත්තු මැනුම් කුඤ්ඤ වලට සම්බන්ධ කළ යුතුය.

9.79. 'මාර්ග කොන්ත්‍රාත්තු පිඹුරුවල' තිබී සොයා ගනු ලැබූ සෑම තදබල වරදක්ම පරීක්ෂා කර බලා සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයට වාර්තා කළ යුතුය.

9.80. දුම්රිය දෙපාර්තමේන්තුවට ඉඩම් අත්කර ගැනීමේ මුල් පිඹුරු වලට අයත් මායිම් අධිස්ථාපනය කොට භූමියෙහි ලකුණු කළ යුතුය. ලකුණු කරන ලද මායිම් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සිටුවන ලද රේල් පීලි මායිමට වෙනස් නම් එම මායිම නිවැරදිව ලකුණු කිරීමේදී දුම්රිය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකුට පෙනී සිටින්නට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී හරහා දැන්විය යුතුය.

පැරණි මායිම් භූමියෙහි ලකුණු කිරීම

9.81. අළුත් මැනුමක පිඹුරක් මත පෙන්වා ඇති මායිමක් භූමියෙහි ලකුණු කිරීමේදී පිඹුරෙන් මිමි පරිමාණය කරගෙන ඒවා භූමියෙහි පිහිටුවිය යුතුය. පරිමාණය කර ගත් මිමි ක්ෂේත්‍ර පොතේ පැන්සලෙන් ඇතුළත් කළ යුතුය. එම මිමි ආධාරයෙන් මායිම් පිහිටුවීම කළ යුතු අතර, මිනින්දෝරුවරයෙකු ඉදිරිපිටදී ඒවායෙහි මායිම්ගල් වැළලිය යුතුය.

9.82. ඉන්පසු නැවත පිහිටුවන මායිම්ගල් ක්ෂේත්‍ර පොතේ රතු පාටින් ලිවිය යුතුය. පිඹුරෙන් පරිමාණය කර භූමියෙහි ලකුණු කළ බව හැඟවීමට අනුලම්භ, සම්මත සළකුණු හා මායිම්ද රතු පාටින් පෙන්නුම් කළ

යුතුය. දම්වැල් රේඛා, දුර ප්‍රමාණ හා දිගංශ නැවත මනින ලද නම් ඒවා කළු හෝ නිල් පාටින් ලිවිය යුතුය.

9.83. බැවුම් රේඛා වලදී අනුගමනය කළ යුතු ක්‍රමය සඳහා ශිල්පීය උපදේශ පොතේ IV වැනි පරිච්ඡේදය බලන්න.

9.84. පිඹුරකින් සුළු දුර ප්‍රමාණ පරිමාණ කර ගැනීමට යාමේදී ඇතිවන දෝෂ නිසා පරිමාණ කර ගත් මිමි වලින් මායිම්ගලක් භූමියෙහි ලකුණු කරන විට එය භූමියෙහි දක්නට ලැබෙන සැබෑ නැතහොත් ප්‍රත්‍යක්ෂ මායිමේ නොවැටේ නම් එය භූමියෙහි දැක්වෙන නිවැරදි මායිමේ වළලා ඊට අනුලම්භයක් ගත යුතුය.

9.85. කුඤ්ඤයක් වෙනුවට මායිම්ගලක් වැළලීමේදී එය නිෂ්ක්‍රමණ ලක්ෂ්‍යයක් වශයෙන් ගත යුතුය. ඉන්පසු එයට අදාළ වන මැනුම් රේඛා නැවත මැන ඒවා අළුත් පිටුවක පෙන්නුම් කර යොමු සටහන්ද යෙදිය යුතුය.

9.86. හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර හා නිරවුල් කරන ලද මූලික පිඹුරු ආදියට අයත් ඉඩම්වල කලින් මායිම්ගල් සිටුවා තිබෙන විට රජයේ ඉඩම් වලට යාව තිබෙන පැරණි මායිම්ගල් නැවත මැනිය යුතුය. කැඩුණු හෝ නැතිවී තිබෙන හෝ මායිම්ගල් වෙනුවට අළුත් මායිම්ගල් සිටුවා පැරණි ක්ෂේත්‍ර පොතෙහි හා ක්ෂේත්‍ර පත්‍රයෙහි ඒ සම්බන්ධයෙන් සටහනක් කළ යුතුය.

9.87. පැරණි මායිම්ගල් රාශියක්ම තිබෙන විට ඒවායින් ස්වල්පයක් පමණක් මැන, ඉතිරි මායිම්ගල් ක්ෂේත්‍ර පොතෙන් බලා පිඹුරෙහි ලකුණු කළ හැකිය. එහෙත් සියළුම මායිම්ගල් භූමියෙහි ඇත්දැයි පරීක්ෂා කර බැලිය යුතුය.

අළුත් මායිම් භූමියෙහි ලකුණු කිරීම

9.88. අළුත් මායිම් හෝ වෙන් කළ බිම්, කොටස් කරන ඉඩම්, යනාදිය ලකුණු කිරීමේදී 9.84 – 9.87 ඡේදයන්හි විස්තර කර ඇති ක්‍රමයම අනුගමනය කළ යුතුය. එහෙත් අනුලම්භයන් හා මායිම් සටහන් කර ගැනීම සඳහා කළු හෝ නිල් තීන්ත භාවිතා කළ යුතුය.

9.89. රජයේ ප්‍රයෝජනය සඳහා වුවද, ඉඩමක් මැනීමේදී යාබදව තිබෙන ඉඩම් වලින් රජයට ඇති අවශ්‍යතාවයන් ගැන සලකා බලා මායිම් පැහැදිලිව භූමියේ ලකුණු කළ යුතුය.

අයුතු ලෙස අල්ලා ගැනීම්

9.90. සියළුම අයුතු ලෙස අල්ලා ගැනීම් සම්පූර්ණයෙන්ම මායිම්ගල් සිටුවා ලකුණු කළ යුතුය.

9.91. අයුතු ලෙස අල්ලා ගන්නා ලද මෙවැනි ඉඩම් කොටස් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ/ ප්‍රාදේශීය ලේකම්ගේ තීරණය පරිදි කටයුතු කළ යුතුය. අයුතු ලෙස ඉඩම් ඇඳා ගන්නා අයට දඬුවම් නොලබා එසේ කළ නොහැකි බව අවබෝධ කර දිය යුතුය.

9.92. මායිම්ගල් යෙදූ මායිම් වලට පිටතින් අයුතු ලෙස අල්ලා ගන්නා ලද කුඩා ඉඩම් කොටස් තිබෙන විට, මිනින්දෝරුවරු විසින් අයුතු ලෙස ඉඩම් අල්ලාගෙන සිටින්නන්ට ඒවා අත්හැර දමන ලෙස කියා සිටිය යුතුය. ඊට එකඟ වුවහොත් ඒ සම්බන්ධයෙන් තව දුරටත් කටයුතු කිරීමට අවශ්‍ය නොවන්නේය. එවිට අයුතු ලෙස අල්ලා ගන්නා ලද ඉඩම් පිඹුරෙහි දැක්වීමද අනවශ්‍ය වේ. අයුතු ලෙස ඉඩම් අල්ලාගෙන සිටින්නන් විසින් ඔවුන්ගේ මායිම් අතහැර දැමීමට ප්‍රතික්ෂේප කරන විට එම

මායිම සඳහා සම්පූර්ණ වශයෙන්ම මායිම්ගල් පිහිටුවා බිම් කැබලි අංක යොදා සම්පූර්ණ කරන ලද පිඹුරු සමඟ අයුතු ලෙස අල්ලා ගැනීම් පිළිබඳව වාර්තාවක්ද ඉදිරිපත් කළ යුතුය.

9.93. නිසැකවම වටිනා ඉඩම් තිබෙන ස්ථාන වල, එනම් නගර, කඩවීදි ආදියෙහි තිබෙන අයුතු ලෙස අල්ලා ගන්නා ලද ඉඩම් කොටස් වලට වෙනම කැබලි අංක යෙදිය යුතුය. අවශ්‍ය නම් ඒවා විශාල පරිමාණයකින් අතුරු පිඹුරක් වශයෙන් ඇඳ දැක්විය යුතුය.

9.94. මාර්ග හා අතුරු මාර්ග වලට අයත් පැරණි වෙන්කළ ඉඩම් ඇතුලත පිහිටි අයුතු ලෙස අල්ලා ගනු ලැබූ ඉඩම් කොටස් රජයේ ඉඩම් ලෙස සලකනු ලැබේ. එවැනි ඉඩම් කෙළවරවල මායිම්ගල් වැළලිය යුතුය.

9.95. මායිම්ගල් වළලා ඇළවල් සඳහා වෙන්කර තිබෙන භූමි ප්‍රදේශ තුළ අයුතු ලෙස අල්ලා ගන්නා ලද කොටස් හා 1995-07-12 වැනි දින හෝ ඉන් පසුව හෝ අයුතු ලෙස අල්ලා ගනු ලැබූ බිම් කොටස් බදු දීම නැතහොත් ඒවායින් නෙරපා හැරීම සඳහා ඒවාට කැබලි අංක යොදා ඒවායෙහි ඉහත සඳහන් කළ පරිදි මායිම්ගල් වැළලිය යුතුය. මායිම්ගල් නොසිටවූ වෙන් කරන ලද භූමි ප්‍රදේශ වලින් 1995-07-12 දිනට කලින් අයුතු ලෙස අල්ලා ගන්නා ලද කොටස් ප්‍රාදේශීය ලේකම් විසින් විකල්ප වශයෙන් ක්‍රියා කිරීමට හැකිවන පරිදි සම්පූර්ණයෙන්ම භූමියෙහි ලකුණු කළ යුතුය.

9.96. මනිනු ලබන මැනීමේ නියමයන් අසල අයුතු ලෙස අල්ලා ගන්නා ලද ඉඩම් කොටස් රාශියක් තිබේ නම්, ඒ බව මිනින්දෝරු අධිකාරිට වාර්තා කළ යුතුය. මැනුම කරගෙන යන අවස්ථාවේ බාධා පැමිණේ නම් අයුතු ලෙස අල්ලා ගනු ලැබූ කොටස් මැනීමට භාර නොගත යුතුය. මෙවැනි අවස්ථාවකදී ඊට අදාළ විස්තර වාර්තා කර අනුරේඛනයක් යැවිය යුතුය.

9.97. අයුතු ලෙස අල්ලා ගනු ලැබූ ඉඩම් වල මායිම් හැකි පමණ ඍජු කළ යුතුය.

9.98. පැරණි මායිම්ගල් නියම මායිමෙන් ඕනෑකමින් වෙනස් කර අයුතු ලෙස අල්ලා ගනු ලැබූ ඉඩමක මායිමෙහි සිටුවා තිබෙන බව දැනගන්නට ලැබුනහොත් ඒවා මැන පිඹුරෙහි පෙන්නුම් කළ යුතුය. අයුතු ලෙස අල්ලා ගනු ලැබූ කොටසේ මායිම් වල සම්පූර්ණයෙන්ම මායිම්ගල් යොදා ඒ පිළිබඳ වාර්තාවක් සම්පූර්ණ කරන ලද පිඹුරු සමඟ එවිය යුතුය.

9.99. විශේෂයෙන්ම, අයුතු ලෙස අල්ලා ගනු ලැබූ විශාල ඉඩම් කොටසක නොයෙකුත් වයස් සීමා වලට අයත් වැවිලි වර්ග තිබේ නම්, එක් එක් වැවිලි වර්ගය සඳහා හැකි සෑම අවස්ථාවකදීම වෙනම කැබලි අංක යෙදිය යුතුය.

9.100. මායිම් නියම කිරීමේ මැනුම් වලදී අයුතු ලෙස අල්ලා ගනු ලැබූ ඉඩම් කොටස් මැනීමේ විශේෂ උපදෙස් සඳහා **8.22 වැනි ඡේදය** බලන්න.

මගේ අංකය:.....
ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය,
.....
.....
.....දින

.....මයා/මිය/මෙනවිය

මහත්මයාණෙනි/මහත්මියෙනි,

මැනුම් කටයුතු කිරීම සඳහා ඉඩමේ මායිම් පෙන්වා දීමට /තොරතුරු සැපයීමට කරනු ලබන දැනුම් දීමයි
(..... ප්‍රා. ලේ. ගේ අංක ..... සහ ..... දින දරණ මැනුම් ඉල්ලීම)
(ස.ජ. ගේ අංක: .....)

.....(මැනුම අවශ්‍ය කාරණය).....සඳහා ..... ගමේ පිහිටි ..... නමැති ඉඩමේ මැනුම් කටයුතු කිරීමට .....ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කර ඇති ඉහත සඳහන් මැනුම් ඉල්ලීම සම්බන්ධයෙනි.

එම මැනුම් කටයුතු වලදී අදාළ ඉඩමේ මායිම් පෙන්වා දීමට සහ ඊට අදාළ තොරතුරු ලබා දීම සඳහා ..... ප්‍රාදේශීය ලේකම් විසින් ඔබ නම් කර ඇත.

මා සහ මාගේ කණ්ඩායම .....දින එම මැනුම් කටයුතු සඳහා එකී ඉඩමට පැමිණෙන බැවින් එදින පෙ.ව./ප.ව. .....ට ඉඩමේ පෙනී සිටින ලෙස මෙයින් ඔබට දන්වා සිටිමි.

කරුණාකර මෙය ලද බව, මෙම ලිපියේ දෙවන පිටපතේ පහලින් සඳහන් කර ඔබගේ අත්සන යොදා ආපසු මා වෙත එවන්න.

.....(අත්සන).....
.....(නම).....
රජයේ මිනින්දෝරු


DSR
Appendix 1
A
Claimed on TP 92434
Claimed on TP 92433
Claimed on TP 92433
NOTE
Fixation position of old stream shown in
Neutral Tint should be in pencil on the Plan

9.75 ඡේදය ඇමුණුම 03



ශුද්ධි පත්‍රය

ශුද්ධි පත්‍රය

10 වැනි පරිච්ඡේදය

වෙන් කළ බිම්

පටුන

දෙ.මැ.රෙ . යොමුව	විස්තරය	පිටුව
	වෙන් කළ බිම් පිළිබඳ අර්ථ දැක්වීම	
10.1.	වෙන්කළ බිම් පිළිබඳව නීතිමය අර්ථ දැක්වීම්	1
	ඇළ සහ ජල මාර්ග සඳහා වෙන් කළ බිම්	
10.2.	ස්වභාවික ඇළ සඳහා වෙන් කළ බිම්	1
10.3.	කෘත්‍රිම ඇළ හා ජල මාර්ග සඳහා වෙන් කළ බිම්	2
10.4.	ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති තුල වෙන් කළ බිම්	2
	විවිධ දෙපාර්තමේන්තු සතු ඉඩම් සඳහා වෙන්කළ බිම්	
10.5.	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	2
10.6.	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	2
10.7.	වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව	3
10.8.	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	3
10.9.	ලංකා විදුලි බල මණ්ඩලය	3
10.10.	ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය	3
	මාර්ග සහ මංමාවත් සඳහා වෙන් කළ බිම්	
10.11.	ශ්‍රේණිගත කරන ලද මාර්ග සඳහා වෙන් කළ බිම්	4
10.12.	ප්‍රසිද්ධ පාරවල් සඳහා ආඥාපනත	4
10.13.	මාර්ගවල තියුණු වංගු හැඩ කිරීම	4
10.14.	නාගරික සංවර්ධන අධිකාරි පනතේ නියෝග 32 අනුව කටයුතු කිරීම	4
10.15.	අඩිපාර සඳහා වෙන්කළ බිම්	4
10.16.	ජනපද තුල ප්‍රවේශ මාර්ග	4
10.17.	ගම් පුළුල් කිරීම යටතේ ප්‍රවේශ මාර්ග වල පළල	4
10.18.	මාර්ග තුලට අයත්වන අවසන් නිවේදනය නිකුත් කළ හෝ රජයේ බිම් කැබලි සම්බන්ධව ක්‍රියා කිරීම	5
10.19.	මාර්ග සඳහා වෙන් කරන ලද බිම් තීරුව දිගේ ඉදිකිරීම් සඳහා මැනීම	5
10.20.	ප්‍රවේශ මාර්ග සහ වෙන්කළ බිම් පිඹුරුවල දැක්වීම	5
	වැව් සඳහා වෙන්කළ බිම්	
10.21.	විවිධ වැව් සඳහා වෙන්කළ බිම්	5
10.22.	වැව් බැම්මේ මායිමට මායිම්ගල් දැමීම	5
10.23.	සම්පූර්ණ ජල මට්ටම නීර්ණය කිරීම	5
10.24.	සම්පූර්ණ ජල මට්ටම පිහිටු වීම	5
10.25.	වැව් බැම්ම සඳහා වෙන් කළ බිම්	5
	දුම්රිය මාර්ග සඳහා වෙන්කළ බිම්	
10.26.	දුම්රිය මාර්ග සඳහා වෙන් කළ බිම්	6
10.27.	දුම්රිය මාර්ග සඳහා වෙන් කළ බිම් මැනීම	6
	නද බෑවුම් සහිත ඉඩම් වලට යාව තිබෙන කුඹුරු	
10.28.	කුඹුරු සහ යාව ඇති බෑවුම් ඉඩම් සඳහා වෙන් කළ බිම්	6

දෙ.මැ.රෙ . යොමුව	විස්තරය	පිටුව
	අම්බලම්, ළිං, උල්පත්	
10.29.	උල්පත්, ළිං සහ අම්බලම් සඳහා වෙන් කළ බිම්	6
	සුසාන භූමි, පොදු හෙවත් සනීපාරක්ෂක කටයුතු සඳහා වෙන් කළ බිම් (නිස් බඹ)	
10.30.	ප්‍රජා සෞඛ්‍ය ස්ථාන හා සුසාන භූමි සඳහා වෙන් කළ බිම්	6
	ප්‍රවේශ මාර්ග සඳහා වෙන් කළ බිම්	
10.31.	ප්‍රවේශ මාර්ග සඳහා මැනුම්	6
10.32.	හුදෙකලාවූ රජයේ ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග වෙන් කිරීම	7
10.33.	යාබද පුද්ගලික ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග වෙන් කිරීම	7
	භූමික පාලන ලක්ෂ්‍ය	
10.34.	සියළුම ආකාරයේ පාලන ලක්ෂ්‍ය සඳහා වෙන් කළ බිම්	7
	නාගරික සංවර්ධන අධිකාරියට අදාළ ප්‍රදේශ තුළ සිදු කරන මැනුම්	
10.35.	නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් මැනීම	7
10.36.	නාගරික සංවර්ධන අධිකාරියේ 1978 අංක 41 දරණ පනතේ 22(1) නියෝග අනුව සංවර්ධන ප්‍රදේශ තුල පැවතිය යුතු අවම බිම් ප්‍රමාණය	7
10.37.	නාගරික සංවර්ධන අධිකාරියේ 1978 අංක 41 දරණ පනතේ නියෝග 17(1) යටතේ මැනුම් කිරීම	7
	මහවැලි ප්‍රදේශ තුළ සිදුකරන මැනීම්	
10.38.	මහවැලි ප්‍රදේශ තුල ඉඩම් මැනීම	8
	වෙනත් වැදගත් වන කරුණු	
10.39.	වෙන් කළ බිම් සඳහා සාමාන්‍ය ක්‍රියා දාමය	8
10.40.	මීටර් 1500 න් පහල වෙන් කළ ඉඩම්	8
10.41.	මීටර් 1500 දේශගුණික සමෝච්ඡ ස්ථාන ලකුණු කිරීම	8
10.42.	සංරක්ෂිත බිම් සඳහා වෙන් කළ බිම්	8
10.43.	සංරක්ෂිත ඉඩම් මැනීම සම්බන්ධව කටයුතු කිරීම	9
10.44.	උල්පත් ඉඩම් සම්බන්ධව කටයුතු කිරීම	9
10.45.	ප්‍රධාන මාර්ග වලට යාබද ඉඩම් කට්ටි කැඩීම	9
10.46.	ප්‍රධාන මාර්ග වලට යාබද ඉඩම් කට්ටි කැඩීමේ ක්‍රියාවලිය	9
10.47.	බස්නාහිර පළාත තුල ඇළ රක්ෂිත වෙන් කිරීම	9
	ඇමුණුම්	
ඇමුණුම 01	වෙරළ කලාපය තුල පසසිටු ප්‍රදේශවල සාපේක්ෂ පිහිටීමේ දළ සැලැස්මක් හා මුළු පසසිටු දුර	10

10 වැනි පරිච්ඡේදය

වෙන් කළ බිම්

වෙන් කළ බිම් පිළිබඳ අර්ථ දැක්වීම

10.1. වෙන්කළ බිම් පිලිබඳව නීතිමය අර්ථදැක්වීම් කරුණු 1947 අංක 8 දරණ රජයේ ඉඩම් ආඥාපනතේ 49, 50, 55, 101, 102 සහ 103 වගන්ති වලින් හා එම වගන්ති වලට අදාළව 1948 ඔක්තෝබර් 15 අංක 9912 දරණ ගැසට් පත්‍රයේ පලවූ නියෝග අංක 11, 22 මඟින් ආවරනය වී ඇති අතර රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ 227 සිට 230 ඡේද වලින් තවදුරටත් පැවතිය යුතු ආකාරය විස්තර කර ඇත. මීට අමතරව 1861 අංක 10 දරණ ප්‍රසිද්ධ පාරවල් පිළිබඳ අඥාපනත, 1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥාපනත, 1937 අංක 02 දරණ සත්ව හා ශාක ආරක්ෂා කිරීමේ පනත, 1940 අංක 24 දරණ පුරාවිද්‍යා සංරක්ෂණ පනත, 1962 අංක 12 දරණ සුසානභූමි හා වැලලීමේ ආඥාපනත, 1982 අංක 52 දරණ පනතින් සහ 1976 අංක 27 දරණ නීතියෙන් සංශෝධිත 1968 අංක 15 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනත, 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත, 1985 වෙරළ සංරක්ෂණ පනත සහ 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතින් යන අණපනත් වලින්ද ඒ ඒ කාර්යයන්ට අදාළව වෙන්කළ බිම් පිහිටුවීමට අදාළ නීති රෙගුලාසි පිහිටුවා ඇත.

පෞද්ගලික ඉඩම් හෝ පැරණි වගාවන් හෝ අත්කර ගැනීම සඳහා මනින ලද ඉඩම් තුල, විශේෂ උපදෙස් දී ඇති අවස්ථාවක විනා, අන් කිසිවිටෙක වෙන් කළ බිම් ලකුණු නොකළ යුතුය.

ඕනෑම රජයේ ඉඩම් බැහැර කිරීමකදි මෙහි සඳහන් පරිදි වෙන් කළ බිම් ලකුණු කළ යුතුය. අනිකුත් සියළුම වෙන්කළ බිම් ලකුණු කිරීම්, ඒ ඒ අවස්ථාවලදී පළාත් පාලන ආයතන වලින් පනවන රෙගුලාසි වලට අනුකූලව සිදු කළ යුතුය.

ඇළ සහ ජල මාර්ග සඳහා වෙන් කළ බිම්

10.2. (අ) ස්වභාවික ඇළ සඳහා පහත සඳහන් වන වෙන් කළ බිම් තැබිය යුතුය.

පතුලෙහි පළල	**ඉවුරේ සිට වෙන් කළ බිමේ පළල**
මීටර් 3 ට අඩු නම්	මීටර් 05 බැගින් දෙපසටම
මීටර් 3 සිට 8 දක්වා	මීටර් 10 බැගින් දෙපසටම
මීටර් 8 සිට 15 දක්වා	මීටර් 20 බැගින් දෙපසටම
මීටර් 15 සිට 22 දක්වා	මීටර් 40 බැගින් දෙපසටම

වැහි කාලයෙහි පමණක් වතුර තිබෙන වියළි ඇළ වලට ඉහත සඳහන් නියමිත අඩුම වෙන් කළ බිම් පළල තැබිය යුතුය. වැඩි විස්තර සඳහා 1947 අංක 8 දරණ රජයේ ඉඩම් ආඥාපනතෙහි 228 වන කොටසෙහි සඳහන්ව ඇත.

(ආ) ජල මූලාශ්‍ර සඳහා චතුරස්‍රාකාරව වෙන් කළ බිම් වෙන් කර තැබිය යුතුය.

(ඇ) මීටර් 15 ට වැඩි ප්‍රධාන ගංගා සඳහා මීටර 60 බැගින් දෙපසටම වෙන් කළ බිම් වෙන් කර තැබිය යුතුය.

10.3. කෘත්‍රිම ඇළ හා ජල මාර්ග සඳහා පහත සඳහන් පරිදි වෙන් කළ බිම් විය යුතුය.

පතුලෙහි පළල	**කණ්ඩියේ පාමුල සිට හෝ කැපීමේ පිට මායිමේ සිට**
මීටර් 3 හා ඊට වැඩි	මීටර් 15 ට නොඅඩුව දෙපසටම
මීටර් 1.5 - මීටර් 3	මීටර් 8 ට නොඅඩුව දෙපසටම
මීටර් 1.5 ට අඩු	මීටර් 3 ට නොඅඩුව දෙපසටම

කෙත් වලට වතුර සැපයීමක් නොකර, වතුර අපතේ යන පරිදි, ගලා යන වාන් ඇළ හා පිට ඇළ සඳහා වෙන් කළ බිම් අවශ්‍ය නොවේ.

10.4. ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම තුල, වාරි මාර්ග දෙපාර්තමේන්තුව / මහවැලි අධිකාරිය වැනි ආයතන විසින් පිළියෙල කරනු ලබන කට්ටි කැඩීමේ සැලසුම් වල පෙන්වා ඇති පරිදි වෙන්කළ බිම් යෙදිය යුතුය.

විවිධ දෙපාර්තමේන්තු සතු ඉඩම් සඳහා වෙන්කළ බිම්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

10.5. 1937 අංක 02 දරණ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ පහත දැක්වෙන ස්ථාන ජාතික වෙන්කිරීම් ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පනවා ඇත.

i) තහනම් අඩවියක්
ii) ජාතික උද්‍යානයක්
iii) ස්වාභාවික රක්ෂිත භූමියක්
iv) වන පිවිසුමක්
v) සමුද්‍රිය ජාතික උද්‍යානයක්
vi) සමුද්‍රිය රක්ෂිත ප්‍රදේශයක්

සියළුම වෙන්කරන ලද මායිම් වල සිට කිලෝමීටර් 1.6 ක දුර ප්‍රමාණයක ඉදිකිරීම් කටයුතු තහනම් හෝ සීමිත වෙයි. මෙම සියළුම වෙන්කළ බිම් රජයට අයත් වේ.
අභයභූමි ලෙස පනවා ඇති ස්ථාන රජයේ හෝ පුද්ගලික විය හැක. මැනුම මෙම ස්ථානයකට ආසන්නයෙන් වැටී ඇත්නම් අදාළ ආයතන හා සම්බන්ධ වී උපදෙස් ලබා ගත යුතුය.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

10.6. පහත ප්‍රඥප්ති දෙක මඟින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනය වේ.

1. වන සංරක්ෂණ ආඥාපනතෙන් ප්‍රදේශ 4 ක් ආවරණය වේ. (1907 අංක 16)
   i) සංරක්ෂණ වනාන්තර
   ii) රක්ෂිත වනාන්තර
   iii) ගම්බද වනාන්තර
   iv) වෙනත් රජයේ වනාන්තර

2. ජාතික උරුම වන භූමි පනත - 1988 අංක 03

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

10.7. රටේ වෙරළබඩ ප්‍රදේශය සඳහා භාවිතා වන ආරක්ෂක කලාප වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කර ඇත.
දිවයිනේ සමස්ත වෙරළ කලාපයේ වෙනස් වන දිග ප්‍රමාණවලින් යුත් කොටස් 105 කට බෙදා ඇත. මෙම එක් එක් කොටස් වල මුළු පසසිටු දුර (මුළු රක්ෂිත දුර) නම්කර ඇත. එක් එක් මුළු පසසිටු කොටස තවදුරටත් උපකොටස් දෙකකට බෙදා ඇති අතර වෙරළට ඉතාම සමීප කොටස "වෙන්කළ ප්‍රදේශය" වන අතර, අනෙක් කොටස "සීමා කළ ප්‍රදේශය" වේ. (වෙරළ කලාපය තුල පසසිටු ප්‍රදේශවල සාපේක්ෂ පිහිටීමේ දළ සැලැස්මක් හා මුළු පසසිටු දුර (මුළු රක්ෂිත දුර) "වෙන්කළ ප්‍රදේශය" හා "සීමා කළ ප්‍රදේශය" සඳහා වන දුරවල් **ඇමුණුම 01** හි දක්වා ඇත. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති භූමිය තුළ මැනුම් වැඩ යෙදී ඇත්නම් තවදුරටත් සංවර්ධන කටයුතු වලට යොදා ඇති අමතර නියෝග සම්බන්ධව එම ආයතනයෙන් විමසීමක් කළ යුතුය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

10.8. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් වෙන් කරන ලද පුරාවිද්‍යා වැඩබිම් කිහිපයක් සහ ආරක්ෂිත ස්මාරකයන් ප්‍රකාශයට පත් කර ඇත.

1940 පුරාවිද්‍යා සංරක්ෂණ පනතේ 24 වෙනි කොටස අනුව පුරාවිද්‍යා ස්මාරකයකට ආරක්ෂිත කලාපයක් වශයෙන් මීටර් 370 ක් (යාර 400 ක් පමණ) වෙන් කළ යුතුය. මෙම ආරක්ෂිත කලාපය තුළ සියළුම ඉදි කිරීම් එනම් ගොඩනැගීම්, පතල් කැණීම් හා ගල් කැඩීම් සම්පූර්ණයෙන් තහනම්ය.
(සියළුම පුරාවිද්‍යා වෙන් කිරීම් හා ආරක්ෂිත ස්මාරක පනතේ 24 වැනි කොටසේ ලැයිස්තුගත කර ඇත. වැඩි විස්තර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතුය.

ලංකා විදුලි බල මණ්ඩලය (ලං.වි.ම)

10.9. අධි බලැති විදුලි රැහැන් සඳහා වෙන් කළ බිම් :-
ප්‍රධාන ජාල රේඛාවලට පහතින් වෙන් කරන ලද විශේෂිත වූ ඉඩම් පටිය තුළ සියළුම ඉදිකිරීම් සඳහා උස පිළිබඳ සීමාවන් ලංකා විදුලි බල මණ්ඩලය විසින් පනවා ඇත.

33,000KV සහ 11,000 KV සඳහා	- අඩි 30. (10m)
132,000KV සහ 220,000 KV සඳහා	- අඩි 120. (40m)

වෙන්කළ බිමේ හි පළල ලංකා විදුලි බල මණ්ඩලය තීරණය කරනු ලබයි.

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ 38 නියෝගය අනුව ගොඩනැගිලි උඩින් හෝ ගොඩනැගිලි අතරින් ඇද ඇති විදුලි රැහැන් අඩුසැර වෝල්ටීයතා විදුලි රැහැන් (අවශක මතාවී විදුලි රැහැන්) වන්නේ නම් සිරස්ව යටත් පිරිසෙයින් මීටර් 2.5 ක් සහ තිරස්ව මීටර් 1.5ක් ද, මධ්‍යම වෝල්ටීයතා විදුලි රැහැන් (අතිශක මතාවී විදුලි රැහැන්) වන්නේ නම් සිරස්ව යටත් පිරිසෙයින් මීටර් 4.5ක් සහ තිරස්ව මීටර් 2.5 ක් ද විය යුතුය.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය. ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය

10.10. අදාළ ආයතනයන් (ටෙලිකොම්,ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය) පාලනය කරනු ලබන වෙන් කළ බිම් ඒවා පාලනය වන අණ පනත් වලට අනුකූල විය යුතුය.

මාර්ග සහ මංමාවත් සඳහා වෙන් කළ බිම්

10.11. 2008 අංක 40 දරණ මංමාවත් පනතේ විධිවිධානයන් බල පැවැත්වෙන පරිදි මාර්ග වල ආරක්ෂාව හෝ ප්‍රතිලාභ සඳහා රක්ෂිත වෙන් කර තැබිය යුතුය. මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත්බද මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පවත්වාගෙන යන A, B, C, D, E වශයෙන් ශ්‍රේණිගත කරන ලද මාර්ග සඳහා වෙන් කළ බිම් යෙදීමේදී අදාළ ආයතනයේ සහාය ලබාගත යුතුය.

10.12. **1861 අංක 10 දරණ ප්‍රසිද්ධ පාරවල් පිළිබඳ ආඥාපනතට අනුව පාරවල් පිළිබඳව මූලික නීතිය ;** "භුක්තියට සවිවීමේ ආඥාපනතේ විධිවිධාන හෝ පරිහරණය කිරීමේ බලය නැතහොත් අයිතිවාසිකම් කීමේ බලය මත පාරවල් අත්කර ගැනීම සම්බන්ධ වෙන කිසියම් නීති හෝ පාරවල් කෙරෙහි බලපානු නොලබනු අතර මෙම ආඥාපනත ක්‍රියාත්මක වීමට පෙර හෝ පසුව හෝ කිසියම් පුද්ගලයකු විසින් පාරක් පිළිබඳ කුමන ආකාරයක අයිතිවාසිකමක් කියා සිටීමේ හෝ පරිහරණය කිරීමේ හෝ යන හේතු නිසා එහි ඕනෑම කොටසක තනි අයිතිවාසිකම පිළිබඳ හිමිකමට භුක්තියට පරිහරණය කිරීමට කිසියම් පුද්ගලයකුට හිමිකම් නොමැත."

10.13. අඩි පාර ඇතුලත්ව සියළුම ආකාරයේ මාර්ග වල මංසන්ධි වල තිබෙන තියුණු වංගු නැති කර දැමීම පිණිස වෙන් කළ බිමෙහි මුළු පලලින් 1/4 ක් පංගුවක් හෝ ඊට වැඩියෙන් ඇතුලට හැඩ කළ යුතුය. එවිට කැපී යන කුඩා ත්‍රිකෝණ වෙන් කළ බිමට ඇතුලත් කළ හැකිය.

10.14. 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 32 වන නියෝගය අනුව වීථි දෙකක් හමුවන මුල්ලක ඉදිකරනු ලබන ගොඩනැගිලි, ඒවායේ මායිම් තාප්ප සහ වැටවල්ද ඇතුළුව, වීථි පරිහරණය කරන්නන්ගේ ආරක්ෂාව සැලසීමට අවශ්‍ය වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් නියම කරනු ලබන දුරකට හා උසකට රවුම් කළ යුතුය. ඒ අනුව නගරවල තිබෙන වීථි කොන්වලදී තියුණු වංගු රවුම් කළ යුතුය.

10.15. අඩිපාර සඳහා වෙන් කළ බිම් හැකි සෑම විටම සෘජු කොටස් ලෙස පිහිටුවිය යුතුය. ඉන් පසු වෙන් කළ බිමට අනුකූල වන පරිදි, අඩි පාර සකස් කළ හැකිය. එහෙත් මනින විට පවත්නා මාර්ගය තිබෙන පරිදිම මැන පිඹුරෙහි පෙන්නුම් කළ යුතුය. එහෙත් කදු සහිත ප්‍රදේශයක යෝජනා කරන ලද පාරක් යෝජිත පරිදි, ඉදිකළ හැකිදැයි ප්‍රවේශමෙන් සොයා බැලිය යුතුය.

10.16. ජනපද පිහිටුවීමේ යෝජනා ක්‍රම තුල මාර්ග සඳහා පහත දැක්වන පළල තැබිය යුතුය.

(අ) ප්‍රධාන ප්‍රවේශ මාර්ග සඳහා - මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 10 බැගින්

(ආ) පළමුවන පංතියේ කට්ටි කිරීමේ පිඹුරු වල අභ්‍යන්තර මාර්ග සඳහා මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 5 බැගින්. (මේවායින් දැක්වෙනුයේ ප්‍රධාන ප්‍රවේශ මාර්ග වලින් යෝජනා ක්‍රම හරහා යන ප්‍රධාන මාර්ගයන්ය.)

(ඇ) අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග සඳහා මීටර් 5 යි. (මෙම මාර්ග, ප්‍රධාන මාර්ග නැතහොත්, ප්‍රධාන ප්‍රවේශ මාර්ග වලින් බෙදී බිම් කට්ටි වලට ප්‍රවිෂ්ඨ වීම සඳහා වේ).

නාගරික සංවර්ධන ප්‍රදේශය තුල ප්‍රවේශ මාර්ග සඳහා 10.31 ඡේදය බලන්න

10.17. විශේෂ අවස්ථා වලදි හැර, ගම් පුළුල් කිරීම සඳහා අත්කර ගත් ඉඩම් වල ප්‍රවේශ මාර්ග වල අවම පළල මීටර් 5 ක් විය යුතුය.

10.18. ඕනෑම පැරණි පිඹුරක පෙන්වා තිබෙන වෙන් කළ බිම් පෞද්ගලික දේපලට යාව තිබේ නම්, ඒවා භූමියේ ලකුණු කළ යුතු අතර, අවශ්‍ය ස්ථානවල මායිම්ගල් සිටුවිය යුතුය.

10.19. මාර්ග සඳහා වෙන් කළ බිම් තුල වැටෙන සියළුම ගොඩනැගිලි නිර්මාණයන් සහ බිත්ති මැන සම්පූර්ණයෙන් විස්තර කළ යුතුය.

10.20. පාර, අඩි පාර සහ ඊට වෙන්කළ බිම් තීරුව අවශ්‍යනම් වෙන් වශයෙන් ඇඳ පෙන්විය හැක. නමුත් වෙන වෙනම කැබලි අංක නොයෙදිය යුතු අතර එක් කැබලි අංකයක් දිය යුතුය.

වැව් සඳහා වෙන්කළ බිම්

10.21. (අ) වැව් සඳහා වෙනමම වෙන්කළ බිමක් ඇතිකරනු නොලැබේ. එහෙත් වැවෙහි මායිම් වශයෙන් උපරිම ජල මට්ටම පිහිටන මායිමේ සිට මීටර් 5 ක් ඇතින්ද , ප්‍රධාන වැව් සඳහා එය මීටර් 20 ක් ඇතින්ද ගනු ලැබේ.

(ආ) පාළු වැව් සඳහා උපරිම ජල මට්ටම පිහිටන මායිම ආරක්ෂාවෙන ආකාරයට, හිමිකම් පිඹුරු කැළෑ හා පැරණි වගාවන් සහිත ඉඩම් හැර අනිකුත් තැන්වලදී භූමියේ ලකුණු කළ යුතුය.

(ඇ) වැවේ උපරිම ජල මට්ටම පිහිටන මායිම ඇතුලත ඇති පෞද්ගලික හේන් ඉඩම් පිඹුරෙහි පෙන්වා එය භූමියෙහිද ලකුණු කළ යුතුය. එහෙත්, රජයේ හේන් ඉඩම් මැදින් එය පිඹුරෙහි පමණක් පෙන්නුම් කොට, භූමියෙහි ලකුණු නොකළ යුතුය.

(ඈ) ඉංජිනේරු මැනුම් සහිත ප්‍රදේශ තුල මැනීම කෙරෙන විට ඉහත කරන ලද ක්‍රමයම අනුගමනය කරනු ලැබේ. එහෙත් මායිම් භූමියෙහි ලකුණු කිරීමට අවශ්‍ය නොවූ තැන් වලදී ඉංජිනේරු මැනුමේ සමෝච්ඡ රේඛා වල ආධාරයෙන් මැනීමේ පිඹුරු වල මුද්‍රිත පිටපත් වල වැවේ උපරිම ජල මට්ටම අධිස්ථාපනය කොට දක්වනු ලැබේ. මැනුම කරනු ලබන මිනින්දෝරුවරයා විසින් එම වාර්තාවෙහි, කුමන සමෝච්ඡ රේඛාව උපරිම ජල මට්ටම වශයෙන් ආරක්ෂිතව ගත හැකි දැයි යන්න සඳහන් කළ යුතුය.

10.22. මායිමේ නැමි වලට මායිම්ගල් යෙදිය යුතුය. මායිම්ගල් දෙකක් අතර උපරිම දුර මීටර 100 නොඉක්මවිය යුතුය. ඉන්පසු, එම මායිම්ගල් මැනුම් උපකරණ ස්ථාන වශයෙන් ප්‍රයෝජනයට ගත යුතුය. මායිම ස්ථාන දෙකකදී පියවිය යුතුය. මෙම ස්ථාන දෙක නම්, වැව් බැම්ම දෙකෙළවර සිට මීටර් 10 ක් පමණ ඇතිනි. එසේ නැත්නම් බැම්ම කෙළෙවර වානක් ඇතිවූ විට ඊට ඇතිනි. මෙම ස්ථාන දෙක දළ වශයෙන් බැම්මේ දීර්ඝ කළ මධ්‍ය රේඛාව මත වැටෙනු ඇත. ශිල්පීය උපදෙස් පොතේ IV වැනි පරිච්ඡේදය බලන්න.

10.23. ඉහළ ජල මට්ටම නිශ්චය කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරිගේ හා ගම් වැසියන්ගේ සාක්ෂි ද ගංවතුර මට්ටම් ලකුණු ද සලකා බැලිය යුතුය. ඊට අමතරව කුඩා වැව් සඳහා වූ ඉහළ ජල මට්ටම නිශ්චය කර ගැනීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවද ප්‍රධාන වැව් සඳහා වූ ඉහළ ජල මට්ටම නිශ්චය කර ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවද විමසිය යුතුය.

10.24. ග්‍රාම නිලධාරිගෙන් හා ගම්වාසීන්ගෙන් ලබා ගත් සාක්ෂි වලට අමතරව විකෝණමානයක හෝ පූර්ණමානයක ආධාරයෙන් ආසන්නම සමෝච්ඡ රේඛාව නිශ්චය කර ගැනීමෙන් උපරිම ජල මට්ටම වානෙහි මට්ටමින් නිශ්චය කළ යුතුය.

10.25. කණ්ඩියෙහි මුදුනෙහි රේඛාවට ලම්භකව මනින ලද කණ්ඩියේ උස මෙන් ආසන්න වශයෙන් 15 ගුණයක් පමණ වන්නාවූ බිමක් වැව් කණ්ඩි වලට පහතින් වෙන් කළ බිමක් ලෙස ලකුණු කළ යුතුය.

ප්‍රමුඛ නැමිවල හා මීටර් 100 ට නොවැඩි පරතරයක් ඇතිව මායිම්ගල් දමා මෙය පිහිටුවිය යුතුය. උස මැනීම සඳහා පියගැට ක්‍රමය භාවිතා කළ හැකි අතර, ඊට අනුරූප වූ පළල ශිල්පීය උපදෙස් පොතේ IV වැනි පරිච්ඡේදයේ පෙන්වා දී ඇති පරිදි පිහිටුවිය යුතුය. එසේ පිහිටුවන ලද මායිමේ දෙකෙළවර ලක්ෂ්‍යයේ සිට, 10.22 වැනි ඡේදයෙහි විස්තර කරන පරිදි වැව් කණ්ඩියේ දීර්ඝ කරන ලද මධ්‍ය රේඛාවේ වැව් කණ්ඩියෙන් මීටර් 10 ට ඇතින් පිහිටුවන ලද ලක්ෂ්‍ය දෙකට වෙන් කළ බිමේ මායිම පියවිය යුතුය

දුම්රිය මාර්ග සඳහා වෙන්කළ බිම්

10.26. දුම්රිය මාර්ගය මධ්‍යගත වනසේ දුම්රිය මහකට මීටර් 40ක් ඇතුලත පිහිටි බිමක් රජයේ කටයුත්තක් හෝ වෙනයම් කටයුත්තක් හෝ සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය නොමැතිව අතුරු බෙදීම් නොකළ යුතුය. මේ සඳහා අනුරේඛනයක් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි මාර්ගයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

10.27. වෙන් කළ බිම යකඩ රේල් කණු සිටුවා භූමියෙහි ලකුණුකර තිබේ නම්, එය මැනිය යුතුය. එසේ නොමැති නම් ඒ සම්බන්ධයෙන් 10.26 ඡේදයෙහි උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

තද බෑවුම් සහිත ඉඩම් වලට යාව තිබෙන කුඹුරු

10.28. තද බෑවුම් සහිත ඉඩමෙන් වෙන්කළ බිම සලකුනු කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලා සිටියහොත් පමණකි. මිනින්දෝරුවරයාගේ අදහස පරිදි, වෙන් කිරීමක් අවශ්‍ය වන නමුදු, එය ඉල්ලා නොමැති නම්, ඒ බව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීම සඳහා මිනිදෝරු අධිකාරි වෙත දැනුම් දිය යුතුය.

අම්බලම්, ළිං, උල්පත්

10.29. මැනුම් ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදි අම්බලම්, ළිං, නැතහොත් උල්පත් ආරක්ෂා කිරීමට සැහෙන මායිම් ඒවා පිහිටි බිම්වල දක්නට නොලැබේ නම්, ඒ සඳහා අවශ්‍ය සෘජුකෝණාස්‍ර බිම් කැබලි ග්‍රාම නිලධාරි හා සාකච්ඡා කර බලා වෙන් කළ යුතුය.

සුසාන භූමි, පොදු හෙවත් සනීපාරක්ෂක කටයුතු සඳහා වෙන් කළ බිම් (නිස්බඹ)

10.30. වෙනත් ආකාරයක විශේෂ උපදෙස් නිකුත් නොකරන විට දැනට තිබෙන සුසානභූමි හා පොදු හෙවත් සනීපාරක්ෂක කටයුතු සඳහා වෙන් කරන ලද බිම් පමණක් මැනිය යුතුය.

වැඩි විස්තර සඳහා 1962 හි අංක12 දරණ සුසානභූමි හා වැලලීමේ ආඥාපනත බලන්න.

ප්‍රවේශ මාර්ග සඳහා වෙන් කළ බිම්

10.31. මැනීම කරන විට පවතින ප්‍රවේශ මාර්ග සියල්ලම මැනිය යුතුය. 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 16(2)(a) නියෝගය සඳහා වන III වන උප ලේඛනයේ (අ) ආකෘති පත්‍රයේ සඳහන් පරිදි නේවාසික සඳහා වූ ගොඩනැගිලි වලට වූ ප්‍රවේශ මාර්ගවල අවම පළල පහත පරිදි විය යුතුය.

පදිංචිය සඳහා ඒකක සංඛ්‍යාව	අවම පළල (මීටර්වලින්)	උපරිම දිග (මීටර්වලින්)
පදිංචි ඒකක 4ට අඩු	3.0	50
පදිංචි ඒකක 4 - 8 ට අඩු	4.5	100
පදිංචි ඒකක 8 – 20 ට අඩු	6.0	-
පදිංචි ඒකක 20ට වැඩි	9.0	-

1978 අංක 41 දරන නා.සං.අ. පනතේ 16(4) නියෝගය අනුව මීටර් 09 කට වඩා අඩු පළලකින් සහ මීටර් 30කට වඩා දිගකින් යුත් සෑම වීථියකම අවසන් වන කෙළවරේ විෂ්කම්භය මීටර් 09 කට නොඅඩු හැරවුම් වෘත්තයක් සඳහා භූමිය වෙන්කර තැබිය යුතුය.

10.32. රජයේ ඉඩම් කොටස් කිරීමේදී ප්‍රාදේශීය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ඕනෑම රජයේ ඉඩමකට ඇතුළුවීමට කරත්ත පාරක් නැතහොත් අඩි පාරක් පිණිස වෙන් කළ බිමක් මැන වෙන් කිරීමට කටයුතු කළ යුතුය.

10.33. සුපරීක්ෂාකාරීව සොයා බැලීමේදී යාබද පිහිටි ඕනෑම පෞද්ගලික ඉඩමකට ඇතුල්වීම සඳහා ප්‍රවේශ මාර්ගයක් අවශ්‍ය යැයි මිනින්දෝරුවරයාට පෙනී ගියහොත් රජයේ ඉඩමක් මැදින් ප්‍රවේශ මාර්ගයක් වෙන් කළ හැකිය.

භූමික පාලන ලක්ෂ්‍ය

10.34. සියළුම ආකාරයේ පාලන ලක්ෂ්‍ය සඳහා වෙන් කළ බිම් පොළවේ ලකුණු කිරීම හැකි සෑම විටම සිදු කළ යුතුය. විශේෂයෙන්ම මූලික සහ ද්විතියික ගණයේ පාලන ලක්ෂ්‍ය සඳහා එය පවතින ස්ථානය අනුව එහි ආරක්ෂාවට අවශ්‍ය අවම බිම් ප්‍රමාණය හැකි සෑම විටම වෙන් කළ බිමක් ලෙස ලකුණු කර පෙන්විය යුතුය. වෙන් කළ බිමෙහි ප්‍රමාණය තීරණය කිරීමේදී පාලන ලක්ෂ්‍ය පිහිටි ස්ථානයේ භූමියේ ස්වරූපය, පරිසරය, ගස් කොළන් යනාදියද සැලකිල්ලට ගත යුතුය.

නාගරික සංවර්ධන අධිකාරියට අදාළ ප්‍රදේශ තුළ සිදු කරන මැනුම්

10.35. නාගරික සංවර්ධන ප්‍රදේශය තුළ සිදු කරන මැනුම් තත්කාලීනව ක්‍රියාත්මක වන නාගරික සංවර්ධන අධිකාරියේ අණපනත් වලට අනුකූලව සිදු කළ යුතුය.

10.36. ජාතික සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වන වගන්තිය සඳහා වන නියෝගයක් ලෙස 1996 අගෝස්තු මස 06 වන දින අංක 935/6 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි අංක 22 (1) හි අතුරු බෙදීම් නියෝග ක්‍රියාත්මක කිරීමේදී අතුරු බෙදීමට ඇති ඉඩම හෝ බිම් කොටස හෙක්ටයාර් 1 ට වැඩිවන අවස්ථාවේදී, වීථි අත්හැරීමෙන් පසු, ඉඩමේ හෝ බිම් කොටසේ සියයකට දහයකට (10%) නොඅඩු බිම් ප්‍රමාණයක් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථානවලින් වෙන් කිරීමට කටයුතු කළ යුතු වන අතර ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් දක්වා ඇති කරුණු සඳහා ගැසට් පත්‍රයේ 22(1) පරීක්ෂා කර ඒ අනුව කටයුතු කළ යුතුය.

10.37. 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ නියෝග 17(1) සඳහා වන III වන උප ලේඛනයේ (ඇ) ආකෘති පත්‍රයේ පහත සඳහන් පරිදි නාගරික සංවර්ධන ප්‍රදේශය තුළ සිදු කරන මැනුම් වලදී පැවතිය යුතු ඉඩමේ අවම විශාලත්වය හා පළල පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

ගොඩනැගිල්ලේ ස්වාභාවය	භූමි භාගයේ අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්වලින්)	භූමි ප්‍රමාණයේ පළල (මීටර්වලින්)
පහත දැක්වෙන ගොඩනැගිලි හැර අන් සියළුම ගොඩනැගිලි	150	06
ජනයා රැස්වෙන ගොඩනැගිලි සහ පොදු ගොඩනැගිලි	300	12

මහවැලි ප්‍රදේශ තුළ සිදුකරන මැනීම්

10.38. මහවැලි ප්‍රදේශය තුළ සිදුකරන මැනුම් වැඩ වලදී, එය 1979 අංක 23 දරණ මහවැලි පනතට අනුකූලව සිදු කළ යුතුය.

වෙනත් වැදගත් වන කරුණු

10.39. වෙන් කළ බිම් හැකි පමණ කෙලින් තිබිය යුතු අතර ඒවා ඇළ, මාර්ග ආදියෙහි සාමාන්‍ය දිශාව මිස ඒවායෙහි කුඩා වංගු දිගේ නොගෙනිය යුතුය. මේ නිසා ඒවායෙහි පළල වෙනස් වන නමුදු, කිසිම ස්ථානයක ඒවායේ පළල නියම කරන ලද පළලට වඩා අඩු නොවිය යුතුය.

10.40. මීටර් 1,500 ට වඩා උස් වූ බිම් වෙන් කර තැබිය යුතුය. මෙම බිම් තුළ මැනුමක් කිරීම සඳහා කරන ඉල්ලීම් ඉටු කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් බලය දුන් විට පමණකි.

10.41. මීටර් 1,500 දේශගුණික සමෝච්ඡ රේඛාව මාර්ග හා අඩි පාර හරහා වැටෙන විට ඒවායේ ආසන්නතම පිහිටීම ලකුණු කිරීම සඳහා 3.1(iii) ඡේදයෙහි විස්තර කර තිබෙන විශේෂ මායිම්ගල් ප්‍රයෝජනයට ගත යුතුය. මීටර් 1,500 සමෝච්ඡ රේඛාවට අයත් සෙසු මායිම් වල මායිම්ගල් සිටුවීම, මායිම්ගල් සිටුවීමේදි අනුගමනය කරන සාමාන්‍ය පිළිවෙලටම කරගෙන යා යුතුය. මෙම රේඛාව පිහිටුවීම සඳහා කටයුතු කරගෙන යන විට ජ්‍යෙෂ්ඨ මිනිදෝරු අධිකාරි විසින් විශේෂ උපදෙස් නිකුත් කළ යුතුය.

10.42. වතුර බැස යාම වැළැක්වීමත්, පොළව යට ජලය රැස්වීම ආරක්ෂා කර ගැනීමත්, පස සේදී යාම හා පහත් ප්‍රදේශ පිරියැම වැළැක්වීමත් පිණිස ගොවිතැන් කිරීම හෝ තණබිම් ලෙස හෝ පහත දැක්වෙන බිම් බෙදා නොදිය යුතුය.

(1) ඉඩමේ සමෝච්ඡ රේඛාවලට ලම්බකව බෑවුම දිගේ ඉහළට සහ පහළට මීටර් 20 කට වැඩි දුර ප්‍රමාණයක බෑවුම් අංශක 30 කට වැඩි (=2 ට 1 හෝ 50%) බිම් : නැතහොත්

(2) තද බෑවුම් සහිත කැලෑවෙන් ගැවැසි කඳු හෝ වැටි සම්පූර්ණයෙන් හෝ මුදුන් පමණක් සහිත බිම් : නැතහොත්

(3) විශාල ගල් පර්වත හා භූමියෙහි උඩට නෙරාගිය ගල්පර සහිත ඉඩම් :නැතහොත්

(4) උල්පත් සහ ජල මූලාශ්‍ර හා ඒවායේ මාර්ග ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වූ බිම්.

10.43. ඉහත සඳහන් කළ ඉඩම් මැනීම සඳහා කරන ඉල්ලීම් සාමාන්‍යයෙන් ඉටු කරනු නොලැබේ. එතෙකුදු වුවත් මැන ගෙන යනු ලබන ඉඩමක යම්කිසි කොටසක් ඉහත සඳහන් නියෝගයේ කොන්දේසි වලට

අයත් වන බව පෙනී ගියහොත්, ඒ බව ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කර ඒ ඉඩමට වෙනම කැබලි අංකයක් යෙදිය යුතුය.

10.44. එසේ වෙන් කරනු ලැබූ කොටසක උල්පතක් තිබේ නම් හෝ එය මීටර් 40 ක දුර ප්‍රමාණයක් තුළ පිහිටියේ නම් හෝ ඒ බව ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කළ යුතුය.

10.45. ප්‍රධාන හෝ කුඩා හෝ ප්‍රාදේශීය සභා පාරකට යාව තිබෙන ඉඩමක් කොටස් වලට කැඩීමේදී එම කොටස්වල පාරට යාවන පැත්තේ දිග ඉඩම ඇතුලට තිබෙන දිගෙන් 2/3ට වැඩි නොවිය යුතුය. මෙම කොටස් වලට පිටු පසින් ඉඩම් කැබලි වලට ඇතුළුවීම සඳහා ප්‍රවේශ මාර්ගයක් 10.31 ඡේදයෙහි සඳහන් පරිදි සෑහෙන පරතර වලින් වෙන් කළ යුතුය.

10.46. පාරට යා වන විශාල බිම් කොටස් කුඩා කැබලි වලට බෙදීමේදී පාරට යාවන පැත්තේ තිබිය යුතු දිග තීරණය කර ගැනීම දුෂ්කර වුවහොත්, ඒ ඒ පැති සඳහා අවශ්‍ය දිග ප්‍රමාණ පහත සඳහන් වන ක්‍රමය අනුව විසඳා ගත හැකිය.

වර්ග ප්‍රමාණය මීටර් 2400 ක් වූ එනම් මීටර් 60 ක් දිගින් හා පළලින් මීටර් 40ක් වූ ඉඩමක් නිදසුනක් වශයෙන් ගත හොත්, කැබලි වලට බෙදීමට යන එම කොටසේ පාර දෙපැත්තේ දිග හා එය ඇතුලට විහිදී තිබිය යුතු දිග ප්‍රමාණය පහත සඳහන් පරිදි වෙන වෙනම සොයා බැලිය හැකිය.

$$\text{පාර පැත්ත} = 40 \left\{ \sqrt{\frac{\text{කොටස් කිරීමට තිබෙන බිමේ වර්ග ප්‍රමාණය, වර්ග මීටර් වලින්}}{2400}} \right\}$$

$$\text{ඇතුළට තිබිය යුතු ප්‍රමාණය} = 60 \left\{ \sqrt{\frac{\text{කොටස් කිරීමට තිබෙන බිමේ වර්ග ප්‍රමාණය, වර්ග මීටර් වලින්}}{2400}} \right\}$$

10.47. අංක 1662/17 හා 2010 ජූලි 14 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් දක්වා ඇති පරිදි බස්නාහිර පළාතේ රජයේ ඉඩම් තුල ඇති ඇළ රක්ෂිත සඳහා වෙන්කළ බිම් ලකුණු කළ යුතුය.

පුද්ගලික ඉඩම්වල එම රක්ෂිත වෙන් කිරීම සිදු නොකළද භූමියේ සංවර්ධන කටයුතු කිරීමේදී එම සීමාවන්ට යටත්වේ.

6.1 වගුව : එක් එක් වෙරළ කොටස අනුව සහ අන්තරායට ලක්විය හැකි බව අනුව ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය තුළ සංවර්ධන කාර්යයන් සඳහා වෙරළ පසසිවු පමිණි

කොටස් අංකය	ප්‍රදේශය	මූලාශ්‍ර සිතියම	අක්ෂාංශ	ඒකාංශ	අන්තරායට ලක්විය හැකි බව මට්ටම	පස සිඳුමේ දුර (මීටර්)		
						වෙන්කළ පුදේශය	සීමාකළ පුදේශය	මුළු පස සිඳු පුදේශය (මීටර්)
1	වෙල්ලායි, පල්ලියමුල්ල, බත්තලන්ගුන්ඩුව වෙනත් ද්‍රුත් සහ (කල්පිටිය අර්ධද්වීපය හැර ද්‍රුත්)	ප්‍රාන්තලම	8°32'26.82"උ 8°24'19.50"උ	79°46'56.70"නැ 79°48'44.76"නැ	ඉහල(+)	60		60
2	දම්බිලුවෙයි සිට මොහොත්තුවාරම් වැලි වැටියේ උතුරු මායිම)	ප්‍රාන්තලම	8°23'01.20"උ 8°15'00.60"උ	79°47'14.90"නැ 79°44'20.20"නැ	ඉහල(+)	25	35	60
3	මොහොත්තුවාරම් (මොහොත්තුවාරම් වැලි වැටියේ උතුරු මායිම) සිට මොහොත්තුවාරම්/කුඩාව වැලි වැටියේ දකුණු මායිම (සංරක්ෂණ/ඉදිකිරීම් තහනම් කලාපය)	ප්‍රාන්තලම	8°15'00.60"උ 8°13'41.50"උ	79°44'20.20"නැ 79°43'52.10"නැ	ඉදිකිරීම් තහනම් කලාපය			ඉදිකිරීම් තහනම් කලාපය
4	මොහොත්තුවාරම්/කුඩාව වැලි වැටියේ දකුණු මායිම (කුඩාව ආරම්භක ස්ථානය) සිට දකුණු උවප්පුව (සුසාන භූමිය)	ප්‍රාන්තලම	8°13'41.50"උ 7°44'17.50"උ	79°43'52.10"නැ 79°47'29.70"නැ	ඉහල(+)	25	35	60
5	දකුණු උවප්පුව (සුසාන භූමිය) සිට දුරුෑ ඔය මෝය උතුරු මායිම	ප්‍රාන්තලම	7°44'17.50"උ 7°37' 06.70"උ	79°47'29.70"නැ 79°47'56.50"නැ	ඉහල (-)	20	35	55
6	දුරුෑ ඔය මෝය උතුරු මායිම සිට නලාවත සුසාන භූමියේ දකුණු මායිම (සංරක්ෂණ කලාපය/තහනම් කලාපය)	ප්‍රාන්තලම	7°37'06.70"උ 7°35'48.90"උ	79°47'56.50"නැ 79°47'11.60"නැ	ඉදිකිරීම් තහනම් කලාපය			ඉදිකිරීම් තහනම් කලාපය
7	නලාවත සුසාන භූමියේ දකුණු මායිම සිට නලාවත වෙරළ උද්‍යානයේ උතුරු මායිම	ප්‍රාන්තලම	7° 35'48.90"උ 7° 34'53.50"උ	79°47'11.60"නැ 79°47'14.30"නැ	මධ්‍යස්ථ (-)	15	30	45
8	නලාවත වෙරළ උද්‍යානයේ උතුරු මායිම සිට උතුරු නොඩුවාව ගං මෝය	ප්‍රාන්තලම	7°34' 53.50"උ 7°29' 31.60"උ	79°47'14.30"නැ 79°47'49.90"නැ	මධ්‍යස්ථ (+)	20	30	50
9	උතුරු නොඩුවාව ගං මෝය සිට මෙදරුවැල්ල, මාවිල, ගෙම්බරගහිය කලපු මෙදර (කලබලි නාම ලබා ගෙන්දෙයි)	ප්‍රාන්තලම	7°29' 31.60"උ 7°25'58.20"උ	79°47'49.90"නැ 79°48'39.10"නැ	High (-)	20	35	55
10	මෙදරුවැල්ල, මාවිල, ගෙම්බරගහිය කලපු මෙදර (කලබලි නාම ලබා ගෙන්දෙයි) සිට නයිනමඩම, වැල්ලමන්කර ගිනි ඔය මෝය	ප්‍රාන්තලම	7°25'58.20"උ 7°18'12.05"උ	79°48'39.10"E 79°50'14.16"E	Medium (+)	20	30	50

11	නයිනමඩම වැද්දිමන්කාව ගිනි ඔය මෙන්ය සිට ලුවිස් පෙදෙස, මඩකනදි පාර	පුත්තලම/ගම්පහ	7°18'12.05"උ 7°13'18.70"උ	79°50'14.16"නැ 79°50'19.50"නැ	මධ්‍යම (-)	15	30			45
12	ලුවිස් පෙදෙස, මඩකනදි පාර සිට දුව පිටපන වීදිය, මම්බල සිට	ගම්පහ	7°13'18.70"උ 7°12'13.00"උ	79°50'19.50"නැ 79°49'02.50"නැ	පහළ (+)	15	25			40
13	දුව පිටපන වීදිය, මම්බල සිට දික්ඔය වම්පර වරාය දකුණු මාධ්‍ය	ගම්පහ/කොළඹ	7°12'13.00"උ 7°00'34.80"උ	79°49'02.50"නැ 79°51'55.50"නැ	මධ්‍යම (-)	15	30			45
14	දික්ඔය වම්පර වරාය දකුණු මාධ්‍ය සිට ගාල් ෆේස් හෝටල, කොල්ලුපිටිය	කොළඹ	7°00'34.80"උ 6°55'14.40"උ	79°51'55.50"නැ 79°50'43.60"නැ	මධ්‍යම (+)	20	30			50
15	ගාල් ෆේස් හෝටල, කොල්ලුපිටිය සිට වැල්ලවත්ත ප්‍රමිය පාලම	කොළඹ	6°55'14.40"උ 6°52'44.40"උ	79°50'43.60"නැ 79°51'24.10"නැ	පහළ (-)	10	25			35
16	වැල්ලවත්ත ප්‍රමිය පාලම සිට ගල්කිස්ස හෝටලය	කොළඹ	6°52'44.40"උ 6°50'06.00"උ	79°51'24.10"නැ 79°51'46.10"නැ	මධ්‍යම (-)	15	30			45
17	ගල්කිස්ස හෝටලය සිට පානදුර ගංමෙන්ය (මහාරවුල වම්පර වරාය)	කොළඹ	6°50'06.00"උ 6°43'05.70"උ	79°51'46.10"නැ 79°54'05.60"නැ	පහළ (+)	15	25			40
18	පානදුර ගංමෙන්ය (මහාරවුල වම්පර වරාය) සිට පිසත්ත කැලිපිටිය මෙන්ය	කළුතර	6°43'05.70"උ 6°40'56.76"උ	79°54'05.60"නැ 79°55'02.46"නැ	මධ්‍යම (-)	15	30			45
19	පිසත්ත කැලිපිටිය මෙන්ය සිට කළුතර කැලිඔය වැලි වැටියේ උතුරු මායිම	කළුතර	6°40'56.76"උ 6°35'15.60"උ	79°55'02.46"නැ 79°57'17.30"නැ	පහළ (+)	15	25			40
20	කළුතර කැලිඔය වැලි වැටියේ උතුරු මායිම සිට කලුතුරුත්ද අවාහි හෝටලය (කළුතර ගංමෙන්ය දකුණු සීමාව) (අයුර්ක කැලිඔය වැලි වැටි සංරක්ෂණ ප්‍රදේශය)	කළුතර	6°35'15.60"උ 6°34'14.60"උ	79°57'17.30"නැ 79°57'33.90"නැ			නහනම් කලාපය			නහනම් කලාපය
21	කලුතුරුත්ද අවාහි හෝටලය (කළුතර ගංමෙන්ය දකුණු සීමාව) සිට දකුණු පයාගල ප්‍රමිය තරඹ මාර්ගය	කළුතර	6°34'14.60"උ 6°31'14.80"උ	79°57'33.90"නැ 79°58'42.80"නැ	මධ්‍යම (+)	20	30			50
22	දකුණු පයාගල ප්‍රමිය තරඹ මාර්ගය සිට මහරවිල කොඩිමඹේ පල්ලිය	කළුතර	6°31'14.80"උ 6°28'13.40"උ	79°58'42.80"නැ 79°58'24.47"නැ	පහළ (+)	15	25			40

23	බෙරුවල කොඩිමලේ පල්ලිය සිට	කඳවත/ගාල්ල	6°28'13.40"උ	79°58'24.47"නැ	මධ්‍යම (+)	20	30	50			
	ඉඳුරුව උස්බිම (සමන්විලා හෝටලය)		6°23'41.70"උ	80°00'13.34"නැ							
24	ඉඳුරුව උස්බිම (සමන්විලා හෝටලය) සිට	ගාල්ල	6°23'41.70"උ	80°00'13.34"නැ	මධ්‍යම (-)	15	30	45			
	මාදූ ගඟ මෝය		6°16'26.40"උ	80°02'06.60"නැ							
25	මාදූ ගඟ මෝය සිට	ගාල්ල	6°16'26.40"උ	80°02'06.60"නැ	පහළ (+)	15	25	40			
	හික්කඩුව වීථිර වරය		6°08'27.29"උ	80°05'56.44"නැ							
26	හික්කඩුව වීථිර වරය සිට	ගාල්ල	6°08'27.29"උ	80°05'56.44"නැ	පහළ (-)	10	25	35			
	ගිංතොට ගං මෝය		6°03'49.10"උ	80°10'26.00"නැ							
27	ගිංතොට ගං මෝය සිට	ගාල්ල	6°03'49.10"උ	80°10'26.00"නැ	පහළ (+)	15	25	40			
	දඩල්ල ලයිට් හවුස් හෝටලය		6°02'28.71"උ	80°11'40.82"නැ							
28	දඩල්ල ලයිට් හවුස් හෝටලය සිට	ගාල්ල	6°02'28.71"උ	80°11'40.82"නැ	පහළ (-)	10	25	35			
	ගාල්ල ඕමන්ති කඩොල අසල පාලම		6°01'39.20"උ	80°14'37.40"නැ							
29	ගාල්ල ඕමන්ති කඩොල අසල පාලම සිට	ගාල්ල	6°01'39.20"උ	80°14'37.40"නැ	පහළ (+)	15	25	40			
	උණවටුන වැල්ල දේවාලය		6°00'23.30"උ	80°14'37.70"නැ							
30	උණවටුන වැල්ල දේවාලය සිට	ගාල්ල	6°00'23.30"උ	80°14'37.70"නැ	පහළ (-)	10	25	35			
	උණවටුන දලවැල්ල මිල්ටන් හෝටලය		6°00'18.40"උ	80°15'20.10"නැ							
31	උණවටුන දලවැල්ල මිල්ටන් හෝටලය සිට	ගාල්ල	6°00'18.40"උ	80°15'20.10"නැ	මධ්‍යම (-)	15	30	45			
	ගොඩියාපාන පාලම		5°57'56.40"උ	80°22'53.20"නැ							
32	ගොඩියාපාන පාලම සිට	ගාල්ල/මාතර	5°57'56.40"උ	80°22'53.20"නැ	පහළ (-)	10	25	35			
	මිඩිය නැගෙනහිර		5°56'12.1"උ	80°30'46.7" නැ							

33	මඩිත නැගෙනහිර සිට	මානර	5°56'12.1"උ	80°30'46.7" නැ	පහළ (-)	10	25	35		
	මානර නානායම		5°56'35.8"උ	80°32'51.2" නැ						
34	මානර නානායම සිට	මානර	5°56'35.8"උ	80°32'51.2" නැ	පහළ (+)	15	25	40		
	ඇඳිනුවර පුදීපාගාරය		5°55'12.8"උ	80°35'35.0" නැ						
35	ඇඳිනුවර පුදීපාගාරය සිට	මානර	5°55'12.8"උ	80°35'35.0" නැ	පහළ (-)	10	25	35		
	මොයම්බොක්ක සීප් ගොවන් කෝට්ලය ආශ්‍රිත උස්බිම (ජුල්ගහ වැල්ල වීවර කොටුපල)	නම්බන්තොට	6°00'44.92"උ	80°47'13.50" නැ						
36	මොයම්බොක්ක සීප් ගොවන් කෝට්ලය ආශ්‍රිත උස්බිම (ජුල්ගහ වැල්ල වීවර කොටුපල) සිට	නම්බන්තොට	6°00'44.92"උ	80°47'13.50"නැ	පහළ (+)	15	25	40		
	යකඩ බටශිර		6°02'34.19"උ	80°51'38.27"නැ						
37	යකඩ බටශිර සිට	නම්බන්තොට	6°02'34.19"උ	80°51'38.27"නැ	මධ්‍යම (+)	20	30	50		
	කලමැටිය ගොනගහපුලල		6°04'34.40"උ	80°56'07.90"නැ						
38	කලමැටිය ගොනගහපුලල සිට	නම්බන්තොට	6°04'34.40"උ	80°56'07.90"නැ	ඉහළ (+)	25	35	60		
	උස්සන්ගොඩ වනජීවී ජාතික උදාහරණයේ දකුණු මායිම (ශුෂම) (කලමැටිය වන ජීවී අභය භූමි පුළුල්ය)		6°05'13.20"උ	80°58'36.40"නැ						
39	උස්සන්ගොඩ වනජීවී ජාතික උදාහරණයේ දකුණු මායිම (ශුෂම) සිට	නම්බන්තොට	6°05'13.20"උ	80°58'36.40"නැ		300		300		
	උස්සන්ගොඩ වනජීවී ජාතික උදාහරණයේ උතුරු මායිම (උස්සන්ගොඩ වීවර වරාය අසල) (උස්සන්ගොඩ වනජීවී ජාතික උදාහරණය)		6° 05'43.00"උ	80°59'23.90"නැ						
40	උස්සන්ගොඩ වනජීවී ජාතික උදාහරණයේ උතුරු මායිම (උස්සන්ගොඩ වීවර වරාය අසල) සිට	නම්බන්තොට	6° 05'43.00"උ	80°59'23.90"නැ	පහළ (+)	15	25	40		
	මානඩවාය වලලේ ගංමෙම්ය (මවරළ සංරක්ෂණ කාර්යාලය අසල)		6°06'28.00"උ	81°03'02.50"නැ						

41	ගොඩවාය වලංගු ගංමෙට්ය (වෙරළ සංරක්ෂණ කාර්යාලය අසල) සිට	හම්බන්තොට	6°06'28.00"ද	81°03'02.50" නැ	මධ්‍යම (+)	20	30	50		
	හම්බන්තොට ජාතාන්තර වරායේ දකුණු මායිම (ඕපිස්ථිල)		6° 06'53.16"ද	81° 5'43.98" නැ						
42	හම්බන්තොට ජාතාන්තර වරායේ උතුරු මායිම (ටැංකි පාර හම්බන්තොට) සිට	හම්බන්තොට	6°07'23.10"ද	81°07'36.40" නැ	ඉහළ (+)	25	35	60		
	ලුහුල් ජාතික උද්‍යානයේ දකුණු මායිම (හම්බන්තොට)		6° 08'01.51"ද	81°07'59.32" නැ						
43	උප කලාපය - හම්බන්තොට වරාය සිට	හම්බන්තොට	6°07'27.00"ද	81°07'34.80" නැ	පහළ (+)	15	25	40		
	හම්බන්තොට කෞම්බුඇල පිටවාන (අයුර්ත විනෝදාත්මක කලාපය)		6°07'50.60"ද	81°07'43.20" නැ						
44	ලුහුල් ජාතික උද්‍යානය දකුණු මායිම (හම්බන්තොට සිට)	හම්බන්තොට	6° 08'01.51"ද	81°07'59.32" නැ		300		300		
	කිරිඳිය මෙට්ය (ලුහුල් ජාතික උද්‍යානය)		6°11'46.70"ද	81°17'44.90" නැ						
45	කිරිඳිය මෙට්ය සිට	හම්බන්තොට	6°11'46.70"ද	81°17'44.90" නැ	ඉහළ (+)	45	80	125		
	කිරිඳ් අඳගල උස්බිම ආරම්භක ස්ථානය (අඳගල මෙට්ර අසල)		6°12'09.30"ද	81°19'27.50" නැ						
46	කිරිඳ් අඳගල උස්බිම ආරම්භක ස්ථානය (අඳගල මෙට්ර අසල) සිට	හම්බන්තොට	6°12'09.30"ද	81°19'27.50" නැ	පහළ (+)	25	40	65		
	කිරිඳ් විහාර ගල්තලාව		6°11'55.91"ද	81°19'27.12" නැ						
47	කිරිඳ් විහාර ගල්තලාව සිට	හම්බන්තොට	6°11'55.91"ද	81°19'27.12" නැ	ඉහළ (+)	45	80	125		
	පලපුවාන ශ්‍රී ලංකා සංවාරක සංවර්ධන අධිකාරිය සංවාරක කලාපයේ අවසන් මායිම (ගොඩේ කලපුව මායිම)	හම්බන්තොට	6°16'26.67"ද	81°25'11.56" නැ						
48	පලපුවාන ශ්‍රී ලංකා සංවාරක සංවර්ධන අධිකාරිය සංවාරක කලාපයේ අවසන් මායිම (ගොඩේ කලපුව මායිම) සිට	හම්බන්තොට	6°16'26.67"ද	81°25'11.56" නැ		300		300		
	යාල ජාතික උද්‍යානය උතුරු මායිම (ඔකඳ)	අම්පාර	6°21'46.50"ද	81°31'44.00" නැ						
49	යාල ජාතික උද්‍යානය උතුරු මායිම (ඔකඳ) සිට	අම්පාර	6°21'46.50"ද	81°31'44.00" නැ	ඉහළ (+)	45	80	125		
	වාතම කලපු මෙට්ර කිසෙස් ලාම්පු සවිකර ඇති ගල		6° 46'02.61"ද	81°49'32.37" නැ						
50	වාතම කලපු මෙට්ර කිසෙස් ලාම්පු සවිකර ඇති ගල සිට	අම්පාර	6° 46'02.61"ද	81°49'32.37" නැ	මධ්‍යම (+)	35	60	95		
	කුඩා කල්ලි කිඹුලා ගල (හැඩ බය මෙට්ය)		6° 48' 32.71"ද	81°49'27.14" නැ						
51	කුඩා කල්ලි කිඹුලා ගල (හැඩ බය මෙට්ය) සිට	අම්පාර	6° 48' 32.71"ද	81°49'27.14" නැ	ඉහළ (+)	45	80	125		
	ආරුගම්බේ උල්ල සර්ෆින් තුඩුව		6° 50' 21.70"ද	81°50'08.90" නැ						

52	ආරුගම්බෙ උප්පු සර්ෆින් තුඩුව සිට	අම්පාර	6° 50' 21.70"උ	81°50'08.90"නැ	පහළ (-)	20	30	50		
	ආරුගම්බෙ පාලම		6° 51' 03.20"උ	81°49'55.10"නැ						
53	ආරුගම්බෙ පාලම සිට	අම්පාර	6° 51' 03.20"උ	81°49'55.10"නැ	ඉහළ (+)	45	80	125		
	විස්කි තුඩුව වැලිකන්ද ආරම්භක සීමාව (කතානාර් ග්‍රාමම 326 කි.මී. 326 කණුව)		6° 55' 05.60"උ	81°50'52.10"නැ						
54	විස්කි තුඩුව වැලිකන්ද ආරම්භක සීමාව (කතානාර් ග්‍රාමම 326 කි.මී. 326 කණුව) සිට	අම්පාර	6° 55' 05.60"උ	81°50'52.10"නැ	මධ්‍යස්ථ (+)	35	60	95		
	සංගමන්කන්ද තුඩුව		7° 01' 21.39"උ	81°52'42.46"නැ						
55	සංගමන්කන්ද තුඩුව සිට	අම්පාර	7° 01' 21.39"උ	81°52'42.46"නැ	මධ්‍යස්ථ (-)	30	50	80		
	නම්බවටෙයි (ගම්බවටෙයි කෝවිල සහ ගොඩි තපෝවනම අසල කි.මී. 354.5 කණුව)		7°08' 24.70"උ	81°51'29.30"නැ						
56	නම්බවටෙයි (ගම්බවටෙයි කෝවිල සහ ගොඩි තපෝවනම අසල කි.මී. 354.5 කණුව) සිට	අම්පාර	7°08' 24.70"උ	81°51'29.30"නැ	ඉහළ (+)	45	80	125		
	ආදයාඩවෙම්බු (පදු බිම කිරය)		7°12' 26.40"උ	81°51'43.75"නැ						
57	ආදයාඩවෙම්බු සිට	අම්පාර	7°12' 26.40"උ	81°51'43.75"නැ	පහළ (+)	25	40	65		
	ඔළුවිල් වරාය දකුණු මායිම		7°16' 32.70"උ	81°51'49.90"නැ						
58	ඔළුවිල් වරාය දකුණු මායිම (ඔළුවිල් ප්‍රදීපාගාරය අසල) සිට	අම්පාර	7°16' 55.20"උ	81°51'59.30"නැ	මධ්‍යස්ථ (-)	30	50	80		
	කින්දුළුර් වවිල් කලපු මෙදුර (ගිංගර් පාර)		7°20' 02.70"උ	81°51'47.30"නැ						
59	කින්දුළුර් වවිල් කලපු මෙදුර (ගිංගර් පාර) සිට	අම්පාර	7°20' 02.70"උ	81°51'47.30"නැ	පහළ (+)	25	40	65		
	මඩකලපුව අම්පාර දිස්ත්‍රික් මායිම		7°27' 15.40"උ	81°49'09.72"නැ						
60	මඩකලපුව - අම්පාර දිස්ත්‍රික් මායිම සිට	මඩකලපුව/ අම්පාර	7°27' 15.40"උ	81°49'09.72"නැ	මධ්‍යස්ථ (-)	30	50	80		
	කන්නන්කුඩි සිත්ත පාර අල් තකියා පල්ලිය		7°41'40.38"උ	81°44'05.40"නැ						
61	කන්නන්කුඩි සිත්ත පාර අල් තකියා පල්ලිය සිට	මඩකලපුව	7°41'40.38"උ	81°44'05.40"නැ	මධ්‍යස්ථ (+)	35	60	95		
	කල්ඇඩි මෙරළ දඳගහය (සරවන පාර)		7°43'05.10"උ	81°43'08.80"නැ						
62	කල්ඇඩි මෙරළ දඳගහය (සරවන පාර) සිට	මඩකලපුව	7°43'05.10" උ	81°43'08.80"නැ	ඉහළ (+)	45	80	125		
	මඩකලපුව ප්‍රදීපාගාරය (පාල්මීන්මඩු)		7°45'18.50" උ	81°41'07.50"නැ						

63	මඩකලපුව පුදීපාගාරය (පාල්මීන්මඩු) සිට	මඩකලපුව	7°45'18.50" උ	81°41'07.50"නැ	මධ්‍යස්ථ (-)	30	50		80	
	පුත්තියකුඩා තුඩුව		7°49'41.80" උ	81°37'07.80" නැ						
64	පුත්තියකුඩා තුඩුව සිට	මඩකලපුව	7°49'41.80" උ	81°37'07.80" නැ	ඉහළ (+)	45	80		125	
	පාසිකුඩා වීවර තොටුපල		7°55'59.50" උ	81°33'36.30" නැ						
65	පාසිකුඩා වීවර තොටුපල සිට	මඩකලපුව	7°55'59.50" උ	81°33'36.30" නැ	ඉහළ (-)	40	70		110	
	නාඹන්තිවු කලපු මෙදුර		7°56'46.50" උ	81°32'42.80" නැ						
66	නාඹන්තිවු කලපු මෙදුර සිට	මඩකලපුව	7°56'46.50" උ	81°32'42.80" නැ	පහළ (+)	25	40		65	
	වල්ලිතිවු මුනායි තුඩුව (වල්ලිතිවු දූපත අසල)		8°06'36.20" උ	81°27'34.70" නැ						
67	වල්ලිතිවු මුනායි තුඩුව (වල්ලිතිවු දූපත අසල) සිට	මඩකලපුව	8°06'36.20" උ	81°27'34.70" නැ	මධ්‍යස්ථ (-)	30	50		80	
	ලංකාපටුන		8°21'24.60" උ	81°23'19.00" නැ						
68	ලංකාපටුන සිට	තිකුණාමලය	8°21'24.60" උ	81°23'19.00" නැ	මධ්‍යස්ථ (+)	35	60		95	
	කෙඳලිය කුකුළු තුඩුව (තීරුකෝනාමලේයි පුදීපාගාරය)		8°31'31.57" උ	81°19'07.40" නැ						
69	කෙඳලිය කුකුළු තුඩුව (තීරුකෝනාමලේයි පුදීපාගාරය) සිට	තිකුණාමලය	8°31'31.57" උ	81°19'07.40" නැ	පහළ (-)	20	30		50	
	මුතූර් නැගෙනහිර ගංමෙළිය (ළඟාලිස් ස්ථානය අසල)		8°27'42.60" උ	81°15'33.40" නැ						
70	මුතූර් නැගෙනහිර ගංමෙළිය (ළඟාලිස් ස්ථානය අසල) සිට	තිකුණාමලය	8°27'42.60" උ	81°15'33.40" නැ	මධ්‍යස්ථ (-)	30	50		80	
	ගංගොඩ පාලම		8°27'37.50" උ	81°13'44.10" නැ						

71	ගංගෙයි පාලම සිට	ඉකුණාමලය	8°27'37.50"උ	81°13'44.10"නැ	පහළ (-)	20	30	50		
	ඉරක්කන්ඩි පාලම (ගංමෝය)		8°43'55.40"උ	81°10'24.60"නැ						
72	ඉරක්කන්ඩි පාලම (ගංමෝය) සිට	ඉකුණාමලය	8°43'55.40"උ	81°10'24.60"නැ	මධ්‍යස්ථ (-)	30	50	80		
	සල්පෘරු පාලම		8°47'27.80"උ	81°07'13.10"නැ						
73	සල්පෘරු පාලම සිට	ඉකුණාමලය	8°47'27.80"උ	81°07'13.10"නැ	පහළ (-)	20	30	50		
	කුච්චවේලි පුඩුවකට්ටු		8°51' 33.40"උ	81°05' 06.10"නැ						
74	කුච්චවේලි පුඩුවකට්ටු සිට	ඉකුණාමලය	8° 51' 33.40"උ	8° 05' 06.10"නැ	පහළ (+)	25	40	65		
	කල්ලාරුව (ගිරියාය ගඟදිය අසල)		8 °53' 04.52"උ	81°02'09.08"නැ						
75	කල්ලාරුව (ගිරියාය ගඟදිය අසල) සිට	ඉකුණාමලය	8 °53' 04.52"උ	81°02'09.08"නැ	මධ්‍යස්ථ (-)	30	50	80		
	පුල්මුඩ අතිසිමෙල් තුඩුව		8 °56' 17.05"උ	81°00'26.64"නැ						
76	පුල්මුඩ අතිසිමෙල් තුඩුව සිට	ඉකුණාමලය	8 °56' 17.05"උ	81°00'26.64"නැ	ඉහළ (+)	45	80	125		
	කෝකිලායි කලපුව දකුණු මායිම		8° 59' 02.80"උ	80°58'00.20"නැ						
77	කෝකිලායි කලපුව දකුණු මායිම සිට	මුලතිව්	8° 59' 02.80"උ	80°58'00.20"නැ	ඉහළ (-)	40	70	110		
	මුලතිව් නගරය		9° 16' 03.40"උ	80°49'16.10"නැ						
78	මුලතිව් නගරය සිට	මුලතිව්	9° 16' 03.40"උ	80°49'16.10"නැ	මධ්‍යස්ථ (-)	30	50	80		
	මුලතිව් මොහොත්තුවම/වව්වුලාන් කලපුව		9°16' 23.80"උ	80°48'47.60"නැ						

79	මූලික මොහොත්තුවරම/වට්ටුවාන් කඳවුව සිට	මූලික	9°16' 23.80"උ	80°48'47.60"නැ	ඉහළ (-)	40	70	110	
	නාලියාතන්නිමොඩුවායි (ලුන්ඩිකුලම් ජාතික උද්‍යානය දකුණු මායිම)	කිලිනොච්චි	9°27'34.20"උ	80°37'26.30" නැ					
80	නාලියාතන්නිමොඩුවායි (ලුන්ඩිකුලම් ජාතික උද්‍යානය දකුණු මායිම) සිට	කිලිනොච්චි	9°27'34.20"උ	80°37'26.30" නැ		300		300	
	කඩබාසකුඩු වන්ඩිකුලම් ජාතික උද්‍යානය උතුරු මායිම		9°33'43.70"උ	80°29'24.30" නැ					
81	කඩබාසකුඩු වන්ඩිකුලම් ජාතික උද්‍යානය උතුරු මායිම සිට	යාපනය	9°33'43.70"උ	80°29'24.30" නැ	මධ්‍යස්ථ (-)	30	50	80	
	මාමුනයි ගම		9° 39' 45.50"උ	80°21'49.80" නැ					
82	මාමුනයි ගම සිට	යාපනය	9°39'45.50"උ	80°21'49.80" නැ	ඉහළ (+)	45	80	125	
	තුම්පලයි (ඒදුරුකුලුව)		9°49'05.00"උ	80°15'16.60" නැ					
83	තුම්පලයි (ඒදුරුකුලුව) සිට	යාපනය	9°49'05.00"උ	80°15'16.60" නැ	පහළ (-)	20	30	50	
	ආර්යාලයි		9°38'11.50"උ	80°04'25.40" නැ					
84	කාරතිවු දූපත	යාපනය	9°45'43.80"උ	79°53'06.70" නැ	මධ්‍යස්ථ (-)	30	50	80	
			9°42'24.80"උ	79°51'55.30" නැ					

85	මන්ඛිලු දූපත	යාපනය	9°35'58.20" උ	79°58'43.20" නැ	පහළ (+)	25	40	65		
			9°38'16.20" උ	79°59'19.56" නැ						
86	අල්ලප්පිඩි සිට	යාපනය	9°36'53.10" උ	79°57'42.00" නැ	මධ්‍යස්ථ (-)	30	50	80		
	මඩකරි අයියනර් කොවිල		9°37'52.40" උ	79°54'52.80" නැ						
87	කයිරිස් දූපත	යාපනය	9°38'48.60" උ	79°52'02.60" නැ	පහළ (-)	20	30	50		
			9°42'10.90" උ	79°51'45.20" නැ						
88	පුන්කුඩුතිව් දූපත	යාපනය	9°35'22.40" උ	79°48'26.60" නැ	පහළ (+)	25	40	65		
			9°35'17.50" උ	79°48'07.50" නැ						
89	නයිනතිව් දූපත	යාපනය	9°37'08.30" උ	79°46'30.70" නැ	පහළ (+)	25	40	65		
			9°35'05.30" උ	79°46'23.80" නැ						
90	කෙල්ච් දූපත (කෙල්ච් ජාතික උද්‍යානය)	යාපනය			ඉහළ (+)	45	80	125		
91	ඇනලතිව්, එස්වයිතිව්, ඉරණතිව් සහ අනෙකුත් දූපත්	යාපනය කිලිනොච්චි අනෙකුත් දූපත්			මධ්‍යස්ථ (-)	30	50	80		
92	පුනරින් කල්මුනේ කුඩුව සිට	කිලිනොච්චි	9°35'56.70" උ	80°03'08.30" නැ	පහළ (-)	20	30	50		
	පල්ලිකුඩා		9°29'11.10" උ	80°11'08.60" නැ						
93	පල්ලිකුඩා සිට	කිලිනොච්චි	9°29'11.10" උ	80°11'08.60" නැ	පහළ (+)	25	40	65		
	යක්කුඩුව		9°23'19.50" උ	80°03'11.10" නැ						
94	යක්කුඩුව සිට	කිලිනොච්චි	9°23'19.50" උ	80°03'11.10" නැ	මධ්‍යස්ථ (-)	30	50	80		
	නාවිකුඩා (නාවන්තුරෙයි කුඩුව)		9°16'06.10" උ	80°06'46.80" නැ						
95	නාවිකුඩා (නාවන්තුරෙයි කුඩුව) සිට	මන්නාරම	9°16'06.10" උ	80°06'46.80" නැ	මධ්‍යස්ථ (+)	35	60	95		
	පල්ලිමාර් උතුර් කුඩුව		9°09'34.50" උ	80°05'54.10" නැ						
96	පල්ලිමාර් උතුර් කුඩුව සිට	මන්නාරම	9°09'34.50" උ	80°05'54.10" නැ	ඉහළ (+)	45	80	125		
	එන්ටලොයි කුඩුව		8°56'15.30" උ	79°54'11.30" නැ						
97	මන්නාරම දූපත දකුණු වැලිපරය සිට	මන්නාරම දූපත	8°57'53.40" උ	79°53'08.60" නැ	පහළ (-)	20	30	50		
	එරුක්කලම්පිටි පාලම		9°01'54.80" උ	79°52'16.50" නැ						

98	එරුක්කුලම්පිඩි පාලම හරහා උමිලුක්කන්මුනෙයි තුඩුව සිට	මන්නාරම දූපත	9°01'54.80" උ	79°52'16.50" නැ	මධ්‍යස්ථ (-)	30	50	80			
	මන්නාරේ වන්කලායිපාඩු		9°04'48.50" උ	79°50'48.60" නැ							
99	මන්නාරේ වන්කලායිපාඩු සිට	මන්නාරම දූපත	9°04'48.50" උ	79°50'48.60" නැ	පහළ (-)	20	30	50			
	තලෙයිමන්නාරම ප්‍රදේශයේ/ජෙටිය		9°06'26.90" උ	79°43'51.40" නැ							
100	තලෙයිමන්නාරම ප්‍රදේශයේ/ජෙටිය සිට	මන්නාරම දූපත	9°06'26.90" උ	79°43'51.40" නැ	මධ්‍යස්ථ (-)	30	50	80			
	මන්නාරම දූපත දකුණු වැලිපරය		8°57'53.40" උ	79°53'08.60" නැ							
101	මන්නාරම දූපත දකුණු වැලිපරය සිට	මන්නාරම දූපත	8°57'53.40" උ	79°53'08.60" නැ	ඉදිකිරීම් තහනම් කලාපය						
	වන්කලායි තුඩුව (යෝජිත සංරක්ෂණ/ඉදිකිරීම් තහනම් කලාපය)		8°56'15.30" උ	79°54'11.30" නැ							
102	වන්කලායි තුඩුව සිට	මන්නාරම	8°56'15.30" උ	79°54'11.30" නැ	ඉහළ (+)	45	80	125			
	වන්කලායි අගතුමුය දකුණු මායිම		8°53'26.30" උ	79°55'44.70" නැ							
103	වන්කලායි අගතුමුය දකුණු මායිම සිට	මන්නාරම	8°53'26.30" උ	79°55'44.70" නැ	මධ්‍යස්ථ (-)	30	50	80			
	අරිප්පු නැගෙනහිර		8°47'43.10" උ	79°55'28.60" නැ							
104	අරිප්පු නැගෙනහිර සිට	මන්නාරම	8°47'43.10" උ	79°55'28.60" නැ	පහළ (+)	25	40	65			
	පුත්තලම මෙච්චරගම ආරූ		8°33'48.70" උ	79°55'12.80" නැ							
105	පුත්තලම මෙච්චරගම ආරූ සිට	පුත්තලම	8°33'48.70" උ	79°55'12.80" නැ		300		300			
	කලා ඔය මෙච්ච (මිල්ලත්තු ජාතික උද්‍යානය)		8°17'53.60" උ	79°49'55.00"නැ							

වගුව 6.2 : අන්තරායට ලක්විය හැකි බවේ මට්ටම අනුව සහ පසසිවූ දුර අනුව වෙරළ කොටස් වර්ගීකරණය (දුර මීටර් වලිනි)

	අන්තරායේ මට්ටම	වෙරළ ඛණ්ඩය (අංක 1- 44)			වෙරළ ඛණ්ඩය (අංක 45- 105)		
		වෙන්කළ ප්‍රදේශ	සීමාකළ ප්‍රදේශ	මූළු පස සිටුව	වෙන්කළ ප්‍රදේශ	සීමාකළ ප්‍රදේශ	මූළු පස සිටුව
	පහළ (-)	10	25	35	20	30	50
	පහළ (+)	15	25	40	25	40	65
	මධ්‍යස්ථ (-)	15	30	45	30	50	80
	මධ්‍යස්ථ (+)	20	30	50	35	60	95
	ඉහළ (-)	20	35	55	40	70	110
	ඉහළ (+)	25	35	60	45	80	125
		ආරක්ෂිත ප්‍රදේශ		300	ආරක්ෂිත ප්‍රදේශ		300
		සංරක්ෂණ කලාපය			සංරක්ෂණ කලාපය		

ශුද්ධි පත්‍රය

11වැනි පරිච්ඡේදය

ක්ෂේත්‍ර මැනුම් දත්ත රැස් කිරීම හා සටහන් තැබීම

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	ක්ෂේත්‍ර පොත් භාවිතය	
11.1.	ක්ෂේත්‍ර පොත් පිටු අංකනය සහ පිටු සකස් කර ගැනීම	1
11.2.	මැනුම් සටහන් කිරීම සඳහා අංක යෙදූ ක්ෂේත්‍ර පොත් භාවිතය	1
11.3.	විවිධ පිඹුරු වර්ග සඳහා භාවිතා කරන ක්ෂේත්‍ර පොත් පිට කවරයෙහි විස්තර දැක්වීම සහ පැරණි ක්ෂේත්‍ර පොත් භාවිතය	1
11.4.	කැඩැස්තර මැනුම්වලදී භාවිතා කරන ක්ෂේත්‍ර පොත් පිට කවරයෙහි විස්තර දැක්වීම සහ ක්ෂේත්‍ර පොත් භාවිතය	1
	ක්ෂේත්‍ර සටහන් තැබීමේදී වැදගත් වන කරුණු	
11.5.	මැනුම් කළ යුතු ප්‍රදේශ සඳහා පිරික්සුම් සටහන පිළියෙල කිරීම	1
11.6.	අඩිපාර, පටු ඇළ මාර්ග සහ කාණු වල දත්ත රැස් කිරීම	1
11.7.	අනවසරකරුවන්ගේ හා හිමිකම් කියන්නන්ගේ නම් ක්ෂේත්‍ර පොතේ ඇතුලත් කිරීම	1
11.8.	ස්ථීර ගති ලක්ෂණ ඇති මායිම් සඳහා පාද සටහන් යෙදීම	1
11.9.	ක්ෂේත්‍ර පොත්වල මැනුම් දත්ත සටහන් කිරීම	2
11.10.	ක්ෂේත්‍ර පොත්වල යොමු සටහන් යෙදීම	2
11.11.	ක්ෂේත්‍ර පොත් වල සටහන් වෙනස් නොකළ යුතු බව	2
11.12.	මායිම් නැවත පිහිටුවීම හෝ මායිම් නැවත විවෘත කිරීම සටහන් කිරීම	2
	මැනුම් වැඩ අවසන් කිරීමෙන් පසු යොදන සටහන්	
11.13.	සෑම දිනක් අවසානයේදීම අත්සන් කළ යුතු බව	2
11.14.	භාවිතා කළ මායිම්ගල් විස්තර කිරීම	2
11.15.	මායිම්ගල් විස්තර ක්ෂේත්‍ර පොතෙහි සුචි පිටුවෙහි වගුවක දැක්වීම	2
11.16.	මායිම්ගල් සහතිකය	3
11.17.	ක්ෂේත්‍ර සටහන් සඳහා වර්ණ භාවිතය	3
11.18.	නිවැරදි කිරීම් සඳහා සහතිකයන් යෙදීම	3
11.19.	පැරණි ක්ෂේත්‍ර සටහන් වෙනස් නොකළ යුතු බව	3
	සුචි පිටුවෙහි යොදන සටහන්	
11.20.	විවිධ වර්ගවල මැනුම් වලදී ක්ෂේත්‍ර පොතේ සුචි පිටුව පිරවීම	3
11.21.	මායිම් නියම කිරීමේ මැනුම් වලදී ක්ෂේත්‍ර පොත්වල සුචි පිටුව පිරවීම	4
	ක්ෂේත්‍ර පොත්වල යොදන අනෙකුත් සටහන්	
11.22.	ඉඩම් විස්තර ලිවීම සහ පිඹුරු අංක සටහන් කිරීම	4
11.23.	මායිම් නියම කිරීමේ මැනුම් වලදි ඉඩම් විස්තර ලිවීම	4
	නැවත දිග හා කෝණ මැනීම	
11.24.	නැවත කෝණ මැනීම හෝ නැවත දිග මැනීම සටහන් කිරීම	4
	මට්ටම් පොත්	
11.25.	මට්ටම් පොත්වල තීන්තෙන් ලිවිය යුතු බව	5
11.26.	මට්ටම් පොත්වල කවර පිටුව නම් කළ යුතු බව	5

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
11.27.	ප්‍රාථමික හා ද්විතියික මට්ටම් රේඛාවල අගයන් දශමස්ථාන 5කට ලිවිය යුතු බව	5
11.28.	තෘතියික මට්ටම් රේඛාවල අගයන් දශමස්ථාන 3කට ලිවිය යුතු බව	5
11.29.	මට්ටම් රේඛාවේ අංකය සෑම පිටුවකම ලිවිය යුතු බව	5
11.30.	පිල් ලකුණුවල අගයන් පරීක්ෂා කිරීම	5
11.31.	සෑම දිනක් අවසානයේදීම මට්ටම් රේඛාව පිල් ලකුණකට පියවිය යුතු බව	5
11.32.	සෑම ඇතුලත් කිරීමකටම මට්ටම්කරු වග කිවයුතු බව	5
11.33.	මට්ටම් රේඛාවේ පියවීම පෙන්විය යුතු බව	6
11.34.	එක් එක් දිනය අවසනදී සටහන් යෙදීම	6
11.35.	මට්ටම් පොත්වල සුචි පිටුව	6
	පරික්‍රමණ මැනුම් කිරීම හා වෙනත් වැදගත් කරුණු	
11.36.	විස්තර මැනුම් සඳහා පාලන පරික්‍රමණ පිහිටුවීම	6
11.37.	SLD 99 ජාතික ඛණ්ඩාංක පද්ධතියට අනුව පරික්‍රමණ සිදු කිරීම	6
11.38.	පාලන ලක්ෂ්‍ය පිහිටුවීමට අදාළ ක්ෂේත්‍ර සටහන්	6
11.39.	විස්තර මැනුම් ක්‍රම	6
11.40.	පරික්‍රමණ ස්ථාන, නිරීක්ෂණ ස්ථාන, පිහිටුම් ස්ථාන අංකනය	6
11.41.	පරික්‍රමණ මැනුමේදී ලබා ගන්නා දත්ත	6
11.42.	පරික්‍රමණ මැනුමක ආදර්ශයක්	7
11.43.	පරික්‍රමණ මැනුමේදී දත්ත සටහන් කිරීම	7
11.44.	සැකසූ ඛණ්ඩාංක පත්‍ර ක්ෂේත්‍ර පොත්වල දැක්වීම	7
	විස්තර මැනුම් (Detail Survey)	
11.45.	විස්තර මැනුම් ක්‍රම	7
	විකෝණමාන (Theodolite) හා මැනුම් පටි ආධාරයෙන් විස්තර මැනුම් කිරීම	
11.46.	විකෝණමාන මඟින් දත්ත රැස් කිරීම	7
11.47.	දත්ත නිවැරදිව අනුකූලනය කිරීම	7
11.48.	මුද්‍රිත ඛණ්ඩාංක පිටපත් ක්ෂේත්‍ර පොතෙහි ඇලවීම	7
	පූර්ණමාන (Total Station) මඟින් විස්තර මැනුම් කිරීම	
11.49.	ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් තුල දත්ත ගබඩා කිරීම සහ ක්ෂේත්‍ර සටහන් තැබීම	7
11.50.	දත්ත ගබඩාව තුල ගබඩා කරගත යුතු දත්ත	8
11.51.	දත්ත සඳහා සංකේත නියම	8
11.52.	නිරීක්ෂණ ලක්ෂ්‍ය වල උන්නතිය	8
11.53.	පූර්ණමාන (Total Station) මඟින් දත්ත රැස් කිරීම	8
11.54.	මුද්‍රිත ඛණ්ඩාංක පිටපත් ක්ෂේත්‍ර පොත්වල දැක්වීම හා සහතික කිරීම	8
11.55.	පරික්‍රමණ මැනීම කරන අවස්ථාවේදීම මායිම් ලක්ෂ්‍යය නිරීක්ෂණයේදී ක්ෂේත්‍ර පොත්වල සටහන් තැබීම	8
11.56.	ඉලෙක්ට්‍රොනික මාධ්‍යය දත්ත ගබඩා කිරීම් නොමැති විට ක්ෂේත්‍ර කටයුතු කිරීම	8
11.57.	ඉලෙක්ට්‍රොනික මාධ්‍යය දත්ත ගබඩා කිරීම් නොමැති විට ක්ෂේත්‍ර පොත්වල සටහන් තැබීම	8
	තත්කාලීන ගතික (RTK) මැනුම් කිරීම මඟින් දත්ත රැස් කිරීම	
11.58.	තත්කාලීන ගතික (RTK) මැනුම් කිරීමේ ක්‍රම	8

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
11.59.	ශ්‍රී ලංකා අඛණ්ඩ නිරීක්ෂණ යොමු පද්ධති (SLCORS) ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කර දත්ත රැස් කිරීම	9
11.60.	පාදක ස්ථානය(Base station) හා චලකය (Rover) අතර දත්ත සම්බන්ධතාවය මඟින් දත්ත රැස් කිරීම	9
11.61.	පාදක ස්ථානය (Base station) හා චලකය (Rover) අතර රේඩියෝ සම්බන්ධතාවය මඟින් දත්ත රැස් කිරීම	9
11.62.	තත්කාලීන ගතික (RTK) මැනුම් ක්ෂේත්‍ර දත්ත සටහන් තැබීම	9
11.63.	භූමිතික පාලන ලක්ෂ්‍ය භාවිතා කිරීම	9
	ශ්‍රී ලංකා අඛණ්ඩ නිරීක්ෂණ යොමු පද්ධති (SLCORSnet) ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කරන මැනුම් වල ක්ෂේත්‍ර දත්ත සටහන් තැබීම	
11.64.	SLCORS ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කර මැනුම් කිරීමේ ක්‍රමවේදය	9
	පද්ධති වින්‍යාසය හා ප්‍රතිදාන දත්ත ආකෘතීන් (output data formats)	
11.65.	(SLCORS) ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කිරීම සඳහා විස්තරාත්මක උපදෙස්	10
	තත්කාලීන ගතික දත්ත රැස්කිරීමේදී භාවිතා කළ යුතු පරිසණක දත්ත ආකෘතීන් (File format)	
11.66.	දෙපාර්තමේන්තුවේ භාවිතා කරන ග්‍රාහකයන් සඳහා නිමැවුම් දත්ත ආකෘති	10
11.67.	මැනුම් පිඹුරු සකස් කිරීම සඳහා දත්ත ආකෘති	10
	දත්ත පරීක්ෂා කිරීම හා Filter කිරීම	
11.68.	ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ ක්‍රම	10
11.69.	'FIXED' තත්වය සහිත දත්ත රැස් කිරීම	11
11.70.	මැනුම් දත්ත ක්ෂේත්‍ර පොතේ පිටුවල ඇලවීම	11
	අස්ථාවර (unfixed) ලක්ෂ්‍යයන් සඳහා විකල්ප මැනුම් ක්‍රම භාවිතා කිරීම	
11.71.	වන්ද්‍රිකා ආවරණයක් නොමැති ස්ථාන සඳහා නිරීක්ෂණ ගැනීම	11
	ඇමුණුම්	
ඇමුණුම 01	පරික්‍රමණයක් සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශය	12
ඇමුණුම 02	පරික්‍රමණ ඛණ්ඩාංක පත්‍රයක ආදර්ශය	13
ඇමුණුම 03	මැනුම් ලක්ෂ්‍යය විස්තර කිරීම සඳහා අදාළ සංකේත	15
ඇමුණුම 04	විස්තර මැනීම සඳහා ක්ෂේත්‍ර පොතක ආදර්ශය	16
ඇමුණුම 05	අංකිත ක්‍රමයට ගබඩා කරන ලද දත්ත සඳහා ක්ෂේත්‍ර පොතක ආදර්ශය	17
ඇමුණුම 06	විස්තර සමඟ පරික්‍රමණය මැනීම සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශය	19
ඇමුණුම 07	අංකිත ක්‍රමයට ගබඩා කරන ලද දත්ත සඳහා ක්ෂේත්‍ර පොතක ආදර්ශය	20
ඇමුණුම 08	දත්ත අතින් ඇතුලත් කරන ලද ක්ෂේත්‍ර පොතක ආදර්ශය	22
ඇමුණුම 09	විස්තර සමඟ දත්ත අතින් අතුලත් කරන ලද ක්ෂේත්‍ර පොතක ආදර්ශය	24
ඇමුණුම 10	අංකිත දත්ත පිඹුරු සඳහා දත්ත ස්ථර	26
ඇමුණුම 11	පරීක්ෂණ ලක්ෂ්‍ය සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශය	35
ඇමුණුම 12	RTK/ SLCORSnet භාවිතයෙන් විස්තර මැනුම් සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශය	36
ඇමුණුම 13	විවිධ ග්‍රාහක වර්ග වලින් සහ දත්ත සකස් කිරීමේ මෘදුකාංග වලින් සකස් කරන ලද අවසාන දත්ත	37

11 වැනි පරිච්ඡේදය

ක්ෂේත්‍ර මැනුම් දත්ත රැස් කිරීම හා සටහන් තැබීම

ක්ෂේත්‍ර පොත් භාවිතය

11.1. නව ක්ෂේත්‍ර පොත් භාවිතයට ගැනීමේදී අංක යෙදූ ක්ෂේත්‍ර පොතක් බවටත්, ක්ෂේත්‍ර පොතෙහි පිටු 28ක් ඇති බවටත් තහවුරු කර ගත් පසු පැන්සල් ඉරකින් සෙ.මී. 1ක වට තීරයක් ඇඳ වෙන්කර එම තීරය තුල ක්ෂේත්‍ර සටහන් තැබීමෙන් වැලකිය යුතුය. භාවිතයට පෙර පිටු සියල්ල අංක 1-28 දක්වා අංක කිරීම සිදු කළ යුතුය.

11.2. මැනුම් සටහන් කිරීම සඳහා අංක යෙදූ ක්ෂේත්‍ර පොත් පමණක් භාවිතා කළ යුතු අතර තාවකාලික පොත් හෝ තනි කඩදාසි කිසිවිටකත් භාවිතා නොකළ යුතුය. මැනුම් කරන සියළුම දත්ත ක්ෂේත්‍ර පොත්වල මැනුම් කරන අවස්ථාවේදීම සටහන් කළ යුතුය.

11.3. ගම් පිඹුරු/ අවසාන ගම් පිඹුරු හෝ භූලක්ෂණාත්මක පිඹුරු/අවසාන භූලක්ෂණාත්මක පිඹුරු සඳහා ක්ෂේත්‍ර පොත් භාවිතා කරන විට පිට කවරයෙහි ගම් පිඹුරු/අවසාන ගම් පිඹුරු අංකය හා ගමෙහි නම හෝ භූලක්ෂණාත්මක පිඹුරු/අවසාන භූලක්ෂණාත්මක පිඹුරු අංකය යනාදී ලෙසද විස්තර ලිවිය යුතුය. අළුතින් මැනුමක් කිරීමේදී ඊට පෙර එම ගමේම මැනුම් සිදු කරන ලද ක්ෂේත්‍ර පොත් වල හිස් පිටු තිබේ නම් ඒවා භාවිතා කළ යුතුය.

11.4. කැඩැස්තර මැනුම් ප්‍රදේශවලදී කැඩැස්තර සිතියම් අංකය සමඟ කලාප අංකයද ක්ෂේත්‍ර පොතේ පිට කවරයෙහි ලිවිය යුතුය. එක් එක් කලාපය සඳහා වෙන වෙනම ක්ෂේත්‍ර පොත් භාවිතා කළ යුතුය. කලාපයක් සඳහා භාවිතා කරන ලද ක්ෂේත්‍ර පොත් වල හිස් පිටු එම කලාපයට අදාළව සිදු කරනු ලබන පසුකාලීන මැනුම් සඳහා භාවිතා කළ යුතුය.

ක්ෂේත්‍ර සටහන් තැබීමේදී වැදගත් වන කරුණු

11.5. මිනින්දෝරුවරයා විසින් සකස් කරන පිඹුර මඟින් ඉදිරිපත් කිරීමට නියමිත සියළු තොරතුරු එනම් ඉඩම් කැබලි විස්තර, ඒවායේ මායිම්, අනෙකුත් වැදගත් තොරතුරු සහ ප්‍රදේශය තුල පිහිටි මැනුම් පාලන ලක්ෂ්‍ය යන සියල්ලක්ම ඇතුලත් වන පරිදි පැහැදිලි පිරික්සුම් සටහනක් ක්ෂේත්‍ර විමර්ශණයේදී මිනින්දෝරුවරයා විසින්ම සකස් කළ යුතුය. චන්ද්‍රිකා ඡායාරූප සහ/හෝ භූලක්ෂණාත්මක අංකිත දත්ත භාවිතා කිරීම මඟින් මෙම පිරික්සුම් සටහන පිළියෙළ කිරීම වඩාත් පහසු කර ගත හැක.

11.6. අඩි පාර, පටු ඇළ මාර්ග සහ කාණු ආදියේ මායිමේ දෙපසම මැනුම් කර මායිම් ක්ෂේත්‍ර පොතේ තද ඉරි වලින් පෙන්නුම් කළ යුතුය. අතීතයේදී කළ පරිදි මධ්‍ය රේඛාව මැනුම්ගත නොකළ යුතුය.

11.7. අනවසරයෙන් ඉඩම් අල්ලාගත් අයගේ නම් ඉඩම් විස්තර ලැයිස්තුවට ඇතුලත් නොකළ යුතු අතර හිමිකම් කියන්නන්ගේ නම් ප්‍රවේශමෙන් ඇතුලත් කළ යුතුය. මෙම අය අතරින් ගමෙහි වාසය නොකරන්නන්ගේ ලිපිනයන්ද සඳහන් කළ යුතුය.

11.8. ස්ථීර ගති ලක්ෂණයක් රහිත මායිමකට මායිම්ගල් යෙදුවේ නැතිනම් ඊට හේතුව ක්ෂේත්‍ර පොතේ අදාළ පිටුවේ පහලින් අධෝලිපියක් වශයෙන් සටහන් කළ යුතුය.

11.9. මායිම් හා මනින ලද විස්තර පැහැදිලි කිරීමේදී ඇමුණුම 10 හි සඳහන් සම්මත ලකුණු භාවිතා කළ යුතුය. ක්ෂෙත්‍ර පොත් වල මැනුම් දත්ත සටහන් කිරීම වැඩිදුර උපදෙස් සඳහා ශිල්පීය උපදෙස් පොතෙහි 4 වැනි පරිච්ඡේදය බලන්න.

11.10. ක්ෂෙත්‍ර පොත් වල එකිනෙකට කරනු ලබන සියළුම යොමු සටහන් ක්ෂෙත්‍රයේදීම කළ යුතුය. ක්ෂෙත්‍ර පොතේ පෙන්නුම් කර තිබෙන සියළුම මායිම් හා ඒ ඒ මායිම් දෙපැත්තේ එනම් යාබද පිහිටි ඉඩම්වල නම් හා හිමිකරුවන්ගේ නම් ද අදාළ සෑම පිටුවක් පාසාම විස්තර කළ යුතුය. ඒවායේ සඳහන් සටහන්, සංඛ්‍යා පිරිසිදුවටත්, පැහැදිළිවත් තිබිය යුතුය.

11.11. කිසිම මිනින්දෝරුවරයෙකු, වෙනත් මිනින්දෝරුවරයෙකු විසින් කරන ලද මැනුමක් සම්බන්ධ ක්ෂෙත්‍ර පොතක හෝ තමා විසින්ම මීට පෙර කරන ලද මැනුමක් සම්බන්ධ ක්ෂෙත්‍ර පොතක හෝ කිසිවක් ඇතුලත් කිරීම සිදු නොකළ යුතුය. ක්ෂෙත්‍ර පොත් එකිනෙකට යොමු කිරීමට පමණක් එසේ සටහන් කළ හැක.

11.12. පැරණි මායිම් නැවත පිහිටුවීමට හෝ නැවත විවෘත කිරීමට අවශ්‍යවූ විට පැරණි ක්ෂෙත්‍ර පොත් වලින් නැවත විවෘත කළ යුතු දම්වැල් රේඛා වෙනම ලියාගත යුතු අතර, පිහිටුවන ලද නියම අගය ලියාගෙන, ප්‍රවේශමෙන් පැරණි මැනුම් වලට යොමු සටහන් දිය යුතුය.

මැනුම් වැඩ අවසන් කිරීමෙන් පසු යොදන සටහන්

11.13. එක් එක් දිනයේ ක්ෂෙත්‍ර වැඩ අවසන් කළ පිටුවෙහි පහත සඳහන් තොරතුරු ඇතුලත් කර අත්සන, නම සහ දිනය යොදා සහතික කළ යුතුය.

විකෝණමාන මැනුමකදී	පූර්ණමාන මැනුමකදී
උපකරණ ස්ථාන ගණන	උපකරණ ස්ථාන ගණන
-	ලබාගත් නිරීක්ෂණ ගණන
මනින ලද මැනුම් රේඛා ගණන	මනින ලද මැනුම් රේඛා ගණන
මනින ලද මායිම්ගල් ගණන	මනින ලද මායිම්ගල් ගණන
මනින ලද මීටර් ගණන	මනින ලද මීටර් ගණන
ගමන් කළ දුර කි.මී.	ගමන් කළ දුර කි.මී.
කාලගුණය	කාලගුණය
	උපකරණ අංකය
ග්‍රාම නිලධාරිවරයාගේ/නියෝජිතගේ නම	ග්‍රාම නිලධාරිවරයාගේ/නියෝජිතගේ නම

11.14. භාවිතා කළ මායිම්ගල් ගණන සහ මායිම්ගල් උප ගබඩා අංකය, මැනුම් කළ දිනයේදී එක් එක් ක්ෂෙත්‍ර පොතේ අදාළ පිටුවේ වම් පැත්තේ උඩ කෙලවරේ තීන්තෙන් සටහන් කළ යුතුය. වෙනත් මායිම්ගල් ගබඩා සහ වෙනත් දිනයන්හි කළ මැනුම් පිළිබඳව වෙන වෙනම සටහන් කළ යුතුය. මිනින්දෝරු අධිකාරිගේ පරීක්ෂණ වලදී මෙම සටහන් වලට කෙටි අත්සන් යොදා සහතික කළ යුතුය.

11.15. සෑම ක්ෂෙත්‍ර පොතකම සුචි පිටුවේ පිටුපස පිටු අංකය, උප ගබඩා අංකය සහ එක් එක් පිටුවේ භාවිතා කර ඇති මායිම්ගල් ගණන වගුවක සඳහන් කළ යුතුය. එහි නිරවද්‍යතාවය පිළිබඳව මිනින්දෝරු අධිකාරි විසින් කෙටි අත්සන් යොදා සනාථ කළ යුතුය.

11.16. මිනින්දෝරුතැන විසින් ඕනෑම මැනුම් ඉල්ලීමක වැඩ නිම කළ පසුව එහි අන්තිම ක්ෂෙත්‍ර සටහන් පිටුවේ පහත සඳහන් මායිම්ගල් සහතිකය යෙදිය යුතුය.

" අංක ..... දරණ පිටුවල පෙන්නුම් කර ඇති මායිම්ගල් මවිසින් පෞද්ගලිකව පරීක්ෂා කර බලා භූමියේදී ඒවාට අදාළ අනුලම්භයන්/නිරීක්ෂණයන් ලබා ගන්නා ලදි. මායිම් ..... විසින් මාහට පෙන්වා දෙන ලද අතර මා විසින් මායිම්ගල් යොදා සලකුණු කළ මායිම් ..... ට පෙන්වා දෙන ලදී."

11.17. මුල් ක්ෂෙත්‍ර සටහන් කළු තීන්තෙන්ද කාර්යාලයේදී කරනු ලබන සටහන් රතු තීන්තෙන්ද ලිවිය යුතුය. මැනීමට පෙර, ක්ෂෙත්‍ර පොත් වල සහ පිඹුරු වල මායිම්ගල් තීන්තෙන් ලකුණු නොකළ යුතුය.

11.18. ක්ෂෙත්‍ර පොත් වල නිවැරදි කිරීම් සඳහා යොදන සහතික හා ඊට අදාළ කෙටි අත්සන් හා දිනද, එවැනි නිවැරදි කිරීම් කළ විගසම ක්ෂෙත්‍ර පොතෙහි පහත සඳහන් පරිදි යෙදිය යුතුය.

ටී.ඩබ්.
2018.09.07

මේ සමඟම එම පිටුවේ පහළ කෙළවරේ එක් එක් නිවැරදි කිරීමක් සඳහා (අකුරින් හා ඉලක්කමෙන්) පහත සඳහන් පරිදි සහතිකයක් කළ යුතුය.

"මවිසින් එක් (1) ශුද්ධියක් කර ටී.ඩබ්. 2018.09.07 ලෙස කෙටි අත්සන හා දිනය යොදන ලදී. "

(අත්සන)
ටී.වීරසිංහ,
රජයේ මිනින්දෝරු
2018.09.07

හෝ "මවිසින් තවත් ශුද්ධීන් තුනක් (3) කර ටී.ඩබ්. 2018.09.07 ලෙස කෙටි අත්සන හා දිනය යොදන ලදී. "

(අත්සන)
ටී.වීරසිංහ,
රජයේ මිනින්දෝරු
2018.09.07

11.19. ක්ෂෙත්‍ර පොත් වල මුල් සටහන් මකා දැමීම හෝ වෙනස් කිරීම හෝ ඒවාට අළුතෙන් යමක් එකතු කිරීම හෝ නොකළ යුතුය. යම් කිසි දෙයක් වැරදි යයි පෙනී ගියහොත්, එය එක ඉරකින් පැහැදිලිව කපා දමා නැවත ලිවීමෙන් නිවැරදි කළ යුතුය. එක් සංඛ්‍යාවක් හෝ අකුරක් හෝ වෙන එකක් මත එය නිවැරදි කිරීම පිණිස කිසිම විටක නොලිවිය යුතුය. වැරදි හා නිවැරදි සටහන් පැහැදිලිව කියවා බැලීමට හැකිවිය යුතුය. ඉන්පසු 11.18 වැනි ඡේදයේ නියමකර ඇති පරිදි, සංඛ්‍යාවක් හෝ අකුරක් වැරදිවට ලියා ගෙන තිබේනම්, එය කපා දමා, නිවැරදි එක ලියා, එම නිවැරදි කිරීම් සහතික කිරීමට කෙටි අත්සන හා දිනය යෙදිය යුතුය. කිසිම අන්දමක මකා දැමීමක් කිරීමට අවසර නැත. ක්ෂෙත්‍ර පොත් වල සියළුම වර්ග වල සටහන් සම්බන්ධයෙන් මෙම නීතිය අදාළ වන්නේය. තවද ක්ෂෙත්‍ර පොත් පිටුවල කටු සටහන් හෝ ගණනයන් කිරීම හෝ නොකළ යුතුය.

සුචි පිටුවෙහි යොදන සටහන්

11.20. ක්ෂෙත්‍ර පොතේ සුචි පිටුවෙහි එක් එක් මැනුමට භාවිතා කළ පිටු අංකය හා එම මැනුමට අදාළ විස්තර සම්පූර්ණ කළ යුතුය. වැඩෙහි ස්වභාවය සටහන් කරන තීරයේ පහලින් මැනුම් ඉල්ලීම් අංකය සමඟ පිඹුරු අංකය, පත්‍ර අංකය, අතිරේක/ අතුරු පිඹුරු අංකය, භාවිතා කරන ලද ඛණ්ඩාංක පද්ධතිය

යනාදිය විස්තරද සඳහන් කළ යුතුය. කැඩැස්තර මැනුම් වලදී කැඩැස්තර සිතියමේ අංකය (කලාප අංකය සමඟ) / පත්‍ර අංකය රතු පාටින් ලිවිය යුතුය.

11.21. මායිම් නියම කිරීමේ මැනුම් වලදී සුචි පිටුවෙහි "නිරවුල් කිරීමේ නිලධාරියාගේ මැමෝ පත්‍රයෙහි සඳහන් වන අදාළ බිම් කැබලි අංක හා ඊට අදාළ ලංකා මැනුම් බිම් කැබලි අංක ක්ෂේත්‍ර පොතේ ඒ ඒ බිම් කැබලි ඇතුලත නිල් පාටින් ලකුණු කර ඇත." පරිදි සටහනක් යෙදිය යුතුය.

ක්ෂේත්‍ර පොත්වල යොදන අනෙකුත් සටහන්

11.22. ක්ෂේත්‍ර පොත්වල, කියවීමට අපහසු වන පරිදි ළං ළංව කරුණු ඇතුලත් කිරීමත්, බිම් කැබලි තොරතුරු එහි නැවත නැවත ලිවීමත් නොකළ යුතුය.

බිම් කැබැල්ලක් ක්ෂේත්‍ර පොතේ පිටු කිහිපයකම සඳහන් කර තිබෙන විට බිම් කැබැල්ල පිළිබඳ සම්පූර්ණ තොරතුරු එක් පිටුවක සඳහන් කළ යුතුය. අනෙක් පිටුවල ඉඩමේ නම, ඉඩම් පරිහරණය සඳහන් කර ඉඩම් හිමිකරු ආදී අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් එක් එක් බිම් කැබැල්ලකට ඉදිරියෙන් සුදුසු යොමු සටහනක් (පිටුව ... "අ බලන්න" යනාදි වශයෙන්) සමඟ සම්පූර්ණ තොරතුරු ඇතුලත් වන පිටුවට යොමු අංකයද සහිතව දැක්විය යුතුය.

සෑම පිටුවකම ඉහලින් අදාළ පිඹුරු අංකය, පත්‍ර අංකය, අතිරේක/ අතුරු පිඹුරු අංකය හෝ කැඩැස්තර සිතියමේ අංකය, කලාප අංකය, පත්‍ර අංකය රතු වර්ණයෙන් සඳහන් කළ යුතුය. එහි ඇති සෑම ඉඩම් කැබැල්ලක් පාසාම ඉඩම් කැබලි අංකය රතු වර්ණයෙන් "කොටස ...." ලෙසද සඳහන් කළ යුතුය.

11.23. නිරවුල් කිරීම පිළිබඳ තොරතුරු නිරවුල් කිරීමේ නිලධාරියාගේ මායිම් නියම කිරීමේ මැමෝ පත්‍රයෙන් පිටපත් කරගන්නා බැවින් එම තොරතුරු ක්ෂේත්‍ර පොතේ ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ. නිරවුල් කිරීමේ නිලධාරියාගේ මැමෝ පත්‍රයෙහි සඳහන් වන ඔහුගේ බිම් කැබලි අංක හා ඊට අදාළ ලංකා මැනුම් බිම් කැබලි අංක ක්ෂේත්‍ර පොතේ ඒ ඒ බිම් කැබලි ඇතුලත පහත සඳහන් පරිදි නිල් වර්ණයෙන් ලකුණු කළ යුතුය.

නැතහොත්



මෙහි ඉරට උඩින් සඳහන් කර ඇත්තේ නිරවුල් කිරීමේ නිලධාරියාගේ බිම් කැබලි අංකය වේ. ඉරට පහතින් දක්වා ඇත්තේ ලංකා මැනුම් බිම් කැබලි අංකය වේ. ක්ෂේත්‍ර පොතේ මෙය පැන්සලෙන් සටහන් කර මැනුම් අවසන් වූ විගසම ඊට උඩින් නිල් තීන්තෙන් එය නැවත ඇඳිය යුතුය.

ඉඩම් වල නම් හා වැවිලි වල විස්තර නිරවුල් කිරීමේ නිලධාරියාගේ ඉඩම් කැබැල්ලේ ප්‍රධාන කොටස පෙන්නුම් කර තිබෙන ක්ෂේත්‍ර පොතේ සඳහන් කළ යුතුය. එසේ වුවත් නිරවුල් කිරීම් පිළිබඳ විස්තර ඉඩම් විස්තර ලැයිස්තු වල සම්පූර්ණයෙන්ම සඳහන් කළ යුතුය.

නැවත දිග හා කෝණ මැනීම

11.24. නැවත දිග මැනීමක් හෝ නැවත කෝණ මැනීමක් අවශ්‍ය වූ විට ඒ බව වහාම මිනින්දෝරුවරුන් විසින් තම මිනින්දෝරු අධිකාරි වෙතින් පූර්ව අනුමැතියක් ලබාගත යුතුය.
නැවත දිග මැනීමක් හෝ නැවත කෝණ මැනීමක් අවශ්‍ය වන විට අළුත් මැනුම ක්ෂේත්‍ර පොතේ වෙනම පිටුවක ලිවිය යුතුය. ඉන්පසු එය පැරණි මැනුමට යොමු කළ යුතුය.

පැරණි මැනුමේ සාවද්‍ය දිගංශ හා දිග කපා දමා නිවැරදි දිගංශ හා දිග රතෙන් ලකුණු කළ යුතුය. පැරණි මැනුමේ සෑම පිටුවකම පහත සඳහන් සහතිකය ලියා අත්සන් කර දිනයද යෙදිය යුතුය.

"රතු වර්ණයෙන් ලියා තිබෙන දිගංශ හෝ දිග ප්‍රමාණ නැවත කෝණ මැන හෝ නව දිග මැන පිළිගන්නා ලද ඒවාය. "නැවත දිග මැනීම හෝ නැවත කෝණ මැනීම සඳහා ..... ක්ෂෙත්‍ර පොතේ ..... පිටුව බලන්න."

මට්ටම් පොත්

11.25. මට්ටම් පොත් වල කරන සියළු සටහන් තීන්තෙන් කළ යුතුය. යම් කිසි අංකයක් වෙනස් කිරීමේදී එක් අංකයක් උඩ තවත් අංකයක් ලිවීම නැතහොත් කිසිම මකා දැමීමක් නොකළ යුතුය. යම්කිසි කියවීමක් වැරදි ලෙස සටහන් කර ඇත්නම් එම වැරදි ඉලක්කම කපා හැර ඊට උඩින් නිවැරදි ඉලක්කම ලිවිය යුතුය. ඉන්පසු, එම නිවැරදි කිරීම සම්බන්ධයෙන් එහි කෙටි අත්සන හා දිනය 11.18 ඡේදය පරිදි යෙදිය යුතුය.

11.26. අංක යෙදූ මට්ටම් පොත් භාවිතා කළ යුතුය. එම පොතේ ඇතුලත් වන විෂයෙහි විස්තරය ද තීන්තෙන් පිට කවරයෙහි සඳහන් කළ යුතුය.
උදා :රාජාංගන ඉංජිනේරු මැනුම් 1964.

11.27. ප්‍රධාන හා ද්විතියික මට්ටම් ගැනීම මීටරයෙන් දශම ස්ථාන 5 කට ලියා ගත යුතුය. පිල් ලකුණක (පැරණි හෝ අළුත්) පියවීමක් කළ පසු, අනික් කොටස ලියා ගැනීම පටන් ගැනීමට ප්‍රථම හිස්තැන් දෙකක් (භූමිතික අංශයේ ප්‍රයෝජනය සඳහා) තැබිය යුතුය.

11.28. තෘතියික මට්ටම් ගැනීම හා අන් සියළු විස්තර මට්ටම් ගැනීම මීටරයෙන් දශම ස්ථාන 3 කට ලියා ගත යුතුය.

11.29. සමෝච්ඡ රේඛා සඳහා ස්ථාන උස ගන්නා විට මට්ටම්කරු විසින් රේඛාවේ අංකය මට්ටම් පොතේ එක් එක් පිටුවේ ශීර්ෂයෙහිද ස්ථාන උස ගන්නා තැනෙහි තිබෙන කුඤ්ඤයේ අංක වෙනත් කිවයුතු කරුණු සටහන් කිරීමට තබා තිබෙන තීරුවෙහිද ඇතුලත් කළ යුතුය. කුඤ්ඤ අතර වූ ස්ථාන උස සම්බන්ධයෙන් ළඟම පිහිටි අංක යොදා කුඤ්ඤයේ සිට තිබෙන දුර මැන පෙන්නුම් කළ යුතුය.

11.30. රේඛාවක තිබෙන පර්යන්ත පිල් ලකුණුවල පිහිටීම හා වටිනාකම, දෙපැත්තේ යාව පිහිටි පිල් ලකුණු වලට පරීක්ෂණ මට්ටම් ගැනීමකින් නිවැරදි දැයි සොයා බැලිය යුතුය. යම්කිසි දෝෂයක් දක්නට ලැබුනහොත් එක ළඟ තිබෙන පිල් ලකුණු දෙකක් හා එකඟ වන තෙක් මෙම පරීක්ෂණය කළ යුතුය. මෙම පරීක්ෂණය සඳහා නිරීක්ෂණ ගැනීමේදී අනුගමනය කළ යුතු නිරවද්‍යතාව යෝජිත රේඛාව මට්ටම් ගැනීමේදී අනුගමනය කළ යුතු නිරවද්‍යතාවම වේ.

11.31. එක් එක් දවසේ වැඩ අවසන් වූ පසු මට්ටම් ගැනීම පිල් ලකුණකට නැතහොත්, තාවකාලික පිල් ලකුණකට අවසන් කළ යුතුය. අංක යෙදූ කුඩා කුඤ්ඤ තාවකාලික පිල් ලකුණු වශයෙන් ප්‍රයෝජනයට නොගත යුතුය.

11.32. පෙරළු උස ඌණනය කිරීම තනි කඩදාසි වල කළ හැකිය. එහෙත් ඒවා මට්ටම් පොතට ඇතුලත් කර, කඩදාසි විනාශකර දැමීමට ප්‍රථම හොඳින් පරීක්ෂා කර බැලිය යුතුය. මට්ටම්කරුගේ අත්සනට උඩින් කර තිබෙන සෑම සටහනකම නිරවද්‍යතාව සම්බන්ධයෙන් මට්ටම්කරු වගකිව යුතුය.

11.33. මට්ටම් රේඛාවක පියවීම ඉතා පැහැදිලිව පෙන්නුම් කළ යුතුය. පිල් ලකුණු පිහිටුවීම සඳහා කරන මට්ටම් ගැනීම සම්බන්ධයෙන් පියවීමේ දෝෂය ඉවත් කළ යුතුය. පියවීම දෙ.මැ.රෙ. හි නියම කර ඇති සීමාවන් ඉක්මවා ඇත්නම් රේඛාවට අයත් මට්ටම් ගැනීම අවලංගු කර අළුතෙන් මට්ටම් ගැනීම කළ යුතුය. පියවීමේ දෝෂය සඳහා 2.47 ඡේදය බලන්න.

11.34. එක් එක් දිනයේ ක්ෂෙත්‍ර වැඩ අවසන් කළ මට්ටම් පොතේ පිටුවෙහි පහත සඳහන් තොරතුරු ඇතුලත් කර අත්සන, නම සහ දිනය යොදා සහතික කළ යුතුය.

උපකරණ ස්ථාන ගණන
මට්ටම් කළ කිලෝ මීටර් ගණන
ගමන් කළ දුර
කාලගුණය
උපකරණ අංකය

11.35. සෑම පොතකම සුචි පිටුවේ දෙපාර්තමේන්තු ක්ෂෙත්‍ර පොතක මෙන් කරුණු සටහන් කර, එක් එක් පිටුවේ ඇතුලත් කර තිබෙන වැඩ පිළිබඳ විස්තරයක්ද කළ යුතුය. සුචි පිටුව කිසිම අඩු ලුහුඬුවක් නොමැතිව දිනපතා සම්පූර්ණ කර තිබිය යුතුය. ස්ථාන උස මට්ටම් ගැනීම සම්බන්ධ වැඩවලදී එය රූප සටහන් මාර්ගයෙන් සුචියෙහි පෙන්වා තිබිය යුතුය.

පරික්‍රමණ මැනුම් කිරීම හා වෙනත් වැදගත් කරුණු

11.36. විස්තර මැනුම් සඳහා පාලන පරික්‍රමණ පිහිටුවිය යුතු අතර දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි වලට අදාළ වන පරිදි ඒවායේ සංවෘතතාව, පරීක්ෂා කිරීම හා අනුකූලනය (Adjustment) කිරීම කළ යුතුය. පරික්‍රමණ ජාලයක් රේඛා 20 කට සීමා විය යුතුය.

11.37. සියළුම පරික්‍රමණයන් නියමිත නිරවද්‍යතාවයන්ට හා ක්‍රමවේදයන්ට අනුකූලව සිදු කළ යුතුය (2 වැනි පරිච්ඡේදය බලන්න). මෙම පරික්‍රමණ SLD 99 ජාතික බණ්ඩාංක පද්ධතියට අදාළව පිහිටුවිය යුතුය.

11.38. පාලන ලක්ෂ්‍ය පිහිටුවීමට අදාළ ක්ෂෙත්‍ර සටහන් තැබීම සඳහා 2.13 ඡේදය බලන්න.

11.39. පරික්‍රමණ මැනීම සහ විස්තර මැනීම එකවිට හෝ වෙන වෙනම සිදු කළ හැකිය. කෙසේ වුවද පරික්‍රමණ පිහිටුවීම සහ විස්තර මැනීම එක්වරම සිදු කෙරේ නම් පිඹුරු සැකසීමට පෙර එකී සියළුම දත්ත එකවිට-අනුකූලනය (Adjustment) කළ යුතුය.

11.40. පරික්‍රමණ ස්ථාන, ක්ෂෙත්‍රයේ පිහිටුවිය යුතු ලක්ෂ්‍යයන් සහ විස්තර මැනුම් ලක්ෂ්‍යයන් පහත සඳහන් පරිදි අංකනය කළ යුතු අතර ඒවා ක්ෂෙත්‍ර පොත්වල සටහන් කළ යුතුය.

- ❖ විස්තර මැනුම් ලක්ෂ්‍යයන් අංක 1 – 6999 දක්වා අංකනය කළ යුතුය.
- ❖ ක්ෂෙත්‍රයේ පිහිටුවිය යුතු ලක්ෂ්‍යයන් 7000 – 8999 දක්වා අංකනය කළ යුතුය.
- ❖ පරික්‍රමණ ස්ථාන අංක 9000 න් ආරම්භ වන ලෙස අංකනය කළ යුතුය.

මෙම අංක එක් එක් පිඹුරු සඳහා අනන්‍යය විය යුතුය.

11.41. එක් එක් පරික්‍රමණය සඳහා පරික්‍රමණ ස්ථාන අංකය (Traverse Station No), තිරස් දිග (Horizontal Distance), දිගාංශය (Bearing), සිරස් ආනත කෝණය (Vertical angle) සහ ලක්ෂ්‍ය විස්තරය (Point Description) යන කරුණු අංකිතව ගබඩා කළ යුතු අතර ඒවා ක්ෂෙත්‍ර පොත්වලද මැනුම් කරන අවස්ථාවේදීම සටහන් කළ යුතුය. මැනුම් කළ යුතු ප්‍රදේශය සඳහා සකස් කරන පිරික්සුම් සටහන භාවිතා කිරීමෙන් මෙය පහසු වේ.

11.42. පරික්‍රමණ මැනුමක් සටහන් කළ ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශය සඳහා **ඇමුණුම 01** බලන්න.

11.43. පරික්‍රමණ මැනීමේදී උපකරණ ස්ථානය බණ්ඩාංක නැවත පරීක්ෂා කිරීම පහසුවීම සඳහා සෑම උපකරණ ස්ථානයකම සිට නිරීක්ෂණය කරනු ලබන ඉදිරි උපකරණ ස්ථානයේ බණ්ඩාංකද සටහන් කරගත යුතුය. පූර්ණමානය මඟින් සිරස් ආනත කෝණය ලබා නොදෙන්නේ නම් ආනත දිග (Vertical Distance) හා සිරස් උසද (Vertical Height) සටහන් කරගත යුතුය.

11.44. අනුකූලනය කරන ලද දිගාංශය, දුර හා බණ්ඩාංක සටහන් වන මුද්‍රිත කඩදාසියක් පරික්‍රමණ ජාලය සටහන් කළ අවසාන පිටුවේ ඇලවිය යුතුය. සෑම පරික්‍රමණ ජාලයක් සඳහාම **ඇමුණුම 02** හි පෙන්නුම් කර ඇති සැකසූ බණ්ඩාංක පත්‍ර ආදර්ශය භාවිතා කළ යුතුය.

විස්තර මැනුම් (Detail Survey)

11.45. විස්තර මැනුම් කිරීම පහත ක්‍රම අනුව සිදු කළ හැක.

1. විකෝණමාන (Theodolite) හා මැනුම් පටි ආධාරයෙන්
2. පූර්ණමාන (Total Station) මඟින්
3. තත්කාලීන ගතික (RTK) මැනුම් මඟින්
4. ශ්‍රී ලංකා අඛණ්ඩ නිරීක්ෂණ යොමු පද්ධති (SLCORS) ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කරන මැනුම් මඟින්

විකෝණමාන (Theodolite) හා මැනුම් පටි ආධාරයෙන් විස්තර මැනුම් කිරීම

11.46. උපරිම නිවැරදිතාවයකින් යුතුව දත්ත රැස්කිරීම මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වගකීම බැවින් හැකි සෑම විටම පූර්ණමාන භාවිතය නිර්දේශ කරන අතර විකෝණමාන හා මැනුම් පටි භාවිතයෙන් දත්ත රැස් කිරීම හැකිතාක් අවම කළ යුතුය. කෙසේ වෙතත් තවදුරටත් විකෝණමාන හා මැනුම් පටි භාවිතයෙන් දත්ත රැස් කිරීම කළ හැකි අතර එම මැනුම් දත්ත, දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති මෘදුකාංග භාවිතා කර අංකිත දත්ත බවට පරිවර්තනය කළ යුතුය.

11.47. සියළුම වෙනස්කම් පෙන්වා දී නොපියවීම් සඳහන් කර, ඒවා නිවැරදිව අනුකූලනය කළ යුතුය. මෙය නිරීක්ෂණ රැගෙන අවසන්වූ වහාම කළ යුතුය.

11.48. මුද්‍රිත බණ්ඩාංක පිටපත් ක්ෂේත්‍ර පොතෙහි ඇලවීමෙන් හෝ සටහන් කිරීමෙන් පසු මිනින්දෝරුවරයාගේ සහතිකයට අමතරව මිනින්දෝරු අධිකාරී විසින් පරීක්ෂා කළ බවට කෙටි අත්සන යෙදිය යුතුය.

පූර්ණමාන (Total Station) මඟින් විස්තර මැනුම් කිරීම

11.49. පූර්ණමාන (Total Station) මඟින් දත්ත රැස් කිරීමේදී එම දත්ත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් තුල ගබඩා කිරීම කරනු ලැබේ. මෙයට අමතරව ක්ෂේත්‍ර සටහන් තැබීම සඳහා EDM ක්ෂේත්‍ර පොත් භාවිතා කළ යුතුය.

11.50. මැනුම් කරන ලද එක් එක් මැනුම් ලක්ෂ්‍යයට අදාළ ලක්ෂ්‍යය අංකය (P), උතුර-ඛණ්ඩාංක (N), නැගෙනහිර-ඛණ්ඩාංක (E), උස (Z) සහ ලක්ෂ්‍යය විස්තරය (C) යන තොරතුරු අභ්‍යන්තර හෝ බාහිර දත්ත ගබඩාවක් තුල ගබඩා කර ගත යුතුය.

11.51. මැනීමේදී රැස් කළ යුතුයැයි හඳුනාගත් සියළු තොරතුරු සඳහා සංකේත නියම කර දක්වා ඇති අතර එය ඇමුණුම 10 මඟින්ද, මැනුම් ලක්ෂ්‍යය විස්තර කිරීම (C) සඳහා අදාළ සංකේත ඇමුණුම 03 මඟින්ද පෙන්වා ඇති අතර එම සංකේත අනිවාර්යයෙන්ම භාවිතා කළ යුතුය. අමතර සංකේතයක් අවශ්‍ය වන්නේ නම් එය ප්‍රධාන කාර්යාලයේ ඉඩම් තොරතුරු පද්ධති අංශයෙන් ලබාගත යුතුය.

11.52. සත්‍ය ස්ථානීය උස නොදන්නා විට මිහිතැන් ගැන්වූම් චන්ද්‍රිකා (සූසැටි) පද්ධතිය (GNSS) මඟින් ලබාදී ඇති උන්නතාංශය (උස) භාවිතා කළ යුතු අතර එයද නොමැති අවස්ථාවලදී පමණක් කල්පිතමය උන්නතියක් භාවිතා කළ හැක.

11.53. පරික්‍රමණ මැනීම කර මායිම් ලක්ෂ්‍ය නිරීක්ෂණය කරන ලද්දේ නම් ලක්ෂ්‍යය අංකය, විස්තරය, මායිම් විස්තර සහ මුල් පරික්‍රමණ හෝ පසු පරික්‍රමණ යොමු සටහන් සහිත පරික්‍රමණ ලක්ෂ්‍යයන් හා ඉඩම් විස්තර යනාදිය ඇතුලත් වන ආකාරයට, ඇමුණුම 04 හි සඳහන් පරිදි ක්ෂේත්‍ර සටහන් තැබිය යුතුය. පරික්‍රමණ ලක්ෂ්‍යයන් එහි සිට නිරීක්ෂණය කළ මායිම් ලක්ෂ්‍යයන්ට සාපේක්ෂව නිවැරදිව පිහිටන පරිදි ක්ෂේත්‍ර සටහන්වල දැක්විය යුතුය.

11.54. නිරීක්ෂණය කළ ලක්ෂ්‍ය වලට අදාළ ඛණ්ඩාංකවල මුද්‍රිත පිටපත් ඇමුණුම 05 හි දැක්වෙන පරිදි මිනින්දෝරුවරයා විසින් සහතික කර ක්ෂේත්‍ර පොතෙහි අදාළ ක්ෂේත්‍ර සටහන් වලට ඉදිරියෙන් ඇති පිටුවල ඇලවිය යුතු අතර මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කළ බවට කෙටි අත්සන යෙදිය යුතුය.

11.55. පරික්‍රමණ මැනීම කරන අවස්ථාවේදීම මායිම් ලක්ෂ්‍යය නිරීක්ෂණය කරන ලද්දේ නම්, ඇමුණුම 06 හි දක්වා ඇති පරිදි ක්ෂේත්‍ර පොත්වල සටහන් තැබීම කළ යුතුය. මෙම දත්තයන් පරිගණකයට බාගත කළ යුතු අතර ඒවා අනුමත කර ඇති මෘදුකාංග මඟින් යලි සැකසිය (Adjustment) යුතුය. නැවත සකසා ගණනය කරන ලද පරික්‍රමණ ඛණ්ඩාංක සහ නිරීක්ෂණ ලක්ෂ්‍ය ඛණ්ඩාංක, ලක්ෂ්‍ය අංකය, උතුරු-ඛණ්ඩාංක, නැගෙනහිර-ඛණ්ඩාංක, උන්නතිංශය (ඇත්නම්) සහ ලක්ෂ්‍ය විස්තර (P,N,E,Z,C) මිනින්දෝරුවරයාගේ සහතිකය සහිතව ක්ෂේත්‍ර පොතෙහි අදාළ පිටුවෙහි ඇමුණුම 02 හා ඇමුණුම 07 හි දක්වා ඇති ආකාරයට ඇලවිය යුතුය.

11.56. දත්ත රෙකෝඩරයක් නොමැති නම්, ඉහත කී සියළුම තොරතුරු ඇමුණුම 08 හි විස්තර මැනුම් සඳහා පෙන්නුම් කර ඇති ආකාරයට, නිරීක්ෂණ ලබාගෙන ක්ෂේත්‍ර පොතෙහි අතින් සටහන් කළ යුතුය. කෙසේ වුවද අතින් දත්ත වාර්තා කිරීම (Manual Recording) සඳහා මිනින්දෝරු අධිකාරිගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා ගත යුතුය.

11.57. පරික්‍රමණ කරන අවස්ථාවලදී දත්ත අතින් සටහන් කරන ලද්දේ නම් සම්පූර්ණ දත්ත පද්ධතිය, ලබා දී ඇති මෘදුකාංග භාවිතයෙන් නැවත සැකසිය යුතු අතර එසේ නැවත සකසන ලද ඛණ්ඩාංක ඇමුණුම 09 හි පරිදි ක්ෂේත්‍ර පොතෙහි අදාළ පිටුවල ඇලවිය යුතුය. ක්ෂේත්‍ර සටහන්, ලක්ෂ්‍යය අංකය, ලක්ෂ්‍යයේ විස්තරය, මායිම් විස්තරය, පරික්‍රමණ අංකය (පෙර හා පසු පරික්‍රමණ යොමු සහිත පරික්‍රමණ අංක) හා ඉඩම් විස්තරය යන විස්තරයන් සහිතව **ඇමුණුම 04** හා **ඇමුණුම 06** හි සඳහන් ආකාරයකට සැකසිය යුතුය.

තත්කාලීන ගතික (RTK) මැනුම් කිරීම මඟින් දත්ත රැස් කිරීම

11.58. මෙහිදී ක්‍රම තුනකට දත්ත රැස්කිරීම සිදු කළ හැක. එනම්

- ශ්‍රී ලංකා අඛණ්ඩ නිරීක්ෂණ යොමු පද්ධති (SLCORS) ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කිරීම මඟින්
- පාදක ස්ථානය (Base station) හා චලකය (Rover) අතර දත්ත සම්බන්ධතාවය මඟින්
- පාදක ස්ථානය (Base station) හා චලකය (Rover) අතර රේඩියෝ සම්බන්ධතාවය මඟින්

ඉහත ක්‍රම මඟින් දත්ත රැස් කිරීමේදී පහත පරිදි නිරවද්‍යතාවයන් පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

11.59. ශ්‍රී ලංකා අඛණ්ඩ නිරීක්ෂණ යොමු පද්ධති (SLCORS) ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කර රැස් කරන දත්ත වල නිවැරදිභාවය තහවුරු කිරීම සඳහා අවම වශයෙන්, ඛණ්ඩාංක දන්නා පාලන ලක්ෂ්‍යයන් දෙකකට මැනුම් කර ලබා ගන්නා ඛණ්ඩාංක සමඟ මුල් ඛණ්ඩාංක සසඳා බැලීම සිදු කළ යුතුය.

11.60. පාදක ස්ථානය (Base station) හා චලකය (Rover) අතර දත්ත සම්බන්ධතාවය මඟින් දත්ත රැස් කිරීමේදී පාදක ග්‍රාහකය ඛණ්ඩාංක දන්නා ස්ථානයක පිහිටුවා තිබිය යුතු අතර පහත 1.0 රූපයේ දැක්වෙන පරිදි චලක ග්‍රාහකය ඛණ්ඩාංක දන්නා වෙනත් ස්ථාන දෙකක රඳවා ලබා ගන්නා ඛණ්ඩාංක මුල් ඛණ්ඩාංක සමඟ සසඳා නිවැරදිතාවය පරීක්ෂා කළ යුතුය. යෝජිත මැනුම් ප්‍රදේශය සහ පාදක ස්ථානය අතර දුර කි.මී. 2 ක දුරක් නොඉක්මවිය යුතුය.



රූපය 1.0 - පාදක ස්ථාන භාවිතා කර තත්කාලීන ගතික (RTK) මැනුම් කිරීම

11.61. පාදක ස්ථානය (Base station) හා චලකය (Rover) අතර රේඩියෝ සම්බන්ධතාවය මඟින් දත්ත රැස් කිරීමද ඉහත 11.60 ඡේදය පරිදිම වේ.

11.62. මෙම දත්ත සටහන් කිරීම සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශය **ඇමුණුම 12** හි දක්වා ඇත.

11.63. මෙහිදී මිනින්දෝරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පලකර ඇති භූමිතික පාලන ලක්ෂ්‍ය දත්ත ගබඩාවේ ඇති පාලන ලක්ෂ්‍ය භාවිතා කළ යුතුය. ප්‍රමාණවත් පාලන ලක්ෂ්‍යයන් භෞතිකව නොපවතී නම්, ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කිරීමට පෙර, භූමිතික මැනුම් ඒකකය හරහා අවශ්‍ය පාලන ලක්ෂ්‍ය පිහිටුවීමට කටයුතු කළ යුතුය.

ශ්‍රී ලංකා අඛණ්ඩ නිරීක්ෂණ යොමු පද්ධති (SLCORSnet) ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කරන මැනුම් වල ක්ෂේත්‍ර දත්ත සටහන් තැබීම

11.64. ඉහත 11.58 ඡේදයෙහි දක්වා ඇති අවස්ථා තුනේම ක්ෂේත්‍ර දත්ත සටහන් තැබීම එකම ආකාරයකට සිදු කළ හැක. පූර්ණමාන භාවිතා කර විස්තර මැනුම් සිදු කළ යුතු ආකාරයටම මෙහිදීද පිරික්සුම් සටහනක් ක්ෂේත්‍ර පොතේ ඇඳිය යුතුය. මැනුම් කිරීමේදී පිරික්සුම් සටහනේ 11.40 ඡේදයෙහි සඳහන් පරිදි ලක්ෂ්‍ය අංකනය කිරීම සඳහා සම්මත අංකනයන් භාවිතා කළ යුතුය. එම ලක්ෂ්‍යයන් මැනීමේදී රැස්කරන ක්ෂේත්‍ර නිරීක්ෂණ දත්තවල ලක්ෂ්‍ය අංක සහ ලක්ෂ්‍ය විස්තරය හෝ විස්තර කේතයන්, දත්ත රැස්කරනයෙහි/ පාලකයෙහි පටිගත (රෙකෝඩ්) කළ යුතුය. මීට අමතරව, අනෙකුත් අවශ්‍ය ක්ෂේත්‍ර තොරතුරු ක්ෂේත්‍ර පොතේ සටහන් කළ යුතුය. (**ඇමුණුම 12** හි ආදර්ශය)

මෙම අවස්ථාවේදී මිනින්දෝරුවරුන් විසින් මැනුම් දත්ත රැස් කරන සෑම ලක්ෂ්‍යයකම තත්ත්වය (status) 'FIXED' ලෙස ඇති බවට තහවුරු කරගැනීමෙන් පසු පමණක් නිරීක්ෂණ දත්ත රැස්කරනයෙහි/ පාලකයෙහි පටිගත (රෙකෝඩ්) කළ යුතුය.

පද්ධති වින්‍යාසය හා ප්‍රතිදාන දත්ත ආකෘතීන් (output data formats)

11.65. ශ්‍රී ලංකා අඛණ්ඩ නිරීක්ෂණ යොමු පද්ධති (SLCORS) ජාලයේ තත්කාලීන සේවාව භාවිතා කිරීම සඳහා විස්තරාත්මක උපදෙස් 2.53 ඡේදයෙහි දක්වා ඇත. තත්කාලීන ගතික මැනුම් කිරීමේදී GNSS ග්‍රාහකයන් සඳහා වන පරිශීලක අත්පොත අනුව ඉහත 11.60 හා 11.61 ඡේදයන්හි පාදක ස්ථානය (Base station) හා චලකය (Rover) සමඟ දත්ත රැස්කිරීම සිදු කළ යුතුය.

තත්කාලීන ගතික දත්ත රැස්කිරීමේදී භාවිතා කළ යුතු පරිගණක දත්ත ආකෘතීන් (File format)

11.66. තත්කාලීන ගතික දත්ත රැස්කිරීමේදී පරිගණක දත්ත ආකෘතීන් භාවිතා කරන ග්‍රාහකය අනුව වෙනස් විය හැක. දෙපාර්තමේන්තුවේ භාවිතා කරන ග්‍රාහකයන් සඳහා නිමැවුම් දත්ත ආකෘති පහත පරිදි විය යුතුය.

වගුව 1: ග්‍රාහකයන් සඳහා නිමැවුම් දත්ත ආකෘති (Output data formats of GNSS receivers)

ග්‍රාහකය (GNSS Receiver)	**නිමැවුම් දත්ත ආකෘති (Output Data format)**
Topcon GR-5	.tps
CHC i80	.HCN
Hi-Target v60	.GNS
Trimble R6	.T02
Leica Viva	.m00

11.67. මැනුම් පිඹුරු සකස් කිරීම සඳහා පාලකයෙහි දත්ත txt හෝ excel ගොනු ආකෘතියට ලබා ගත යුතුය. විවිධ ග්‍රාහක වර්ග වලින් සහ දත්ත සකස් කිරීමේ මෘදුකාංගවලින් සකස් කරන ලද අවසාන දත්ත ඇමුණුම 13 හි දක්වා ඇත.

දත්ත පරීක්ෂා කිරීම හා Filter කිරීම

11.68. ක්ෂේත්‍ර දත්ත 'FIXED', 'FLOAT' හෝ 'AUTO' තත්වයන් යටතේ රැස්කළ හැකිය. නමුත් මැනුම් කිරීමේදී ' FIXED ' තත්වය යටතේ පමණක් දත්ත රැස් කළ යුතුය. මිනින්දෝරුවරයා විසින් මැනුම අවසන් කිරීමට පෙර නිරීක්ෂිත දත්ත පරීක්ෂා කර බැලීම හා **Filter** කිරීම සිදු කළ යුතුය.

11.69. තව ද මිනින්දෝරුවරයා සහ මිනින්දෝරු අධිකාරීවරුන් විසින් 'FIXED' තත්වය සහිත දත්ත රැස්කලේද යන්න පරීක්ෂා කර තිරස් දෝෂය / තිරස් RMS අගයයන් එක් එක් ලක්ෂ්‍ය සඳහා 0.05m ට වඩා අඩු වන බවට තහවුරු කර ගත යුතුය.
උදාහරණයක් වශයෙන්; **ඇමුණුම 13** හි පිළිවෙලින් වගු 3, 4 හා 5 හි දක්වා ඇති ලක්ෂ්‍යයන්හි තත්ත්වය "FIXED " නොවන ලක්ෂ්‍ය අංක 379, 12, 13, 14, 15, 16, 17 හා 6, 9 ද තිරස් දෝෂය 0.05m ට වඩා වැඩි වගු අංක 3 හි 364, 365 ලක්ෂ්‍යයන් ද පිඹුරු වැඩ සඳහා භාවිතා නොකළ යුතුය.

11.70. ඇමුණුම 13 හි 2, 3, 4 සහ 5 වගුවෙහි දැක්වෙන පරිදි මැනුම් දත්ත ක්ෂේත්‍ර පොතේ පිටුවල අලවා 11.46 ඡේදය අනුව අදාළ සහතිකයන් යෙදිය යුතුය.

අස්ථාවර (unfixed) ලක්ෂ්‍යයන් මැනුම් කිරීම සඳහා විකල්ප ක්‍රම

11.71. ඉහත සඳහන් RTK ක්‍රමවේදයන් යොදා ගනිමින් චන්ද්‍රිකා ආවරණයක් නොමැතිවීම හා නොයෙකුත් භූමි තත්වයන් නිසා මැනුම් නිරීක්ෂණ ගැනීමට නොහැකි අවස්ථාවල 2.59 ඡේදය අනුව සුදුසු විකල්ප ක්‍රමයක් යොදා ගත යුතුය.

[11.42 ඡේදය](#) [7.8 ඡේදය](#) [ඇමුණුම 01](#)

පරික්‍රමනයක් සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශය



පරික්‍රමණ බණ්ඩාංක පත්‍රයක ආදර්ශය

(*සෑම **පරික්‍රමණයක්** සඳහාම මෙම පිටුව පවත්වාගෙන යා යුතුය.*)

පූර්ණමාණ පරික්‍රමණ		විස්තරය	තිරස්<			සිරස්<			තිරස් දුර/ආනත	බණ්ඩාංක			සටහන
ස්ථාන අංක	ඉලක්ක අංක		0	′	″	0	′	″		උ/ද	නැ/බ	උස	

අනුකූලනය කරන ලද පරික්‍රමණයේ බණ්ඩාංක පත්‍රය මෙහි පහත පරිදි ඇලවිය යුතුය.

අනුකූලනය කළ බණ්ඩාංක පත්‍රය

ස්ථාන අංක	විස්තර ය.	දිගංශය ° ′ ″	දිගංශය සඳහා සංශෝධන ° ′ ″	සංශෝධිත දිගංශය ° ′ ″	සීරු මාරු දිගංශය ° ′ ″	තිරස් දිග (මී)	අනුකූලනය කළ බණ්ඩාංක		සටහන
							උතුර (මී)	නැගෙනහිර (මී)	
9000	A6						560917.727	454882.965	GPS Point □No. 1507
9001	C	348 02 08	- 5	348 02 03	348 02 03	50.850	560967.88	454872.440	
9002	CP	01□ 12 35	- 10	01 12 25	0 1□12 24	55.616	561023.107	454873.630	
9003	C	357 03 58	- 15	357 03 43	357 03 42	45.706	561068.753	454871.287	
9004	CP	86 51 12	- 20	86 50 52	86 50 52	74.500	561072.865	454945.692	
9005	CP	85 32 08	- 25	85 31 43	85 31 42	67.569	561078.148	455013.073	
9006	CP	209 00 59	- 30	209 00 29	209 00 29	49.519	561034.857	454989.078	

9007	CP	159 35 06	- 35	159 34 31	159 34 30	53.708	560984.541	455007.839	
9008	CP	167 03 47	- 40	167 03 07	167 03 07	44.440	560941.246	455017.814	
9009	CP	299 02 52	- 45	299 02 07	299 02 06	60.293	560970.525	454965.117	
9010	CP	225 24 40	- 50	225 23 50	225 23 51	38.802	560943.294	454937.508	
				මුළු එකතුව		541.003	560943.294	454937.508	OCP

ඉඩදෙන දෝෂය :

ලද දෝෂය :

මිනින්දෝරුවරයාගේ අත්සන හා දිනය:

මිනින්දෝරු අධිකාරීගේ අත්සන හා දිනය

11.51 ඡේදය **ඇමුණුම 03**

මැනුම් ලක්ෂ්‍යය විස්තර කිරීම සඳහා අදාළ සංකේත

1. උපකරණය පිහිටුවන ස්ථානය:

1	සිමෙන්ති කුඤ්ඤය	CP
2	ගල් කුඤ්ඤය (පොලොව මට්ටමට යටින් පිහිටි)	RPB
3	ගල් කුඤ්ඤය	RP
4	වැලලූ ගල	SS
5	GPS නිරීක්ෂණ ලක්ෂ්‍ය -භූ පාල	GPS
6	මායිම්ගල් කුඤ්ඤය(මාගකු)	LP
7	පරික්‍රමණ සිමෙන්ති කුඤ්ඤය	TCP
සටහන : විස්තර රේඛා කැඩීම් (bkCP, bkRPB, etc;) Note: Feature line break (bkCP, bkRPB, etc;)		bk...

විස්තර මැනීම සඳහා ක්ෂේත්‍ර පොතක ආදර්ශය

(විස්තර මැනිම වෙනම කරන ලදි. පරික්‍රමණය සඳහා ඇමුණුම 01 බලන්න.)



11.54 ඡේදය **ඇමුණුම 05**

අංකිත ක්‍රමයට ගබඩා කරන ලද දත්ත සඳහා ක්ෂෙත්‍ර පොතක ආදර්ශය

(අනුකූලනය කරන ලද විස්තර පරික්‍රමණයක් සඳහා පමණක් භාවිතා කළ යුතුය.)

පූර්ණමාණ පරික්‍රමණ		විස්තරය	තිරස්<			සිරස්<			තිරස් දුර	ඛණ්ඩාංක			සටහන
ස්ථාන අංක	ඉලක්ක අංක		0	′	″	0	′	″		උතුර (මී)	නැගෙනහිර (මී)	(මී)	
9002		පැසිකු								561023.107	454873.630		Page 3
	9001	පැසිකු	181	12	25				55.616	560967.488	454872.440		Set on
	9003	පැසිකු	357	03	43				45.706	561068.722	454871.251		Checked on
	9001	පැසිකු	181	12	24				55.616	560967.465	454872.440		Checked on after observation
9003		පැසිකු								561068.753	454871.287		Page 3
	9002	පැසිකු	177	03	43				45.706	561023.107	454873.630		Set on
	9004	පැසිකු	86	50	52				74.500	561072.818	454945.638		Checked on
	9002	පැසිකු	177	03	43				45.706	561023.107	454873.631		Checked on after observation
	නිරීක්ෂණ ලක්ෂ්‍ය වල ඛංණ්ඩාංක පහත පරිදි ඇලවිය යුතුය.												

ස්ථාන අංක	නිරීක්ෂණ ඛණ්ඩාංක			සංකේත
	උතුර (මී)	නැගෙනහිර (මී)	උස (මී)	
1	561110.671	454534.539		අවි
2	561112.837	454532.627		අවි
3	561120.135	454528.086		ග
4	561100.484	454464.801		ග
5	561093.674	454466.586		අවි

		6	561091.480	454460.516		පැවැ	
		7	561151.215	454514.362		අවි	
		8	561125.739	454455.991		අවි	
		9	561126.719	454546.993		අවි	
		10	561157.612	454591.692		අවි	
		11	561184.676	454577.363		අවි	
		1	561157.993	454532.766		අවි	
		13	561211.184	454561.959		අවි	
		14	561190.235	454518.080		අවි	
		15	561200.089	454549.686		අවි	
		16	561232.139	454536.819		අවි	
		17	561224.620	454516.145		අවි	
		18	561213.673	454509.572		අවි	
		19	561183.331	454500.131		අවි	

මිනින්දෝරුවරයාගේ අත්සන: මිනින්දෝරුවරයාගේ නම: දිනය:									
මිනින්දෝරු අධිකාරීගේ අත්සන, නම හා දිනය									

11.55 ඡේදය ඇමුණුම 06

විස්තර සමග පරික්‍රමණය මැනීම සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශනය



අංකිත ක්‍රමයට ගබඩා කරන ලද දත්ත සඳහා ක්ෂෙත්‍ර පොතක ආදර්ශය

(විස්තර සමඟ පරික්‍රමණයක් මැනීම)

පූර්ණමාන පරික්‍රමණ		විස්තරය	තිරස්<			සිරස්<			තිරස් දුර	ඛණ්ඩාංක			සටහන
ස්ථාන අංකය	ඉලක්ක අංක		0	′	″	0	ස්ථාන සිරස්	ඉලක්ක සිරස්		උතුර	නැගෙනහිර	උස	
	පරික්‍රමණයේ සහ නිරීක්ෂණ ලක්ෂ්‍ය වල ඛංණ්ඩාංක පත්‍රය පහත පරිදි ඇලවිය යුතුය												

ස්ථාන අංක	නිරීක්ෂණ ඛණ්ඩාංක			සංකේත
	උතුර (මී)	නැගෙනහිර (මී)	උස (මී)	
□9100	561123.341	455520.321		පැසිකූ
1	561141.905	455514.652		පැග
2	561166.645	455533.177		ග
9101	561211.818	455585.941		සිකූ
3	561192.29□	455551.230		පැග
4	561203.360	455558.781		අවි
9102	561249.006	455536.206		සිකූ
5	561227.468	455529.446		ඉ
6	561240.542	455514.748		ඉ
7	561231.994	455506.693		පැග
8	561217.914	455520.285		පැග
9103	561160.663	455456.863		සිකූ
9	561191.769	455496.977		ග
10	561205.748	455483.084		පැග

			11	561180.505	455460.331		පැග	
			12	561168.034	455448.754		කවැ	
			13	561157.823	455466.571		කවැ	
			14	561165.768	455474.323		පැග	

මිනින්දෝරුවරයාගේ අත්සන: මිනින්දෝරුවරයාගේ නම: දිනය:	
මිනින්දෝරු අධිකාරිගේ අත්සන, නම හා දිනය	

දත්ත අතින් ඇතුලත් කරන ලද ක්ෂේත්‍ර පොතක ආදර්ශය

පූර්ණමාණ පරික්‍රමණ		විස්තරය	තිරස්<			සිරස්<			තිරස් දුර	ඛණ්ඩාංක			සටහන
ස්ථාන අංශ	ඉලක්ක අංශ		0	′	″	0	ස්ථාන අංශ	ඉලක්ක අංශ		උතුර	නැගෙනහිර	උස	0
9002										561023.107	454873.630		Page 3
	9001	A6							55.616	560967.488	454872.440		GPS B1507 Set on
	9003	පැසිකු	357	03	43				45.706	561068.722	454871.251		Checked on
	1	අවි								561104.671	454534.539		
	2	අවි								561112.837	454552.627		
	3	ග								561120.135	454528.086		
	4	ග								561100.484	454464.801		
	5	අවි								561093.674	454466.586		
	6	පැවැ								561091.248	454460.516		
	7	ග								561151.215	454514.362		
	8	ග								561125.739	454455.991		
	9	ග								561126.719	454546.993		
	10	ග								561157.612	454591.692		
	11	ග								561184.676	454577.363		
	12	ග								561157.993	454532.766		
9003		පැසිකු								561068.753	454871.287		Page 3
	9002	පැසිකු							45.706	561023.107	454873.630		Set on
	9004	පැසිකු	86	50	52				74.500	561072.818	454945.638		Checked on
	13	අවි								561211.184	454561.959		
	14	අවි								561190.235	454518.708		
	15	අවි								561230.089	454549.686		
	16	අවි								561232.139	454536.819		

	17	අවි								561224.620	454516.145		
	18	අවි								561213.673	454509.572		
	19	අවි								561183.331	454500.131		
	20	අවි								561158.273	454443.947		
	21	අවි								561188.607	454433.030		
	22	අවි								561202.022	454442.774		
	23	අවි								561197.193	454422.988		
	24	අවි								561206.323	454420.564		
	25	අවි								561227.123	454492.838		
මිනින්දෝරුවරයාගේ අත්සන: මිනින්දෝරුවරයාගේ නම: දිනය:													
මිනින්දෝරු අධිකාරීගේ අත්සන, නම හා දිනය:													

(විස්තර මැනීම සඳහා පමණි.)

දත්ත අතින් ඇතුලත් කරන ලද ක්ෂේත්‍ර පොතක ආදර්ශය
(විස්තර සමඟ පරික්‍රමණයක් මැනීම)

පූර්ණමාණ පරික්‍රමණ			තිරස්<			සිරස්<				ඛණ්ඩාංක			සටහන
ස්ථාන අංක	ඉලක්ක අංක	ඩිස්තරය	0	′	″	0	ස්ථාන අංශක	ඉලක්ක අංශක	තිරස් දුර	උතුර (මී)	නැගෙනහිර (මී)	උස	0
9100		පැසිකූ								561123.341	455520.321		
	9099	පැසිකූ							56.848	561104.890	455466.550		
	9091	පැසිකූ	70	7	15				69.370	561146.935	455585.550		
	9103	සිකූ	120	27	43				73.632	561160.663	455456.863		
	1	පැග								561141.904	455514.657		
	2	ග								561166.644	455533.182		
	9101	සිකූ	36	33	46				110.155	561211.817	455585.946		
9101		සිකූ								561211.817	455585.946		
	9100	සිකූ	216	33	46				110.155	561123.340	455520.325		
	3	පැග								561192.296	455551.240		
	4	අවි								561203.359	455558.791		
	9102	සිකූ	306	47	12				62.101	561249.005	455536.216		
9102		සිකූ								561249.005	455536.216		
	9101	සිකූ	126	47	12				62.101	561211.817	455585.951		
	9103	සිකූ	221	55	39				118.743	561160.662	455456.877		
9103		සිකූ								561160.662	455456.877		
	9102	සිකූ	41	55	39				118.743	561249.005	455536.220		
	9100	පැසිකූ	120	27	23				73.632	561123.340	455520.335		
										561123.341	455520.321		

පරික්‍රමණයේ සහ නිරික්ෂණ ලක්ෂ්‍ය වල බංණ්ඩාංක පත්‍රය පහත පරිදි ඇලවිය යුතුය

ස්ථාන අංක	නිරික්ෂණ බණ්ඩාංක			සංකේත
	උතුර (මී)	නැගෙනහිර (මී)	උස (මී)	
9100	561123.341	455520.321		පැසිකු
1	561141.905	455514.652		ග
2	561666.645	455533.177		ග
9101	561211.818	455585.941		සිකු
3	561192.297	455551.230		පැග
4	561203.360	455558.781		අවි
9102	561249.006	455536.206		සිකු
□103	561160.663	455456.863		සිකු

මිනින්දෝරුවරයාගේ අත්සන:

මිනින්දෝරුවරයාගේ නම:

දිනය:

මිනින්දෝරු අධිකාරීගේ අත්සන, නම හා දිනය:

11.51 ඡේදය 16.18 ඡේදය 22.4 ඡේදය ඇමුණුම 10

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
BOUND-ADMIN-VIR	+--+--+--+	පළාත් මායිම/Province boundary
	·+·+·+·+·+·+	දිස්ත්‍රික් මායිම /District Boundary
	—···—···—···—	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මායිම/ Divisional Secretaries Division Boundary
	—··—··—·· —	ග්‍රාම නිලධාරී කොට්ඨාශ මායිම Grama Niladhari Boundary
	—·—·—·—·-	ගම් මායිම /Village Boundary
	⊢⊢⊢⊢⊢	මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා මායිම /Municipal, Urban Council or Pradeshiya Sabha
	⊢·—⊢—⊢—⊢·—⊣	මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා සීමා(විශාල කිරීම්වල)/Municipal, Urban Council or Pradeshiya Sabha limits (of extensions)
	— — — — —	ඡන්ද කොට්ඨාශය නැතහොත් කොට්ඨාශ මායිම /Ward or Division
BOUND-B-GEN	ඉ/B	ඉවුර/Bank
BOUND-BUND-GEN	කණ්ඩිය /Bund	කණ්ඩිය /Bund (කණ්ඩිය දිගේ ලියනු ලබයි)
BOUND-BW-GEN	මාතා/ BW	මායිම් තාප්පය /Boundary Wall
BOUND-C-GEN	ගැබැ/ Cu	ගැටි බැම්ම /Curb
BOUND-DF-GEN	කෝවැ /DF	කෝටු වැට /Dry Fence
BOUND-DT-GEN	අ/Dh	අගල /Ditch
BOUND-EDN-GEN	කා/Dn	කපන ලද කාණුව /Earth drain
BOUND-HG-GEN	බවැ/ Hg	බඩ වැටිය /Hedge
BOUND-HYDRO-GEN	ජ/C	ජල මාර්ගය /Channel/Canal
BOUND-HYDRO-GEN	ඇළ /S	ඇළ /Stream (කෙටි යෙදුම English පමණි)
BOUND-HYDRO-GEN	-	ජල ප්‍රවාහය/ඔය/ගඟ /Stream/Oya/River

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
BOUND-HYDRO-GEN	-	ජලාශ/වැව/කළපු /Reservoir/Wewa/Lagoon
BOUND-HYDRO-GEN	-	වෙනත් ජල මායිම් /Other type of Water Boundary (සුදුසු ස්ථානයක නම යෙදිය යුතුය)
BOUND-HYDRO-GEN	ඇළ (වි) /S(Dry)	ඇළ (වියළි) /Stream(Dry)
BOUND-IF-GEN	යවැ/IF	යකඩ වැට /Iron Fence
BOUND-LF-GEN	පැවැ/ LF	පැළඉනි වැට /Live Fence
BOUND-LM-GEN		මායිම්ගල් භාවිතයෙන් මායිම් පිහිටුවා ඇතිවිට /Boundaries defined with Landmarks or Rock Landmarks
BOUND-MYDN-GEN	සිකා/ MDn	සිමෙන්ති කාණුව/ Masonry Drain
BOUND-MW-GEN	සිබැ/MW	සිමෙන්ති බැම්ම/Masonry Wall
BOUND-OTHER-GEN	-	වෙනත් මායිම් /Other type of Boundary
BOUND-OUTER-GEN	-	වෙරළ මායිම /Shore Line
BOUND-RG-GEN	නි/R	නියර /Ridge
BOUND-RL-GEN	-	දුම්රිය මාර්ගය/ Railway line (කෙටි යෙදුම භාවිතා කිරීම අවශ්‍ය නැත) (No need to use abbreviations)
BOUND-RW-GEN	ආතා/RW	ආධාරක තාප්පය /Retaining Wall
BOUND-SF-GEN	ගවැ/SF	ගල්වැට /Stone Fence
BOUND-TB-VIR	-	Transferred Boundaries
BOUND-TE-GEN	තාගැ/ TE	තාර ගැට්ට /Tar Edge
BOUND-U-GEN	අවි/U	අවිනිශ්චිත /Undefined
BOUND-W-GEN	මාබි/ W	මායිම් බිත්තිය /Wall
BOUND-WF-GEN	කවැ/ WF	කම්බි වැට /Wire Fence

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
BOUND-WLF-GEN	කපැවැ/ WLF	කම්බි පැළඉනි වැට/ Wire Live Fence
BOUND-WNF-GEN	කදැවැ/WNF	කම්බි දැල් වැට /Wire Net Fence
OBJ-MAN-MADE		ස්ථිර ගොඩනැගිල්ල /Permanent building (මෙම ස්ථරයෙහි ගොඩනැගිලි සළකුණ, ස් සහ යා ලකුණ යන සියල්ල ඇඳිය යුතුය.) (Square, P and clitch – all should be in this layer)
OBJ-MAN-MADE		තාවකාලික ගොඩනැගිල්ල /Temporary building (මෙම ස්ථරයෙහි ගොඩනැගිල්ල, තා සහ යා ලකුණ යන සියල්ල ඇඳිය යුතුය.) (Square, Ty and clitch – all should be in this layer)
OBJ-MAN-MADE		අත්තිවාරම /Masonry Foundation (අත්තිවාරම අ /F සහ යා ලකුණ මෙම ස්ථරයෙන් ඇඳිය යුතුය.) (break line square, F and clitch – all should be in this layer)
OBJ-MAN-MADE	වැ/To	වැසිකිලිය /Toilet
OBJ-MAN-MADE	වැව/TtP	වැසිකිලි වල /Toilet Pit
OBJ-MAN-MADE	 බෝ / Cul පාලම/Bridge	පාලම/බෝක්කුව /Bridge/Culvert (කෙටි යෙදුම් TEXT-BD දත්ත ස්ථරයේ ලිවිය යුතුය.) (TEXT-BD data layer should be used for abbreviations.)
OBJ-MAN-MADE	මැනුම් දත්ත භාවිතා කර ඇඳිය යුතුය/ should be drawn using survey data	සිමෙන්තියෙන් බඳින ලද ළිඳ/ළිඳ/නල ළිඳ Masonry Well/Earth well/Tube well (කෙටි යෙදුම භාවිතා කිරීම අවශ්‍ය නැත) (No need to use abbreviations)
OBJ-MAN-MADE	වටැ / WT	වතුර ටැංකිය/ Water Tank (මෙම ස්ථරයේ ඇඳිය යුතුය/Object draw in this layer) (කෙටි යෙදුම් TEXT-BD දත්ත ස්ථරයේ ලිවිය යුතුය) (TEXT-BD data layer should be used for abbreviations.)
OBJ-MAN-MADE	 ගේ /G	ගේට්ටුව /Gate (කෙටි යෙදුම් TEXT-BD දත්ත ස්ථරයේ ලිවිය යුතුය)

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
		(TEXT-BD data layer should be used for abbreviations.)
OBJ-MAN-MADE	මපාල /SM	මතුපිට පාලන ලක්ෂ්‍යය සඳහා සංකේතය /Surface Monument Symbol (කෙටි යෙදුම් TEXT-BDP හිද තිත් සලකුන POINT_FS දත්ත ස්ථරයේ ද විය යුතුය.) (should be used abbreviation on TEXT-BDP & Dot mark in POINT-FS data layer.)
OBJ-MAN-MADE	 භූපාල /GCP	භූමිතික පාලන ලක්ෂ්‍යය සඳහා සංකේතය /Geodetic Control Point Symbol (කෙටි යෙදුම් TEXT-BDP හිද කතිර සලකුන POINT_FS දත්ත ස්ථරයේ ද විය යුතුය.) (should be used abbreviation on TEXT-BDP & cross mark in POINT-FS data layer.)
OBJ-MAN-MADE	115.76 පිල/ BM	පිල් ලකුණ /Bench Mark
OBJ-MAN-MADE	115.76 මූපිල /FBM (with value)	මූලික පිල් ලකුණ/ Fundamental Bench Mark
POINT-FS	ග/L	මායිම්ගල /Landmark
POINT-FS	පිග /RL	පිහිටි මායිම්ගල /Rock Landmark
POINT-FS	ක/BP	මායිම් කණුව (කොන්ක්‍රීට් කණුව /ලී වැට කණුව /වෙනත් ස්ථිර මායිම් කණු) / Boundary Post (Concreate Post/ Wooden Post/ Other Permenent Boundary Post)
POINT-FS	ල/M	මායිම් සලකුණ / Boundary Mark (සිමෙන්තිය මත සලකුණ /Mark on cement floor, මායිම් තාප්පය මත සලකුණ /Mark on boundary wall, තාප්පය මත සලකුණ /Mark on Wall)
POINT-FS	ලී / St	ලී කූඤ්ඤය /Stake / Wooden Stakes
POINT-FS	පුග /AL	පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් වළලන ලද ගල /Boundary Stone- Archaeological Dept.
POINT-FS	කැග/ FL	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් වළලන ලද ගල /Boundary Stone- Forest Dept.
POINT-FS	මාග/RDL	මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් වළලන ලද ගල / Boundary Stone- RDA

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
POINT-FS	වික/ EP	විදුලි කණුව /Electric Post
POINT-FS	දුක/TP	දුරකථන කණුව /Telephone Post
POINT-FS	ට්‍රාක /TFP	ට්‍රාන්ස්ෆෝමර් කණුව /Transformer Post
POINT-FS	තැපෙ/PB	තැපැල් පෙට්ටිය /Post Box
POINT-FS	දුකු/ TCB	දුරකථන කුටිය/ Telephone Call Box
POINT-FS	ඇ/N	ඇණය/ Nail (පිත්තල ඇණය /Brass Nail , යකඩ ඇණය /Iron Nail)
POINT-FS	යක/IR	යකඩ කණුව /Iron Rail
POINT-FS	මබ්/Mh	මනුබිල /Manhole
POINT-FS	කුබ/RR	කුණු බක්කිය/ Refuse Receptacle
POINT-FS	වප/SP	වතුර පයිප්පය/Stand Pipe
POINT-FS	වෑ/V	වෑල්වය නොහොත් වාතාශ්‍ර නලය/Valve or Vent-pipe
POINT-FS	මපාල /SM	මතුපිට පාලන ලක්ෂ්‍යය /Surface Monument (නිත් සලකුණ / Node)
POINT-FS	භූපාල/GCP	භූමිතික පාලන ලක්ෂ්‍යය /Geodetic Control Point (නිත් සලකුණ / Node)
POINT-FS	ගස /Tr	ගස /Tree
POINT-FS	කික/ KmP	කිලෝමීටර කණුව /Kilometer Post
POINT-SN		මැනුම් ස්ථානය /Survey Nodes
POINT-TN		පරික්‍රමණ ස්ථානය/ Traverse Nodes
POINT-TP		පැරණි පිඹුරක් මඟින් පිහිටුවන ලද ලක්ෂ්‍යය /Transferred Points (Transferred survey nodes)
TEXT-BD		මායිම හැඳින්වීමේ විස්තරය/Boundary Line Description
TEXT-BD	පාලම/බෝ, Bridge/Cul	පාලම/බෝක්කුව /Bridge/Culvert
TEXT-BD	ගේ /Gate	ගේට්ටුව /Gate (සලකුන සමඟ ලිවිය යුතුය./should be written with symbol)
TEXT-BD	ළිඳ/Well	ළිඳ/Well (නියැකන ලද අංගය සමඟ ලිවිය යුතුය./should be written with the plotted feature)

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
TEXT-BDP		මායිම් ලක්ෂ්‍යයේ විස්තරය/Boundary Point Description (Point Layer වල තිබෙන සියළුම ලක්ෂණ වල කෙටි යෙදුම් මෙම ස්ථරයේ ලිවිය යුතුය) (All abreviations of the features in Point Layer should be written in this layer)
TEXT-EXT		ඉඩම් කැබැල්ලේ ගණනය කරන ලද වර්ගඵලය /Computed Extent of Land Parcels
TEXT-HG		ස්ථානීය උස /Height Value
TEXT-HYDRO		ඇළ /ඔය/ගඟේ නම /Name of the Ela/ Oya/ River
TEXT-INFO-PLAN		පිඹුර මත සටහන් කරන තොරතුරු /Text in body of Plan
TEXT-LOT		කැබලි අංකය /Lot Number
TEXT-PN		තොරතුරු මැනුම් හඳුනාගැනීමේ අංකය /Point Number
TEXT-RD	මාර්ග (අධි)/ Road(E)	මාර්ගය (අධිවේගී)/ Road (Expressways)
TEXT-RD	මාර්ග (ම)/ Road(H)	මාර්ගය (මහාමාර්ග)/ Road (Highways)
TEXT-RD	මාර්ග (වා)/ Road(ID)	මාර්ගය (වාරි මාර්ග)/ Road (Irrigation Dept)
TEXT-RD	මාර්ග (ඉ)/ Road(LD)	මාර්ගය (ඉඩම් සංවර්ධන)/ Road (Land Development)
TEXT-RD	මාර්ග (මාසංඅ)/ Road (RDA)	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)/ Road(Road Development Authority)
TEXT-RD	මාර්ග (ප්‍රාස)/ Road(PS)	මාර්ගය (ප්‍රාදේශීය සභා)/ Road (Pradeshiya Saba)
TEXT-RD	මාර්ග (නස)/ Road(UC)	මාර්ගය (නගර සභා)/ Road (Urban)
TEXT-RD	මාර්ග (මනස) / Road (MC)	මාර්ගය (මහනගර සභා)/ Road (Municipal)
TEXT-RD	මාර්ග (පස)/ Road(PC)	මාර්ගය (පළාත් සභා)/ Road (Provincial Council)
TEXT-RD	මාර්ග (මඅ)/ Road (MA)	මාර්ගය (මහවැලි අධිකාරිය)/ Road (Mahaweli Authority)
TEXT-RD	මාර්ග (පමාසංඅ)/ Road(PRDA)	මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය)/ Road (Provincial RDA)

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
TEXT-RD	මාර්ග (මාසංදෙ)/ Road (RDD)	මාර්ගය (මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව)/ Road (Road Development Department)
TEXT-RD	අපා /FP	අඩි පාර /Foot Path
TEXT-RD		ප්‍රවේශ මාර්ගය /Means of Access
TEXT-RD		පාර/ වතු පාර / Road / Estate Road
TEXT-RD		මාර්ග දිශාවන්/Road Directions
TEXT-SC		ලක්ෂ්‍ය සංකේත/ Feature Code
TEXT-TP		පැරණි පිඹුරක් මඟින් පිහිටුවන ලද ලක්ෂ්‍යයේ හඳුනා ගැනීමේ අංකය /Transferred Point Number
TEXT-VAL-GRID		ග්‍රිඩ් අගයන්/ Grid Values
VIR-ARROW		ඊතලය/ Arrow
VIR-BAR		කොටස් දාර /Section Bar
VIR-CLITCH		යා ලකුණ / භාග යා ලකුණ/ Clitch / Half Clitch
VIR-CS		හරස් කැපුම/ CS Profile
VIR-DANGLE		Dangling Node
VIR-GRID		ග්‍රිඩ් රේඛා/ Grid
VIR-INDEX		මූලික සමෝච්ඡ රේඛා /Index Contours
VIR-INTER		අන්තර් සමෝච්ඡ රේඛා / Intermediate Contours
VIR-CLOSEDOT		කැබලි පියවීමේ තිත / Lot Closing Dot
VIR-CLOSELINE		කැබලි පියවීමේ රේඛා /Lot Closing Line (ඇළකින් හෝ මාර්ගයකින් අඩක් වර්ගඵලය ලෙස ගන්නා අවස්ථාවලදී එම මායිම්) (Boundary as half way of Road or water feature when computing the extent)
VIR-LS		දිග් කැපුම/ LS Profile

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
VIR-MARKS		කොටස් ලකුණු / Section marks , සෙ.මී. 1 ක් දිග ග්‍රිඩ් රේඛා ඡේදනයන් /Grid Cutting line-1cm
VIR-POLY		Virtual Polyline
VIR-TRVLINE		පරික්‍රමණ රේඛා/Traverse Line
TEXT- LUSE	ක / Cam	කපුරු /Camphor
	කර / Car	කරදමුංගු / Cardamom
	පොව/ CE	පොල් වත්ත (හෙක්.20ට වැඩි) / Coconut estate (over 20 hectares)
	සො /Cem	සොහොන්බිම / Cemetery
	පොඉ /CG	පොල් ඉඩම (හෙක්.20ට අඩු) / Coconut Garden (under 20 hectares)
	හේ /Ch	හේන / Chena
	කු /Cin	කුරුඳු /Cinnamon (කු - කුඹුර සඳහාද වේ)
	පැ / Cit	පැණිරි / Citronella
	කො / Coa	කොකෝ / Cocoa
	කෝ / Cof	කෝපි / Coffee
	කපු / Cot	කපු / Cotton
	දෙ/D	දෙනිය / Deniya
	කැ / F	කැලය / Forest
	ව / G = Garden	ගෙවත්ත (ස්ථිර හෝ තාවකාලික වගාව) / G = Garden (permanent or temporary cultivation)
	මු / HJ	මුකලාන / High jungle
	ලකැ / LJ	ලඳු කැලය / Low jungle
	බපි / LP = Lease Plan	බදුකර පිඹුර / LP = Lease Plan
	අහෙ / NC	අළුත් හෙළිකිරීම / New clearing

දත්ත ස්ථර **Layers – Version 2019**	කෙටි යෙදුම් සිංහල/ඉංග්‍රීසි **Abbreviations** **Sinhala/English**	විස්තරය **Description**
TEXT- LUSE	ඕ / O	ඕවිට /Owita
	කු /P	කුඹුර / Paddy field (කු - කුරුඳු සඳහාද වේ.)
	තව / PG	තල් වත්ත /Palmyrah Garden
	වැ / PL	වැවිල්ල / Plantation (gums, teaks & c)
	මිප / PM	මිනිරන් පතල / Plumbago Mine
	තැකා / PO	තැපැල් කාර්යාලය / Post Office
	තැවිකා / PTO	තැපැල් හා විදුලි පණිවුඩ කාර්යාලය / Post and Telegraph Office
	ප / Pt	පතන / Patana
	ආවැබ / PW	ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තු බංගලාව / Public Work Department bungalow
	ගව / Q	ගල්වල / Quarry
	ර / Rb	රබර් / Rubber
	තා / RH	තානායම / Rest House
	දුනැ / RS	දුම්රිය නැවතුම්පල/ Railway Station
	තේ / T	තේ / Tea
	කම / TF	කමත / Threshing Floor
	දු / Tob	දුම්කොළ / Tobacco
	හිපි / TP	හිමිකම් පිඹුර / Title Plan
	හිපි (ර) / TP (Cr)	රජයේ හිමිකම් පිඹුර / Crown Title Plan
	එ / V	එළවළු වගාව / Vegetable cultivation
	වව / WH	වතුර වල /Water Hole
	මුබි / WL	විවෘත මුඩුබිම / Open Waste Land
	පා/ab eg: පොඉ(පා) / CG (ab)	පාළු (අනෙකුත් සාපේක්ෂ නාම සමඟ එකට භාවිතා කරනු ලැබේ.)/ Abandoned (used conjunction with other initials)
	ගල/ RK	ගල /Rock

ඇමුණුම 11

පරීක්ෂණ ලක්ෂ්‍ය සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශනය



11.62 ඡේදය ඇමුණුම 12

RTK/ SLCORSnet භාවිතයෙන් විස්තර මැනුම් සඳහා ක්ෂේත්‍ර පොත් පිටුවක ආදර්ශනය



විවිධ ග්‍රාහක වර්ග වලින් සහ දත්ත සකස් කිරීමේ මෘදුකාංගවලින් සකස් කරන ලද අවසාන දත්ත

Table 2: Topcon GR-5 උපකරණය භාවිතයෙන් ලබාගන්නා බණ්ඩාංක පත්‍රයක ආදර්ශනය

සියළුම උතුරු, නැගෙනහිර බණ්ඩාංක හා තිරස් දෝෂය මීටර වලින්

Name	N	E	Code	HRMS	Solution
21	517674.404	399964.035	MDn	0.003	FIXED
22	517679.33	399966.754	MDn	0.005	FIXED
23	517761.376	399957.751	WF	0.005	FIXED
24	517793.775	399949.732	WF	0.007	FIXED
25	517825.266	399940.992	WF	0.014	FIXED
26	517842.42	399946.631	WF	0.025	FIXED
27	517855.529	399943.253	WF	0.01	FIXED
28	517863.747	399947.657	WF	0.027	FIXED
29	517919.527	399947.627	WF	0.014	FIXED
30	517951.062	399977.335	WF	0.032	FIXED
31	517981.054	399973.206	WF	0.011	FIXED
32	517982.977	399987.936	WF	0.012	FIXED
33	517985.326	400005.648	WF	0.01	FIXED
34	517988.213	400025.335	WF	0.008	FIXED
35	518005.868	400021.043	WF	0.017	FIXED
36	518007.645	400020.604	WF	0.028	FIXED
37	518006.626	400016.438	WF	0.01	FIXED
38	518009.055	400022.639	WF	0.035	FIXED
39	518013.953	400043.213	WF	0.012	FIXED
40	518021.228	400076.677	WF	0.016	FIXED
41	518016.622	400073.852	GP	0.009	FIXED
42	518014.879	400061.067	WF	0.015	FIXED
43	518010.903	400043.905	WF	0.012	FIXED

Table 3: CHC i80 උපකරණය භාවිතයෙන් ලබාගන්නා බණ්ඩාංක පත්‍රයක ආදර්ශනය

Name	N	E	Code	Horizontal Error	Solution
360	521051.904	402097.859	HYE	0.0125	Fix
361	521068.498	402087.892	HYE	0.0126	Fix
362	521073.753	402085.551	HYE	0.0243	Fix
363	521084.728	402080.557	HYE	0.0243	Fix
364	521100.986	402073.645	HYE	0.0982	Fix
365	521114.921	402066.895	HYE	0.0982	Fix
366	521110.91	402059.119	HYE	0.0284	Fix
367	521103.598	402042.973	HYE	0.0284	Fix
368	521099.905	402034.519	HYE	0.0284	Fix
369	521098.72	402031.495	HYE	0.0284	Fix
370	521093.243	402017.41	HYE	0.0284	Fix
371	521111.602	402009.907	HYE	0.0285	Fix
372	521167.507	401989.49	HYE	0.0285	Fix
373	521200.187	401977.949	HYE	0.0285	Fix
374	521213.915	401973.318	HYE	0.0285	Fix
375	521229.227	401967.941	HYE	0.0285	Fix
376	521240.804	401963.917	HYE	0.0286	Fix
377	521263.424	401956.867	HYE	0.0286	Fix
378	521275.044	401953.251	HYE	0.0286	Fix
379	521279.456	401951.608	HYE	0.796	Float
380	521354.234	401922.952	HYE	0.0284	Fix

Table 4: Hi-Target V60 උපකරණය භාවිතයෙන් ලබාගන්නා බණ්ඩාංක පත්‍රයක ආදර්ශනය

Name	N	E	Desc	HRMS	Status
pt1	487675.510	399963.891	cp	0.0078	RTK Fix
pt2	487675.494	399963.901	cp	0.0085	RTK Fix
pt3	487308.614	400051.167	cp	0.0078	RTK Fix
pt4	487506.916	399790.864	cp	0.008	RTK Fix
pt5	487640.960	399590.990	cp	0.0064	RTK Fix
pt6	487357.985	399280.423	cp	0.0081	RTK Fix
pt7	487322.615	399027.304	cp	0.0041	RTK Fix
pt8	486742.417	398851.177	cp	0.0051	RTK Fix
pt9	487155.773	398727.718	cp	0.0035	RTK Fix
pt10	486888.222	399154.306	cp	0.0037	RTK Fix
pt11	486805.921	399490.826	cp	0.0087	RTK Fix
pt12	486824.989	399524.894	cp	5.2174	DGPS
pt13	487044.150	399877.042	cp	0.0537	RTK Float
pt14	488125.109	400717.712	cp	0.4765	RTK Float
pt15	488125.067	400717.654	cp	0.5501	DGPS
pt16	488125.065	400717.653	cp	0.5457	DGPS
pt17	488124.925	400718.203	cp	0.5332	RTK Float
A311	488089.935	400782.363	cp	0.0036	RTK Fix

Table 5: RTK භාවිතා කර ලබාගන්නා බණ්ඩාංක පත්‍රයක ආදර්ශනය

Name	N	E	CODE	Horizontal Error	Status
1	488156.011	400608.007	cp	0.0041	RTKFix
2	488124.746	400616.128	cp	0.0019	RTKFix
3	488003.625	400635.459	cp	0.0035	RTKFix
4	487986.717	400520.795	cp	0.0033	RTKFix
5	488006.060	400570.626	cp	0.0031	RTKFix
6	488002.542	400548.950	cp	1.3550	RTKFloat
7	488017.003	400526.286	cp	0.0158	RTKFix
8	488135.033	400494.209	cp	0.0161	RTKFix
9	488114.805	400506.860	cp	2.1980	RTKFloat
10	488061.353	400519.820	cp	0.0078	RTKFix

ශුද්ධි පත්‍රය

12 වැනි පරිච්ඡේදය

පිඹුරු වැඩ

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	පිඹුරු වැඩ සඳහා පොදු උපදෙස්	
12.1.	මෘදුකාංගය භාවිතයෙන් පිඹුරු නියැකීම	1
12.2.	පිඹුරු සඳහා ක්ෂේත්‍ර පත්‍ර	1
12.3.	නියැකීම් පත්‍රයේ පිඹුර ස්ථානගත කිරීම	1
	පත්‍ර එකකට වඩා භාවිතා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු	
12.4.	අවම පත්‍ර ගණනක් භාවිතා කිරීම	1
12.5.	පිඹුරෙහි කොටස් කීපයක් ඇති විට පත්‍ර තෝරා ගැනීම	1
12.6.	නියැකීම් පත්‍රය 90° කින් හැරවීම	1
12.7.	යාබද කොටස් සඳහා යොමු සටහන් යෙදීම	1
	විවිධ වර්ගවල පිඹුරු සකස් කළ යුතු ආකාරය	
12.8.	අ.ග.පි / භූ.මූ.පි. ප්‍රදේශ වලින් පිටස්තර මැනුම් වැඩ	2
12.9.	ග.පි. හෝ අ.ග.පි. ප්‍රදේශ තුල වැඩ	2
12.10.	කැඩැස්තර මැනුම් ප්‍රදේශ තුල අනුබෙදුමක්/ ඒකාබද්ධ කිරීමකදී	2
12.11.	අ.ග.පි./අ.භූ.පි. ප්‍රදේශ වල විසිරී ඇති මැනුම් වැඩ	2
12.12.	මූ.පි. ප්‍රදේශ තුල වනාන්තර මැනුම් වැඩ	2
12.13.	අ.භූ.පි. හෝ භූ.මූ.පි. ප්‍රදේශ තුල මැනුම් වැඩ	2
	පිඹුරු වල පරිමාණය	
12.14.	විවිධ වර්ගයන්හි පිඹුරු වල පරිමාණය	2
	දාර තොරතුරු, විශේෂ ලක්ෂණ ඇඳීම හා මුද්‍රණය	
12.15.	ඉඩම් විස්තර දත්ත පද්ධතිය සඳහා දාර තොරතුරු	3
12.16.	නගර සභා සීමාව තුල වැටෙන මැනුම් වලදී ඇතුලත් විය යුතු කරුණු	3
12.17.	උතුරු රේඛාව ඇඳීම	3
12.18.	බිත්තියක් සහ වැටක් එකම සරල රේඛාවකින් එකිනෙකට යාවන විට	3
12.19.	පිඹුරේ වගාවන් දැක්වීම	3
	අංකිත පිඹුරු සැකසීම, මායිම්ගල් යෙදීම හා යාබද මායිම් සැසඳීම	
12.20.	අංකිත පිඹුරු සැකසීම, මායිම්ගල් යෙදීම හා යාබද මායිම් සැසඳීම පරීක්ෂා කිරීම	3
	පිඹුරු වල යෙදෙන විශේෂ වර්ණ සහ සලකුණු	
12.21.	පිඹුරක නිල් වර්ණය භාවිතය	3
12.22.	ජල ප්‍රවාහවල දිශාව	3
12.23.	මායිම්ගල් විස්තර කිරීම	4
12.24.	ඛණ්ඩාංක මුද්‍රණය කිරීම	4
12.25.	යා ලකුණු යෙදීම	4
12.26.	ඇළ සහ අධිස්ථාපිත මායිම් සඳහා වර්ණ	4
12.27.	භූමිකම් පිඹුරු, රේඛා චිත්‍ර මූලික පිඹුරු හෝ රේඛා චිත්‍ර පිඹුරු පෙන්නුම් කිරීමට වර්ණ හා අක්ෂර භාවිතය	4

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
12.28.	ත්‍රිකෝණමිතික ස්ථාන, ප්‍රාදේශිය පාලන ලක්ෂ්‍ය හා කූඤ්ඤ සඳහා වර්ණ සහ මිමි	4
	පිඹුරු වල සංක්ෂිප්ත නාම	
12.29.	පිඹුරු සඳහා සංක්ෂිප්ත නාමයන් භාවිතය	4
12.30.	පිඹුරේ භාවිතා කරන සංක්ෂිප්ත නාම යෙදීම	5
12.31.	මායිම් විස්තර කිරීමට සංක්ෂිප්ත නාම	5
12.32.	සංක්ෂිප්ත නාම පිඹුරේ සටහන් කිරීම	5
12.33.	පිඹුරේ අකුරු ලිවීම	5
12.34.	අවිනිශ්චිත සඳහා “අවි ” යන්න සංක්ෂිප්ත නාමය යෙදීම	5
12.35.	පාරක් නැතහොත් අඩි පාරක් ජලමාර්ගයක ඉවුර දිගේ වැටී ඇතිවිට කැබලි අංක කිරීම	5
12.36.	අඩි පාර සහ ජලමාර්ගයන් පිඹුරේ පෙන්වීම	5
	ආදායම් මායිම්	
12.37.	සම්මත සලකුණු යෙදීම	5
12.38.	ආදායම් මායිම් දෙපස යාබද ගම් වල නම් පිඹුරේ මුද්‍රණය කිරීම	5
12.39.	ආදායම් මායිම් සඳහා සම්මත සලකුණු පිඹුරේ පෙන්වීම	5
12.40.	යම් භූමි ලක්ෂණයක මධ්‍යයෙන් ආදායම් මායිම් වැටෙන විට පිඹුරේ පෙන්වීම	5
	යාබද විස්තර	
12.41.	විවිධ මැනුම් ප්‍රදේශ වල යාබද විස්තර මුද්‍රණය කිරීම	6
12.42.	හිපි මායිම් පිඹුරේ මුද්‍රණය කිරීම	6
	බිම් කැබලි අංක යෙදීම	
12.43.	විශාල මැනුම් වලදී බිම් කැබලි අංක යෙදීම	6
12.44.	සමහර බිම් කැබලි සඳහා අංක යොදා නොමැති විට	7
12.45.	සියළුම සම්පූර්ණ සහ භාගේ ක්ෂේත්‍ර පත්‍ර වල කැබලි අංක සටහන් කිරීම	7
12.46.	ලංකා මැනුම් පත්‍ර වල අතුරු පිඹුරු අඳින විට කැබලි අංක යෙදීම	7
12.47.	කලින් තිබූ මායිම් ඒ ලෙසටම ඇති විට ක්ෂේත්‍ර පත්‍ර වල යොදන සටහන්	7
12.48.	මූලික පිඹුරු වල රතු පාටින් යොදා ඇති කැබලි අංක	7
12.49.	විෂම හැඩයෙන් යුත් විශාල බිම් කැබලි සඳහා කැබලි අංක යෙදීම	7
12.50.	බිම් කැබලි හරහා යා ලකුණ යෙදීම	7
12.51.	අවසාන නියෝගයකින් රජයේ යයි ප්‍රකාශිත බිම් කැබලි සඳහා කැබලි අංක යෙදීම	7
12.52.	ගම් මායිම් සඳහා යා ලකුණ නොයෙදීම	7
12.53.	ගම් මායිම් නැතිවිට කැබලි අංක යෙදීම	7
	කැබලි වල උපබෙදීම්	
12.54.	කැබලි අංක යෙදීමේ පූර්ණාංක ක්‍රමය	7
12.55.	පැරණි දර්ශක ක්‍රමය අනුව කැබලි අංක යෙදීම	8
12.56.	වනාන්තර මැනුම් මූලික පිඹුරු අංක පිඹුරේ දැක්වීම	8
12.57.	අ.ග.පි. පත්‍ර අංක කිරීම	8
12.58.	අ.ග.පි. / අ.භූ.මූ.පි. වල පෙන්නුම් කළ යුතු යොමු සටහන්	8
	ඉඩම් විස්තර ලැයිස්තු	
12.59.	ඉඩම් විස්තර දත්ත ගබඩාව	8
12.60.	ඉඩම් විස්තර ලැයිස්තු සඳහා A3 ප්‍රමාණයේ පත්‍ර	8

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
12.61.	ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම සඳහා ආදර්ශ	8
12.62.	ග.පි. හෝ අ.ග.පි. වල බිම් කැබලි අවලංගු කිරීම	8
12.63.	ග.පි. හෝ අ.ග.පි. සඳහා නව ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම	8
12.64.	උප බිම් කැබලි වල ප්‍රමාණයන්ගේ එකතුව, අනුකූලනය කිරීම	9
12.65.	උප බෙදුම් බිම් කැබලි වල ශේෂ ප්‍රමාණය	9
12.66.	ඉඩම් වල නම් සඳහන් කිරීම	9
12.67.	ඉඩමක තිබෙන වගාවන් අනුව එම ඉඩම විස්තර කිරීම	9
12.68.	පැරණි වතු හෝ තාවකාලික වගාව වශයෙන් ඉඩමේ පරිහරණය විස්තර කිරීම	9
12.69.	ගොඩනැගිලි විස්තර කිරීම	9
12.70.	ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිලි යන්න තීරණය කිරීම	9
12.71.	ගොඩනැගිලි පිළිබඳව විස්තරාත්මක තොරතුරු ඇතුලත් කිරීම	9
12.72.	ළිඳක් හෝ උල්පතක් වැනි දෙයක් විස්තර කිරීම	9
12.73.	පාරවල් විස්තර කිරීම	9
12.74.	රජයේ ඉඩම් වල අයුතු ලෙස අල්ලා ගැනීම පිළිබඳව	9
12.75.	හිමිකම් කියන්නන් කීපදෙනෙකු සිටින විට	10
12.76.	හිමිකම් කියන්නාගේ ලිපිනය	10
12.77.	ගම් වල නම් ලිවීම	10
12.78.	ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා සීමාතුල පිහිටි ගම් හා වරිපනම් අංක විස්තර කිරීම	10
12.79.	බිම් ප්‍රමාණ ගණන් බැලීම	10
12.80.	ගම් කිහිපයකට වැටෙන විට ගමේ නම ලිවීම	10
12.81.	ඉඩම් විස්තර ලැයිස්තුව අත්සන් කිරීම	10
12.82.	ඉඩම් විස්තර ලැයිස්තුවේ මැනුම් ඉල්ලීම් අංකය ඇතුලත් කිරීම	10
12.83.	අත්කර ගැනීමේ මැනුම් වල ඉඩම් විස්තර ලැයිස්තු	10
12.84.	ඉඩම් විස්තර ලැයිස්තුවක වර්ග ප්‍රමාණ සංශෝධනය	10
	මැනුම් පිළිබඳ වාර්තාව	
12.85.	මැනුම් වර්ගයන්ට අදාළ වන වාර්තා ආකෘති පත්‍රයන්	11
12.86.	වාර්තාව නිසියාකාරව සම්පූර්ණ කිරීම	11
12.87.	වාර්තාවේ අන්තර්ගත විය යුතු කරුණු	11
12.88.	වාර්තාවේ ඇතුලත් නොවිය යුතු කරුණු	11
12.89.	මැනුම් ඉල්ලීමේ කරන ලද වෙනස්වීම් වාර්තාවට ඇතුලත් කිරීම	11
	පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම	
12.90.	පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවක් සකස් කිරීම	11
12.91.	දිස්ත්‍රික් කාර්යාලයේ සංශෝධන සටහන් පවත්වාගෙන යාම	12
12.92.	ඉ. සං. ආ. සහ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත් යටතේ පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු ලිවීම	12
12.93.	තොරතුරු පරික්ෂා කිරීම සහ සහතික කිරීම	12
12.94.	ක්ෂේත්‍ර පරික්ෂාවකින් පසු පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම	12
12.95.	නව ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක ලබා ගැනීම	12
12.96.	පැරණි ඉඩම් විස්තර ලැයිස්තු සංශෝධනය කිරීම	12
12.97.	පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු පිටපත් නිකුත් කිරීම	12
12.98.	කැඩැස්තර පිඹුරක තොරතුරු යථාවත් කිරීම	12

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	පිඹුරු පරීක්ෂා කිරීම	
12.99.	මිනින්දෝරුවරයා විසින් මැනුම් ඉල්ලීම අවසන් කිරීම	13
12.100.	මිනින්දෝරු අධිකාරි විසින් පිඹුරු පරීක්ෂා කිරීම	13
12.101.	පිඹුර අනුමත කිරීම හා අංකිත දත්ත සම්බන්ධව ජේ‍ය.මි. අ. ගේ වගකීම	13
12.102.	ජේ‍ය.මි. අ. විසින් පිඹුරේ පරීක්ෂා කළ යුතු කරුණු ලැයිස්තුව	13
12.103.	එක් නිලධාරියකු අවසන් නොකළ පිඹුරු වෙනත් නිලධාරියෙකුට භාරදීම	13
	පිඹුරු අත්සන් කිරීම	
12.104.	මිනින්දෝරුවරයා, මිනින්දෝරු අධිකාරි සහ ජේ‍යෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිඹුරු අත්සන් කිරීම	13
12.105.	නව මැනුම් වැඩක් මඟින් පැරණි වැඩ අවලංගු කිරීම	13
	ඇමුණුම්	
ඇමුණුම 01	නොයෙකුත් වර්ග වල මැනුම් සඳහා පිළියෙල කරනු ලබන ඉඩම් විස්තර ලැයිස්තු ආදර්ශ	14
ඇමුණුම 02	පිඹුරු පරීක්ෂා කිරීමට අදාළ උපදෙස්	18

12 වැනි පරිච්ඡේදය

පිඹුරු වැඩ

පිඹුරු වැඩ සඳහා පොදු උපදෙස්

12.1. සියළු මැනුම් වලට අදාළ පිඹුරු සකස් කිරීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති මෘදුකාංගය භාවිතා කළ යුතුය. ඉඩම් විස්තර දත්ත පද්ධතියට ඇතුලත් කරන දත්ත වලින් තෝරාගත් දත්ත භාවිතා කර ඉඩම් විස්තර ලැයිස්තුව පිළියෙල වන පරිදි මෘදුකාංගය සකස් කර ඇත. මෙම ඉඩම් විස්තර දත්ත පද්ධතියේ ඇති දත්ත භාවිතා කර වෙබ් සේවාවක් හරහා තොරතුරු විශ්ලේෂණය කිරීමට හැකිවන පරිදි දත්ත ව්‍යුහගත කිරීමක් සිදුකර ඇත. සෑමවිටම කාලීනව යථාවත් කරන ලද මෘදුකාංගය භාවිතා කළ යුතුය.

12.2. පිඹුරු/ කැඩැස්තර සිතියම් ඇඳීම සඳහා A3 ප්‍රමාණයේ හිස් ක්ෂෙත්‍ර පත්‍ර භාවිතා කළ යුතුය. පිඹුරේ වට මායිම් විස්තර, ග්‍රිඩ් රේඛා සහ මැනුම් විස්තර ඉඩම් විස්තර දත්ත පද්ධතියේ තොරතුරු භාවිතා කර පරිගණක මෘදුකාංගය මඟින් මුද්‍රණය කළ යුතුය.

12.3. පිඹුර මුද්‍රණයට පෙර, පිඹුරට යන ඉඩ ප්‍රමාණය ගැන සැලකිලිමත්ව පරීක්ෂා කර බලා, ක්ෂෙත්‍ර පත්‍රයේ පිඹුරේ පිහිටීම තීරණය කළ යුතුය. මූලිකවම නිවැරදිව පිඹුර පිහිටුවා ගැනීමෙන් හොඳ නිමාවකින් යුත් පිඹුරු/කැඩැස්තර සිතියම් සැකසිය හැක.

පත්‍ර එකකට වඩා භාවිතා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

12.4. A3 ප්‍රමාණයේ පත්‍ර කීපයක් ගැනීමට සිදුවන විශාල ප්‍රදේශයක මැනුමකදී, පත්‍ර සැකසුම සැලකිලිමත්ව කළ යුතුය. මෙ මඟින් අදාළ ප්‍රදේශය අවම පත්‍ර ගණනකින් ආවරණය කළ හැක. එමෙන්ම පිඹුරක් A3 පත්‍ර 1ට වඩා වැඩිවන විට පළමු පත්‍රයේ උතුරු හා නැගෙනහිර දිශාවට පත්‍ර නොගත යුතුය. මෙම පත්‍ර සැකසුම පිඹුර මුද්‍රණයට පෙර මිනින්දෝරු අධිකාරී විසින් පරීක්ෂා කළ යුතුය.

12.5. අවශ්‍ය වූ විට 90º ක් තුලින් මධ්‍යාන්න රේඛාව හරවා තිබෙන විටද, සියළුම පිඹුරු මත මුද්‍රණයන්, පත්‍රයේ ශීර්ෂ මුද්‍රණය කර ඇති දිශාවට අනුකූලව කළ යුතුය. පිඹුරක් කොටස් එකකට වැඩි ගණනකින් යුක්තවේ නම් සියළුම කොටස් වලින් සංයුක්ත පිඹුරක් පහසුවෙන් පිළියෙල කිරීමට හැකිවන පරිදි මෙම කොටස් වල මුද්‍රණය කිරීමේ දිශාව පිඹුරේ පළමු කොටස සමඟ සමාන විය යුතුය.

12.6. පත්‍රය 90º කින් හැරවීමට අවශ්‍ය වූවිට, එය ඔරලෝසුවේ කටු කැරකෙන දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාවට විය යුතුය. මෙලෙස ගත් විට පිඹුරේ ගොනු කරන පත්‍ර දාරය ඔබගේ වම් අත පැත්තට ලැබේ. තවද සියළුම පිඹුරු මත මුද්‍රණයන්, පත්‍රයේ ශීර්ෂ මුද්‍රණය කර ඇති දිශාවට අනුකූලව කළ යුතුය.

12.7. පත්‍ර එකකට වඩා භාවිතා කිරීමේදී සියළුම කොටස් වල වටේ ඇති නිල් ග්‍රිඩ් රේඛාවට මී.මී. 1 ක් නුදුරින් “ 4 වැනි කොටස ” යනුවෙන් මී. මී. 1 ක් පළල අකුරින් පැහැදිලිව සෑම කොටසකට යාබද තීරු වල ලියා කොටස් එකිනෙකට යොමු කිරීම දැක්විය යුතුය. මී.මී. 1 ගණන් ගනු ලබන්නේ 1:4,000 පරිමාණයෙනි. මැනුම තුල වැටෙන මෙම ග්‍රිඩ් රේඛාවේ කොටස සහ මැනුමේ භාහිර මායිමේ පිටතට මී.මී. 5ක පමණ කොටස කළු පාටින් ඇඳිය යුතු අතර, වෙන් වෙන් බිම් කැබලි තුල සහ ඒවායින් පිටත එම ග්‍රිඩ් රේඛාවේ කොටස් වලට කළු පාටින් යා ලකුණ යෙදිය යුතුය.

විවිධ වර්ගවල පිඹුරු සකස් කළ යුතු ආකාරය

12.8. අ.ග.පි/ භූ.මූ.පි. ප්‍රදේශ වලට අයත් නොවන ප්‍රදේශ සඳහා මූලික පිඹුරක් සකස් කළ යුතුය. දිස්ත්‍රික්කයට අදාළ උපසර්ගික අක්ෂරයට පසුව මූලික පිඹුරු අංකය මුද්‍රණය කළ යුතු අතර මිනින්දෝරුවරයා විසින් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් මූලික පිඹුරු අංකය ලබා ගත යුතුය. දිස්ත්‍රික් උපසර්ග සඳහා 4.13 ඡේදය බලන්න.

12.9. ග.පි. හෝ අ.ග.පි. ප්‍රදේශ තුල වැඩ සඳහා පරිපූරක පිඹුරක් සකස් කළ යුතුය. අවසානයට භාවිතා කර ඇති අතිරේක අංකය, පත්‍ර අංකය, කැබලි අංකය සහ ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංකය (**4.47 ඡේදය** අනුව) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ලිඛිතව ලබා ගත යුතුය.

12.10. කැඩැස්තර මැනුම් ප්‍රදේශ තුල අනුබෙදුමක්/ ඒකාබද්ධ කිරීමකදී නව පත්‍රයක් සෑදිය යුතු අතර අවසානයට භාවිතා කළ පත්‍ර අංකය, කැබලි අංකය සහ ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංකය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ලිඛිතව ලබා ගත යුතුය.

12.11. අ.ග.පි./අ.භූ.පි. ප්‍රදේශ වල මැනුම් වැඩ, විසිරී ඇති බිම් කැබලි කිහිපයක් යුක්ත වන්නේ නම්, එසේ එක් එක් බිම් කැබලි සමූහ සඳහා අළුත් A3 ප්‍රමාණයේ පත්‍ර ගැනීම අවශ්‍ය නැත. බිම් සමූහ 2ක් හෝ ඊට වැඩි ගණනක් එකම A3 ප්‍රමාණයේ ක්ෂෙත්‍ර පත්‍රයේ අතුරු පිඹුරු වශයෙන් පෙන්විය හැක.

12.12. වනාන්තර මැනුම් මූලික පිඹුරු ප්‍රදේශ තුල මැනුම් කටයුතු අ.ග.පි. ප්‍රදේශ තුලදී කටයුතු කරන ආකාරයටම කළ යුතුය.

12.13. අ.භූ.පි සහ භූ.මූ.පි ප්‍රදේශ තුල වැඩ සඳහා අවසාන ඉඩම් කැබලි අංකය, අවසාන වශයෙන් භාවිතා කර ඇති පත්‍ර අංකය, ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංකය සහ අතුරු පිඹුරු අංකය හෝ අතිරේක අංකය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ලිඛිතව ලබා ගත යුතුය.

පිඹුරු වල පරිමාණය

12.14. පහත සඳහන් මැනුම් වලදී හැර අන් සියළුම මැනුම් වලදී 1:2,000 පරිමාණය භාවිතා කළ යුතුය.

අ) අත්කර ගැනීමේ මැනුම් වල පිඹුරු අඳිනු ලබන පරිමාණය සඳහා **6.39 ඡේදය** බලන්න.

ආ) අයුතු ලෙස අල්ලා ගන්නා ලද කුඩා ඉඩම් වුවද, ඒවා වටිනා බැවින් හෝ 1:2,000 පරිමාණයට ඇඳීමේදී පැහැදිලිව නොපෙනෙන ඉතා කුඩා බිම් කැබලි

ඇ) ගෙවල්, අත්තිවාරම්, නගර හා ගම් වල තිබෙන පාරවල්වල මායිම්

ඈ) පැරණි මැනුම් දම්වැල් පරිමාණයට හෝ 1:4,000 පරිමාණයට ඇඳ තිබෙන විශේෂ අවස්ථාවලදී අළුතෙන් මනින ඉඩම වටිනා ඉඩමක් නොවන්නේ නම් හා එය 1:5,000 පරිමාණයට ඇඳීම වඩා ඵලදායි වන්නේ නම්, දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ අනුමැතිය ලබාගෙන එම පරිමාණයට ඇඳිය යුතුය.

ඉ) යම්කිසි පිඹුරක අවශ්‍යතාවය අනුව කුඩා හෝ විශාල හෝ පරිමාණයකින් එය ඇඳිය යුතුවූ විට උදා: ඉංජිනේරු යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය වන තොරතුරු සෝදිසි කිරීමේ මැනුම් සඳහා 1:10,000 හෝ කාර්ය ස්ථාන පිඹුරක් (Site Plan) සඳහා 1:100 පරිමාණයද අවශ්‍ය වනු ඇත.

ඊ) කැඩැස්තර සිතියම්වල පරිමාණය හා අංකනය සඳහා **21.32 ඡේදය** බලන්න.

උ) අධිකාරිපත්‍ර (උසාවි කොමිෂන්) මැනුම් වල පරිමාණය සඳහා **5.18 ඡේදය** බලන්න.

දාර තොරතුරු, විශේෂ ලක්ෂණ ඇඳීම හා මුද්‍රණය

12.15. ඉඩම් විස්තර දත්ත පද්ධතිය සඳහා ගම, ග්‍රාම නිලධාරි කොට්ඨාශය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, දිස්ත්‍රික්කය සහ පළාත ඇතුලත් කිරීමෙන් පසු, A3 ප්‍රමාණයේ ක්ෂෙත්‍ර පත්‍රයේ මුද්‍රණය කිරීමට හැක.

12.16. නගර සහා සීමාව තුල වැටෙන මැනුම් වලදී කොට්ඨාශ අංකය සහ නම (එක පේලියකද) සහ ප්‍රාදේශිය බල මණ්ඩලයේ නම (ඊළඟ පේලියේද) ඉඩ ඇති පරිදි මුද්‍රණය කළ යුතුය.
"36 වැනි කොට්ඨාශය, කිරුළ"
"කොළඹ මහ නගර සහා සීමාව තුල

12.17. උතුරු රේඛාව A3 ප්‍රමාණයේ ක්ෂෙත්‍ර පත්‍රයේ ඊසාන පැත්තේ සුදුසු ස්ථානයක ඇඳීම වඩා සුදුසුය. එහි උස සෙ.මී. 4ක් විය යුතුය.

12.18. බිත්තියක් සහ වැටක් එකම සරල රේඛාවකින් එකිනෙකට යාවේ නම් බිත්තිය සහ වැට එකිනෙකට වෙනස්ව හඳුනා ගැනීමට හැකිවන ලෙස බිත්තිය (වැටට වඩා මදක් ඝනව) සම්මත සලකුණු ආකාරයට ඇඳිය යුතුය.

12.19. යම් බිම් කොටසක ඇත්තේ එකම වගාව නම් හෝ පිඹුරේ වෙන් කර පෙන්වා ඇති වගාවන් එකට වැඩි ගණනක් ඇතොත්, වගාවේ විස්තරය මුද්‍රණය කිරීම අවශ්‍ය නැත. විස්තරය මුද්‍රණය කිරීම අවශ්‍ය වන්නේ, බිම් කොටසක ඇති වෙනස් වගාවන් කිහිපයක් පිඹුරේ වෙන් වෙන්ව දක්වා ඇතොත් පමණි.

අංකිත පිඹුරු සැකසීම, මායිම්ගල් යෙදීම හා යාබද මායිම් සැසඳීම

12.20. අ) මිනින්දෝරුවරයා විසින් ක්ෂෙත්‍රයේ මනින ලද දත්ත සහ පරිලෝකණය (scanned) කරන ලද පිඹුරු උපයෝගි කරගෙන අංකිත පිඹුරු සැකසීම මැනුම් කටයුතු හා සමගාමීව සිදු කළ යුතුය.

ආ) හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර, නිරවුල් කරන ලද මූලික පිඹුරු ආදියෙහි විස්තර මායිම් ඇඳීම සහ ඒවායේ වලලන ලද මායිම්ගල් ඇඳීම, මිනින්දෝරු අධිකාරි හා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මායිම්ගල් යෙදීම ප්‍රමාණවත් ලෙස සහ ඵලදායි ලෙස කර තිබෙදැයි සහතික වශයෙන්ම දැනගත යුතුය.

ඇ) මිනින්දෝරු අධිකාරි විසින්, මැනුම් ප්‍රදේශයන් එකිනෙකට යාව තිබෙන විට එක් එක් මිනින්දෝරුවරයාගේ මැනුම් වල මායිම් සඳහා බැලිය යුතුය. එම පොදු මායිම් අතර හිඩැස් හෝ අතිච්ඡාදන නොතිබිය යුතුය. සෑම විටම පොදු මායිම් එක් මිනින්දෝරුවරයෙකු විසින් මැනුම් කිරීමෙන් පසු එය අනෙක් මිනින්දෝරුවරයාට පිඹුරු කටයුතු සඳහා ලබාදිය යුතුය.

පිඹුරු වල යෙදෙන විශේෂ වර්ණ සහ ලකුණු

12.21. කුඤ්ඤ සහ දම්වැල් රේඛා නිල් පාටින් තිබිය යුතුය. ක්ෂෙත්‍ර පොත් අංක හා පිටු අංක කිහිපයක් නිල් පාටින් සඳහන් කළ යුතුය. එසේම තලමිති පොත්වල අංකය ද නිල් පාටින් එතුලෝන් කඩදාසියෙහි සටහන් කළ යුතුය.
අවසාන නිරවුල් ප්‍රදේශවලින් බැහැර වැඩ සම්බන්ධයෙන් A3 ප්‍රමාණයේ ක්ෂෙත්‍ර පත්‍ර වල, පැරණි පත්‍ර වලට යොමු සටහන් නිල් පාටින් පෙන්විය යුතුය.

12.22. ජලමාර්ගවල ජලය ගලා යන දිශාව දක්වන ඊතල ලකුණු පැහැදිලිව කළුපාටින් ඇඳිය යුතුය.

12.23. මායිම්ගල් පෙන්නුම් කරන තිත් හා මායිම්ගල් විස්තර කිරීම් ද කළු පාටින් කළ යුතුය.

12.24. සෑම පිඹුරක්ම පරිලෝකනය කළ යුතු බැවින් ක්ෂෙත්‍ර පත්‍ර වල අවම වශයෙන් මුළු දෙකක ග්‍රිඩ් රේඛා ඡේදනයන් සෙන්ටිමීටර් 1 ක් දිග කළු ඉරි වලින් පෙන්වා එහි ඛණ්ඩාංක අගයන් කියවිය හැකි දිශාවට අගය වැඩිවන අයුරින් පූර්ණ අගයන් පමණක් කළු වර්ණයෙන් මුද්‍රණය කළ යුතුය.

12.25. යා ලකුණ කළු පාටින් විය යුතුය. බිත්තියක හෝ අගලක ආදියෙහි භාගයක්, දෙපැත්තේ සිටින අයිතිවාසිකම් කියා සිටින්නන්ට අයත් නම් යා ලකුණ එම මායිම හරහා ලකුණු නොකර දෙපැත්තේ වෙන වෙනම අර්ධ යා ලකුණු යෙදිය යුතුය.

12.26. පහත සඳහන් මායිම් හැර අන් සියළු මායිම් කළු පාටින් ඇඳිය යුතුය.

අ) ජල ප්‍රවාහ වැනි ජලය ආශ්‍රිත අංග කහ මිශ්‍ර තැඹිලි (Cadmium orange) වර්ණයෙන් ඇඳිය යුතුය.(මෙම මායිම් වෙනත් මායිම් සමඟ සමපාත වන විටද මෙම වර්ණයෙන්ම ඇඳිය යුතුය, එහෙත් වෙනත් මායිම් කළු පාටින් විස්තර කළ යුතුය.)

ආ) අධිස්ථාපන මායිම් රතු වර්ණයෙන් දැක්විය යුතුය. පවතින පිඹුරු වල මායිම් අධිස්ථාපනය කළ යුත්තේ පරිලෝකනය (scanned) හා භූමි ඛණ්ඩාංක වලට පරිවර්තනය කරන ලද (Geo referenced) ප්‍රතිබිම්බ (Images) මගිනි.

12.27. මුල් පිඹුරේ හැර වෙනත් ඕනෑම පිඹුරක, හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර මූලික පිඹුරු හෝ රේඛා චිත්‍ර පිඹුරු හෝ පෙන්නුම් කරන විට 'හිපි'(TP), 'රේ'(D), 'මූපි'(PP) හෝ 'රේපි'(DP) යන අක්ෂර අංකයන් සමඟ පිඹුරෙහි රතු වර්නයෙන් මුද්‍රණය කළ යුතුය. අළුත් මැනුමකට යාවෙන ඉඩම් කැබලි වලට අයත් බදු පිඹුරු අංක නැතහොත්, බදු රේඛා චිත්‍ර අංක විකීර්ණ මැනුම් වල කළු පාටින් පෙන්නුම් කළ යුතුය. ලංකා මැනුම් වලට අයත් වන ඉඩම් කැබලි සම්බන්ධයෙන් පිළියෙල කර තිබෙන පිඹුරක මෙම අංක සඳහන් නොකළ යුතුය.

12.28. ත්‍රිකෝණමිතික ස්ථාන, ප්‍රාදේශිය පාලන ලක්ෂ්‍ය හා කුඤ්ඤ පහත සඳහන් මිමි හා වර්ණ වලින් පිඹුරේ පෙන්විය යුතුය.

ත්‍රිකෝණමිතික ස්ථාන	- රතු පාට ත්‍රිකෝණ මඟින් පැති මි.මී. 3.0 ක් ලෙස
ප්‍රාදේශීය පරික්‍රමණ ලක්ෂ්‍ය	- නිල් පාට ත්‍රිකෝණ මඟින් පැති මි.මී. 3.0 ක් ලෙස
ප්‍රාථමික පරික්‍රමණ කුඤ්ඤ	- නිල් පාට චතුරස්‍ර මඟින් පැති මි.මී. 2.0 ක් ලෙස
ද්විතියික පරික්‍රමණ කුඤ්ඤ	- නිල් පාට වෘත්ත මඟින් එහි විශ්කම්භය මි.මී 2.0 ක් ලෙස
තෘතීයික පරික්‍රමණ කුඤ්ඤ	- නිල් පාට වෘත්ත මඟින් එහි විශ්කම්භය මි.මී 1.5 ක් ලෙස
විස්තර පරික්‍රමණ කුඤ්ඤ	- හැකි තාක් කුඩා නිල් පාට වෘත්ත මඟින්
පැරණි ක්ෂෙත්‍ර පොත් ඇසුරෙන් නැවත අදින ලද කුඤ්ඤ	- නිල් පාට ත්‍රිකෝණ මඟින් පැති මි.මී 1.25ක් ලෙස
ක්ෂෙත්‍ර පොත් යොමුව	- නිල් පාටින් උදා. EDM ගා 2122 ලෙස කුඤ්ඤය අසලින් සුදුසු පරිදි 18

පිඹුරු වල සංක්ෂිප්ත නාම

12.29. සෑම පිඹුරක්ම පිළියෙල කිරීමේදී යොදනු ලබන සියළුම සංක්ෂිප්ත නාමයන් සඳහා යොමුවක් යොදා විස්තර කළ යුතු අතර 11 වැනි පරිච්ඡේදයේ 10 වන ඇමුණුම පරිදි සංක්ෂිප්ත නාම භාවිතා කළ යුතුය.

12.30. පිඹුරු වල සංක්ෂිප්ත නාම යෙදීමේදී පහත සඳහන් කරුණු සිහියේ තබා ගත යුතුය.

අ) සංක්ෂිප්ත නාම සඳහා යොදන අක්ෂර බිම් කැබලි අංක වලට යටින් යෙදිය යුතුය.
ආ) අක්ෂර අතර නැවතීමේ ලකුණ නොයෙදිය යුතුය.
ඇ) ළඟ ළඟම විස්තර පෙන්නුම් කිරීමට සිදුවන විට මෙම අක්ෂර බිම් කැබලි වලට පිටතින් ලියා එම විස්තරය අදාළ වන තැන ඊ ලකුණක් මඟින් පෙන්නුම් කළ යුතුය. එසේ නැත්නම් එය වෙනම යොමු වගුවක සටහන් කළ යුතුය.
ඈ) යාබද ඉඩම් වල මෙම අක්ෂර මුද්‍රණය කළ යුත්තේ ඉඩමේ නමට යටින්ය.

12.31. පිඹුරක ආදායම් මායිම් ඇතුළු සියළු මායිම් විස්තර කළ යුතු අතර ඒ සඳහා සංක්ෂිප්ත නාම සහ සලකුණු 11වැනි පරිච්ඡේදයේ 10 වන ඇමුණුම අනුව යෙදිය යුතුය.

12.32. පිඹුරේ විස්තර ව්‍යාකූල නොවන අයුරින් සංක්ෂිප්ත නාම අක්ෂර ලිවිය යුතු අතර, ඒවාට පසුව නැවතීමේ ලකුණ නොයෙදිය යුතුය.

12.33. පිඹුරේ ලියන අකුරු සියල්ලම **22.7 ඡේදය** අනුව විය යුතුය.

12.34. සියළුම මාර්ග හා වෙන්කළ බිම්වල මායිම් ස්ථිර රේඛා වලින් පෙන්නුම් කළ යුතුය. මෙවැනි මායිම් පිඹුරෙහි විස්තර කළ යුතුය. ඒවා භූමියේ ලකුණු කර නොමැති නම්, 'අවි' යනුවෙන් ඒවා විස්තර කළ යුතුය. ලංකා මැනුම් පිඹුරු වල හැර අනිකුත් පිඹුරු වල තිබෙන අඩි පාර, පාර, මාර්ග (ප්‍රාස), මාර්ග (මනස), මාර්ග (මාසංඅ) ආදි වශයෙන් විස්තර කර ලිවිය යුතුය. මායිමක මායිම්ගල් සිටුවා තිබෙන විට 'අවි' යන සංක්ෂිප්ත නාමය නොයෙදිය යුතුය.

12.35. මාර්ගයක් නැතහොත් අඩි පාරක් ජලමාර්ගයක ඉවුර දිගේ වැටී ඇත්නම් එය ජලමාර්ගයෙන් වෙන්කර කැබලි අංක යොදා පෙන්නුම් කළ යුතුය. මෙම ලක්ෂණ දෙක සම්බන්ධයෙන් ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියාට වෙන වෙනම දැන්වීම් නිකුත් කිරීමට සිදු වන්නේය.

12.36. අංකිත දත්ත වලින් පිඹුර සැකසීමේදී අඩි පාර සහ ජලමාර්ග එහි නියමිත ප්‍රමාණයෙන්ම පෙන්විය යුතුය. අඩි පාර පිඹුරේ කළු වර්ණයෙන් එහි නියමිත ප්‍රමාණයෙන්ම පෙන්විය යුතුය. එය අඩි පාර ලෙස හෝ 'අපා' යන සංක්ෂිප්ත නාමය භාවිතයෙන් විස්තර කළ යුතුය.

ආදායම් මායිම්

12.37. සම්මත සලකුණු යෙදීම 11 වැනි පරිච්ඡේදයෙහි ඇමුණුම 10 අනුව සිදු කළ යුතුය.

12.38. ආදායම් මායිම් පෙන්වීමට පිඹුරේ සම්මත සලකුණු යෙදීමේදී, ආදායම් කොට්ඨාශයේ නම මායිම දෙපැත්තේම පෙන්විය යුතුය. ගමකට ගන්නා ලද පත්‍රයකට සම්පූර්ණ මැනුම වැටෙන විට යාබද ගම් එකක් හෝ කීපයක් ඇත්නම්, යාබද ගම් වල නම් පමණක් පිඹුරේ මුද්‍රණය කිරීම කළ යුතුය.

12.39. ආදායම් මායිම් පිළිබඳ සම්මත සලකුණු විශාල පිඹුරක් වටා සම්පූර්ණයෙන්ම යෙදීම අවශ්‍ය නැත. මේ සම්බන්ධව මිනින්දෝරුවරයෙකුට සිය අභිමතය පරිදි කටයුතු කළ හැකිය. එහෙත් සම්මත සලකුණු පිඹුරේ අදාළ ස්ථාන වල කොටස් වශයෙන් යොදා ආදායම් මායිම් පැහැදිලිව පෙන්නුම් කළ යුතුය. යාබද ආදායම් මායිම් ඒවාට අයත් සම්මත සලකුණු වලින් පෙන්නුම් කළ යුතුය.

12.40. යම් භූමි ලක්ෂණයක මධ්‍යයෙන් ආදායම් මායිම් වැටෙන විට, ලංකා මැනුම් වලදී මෙන් ඊට කැබලි අංක යෙදීමට සිදුවන විට එම භූමි ලක්ෂණයට අයත් ප්‍රදේශයෙන් හරි අඩක් එක් එක් ගම් පිඹුරෙහි කැබලි අංක යොදා පෙන්නුම් කළ යුතුය. එසේම ත්‍රිකෝණමිතික ස්ථානයක් ගමක මායිමක පිහිටා

තිබෙන විට ආදායම් මායිමේ පිහිටීම ත්‍රිකෝණමිතික ලක්ෂයට වෙන් කළ බිම හරහා ඇඳිය යුතු අතර, වෙන්කළ බිමෙහි කොටස් දෙකට වෙන වෙනම කැබලි අංක යෙදිය යුතුය.

යාබද විස්තර

12.41. අ) අ.ග.පි. ප්‍රදේශයකින් පිට ප්‍රදේශයකට යාබද හිමිකම් පිඹුරක් හෝ මූලික පිඹුරක් හෝ මායිම්ගල් නොයෙදූ පැරණි මැනුමක් වූ විට, හිපි හෝ මූපි අංකයට අමතරව යාබද බිම් කැබලි වල නම්, හිමිකම් කියන්නන්ගේ විස්තරය සහ පැරණි පිඹුරු වලට යොමු සටහන්, පිඹුරේ පෙන්විය යුතුය. නගර බද ප්‍රදේශ සම්බන්ධයෙන්, වරිපනම් අංකය සමඟ මාර්ගයේ නම ඉඩමේ නමට යටින් මුද්‍රණය කරනු ලැබේ. මායිම්ගල් දැමූ අළුත් හිමිකම් පිඹුරක්, රේඛා චිත්‍ර පිඹුරක් හෝ මූලික පිඹුරක් මඟින් හිමිකම් කියනු ලබන මායිමක් යාව පිහිටා ඇත්නම් සහ ඒවා මත වැටේ නම්, හිමිකම් පිඹුරට හෝ මූලික පිඹුරට යොමු සටහනක් සහ බිම් කැබලි අංකය රතු වර්ණයෙන් පෙන්වීම ප්‍රමාණවත්ය. නැතහොත් සම්පූර්ණ යාබද විස්තරය අවශ්‍ය වේ.

ආ) අ.ග.පි. හෝ අ.භූ.පි. ප්‍රදේශ වල, යාබද බිම් කැබලි අංක විස්තර නොමැතිව මුද්‍රණය කළ යුතුය. එහෙත් යාබද බිම් කැබැල්ලක එක් වගාවකට වඩා ඇත්නම් ඒවායේ විස්තරද මුද්‍රණය කළ යුතුය.

ඇ) කැඩැස්තර සිතියම් ප්‍රදේශ තුල යාබද බිම් කැබලි අංක/ කලාප අංක/ ක.සි. අංක හා ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නම මුද්‍රණය කළ යුතුය.

ඈ) යාබද පිඹුරු අංක නැවත මුද්‍රණය කිරීමෙන් යාබද මායිම් මත රතු පාටින් යා ලකුණු යෙදීම මඟ හැරිය යුතුය.

ඊ) නගරබද ප්‍රදේශ වල මාර්ග සඳහා ප්‍රාදේශීය නම් ඇති විට, මාර්ග වල දිශාව මුද්‍රණය කිරීම අවශ්‍ය නැත.

12.42. හිමිකම් පිඹුරු වල හෝ මුළුමනින්ම පැවරු රේඛා චිත්‍ර වල හෝ නිරවුල් කිරීමේදී පුද්ගලික යයි නියෝග කළ ඉඩම් හෝ මායිම්, අත්කර ගැනීමේ මැනුම් වලදී කටයුතු කරන්නට සිදුවන පුද්ගලික ඉඩම් තුලට වැටෙන විට, ඒවා ආසන්න වශයෙන් අධිස්ථාපනය කර අත්කර ගැනීමට යන ඉඩම් තුල පැන්සල් ඉරි වලින්ද, යාවෙන මායිම් ලෙස අඳින විට රතු තීන් හා ඉරි වලින් පෙන්නුම් කළ යුතුය. "හිමිකම් පිඹුරු වල මායිම් රතු තීන් හා ඉරිවලින් පෙන්වා ඇත" යනුවෙන් පිඹුරේ යොමු සටහනක් මුද්‍රණය කළ යුතුය.

හිමිකම් කියනු ලබන යාබද කොටස් දෙකක් අතර දැනට ඇති මායිම මත හිමිකම් පිඹුරු මායිම් වැටේ නම්, කළු පාටින් පෙන්වන යාබද මායිම හා අඛණ්ඩව රතු තීන් තුනක් පෙන්විය යුතුය. රතු ඉරි හරහා යා ලකුණ යෙදිය යුතු නොවේ.

හිපි හෝ මූපි බිම් කැබැල්ලකින් එක් යාබද බිම් කැබැල්ලකට වඩා වැඩි ගණනක් ආවරණය වේ නම්, එවැනි කැබලි අංක නැවත නැවත ලිවීමෙන් රතු වර්ණයෙන් යා කිරීමේ ලකුණ යෙදීම වැලැක්විය යුතුය.

බිම් කැබලි අංක යෙදීම

12.43. විශේෂයෙන් විශාල මැනුම් වලදී, පිළිවෙලින් කැබලි අංක යෙදිය යුතුය. මෙම අංක යෙදීම පිඹුරේ උතුරු-බටහිර මායිමේ කෙළවරේ සිට පටන් ගෙන නැගෙනහිර පැත්තට යෙදීම කරගෙන ගොස් නැවත බටහිරට කරගෙන යා යුතුය. පහසුවෙන් බලාගැනීම සඳහා අනුගාමී කැබලි අංක එකිනෙකට ආසන්න කැබලි සඳහා යෙදීම වඩාත් සුදුසු වේ.

12.44. පිඹුරු වැඩ නිම කළ පසු, එහි තිබෙන සමහර බිම් කැබලි සඳහා අංක යොදා නොමැති බව පෙනී ගියහොත්, ඒවාට නව කැබලි අංක යෙදිය යුතුය. පිඹුර සහ ඉ.වි.ලැයිස්තුව අංකිත දත්ත ආශ්‍රයෙන් සකස් කරන බැවින් භාග කැබලි අංක කුමන හේතුවක් නිසාවත් භාවිතා නොකළ යුතුය. ලබාදී ඇති මෘදුකාංගය භාවිතා කර කැබලි අංක යෙදීම සිදු කළ යුතුය.

12.45. සියළුම සම්පූර්ණ සහ භාගේ ක්ෂේත්‍ර පත්‍ර වල කැබලි අංක ක්ෂේත්‍ර පත්‍ර වල වම් පැත්තේ තීරුවේ සටහන් කළ යුතුය. මේ සමඟ මැනුම කරන ලද මාසය නැතහොත් මාසද, ක්ෂේත්‍ර පොත් අංකය, මිනින්දෝරුවරයාගේ අත්සන, තනතුර හා දිනය සඳහන් කළ යුතුය.

12.46. ලංකා මැනුම් ප්‍රදේශයකට පිටස්තරව වූ ක්ෂේත්‍ර පත්‍රයක අතුරු පිඹුරු කිහිපයක් ඇඳ තිබෙන විට, කැබලි අංක යෙදීම ක්ෂේත්‍ර පත්‍රය පුරාම අනුපිළිවෙලින් කළ යුතුය. එසේ නොමැතිව එක් එක් අතුරු පිඹුරු සඳහා එකේ සිට පටන්ගෙන කැබලි අංක නොයෙදිය යුතුය.

12.47. පරීක්ෂා කිරීමෙන් හෝ මැනීමෙන් හෝ බිම් කැබලි වල කලින් තිබූ මායිම් ඒ ලෙසටම ඇති බව සොයාගනු ලැබූ විට, මුල් ක්ෂේත්‍ර පත්‍ර වල වම් පැත්තේ තීරුවෙහි ඒ පිළිබඳව සටහන් කළ යුතුය. A3 ප්‍රමාණයේ ක්ෂේත්‍ර පත්‍ර වල මෙම සටහන් යෙදිය යුත්තේ පිඹුරේ ග්‍රිඩ් කොටුවලින් පිටත සුදුසු ස්ථානයකය.

12.48. නව බිම් කැබලි අංක යෙදීමේදී ක්ෂේත්‍ර පත්‍රයේ රතු පාටින් දැක්වෙන මූලික පිඹුරු බිම් කැබලි අංක කෙරෙහි සැලකිල්ලක් නොදැක්විය යුතුය.

12.49. ස්වාභාවික ලක්ෂණ කැපීයන පරිදි විෂම හැඩයෙන් යුක්ත විශාල බිම් කැබලි එකක් වශයෙන් දැක්විය යුතු නැත. ස්වාභාවික ලක්ෂණ මායිම් වශයෙන් ගෙන මේවා කොටස් වලට වෙන්කර ඒවාට වෙන වෙනම කැබලි අංක යෙදිය යුතුය. පාරක්, දිය ඉම් මායිම් වන අවස්ථාවලදී එම භූ විෂමතා ලක්ෂණයෙන් එක් මායිමක් හා මධ්‍ය රේඛාව සම්මත ලකුණෙන් ඇඳ කැබලි අංක යොදා මුළු වර්ගඵලයෙන් අඩක් ඉඩම් විස්තර ලැයිස්තුවේ සටහන් කළ යුතුය. එවැනි අවස්ථාවක අංකිත දත්ත සකස් කිරීමේදී මධ්‍ය රේඛාව තනි ඉරක් ලෙස VIR-CLOSELINE දත්ත ස්ථරයට ඇතුලත් කළ යුතුය. (11 වැනි පරිච්ඡේදයෙහි ඇමුණුම 10 බලන්න).

12.50. සාමාන්‍යයෙන් පාරවල්, දියඉම් හා වෙන්කළ බිම් කැබලි හරහා යා ලකුණ නොයෙදිය යුතුය. එහෙත් එක ඔප්පුවක් මඟින් අයිතිය ලැබී ඇති ඉඩමක් මෙලෙස කැඩී ඇති විට ඉඩම් හිමිකරුගේ ඉල්ලීමට අනුව කැබලි අංක යෙදිය යුතුය. වෙනත් කාරණා සඳහා වෙන්කරන ලද ඉඩම් ඒකාබද්ධ කර කැබලි අංක නොයෙදිය යුතුය. රජයේ ඉඩම් මෙලෙස කැඩී ඇති විට වෙන වෙනම කැබලි අංක යෙදිය යුතුය.

12.51. පැවරුම් නඩුවකදී රජයේ යැයි ප්‍රකාශ කරනු ලැබූ බිම් කැබලි සහ අවසාන නියෝගයකින් හෝ රජයේ යයි ප්‍රකාශිත යාව තිබෙන බිම් කැබල්ලක් සඳහා එක් කැබලි අංකයක් යෙදීම නොකළ යුතුය.

12.52. ගම් මායිම් හරහා යා ලකුණ නොයෙදිය යුතුය. දෙපැත්තේ තිබෙන ඉඩම් වලට වෙන වෙනම කැබලි අංක යෙදිය යුතුය.

12.53. වෙන වෙනම ගම් මායිම් නොතිබෙන විට අයිතිවාසිකම් කියා නොසිටින මුළු ප්‍රදේශයම 1 වැනි කැබැල්ල වශයෙන් හැඳින්විය යුතුය. අයිතිවාසිකම් කියා සිටින බිම් කැබලි වලට පිළිවෙලින් අංක 2 සිට අංක යෙදිය යුතුය.

කැබලි වල උපබෙදීම

12.54. සෑම බිම් කැබැල්ලකටම මුලින් පැවති මායිම් නොවෙනස්ව තිබෙන තෙක් එයට යොදා ඇති අංකයද වෙනස් නොකළ යුතුය. අනු කොටස් වලට බෙදීමෙන් හෝ ඇළක් හෝ පාරක් හෝ ආදිය වෙනස් වීම

නිසා හෝ යම්කිසි බිම් කැබැල්ලක ප්‍රමාණය වෙනස් වූ විට පැරණි බිම් කැබැල්ල වෙනුවට අළුත් බිම් කැබලි අංක දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ඇති වේ. එවිට, පිඹුරේ තිබෙන මුල් බිම් කැබලි අංකය අවලංගු කර, අන්තිමට යොදා තිබෙන බිම් කැබලි අංකයෙන් පසු අංකයෙන් පටන්ගෙන සම්පූර්ණ අංක යෙදිය යුතුය. මෙම කැබලි අංක යෙදීමේ ක්‍රමයට පූර්ණාංක ක්‍රමය යයි කියනු ලැබේ.

12.55. පැරණි දර්ශක ක්‍රමය අනුව කැබලි අංක කිරීමේදී උප බිම් කැබලි වලට යොදන ලද අංක, බිම් කැබලි නැවත අතුරු කොටස් වලට බෙදීමේදී පූර්ණාංක ක්‍රමයට සංශෝධනය කළ යුතුය.

12.56. අතීතයේ නිකුත් කරන ලද අවසාන ගම් පිඹුරු වලින් සමහර ඉඩම් කොටස් ඉවත්කර වනාන්තර මැනුම් මූලික පිඹුරු නිකුත්කර ඇත. මෙහිදී ලංකා මැනුම් වලදී මෙන් ක්ෂෙත්‍ර පත්‍රවලට අංක යෙදිය යුතු අතර, ශීර්ෂයේ පෙන්විය යුත්තේ 'වනාන්තර මැනුම් මූලික පිඹුර' සහ අංකය වේ.

12.57. අවසාන ගම් පිඹුරු පත්වල අනු පිළිවෙලින් අංක යෙදිය යුතුය. ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිවරයාගේ අවසාන වාර්ථාව ලැබුන පසු කරන ලද ප්‍රථම මැනුම ඇඳිය යුත්තේ පහත සඳහන් පරිදි, අංකයන් යෙදූ ක්ෂෙත්‍ර පත්‍රයකය. (උදා:- අ.ග.පි. 326 ක්ෂෙත්‍ර පත්‍ර අංක 1) අවසාන ගම් පිඹුරු ක්ෂෙත්‍ර පත්‍ර 'කිමී 24 X කිමී 25 පත්‍ර' අංක නොයෙදිය යුතුය.

12.58. අවසාන ගම් පිඹුරු පත්වල හෝ අවසාන භූලක්ෂණාත්මක මූලික පිඹුරු පත්වල සිදු කරන ලද මැනුම් වලදී පිළිවෙලින් යොදන ලද පත්‍ර අංකය, අතුරු පිඹුරු අංක හෝ අතිරේක පිඹුරු අංක සමඟ භාවිතා කරන ලද බිම් කැබලි අංක හා ක්ෂෙත්‍ර පොත් පිටුවලට යොමු සටහන්ද පෙන්නුම් කරමින්, ඒවාට අදාළ අවසාන ගම් පිඹුරෙහි හෝ අවසාන භූලක්ෂණාත්මක මූලික පිඹුරෙහි පහත සඳහන් පරිදි වගු ගත කළ යුතුය.

අ.ග.පි/අ.භූ.පි. පත්‍ර අංකය	අතුරු පිඹුරු හෝ අතිරේක පිඹුරු අංකය	භාවිතා කරන බිම් කැබලි අංක	ඉ.වි.ලැයිස්තු පිටු අංක	ක්ෂෙත්‍ර පොත් සහ පිටු අංක	ශේෂ ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය

ඉඩම් විස්තර ලැයිස්තු

12.59. ලබාදී ඇති මෘදුකාංගයට දත්ත ඇතුලත් කර ඉඩම් විස්තර දත්ත ගබඩාව (Tenementary Information Data Base) සැකසිය යුතුය.

12.60. ඉඩම් විස්තර ලැයිස්තුව මෘදුකාංගය භාවිතා කර A 3 ප්‍රමාණයේ පත්‍රවල කළු පාටින් මුද්‍රණය කළ යුතුය.

12.61. නොයෙකුත් වර්ග වල මැනුම් සඳහා පිළියෙල කරනු ලබන ඉඩම් විස්තර ලැයිස්තු වල ආදර්ශයන් **ඇමුණුම 01** හි දක්වා ඇත.

12.62. ගම් පිඹුරක හෝ අවසාන ගම් පිඹුරක බිම් කැබලි, අතුරු කොටස් වලට බෙදීමේදී, මුල් ඉඩම් විස්තර ලැයිස්තුවේ තිබෙන පැරණි බිම් කැබලි අංකය මත රතු පාටින් ලොකු කුරුස ලකුණක් යොදා වෙනත් කිවයුතු කරුණු තීරුවෙහි '---------- වැනි පිටුවේ ---------- වැනි බිම් කැබලි බලන්න' ලෙස රතු තීන්තෙන් සටහන් යොදා එම අංකය අවලංගු කළ යුතුය. නව ඉඩම් විස්තර ලැයිස්තු පිටුව මුල් ඉඩම් විස්තර ලැයිස්තුවට අමුණා තිබිය යුතුය.

12.63. බිම් කැබලි පිළිබඳව අළුත් තොරතුරු ඉහත සඳහන් කළ අළුත් පිටුවේ ඇතුලත් විය යුතුය. ගම් පිඹුරක හෝ අවසාන ගම් පිඹුරක හෝ නිකුත් කළ තැන් පටන් බිම් කැබැල්ලක් සම්බන්ධයෙන් ඒ ඒ අවස්ථාවෙහි කෙරුණු කටයුතු ඉඩම් විස්තර ලැයිස්තුවේ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය. දත්ත

පද්ධතියට නව දත්ත ඇතුලත් කර පිළියෙල කරන පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවේ නීතිමය විධි විධාන හා මැනීමට හේතුව යටතේ එම බිම් කැබැල්ල නැවත මැනීමට හේතුව සඳහන් කළ යුතුය.

12.64. බිම් කැබලි වල ප්‍රමාණය අංකිත දත්ත භාවිතයෙන් ආගණනය කළ යුතු අතර උප බිම් කැබලි වල ප්‍රමාණයන්ගේ එකතුව **13.18- 13.21 ඡේදයන්ට** අනුව විය යුතුය.

12.65. උප බෙදුම් බිම් කැබලි වලට බෙදූ බිම් කැබැල්ලේ ශේෂ ප්‍රදේශය ඉඩම් විස්තර ලැයිස්තුවේ සෑම විටම පෙන්නුම් කළ යුතුය.

12.66. සියළුම ඉඩම් වල ප්‍රධාන නම් ඉතා ප්‍රවේශමෙන් දැන මෙහි සඳහන් කළ යුතුය. ඉඩම් විස්තර දත්ත පද්ධතියේ ඉඩමේ නම සඳහා දත්ත ඇතුලත් කිරීමේදී වර්තමානයේ භූමියේ භාවිතා කරන නම්, පැරණි නම් හා වෙනස් වන අවස්ථාවලදී අවසාන ගම් පිඹුරේ සඳහන් නම ඇතුලත් කර " නොහොත් " යන්න සමඟ වර්තමානයේ භාවිතා කරන නම ඇතුලත් කළ යුතුය.

12.67. ඉඩමක තිබෙන වගාවන් අනුව එම ඉඩම විස්තර කළ යුතුය. වටිනා ගස් ස්වල්පයක් පමණක් තිබෙන බිම් කැබැල්ලක, එම ගස් තිබෙන කොටස වෙන්කර පෙන්වීම ප්‍රායෝගික නොවන විට එම ගස්වල නම් හා සංඛ්‍යාව සඳහන් කළයුතුය. තවද වගාවන්හි වයස කොපමණ කළක් ගතවූවක් දැයි යන්න ආසන්න වශයෙන් සඳහන් කළ යුතුය.

12.68. පැරණි වැවිලි, ගෙවල් ආදිය නොමැති නැතහොත් 'පැරණි වතු' බව දැන ගැනීමට කිසිම ස්ථීර සාක්ෂියක් නොමැති අවස්ථාවලදී ඉඩම් පරිහරණය 'තාවකාලික වගාව' ලෙස සඳහන් කළ යුතුය. මේවා කිසි විටක ශ්‍රැති මාත්‍ර සාක්ෂි අනුව 'පැරණි වගාව ' යනුවෙන් විස්තර නොකළ යුතුය.

12.69. බිම් කැබැල්ලක තිබෙන ගොඩනැගිලි සියල්ලම පිඹුරෙහි පෙන්වා නොමැති වුවද, ඒවා ස්ථීර නැතහොත්, තාවකාලික ගොඩනැගිලිද යන්න විස්තර සහිතව ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කළ යුතුය.

12.70. සම්මතයක් වශයෙන් ඕනෑම උළු සෙවිලි කළ සහ සිමෙන්තියෙන් සාදන ලද ගොඩනැගිලි ස්ථීර ගොඩනැගිලි වශයෙන්ද මැටියෙන් තනා පොල්අතු සෙවිලි කරන ලද ගොඩනැගිලි තාවකාලික ගොඩනැගිලි වශයෙන්ද සැලකිය හැක.

12.71. අත්කර ගැනීමේ මැනුම්, උසාවි මැනුම් වැනි මැනුම් වලදී ගොඩනැගිලි මැටියෙන් නැතහොත් ගඩොලින් තැනූ ගොඩනැගිලිද එසේ නැත්නම් ඒවා අතු සෙවිලි නැතහොත් උළු සෙවිලි ගොඩනැගිලිද ආදී වශයෙන් ගොඩනැගිලි සම්බන්ධව විස්තරාත්මක තොරතුරු සැපයිය යුතුය.

12.72. බිම් කැබැල්ලක් තුල ළිඳක් නැතහොත් උල්පතක් වැනි දෙයක් ඇත්නම් එයද සඳහන් කළ යුතුය. ළිං ගැන සඳහන් කිරීමේදී ඒවා 'බඳින ලද' නැතහොත් 'තාවකාලික' ළිං ද යන වග සඳහන් කළ යුතුය.

12.73. වතු මඟින් නඩත්තු කරන පාරවල් "පාර" යනුවෙන් විස්තර කළ යුතු අතර ඒවා වතු මඟින් නඩත්තු කරන බව "කිවයුතු කරුණු" තීරයේ සඳහන් කළ යුතුය. මේ සඳහා "වතු පාර" යන පාඨය නොයෙදිය යුතුය. මාර්ග සංවර්ධන අධිකාරිය සහ ප්‍රාදේශීය සභා නඩත්තු කරන පාරවල් පිළිවෙලින් මාර්ග (මාසංඅ) සහ මාර්ග (ප්‍රාස) යනුවෙන් විස්තර කළ යුතුය.

12.74. රජයේ බිම් කැබලි සම්බන්ධයෙන් අයුතු ලෙස අල්ලා ගැනීම පිළිබඳව විවාදයක් නොමැති බැවින් හිමිකම් කියන්නාගේ නම "රජය" යන්න යෙදිය යුතුය. මැනීමට හේතුව /නීතිමය විධි විධාන යටතේ "අනවසරයෙන් වගා කර ඇත" යන්න පමණක් සඳහන් කළ යුතු අතර අනවසරකරුගේ නම ඇතුළත් නොකළ යුතුය.

12.75. හිමිකම් කියන්නන් කීපදෙනෙකු සිටින විට ප්‍රධාන හිමිකම් කියන්නාගේ නම සමඟ "සහ තවත් අය" යන්න සඳහන් කළ යුතුය. හිමිකම් කියන කණ්ඩායම් කිහිපයක් සිටී නම් ඒ ඒ කණ්ඩායම වෙනුවෙන් පෙනී සිටින එක් අයකුගේ නම සමඟ සෙසු අය සඳහා "සහ තවත් අය" යන්න සඳහන් කළ යුතුය.

12.76. මැනුම කටයුතු කෙරෙන ගමක වාසය නොකරන හිමිකම් කියන්නන්ගේ ලිපිනයන් සඳහන් කළ යුතුය.

12.77. අවසාන ගම් ප්‍රදේශයක තිබෙන ගම්වල නම් ලිවීමේදී ඒවා ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීගේ අවසාන රජෝර්තුවෙහි තිබෙන අක්ෂර පරිදි ලිවිය යුතුය. අනිකුත් ගම් වල නම් ආණ්ඩුවේ ග්‍රාම ලැයිස්තුවේ සඳහන් කර තිබෙන පරිදි ලිවිය යුතුය. ලැයිස්තුවේ වෙනම සඳහන් කර නොමැති කුඩා ගම් ඒවා අයත් වන ගම් සමඟ සඳහන් කළ යුතුය. පාළු ගම් සඳහන් කිරීමේදී ප්‍රාදේශීය ලේකම්ගෙන් විමසා බලා ප්‍රධාන ගමේ නම වරහන් තුල ලිවිය යුතුය.

12.78. ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා යනාදියන්හි සීමාතුල පිහිටි බිම් කැබලි, ඒවා තුළ පිහිටා තිබෙන බව සඳහන් කළ යුතු අතර එම බිම් කැබැල්ල පිහිටා තිබෙන ගමේ නමද සමඟ 12.16 ඡේදයේ ඇතුලත් කරුණුද පෙන්විය යුතුය. තවද, බිම්කැබලි වල වරිපනම් අංක, ඒවා පිහිටි පාරවල නම් ඉඩමේ නම සමඟ සඳහන් කළ යුතුය.

12.79. බිම් ප්‍රමාණ පරිගණක මෘදුකාංගය මඟින් ගණනය කළ යුතුය. 13 පරිච්ඡේදය අනුව එහි නිරවද්‍යතාව පරීක්ෂා කළ යුතුය. බිම් ප්‍රමාණය කුඩා වන විට සහ එහි ප්‍රමාණය දශම ස්ථානයකට පසු බිංදු එකක් හෝ ඊට වැඩිවන විට (උදා: හෙක්. 0.0037) ඉඩම් විස්තර ලැයිස්තුව භාවිතා කරන අයගේ පහසුව තකා අදාළ ප්‍රමාණය වර්ග මීටර වලින් (වර්ග මීටර 37) සටහන් කළ යුතුය.

12.80. අදාළ මැනුම එක ගමකට වඩා වැටෙන විට, ඉඩම් විස්තර ලැයිස්තුවේ ගම සඳහා දත්ත ඇතුලත් කිරීමේදී ගම්වල නම් සියල්ල ඇතුලත් කිරීමේදී " ," ලකුණ යෙදිය යුතුය. සෑම විටම මැනුමේ පාදක ඒකකය ග්‍රාම නිලධාරී කොට්ඨාශය විය යුතුය.

12.81. පිඹුරු පරීක්ෂා කරනු ලැබූ පසු පිඹුරේ සහ ඉඩම් විස්තර ලැයිස්තුවේ සියළුම පිටුවල මිනින්දෝරු අධිකාරි විසින් අත්සන් කළ යුතුය. පිඹුරු අනුමත කරන අවස්ථාවේදී පිඹුරේ මුල් පත්‍රයේ සහ ඉඩම් විස්තර ලැයිස්තුවල අවසන් පිටුවේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 'සර්වේයර් ජනරාල් වෙනුවට' අත්සන හා දිනය යෙදිය යුතු අතර එහි අනෙක් පත්‍ර හා පිටු සඳහා යොමුව දිය යුතුය.

12.82. සේවාලාභියාගේ යොමු අංකය යටතේ මැනුම් ඉල්ලීම් අංකය (සාමාන්‍ය විකිර්ණ මැනුම් වලදී ප්‍රාදේශීය ලේකම්ගේ අංකය සහ දිනයද) සහ ස.ජ. ගේ අංකය යටතේ ඊට අදාළ යොමු අංකයන්ද (උදා:- දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ යොමු අංකය හා දිනය) ඉඩම් විස්තර දත්ත පද්ධතියට ඇතුලත් කිරීමෙන් පසු නියමිත පරිදි ඉ.වි.ලැ. හි මුද්‍රණය වේ.

12.83. අත්කර ගැනීමේ මැනුම් වල ඉඩම් විස්තර ලැයිස්තු සඳහා **6.46 – 6.56 ඡේදයන්** බලන්න.

12.84. පෙර මැනුම් කරන ලද ඉඩමක් සඳහා වූ ඉඩම් විස්තර ලැයිස්තුවක එක් ඉඩම් කැබැල්ලක හෝ ඉඩම් කැබලි කිපයක වර්ග ප්‍රමාණය වෙනස් වීමකදී පමණක් එය රතු පාටින් කපා නිවැරදි අගය රතුපාටින් ලියා ඒ පිළිබඳව කළු අකුරින් සටහනක් තබා ඒ බවට රජයේ මිනින්දෝරු, මිනින්දෝරු අධිකාරි සහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළිවෙලින්, නැවත ලිවීම, පරීක්ෂා කිරීම සහ අනුමත කිරීම් කළ බවට නම, තනතුර, දිනය සමඟ අත්සන යෙදිය යුතුය. මෙවැනි අවස්ථාවකදී, පරිපුරක ඉඩම් විස්තර ලැයිස්තුවක් ලිවීම අවශ්‍ය නොවේ. ඒ හා සමාන්තරව ඉඩම් විස්තර දත්ත පද්ධතියද යාවත් කළ යුතුය.

මැනුම් පිළිබඳ වාර්තාව

12.85. සම්පූර්ණ කළ පිඹුරු සමඟ සෑම මැනුමක් පිළිබඳවම වාර්තාවක් යැවිය යුතුය. ඒ ඒ මැනුම් වර්ගයන්ට අදාළ වන වාර්තා ආකෘති පත්‍රයන් 4.88 ඡේදයෙහි සඳහන් කර ඇත.

12.86. මෙම වාර්තාව නිසියාකාරව සම්පූර්ණ කිරීම හා මැනුම සම්බන්ධව විශේෂිතවූ කරුණු එහි සටහන් කිරීම මිනින්දෝරුවරයාගේ වගකීමකි. මැනුම කරගෙන යන විට ඒ පිළිබඳව සටහන්, අභ්‍යාස පොතක හෝ සටහන් පොතක මිනින්දෝරුවරුන් විසින් ලියාගත යුතුය. පරීක්ෂණ වලදී මෙම සටහන් මිනින්දෝරු අධිකාරී විසින් පරීක්ෂා කර බැලිය යුතුය. පිඹුර සහ ඉඩම් විස්තර ලැයිස්තුව පරීක්ෂා කිරීමේදී පැහැදිලි නොවන කරුණු වාර්තාවල සවිස්තරාත්මකව ඇතුලත් කළ යුතුය.

12.87. පහත සඳහන් කරුණු වාර්තාවල අන්තර්ගත කිරීමට අවශ්‍ය වූ විට ඒවා මෙහි සඳහන් කර තිබෙන පිළිවෙලට පෙන්නුම් කළ යුතුය.

- භාවිතා කරන ලද උතුර
- ඇඳීම
- හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර ආදියෙහි අධිස්ථාපන හා නැවත ඇඳීම
- පැරණි මායිම්ගල් වල වෙනස්වීම් හෝ නැතිවූ මායිම්ගල්
- ආදායම් ප්‍රදේශවල නම් වල හා ඒවායේ මායිම් වල වෙනස්කම්, නැතහොත් ඉඩම් වල නම්, ඒවායේ මායිම්, බිම් ප්‍රමාණ සහ වගාවන්හි වෙනස්කම්
- වෙනස්වී ඇති හෝ නැතිවී ඇති පැරණි භූලක්ෂණ
- භූමියේ ලකුණු නොකළ මායිම්
- ග්‍රාම නිලධාරි හෝ ඔහුගේ නියෝජිතයා
- අත්කර ගැනීමේ මැනුමක නම්, මනින ලද ඉඩම හා කටු සටහනේ පෙන්නුම් කර ඇති ඉඩම් අතර වෙනස්කම්
- ඉල්ලුම්කරුගේ හෝ මායිම් පෙන්වා දෙනු ලැබූ තැනැත්තාගේ හෝ නමෙහි වෙනස්කම්
- මනිනු නොලැබූ අයුතු අල්ලා ගැනීම්
- සොහොන්බිම්
- ගංගොඩවල් (hamlets)
- කුඩා කිරීම් හා පැරණි පිඹුරුවල ඇතුලත් කිරීම් සඳහා වැදගත් වූද සැලකිය යුතු වූද වෙනත් කරුණු
- වෙනත් වැදගත් හෝ සැලකිය යුතු කරුණු සහ ගැටළු

12.88. නිසි පරිදි ඉඩම් විස්තර දත්ත පද්ධතියට ඇතුලත් කළ හැකි තොරතුරු ඉහත සඳහන් කළ වාර්තාවට ඇතුලත් නොකළ යුතුය. සේවාලාභියා වෙත දැන්විය යුතු විශේෂිත කරුණු වේ නම් ඒවා ඇතුලත් වාර්තාවක් වෙනම පිළියෙල කර මිනින්දෝරු අධිකාරීගේ නිර්දේශය සහිතව මැනුම් ඉල්ලීම් ගොනුව සමඟ ජ්‍යෂඨ මිනින්දෝරු අධිකාරි වෙත භාරදිය යුතුය.

12.89. මැනුම් ඉල්ලීමක සඳහන් කර තිබෙන ඉඩමක පිහිටීම හෝ එහි මායිම හෝ එහි නම හෝ වැරදි බව පෙනේ නම් ඒ පිළිබඳව පරීක්ෂා කර එහි ප්‍රතිඵල වාර්ථාවේ සටහන් කළ යුතුය.

පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම

12.90. කැඩැස්තර මැනුමක් නොවන ඉඩම් විස්තර ලැයිස්තුවක ඉඩමේ නම, හිමිකම්පාන්නාගේ නම, මැනීමේ අරමුණ, සහ වෙනත් කරුණු තීරයේ තොරතුරු වෙනස් වන අවස්ථාවලදී අනිවාර්යයෙන්ම ඉඩම් විස්තර දත්ත පද්ධතියේ වෙනස්වූ තොරතුරු ඇතුලත් කර පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. මෙහිදී මුල් තොරතුරු සහ වෙනස් කළ යුතු ආකාරය පැහැදිලිව දැක්වෙන මැනුම් ඉල්ලීමක් හෝ ලිපියක් හෝ අදාළ බලධාරියාගෙන් ලද විටක, එය අදාළ වෙනස් වීම් දැනගෙන සනාථ කර එවන ලියවිල්ලක්/ ඉල්ලීමක් සේ පිළිගත යුතු අතර ඒ සඳහා යොමුව ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතියේ පරිපූරක ඉඩම් විස්තර ඇතුලත් කිරීමේදී ඇතුලත් කළ යුතුය. මෙහිදී "භුක්තිය" යටතේ 'ක්ෂෙත්‍ර පරීක්ෂාවකින් තොරව (පැරණි ඉඩම්ලාභියාගේ නම) ගේ නම (නව

ඉඩම්ලාභියාගේ නම) ලෙස සංශෝධනය කරන ලදී' ලෙස දත්ත සටහන් කළ යුතුය. සංශෝධන කළ යුතු ඉඩම් කැබැල්ල අඩංගු වන පිඹුරේ සියළු දාර තොරතුරු (Marginal information) මේ වනවිට දත්ත පද්ධතියේ ඇතුලත් කර ඇති බැවින් නැවත ඇතුලත් කිරීමක් අවශ්‍ය නොවේ. නමුත් අවශ්‍ය නම් දාර තොරතුරු සංශෝධනය කළ යුතුය.

12.91. මෙලෙස ලැබෙන ඉල්ලීම් සඳහා එක් එක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මට්ටමින් ලේඛනගත කළ යුතු වන අතර ඉල්ලීම ලද දිනය, ඉල්ලුම්කරුගේ අංකය හා දිනය, පිඹුරු අංකය, කැබලි අංකය, සර්වේයර් ජනරාල්ගේ අංකය සහ නිම කළ දිනය සඳහන් එම ලේඛනය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ පවත්වා ගෙන යා යුතුය. සර්වේයර් ජනරාල් ගේ අංකය ලෙස එක් එක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා වර්ෂයකට අදාළව අංක 1 සිට අනුක්‍රමික අංක භාවිතා කළ හැක.

උදා: 2015 වර්ෂයේ මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලද පලමු ඉල්ලීම සඳහා (මැද/පරි.ඉවි/2015/01) (MDW/Sup.TL/2015 /01) ලෙස භාවිතා කළ හැක.

මෙම ඉල්ලීම් මොනම හේතුවක් නිසාවත් මැනුම් ඉල්ලීම් දත්ත පද්ධතියට (SRIMS) ඇතුලත් නොකළ යුතුය.

12.92. ඉඩම් සංවර්ධන ආඥාපනත සහ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යන පනත් යටතේ දීමනා පත්‍ර/ නියාදන සාධන පත්‍ර නිකුත් කිරීම සඳහා පිළියෙල කරනු ලබන පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු ලිවීම සඳහා මුදල් අය නොකළ යුතුය. කෙසේ වුවද, එම පනත් වල අනෙකුත් කාර්යයන් සඳහා එනම් දීර්ඝ කාලීන බදුකර, නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම සහ පැවැරුම් වලට අදාළ වන පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු ලිවීම සඳහා දෙපාර්තමේන්තු වක්‍රලේඛ ප්‍රකාරව ගාස්තු අය කළ යුතුය.

12.93. මෙම තොරතුරු පරීක්ෂා කිරීම සහ සහතික කිරීම මිනින්දෝරු අධිකාරි මුලස්ථාන හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සිදු කළ යුතුය. මෙහිදී මැනුම සිදු කළ මුල් මිනින්දෝරුවරයාගේ නම දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතුය. දෘඪ පිටපතේ අත්සන් තැබීමක් සිදු නොකළ යුතුය.

12.94. ක්ෂෙත්‍ර පරීක්ෂාවකින් පසු පිළියෙල කරන පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු සඳහා දත්ත පද්ධතියේ රජයේ මිනින්දෝරුවරයාගේ නම හා දෘඪ පිටපතේ අත්සන ද ඇතුලත් විය යුතුය. මැනුම් ඉල්ලීමක් මඟින් සිදු කරන ලද ක්ෂෙත්‍ර පරීක්ෂාවකින් පසු ඉඩම් විස්තර ලැයිස්තුවක හිමිකම් පාන්නාගේ නම සංශෝධනය කළ යුතුය. මෙහිදී සංශෝධනය කළ යුතු තොරතුරු ග්‍රාම නිලධාරි විසින් ලිඛිතව තහවුරු කර ඇති බව මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කළ යුතුය.

12.95. නව ඉඩම් විස්තර ලැයිස්තු පිටුව සඳහා ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංකයන් දිස්ත්‍රික් මැනුම් කාර්යාලයේ අවසාන විස්තර ලේඛනයෙන් ලබා ගත යුතු අතර, එය නිවැරදිව ඉල්ලීමේ යොමුවට අදාළව භාවිතා කර තිබේද යන වග පරීක්ෂා කරන සහ සහතික කරන නිලධාරීන් විසින් තහවුරු කර ගත යුතුය.

12.96. සංශෝධිත පැරණි ඉඩම් විස්තර ලැයිස්තුවේ බිම් කැබැල්ලේ රතු පාටින් නව ඉඩම් විස්තර ලැයිස්තුවේ පිටු අංකය සඳහා යොමුව සටහන් කළ යුතුය.

12.97. පිටපත් නිකුත් කිරීම 4.77, 4.78 ඡේදයන් අනුව කටයුතු කළ යුතුය.

12.98. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් විමර්ශනය කර හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ අවසන් තීන්දුව ගැසට් මඟින් ප්‍රකාශයට පත් කළ පසු කැඩැස්තර පිඹුරක ඉඩම් විස්තර ලැයිස්තුව අදාළ යාවත්කාලීන කිරීම **21.74 ඡේදය** අනුව සිදු කළ යුතුය.

පිඹුරු පරීක්ෂා කිරීම

12.99. මැනුම අවසන් කළ පසු මිනින්දෝරුවරුන් විසින් ඔවුන්ගේ පිඹුරු වල හා ඊට අදාළ වෙනත් ලියකියවිලි වලද අතපසු වීම් ඇත්දැයි දැනගැනීමට ඒවා ඉතා හොඳින් පරීක්ෂා කර බැලිය යුතුය.

12.100. මිනින්දෝරු අධිකාරි විසින් පිඹුර පරීක්ෂා කිරීමේදී සියළුම කරුණු නිවැරදි දැයි පරීක්ෂා කර අත්සන් කළ යුතුය. ඇතිවිය හැකි සෑම වැරැද්දක්ම සොයාගැනීම මෙම උපදෙස් වලින් ආවරණය නොවේ. ඒ ඒ අවස්ථාවට ගැලපෙන පරිදි ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම මිනින්දෝරු අධිකාරි විසින් කළ යුතුය. පිඹුරු පරීක්ෂා කිරීමට අදාළ උපදෙස් සඳහා ඇමුණුම 02 බලන්න.

12.101. ඉහත සඳහන් කළ රෙගුලාසි අනුගමනය කර නිවැරදි අංකිත දත්ත ගොනුව සමඟ පිඹුර ඉදිරිපත් කර ඇද්දැයි, පිඹුර අනුමත කිරීමට පෙර පරීක්ෂා කර බැලීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ වගකීම වේ.

12.102. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිට ලැබෙන නොයෙකුත් වර්ග වල පිඹුරු පරීක්ෂාකර බැලීම සඳහා ඔහුගේම කරුණු වල ලැයිස්තුවක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරගත යුතුවේ. එහි පරමාර්ථය නම් හැකි පමණ ඉක්මනින් පිඹුරු පිටපත් යැවීමට හැකිවන පරිදි, ඒවා සීඝ්‍ර ලෙස හා කාර්යක්ෂම ලෙස පරීක්ෂා කර බැලීමය.

12.103. එක් නිලධාරියකු විසින් ආරම්භකරන ලද මැනුමක් වෙනත් නිලධාරියෙකු විසින් සම්පූර්ණයෙන් භාරගන්නා විට එහි එක් එක් නිලධාරියා වගකිව යුතු ප්‍රමාණය කොතෙක් දැයි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් තීරණය කළ යුතුය. මෙය පිඹුරේ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.

පිඹුරු අත්සන් කිරීම

12.104. මිනින්දෝරුවරයා, මිනින්දෝරු අධිකාරි සහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සියළුම පිඹුරු කළු තීන්තෙන් අත්සන් කළ යුතුය. යම් කිසි නිලධාරියකු පිඹුරෙහි සඳහන් වන සම්පූර්ණ කාර්යයන් සම්බන්ධව වගකිවයුතු නොවේ නම්, එම නිලධාරියා වගකිවයුතු කොටස පැහැදිලිව පෙන්නුම් කළ යුතුය. පිඹුර සම්පූර්ණ කරන විට හා පසුව කරන මැනුමක් අනුමත කරන සෑම අවස්ථාවකම දිස්ත්‍රික්කය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි හෝ වැඩ බලන ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි හෝ ‘සර්වේයර් ජනරාල් වෙනුවට’ එහි අත්සන් කළ යුතුය. පිඹුර කලින් සහතික නොකර තිබෙන අවස්ථාවන්හි අළුතෙන් කටයුතු කරනු ලැබූ සියළුම බිම් කැබලි සම්බන්ධයෙන්ද, ‘සර්වේයර් ජනරාල් වෙනුවට’ ඉහත සඳහන් කළ නිලධාරියකු විසින් මෙහි අත්සන් තැබිය යුතුය.

12.105. නව පිඹුරක් මඟින් පැරණි පිඹුරක කොටස් අවලංගු වන විට පැරණි පිඹුරේ වට මායිම් පැන්සලෙන් ඉරි සෙවන කළ යුතුය. අවශ්‍ය යොමු කිරීම් කර එය අවලංගු වී ඇති බව පැරණි පිඹුරේ පෙන්නුම් කළ යුතුය. තවද පැරණි පිඹුර සම්පූර්ණයෙන්ම නව පිඹුරෙන් ආවරණය වන විට, එය අවලංගු කළ යුතු අතර එහිදී නව පිඹුරට පැන්සලෙන් යොමු සටහන් දිය යුතුය. මුල් ලංකා මැනුම් පත්‍රය හෝ නගර මැනුම් පත්‍රය මෙම නීතියට අනුගත නොවේ.

[12.61 ඡේදය](#) [ඇමුණුම 01](#)

රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් විස්තර ලැයිස්තු සඳහා ආදර්ශයන්

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ඉ.ව.ල. පිටු අංක හා සම්පූර්ණ පිටු ගණන TL. Page No :-
පිළිරූ අංක Plan No :- ඉ.ව. අංක 9015
කලාප අංක හෝ නගර බ්ලොක් අංක Block No :- --
අතිරේක අංක Sup No :- --
අතුරු පිළිරූ අංක Inset No :- --
පත්‍ර අංක Sheet No :- --

ව.ප.ග්‍රා අංක Req. No :- CO/MHR/2019/25
අරමුණ Purpose :-
ගවේෂණ කිරීමේ ඉල්ලීම් අංක Client Requisition No :- මහරගම දුරදැකීම අදහස් අංක 1/8/520 සහ 2019-06-04 දින

ඉඩම් අංකය Lot No	විමිති ප්‍රමාණය Extent				ඉඩමේ නම Name of Land	වර්තමාන ඉඩම් පරිශ්‍රයේ භූමිපරිහරණ සංලක්ෂණය Present Land Use	හිමිකම් කියන්නා உரிமை கோருபவர் Claimant	නීතිමය විවිධතා සහ මැනීමට හේතුවූ අදාළ කරුණු Legal Provisions & Reason for Survey	මායිම් පිහිටා ඇති ආකාරය Details of Boundaries				මායිම් සලකුණු කළ පැරණි සටහන් අංක Previous Lot References
	ha	sqm	A	R	P (approx.)				උතුර North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බටහිර மேற்கு West	
1	0.8102		2	0	0.3	ගස්වැල්ක	ගඩොල් නිවාස හා ඉඩම් සහිත	රජය	මිටියන කාර	වර්ජනය අංක 25 ගසාගත ගොඩැකි දුම්රිය ඉදිකිරීම් සඳහා ඉඩම් පවරා ගැනීමේ පනත	මාලිමි අංක 31	මාලිමි අංක 25	රජය සතු ඉඩම	ඉ.පි.අංක 623 හි 12 වැනි කාඩ්පත්‍රයේ කොටසක්
12	0.3456		0	3	16.6	යකඩලුවකැලේ	ගඩොල් නිවාස හා ඉඩම්	රජය	මිටියන කාර	වර්ජනය අංක 25 ගසාගත ගොඩැකි දුම්රිය ඉදිකිරීම් සඳහා ඉඩම් පවරා ගැනීමේ පනත	මාලිමි අංක 68	මාලිමි අංක 42	මාර්ග කාර	
30	0.0256	256	0	0	10.1	තුනඅඟිය	ගඩොල් නිවාස හා ඉඩම්	රජය	මිටියන කාර	වර්ජනය අංක 25 ගසාගත ගොඩැකි දුම්රිය ඉදිකිරීම් සඳහා ඉඩම් පවරා ගැනීමේ පනත	මාලිමි අංක 31	මාලිමි අංක 42	මාලිමි අංක 29	ඉ.පි.අංක 356 හි 2 වැනි කාඩ්පත්‍රයේ කොටසක්
මුළු වෙනස	1.1814												

මායිම් පෙන්වා දුන් අය
அளக்கும் எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out by
කොට්ඨාස අංක 524 මැදිපෙරට ගුණ නිලංකි
එන්. සෙනිවිරත්න සහ කොට්ඨාස්වරුන්

මායිම් මලයන් අය
அளந்த எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out to
කොට්ඨාස අංක 524 මැදිපෙරට ගුණ නිලංකි
එන්. සෙනිවිරත්න සහ කොට්ඨාස්වරුන්

මැනීම් කළ වර්ෂය
ஆண்டு
Field Book No.s
EDM කොට 2302

මැනීම සහ ඇඳීම කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by
ඒ. බී.සී.ඩී.ඊ

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by

අනුමත කළේ
அங்கீகாரிப்பு அதிகாரி
Approved By
මහ භූමිමිනින්දෝරු අතිරේක අධිකාරී
நிலஅளவை ஆக்கிரமிப்பாளர்
Snr. Supdt. of Surveys
කර්මාන්ත ජාතික්ත් මෙහෙයුම
நில அளவை அதிகாரி
On behalf of the Surveyor General

මිනින්දෝරු අතිරේක
நில அளவை ஆக்கிரமிப்பாளர்
Supdt. of Surveys

ලියාපදිංචි මිනින්දෝරු
பதிவு செய்யப்பட்ட உத்தரவுபெற்ற நிலஅளவையாளர்
Registered Licensed Surveyor
From :- 2019 ජූලි මස 08 දින සිට To :- 2019 අගෝස්තු 08 දින දක්වා

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් විස්තර ලැයිස්තු සඳහා ආදර්ශයන්

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ග්‍රා.ඒ. කොට්ඨාශය பி.செ.பிரிவு D.S. Division :- කල්තර

දිස්ත්‍රික්කය மாவட்டம் District :- මාතර

පළාත மாகாணம் Province :- මාතර්කාර්

ග්‍රාම නිලධාරී කොට්ඨාශය கி.நி.பிரிவு G.N. Division :- අංක 823 A, බදුල්ල

ග්‍රාමය கிராமம் Village :- බදුල්ල

ඉ.වි.ද පිටු අංකය නි.வி.ப பக்க இல Y.L. Page No :-

විමසූ අංකය வரைபட இல Plan No :- අ.මැ.සි. 123

කලාප අංකය தொகுதி இல Block No :- --

අතිරේක අංකය பிற்சேர்க்கை இல Sup No :- 25

අනුරූ පිටපත් අංකය உள்வரைபட இல Inset No :- --

පත්‍ර අංකය தாள் இல Sheet No :- 28

ස.ප.ග අංකය නි.පත්‍ර இல SG's Req. No :- KA/PAL/19/375

දේශපාලනීයමයේ කොළු අංක පිහෙණ பெறுமதியின் கோள்(இல) இல Client Requisition No :- පළමුවරට මැන්මයි අංක පාදි/ස/ඒ/4/6 යන 2019-08-06 දින

අත්‍යවශ්‍ය අරමුණ நோக்கம் Purpose :-

කොටස් අංකය නිල් ගණන් இலக்கு Lot No	කොටස් ප්‍රමාණය விஸ்தீரணம் Extent				ඉඩමේ නම காணியின் பெயர் Name of Land	වර්තමාන ඉඩම් පරිහරණය தற்போதைய நில பயன்பாடு Present Land Use	හිමිකම් විස්තිරය உரிமை கோருபவர் Claimant	නීතිමය විධිවිධාන සහ මූලික හේතුව சட்டபடியான ஏற்பாடுகள் மற்றும் காரணங்களுக்கான காரணம் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර எல்லைகளின் விபரங்கள் Details of Boundaries				පැරණි බිම් සැලසුම් අංකය යොමුව கணக்கு இலக்கத்துக்கான குறிப்புகள் Previous Lot References
	ha	sqm	A	R	P (approx)				උතුර வடக்கு North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බටහිර மேற்கு West	
1265	0.4080		1	0	1.3	ඉඟවන්න	රජය	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ විශාලතාවේ සුළුවිදි දැනවන්න පිළිබඳ නියෝගය ඉඩම් වර්ගීකරණ ආඥාපනතේ 11.54, දිවිනා පලාසයේ සිතියම් අංකය	තැඹිලි අංක 25	තැඹිලි අංක 26 සහ 24	තැඹිලි අංක 1266 සහ 1267	තැඹිලි අංක 1269	22 වැනි කැබැල්ලේ කොටසක්
1266	0.5020		1	0	38.5	ඉඟවන්න	රජය	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බදුල්ල දිස්ත්‍රික් ලේකම් සිවිලියන් තාවකාලික බදුපෙත්ත ඉඩම් වර්ගීකරණ ආඥාපනත යටතේ ඉඩම් වර්ගීකරණ අංකය ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බදුල්ල දිස්ත්‍රික් ලේකම් සිවිලියන් තාවකාලික බදුපෙත්ත ඉඩම් වර්ගීකරණ අංකය	තැඹිලි අංක 1265, 26 සහ 24	තැඹිලි අංක 24	තැඹිලි අංක 1267	තැඹිලි අංක 1267	22 වැනි කැබැල්ලේ කොටසක්
1267	0.0560	560	0	0	22.1	මිහිකත මුදුන සිම	රජය	මුළුමන කැබලිය	-	-	-	-	36 වැනි කැබැල්ලේ කොටසක්
1268	0.0062	62	0	0	2.5	ඉඟවන්න	රජය	කෙතේ පිදෑන ඇටවන් කැබ ඇත	-	-	-	-	36 වැනි කැබැල්ලේ කොටසක්
1269	0.0325	325	0	0	12.8	ඉඟවන්න	රජය	තැඹිලි අංක 1265 ගි කැවිටියේ වින තිහාසයේ සුළුවිදි දැනවන්න පිළිබඳ කරන ලද වැවිලුප් වහල ඉඩම් වර්ගීකරණ අංකය	තැඹිලි අංක 25	තැඹිලි අංක 1265	තැඹිලි අංක 1267	තැඹිලි අංක 1270	22 වැනි කැබැල්ලේ කොටසක්
1270	0.1031		0	1	0.8	ඉඟවන්න	රජය	ඉඟවන්න පිළිබඳ ගස් සිටින්නේ ඇත.	-	-	-	-	22 වැනි කැබැල්ලේ කොටසක්
1271	0.4062		1	0	0.6	ඉඟවන්න	අම්බානෙ ද බිඳිවා	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ රජයකි දිවිනාසලයේ සිතියම් කර ඇත. දිවිනා පලා අංකය - කෑ/ස/1367	තැඹිලි අංක 1267	තැඹිලි අංක 1268	තැඹිලි අංක 1273	තැඹිලි අංක 1272	22 වැනි කැබැල්ලේ කොටසක්
1272	0.0365	365	0	0	14.4	ඉඟවන්න	රජය	ඉඟවන්න පිළිබඳ ගස් සිටින්නේ ඇත.	තැඹිලි අංක 1267	තැඹිලි අංක 1271	තැඹිලි අංක 1273	තැඹිලි අංක 23	22 වැනි කැබැල්ලේ කොටසක්
1273	3.6541		9	0	4.7	ඉඟවන්න	රජය	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ රජයකි දිවිනාසලයේ සිතියම් කර ඇත.	-	-	-	-	22 සහ 36 වැනි කැබැල්ලේ කොටස්

මායිම් ඔපෝරා දුන් පාර
அளக்கும் எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out by

මායිම් කටයුත්ත
அளந்து எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out to

කොට්ඨාශ ඇත 823 A බදුල්ල ග්‍රාම නිලධාරී වසම්බලිය සහ කවිටකරුවන්

කොට්ඨාශ ඇත 823 A බදුල්ල ග්‍රාම නිලධාරී වසම්බලිය සහ කවිටකරුවන්

සෙනසුරාවන් අංක පාලන නිලධාරියාගේ කාර්යාලය පත්තන ඉඩම් Field Book No.s

EDM ක 1202

මැනීම සහ ඇඳීම කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by
ජ. බී.බදිවා

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by

අනුමත කළේ
அங்கீகரிப்பவர்
Approved By
අධිකාරී මිනින්දෝරු (සැලසුම්)
சர்வேயர் நாயகம் அந்திறியட்சகர்
Snr. Supdt. of Surveys

ජිල්ලාව
மாவட்டம்
District
බදුල්ල

මිනින්දෝරු අධීක්ෂක
நிலஅளவை அந்திறியட்சகர்
Supdt. of Surveys

පත්‍රිකා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද්දකි
பதிவு செய்யப்பட்ட அரச நிலஅளவையாளர்
Registered Government Surveyor

සත්‍යය
நிலஅளவை அந்திறியட்சகருக்காக
On behalf of the Surveyor General

From :- 2019 අගෝස්තු මස 06 දින/திகதி To :- 2019 අගෝස්තු මස 06 දින/திகதி

12 වැනි පරිවිඡ්දය

14(iii)

ගම ගිරාමම Village :- බදුරලිය

ග්‍රාම නිලධාරී කොට්ඨාශය ගි.නි.පිරිවු G.N. Division :- අංක 823 A, බදුරලිය

ප්‍රා. ලේ. කොට්ඨාශය ප්‍රි.සෙ.පිරිවු D.S. Division :- පාලින්දනුවර

දිස්ත්‍රික්කය මාවට්ටම District :- කළුතර

පළාත මාකාණම් Province :- බස්නාහිර

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ඉ.වි.ලැ පිටු අංකය නි.වි.ප. පක්ක இல T.L. Page No :-

පිසුරු අංකය வரைபட இல Plan No :- අ.ග.සි. 123

කලාප අංකය தொகுதி இல Block No :- --

අතිරේක අංකය பிற்சேர்க்கை இல Sup No :- 25

අතුරු පිසුරු අංකය உள்வரைபட இல Inset No :- --

පත්‍ර අංකය தாள் இல Sheet No :- 28

ස.ජ.ගේ අංකය நி.நா.இல SG's Req. No :- KA/PAL/19/375

අරමුණ நோக்கம் Purpose :-

සේවාලාභියාගේ යොමු අංක சேவை பெறுநரின் வேண்டுகோள் இல Client Requisition No :- පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම්ගේ අංක පාලි/ඉ/ව/4/6 සහ 2019-08-06 දින

කැබලි අංකය තුණ්ඩු இல Lot No	බිම් ප්‍රමාණය විස්තීරණය Extent					ඉඩමේ නම காணியின் பெயர் Name of Land	වර්තමාන ඉඩම් පරිහරණය තව්පොතය காணியின் தற்போதைய உபயோகம் Present Land Use	හිමිකම් කියන්නා உரிமை கோருபவர் Claimant	නීතිමය විධිවිධාන සහ මැනීමට හේතුව சட்டப்படியான விதிகள் மற்றும் அளவைக்கான காரணம் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර புற எல்லைகளின் விபரங்கள் Details of Boundaries				පැරණි බිම් කැබලි වලට යොමුව பழைய காணித்துண்டின் குறிப்புகள் Previous Lot References
	ha	sqm	A	R	P (approx.)					උතුර வடக்கு North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බටහිර மேற்கு West	
1274	0.0123	123	0	0	4.9	මහවත්ත	විවෘත මුඩු බිම	රජය	මාර්ගය සඳහා වෙන් කළ බිම	-	-	-	-	22 වැනි කැබැල්ලේ කොටසක්
1275	0.0453	453	0	0	17.9	-	මාර්ගය -	රජය		-	-	-	-	22 වැනි කැබැල්ලේ කොටසක්
1276	0.0128	128	0	0	5.1	මහවත්ත	විවෘත මුඩු බිම	රජය	ඇළ දිගේ වෙන් කළ බිම	-	-	-	-	22 වැනි කැබැල්ලේ කොටසක්
1277	0.4096		1	0	1.9	මහවත්ත	ගෙවත්ත අඩුරුදු 5-10 ක් පමණ වයසැති රබර් වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත.	රජය	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ කොඩිකුවක්කු ආරච්චිගේ තිලේසිරි විසින් බලපත්‍රයක් මත වගාකර ඇත, බලපත්‍ර අංකය LL 68, දීමනා පත්‍රයක් නිකුත් කිරීම සඳහා	කැබලි අංක 1276	කැබලි අංක 1278	කැබලි අංක 1280	කැබලි අංක 23	22 වැනි කැබැල්ලේ කොටසක්
1278	0.0256	256	0	0	10.1	මහවත්ත	ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක් ඇත.	රජය	අනවසරයෙන් පදිංචි වී ඇත සුදුස්සක් කිරීම සඳහා	කැබලි අංක 1276	කැබලි අංක 1279	කැබලි අංක 1280	කැබලි අංක 1277	22 වැනි කැබැල්ලේ කොටසක්
1279	0.1352		0	1	13.5	මහවත්ත	ගෙවත්ත අඩුරුදු 15-20 ක් පමණ වයසැති තේ, පොල් වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත.	පියදාස රණසිංහ	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දීමනාපත්‍රයක් නිකුත් කර ඇත, දීමනා පත්‍ර අංකය - කළු/ප්‍ර/පාලි/3456	කැබලි අංක 1276	කැබලි අංක 24	කැබලි අංක 1280	කැබලි අංක 1278	22 වැනි කැබැල්ලේ කොටසක්
1280	11.3466		28	0	6.2	මහවත්ත	ගෙවත්ත අඩුරුදු 5-10 ක් පමණ වයසැති කුරුඳු වගාවක් සහ මිශ්‍ර වගාවක් ඇත.	රජය	ක්ෂේත්‍ර ප්‍රදේශය නිගමනයෙනි. අලුතින් කරන ලද මැනුමක් හා ඒ හා සම්බන්ධ පිසුරක් නොමැතිව මෙම බිම් කැබැල්ල සම්බන්ධයෙන් කිසිවක් නොකල යුතුය	-	-	-	-	22 වැනි කැබැල්ලේ කොටසක්
මුළු එකතුව	17.1920													

මායිම පෙන්වා දුන් අය
අළක්කුම් එல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out by

කොට්ඨාශ අංක 823 A බදුරලිය ග්‍රාම නිලධාරී
එන්.ජයතිලක සහ කට්ටිකරුවන්

ක්ෂේත්‍ර පොත් අංක
புலக்குறிப்புப் புத்தக இல
Field Book No.s

EDM ක 1202

මැනීම සහ ඇඳීම කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by

ඒ. සී.සිල්වා

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by

අනුමත කළේ
அத்தாட்சிப்படுத்தியவர்
Approved By

මිනින්දෝරු අධිකාරී
நில அளவை அத்தியட்சகர்
Supdt. of Surveys

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී
சிரேஷ்ட நில அளவை அத்தியட்சகர்
Snr. Supdt. of Surveys

දිස්ත්‍රික්කය
மாவட்டம்
District
කළුතර

සර්වේයර් ජනරාල් වෙනුවට
நில அளவை அதிபதிக்காக
On behalf of the Surveyor General

මායිම බලාගත් අය
அளந்த எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out to

කොට්ඨාශ අංක 823 A බදුරලිය ග්‍රාම නිලධාරී
එන්.ජයතිලක සහ කට්ටිකරුවන්

ලියාපදිංචි රජයේ මිනින්දෝරු
பதிவு செய்யப்பட்ட அரச நில அளவையாளர்
Registered Government Surveyor
From :- 2019 අගෝස්තු සිට இருந்து To :- 2019 නොවැම්බර් දක්වා வரை

ලේඛන අංකය

පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු සඳහා ආදර්ශයන්

ශ්‍රී ලංකා මිනිත්තෙදරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ගම් ග්‍රාමය Village :- දෙඩන්ගොඩ
ග්‍රාම නිලධාරී කොට්ඨාශය ගි.ග්‍රි.නිරීක්ෂණ කළාපය - :- අංක 800G, කඩෙතෙර දෙඩන්ගොඩ
දූපතේ
ප්‍ර. ලේ. කොට්ඨාශය ප්‍රා.ලේ.නිරීක්ෂණ කළාපය :- දෙඩන්ගොඩ
දිස්ත්‍රික්ක ජාතිය District :- කළුතර
පළාත ජාතිකත්වය Province :- බස්නාහිර

ඉ.වි.ප. පිටු අංකය නිලධාරී පත්‍රය ඉල Tl. Page No :-
පිළිරූ අංකය සැලැස්ම ඉල Plan No :- ඉ.පි.අ 36
කලාප අංකය කොෂ්ඨාශ ඉල Block No :- --
අතිරේක අංකය පිරිනැත්කෙළ ඉල Sup No :- --
අතුරු පිළිරූ අංකය உள்ளடைப்பட ඉල Inset No :- --
පත්‍ර අංකය தாள் ඉල Sheet No :- --

පරීක්ෂණ අරමුණ Purpose :-
සේවාදායකයාගේ ඉල්ලීම අංක 2019-09-11 දින Client Requisition No :- දෙපාර්තමේන්තු ලේඛනාගාර අධ්‍යයන අංක ලප/ඉ/2346

කැබලි අංකය துண்டு இல Lot No	ඉඩම් ප්‍රමාණය விஸ்தீரணம் Extent				ඉඩමේ නම காணியின் பெயர் Name of Land	එවකට ඉඩම් පවතින භූමිය භාවිතය தற்போதைய காணியின் உபயோகம் Present Land Use	හිමිකරු සිටියහොත් உரிமை கோருபவர் Claimant	නිර්මාණ සඳහා අවශ්‍ය සටහන් හා හේතු அளவைக்கான காரணம் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර எல்லைகளின் விபரங்கள் Details of Boundaries				පැරණි ඉඩම් සැසඳීම් වලට යොමු වන ලෙස Previous Lot References
	ha	sqm	A	R	P (approx.)				උතුර வ.கி.மு North	නැගෙනහිර கி.மு கி.தி East	දකුණ தெற்கு South	බටහිර மேற்கு West	
15	0.5661		1	1	23.8	තායාවත්ත	පුවරය	මායිම විවෘත කැබලි වැදැරී බිඳෙන ලදී. රේඛාව ඉඩම් නඩුවකින් රෝහණ ලබා ඇත.	කැබලි අංක 4	කැබලි අංක 14	කැබලි අංක 18	කැබලි අංක 16	3 වැනි පිටුපල 15 වැනි කැබලිය
20	0.5465		1	1	16.1	තායාවත්ත	පුවරය	මායිම විවෘත කැබලි වැදැරී බිඳෙන ලදී. රේඛාව ඉඩම් නඩුවකින් රෝහණ ලබා ඇත.	කැබලි අංක 10	කැබලි අංක 21	කැබලි අංක 25	කැබලි අංක 19	4 වැනි පිටුපල 20 වැනි කැබලිය
28	0.4021		0	3	39.0	තායාවත්ත	පුවරය	ඡන්ඡනුගේ මායිම පරීක්ෂාකර සලකා බලා දැඩි ඉඩම් ගැටුම්වල අතරමැදියකු මෙන් ක්‍රියාකර ඇති බවත් ඔහු විසින් ඉදිකරන ලද ගඩොල් බිත්තිය ඉඩම් මායිමෙන් 1.179 දුරකට පිහිටා ඇති බවත් ඔහුගේ ඉඩම වන අතර පිටුවහල් කිරීම සඳහා පුද්ගලයෙකු නියමිත බවත්.	කැබලි අංක 25	කැබලි අංක 26 සහ 27	කැබලි අංක 33	කැබලි අංක 34 සහ 27	6 වැනි පිටුපල 28 වැනි කැබලිය
මුළු එකතුව	1.5147												

මායිම් පෙන්වූ දුන් අය
අණක්කුම් සෙල්ලෙයිකළ
குறித்துக் காட்டியது
Boundaries Pointed out by
කොට්ඨාස අංක 800G තායාවත්ත දෙඩන්ගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ නාවිකයන්

ඡායාරූප අංක 800G තායාවත්ත දෙඩන්ගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ නාවිකයන්

ක්ෂේත්‍ර පොත් අංක ක 2565
புலக்குறிப்பிடம்
Field Book No.s

මැනීම සහ ඇඳීම කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by
ජ.කි.සි.සෙවිරිය

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by

ලියාපදිංචි මැදපෙරළි නිලමැණියෙකු
பதிவுசெய்யப்பட்ட உத்தரவுபெற்ற நிலஅளவையாளர்
Registered Licensed Surveyor
From :- 2019 ජනවාරි මස 01 දිනත් To :- 2019 දෙසැම්බර් 31 දිනට වලංගුයි

අනුමත කළේ
அத்தாட்சிப்படுத்தியவர்
Approved By
ජී.එම්.ඩී.ජයසිරි
මහ නිලමැණිය (සමීක්ෂණ)
நில அளவை அத்தியட்சகர்
Snr. Supdt. of Surveys

ජී.එම්.ඩී.ජයසිරි
මහ නිලමැණිය (සමීක්ෂණ)
நில அளவை அத்தியட்சகர்
Supdt. of Surveys

දිස්ත්‍රික්කය
மாவட்டம்
District
කළුතර

නිලමැණිය වෙනුවෙන්
நில அளவை அதிபதிக்காக
On behalf of the Surveyor General

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අනුරු විධානය යටතේ සම්පූර්ණ ඉඩම් විස්තර ලැයිස්තුවක ආදර්ශය

අත්කර ගැනීමේ ඉඩම් විස්තර ලැයිස්තුව

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ග්‍රා.නි. Village :- මිදුලන
ග්‍රාම නිලධාරී කොට්ඨාශය ඉ.නි.පිරිසු G.N. Division :- අංක 837, මිදුලන
ප්‍ර. ලේ. කොට්ඨාශය ம.செ.பிரிவு D.S. Division :- පෙළින්දනුවර
දිස්ත්‍රික්කය மாவட்டம் District :- මහනුවර
පළාත மாகாணம் Province :- මධ්‍යමාණ්ඩ

ළ.බි.ල අංකය நி.ப.இல SG's Req. No :- KA/PAI/2017/400
අරමුණ நோக்கம் Purpose :- අලුවත්ත කැලෑවත් ඉවත් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම
මෙවැලපතිවෙත් යොමු අංක සේවෙය ඉල්ලුම්කරුගේ இல Client Requisition No :- පෙළින්දනුවර ග්‍රාමලේඛිය වසම්හිය අංක පෙනි/ඉ/ඉසි/4/2345 සහ 2017-03-12 දිට
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංක RD/HW/48 සහ 2017-01-24 දිට

ඩී.පී.ල. මිලු අංකය ப.ரி.ப.இல T.L. Page No :-
සිතියම් අංකය வரைபட இல Plan No :- අ.කා.සි. 124
කලාප අංකය தொகுதி இல Block No :-
අතිරේක අංකය பிற்சேர்க்கை இல Sup No :- 10
අනුරු සිතියම් අංකය உரிமையாரிட இல Inset No :- --
පත්‍ර අංකය தாள் இல Sheet No :- 12

කැබලි අංකය துண்டு இல Lot No	කිරි ප්‍රමාණය எல்லைநிலை Extent				ඉඩමේ නම காணியின் பெயர் Name of Land	වර්තමාන ඉඩම් පරිහරණය தற்போதைய காணியின் உபயோகம் Present Land Use	හිමිකම් කියන්නා உரிமை கோருபவர் Claimant	නීතිමය විධිවිධාන சட்டப்படியான விதிகள் மற்றும் அளவைக்கான காரணம் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර Plan භාරගන්නන්ගේ මායිම් විස්තර Details of Boundaries				පෙර කළ මිම කැබලි වලට යොදපු පරණ ඉඩම් අංක Previous Lot References
	ha	sqm	A	R	P (approx.)				උතුර வடக்கு North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බස්නහිර மேற்கு West	
1001	0.0026	26	0	0	1.0	කැලෑවත්ත	රජය	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අනුරු විධානය යටතේ පවරා ගන්නා ලදී. මුද්‍රිත සිතියම පරිමාණ නිශ්චයක් නොමැත අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා	කැබලි අංක 25	කැබලි අංක 1003 සහ 1002	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	කැබලි අංක 25	20 වැනි කැබැල්ලේ කොටසක්
1002	0.0321	321	0	0	12.7	ඖෂධත්ත	රජය	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අනුරු විධානය යටතේ පවරා ගන්නා ලදී.	කැබලි අංක 1003	කැබලි අංක 1004	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	කැබලි අංක 1001	21 වැනි කැබැල්ලේ කොටසක්
1004	0.0041	41	0	0	1.6	-	ඇතැම්ගෙන් ගොගෙන්.	අත්කර ගත යුතුව ඇත	මාර්ගය	කැබලි අංක 1005	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	කැබලි අංක 1002	18 වැනි කැබැල්ලේ කොටසක්
1005	0.0460	460	0	0	18.2	කැවිලවත්ත	රජය	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අනුරු විධානය යටතේ පවරා ගන්නා ලදී. මුද්‍රිත සිතියම පරිමාණ නිශ්චිත නොමැති. සිතියම් කටයුතු අවසන් කිරීම සඳහා අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා	කැබලි අංක 1006	කැබලි අංක 1007	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	කැබලි අංක1004	19 වැනි කැබැල්ලේ කොටසක්
1006	0.0045	45	0	0	1.8	කැවිලවත්ත	කෝකිල විමලරත්න	අත්කර ගත නැත	කැබලි අංක 19	කැබලි අංක 1008	කැබලි අංක 1005 සහ 1004	මාර්ගය	19 වැනි කැබැල්ලේ කොටසක්
1007	0.0254	254	0	0	10.0	ඇල්ගහවත්ත	රජය	අලුවත්ත- කලවාන මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත	කැබලි අංක 1008	කැබලි අංක 30	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	කැබලි අංක 1005	26 වැනි කැබැල්ලේ කොටසක්
1009	0.0654	654	0	0	25.9	කොඩාගන ගොගෙන්.	ඇමුණ	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අනුරු විධානය යටතේ පවරා ගන්නා විනාසෙන් රුගෙවීම්. විනාසෙන් සිටියාගේ ඉඩම් මිදීම. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා	කැබලි අංක 30	කැබලි අංක 30	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	කැබලි අංක 1007	30 වැනි කැබැල්ලේ කොටසක්
1010	0.0023	23	0	0	0.9	-	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	අලුවත්ත - කලවාන මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත					26 වැනි කැබැල්ලේ කොටසක්
1011	0.0236	236	0	0	9.3	ඇල්ගහවත්ත	රජය	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අනුරු විධානය යටතේ පවරා ගන්නා ලදී. මුද්‍රිත සිතියම පරිමාණ නිශ්චිත නොමැති. සිතියම් කටයුතු අවසන් කිරීම සඳහා අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා	කැබලි අංක 28	කැබලි අංක 29	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	කැබලි අංක 1010	28 වැනි කැබැල්ලේ කොටසක්
මුළු වපසරිය	0.2060												

මායිම් පෙන්වා දුන් අය
அளக்கும் எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out by
: කොඩාගන අංක 837 මිදුලන ගම් නිලධාරී
ඒ.සෙමරිස සහ කවිරතුවල්

මායිම් සලකුණ් අය
அளந்த எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out to
: කොඩාගන අංක 837 මිදුලන ගම් නිලධාරී
ඒ.සෙමරිස සහ කවිරතුවල්

සෙලවූ ලඳන් අංක 2396, අ 2397
චලනය කළ හැකි ගස්
Movable Trees

මැනීම සහ ඇඳීම කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by
ඒ.තෙවිඩ්සිරිවර්ධ

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by

ලියාපදිංචි මැහැයියන් මිනිසෙදරුව්,
පළිඟු සෙවෙයියන්ස්ටැ ඒ.ඒ. ලියාපදිංචි භූමිමිනින්දෝරු
Registered Licensed Surveyor

අනුමත කළේ
அங்கீகரிப்பவர்
Approved By
ජෙහෙඩ් ඊසිකේදෝරු අධිකාරී
சிரேஷ்ட நில அளவை அத்தியட்சகர்
Snr. Supdt. of Surveys
සර්වේයර් ජනරාල් වෙනුවට
நில அளவை அதிபருக்காக
On behalf of the Surveyor General

දිස්ත්‍රික්කය
மாவட்டம்
District
කච්චේරි
From :- 2017 අගෝස්ට් මස 01 දින
To :- 2017 දුසැම්බර් මස 31 දින

12 වැනි පරිවර්ජ්දය

15(ii)

ගම ඔරාමම් Village :- මිදලන

ග්‍රාම නිලධාරී කොට්ඨාශය ඔ.නි.පිරිවු G.N. Division :- අංක 837, මිදලන

ප්‍රා. ලේ. කොට්ඨාශය பி.செ.பிரிவு D.S. Division :- පාලින්දනුවර

දිස්ත්‍රික්කය மாவட்டம் District :- කළුතර

පළාත மாகாணம் Province :- බස්නාහිර

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ඉ.වි.ලැ පිටු අංකය நி.வி.ப. பக்க இல T.L. Page No :-

පිඹුරු අංකය வரைபட இல Plan No :- අ.ග.පි. 124

කලාප අංකය தொகுதி இல Block No :- --

අතිරේක අංකය பிற்சேர்க்கை இல Sup No :- 10

අතුරු පිඹුරු අංකය உள்வரைபட இல Inset No :- --

පත්‍ර අංකය தாள் இல Sheet No :- 12

ස.ප.ගේ අංකය நி.நா.இல SG's Req. No :- KA/PAL/2017/400

අරමුණ நோக்கம் Purpose :- අගලවත්ත- කලවාන මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම

සේවාලාභියාගේ යොමු අංක சேவை பெறுநரின் வேண்டுகோள் இல Client Requisition No :- පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම්ගේ අංක පාලි/ඉ/අත්/4/2345 සහ 2017-03-12 දින

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංක RD/HW/48 සහ 2017-01-24 දින

කැබලි අංකය துண்டு இல Lot No	වීම් ප්‍රමාණය විස්තීරණය Extent					ඉඩමේ නම காணியின் பெயர் Name of Land	වර්තමාන ඉඩම් පරිහරණය தற்போதைய காணியின் உபயோகம் Present Land Use	හිමිකම් කියන්නා உரிமை கோருபவர் Claimant	නීතිමය විධිවිධාන සහ මැනීමට හේතුව சட்டப்படியான விதிகள் மற்றும் அளவைக்கான காரணம் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර புற எல்லைகளின் விபரங்கள் Details of Boundaries				පැරණි වීම් කැබලි වලට යොමුව பழைய காணித்துண்டின் குறிப்புகள் Previous Lot References
	ha	sqm	A	R	P (approx.)					උතුර வடக்கு North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බටහිර மேற்கு West	
1010	0.0023	23	0	0	0.9	-	මාර්ගය (ප්‍රාදේශීය සභා)	රජය	අගලවත්ත - කලවාන මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත					26 වැනි කැබැල්ලේ කොටසක්
1011	0.0236	236	0	0	9.3	දෙමටගහවත්ත	ගෙවත්ත මිශ්‍ර වගාවක් ඇත.	රජය	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අනුරු විධානය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා විකානගේ අජන්ක සහ තවත් අය අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා	කැබලි අංක 28	කැබලි අංක 29	මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)	කැබලි අංක 1010	28 වැනි කැබැල්ලේ කොටසක්
මුළු එකතුව	16.9905													

මායිම් පෙන්වා දුන් අය
අළක්කුම් எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out by
කොට්ඨාශ අංක 837 මිදලන ග්‍රාම නිලධාරී
ඒ.සමරවීර සහ කට්ටිකරුවන්

ක්ෂේත්‍ර පොත් අංක
புலக்குறிப்புப் புத்தக இல
Field Book No.s
ක 2396, ක 2397

මැනීම සහ ඇඳීම කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by
ඒ.ආර්.එම්.සිල්වා

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by

අනුමත කළේ
அத்தாட்சிப்படுத்தியவர்
Approved By

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී
சிரேஷ்ட நில அளவை அத்தியட்சகர்
Snr. Supdt. of Surveys

දිස්ත්‍රික්කය
மாவட்டம்
District
කළුතර

සර්වේයර් ජනරාල් වෙනුවට
நில அளவை அதிபதிக்காக
On behalf of the Surveyor General

මායිම් බලාගත් අය
அளந்த எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out to
කොට්ඨාශ අංක 837 මිදලන ග්‍රාම නිලධාරී
ඒ.සමරවීර සහ කට්ටිකරුවන්

ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
பதிவு செய்யப்பட்ட உத்தரவுபெற்ற நிலஅளவையாளர்
Registered Licensed Surveyor
From :- 2017 අප්‍රේල් සිට இருந்து To :- 2017 ජූනි දක්වා வரை

මිනින්දෝරු අධිකාරී
நில அளவை அத்தியட்சகர்
Supdt. of Surveys

ලේඛ අංකය

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අනුරු විධානය යටතේ අත්කර ගැනීමේ ඉඩම් විස්තර ලැයිස්තුවක ආදර්ශය

අත්කර ගැනීමේ ඉඩම් විස්තර ලැයිස්තුව

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ග්‍රා.වැ පිටු අංකය නිර්මිය.පත්‍රය අංකය :- G.N.T.L. Page No
විමසුම් අංකය ගණ්‍යාව.L. අංකය :- Plan No
කලාප අංකය කොලුපු අංකය :- Block No
අතිරේක අංකය ව්‍යිත්‍රේක්ෂණ අංකය :- Sup No
අනුරු පිටුවේ අංකය உரிஞ்ஞாப.L. අංකය :- Inset No
පත්‍ර අංකය தாள் අංකය :- Sheet No

ග්‍රාම නිලධාරී වසම :- මැදගෙ
ගුප්ත නිලධාරී කොට්ඨාසය :- අංක 837, මීදෙල
ප්‍රා. ලේ. කොට්ඨාසය :- පාලිදෙනුවර
දිස්ත්‍රික්කය மாவட்ட :- කඩවර
පළාත மாகாணம் :- බස්නාහිර

ස.ප.ල අංකය நி.ஞா අංකය SG's Req. No :- KA/PAL/2017/400

අරමුණ நோக்கம் Purpose :- අතුරුවන- කැලවාන මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම

අස්වැලකියෙන් ලබාදුන් අංක සේවෙල පොලනරුවේ ගෙන් ඉල Client Requisition No :- පාලිදෙනුවර ප්‍රාදේශීය ලේකම්ගේ අංක පාලි/ඉ/අත්/4/2345 යන 2017-05-12 දින

ඉඩම් අත්කරගැනීමේ අංකය RD/HW/45 යන 2017-01-24 දින

කැබලි අංකය துண்டு இல Lot No	ඉඩම් ප්‍රමාණය விஸ்தீரணம் Extent				ඉඩම් කොටස් හඳුනාගත් නාමය/පිහිටි ස්ථානය Name of Land	වර්තමාන ඉඩම් පරිහරණය தற்போதைய காணியின் உபயோகம் Present Land Use	හිමිකම් කියන්නා உரிமை கோருபவர் Claimant	හිමිකම් විමර්ශනය සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන හා හේතු சிபாரிசுகளுக்கான சட்ட ஏற்பாடுகள் & காரணம் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර Details of Boundaries				පැරණි ඉඩ කැබලි අංක පිළිබඳ යොමුව ඇත්නම් සඳහන් කරන්න முன்பிருந்த காணித்துண்டுகள் குறிப்புகள் Previous Lot References
	ha	sqm	A	R	P (approx.)				උතුර வடக்கு North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බස්නාහිර மேற்கு West	
1001	0.0026	26	0	0	1.0	කොටහක්ම	ගොවිතැන් සිදුවන කැලිදෙනා ඉඩමේ ඇත.	රජය	ඉඩම් අත්කර ගැනීම පනතේ 38 (අ) අනුව්. විධානය යටතේ නිවාසය ඉවතට දැමී. මිදේ නිවාසය ඉවතට දැමීම සඳහා අත්කර ගැනීම සඳහා සැලසුම් අවසන් කිරීම සඳහා	කැබලි අංක 25	කැබලි අංක 1003 සහ 1002	මාර්ගය (මාර්ග කොන්ත්‍රාත්)	කැබලි අංක 25	20 වැනි කැබැල්ලේ කොටසක්
1002	0.0321	321	0	0	12.7	ගොවිතැන	ගොවිතැන සිදුවන කැලිදෙනා ඉඩමේ ඇත. සහ මිදු වගාවක් ඇත.	රජය	අත්පත්කිරීම- කැලවාන මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත	කැබලි අංක 1003	කැබලි අංක 1004	මාර්ගය (මාර්ග කොන්ත්‍රාත්)	කැබලි අංක 1001	21 වැනි කැබැල්ලේ කොටසක්
1004	0.0041	41	0	0	1.6	-	මාර්ගය	කොටහක්ම නොහැක.	අත්කර ගත යුතුම ඇත	මාර්ගය	කැබලි අංක 1005	මාර්ගය (මාර්ග කොන්ත්‍රාත්)	කැබලි අංක 1002	15 වැනි කැබැල්ලේ කොටසක්
1005	0.0460	460	0	0	18.2	කොටහක්ම	ගොවිතැන කැලිදෙනා ඉඩමේ ඇත.	රජය	ඉඩම් අත්කර ගැනීම පනතේ 38 (අ) අනුව්. විධානය යටතේ නිවාසය ඉවතට දැමී. මිදේ නිවාසය ඉවතට දැමීම සඳහා අත්කර ගැනීම සඳහා සැලසුම් අවසන් කිරීම සඳහා	කැබලි අංක 1006	කැබලි අංක 1007	මාර්ගය (මාර්ග කොන්ත්‍රාත්)	කැබලි අංක1004	19 වැනි කැබැල්ලේ කොටසක්
1006	0.0045	45	0	0	1.8	කොටහක්ම	ගොවිතැන සහ යටිම ගොවිතැන්හිදුවන කොටසක් ඇත.	කෘෂිකර්මාන්ත	අත්කර ගත හැක	කැබලි අංක 19	කැබලි අංක 1008	මාර්ගය	කැබලි අංක 1005 සහ 1004	19 වැනි කැබැල්ලේ කොටසක්
1007	0.0254	254	0	0	10.0	ඉඳුරාගම්බර	ගොවිතැන	රජය	අතුරුවන- කැලවාන මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත	කැබලි අංක 1008	කැබලි අංක 30	මාර්ගය (මාර්ග කොන්ත්‍රාත්)	කැබලි අංක 1005	26 වැනි කැබැල්ලේ කොටසක්
1009	0.0654	654	0	0	25.9	කොටහක්ම නොහැක	ඇඹුර	රජය	ඉඩම් අත්කර ගැනීම පනතේ 38 (අ) අනුව්. විධානය යටතේ නිවාසය ඉවතට දැමී. මිදේ නිවාසය නිවාසයන් ඩිසැබෝනි සුන්ඩි ඩිදුරි. අත්කර ගැනීම සඳහා සැලසුම් අවසන් කිරීම සඳහා	කැබලි අංක 30	කැබලි අංක 30	මාර්ගය (මාර්ග කොන්ත්‍රාත්)	කැබලි අංක 1007	30 වැනි කැබැල්ලේ කොටසක්
1010	0.0023	23	0	0	0.9	-	මාර්ගය (පුළුල්කිරීම සඳහා)	රජය	අතුරුවන - කැලවාන මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත					26 වැනි කැබැල්ලේ කොටසක්
1011	0.0236	236	0	0	9.3	ගෙඩියාවත්ත	ගොවිතැන මිදු වගාවක් ඇත.	රජය	ඉඩම් අත්කර ගැනීම පනතේ 38 (අ) අනුව්. විධානය යටතේ නිවාසය ඉවතට දැමී. මිදේ නිවාසය නිවාසයන් අත්කර සහ සැලසුම් අත්කර ගැනීම සඳහා සැලසුම් අවසන් කිරීම සඳහා	කැබලි අංක 29	කැබලි අංක 25	මාර්ගය (මාර්ග කොන්ත්‍රාත්)	කැබලි අංක 1010	25 වැනි කැබැල්ලේ කොටසක්
මුළු එකතුව	0.2060													

මායිම් පෙන්වා දුන් අය
அளக்கும் எல்லைகளை
குறித்துக் காட்டியது
Boundaries Pointed out by

සහතිකය අංක 837 මීදෙල ග්‍රාම නිලධාරී වසම්හිදී සහ කවිටියේදී
சான்றிதழ் எண் 837 மீதெல கிராம உத்தியோகத்தர் பிரிவில் மற்றும் கவிடிய
Certificate No 837 Meedella GN Division and Kawitiya

සහතික කළ අය
அளந்து எல்லைகளை
குறித்துக் காட்டியது
Boundaries Pointed out to

සහතිකය අංක 837 මීදෙල ග්‍රාම නිලධාරී වසම්හිදී සහ කවිටියේදී
சான்றிதழ் எண் 837 மீதெல கிராம உத்தியோகத்தர் பிரிவில் மற்றும் கவிடிய
Certificate No 837 Meedella GN Division and Kawitiya

සහතික කළේ අය
அளந்து எல்லைகளை
குறித்துக் காட்டியது
Boundaries Pointed out by

සහතික කළේ දින
அளந்த திகதி
Date of Survey

කොළඹ වෙත ඇති ප්‍රධාන ත්‍රිකෝණමිතික ලක්ෂ්‍යයට සාපේක්ෂව
පොළොන්නරුව පිහිටි ප්‍රධාන ත්‍රිකෝණමිතික ලක්ෂ්‍යයට සාපේක්ෂව
පළාත්කුරුණෑ පිහිටි ප්‍රධාන ත්‍රිකෝණමිතික ලක්ෂ්‍යයට සාපේක්ෂව
Field Book No.s

ත 2396, ත 2397

මැනීම සහ ඇඳීම කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by

ඒ.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
ඒ.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
ඒ.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by

ඒ.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
ඒ.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
ඒ.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ

ඉදිරිපත් කළේ
இவர்களுக்கு சமர்ப்பிக்கப்பட்டது
Submitted to

මහින්දදේව අධිකාරී
நில அளவை அத்தியட்சகர்
Supdt. of Surveys

පිටපත් නිවැරදි බව සහතික කරමි.
பிரதிகள் சரியானவை என சான்றளிக்கப்படுகின்றன.
Registered Licensed Surveyor

From :- 2017 අගෝස්ට් මස 01 දින සිට To :- 2017 දුසැම්බර් මස 31 දින දක්වා වලංගුයි

අනුමත කළේ
அங்கீகரிப்பவர்
Approved By

මහින්දදේව අධිකාරී
நில அளவை அத்தியட்சகர்
Supdt. of Surveys

ඩී.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
ඩී.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
ඩී.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ

අධ්‍යක්ෂ මිනින්දෝරු ජනරාල්
මේජර් ඒ.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
නිල අණසෙ අත්තියட்சகர்
Snr. Supdt. of Surveys

දිස්ත්‍රික්කය
மாவட்டம்
District

කවිටි
கவிடி

ඩී.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
ඩී.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ
ඩී.එම්.ඩබ්.බී.ඒ.බී.ඒ

නිල අණසෙ අත්තියட்சகර්
On behalf of the Surveyor General

12 වැනි පරිච්ඡේදය

15(iv)

ඉඩම් අත්කර ගැනීම පනතේ විධිවිධාන යටතේ ඉඩම් සීමා රැයිස්තු සඳහා උදාහරණය

ඉ.ඉ.ආර.

ගම ඕරාමම Village

:- අත්තිඩිය (කොටයාශ අංක 25, අත්තිඩිය දකුණ මහ නගර සභාව සීමාව තුල)

ග්‍රාම නිලධාරී කොටයාශය ඕ.නි.පිරිවු G.N. Division :- අංක 543B, අත්තිඩිය දකුණ

ප්‍රා. ලේ. කොටයාශය பி.செ.பிரிவு D.S. Division :- රත්මලාන

දිස්ත්‍රික්කය மாவட்டம் District :- කොළඹ

පළාත மாகாணம் Province :- බස්නාහිර

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ඉ.ප.ලැ පිටු අංකය නි.ඛි.ප. පක්ක இல T.L. Page No :-

පිඹුරු අංකය வரைபட இல Plan No :- ඉ.පි කොා 1201

කලාප අංකය தொகுதி இல Block No :- --

අතිරේක අංකය பிற்சேர்க்கை இல Sup No :- --

අතුරු පිඹුරු අංකය உள்வரைபட இல Inset No :- --

පත්‍ර අංකය தாள் இல Sheet No :- --

ස.ප.ගේ අංකය நி.நா.இல SG's Req. No :- CO/RAT/2019/245

අරමුණ நோக்கம் Purpose :- රත්මලාන- අත්තිඩිය මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම

සේවාලාභියාගේ යොමු අංක சேவை பெறுநரின் வேண்டுகோள் இல Client Requisition No :- රත්මලාන ප්‍රාදේශීය ලේකම්ගේ අංක රත්/ අත්/2019 සහ 2019-10-08 දින
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංක RD/H/125 සහ 2019-10-02 දින

කැබලි අංකය துண்டு இல Lot No	මිම ප්‍රමාණය විස්තීරණය Extent					ඉඩමේ නම காணியின் பெயர் Name of Land	වර්තමාන ඉඩම් පරිහරණය தற்போதய காணியின் உபயோகம் Present Land Use	හිමිකම් කියන්නා உரிமை கோருபவர் Claimant	නීතිමය විධිවිධාන සහ මැනීමට හේතුව சட்டப்படியான விதிகள் மற்றும் அளவைக்கான காரணம் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර පුර එල්ලෙකලින් විවරණ Details of Boundaries				පැරණි මිම් කැබලි වලට යොමුව පழைய காணித்துண்டின் குறிப்புகள் Previous Lot References
	ha	sqm	A	R	P (approx.)					උතුර வடக்கு North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බටහිර மேற்கு West	
1	0.0183	183	0	0	7.2	දෙල්ගහවත්ත, වරිපනම් අංකය - 45 ද සිල්වා පාර	ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත.	එස්.අනුරසිරි	ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම් සඳහා එස්.වීමලදාස භුක්ති විදියි	එම ඉඩමේ ඉතිරි කොටස	කැබලි අංක 2	මාර්ගය	කේ. සුසිලා හිමිකම් කියන දෙල්ගහවත්ත	ඔ.පි.කොා 25 හි 4 (හිසි 50578) වැනි කැබැල්ලේ කොටසක්
2	0.0234	234	0	0	9.3	දෙල්ගහවත්ත වරිපනම් අංකය - 48 ද සිල්වා පාර	ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක් සහ ළිඳක් ඇත.	රජය	රත්මලාන- අත්තිඩිය මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත	ඔ.පි.කොා 988 හි කැබලි අංක 8	කැබලි අංක 11	මාර්ගය	කැබලි අංක 9	ඔ.පි.කොා 988 හි 8 වැනි කැබැල්ල
25	0.0785	785	0	0	31.0	දෙල්ගහවත්ත	ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක් සහ මිශ්‍ර වගාවක් ඇත.	රජය	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(අ)1 වගන්තිය යටතේ අවසකු කිරීම සඳහා	කැබලි අංක 45	කැබලි අංක 12 සහ 28	කැබලි අංක 52	කැබලි අංක 87	ඔ.පි.කොා 965 හි 25 වැනි කැබැල්ල
35	888.8888		2196	2	5.3	මාරගහදෙනිය	වගුරු බිම	පියදාස රණසිංහ	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 50 වගන්තිය යටතේ අත්පත් කර ගැනීම අතහැර දැමීම සඳහා	කැබලි අංක 30	කැබලි අංක 12	කැබලි අංක 28	කැබලි අංක 24	ඔ.පි.කොා 889 හි 35 වැනි කැබැල්ල
මුළු එකතුව	889.0090													

මායිම් පෙන්වා දුන් අය අළක්කුම් එල්ලෙකලை குறித்துக் காட்டியது Boundaries Pointed out by

කොටයාශ අංක 543B, අත්තිඩිය දකුණ ග්‍රාම නිලධාරී එස්. කේ.කුමාර, මාර්ග සංවර්ධන අධිකාරියේ ක්ෂෙත්‍ර නිලධාරී ආර්. රත්නායක සහ කට්ටිකරුවන්

ක්ෂෙත්‍ර පොත් අංක புலக்குறிப்புப் புத்தக இல Field Book No.s

EDM කොා 2780

මැනීම සහ ඇඳීම කළේ நில அளவை செய்து வரைந்தவர் Surveyed and Drawn by

ආර්. රණසිංහ

පරීක්ෂා කළේ சரி பார்த்தவர் Checked by

අනුමත කළේ அத்தாட்சிப்படுத்தியவர் Approved By

මායිම් බලාගත් අය அளந்த எல்லைகளை குறித்துக் காட்டியது Boundaries Pointed out to

කොටයාශ අංක 543B, අත්තිඩිය දකුණ ග්‍රාම නිලධාරී එස්. කේ.කුමාර, මාර්ග සංවර්ධන අධිකාරියේ ක්ෂෙත්‍ර නිලධාරී ආර්. රත්නායක සහ කට්ටිකරුවන්

ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
பதிவு செய்யப்பட்ட உத்தரவுபெற்ற நிலஅளவையாளர்
Registered Licensed Surveyor
From :- 2019 නොවැම්බර් සිට இருந்து To :- 2019 දෙසැම්බර් දක්වා வரை

මිනින්දෝරු අධිකාරී
நில அளவை அத்தியட்சகர்
Supdt. of Surveys

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී
சிரேஷ்ட நில அளவை அத்தியட்சகர்
Snr. Supdt. of Surveys

සර්වේයර් ජනරාල් වෙනුවට
நில அளவை அதிபதிக்காக
On behalf of the Surveyor General

දිස්ත්‍රික්කය மாவட்டம் District

කොළඹ

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ ඉඩම් විස්තර ලැයිස්තුවක ආදර්ශය

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ඉ.ටී.ඒ. මිටු අංකය නිලධා පත්‍රය අංකය T.L. Page No :-
මිනුම් අංකය සැලැස්ම අංකය Plan No :- ම.මි. 759
කලාප අංකය කොට්ඨාස අංකය Block No :- --
අතිරේක අංකය ව්‍යුත්පන්න අංකය Sup No :- 19
අතුරු මිනුම් අංකය උළුවහුව අංකය Inset No :- --
පත්‍ර අංකය කාණ්ඩ අංකය Sheet No :- 19

ගම් නිලධාරි වසම ග්‍රාම නිලධාරි කොට්ඨාසය D.S. Division :- කොළොන්නාව
ග්‍රා. ලේ. කොට්ඨාසය பி.செ.பிரிவு G.N. Division :- අංක 217A, කැලණිය
දිස්ත්‍රික්කය மாவட்டம் District :- කොළඹ
පළාත மாகாணம் Province :- බස්නාහිර

ස.ප.ග්‍රේ අංකය நி.ஆ இல SG's Req. No :- RA/AMB/93/247
අරමුණ நோக்கம் Purpose :-
ගවේෂකයාගේ ගොඩ පැන අංකය සේවකය හෝ ඒජන්සියේ නම Client Requisition No :- නිමැයුම් නිරවුල් කිරීමේ ගොඩබෑමයිග්‍රේ අංක 1669(රත්නපුර) සහ 1992-10-27 දිනය

කැබලි අංකය Lot No	නිල ප්‍රමාණය Extent				ඉඩමේ නම Name of Land	වර්තමාන ඉඩම් පරිශීලනය தற்போதைய காணியின் உபயோகம் Present Land Use	නිමැයුම් කියන්නා உரிமை கோருபவர் Claimant	නිමැයුම් හා ඒ සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන சரிபார்ப்புமான வரைமுறைகளும் சட்டவிதிகளும் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර பிற எல்லைகளின் விபரங்கள் Details of Boundaries				පැරණි නිති කැබලි වලට යොමුව பழைய துண்டுகளின் குறிப்புகள் Previous Lot References
	ha	sqm	A	R	P (approx.)				උතුර வடக்கு North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බටහිර மேற்கு West	
314	6.1650		15	0	37.5	කැලිකොළුවත්ත	ගොවිබත්	නිරවුල් කොමසල් ඉඩම	ඉඩම නිරවුල් කිරීමේ අතුරුසටහන යටතේ ගොඩබෑමට ලක්වන නිරවුල් කිරීම සඳහා	කැබලි අංක 316 සහ 315	කැබලි අංක 316	කැබලි අංක 316	කැබලි අංක 314 සහ 316	313 වැනි කැබැල්ලේ කොටසක්
315	0.9670		2	1	22.3	කැලිකොළුවත්ත	ගොවිබත්	නිරවුල් කොමසල් ඉඩම	ඉඩම නිරවුල් කිරීමේ අතුරුසටහන යටතේ ගොඩබෑමට ලක්වන නිරවුල් කිරීම සඳහා	කැබලි අංක 316	කැබලි අංක 316 සහ 314	කැබලි අංක 314	කැබලි අංක 314 සහ 316	313 වැනි කැබැල්ලේ කොටසක්
316	117.3790		290	0	8.8	කැලිකොළුවත්ත	සහ කැලෑවතු	නිරවුල් කොමසල් ඉඩම	ඉඩම පුරාවිද්‍යා නිලධාරීන්ගේ, අතුරින් කරන ලද මැනුමක් හා ඒ හා සම්බන්ධ සිතියම් හෝ සිදුවීම් ලේඛණ සිය කැබැල්ල සම්බන්ධයෙන් නිසිබවක් ඉල්ලා සිටිය	-	-	-	-	313 වැනි කැබැල්ලේ කොටසක්
මුළු එකතුව	124.5110												

මායිම් යොමා දැක් අයත්කරුගේ අත්සන්
Boundaries Pointed out by

සහාධිකාරිගේ අංක 217A කැලණිය ග්‍රාම නිලධාරී ඒ.එස්.ඇසෝකා සහ කවිනෙරුවන්

ඉඩම මැනුම් කළ දිනය සහ ක්‍රියාත්මක කළ නිලධාරියා
ජෙනු අයත් අංක ප්‍රභේදාත්මක පුස්තකය ඉඩම
Field Book No.s

ර 5596

මායිම් පෙන්වා දුන් අය අත්සන් කරන්නේ
Boundaries Pointed out to

සහාධිකාරිගේ අංක 217A කැලණිය ග්‍රාම නිලධාරී ඒ.එස්.ඇසෝකා සහ කවිනෙරුවන්

මැනීම සහ ඇඳිම කළේ
නිල අණසහ ලෙස්ලු ගොඩබෑමයි
Surveyed and Drawn by

ඒ. ඩී.සිල්වා

පරීක්ෂා කළේ
ජෑෆ් පාත්‍රිකයෝ
Checked by

රජයේ මිනින්දෝරු
අාර නිලඅණසහ ගොඩබෑමයි
Government Surveyor

From :- 1993 මෙතැන් සිට இருந்து To :- 1993 දෙකැමති දක්වා வரை

අනුමත කළේ
අත්සන්කිරීමයෝ
Approved By

සමීක්ෂණ මිනින්දෝරු අධිකාරි
නිල අණසහ අත්සන්කිරීමයෝ
Snr. Supdt. of Surveys

සර්වේයර් ජනරාල් වෙනුවට
නිල අණසහ අත්සන්කිරීමක්කාරු
On behalf of the Surveyor General

දිස්ත්‍රික්කය
மாவட்டம்
District
යන්තුලව

12 වැනි පරිමාණය

ඉඩම් කොමසාරිස්

කැඩැස්තර සිතියමක් සඳහා ඉඩම විස්තර රැයිස්තුවක ඇරඹීම

17

ගම ඔරාමඹ Village :- බටකැත්තර උතුර

ග්‍රාම නිලධාරී කොට්ඨාශය ඔ.නි.පිරිවු G.N. Division :- අංක 565, බටකැත්තර උතුර

ප්‍රා. ලේ. කොට්ඨාශය ප.ලෙ.පිරිවු D.S. Division :- කැස්බෑව

දිස්ත්‍රික්කය ආඛ්‍යාට්ඨම District :- කොළඹ

පළාත ආඛ්‍යාණම Province :- බස්නාහිර

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ස.ප.ගේ අංකය නි.නා.ඉල SG's Req. No :- CO/LTR/2013/159

අරමුණ නෝක්කම් Purpose :-

සේවාලාභියාගේ යොමු අංක සේනෙහ පොහුනරින් වේණ්ඩුකෝள් ඉල Client Requisition No :- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමිසාරිස්ගේ අංක LSD/2016/325 සහ 2016-12-20 දින

ඉ.වි.ලැ පිටු අංකය නි.වි.ප. පක්ක ඉල T.L. Page No :-

පිඹුරු අංකය வரைபட இல Plan No :- ක.සි 521209

කලාප අංකය தொகுதி இல Block No :- 07

අතිරේක අංකය பிற்சேர்க்கை இல Sup No :- --

අතුරු පිඹුරු අංකය உள்வரைபட இல Inset No :- --

පත්‍ර අංකය தாள் இல Sheet No :- 1

කැබලි අංකය තුණ්ඩු ඉල Lot No	මිම ප්‍රමාණය விஸ்தீரணம் Extent					ඉඩමේ නම காணியின் பெயர் Name of Land	වර්තමාන ඉඩම් පරිහරණය தற்போதைய காணியின் உபயோகம் Present Land Use	හිමිකම් කියන්නා உரிமை கோருபவர் Claimant	නීතිමය විධිවිධාන සහ මැනීමට හේතුව சட்டப்படியான விதிகள் மற்றும் அளவைக்கான காரணம் Legal Provisions & Reason for Survey	මායිම් විස්තර புற எல்லைகளின் விபரங்கள் Details of Boundaries				පැරණි මිම් කැබලි වලට යොමුව பழைய காணித்துண்டின் குறிப்புகள் Previous Lot References
	ha	sqm	A	R	P (approx.)					උතුර வடக்கு North	නැගෙනහිර கிழக்கு East	දකුණ தெற்கு South	බටහිර மேற்கு West	
1	0.0507	507	0	0	20.0	අබිගහවත්ත	ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක් ඇත.	ගමගේ දෝන සිරියාවති සහ ගමගේ දෙනෙත් තරුෂ						මු.ඉ.2507 හි X917 සහ , මු.ඉ.4286 හි 82 (හිසි 233215) වැනි කැබලිවල කොටස්
2	0.0095	95	0	0	3.8	-	ප්‍රවේශ මාර්ගය	ගමගේ දෝන සිරියාවති සහ ගමගේ දෙනෙත් තරුෂ						මු.ඉ.4286 හි 82(හිසි 233215) වැනි කැබැල්ලේ කොටසක්
3	0.0251	251	0	0	9.9	අබිගහවත්ත	ගෙවත්ත ස්ථිර ගොඩනැගිලි දෙකක් ඇත.	මිනුවම්පිටියගේ අරුණ						මු.ඉ.4286 හි 82(හිසි 233215) වැනි කැබැල්ලේ කොටසක්
4	0.0104	104	0	0	4.1	-	මාර්ගය	සොයාගත නොහැක						මු.ඉ.4286 හි 82 (හිසි 233215) වැනි කැබැල්ලේ කොටසක්
5	0.0147	147	0	0	5.8	දෙල්ගහවත්ත	ගෙවත්ත අවුරුදු 5-10 ක් පමණ වයසැති පොල් වගාවක් ඇත.	රජය	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ගමගේ දෝන ජයන්ති විසින් බලපත්‍රයක් මත වගාකර ඇත, බලපත්‍ර අංකය 24, දීමනා පත්‍රයක් නිකුත් කිරීම සඳහා	කැබලි අංක 5	කැබලි අංක 9	කැබලි අංක 3	කැබලි අංක 10	මු.ඉ. 4286 හි 1 වැනි කැබැල්ලේ කොටසක්
6	0.0274	274	0	0	10.8	දෙල්ගහවත්ත	ගෙවත්ත නාවකාලික ගොඩනැගිල්ලක් ඇත.	හතරසිංහගේ දෝන හෂිනි	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ජයභූමි දීමනාපත්‍රයක් නිකුත් කර ඇත, දීමනා පත්‍ර අංකය - කොග/ප/25	කැබලි අංක 9	කැබලි අංක 7	කැබලි අංක 6	කැබලි අංක 5	මු.ඉ. 4286 හි 1 වැනි කැබැල්ලේ කොටසක්
මුළු එකතුව	0.1378													

මායිම් පෙන්වා දුන් අය
අළක්කුම් එல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out by

කොට්ඨාශ අංක 565 බටකැත්තර උතුර ග්‍රාම නිලධාරී වෘන්දනී ඛන්ඩුවර්ධන සහ ඉඩම් හිමියන්

ක්ෂේත්‍ර පොත් අංක புலக்குறிப்புப் புத்தக இல Field Book No.s

කොග 7215, කොග 7216

මැනීම සහ ඇඳීම කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by

එස්.ඒ.පෙරේරා

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by

අනුමත කළේ
அத்தாட்சிப்படுத்தியவர்
Approved By

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී
சிரேஷ்ட நில அளவை அத்தியட்சகர்
Snr. Supdt. of Surveys

දිස්ත්‍රික්කය
மாவட்டம்
District

කොළඹ

සර්වේයර් ජනරාල් වෙනුවට
நில அளவை அதிபதிக்காக
On behalf of the Surveyor General

මායිම් බලාගත් අය
அளந்த எல்லைகளை குறித்துக் காட்டியது
Boundaries Pointed out to

කොට්ඨාශ අංක 565 බටකැත්තර උතුර ග්‍රාම නිලධාරී වෘන්දනී ඛන්ඩුවර්ධන සහ ඉඩම් හිමියන්

ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
பதிவு செய்யப்பட்ட உத்தரவுபெற்ற நிலஅளவையாளர்
Registered Licensed Surveyor
From :- 2017 පෙබරවාරි සිට இருந்து To :- 2017 මැයි දක්වා வரை

මිනින්දෝරු අධිකාරී
நில அளவை அத்தியட்சகர்
Supdt. of Surveys

12.100 ජේදය 4.60 ජේදය ඇමුණුම 02

පිඹුරු පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සටහන්

හරි වැරදි බැලීම

01. ඛණ්ඩාංක ලක්ෂ්‍ය ක්ෂෙත්‍ර පොත සමඟ පරීක්ෂා කිරීම
02. මායිම් රේඛා ක්ෂෙත්‍ර පොත සමඟ සැසඳීම
03. ස්ථිර මායිම් සහ මායිම්ගල් විස්තර කිරීම හා නිවැරදිභාවය පරීක්ෂා කිරීම
04. ක්ෂෙත්‍ර පොත් යොමුව නිල්පාටින් පිඹුරේ පෙන්වීම
05. ක්ෂෙත්‍ර පත්‍ර අංක, ක්ෂෙත්‍ර පොත් අංක සහ අනෙකුත් විස්තර නිවැරදිව පිඹුරේ සඳහන් කිරීම සහ පරීක්ෂා කිරීම
06. සටහන් කරන ලද ග්‍රිඩ් ඛණ්ඩාංක වල නිවැරදිභාවය පරීක්ෂා කිරීම
07. පත්‍ර දාර සහ තොරතුරු (ගම, ග්‍රා.නි.කොට්ඨාශය,..ආදිය) නිවැරදිද යන්න පරීක්ෂා කිරීම
08. උතුර, පරිමාණය, ජා.සිතියම් යොමුව, පත්‍ර අංක, දම්වැල් 16 රේ.වි.අංක නිවැරදිව ඇතුලත් කර තිබේද යන්න පරීක්ෂා කිරීම
09. ක.සි. මායිම්, ගම් මායිම්, ග්‍රා.නි.මායිම්, ප්‍රා.ලේ. කොට්ඨාශ මායිම්, දිස්ත්‍රික් මායිම් හා අනෙකුත් විස්තර
10. අවසාන පිඹුරෙහි අංකිත දත්ත ලැබී ඇති බවට පරීක්ෂා කිරීම හා ලැබී ඇති අවසාන අංකිත පිඹුරෙහි සියළු දත්ත අදාළ දත්ත ස්ථරයෙහි නිවැරදිව ඇතුලත් කර තිබේද යන්න පරීක්ෂා කිරීම

පිරික්සා බැලීම

11. සියළු පරික්‍රමණ ලක්ෂ්‍ය නිවැරදිව පෙන්වා තිබීම සහ දම්වැල් රේඛා නිල්පාටින් තීන්ත කර තැබීම
12. සියළු ජල මාර්ග විස්තර කර තිබීම සහ ඒවායේ ජලය ගලන දිශාව නිවැරදිව පෙන්වා තැබීම
13. මාර්ග සහ පාරවල් වල දිශාව සෑම අවස්ථාවකම පෙන්වා තැබීම
14. සියළුම මායිම් විස්තර කර තැබීම සහ ඒවා ක්ෂෙත්‍ර පොත් සමඟ පරීක්ෂා කිරීම
15. සියළු මායිම් සඳහා ප්‍රමාණවත්ව මායිම්ගල් දමා තිබීම හෝ ඒවා වාර්තා කර තිබීම
16. ඇළ මාර්ග සහ සමෝච්ඡ රේඛා රවුම් හැඩවීම සහ තියුණු මුළු නොතිබීම
17. සියළුම තොරතුරු ස්ථිර රේඛාවලින් සෘණව මුද්‍රණය වී තිබීම
18. කැබලි අංක නිවැරදිව අංක කර තිබීම
19. ඉඩම් විස්තර ලැයිස්තුව රෙගුලාසි වලට අනුව දත්ත පද්ධතිය (TL database) භාවිතා කර පිළියෙල කිරීම
20. සියළුම ඛණ්ඩාංක පත්‍ර (යැවිය යුතු) සුපරීක්ෂාකාරීව පුරවා තිබීම සහ ආපසු යවන පෝරම නිවැරදිව සම්පූර්ණ කර තැබීම සහ අත්සන් තබා තිබීම
21. ක්ෂෙත්‍ර පොත් අංක නිවැරදි ආකාරයට අකාරාදීව අංක කර යොමුගත කිරීම සහ ඒවා අත්සන් තබා පාද සටහන් තැබීම
22. සිදු කළ මැනුම 1:50,000 භූලක්ෂණ සිතියම සමඟ වෙනස්වන අවස්ථාවල් හිදි වාර්තාකර තැබිය යුතුය
23. ඉඩම් කැබලිවල විස්තර, ක්ෂෙත්‍ර පොත සහ ඉඩම් විස්තර ලැයිස්තුව සමඟ පරීක්ෂා කළ යුතුය.
24. ගම්, ඉඩම්, සහ පුද්ගල නම් සමඟ තවත් දෑ අනෙකුත් පිඹුරු සහ ලේඛන වල අක්ෂර වලට අනුකූලද යන්න සහ යම් වෙනසක් වේනම් ඒ සම්බන්ධව වාර්තාවේ සඳහන් කළ යුතුය.
25. මිනින්දෝරුවරයාගේ වාර්තාව පරීක්ෂා කළ යුතුය.

භූලක්ෂණාත්මක මූලික පිඹුරු පරීක්ෂා කිරීමට අදාළ විශේෂ සටහන්

පිරික්සා බැලීම

26. මාර්ග, ජල මාර්ග, යා බඳ මායිම් සහ අනෙකුත් දෑ ඇතුලත්ව නිවැරදිව භූලක්ෂණාත්මක මූලික පිඹුරෙන් 1:50,000 පරිමාණයට අනුරේඛනය ලබා ගෙන තිබේද යන්න පරීක්ෂා කිරීම සහ එය 1:50,000 පත්‍රයේ අධිස්ථාපනය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයට යැවීමට කටයුතු කිරීම.
27. ගමක කොටසක් භූලක්ෂණාත්මක පිඹුර තුලට සහ කොටසක් ඉන් පිටතට වැටෙන විට යාබද ගම් මායිම පෙන්වා ‘‘කොටසක්’’ ලෙස සඳහන් කළ යුතුය.
28. යාබද මායිම ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් මායිමක් වන විට ඊට අදාළ නිරවද්‍ය සම්මත සලකුණු යෙදිය යුතුය.
29. අතුරු පිඹුරු වල පිහිටීම 1:50,000 අනුරේඛනයේ නිවැරදිව පෙන්විය යුතු අතර 1:4,000 අතුරු පිඹුරෙහි පෙන්වා ඇති ගම් මායිම් සහ අනෙකුත් දෑ නිවැරදිව සහ ඒවායේ හැඩයට එකඟව තිබිය යුතුය.
30. එක් ගමකට අතුරු පිඹුරු එකකට වැඩි ප්‍රමාණයක් වැටෙන විට අතුරු පිඹුරු අංක සහ කැබලි අංක සඳහා අනුයාත අංක යෙදිය යුතුය.
31. සියළුම අතුරු පිඹුරුවල යාබද ඉඩම් විස්තර සහ කැබලි අංක පෙන්විය යුතුය.
32. ඉඩම් විස්තර ලැයිස්තුවේ පළමු වන පිටුව ප්‍රධාන කැබලි අංකයට පමණක් භාවිතා කළ යුතුය.

මායිම් නියම කිරීමේ මැනුම් පිඹුරු පරීක්ෂා කිරීමට අදාළ විශේෂ සටහන්

පිරික්සා බැලීම

33. නිරවුල් කිරීමේ නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් ලංකා මැනුම සහ අතිරේක ඉඩම් විස්තර ලැයිස්තු සමඟ පරීක්ෂා කළයුතුය
34. උප කැබලි වල මායිම් දළ සැලැස්ම සමඟ එකඟ වීම
35. කපා ඉවත් කරනු ලබන ප්‍රමාණයන් නිසි පිළිවෙලින් අදාළ සීමාවන් තුල තිබිය යුතුය.
36. මුල් කැබැල්ලේ කොටසක් අත් නොහැරිය යුතු අතර උප කැබලි පිලිවෙලට විය යුතුය.
37. ගම් මැනුමට අදාළ ක්ෂෙත්‍ර පත්‍රයේ සංශෝධන පරීක්ෂා කළ යුතුය.
38. මුල් පිඹුරේ ඇති සියළුම රේඛා ගම් පිඹුරෙහි තිබේද යන්න පරීක්ෂ කර බැලීම.
39. අතිරේක ඉඩම් විස්තර ලැයිස්තුව මුල් ඉඩම් විස්තර ලැයිස්තුව සමඟ පිරික්සා බලා යොමුව නිවැරදි ලෙස තිබේදැයි පරීක්ෂා කළ යුතුය.
40. නිරවුල් කිරීමේ නිලධාරියාගේ මැනුම් ඉල්ලීම අවලංගු කිරීම පරීක්ෂා කළ යුතුය.
41. මිනින්දෝරු වාර්තාවේ සඳහන් තොරතුරු කරන ලද වැඩ වලට අදාළද යන්න පරීක්ෂා කළ යුතුය.
42. ගම් මැනුමට අදාළ ක්ෂෙත්‍ර පත්‍රයේ අත්සන් තබා ඇත්ද යන්න පරීක්ෂා කර බැලිය යුතුය.

විකීර්ණ මැනුම් වල පිඹුරු පරීක්ෂා කිරීමට අදාළ විශේෂ සටහන්

පිරික්සා බැලීම

43. ක්ෂෙත්‍ර පොත් සඳහා යොමුව පිඹුරේ නිල් පාටින් පෙන්වා තිබිය යුතුය.
44. ක්ෂෙත්‍ර පත්‍රය නිවැරදිව අංක කිරීම සහ සියළුම ලේඛණ පිඹුරට යොමුගත විය යුතුය.
45. සියළුම මැනුම් කුඤ්ඤ නිවැරදිව පෙන්වා තිබිය යුතු අතර දම්වැල් රේඛා තීන්ත කර තිබිය යුතුය.

46. ක්ෂෙත්‍ර පත්‍ර අංකය සහ මැනුම් ඉල්ලීම් අංකය සියළුම ක්ෂෙත්‍ර පොත් වල සඳහන් කළ යුතු අතර ඒවා නිවැරදිව අකාරාදීව අංක කර යොමුව යොදා නිවැරදිව අත්සන් තබා පාද සටහන් යෙදිය යුතුය.
47. වෙනත් පිඹුරකින් අනුරේඛනය කරන ලද සහ සකස් කරන ලද මායිම් රතු පාටින් ක්ෂෙත්‍ර පොතෙහි පෙන්විය යුතුය.
48. මායිම්ගල් සඳහා සහතිකය සහ මායිම් පෙන්වා දුන් සහතිකය එක් එක් වැඩ අවසානයේ ක්ෂෙත්‍ර පොතෙහි සටහන් කළ යුතු අතර විශාල මැනුමකදී ක්ෂෙත්‍ර පොතෙහි යොමු පිටුවෙහි සටහන් කර තැබිය යුතුය.
49. මායිම්ගල් දමා නොමැති ස්ථිර නොමැති මායිම් සම්බන්ධව ඊට හේතුව අදාළ පිටුවෙහි පහලින් ලියා තිබිය යුතුය.
50. 1:50,000 භූලක්ෂණාත්මක සිතියම සමඟ යම් වෙනසක් ඇති බව මැනුම සිදු කිරීමෙන් පසු අනාවරණය වුවහොත් ඒ සම්බන්ධව වාර්තා කර තැබිය යුතුය.
51. මනින ලද රජයේ ඉඩමට යබඳ ඉඩම වගාකර ඇත්නම් එය අනවසර වගාවක්ද නැතහොත් අවසරයක් මත වගාකර ඇද්ද යන්න වාර්තා කර තිබිය යුතුය.
52. අළුත් මැනුමේ වට මායිම පැරණි ක්ෂෙත්‍ර පත්‍රයේ පැන්සලෙන් සංශෝධනය කළ යුතුය. එය කලින් කරන ලද මැනුමකට යාව ඇති විටෙක ඒ සම්බන්ධව අළුත් ක්ෂෙත්‍ර පත්‍රයේ රතු පාටින් යොමු කර තිබිය යුතුය.
53. දැනටමත් ඇති පිඹුරක් සඳහා නව පිඹුරක් පිලියෙල කළ විටෙක පැරණි පිඹුර කඩ ඉරි මඟින් පැන්සලෙන් අඳුරු කර අළුත් පිඹුරට යොමුව යොදා තිබිය යුතුය.
54. සියළුම ඇළ මාර්ග විස්තර කර ඒවායේ ජලය ගලන දිශාව පෙන්වා තිබිය යුතුය.
55. තනි රේඛාවකින් පෙන්වා ඇති ඇළ මාර්ග වල පළල ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කළ යුතුය.
56. සියළුම මාර්ග සහ පාරවල් හි දිශාවන් සෑම විටම පෙන්වා තිබිය යුතුය.
57. ඇළ මායිම් සහ සමෝච්ජ රේඛා වක්‍රාකාර විය යුතු අතර තියුණු කොන් නොතිබිය යුතුය.
58. සියළු තොරතුරු සහ මුද්‍රණයන් සෘණ ස්ථිර රේඛා විය යුතුය.
59. ඉඩම් විස්තර ලැයිස්තුව රෙගුලාසි වලට අනුකූලව පිළියෙල කර තිබිය යුතුය.
60. ඇතුලත් නොකරන යම් මායිමක් නියමාකාරයට අතහැර දැමිය යුතුය.
61. සියළුම මාර්ග සහ පාරවල් විස්තර කර තිබිය යුතුය.
62. අවශ්‍ය පැරණි ස්ථිර කුඤ්ඤ මැනුම් කර පෙන්වා තිබිය යුතුය.
63. අතුරු පිඹුරක් තිබේ නම් එය නිවැරදිව පරිමාණයට යොමුකර පෙන්වා තිබිය යුතුය.
64. පිඹුරුගත කර ඇති ප්‍රදේශය තුලට වැටී ඇති කැබලි අංක කපා ඉවත් කළ යුතුය. එසේ නොමැති විට ඒ සම්බන්ධව වාර්තා කර ඊට අදාළ සුදුසු පියවර ගත යුතුය.
65. සියළුම මායිම් විස්තර කර තිබිය යුතු අතර ක්ෂෙත්‍ර පොත් සමඟ පරීක්ෂා කළ යුතුය.
66. සියළුම මායිම් සඳහා ප්‍රමාණවත් පරිදි මායිම්ගල් යෙදිය යුතු අතර නොඑසේනම් වාර්තා කර තැබිය යුතුය.
67. ක්ෂෙත්‍ර පොතෙහි සඳහන් පිහිටීම වෙනස්වූ, කැඩී තිබූ හෝ අස්ථානගතවී ඇති මායිම්ගල් සම්බන්ධව ක්ෂෙත්‍ර පත්‍රයේ සීමා තීරයේ සටහනක් යොදා ඒ සම්බන්ධව වාර්තා කළ යුතුය.
68. කැබලි නිවැරදිව අංක කළ යුතුය.
69. කැබලි අංක විස්තර, ක්ෂෙත්‍ර පොත් අංක, මනින ලද දිනය සහ අත්සන ක්ෂෙත්‍ර පත්‍ර සීමා තීරයේ සටහන් කළ යුතුය.
70. යැවිය යුතු සියළුම ඛණ්ඩාංක පත්‍ර සුපරීක්ෂාකාරීව සම්පූර්ණ කළ යුතු අතර ආපසු යවන පෝරමයට නිවැරදිව ඇතුලත් කර අත්සන් තැබිය යුතුය.
71. ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කැබලි විස්තර පිඹුර සමඟ එකඟ විය යුතු අතර ඒ සියල්ල ක්ෂෙත්‍ර පොත සමඟද එකඟ විය යුතුය.
72. ගම්, ඉඩම් සහ පුද්ගල නම් වල අක්ෂර අනෙකුත් පිඹුරු සහ ලේඛන වලට අදාළව විය යුතු අතර ඉඩමේ නම දෙන ලද මැනුම් ඉල්ලීමට එකඟ විය යුතුය. නොඑසේනම් ඒ සම්බන්ධව වාර්තා කළ යුතුය.

73. මුල් මැනුමට අදාළ මායිම් වලින් ලබා ගත් අධිස්ථාපන හෝ සංසන්දන අනුරේඛන වල උතුරු රේඛාව, පරිමාණය, පත්‍ර අංකය, විශාල කිරීමක්ද කුඩා කිරීමක්ද යන්න, අධිස්ථාපනය කිරීමක්ද සංසන්දනය කිරීමක්ද යන්න සමඟ මිනින්දෝරුවරයාගේ අත්සන සහ දිනය යොදා තිබිය යුතුය.
74. අධිස්ථාපන පරීක්ෂා කර පිළිගත හැකි අධිස්ථාපන සඳහා ‘‘හරි’’ ලකුණු යෙදිය යුතුය.
75. කලින් සිදුකර ඇති අධිස්ථාපන අනවශ්‍ය පරිදි වෙනස් නොකර තිබිය යුතුය.
76. අධිස්ථාපන ‘‘P’’, ‘‘Q’’ හෝ ‘‘R’’ ලෙස නියමාකාරව වර්ග කර තිබිය යුතුය.
77. සියළු අධිස්ථාපන අනුරේඛන පිඹුර සමඟ යැවිය යුතුය.
78. ආරක්ෂිත කැබලි සහ හිමිකම් මායිම් සම්බන්ධව දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි නියමානුකූලව භාවිතා කර තිබිය යුතුය.
79. සියළු මායිම් නියමානුකූලව කෙලින් කර හෝ කෙලින් නොමැති මායිම් අත්හැර හෝ අවශ්‍ය පරිදි තිබිය යුතුය.
80. අවශ්‍ය ප්‍රවේශ මාර්ග මගහැරී තිබේද යන්න.
81. අවශ්‍ය සියළු වෙන්කළ බිම් මගහැරී තිබේද යන්න.
82. මාර්ගයකට යාබදව ඇති විටෙක ඉදිරිපසත් ගැඹුරත් අතර අනුපාතය නියෝග වලට එකඟව විය යුතුය.
83. යම් විශේෂ අවශ්‍යතා පිළිබඳව මැනුම් ඉල්ලීමේ සඳහන්ව ඇත්නම් ඒ සම්බන්ධව ක්‍රියා කළ යුතුය.
84. පිඹුර නියමිත පරිමාණයෙන් පිළියෙල කළ යුතු අතර එහි පරිමාණය අවශ්‍ය පරිදි පිඹුරේ හෝ අතුරු පිඹුරෙහි සඳහන් කළ යුතුය.
85. ඉඩමේ පිහිටීම සහ විස්තර, මැනුම් ඉල්ලීමට එකඟව තිබිය යුතු අතර එසේ නොමැති නම් ඊට හේතුව වාර්තා කර තිබිය යුතුය.
86. කපා ඉවත්වන ප්‍රමාණය නිවැරදි විය යුතු අතර එසේ නොමැති නම් ඒ සම්බන්ධව නිවැරදිව වාර්තා කළ යුතුය.
87. සියළු කුඩා ශේෂ ප්‍රදේශ විස්තර කර පිඹුර සම්පූර්ණ කිරීමට අංක යෙදිය යුතුය. මෙය අවශ්‍ය කරුණකි.
88. මැනුම් ඉල්ලීම නියමානුකූලව අවලංගු කර මැනුම් කළ දිනය, පත්‍ර අංකය, කැබලි අංක සහ මිනින්දෝරුවරයාගේ අත්සන යොදා තිබිය යුතුය.
89. අත්කර ගැනීමේ මැනුමකදී කපා ඉවත්වන ඉඩම් කොටස විස්තර කර ඇති ප්‍රකාශණය සමඟ සමාන විය යුතු අතර එය දළ සැලැස්මේ පෙන්වා තිබිය යුතුය. එසේ නොමැති නම් ඒ සම්බන්ධව 6.6-6.11 ඡේදයන් ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.
90. පැරණි මැනුමට අදාළ පිඹුරේ පෙන්වා ඇති සියළු මාර්ග, ඇළ මාර්ග සහ අනෙකුත් දෑ නව මැනුම හරහා වැටී තිබිය යුතුය. එසේ නොමැති නම් එය වාර්තා කර තිබිය යුතුය.
91. නිම කරන ලද වැඩ 1:10,000 පත්‍රයට නියමානුකූලව ගැලපිය යුතුය. එසේ නොවේ නම් ඒ සම්බන්ධව වාර්තා කළ යුතුය.
92. කරන ලද වැඩ කෙලින්ම ප්‍රධාන කාර්යාලයට යවන්නේ නම් සංශෝධන අනුරේඛන දෙකක් පිළියෙල කළ යුතුය. එයින් එක් පිටපතක් ප්‍රධාන කාර්යාලයට සහ අනෙක දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත අමතර තොරතුරු සමඟින් යැවිය යුතුය.
93. අවසාන ගම් පිඹුරු ප්‍රදේශයකදී අවසාන ගම් පිඹුරු රේඛා චිත්‍රයට අදාළ පිටපත නියමානුකූලව සංශෝධනය කර තිබිය යුතු අතර, පිඹුරු රූප සටහනුකූලව සංශෝධනය කළේ නම් ඒ සම්බන්ධව වාර්තා කළ යුතුය.
94. පැරණි ක්ෂෙත්‍ර පොත්, ක්ෂෙත්‍ර පත්‍ර සහ භාවිතා කරන ලද අවසාන කැබලි අංක අවසාන ගම් පිඹුරෙහි ඇතුලත් කර තිබිය යුතුය.
95. අවසාන ගම් පිඹුරේ නිවේශය කිරීම සඳහා පිළියෙල කර ඇති අනුරේඛනය නිවැරදි කළ යුතුය.
96. යාබද අවසාන ගම් පිඹුරු සහ ගම් පිඹුරු සංශෝධනය කර තිබිය යුතු අතර එම සංශෝධන අනුරේඛන යැවිය යුතුය.
97. මැනුම් කර නොමැති අනවසර අල්ලාගැනීම් තිබේ නම් වාර්තා කළ යුතුය.
98. ග්‍රාම නිලධාරි දැන්වීම් පෝරමය නියමානුකූලව පුරවා ග්‍රාම නිලධාරි වසම් අංකය සහ ග්‍රාම නිලධාරිගේ නමද ඉඩම් විස්තර ලැයිස්තුව සමඟ සමාන විය යුතුය.

99. ග්‍රාම නිලධාරිගේ නියෝජිතයකු නොවන වෙනත් අයකු අත්සන් කර තිබේ නම් ඒ සම්බන්ධව වාර්තා කළ යුතුය.
100. මායිම් සහ මායිම්ගල් ග්‍රාම නිලධාරිට සහ අයදුම්කරුට පෙන්වා තිබිය යුතු අතර මේ සම්බන්ධව දැන්වීම් පෝරමයේ සහතික කර ඉඩම් විස්තර ලැයිස්තුවට ඇතුලත් කර තිබිය යුතුය.
101. "මළ" හේතුව නිසා ඉඩම් විස්තර ලැයිස්තුවේ වෙන් කළ බිම් අතහැර ඇති හෝ වෙන්කළ බිම් ප්‍රමාණය අඩුකර ඇති විට ඊට හේතුව වාර්තාවේ පැහැදිලි කර තිබිය යුතුය.
102. කරන ලද වැඩ හරහා හෝ ඊට යාබදව පළාත් පාලන මායිමක් ඇති විටෙක එය නිවැරදිව පිඹුරේ පෙන්වා අවශ්‍ය පරිදි විස්තර කර තැබිය යුතුය.
103. අළුතින් මැන පිළියෙල කර ඇති පිඹුරේ පෙන්වා ඇති පළාත් පාලන මායිම් පැරණි පිඹුර සමඟ වෙනස් වන්නේ නම් ඒ සම්බන්ධව වාර්තා කර තිබිය යුතුය.
104. වගාවේ වයස ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කර තිබිය යුතුය.
105. ග්‍රාම නිලධාරි පෝරමයේ සහ පිරිවැය බිල්පතේ සඳහන් මායිම්ගල් ප්‍රමාණය එකම නම් එය පිඹුර සමඟද සමාන විය යුතුය.
106. මිනින්දෝරුවරයාගේ වාර්තාව පරීක්ෂා කර වැඩෙහි තත්වය පිළිබඳව අදහස් දැක්විය යුතුය.

ඉංජිනේරු මැනුම් පිඹුරු පරීක්ෂා කිරීම සඳහා විශේෂ සටහන්

පිරික්සා බැලීම

107. පිඹුරේ පරිමාණය, දික් අතට සහ හරස් කැපුම පිරිවිතර වලට අනුරූපව විය යුතුය.

පරීක්ෂා කර බැලීම

108. ස්ථානීය උස ලකුණු කිරීම
109. සමොච්ජ රේඛා අන්තර් නිවේශනය කිරීම.
110. පෙන්වා ඇති පිල් ලකුණු වල අගයන්
111. මුද්‍රිත සමෝච්ජ රේඛා අගයන් සහ ඒවා කන්දක නැග්මක් ආකාරයට මුද්‍රණය වී ඇත්ද යන්න.
112. දිග් කඩ ලකුණු කිරීම, පිඹුරේ පෙන්වා ඇත්නම්
113. යම් රජයේ සහ අයිතිවාසිකම් කියන්නාවූ ඉඩමක් අතර මායිමට මායිම්ගල් යෙදිය යුතුය.
114. සියළුම මාර්ග සහ පාරවල් විස්තර කර තිබේදැයි පිරික්සා බැලිය යුතුය.
115. ඉඟි සටහන සමඟ පත්‍ර අංකනය සහ සියළු සඳහන් කිරීම් පෙන්වා තිබිය යුතුය.
116. පිරිවිතර සහ පිඹුර සමඟ සියළු විසංගතතාවන් වාර්තාවේ පැහැදිලි කර තිබිය යුතුය.
117. කොටු රේඛා සහ අංකනයන්
118. කි.මී. 4 X 2.5 සම්මත පත්‍ර, රේඛා පිහිටීම සහ හතරැස් සංඛ්‍යා, සීමා තීරයේ තිබිය යුතුය.

නගර මැනුම් පිඹුරු පරීක්ෂාවට අදාළ විශේෂ සටහන්

පිරික්සා බැලීම

119. හිමිකම් කියනු ලබන මායිම් සහ ඒවායේ විස්තර
120. ගොඩනැගිලි සහ ඒවායේ විස්තර
121. කැබලි අංක සහ කාණු
122. රජයේ ඉඩම් සහ ඒවායේ අධිස්ථාපන, ඒවායේ මායිම් නිවැරදිව අර්ථ දක්වා තිබේද යන්න
123. ඉඩම් කැබලිවල අංක සහ ඒවායේ මායිම් යාබද පත්‍ර සමඟ සසඳා බැලිය යුතුය.
124. ශීර්ෂ සහ සීමා තීර අවශ්‍යතා පරීක්ෂා කළ යුතුය.
125. පිල් ලකුණු සහ ඒවායේ අගයන් පරීක්ෂා කළ යුතුය.

126. පිරිවිතර වල අවශ්‍යතාවන් නියමාකාරව ක්‍රියාත්මක කළේද යන්න පිරික්සා බැලිය යුතුය.
127. ක්ෂෙත්‍ර පත්‍රයේ පෙන්වා ඇති මාර්ග වල නම් සහ වසම් හෝ කොටියාශ අංක යාබද පත්‍ර සමඟ පරීක්ෂා කර බැලිය යුතුය.
128. නාගරික ප්‍රදේශයේ මායිම් නවතම ප්‍රකාශ පත්‍ර සමඟ පිරික්සා බලා ඒවා නිවැරදිව විස්තර කර ඇත්ද යන්න පරීක්ෂා කළයුතුය.
129. ඒ ඒ පත්‍ර වල මුද්‍රණ වර්ග සහ ප්‍රමාණයන් සමාන දැයි පිරික්සා බැලීම.
130. දෙපාර්තමේන්තු උපදෙස් වලට අනුකූලව පිඹුරු වල අත්සන් තබා ඇත්ද යන්න පිරික්සා බැලීම.
131. සියළු වරිපණම් අංක ඉඩම් විස්තර ලැයිස්තුවට ඇතුලත් කර එම වරිපණම් අංක අදාළ කොටියාශය, වසම හෝ මාර්ගයට අනුකූලව නිවැරදිව ඉඩම් විස්තර ලැයිස්තුවේ පෙන්වා ඇත්ද යන්න පිරික්සා බැලීම.
132. ඉඟි සටහන් පරීක්ෂා කිරීම.
133. විශාල පරිමාණයකින් අතුරු පිඹුරු භාවිතා කර තිබේ නම් වට මායිම් සසඳා බැලීම.

ශුද්ධි පත්‍රය

13 වැනි පරිච්ඡේදය

ක්ෂෙත්‍රඵලය ගණනය කිරීම

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	ක්ෂෙත්‍රඵලය ගණනය කිරීමේදී සැළකිය යුතු කරුණු	
13.1.	සියළුම කැබලි සඳහා ස්වායත්ථ ගණනය කිරීම් දෙකක් කළ යුතු බව	1
13.2.	ක්ෂෙත්‍රඵලය ගණනය කිරීම් වල නිරවද්‍යතාව	1
13.3.	ක්ෂෙත්‍රඵල ආගණන පත්‍රයේ අනු අත්සන යොදා නිරවද්‍යතාව සහතික කළ යුතු බව	1
13.4.	පරිගණක යන්ත්‍ර ආධාරයෙන් ක්ෂෙත්‍රඵල ගණනය කිරීම දෝෂ අවම බව	1
13.5.	භූවමාරු කිරීම සඳහා නියමිත බිම් ප්‍රමාණවල් මැන වෙන් කිරීම	1
13.6.	සම්මත ක්ෂෙත්‍රඵල සඳහා දිය යුතු ශුද්ධිය	1
	අ.ග.පි. ඉතිරි ප්‍රදේශය සම්බන්ධයෙන් කටයුතු කිරීම	
13.7.	අවසාන ගම් පිඹුරක් තුල ඉතිරි ප්‍රදේශය හෙක්ටයාර් එකකට වඩා අඩු විට ක්‍රියාදාමය	1
13.8.	අවසාන ගම් පිඹුරක් තුල ඉතිරි ප්‍රදේශය හෙක්ටයාර් එකකට වඩා වැඩි විට ක්‍රියාදාමය	1
	මායිම් නියම කිරීමේ මැනුම් වලදී ක්ෂෙත්‍රඵලය ගණනය කිරීම	
13.9.	ලංකා මැනුම් කැබලි වල ක්ෂෙත්‍රඵලය ගණනය කිරීම	2
13.10.	මායිම් නියම කිරීමේ මැනුම් වලදී, ඉතිරිවන කැබැල්ලේ ක්ෂෙත්‍රඵලය ගණනය කිරීම	2
	වර්ගඵල ගණනයේදී ඉඩදිය හැකි දෝෂය නිර්ණය කිරීම	
13.11.	මායිම් ස්වාභාවය පාදක කරගත් බිම් කැබැල්ලක වර්ගඵලයේ ඉඩදිය හැකි දෝෂය ගණනය කිරීම	2
	මායිම් අර්ථ දැක්වීම	
13.12.	ස්ථාවර මායිම	2
13.13.	පොදු මායිම	3
	නිරවද්‍යතා මට්ටම්	
13.14.	I පන්තියේ නිරවද්‍යතාව නිර්ණය කිරීම	3
13.15.	II පන්තියේ නිරවද්‍යතාව නිර්ණය කිරීම	4
13.16.	III පන්තියේ නිරවද්‍යතාව නිර්ණය කිරීම	4
	වර්ගඵල ගණනය	
13.17.	වර්ගඵලය ගණනය කිරීමේදී දශමස්ථාන නිර්ණය කිරීම	5
	බිම් කට්ටියක වර්ගඵලය නිර්ණය කිරීම	
13.18.	පෙර මැනුමේ වර්ගඵලය සමඟ සංසන්දනය කිරීම	5
13.19.	පෙර මැනුමේ වර්ගඵලය අංකිත ප්‍රතිගණනයෙන් පසුව සැලකිය යුතු වෙනසක් පවතින විට කටයුතු කිරීම	6
13.20.	පෙර මැනුමේ වර්ගඵලය අංකිත ප්‍රතිගණනයෙන් පසුව සැලකිය යුතු වෙනසක් නොවන විට කටයුතු කිරීම	6
13.21.	ක්ෂෙත්‍රඵලය ගණනය කිරීම් සඳහා මෘදුකාංග	6

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	ඇමුණුම්	
ඇමුණුම 01	I පන්තිය සහ II පන්තිය නිරවද්‍යතා මට්ටම් (පහසු යොමුව සඳහා) සඳහා ඉඩදිය හැකි දෝෂය සඳහා පූර්වයෙන් ගණනය කරන ලද අගයන්	7

13 වැනි පරිච්ඡේදය

ක්ෂේත්‍රඵලය ගණනය කිරීම

ක්ෂේත්‍රඵලය ගණනය කිරීමේදී සැළකිය යුතු කරුණු

13.1 මිනින්දෝරුවරයා විසින් පිඹුරේ ඇති සියළුම කැබලිවල ක්ෂේත්‍රඵලය ගණනය කර සටහන් කළ යුතු අතර මිනින්දෝරු අධිකාරි විසින් සියළුම කැබලි සඳහා ස්වාධීනව ගණනය කිරීමක් කර ප්‍රතිඵල සන්සන්දනය කළ යුතුය. ගණනය කරන ලද බිම් ප්‍රමාණයන් ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කළ යුතු අතර පිඹුරේ සඳහන් නොකළ යුතුය.

13.2 සියළුම ක්ෂේත්‍රඵල ගණනය කිරීම් වල නිරවද්‍යතාව පිළිබඳව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් වගකිව යුතුය.

13.3 ක්ෂේත්‍රඵල ආගණනය සටහන් කිරීම සඳහා S128 පෝරමය භාවිතා කළ හැකි වුවද SDCAD මෘදුකාංගය භාවිතා කර ක්ෂේත්‍රඵල ගණනය කිරීම් ස්වයංක්‍රීයව මුද්‍රණය කර අත්සන් කළ යුතුය. මිනින්දෝරු අධිකාරි විසින්ද ප්‍රතිඵල සංසන්දනයෙන් පසු එහි අනු අත්සන යොදා නිරවද්‍යතාව සහතික කර මැනුම් ඉල්ලීම් ගොනුවේ ගොනු කළ යුතුය.

13.4 ඉඩම් කැබලි වල ඛණ්ඩාංක උපයෝගී කරගෙන පරිගණක හෝ ගණක යන්ත්‍ර ආධාරයෙන් ක්ෂේත්‍රඵලය ගණනය කළ හැකි වූ අවස්ථා වලදී ගණනය කිරීම් දෝෂ අවම වුවද දෙපාර්තමේන්තුව මඟින් සපයා ඇති මෘදුකාංගය භාවිතා කර ක්ෂේත්‍රඵලය ගණනය කර නිරවද්‍යතාව පරීක්ෂා කිරීම වඩාත් යෝග්‍ය වේ.

13.5 හුවමාරු කිරීම සඳහා නියමිත බිම් ප්‍රමාණවල් මැන වෙන් කිරීමට සිදුවන විට මිනින්දෝරුවරයා විසින් පිඹුරු ඉදිරිපත් කිරීමට පෙර ක්ෂේත්‍රඵල ආගණනය ප්‍රවේශමෙන් පරීක්ෂා කර බැලිය යුතුය.

13.6 සම්මත ක්ෂේත්‍රඵලයට දිය යුතු ශුද්ධිය ගණනය කර බිම්කැබලි වලට බෙදා හැරීම සිදු කළ යුතුය. එය ගණනය කළ ආකාරය මිනින්දෝරුවරයා විසින් ක්ෂේත්‍රඵල ආගණන පත්‍රයෙහි රතු පාටින් ඇතුලත් කර අත්සන් කිරීමෙන් පසු මිනින්දෝරු අධිකාරි විසින් සහතික කළ යුතුය.

අ.ග.පි. ඉතිරි ප්‍රදේශය සම්බන්ධයෙන් කටයුතු කිරීම

13.7 අවසාන ගම් පිඹුරක් තුල පිහිටි රජය සතු ප්‍රදේශයක කොටසක් මැන වෙන්කිරීමේදී ඉතිරි ප්‍රදේශය හෙක්ටයාර් එකකට වඩා අඩුනම් හා එම ඉතිරි ප්‍රදේශය රක්ෂිත ප්‍රදේශයක්, පාරක්, දිය ඇළක් හෝ බෙදා නොදෙන වෙනත් රජයේ ඉඩමක් නොවේනම් එහි පැරණි මායිම් වල හා ඉඩම් විස්තර ලැයිස්තුවල හරි වැරදි බලා එම පිඹුරේම සම්පූර්ණ කළ යුතුය. ඉතිරිව තිබෙන කොටස ඉහත සඳහන් කළ යම් කිසිවක් වේ නම් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ පූර්ව අනුමැතිය ඇතිව එම පිඹුරේම සම්පූර්ණ නොකලාට වරදක් නැත.

13.8 ඉතිරි ප්‍රදේශය හෙක්ටයාර් එකකට වැඩි වේ නම් නැතහොත් 4.36 වැනි ඡේදයෙහි විස්තර කර තිබෙන පරිදි නැතහොත් මෙහි පූර්වයෙහි සඳහන් වගන්තිය පරිදි මැන නැත්නම් එය එම පිඹුරේම සම්පූර්ණ නොකලාට වරදක් නොමැත. එහෙත් ඒ සඳහා වෙනම පිඹුරක් නොමැතිව එහි ක්ෂේත්‍රඵලය නිගමනය කිරීමෙන් දැනගත හැකිය. මෙවැනි අවස්ථාවන්හි දී බිම් කට්ටිය ඉදිරියෙහි යෙදිය යුතු සටහන මෙසේ විය යුතුය. ‘‘ශේෂ ප්‍රදේශය නිගමනයෙනි. අළුතින් කරන ලද මැනුමක් සහ ඒ හා සම්බන්ධ පිඹුරක්

නොමැතිව මෙම බිම්කැබැල්ල සම්බන්ධයෙන් කිසිවක් නොකළ යුතුය.” අළුත් මැනුමේ මායිම් පැරණි ක්ෂේත්‍ර පත් වල පැන්සලෙන් ලකුණු කර ක්ෂේත්‍ර පත්‍රය ගැන එහි යොමු සටහනක් ද පැන්සලෙන් කළ යුතුය.

සිදු කරන ලද නව මැනුමෙන් ශේෂ ප්‍රදේශය කොටස් එකකට වඩා වෙන් වන්නේ නම් ශේෂ ප්‍රදේශය නිගමනයෙන් ලෙස සඳහන් කළ හැක්කේ එක් කැබැල්ලකට පමණක් වන හෙයින් බිම් ප්‍රමාණය වැඩි කොටසෙහි ශේෂ ප්‍රදේශය නිගමනය කිරීමටත්, අඩු බිම් ප්‍රමාණයෙන් යුතු කොටස ක්ෂේත්‍ර පත්‍රය මත ආගණනයෙන් ශේෂ ප්‍රදේශය නිර්ණය කිරීමටත් කටයුතු කළ යුතුය. මෙවැනි අවස්ථාවකදී ඉඩම් විස්තර ලැයිස්තුවේ මෙලෙස සටහන යෙදිය යුතුය. “ ශේෂ ප්‍රදේශය පත්‍රය මත ආගණනයෙනි. අළුතින් කරන ලද මැනුමක් සහ ඒ හා සම්බන්ධ පිඹුරක් නොමැතිව මෙම බිම්කැබැල්ල සම්බන්ධයෙන් කිසිවක් නොකළ යුතුය.”

මායිම් නියම කිරීමේ මැනුම් වලදී ක්ෂේත්‍රඵලය ගණනය කිරීම

13.9 මායිම් නියමකිරීමේ මැනීම් වලදී ලංකා මැනුම් කැබලි වල ක්ෂේත්‍රඵලය එලෙසම තැබිය යුතුය. එසේ වුවද අළුතෙන් ගණනය කරන ලද බිම් ප්‍රමාණ මුල් බිම් ප්‍රමාණ සමඟ සංසන්දනය කර 13.19 ඡේදය අනුව කටයුතු කළ යුතුය.

13.10 මායිම් නියමකිරීමේ මැනුම් වලදී, අනුබිම් කොටස් වලට බෙදීමෙන් පසු බිම් කැබැල්ලකින් ඉතිරිවන කොටස මුල් කැබැල්ලේ ප්‍රමාණයෙන් සියයට 75ට වැඩිනම් හා හෙක්ටයාර් එකකට අඩු නොවේනම් එය ගණන් බැලීම අවශ්‍ය නොවේ. අනු බිම් කැබලි වල මුළු බිම් ප්‍රමාණය බිම් කැබැල්ලේ මුල් බිම් ප්‍රමාණයෙන් අඩු කිරීමෙන් මෙහි බිම් ප්‍රමාණය කොපමණදැයි දැනගත හැකිය. එතකුදු වුවත් මෙවැනි අවස්ථා වලදී මැන වෙන් කළ කොටසේ මුළු බිම් ප්‍රමාණය හා එක් එක් අනු බිම් කැබැල්ල ද වෙන වෙනම ගණන් බැලිය යුතුය. එසේ ගණන් බලා අනු බිම් කැබලි වල බිම් ප්‍රමාණය මුල් බිම් කැබැල්ලේ බිම් ප්‍රමාණයට අනුව නොව , මැන වෙන්කළ කොටසේ ගණන් බැලීම් වලට සරිලන පරිදි අනුකූලනය කළ යුතුය. මෙවැනි බිම් කට්ටි සඳහා පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවේ වෙනත් කිවයුතු දේ නැමති තීරුවෙහි එම බිම් කැබලි වලට ඉදිරියෙන් “ඉතිරි බිම් ප්‍රමාණය නිගමනය කිරීමෙනි” යන්න සටහන් කළ යුතුය.

වර්ගඵල ගණනයේදී ඉඩදිය හැකි දෝෂය නිර්ණය කිරීම

13.11 පහත සඳහන් නිරවද්‍යතා මට්ටම් මත අර්ථ දක්වා ඇති මායිම් ස්වාභාවය පාදක කරගත් බිම් කැබැල්ලක වර්ගඵලයේ ඉඩදිය හැකි දෝෂය ගණනය කිරීමේදී මෙම පරිච්ඡේදයේ අර්ථ දක්වා ඇති සමීකරණය උපයෝගී කරගන්නා ලෙසට නියම කරනු ලැබේ. මැනුම් ශිල්පක්‍රම සහ බිම් කැබලි මායිම් වල ඇති ලක්ෂ්‍ය ප්‍රමාණය, මෙම සමීකරණය යොදා ගැනීමේදී ආදාල නොවන බව අවධාරණය කළ යුතුය.

මායිම් අර්ථ දැක්වීම

13.12 ස්ථාවර මායිම -:

මිනිසා විසින් සාදාගන්නා ලද ස්ථීර අංගයන් ගෙන් සමන්විත මායිම්ගල්, මායිම් තාප්ප, තාප්ප, කම්බි වැට, කම්බි සහ පැලඉණි වැට ආදී වූ අංගයන් ගෙන් නිම වූ මායිමක් වේ.

ස්ථාවර මායිමක අංගයන් අස්ථාන ගත වීමේදී එය නිවැරදි ලෙස නැවත ස්ථාපනය කළ හැකිවිය යුතුය.

13.13. පොදු මායිම -:

පිහිටීම අපැහැදිලි (නිවැරදිව නිර්ණය කළ නොහැකි) ස්වභාවික අංගයන්ගෙන් සමන්විත මායිමක් වේ. උදාහරණ කිහිපයක් නම් පැලඉණි වැට, බඩවැටි, ඉවුරු, වැටිය, අගල, තණ තීරුව ආදිය වේ.

නිරවද්‍යතා මට්ටම්

13.14 1 පන්තිය

මෙම පන්තියේදී තිරස් ස්ථානීය අවිනිශ්චිතතාව (σ_d) ± සෙ.මී 7.5

වගුව 1 –: I පන්තියේ නිරවද්‍යතාව නිර්ණය කිරීම සඳහා සමීකරණය සහ මෙම නිරවද්‍යතා මට්ටම ළඟා කරගැනීම සඳහා අනුගමනය කළ යුතු පිරිවිතර

සමීකරණය මත පාදක වූ වර්ගඵලය ගණනයේදී ඉඩදිය හැකි දෝෂය - ව. මී. ($\sqrt{Area}$ x σ_d x $\sqrt{2}$) මෙහි Area (වර්ගඵලය) වර්ග මීටර වලින් (ව.මී) සහ σ_d - බිම් කැබලි වල මායිම්හි සෑම විස්තර ලක්ෂ්‍යයකම තිරස් අවිනිශ්චිතතාව මීටර් වලින් (මී)	
ස්ථාවර සහ අනන්‍ය මායිම් සඳහා විස්තරාත්මක ලක්ෂ්‍යයක තිරස් අවිනිශ්චිතතාවය	ඉඩදිය හැකි දෝෂය (ව.මී)
මී 0.075 (සෙ.මී 7.5)	0.1061 x $\sqrt{Area}$
පිරිවිතර	
උපකරණ සහ ඉලක්ක කේන්ද්‍රණ දෝෂ	<= මී.මී. 2
විස්තර පරික්‍රමණ රේඛාවක අවම දුර	මී. 30
විස්තර පරික්‍රමණ රේඛාවක උපරිම දුර	මී. 750
විස්තර ලක්ෂ්‍යයකට පැති නිරීක්ෂණයක අවම දුර	මී. 3
විස්තර ලක්ෂ්‍යයකට පැති නිරීක්ෂණයක උපරිම දුර	මී. 100
විස්තර ලක්ෂ්‍යයකට අනුලම්භයක උපරිම දුර	මී. 3 (ඇළ අනුලම්භ අනුමත නොකෙරේ)
විස්තර පරික්‍රමණ පියවීම් සාධකය	මී. $0.4\sqrt{K}$ (K යනු පරික්‍රමණයේ මුළු දිග කි.මී.වලින්)
කෝණ මිනුම්	සර්ව භ්‍රමණ දිගංශය
උද්දිගංශ පාලනය	රේඛා 20
උද්දිගංශ පියවීම	3’

13.15 II පන්තිය

මෙම පන්තියේදී තිරස් ස්ථානීය අවිනිශ්චිතතාව (σ_d) ± සෙ.මී. 15 කි.

වගුව 2-: II පන්තියේ නිරවද්‍යතාව නීර්ණය කිරීම සඳහා සමීකරණය සහ මෙම නිරවද්‍යතා මට්ටම ළඟා කරගැනීම සඳහා අනුගමනය කළ යුතු පිරිවිතර

සමීකරණය මත පාදක වූ වර්ගඵලය ගණනයේදී ඉඩදිය හැකි දෝෂය - ව. මී. ($\sqrt{Area}$ x σ_d x $\sqrt{2}$) **මෙහි Area (වර්ගඵලය) වර්ග මීටර වලින් (ව.මී) සහ σ_d - බිම් කැබලි වල මායිම්හි සෑම විස්තර ලක්ෂ්‍යයකම තිරස් අවිනිශ්චිතතාව මීටර් වලින් (මී)**	
පොදු හෝ පොදු ස්ථාවර හෝ අනන්‍ය නොවන ස්ථාවර මායිම් සඳහා විස්තරාත්මක ලක්ෂ්‍යයක තිරස් අවිනිශ්චිතතාවය	ඉඩදිය හැකි දෝෂය (ව.මී)
මී 0.015 (සෙ.මී 15)	0.2121 x $\sqrt{Area}$
පිරිවිතර	
උපකරණ සහ ඉලක්ක කේන්ද්‍රණ දෝෂ	<= මී.මී. 2
විස්තර පරික්‍රමණ රේඛාවක අවම දුර	මී. 20
විස්තර පරික්‍රමණ රේඛාවක උපරිම දුර	මී. 750
විස්තර ලක්ෂ්‍යයකට පැති නිරික්ෂණයක අවම දුර	මී. 2
විස්තර ලක්ෂ්‍යයකට පැති නිරික්ෂණයක උපරිම දුර	මී. 100
විස්තර ලක්ෂ්‍යයකට අනුලම්භයක උපරිම දුර	මී. 5 (ඇළ අනුලම්භ අනුමත නොකෙරේ)
විස්තර පරික්‍රමණ පියවීම් සාධකය	මී. $0.4\sqrt{k}$ (Kයනු පරික්‍රමණයේ මුළු දිග කි.මී.වලින්)
කෝණ මිනුම්	සර්ව භ්‍රමණ දිගංශය
උද්දිගංශ පාලනය	රේඛා 20
උද්දිගංශ පියවීම	3’

13.16 III පන්තිය

මෙම පන්තියේදී තිරස් ස්ථානීය අවිනිශ්චිතතාව මිනුම් සඳහා භාවිතා කරන අත් මිහිතැන් ගැන්වුම් (HHGPS) උපකරණයේ ස්ථානීය නිරවද්‍යතාව මත රඳා පවතී. මෙම සමීකරණය යොදා ගැනීමේදී මායිම් වල ස්වභාවය අදාළ නොවේ.

වගුව 3-: III පන්තියේ නිරවද්‍යතාව නිර්ණය කිරීම සඳහා සමීකරණය සහ මෙම නිරවද්‍යතා මට්ටම ළඟා කරගැනීම සඳහා අනුගමනය කළයුතු පිරිවිතර

සැලසුම් කාර්යයන් හා භූලක්ෂාත්මක සිතියම් යාවත් කාලීන කිරීම සඳහා ඉටුකරනු ලබන මැනුම් වලදී වර්ගඵල ගණනයේදි අතේගෙන යා හැකි GPS උපකරණය භාවිතයේ දි ඇතිවන ඉඩදිය හැකි දෝෂ	
තිරස් නිරවද්‍යතාව (σ_d)	අත් මිහිතැන් ගැන්වුම් (HHGPS) උපකරණයෙහි තිරස් නිරවද්‍යතාව (සාමාන්‍යයෙන් මී. 0.5 - මී. 5 අතර වේ)
වර්ගඵලයේ ඉඩදිය හැකි දෝෂය (මී)	$\sqrt{Area}$ x σ_d x $\sqrt{2}$ මෙහි Area (වර්ගඵලය) වර්ග මීටර් (ව.මී.) සහ σ_d- බිම් කැබලි වල මායිම්හි සෑම විස්තර ලක්ෂ්‍යයකම තිරස් අවිනිශ්චිතතාව මීටර් වලින් (මී.)

වර්ගඵල ගණනය

13.17 ඉඩම් කට්ටියක වර්ගඵලය ගණනය කිරීමේදී දශමස්ථාන නිර්ණය කිරිම.

ප්‍රමාණය	පන්තිය නිරවද්‍යතාව	වර්ගඵලයෙහි දශමස්ථාන ගණන (හෙක්ටයාර්)
ව.මී.8093.7120 දක්වා (අ. 2- රූ .0- ප. 0) ව.මී.8093.7120 (අ.2- රූ.0- ප. 0) ට වැඩි	I	දශමස්ථාන හතරයි (04)
ව.මී.2023.4280 දක්වා (අ. 0- රූ .2- ප. 0) ව.මී.2023.4280 (අ. 0- රූ. 2- ප.0) ට වැඩි	II	දශමස්ථාන හතරයි (04)
සීමාවක් නැත	III	කරනු ලබන කාර්යයේ නිරවද්‍යතා මට්ටමේ අවශ්‍යතාව මත රඳා පවතින දශමස්ථාන තුනක් (03) හෝ අඩු සංඛ්‍යාවක්

බිම් කට්ටියක වර්ගඵලය නිර්ණය කිරීම

13.18 අනන්‍ය බිම් කට්ටියක, නව මැනුමක් පාදක වූ වර්ගඵලය, පැවතියා වූ පෙර මැනුමේ වර්ගඵලය සමඟ සංසන්දනය කිරීමේදී පහත සඳහන් නිර්ණායක අනුව කටයුතු කළ යුතුය.

i නව මැනුමේ වර්ගඵලය සහ පෙර මැනුමේ වර්ගඵලය අතර වෙනස සමීකරණය මඟින් දෙන ලද ඉඩදිය හැකි දෝෂය ඇතුළත නම් (**ඇමුණුම 01**) හා පෙර මැනුමේ අවශ්‍යතාවයන්ට අනුව ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් සිදු කර නොමැති බව තහවුරු වන්නේ නම් නව මැනුමේ වර්ගඵලය නිවැරදි වර්ගඵලය ලෙස යොදා ගත යුතුය.

ii ලැබුණු වෙනස ඉඩදිය හැකි දෝෂයට පරිභාහිර නම් බිම් කට්ටියේ ගණනය කරන ලද පෙර මැනුමෙහි වර්ගඵලය පහත අයුරු ක්‍රියා කිරීම සඳහා නැවත නිශ්චය කළ යුතුය.

13.19 කැබලි X හි පෙර මැනුමේ වර්ගඵලය අංකිත ප්‍රතිගණනයෙන් පසුව සැලකිය යුතු වෙනසක් පවතී නම් සහ පෙර මැනුමේදී කැබලි X හි ප්‍රතිගණනය කරන ලද ප්‍රමාණය නව මැනුම සමඟ සසඳන විට ඉඩදිය හැකි දෝෂය ඇතුළත වේ නම්, අංකිත ප්‍රතිගණනය කරන ලද වර්ගඵලය පිළිගත යුතු අතර අළුතින් මනින ලද බිම් කැබැල්ලේ මායිම් ප්‍රස්ථාරික සංසන්දනයක් සිදුකර ලබාගත් වැඩිදුර සත්‍යාපනයක් මත, පැහැදිලි මායිම් අපගමනයෙන් නොවේ නම් පමණක් "කැබලි X හි වර්ගඵලය අංකිත ප්‍රතිගණනයෙන් පසුව X.XXXX ගෙන් Y.YYYY ට සංශෝධනය කරන ලදී" යන ප්‍රකාශය ඉඩම් විස්තර ලැයිස්තුවේ සටහන තීරුවේ තැබිය යුතුය.

13.20 අංකිත ප්‍රතිගණනයෙන් පසුව කැබලි X හි පෙර මැනුමේ වර්ගඵලය සැලකිය යුතු වෙනසක් නොවේ යැයි අනාවරණය වේ නම් නව මැනුමේ වර්ගඵලය පිළිගත යුතු අතර "නැවත මැනීමෙන් සහ අංකිත ප්‍රතිගණනයෙන් පසුව වර්ගඵලය X.XXXX ගෙන් Y.YYYY ට සංශෝධනය කරන ලදී" යන ප්‍රකාශය ඉඩම් විස්තර ලැයිස්තුවේ සටහන තීරුවේ තැබිය යුතුය.

13.21 මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ භාවිතා වන සම්මත මෘදුකාංග සඳහා මෙම සමීකරණ ඇතුලත් කර ඇත. එතකුදු වුවත් ගණනය කරණ ලද අගයයන් කිහිපයක් මෙම පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.

13.19 ඡේදය ඇමුණුම 01

I පන්තිය සහ II පන්තිය නිරවද්‍යතා මට්ටම් (පහසු යොමුව සඳහා) සඳහා ඉඩදිය හැකි දෝෂය සඳහා පූර්වයෙන් ගණනය කරන ලද අගයන්

වර්ගඵලය පර්චස්	වර්ගඵලය වර්ග මීටර් (ව.මී)	ඉඩදිය හැකි දෝෂය (σ_{area}) වර්ග මීටර් (ව.මී) වලින් = $\sqrt{Area}$ x σ_d x $\sqrt{2}$	
		I පන්තිය සඳහා නිරවද්‍යතාව $0.1061\sqrt{Area}$	II පන්තිය සඳහා නිරවද්‍යතාව $0.2121\sqrt{Area}$
1	25.2928	0.53	1.06
2	50.5857	0.75	1.51
5	126.4642	1.19	2.39
8	202.3428	1.51	3.02
10	252.2928	1.69	3.37
15	379.3927	2.06	4.13
20	505.8570	2.39	4.77
25	632.3212	2.67	5.33
30	758.7855	2.92	5.84
35	885.2497	3.16	6.31
40	1011.7140	3.37	6.75
80	2023.4280	4.77	9.54
120	3035.1420	5.84	11.69
160 (1අ-0රූ-0ප)	4046.8560	6.74	13.49
240 (1අ-2රූ-0ප)	6070.2840	8.27	16.53
320 (2අ-0රූ-0ප)	8093.7120	9.54	20.24
400 (2අ-2රූ-0ප)	10117.1400	10.67	21.33
480 (3අ-0රූ-0ප)	12140.5680	11.69	23.37
560 (3අ-2රූ-0ප)	14163.9960	12.63	25.24
640 (4අ-0රූ-0ප)	16187.4240	13.50	26.99
720 (4අ-2රූ-0ප)	18210.8520	14.32	28.62
800 (5අ-0රූ-0ප)	20234.2800	15.09	30.18
1600 (10අ-0රූ-0ප)	40468.5600	21.33	42.67
3200 (20අ-0රූ-0ප)	80937.1200	30.18	60.34
4800 (30අ-0රූ-0ප)	121405.6800	36.97	73.90
6400 (40අ-0රූ-0ප)	161874.2400	42.69	85.34
8000 (50අ-0රූ-0ප)	202342.8000	47.73	95.41

ශුද්ධි පත්‍රය

14 වැනි පරිච්ඡේදය

සිතියම්, රේඛාචිත්‍ර සහ වාර්තා

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	1:50,000 සිතියම සංශෝධනය කිරීම	
14.1.	1:50,000 සිතියම් ක්ෂෙත්‍රයට සැපයීම	1
14.2.	1:50,000 සිතියම් වල සංශෝධන	1
14.3.	දිස්ත්‍රික් ජ්‍යෙ.මි.අධිකාරිවරුන් සහ මිනින්දෝරු අධිකාරිවරුන් විසින් සංශෝධන සටහන් කිරීම	1
14.4.	ගුරු පිටපතෙහි සංශෝධන සටහන් කිරීම	1
	ප්‍රාරම්භ රේඛා චිත්‍ර	
14.5.	ප්‍රාරම්භ රේඛා චිත්‍ර	1
	ප්‍රදේශ රේඛා චිත්‍ර (විකිර්ණ මැනුම්)	
14.6.	සියළුම මැනුම් පෙන්නුම් කරන "ප්‍රදේශ රේඛා චිත්‍රයක්" පවත්වා ගෙන යාම	2
14.7.	ප්‍රදේශ රේඛා චිත්‍රයක ඇතුලත් විය යුතු කරුණු	2
14.8.	ප්‍රදේශ රේඛා චිත්‍රයක මැනුම් ස්ථාන සලකුණු කිරීම	2
14.9.	ප්‍රමුඛතාවය අනුව මැනුම් ඉල්ලීම් වර්ගීකරණය	2
	කාර්යාලීය ප්‍රගති රේඛා චිත්‍ර	
14.10.	කාර්යාලීය ප්‍රගති රේඛා චිත්‍රය යාවත්කාලීන කිරීම	2
	මිනින්දෝරුවරුන්ගේ දින වාර්තා	
14.11.	එස් 347/N වැනි පෝරමයේ (ජර්නලය) රාජකාරි කටයුතු සටහන් කිරීම	2
14.12.	ජර්නල් පෝරම “ගුරු” සහ “වලන” යන පිටපත් දෙකකින් පවත්වාගෙන යාම	2
14.13.	පිරිවැය බිල් පත්‍ර පිළියෙල කිරීම	3
	විවිධ වාර්තා	
14.14.	අමාත්‍යවරයාගේ ප්‍රගති සමාලෝචනය	3
14.15.	මාසික වාර්තා	3
14.16.	කාර්තු වාර්තා	3
14.17.	වාර්ෂික වාර්තා	3
14.18.	වාර්ෂික වාර්තා ප්‍රධාන කාර්යාලයේ ප්‍රගති අංශයට යැවීම	3
14.19.	වැඩ සඳහා යන වියදම	3
14.20.	රහස්‍ය වාර්තාවේ ප්‍රගතිය ඇතුලත් කිරීම	3
	ඇමුණුම්	
ඇමුණුම 01	ප්‍රදේශ රේඛා චිත්‍රය	4

14 වැනි පරිච්ඡේදය

සිතියම්, රේඛාචිත්‍ර සහ වාර්තා

1:50,000 සිතියම සංශෝධනය කිරීම

14.1. දිස්ත්‍රික්කයට අදාළ 1:50,000 සිතියම් පුනරීක්ෂණය සඳහා මිනින්දෝරු අධිකාරිවරුන්ට හා මිනින්දෝරුවරුන් වෙත යැවීමට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් වග බලා ගත යුතුය. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (සිතියම්) විසින් පුනරීක්ෂණය කරන ලද සිතියම් මුද්‍රණය කරනු ලැබූ විට එහි පිටපත් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන්ට යැවිය යුතුය.

14.2. සෑම මිනින්දෝරුවරයෙකු විසින්ම තමා අළුත් සේවා ස්ථානයක නැවතී සිටින කාලය තුළ 1:50,000 සිතියම නිවැරදි දැයි පරීක්ෂා කර බලා ඒ පිළිබඳ අවශ්‍ය සංශෝධන මිනින්දෝරු අධිකාරි හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරින්ගේ මාර්ගයෙන් ප්‍රධාන කාර්යාලයට වාර්තා කළ යුතුය.
සාමාන්‍යයෙන් කි.මී 5 ක අරයකින් යුත් ප්‍රදේශ පුනරීක්ෂණය කිරීම පිණිස මිනින්දෝරු අධිකාරි විසින් එක් එක් මිනින්දෝරුවරුන්ට භාර කළ යුතුය.
1.50,000 සිතියමේ දැක්වෙන සම්මත සළකුණු අනුව, මාර්ගයන්හි හරි වැරැදි බැලිය යුතුය. ඊට අමතරව මාර්ග ඇත්නම්, ඒවා "කොන්ක්‍රීට් දැමූ" හෝ "වාහන යා හැකි"හෝ කුමන වර්ගයේ මාර්ගයන් ද යනවග විස්තර කළ යුතුය.
සංශෝධන වේ නම් ඒවා රතුපාටින් ඇඳ අනුරේඛනයක් සකස් කළ යුතු අතර එහි අත්සන සහ දිනය යෙදිය යුතුය. තවද එහි 1:50,000 සිතියම මුද්‍රණය කර තිබෙන දිනයද සඳහන් කළ යුතුය.
සංශෝධන කිසිවක් නොමැති නම්, සංශෝධන නොමැති බවට වාර්තාවක් යැවිය යුතුය. නව මැනුමක් කිරීමට තරම් අවශ්‍ය වන සංශෝධන රාශියක් තිබේ නම් මිනින්දෝරුවරයා ඒ බව වාර්තා කර යැවිය යුතුය. එවිට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (සිතියම්) විසින් එම භූ ලක්ෂණාත්මක සිතියම් පුනරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීමට නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූ විඥාපන) වෙත දන්වා යැවිය යුතුය. එවිට 19 වැනි පරිච්ඡේදය අනුව අවශ්‍ය පුනරීක්ෂණයන් සිදු කරනු ඇත. ඉංජිනේරු මැනුම්, කැලෑ මැනුම් හෝ නගර මැනුම් වල යෙදී සිටින මිනින්දෝරුවන් මෙම නියෝගයෙන් නිදහස් කර ඇත.

14.3. රජයේ මිනින්දෝරුවරුන් විසින් වාර්තා කර එවන සංශෝධන ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි හා මිනින්දෝරු අධිකාරි විසින් තමන්ගේ කාර්යාලයේ ඇති 1:50,000 සිතියම් පිටපත් වලද සටහන් කරගත යුතුය. පරීක්ෂණ කටයුතු සඳහා යන විට පරීක්ෂා කරනු ලබන ප්‍රදේශයේ 1:50,000 සිතියම නිතරම මිනින්දෝරු අධිකාරි විසින් ගෙන යා යුතුය. මෙසේ කළ යුත්තේ මාර්ගයන් දිගේ මෝටර් රථයෙන් නැතහොත් බයිසිකලයෙන් ගමන් කරන විට හරි වැරදි සොයා බැලීම් රාශියක්ම කිරීමට හැකිවන බැවිනි.

14.4. අනුරේඛන වල සඳහන් කර තිබෙන තොරතුරු සිතියම්කරණ අංශයෙහි තිබෙන "ගුරු පිටපත්" වල සටහන් කළ යුතුය. මෙම තොරතුරු ඊළඟට මුද්‍රණය කරනු ලබන 1:50,000 සිතියම් හා වෙනත් සිතියම් පිළියෙල කිරීමේදී ප්‍රයෝජනයට ගත යුතුය.

ප්‍රාරම්භ රේඛා චිත්‍ර

14.5. යම්කිසි ප්‍රදේශයක මැනුමක් පටන් ගැනීමට ප්‍රථම ඊට යාබදව පිහිටි ප්‍රදේශයේ කලින් කරන ලද මැනුම් මොනවාදැයි දැන ගැනීමට හැකිවන පරිදි මිනින්දෝරු අධිකාරිවරුන්ට 1.50,000 පරිමාණයේ අනුරේඛන දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් නිකුත් කළ යුතුය.

ප්‍රදේශ රේඛා චිත්‍ර (විකිර්ණ මැනුම්)

14.6. එක් එක් ප්‍රදේශයේ තමාගේ විකිර්ණ කාර්යය මණ්ඩලය මඟින් කළ යුතු සියළුම මැනුම් පෙන්නුම් කරන "ප්‍රදේශ රේඛා චිත්‍රයක්" සෑම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් හා මිනින්දෝරු අධිකාරි විසින් පවත්වා ගෙන යා යුතුය.

14.7. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ තිබිය යුතු ප්‍රදේශ රේඛා චිත්‍ර 1:50,000 පරිමාණයට ඇඳිය යුතුය. සියළුම මාර්ග, දුම්රිය මාර්ග, ප්‍රධාන ගම්, ගංගාවල් හා ලංකා මැනුම් වලට භාජනය කරන ලද ගම්වල අංක සහ මායිම් මෙහි පෙන්නුම් කළ යුතුය.

14.8. 1:50,000 හූ ලක්ෂණාත්මක සිතියම් වල මැනුම් ඉල්ලීම් වල පිහිටීම් පෙන්වීම කළ යුතු අතර ඒවායෙහි මැනුම් ලකුණු නොකළ යුතුය. මෙම මැනුම් ඉල්ලීම් හැකි පමණ ඒවා අයත් නියම ග්‍රාම නිලධාරි කොට්ඨාශය තුලම පෙන්නුම් කළ යුතු අතර, එක ග්‍රාම නිලධාරි කොට්ඨාශයකට අයත් මැනුම් ඉල්ලීම් ගණන ග්‍රාම නිලධාරි කොට්ඨාශය තුල **ඇමුණුම 01** පෙන්වා දී ඇති පරිදි සටහන් කල යුතුය.

14.9. **4.15 ඡේදයෙහි** සඳහන් පරිදි එක් එක් ප්‍රමුඛතා වර්ගීකරණය අනුව සිදු කිරීමට ඇති මැනුම් ඉල්ලීම්, SRIMS දත්ත පද්ධතියෙන් ලබාගත යුතුය. එලෙස ලබාගන්නා ලද ප්‍රමුඛතාවය අනුව මැනුම් ඉල්ලීම් ප්‍රමාණ ප්‍රාදේශීය ලේකම් මට්ටමින් වගුගත කර ප්‍රදේශ රේඛා චිත්‍රයේ පහලින් දැක්විය යුතුය. **(** **ඇමුණුම 01** පරිදි)

කාර්යාලීය ප්‍රගති රේඛා චිත්‍ර

14.10. කිසිම අඩු ලුහුඬුවක් නොමැතිව යාවත්කාලීන කළ යුතු කාර්යාලීය ප්‍රගති රේඛා චිත්‍රයක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පවත්වාගෙන යා යුතුය. එක් එක් ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයට යවන ලද මැනුම් සම්බන්ධයෙන් හා ඒවා පරීක්ෂා කිරීම, නැවත යැවීම හා අවසන් කිරීම මෙහි සටහන් කළ යුතුය. අමතර වශයෙන් SRIMS දත්ත පද්ධතියෙහි මෙම කරුණු ඇතුලත් කර යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

මිනින්දෝරුවරුන්ගේ දින වාර්තා

14.11. සියළුම මිනින්දෝරුවරුන් විසින් එස් 347/N වැනි පෝරමයේ (ජර්නලය) රාජකාරි කටයුතු සටහන් කළ යුතුය. මෙම කටයුතු සෑම දිනයක් අවසානයේදීම එහි ඇතුළත් කළ යුතුය. මිනින්දෝරුවන් සහ මැනුම් ක්ෂේත්‍ර සහායකයන් විසින් කරන වැඩ වෙන වෙනම පෙන්නුම් කළ යුතුය. මේ පිළිබඳ කරන සටහන් ආසන්නතම දවස් භාගය තෙක් විය යුතුය. මෙලෙස ඇතුලත් කරන ලද සංඛ්‍යා අනුව ඔවුන් විසින් කරන ලද විවිධ කාර්යයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොලැබේ නම්, වෙනත් කිවයුතු දේ නැමැති තීරුවෙහි ඒ පිළිබඳ කෙටි සටහනක් කළ යුතුය. GNSS භාවිතයෙන් මැනුම් කටයුතුවල යෙදී සිටින මිනින්දෝරුවරුන් විසින් පෝරමයේ තිබෙන ශීර්ෂ පාඨ අවශ්‍ය පරිදි වෙනස් කර භාවිතයට ගත යුතුය.

14.12. එක් එක් මාසය සඳහා ජර්නල් පෝරම "ගුරු" සහ "වලන" යන පිටපත් දෙකකින් පවත්වාගෙන යා යුතුය. මින් "වලන" පිටපත සෑම සතියක් අවසානයේදීම ඊළඟ සතියේ වැඩ සටහනද සඳහන් කර මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය. මිනින්දෝරු අධිකාරි විසින් එය ආපසු එවනු ලැබූ විට එහි යම් සටහනක් ඇතුළත් කර තිබේ නම් එය ගුරු පිටපතේ රතෙන් පිටපත් කළ යුතුය. ඊට සමගාමීව SRIMS දත්ත පද්ධතියේද සෑම සතියකම අවසාන දිනද එක් එක් මැනුම් ඉල්ලීම යටතේ සිදු කරන ලද ක්ෂේත්‍ර වැඩ සහ පිඹුරු වැඩ ප්‍රමාණයන් අනුව ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස ඇතුලත් කිරීමද කළ යුතුය.

සෑම මාසයක් අවසානයේදීම මිනින්දෝරුවරයා විසින් ජර්නලයේ වලන පිටපත් ගොනු කර තබාගත යුතු අතර "වලන" පිටපතෙහි මිනින්දෝරු අධිකාරි විසින් යොදන ලද සටහන් ගුරු පිටපතෙහි රතු තීන්තෙන් පිටපත් කළ යුතුය. මිනින්දෝරු අධිකාරි විසින් මාසය අවසානයේ පවත්වනු ලබන ප්‍රගති රැස්වීමේදී ජර්නලයේ ගුරු පිටපත, ඊළඟ මාසයේ වැඩ සටහන, මැනුම් උපකරණ හා වාහන වෙන් කර ගැනීම, එම මාසයට අදාළ වවුචර්, ගමන් වියදම් ඉල්ලීම්, ජර්නල් උද්ධෘත ආදීය වාර්තා සමඟ මිනින්දෝරු අධිකාරිට භාර දිය යුතුය.

14.13. පිරිවැය බිල් පත්‍ර පිළියෙල කිරීම සඳහා අවශ්‍ය වන මැනුම් වල බිම් කැබලි ගණන, බිම් ප්‍රමාණ, මායිම්ගල් ගණන ආදි දත්ත එක් එක් මැනුමෙහි විස්තර සඳහා වෙන වෙනම ඇතුළත් කළ යුතුයි.

විවිධ වාර්තා

14.14. අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචනය :
දිස්ත්‍රික්කය තුල කරන ලද වැඩ පිළිබඳ වාර්තා SRIMS දත්ත පද්ධතියෙන් ලබාගෙන සෑම මාසයක් අවසානයේදීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ප්‍රධාන කාර්යාලයේ අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂෙත්‍ර) වෙත යැවිය යුතුය.

14.15. මාසික වාර්තා:
මිනින්දෝරු අධිකාරි විසින් මාසික වාර්තා ඊළඟ මාසයේ වැඩකරන දෙවන දිනට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙතටද, දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සෑම මසකම 10 වැනිදාට පෙර මාසික වාර්තා ස.ජ.කාර්යාලයට යැවීමට හැකි වන පරිදි පළාත් කාර්යාලයට යැවීමට කටයුතු කළ යුතුය. අනෙකුත් මාසික වාර්තා සමඟ SRIMS දත්ත පද්ධතියෙන් ලබා ගන්නා බිම්සවිය මැනුම් සම්බන්ධයෙන්වූ PRS 1 හා PRS 2 දරන වාර්තා අත්සන් කර යැවිය යුතුය.

14.16. කාර්තු වාර්තා:
සෑම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයෙකු විසින්ම කාර්තුව ඇතුලත තමාගේ දිස්ත්‍රික්කය තුල කරන ලද වැඩ පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ඇතුලත් වන වාර්තාවක් SRIMS දත්ත පද්ධතිය අනුසාරයෙන් පිළියෙල කර සෑම කාර්තුවක් පාසාම පළාත් සර්වේයර් ජනරාල් වෙත යැවිය යුතුය.

14.17. වාර්ෂික වාර්තා:
සෑම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයෙකු විසින්ම වර්ෂය ඇතුලත තමාගේ දිස්ත්‍රික්කය තුල කරන ලද වැඩ පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ඇතුලත් වන වාර්තාවක් SRIMS දත්ත පද්ධතිය අනුසාරයෙන් පිළියෙල කර සෑම වර්ෂයක් පාසාම පළාත් සර්වේයර් ජනරාල් වෙත යැවිය යුතුය.

14.18. වාර්ෂික වාර්තා ප්‍රධාන කාර්යාලයේ ප්‍රගති අංශයට ජනවාරි 10 වැනි දින හෝ ඊට පෙර යැවිය යුතුය.

14.19. මැනුම් කිරීම සඳහා යන වියදම් හැකි පමණ අඩු කිරීම සෑම මිනින්දෝරුවරයෙකුගේම යුතුකම වන අතර, මෙම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා මැනුම් සම්බන්ධයෙන් වැයවන වියදම් පිළිබඳව සෑම මිනින්දෝරු අධිකාරිවරයෙකු විසින්ම පසුවිපරමක් කළ යුතුය.

14.20. සෑම මිනින්දෝරුවරයෙකු විසින්ම රහස්‍ය වාර්තාවේ 7 වැනි කොටුවෙහි, මාසික වැඩ ප්‍රගතියේ සාමාන්‍යය ඇතුලත් කළ යුතුය. මිනින්දෝරු අධිකාරි විසින් වැටුප් වර්ධකය ලබා දීමට නිර්දේශයන් ලබා දීම සඳහා අදාළ වන රහස්‍ය වාර්තාවේ 4, 5, 7 වැනි කොටුවල සඳහන් කර ඇති කරුණු ගැන සැලකිලිමත් විය යුතුය.

14.8 ඡේදය **ඇමුණුම 01**

ප්‍රදේශ රේඛා චිත්‍රය

ගාල්ල ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලය





මැනුම් ඉල්ලීම් ගණන

කැබලි ගණන

වැඩ ප්‍රමාණය

යොමුව

ප්‍රා දේශිය ලේකම් කොට්ඨාසය

ග්‍රාම නිලධාරී කොට්ඨාශය

පරිමාණය 1 : 50,000

මැනුම් ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය	ප්‍රමුඛතා පන්තිය		
	අ	ආ	ඇ
ගාල්ල කඩවත්සකර			
ඉමුදුව			
බෝපේ - පෝද්දල			
හබරාදුව			
අක්මීමන			

0 2 4 8 Kilometers

ශුද්ධි පත්‍රය

ශුද්ධි පත්‍රය

15 වැනි පරිච්ඡේදය

කට්ටි කැඩීමේ සැලසුම් පිළියෙල කිරීමේ සහ කුඤ්ඤු ගැසීමේ මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීමේදී සැලකිය යුතු කරුණු	
15.1.	කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම සහ කුඤ්ඤු ගසා මායිම් ලකුණු කිරීම සඳහා මැනුම් ඉල්ලීම්	1
15.2.	නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ සීමා/ පරිපාලන බල ප්‍රදේශ සීමා වල නීති අනුව සැලසුම් පිළියෙල කිරීම	1
	ක්ෂේත්‍ර කටයුතු	
15.3.	අනවසර පදිංචිකරුවන් ඇති විට මැනුම් කිරීමේ ක්‍රියාවලිය	1
15.4.	වට මායිම මැනීම හා විස්තර මැනීම	1
15.5.	සියළුම ඉඩම් කට්ටි සඳහා සුදුසු ප්‍රවේශ මාර්ග යෙදීම	1
15.6.	බෙදා දීමට නුසුදුසු ඉඩම් වෙන් කිරීම	1
15.7.	මැනුමට භාවිතා කළ හැකි උපකරණ	2
15.8.	පැරණි මායිම් අනුව මායිම් සලකුණු කිරීම	2
15.9.	ලී කුඤ්ඤු ගසා ඉඩම් කට්ටි සලකුණු කිරීම	2
15.10.	කට්ටිකරුවන්ගේ නාම ලේඛන නොමැතිව මැනුම් ඉල්ලීම් ලද විට කටයුතු කිරීම	2
15.11.	මායිම් කට්ටිකරුවන්ට පෙන්වා දුන් බවට ලේඛන	2
15.12.	කට්ටි කැඩීමේ නිවැරදිතාවය පරීක්ෂා කිරීම	2
	පිඹුරු වැඩ	
15.13.	යෝජිත කට්ටි මායිම් අනුරේඛනයේ පෙන්වීම	2
15.14.	අනුරේඛන පිළියෙල කිරීම	2
15.15.	බිම් කැබලි අංක කිරීම	2
15.16.	වගුවෙහි දැක්විය යුතු විස්තර	2
15.17.	මිනින්දෝරුවරයාගේ සහතිකය යෙදීම	3
15.18.	පැරණි පිඹුරු මත කට්ටි කැඩීමේ සැලසුම් වලට යොමුව දැක්වීම	3
15.19.	භාවිතා කළ යුතු මැනුම් පෝරම	3
15.20.	මුල් අනුරේඛනය මැනුම් ඉල්ලීම් ගොනුවට ඇතුලත් කිරීම	3
15.21.	සම්පූර්ණ කරන ලද මැනුම් ඉල්ලීම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට ඉදිරිපත් කිරීම	3
15.22.	අනුරේඛන පිටපත් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඉදිරිපත් කිරීම	3
15.23.	කැලෑ ප්‍රදේශ වල මැනුම් කිරීමේදී අමතර පිටපතක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට යැවීම	3
15.24.	ලී කුඤ්ඤු ගසා මායිම් පෙන්වීමේදී කට්ටි කැඩීමේ සැලැස්ම මත යොදන සටහන	3
15.25.	වැඩ අවසන් කළ මැනුම් ඉල්ලීම් ගොනු තැන්පත් කිරීම	3

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ ඉඩම් කට්ටි කිරීම සඳහා විශේෂිත කරුණු	
15.26.	වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන මැනුම් ඉල්ලීම්	4
15.27.	යාය වශයෙන් වෙන් කර ගෙන කුඤ්ඤ ගැසීම	4
15.28.	කට්ටි කැඩීමේ සැලසුම් සහ ඉංජිනේරු මැනුම් පත්‍ර සංසන්දනය කිරීම	4
15.29.	වාරිමාර්ග යෝජනා ක්‍රම වලදී ඇළ මාර්ග පිහිටුවීම	4
15.30.	ලී කුඤ්ඤ සපයා ගැනීම	4
15.31.	කට්ටි කැඩීමේ සැලසුමෙහි සංශෝධන පවතින විට ක්‍රියා කළ යුතු ආකාරය	4

15 වැනි පරිච්ඡේදය

කට්ටි කැඩීමේ සැලසුම් පිළියෙල කිරීමේ සහ කුඤ්ඤ ගැසීමේ මැනුම්

කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීමේදී සැලකිය යුතු කරුණු

15.1. කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම සහ කුඤ්ඤ ගසා මායිම් ලකුණු කිරීමේ මැනුම් සඳහා මැනුම් ඉල්ලීම් ලැබීමේදී ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයෙන් යෝග්‍යතා වාර්තාවක් අවශ්‍ය යයි හැඟෙන අවස්ථාවලදී ඒ පිළිබඳව විමසිලිමත් විය යුතුය.

15.2. යෝජිත කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කළ යුතු ඉඩම අයත් වන පළාත් පාලන බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් බල පැවැත්වෙන නීති වලට යටත්වේ නම් නාගරික සංවර්ධන අධිකාරී පනතට අදාළ නීති හා රෙගුලාසි වලට අනුව කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කළ යුතුය. අනිකුත් ප්‍රදේශ වල කට්ටි සැලසුම් පිළියෙල කිරීමේදී අදාළ පරිපාලන ප්‍රදේශයේ බල පැවත්වෙන නීති හා රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි අනුව අදාළ රක්ෂිත බිම් අනිවාර්යයෙන්ම පවත්වාගෙන යා යුතුය. තවද මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනයන්හි නීති හා රෙගුලාසි සම්බන්ධවද අදාළ වන පරිදි කටයුතු කළ යුතුය.

කෂෙතු කටයුතු

15.3. කට්ටි කැඩීමේ සැලැස්මක් පිළියෙල කිරීම සඳහා මැනුම් ඉල්ලීමක් ලද පසුව එම මැනුම් ප්‍රදේශය තුල අනවසර පදිංචිකරුවන් පදිංචිව සිටීනම් ඔවුන් පදිංචිව සිටින ඉඩම් පෙන්නුම් කරන අනුරේඛනයක් පමණක් පිළියෙල කරනු ලබන අතර ඊට අනුරූපව අනවසරකරුවන්ගේ නම්, ලිපිනයන්, ඉඩම් පරිහරණයන්, බිම් ප්‍රමාණ ආදි තොරතුරු දැක්වෙන උප ලේඛනයක්ද සකස් කිරීම මඟින් මැනුම අවසන් කළ යුතුය.

15.4. මැනුම් ඉල්ලීමට අනුව කට්ටි කැඩීමේ සැලැස්ම සකස් කිරීමට යෝජිත ඉඩමේ මූලික පරීක්ෂාවකින් පසුව වට මැනුමක් හා විස්තර මැනුමක් සිදු කළ යුතුය. කඳු බෑවුම් සහිත ප්‍රදේශයක් නම් ප්‍රවේශ මාර්ග, කානු සහ ඉඩම් කට්ටි සැලසුම් කිරීමේදී භූමියේ ස්වාභාවය සලකා බලා අවශ්‍ය නම් මට්ටම් ගැනීමෙන් පසු ප්‍රවේශ මාර්ග වෙන් කළ යුතුය. ඉඩමේ බිම් ප්‍රමාණය විශාල වන්නේ නම් ඛණ්ඩාංකගත පාලන පරික්‍රමණයක් මාර්ගයෙන් නිවැරදිතාවය පාලනය කළ යුතුය.

15.5. මිනින්දෝරුවරයා විසින් කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීමේදී සෑම බිම් කට්ටියකටම ප්‍රවේශ වීමට ප්‍රවේශ මාර්ග වෙන් කළ යුතු අතර කට්ටි සැලැස්මට යාබදව පවතින රජයේ ඉඩම් ඇත්නම් ඒ පිළිබඳව සලකා බලා සුදුසු පරිදි ප්‍රවේශ මාර්ග යෙදිය යුතුය. එසේම අදාළ ඉඩමට යාව පුද්ගලික ඉඩමක් ඇති විටක සහ එයට ප්‍රවේශ වීමට විකල්ප මාර්ග නොමැති විටක ඒ සඳහාද ප්‍රවේශ මාර්ග සැලසුම් කළ යුතුය. මෙහිදී, මිනින්දෝරු අධිකාරිගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය. කට්ටි කැඩීමට යාබදව පෞද්ගලික ලෙස නිරවුල් කරන ලද ඉඩම් තිබේ නම් ඒවාට අවශ්‍ය වුවහොත් ප්‍රවේශ මාර්ග ලෙස යොදා ගැනීමට හැකි වන පරිදි ආරක්ෂිත බිම් තීරුවක් වෙන් කර තැබීම කරනු ලැබේ.

15.6. කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කරනු ලබන ප්‍රදේශය තුළ උපරිම ගංවතුර මට්ටමට පහලින් පිහිටි ප්‍රදේශ , වගුරු බිම්, ගල් පර්වත, අංශක 30 ට වඩා වැඩි බෑවුමක්, මීටර් 20 කට වඩා දුරකට ඇති කඳු බෑවුම් ආදී බෙදා දීමට නුසුදුසු ඉඩම් ඇතුලත් ප්‍රදේශ කට්ටි කැඩීමේ සැලැස්මෙහි වෙන් කර දැක්විය යුතුය.

15.7. කට්ටි කැඩීමේ සැලැස්මට අනුව එම මායිම් භූමියේ පිහිටුවීමට කුඤ්ඤු ගැසීම සඳහා සුදුසු ඕනෑම මැනුම් උපකරණයක් භාවිතයට ගත හැක.

15.8. ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කට්ටි කැඩීමේ සැලැස්මට අනුව කුඤ්ඤු ගසා බෙදා දීමට තෝරා ගත් ඉඩම්ලාභීන්ගේ නාම ලේඛනය සමඟ මැනුම් ඉල්ලීම නිකුත් කරනු ලැබේ. අවසාන ගම් පිඹුරු ප්‍රදේශයක හෝ මායිම්ගල් යොදන ලද මුලික පිඹුරු ප්‍රදේශයක මායිම් සලකුණු කිරීමට පැරණි මායිම්ගල් ආධාර කර ගත යුතුය. පැරණි මායිම්ගල් නොමැති අවස්ථාවල පැරණි මායිම් විවෘත කිරීම කළ යුතුය.

15.9. ප්‍රවේශ මාර්ග සහ ප්‍රධාන මැනුම් රේඛා භූමියේ පිහිටුවීමෙන් පසුව සම්පාදනය කර ගන්නා ලද දත්ත අනුසාරයෙන් ලී කුඤ්ඤු භූමියේ පිහිටුවිය යුතුය. කැබලි දෙකක් අතර මායිම් සම්පූර්ණයෙන් එළි නොකොට දෙපස ලී කුඤ්ඤු වල සිට මීටර් 5 බැගින් එළි කිරීම ප්‍රමාණවත් වේ.

15.10. කට්ටිකරුවන්ගේ නාම ලේඛනයක් නොමැතිව කුඤ්ඤු ගසා මායිම් පිහිටුවීම නොකළ යුතුය. කෙසේ වුවද එසේ කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කර කුඤ්ඤු ගැසීම සඳහා මැනුම් ඉල්ලීමක් ලද අවස්ථාවක, කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කොට ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සඳහා යැවිය යුතුය. කට්ටිකරුවන්ගේ නාමලේඛනය ලබා ගැනීමෙන් පසු පමණක් කට්ටි කැඩීම සිදු කළ යුතුය.

15.11. කුඤ්ඤු ගසන ලද මායිම් කට්ටිකරුවන්ට පෙන්වා දී පිටපත් දෙකකින් අත්සන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. කට්ටි කරුවන්ට භාර නොදුන් ඉඩම් ග්‍රාම නිලධාරි/ ජනපද නිලධාරි වෙත පෙන්වා පිටපත් දෙකකින් සහතික කර ලබා ගත යුතුය. පදිංචිව සිටින කට්ටිකරුවන්ගේ අත්සන් ලැයිස්තුවක්ද පිටපත් දෙකකින් වෙනම ලබා ගත යුතුය.

15.12. කට්ටි කැඩීමේ නිවැරදිතාවය මිනින්දෝරු අධිකාරි විසින් සුදුසු මැනුම් උපකරණ භාවිතා කොට ප්‍රමාණවත් ක්ෂෙත්‍ර පරීක්ෂණ මඟින් පරීක්ෂා කළ යුතුය.

පිඹුරු වැඩ

15.13. කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීමේදී යෝජිත කට්ටි මායිම් අනුරේඛනයේ රතු පාටින් පෙන්නුම් කරනු ලැබේ.

15.14. මිනින්දෝරුවරයා විසින් මැනුම් ඉල්ලීමේ අවශ්‍යතාවයන් සපුරාලන පරිදි කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කළ යුතුය. කට්ටි සැලැස්ම අංකනය කිරීම සඳහා මැනුම් ඉල්ලීම් අංකයම යොදාගනු ලැබේ. කට්ටි කැඩීමේ මායිම් භූමියේ පිහිටුවීම සඳහා අනුරේඛනයෙන් හෝ පරිගණක දත්ත මඟින් සම්පාදනය කර ගන්නා ලද දුර, කෝණ සහ ඛණ්ඩාංක භාවිතා කළ යුතුය.

15.15. කට්ටි කැඩීමේ සැලැස්මෙහි දැක්වෙන බිම් කැබලි අංක Ⓐ, Ⓑ, Ⓒ ..ආදී වශයෙන් අක්ෂරය වටා රවුමක් යොදා රතු වර්ණයෙන් දැක්විය යුතු අතර, කැබලි අංක Ⓩ වලින් පසුව ⒶⒶ, ⒶⒷ, ⒶⓄ .. ආදී වශයෙන් අංක කළ යුතුය. කැබලි අංක සඳහා I, O, L අක්ෂර භාවිතා නොකළ යුතු අතර ඒ බවට සහතිකයක් රතු වර්ණයෙන් අනුරේඛනයේ සුදුසු ස්ථානයක ලිවිය යුතුය.

15.16. කට්ටි කැඩීමේ සැලැස්මෙහි දැක්වෙන සියළුම බිම් කැබලි සඳහා කැබලි අංකය, බිම් ප්‍රමාණය සහ විස්තරය ඇතුලත් වගුවක් රතු වර්ණයෙන් අනුරේඛනයේ දැක්විය යුතුය.

15.17. මැනුම් ඉල්ලීම සම්පූර්ණ කළ බවට මිනින්දෝරුවරයා සහතිකය යෙදීමේදී කඩන ලද ඉඩම් කට්ටි වල බිම් ප්‍රමාණය ද එයට ඇතුළත් කළ යුතුවේ.

15.18. කට්ටි කැඩීමට අදාළ ප්‍රදේශය "අ.ග.පි/අ.භූ.පි/ මූලික පිඹුරු" ප්‍රදේශවලට අයත් වන විට එම පිඹුරු මත වට මායිම පැන්සලෙන් දක්වා ඉරිසෙවන කොට අනුරේඛන අංකයද පැන්සලෙන් යොදනු ලැබේ. මූලික පිඹුරු ප්‍රදේශ තුලට වැටෙන අවස්ථාවල දම්.16 පත්‍රයේ ක්ෂෙත්‍ර පිටපතෙහි අදාළ යොමු සටහන පැන්සලෙන් යෙදිය යුතුය. කාර්යාලීය පිටපත් ද ඒ ආකාරයටම සංශෝධනය කළ යුතුය.

15.19. කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම හා ලී කුඤ්ඤු ගසා කට්ටි කැඩීමේ මැනුම් සඳහා ලැබෙන මැනුම් ඉල්ලීම සම්පූර්ණ කළ පසු ඊට අදාළ වාර්තාව පිළියෙල කිරීම සඳහා අවසාන නිරවුල් ප්‍රදේශයක නම් මැනුම් 418 පෝරමයද, අවසාන නිරවුල් ප්‍රදේශ පිටස්තර ප්‍රදේශ තුළ නම් මැනුම් 417 පෝරමයද භාවිතා කළ යුතුය.

15.20. කට්ටි කැඩීම සඳහා නිකුත් කරන ලද මැනුම් ඉල්ලීමක සියළු කටයුතු අවසන්වූ පසු මිනින්දෝරු අධිකාරි විසින් එම කටයුතු පරීක්ෂා කළ යුතුය. අනතුරුව අදාළ අනුරේඛනය, ලිපි ගොනුව සහ ප්‍රාදේශීය ලේකම්වරයාට වැදගත් හා සැලකිලිමත් විය යුතු කරුණු අඩංගු වාර්තාව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත භාර දිය යුතුය.

15.21. මිනින්දෝරුවරයා විසින් පිළියෙල කරන ලද කට්ටි සැලැස්මේ මුල් අනුරේඛනය ඉදිරි මැනුම් කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට මැනුම් ඉල්ලීම ගොනුවට ඇතුළත් කොට දි.මි.කා. හි තැන්පත් කළ යුතුය.

15.22. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැනුම් ඉල්ලීම අනුමත කොට අදාළ අනුරේඛන පිටපත්, මිනින්දෝරු වාර්තාව සහ කට්ටි බාර දුන් බවට කට්ටිලාභීන්ගේ අත්සන් පත්‍රයේ පිටපතක් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යැවිය යුතුය.

15.23. අදාළ මැනුම් ප්‍රදේශය කැළෑ හෝ වටිනා දැව ගස් අයත්වන අවස්ථාවල කට්ටි කැඩීමේ සැලැස්මේ අමතර පිටපතක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ද යැවිය යුතුය.

15.24. ලී කුඤ්ඤු ගසා මායිම් පෙන්වා දුන් පසුව කට්ටි කැඩීමේ සැලැස්ම මත "ලී"ලෙස රතුපාටින්ද, ලී කුඤ්ඤු ගසන ලද ස්ථානය කළු තිතකින්ද පෙන්නුම් කරනු ලැබේ. ඉන් පසු මිනින්දෝරුවරයා විසින් "ප්‍රා.ලේ.ගේ අංක ....., ස.ජ.ගේ අංක ..... දරණ මැනුම් ඉල්ලීමට අනුව කැබලි අංක ..... හි මායිම් මා විසින් ක්ෂෙත්‍රයේ පිහිටුවා පෙන්වා දෙන ලදී." යන සටහන කට්ටි කැඩීමේ සැලැස්ම මත රතුපාටින් යොදා තම අත්සන, නම, තනතුර හා දිනයද රතුපාටින් යෙදිය යුතුය. ඉන් පසුව මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කල බවට හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අනුමත කළ බවටද කට්ටි කැඩීමේ සැලැස්ම මත තම අත්සන, නම, තනතුර හා දිනයද රතුපාටින් යෙදිය යුතුය. මෙම සටහන් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යවනු ලබන කට්ටි කැඩීමේ සැලැස්මෙහි ඡායා පිටපත මතද සිදු කළ යුතුය. මුල් අනුරේඛනය කට්ටි කැඩීමේ සැලැස්ම සඳහා වන මුල් ගොනුවට ඇතුලත් කරන අතර ඡායා පිටපතක් කුඤ්ඤු ගසා මායිම් සලකුණු කිරීමේ ලිපි ගොනුවට ඇතුලත් කළ යුතුය.

15.25. මිනින්දෝරු වාර්තා පෝරමයේ මුල් පිටුවේ දැක්වෙන තොරතුරු සම්පූර්ණ කොට තම අත්සන ද යෙදීමෙන් පසු එය සමඟ කට්ටි කැඩීමේ සැලැස්ම හා අනිකුත් අදාළ ලිපි ලේඛන ගොනු කොට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ තැන්පත් කර තැබීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි කටයුතු කළ යුතුවේ.

වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ ඉඩම් කට්ටි කිරීම සඳහා විශේෂිත කරුණු

15.26. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා ඉඩම් කට්ටි කිරීමට ඉදිරිපත් කරන මැනුම් ඉල්ලීම සමඟ එවනු ලබන වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින්ම පිළියෙල කරන ලද නිල් මුද්‍රිත පත් හෝ පරිගණක මෘදු පිටපත් අනුව ඉඩම් කට්ටි භූමියේ සලකුණු කිරීම කළ යුතුය. මාර්ග, ජල මාර්ග, ජලය බැසයාම සඳහා කානු පද්ධති හා කට්ටි මායිම් එම නිල් මුද්‍රිත පත්‍රයේ හෝ පරිගණක මෘදු පිටපත්හි දක්වා ඇති ආකාරයට මිනින්දෝරුවරයා විසින් භූමියේ පිහිටුවිය යුතුය.

15.27. මෙම කට්ටි කැඩීමේ සැලසුම් වල කුඤ්ඤු ගැසීම කරනු ලබන්නේ යාය වශයෙනි. එම යාය විශාල වන අවස්ථාවලදී පහසු ආකාරයට හෙක්. 200 නොඉක්මවන බිම් ප්‍රමාණ අඩංගු කලාපවලට එම යාය වෙන්කර ගනු ලැබේ.

15.28. කට්ටි කැඩීමේ සැලැස්මෙන් අනුරේඛනයක් සකස් කර එය ඉංජිනේරු පත්‍රය මත සීරුමාරු කොට සංසන්දනය කිරීමෙන් පසු සියළුම පිල් ලකුණු හා අවශ්‍ය පරිදි අනුයාත කුඤ්ඤු තුන බැගින් වන කට්ටල පිටපත් කර අවශ්‍ය දුරවල් ගණනය කිරීම හා සම්පාදනය කිරීම කරනු ලැබේ. පරිගනක මෘදු පිටපත් ලබා දී ඇති විට පරිගනකය මඟින් අවශ්‍ය දුර, කෝණ හා ඛණ්ඩාංක ගණනය කිරීම කළ හැක.

15.29. දැනටමත් භූමියේ ඉදිකරන ලද හෝ ලකුණු කොට ඇති මාර්ග හෝ ඇළ මාර්ග වේනම් ඒවා විකෝණමානය/ පුර්ණමානය භාවිතයෙන් ජාතික ඛණ්ඩාංක පද්ධතියට සම්බන්ධ කළ යුතුය. එම මැනුම පත්‍රයක් මත නියැකීම කර ඒ මත ඉහත සඳහන් කළ අනුරේඛනය අධිස්ථාපනය කරනු ලැබේ. ප්‍රධාන බෙදාහැරීමේ ඇළ මාර්ග එතෙක් ඉදිකර නොමැති නම් එය භූමියේ පිහිටුවිය යුතු අතර ඉදිකිරීම් අවස්ථාවේදි එය වෙනස් නොවන බවට වාරිමාර්ග ඉංජිනේරුවරයාගෙන් සහතිකයක් ලබා ගත යුතුය. ඉදිකිරීමට නියමිත ඇළ මාර්ග කට්ටි සැලැස්මෙන් වෙනස්වන බව පෙනේනම් එම ඇළ මාර්ග හා ඊට සම්බන්ධ බිම් කට්ටිවල මායිම්ද කට්ටි කැඩීමේ සැලැස්මේ සංශෝධනය කර ව්‍යාපෘති භාර වාරිමාර්ග ඉංජිනේරු වරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

15.30. කල් වේලා ඇතිව ප්‍රාදේශිය ලේකම්වරයා හෝ වාරිමාර්ග ඉංජිනේරුවරයා සමඟ සම්බන්ධ වී ප්‍රමාණවත් පරිදි ලී කුඤ්ඤු ලබා ගැනීමට කටයුතු සංවිධානය කළ යුතුය.

15.31. කට්ටි කැඩීමේ සැලැස්ම භාවිතයෙන් ක්ෂෙත්‍රයේ කට්ටි කැඩීමේදී සුළු සංශෝධන පවතින අවස්ථාවේදී ප්‍රාදේශීය ලේකම්ගේ පිටපත ගෙන්වා ගෙන එම සංශෝධන එම පිටපතේ රතු පාටින් දක්වා භූමියේ ගසන ලද නව ලී කුඤ්ඤු සඳහා 15.24 ඡේදයෙහි සඳහන් පරිදිම කටයුතු කළ යුතුය. සංශෝධන වැඩි ප්‍රමාණයක් කිරීමට සිදුවන විටදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා සංශෝධිත කට්ටි කැඩීමේ සැලැස්මක් පිළියෙල කල යුතුය.

ශුද්ධි පත්‍රය

ශුද්ධි පත්‍රය

16 වැනි පරිච්ඡේදය

නගර මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	හැඳින්වීම	
16.1.	පළාත් පාලන ආයතන වල ඉල්ලීම මත කරන නගර මැනුම්	1
16.2.	මැනීමට ඇති ප්‍රදේශයේ සීමාව තීරණය කිරීම	1
	නගර මැනුම් පිඹුරු වර්ග	
16.3.	නගර මැනුම්වලදී පිළියෙල කරනු ලබන පිඹුරු වර්ග	1
	තක්සේරු මැනුම් වල ක්ෂෙත්‍ර වැඩ	
16.4.	නගර මැනුම් සඳහා පෞද්ගලික ඉඩම් වලට ඇතුල් වීමට බලය	1
16.5.	තක්සේරු මැනුම් සඳහා පාලන පරික්‍රමණ	1
16.6.	නගර මැනුම්වලදී මායිම්ගල් යෙදීම	1
16.7.	නගර මැනුම්වලදී භාවිතා කරනු ලබන පිල් ලකුණු වර්ග	1
16.8.	නගර මැනුම් සිදු කිරීමට ගුවන් මැනුම් උපයෝගි කර ගැනීම	2
16.9.	අවශ්‍ය ප්‍රදේශයේ ගුවන් මැනුම් පිඹුරක් සැකසීම	2
16.10.	විස්තර මැනීම සඳහා පරික්‍රමණ	2
16.11.	ගොඩනැඟිලි මැනුම්	2
16.12.	මායිම් විස්තර මැනීම	2
16.13.	හිමිකම් කියනු ලබන ඉඩමක් තුල ඇති එක් එක් තක්සේරු වෙන් කර දැක්වීම	2
16.14.	මායිම් බේරුම් කර ගැනීමට නොහැකි වන විට එක් තක්සේරුවක් ලබාදීම	2
16.15.	හිමිකම් කියනු ලබන ඉඩමක් තුල ඇති ගොඩනැගිලි වල පිටතට නෙරා ඇති කුඩා කොටස් මැනීම	3
16.16.	මාර්ග වල මායිම් දිගේ ඇති කාණු සහ පෞද්ගලික ඉඩම් හරහා වැටී ඇති ප්‍රසිද්ධ කාණු මැනීම	3
16.17.	ක්ෂෙත්‍ර පත් වල මැනුම් කටයුතු පිළිවෙලින් නිම කිරීම	3
16.18.	මායිම් විස්තර කිරීම සඳහා සංක්ෂිප්ත නාම භාවිතා කිරීම	3
	තක්සේරු මැනුම් වල පිඹුරු වැඩ	
16.19.	නගරයේ පිටත මායිම් නියැකීම	3
16.20.	නගර මැනුම් පිඹුරු සඳහා පිඹුරු අංක ලබා ගැනීම	3
16.21.	ක්ෂෙත්‍ර පත් එකේ සිට අංක කිරීම	3
16.22.	නගර මැනුම් සිදු කළ යුතු පරිමාණය	3
16.23.	මුල් ක්ෂෙත්‍ර පත් මත වරිපනම් අංක ඇතුලත් කිරීම	3
16.24.	භූමියෙහි පවතින පැරණි හා අළුත් විස්තර පෙන්වීම	3
16.25.	විස්තර මැනීම හා පිඹුරේ දැක්වීම	3
16.26.	නගර මැනුම්වල පිඹුරු වැඩ	4
16.27.	පත්‍ර දාර සංසන්දන අනුරේඛන සැකසීම	4
16.28.	වැඩ අවසන් පත්‍ර මුද්‍රණයට යැවීම	4
16.29.	මිනින්දෝරු වාර්තාව	4
16.30.	යොමු රේඛා චිත්‍රය අනුමත කිරීම හා මුද්‍රණය	4
16.31.	විස්තර පරික්‍රමණ වල ඛණ්ඩාංක පත් දි.මී.කා.ට යැවීම	4

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	සමෝච්ඡ රේඛා මැනුම් වල ක්ෂේත්‍ර වැඩ	
16.32.	මට්ටම් ගැනීමේදී අනුගමනය කළ යුතු ආකාර	4
16.33.	සමෝච්ඡ රේඛා මැනුම්වලදී විස්තර මට්ටම් ගැනීම	4
	සමෝච්ඡ රේඛා මැනුම් වල පිඹුරු වැඩ	
16.34.	සමෝච්ඡ රේඛා මැනුම් පරිමාණය	5
16.35.	සමෝච්ඡ රේඛා පරතරය සහ රේඛාවල ඝනකම	5
16.36.	සමෝච්ඡ රේඛා මැනුම්වල විස්තර සංශෝධනය	5
16.37.	එතුලොන් / අනුරේඛන පතක සමෝච්ඡ රේඛා දැක්වීම	5

16 වැනි පරිච්ඡේදය

නගර මැනුම්

හැඳින්වීම

16.1. ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා වැනි පළාත් පාලන ආයතන වල ඉල්ලීම මත නගර මැනුම් කරනු ලැබේ.

16.2. මැනීමට ඇති ප්‍රදේශයේ සීමාව තීරණය කරනු ලබන්නේ ගැසට් පත්‍ර දැන්වීමේ ආධාරයෙනි.

නගර මැනුම් පිඹුරු වර්ග

16.3. පිළියෙල කරනු ලබන පිඹුරු වර්ග දෙකකින් යුක්ත වේ. එනම් :

(අ) මහා මාර්ග, මාර්ග, දිය පාරවල්, වෙනත් ස්වාභාවික අංග ලක්ෂණ, දේපළ වල මායිම් සහ ගොඩනැගිලි ඇතුළු වෙනත් විස්තර පෙන්වන තක්සේරු පිඹුරු

තක්සේරු පිඹුරු වනාහී භූමියෙහි පවතින විස්තර වල සටහනක් වන අතර, එය තක්සේරු කටයුතු සඳහා පමණක් ප්‍රයෝජනවත් වේ. පැරණි වැඩ ගැන ක්‍රියා නොකරයි. ඉඩම් විස්තර ලැයිස්තු සපයනු නොලැබේ. ප්‍රාදේශීය බලධාරි වෙත සපයනු ලබන පිඹුරු පිටපත් මත දේපළ වල වරිපනම් අංක අතින් ලියනු ලැබේ.

(ආ) ජල සම්පාදන සහ ජලාපවාහන අධ්‍යක්ෂ ජනරාල්ගේ ඉල්ලීම පරිදි සපයනු ලබන සමෝච්ඡ රේඛා පිඹුරු

තක්සේරු මැනුම් වල ක්ෂෙත්‍ර වැඩ

16.4. එක් එක් මිනින්දෝරුවරයා විසින්, නගර මැනුම් සඳහා පෞද්ගලික ඉඩම් වලට ඇතුල් වීමට බලය ලබා දෙන ලිපියක් සර්වේයර් ජනරාල්ගෙන් ලබා ගත යුතුය.

16.5. දැනට පවතින පරික්‍රමණ වලින් පාලනය වන අන්දම පරීක්ෂා කරනු ලබන අතර, නගරයේ පිටස්තර සීමාව, ප්‍රධාන මාර්ග සහ ඇළවල් මත වැටෙන පරිදි පාලන පරික්‍රමණ ජාලයක් එයට අතිරේක වශයෙන් යොදා ගත යුතුය.

16.6. පළාත් පාලන කොමසාරිස් ගේ අවශ්‍යතාවය වනුයේ ස්වාභාවික නොහොත් කෘතිම අංග ලක්ෂණයන් ගෙන් නිරූපණය නොවන්නා වූ නගර මායිම්, මායිම්ගල් දමා නිරූපණය කිරීම වේ. ආදායම් පිඹුරක් නිකුත් නොකරනු ලබන බැවින්, දෙපාර්තමේන්තු මායිම්ගල් භාවිතා නොකළ යුතුය. ඒ සඳහා අවශ්‍යවන මායිම්ගල් අදාළ පළාත් පාලන ආයතනයෙන් ලබාගත යුතුය. මෙවා මීටර් 200 පරතරයට සහ ප්‍රමුඛ නැමීවල වැළලිය යුතුය. එම මායිම්ගල් සුදුසු ප්‍රමාණයේ කළු සමචතුරශ්‍රයකින් පිඹුර මත පැහැදිළිව දැක්විය යුතුය. මෙම මායිම් වල කොටස්, අ.ග.පි. වැනි මායිම්ගල් දැමූ ආදායම් මායිම් මත වැටේ නම් ඒවා තවදුරටත් පළාත් පාලන මායිම්ගල් මඟින් නිරූපණය නොකෙරනු ඇත. එවැනි කොටස් වල දෙපාර්තමේන්තු මායිම්ගල් සාමාන්‍ය අන්දමට පිඹුරේ පෙන්විය යුතුය. දෙපාර්තමේන්තු සහ පළාත් පාලන මායිම්ගල් යන දෙවර්ගයම පිඹුරේ විස්තර කරනු නොලැබේ. නමුත් ඒවා යොමු සටහන් ලැයිස්තුවට ඇතුලත් කළ යුතුය.

16.7. තක්සේරු මැනුම් කරනු ලබන අවස්ථාවේදීම පිල් ලකුණු යෙදීම කළ යුතුය. අවශ්‍ය වුවහොත් වැඩි දුරටත් පිල් ලකුණු යෙදීම පසුව කළ යුතුය.

(අ) තක්සේරු පිඹුරු මත පිල් ලකුණු ඒවායේ වටිනාකම සමඟ මෙසේ පෙන්වනු ලැබේ. ⟶ මී. 21.875

කි.මී.1 ක පමණ පරතරය ඇතිව ප්‍රධාන මාර්ග දිගේ, වඩාත් සතුටුදායක ලෙස ප්‍රධාන මන්සංධිවල, 'සී ' වර්ගයේ පිල් ලකුණු (ලෝකඩ ඇණය රහිත) තනනු ලැබේ. පිහිටිගල්, කොන්ක්‍රීට් නැතහොත් පෙදරේරු ගොඩනැගිලි නොමැති නම්, ' ඊ ' වර්ගයේ පිල් ලකුණු (ලෝකඩ ඇණය රහිත) ප්‍රයෝජනයට ගනු ලැබේ. මෙම පිල් ලකුණු සඳහා මට්ටම් ගැනීම සඳහා අවශ්‍ය පාලන මට්ටම් ගැනීම් කළ යුතුය.

(ආ) ' ඊ ' වර්ගයේ පිල් ලකුණු ඒවායේ ආරක්ෂාව සඳහා මංසන්ධි අසල, පෞද්ගලික ඉඩම් හිමියන්ගේ අවසරය ඇතිව යාබද පෞද්ගලික ඉඩම් තුල පිහිටුවිය හැකිය.

(ඇ) වැඩ නිම කිරීමෙන් පසු, සුදුසු පරිමාණයකට ඇඳ පිහිටීම දක්වන රේඛා චිත්‍ර සමඟ පිල් ලකුණුවල වටිනාකම් සහ පිහිටීම පෙන්වන දළ සටහන් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

16.8. නගර මැනුම් සඳහා බිම් මැනුම් පමණක් උපයෝගී කර ගැනීමේදී අනුගමනය කරන කාර්ය පටිපාටිය 16.6 සහ 16.7 ඡේදවලින් දක්වා ඇත. ගුවන් මැනුම් ක්‍රමද උපයෝගී කරගත හැකිය. මේ සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ගුවන් මැනුම්) විසින් අවශ්‍ය භූමි පාලන ලක්ෂ්‍ය ගණන සැපයීමෙන් පසුව ඒවායේ මැනීම හා මට්ටම් ගැනීම කරනු ලැබේ.

16.9. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ගුවන් මැනුම්) විසින් සුදුසු පරිමාණයකට අවශ්‍ය ප්‍රදේශයේ ගුවන් මැනුම් පිඹුරක් සකසා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (භූගෝලීය තොරතුරු පද්ධති) වෙත යවනු ලබන අතර ඔහු විසින් එහි පිටපතක් ක්ෂෙත්‍රයේදී සංශෝධනය සඳහා යවනු ඇත. ක්ෂෙත්‍ර සංශෝධනයෙන් පසු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (සිතියම්) විසින් නගර මැනුම් පත්‍ර මුද්‍රණය කරනු ලැබේ.

16.10. විස්තර මැනීම සඳහා දැනට පවතින පරික්‍රමණ භාවිතා කරනු ලැබේ. අවශ්‍ය නම් විස්තර මැනුම තවදුරටත් පාලනය කිරීම සඳහා වැඩිපුර විස්තර පරික්‍රමණ මැනිය හැක. මෙම පරික්‍රමණ අවම සංඛ්‍යාවක් වන පරිදි පිහිටුවිය යුතුය.

16.11. ගොඩනැගිලි සඳහා අනුලම්බන මීටර් 10 දක්වා ලබාගත හැකිය. තනි මැනුම් රේඛා මාර්ගයෙන් එවැනි ගොඩනැගිලි ද මැනුමට ඇඳා ගත හැකිය.

16.12. හිමිකම් කියා සිටින ඉඩම් වලට අයත් මායිම් ඒවා බිමෙහි දක්නට ලැබෙන පරිද්දෙන්ම මැනිය යුතුය. මායිම් දක්නට නොලැබෙන විට යාබද ඉඩම් අයිතිකරුවන් විසින් පොදු මායිමක් තබා ගැනීමට එකඟ වන්නේ නම් , එවැනි මායිම් මැනිය හැකිය. එහෙත් ඒවා අවිනිශ්චිත මායිම් බව විස්තර කළ යුතුය.

16.13. හිමිකම් කියා සිටිනු ලබන ඉඩමක් තුල තිබෙන එක් එක් තක්සේරුවක් වෙන වෙනම පෙන්නුම් කළ යුතුය. මේ ක්‍රමය නිසා ඉඩම් විස්තර සම්බන්ධයෙන් අවුල් සහගත තත්වයක් ඇතිවීමට ඉඩ ඇති බව පෙනේ නම්, එවැනි තක්සේරු 3 ක් හෝ 4 ක් එකට මැනිය හැක. ක්ෂෙත්‍ර පොත් තැබීම හෝ ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම කරනු නොලැබේ.

16.14. මනිනු ලබන අවස්ථාවේදී එක් එක් තක්සේරු බිම් කැබැල්ල නැතහොත් හිමිකම් කියනු ලබන බිම් කැබැල්ල සම්බන්ධයෙන් මායිම බේරුම් කර ගැනීමට නොහැකි වන විට, එකිනෙකට වෙනස් තක්සේරු අංක දරන ඉඩම් කැබලි දෙකක් හෝ ඊට වැඩි ගණනක් එක් බිම් කැබැල්ලක් වශයෙන් මැනිය හැක. මෙවැනි අවස්ථාවන්හි දී සම්පූර්ණ කරන ලද පිඹුරු සමඟ වාර්තාවක් ද යැවිය යුතුය.

16.15. හිමිකම් කියනු ලබන ඉඩමක් තුල ඇති ගොඩනැගිලි වල පිටතට නෙරා ඇති කුඩා කොටස්, ඇතුලට නෙරා ඇති කුඩා කොටස් සහ හැඩයෙන් යුත් කොටස් පැහැදිලි ලෙස පිඹුරේ ඇඳ පෙන්වීමට නොහැකි නම් ඒවා මැනීම අවශ්‍ය නැත.

16.16. මාර්ග වල මායිම් දිගේ ඇති කාණු සහ පෞද්ගලික ඉඩම් හරහා වැටී ඇති ප්‍රසිද්ධ කාණු මැන පෙන්විය යුතුය.

16.17. ප්‍රාදේශීය බලධාරියාට පිඹුර මත ඡන්ද කොට්ඨාශය බැගින් ගෙන කටයුතු කිරීම සඳහා අළුතින් ගනු ලබන ක්ෂෙත්‍ර පත්වල මැනුම් කටයුතු පිළිවෙලින් නිම කළ යුතුය.

16.18. මායිම් විස්තර කිරීම සඳහා **11 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 10** හි සඳහන් සංක්ෂිප්ත නාම භාවිතා කරන්න.

තක්සේරු මැනුම් වල පිඹුරු වැඩ

16.19. නගරයේ පිටත මායිම, සුදුසු පරිමාණයකට (උදා. 1: 10,000) A1 ප්‍රමාණයේ ක්ෂෙත්‍ර පතක ලකුණු කර ක්ෂෙත්‍ර පතෙන් ආවරණය වන ප්‍රදේශය සඳහා යොමු රේඛා චිත්‍රයක් පිළියෙල කරනු ලැබේ. අළුතින් ගනු ලබන සියළුම ක්ෂෙත්‍ර පත්‍ර, A3 ප්‍රමාණයේ පත්‍ර විය යුතුය.

16.20. නගර මැනුම් පිඹුරු සඳහා පිඹුරු අංක ජ්‍යෙෂ්ඨ නි.ස.ජ. (ලේඛන කළමනාකරණ හා ව්‍යෘත්තීය ප්‍රමිතීන්) ගෙන් ලබා ගත යුතුය.

16.21. ක්ෂෙත්‍ර පත් එකේ සිට අංක කර ඇත. යාබද ක්ෂෙත්‍ර පත් වල අංක සෑම ක්ෂෙත්‍ර පතකම අදාළ තීරුවල පෙන්විය යුතුය.

16.22. මතුවට, සියළුම නගර මැනුම් පිඹුරු 1 :1,000 පරිමාණයෙන් පිළියෙල කල යුතුය. දත්ත රැස් කළ යුත්තේ එම පරිමාණයට අනුවය.

16.23. මුල් ක්ෂෙත්‍ර පත් මත වරිපනම් අංක පැන්සලෙන් ඇතුලත් කළ යුතුය.

16.24. දැනට භූමියෙහි පවතින පැරණි විස්තර කළු පාටින් පෙන්වනු ලබන අතර, අළුත් විස්තර රතු පාටින් පෙන්වනු ලැබේ.

16.25. පහත සඳහන් විස්තර මැනීම කළ යුතු අතර එම මායිම් පිඹුරෙහි පහත පරිදි පෙන්විය යුතුය.
පිල් ලකුණු, සියළුම ජල මාර්ග, ඔයවල්, ගංගා, ඇළවල්, වාරිමාර්ග ඇළවල්, මාර්ග දිගේ ඇති සියළුම කාණු සහ විවෘත සිමෙන්ති කාණු, විවෘත වැසි දිය කාණු, වසා ඇති සහ පොළව යට ඇති වැසි දිය කාණු කවාට, වා සිදුරු කුළුණු, පළාත් පාලන ආයතන වලින් පාලනය කරනු ලබන කසළ කාණු , කසළ පොම්ප කරණ ස්ථාන, කසළ විනාශ කරණු ලබන භූමි, කසළ පිටකර හරින දොරටු, කුඹුරු වට මායිම් ප්‍රදේශවල, තණබිම් වල, මඩගොහොරු බිම්වල පහත් පුරන් බිම්වල, වලවල්වල, වතුර වලවල්වල, පොකුණුවල, වැව්වල, කණ්ඩිවල සහ බෑවුම්වල පිටස්තර මායිම්, බෝක්කු සහ පාලම් ඒවායේ අප මුඛ වල මිනුම් සමඟ, සැල්වීනියා උවදුරට යටත් ප්‍රදේශවල සීමාවන් තිත් ඉරි වලින් ඇඳ පෙන්විය යුතුය. සුළු ගංවතුරට, මධ්‍ය ගංවතුරට හා වැඩිම ගංවතුරට ගොදුරුවන ප්‍රදේශවල සීමාවන් කඩ ඉරි වලින් ඇඳ පෙන්වා, අ.ගං.ම. (L.F.L) , ම.ගං.ම. (M.F.L), ඉ.ගං.ම. (H.F.L) යනුවෙන් විස්තර කළ යුතුය.

16.26. පහත දක්වා ඇති ආකාරයට පිඹුරු වැඩ සිදු කළ යුතුය.

(අ) පිඹුරේ ශීර්ෂය සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් විය යුතුය.
(ආ) වෙනත් විස්තර සිංහලෙනි.
(ඇ) යොමුව සඳහා ඉංග්‍රීසි පරිවර්තනයක් සැපයිය යුතුය. සංක්ෂිප්ත නාම සඳහා යොමු සටහනක් සිංහලෙන් පිඹුරේ පෙන්විය යුතුය.
(ඈ) පරිගණක මුද්‍රණය සඳහා සපයනු ලබන අනුරේඛනය ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවලට අනුකූල විය යුතුය.
(ඉ) උතුර හා නැගෙනහිර පළාත් හා සම්බන්ධ නගර මැනුම් පිඹුරු ඉංග්‍රීසියෙන් පිළියෙල කරනු ඇත.
(ඊ) පිඹුරු මත පහත දැක්වෙන ප්‍රධානතම කරුණු විස්තර කළ යුතුය.
i. ජන්ද කොට්ඨාශ අංක සහ නම්
ii. ගොඩනැගිලි වල විස්තර (එනම් තාවකාලික ද නැතහොත් ස්ථිර ද යන වග)
iii. මායිම් වල විස්තර
iv. මාර්ග වල නම්

11 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 10 හි සඳහන් කර ඇති සංක්ෂිප්ත නාම භාවිතා කළ යුතුය.

16.27. එක් ක්ෂෙත්‍ර පතක වැඩ නිම කළ වහාම, ක්ෂෙත්‍ර පතේ වට මායිම යාව ඇති ක්ෂෙත්‍ර පත්වල වට මායිම සමඟ සංසන්දනය කර, නැතහොත් එසේ කිරීම සඳහා සංසන්දන අනුරේඛන පිළියෙල කර තැබිය යුතුය. මෙම ක්‍රමය අනුගමනය කිරීමෙන් එක් එක් ක්ෂෙත්‍ර පතේ වැඩ නිමවීමත් සමඟම එය මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමත කර මුද්‍රණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය.

16.28. වැඩ නිම කරන ලද ක්ෂෙත්‍ර පත් ක්ෂෙත්‍රයේ රඳවා නොගත යුතුය. පත්‍ර මායිම් සංසන්දනය කිරීම සඳහා මුද්‍රණය කිරීම පිණිස යවන ලද ක්ෂෙත්‍ර පත් නැවත ගෙන්වා ගැනීම නොකළ යුතුය.

16.29. එක් එක් ක්ෂෙත්‍ර පත සමඟ ඊට අදාළ මිනින්දෝරුවරයාගේ වාර්තාව යැවිය යුතුය.

16.30. වැඩ නිම කිරීමෙන් පසු මිනින්දෝරු අධිකාරිගේ පරීක්ෂාවෙන් අනතුරුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් යොමු රේඛා චිත්‍රය අනුමත කළ යුතු අතර , එය මුද්‍රණය කිරීම සඳහා ආදර්ශ පතක් සමඟ ඉදිරිපත් කළ යුතුය.

16.31. වැඩ අවසන් කරන ලද විස්තර පරික්‍රමණ වල ඛණ්ඩාංක පත් සමඟ යොමු රේඛා චිත්‍රය ක්‍රමවත් ලෙස ගොනුකර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

සමෝච්ඡ රේඛා මැනුම් වල ක්ෂෙත්‍ර වැඩ

16.32. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මට්ටම් ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රමය (සෘජුකෝණාශ්‍ර ග්‍රීඩ් රේඛා දිගේ ලෙවලය මඟින් මට්ටම් ගැනීමේ ක්‍රමය හෝ විකෝණමානය/පූර්ණමානය ආධාරයෙන් සමෝච්ඡ රේඛා භූමියෙහි පිහිටුවීමේ ක්‍රමය) තීරණය කළ යුතුය.

16.33. පහත දක්වන විස්තර මට්ටම් ගැනීම කළ යුතුය.
පිල් ලකුණු, සියළුම තාර පාරවල් මීටර් 50 පරතරයෙන් යුතුව ස්ථාන උස සහ වාහන යන මාර්ගවල එක් අයිනක් දිගේ බෑවුම වෙනස් වන ස්ථානයන්හි උස, වෙනත් පාරවල් සහ පටු මාවත් වැන්නෙහි මධ්‍ය රේඛාව දිගේ, පළාත් පාලන ආයතන වලින් පාලනය කරනු ලබන වැසිදිය හා කසළ කාණු

කවාට (කාණු කවාට පියන් මත) ඉවුරු සහ දිය පාරවල්, ඔයවල්, ගංගා, ඇළවල්, වාරිමාර්ග ඇළවල්වල ඒවා බෙදී යන ස්ථාන වල සහ කි.මී. 1/2 පරතරයන්හි, උස කණ්ඩි පටන් ගන්නා ස්ථාන වල කණ්ඩිය මුදුනේ සහ පාමුල උසවල් ද, කණ්ඩි සහ බෑවුම් වල (මැද සිට දෙකෙළවර අතර කි.මී 1/2 පරතරය ඇතිව උස ලබා ගත යුතුය.) , බෑවුම් වළවල් (පත්ලේ උස), වතුර වළවල් සහ පොකුණු.

සමෝච්ඡ රේඛා මැනුම් වල පිඹුරු වැඩ

16.34. මෙම මැනුම් 1:2,000 පරිමාණයෙන් යුක්ත විය යුතුය.

16.35. මිලි මීටර 0.25 ඝනකමින් යුක්ත වන සේ මීටර් 1ක සමෝච්ඡ රේඛා අන්තරයකින් විය යුතු අතර සෑම මීටර් 3 සමෝච්ඡ රේඛාවක්ම මි.මී. 0.8 ක ඝනකමින් විය යුතුය. කඳුකර ප්‍රදේශයන්හි සුදුසු පරිදි සමෝච්ඡ රේඛා අන්තරය මීටර් 2 ක් විය හැක.

16.36. මෑත දී කරන ලද තක්සේරු මැනුම් ඇතොත්, එම පිඹුරු වල 1:2,000 පරිමාණයට A3 ක්ෂෙත්‍ර පත් මත සමෝච්ඡ රේඛා පෙන්විය යුතුය. අළුත් මාර්ග සහ ප්‍රසිද්ධ ගොඩනැගිලි පමණක් ඇතුලත් කිරීම සඳහා ප්‍රමාණවත් විස්තර සංශෝධනයක් කළ යුතුය.

16.37. 1: 4,000 පරිමාණයට A3 ක්ෂෙත්‍ර පතක් මත සංශෝධනය කිරීම් රතු තින්තෙන් ඇඳ පෙන්විය යුතුය. උස දැක්වීම සඳහා එතුලෝන්/ අනුරේඛන පතක් ගෙන ඒ මත සමෝච්ඡ රේඛා, පිල් ලකුණු සහ ඒවායේ වටිනාකම්, පාලන උසවල් සහ අධිස්ථාපන ලකුණු කළු පාටින් පෙන්විය යුතුය.

ශුද්ධි පත්‍රය

17 වැනි පරිච්ඡේදය

විවිධ

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	විශේෂ මැනුම් කටයුතු	
17.1.	මැනුම් ගොනු පවත්වා ගැනීම	1
	හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර	
17.2.	හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර ආදියේ පිටපත් නිකුත් කිරීම	1
17.3.	රේඛා චිත්‍ර නිකුත් කිරීම පිළිබඳව දත්ත පද්ධතිය යථාවත් කිරීම	1
17.4.	අවසාන ගම් පිඹුරු රේඛා චිත්‍ර වල විස්තර යථාවත් කිරීම හා තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම	1
	අවසාන වාර්තා	
17.5.	අවසාන වාර්තා සහ අවසාන ගම් පිඹුරු	1
17.6.	අවසාන වාර්තාවට අදාළ නිරවුල් කිරීමේ පිඹුර	1
17.7.	අවසාන වාර්තාව ලද පසු කරනු ලබන දැන්වීම	1
	අවසාන ගම් පිඹුරු	
17.8.	අවසාන ගම් පිඹුර මුද්‍රණය කිරීමට ප්‍රථම අවසන් කරන ලද පිඹුරු ඇතුලත් කිරීම	1
17.9.	අවසාන ගම් පිඹුර පිළියෙල කිරීම	2
17.10.	අවසාන ගම් පිඹුර මුද්‍රණ පිටපත් නිකුත් කිරීම	2
17.11.	අවසාන ගම් පිඹුර මුද්‍රණය කළ පසු මැනුම් කටයුතු	2
17.12.	අවසාන ගම් පිඹුර මුද්‍රණය කළ පසු මුල් ගම් මැනුම හා ඉඩම් විස්තර ලැයිස්තු අවලංගු කිරීම	2
17.13.	අවසාන ගම් පිඹුර මුද්‍රණය කළ පසු මුල් ගම් මැනුමට අදාළ අනවශ්‍ය ලිපි විනාශ කිරීම	2
	අත් මිහිතැන් ගැන්වුම් උපකරණය මඟින් දත්ත රැස් කිරීම (Hand Held GPS)	
17.14.	අත් මිහිතැන් ගැන්වුම් උපකරණ (Handheld GPS receivers) මඟින් දත්ත රැස් කිරීම	2
17.15.	පවතින වට මායිම පැරණි ව්‍යවස්ථාපිත පිඹුරක මායිමක් වන අවස්ථාවේ දත්ත රැස් කිරීම	2
17.16.	පැරණි මැනුම් නියැකීම මඟින් ආවරණය නොවන විට දත්ත රැස් කිරීම	2
17.17.	HHGPS උපකරණ මඟින් ඛණ්ඩාංක ලබා ගත නොහැකි විට දත්ත රැස් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ පූර්ව අවසරය ලබා ගැනීම	2
17.18.	චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර දත්ත රැස්කිරීමේදී ක්‍රියා කළ යුතු ආකාරය	3
17.19.	වර්ගඵලය හෙක්ටයාර් 100 වැඩි හා අඩු විට වර්ග ප්‍රමාණය දැක්වීම	3
17.20.	අංකිත දත්ත ගොනු පවත්වා ගෙන යාම	3
	චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර වියමන් චිත්‍ර පිළියෙල කිරීම සඳහා දත්ත රැස් කිරීම	
17.21.	දත්ත රැස් කිරීමේදී භාවිතා කළ යුතු චන්ද්‍රිකා ඡායාරූප වර්ග	3
17.22.	වියමන් චිත්‍ර පිළියෙල කිරීම සඳහා දත්ත රැස් කිරීම	3
17.23.	මාර්ග හා ජලමාර්ග පළමුව අංකිතකරණය කළ යුතු බව	3
17.24.	මායිම් සලකුණු කිරීමට නොහැකිවූ බිම් කැබලි සඳහා දත්ත රැස් කිරීම	3
17.25.	ලි.බ.මී. පිඹුරක් ඇතිවිට ක්‍රියා කළ යුතු ආකාරය	4
17.26.	වියමන තුල ඇති ඉඩම් කැබලි සඳහා දත්ත පත්‍ර සම්පූර්ණ කිරීම	4

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	වියමන් ක්ෂෙත්‍ර දත්ත සටහන් තැබීම	
17.27.	ඉඩමට අනන්‍ය වූ අංකයක් ලබා දීම	4
17.28.	ක්ෂෙත්‍ර පොතේ පිට කවරයේ සටහන් තැබීම	4
	බිම් කැබලි අංකිතකරණය සඳහා උපදෙස්	
17.29.	Geo-referenced image වල බිම් කැබලි අංකිතකරණය	4
17.30.	අංකිතකරණය සඳහා වන නීති	4
17.31.	දත්ත ව්‍යුහය (Data Structure)	5
17.32.	රේඛා සඳහා දත්ත ව්‍යුහය	5
17.33.	ලක්ෂ්‍යයන් සඳහා දත්ත ව්‍යුහය	5
17.34.	බහුඅස්‍ර සඳහා දත්ත ව්‍යුහය	6
17.35.	දත්ත ගොනු නම් කිරීම	7
17.36.	දත්ත පත්‍ර ගොනු විනාශ කිරීම	7
	වියමන් චිත්‍ර පිළියෙල කිරීම	
17.37.	ගබඩා කර ගත් GPS ඛණ්ඩාංක දත්ත QGIS/ArcGIS භාවිතා කර නියැකීම	7
17.38.	සෑම සංවෘත බිම් කැබැල්ලකටම අංකයක් ලබාදිය යුතු බව	7
17.39.	වියමන් චිත්‍රයේ (Fabric Diagram) යෙදිය යුතු සටහන	7
	ඇමුණුම්	
ඇමුණුම 01	ජාතික බිම් කැබලි වියමන-දත්ත එකතු කිරීමේ පත්‍රිකාව	8
ඇමුණුම 02	රේඛා සඳහා දත්ත ව්‍යුහය	11
ඇමුණුම 03	ලක්ෂ්‍යයන් සඳහා දත්ත ව්‍යුහය	12
ඇමුණුම 04	දිස්ත්‍රික් කේත	13
ඇමුණුම 05	කලාප කේත	14
ඇමුණුම 06	පිඹුරු වර්ග සඳහා කේත	15

17 වැනි පරිච්ඡේදය

විවිධ

විශේෂ මැනුම් කටයුතු

17.1. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ක්‍රියාත්මක කරන විශේෂ මැනුම් කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක් ගොනුව බැගින් දිස්ත්‍රික්කය තුල ඇති සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ගොනු දිස්ත්‍රික් කාර්යාලයේ පවත්වා ගත යුතුය.

හිමිකම් පිඹුරු, රේඛා චිත්‍ර

17.2. හිමිකම් පිඹුරු පිටපත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය මඟින් හෝ අදාළ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය DMS දත්ත පද්ධතිය මඟින් නිකුත් කළ යුතුය. අනෙකුත් රේඛා චිත්‍ර, බදු රේඛා චිත්‍ර ආදිය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය මඟින් නිකුත් කළ යුතුය. රේඛා චිත්‍ර නිකුත් කිරීම් සටහන් කිරීමේ ලේඛන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වා ගෙන යා යුතු අතර ග්‍රාම නිලධාරී කොට්ඨාශ සඳහා වෙනමම පිටු වෙන් කර ඒ යටතේ නිකුත් කිරීම් සටහන් තැබිය යුතුය.

17.3. LDO රේඛා චිත්‍ර නිකුත් කිරීමේ ලේඛනයේ තොරතුරු, ඊට සමගාමීව දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ‘Staff Access” හි “Issue LDO Diagram” දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතුය.

17.4. අවසාන ගම් පිඹුරු ප්‍රදේශයකට අයත් L, O සහ V රේඛා චිත්‍ර අංක කර නිකුත් කළ පසු දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් නිකුත් කරන ලද රේඛා චිත්‍ර වල අංක ඉඩම් විස්තර ලැයිස්තුවේ හා එහි පිටපත් වල අදාළ කැබලි අංක ඉදිරියෙන්ද ක්ෂෙත්‍ර පත්‍රයේ බිම් කැබැල්ල තුළ ද රතු පාටින් ඇතුලත් කළ යුතුය. ඊට සමගාමීව නිකුත් කරන ලද රේඛා චිත්‍ර පිළිබඳ තොරතුරු ProMS දත්ත පද්ධතියටද ඇතුලත් කළ යුතුය.

අවසාන වාර්තා

17.5. යම් ගමක මායිම් නියම කිරීමේ මැනුම් නිම කළ පසු, ඒවා භාවිතයෙන් ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින්ද සියළු නිරවුල් කිරීම් අවසන් කළ පසු එම ගම තුල වන සියළුම ඉඩම් කැබලි පිළිබඳව ක්‍රියා කළ ආකාරය දැක්වෙන අවසාන වාර්තාවක් නිරවුල් කිරීමේ නිලධාරී විසින් සර්වේයර් ජනරාල් වෙත එවීම සිදු කරයි.

17.6. එම අවසාන වාර්තාවේ සඳහන් වන නිරවුල් කිරීම් පැහැදිලි කර දීම සඳහා 1:25,000 පරිමාණයට ප්‍රධාන කාර්යාලයේදී නිරවුල් කිරීමේ පිඹුරක් සකස් කර අවසාන වාර්තාව මුද්‍රණයට යැවිය යුතුය.

17.7. නිරවුල් කිරීමේ නිලධාරී වෙතින් අවසාන වාර්තාව ජ්‍යෙෂ්ඨ නි.ස.ප (ලේ.ක හා වෘ.ප්‍ර) වෙත ලද වහාම ඒ බව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත දන්වා යැවිය යුතුය.

අවසාන ගම් පිඹුරු

17.8. අවසාන ගම් පිඹුර හා ඉඩම් විස්තර ලැයිස්තුව සකස් කිරීමේ කටයුතු ප්‍රධාන කාර්යාලයේදී ආරම්භ කරනු ලැබේ. අවසාන වාර්තාව නිකුත් කිරීමෙන් පසු කරන මැනුම් වැඩ කිසිවක් ඇත්නම් ඒවා අවසාන ගම් පිඹුරට ඇතුලත් කිරීම සඳහා අවසාන ගම් පිඹුර මුද්‍රණය කිරීමට ප්‍රථම ප්‍රධාන කාර්යාලයේ

ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය වෙත දන්වා එවීමට හෝ එසේ කිරීමට නොහැකි වුවහොත් ඒවා දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී ඇතුලත් කිරීම හෝ කළ යුතුය.

17.9. අවසාන ගම් පිඹුර A3 ප්‍රමාණයේ පත්‍රයක් ලෙස හෝ A3 ප්‍රමාණයේ කොටස් කිහිපයක් වශයෙන් හෝ මුද්‍රණය කර අවසාන වාර්තාව හා ඉඩම් වෙන් කිරීමේ රේඛා චිත්‍රයද සමඟ කාඩ්බෝඩ් පිට කවර දෙකක් තුළ ගොනු කළ යුතුය.

17.10. අවසාන ගම් පිඹුරු මුද්‍රණය කළ පසු එහි පිටපතක් බැගින් අදාළ ප්‍රාදේශීය ලේකම් හා නිරවුල් කිරීමේ නිලධාරි වෙතද, පිටපත් දෙකක් දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ද නිකුත් කරනු ඇත. ප්‍රාදේශීය ලේකම් වෙත පිටපත නිකුත් කරන්නේ ඔහුගේ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා වේ. දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත නිකුත් කරනු ලබන අවසාන ගම් පිඹුරු පිටපත් දෙකෙන් එක් පිටපතක් මිනින්දෝරුවරුන්ගේ ප්‍රයෝජනය සඳහා ක්ෂෙත්‍ර පිටපත ලෙසද, අනෙක් පිටපත දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා කාර්යාල පිටපත ලෙසද භාවිතා කළ යුතුය.

17.11. එම ප්‍රදේශයේ පසුව කෙරෙන සියළුම මැනුම් අවසාන ගම් පිඹුර පාදක කර ගනිමින් සිදු කළ යුතුවේ.

17.12. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත අවසාන ගම් පිඹුරක් ලද විගස, මුල් ගම් මැනුමේ ඉඩම් විස්තර ලැයිස්තු සියල්ල අවලංගු කර ඒ බව ජ්‍යෙෂ්ඨ නි.ස.ජ (ලේ.ක හා වෘ.ප්‍ර) වෙත දන්වා යැවිය යුතුය.

17.13. වසරකට පසුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ගමට අයත් ගොනුවේ ඇති ලිපි තෝරා බලා මැනුම් ක්‍රමය, බිම් ප්‍රමාණය ගණන් බැලීමේ පත්‍ර, විස්තර මැනීමේ ඛණ්ඩාංක යනාදි වෙනත් වැදගත් ලිපි හැර අනෙකුත් සියළුම නොවැදගත් ලිපි විනාශ කළ යුතුය.

අත් මිහිතැන් ගැන්වුම් උපකරණය මඟින් දත්ත රැස් කිරීම (Hand Held GPS)

17.14. 13.16 ඡේදයෙහි පරිදි නිරවද්‍යතා මට්ටම III පන්තියේ දක්වා ඇති නිරවද්‍යතාවයකට දත්ත රැස්කිරීම ප්‍රමාණවත් වන, අනුරේඛනයක් සකස්කිරීමට ඇති මැනුම් ඉල්ලීමක් සඳහා, දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අත් මිහිතැන් ගැන්වුම් (HHGPS -Hand Held GPS) උපකරණ මඟින් මැනීමට උපදෙස් නිකුත් කළ යුතුය. මැනුමට ගැලපෙන නිරවද්‍යතාවයකින් දත්ත රැස් කළ යුතු අතර 11 වැනි පරිච්ඡේදයෙහි ඇමුණුම 04 හා **ඇමුණුම 05** පරිදිම ක්ෂෙත්‍ර සටහන් තැබීම සහ ඛංඩාංක ක්ෂෙත්‍ර පොතේ ඇලවීම සිදු කළ යුතුය. HHGPS හි SLD 99 ඛණ්ඩාංක පද්ධතියට සීරු මාරු කර තිබිය යුතුය. ඉඩම්වල මායිම් වල ඇති සියළුම හැරවුම් ලක්ෂ්‍ය වල ඛණ්ඩාංක ගබඩා කර ගත යුතුය.

17.15. දැනට පවතින වට මායිම්, පැරණි ව්‍යවස්ථාපිත පිඹුරක මායිමක් වන විට එම මායිම් හා පැරණි මායිම් අතර වෙනස මීටර් 5 කට අඩු වන විට පැරණි මායිම් නිවැරදි ලෙස සලකා නැවත නියැකීම කළ යුතුය. වෙනස මීටර් 5කට වැඩි වන විට නව මායිම් මැන අනුරේඛනයට ඇතුළත් කළ යුතුය.

17.16. ඉඩම තුල සහ වටේ ඇති සියළුම මායිම් (පැරණි මැනුම් නියැකීම මඟින් ආවරණය නොවන) HHGPS උපකරණ මඟින් ඛණ්ඩාංක ගත කොට නියැකීම සිදු කළ යුතුය. ඉඩම තුළ ඇති ජල මාර්ග හා පොදු මාර්ග පෙන්විය යුතු අතර ගොඩනැගිලි පෙන්විය යුතු නැත.

17.17. HHGPS උපකරණ මඟින් ඛණ්ඩාංක ලබා ගත නොහැකි එනම් භෞතිකව ළඟාවිය නොහැකි පිහිටීම් ඇති නමුත් වන්දිකා ඡායාරූපයක එම මායිම් පැහැදිලිව හඳුනා ගත හැකි විශේෂ අවස්ථා වලදී පමණක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ පූර්ව අවසරය මත 11.68 ඡේදය අනුව දත්ත රැස් කළ යුතුය.

17.18. චන්ද්‍රිකා ඡායාරූපය භාවිතා කර දත්ත රැස්කිරීමට තීරණය කරන්නේ නම් එම මායිම් කොටසේ දෙකෙලවර මායිම් ලක්ෂ්‍ය (හැරවුම් ලක්ෂ්‍ය) උපරිම වශයෙන් මීටර 300 කට සීමා වන සේ ලී කුඹුක්කු සිටුවා ඒ මත HHGPS මඟින් මායිම් ලකුණු කොට ඒ ලක්ෂ්‍ය අතර මායිම් කොටස පමණක් චන්ද්‍රිකා ඡායාරූපයෙන් අංකිතකරණය කළ හැකිය. මෙම අංකිත ඛණ්ඩාංකද පිරික්සුම් සටහනට යොමු කර ක්ෂේත්‍ර පොතට ඇතුලත් කළ යුතුය. මෙම මැනුම් සිදු කළ ආකාරය පිළිබඳව සටහනක් අනුරේඛනයට හා මිනින්දෝරු වාර්තාවට ඇතුලත් කළ යුතුය.

17.19. වර්ගඵලය හෙක්ටයාර් 100 වැඩි නම් ආසන්න හෙක්ටයාරයට හා වර්ගඵලය හෙක්ටයාර් 100 අඩු නම් ආසන්න දශම ස්ථානයට හෙක්ටයාර වලින් දැක්විය යුතුය.

17.20. මෙම මැනුම් කටයුතු කිරීමේදී සකස් කරන ලද පිඹුරට අමතරව පහත දක්වන අංකිත දත්ත ගොනු මැනුම් ඉල්ලීම් සමග දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගොනු කර තබා ගත යුතුය. එම අංකිත දත්ත ගොනු SRIMS දත්ත පද්ධතිය හරහා ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත එවිය යුතුය. SRIMS දත්ත පද්ධතියේ Project යටතේ උදා:- ලෙස Plantation Surveys හෝ මැනුමේ යොමුව ඇතුලත් කිරීම අනිවාර්යවේ.

අංකිත දත්ත Zip ගොනුව තුල

- HHGPS උපකරණ මඟින් ලබා ගන්නා ලද way point සහ track වලට අදාළ .gpx ගොනු
- මැනුමේ අංකිත දත්ත ගොනුව (dxf)
- මැනුම් දත්ත google earth මත ප්‍රක්ෂේපණය කිරීම සඳහා සකස් කරන ලද .kml ගොනුව

මෙම දත්ත ගොනු අංක කිරීමේදී අනුරේඛනයේ අංකය නාමකරණය සඳහා භාවිතා කළ යුතුය.

චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර වියමන් චිත්‍ර පිළියෙල කිරීම සඳහා දත්ත රැස් කිරීම

17.21. වැඩි විභේදනයක් (එනම් 50 සෙ.මී හෝ ඊට වැඩි) සහිත යාවත්කාලීන චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර වියමන් දත්ත රැස්කිරීම සිදු කළ හැක. මෙසේ වියමන් චිත්‍ර පිළියෙල කිරීමේදී සෑම විටම ග්‍රාම නිලධාරි වසම පාදක ඒකකය ලෙස ගත යුතුය.

17.22. වියමන් චිත්‍ර පිළියෙල කිරීම සඳහා දත්ත රැස් කිරීම
මෙහිදී තෝරාගත් ග්‍රාම නිලධාරි වසම තුල

- මැනුම් කර අංකිත ආකාරයෙන් දත්ත තිබෙන ප්‍රදේශ
- දෙපාර්තමේන්තු පිඹුරු ඇති ප්‍රදේශ (එනම් අංකිත දත්ත නොමැති පිඹුරුවල වටමායිම් අංකිතකරණය කර මෙම වසම් මායිම තුලට ඇතුලත් කිරීම)

හැර ඉතිරි ප්‍රදේශ සඳහා චන්ද්‍රිකා දත්ත වලින් වියමන් පාදකය සඳහා දත්ත රැස් කිරීම සිදු කළ යුතුය.

17.23. දත්ත රැස් කරන ප්‍රදේශය තුල ඇති පහසුවෙන් හඳුනාගත හැකි මාර්ග හා ජලමාර්ග පලමුව අංකිතකරණය කළ යුතුය. මෙහිදී මාර්ගයේ දෙපස මායිම් හා ජල මාර්ගවල පැහැදිලි මායිම් චන්ද්‍රිකා ඡායාරූප මත ලකුණු කිරීමෙන් අනතුරුව හඳුනාගත් ඉඩම් මායිම් චන්ද්‍රිකා ඡායාරූපයේ ලකුණු කළ යුතුය.

17.24. මායිම් සලකුණු කිරීමට නොහැකිවූ බිම් කැබලි සඳහා අත් මිහිතැන් ගැන්වුම් (Hand Held GPS-HHGPS) උපකරණ මඟින් මායිම් දත්ත රැස්කර ගත යුතුය. HHGPS උපකරණයේ ගබඩා කර ගත්

මෙම දත්ත පරිගණකයට බාගත කර වියමන සම්පූර්ණ කළ යුතුය. වන්ද්‍රිකා ඡායාරූපයෙන් ලකුණු කරගත් මායිම් වලින් 10% ක් HHGPS මඟින් පරීක්ෂා කර නිවැරදිදැයි තහවුරු කර ගත යුතුය.

17.25. වියමන් තොරතුරු රැස්කිරීමේදී ලියාපදිංචි බලයලත් මිනින්දෝරු පිඹුරක් ඇති අවස්ථාවල එම පිඹුරේ දැක්වෙන හා දැනට ක්ෂේත්‍රයේ හඳුනාගත හැකි ස්ථාන තුනක (අවම වශයෙන්) ඛණ්ඩාංක HHGPS උපකරණයක් මඟින් ලබා ගෙන එම පිඹුරද අංකිතකරණය කර වියමනට ඇතුලත් කළ හැක. එවැනි අවස්ථාවල නැවත වන්ද්‍රිකා ඡායාරූප හා/හෝ HHGPS උපකරණයෙන් දත්ත රැස්කිරීම අවශ්‍ය නොවේ.

17.26. ග්‍රාම නිලධාරි වසම තුල මායිම් දත්ත රැස්කරන සියළුම ඉඩම් සඳහා ඇමුණුම 01 හි සඳහන් තොරතුරු රැස් කිරීම සිදු කළ යුතුය. මෙහිදී වසමේ ග්‍රාම නිලධාරි මඟින් මෙම පෝර්මය (දත්ත පත්‍රය) ඉඩම් හිමියන්ට භාර දී පෝරමය පිරවීම සඳහා උපදෙස්ද ඉඩම් හිමියන්ට ලබා දිය යුතුය. පෝරමය පිරවීම සඳහා ඇමුණුම 01 හි ඇති උපදෙස් පලමුව ග්‍රාම නිලධාරින්ට පහදා දී සාම්පලයක් සකස් කර භාර දීමෙන් අවශ්‍ය තොරතුරු සටහන් කිරීම සරළ කර ගත හැක.

වියමන් ක්ෂේත්‍ර දත්ත සටහන් කැබීම

17.27. ඉහත ආකාරයට රැස්කර ගන්නා ඉඩම් මායිම්වල අංකිත දත්ත වලින් පිළියෙල කරන වියමන් චිත්‍රයේ දළ සටහනක් ක්ෂේත්‍ර පොතක ඇඳ ඉඩමට අනන්‍ය වූ අංකයක් ලබා දිය යුතුය. ඉඩමේ විස්තර අඩංගුවන **ඇමුණුම 01** හි ඇති හිමිකම්පාන්නන් විසින් සම්පූර්ණ කරන ලද දත්ත පත්‍ර එකතු කරන අවස්ථාවේදීම එම ඉඩම් කැබැල්ල සඳහා ක්ෂේත්‍ර පොතේ සටහන් කළ අංකයම අනුක්‍රමික අංකය ලෙස සටහන් කළ යුතුය. මෙම දත්ත පත්‍ර අංකිතකරණය සඳහා දෙපාර්තමේන්තු OLD TL System හි Add Collected Data භාවිතා කළ යුතුය.

17.28. ක්ෂේත්‍ර පොතේ පිට කවරයේ 'බිම් කැබලි වියමන' යන්න සටහන් කර වසමේ නම සහ යොදාගත් කැඩැස්තර සුචි අංකය, ග්‍රාම නිලධාරි කොට්ඨාශ අංකය සහ නමද ඇතුලත් කළ යුතුය.

බිම් කැබලි අංකිතකරණය සඳහා උපදෙස්

17.29. බිම් කැබලි අංකිතකරණය සඳහා උපදෙස් පහත දී ඇත.

- ❖ Geo-referenced image වල බිම් කැබලි අංකිතකරණය

geo-referenced කර විචිත්‍රකරණයෙන් පසු පිඹුරේ කැබලි අංකිතකරණය ආරම්භ කළ හැක. නැවත වාරයක් මෙම geo-referenced image හි ඛණ්ඩාංක SLD_99 ජාතික පාලන ජාල ඛණ්ඩාංක දැයි ස්ථීර කර ගන්න. මෙහිදී manual/semi-automatic/automatic ආකාරයට සිදු කළ හැක. තෝරා ගන්නා ක්‍රමය මුල් පිඹුරු පිටපතේ තත්වය මත රඳා පවතී. අංකිතකරණය semi-automatic/automatic ආකාරයට සිදු කරන්නේ නම් පලමුව Image cleaning සිදු කළ යුතුය. මේ සඳහා Photoshop මෘදුකාංගය භාවිතා කළ හැක. දෙපාර්තමේන්තුවේ අංකිතකරණය සඳහා QGIS මෘදුකාංගය භාවිතා කරන බැවින් දැනට semi-automatic/automatic ආකාරයට අංකිතකරණය සඳහා උපදෙස් ලබාදී නැත.

QGIS මෘදුකාංගය භාවිතා කර Polyline ආකාරයට අංකිතකරණය කළ යුතු වන අතර මුල් ඇඳීම් විකෘති නොවන පරිදි අංකිතකරණය කළ යුතුය.

17.30. අංකිතකරණය සඳහා වන නීති

- පලමුව snap කිරීම සඳහා අගයන් තෝරාගන්න. මෙහිදී මුල් පිඹුරේ පරිමාණය අනුව තීරණය කළ යුතුය. (1:4000 – 1මීටර, 1:2000 - 0.5 මී, 1:10000 – 1-2 මී)
- අංකිතකරණය Polyline ආකාරයට සිදු කළ යුතුය.

- සෑම මායිම් ලක්ෂ්‍යයක (උදා. ග. සිට .ග දක්වා) සිට තව මායිම් ලක්ෂ්‍යයක් යා වන රේඛා ඍජු රේඛාවකින් යා කිරීම සිදු කළ යුතුය.
- සෑම මායිම් ලක්ෂ්‍යයක්ම එම රේඛා දත්ත වලින් උධෘත කරගෙන ඒවා ලක්ෂ්‍යය ස්ථරයක node ආකාරයෙන් ගබඩා කළ යුතුය.
- රේඛා දෙකක් ඡේදනය වන විට node එකක් තිබිය යුතුය. ලක්ෂ්‍ය දෙකක් වේ නම් ඒවා රේඛාවකින් යා විය යුතුය.
- එකම රේඛාව දෙවතාවක් නොඇඳිය/අංකිතකරණය නොකළ යුතුය.
- පොදු මායිම් එක් වරක් පමණක් අංකිතකරණය කළ යුතුය.
- රේඛා ලෙස අංකිතකරණය කර එයින් nodes සහ polygon ස්ථර සෑදිය යුතුය. සකස් කරන සෑම බහුඅස්‍රයක්ම (polygon) සංවෘත විය යුතු අතර එයට වර්ගඵලයක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය. මෙම බහුඅස්‍ර අංගයන් අතර හිඩැස්, කුඩා බහුඅස්‍ර ප්‍රදේශ හෝ අතිච්ඡාදනය වීම් නොතිබිය යුතුය. සෑම විටම අංකිතකරණය කරන අංගයන් (plan features) polyline, nodes සහ polygons ආකාරයට ගබඩා කළ යුතුය.
- සංකේත ආකාරයට ඇති දේවල්ද අංකිතකරණය කිරීමේදී සම්මත සංකේත භාවිතා කළ යුතුය.
- ඒවා වෙනමම symbols ලෙස දත්ත ස්ථරයක ගබඩා කළ යුතුය.

17.31. දත්ත ව්‍යුහය (Data Structure)

කැබලි අංකිතකරණයේදී polyline, nodes සහ polygons ආකාරයට දත්තයන් පිළියෙල කළ යුතුවේ.

17.32. රේඛා සඳහා දත්ත ව්‍යුහය

මෙහිදී දත්ත අංකිතකරණය කිරීම හා සමාන්තරවම සෑම රේඛාවකම සඳහන් විස්තරය කේත කිරීමකට ලක්විය යුතුය. ඒ සඳහා භාවිතා කළ යුතු සම්මත කේත ඇමුණුම 02 හි දක්වා ඇත.

Field Name	Field Type	Field length	Remarks
DSR_IX_ID	numeric	4	
DSR_IX_AS	Text	6	Only for Sinhala text in a plan
DSR_IX_AE	Text	6	Only for English text in a plan

17.33. ලක්ෂ්‍යයන් සඳහා දත්ත ව්‍යුහය

මෙහිදී දත්ත අංකිතකරණය කිරීම හා සමාන්තරවම සෑම ලක්ෂ්‍යයක්ම කේත කිරීමකට ලක්විය යුතුය. ඒ සඳහා භාවිතා කළ යුතු සම්මත කේත ඇමුණුම 03 හි දක්වා ඇත.

Field Name	Field Type	Field length	Remarks
DSR_IX_ID	numeric	4	
DSR_IX_AS	Text	6	Only for Sinhala text in a plan
DSR_IX_AE	Text	6	Only for English text in a plan

17.34. බහුඅස්‍ර සඳහා දත්ත ව්‍යුහය

පිඹුරේ ඇති වටකිර තොරතුරු (marginal information) භාවිතා කර පහත සඳහන් දත්ත ව්‍යුහයට අවශ්‍ය වන විස්තරයන් සියල්ලම ඇතුලත් වන පරිදි අංකිතකරණයට පෙර හිස් ගොණුවක් (empty shape file එකක්) සකස් කර ගත යුතුය.

Field Name	Field Type	Field length	විස්තරය
district_c	Text		සම්මත දිස්ත්‍රික් කේත අගයන් ඇමුණුම 04 හි දක්වා ඇත.
cmi_index	Text		දිස්ත්‍රික්කයෙන් cmindex ලෙස ඉ.තො.ප. අංශය වෙත ලබා දී ඇති අංකය, www.lis.survey.gov.lk හි දක්වා ඇත.
block_code	Text		ඇමුණුම 05 හි සඳහන් අගයන්ගෙන් තෝරාගන්න.
cm_lot	Text		අවශ්‍ය නොවේ. හිස්ව තබන්න.
plan_type	Text		ඇමුණුම 06 හි දීඇති අගයන්ගෙන් තෝරාගන්න.
plan_d_code	Text		වෙනත් දිස්ත්‍රික්ක වල පිඹුරු සඳහා දැන් මෙම දිස්ත්‍රික්කයේ කේතය යොදන්න. නැත්නම් හිස්ව තබන්න.
plan_No.	Text		පිඹුරු අංකය (අ.ග.පි. 12 නම් 00012, මුපිකො 2345 නම් 02345)
inset_No	Text		F.V.P., Topo P.P. සඳහා පමණක් අතුරු පිඹුර 25 සඳහා 0025, අනෙක් පිඹුරු සඳහා හිස්ව තබන්න.
sup_No	Text		FVP, Topo PP සඳහා පමණක්, අතිරේක 25 සඳහා 0025, අනෙක් පිඹුරු සඳහා හිස්ව තබන්න.
sht-No	Text		තිබෙනම් අංක 4ක් වනසේ සම්පූර්ණ කරන්න. (පත්‍ර 2-0002)
village_na	Text		පිඹුරේ සටහන්ව ඇති ගමේ නම, ඉංග්‍රීසියෙන් මුල අකුර Capital (Mahawa)
gnd_name	Text		ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නම සොයාගත හැකිනම් , ඉංග්‍රීසියෙන් මුල අකුර Capital (Mahasenpura) . නැත්නම් හිස්ව තබන්න.
gnd_code	Text		ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ අංකය සොයාගත හැකිනම් , භාවිතාවන ආකාරයට. නැත්නම් හිස්ව තබන්න.
place_name	Text		සොයාගත හැකිනම් , ඉංග්‍රීසියෙන් මුල අකුර Capital (Mahasenpura) . නැත්නම් හිස්ව තබන්න.
Lot_No	Text		පිඹුරේ සටහන්ව ඇති බිම් කැබලි අංකය. අංක 23 නම් 00023 ලෙස සම්පූර්ණ කරන්න
Lot_suffix	Text		භාග කැබලි අංක වේනම් පමණක් උදා. කැබලි අංක 12 ½ යන්න සඳහා Lot_No හි 00012 යන්නත් 01Z2 යන්න මෙම තීරයේත් ස්ථාන 4ක් සම්පූර්ණ වන පරිදි capital Z සහිතව ලියන්න. භාග කැබලි නැත්නම් හිස්ව තබන්න
pcl_id_con			සම්පූර්ණ කිරීම පසුව කරයි.
pcl_id_Fabri			සම්පූර්ණ කිරීම පසුව කරයි.
st_area			සම්පූර්ණ කිරීම පසුව කරයි.
St_length			සම්පූර්ණ කිරීම පසුව කරයි.

17.35. දත්ත ගොනු නම් කිරීම

අංකිත දත්ත නොමැති කැඩැස්තර පිඹුරු අංකිතකරණය කළ විට එම ගොනු , වටමායිම් Plan_type + Plan ref + lot.shp ලෙසද අනෙකුත් අංකිතකරණය කරන ලද වටමායිම් අඩංගු ගොනු District code + Plan_ref + lot.shp ලෙසද නම් කරන්න.

උදා :- **පැරණි කැඩැස්තර නොවන පිඹුරු සඳහා**

1. 52 pplanco3234lot.shp
   හෝ
2. 81 FvpMAHA432sup3lot.shp ලෙසද ,

කැඩැස්තර පිඹුරු සඳහා

1. 12520001B12sh1lot.shp ලෙසද , නම් කළ හැකිය

17.36. සියළුම දත්ත පත්‍ර අනුක්‍රමික අංක පිළිවෙලට තබා ගොනු කර කවරයේ 'බිම් කැබලි වියමන' යන්න සටහන් කර කවරයේ ඉහත තොරතුරුම ඇතුලත් කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයම සඳහා දත්ත රැස් කිරීම අවසන් කළ පසු දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් එම දත්ත පත්‍ර ගොනු විනාශ කිරීම සඳහා තීරණ ලබාදිය යුතුය.

වියමන් චිත්‍ර පිළියෙල කිරීම

17.37. ගබඩා කර ගත් GPS බණ්ඩාංක දත්ත QGIS/ArcGIS භාවිතාකර නියැකීම කරන්න. මෙහිදී මායිම් රේඛා සහ මායිම්/හැරවුම්/පාලන ලක්ෂ්‍යයන් එක් දත්ත ස්ථරයක (boundary layer & point layer) ගබඩා කළ යුතුය. කැබලි අංකනය හා විස්තර/සංකේත කිරීම් වේ නම් ඒවාද වෙනම දත්ත ස්ථරයක (annotation layer) ගබඩා කළ යුතුය.

17.38. point layer හි ඇති මායිම් හා හැරවුම් ලක්ෂ්‍යයන් යා කර සංවෘත බහුඅස්‍රයන් ගොඩ නගන්න. සෑම සංවෘත බිම් කැබැල්ලකටම අංකයක් ලබා දිය යුතුය. අවසානයේදී අංක 12 කින් සමන්විත වන ආකාරයට බිම් කැබැල්ලකට අනන්‍ය අංකයක් පද්ධතියෙන් ලැබේ. සියළු ඉඩම් කැබලි ඇඳ අවසන් වූ පසු මාර්ග, රක්ෂිත ආදියටද කැබලි අංක ලබාදී දත්ත පත්‍ර නොමැති වුවත් එම විශේෂිත බිම් කැබලි සඳහා වූ විස්තර දෙපාර්තමේන්තු OLD TL System හි ඇතුලත් කළ යුතුය. සංවෘත බහුඅස්‍රයන් සහිත අංකිත දත්ත ගොනුව QGIS/ARCMAP භාවිතා කර වසම සඳහා වන කැඩැස්තර සුචි අංකය_D01.shp, කැඩැස්තර සුචි අංකය _D02.shp ,... ලෙස පිළිවෙලින් අංක කර shape file format වලින් SRIMS දත්ත පද්ධතිය හරහා ඉ.තො.ප. අංශය වෙත එවිය යුතුය. SRIMS දත්ත පද්ධතියේ Project හි "Parcel Fabric Surveys" යන්න අනිවාර්යයෙන්ම ඇතුලත් කළ යුතුය. මෙම shape file format හි අඩංගු විය යුතු විස්තර දත්ත 17.34 ඡේදයෙහි දක්වා ඇත.

17.39. මෙසේ පිළියෙල කරන ඉඩම් කැබැල්ල සඳහා වන වියමන් චිත්‍රයේ (parcel Fabric Diagram) සටහනක් යෙදිය යුතුය. " මෙය මූලික අදියරේ සිතියමකි. එය කිසිම අධිකරණ කටයුතුතකට හෝ අධිකරණයේ තීරණයන් සඳහා භාවිතා කළ නොහැක. දත්ත රැස් කරන ලද්දේ ....." (උදා. වන්ද්‍රිකා ඡායාරූප හා HHGPS භාවිතා කළ බව)

17.26 ඡේදය **ඇමුණුම 01**

අනුක්‍රමික අංකය

කැබලි අංකය

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ජාතික බිම් කැබලි වියමණ - දත්ත එකතු කිරීමේ පත්‍රිකාව

දිස්ත්‍රික්කය : ..... ප්‍රා.ලේ.කො. : .....
ග්‍රා.නි.වසම,කොට්ඨාශ අංකය: ..... ගම : .....

01. ඉඩම් හිමියාගේ නම (පූජ්‍ය./මයා./මිය./මෙවි) : .....

02. ලිපිනය

.....

.....

03. වරිපනම් අංකය සහ වීදිය: ජා.හැ.අං:

04. දුරකතන අංකය: (ස්ථාවර) ජංගම:

05. ඉඩමේ නම:

.....

06. ඉඩමේ හිමිකාරීත්වය : රාජ්‍ය පුද්ගලික වෙනත්

6.1 රාජ්‍ය අංශයේ නම්:

දීමනා පත්‍ර බලපත්‍ර රාජ්‍ය සංස්ථා

6.1.1 දීමනා පත්‍ර නම්:

ජයභූමි ස්වර්ණ භූමි රත්න භූමි වෙනත්

6.1.2 බලපත්‍ර නම්

ඉ.සං.ආ. රජයේ ඉ.ආ. ඉ.ප්‍ර.කො. වෙනත්

6.1.3 රාජ්‍ය සංස්ථා නම්

මහ.න.ස	☐	න.ස.	☐	ප්‍රාදේ.ස.	☐	ඉ.ප්‍ර.කොා.	☐	මා.සං.අධි.	☐
ල.දු.දෙ.	☐	ජ.ව.සං.ම.	☐	උ.ජ.ව.සං.ම.	☐	සෙ.දෙ.	☐	වන සං.දෙ.	☐
වනජීවී දෙ.	☐			අධ්‍යාපන දෙ.	☐			අනවසර	☐

දීමනා පත්‍ර /බලපත්‍ර /ඔප්පු අංකය: :..... දිනය : D D M M Y Y Y Y

ඔප්පුවේ සඳහන් බිම් ප්‍රමාණය: අක්.....රූඩ්.....පර්..... (හෙක්:.....)

පිඹුරු (ප්ලෑන්) අංකය (තිබේ නම්): ..... දිනය: D D M M Y Y Y Y

වෙනත් කිවයුතු කරුණු වේ නම් .....

.....

.....

.....

.....

6.2 පෞද්ගලික ඉඩමක් නම් :

පිඹුරු (ප්ලෑන්) අංකය(තිබේ නම්)..... දිනය: D D M M Y Y Y Y

පිඹුරෙහි (ප්ලෑනේ) බිම් ප්‍රමාණය: අක්.....රූඩ්.....පර්..... (හෙක්:.....)

පිඹුරෙහි (ප්ලෑනේ) සඳහන් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාගේ නම .....

.....

ඔප්පු අංකය: ..... දිනය: D D M M Y Y Y Y

ඔප්පුවේ සඳහන් බිම් ප්‍රමාණය: අක්.....රූඩ්.....පර්..... (හෙක්:.....)

නොතාරිස්වරයාගේ නම: .....

ඉඩම ලියාපදිංචි කළේ නම් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය: .....

ඉඩමේ පිහිටීම



07. ඉඩම් පරිහරණය**:**

7.1 විධික්‍රම 01

ගොඩ ඉඩම් ☐ කුඹුරු ☐ ජල මූලාශ්‍ර ☐

7.2 විධික්‍රම 02

පොල් ඉඩම් (අක්කර 50 අඩු) ☐ පොල් ඉඩම් (අක්කර 50 වැඩි) ☐

වනාන්තර ☐ කුඹුරු ☐ රබර් ☐

තේ ☐ වතු ☐

වෙනත් (විශේෂිත)……

08. ඉඩම් හිමියාගේ අත්සන ::……..…… දිනය: D D M M Y Y Y Y

09. දත්ත එකතු කරන්නාගේ නම :…… දිනය: D D M M Y Y Y Y

දත්ත එකතු කරන්නාගේ තනතුර (ර.මී. / සි.තා.නි./ සං.නි.) වේලාව: H M

ග්‍රාම නිලධාරිවරයාගේ/වරියගේ අත්සන …… දිනය D D M M Y Y Y Y

17.32 ඡේදය ඇමුණුම 02

රේඛා සඳහා දත්ත ව්‍යුහය

DSR_IX_AE	DSR_IX_AS	DSR_IX_ID
B	ඉ	101
BUND	වැක	102
BW	මාතා	103
DF	ඉවැ	104
Dt	අගල	105
EDn	කකා	106
Hg	බවැ	107
IF	යවැ	108
LF	පැවැ	109
MDn	සිකා	110
RW	ආතා	111
SF	ගවැ	112
WLF	කපැවැ	113
WF	කවැ	114
WNF	කදැවැ	115
U	අවි	116
W	බි	117
TE	තාගැ	118
Cu	ගැබැ	119
Rg	නි	120
RI	මාඳු	121

17.33 ඡේදය ඇමුණුම 03

ලක්ෂ්‍යයන් සඳහා දත්ත ව්‍යුහය

DSR_IX_AE	DSR_IX_AS	DSR_IX_ID
L	ග	
RL	පිග	
St	ලී	
N	අ	
IR	යක	
	සික	
	මාක	
	සිස	
	ල	
EP	වික	
	දුක	
Road(H)	මාර්ග (ම)	
Road(PS)	මාර්ග (ප්‍රාස)	
Road(ID)	මාර්ග (වා)	
Road(LD)	මාර්ග (ඉ)	
Road(RDA)	මාර්ග (මාසංඅ)	
Road(MC)	මාර්ග (නස)	
FP	අපා	
SM	මපාල	
LB	තැපෙ	
M	කාක	
Cul	බෝ	
FL	කැග	
AL	පුග	
T	අ	
Ty	තා	
P	ස්	
C	ඡ	
	ස	
	ලීක	

17.34 ඡේදය ඇමුණුම 04

දිස්ත්‍රික් කේත

දිස්ත්‍රික්කය	කේතය
අනුරාධපුර	1
පොළොන්නරුව	1
ත්‍රිකුණාමලය	2
මඩකලපුව	2
අම්පාර	2
මාතලේ	3
මහනුවර	3
නුවරඑලිය	3
පුත්තලම	4
කුරුණෑගල	4
ගම්පහ	5
කොළඹ	5
කළුතර	5
කෑගල්ල	6
රත්නපුර	6
බදුල්ල	7
මොනරාගල	7
ගාල්ල	8
මාතර	8
හම්බන්තොට	8
යාපනය	9
කිලිනොච්චිය	9
මුලතිව්	9
මන්නාරම	9
වව්නියාව	9

කලාප කේත

Methodology	Code
Geo-referencing using Google Image coordinates	86
Geo-referencing using Mobile GPS coordinates	87
Geo-referencing using Old Map sheet Reference coordinates	88
Geo-referencing using Plan Grid coordinates	89

17.32 ඡේදය ඇමුණුම 06

පිඹුරු වර්ග

මැනුම් පිඹුරු වර්ග: පිඹුරු වර්ගය කේත මඟින් දක්වා ඇත.				
Survey Plan Type: Plan Type is defined with digit-Code				
Plan Type	**පිඹුරු වර්ගය**	**කේත**	**සංක්ෂිප්ත නාම**	**Abbreviations**
Preliminary Plan (with District Prefix)	මූලික පිඹුර (දිස්ත්‍රික් උපසර්ග සහිත)	11	මූපි ..	PP..
Cadastral Map	කැඩැස්තර සිතියම	12	කසි	CM
Topo.PP	භූලක්ෂණාත්මක මූලික පිඹුර	13	භූමූපි	TopoPP
Final Topo Plan	අවසාන භූලක්ෂණාත්මක පිඹුර	14	අභූපි	FTP
Village Plan	ගම් පිඹුර	15	ගපි	VP
Final Village Plan	අවසාන ගම් පිඹුර	16	අගපි	FVP
Colony Plan	ජනපද පිඹුර	17	ජපි	CP
Final Colony Plan	අවසාන ජනපද පිඹුර	18	අජපි	FCP
Forest Survey Plan	කැලෑමැනුම් පිඹුර	19	කැමැපි	FSP
Forest Survey Preliminary Plan	කැලෑ මැනුම් මූලික පිඹුර	20	කැමැමූපි	FSPP
Irrigation Survey Preliminary Plan	වාරිමාර්ග මැනුම් මූලික පිඹුර	21	වාමැමූපි	ISPP
Final Urban Plan	අවසාන නගර පිඹුර	22	අනපි	FUP
Court Commission Surveys	අධිකාරිපත්‍ර මැනුම්	23		
ES Sheets	ඉංජිනේරු මැනුම් පත්‍ර	24	ඉමැප	ESS
Tracings	අනුරේඛන	25		
Title Plan	හිමිකම් පිඹුර	26	හිපි	TP
Crown Title Plan	රජයේ හිමිකම් පිඹුර	27	රහිපි	CTP
Temple Title Plan	විහාර හිමිකම් පිඹුර	28	විහිපි	TTP
Town Plan	නගර පිඹුර	30	නපි	TWNP
Town Survey Plan	නගර මැනුම් පිඹුර	31	නමැපි	TSP
Town Survey Preliminary Plan	නගර මැනුම් මූලික පිඹුර	32	නමැමූපි	TSPP
Miscellaneous Survey Preliminary Plan	විවිධ මැනුම් මූලික පිඹුර	33	විමැමූපි	MSPP
Condominium Plan	සහාධිපත්‍ය පිඹුර	34		
Chena Survey Preliminary Plan	හේන් මැනුම් මූලික පිඹුර	35	හේමැමූපි	CSPP
Cadastral Map (Digitized)	කැඩැස්තර සිතියම් (අංකිතකරණය කරන ලද)	36		CMD
Block Survey Village Plan	ලංකා මැනුම් ගම් පිඹුර	37	ලංමැගපි	BSVP
Block Survey Preliminary Plan	ලංකා මැනුම් මූලික පිඹුර	38	ලංමැමූපි	BSPP
Crown Land Plan	රජයේ ඉඩම් පිඹුර	39	රඉපි	CLP
Urban Plan	නගර පිඹුර	40		
Standard Preliminary Plan	සම්මත මූලික පිඹුර	41	සමූපි	PPS
Preliminary Plans with suffix	උපසර්ග සහිත මූලික පිඹුර	42	මූපි ඒ	PPA
Final Settled Plans	අවසාන නිරවුල් පිඹුර	43	අනිපි	FSP
Final Settled Preliminary Plans	අවසාන නිරවුල් මූලික පිඹුර	44	අනිමූපි	FSPP
Preliminary Plan (without District Prefix)	මූලික පිඹුර (දිස්ත්‍රික් උපසර්ග රහිත)		මූපි	PP

ශුද්ධි පත්‍රය

18 වැනි පරිච්ඡේදය

සභාධිපත්‍ය දේපළ මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	සභාධිපත්‍ය දේපළ හා අනුශාංගික නීති	
18.1.	සභාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සඳහා සභාධිපත්‍ය දේපළ මැනුම් කිරීම	1
18.2.	සභාධිපත්‍ය දේපළ වර්ග කිරීම	1
18.3.	සභාධිපත්‍ය නීතියේ දක්වා ඇති විශේෂ කරුණු	1
	සභාධිපත්‍ය පිඹුරක සංයුතිය	
18.4.	සභාධිපත්‍ය පිඹුරක සංයුතිය	2
18.5.	සභාධිපත්‍ය දේපළ මැනුම් වල පිඹුරු පිටපත් නිකුත් කිරීම	3
	බිම් කොටස දැක්වෙන පිඹුර	
18.6.	බිම් කොටස දැක්වෙන පිඹුරු පිළියෙල කිරීම	3
18.7.	බිම් කොටස දැක්වෙන පිඹුරු වල වූ විශේෂ අවශ්‍යතා	3
	සිරස් කඩ පිඹුරු	
18.8.	එක් එක් ගොඩනැගිල්ලේ / ගොඩනැගිලි වල සිරස්කඩ පිඹුරුගත කිරීම	4
	සභාධිපත්‍ය කොටස් දැක්වෙන පිඹුරු	
18.9.	සභාධිපත්‍ය කොටස් පිඹුරේ පෙන්වීම	4
18.10.	සභාධිපත්‍ය කොටස් සඳහා වෙනස් වර්ණයන් භාවිතාව	4
	සභාධිපත්‍ය දේපළ ඇතුළත තිරස් මාන දැක්වෙන පිඹුර	
18.11.	සභාධිපත්‍ය දේපළ ඇතුළත තිරස් මාන දැක්වෙන පිඹුර, සභාධිපත්‍ය කොටස් අංක කිරීම	4
	සභාධිපත්‍ය කොටස් අංකනය	
18.12.	සභාධිපත්‍ය කොටස් අංක කිරීම	4
18.13.	සභාධිපත්‍ය කොටසක් මහල් දෙකකට අදාළ කොටස් වලින් සමන්විත වන විට (Duplex Unit) කටයුතු කළ යුතු ආකාරය	5
18.14.	සභාධිපත්‍ය කොටසට අදාළ ඉඩම් විස්තර ලැයිස්තු ඉදිරිපත් කළ හැකි ආකාරය සහ කොටස් වටිනාකම ගණනය කිරීම	6
	අතිරේක කොටස්	
18.15.	අතිරේක කොටස සඳහා ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම	6
18.16.	අතිරේක කොටස අංක කිරීම	6
18.17.	අතිරේක කොටස්හි පොදු අංගෝපාංග කොටස් වල ඒකක වල වටිනාකම	6
18.18.	අතිරේක කොටස් වල මායිම් ඉඩම් විස්තර ලැයිස්තුවේ ලිවීම	7
	පොදු අංගෝපාංග කොටස් (Common Elements)	
18.19.	පොදු අංගෝපාංග කොටස් සඳහා අයිතිවාසිකම් දැක්වීම	7
18.20.	පොදු අංගෝපාංග කොටස් පිඹුරේ පෙන්වීම	7
18.21.	පොදු අංගෝපාංග කොටස් අංකනය	7
18.22.	පොදු අංගෝපාංග කොටස් සඳහා ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම	7

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
18.23.	පොදු අංගෝපාංග කොටස් වලට අදාළ විශේෂ ලක්ෂණ	7
	යෝජිත ගොඩනැගිලි	
18.24.	යෝජිත ගොඩනැගිලි වලට අදාළ සභාධිපත්‍ය පිඹුරු පිළියෙල කිරීම	7
18.25.	නව ගොඩනැගිල්ලක් හෝ පවතින ගොඩනැගිල්ල දිගු කිරීමකදී පිඹුරු පිළියෙල කිරීම	7
18.26.	ගොඩනැගිල්ලක් අළුතින් ඒකාබද්ධ කිරීමකදී හෝ ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමකදී මුල් පිඹුරු වලට සහ ඉඩම් විස්තර ලැයිස්තු වලට යොමු සටහන් ඇතුලත් කිරීම	8
18.27.	යෝජිත ගොඩනැගිලි අඩංගු ඉඩමේ කැබලි අංක කිරීම	8
18.28.	යෝජිත ගොඩනැගිල්ලේ කොටස් අංක කිරීම	8
18.29.	යෝජිත ගොඩනැගිල්ලේ කොටස් සඳහා ඉඩම් විස්තර ලැයිස්තු ලිවීම	8
	සභාධිපත්‍ය කොටස් නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම	
18.30.	කොටස් ඒකාබද්ධ කිරීම හෝ නැවත කොටස් වලට කැඩීමේදී නව පිඹුරු පිළියෙල කිරීම	8
18.31.	නව පිඹුරුපත් අංකනය	8
18.32.	නව පිඹුරුවල යොමු සටහන් යෙදීම	8
18.33.	කොටස් ඒකාබද්ධ කිරීම හා නැවත කොටස් වලට කැඩීමේදී මුල් වර්ග ප්‍රමාණය වෙනස්වීම	9
18.34.	නව සභාධිපත්‍ය බිම් පිඹුරක් සකස් කිරීම අවශ්‍ය නොවන අවස්ථාවකදී කටයුතු කරන ආකාරය	9
	පොදු අංගෝපාංගයකින් කොටසක් තවත් කොටසක අයිතිකරුවකුට විශේෂිත භාවිතය සඳහා ලබාදීම	
18.35.	පොදු කොටසක් තවත් කොටසක අයිතිකරුවකුට සුවිශේෂී භාවිතය සඳහා ලබාදීම	9
	කැඩැස්තර මැනුම් ප්‍රදේශ තුල සභාධිපත්‍ය දේපළ මැනුම්	
18.36.	කැඩැස්තර මැනුම් ප්‍රදේශ තුල සභාධිපත්‍ය දේපළ මැනුම් සිදු කිරීමට අදාළ පනත්	9
18.37.	කැඩැස්තර මැනුම් ඉඩම් කැබැල්ලක් තුල සභාධිපත්‍ය දේපළක මැනුම් කටයුතු හා පිඹුරු කටයුතු	9
	ඇමුණුම්	
ඇමුණුම 01	1973 අංක 11 දරණ සභාධිපත්‍ය දේපළ නීතියෙන් හා 2003 අංක 39 දරණ සභාධිපත්‍ය දේපළ (සංශෝධිත) නීතිය මඟින් උපුටා ගන්නා ලද කරුණු	10
ඇමුණුම 02	සභාධිපත්‍ය බිම් කොටස දැක්වෙන පිඹුර සඳහා ආදර්ශය	19
ඇමුණුම 03	සභාධිපත්‍ය බිම් කොටස සඳහා ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තුව	20
ඇමුණුම 04	සිරස්කඩ පිඹුර සඳහා ආදර්ශය	21
ඇමුණුම 05	බිම් මහල දැක්වෙන පිඹුර සඳහා ආදර්ශය	22
ඇමුණුම 06	පළමු මහල දැක්වෙන පිඹුර සඳහා ආදර්ශය	23
ඇමුණුම 07	සභාධිපත්‍ය කොටස් සඳහා ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තුව	24
ඇමුණුම 08	අතිරේක කොටස් සඳහා ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තුව	25
ඇමුණුම 09	පොදු අංගෝපාංග කොටස් සඳහා ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තුව	26

18 වැනි පරිච්ඡේදය

සභාධිපත්‍ය දේපළ මැනුම්

[සභාධිපත්‍ය දේපළ හා අනුශාංගික නීති]

18.1. එක් ඉඩම් කොටසක් ලෙස ඇති අන්සතු ඉඩමක් මත ඉදිකරන ලද සහ කොටස් වලට නැවත බෙදා වෙන් කිරීමේ හැකියාව ඇති යම් ගෙඩනැගිල්ලකට හෝ ඉදි කිරීමට යෝජිත ගෙඩනැගිල්ලකට හෝ අර්ධ වශයෙන් ඉදිකරනු ලැබ ඇති වූ ද මනුෂ්‍ය වාසය සඳහා සුදුසු වූ ද, බහු අයිතියක් ගොඩනැගෙන මහල් කිහිපයකින් සමන්විත ගොඩනැගිලිවල ස්වාධීන කොටස් සභාධිපත්‍ය දේපළ ගණයට අයත්වේ. මෙවැනි දේපළ ලියාපදිංචි කිරීම සඳහා ඒවා මැන පිඹුරු සකස් කළ යුතු ආකාරය හා සම්බන්ධිත කාර්යයන් සිදු කළ යුතු ආකාරය පළමුවරට නීතිගත කරන ලද්දේ 1970 අංක 12 දරන සභාධිපත්‍ය දේපළ පනත මඟිනි. නමුත් පසුව සම්මත කරන ලද 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ අංක 22 දරණ වගන්තිය මඟින් මුල් පනත වන 1970 අංක 12 දරණ සභාධිපත්‍ය දේපළ පනත ඉවත් කරන ලදී. ඒ අනුව අද වන විට සභාධිපත්‍ය දේපළ පිළිබඳ සියලුම කාර්යයන් නීතිගතව ඇත්තේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනත යටතේ වන අතර, 1982 අංක 45 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (සංශෝධන) පනත මඟින් සහ 2003 අංක 39 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (සංශෝධන) පනත මඟින් 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ අන්තර්ගත බොහොමයක් වගන්ති විශාල වශයෙන් සංශෝධනය කර ඇත. මීට අමතරව ඉහත පනතට සංශෝධන වශයෙන් තවත් විවිධ සංශෝධන හා විශේෂ විධිවිධාන පනත් කිහිපයක් සම්මත කර ඇති නමුත් ඒවා මැනුම් කටයුතු වලට සෘජුවම අදාළ නොවේ. (**ඇමුණුම 01**)

18.2. සභාධිපත්‍ය නීතියට අදාළ දේපළ පහත පරිදි කොටස් තුනකට වර්ග කළ හැකිය.

සභාධිපත්‍ය දේපළ
එක් ඉඩම් කොටසක් ලෙස සලකනු ලබන අන්සතු ඉඩමක් මත ඉදිකරන ලද සහ කොටස් වලට නැවත බෙදා වෙන් කිරීමේ හැකියාව ඇති යම් ගොඩනැගිල්ලක්.

තාවකාලික සභාධිපත්‍ය දේපළ
එක් ඉඩම් කොටසක් ලෙස සලකනු ලබන අන්සතු ඉඩමක් මත ඉදිකිරීමට යෝජිත සහ කොටස්වලට නැවත බෙදා වෙන් කිරීමේ හැකියාව ඇති යම් ගොඩනැගිල්ලක්.

අර්ධ සභාධිපත්‍ය දේපළ
එක් ඉඩම් කොටසක් ලෙස සලකනු ලබන අන්සතු ඉඩමක් මත අර්ධ වශයෙන් ඉදිකරනු ලැබ ඇති වූ ද මනුෂ්‍ය වාසය සඳහා සුදුසු සම්පූර්ණ කරන ලද සභාධිපත්‍ය කොටස් එකකට වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තා වූ ද යම් ගොඩනැගිල්ලක්.

අවස්ථානුකූලව ඉහත විස්තර කළ දේපළ වල පිඹුරු, සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් හෝ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් හෝ අඳිනු ලැබිය යුතුය.

18.3. බද්ධ නිවාස අයිතිවාසිකම් පනත් යටතේ දක්වා ඇති විධිවිධාන අතුරින් බිම් මැනීමට හා සභාධිපත්‍ය පිඹුරු පිළියෙල කිරීමට අදාළ වැදගත් කරුණු පහත දක්වා ඇත.

අ.) "සභාධිපත්‍යය" පිඹුරක් හෝ "තාවකාලික සභාධිපත්‍යය පිඹුරක්" හෝ "අර්ධ සභාධිපත්‍ය පිඹුරක්" ලියාපදිංචි කිරීම සඳහා වන කිසියම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන කිසියම් ඉල්ලීමක් ලැබුන විට 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත්කරනු ලැබුවා වූ ද, සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළ හෝ

තාවකාලික සභධිපත්‍ය දේපළ `පිහිටි ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කය විෂයෙහි බලය ඇති වූ ද හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළ හෝ තාවකාලික සභධිපත්‍ය දේපළ සඳහා පිඹුරේ දක්වා ඇති එක් එක් සභාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් අලුත් හිමිකම් නාම ලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර සභාධිපත්‍ය පිඹුරේ, තාවකාලික සභාධිපත්‍යය පිඹුරේ හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරේ අනුපිටපත අදාළ සභාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනු කළ යුතු ය. ඒ ඉල්ලීම මේ පනතේ විධිවිධානවලට සහ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූල බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වන්නේ නම්, ඔහු විසින් නියමිත ගාස්තු ලැබුණු පසු අදාළ වන පරිදි පුද්ගලික සභාධිපත්‍ය හිමිකම් සහතිකයක්, පුද්ගලික තාවකාලික සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් හෝ අර්ධ සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

ආ.) එක් එක් සභාධිපත්‍ය කොටස් සඳහා පිළියෙල කරන පිඹුරක් සභාධිපත්‍ය දේපළක් ලෙස ලියාපදිංචි කිරීම.

ඇ.) එක් එක් සභාධිපත්‍ය කොටස් සඳහා වෙන් වෙන්ව අයිතිය දැක්වීම.

ඈ.) එක් එක් සභාධිපත්‍ය කොටස් විසින් භුක්ති විඳින සඳළුතල, වාහන නැවතුම් ස්ථාන වැනි ඒකක අතිරේක ඒකක ලෙස හිමිකමට බද්ධ කිරීමේ හැකියාව.

ඉ.) සභාධිපත්‍ය දේපළක පොදු අංගෝපාංග කොටස් ගණයට වැටෙන පොදු ප්‍රදේශ හා පොදු පහසුකම් වල අයිතිය ඊට අදාළ සියළුම කොටස් හිමිකරුවන්ගේ පොදු අයිතියක් ලෙස සැලකීම.

ඊ.) සභාධිපත්‍ය දේපළක ගොඩනැගිලි නිසියාකාර පරිපාලන කටයුතු සඳහා එයට ඇතුලත් සියළුම කොටස් හිමිකරුවන්ගෙන් සමන්විත කළමනාකරණ සංස්ථාවක් පිහිටුවීම. මීට අදාළ කටයුතු පළමු වන උපලේඛනයේ සඳහන් නීතිරීති වලට හා 2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල පනතේ දෙවන උපලේඛනයේ සඳහන් නීතිරීති වලට යටත් වේ.

උ.) කිසියම් කොටසක සුවිශේෂී භාවිතය සඳහා පොදු අංගෝපාංග කොටස් වෙන් කිරීමේ හැකියාව කළමනාකරණ සංස්ථාව සතුය.

සභාධිපත්‍ය පිඹුරක සංයුතිය

18.4. සභාධිපත්‍ය පිඹුරු සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් හෝ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයකු විසින් පිළියෙල කළ යුතුය. සභධිපත්‍ය පිඹුරක් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ කාර්යයන් සඳහා ඉඩම් වලට බලපාන සාධනපත්‍රයක් ලෙස සැලකිය යුතු ය. සභාධිපත්‍ය පිඹුරක් පහත සඳහන් කොටස් වලින් සමන්විත විය යුතුය.

1. **බිම් කොටසේ පිඹුර -** මෙය සාමාන්‍ය බිම් මැනුම් පිඹුරක් වන අතර, එහි අදාළ ප්‍රදේශය තුල පිහිටි ගොඩනැගිලි හෝ යෝජිත ගොඩනැගිලි, ඉඩම් මායිම් හා අනෙකුත් විස්තර නිශ්චිතව දැක්විය යුතුය. ඉඩම් කොටස ලියා පදිංචි කර ඇති කොට්ඨාශය, වෙළුම සහ පත්ඉරුවද දැක්විය යුතු ය. සභාධිපත්‍ය දේපළෙහි පෙන්නුම් කර ඇති ගොඩනැගිලි සහ සියලු සභාධිපත්‍ය කොටස් සභාධිපත්‍ය දේපළෙහි බාහිර තිරස් මායිම් ඇතුළත පිහිටා ඇති බවටද ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ උප බෙදීමේ සැලසුම් වලට අනුකූල වන බවටද සහතිකයක් තිබිය යුතු ය.

2. **සිරස්කඩ පිඹුර -** සභාධිපත්‍ය කොටස් වලින් සමන්විත ගොඩනැගිල්ලේ එක් එක් මහලේ බිම් ප්‍රමාණය සහ සීලිම ද, එක් එක් මහලේ උසද දැක්වෙන සිරස්කඩ පිඹුරක් පිළියෙල කළ යුතුය.

3. **සභාධිපත්‍ය කොටස් දැක්වෙන පිඹුරු -** වෙන් වෙන් වශයෙන් එක් එක් මහලේ පිහිටා ඇති සභාධිපත්‍ය කොටස්, අතිරේක කොටස් හා පොදු අංගෝපාංග කොටස් දැක්වෙන පිඹුරු, එක් මහලකට එක් පිඹුරක් බැගින් පිළියෙල කළ යුතුය.

4. **සභාධිපත්‍ය දේපළ ඇතුළත තිරස් මාන දැක්වෙන පිඹුර -** අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදා වෙන් කළ සැලසුම් වලට අනුකූලව සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ලක් ලෙස සභාධිපත්‍ය දේපළ ඇතුළත ඉදිකරනු ලැබූ එක් එක් ඒකකයේ යම් දිගාංශයක් පෙන්වීමේ අවශ්‍යතාවයක් නොමැතිව, බාහිර මායිම් රූප රේඛනය කොට ඒවායේ තිරස් දිග, පළල පෙන්නුම් කළ යුතු ය.

5. **ඉඩම් විස්තර ලැයිස්තු -** සභාධිපත්‍ය දේපළෙහි ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීමේදී, බිම් කොටසේ පිඹුර සඳහාද, සභාධිපත්‍ය ඒකක සඳහාද, අතිරේක කොටස් සඳහාද, පොදු උපාංග කොටස් සඳහාද ලෙස වෙන් වෙන් වශයෙන් ඉඩම් විස්තර ලැයිස්තු හතරක් (4) පිළියෙල කළ යුතුය.

18.5. මූලික පිඹුරු, ලංකා මැනුම් උද්ධෘත හා අ.ග.පි වල අතිරේක ලෙස නිකුත් කරන සභාධිපත්‍ය පිඹුරු A3 ප්‍රමාණයේ ඇදීම් පත්‍ර වල පිළියෙල කළ යුතුය. අනෙකුත් ආයතන වෙත මෙකී පිඹුරු වල පිටපත් නිකුත් කිරීමේදී පිටපත් තුනක් ලබා ගත යුතු අතර, 'මුල් පිටපත' , 'දෙවන පිටපත' හා 'තෙවන පිටපත' ලෙස සටහන් කර අදාළ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අනුමත කළ යුතුය. එම මුල් හා දෙවන පිටපත් ඉඩම් රෙජිස්ට්‍රාර් වෙතද, තෙවන පිටපත සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙතද යැවිය යුතු වේ.

බිම් කොටස දැක්වෙන පිඹුර

18.6 මෙය සාමාන්‍ය බිම් මැනුම් පිඹුරකි. මෙම පිඹුරු ආදර්ශයේ සඳහන් ආකාරයට පිළියෙල කළ යුතුය. මෙය සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුර ලෙස නම් කළ යුතු අතර සුදුසු පරිමාණයකට ඇඳිය යුතුය. පිඹුරේ කැබලි අංක යෙදීම සාමාන්‍ය ආකාරයට සිදු කළ යුතුය. **(ඇමුණුම 02)**

18.7 පහත සඳහන් විශේෂ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු විය යුතුය.

අ.) මෙම දේපළ හා සම්බන්ධ පෙර ලියාපදිංචිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පරීක්ෂා කර, (අයදුම්පතක් මඟින් ඉල්ලීමක් කළ විට, ගෙවීමකින් හා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව මීට අදාළ පරීක්ෂාවන්ට ඉඩ සැලසෙනු ඇත.) අදාළ වෙළුම සහ පත්ඉරු අංකය ආදි තොරතුරු පිඹුරේ සටහනක් යටතේ දැක්විය යුතුය.

ආ.) බද්ධ නිවාස අයිතිවාසිකම් පනත සහ එහි සංශෝධන පනත් අනුව "සභාධිපත්‍ය දේපළේ බාහිර මතුපිට මායිම් වලට අදාළව සභාධිපත්‍ය පිඹුරෙහි පෙන්නුම් කර ඇති සියළු ගොඩනැගිලි සහ සියළු සභාධිපත්‍ය කොටස් සභාධිපත්‍ය දේපළ ඇතුලත පිහිටා ඇති බවට ද ගොඩනැගිලි සැලැසුම් අනුමත කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ ගොඩනැගිලි සැලැසුම් සහ උප බෙදීමේ සැලසුම් වලට අනුකූල වන බවට ද" අදාළ රජයේ මිනින්දෝරුවරයා / ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා විසින් පිඹුරෙහි එනම් ආදර්ශයේ පෙන්වා ඇති ආකාරයට විශේෂ සටහනක් යෙදිය යුතුය.

ඇ.) පිඹුරු මත යෝජිත ගොඩනැගිලි දැක්වීමේදී, එකී ගොඩනැගිලි රතුපැහැති කඩ ඉරි වලින් පෙන්විය යුතුය.

ඈ.) පිඹුරේ පෙන්වා ඇති ගොඩනැගිලිවල මහල් ගණන සහ එක් එක් මහලේ භාවිතාව පිළිබඳ විස්තර දැක්විය යුතුය.

ඉ.) සභාධිපත්‍ය පිඹුරේ, සභාධිපත්‍ය දේපළෙහි තැපැල් ලිපිනය දැක්විය යුතුය.

ඊ.) ඇමුණුම 03 හි පෙන්වා ඇති පරිදි දේපළවල මායිම්, මායිම් විස්තර තීරයේ දැක්විය යුතුය.

සිරස් කඩ පිඹුරු

18.8 එක් එක් ගොඩනැගිල්ලේ සිරස්කඩ පිඹුරුගත කර පෙන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය තිරස් හා සිරස් මිම්මි දුර මැනීමෙන්ද, මැනිය නොහැකි ස්ථානවලදී පමණක් අනුමත ගොඩනැගිලි සැලැස්මෙන් ලබාගෙනද පිඹුරේ ඇතුලත් කළ යුතුය. මෙකී සියළුම මිම්මි ක්ෂෙත්‍ර පොත් වල ඇතුලත් කළ යුතුය. මහල් වල උස හා බිමෙහි සණකමද ක්ෂෙත්‍ර පොත් වල දැක්වීම අවශ්‍ය වේ. එක් එක් මහලේ සිවිලිම හා බිම නිරූපණය කිරීම සඳහා 1:100 සහ 1:200 වැනි පරිමාණයන් යොදා ගත යුතුය. (ඇමුණුම 04)

සභාධිපත්‍ය කොටස් දැක්වෙන පිඹුරු

18.9 සභාධිපත්‍ය කොටස් වලින් සමන්විත ගොඩනැගිලි වල එක් එක් මහලේ පිහිටි, සභාධිපත්‍ය කොටස් වෙන් වෙන්ව පිඹුරේ පෙන්විය යුතුය. මෙකී එක් එක් කොටස් වලට අදාළ මිම්මි ක්ෂෙත්‍ර පොත් වල ඇතුලත් විය යුතු අතර, රේඛීය දුර ප්‍රමාණයන්ද පිඹුරේ පෙන්විය යුතුය. සභාධිපත්‍ය කොටස් වෙන් කර පෙන්වීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් රේඛීය දුර ප්‍රමාණයන් ලබාගත යුතුය. වෙන් වෙන් වශයෙන් එක් එක් මහලේ පිහිටා ඇති සභාධිපත්‍ය කොටස්, අතිරේක කොටස් හා පොදු අංගෝපාංග කොටස් දැක්වෙන පිඹුරු, එක් මහලකට එක් පිඹුරක් බැගින් පිළියෙල කළ යුතුය. (ඇමුණුම 05 **සහ** ඇමුණුම 06)

18.10 මෙම පිඹුරු මත එක් එක් සභාධිපත්‍ය කොටස් සහ එම කොටස්වලට අදාල අතිරේක කොටස්ද, පොදු අංගෝපාංග කොටස්ද පහසුවෙන් හඳුනා ගැනීම සඳහා වෙනස් වර්ණයන් භාවිතා කිරීම වඩාත් සුදුසුය. උදා: සියලු පොදු අංගෝපාංග කොටස් තැඹිලි වර්ණයෙන්ද, එක් එක් සභාධිපත්‍ය කොටස සහ එම කොටසට අදාල අතිරේක කොටස් සඳහා එකම වර්ණයක්ද භාවිත කළ යුතුය.

සභාධිපත්‍ය දේපළ ඇතුළත තිරස් මාන දැක්වෙන පිඹුර

18.11 සභාධිපත්‍ය දේපළ ඇතුළත ඉදිකරනු ලැබූ එක් එක් ඒකකයේ යම් දිගාංශයක් පෙන්වීමේ අවශ්‍යතාවයක් නොමැතිව, බාහිර මායිම් රූප රේඛනය කොට ඒවායේ තිරස් දිග, පළල පෙන්නුම් කළ යුතුය. සභාධිපත්‍ය පිඹුරෙහි අන් ආකාරයකින් නියම කර ඇත්නම් මිස, සභාධිපත්‍ය කොටසක හෝ පොදු අංගෝපාංගයක මායිම් විය යුත්තේ අවස්ථාවෝචිත පරිදි බිත්තිවල හෝ සිවිලිමේ මධ්‍ය රේඛාවය.

සභාධිපත්‍ය කොටස් අංකනය

18.12 හඳුනා ගැනීම සඳහා, සභාධිපත්‍ය කොටස් අංක කිරීම පහත සඳහන් ආකාරයට සිදු කළ යුතුය.

අ.) බිම් කොටසෙහි පිහිටීමට අදාළව සභධිපත්‍ය දේපළ දැක්වෙන බිම් පිඹුරේ කැබලි අංකය

ආ.) ඉංග්‍රීසි අකාරාදි ක්‍රමයට A, B, C……. ලෙස ගොඩනැගිලි අංකය. ගොඩනැගිලි අංකනය කිරීම සඳහා I, L සහ O අක්ෂර භාවිතා නොකළ යුතුය. එක් ගොඩනැගිල්ලක් පමණක් ඇතිවිටද ගොඩනැගිලි අංක යෙදීම කළ යුතුය.

ඇ.) සහාධිපත්‍ය කොටස් අඩංගු මහල් පහත පරිදි ඉංග්‍රීසියෙන් අංක කළ යුතුය. එහි "F" මඟින් "Floor" එනම් "මහල" අර්ථය දැක්වේ.

බිම් මහලට පහළින් වූ මහල (Basement)	- FB
බිම් මහල (Ground Floor)	- F0
මහල් දෙකක් අතර, අතරමැදි මහල (Mezzanine)	- FM
පළමු මහල (First Floor)	- F1
දෙවන මහල (Second Floor)	- F2

බිම් මහලට පහළින් වූ මහලට (Basement) පහළින් මහල් ඒකක එකකට වඩා වැඩිවන විට FB1, FB2… ආදී ලෙස පොළව මට්මමේ සිට පහළට වැඩිවන ලෙස මහල් සඳහා අංක කළ යුතුය. මහල් දෙකක් අතර, අතරමැදි මහල් කිහිපයක් ඇතිවිට (Mezzanine) FM1, FM2 …..ලෙස අංක ලබා දිය යුතුය.

ඈ.) එක් එක් මහලේ පිහිටි සහාධිපත්‍ය කොටස් U1, U2, …… ලෙස අංක කළ යුතුය. ඒකක සඳහා කැබලි අංක යෙදීමේදී, විදුලි සෝපානයෙන් පිටතට ඒමේදී, ඉදිරියට ඇති ඒකකය, පළමු කැබලි අංකය ලෙස ගෙන දක්ෂිණාවර්තව කැබලි අංක කළ යුතුය.
ඒ අනුව කැබලි අංක 5 හි ගොඩනැගිලි අංක A ට අයත් දෙවන මහලෙහි වූ තුන්වෙනි කොටස (Unit) සඳහා 5A-F2-U3- ද,
කැබලි අංක 1 හි ගොඩනැගිලි අංක A ට අයත් බිම් මහලෙහි වූ දසවෙනි කොටස (Unit) සඳහා 1A-F0-U10 ද ආදි වශයෙන් සියළුම සහාධිපත්‍ය කොටස් සඳහා අංක යෙදීම කළ යුතුය.

ඉ.) රූපසටහනෙහි පෙන්වා ඇති පරිදි මහල් කිහිපයකින් පසු තනි මහලක් ලෙස බද්ධ වී ඇති සහාධිපත්‍ය දේපළක් අංකනය කිරීමේදී සුදුසු පරිදි පොදු මහල අංකනය කර (ABF6ලෙස) ඉහත ඡේද පරිදි ඒකක අංකනය කළ යුතුය.



18.13 කිසියම් සහාධිපත්‍ය කොටසක් මහල් දෙකකට අදාළ කොටස් වලින් සමන්විත වන විට (Duplex Unit) පහත පරිදි කටයුතු කළ යුතුය.

1. එක් එක් මහලට වැටෙන සභාධිපත්‍ය කොටස අදාළ පිඹුරේ පෙන්විය යුතු අතර, ඉතිරි කොටසද අදාළ යොමුව දෙමින් දැක්විය යුතුය.

2. එක් එක් මහලට වැටෙන කොටස් වෙන්ව හඳුනාගත හැකි වන පරිදි සභාධිපත්‍ය කොටස පහත පරිදි අංකනය කළ යුතු වේ.
2A-FOF1-U1 වලින් දැක්වෙන්නේ දෙවන කැබැල්ලේ පිහිටි A නැමති ගොඩනැගිල්ලේ බිම් මහලේ සහ පළමු වන මහලේ කොටස් වලින් සමන්විත සභාධිපත්‍ය ඒකකයයි.

18.14 එක් එක් කොටසට අදාළ විස්තර ඉදිරිපත් කළ හැකි ආකාරය ඇමුණුම 07 ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තුවෙහි දැක්වේ. එහි පහත සඳහන් විශේෂ අවස්ථා ද පෙන්වා දිය යුතුය.

i. ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තුවල දක්වා ඇති පරිදි ඉඩම් විස්තර ලැයිස්තු පිටු වල මාතෘකා අදාළ පරිදි විය යුතුය.

ii. එක් එක් කොටසට අදාළව පොදු අංගෝපාංග කොටස් වල කොටස් වටිනාකම පහත සමීකරණයට අනුව ගණනය කර අදාළ ඉඩම් විස්තර ලැයිස්තුවල දැක්විය යුතුය.

$$SV = \frac{U+A}{\Sigma\,(U+A)} * 100 = \frac{\text{එම කොටස සහ එම කොටසට අයත් අතිරේක කොටස් වල වර්ග මීටර් ගණන් වල එකතුව}}{\sum \text{මුළු කොටස් වල සහ ඊට අයත් අතිරේක කොටස් වල මුළු වර්ග මීටර් ගණනේ එකතුව}} * 100$$

SV –කොටස් වල වටිනාකම
U – සභාධිපත්‍ය කොටසේ වර්ග ප්‍රමාණය වර්ග මීටර් වලින්
A – ඊට අයත් අතිරේක කොටස් (Accessary Units) වල වර්ග ප්‍රමාණය වර්ග මීටර් වලින්

iii. කිසියම් හෝ අතිරේක කොටසට අදාළව කිවයුතු කරුණු තීරයේ විස්තර සඳහන් කළ යුතුය.

iv. පහත සඳහන් පරිදි සභාධිපත්‍ය කොටස් වල මායිම්, මායිම් විස්තර තීරයේ දැක්විය යුතුය.

a) මායිම් : උතුර, නැගෙනහිර, දකුණ, බටහිර, ඉහලින් (Zenith) සහ පහලින් (Nadir) ඇති කොටස්වල අංක සඳහන් කළ යුතුය.

b) ඉහත කී දිශාවන් සැලකූ විට අවස්ථානුකූලව මායිම් රේඛාව වන්නේ බිම, සිවිලිම හා බිත්ති වල මධ්‍ය රේඛාවයි.

අතිරේක කොටස්

18.15 සභාධිපත්‍ය කොටස් වලට අනුයුක්ත අතිරේක කොටස් තිබීම හෝ නොතිබීම සිදුවිය හැක. ඇමුණුම 08 හි දක්වා ඇති අකාරයට අතිරේක කොටස් සඳහා පිඹුරු සහ ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කළ යුතුය.

18.16 අතිරේක කොටසට අදාළ අංකනය මඟින් එය කුමන සභාධිපත්‍ය කොටසට අනුයුක්ත දැයි නිරූපණයවේ. උදාහරණ 1A-FO-U1-A1 මඟින් දැක්වෙන අතිරේක 1A-FO-U1 සභාධිපත්‍ය කොටසට අයත් අතිරේක කොටස A1 වේ. අතිරේක කොටස් A1, A2, A3,..... යනාදී ලෙස අංක කළ හැකිය.

18.17 එක් එක් අතිරේක කොටස් වලට අදාළව, පොදු අංගෝපාංග කොටස් වල කොටස්/ඒකක වටිනාකම එම ඉඩම් විස්තර ලැයිස්තුවල ප්‍රධාන කොටස යටින් දැනටමත් ලියා ඇති (ඉහත 18:14(ii) අනුව) නිසා වෙනම පෙන්විය යුතු නැත.

18.18 අතිරේක කොටස්/ඒකක වලට අදාළ මායිම්, මායිම් විස්තර තීරයේ සඳහන් කළ යුතුය. සභාධිපත්‍ය ගොඩනැගිලි වලින් පිටත පිහිටි අතිරේක කොටස් වල මායිම් විස්තර කිරීමේදී ඉහලින් (Zenith) සහ පහලින් (Nadir) ඇති මායිම් විස්තර දැක්වීම අවශ්‍ය නොවේ.

පොදු අංගෝපාංග කොටස් (Common Elements)

18.19 සභාධිපත්‍ය පිඹුරක අඩංගු පොදු අංගෝපාංග කොටස් සඳහා සියළුම කොටස් වල අයිතිකරුවන් විසින් පොදුවේ අයිතිවාසිකම් කියනු ලැබේ.

18.20 පොදු අංගෝපාංග කොටස් සියල්ල හඳුනාගැනීමේ පහසුව සඳහා අංක කළ යුතුය.

18.21 ආදර්ශයේ පෙන්වා ඇති පරිදි මේවා අංක කළ යුතුය. උදාහරණ: පළමුවන පොදු අංගෝපාංග කොටස් 1CE1 ලෙස අංකනය කර දැක්විය හැක.

18.22 පොදු අංගෝපාංග කොටස් වලට අදාළ සියළු තොරතුරු (පිහිටීම හා ප්‍රයෝජනය) ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තුවෙහි (ඇමුණුම 09) පෙන්වා ඇති පරිදි දැක්විය යුතුය.

18.23 පොදු අංගෝපාංග කොටස් වලට අදාළ විශේෂ ලක්ෂණ කිහිපයක් පහතින් සඳහන් කර ඇත.

1. ආදර්ශ පිඹුරේ පෙන්වා ඇති 1CE1 නම් පොදු අංගෝපාංග කොටස්වල ඊට ඇතුලත් මාර්ග හා රථගාල් දක්වා ඇති අතර අත්තිවාරම්, කුළුණු, කොන්ක්‍රීට් බාල්ක යනාදිය පෙන්වා නැත. නමුත් ඒවාට අදාළ විස්තර ඉඩම් විස්තර ලැයිස්තුවෙහි දක්වා ඇත. ඉඩම් විස්තර ලැයිස්තුවෙහි කිවයුතු කරුණු තීරයේ මෙම තොරතුරු ඇතුලත් කර පෙන්විය යුතුය.

2. පොදු අංගෝපාංග කොටස් සඳහා සියළුම අයිතිකරුවන් විසින් පොදුවේ අයිතිවාසිකම් කියනු ලබයි. ආදර්ශ ඉඩම් විස්තර ලැයිස්තුවෙහි (ඇමුණුම 09) මෙම තත්වය දක්වා ඇත.

3. පොදු අංගෝපාංග කොටස් වලට අදාළව බිම් ප්‍රමාණය, කොටස් වටිනාකම හා මායිම් පෙන්වීම අවශ්‍ය නැත.

යෝජිත ගොඩනැගිලි

18.24 දැනට පවතින ගොඩනැගිලි හා යෝජිත ගොඩනැගිලි වලට අදාළ පිඹුරු පිළියෙල කිරීමේදී, එකී මායිම් පිළිවෙලින් අඛණ්ඩ ඉරි වලින් හා කඩ ඉරි වලින් පෙන්විය යුතුය. තවද යෝජිත සභාධිපත්‍ය දේපළ නැවත පිහිටුවිය හැකි පරිදි ස්ථාන තුනක ඛණ්ඩාංක පිඹුර මත මුද්‍රණය කළ යුතුය යෝජිත ගොඩනැගිලි හා යෝජිත යා කිරීම් වල මායිම් කඩඉරි වලින් පෙන්වා ඇති බව යොමුව තීරයේ සටහනක් මඟින් දැක්විය යුතුය. කොටස් වටිනාකම් (Share Value) වල මුළු එකතුව, සියළුම කොටස් අළුත් එකතු කිරීම් සැලකිල්ලට ගෙන ඉඩම් විස්තර ලැයිස්තුවෙහි සඳහන් කළ යුතුය. මෙයට අමතරව පිඹුර හා ඉඩම් විස්තර ලැයිස්තුවෙහි ඉහතින් දක්වා ඇති අවශ්‍යතාද සපුරාලිය යුතුය.

18.25 සභාධිපත්‍ය දේපළකට නව ගොඩනැගිල්ලක් හෝ පවතින ගොඩනැගිල්ල දිගු කිරීමක් සිදුකරන්නේ නම් ඊට අදාළව පිඹුර පිළියෙල කළ යුතු වන්නේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි පිඹුරු සැලකිල්ලට ගෙනය. මෙහිදී නව පිඹුර සහ නව ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කළ යුත්තේ එසේ කොටස් කිරීමකට හෝ අළුතින් ඉදි කළ කොටස් වලට පමණි.

18.26 දැනටමත් ලියාපදිංචි සභාධිපත්‍ය දේපළකට නව ගොඩනැගිල්ලක් හෝ පවතින ගොඩනැගිල්ල දිගු කිරීමක් සඳහා පිඹුරු සකස් කිරීමේදී මුල් පිඹුරු සහ ඉඩම් විස්තර ලැයිස්තුවල පහත සඳහන් පරිදි සටහන් ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය.

(අ) පිඹුරේ පත්‍ර අංක 1 හි පහලින් "අංක ..... හා .....දිනැති සභාධිපත්‍ය පිඹුර සංශෝධනය සඳහා" යන සටහන යෙදිය යුතුය.

ආ) පැරණි සභාධිපත්‍ය පිඹුරෙහි නව පිඹුරෙන් ආවරණය වන කොටස් වල වට මායිම පැන්සල් ඉරි මඟින් සෙවන කර සංශෝධනය කළ යුතුය.

ඇ) මුල් සභාධිපත්‍ය බිම් පිඹුරෙහි ඇති අංගයන් අධිස්ථාපනයන් මඟින් නව සභාධිපත්‍ය පිඹුරේ රතු පාටින් පෙන්විය යුතුය.

ඈ) ඉදිකර අවසන් නව ගොඩනැගිලි අබන්ඩ ඉරි වලින් හා යෝජිත ගොඩනැගිලි කඩඉරි මඟින් පෙන්විය යුතුය. රතු පාට තීත් රේඛා, කඩඉරි හා අබණ්ඩ රේඛා කුමක්ද යන්න පිඹුරේ යොමුව තීරයේ විස්තරාත්මකව දැක්විය යුතුය.

18.27 ඉඩම සඳහා මුල් සභාධිපත්‍ය පිඹුර මඟින් ලබා දුන් කැබලි අංකයම නොවෙනස්ව පවත්වාගෙන යා යුතුය . එම කැබලි අංක නව පිඹුරේ පිහිටීම හා අදාළ පිඹුරු අංකය සමඟ සඳහන් කළ යුතුය.

18.28 නව/ යෝජිත ගොඩනැගිලි හා නව/ යෝජිත කොටස් සාමාන්‍ය පරිදි ඉහත සඳහන් උපදෙස් වලට අනුව අංකනය කළ යුතුය. මෙහිදී නව/ යෝජිත ගොඩනැගිලි හැඳින්වීම සඳහා මුල් ගොඩනැගිලි හැඳින්වීමට භාවිතා කළ ඉංග්‍රීසි අකුරු නැවත පුනරාවර්ථනය නොවීමට ද I සහ O අක්ෂර භාවිතා නොකිරීමටද වග බලාගත යුතුය. යාබද ඒකක/කැබලි අංක පෙර පරිදිම පවත්වාගෙන යා යුතුය.

18.29 නව/ යෝජිත ගොඩනැගිලි හා නව/ යෝජිත කොටස් සඳහා ඉඩම් විස්තර ලැයිස්තු සාමාන්‍ය පරිදි ඉහත සඳහන් උපදෙස් වලට අනුව සකස් කළ යුතුය.

සභාධිපත්‍ය කොටස් නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම

18.30 මෙම නීතිය යටතේ ලියාපදිංචි කර ඇති පිඹුරේ කොටස් නැවත එකතු කර හෝ නැවත කොටස් වලට බෙදා පිඹුරු පිළියෙල කිරීමට ඇති අවස්ථාවලදී, එසේ බෙදීමට හෝ එකතු කිරීමට භාජනය වූ කොටස් පැවති ප්‍රදේශ සඳහා අළුත් පිඹුරු සකස් කළ යුතුය.

18.31 නව පිඹුරු සඳහා අංක ලබාදීම ඉහත ඡේද වල ලබාදී ඇති උපදෙස් අනුව සිදු කළ යුතුය.

18.32 මුල් පිඹුරු සඳහා යොමු සටහන් නව පිඹුරුවල යෙදීම සඳහා හා යාබද කැබලි විස්තර දැක්වීමේදී පහත පරිදි කටයුතු කළ යුතුය.

(අ) නව පිඹුරේ 1 වන කොටසේ ඉහලින්ම " සභාධිපත්‍ය පිඹුරු අංක ..... නැවත බෙදීම/ එකතු කිරීම" ලෙස සටහනක් යෙදිය යුතුය. එසේම එම කොටසේ පිඹුරේ අංකයට පහලින් " (අංක ..... සහ ..... දින දරන සභාධිපත්‍ය පිඹුරු සංශෝධනය සඳහා)" ලෙස ලියා දැක්විය යුතුය.

(ආ) මුල් සභාධිපත්‍ය පිඹුරේ ඒකක වල අංක යොදමින් නව පිඹුරේ යාබද කැබලි විස්තර කළ යුතුය.

(ඇ) නව ඉඩම් විස්තර ලැයිස්තුවල අදාළ කොටස් වලට ඉදිරියෙන් කැබලි සඳහා යොමුව තීරයේ අදාළ පැරණි කොටස් වලට යොමු විස්තර ‘‘සභාධිපත්‍ය පිඹුරු අංක ..... හි .....ඒකකයේ කොටසක්’’ ලෙස සඳහන් කළ යුතුය. පැරණි පිඹුරෙහි සහ ඉඩම් විස්තර ලැයිස්තුවෙහිද නව පිඹුර සහ ඉඩම් විස්තර ලැයිස්තුව සම්බන්ධයෙන් යොමු සටහන් යෙදිය යුතුය.

18.33 කිසියම් සභාධිපත්‍ය කොටස් සංඛ්‍යාවක් නැවත එක් කිරීම/ නැවත බෙදීම යන ක්‍රියාවලියේදී සභාධිපත්‍ය කොටස්වල මුල් වර්ග ප්‍රමාණය එලෙසම පවත්වාගෙන යා යුතුය.

18.34 සභාධිපත්‍ය පිඹුරක කොටස් එකතු කිරීම හා නැවත කොටස් වලට බෙදීමේදී මුල් සභාධිපත්‍ය පිඹුරේ බිම් පිඹුරට හෝ පොදු අංගෝපාංග කොටස්වලට බලපෑමක් ඇති නොවන්නේ නම් අළුත් සභාධිපත්‍ය බිම් පිඹුරක් සකස් කිරීම අවශ්‍ය නොවන අතර නව පිඹුරේ 1 වන කොටසේ පහත දැක්වෙන සටහන යෙදීම ප්‍රමාණවත්වේ.

‘‘ බිම් පිඹුර : අංක ..... සහ ..... දින දරන සභාධිපත්‍ය පිඹුරේ දැක්වෙන බිම් පිඹුරට සමානවේ.’’

පොදු අංගෝපාංගයකින් කොටසක් තවත් කොටසක අයිතිකරුවකුට විශේෂිත භාවිතය සඳහා ලබාදීම

18.35 පොදු අංගෝපාංගයකින් කොටසක් තවත් කොටසක අයිතිකරුවකුගේ සුවිශේෂී භාවිතය සඳහා ලබාදීමට අදාළ සභාධිපත්‍ය දේපළ කළමනාකරණ සංස්ථාව (කමිටුව) තීරණය කර ඇතිවිට අතුරු ව්‍යවස්ථාවේ දෙවන උපලේඛනයේ සඳහන් කර ඇති පරිදි මුල් ලියාපදිංචි පිඹුර සංශෝධනය කළ යුතුය. මෙහිදීද ඉහත ආකාරයට ක්‍රියාකර අදාළ වෙනස්වීම් පෙන්නුම් කරන නව පිඹුරක් සකස් කළ යුතුය.

කැඩැස්තර මැනුම් ප්‍රදේශ තුල සභාධිපත්‍ය දේපල මැනුම්

18.36 නීත්‍යානුකූලව ඇති අයිතිවාසිකම් ලියාපදිංචි කිරීම සඳහා කැඩැස්තර මැනුම් ප්‍රදේශ තුල සභාධිපත්‍ය දේපළ මැනුම් 2003 අංක 39 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත හා 1998 අංක 21 හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යන පනත් දෙකට අනුකූලව සිදු කළ යුතුය. මෙය සිදුකරන ආකාරය 1998 අංක 21 හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 51 හා 52 ඡේදයන්හි දක්වා ඇත. මේ සම්බන්ධයෙන් **21.54 – 21.59 ඡේදයන්හි** විස්තර කර ඇත.

18.37 කැඩැස්තර මැනුම් ඉඩම් කැබැල්ලක් තුල සභාධිපත්‍ය දේපළක මැනුම් හා පිඹුරු කටයුතු සිදු කිරීමේදී පහත දක්වා ඇති කරුණු සඳහා අවධානය යොමු කළ යුතුය.

අ) ඉඩම සඳහා නිකුත් කර ඇති හිමිකම් සහතිකයේ මුල් පිටපත පරීක්ෂා කිරීම සහ එහි පිටපතක් ලබා ගැනීම
ආ) ඉඩමේ මුල් අංකිත දත්ත භාවිතා කිරීම
ඇ) ඉඩමේ වට මායිම් භූමියේ නැවත පිහිටුවීම
ඈ) ගොඩනැගිල්ල හා ඒකක මැනීම
ඉ) දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් නිකුත් කල අවසාන විස්තර අඩංගු කර, සම්පූර්ණ කරන ලද පිඹුර හා ඉඩම් විස්තර ලැයිස්තුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත භාර දීම
ඊ) දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ලබාදෙන සංශෝධන වේනම් ඒවා සඳහන් කර හෝ සංශෝධන නොමැති නම් ඒ බව දැන්වීමෙන් අනතුරුව අනුමත කිරීම සඳහා අවසාන පිඹුරු පිටපත් 5 බැගින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත භාර දීම

18.1 ඡේදය 20.48 ඡේදය ඇමුණුම 01

1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත, 1982 අංක 45 දරණ සභාධිපත්‍ය දේපළ (සංශෝධිත) පනත මඟින් සංශෝධනය වී ඇති අතර ඉන් පසු එය 2003 අංක 39 දරන බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත මඟින්ද සංශෝධනය වී ඇත. එමඟින් උපුටා ගන්නා ලද කරුණු පහත දැක්වේ.

සටහන: පහත දක්වා ඇති වගන්ති අංක 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනතේ වගන්ති අංක වන අතර එම වගන්ති සංශෝධනය වී ඇති අවස්ථාවල අදාල සංශෝධන පනත් අංක සහ යොමුව කොටු වරහන් තුල දක්වා ඇත.

පනතේ දීර්ඝ නාමය. [§ 2003 අංක 39, (2)]

"ගොඩනැගිලි වල සභාධිපත්‍ය කොටස්වලට අදාළ හිමිකම් ලියාපදිංචි කිරීම සඳහාද, ගොඩනැගිල්ල අනුබද්ධ පොදු අංගෝපාංග ඇති සභාධිපත්‍ය කොටස් වලට නැවත බෙදා වෙන් කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහාද, එම කොටස් වලට වෙන් වෙන් වශයෙන් අයිතිය ලබා ගැනීමට හැකි වීම පිණිස සහ ඒවායේ හිමිකම් බැහැර කිරීමට හැකි වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුශංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි."

2 වගන්තිය - පනත අදාල වීම. [§ 2003 අංක 39, (3)]

2. (අ) එක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත ඉදිකරන ලද සහ (මෙහි මින් මතු "සභාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස් වලට නැවත බෙදා වෙන් කිරීමේ හැකියාව ඇති යම් ගොඩනැගිල්ලකට;

(ආ) එක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත ඉදි කිරීමට යෝජිත සහ (මෙහි මින් මතු "තාවකාලික සභාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස්වලට නැවත බෙදා වෙන් කිරීමේ හැකියාව ඇති යම් ගොඩනැගිල්ලකට;

(ඇ) එක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත අර්ධ වශයෙන් ඉදිකරනු ලැබ ඇති වූ ද මනුෂ්‍යය වාසය සඳහා සුදුසු (මෙහි මින් මතු "අර්ධ සභාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්පූර්ණ කරන ලද සභාධිපත්‍ය කොටස් එකකට වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තා වූ ද යම් ගොඩනැගිල්ලකට,

මේ පනත අදාල විය යුතු ය.

5 (1) වගන්තිය - සභාධිපත්‍ය පිඹුර [§ 1982 අංක 45, (4)] [§ 2003 අංක 39, (6)]

5(1) සභාධිපත්‍ය පිඹුරකට, බලයලත් මිනින්දෝරුවරයකු හෝ මිනුම්පතිවරයාගේ අධිකාරිය මඟින් හෝ එය යටතේ සකස්කොට අදිනු ලැබූ මිනුම් පිඹුරක් හෝ පිඹුරු ඇතුළත් විය යුතු අතර

(අ) සභාධිපත්‍ය දේපලේ මතුපිට මායිම් සහ මායිම් සලකුණු සහ ඒ මත පිහිටා ඇති එක් එක් නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ල මතුපිට මායිම්වලට අදාළව පිහිටීම රූපරේඛනය කළ යුතු ය.

(ආ) ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති කොට්ඨාශය, වෙළුම සහ පත්ඉරුව එසේම එහි මනින ලද ප්‍රදේශය ද නිශ්චිතව දැක්විය යුතුය.

(ඇ) (i) එක් එක් මහලේ බිම් ප්‍රමාණය සහ සීලිම ද;

(ii) එක් එක් මහලේ උස ද,

පෙන්නුම් කරමින් එක් එක් නැවත බෙදා වෙන් කරන ලද ගොඩනැගිල්ලේ සිරස් කොටසක් ඇතුළත් විය යුතුය.

(ඈ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයෙහි බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදා වෙන්කිරීමේ සැලසුම් වලට අනුකූලව සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ලක් ලෙස සභාධිපත්‍ය දේපළ ඇතුළත ඉදිකරනු ලැබූ එක් එක් ගොඩනැගිල්ලේ විස්තරයක් සහ ඒ ගොඩනැගිල්ලේ සිරස් පැතිකඩක් සහ එහි දිග සහ පළල ද ඇතුළත් විය යුතුය.

(ඉ) එක් එක් සභාධිපත්‍ය කොටසේ (2) සහ (3) වන උපවගන්ති වල විධිවිධාන වලට යටත්ව රේඛනය කළ යුතු අතර යම් දිගාංශයන් පෙන්වීමේ අවශ්‍යතාවයක් නොමැතිව, තිරස් දිග පළල පෙන්නුම් කරමින් බිමේ ප්‍රමාණය සහ බිත්ති පිළිබඳව සඳහන් කරමින් එහි මායිම් නිර්ණය කළ යුතුය.

(ඊ) එක් එක් ගොඩනැගිල්ල බෙදා වෙන්කර ඇති සභාධිපත්‍ය කොටස්/ඒකක හඳුනාගත යුතු අතර වරිපනම් අංක, අංක හෝ වෙනත් සලකුණු මඟින් එම කොටස්/ඒකක වෙන්කොට දැක්විය යුතුය.

(උ) සභාධිපත්‍ය දේපළේ ඉඩම් කොටස්/ඒකක අංකයට අදාළව හඳුනා ගැනීමේ ප්‍රලේඛන අකුරක් මඟින් එක් එක් මහල වෙන්කොට දැක්විය යුතු අතර එක් එක් මහලේ අංකයට අදාළව ඒ මහලේ ඇති සභාධිපත්‍ය කොටස්/ඒකක දැක්විය යුතුය;

(ඌ) එක් එක් සභාධිපත්‍ය කොටසේ ආසන්නතම බිම් ප්‍රමාණය පෙන්විය යුතුය;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයෙහි බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදා වෙන්කළ සැලසුම්වලට අනුකූලව සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන්කළ ගොඩනැගිල්ලක් ලෙස සභාධිපත්‍ය දේපළ ඇතුළත ඉදිකරනු ලැබූ එක් එක් ගොඩනැගිල්ලේ යම් දිගාංශයක් පෙන්වීමේ අවශ්‍යතාවක් නොමැතිව, බාහිර මායිම් රූප රේඛනය කොට ඒවායේ තිරස් දිග, පළල පෙන්නුම් කළ යුතුය;

(ඒ) සභාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග කොටස් නිර්ණය කළ යුතුය;

(ඔ) සභාධිපත්‍ය දේපළෙහි පෙන්නුම් කර ඇති ගොඩනැගිල්ල සභාධිපත්‍ය දේපළේ බාහිර තිරස් මායිම් ඇතුළත පිහිටා ඇති බවට එය පිළියෙල කරන තැනැත්තා විසින් කරනු ලබන සටහනක් තිබිය යුතුය;

(ඕ) එහි පෙන්වා ඇති සභාධිපත්‍ය කොටස්/ඒකක, සභාධිපත්‍ය දේපළ මත පිහිටා ඇති සභාධිපත්‍ය කොටස්ම බවට ලියාපදිංචි වාස්තු විද්‍යාඥයකු හෝ ලියාපදිංචි වෘත්තීයමය සිවිල් ඉංජිනේරුවකු විසින් නිකුත් කරනු ලබන සහතිකයක් එයට අමුණා තිබිය යුතුය;

(ක) 20 අ වගන්තියේ විධිවිධාන වලට අනුකූලව සැලැස්මෙහි ඇති එක් එක් සභාධිපත්‍ය කොටසේ හිමිකම් වටිනාකම ඇතුළත් කළ යුතුය;

(ග) සභාධිපත්‍ය දේපළේ බාහිර මතුපිට මායිම් වලට අදාළව සභාධිපත්‍ය පිඹුරෙහි පෙන්නුම් කර ඇති සියළු ගොඩනැගිලි සහ සියළු සභාධිපත්‍ය කොටස්/ඒකක සභාධිපත්‍ය දේපළ ඇතුළත පිහිටා ඇති බවට ද ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ උප බෙදීමේ සැලසුම් වලට අනුකූල වන බවටද බලයලත් මිනින්දෝරුවරයකු විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් මඟින් කරන ලද සටහනක් තිබිය යුතුය;

(ච) එක් එක් සභාධිපත්‍ය කොටසේ හිමිකම් වටිනාකම සම්පූර්ණ සංඛ්‍යා වලින් ද සියළුම සභාධිපත්‍ය කොටස්/ඒකක වල මුළු හිමිකම් වටිනාකමේ අයිතිය සමාන සංඛ්‍යාවක් ද පෙන්නුම් කළ යුතුය.

(ජ) 20 වගන්තියට අනුකූලව කළමනාකාර සංස්ථාව වෙත ලේඛන භාර දිය හැකි ලිපිනය එහි සටහන් කර තිබිය යුතුය; සහ

(ට) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ද ඇතුළත් විය යුතුය.

5(2) වගන්තිය - සභාධිපත්‍ය පිඹුර [§ 1982 අංක 45, (4)] [§ 2003 අංක 39, (6)]

(2) උපකාරක කොටසක ගොඩනැගිල්ලකින් සහ බාහිර බිත්ති කීපයකින්, බිමකින් සහ සිවිලිමකින් සමන්විත වන අවස්ථාවක ඒ උපකාරක කොටසේ දිග, පළල සහ මායිම් (1) වන උප වගන්තියේ නියමයන්ට අනුකූලව සභාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කළ යුතුය.

5(3) වගන්තිය - සභාධිපත්‍ය පිඹුර [§ 1982 අංක 45, (4)] [§ 2003 අංක 39, (6)]

(3) උපකාරක කොටසක් ගොඩනැගිල්ලකින් සමන්විත නොවන අවස්ථාවක

(අ) ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදන ලද සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයෙහි වගකිව යුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදන ලද සැලසුම් වලින් උපකාරක කොටස්වල බාහිර මායිම් දැනගත යුතු අතර, සභාධිපත්‍ය දේපළේ වෙනත් කොටසක් මඟින් බිම් මට්ටමට ඉහතින් වූ යම් දීර්ඝ කිරීමකට හෝ බිම් මට්ටමකට පහලින් වූ ප්‍රසර්පණයක ප්‍රමාණයට හැර උපකාරක කොටසේ කොටසේ සිරස් දිග පළල සීමා රහිත විය යුතුය; සහ

(ආ) සභාධිපත්‍ය පිඹුරෙහි, (අ) ඡේදයෙහි සඳහන් අනුමත සැලසුම් මත පෙන්වා ඇති සමාන දිග පළල ඇති උපකාරක කොටස්වල රූප සටහන් පෙන්නුම් කළ යුතුය.

5(4) වගන්තිය - සභාධිපත්‍ය පිඹුර [§ 1982 අංක 45, (4)] [§ 2003 අංක 39, (6)]

(4) සභාධිපත්‍ය පිඹුරෙහි අන්‍යාකාරයකින් නියම කර ඇත්නම් මිස, වෙනත් සභාධිපත්‍ය කොටසක හෝ පොදු අංගෝපාංගයක් සමඟ ගත් කළ යම් සභාධිපත්‍ය පිඹුරක හෝ මායිම් විය යුත්තේ අවස්ථාවෝචිත පරිදි බිම් ප්‍රමාණයේ, බිත්තිවල හෝ සිවිලිමේ මධ්‍යස්ථානයේ ය.

5(5අ) වගන්තිය - තාවකාලික සභාධිපත්‍ය පිඹුර [§ 2003 අංක 39, (7)]

(5) (අ) තාවකාලික සභාධිපත්‍ය පිඹුර බලයලත් මිනින්දෝරුවරයකු විසින් හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ සකස් කොට අඳිනු ලැබිය යුතු අතර එම සැලැස්මට පහත සඳහන් දේ ඇතුළත් විය යුතුය :

(අ) යෝජිත සභාධිපත්‍ය දේපළෙහි බාහිර මතුපිට මායිම් සහ මායිම් සලකුණු රූපරේඛනය කළ යුතු අතර, මතුපිට මායිම් වලට අදාළව එය මත ඉදිකිරීමට අපේක්ෂිත එක් එක් නැවත බෙදන ලද ගොඩනැගිල්ලේ තත්වය;

(ආ) ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති කොට්ඨාශය, වෙළුම සහ පත් ඉරුව සහ එහි මනින ලද ප්‍රදේශය දැක්විය යුතු ය;

(ඇ) (i) එක් එක් මහලේ බිම් ප්‍රමාණ සහ සීලිම ද; සහ
(ii) එක් එක් වහලේ උස, පෙන්නුම් කරමින් ඉදිකිරීමට යෝජිත එක් එක් නැවත බෙදන ලද ගොඩනැගිල්ලේ තිරස් කොටසක් විය යුතුය;

(ඈ) ගොඩනැගිලි අනුමත කිරීම සඳහා වගකිව යුතු තත් කාලය සඳහා වූ අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුළත ඉදිකිරීමට යෝජිත එක් එක් ගොඩනැගිල්ලේ විස්තරයක් සහ ඒ ගොඩනැගිල්ලේ සිරස් කොටසක් සහ දිග පළල;

(ඉ) 5 වන වගන්තියේ (2) සහ (3) උපවගන්තිවල විධිවිධානවලට යටත්ව එක් එක් යෝජිත සභාධිපත්‍ය කොටස ආලේඛනය කළ යුතු අතර, යම් පිහිටීමේ ස්වභාවය පෙන්නුම් කිරීමක්

නොමැතිව දිග සහ පළල නිසා පෙන්නුම් කරමින් බිම් ප්‍රමාණය සහ බිත්තීන් පිළිබඳව සඳහන් කරමින් එහි මායිම් නිර්ණය කළ යුතුය;

(ඊ) එක් එක් යෝජිත සභාධිපත්‍ය කොටස්/ඒකක හඳුනාගත යුතු අතර, වරිපනම් අංක වලින්, අංක වලින් හෝ වෙනත් සංකේත වලින් එම කොටස්/ඒකක පැහැදිලිව පෙන්නුම් කළ යුතුය;

(උ) කැඩස්තර සිතියමේ ඉඩම් කොටස්/ඒකක අංකයට අදාළව හඳුනාගැනීමේ අකුරක් මඟින් එක් එක් යෝජිත මහල වෙන් වශයෙන් හඳුනාගත යුතු අතර, එක් එක් මහලේ අංකයට අදාළ එක් එක් මහලේ පිහිටි යෝජිත සභාධිපත්‍ය කොටස නිශ්චිතව දක්වනු ලැබිය යුතුය;

(ඌ) එක් එක් යෝජිත කොටසේ ආසන්නතම බිම් ප්‍රමාණය දැක්වීම කළ යුතුය;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයෙහි වගකිව යුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුළත ඉදිකිරීමට යෝජිත එක් එක් ගොඩනැගිල්ලේ පිහිටීම පෙන්නුම් කිරීමේ අවශ්‍යතාවක් නොමැතිව බාහිර මායිම් ආලේඛනය කොට තිරස් මිමි පෙන්නුම් කළ යුතුය;

(ඒ) තාවකාලික සභාධිපත්‍ය දේපළින් තාවකාලික පොදු අංගෝපාංග කොටස් නිර්ණය කළ යුතුය;

(ඔ) එක් එක් යෝජිත සභාධිපත්‍ය පිඹුරේ තාවකාලික හිමිකම් වටිනාකම් සම්පූර්ණ අංක වලින් පෙන්නුම් කළ යුතු අතර, සියළුම යෝජිත සභාධිපත්‍ය කොටස්වල තාවකාලික හිමිකම් වටිනාකම්වල මුළු එකතුව සමාන අංක වලින් ද පෙන්නුම් කළ යුතුය;

(ඕ) තාවකාලික සභාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ල ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා තත් කාලයේ බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලැස්මට අනුකූල වන බවට එකී සැලැස්ම පිළියෙල කළ තැනැත්තා විසින් සටහන් කර තිබිය යුතුය.

<u>5(5ආ) වගන්තිය - අර්ධ සභාධිපත්‍ය පිඹුර [§ 2003 අංක 39, (7)]</u>

5ආ.(1) "අර්ධ සභාධිපත්‍ය පිඹුරක්" බලයලත් මිනින්දෝරුවරයකු විසින් හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ සකස් කොට ඇදිය යුතු අතර, එම පිඹුරෙහි පහත සඳහන් දේ ඇතුළත් විය යුතුය:-

(අ) අර්ධ සභාධිපත්‍ය දේපළෙහි බාහිර භූතල මායිම් සහ මායිම් සළකුණු ද, භූතල මායිම් වලට අදාළව ඒ මත පිහිටා ඇති එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ලේ පිහිටීම ද භූතල මායිම් වලට අදාළව ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා වන අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව සම්පූර්ණ කිරීමට ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටසේ පිහිටීම ද ආලේඛනය කිරීම;

(ආ) ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති කොට්ඨාශය, වෙළුම, සහ පිටුව සහ එහි මනින ලද ප්‍රදේශය නිශ්චිතව දැක්වීම;

(ඇ) (i) එක් එක් මහලේ ගෙබිම සහ සීලිම; සහ
(ii) එක් එක් මහලේ උස පෙන්නුම් කරමින් එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන්කළ ගොඩනැගිල්ලේ සිරස් කඩක්;

(ඈ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයේ බලය දරන බලධරයා විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටසෙහි ඉදි කරන ලද අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ විස්තරයක් සහ එහි සිරස් කඩක් සහ දිග පළල ද එසේම එම ඉඩම් කොටස මත ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටසේ සිරස් කඩක් සහ දිග පළල ද ඇතුළත් කළ යුතුය;

(ඉ) 5 වන වගන්තියේ (2) සහ (3) උපවගන්තිවල විධිවිධාන වලට යටත්ව අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ලේ එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක රූප රේඛනය කළ යුතු අතර යම් දිගාංශයන් පෙන්වීමේ අවශ්‍යතාවක් නොමැතිව තිරස් මාන දැක්වෙන පරිදි ගෙබිම සහ බිත්තිවලට අනුව එහි මායිම් නිර්ණය කිරීම;

(ඊ) එක් එක් ගොඩනැගිල්ල බෙදා වෙන් කිරීමට අදහස් කරනු ලබන අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ සභාධිපත්‍ය කොටස්/ඒකක හඳුනාගැනීම සහ වරිපනම් අංක වලින්, අංක වලින් හෝ වෙනත් සළකුණු වලින් එක් එක් කොටස වෙන් වශයෙන් හඳුනාගැනීම;

(උ) කැඩැස්තර සිතියමේ ඉඩම් කොටස්/ඒකක අංකයට අදාළව හඳුනාගැනීමේ අකුරක් මඟින් එක් එක් මහල වෙන් වශයෙන් හඳුනාගැනීම සහ එම මහලේ අංකයට අදාළව එක් එක් මහලෙන් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ සභාධිපත්‍ය කොටස නිශ්චිතව දැන්වීම;

(ඌ) එක් එක් කොටසේ ආසන්නතම බිම් ප්‍රමාණය දැක්වීම;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයේ වගකිවයුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුළත ද ඉදිකරන ලද එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ පිහිටීම පෙන්නුම් කිරීමේ අවශ්‍යතාවක් නොමැතිව බාහිර මායිම් ආලේඛනය කිරීම සහ තිරස් දිග පළල පෙන්නුම් කිරීම;

(ඒ) අර්ධ සභාධිපත්‍ය දේපළෙහි පොදු අංගෝපාංග කොටස් නිර්ණය කිරීම;

(ඔ) අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ එක් එක් සභාධිපත්‍ය කොටසේ සහ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටසෙහි එක් එක් තාවකාලික සභාධිපත්ය කොටසේ සම්පූර්ණ සංඛ්‍යාවල හිමිකම් වටිනාකම පෙන්වීම සහ සියළුම සභාධිපත්‍ය කොටස්/ඒකක වල සහ එක් එක් සභාධිපත්‍ය කොටසේ හිමිකම්, වටිනාකම්වල මුළු එකතුවට සමාන අංකයක් ද පෙන්නුම් කිරීම;

(ඕ) අර්ධ සභාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා තත්කාලයේ බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලැස්මට අනුකූල බව එකී සැලැස්ම පිළියෙල කළ තැනැත්තා විසින් සටහනක් කර තිබිය යුතුය.

6 වගන්තිය - සභාධිපත්‍යය පිඹුරු ඒකාබද්ධ කිරීමේ හෝ නැවත බෙදා වෙන්කිරීමේ පිඹුරු ලියා පදිංචි කිරීම [§ 2003 අංක 39, (8)]

6 (1) සභාධිපත්‍ය පිඹුරක් හෝ ''තාවකාලික සභාධිපත්‍ය පිඹුරක්'' හෝ ''අර්ධ සභාධිපත්‍ය පිඹුරක්'' ලියාපදිංචි කිරීම සඳහා වන කිසියම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන කිසියම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8 වන වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8ආ වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් හෝ නැවත බෙදන ලද පිඹුරක් හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 12 වන වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් හෝ ''සංකළන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8අ වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් ලැබීමෙන් පසු, රෙජිස්ට්‍රාර් විසින්, අවස්ථාවෝචිත පරිදි, සභාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර හෝ සංශෝධන පිඹුර හෝ නැවත බෙදන ලද පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර හෝ සංකළන පිඹුර ඇතුළුව ඒ ඉල්ලීම හා කැඩැස්තර සිතියම සහතික කිරීම සඳහා මිනින්දෝරුවරයා වෙත යොමු කළ යුතුය.

(2) අවස්ථාවෝචිත පරිදි, සභාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර හෝ සංශෝධන පිඹුර හෝ නැවත බෙදන ලද පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර හෝ සංකළන පිඹුර මේ පනතේ විධිවිධාන වලට හා 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූල වන බවට මිනින්දෝරුවරයා සෑහීමට පත්වන අවස්ථාවක, සර්වේයර් ජනරාල්වරයා වෙනුවට ඒ පිඹුර ඔහු විසින් සහතික කරනු ලැබිය යුතු අතර -

(අ) හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා භාවිතා වන කැඩැස්තර සිතියමට අනුව, සුදුසු සඳහන් කිරීම් දැක්වීමෙන් පසුව හා අවශ්‍ය සංශෝධන හෝ වෙනස් කිරීම් හෝ අතුරු බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් හෝ සංයුක්ත කිරීම් වලින් පසුව අවස්ථාවෝචිත පරිදි සභාධිපත්‍ය පිඹුරු හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරු හෝ සංශෝධන පිඹුරු හෝ නැවත බෙදන ලද පිඹුරු හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරු හෝ සංකළන පිඹුරු මුල් පිටපත් ගොනු කළ යුතුය; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, අවශ්‍ය සඳහන් කිරීම් හෝ සංශෝධන නැතහොත් අතුරු බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් සිදුකිරීමෙන් පසුව කැඩැස්තර සිතියම සමඟ ඒ පිඹුරේ සහ ඉල්ලීමේ අනු පිටපත් නිසි රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) මිනින්දෝරුවරයා විසින් නිසි ලෙස සහතික කරන ලද කැඩැස්තර සිතියමක් ලැබීමෙන් පසු, ඒ ඉල්ලීම මේ පනතේ විධිවිධාන වලට සහ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව වන බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් -

(අ) ඉල්ලීම, සභාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවක දී, -

i. සභාධිපත්‍ය පිඹුරේ අනුපිටපත සභාධිපත්‍ය කොටස්/ඒකක ගොනුවේ ගොනු කළ යුතුය;

ii. සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් අළුත් හිමිකම් නාම ලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර එම නාම ලේඛනයේ සහ ඉඩම් කොටස්/ඒකක ලියාපදිංචි කර ඇත්තා වූ නාම ලේඛනයේ හා තාවකාලික සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර මීට පෙර ලියාපදිංචි කර තිබෙන්නේ නම් එම තාවකාලික සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇත්තා වූ නාම ලේඛනයේ සුදුසු හරස් විමසුම් යොමු සටහන් යෙදිය යුතුය;

iii. නාමලේඛනයේ ඇතුළත් වන ඉඩම්වල පොදු දේපළ පමණක් අඩංගු වන බව, ඉඩම් කොටසට අදාළ වන්නා වූ නාම ලේඛනයේ දේපළ කොටසේ සටහන් කළ යුතුය;

iv. එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක අරඹයා පවතින උකස් කිරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බදු දීම්, විකිණීම සඳහා වූ ගිවිසුම් විනිශ්චයට භාජනයවීම, තහනමට ගැනීමක්, නියෝගයක් හෝ තීන්දු ප්‍රකාශයක් ආදී ලෙසින් සභාධිපත්‍ය කොටස්/ඒකක වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියළු බැඳීම් පිළිබඳ විස්තර සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එවැනි එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ බැඳුම් සහතික පත්‍ර කොටසේ සටහන් කළ යුතුය;

v. (මෙහි මින් මතු, ‘‘ලියාපදිංචි කළ සභාධිපත්‍ය පිඹුර යනුවෙන් සඳහන් කරනු ලබන) එම සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයක් සමඟ අදාළ නාම ලේඛන වල යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැන්විය යුතුය;

vi. නියමිත ගාස්තු ලැබුන පසු තනි පුද්ගලික සභාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් ‘‘සභාධිපත්‍ය හිමිකම්’’ සහතිකයක් නිකුත් කළ යුතුය.

(ආ) ඉල්ලීම, තාවකාලික සභාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවකදී, -

i. තාවකාලික සභාධිපත්‍ය පිඹුරේ අනුපිටපත තාවකාලික සභාධිපත්‍ය කොටස්/ඒකක ගොනුවේ ගොනු කළ යුතුය;

ii. තාවකාලික සභාධිපත්‍ය පිඹුරක දක්වා ඇති එක් එක් තාවකාලික සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් වූ නාමලේඛනය තුළ අළුත් තාවකාලික හිමිකම් නාමලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර ඒ ඉඩම් කොටස්/ඒකක ලියාපදිංචි කර තිබෙන්නා වූ නාමලේඛනය තුළ වූ එම නාමලේඛනයේ සුදුසු හරස් විමසුම් යොමු සහටන් යෙදිය යුතුය;

iii. නාමලේඛනයේ ඇතුළත් වන ඉඩම්වල පොදු දේපළ පමණක් අඩංගු වන බව, ඉඩම් කොටසට අදාළ වන්නා වූ නාම ලේඛනයේ දේපළ කොටසේ සටහන් කළ යුතුය;

iv. එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක අරභයා පවතින උකස් කිරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බදුදීම්, විකිණීම සඳහා වූ ගිවිසුම්, විනිශ්චයට භාජනය වීම තහනමට ගැනීමක්, නියෝගයක් හෝ තීන්දු ප්‍රකාශයක් ආදී ලෙසින් සභාධිපත්‍ය කොටස්වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියළු බැඳීම් පිළිබඳ විස්තර එක් එක් තාවකාලික සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ බැඳුම් සහතික පත්‍ර කොටසේ සටහන් කළ යුතුය;

v. (මෙහි මින් මතු ලියාපදිංචි කළ තාවකාලික සභාධිපත්‍ය පිඹුර යනුවෙන් සඳහන් කරනු ලබන) එම තාවකාලික සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයක් සමග අදාළ නාම ලේඛනවල යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැන්විය යුතුය;

vi. නියමිත ගාස්තු ලැබුන පසු පුද්ගලික තාවකාලික සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතුය.

(ඇ) ඉල්ලීමක්, අර්ධ සභාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවකදී :-

i. අර්ධ සභාධිපත්‍ය අනු පිටපත අර්ධ සභාධිපත්‍ය කොටස්/ඒකක ගොනුවේ ගොනු කළ යුතුය;

ii. අර්ධ සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ අළුත් හිමිකම් නාමලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර එම නාම ලේඛනයේ සහ ඉඩම් කොටස්/ඒකක ලියාපදිංචි කර තිබෙන්නා වූ නාම ලේඛනයේ හා තාවකාලික සභාධිපත්‍ය පිඹුර මීට පෙර ලියාපදිංචි කර තිබෙන්නේ නම් ඒ තාවකාලික සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර තිබෙන්නේ වූ නාම ලේඛනයේ සුදුසු හරස් විමසීම් යොමු සටහන් යෙදිය යුතුය;

iii. නාම ලේඛනයේ ඇතුළත් වන ඉඩම්වල පොදු දේපළ පමණක් අඩංගු වන බව ඉඩම් කොටසට අදාළ වන්නා වූ නාම ලේඛනයේ දේපළ කොටසේ සටහන් සටහන් කළ යුතුය

iv. එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක අරභයා තවතින උකස් කරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බදු දීම්, විකිණීම සඳහා වූ ගිවිසුම් විනිශ්චයට භාජනය වීම, තහනමට ගැනීමක්, නියෝගයන් හෝ තීන්දු ප්‍රකාශයන් ආදී ලෙසින් සභාධිපත්‍ය කොටස්වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියළු බැඳීම් පිළිබඳ විස්තර අර්ධ සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ බැඳුම් සහතික පත්‍ර කොටසේ සටහන් කළ යුතුය;

v. (මෙහි මින් මතු "ලියාපදිංචි කළ අර්ධ සභාධිපත්‍ය පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ අර්ධ සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇති බවට එහි ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයක් සමග අදාළ නාම ලේඛනවල යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැන්විය යුතුය;

vi. නියමිත ගාස්තු ලැබුනු පසු තනි පුද්ගලික සභාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් අර්ධ සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතුය.

(ඈ) ඉල්ලීම ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරක හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරක සංශෝධනය කිරීමේ යම් පිඹුරක් හෝ නැවත බෙදන ලද යම් පිඹුරක් හෝ ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරක් හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරක් ඒකාබද්ධ කිරීම සඳහා වන කිසියම් පිඹුරක්, ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවකදී :-

i. සංශෝධන පිඹුරේ හෝ නැවත බෙදන ලද පිඹුරේ හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරේ අනු පිටපත් අදාළ සභාධිපත්‍ය කොටස්/ඒකක ගොනුවේ ගොනුකළ යුතුය;

ii. ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් වන අවශ්‍ය සඳහන් කිරීම් නාම ලේඛනයේ සටහන් කළ යුතු අතර ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරේ මුල් පිටපතේ හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ මුල්පිටපතේ අවශ්‍ය යොමු සටහන් යෙදිය යුතුය;

iii. ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරක හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරක ඇති එවැනි සංශෝධන හෝ නැවත බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් ලියාපදිංචි කර තිබෙන්නා වූ බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයක් සමග අදාළ නාම ලේඛනවල යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැන්විය යුතුය;

iv. නියමිත ගාස්තු ලැබීමේ දී, තනි පුද්ගල සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් නව්‍ය සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතුය.

(ඉ) ඉල්ලුම් පත්‍රය, ලියාපදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරක් සංශෝධනය කිරීමේ යම් පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අවස්ථාවකදී :-

i. ලියාපදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරේ අනු පිටපතක් අදාළ තාවකාලික සභාධිපත්‍ය කොටස්/ඒකක ලිපි ගොනුවේ ගොනු කළ යුතුය;

ii. ලියාපදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති එක් එක් තාවකාලික සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් තාවකාලික සභාධිපත්‍ය හිමිකම් ලේඛනයේ අවශ්‍ය සටහන් කළ යුතු අතර ලියාපදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරේ මුල්පිටපතේ අවශ්‍ය යොමු සටහන් ද කරනු ලැබිය යුතුය;

iii. එක් එක් සංශෝධිත තාවකාලික සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් සභාධිපත්‍ය කොටස්වලට බලපාන උකස් කිරීම් සහ එක් එක් සභාධිපත්‍ය කොටසට එරෙහිව ලබාගන්නා ලද මුදල් ප්‍රමාණයන් එසේම බදු, විකිණීම සඳහා වූ ගිවිසුම්, විනිශ්චයට භාජනය වීම, තහනමට ගැනීමේ ආඥා හෝ තීන්දු ප්‍රකාශ ආදිය තිබේ නම් ලේඛනයේ බැඳීම් කොටසෙහි සටහන් කළ යුතුය;

iv. ඉල්ලුම්කරුට ඒ ලියාපදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරේ සංශෝධනය කිරීම ලියාපදිංචි කරනු ලැබ ඇති බව දැනුම් දිය යුතු අතර සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිවේදනයක් ද සමග අදාළ ලේඛනයේ යොමු අංක පිළිබඳව ද ඉල්ලුම්කරුට දැනුම් දිය යුතුය;

v. නියමිත ගාස්තු ගෙවීමේ දී, තනිපුද්ගල සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් අළුත් සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතුය

(ඊ) ඉල්ලීම ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරට එකතු කිරීමේ යම් පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවක දී :-

i. ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරට එකතු කිරීමේ පිඹුරෙහි අනු පිටපතක් අදාළ සභාධිපත්‍ය කොටසේ ලිපිගොනුවෙහි ගොනු කරනු ලැබිය යුතුය.

ii. ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ එකතු කිරීමේ පිඹුරේ පෙන්නුම් කර ඇති පසුව එකතු කරන ලද එක් ඒක් සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් සභාධිපත්‍ය හිමිකම් ලේඛනයෙහි අවශ්‍ය සඳහන් කිරීම් කළ යුතු අතර ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති ලේඛනයෙහි සහ අර්ධ සභාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික

සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කරනු ලැබ ඇති ලේඛනවල අවශ්‍ය යොමු සටහන් කළ යුතුය;

iii. ලියාපදිංචි අර්ධ සභාධිපත්‍ය පිඹුරේ එකතු කිරීමේ පිඹුරෙහි පෙන්නුම් කර ඇති පසුව එකතු කරන ලද එක් එක් සභාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් සහ එක් එක් සභාධිපත්‍ය කොටසට බලපාන උකස් කිරීමේ සහ එම සභාධිපත්‍ය කොටස්වලට එරෙහිව ලබාගත් මුදල් ප්‍රමාණයන් තිබීම පිළිබඳව ද, බදු දීම්, විකිණීම සඳහා ගිවිසුම්, විනිශ්චයට භාජනය වීම, තහනමට ගැනීමේ ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් තිබීම පිළිබඳව ලේඛනයේ බැඳීම් කොටසෙහි සටහන් කළ යුතුය;

iv. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ද පිටපතක් සහිතව එකී සභාධිපත්‍ය කොටස්/ඒකක අර්ධ සභාධිපත්‍ය පිඹුරේ ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරුට දැන්විය යුතුය;

v. නියමිත ගාස්තු ලැබුණු විට සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් එකී සභාධිපත්‍ය කොටස්/ඒකක සම්බන්ධයෙන් නිකුත් කළ යුතුය.

(4) ඔප්පු ලියාපදිංචි කිරීම සහ කැඩැස්තර සිතියම් පරීක්ෂා කිරීම සහ ලේඛනවල සහ කැඩැස්තර සිතියම්වල සහතික පිටපත් නිකුත් කිරීම සහ සභාධිපත්‍ය කොටස හෝ කොටස්වල අයිතිවාසිකම් හෝ කැමති පත්‍රවල සහතික පත්‍ර ලබා ගැනීම සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 1998 අංක 21 දරන ඔප්පු ලියාපදිංචි කිරීමේ පනතේ 34, 35 සහ 37 වන වගන්ති යොදා ගනු ලැබිය යුතුය.

(5) රෙජිස්ට්‍රාර්වරයා විසින් ''සභාධිපත්‍ය පිඹුර'' හෝ ''තාවකාලික සභාධිපත්‍ය පිඹුර'' හෝ ''අර්ධ සභාධිපත්‍ය පිඹුර'' හෝ ''සංශෝධිත පිඹුර'' හෝ ''වෙන් කිරීමේ පිඹුර'' හෝ ''ඒකාබද්ධ කිරීමේ පිඹුර'' හෝ ''එකතු කිරීමේ පිඹුර'' ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී ඔහු විසින් ප්‍රතික්ෂේප කිරීමේ නියමයක් කරනු ලැබිය යුතු අතර ඒ ප්‍රතික්ෂේප කිරීමේ නියමය සඳහා වූ හේතු නියමිත ලේඛනයක වාර්තා කරනු ලැබ අවස්ථාවෝචිත පරිදි ''සභාධිපත්‍ය හිමිකම ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන ලදී'' හෝ ''තාවකාලික සභාධිපත්‍ය හිමිකම ලියාපදිංචි කිරීම හෝ අර්ධ සභාධිපත්‍ය හිමිකම ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන ලදී'' යන වචන සාධන පත්‍රවල සහ එවැනි ලියාපදිංචි කිරීමක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර කරනු ලබන තැනැත්තා විසින් කරනු ලබන ඒ ඉල්ලුම් පත්‍රය මත පිටසන් කරනු ලැබිය යුතු අතර එසේ වාර්තා කරනු ලබන හේතුවල පිටපතක් ඒ තැනැත්තා වෙත ගෙවීමකින් තොරව හෝ අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ලබාදිය යුතුය.

(6) සභාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර, හෝ සංශෝධිත පිඹුර හෝ වෙනස් කිරීමේ පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ කිරීමේ පිඹුර හෝ එකතු කිරීමේ පිඹුර ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරමින් රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන සෑම නියමයක්ම සඳහාම අභියාචනය කිරීමක් කරනු ලැබීමේ හැකියාවක් තිබිය යුතු අතර ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 38 වන වගන්තියේ විධිවිධාන එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව යොදාගනු ලැබිය යුතුය.

<u>22 වගන්තිය - ඉවත් කිරීම</u>

22. 1970 අංක 12 දරන සභාධිපත්‍ය දේපළ පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

<u>23 වගන්තිය - බෙදුම් නඩු පනතේ විධිවිධාන ඇතැම් අවස්ථාවන්හි දී අදාළ නොවීම</u>

23. ලියා පදිංචි කරන ලද යම් සභාධිපත්‍ය පිඹුරකට අඩංගු යම් ඉඩමකට හෝ ගොඩනැගිල්ලකට බෙදුම් නඩු පනත අදාළ නොවිය යුතු ය.

[18.6 පේදය](#) [ඇමුණුම 02](#)

ග්‍රාම නිලධාරී කොට්ඨාශය கி. நி. பிரிவு
G.N. Division:

සුළු කොට්ඨාශය சிறு பிரிவு Minor Division:

ප්‍රා. ලේ. කොට්ඨාශය பி. செ. பிரிவு
D.S. Division:

දිස්ත්‍රික්ක මාවට්ටම் District:

පළාත மாகாணம் Province:

Moratuwella (Within the Municipal Council Limits of Moratuwa)

553A, Moratuwella North

-

Moratuwa

Colombo

Western

මැනුම් ඉල්ලීම් අංකය
நில அளவை வேண்டுகோள் இல.
Survey Requisition No

S.G's No. CO/MRT/2016/0054 Date: 16-10-2016

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

කැඩැස්තර සිතියම් අංකය கடதாசில் வரைபட இல Cadastral Map No: 520214
කලාප අංකය தொகுதி இல Block No: 02
පත්‍ර අංකය தாள் இல. Sheet No: 12
ඉවිලැ පිටු අංකය தி.வி.கோ. பக்க இல T. L. Page No: 37

කැබලි අංකය துண்டு இல. Lot No	ඕම ප්‍රමාණය (වර්ග මීටර්) விஸ்தீரணம் (சதுரமீற்றர்) Floor Area (Sq.m)	කොටස් වටිනාකම பங்கு மதிப்பு Share Value	ඉඩමේ නම காணியின் பெயர் Name of Land	ඉඩම් පරිහරණය காணிப் பயன்பாடு Land use	හිමිකම් කියන්නා உரிமை கோருபவராக Claimant	මායිම් විස්තරය எல்லை விபரம் Boundary Schedule						වෙනත් කරුණු பிற குறிப்பு Remarks
						උතුරට வடக்கு North	නැගෙනහිරට கிழக்கு East	දකුණට தெற்கு South	බටහිරට மேற்கு West	ඉහළ மேல் Zenith	පහළ கீழ் Nadir	
401	0.0856	–	Madangahawatta, Assesment No. 34/14, Watson Peiris Mawatha	Residential Property containing Six storied building marked A subdivided into 20 parcels.	Suncity Property Developers (Pvt) Ltd.	Lot 149 in CM No. 520214 (Watson Peiris Patumaga) and Lot 213 in CM No. 520214 (Watson Peiris Mawatha)	Lot 213 in CM No. 520214 (Watson Peiris Mawatha) and Lot 214 in CM No. 520214	Lot 214 in CM No. 520214 and Lot 185 in CM No. 520214 (Road 15ft wide)	Lot 185 in CM No. 520214 (Road 15ft wide) and Lot 149 in CM No. 520214 (Watson Peiris Patumaga)	–	–	Lot No. 184 (A: 0, R: 0, P: 33.8)
Total	0.0856											

මායිම් පෙන්වූ අය
எல்லைகளைக் குறித்துக்காட்டியது
Boundaries shown by

H.M.B.Hitihamu, Grama Niladhari of Division No. 553A, Moratuwella North

මායිම් බලාගත් අය
எல்லைகளைக் குறித்துக்காட்டியது
Boundaries shown to

H.M.B.Hitihamu, Grama Niladhari of Division No. 553A, Moratuwella North

කෂේත්‍ර පොත් පුළුල් කුඩිප්පේ පුස්තක இல
EDM සං. 4558, EDM සං. 4559
Field Book

මැනීම් හා ඇඳීම් කළේ
நில அளவை செய்து வரைந்தவர்
Surveyed and Drawn by A.N.Fernandu
..... මිනින්දෝරු ..... நில அளவையாளர் ..Govt.. Surveyor

From March 2017 සිට இருந்து To April 2017 දක්වා வரை

පරීක්ෂා කළේ
சரி பார்த்தவர்
Checked by:

මිනින්දෝරු අධිකාරි
நில அளவை அத்தியட்சகர்
Supdt. of Surveys

අනුමත කළේ
அத்தாட்சிப்படுத்தியவர்
Approved By
ජෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි
சிரேஷ்ட நில அளவை அத்தியட்சகர்
Snr. Supdt. of Surveys
සර්වේයර් ජනරාල් වෙනුවට
நில அளவை நாயகத்திற்கு பதிலாக
On behalf of the Surveyor General

දිස්ත්‍රික්කය மாவட்டம் District: Colombo

18.8 ඡේදය

ඇමුණුම 04



[18.9 ඡේදය](#) [ඇමුණුම 05](#)



18.9 ඡේදය **ඇමුණුම 06**



18.14 ඡේදය 21.57 ඡේදය ඇමුණුම 07

ගම: Village: Moratuwella (Within the Municipal Council Limits of Moratuwa)
ලිපිනය: 553A, Moratuwella North
G.N Division:
මූල කොට්ඨාසය: Minor Division: -
ප්‍ර. ලේ කොට්ඨාසය: District: Colombo
D.S. Division:
පළාත: Province: Western

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

S.G's No. CO/MRT/2016/0054 Date: 16-10-2016

කැඩපිත්ත සිතියම් අංකය: Cadastral Map No: 520214
කලාප අංකය: Block No: 02
පත්‍ර අංකය: Sheet No: 12
ඉඩම්ද සිටු අංකය: T. L. Page No: 38

ඉඩම් අංකය Lot No	ඉඩම් ප්‍රමාණය (වර්ග මීටර්) Floor Area (Sq.m)	හිමිකම්වල කොටස් ප්‍රමාණය Share Value	ඉඩම් හිමියාගේ නම Name of Land	ඉඩම් පරිහරණය Land use	හිමිකම් කියන්නා Claimant	මායිම් විස්තරය Boundary Schedule						අමතර සටහන් Remarks
						උතුර North	නැගෙනහිර East	දකුණ South	බටහිර West	ඉහළ Zenith	පහළ Nadir	
401A-F1-U1	123	5	Assessment No. 25 1/4, Watson Peiris Mawatha	Residential parcel.	Suncity Property Developers (Pvt) Ltd.	Center of wall separating common elements 401CE1(Space above).	Center of wall separating common elements 401CE1(Space above) and Centre of wall separating common elements 401CE23	Center of wall separating parcel 401A-F1-U4, Center of wall separating common elements 401CE18, 401CE7, 401CE6, 401CE5 and 401CE20, Center of wall separating parcel 401A-F1-U4 and Center of wall separating common element 401CE1(Space above)	Center of wall separating common element 401CE1(Space above), Center of wall separating common element 401CE3 and Center of wall separating common elements 401CE1(Space above)	Center of wall separating Parcel 401A-F2-U1	Center of wall separating Ground Floor	Parcel of subdivided building A Situated in Lot 401 with accessory parcel 401A-F2-U1-A20. Aggregate Floor Area 507 sq.m.
401A-F1-U2	120	5	Assessment No. 25 1/4, Watson Peiris Mawatha	Residential parcel.	Suncity Property Developers (Pvt) Ltd.	Center of wall separating common elements 401CE1 (Space above), wall separating common element 401CE9	Center of wall separating common elements 401CE1 (Space above) and Center of wall separating common elements 401CE9 and Center of wall separating common elements 401CE1 (Space above)	Center of wall separating parcel 401A-F1-U3, Center of wall separating common elements 401CE15, 401CE10, 401CE11, 401CE12 and 401CE13, Center of wall separating parcel 401A-F1-U3	Center of wall separating common element 401CE23 and Center of wall separating common element 401CE1 (Space above)	Center of Floor separating Parcel 401A-F2-U2	Center of Floor separating Ground Floor	Parcel of subdivided building A Situated in Lot 401 with accessory parcel 401A-F1-U2-A17. Aggregate Floor Area 507 sq.m.
Total	143	10										

මැනීම් කරන්නා: H.M.B.Hithamu, Grama Niladhari of Division No. 553A, Moratuwella North
Boundaries shown by

මැනීම් කරනලද්දේ: EDM මඟින් 4558, EDM මඟින් 4559
Surveyed and Drawn by
A.N.Fernandu .Govt. Surveyor

මැනීම් ඇරඹුනේ: From March 2017 සිට To April 2017 දක්වා
Boundaries shown to

පරීක්ෂා කළේ: Checked by:
මිනින්දෝරු අධිකාරි
Supdt. of Surveys

අනුමත කළේ: Approved By:
අධ්‍යක්ෂ මිනින්දෝරු අධිකාරි
Snr. Supdt. of Surveys
Colombo District
On behalf of the Surveyor General

18.15 ඡේදය ඇමුණුම 08

ශ්‍රී ලංකා මිනිසුරෝරු දෙපාර්තමේන්තුව
இலங்கைக் நில அளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

කැඩපත්තර සිතියම් අංකය / කடிதத்தில் வரைபட இல. / Cadastral Map No: 520214
කලාප අංකය / தொகுதி இல. / Block No: 02
පත්‍ර අංකය / தாள் இல. / Sheet No: 12
මුළු පිටු ගණන / மொத்த பக்க இல. / T. L. Page No: 40

වත්ත / කිහාස්: Village:
Moratuwella (Within the Municipal Council Limits of Moratuwa)
ග්‍රාම නිලධාරී කොට්ඨාසය / கி. நி. பிரிவு: G.N. Division:
553A, Moratuwella North
මූල කොට්ඨාසය / பிரிவு: Minor Division:
-
ප්‍රා. ලේ. කොට්ඨාසය / உ. செ. பிரிவு: D.S. Division:
Moratuwa
දිස්ත්‍රික්ක / மாவட்டம்: District:
Colombo
පළාත / மாகாணம்: Province:
Western

මිනුම් ඉල්ලීම් අංකය / நில அளவை வேண்டுகோள் இல. Survey Requisition No
S.G's No. CO/MRT/2016/0054 Date: 16-10-2016

කොටස් අංකය / தனிகை இல. Lot No	මහලේ වර්ගඵලය (වර්ග මීටර්) / மாடி பரப்பளவு (சதுரமீற்றர்) Floor Area (Sq.m)	කොටස්වල වටිනාකම් / பங்கு மதிப்பு Share Value	ඉඩමේ නම / காணியின் பெயர் Name of Land	ඉඩමේ පරිහරණය / காணிப் பயன்பாடு Land use	සිතියම් සිටියවරා / உரிமை கோருபவர் Claimant	මායිම් විස්තරය / எல்லை விபரம் Boundary Schedule						සටහන් / குறிப்புரை Remarks
						උතුරට / வடக்கு North	නැගෙනහිරට / கிழக்கு East	දකුණට / தெற்கு South	බටහිරට / மேற்கு West	ඉහළ / மேல் Zenith	පහළ / கீழ் Nadir	
401A-F2-U1-A1	12	–	–	Parking Area	Suncity Property Developers (Pvt) Ltd.	Common Element 401CE1	Accessory Parcel 401A-F2-U4-A2	Common Element 401CE1	Common Element 401CE1			Accessory Parcel situated in Lot 401 Appurtenance to parcel 401A-F2-U1
401A-F2-U4-A2	12	–	–	Parking Area	Suncity Property Developers (Pvt) Ltd.	Common Element 401CE1	Accessory Parcel 401A-F2-U3-A3	Common Element 401CE1	Accessory Parcel 401A-F2-U1-A1			Accessory Parcel situated in Lot 401 Appurtenance to parcel 401A-F2-U4
Total	24	5										

මායිම් පෙන්වූ අය
அளந்தும் எல்லைகளைச் சுற்றிக்காட்டியவர்
Boundaries shown by
H.M.B.Hithanru, Grama Niladhari of Division No. 553A, Moratuwella North

මැනුම් කළේ EDM සහ 4558, EDM සහ 4559 මගින්
அளவை செய்தது
Surveyed and Drawn by
.....මිනින්දෝරු
Field Book

මැනුම් කළ දිනය
அளவை செய்த திகதி
From March 2017 සිට / இல் To April 2017 දක්වා / வரை

A.N.Fernandu
.....Govt. Surveyor

පරීක්ෂා කළේ
சரிபார்த்தவர்
Checked by:
.....මිනින්දෝරු අධීක්ෂක
நில அளவை மேற்பார்வையாளர்
Supdt. of Surveys

අනුමත කළේ
அங்கீகரிக்கப்பட்டவர்
Approved By
අධ්‍යක්ෂ මිනින්දෝරු අධිපති
நில அளவை மேற்பார்வையாளர்
Snr. Supdt. of Surveys
පරිපාලන දිස්ත්‍රික්කය
நிர்வாக மாவட்டம்
Colombo
දිස්ත්‍රික්කය
மாவட்டம்
District
ශ්‍රී ලංකා සර්වේ ජනරාල්ගේ නියෝගය
On behalf of the Surveyor General

[18.22 ඡේදය](#) [ඇමුණුම 09](#)

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

ගම/ கிராமம்/ Village: Moratuwella (Within the Municipal Council Limits of Moratuwa)
ලාභ බිලියම් කොට්ඨාසය - கி. தி. பிரிவு/ G.N. Division: 553A, Moratuwella North
සුළු කොට්ඨාසය කිහිල/ பிரிவு Minor Division:
ප්‍ර. ලේ. කොට්ඨාසය/ D.S. Division:
දිස්ත්‍රික්කය/ மாவட்டம்/ District: Colombo
පළාත/ மாகாணம்/ Province: Western

සැලැස්මෙහි සිමාවල ඇතය සැ.මි./ කි.මී. සංඛ්‍යාව இலக்கம் Cadastral Map No: 520214
කලාප ඇතය தொகுதி இல. Block No: 02
පත්‍ර ඇතය தாள் இல. Sheet No: 12
ඉමිරැ. මිලු ඇතය நிலவிடை. பக்க இல. T. L. Page No: 39

මැනුම් ඉල්ලීම් අංකය/ මැනුම් අංකය/ S.G's No. CO/MRT/2016/0054 Date: 16-10-2016
Survey Requisition No

කැබලි අංකය/ தனிகை இல./ Lot No	කොටස් වටිනාකම/ பங்கு மதிப்பு/ Share Value	ඉඩමේ නම/ காணியின் பெயர்/ Name of Land	ඉඩමේ පරිහරණය/ காணிப் பயன்பாடு/ Land use	හිමිකම් කියන්නා/ உரிமை கோருபவர்/ Claimant	මායිම් විස්තරය/ எல்லை விபரம்/ Boundary Schedule: උතුරට/ வடக்கு/ North	නැගෙනහිරට/ கிழக்கு/ East	දකුණට/ தெற்கு/ South	බටහිරට/ மேற்கு/ West	ඉහළ බිම්/ மேல் Zenith	පහළ බිම්/ கீழ் Nadir	මතක් කළ යුතු කරුණු/ விசேட குறிப்பு/ Remarks
401CE1	--	--	.....	Suncity Property Developers (Pvt) Ltd.	--	--	--	--	--	--	Remaining portion of Lot 401 to be owned and used in common by all of this condominium property
401CE2	--	--	Lift Well leading from Ground Floor to Roof Deck	Suncity Property Developers (Pvt) Ltd.	--	--	--	--	--	--	Common Element of Lot 401 to be owned and used in common by all of this condominium property
401CE3	--	--	Duct leading from First Floor to Fifth Floor	Suncity Property Developers (Pvt) Ltd.	--	--	--	--	--	--	Common Element of Lot 401 to be owned and used in common by all of this condominium property
401CE4			Open to sky leading from First floor to Fifth Floor	Suncity Property Developers (Pvt) Ltd.							Common Element of Lot 401 to be owned and used in common by all of this condominium property

මැනුම් කරන ලද්දේ H.M.B.Hitihamu, Grama Niladhari of Division No. 553A, Moratuwella North
Boundaries shown by

මැනුම් කරන ලද්දේ සහ ඇඳීම් කළේ
මිනින්දෝරු විසින්
Surveyed and Drawn by
..... මිනින්දෝරු
From March 2017 සිට To April 2017 දක්වා

A.N.Fernandu ..... Govt. Surveyor

පරීක්ෂා කළේ
சரிபார்த்தவர்
Checked by:

අනුමත කළේ
அங்கீகரிப்பவர்
Approved By
මිනින්දෝරු අධිපති
Supdt. of Surveys

මැනුම් කරන ලද්දේ H.M.B.Hitihamu, Grama Niladhari of Division No. 553A, Moratuwella North
Boundaries shown to

භාවිත කළ මිනින්දෝරු උපකරණ
அளவைக் கருவிகள்
Instruments used
සේතු මෙවර EDM මෙවර 4558, EDM මෙවර 4559
Field Book

මිනින්දෝරු අධිපති
Supdt. of Surveys

දිස්ත්‍රික්කය
மாவட்டம்
District
Colombo

ශුද්ධි පත්‍රය

ශුද්ධි පත්‍රය

19 වැනි පරිච්ඡේදය

සිතියම්කරණය

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	භූ ලක්ෂණාත්මක සිතියම් පෙළ - 1:50,000	
19.1.	1:50,000 සිතියම් මාලාව සඳහා අංකිත දත්ත හා ක්ෂෙත්‍ර පුනරීක්ෂණය	1
	ක්ෂෙත්‍ර පුනරීක්ෂණය සිදු කරන මිනින්දෝරුවරයෙකුගේ කාර්යභාරය	
19.2.	ක්ෂෙත්‍ර පුනරීක්ෂණය සඳහා ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර යොදා ගැනීම	1
19.3.	මුද්‍රිත සිතියමෙහි සඳහන් තොරතුරු යථාවත් කිරීම	1
	ජල ආශ්‍රිත තොරතුරු යථාවත් කිරීම	
19.4.	ජල ආශ්‍රිත තොරතුරු විස්තර කිරීම	2
19.5.	නිරීක්ෂණය නොවන දත්ත සම්පූර්ණ කිරීම	2
19.6.	භූමියට යටින් ගමන් කරන ජල මාර්ගයක් සම්පූර්ණ කිරීම	3
19.7.	ජල ආශ්‍රිත තොරතුරු නම් කිරීම	3
	මාර්ග තොරතුරු යථාවත් කිරීම	
19.8.	මාර්ග වර්ගීකරණය	3
19.9.	මාර්ග හා බැඳී පවතින ලක්ෂණ	3
19.10.	ගංතොට හා තොටුපොල නම් කිරීම	3
19.11.	වැදගත් ස්ථාන සඳහා දුර	3
19.12.	අධිවේගී මාර්ග, ප්‍රධාන මාර්ග හා එකිනෙකට සම්බන්ධ කරනු ලබන පාරවල් පෙන්වීම	3
	දුම්රිය මාර්ග තොරතුරු යථාවත් කිරීම	
19.13.	දුම්රිය මාර්ග වර්ගීකරණය	4
19.14.	දුම්රිය මාර්ග සඳහා අදාළ වන තොරතුරු	4
19.15.	දුම්රිය නැවතුමේ නම සහ පත්‍ර දාරයේ සිට දුම්රිය ස්ථානයට දුර	4
	ඉඩම් පරිහරණ තොරතුරු යථාවත් කිරීම	
19.16.	ඉඩම් පරිහරණය වර්ගීකරණය	4
19.17.	මිශ්‍ර වගාවන් සහ වගාවන් වල මායිම්	5
19.18.	අභය භූමි, මහාවැලි කලාප, ජාතික වනෝද්‍යාන, වන සංරක්ෂණ ප්‍රදේශයන්හි මායිම්	5
	ගොඩනැගිලි තොරතුරු යථාවත් කිරීම	
19.19.	නාගරික/ ග්‍රාමීය ප්‍රදේශයක ඇති වැදගත් ගොඩනැගිලි	5
19.20.	ගොඩනැගිලි නම් කිරීම	5
19.21.	ගොඩනැගිලි සඳහා කෙටි යෙදුම්	5
19.22.	ගොඩනැගිලි එකිනෙකට ආසන්න විට	5
19.23.	ඓතිහාසික ස්ථාන	5
19.24.	නම් කළ යුතු ගොඩනැගිලි	5
	පරිපාලන මායිම් හා නාම තොරතුරු යථාවත් කිරීම	
19.25.	පරිපාලන මායිම් හා නම්	6
19.26.	ග්‍රාම නාම	6

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
19.27.	මංසන්ධි, නගර වැනි වෙනත් වැදගත් ස්ථාන	6
19.28.	සියළුම වතු නාම	6
19.29.	සියළුම නම් ඉංග්‍රීසි භාෂාවෙන් ලිවිය යුතු බව	6
19.30.	සඳහන් කිරීමට නොහැකිවූ තොරතුරු	6
19.31.	පත්‍ර දාර සංසන්දන අනුරේඛන	6
19.32.	විශේෂ තොරතුරු සටහන් කිරීම	6
19.33.	සම්පූර්ණ කරන ලද ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර භාරදීම	6
	මිනින්දෝරු අධිකාරිගේ කාර්යභාරය	
19.34.	මාර්ගෝපදේශයන්හි සඳහන් උපදෙස් අනුව සිය කාර්යය සිදු කර ඇති බව තහවුරු කර ගැනීම	6
19.35.	සියළු ආධාරක පත්‍ර යාබද පත්‍ර සමඟ සැසඳීම	6
19.36.	අංකිත දත්ත පරීක්ෂා කිරීම	7
19.37.	සියළු ලේඛන වල අත්සන් කිරීම	7
	ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ කාර්යභාරය	
19.38.	සහතික කරන ලද ලේඛන යැවීම	7
	භූ ලක්ෂණාත්මක සිතියම් පෙළ - 1:10,000	
19.39.	ක්ෂෙත්‍රයට යවනු ලබන ලියවිලි	7
	මිනින්දෝරුවරයාගේ කාර්යභාරය	
19.40.	ක්ෂෙත්‍ර විමර්ශනය යටතේ ලබා දී ඇති උපදෙස්	7
19.41.	සම්බන්ධතාවය රහිත මාර්ග හෝ ඇළ මාර්ග එකිනෙක සම්බන්ධවූ විට	7
19.42.	ස්ථානීය නිරවද්‍යතාවය රහිත තොරතුරු ඇතුළත් කිරීම	7
19.43.	ක්ෂෙත්‍ර විමර්ශනයෙන් රැස්කරගන්නා ලද තොරතුරු	7
19.44.	ආධාරක පත්‍රයෙහි ඇතුලත් කර නොමැති ලක්ෂණ හෝ විස්තර	8
19.45.	ආධාරක පත්‍රයෙහි සඳහන් යම් ලක්ෂණයක් සත්‍ය වශයෙන්ම නිරීක්ෂණය කළ විට	8
19.46.	රේඛා, නම් සහ සලකුණු විස්තර කිරීම	8
	ජල මාර්ග හා ජලය ආශ්‍රිත තොරතුරු	
19.47.	ජලය ආශ්‍රිත තොරතුරු වල නිරවද්‍යතාව	8
19.48.	ජලය ආශ්‍රිත තොරතුරු වර්ගීකරණය	8
19.49.	එක් ජල මාර්ගයක් තවත් ජල මාර්ගයක් හරහා වැටී ඇති විට	9
	මාර්ග තොරතුරු යථාවත් කිරීම	
19.50.	චන්ද්‍රිකා ඡායාරූප මඟින් හඳුනාගත් මාර්ග	9
19.51.	එකිනෙක සම්බන්ධ කර නොමැති මාර්ග	9
19.52.	ඉදිවෙමින් පවතින මාර්ග	9
19.53.	මාර්ග වර්ගීකරණය	9
19.54.	වැදගත් ස්ථානවලට ඇති දුර	9
19.55.	වෙන්කර විස්තර කළ යුතු තොරතුරු	9
	දුම්රිය මාර්ග තොරතුරු යථාවත් කිරීම	
19.56.	යොමු පත්‍රයෙහි සඳහන් කර ඇති දුම්රිය මාර්ගවල ස්ථානීය නිරවද්‍යතාවය	9
19.57.	දුම්රිය මාර්ග සම්බන්ධයෙන් සටහන් කළ යුතු තොරතුරු	10
	ඉඩම් පරිහරණ තොරතුරු යථාවත් කිරීම	
19.58.	ඉඩම් පරිහරණ තොරතුරුවල නිරවද්‍යතාව	10
19.59.	ක්‍රීඩා පිට්ටනි, උද්‍යාන, සුසානභූමි විස්තර	10

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
19.60.	රක්ෂිත ප්‍රදේශයන්හි මායිම් හා නම්	10
19.61.	කර්මාන්තපුර, වෙළඳ කලාප, ගොවිපලවල් හා වාහන නැවතුම් ස්ථාන	10
	ගොඩනැගිලි තොරතුරු යථාවත් කිරීම	
19.62.	ක්ෂේත්‍රයේ හඳුනාගත යුතු ගොඩනැගිලි	10
19.63.	ආධාරක පත්‍ර A හි සඳහන් නොවන වෙනත් ගොඩනැගිලි	11
19.64.	ගොඩනැගිලි නම් කිරීම	11
	අධිබලැති විදුලි රැහැන්	
19.65.	අධිබලැති විදුලි රැහැන් පෙන්වීම	11
	පරිපාලන කොට්ඨාශ මායිම් හා නම්	
19.66.	පරිපාලන කොට්ඨාශ මායිම් හා නම්	11
19.67.	වතු නාම	11
19.68.	යාබද පත්‍ර දාර සමඟ සැසඳීම	11
	පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම්	
19.69.	ස්ථර කළමනාකරණ ආධාරකය භාවිතා කිරීම	12
19.70.	ක්ෂේත්‍රයේ නොමැති යම් ලක්ෂණයක් ඉවත් කිරීමට අවශ්‍ය වූ විට	12
19.71.	වැවක කොටස් හෝ ද්විත්ව රේඛා ජල මාර්ගයක නම් කිහිපයක් භාවිතා කර ඇති විට	12
19.72.	මිනින්දෝරු අධිකාරි වෙත භාර දිය යුතු ලේඛන	12
	මිනින්දෝරු අධිකාරිගේ හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ කාර්භාරය	
19.73.	19.34- 19.38 දක්වා ඡේදයන් අනුව කටයුතු කිරීම	12
	ගුවන් මැනුම් සඳහා භූමිතික පාලන ලක්ෂ්‍ය පිහිටුවීම	
19.74.	භූමිතික පාලන ලක්ෂ්‍ය තෝරා ගැනීම	12
19.75.	අවශ්‍ය නිරවද්‍යතාව සහිතව ස්ථානීය රූප සටහන් ඇඳීම	13
19.76.	භූමිතික පාලන ලක්ෂ්‍ය සඳහා අවශ්‍යතාවයන්	13
19.77.	තිරස් හා සිරස් පාලන ලක්ෂ්‍ය සඳහා වන ඡායාරූප	13
19.78.	තිරස් පාලන ලක්ෂ්‍ය සඳහා සුදුසු ස්ථාන	13
19.79.	සිරස් පාලන ලක්ෂ්‍ය සඳහා සුදුසු ස්ථාන	13
19.80.	සුදුසු ලක්ෂ්‍ය සොයා ගැනීම දුෂ්කර වූ විට	13
19.81.	තෝරාගත් ලක්ෂ්‍ය සඳහා දළ සටහන් සකස් කිරීම	13
19.82.	සියළුම ලක්ෂ්‍ය එකිනෙක ජාලගත විය යුතු බව	14
19.83.	අවසන් කරන ලද ලේඛන යැවීම	14
	ඇමුණුම්	
ඇමුණුම 01	භූමිතික පාලන ලක්ෂ්‍ය - දත්ත පත්‍රය	15

19 වැනි පරිච්ඡේදය

සිතියම්කරණය

භූ ලක්ෂණාත්මක සිතියම් පෙළ - 1:50,000

19.1. දුරස්ථ ග්‍රහණ අංශය මඟින් වන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර ලබාගත් අංකිත දත්ත යොදාගෙන ප්‍රධාන කාර්යාලයේ භූ ලක්ෂණාත්මක සිතියම් අංශය මඟින් 1:50,000 සිතියම් මාලාව නිශ්පාදනය කෙරේ. මෙම පත්‍ර වලට අදාළ පහත සඳහන් දත්ත හා ලේඛන ක්ෂෙත්‍ර පුනරීක්ෂණය සඳහා දුරස්ථ ග්‍රහණ අංශය මඟින් ක්ෂෙත්‍රයට යවනු ලැබේ.

(1) අංකිත දත්ත සහිත සංයුක්ත තැටිය (CD)
(2) ක්ෂෙත්‍ර ආධාරක පත්‍රය 'A'
(3) ක්ෂෙත්‍ර ආධාරක පත්‍රය 'B'
(4) ක්ෂෙත්‍ර ආධාරක පත්‍රය 'C1'
(5) ක්ෂෙත්‍ර ආධාරක පත්රය 'C2'
(6) ක්ෂෙත්‍ර පුනරීක්ෂණ අවසන් කරන ලද පත්‍රවල පත්‍ර දාර පෙන්වන අනුරේඛනය (CD එකට දත්ත ඇතුලත් කර ඇත.)

ක්ෂෙත්‍ර පුනරීක්ෂණය සිදු කරන මිනින්දෝරුවරයෙකුගේ කාර්යභාරය

19.2. 19.1 ඡේදයෙහි සඳහන් කර ඇති ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර මෙම ක්‍රියාවලිය සඳහා පහත දක්වා ඇති පරිදි යොදාගත යුතුය.

1. ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර 'A' - ක්ෂෙත්‍රයේ විමර්ශනයෙන් අනතුරුව වාර්තා කළ යුතු දත්ත පිළිබඳ තොරතුරු මෙම ආධාරක පත්‍රයේ පැන්සලෙන් ලකුණු කළ යුතුය.

2. ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර 'B' – පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කොට්ඨාශ, ගම්, නගර සභා, මහ නගර සභා වල නම් සහ මායිම් හා වෙනත් ස්ථාන නාම හා මායිම් ගැටළු, මහ නගර සභා, නගර සභාවල පවතින මායිම් ගැටළු සඳහා මෙම තොරතුරු පිටපත් කර ගැනීම සඳහා ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර A යොදා ගත හැකිය.

3. ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර 'C1' - මංමාවත් සහ දුම්රිය මාර්ග ක්ෂෙත්‍රයේ පරීක්ෂාකර බලා තහවුරු කරගත යුතු අතර කිසියම් වෙනස්වීමක් අනාවරණය වුවහොත් මෙම ආධාරක පත්‍රයේ පෙන්විය යුතුය. අදාළ තොරතුරු ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර A මඟින් පිටපත් කර ලබා ගත හැකිය.

4. ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර 'C2' – (ඉහත (2) හා (3) න් වාර්තා නොකරන ලද) වෙනත් කිසියම් තොරතුරක් අනාවරණය වුවහොත් මෙම ආධාරක පත්‍රයට ඇතුළත් කළ හැක. අදාළ තොරතුරු ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර A මඟින් පිටපත් කර ලබා ගත හැකිය.

5. ඉහත 2, 3, 4 හි සඳහන් දත්ත ඛණ්ඩාංක සමඟ සංයුක්ත තැටියක සඳහන් කර දුරස්ථ ග්‍රහණ අංශයට ආපසු එවිය යුතුය.

19.3. මුද්‍රිත සිතියමෙහි සඳහන් තොරතුරු යථාවත් කිරීමේදී පහත පරිදි කටයුතු කළ යුතුය.

1. සිතියමෙහි පෙන්වා ඇති කිසියම් හෝ තොරතුරක් ක්ෂේත්‍රයේ සොයාගැනීමට නොහැකි නම් එම තොරතුරු සිතියමෙන් ඉවත් කළ යුතුය.
2. කිසියම් හෝ තොරතුරක කොටසක පමණක් සංශෝධනයක් දැක්වීමට අවශ්‍ය විටකදී, එම සංශෝධනයට අදාළ වන්නේ කුමන ස්ථානයක සිට කුමන ස්ථානයක් දක්වා ද යන්න පෙන්වීම සඳහා යා සලකුණ යෙදිය යුතුය.

3. භූගෝලීය ඛණ්ඩාංක පද්ධති භාවිතයෙන් අළුතින් තොරතුරු ඇතුලත් කරන ලද්දේ නම් (මාර්ග, ජල ප්‍රවාහ) එම දත්තයන් ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතුවේ. මෙම තොරතුරු අදාළ ආධාරක පත්‍රයේ ඇතුලත් කළ යුතුය.

4. සංශෝධන පෙන්වීම සඳහා මිනින්දෝරුවරයා විසින් භාවිතා කරන ලද රේඛා, වර්ණ, සලකුණු ආදි සියළු දේ සඳහන් කරමින් යොමුව සකස් කළ යුතුය. මෙය ඉතා වැදගත් බැවින් මේ සඳහා ඔබගේ විශේෂ අවධානය යොමුවිය යුතුය. තවද යොමුව අංකිත දත්ත ඇසුරෙන් සකස් කර සංයුක්ත තැටියට ඇතුලත් කළ යුතුය.

5. ගොඩනැගිලි, ගම් හා වෙනත් විස්තර සඳහා යොදාගන්නා ලද ඉංග්‍රිසි නාම අදාළ ආයතන වෙතින් ලබාගත යුතුය. මෙම නම් වල ලැයිස්තුවක් පිළියෙල කර යොමු අංක යොදා භාරදිය යුතුය. මෙම නාම යෙදීමේදී අක්ෂර වල නිවැරදිකාවය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

ජල ආශ්‍රිත තොරතුරු යථාවත් කිරීම

19.4. මෙම තොරතුරු ක්ෂේත්‍ර ආධාරක පත්‍ර C2 හි පෙන්විය යුතු අතර ඒවා එකිනෙකින් වෙන්කර හඳුනාගැනීම සඳහා පහත පරිදි විස්තර කළ යුතුය.

1) ද්විත්ව රේඛා ඇළවල් (පළල මීටර් 50 සහ ඊට වැඩි)
2) තනි රේඛා ඇළවල් (පළල මීටර් 50 ට අඩු)
3) ද්විත්ව රේඛා වාරිමාර්ග ඇළ (පළල මීටර් 50 සහ ඉන් ඉහල)
4) තනි රේඛා වාරිමාර්ග ඇළ (පළල මීටර් 50 ට අඩු)
5) ඇළ කණ්ඩි
6) එකිනෙක හරහා දිවෙන ඇළ මාර්ග
7) වැව (උපරිම ජල මට්ටම සහ එහි අගය සඳහන් කළ යුතුය)
8) වැව් කණ්ඩිය
9) අත්හරින ලද වැව
10) අත්හරින ලද වැව් කණ්ඩිය
11) අමුණ
12) පිටවාන
13) සොරොව්ව
14) දිය ඇල්ල
15) යටි බිම් ජල උමග
16) දිය මං පාලම
17) වතුර වල
18) බුබුල/ උණු දිය බුබුල
19) ලේවාය

20) ඉස්සන්/ මිරිදිය මසුන් බෝ කරන ස්ථානය
21) කලපුව

19.5. ජල මාර්ගයක් සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් දත්ත නිරීක්ෂණය නොවන අවස්ථාවලදී, කොටසක් පමණක් පෙන්වා ඇති ජල මාර්ග/අතුරු ජල මාර්ග ක්ෂේත්‍රයේ පරීක්ෂාකර බලා ප්‍රධාන ජල මාර්ගයකට සම්බන්ධ කර පෙන්විය යුතුය.

19.6. ජල මාර්ගයක් හෝ කොටසක් භූමියට යටින් ගමන් කරන අවස්ථාවක දී (සම්බන්ධතාවය නොපෙනෙන අවස්ථාවක දී) සුදුසු පරිදි නම් කළ යුතුය. දිය මං පාලමෙහි ආරම්භය සිට අවසානය දක්වා නම් කළ යුතුය.

19.7. ජලය ආශ්‍රිත සියළු ලක්ෂණ වල නම් කියවිය හැකි වන පරිදි විය යුතුය. ජල මාර්ග නම් කිරීමේදී එහි නාමය ආරම්භ වන ස්ථානය හා අවසාන වන ස්ථානය පැහැදිලිව දැක්විය යුතුය.

මාර්ග තොරතුරු යථාවත් කිරීම

19.8. මාර්ග සම්බන්ධ සියළු දත්ත සංයුක්ත තැටියට ඇතුලත් කළ යුතුය. එමෙන්ම සියළුම මාර්ග 19.53 ඡේදය පරිදි වර්ගීකරණය කළ යුතුය.

19.9. මාර්ග හා බැඳී පවතින ලක්ෂණ

1) පාලම්
2) බෝක්කු
3) ආරක්ෂිත දුම්රිය මාර්ග
4) අනාරක්ෂිත දුම්රිය මාර්ග
5) මාර්ගයට ඉහලින් පිහිටි මාර්ග / මාර්ගයට පහලින් පිහිටි මාර්ග
6) ගුවන් පාලම්
7) එල්ලෙන පාලම
8) උමං මාර්ග
9) අඩි පාලම/ ඒදණ්ඩ
10) මාර්ගය ඔස්සේ කැපුම (මීටර 3 ට වඩා වැඩි)
11) මාර්ගය ඔස්සේ පහත් බිම් පිරවුම (මීටර 3 ට වඩා වැඩි)
12) සපත්තු පාලම
13) ගංතොට
14) තොටුපොල
15) බස්නැවතුම් පොළ
16) බස් ඩිපෝව
17) කි.මී. කණු එම අගය සමඟ (AA, AB, AC, හා B මාර්ග සඳහා පමණි) කි.මී කණු නොමැති හෝ අංක කිරීමේ ගැටළු සහගත අවස්ථා ඇත්නම් ඒවා වාර්තා කළ යුතුය.
18) අධිවේගී මාර්ග ඇතුල්වීමේ හා පිටවීමේ ස්ථාන
19) අධිවේගී මාර්ගයන්හි අන්තර් හුවමාරු ස්ථාන සියල්ලම සටහන් කළ යුතුය.
20) අධිවේගී මාර්ගයන්ට අනෙකුත් මාර්ග (උදා: වර්ණයට ඉහළින්) සම්බන්ධ වන ආකාරය (over pass/under pass) දැක්විය යුතුය.
21) මාර්ග අංක මාර්ග සංවර්ධන අධිකාරියේ නම් කිරීම් අනුව සඳහන් කළ යුතුය.
22) වෙනත් වැදගත් තොරතුරු

19.10. ගංතොට හා තොටුපොල නියමිත පරිදි නම් කර පෙන්විය යුතුය.

19.11. යාබද පත්‍ර වල A, B, C මාර්ග දිගේ සඳහන් කර ඇති මූලිකව වැදගත් ස්ථාන, මංසන්ධි, කඩවීදි හෝ නගර (මාර්ග) හා ඒවාට පත්‍ර දාරයේ සිට ඇති දුර සඳහන් කළ යුතුය.

19.12. අධිවේගී මාර්ග, ප්‍රධාන මාර්ග හා සම්බන්ධ වීමට ප්‍රදේශ දෙකක් යාකරනු ලබන හෝ A, B, C හෝ D මාර්ග එකිනෙකට සම්බන්ධ කරනු ලබන පාරවල් පෙන්විය යුතුය.

දුම්රිය මාර්ග තොරතුරු යථාවත් කිරීම

19.13. දුම්රිය මාර්ග සම්බන්ධ තොරතුරු සංයුක්ත තැටියේද ගබඩා කළ යුතුය. එමෙන්ම දුම්රිය මාර්ග ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර C1 හි පෙන්විය යුතු අතර පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ යුතුය.

1) ත්‍රිත්ව දුම්රිය මාර්ග
2) ද්විත්ව දුම්රිය මාර්ග
3) තනි දුම්රිය මාර්ග

19.14. දුම්රිය මාර්ග සඳහා අදාළ වන පහත සඳහන් තොරතුරු ඇත්නම් වාර්තා කළ යුතුය.

1) දුම්රිය ස්ථාන
2) දුම්රිය නැවතුම්
3) පාලම්
4) බෝක්කු
5) උඩිස් පාලම
6) උමං දුම්රිය මාර්ග
7) කැපුම් ස්ථාන
8) පිරවුම්/ ගොඩැල්ල
9) දුම්රිය අංගනය

19.15. දුම්රිය මාර්ගය ඔස්සේ, යාබද පත්‍රයේ හමුවන පළමුවන දුම්රිය නැවතුමේ නම සහ දුම්රිය මාර්ගය ඔස්සේ පත්‍ර දාරයේ සිට අදාළ දුම්රිය ස්ථානයට දුර කි.මී.වලින් සඳහන් කළ යුතුය .

ඉඩම් පරිහරණ තොරතුරු යථාවත් කිරීම

19.16. ඉඩම් පරිහරණය ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර C 2 හි දැක්විය යුතු අතර පහත පරිදි වර්ගීකරණය කළ යුතුය.

1)	වී වගාව	-	P
2)	තේ වගාව	-	T
3)	රබර් වගාව	-	R
4)	පොල්	-	C
5)	පහත් බිම්	-	Msh
6)	වැලි සහිත	-	Snd
7)	කඩොලාන	-	Mngr
8)	ලදු කැලෑ	-	Scr
9)	කැලය	-	F
10)	හේන	-	Ch

11)	තණ බිම්	-	Gr
12)	උද්‍යානය	-	Park
13)	ක්‍රීඩා පිට්ටනිය	-	PG
14)	ගෙවත්ත	-	G
15)	ගල්	-	Rk
16)	සුසාන භූමිය	-	Cem
17)	එළිකිරීම්	-	Cl
18)	මුඩු බිම්	-	BL

19.17. ඉහත ඉහත වර්ගීකරණයන්ට අයත් සෙසු වගාවන්, වෙනත් වගාවන් ලෙස වගාවේ ස්වාභාවයද සමඟ දැක්විය යුතුය. මිශ්‍ර වගාවන් ඇති අවස්ථාවන් වලදී ප්‍රධාන වගාව පමණක් සඳහන් කළ යුතුය. වගාවන් වල මායිම් පැහැදිලිව දැක්විය යුතු අතර ඒ ඒ වගාව වෙන් වෙන්ව දැක්විය යුතුය.

19.18. අභය භූමි, මහාවැලි කලාප, ජාතික වනෝද්‍යාන, වන සංරක්ෂණ ප්‍රදේශයන්හි මායිම් හා එම නාමයන්ද සඳහන් කළ යුතුය.

ගොඩනැගිලි තොරතුරු යථාවත් කිරීම

19.19. ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර C2 හි ගොඩනැගිලි සටහන් කළ යුතුය. නාගරික/ ග්‍රාමීය ප්‍රදේශයක පෙන්වා ඇති සියළුම වැදගත් ගොඩනැගිලි (උදා: පාසල්, ආගමික ස්ථාන, රෝහල්, රාජ්‍ය, සංස්ථා සහ මණ්ඩල) පැහැදිලිව හඳුනා ගත හැකි වන පරිදි නම් කළ යුතුය.

19.20. ගොඩනැගිලි නම් කිරීමේදී නිල නාමය ඉංග්‍රිසියෙන් විය යුතුය. ඉංග්‍රිසියෙන් භාවිත කරන නාමය සොයාගත නොහැකි නම් පමණක් සිංහල භාෂාවෙන් යෙදීම සුදුසුවේ. සියළුම ගොඩනැගිලිවල නම් මෙම පත්‍රයේම සඳහන් කිරීමට ඉඩකඩ ප්‍රමාණවත් නැත්නම් පත්‍රයේ කෙලවර සඳහන් කර ඒ සඳහා යොමු සටහන් තැබිය යුතුය.

19.21. ගොඩනැගිලි සඳහා කෙටි යෙදුම් ඇත්නම් සටහන් කළ යුතුය. (උදා -: සමුපකාර තොග වෙළඳ සංස්ථාව - ස.තො.ස.)

19.22. ගොඩනැගිලි එකිනෙකට ආසන්න අවස්ථාවකදී වඩා වැදගත් කොටස ඊ හිසින් දැක්විය යුතුය.

19.23. ඓතිහාසික ස්ථාන වල පිහිටි ගොඩනැගිලි ඒවායේ නම්ද සමඟ පෙන්විය යුතුය. පැරණි නටබුන් ඇති අවස්ථාවලදී ඒ බව සඳහන් කළ යුතුය.

19.24. පහත සඳහන් ගොඩනැගිලි පෙන්වා නම් සඳහන් කළ යුතුය.

1) තැපැල් කාර්යාල
2) උප තැපැල් කාර්යාල
3) කණ්ඩියබැංකු
4) රජයේ රෝහල්
5) පෞද්ගලික රෝහල්
6) බෙහෙත් ශාලාවන්
7) තානායම
8) සංචාරක හෝටල
9) භෝජනාගාර

10) පොලිස් ස්ථාන
11) පන්සල
12) පල්ලි
13) මුස්ලිම් දේවස්ථාන
14) කෝවිල්
15) ඉන්ධන පිරවුම් හල්
16) පාසල
17) විශ්ව විද්‍යාල
18) කර්මාන්ත ශාලාවන්
19) ගොවිජන සේවා මධ්‍යස්ථානයන්
20) දිස්ත්‍රික්/ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්
21) උසාවි
22) ප්‍රාදේශිය සභාවන්
23) රජයේ අනෙකුත් වැදගත් ගොඩනැගිලි

පරිපාලන මායිම් හා නාම තොරතුරු යථාවත් කිරීම

19.25. පරිපාලන මායිම් හා නම්, ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර B හි පෙන්විය යුතුය. පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ, මහ නගර සභා, නගර සභා සහ ග්‍රාම නිලධාරී වසම් නාමයන් සහ මායිම් සඳහා සංශෝධන ඇති විටදී පැහැදිලිව පෙන්විය යුතුය.

19.26. පරිපාලන මායිම් සංශෝධනය කළ පසු කුඩා කොටස් ඇතිවූයේ නම් ඒවා වෙනම නම් කළ යුතුය. (උදා: ග්‍රා.නි. වසම්) ග්‍රාම නාම අළුතින් එක් වූයේ නම් ඒවා යටින් කළු පාටින් ඉරි ඇඳ දැක්විය යුතුය.

19.27. මංසන්ධි, නගර වැනි වෙනත් වැදගත් ස්ථාන ආදිය නම් කළ යුතුය.

19.28. සියළුම වතු නාම දැක්විය යුතුය. ඊට අදාළ කොට්ඨාශ නම් ලියා දැක්වීම අවශ්‍ය නොවේ.

19.29. සියළුම නම් ඉංග්‍රීසි භාෂාවෙන් ලියා දැක්විය යුතුය. අදාළ ආයතනය විසින් භාවිත කරනු ලබන නිල නාමය සෑම විටම භාවිතා කළ යුතු අතර නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතා කළ බවට තහවුරු කළ යුතුය. ඉවත් කරන ලද අදාළ නොවන සියළුම නම් සැමවිටම යොමුවේ දැක්විය යුතුය. ස්ථානගත කිරීම නිවැරදි නොවේ නම් සුදුසු පරිදි සංශෝධනය කළ යුතුය.

19.30. 19.13- 19.29 දක්වා ජේදයන්හි සඳහන් නොකළ යම් තොරතුරක් වූයේ නම් කියවා තේරුම් ගත හැකිවන පරිදි සඳහන් කළ යුතුය.

19.31. සංශෝධනය සඳහන් කරන ලද පත්‍ර දාරය සංසන්දන අනුරේඛනයක් මඟින් යාබද සියළුම පත්‍ර සමඟ සංසන්දනය කර බැලිය යුතුය. යම් නොගැලපීමක් වේ නම් එම තොරතුරු සඳහන් කළ යුතුය.

19.32. ඉහත දක්වා ඇති ආධාරක පත්‍රවලට ඇතුලත් විය යුතු තොරතුරු වලට අමතරව විශේෂ යමක් සටහන් කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා වාර්තාවක් සකස් කළ යුතුය. සියළුම යොමු පත්‍ර, වාර්තා ආදිය මිනින්දෝරුවරයා විසින් සහතික කළ යුතුය.

19.33. සම්පූර්ණ කරන ලද ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර හතර, සියළුම දත්ත සහිත සංයුක්ත තැටිය සහ ඊට අදාළ සියළු ලේඛන මිනින්දෝරුවරයා විසින් අත්සන් කර මිනින්දෝරු අධිකාරි වෙත පරීක්ෂා කිරීම සඳහා ලබා දිය යුතුය.

මිනින්දෝරු අධිකාරිගේ කාර්යභාරය

19.34. මිනින්දෝරුවරයා වෙත ක්ෂෙත්‍ර පුනරීක්ෂණ කාර්යය භාර දීමට ප්‍රථම ඊට අදාළ සියළුම ලේඛන ලැබී ඇති බව මිනින්දෝරු අධිකාරි විසින් තහවුරු කර ගත යුතුය. මිනින්දෝරුවරයා විසින් සිය කාර්යය අවසන් කළ විගසම ඔහු විසින් අවශ්‍ය මාර්ගෝපදේශයන්හි සඳහන් උපදෙස් අනුව සිය කාර්යය සිදු කර ඇති බව තහවුරු කර ගත යුතුය. මාර්ගෝපදේශයන්හි කිසියම් අතපසු වීමක් හෝ අත්වැරැද්දක් සිදුවී නම් මිනින්දෝරුවරයා ලවා නිවැරදි කරවා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

19.35. සම්පූර්ණ කරන ලද සියළු ආධාරක පත්‍ර යාබද පත්‍ර සමඟ සසඳා සපයා ඇති අනුරේඛන හා ඒ වන විට ක්ෂෙත්‍රයට නිකුත් කරන ලද පත්‍ර සමඟ ද සැසඳිය යුතුය. කිසියම් හෝ වෙනස්කමක් නිරීක්ෂණය කළහොත් නිවරදාතාව පවත්වාගෙන යාම සඳහා නැවත පරීක්ෂා කිරීමට මිනින්දෝරුවරයා වෙත උපදෙස් ලබා දිය යුතුය. යාබද පත්‍ර සංශෝධනය කළ යුතු නම් ඒවාද වාර්තා කළ යුතුය.

19.36. අංකිත දත්තයන් ද තහවුරු කිරීමෙන් පසු සහතික කළ යුතුය.

19.37. මිනින්දෝරුවරයා විසින් සිය කාර්යය නිසි පරිදි සිදු කර ඇත්නම් මිනින්දෝරු අධිකාරිගේ අත්සන සමඟ අදාළ සියළු ලේඛන ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය. මිනින්දෝරු අධිකාරිගේ නම, අත්සන සහ දිනය සියළු ලේඛන වල සටහන් කළ යුතුය.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ කාර්යභාරය

19.38. ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතු සියළු ලියවිලි මුල සිට පරීක්ෂාකර සහතික කිරීමෙන් අනතුරුව පළාත් සර්වේයර් ජනරාල් වෙත පිටපතක් සහිතව ආවරණ ලිපියක් සමඟ අප්‍රමාදව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (දුරස්ථ ග්‍රහණ) වෙත ඉදිරිපත් කළ යුතුය.

භූ ලක්ෂණාත්මක සිතියම් පෙළ - 1:10,000

19.39. ක්ෂෙත්‍රයට යවනු ලබන ලියවිලි

මෙම දත්ත පද්ධතිය මුළු දිවයිනම ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර යාවත්කාලීන කිරීම් හා සිතියම් ප්‍රකාශනය පහසුව සඳහා පත්‍ර 1841 කට වෙන් කර ඇත. දුරස්ථ ග්‍රහන ගෝවර ක්‍රම මඟින් හෝ ඡායාරේඛණමිතික ක්‍රම මඟින් යාවත්කාලීන කරන ලද භූමි දත්ත ක්ෂෙත්‍ර විමර්ශනය සඳහා ආධාරක පත්‍ර ලෙස මුද්‍රණය කර පහත සඳහන් ලේඛන සමඟ ක්ෂෙත්‍රයට යවනු ලැබේ.

(අ) ක්ෂෙත්‍ර ආධාරක පත්‍රය

දත්ත පද්ධතියේ තිබෙන තොරතුරු ආශ්‍රයෙන් පිළියෙල කර ඇත. ක්ෂෙත්‍රයේ දී නිරීක්ෂණය කරන තොරතුරු සටහන් කිරීමට මෙය භාවිතා කළ හැකිය.

(ආ) ක්ෂෙත්‍රය වෙත යොමු කෙරෙන ප්‍රශ්නාවලිය
(මීට අමතරව ක්ෂෙත්‍රයේ නිරීක්ෂණය කරන ලද යම් කිසි සංශෝධනයක් වේ නම් ඒ සියල්ල ද මිනින්දෝරුවරයා විසින් වාර්තා කළ යුතුය.)

(ඇ) අංකිත දත්ත dxf/dwg ආකාරයට ලබා දිය යුතුය.

මිනින්දෝරුවරයාගේ කාර්යභාරය

19.40. ක්ෂෙත්‍රයෙන් තොරතුරු ලබාගැනීමේ දී හා එම තොරතුරු ඇතුලත් කිරීමේ දී ක්ෂෙත්‍ර විමර්ශනය යටතේ ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. ඊට අමතරව ක්ෂෙත්‍රයේ විමර්ශනය කරන ලද කිසියම් හෝ විශේෂිත ලක්ෂණයක් නිරීක්ෂණය කළේ නම් ඒ පිළිබඳව වාර්තා කළ යුතුය.

19.41. සම්බන්ධතාවය රහිත මාර්ග හෝ ඇළ මාර්ග එකිනෙක සම්බන්ධ වූයේ නම් හෝ අළුතින් යම් ලක්ෂණයක් එකතු කරන ලද්දේ නම් - GNSS ක්‍රමය භාවිත කළ හැකි අතර දැනට සම්මත කරන ලද පිඹුරු වලින් ද තොරතුරු ලබාගත හැක. එම තොරතුරුද වාර්තා කළ යුතුය.

19.42. ස්ථානීය නිරවද්‍යතාවය රහිත තොරතුරු ඇතුළත් කිරීමේදී (මැනුමකින් හෝ දැනට පවතින පිඹුරුවලින් නොවන අවස්ථාවන්හිදී) එම සියළු තොරතුරු වාර්තා කළ යුතුය.

19.43. ක්ෂෙත්‍ර විමර්ශනයෙන් රැස්කරගන්නා ලද තොරතුරු ආධාරක පත්‍රයට ඇතුලත් කළ යුතුය. විස්තර ඇතුලත් කිරීමේදී සිතියමේ පරිමාණයම පවත්වාගෙන යාමට වග බලාගත යුතුය.

19.44. කිසියම් ලක්ෂණයක් හෝ විස්තරයක් ආධාරක පත්‍රයෙහි ඇතුලත් කර නොමැති බව නිරීක්ෂණය වුවහොත් ඒවා ලකුණු කළ යුතුය. එමෙන්ම ආධාරක පත්‍රයෙහි සඳහන් යම් ලක්ෂණයක් ක්ෂෙත්‍රයේ දක්නට නොලැබුනහොත් ඒ බව වාර්තා කළ යුතුය.

19.45. ක්ෂෙත්‍ර ආධාරක පත්‍රයෙහි සඳහන් යම් ලක්ෂණයක් සත්‍ය වශයෙන්ම නිරීක්ෂණය කරන ලද ලක්ෂණයකට වඩා වෙනස් වූයේ නම් එය නිවැරදි කර වාර්තා කළ යුතුය. කිසියම් හෝ රේඛීය ලක්ෂණයක කොටසක් පමණක් වාර්තා කළ යුතු අවස්ථාවන්හිදී අදාළ කොටස යා ලකුණ යොදා ආරම්භ කළ යුතු අතර අවසානය ද එපරිදිම විය යුතුය.

19.46. රේඛා, නම් සහ සලකුණු විස්තර කිරීම සඳහා එම ආධාරක පත්‍රයේම වඩාත් සුදුසු යොමුවක් භාවිතා කළ යුතුය.

ජල මාර්ග හා ජලය ආශ්‍රිත තොරතුරු

19.47. ක්ෂෙත්‍ර ආධාරක පත්‍රයෙහි ජලය ආශ්‍රිත තොරතුරු නිල් පැහැයෙන් පෙන්වා ඇත. තද නිල් පැහැයෙන් පෙන්වා ඇති ජලය ආශ්‍රිත තොරතුරු වල නිරවද්‍යතාව පරීක්ෂා කළ යුතු අතර එහි කිසියම් වෙනසක් වේ නම් වාර්තා කළ යුතුය.

19.48. ජලය ආශ්‍රිත තොරතුරු පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ යුතුය.

1) ද්විත්ව රේඛා ඇළ (පළල මීටර් 10 සහ ඊට වැඩි)
2) තනි රේඛා ඇළ (පළල මීටර් 10 ට අඩු)
3) ද්විත්ව රේඛා වාරිමාර්ග ඇළ (පළල මීටර් 10 සහ ඉන් ඉහල)
4) තනි රේඛා වාරිමාර්ග ඇළ (පළල මීටර් 10 ට අඩු)
5) ඇළ කණ්ඩි

6) එකිනෙක හරහා දිවෙන ඇළ මාර්ග
7) වැව (උපරිම ජල මට්ටම සහ එහි අගය සඳහන් කළ යුතුය)
8) වැව් කණ්ඩිය
9) අත්හරින ලද වැව
10) අත්හරින ලද වැව් කණ්ඩිය
11) අමුණ
12) පිටවාන
13) සොරොව්ව
14) දිය ඇල්ල - නාමයන්, උස (මීටර් වලින්), පිහිටි ස්ථානය
15) යටි බිම් ජල උමඟ
16) දිය මං පාලම
17) වතුර වල
18) බුබුල/ උණු දිය බුබුල හා එවැනි සංකීර්ණ ඇති ස්ථාන
19) ලේවාය
20) ඉස්සන්/ මිරිදිය මසුන් බෝ කරන ස්ථානය
21) පොකුණ
22) ජල උමඟ
23) නල ජල මාර්ග
24) ලිඳ
25) නල ලිඳ
26) කලපුව
27) වරාය
28) ධීවර වරාය
29) වගුරු බිම
30) දූපත්

19.49. එක් ජල මාර්ගයක් තවත් ජල මාර්ගයක් හරහා වැටී ඇති අවස්ථාවන්හිදී එකිනෙක හරහා යන ස්ථානය විස්තර කළ යුතුය. උදා: ඇළ මාර්ගය (Aqueduct), නල මාර්ග (Tube), උමඟ (Tunnel)

මාර්ග තොරතුරු යථාවත් කිරීම

19.50. වන්ද්‍රිකා ඡායාරූප මඟින් හඳුනාගත් මාර්ග දම් පැහැයෙන් ඇතුලත් කර ඇත. ක්ෂේත්‍රය පරීක්ෂා කර නිවැරදි බව තහවුරු කළ යුතුය.

19.51. එකිනෙක සම්බන්ධ කර නොමැති මාර්ග කොටස් ප්‍රධාන මාර්ග පද්ධතියට සම්බන්ධ කළ යුතුය. ආධාරක පත්‍රයේ නොමැති මාර්ග ඇතුලත් කළ යුතුය.

19.52. ඉදිවෙමින් පවතින මාර්ග ඇතුලත් කිරීමේදී එම ඉදිකිරීම් අවසන් කිරීමට ඇස්තමේන්තු කාලය සඳහන් කළ යුතුය. යෝජිත මාර්ග ඇතුළත් කිරීමේදී ඒ සඳහා අදාළ ඉඩම් අත් කරගෙන ඇතිද යන්න සඳහන් කළ යුතුය.

19.53. මාර්ග වර්ගීකරණයේ නිරවද්‍යතාව තහවුරු කරගත යුතු අතර හඳුනා නොගත් මාර්ග ද, දම් පාටින් පෙන්වා ඇති මාර්ග ද වර්ගීකරණය කළ යුතුය. මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නඩත්තු කරනු ලබන මාර්ග පමණක් මහා මාර්ග ලෙස සැලකිය යුතුය. එම මාර්ග අංකය, කි.මී ගණන සඳහන් කර තිබිය යුතුය. මාර්ගය දිගේ දුර, මාර්ගය සමඟ සම්බන්ධ වන ස්ථාන නාම, වගා විස්තරය, මාර්ගය

දෙපස ගොඩනැගිලි, පොදු ප්‍රවාහන මාධ්‍යයන් ඇති/ නැති බව සැලකිල්ලට ගත යුතුය. (C හා D වශයෙන් මාර්ග වර්ග කර අඩිපාරවල් E ලෙස වර්ග කළ යුතුය. ආරම්භක හා අවසාන ස්ථාන වල මාර්ග වර්ගීකරණය අපැහැදිළි වේ නම් විස්තර සටහන් කළ යුතුය. (උදා. - මීටර් 2.5 පළල තාර පාර, බොරලු පාර යන ආදී ලෙස)

19.54. A, B හා C යන මාර්ගයන්හි ක්ෂේත්‍ර පත්‍ර කෙලවරේ ආසන්නම නගරයට, කඩවීදියට, හංදියට හෝ වැදගත් ස්ථානවලට ඇති දුර සටහන් කළ යුතුය.

19.55. පහත සඳහන් තොරතුරු වෙන්කර විස්තර කළ යුතුය.

A. පාලම
B. බෝක්කුව (අංකය සඳහන් කරන්න)
C. ගුවන් පාලම, Over pass, Under pass, මගී ගුවන් පාලම
D. උමඟ
E. සපත්තු පාලම
F. ප්‍රධාන බස් නැවතුම
G. බස් ඩිපෝව
H. කි.මී. කණු එම අගයන් සමඟ
I. අධිවේගී මාර්ග වල ඇතුල්වීමේ (Entrance) හා පිටවීමේ (Exit) ස්ථාන

එම ස්ථාන වල නම් සඳහන් කරන්න.

දුම්රිය මාර්ග තොරතුරු යථාවත් කිරීම

19.56. යොමුපත්‍රයෙහි සඳහන් කර ඇති දුම්රිය මාර්ගවල ස්ථානීය නිරවද්‍යතාවය තහවුරු කරගත යුතු වන අතර කිසියම් සංශෝධනයක් වේ නම් වාර්ථා කළ යුතුය. ආසන්නම දුම්රිය ස්ථානයෙහි නම, යාබද පත්‍රයේ ඇති දුම්රිය නැවතුම් ස්ථානය සඳහා ඇති දුර ද සමඟ එම ස්ථානය සටහන් කළ යුතු වන අතර එම අගය කි.මී. වලින් එක් දශම ස්ථානයකට පත්‍ර කෙලවරෙහි සටහන් කළ යුතුය.

19.57. දුම්රිය මාර්ග සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සටහන් කළ යුතුය.

1) දුම්රිය ස්ථානය - නම හා සියළුම ගොඩනැගිලි
2) දුම්රිය නැවතුම - නම හා සියළුම ගොඩනැගිලි
3) දුම්රිය අංගනය - නම හා සියළුම ගොඩනැගිලි
4) පාලම
5) බෝක්කුව
6) උමඟ - ඒවායේ උස, දිග (මීටර් වලින්) හා අංක
7) දුම්රිය මාර්ග හරස් කැපුම හා පිරවුම් ස්ථාන හා ඒවායේ ආරම්භ වන හා අවසාන වන ස්ථාන

ඉඩම් පරිහරණ තොරතුරු යථාවත් කිරීම

19.58. ක්ෂේත්‍ර ආධාරක පත්‍රයෙහි දම්පාටින් දක්වා ඇති ඉඩම් පරිහරණ තොරතුරුවල නිරවද්යතාව තහවුරු කර ගත යුතු අතර සිදු කළ යුතු සංශෝධන වේ නම් ඒවා ද වාර්ථා කළ යුතුය.

19.59. ක්‍රීඩා පිට්ටනි, උද්‍යාන, සුසානභූමි (භාවිතා වන නම් තිබේ නම් සඳහන් කරන්න) ගල් වලවල් ආදියෙහි විස්තර සඳහන් කළ යුතුය.

19.60. රක්ෂිත ප්‍රදේශයන්හි මායිම් හා නම් දැක්විය යුතුය. (අභයභූමි, වන සංරක්ෂිත, පුරාවිද්‍යාත්මක ස්ථාන ආදිය)

19.61. කර්මාන්තපුර, වෙළඳ කලාප, ගොවිපලවල් හා වාහන නැවතුම් ස්ථාන (Car Park) පෙන්විය යුතු අතර, ඒවායේ නාම හා ඒවාට අයිති වන භූමි ප්‍රදේශය සලකුණු කර පෙන්විය යුතුය.

ගොඩනැගිලි තොරතුරු යථාවත් කිරීම

19.62. ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර A හි සඳහන් ගොඩනැගිලි අතරින් පහත සඳහන් ගොඩනැගිලි ක්ෂෙත්‍රයේ හඳුනාගත යුතු අතර ක්ෂෙත්‍ර පත්‍රයට ඇතුලත් කිරීමේදී ඒවා නම් කළ යුතුය. යම් ගොඩනැගිලි නාමයන් ඇතුලත් කිරීමේදී එයට අයිති වන සියළුම ගොඩනැගිලි පෙන්විය යුතුය.

1) බෞද්ධ විහාර හා පන්සල්
2) පල්ලි
3) මුස්ලිම් පල්ලි
4) හින්දු කෝවිල්
5) පාසල්
6) කාර්මික විද්‍යාල
7) උසස් අධ්‍යාපන ආයතන
8) රෝහල්
9) රජයේ ආයතන
10) බැංකු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල
11) පොලිස් ස්ථාන / පොලිස් මුරපොළවල්
12) අධිකරණ සංකීර්ණ
13) සංචාරක හෝටල් , නිවාඩු නිකේතන සහ තානායම්
14) ඉන්ධන පිරවුම් හල්
15) කර්මාන්ත ශාලා (තේ කර්මාන්ත ශාලා, රබර් කර්මාන්ත ශාලා, ඇඟලුම් කර්මාන්ත ශාලා ආදි වශයෙන් නම් සඳහන් කළ යුතුය)
16) ඓතිහාසික වැදගත්කමක් සහිත ස්ථාන (නටඹුන් වශයෙන් පවතී නම් සඳහන් කරන්න)
17) ගුවන් තොටුපල ,හෙලිකොප්ටර් අංගන
18) තැපැල් කාර්යාල, උප තැපැල් කාර්යාල, නියෝජිත තැපැල් කාර්යාල
19) නිවාස සංකීර්ණ හා ඒවායේ නාමයන් ඒවා අයිති ප්‍රදේශය
20) පුස්තකාල
21) ප්‍රජා ශාලා
22) ගොවිජන සේවා මධ්‍යස්ථාන
23) විදුලි බලාගාර, උප විදුලි බලාගාර, ප්‍රධාන ට්‍රාන්ස්ෆොමර් , සුළං විදුලි බලාගාර, කුළුණු හා ටර්බයින
24) රූපවාහිනී, ගුවන් විදුලි, දුරකථන සංඥා හුවමාරු කුළුණු, ශීතාගාර පිහිටි ගොඩනැගිලි
25) ප්‍රදීපාගාර
26) වෙනත් වැදගත් ගොඩනැගිලි (ඒ ඒ ප්‍රදේශයට අදාළ වන පරිදි වැදගත් වන ගොඩනැගිලි දැක්විය යුතුය.)

19.63. ඉහත වර්ගීකරණයන් යටතට ගැනෙන නමුත් ක්ෂෙත්‍ර ආධාරක පත්‍ර A හි සඳහන් නොවන වෙනත් ගොඩනැගිලිද සඳහන් කළ යුතුය.

19.64. ගොඩනැගිලි වල නම් සඳහන් කිරීමේදි අදාළ සංවිධානය භාවිතා කරනු ලබන නිල නාමය යෙදිය යුතුය. කිසියම් නාමයක් දැක්වීම සඳහා අදාළ ස්ථානයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් ඒ සඳහා අංකයක් භාවිතා කර අදාළ විස්තරය ක්ෂෙත්‍ර පත්‍රයේ කෙලවරක අදාළ අංකය යටතේ සඳහන් කළ යුතුය. නම් කරන ලද ගොඩනැගිලි කිහිපයක් ඇති අවස්ථාවක වැදගත් ගොඩනැගිලි කිහිපයක් ඇත්නම් ඒවායේ උස අනුව කිහිපයක් තෝරාගන්න.

අධිබලැති විදුලි රැහැන්

19.65. 33,000 හෝ ඊට වැඩි වෝල්ටීයතාවයක් සහිත රැහැන් පමණක් පෙන්විය යුතුය. පෙන්වන සියළුම අධි බල විදුලි රැහැන් වල වෝල්ටීයතාවය සඳහන් කළ යුතුය.

පරිපාලන කොට්ඨාශ මායිම් හා නම්

19.66. පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ග්‍රාම නිලධාරි වසම් මායිම් හා එම නම් ඇතුලත් කර ඇත. ඒවා නිවැරදි ද යන්න පරීක්ෂා කර බලා තහවුරු කළ යුතුය. ඊට අමතරව ග්‍රාම නාම හා වෙනත් ස්ථාන නාමයන් ද (ප්‍රදේශය, ගම, කඩවිදිය, මංසන්ධි, නගරය ආදියට වඩා කුඩා) වඩාත් සුදුසු වන ස්ථානයන්හි සඳහන් කළ යුතුය. ග්‍රාම නිලධාරි වසමේ නම අවසානයේ "GN" යන්න සඳහන් කළ යුතු අතර ග්‍රාම නාමය යටින් ඉරක් ඇදිය යුතුය. මහ නගර සභා, නගර සභා හා මහවැලි කලාප වල මායිම් හා එම නම් ඇතුළත් කළ යුතුය.
පරිපාලන මායිම්වල වෙනස්කම් සිදුවී ඇත්නම් අදාළ ගැසට් නිවේදනය ඉදිරිපත් කළ යුතුය.

19.67. වතු නාම නියමිත ස්ථානයන්හි සඳහන් කළ යුතුය. වතු නාම සඳහන් කිරීමේදි එම වතුයායට අදාළ කොට්ඨාශ නාමය ද ප්‍රධාන වතුයායේ නමට පහලින් සඳහන් කළ යුතුය.

19.68. අදාළ තොරතුරු ආධාරක පත්‍රයට ඇතුලත් කිරීමෙන් අනතුරුව, ඇතුලත් කර ඇති යාබද පත්‍ර දාර සමඟ හෝ ඒ වන විට ක්ෂෙත්‍රයට නිකුත් කර ඇති යාබද පත්‍ර වල දාර සමඟ හෝ සසඳා පරීක්ෂා කළ යුතුය. යම් නොගැලපීමක් නිරීක්ෂණය කළේ නම් නැවත පරීක්ෂා කළ යුතුය. ආධාරක පත්‍රයේ නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතු අතර අවශ්‍ය අවස්ථාවන්හි දී නිවැරදි කිරීම සඳහා වාර්තා කළ යුතුය. ඊට අමතරව යාබද පත්‍ර වල ලක්ෂණ සහ තොරතුරු නිවැරදි කර ඒවා ද ඉදිරිපත් කළ යුතුය.

පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම්

19.69. ක්ෂෙත්‍රයේ පරීක්ෂාවෙන් පසු රැස්කරගත් තොරතුරු අංකිත ගොනුවට ඇතුලත් කිරීම සඳහා 'ස්ථර කළමනාකරණ ආධාරකය' භාවිතා කළ යුතුය. ඒ අනුව මෙතෙක් සඳහන් නොකළ තොරතුරු ඇතුලත් කිරීමට හැකිවන පරිදි අළුතින් ස්ථර ඇති කළ යුතුය. ක්ෂෙත්‍ර පුනරීක්ෂණයේදී අළුතින් සොයා ගත් මාර්ග සහ ඇළවල් ඇතුලත් කිරීමට භාවිතා කරන ලද ස්ථර පැහැදිළිව හඳුනාගත හැකිවන පරිදි ඒවා නම් කළ යුතුය.

උදා -: ජල මාර්ග - STRMR

නව මහා මාර්ග - MNRDF

19.70. ක්ෂෙත්‍රයේ නොමැති යම් ලක්ෂණයක් ඉවත් කිරීමට අවශ්‍ය වේ නම් එම තොරතුරු අදාළ ස්ථරයන්හි ඇතුලත් කළ යුතුය.
උදා - : යම් ජල මාර්ගයක් ඉවත් කළ යුතු නම් - STRMD
යම් ප්‍රවේශ මාර්ගයක් ඉවත් කළ යුතු නම් - FTPHD

19.71. වැවක කොටස් හෝ ද්විත්ව රේඛා ජල ප්‍රවාහයක නම් කිහිපයක් භාවිතා කර ඇති අවස්ථාවක එම කොටස් පැහැදිලිව වෙන් කර පෙන්විය යුතුය. එසේ වෙන්කර පෙන්වීම සඳහා භාවිතා කරන ලද රේඛා STRMV/ TANKV යන ස්ථර වල ඇතුලත් කළ යුතුය.

19.72. පවරන ලද කාර්යය සම්පූර්ණ කිරීමෙන් පසු පහත සඳහන් ලේඛන මිනින්දෝරු අධිකාරි වෙත භාර දිය යුතුය.
1) ක්ෂෙත්‍ර ආධාරක පත්‍රය
2) අංකිත දත්ත (GNNS point, Coordinates, details, Geotag Photos ඇතුලත් කරන ලද)
3) රක්ෂිත සඳහා වෙන්කරන ලද බිම් ප්‍රදේශවල තොරතුරු සහිත පත්‍ර (ප්‍රා. ලේ. මහින්)
4) ග්‍රාම නාම ලේඛනය සහ ක්ෂෙත්‍රයෙන් ලබාගන්නා ග්‍රාම නාම ලේඛනය
5) යොමු කරන ලද ප්‍රශ්නාවලිය
6) යොමු කරන ලද ගැටළු සඳහා පිළිතුරු හා මිනින්දෝරුවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව
7) ගොඩනැගිලි, ගම් හා වෙනත් ලක්ෂණ සඳහා භාවිතා කරන ලද නම් ඉංග්‍රීසියෙන් සඳහන් කරන ලද ලේඛනය

මිනින්දෝරු අධිකාරිගේ හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ කාර්යභාරය

19.73. 19.34 සිට 19.38 ඡේදයන් හි දක්වා ඇති කරුණු අනුව කටයුතු කළ යුතුය.

ගුවන් මැනුම් සඳහා භූමිතික පාලන ලක්ෂ්‍ය පිහිටුවීම

19.74. ඉතා හොඳ භූමිතික පාලන ලක්ෂ්‍ය පිහිටුවීම ඕනෑම ඡායාරේඛනමිතික හා සිතියම්කරණ කටයුත්තකදී ඉතාමත් වැදගත් කරුණකි. පිළියෙල කර අවසන් කරන ලද සිතියමක නිරවද්‍යතාව ඒ සඳහා මූලික කරගත් පොළොවේ පිහිටුවන ලද භූමිතික පාලන ලක්ෂ්‍ය වල නිරවද්‍යතාවයම නොවේ.
ඡායාරූප ඉතා හොඳින් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව භූමිතික පාලන ලක්ෂ්‍ය තෝරා ගත යුතුය. ඒ සඳහා පැහැදිලි දෘෂ්‍යමාන ත්‍රිමාන ඡායාරූප (ස්ටීරියෝ) යුගල භාවිතා කළ යුතුය.

19.75. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (භූමිතික) විසින් අවශ්‍ය මූලික භූගෝලීය බණ්ඩාංක හඳුනා ගත් විගස ඒවා සඳහා අවශ්‍ය නිරවද්‍යතාව සහිතව ස්ථානීය රූප සටහන් ඇඳ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත මැනුම් කටයුතු ආරම්භ කිරීම සඳහා යැවිය යුතුය.
ස්ථානීය රූපසටහන - භූමිතික පාලන ලක්ෂ්‍ය අනුරේඛනයක ලකුණු කර අඟලට දම්වැල් 16 පත්‍රයේ හෝ 1:50,000 සිතියමකින් අමතර විස්තර ඇතුලත් කර ඉහත රූප සටහන සකස් කළ යුතුය.

19.76. හොඳ මට්ටමේ භූමිතික පාලන ලක්ෂ්‍ය සඳහා පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුය.
1) නිවැරදිතාවය වැඩි හොඳින් අර්ථ දක්වා ඇති සියළුම ඡායාරූපවල හොඳින් හඳුනාගත හැකි ස්ථාන විය යුතුය.
2) මෙම ලක්ෂ්‍ය ඡායාරූපයෙහි සමබරව ස්ථාන ගත වී තිබිය යුතුය.

19.77. තිරස් පාලන ලක්ෂ්‍ය සඳහා වන ඡායාරූප සුළු වශයෙන් සිරස් පාලන ඡායාරූප වලින් වෙනස් වේ. තිරස් පාලන ලක්ෂ්‍ය සඳහා වන ඡායාරූප ඉතා තීව්‍ර වන අතර තිරස්ව හොඳින් අර්ථ දක්වා ඇති අතර සිරස් පාලන ලක්ෂ්‍ය එතරම් තීව්‍රතාවයෙන් ඉහල හෝ හොඳින් අර්ථ නිරූපනය කරන ලද ඡායාරූප නොවේ. කෙසේ නමුත් තෝරා ගත් සිරස් පාලන ලක්ෂ්‍ය සිරස්ව ඉතා හොඳින් අර්ථ නිරූපනය කර තිබිය යුතුය.

19.78. තෝරාගත් ලක්ෂ්‍ය ඡායාරූප මත ලකුණු කරන ලද වෘත්තය තුල විය යුතුය. සෑම විටම සම්මිතික ලක්ෂණ භාවිතා කිරීමට උත්සාහ කළ යුතුය. තිරස් පාලනය සඳහා පොදුවේ සුදුසු වන ලක්ෂණ නම්, මාර්ග එකිනෙක හමුවන ස්ථාන, කුඩා පදුරු , ගොඩනැගිල්ලක කෙලවර, වැට කෙලවර, දුම්රිය මාර්ග එකිනෙක හමුවන ස්ථාන හෝ ජල ස්ථාන ආදිය වේ. මෙම පාලන ලක්ෂ්‍ය ඡායාරූප වල සෙවන සහිත හෙවත් ආවරණය වූ ප්‍රදේශ වල නොපිහිටුවිය යුතුය. විශේෂයෙන් යාබදව පිහිටි එකිනෙකට වෙනස් දිනයන්හි ලබා ගත් ඡායාරූප දෙකෙහිම එම ලක්ෂ්‍ය පිහිටන පරිදි තෝරා ගත යුතුය.

19.79. ඉතාම සුදුසු සිරස් පාලන ලක්ෂ්‍ය කුඩා සමතල සහ සුළු වශයෙන් ඉහලින් පිහිටි ප්‍රදේශයක පිහිටිය යුතුය. ඇතැම් ඉතා කුඩා ප්‍රදේශ ආසන්නයේ ගස්, ගල් ආදී ත්‍රිමාන හැඩය වඩාත් හොඳින් දැකිය හැකි ස්වාභාවික ලක්ෂණ සහිත ප්‍රදේශ මේ සඳහා සුදුසු වේ. තණ බිම් සහිත උස් කඳු හෝ විවෘත බිම් හැකි සෑම විටම බැහැර කළ යුතුය. එනම් ත්‍රිමාන ලක්ෂණ හොඳින් නිරීක්ෂණය කිරීම එහිදී අපහසු විය හැක. මාර්ග ඡේදනය වන කුඩා තෘණ බිම් හෝ කුඩා විවෘත ස්ථාන ආදිය වඩාම සුදුසු සිරස් පාලන ලක්ෂ්‍ය වේ.

19.80. ඇතැම් අවස්ථාවල තිරස් හා සිරස් පාලන ලක්ෂ්‍ය සඳහා එක සේ සුදුසු ලක්ෂ්‍ය සොයා ගැනීම දුෂ්කරවේ. තිරස් පාලන ලක්ෂ්‍ය සඳහා නියමිත ප්‍රමාණය සහ තීව්‍රතාවය තිබිය යුතු අතර සිරස් පාලන ලක්ෂ්‍ය සමතල ප්‍රදේශයක හොඳ තීව්‍රතාවයක් සහිත ඡායාරූප වල තිබිය යුතුය. ඒ අනුව එකිනෙකට යාබදව පිහිටි ලක්ෂ්‍ය දෙකක් තෝරා ගත යුතු අතර ඉන් එකක් සිරස් පාලන ලක්ෂ්‍ය සඳහා ද අනෙක් ලක්ෂ්‍ය තිරස් පාලන ලක්ෂ්‍යය ලෙස ද තෝරා ගත යුතුය.

19.81. ඡායාරේඛණමිතික ශිල්පීන්හට තෝරාගත් ලක්ෂ්‍ය හඳුනා ගැනීමේදී ඇතිවන අවිනිශ්චිතභාවය තුරන් කිරීම සඳහා ඔවුන් විසින් ඡායාරේඛණමිතික දළ සටහනක් සකස් කරනු ඇත. ඡායාරූපවල දක්නට ලැබෙන පරිදි මෙම තෝරා ගත් ලක්ෂ්‍ය වල අවට තොරතුරුද සමඟ නිශ්චිත පිහිටීම එම දළ සටහනෙහි ලකුණු කර ගත යුතුය. ඡායාරූපයට සාපේක්ෂව දළ සටහනේ පිහිටීම සඳහන් කළ යුතුය. මීට අමතරව ඡායාරූපය මත තෝරා ගත් ලක්ෂ්‍යයක් ලකුණු කිරීම අවශ්‍යවේ. තෝරා ගත් ලක්ෂ්‍යයේ නැවත මැනුම් කිරීමට අවශ්‍ය වුවහොත් භාවිතා කිරීම සඳහා මිනින්දෝරුවරයාගේ දළ සටහන සකස් කළ යුතුය. (ඇමුණුම 01 බලන්න)

19.82. සියළුම ලක්ෂ්‍ය එකිනෙක ජාලගත විය යුතුය. භූමිතික පාලන ලක්ෂ්‍ය මේ සඳහා භාවිතා කළ හැකි අතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (භූමිතික) ගේ සහාය ලබා ගත හැක.

19.83. සියළු වැඩ අවසානයේ ගණනය කරන ලද ඛණ්ඩාංක, ලබා ගත් ඡායාරූප, ඡායාරේඛණමිතික දළ සටහන් හා මිනින්දෝරුවරයාගේ සටහන් ආදිය දිස්ත්‍රික් ජ්යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ගුවන් මැනුම්) වෙත යොමු කළ යුතුය.

19.81 පේදය **ඇමුණුම 01**

භූමිතික පාලන ලක්ෂ්‍ය - දත්ත පත්‍රය

1. ස්ථානීය අංකය :
2. 1: 50,000 පත්‍ර අංකය :
3. තෝරාගත් ඡායාරූප අංකය :
4. කොට්ඨාශය :
5. දිස්ත්‍රික්කය:
6. මිනින්දෝරුවරයාගේ නම :



ඡායාරේඛණමිතික දළ සටහන



මිනින්දෝරුවරයාගේ දළ සටහන

7. ඛණ්ඩාංක	(i) උතුර (මීටර්)	125452.00
	(ii) නැගෙනහිර (මීටර්)	476234.00
	(iii) උස (මීටර්)	54.78

8. ලක්ෂ්‍යයේ විස්තරය - .....

9. (i) මැනුම් ක්‍රමය - .....

(ii) ක්ෂේත්‍ර පොත්අංකය - .....

(iii) මනින ලද දිනය : .....

10. උස මනින ලද ක්‍රමය : .....

මට්ටම් පොත්අංකය : .....

මට්ටම් ලබාගත් දිනය : .....

අත්සන: .....

නම : .....

රජයේ මිනින්දෝරු

දිනය: .....

පරීක්ෂා කරන ලද්දේ : .....

නම : .....

මිනින්දෝරු අධිකාරී

දිනය

අනුමත කරන ලද්දේ : .....

නම : .....

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි

දිස්ත්‍රික්කය

ශුද්ධි පත්‍රය

ශුද්ධි පත්‍රය

20 වැනි පරිච්ඡේදය

බිම් මැනීම සඳහා යෙදෙන ව්‍යවස්ථාපිත නීතීන්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	රාජ සන්තක ඉඩම් අනවසර වගා ආඥාපනත	
20.1.	රාජ සන්තක ඉඩම් අනවසර වගා ආඥාපනත (1840 අංක 12, 1931 අංක 22, 1947 අංක 08 ආඥාපනත් සහ 1954 අංක 8 දරණ පනත)	1
	මායිම් නිරූපණ ආඥාපනත	
20.2.	මායිම් නිරූපණ ආඥාපනත (1844 අංක 1, 1905 අංක 13, 1919 අංක 28, 1933 අංක 27, 1947 අංක 08, ආඥාපනත් සහ 1955 අංක 22 දරණ පනත)	1
20.3.	ඉඩම් මායිම් නිරූපනය කරවා ගැනීමට නොහැකි අවස්ථා වල ක්‍රියා මාර්ගය	1
20.4.	සර්වේයර් ජනරාල් විසින් එවැනි මැනුම් වියදම් සහතික කිරීම	1
20.5.	මැනුම් වියදම් සඳහා ගෙවීම්	1
	ඉඩම් මැනුම් ආඥාපනත	
20.6.	ඉඩම් මැනුම් ආඥාපනත (1866 අංක 4, 1917 අංක 2)	2
	ඉඩම් ආපසු ගැනීමේ ආඥාපනත	
20.7.	ඉඩම් ආපසු ගැනීමේ ආඥාපනත (1887 අංක 4, 1934 අංක 2, 1942 අංක 57, 1955 අංක 22)	2
	ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත	
20.8.	ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත (1931 අංක 20, 1932 අංක 22, 1933 අංක 31 ආඥාපනත් සහ 1955 අංක 22 දරණ පනත)	2
20.9.	සම්බන්ධතාවයන් දක්වන අයවලුන් පිළිබඳ පරීක්ෂණය (නියෝග අංක 278)	2
20.10.	නිරවුල් කිරීමේ දැන්වීමේ සඳහන් ඉඩම පිළිබඳ විස්තරය (නියෝග අංක 285)	2
20.11.	ඉඩම් නිරවුල් කිරීම අනුමත කරවා ගැනීම හා උසාවියට යොමු කිරීම (නියෝග අංක 287)	3
20.12.	ඇතැම් අවස්ථා වලදී යොදා ගනු ලබන සරල ක්‍රියාමාර්ගය (නියෝග අංක 288)	3
20.13.	නිරවුල් කිරීමේ නියෝගයන් ලියාපදිංචි කිරීම සහ නිරවුල් කිරීමේ නියෝග සඳහා හිමිකම් පිඹුරු නිකුත් කිරීම (නියෝග අංක 289)	3
20.14.	සර්වේයර් ජනරාල් වෙත අවශ්‍ය තතු සැපයීම (නියෝග අංක 290)	3
20.15.	නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කිරීම සඳහා ගම වසා දැමීම (නියෝග අංක 291)	4
	රජයේ ඉඩම් (හිමිකම් දීමනා) ආඥාපනත	
20.16.	රජයේ ඉඩම් (හිමිකම් දීමනා) ආඥාපනත (1931 අංක 21)	4
	රජයේ මායිම්ගල් ආඥාපනත	
20.17.	රජයේ මායිම්ගල් ආඥාපනත (1909 අංක 7)	4
	ඉඩම් සංවර්ධන ආඥාපනත	
20.18.	ඉඩම් සංවර්ධන ආඥාපනත (1935 අංක 19, 1946 අංක 3, 1953 අංක 49, 1955 අංක 22, 1969 අංක 16, 1971 අංක 21, 1973 අංක 43)	4
20.19.	ඉඩම් නියෝග 4	4
20.20.	රජයේ ඉඩම් වෙන් කර ලකුණු කරනු ලැබිය හැකි කාර්යයන්	5
20.21.	රජයේ ඉඩම් අන්සතු කිරීම	5

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
20.22.	දීමනා පත්‍රයට රේඛා සටහනක් ඇමිණිය යුතු බව	6
20.23.	නියමිත ගාස්තුව ගෙවූ විට පිඹුරේ පිටපතත් සැපයිය යුතු බව	6
	රජයේ ඉඩම් ආඥාපනත	
20.24.	රජයේ ඉඩම් ආඥාපනත (1947 අංක 8, 9 සහ 1949 අංක 13 දරණ පනත)	6
20.25.	රාජසන්තක ඉඩම් ප්‍රදානය, බදු දීම හා අන් අයුරකින් පවරා දීම	6
20.26.	ප්‍රදානයකට හෝ දීර්ඝ කාලීන බද්දකට ප්‍රථම ඉඩම මැනිය යුතු බව	6
	විහාර ඉඩම් (වන්දි) ආඥාපනත	
20.27.	විහාර ඉඩම් (වන්දි) ආඥාපනත (1949 අංක 28, 1950 අංක 09)	7
	ඉඩම් අත්කර ගැනීමේ පනත	
20.28.	ඉඩම් අත්කර ගැනීමේ පනත (1950 අංක 9, 1954 අංක 39, 1955 අංක 22, 1964 අංක 28, 1969 අංක 20, 1971 අංක 48, 1979 අංක 8)	7
20.29.	පොදු කාර්යයන් සඳහා ඉඩමක් තෝරා ගැනීම පිළිබඳ විමර්ශනය	7
20.30.	පොදු කාර්යයන් සඳහා ඉඩමක් හෝ පරවශ්‍යතාවක් වුවමනා බවට වූ ප්‍රකාශය	8
20.31.	ඉඩම මැනීම හා එම ඉඩමෙහි පිඹුර	8
20.32.	ඉඩමක සන්තකය භාර ගැනීම හෝ ඉඩමක් පරවශ්‍යතාවයකට යටත් කිරීම සඳහා වූ ආඥාව	8
	නින්දගම් ඉඩම් පනත	
20.33.	නින්දගම් ඉඩම් පනත (1968 අංක 30)	9
	ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය	
20.34.	ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය (1972 අංක 1 , 1975 අංක 39)	9
	රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීම) පනත	
20.35.	රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත (1979 අංක 07)	9
	ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත	
20.36.	ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත - (1979 අංක 43)	9
20.37.	ජනාධිපතිවරයාට මෙම පනත යටතේ රජය සතු ඉඩම් කිසිදු අයකිරීමකින් තොරව පැවරිය හැකි බව	10
20.38.	පැවරීමට පෙර ඉඩම මැනීම් කළ යුතු බව	10
	හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත	
20.39.	හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (1998 අංක 21)	10
20.40.	කැඩැස්තර සිතියම් සකස් කිරීම	10
	මැනුම් පනත	
20.41.	මැනුම් පනත (2002 අංක 17)	11
20.42.	සර්වේයර් ජනරාල්ගේ බලතල හා කර්තව්‍යයන්	11
20.43.	සර්වේයර් ජනරාල්වරයා හෝ බලයදෙන ලද වෙනත් අය විසින් ඔප්පු ඉදිරිපත් කරන ලෙස බල කර සිටිය හැකි බව	12
20.44.	සර්වේයර් ජනරාල් විසින් අත්සන් කරනු ලැබූ ඇතැම් පිඹුරු ඔප්පු කිරීම	12
	සාක්ෂි ආඥාපනත	
20.45.	සාක්ෂි ආඥාපනත (1895 අංක 14, 1904 අංක 15, 1925 අංක 16, 1927 අංක 25, 1928 අංක 18, 1946 අංක 1, 1961 අංක 3)	12

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	නාගරික සංවර්ධන අධිකාරි නීතිය	
20.46.	නාගරික සංවර්ධන අධිකාරි නීතිය (1978 අංක 41, 1979 අංක 70)	12
	නගර හා ග්‍රාම සැළසුම් ආඥාපනත	
20.47.	නගර හා ග්‍රාම සැලසුම් ආඥාපනත (1946 අංක 13, 1950 අංක 9, 1953 අංක 29, 1955 අංක 10, 1955 අංක 22)	13
	සභාධිපත්‍ය හිමිකම් පනත	
20.48.	සභාධිපත්‍ය හිමිකම් පනත (සංශෝධිත) (2003 අංක 39)	13

20 වැනි පරිච්ඡේදය

බිම් මැනීම සඳහා යෙදෙන ව්‍යවස්ථාපිත නීතීන්

[රාජ සන්තක ඉඩම් අනවසර වගා ආඥාපනත]

20.1. රාජ සන්තක ඉඩම් අනවසර වගා ආඥාපනත (1840 අංක 12, 1931 අංක 22, 1947 අංක 08 ආඥාපනත් සහ 1954 අංක 8 දරණ පනත)

රාජ සන්තක ඉඩම් වල අනවසර වගා වැලැක්වීමේ විධිවිධාන යොදනු පිණිස පනවන ලද ආඥාපනතකි.

[මායිම් නිරූපණ ආඥාපනත]

20.2. මායිම් නිරූපණ ආඥාපනත (1844 අංක 1, 1905 අංක 13, 1919 අංක 28, 1933 අංක 27, 1947 අංක 08, ආඥාපනත් සහ 1955 අංක 22 දරණ පනත)

ශ්‍රී ලංකාවේ ඉඩම් වල මායිම් නිශ්චය කිරීමේ කටයුතු කිරීම සඳහා අදාළ විධිවිධාන මෙම ආඥාපනතින් සළස්වා ඇත. මෙම ආඥාපනත මායිම් ආඥා පනතේ නිර්වචනයක් ලෙස දැක්විය හැක.

රජයට අයත් ඉඩමක මුළු භූමියෙහි හෝ අර්ධ වශයෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන් හෝ මායිම් අළුත් කර ගත යුතු වේ නම් දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ කටයුතු කිරීමට පහත සඳහන් ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය.

20.3. ඉඩම් මායිම් මැනුම් කරවා ගැනීමට නොහැකි අවස්ථා වල ක්‍රියා මාර්ගය

මායිමක් යෙදීමේ හෝ නැවත යෙදීමේ කටයුතු එවැනි තැනැත්තකු විසින් හෝ තමා විසින් සේවයෙහි යොදවනු ලැබූ වෙනම මිනින්දෝරුවරයෙකු විසින් හෝ සතුටුදායක අන්දමින් කළ නොහැකි බව ප්‍රාදේශීය ලේකම්ට නැතහොත් සහකාර ප්‍රාදේශීය ලේකම්ට පෙනීගිය හොත් එම මායිම සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් යොදන ලෙස නැතහොත් නැවත යොදන ලෙස සර්වේයර් ජනරාල්ගෙන් ඉල්ලා සිටිය හැක. එවිට එම ඉල්ලීම අනුව සර්වේයර් ජනරාල් විසින් එම මායිම යෙදීම හෝ නැවත යෙදීම හෝ කළ යුතුය.

20.4. සර්වේයර් ජනරාල් විසින් එවැනි මැනුම් වියදම් සහතික කිරීම

මැනීම සඳහා දරන්නට සිදුවූ වියදම්, සර්වේයර් ජනරාල් විසින් එම මැනීම් අයත් වන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ට නැතහොත් සහකාර ප්‍රාදේශීය ලේකම්ට සහතික කර යැවිය යුතුය. එම සහතිකය අවසාන වූද තීරණාත්මක වූ ද සහතිකය වන්නේය.

20.5. මැනුම් වියදම් සඳහා ගෙවීම්

යම් පුද්ගලයකු පූර්වෝක්ත මැනුම් වියදම, ප්‍රාදේශීය ලේකම්ට හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්ට ගෙවිය යුතු වන අතර, නමුත් එම පුද්ගලයා එම පූර්වෝක්ත ගෙවීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ගෙවීම නොසලකා හරින්නේ නම් හෝ එසේ නොගෙවීමට හේතු දැක්වීම සඳහා මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පෙනී සිටීමට සිතාසි නිකුත් කළ හැක. එසේ නොගෙවීමට එම පුද්ගලයාට සාධාරන හේතුවක් දැක්වීමට නොහැකි වූයේ නම් හෝ මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීමට අසමත් වූයේ නම් හෝ පූර්වෝක්ත මැනුම් වියදම ගෙවන ලෙස නියම කළ හැක.

ඉඩම් මැනුම් ආඥාපනත

20.6. ඉඩම් මැනුම් ආඥාපනත (1866 අංක 4, 1917 අංක 2)

ඉඩම් මැනීමේ කටයුතු සඳහා අදාළ ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් වලට අදාළව සර්වේයර් ජනරාල්ගේ බලතල වැඩි කිරීම සඳහා වූ ආඥාපනත වේ.
මෙම ආඥාපනත, 2002 අංක 17 දරණ මැනුම් පනත මඟින් අවලංගු විය.

ඉඩම් ආපසු ගැනීමේ ආඥාපනත

20.7. ඉඩම් ආපසු ගැනීමේ ආඥාපනත (1887 අංක 4, 1934 අංක 2, 1942 අංක 57, 1955 අංක 22)

රජය විසින් බෙදා දෙන ලද ඉඩම්, නිර්මිකරුවන් විසින් අත්හැර දමා ඇති විට එම ඉඩම් සම්බන්ධ කටයුතු කිරීම සඳහා වූ ආඥාපනතකි.

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත

20.8. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත (1931 අංක 20, 1932 අංක 22, 1933 අංක 31ආඥා පනත් සහ 1955 අංක 22 දරණ පනත)

ඉඩම් නිරවුල් කිරීමට අදාළ නීතීන් සංශෝධනය කිරීමට හා විධිමත් කිරීම සඳහා වූ ආඥාපනතකි. ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ නිකුත් කර ඇති නියෝග වලින් තෝරාගත් නියෝග කිහිපයක් පහත දක්වා ඇත.

20.9. සම්බන්ධතාවයන් දක්වන අයවලුන් පිළිබඳ පරීක්ෂණය (නියෝග අංක 278)

නිරවුල් කිරීමේ නිලධාරියා විසින් නිකුත් කරනු ලබන දැන්වීමකින් විස්තර වන ඉඩම හෝ ඉඩමකින් කොටසක අයිතිය හෝ යම් සම්බන්ධතාවයක් කියා පෑමට හිමිකම් ලබන්නවුන් සම්බන්ධතා දක්වන්නන් ලෙස ගැනේ. නිරවුල් කිරීමේ නිලධාරින් නිරවුල් කිරීමේ දැන්වීමක් නිකුත් කරන්නට තීරණය කළ විගසම සියළුම සම්බන්ධතා දක්වන්නන්ගේ නම හා ලිපිනයන් සොයා ගැනීමට පියවර ගත යුතුය.

20.10. නිරවුල් කිරීමේ දැන්වීමේ සඳහන් ඉඩම පිලිබඳ විස්තරය (නියෝග අංක 285)

නිරවුල් කිරීමේ දැන්වීමේ උපලේඛනයෙහි එම දැන්වීමේ අඩංගු ඉඩම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් අන්තර්ගත විය යුතුය.

අ) ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ග්‍රාම නිලධාරි කොට්ඨාශය, ගම
ආ) පිඹුරු අංකය, සියළුම ඉඩම් කැබලි වල අංකයන්, නම හා ප්‍රමාණයන්
ඇ) ඉඩමේ මායිම
ඈ) ඉඩම පිහිටා ඇති ගමේ මායිම

තවද, දැන්වීමට ඇතුලත් කර නොමැති බිම් කට්ටි (ගම තුල පිහිටා ඇතත්) ඒ සම්බන්ධව ක්‍රියා නොකරන බැවින් ඒවා සඳහා අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට අනවශ්‍ය වේ.

20.11. ඉඩම් නිරවුල් කරවා ගැනීම අනුමත කරවා ගැනීම සඳහා උසාවියට යොමු කිරීම් (නියෝග අංක 287)

තමා විසින් ලද සියළුම හිමිකම් පෑම පිළිබඳ කාර්යයන් අවසන් වූ විගසම නිරවුල් කිරීමේ නිලධාරි විසින් උසාවියට යොමු කළ යුතු යැයි අදහස් කෙරෙන නිරවුල් කිරීම් හා හිමිකම් පෑමට අදාළ වන සියළුම විස්තර අඩංගු කරමින් වාර්තාවක් පිළියෙල කර එම වාර්තාව දැන්වීම් ගොනුවද සමඟ නීතිපති වෙත ඉදිරිපත් කළ යුතුය. නීතිපතිගේ උපදෙස් ලැබුනු පසු එම නිරවුල් කිරීම සම්බන්ධයෙන් උසාවියට යොමු කිරීමට ඉඩම් ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

මෙම ආඥාපනත යටතේ ඉදිරිපත් කරනු ලැබූ යම් යොමු කිරීමක් විභාග කිරීමේ කාර්යය සඳහා අළුත් මැනුමක් අවශ්‍ය යැයි දිස්ත්‍රික් විනිශ්චයකරු අදහස් කරන සෑම අවස්ථාවකදීම එබඳු මැනුමක් පවත්වනු ලබන ලෙස ආඥාවක් ඔහු විසින් පැනවිය හැකිය.

20.12. ඇතැම් අවස්ථා වලදී යොදා ගනු ලබන සරල ක්‍රියාමාර්ගය (නියෝග අංක 288)

උසාවියට යොමු කළ යුතු නොවන අන්දමේ යම් නිරවුල් කිරීම් සම්බන්ධයෙන් වූ නිරවුල් කිරීමේ දැන්වීමේ සඳහන් මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 10ට වැඩි නොවන්නේ නම් තමා විසින්ම එම නිරවුල් කිරීම අනුමත කිරීමේ බලය නිරවුල් කිරීමේ නිලධාරි සතු වන්නේය.

20.13. නිරවුල් කිරීමේ නියෝගයන් ලියාපදිංචි කිරීම සහ නිරවුල් කිරීමේ නියෝග සඳහා හිමිකම් පිඹුරු නිකුත් කිරීම (නියෝග අංක 289)

(i) නිරවුල් කිරීමේ ආඥාපනතේ 5(4) ඇ වගන්තිය යටතේ කිසියම් නිරවුල් කිරීමක් සම්බන්ධයෙන් පුද්ගලයන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් හිමිකරුවන් වශයෙන් අනුමත කර ඇති විටෙක එම එක් එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් හිමිකම් පිඹුරක් ලබා ගැනීම වස් ආ.ඒ.140 දරණ ආකෘතියෙන් මැනුම්පති වෙත මැනුම් ඉල්ලුම් පත්‍රයක් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කළ යුතුය.

(ii) හිමිකම් පිඹුරු ලැබීමෙන් පසු නිරවුල් කිරීමේ නිලධාරි විසින් නිරවුල් නියෝගය පිළියෙල කර හිමිකම් පිඹුරු සමඟ ඉඩම් ලියපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වෙත නිරවුල් කිරීමේ ආඥාපනතේ 9 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා යැවිය යුතුය. එහි පිටපත ලැබුණු පසු, ඉඩම් රෙජිස්ට්‍රාර් විසින්, ඒ පිටපත ලේඛන ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉඩම් කෙරෙහි බලපාන නීත්‍යානුකූල ලේඛනයක් සේ සලකා, ඒ ආඥාපනත මඟින් නියමිත පරිදි අදාළ වන සෑම නිරවුල් කිරීමකම විස්තර, ඉඩම් කෙරෙහි බලපාන නීත්‍යානුකූල ලේඛන ලියාපදිංචි කිරීම සඳහා ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත මඟින් නියමිත පොතක සටහන් කොට ඒ එක් එක් සටහන කරනු ලැබූ කාණ්ඩය හා පත් තීරුව ගැන පිටපතෙහි නිසි තීරයේ සඳහන් කර ඒ පිටපත නිරවුල් කිරීමේ නිලධාරියා වෙත ආපසු යැවිය යුතුය.

(iii) නිරවුල් කිරීමේ නියෝගය රජයේ ගැසට් පත්‍රයේ පලවූ පසුව එහි එක් පිටපතක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත යැවෙන අතර එක් පිටපතක් ඉඩම් කොටසට අදාළ හිමිකරු වෙත යැවිය යුතුය. කිසියම් ඉඩමකට හිමිකරුවන් දෙදෙනකුට වැඩි ගණනක් සිටින අවස්ථාවලදී එක් එක් පුද්ගලයා වෙත නියෝගයේ පිටපත් යැවිය යුතුය.

20.14. මැනුම්පති වෙත අවශ්‍ය තතු සැපයීම (නියෝග අංක 290)

නිරවුල් කිරීමේ දැන්වීමක් ප්‍රසිද්ධ කළ විගසම නිරවුල් කිරීමේ නිලධාරියා විසින් එහි පිටපතක් ස්වකීය ලේඛනවල අවශ්‍ය සටහන් අන්තර්ගත කර ගැනීමේ කාර්යය සඳහා මැනුම්පති වෙත යැවිය යුතුය.

20.15. නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කිරීම සඳහා ගම වසා දැමීම (නියෝග අංක 291)

නිරවුල් කිරීම සඳහා ගම වසා දැමීමට ප්‍රථම නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඒ බව දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්ට හා සර්වේයර් ජනරාල් වෙත දැන්විය යුතුය. යම්කිසි ගමක් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතට පත්ව ඇති විට එම දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පිට මිස මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් එය පිහිටි ඉඩම මැනිය යුතු නොවේ. එසේම නිරවුල් කිරීමේ නිලධාරිගේ අනුමැතියෙන් තොරව එබදු ගමක් තුල පිහිටා ඇති කිසිදු රජයේ ඉඩමක් විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම නොකළ යුතුය. එබදු ගම් "වසන ලද ගම්" වශයෙන් හඳුන්වනු ලැබේ.

කිසියම් "වසන ලද ගමක" නිරවුල් කිරීම අවසන් කළ ඉක්බිති ඒ බව හා එම ගම නිරවුල් කරන ලද බව නිරවුල් කිරීමේ නිලධාරි විසින් සර්වේයර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවිය යුතුය.

[රජයේ ඉඩම් (හිමිකම් දීමනා) ආඥාපනත]

20.16. රජයේ ඉඩම් (හිමිකම් දීමනා) ආඥාපනත (1931 අංක 21)

රජයේ ඉඩම් බැහැර කිරීමේ දී හිමිකම් දීමනා සඳහා අයදුම්පත් සම්බන්ධයෙන් සලකා බැලීමට හා තීරණ ගැනීමට අදාළ විධිවිධාන සැලැස්ම පිණිස වූ ආඥාපනතකි.

[රජයේ මායිම් ගල් ආඥාපනත]

20.17. රජයේ මායිම්ගල් ආඥාපනත. (1909 අංක 7)

රජය විසින් බෙදා දෙන ලද ඉඩම් වල මායිම් අර්ථ නිරූපණය කිරීම සඳහා අවශ්‍ය ස්ථීර මායිම්ගල් ස්ථාපනය සහ නඩත්තු කිරීමට අදාළ විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආඥාපනතකි.

රජයේ මායිම්ගල් හොඳ තත්ත්වයේ තබා ගැනීම සහ එම මායිම්ගල් සම්බන්ධ කර අර්ථ දක්වා ඇති මායිම් ආවරනය නොවන පරිදි වගාවන් පවත්වා ගෙන යාම ඉඩම් හිමිකරුගේ වගකීමක් බව පනතේ සඳහන් වේ.

මායිම්ගලක් පිහිටුවා ඇති ස්ථානයක් සම්බන්ධයෙන් කිසියම් ආරවුලක් පැන නගිනු ලැබුවහොත්, එය නැවත මැන ස්ථාපනය කිරීම සර්වේයර් ජනරාල් විසින් සිදු කළ යුතුය. එම මැනුම සඳහා වියදම ඉඩම් හිමියා විසින් දරනු ලැබිය යුතුය.

[ඉඩම් සංවර්ධන ආඥාපනත]

20.18. ඉඩම් සංවර්ධන ආඥාපනත (1935 අංක 19, 1946 අංක 3, 1953 අංක 49, 1955 අංක 22, 1969 අංක 16, 1971 අංක 21, 1973 අංක 43)

රජයේ ඉඩම් වල ක්‍රමවත් සංවර්ධනය හා ඒවා ක්‍රමානුකූලව බෙදා දීමට අදාළ විධිවිධාන සැලැස්වීම මෙම පනතේ අරමුණ වේ.

20.19. ඉඩම් නියෝග 4

මෙම ආඥා පනත ක්‍රියාත්මක වීමට පෙර ගම් බොහෝ ගණනක් මැන පිඹුරු සකස් කිරීමේ කටයුතු අවසන් කරනු ලැබ, ඉඩම් කොමසාරිස් ජනරාල් ගේ අනුමැතියෙන් පසුව සර්වේයර් ජනරාල් විසින්

වාර්තා ගත කර ඇත. එවැනි ගමක මැන පිඹුරු සකස් කිරීමේ තීරණයක් වෙනස් කළ යුතු යැයි හැඟී ගියහොත් එම ගම මුළුමනින්ම ගෙන නැවත සලකා බලා මෙම පනතේ ඉඩම් නියෝග 4 යටතේ දක්වා ඇති ක්‍රියා මාර්ග අනුගමනය කරමින්, ආඥාපනතේ විධි විධාන යටතේ ඉඩම් මැන පිඹුරු සැකසීම සඳහා කටයුතු ආරම්භ කළ යුතුය. මෙම ආඥාපනතේ 8 වන වගන්තිය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

කිසියම් කාර්යයක් සඳහා මැන සැලසුම් කර නැති ඉඩමක් ආඥාපනත යටතේ කිසියම් කෙනෙකුට අන්සතු කර තිබේ නම්, එම අන් සතු කර තිබීම නිසාම එම ඉඩම් එසේ අන් සතු කරනු ලැබ ඇති තැනැත්තා අයත් පන්තියේ අයට දීම සඳහා නීති ප්‍රකාර මැන සැළසුම් කරනු ලැබ ඇති සේ සැළකිය යුතුය. මුඩු බිම් ආඥාපනත යටතේ හෝ ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ රජයේ ඉඩම් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥාපනත යටතේ අත්පත් කරගෙන ඇති ඉඩම්ද ආඥාපනත යටතේ මැන සැළසුම් කර ඇති කල්හි එම ඉඩම්වලට ආඥාපනතේ 168 වැනි වගන්තියෙන් විශේෂ ආරක්ෂාව සලසා ඇත. මෙහිදී 168 වැනි වගන්තිය යටතේ කටයුතු කරනු වෙනුවට 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතේ විධිවිධාන යටතේ කටයුතු කිරීම වඩාත් උචිත බව සැලකිය යුතුය.

20.20. රජයේ ඉඩම් වෙන් කර ලකුණු කරනු ලැබිය හැකි කාර්යයන්

ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව , දිස්ත්‍රික් ලේකම්වරයා විසින් රජයේ ඉඩම්, පහත දැක්වෙන කාර්යයන් අතුරින් කිසිවක් හෝ වැඩි ගණනක් හෝ සඳහා වෙන් කර ලකුණු කරනු ලැබිය හැකිය.

(අ) ගම් පුළුල් කිරීම

(ආ) ගම්බද කැලෑ

(ඇ) ගම් තණබිම්

(ඈ) මෙහි සඳහන් කර නොමැති ගම් කාර්යයන්

(ඉ) නැවත ජනාවාස කිරීම්

(ඊ) දිය උල්පත් ජල මාර්ග ආරක්ෂා කිරීම

(උ) පස සේදී යාම වැලැක්වීම

(ඌ) රක්ෂිත කැලෑව

(එ) රජයේ ගොඩනැගිලි, පාරවල් හෝ වැඩ ඇතුළත් රජයේ කාර්යයන්

(ඒ) දේශගුණික හා වෙනත් පරිසර විද්‍යාත්මක කාර්යයන් සඳහා සහ පාරිසරික ආරක්ෂාව සඳහා රක්ෂිත ප්‍රදේශ

(ඔ) පුරා විද්‍යාත්මක සහ ඓතිහාසික වැදගත්කමක් ඇති දේවල් ආරක්ෂා කිරීම

(ඕ) පළාත් පාලන ආයතනවල අවශ්‍යතා

(ක) නගර සංවර්ධනය කිරීම

(ග) ඇතැම් පන්තිවල තැනැත්තනට බිම් සතු කිරීම

(ව) ප්‍රදේශයේ ආරක්ෂාව, සංරක්ෂණය සහ සංවර්ධනය පිළිබඳ සැළකිලිමත්ව, නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්යයක්

20.21. රජයේ ඉඩම් අන්සතු කිරීම

මෙම ආඥාපනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තෙකුට රජයේ ඉඩම් අන්සතු කිරීමේදී එම ඉඩම සර්වේයර් ජනරාල්වරයා විසින් මනිනු ලැබීමට සැලැස්විය යුතු අතර , එසේ මනින ලද ඉඩමේ (ඉම්

සහ මායිම් වලට යොමු කිරීමෙන්) ප්‍රමාණය සහ විස්තරය ඒ අවසර පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුතුය. දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් , ඒ ප්‍රමාණයට සහ විස්තරයට අදාළ තොරතුරු අවසර පත්‍රයෙහි ඇතුලත් කිරීමෙන් පසු, ඒ අවසර පත්‍රය ලියාපදිංචි කිරීමට සැලැස්විය යුතුය.

20.22. දීමනා පත්‍රයට රේඛා සටහනක් ඇමිණිය යුතු බව

කිසියම් දීමනා පත්‍රයක් පිට අන්සතු කරන ලද ඉඩමක් සර්වේයර් ජනරාල් විසින් හෝ ඔහුගේ විධානය පිට සම්පාදනය කරනු ලබන සේ ඔහු භාරයේ තිබෙන සිතියමක් ආශ්‍රයෙන් විස්තර කළ යුතුය. එම දීමනා පත්‍රය පිට පවරන ලද ඉඩමේ රේඛා සටහනක් ඒ දීමනා පත්‍රයට ඇමිණිය යුතුය. මෙම සටහන සර්වේයර් ජනරාල්ගේ විධානය පිට සම්පාදනය කළ යුතුය. එහෙත් එය එසේ සම්පාදනය කළ බවට සහතිකයක් එම රේඛා සටහනේ ලියා දැක්වීම අවශ්‍ය නොවේ.

20.23. නියමිත ගාස්තුව ගෙවූ විට පිඹුරේ පිටපතත් සැපයිය යුතු බව

ඕනෑම පිඹුරක හෝ එහි කොටසක පිටපතක් ඉල්ලුම්කර නියමිත මුදල ගෙවන ඕනෑම කෙනෙකුට සර්වේයර් ජනරාල් විසින් එය නිකුත් කරවනු ලැබිය යුතුය.

රජයේ ඉඩම් ආඥාපනත

20.24. රජයේ ඉඩම් ආඥාපනත (1947 අංක 8, 9 සහ 1949 අංක 13 දරණ පනත)

ශ්‍රී ලංකාවේ පිහිටි රාජ සන්තක ඉඩම් ප්‍රදානය කිරීම හා පවරාදීම සඳහාත්, එබඳු ඉඩම් හා මුහුදු වෙරළ පාලනය කිරීම හා පරිපාලනය කිරීම සඳහාත්, විල් වල හා පොදු දොළ වල ජලය භාවිතා කිරීම විධිමත් කිරීම සඳහාත්, ඉහත කී කරුණු වලට ආගන්තුක වූ හෝ ඒ හා සම්බන්ධ වූ වෙනත් කරුණු සඳහාත්, විධිවිධාන යොදනු පිණිස පනවන ලද ආඥාපනතකි.

20.25. රාජසන්තක ඉඩම් ප්‍රදානය, බදු දීම හා අන් අයුරකින් පවරා දීම

මෙම ආඥපනතේ විධිවිධානවලටත් ඒ යටතේ සම්පාදිත නියෝගවලටත් යටත්ව, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය වෙනුවෙන්-

(1) රාජ සන්තක ඉඩම් නියත වශයෙන් හෝ තාවකාලික වශයෙන් ප්‍රදානය කිරීමටත්;
(2) රාජ සන්තක ඉඩම් විකිණීමට, බදු දීමට හෝ වෙනත් අයුරකින් පවරා දීමටත්;
(3) රාජ සන්තක ඉඩම් විකිණීම, බදු දීම හෝ වෙනත් අයුරකින් පවරාදීම සඳහා ගිවිසුම්වලට බැඳීමටත්;
(4) රාජ සන්තක ඉඩම්වල පදිංචිවීම සඳහා අවසර පත්‍ර ප්‍රදානය කිරීමටත්;
(5) රාජ සන්තක ඉඩමක තිබී සම්භවන කිසියම් ද්‍රව්‍යයක් හෝ දෙයක් ලබා ගැනීමට බලපත්‍ර ප්‍රදානය කිරීමටත්;
(6) පතල් කර්මාන්තයේ සම්පූර්ණ අයිතිය රජය කෙරෙහි තබාගෙන, රජයේ කිසියම් ඉඩමක හෝ රජය පවරා දී ඇති කිසියම් ඉඩමක පතල් ගැරීමේ හෝ මැණික් ගැරීමේ අයිතිය විකිණීමට හෝ බදු දීමටත්;

ජනාධිපතිවරයාට පිළිවන.

20.26. ප්‍රදානයකට හෝ දීර්ඝ කාලීන බද්දකට ප්‍රථම ඉඩම මැනිය යුතු බව

ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිද්දෙන් ඉඩම මැන මායිම් ලකුණු නොකර හා කරන තුරු රජයේ ප්‍රදානයක් හා නියම කළ හැකි අන්දමේ කාල සීමාවකට වඩා දීර්ඝ වූ කවර

කාලසීමාවකට හෝ රාජසන්තක ඉඩමක් බද්දට පවරා දෙන නීත්‍යානුකූල ලේඛනයක්ද මෙම ආඥාපනත යටතේ නිකුත් නොකළ යුතුය. (වගන්තිය 9)

[විහාර ඉඩම් (වන්දි) ආඥාපනත]

20.27. විහාර ඉඩම් (වන්දි) ආඥාපනත (1949 අංක 28, 1950 අංක 09)

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ විහාර ඉඩම් වලට අදාළ වන්දි මුදල් භාරකාර මණ්ඩලය වෙත ගෙවීමට ද යම් නිශ්චිත අවශ්‍යතාවකට එවැනි මුදල් සඳහා අයදුම් කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කාරණා සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආඥාපනතකි.

[ඉඩම් අත්කර ගැනීමේ පනත]

20.28. ඉඩම් අත්කර ගැනීමේ පනත (1950 අංක 9, 1954 අංක 39, 1955 අංක 22, 1964 අංක 28, 1969 අංක 20, 1971 අංක 48, 1979 අංක 8)

පොදු කාර්යයන් සඳහා ඉඩම් සහ පරවශ්‍යතා අත්කර ගැනීමට විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ විධි විධාන වලට සම්බන්ධ හෝ අනුෂංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම පිණිසද වූ පනතකි.

20.29. පොදු කාර්යන් සඳහා ඉඩමක් තෝරා ගැනීම පිළිබඳ විමර්ශනය
ප්‍රාථමික විමර්ශනය සහ යෝජිත අත්කර ගැනීම ප්‍රකාශ කිරීම.

(01) යම් ප්‍රදේශයක ඉඩමක් පොදු කාර්යයන් සඳහා අවශ්‍ය බව ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දෙවැනි උප වගන්තියට අනුකූල දැන්වීමක් ඒ ප්‍රදේශයේ සමහර ප්‍රකට ස්ථාන වල ප්‍රදර්ශනය කරන ලෙස ඒ ප්‍රදේශයට අයත් දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධාරියාට නියම කිරීම ඇමතිවරයා විසින් කළ හැකිය.

(02) ඉහත 1 වන උප වගන්තියෙහි සඳහන් දැන්වීම සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන භාෂා වලින් විය යුතු අතර, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශයේ පිහිටි ඉඩම පොදු කාර්යයක් සඳහා අවශ්‍ය බවද, ඒ පොදු කාර්යය සඳහා ඒ ඉඩමෙහි සුදුසුකම විමර්ශනය කිරීම සඳහා ඒ ප්‍රදේශයේ යම් ඉඩමකදී පහත 3 වන උපවගන්තියෙන් බලය පැවරුණු සියළු ක්‍රියා හෝ ඉන් යම් ක්‍රියාවක් කළ හැකි බවද ඒ දැන්වීමෙන් ප්‍රකාශ විය යුතුය.

(03) ඉහත 2 වන උප වගන්තිය යටතේ වූ දැන්වීමක් යම් ප්‍රදේශයක පළමු වන වරට ප්‍රදර්ශනය කිරීමෙන් පසු, ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීමට සැළැස්වූ අත්කර ගැනීමේ නිලධාරියා විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු හෝ ඉහත කී ලෙස බලය පවරනු ලැබූ නිලධාරියාගේ ලිඛිත නියමය යටතේ ක්‍රියාකරන යම් නිලධාරියෙකු විසින් අවශ්‍ය විය හැකි තැනැත්තන්, උපකරණ, ද්‍රව්‍ය , වාහන හා සතුන් ද සමඟ එම ප්‍රදේශයේ යම් ඉඩමකට ඇතුල් වී පහත සඳහන් ක්‍රියා කළ හැකිය.

- ඒ ඉඩම මැන එහි මට්ටම් ගැනීම
- ඒ ඉඩමෙහි යටි පස තෙක් හැරීම හෝ කැණීම
- ඒ ඉඩමෙහි මායිම් සහ ඉඩමෙහි කිරීමට යෝජිත යම් වැඩක රේඛා දැක්වීම
- ලකුණු තැබීමෙන් හෝ කාණු කැපීමෙන් ඒ මට්ටම් , මායිම් සහ රේඛා ලකුණු කිරීම
- ඒ ඉඩමෙහි තිබෙන වගාවක, වැටක හෝ කැළෑවක කොටසක් කපා එළි කිරීමෙන් හැර අන් ලෙසකින් ඒ ඉඩම මැනීම සම්පූර්ණ කිරීම, ඒ මට්ටම් ගැනීම සහ ඒ මායිම්

සහ රේඛා ලකුණු කිරීම කළ නොහැකි නම්, ඒ වගාවේ වැටේ හෝ කැලෑවේ ඒ කොටස කපා එළි කිරීම

- ඒ ප්‍රදේශයේ ඉඩමක් වුවමනා වූ පොදු කාර්යය සඳහා ඒ ඉඩම සුදුසු දැයි නිශ්චිත වශයෙන් දැන ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියළු ක්‍රියා කිරීම

එසේ වුවද, මේ උපවගන්තියෙහි පෙරාතුව වූ විධිවිධාන මඟින් තමා වෙත පැවරුණු බලතල ක්‍රියාවෙහි යෙදවීමෙහිදී කිසිම නිලධාරියෙකු විසින් ගොඩනැගිල්ලේ පදිංචිකරු වෙත අඩු වශයෙන් දින හතක ලිඛිත දැන්වීමක් දී තිබේ නම් මිස, පදිංචියට ගනු ලැබූ යම් ගොඩනැගිල්ලකට හෝ එයට සම්බන්ධ ආවරණය කළ මිදුලකට හෝ ගෙවත්තකට ඇතුළු නොවිය යුතුය.

20.30. පොදු කාර්යයන් සඳහා ඉඩමක් හෝ පරවශ්‍යතාවක් වුවමනා බවට වූ ප්‍රකාශය

(01) කිසියම් ඉඩමක් හෝ පරවශ්‍යතාවක් මේ පනත යටතේ අත්කර ගත යුතු යැයි 4 වන වගන්තියේ 5 වන උප වගන්තිය යටතේ ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ඒ ඉඩම හෝ පරවශ්‍යතාව පොදු කාර්යයන් සඳහා අවශ්‍ය බවට සහ මේ පනත යටතේ එය අත්කර ගන්නා බවට වූ ලිඛිත ප්‍රකාශයක් ඔහු විසින් කළ යුතු අතර, ඒ ප්‍රකාශය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන භාෂා වලින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරවන ලෙසද ඒ ඉඩමේ හෝ ඒ අසල ප්‍රකට ස්ථාන වල ප්‍රදර්ශනය කරවන ලෙසද අත්කර ගනු ලබන ඉඩම හෝ අත්කර ගනු ලබන පරවශ්‍යතාවට සම්බන්ධ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධාරියාට ඇමතිවරයා විසින් නියම කළ යුතුය.

(02) යම් ඉඩමක් හෝ පරවශ්‍යතාවක් සම්බන්ධයෙන් ඉහත 1 වන උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයක් ඒ ඉඩම හෝ පරවශ්‍යතාව පොදු කාර්යයන් සඳහා වුවමනා බවට තීරණාත්මක සාක්ෂ්‍යය විය යුතුය.

(03) ඉහත 1වන උප වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයන් ප්‍රසිද්ධ කිරීම ඒ ප්‍රකාශය යථා පරිදි කළ බවට තීරණාත්මක සාක්ෂ්‍යය විය යුතුය.

20.31. ඉඩම මැනීම සහ එම ඉඩමෙහි පිඹුර

යම් ඉඩමක් පොදු කාර්යයන් සඳහා අවශ්‍ය වූ බවට ප්‍රකාශයන් 5 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ විට මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඒ ඉඩමට පිඹුරක් සාදා නොමැති නම් හෝ මේ පනත යටතේ වූ නීති කෘත්‍යවල කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීම සඳහා සුදුසු එවැනි පිඹුරක් නොමැති නම් ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධාරියා විසින් ඒ දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයෙකු ලවා හෝ සර්වේයර් ජනරාල්ගේ විධාන යටතේ ක්‍රියාකරන බලයලත් මිනින්දෝරුවරයෙකු ලවා ඒ ඉඩම මැන එහි පිඹුරක් සැදීමට සැලැස්විය යුතුය.

20.32. ඉඩමක සන්තකය භාර ගැනීම හෝ ඉඩමක් පරවශ්‍යතාවකට යටත් කිරීම සඳහා වූ ආඥාව

17 වැනි වගන්තිය යටතේ තීරණයක් කිරීමෙන් පසු යම් අවස්ථාවක ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන ආඥාවකින්,

- ඒ තීරණය යම් ඉඩමක් අත්කර ගැනීමට අදාළ වන විට, ඒ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයෙහි අත්කර ගැනීමේ නිලධාරියාට හෝ අත්කර ගැනීමේ නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකුට රජය වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය භාර ගන්නා ලෙස නියම කළ හැකිය. නැතහොත්

- ඒ තීරණය යම් පරවශ්‍යතාවක් අත්කර ගැනීමට අදාළ වන විට, ඒ පරවශ්‍යතාව අත්කර ගැනීමට නියමිතව ඇත්තේ යම් ඉඩමකින් ද ඒ ඉඩම ඒ පරවශ්‍යතාවට යටත් විය යුතුයැයි ප්‍රකාශ කළ හැකිය.

එසේ වුවද,

- 2 වැනි වගන්තිය යටතේ දැන්වීමක් ඒ ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි පළමු වරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක හෝ 4 වැනි වගන්තිය යටතේ දැන්වීමක් ඒ ඉඩමෙහි හෝ ඒ අසල පළමු වරට ප්‍රදර්ශනය කිරීමෙන් පසු යම් අවස්ථාවක යම් අත්‍යාවශ්‍යතාවක් හේතු කොට ගෙන යම් ඉඩමක සන්තකය වහාම භාර ගැනීමට අවශ්‍ය වන විට සහ

- ඒ පරවශ්‍යතාව අත්කර ගැනීමට නියමිතව ඇත්තේ යම් ඉඩමකින්ද ඉඩමෙහි හෝ එය අසල 4 වන වගන්තිය යටතේ දැන්වීමක් පළමු වරට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක යම් අත්‍යවශ්‍යතාවක් හේතු කොට ගෙන යම් පරවශ්‍යතාවක් වහාම අත්කර ගැනීමට අවශ්‍ය වන විට

මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ ඇමතිවරයා විසින් ආඥාවක් කළ හැකිය.

[නින්දගම් ඉඩම් පනත]

20.33. නින්දගම් ඉඩම් පනත (1968 අංක 30)

හිමිකරුවන් විසින් නින්දගම් ඉඩම් වලට අදාළ කුලී හා බදු කරුවන්ගේ සේවාවන් නැවැත්වීම, මෙවැනි කුලී හා බදු කරුවන් එවැනි ඉඩම් වල නියම අයිතිකරුවන් කිරීම, එවැනි අයිතීන් ලියාපදිංචි කිරීම හා ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම

[ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය]

20.34. ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය (1972 අංක1 , 1975 අංක 39)

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම පිහිටුවීම, කෘෂිකාර්මික ඉඩම් සීමා කිරීම, එම සීමාවට වැඩි ඉඩම් කොමිසමට පවරා ගැනීම, කෘෂිකාර්මික ඉඩම් සංවර්ධනය කර ඵලදාව වැඩි කිරීම, රැකියා සැපයීම, මෙම නීතිය මඟින් ඉඩම් අහිමිවූවන්ට වන්දී ගෙවීම හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කාරණා සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආඥාපනතකි.

[රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත]

20.35. රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත (1979 අංක 07)

අනවසරයෙන් රජයේ ඉඩම් වල සන්තක දරන හෝ පදිංචිව සිටින තැනැත්තන්ගෙන් ඒවායේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා ද ඒ හා සම්බන්ධ වූ කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආඥාපනතකි.

ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත

20.36. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත - (1979 අංක 43)

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරන ලද කෘෂිකාර්මික හෝ වතු ඉඩම් රජය සතු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද එසේ රජය සතු කරන ලද ඉඩම් අය කිරීමකින් තොරව ඉඩම් නොමැති තැනැත්තන් වෙත පැවරීමට හැකිවනු සඳහාද ඊට සම්බන්ධ හෝ අනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

20.37. ජනාධිපතිවරයාට මෙම පනත යටතේ රජය සතු ඉඩම් කිසිදු අයකිරීමකින් තොරව පැවරිය හැකි බව

දෙවැනි වගන්තිය යටතේ කරනු ලබන නියමයන් ප්‍රකාර රජය සතු කරන ලද යම් ඉඩමක කොටසක් මෙහි උප ලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ නියාදන සාධන පත්‍රයක් මඟින්, වයස අවු.18 කට වැඩි ශ්‍රී ලංකාවේ කිසියම් පුරවැසියෙකුට කිසිම අයකිරීමක් නොමැතිව ජනාධිපතිවරයා විසින් පවරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ රජයේ කිසියම් ඉඩමක් පැවරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි ජනාධිපතිවරයා සැලකිලිමත් විය යුතුය.

- ශක්‍ය පැවරුම්ලාභියාට ඉඩම් කිසිවක් අයිතිව නොතිබීම
- ශක්‍ය පැවරුම්ලාභියාගේ පවුලේ ආදායම් මට්ටම
- ඒ ඉඩම සංවර්ධනය කිරීමෙහි ලා ශක්‍ය පැවරුම්ලාභියාගේ හැකියාව

20.38. පැවරීමට පෙර ඉඩම මැනීම් කළ යුතු බව

රජයේ කිසිම ඉඩමක් ඒ ඉඩම, ඉඩම් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන පරිදි මැන මායිම් ලකුණු කරනු ලැබීමෙන් පසුව මිස, තුන් වන වගන්තිය යටතේ පැවරීම නොකළ යුතුය.

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

20.39. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (1998 අංක 21)

ඉඩම් කොටසක් පිළිබඳව හිමිකම් විමර්ශනය කිරීමේ හා ලියාපදිංචි කිරීම සඳහා ද එසේ ලියාපදිංචි කරන ලද ඉඩම් කොටස් වලට අදාළ ගණුදෙනු විධිමත් කිරීම සඳහාද ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කාරණා සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

20.40. කැඩැස්තර සිතියම් සකස් කිරීම

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 1 වන වගන්තිය යටතේ නියමයන් පළ කිරීමෙන් පසු, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය සඳහා කැඩැස්තර සිතියම් සකස් කරන ලෙස, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් සර්වේයර් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිය යුතු අතර, ඒ ඉල්ලීම කිරීමෙන් පසු, සර්වේයර් ජනරාල් විසින් ඒ කැඩැස්තර සිතියම් පිළියෙල කරනු ලැබීමට සැලැස්විය යුතුය. තවද ඒවායේ සහතික පිටපත් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරනු ලැබීමට සැලැස්විය යුතුය.

මැනුම් පනත

20.41. මැනුම් පනත (2002 අංක 17)

සර්වේයර් ජනරාල්වරයාට අදාළ බලතල හා කාර්යය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉඩම් මැනීම විධිමත් කිරීම සඳහාද, මිනින්දෝරුවරුන්ගේ වෘත්තීයමය ක්‍රියා පැවැත්ම විධිමත් කිරීම අරභයා ඉඩම් මැනුම් සභාවක් පිහිටුවීම සඳහා ද, ඉඩම් මැනුම් ආඥාපනත සහ මිනින්දෝරු ආඥාපනත ඉවත් කිරීම සඳහාද, ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සඳහාද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

20.42. සර්වේයර් ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍යයන්

(අ) ශ්‍රී ලංකාවේ සියළුම ඉඩම් මැනුම් කටයුතු විධිමත් කිරීම

(ආ) ජාතික භූමිතික පාලන ජාලය පිහිටු වීම සහ පරිපාලනය කිරීම.

(ඇ) කැඩැස්තර, භූමිතික සහ භූලක්ෂණ මැනුම් වල නිරවද්‍යතාවය සඳහා ප්‍රමිති නිශ්චිතව සඳහන් කිරීම.

(ඈ) සිතියම් සකස් කිරීම සඳහා ප්‍රමිති නියම කිරීම.

(ඉ) 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ මැනුම් කටයුතු කිරීමට බලාපොරොත්තු වන ලියාපදිංචි මිනින්දෝරුවන් සඳහා ප්‍රතිපත්ති ක්‍රමයක් පිහිටුවීම හා පරිපාලනය කිරීම සහ ප්‍රතිපත්ති සහතික නිකුත් කරනු ලැබූ මිනින්දෝරුවරුන්ගේ ලේඛනයක් පවත්වාගෙන යාම.

(ඊ) මැනුම්පටි, ඉලෙක්ට්‍රොනික දුර මැනීමේ උපකරණ, වර්තමානයේ භාවිත වන GPS හා ඉදිරියේදී ඒමට නියමිත නව උපකරණ වල අංක ශෝධනය කිරීම සඳහා පාදක රේඛා පිහිටුවීම හා සියළුම මිනින්දෝරුවරුන්ට ඒවා ලබා දීම.

(උ) කැඩැස්තර සිතියම් හා පිඹුරු පිළියෙල කිරීමට පහසුවන පරිදි සහ ඉඩම් තොරතුරු ඒකරාශී කිරීම සඳහා ආධාර කර ගත හැකි පරිපූර්ණ පාදකයක් වන පරිදි, කැඩැස්තර මැනුම් වාර්තා ලබා ගැනීම, අනුමත කිරීම සහ පවත්වාගෙන යාම.

(ඌ) භූ ලක්ෂණ, තේමා සහ විශේෂ කාර්යන් සඳහා වූ සිතියම් නිෂ්පාදනය කිරීම සහ අදාළ ලේඛන පවත්වාගෙන යාම.

(එ) මැනීම හා සිතියම්ගත කිරීම භූගෝලීය පදනමක් මත වූ තොරතුරු සහ ඉඩම් තොරතුරු පද්ධතිය සඳහා වූ අවශ්‍යතා සමඟ අදාළ ඉඩම් තොරතුරු ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීමේ කාර්යන් සඳහා වූ සියළු දත්ත ලබා ගැනීම, රැස්කිරීම සහ යම් අයුරකින් හුවමාරු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු ප්‍රධාන බලධාරියා වීම.

(ඒ) ඉඩම් මැනීම, ඉඩම් තොරතුරු සැපයීම හා ඊට අදාළ සේවා සැපයීම.

(ඔ) භූලක්ෂණ, කැඩැස්තර හා ව්‍යුත්පන්න සිතියම්, දුරස්ථ ග්‍රහණ දත්ත, ගුවන් ඡායා රූප හා වෙනත් මැනුම් සහ සිතියම්කරණය පිළිබඳ ලේඛන ලබා ගැනීම, ගබඩා කිරීම, ප්‍රතිනිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම.

(ඕ) උචිත අවස්ථා වලදී , දෙපාර්තුමේන්තුව විසින් ලේඛන ගත කළ මැනුම් සහ ඉඩම් තොරතුරු භාවිතා කිරීම හෝ ප්‍රතිනිශ්පාදනය සඳහා බලය දීම සහ ඒ තොරතුරු භාවිතා කිරීම හෝ ප්‍රතිනිශ්පාදනය සඳහා ගාස්තුවක් අය කිරීම.

(ක) ඉඩම් මැනීම, සිතියම්කරණය සහ ඉඩම් තොරතුරු සඳහා වූ තාක්ෂණය හුවමාරු කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී විදේශීය නියෝජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(ග) ඉඩම් මැනීම, සිතියම්කරණය සහ ඉඩම් තොරතුරු ක්‍රියාකාරකම් හා අදාළ කරුණු පිළිබඳව එසේ දෙනු ලැබූ උපදෙස් වෙනුවෙන් ඒ සංස්ථාවෙන් හෝ ඒ ආයතනයෙන් ගාස්තුවක් අයකිරීම.

(ව) ඉඩම් මැනීමට අදාළ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි පර්යේෂණ පැවැත්වීම.

(ජ) යම් ලියාපදිංචි මිනින්දෝරුවකුගේ ප්‍රයෝජනය සඳහා මිනින්දෝරුවරයකුගේ ක්ෂේත්‍ර සටහන් භාවිතා කරමින් පිඹුරු සකස් කිරීමට සහ පිඹුරු වල වර්ග ප්‍රමාණය ගණනය කිරීමට ප්‍රවීනත්වයක් ඇති යම් තැනැත්තෙකුට එම ප්‍රවීනත්වය පිළිබඳ විභාග පවත්වා තමා සෑහීමකට පත්වීමෙන් පසුව සැළසුම් කරුවෙකු ලෙස ක්‍රියා කිරීමට බලය දෙන සහතික නිකුත් කිරීම.

(ට) දෙපාර්තමේන්තුව තුල ඉඩම් මැනිම පිළිබඳ ක්‍රියාකාරකම් වල යෙදී සිටින තැනැත්තන් අතර උසස් වෘත්තීයමය ප්‍රමිතීන් පවත්වාගෙන යාමට වග බලා ගැනීම.

20.43. සර්වේයර් ජනරාල්වරයා හෝ බලයදෙන ලද වෙනත් අය විසින් ඔප්පු ඉදිරිපත් කරන ලෙස බලකර සිටිය හැකි බව

14 වන වගන්තිය යටතේ ඉල්ලා සිටිනු ලැබූ ඔප්පුවක්, ලේඛනයක් හෝ වෙනත් සාධන පත්‍රයක් ඒ ඔප්පුව, ලේඛනය හෝ සාධන පත්‍රය, අදාළ වන පරිශ්‍රයේ දී හෝ ඒ ඉල්ලීම කරන තැනැත්තා විසින් නියම කරනු ලබන වෙනත් යම් ස්ථානයකදී හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර 14 වැනි වගන්තිය යටතේ ඒවා ඉදිරිපත් කරන ලෙස කරනු ලබන ඉල්ලීමේ බලයට අවශ්‍ය වන පරිදි ඉඩම් මැනීමේ කාර්ය සඳහා ඒ ඔප්පු, ලේඛන හෝ වෙනත් සාධන පත්‍ර පරීක්ෂා කිරීමේ බලයද ඇතුලත් වන ලෙස සලකනු ලැබිය යුතුය. තවද මේ පනත යටතේ 14 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකුට එවැනි යම් ඔප්පුවක්, ලේඛනයක් හෝ වෙනත් සාධන පත්‍රයක් හේතුවක් නැතිව පරීක්ෂා කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ඔහු/ ඇය යටත් විය යුතුය.

20.44. සර්වේයර් ජනරාල් විසින් අත්සන් තබනු ලැබූ ඇතැම් පිඹුරු ඔප්පු කිරීම

මේ පනත හෝ යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනුකූලව සකස් කරනු ලැබූ, සර්වේයර් ජනරාල්වරයා හෝ ඔහු වෙනුවෙන් වැඩ බලන නිලධාරියෙකු විසින් අත්සන් තබන ලදැයි උද්දේශික හා යම් සිවිල් හමුවකදී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද යම් කැඩැස්තර සිතියමක් පිඹුරක් හෝ වෙනත් යම් පිඹුරක් හෝ සිතියමක් සාක්ෂි වශයෙන් භාරගත යුතු අතර, ඊට පටහැනිව සාක්ෂි ඉදිරිපත් කරන තුරු එම පිඹුර හෝ සිතියම ඇත්ත වශයෙන්ම සර්වේයර් ජනරාල්වරයා හෝ ඔහු වෙනුවෙන් වැඩ බලන යම් නිලධාරියෙකු විසින් ඇත්ත වශයෙන්ම අත්සන් තබා ඇති බවට හෝ සර්වේයර් ජනරාල්වරයාගේ අධිකාරිය යටතේ එය සකස් කරනු ලැබූ බව හෝ එම පිඹුරේ හෝ සිතියමේ නිරවද්‍යතාවය පිළිබඳව හෝ ඔප්පු කිරීම අනවශ්‍යවේ.

සාක්ෂි ආඥාපනත

20.45. සාක්ෂි ආඥාපනත (1895 අංක 14, 1904 අංක 15, 1925 අංක 16, 1927 අංක 25, 1928 අංක 18, 1946 අංක 1, 1961 අංක 3)

සාක්ෂි සම්බන්ධ නීතීන් වල අර්ථ දැක්වීම් හා සංශෝධනයන් තහවුරු කිරීම සඳහා මෙම ආඥාපනත යොදා ගැනේ. යුද්ධාධිකරණය, සමථ මණ්ඩල වැනි ඒවා හැර අනෙක් සියළුම උසාවි වල අධිකරණ ක්‍රියාවලියන් සඳහා මෙම ආඥාපනත බල පැවැත්වේ.

නාගරික සංවර්ධන අධිකාරී නීතිය

20.46. නාගරික සංවර්ධන අධිකාරී නීතිය (1978 අංක 41, 1979 අංක 70)

නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් යම් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කළ විට එම ප්‍රදේශයේ අනුකූලක සැලසුම් ප්‍රවර්ධනය කිරීමට ද ආර්ථික, සමාජීය හා භෞතික සංවර්ධන ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ද අවශ්‍ය නාගරික සංවර්ධන අධිකාරිය පිහිටු වීමට අදාළව ද හෝ ඊට අනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ නීතියකි.

නගර හා ග්‍රාම සැලසුම් ආඥාපනත

20.47. නගර හා ග්‍රාම සැලසුම් ආඥාපනත (1946 අංක 13, 1950 අංක 9, 1953 අංක 29, 1955 අංක 10, 1955 අංක 22)

ඉඩම් සැලසුම් කිරීම හා සංවර්ධනය මෙම ආඥාපනත හඳුන්වාදෙන ලදී. විවිධ ව්‍යාපෘති වලදී ස්වාභාවික සම්පත් හා ගොඩනැගිලි ආරක්ෂා කරගැනීම සඳහාද කරුණු මෙම පනත යටතේ ප්‍රකාශයට පත්කර ඇත.

සභාධිපත්‍ය හිමිකම් පනත

20.48. සභාධිපත්‍ය හිමිකම් පනත (සංශෝධිත) (2003 අංක 39)

1973 අංක 11 දරණ සභාධිපත්‍ය හිමිකම් නීතිය හා 1982 අංක 25 දරණ පනත වෙනුවට මෙම පනත බල පැවැත්වේ. සභාධිපත්‍ය දේපල වල නීත්‍යානුකූල අයිතිය ලියාපදිංචි කිරීමට සභාධිපත්‍ය දේපළ මැනුම් කිරීම සඳහා අදාළ විධිවිධාන මෙම පනත මඟින් සලස්වා ඇත.
සභාධිපත්‍ය දේපළ යනු විවිධ අවශ්‍යතා සඳහා ස්වාධීන ඒකක සහිත ගොඩනගන ලද මහල් ගොඩනැගිලි වල බදු අයිතීන් ඇතිවන අවස්ථා වේ.

18 වැනි පරිච්ඡේදයෙහි මේ පිළිබඳව වැඩි විස්තර සඳහන්ව ඇත.
පනත් පිළිබඳ වැඩි විස්තර සඳහා 18 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 01 බලන්න

ශුද්ධි පත්‍රය

21 වැනි පරිච්ඡේදය

කැඩැස්තර මැනුම්

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	කැඩැස්තර මැනුම් වලට අදාළ නිර්වචනයන්	
21.1.	මැනුම් පනතේ වන ඇතැම් නිර්වචනයන්	1
	ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය	
21.2.	ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් මැනුම් කිරීම	6
21.3.	හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව කටයුතු කිරීම	6
21.4.	ඉඩම් විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රදේශය තීරණය කර රජයේ ගැසට් පත්‍රයේ පල කිරීම	6
21.5.	කැඩැස්තර සිතියම් සකස් කිරීම හා නීතිමය අයිතිවාසිකම් පිළිබඳව තීරණය කිරීම	6
21.6.	හිමිකම් ලියාපදිංචි කිරීමේ ප්‍රධාන පියවරවල්	7
21.7.	අතිරේක මැනුම් කළ යුතු බව තීරණය වූ විට පනතේ 23 වගන්තිය අනුව, කැඩැස්තර සිතියම සංශෝධනය කිරීම	7
	මහජනයා දැනුවත් කිරීම සහ ඉඩම් කැබලි පිළිබඳ ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීම	
21.8.	මූලික දැනුවත් කිරීම	7
21.9.	හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් රැස් කළ මූලික තොරතුරු	7
	දළ සටහන් සකස් කිරීම සහ කාර්යාල කටයුතු	
21.10.	එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශය සඳහා කැඩැස්තර සිතියම් අංක යෙදීම	8
21.11.	ග්‍රාම නිලධාරි කොට්ඨාශය සඳහා කලාප සැලැස්මක් සකස් කිරීම	8
21.12.	2002 අංක 17 දරණ මැනුම් පනතේ 10(2) අ, ආ වගන්ති අනුව මැනුම් කටයුතුවල යෙදවීම	8
21.13.	මිනින්දෝරුවරයා විසින් පැහැදිලි පිරික්සුම් සටහනක් සකස් කිරීම	8
	ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීම	
21.14.	ආරවුල් සහිත ඉඩම් සඳහා ඒකාබද්ධ විමර්ශණයක් කිරීම	9
21.15.	ඉඩමට අදාළ ලේඛන පරීක්ෂා කිරීම සහ මායිම් සලකුණු කිරීම	9
21.16.	පොදු මායිමට එකඟ නොවන අවස්ථාවලදී කටයුතු කිරීම	9
21.17.	මායිම් සලකුණු කිරීම, මායිම් පෙන්වන ලද බවට සහ බලාගත් බවට අත්සන් සහ විස්තර ලබා ගැනීම	9
	මැනුම් කටයුතු	
21.18.	සියළුම කැඩැස්තර මැනුම් ජාතික මැනුම් පාලන පද්ධතියට (SLD 99) සම්බන්ධ කිරීම	10
21.19.	අයිතිවාසිකම් කියනු ලබන ආකාරයට මැනුම් කිරීම	10
21.20.	මායිම් ආරවුල් පවතින ඉඩම්වල මැනුම් කිරීම	10
21.21.	මායිම් පිළිබඳ ආරවුල් විසඳිය නොහැකි අවස්ථාවලදී ක්‍රියා කළ යුතු ආකාරය	10
21.22.	දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා ව්‍යවස්ථාපිත පිඹුරු සකස් කර ඇතිවිට සහ රාජ්‍ය ආයතන/ අර්ධ රාජ්‍ය ආයතන වලට ඉඩම් පැවරීම සඳහා පිඹුරු සකස් කර ඇතිවිට	10
21.23.	ක්ෂේත්‍ර පොත් භාවිතා කිරීම	10
21.24.	ක්ෂේත්‍ර මැනුම් හා සම්බන්ධ වන සියළු කටයුතු සඳහා අදාළ මිනින්දෝරුවරයා පෞද්ගලිකවම වගකිව යුතුබව	11
21.25.	රජයේ ඉඩම්, මාර්ග, වැව් ආදිය ඇතිවිට ක්‍රියාකළ යුතු ආකාරය	11

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
21.26.	එක් ඉඩම් කැබැල්ලක් ඔප්පු කිහිපයකින් ආවරණය වන අවස්ථාවලදී කටයුතු කිරීම	11
	පිඹුරු වැඩ	
21.27.	කැඩැස්තර සිතියමක් අංක කිරීම	11
21.28.	කලාපයක ඇති ඉඩම් කැබලි අංක කිරීම	12
21.29.	යාබද කලාප තුලට වැටෙන අඩිපාර, පාර සහ ජලමාර්ග වැනි පැරණි කැබලි වල ශේෂ කොටස් සඳහා කැබලි අංක කිරීම	12
21.30.	අ. භූ.පි. සහ භූ. මූ.ු පි. තුල කැඩැස්තර සිතියම් සකස් කිරීම	12
21.31.	කලාපය තුලට පැරණි පිඹුරු ඇතුලත් වන විට කටයුතු කිරීම	12
21.32.	කැඩැස්තර සිතියමක පරිමාණය	12
21.33.	බිම් ප්‍රමාණ ගණන් බැලීම	12
21.34.	කැඩැස්තර පිඹුරු හා ඉ.වි.ලැ. මුද්‍රණය කිරීම	12
	කැඩැස්තර සිතියම් සකස් කරන අවස්ථාවේ දී එම ප්‍රදේශය තුල සිදු කරනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත මැනුම්	
21.35.	වෙනත් ව්‍යවස්ථාපිත මැනුම් සිදු කිරීම	12
	පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු කැඩැස්තර සිතියම්වලට ඇතුලත් කිරීම	
21.36.	පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු නව කැඩැස්තර සිතියමට ඇතුලත් කිරීම	12
21.37.	පැරණි ව්‍යවස්ථාපිත පිඹුර මඟින් ආවරණය වන ප්‍රදේශය නව කැඩැස්තර සිතියමේ කලාපයක් හෝ පත්‍රයක් ලෙස තෝරා ගැනීම	13
21.38.	පරිවර්තිත කැඩැස්තර සිතියමේ කැබලි අංක ලබා දීම හා මුද්‍රාවක් තැබීම	13
21.39.	පරිවර්තිත කැඩැස්තර සිතියම් කැබලි අංක ලේඛනය	13
21.40.	පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු තුල අංක නොයෙදූ කැබලි ඇති විට	13
21.41.	පැරණි ව්‍යවස්ථාපිත පිඹුර මත භාග කැබලි අංක යොදා ඇති විට	14
21.42.	පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු තුල තනි රේඛාවකින් පෙන්වා ඇති ඇළක් හෝ අඩිපාරක් ඇති විට	14
21.43.	පිඹුරෙහි කොටසක් සඳහා පසුව මැනීමක් කර නව ව්‍යවස්ථාපිත පිඹුරක් පිළියෙල කර ඇතිවිට	14
21.44.	පැරණි ව්‍යවස්ථාපිත පිඹුර මඟින් ගම් කිහිපයක කොටස් ආවරණය වන විට	14
21.45.	පරිවර්තිත ව්‍යවස්ථාපිත පිඹුරුවල පිටපත් යැවීම	14
21.46.	ව්‍යස්ථාපිත පිඹුරු ප්‍රදේශ තුල පසුකාලීන මැනුම් කැඩැස්තර මැනුමක් ලෙස කළ යුතු බව	14
21.47.	සංශෝධන අනුරේඛනයේ ඇතුලත් විය යුතු කරුණු	14
21.48.	මායිම්ගල් දමා මැන දීමනා පත්‍ර නිකුත් කළ ඉඩම් ඇති විට	14
	කැඩැස්තර සිතියම් ප්‍රදේශ තුල අත්කර ගැනීමේ මැනුම්	
21.49.	ඉඩම් කැබැල්ලක් සම්පූර්ණයෙන්ම 38 (අ) අතුරු විධානය අනුව අත්කර ගෙන ඇති විට	15
21.50.	ඉඩම් කැබැල්ලක කොටසක් 38(අ) අතුරු විධානය අනුව අත්කර ගෙන ඇති විට	15
21.51.	ඉඩම් කැබැල්ලක් සම්පූර්ණයෙන්ම 2 වැනි වගන්තිය යටතේ අත්කර ගැනීමට නියමිත විට	15
21.52.	ඉඩම් කැබැල්ලක කොටසක් පමණක් 2 වැනි වගන්තිය යටතේ අත්කර ගැනීමට යෝජිත විට	15
21.53.	ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම	15
	කැඩැස්තර සිතියම් ප්‍රදේශ තුල සහාධිපත්‍ය දේපළ මැනුම්	
21.54.	සහාධිපත්‍ය දේපළක් කැඩැස්තර සිතියමකට ඇතුලත් වූ විට	15
21.55.	භූමියේ ඉදිකර නොමැති යෝජිත සහාධිපත්‍ය දේපළ සඳහා පිඹුරු පිළියෙල කිරීම	15
21.56.	සහාධිපත්‍ය කොටස් අංකනය කිරීම	15

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
21.57.	ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම	15
21.58.	පැරණි සභාධිපත්‍ය පිඹුරු ඇතිවිට කටයුතු කිරීම	16
21.59.	සභාධිපත්‍ය කැඩැස්තර පිඹුරු ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කළ යුතු බව	16
	කැඩැස්තර සිතියම්වල වැඩ අවසන් කිරීමේදී වැදගත් වන කරුණු	
21.60.	ජාතික සිතියම් යොමු අංකය යෙදීම	16
21.61.	ඛණ්ඩාංක අගයන් මුද්‍රණය කිරීම	16
21.62.	මැනුම් රේඛා සහ ග්‍රිඩ් රේඛා අංකිත පිටපතෙහි තිබිය යුතු බව	16
21.63.	යාබද ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල නම් සහ ක.සි.අංක මුද්‍රණය කිරීම	16
21.64.	මතුපිට පාලන ලක්ෂ්‍ය හා ඛණ්ඩාංක කැඩැස්තර සිතියමේ පෙන්වීම	16
21.65.	රජයේ දීමනා පත්‍ර අංක ඉඩම් විස්තර ලැයිස්තුවේ දැක්වීම	16
21.66.	කැඩැස්තර සිතියම් සියල්ල දැක්වෙන 1:10,000 සුචි සටහනක් පවත්වා ගෙන යාම	16
21.67.	සංශෝධන අනුරේඛනයක් සහ කලාප වට මායිමේ අංකිත පිටපතක් සකස් කළ යුතු බව	16
21.68.	මිනින්දෝරුවරයාගේ වාර්තාව	17
21.69.	හිමිකම් ලියාපදිංචි කළ හැකි සියළුම ඉඩම් කොටස් සඳහා යාබද විස්තර සහිතව කැඩැස්තර පිඹුරු සකස් කිරීම	17
21.70.	SRIMS දත්ත පද්ධතිය මඟින් සැකසෙන බිම්සවිය වාර්තා	17
	පැරණි ලේඛන සංශෝධනය කිරීම	
21.71.	අදාළ ප්‍රදේශයේ කැඩැස්තර සිතියම් සකස් කර අවසන් වූ පසු යොදන සටහන	17
21.72.	දම්වැල් 16 රේඛා චිත්‍ර හා සුචි පත්‍ර සංශෝධනය කිරීම	17
21.73.	ලේඛන සංශෝධනය සඳහා අනුරේඛන සකස් කිරීම	17
21.74.	හිමිකම් ගැසට් පත්‍රය අනුව ඉ.වි.ලැ. හි නම සංශෝධනය කිරීම	17
21.75.	නිකුත් කළ හිමිකම් සහතික අංක ඉ.වි.ලැ. හි ඇතුලත් කිරීම	18
	පිඹුරු පරීක්ෂා කිරීම හා අනුමත කිරීම	
21.76.	මි.අ. සහ ජ්‍යෙ.මි.අ. විසින් පිඹුරු පරීක්ෂා කිරීම සඳහා යොදා ගත යුතු පරීක්ෂණ ලැයිස්තුව	18
21.77.	අනුමත කරන ලද පිඹුරුවල පිටපත් යැවීම	18
	අංකිත පිටපත් ගොනු කිරීම	
21.78.	අංකිත පිටපත් ගොනු කළ යුතු ආකාරය	19
	මැනුම් ඉල්ලීම් ගොනුව හා අනෙකුත් ලේඛන	
21.79.	මැනුම් ඉල්ලීම් ගොනුවට ඇතුලත් කළ යුතු ලිපි ලේඛන	19
21.80.	දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගබඩා කළ යුතු ලේඛන	19
	කැඩැස්තර සිතියම් ප්‍රදේශයක සිදු කරනු ලබන පසුකාලීන මැනුම්	
21.81.	පසුකාලීන මැනුම් සිදු කළ හැකි නීතිමය පසුබිම	20
21.82.	නියමිත ආකෘති පත්‍ර භාවිතා කිරීම	20
21.83.	පසුකාලීන මැනුම් සිදු කරන අවස්ථා	20
21.84.	පසුකාලීන මැනුම් සඳහා උපදෙස්	20
21.85.	හිමිකම් සහතික නිකුත් කර ඇති ඉඩම්වල මැනුම්	20
21.86.	පළාත් පාලන ආයතනයේ කොන්දේසි වලට අනුකූල නොවන අවස්ථාවලදී කටයුතු කිරීම	20
21.87.	තනි අයිතිය ඇති නමුත් මෙතෙක් හිමිකම් සහතික නිකුත් කර නැති ඉඩම් සඳහා වන මැනුම් ඉල්ලීම්	20
21.88.	හවුල් අයිතිය ඇති නිරවුල් නොමැති බැවින් ඒකාබද්ධ කර මැන ඇති සහ මෙතෙක් හිමිකම් සහතික නිකුත් කර නැති ඉඩම් සඳහා වන මැනුම් ඉල්ලීම්	21
21.89.	මුල් මැනුමට අදාළ අංකිත දත්ත නොමැති විට කටයුතු කිරීම	21

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
21.90.	හිමිකම් සහතික නිකුත් කර ඇති ඉඩම් වෙනත් පන්තියක හිමිකම් සහතික නිකුත් කළ ඉඩමක් සමඟ ඒකාබද්ධ කිරීම නොකළ යුතු බව	21
21.91.	මැනුමට අදාළ ඉඩමේ අයිතිකරු විසින් යාබද ඉඩමේ කොටසක් අනවසරයෙන් භුක්ති විඳින විට	21
21.92.	යාබද ඉඩම් හිමියා විසින් මැනුමට අදාළ ඉඩමෙන් කොටසක් අනවසරයෙන් අල්ලාගෙන ඇති විට	21
21.93.	මැන ඇති ඉඩමකින් කුඩා ඉඩම් ප්‍රමාණයක් වෙන් කිරීම සඳහා ඉල්ලීමක් ලද විටක ක්‍රියා කළ යුතු ආකාරය	21
21.94.	අනුබෙදීම්/ඒකාබද්ධ කිරීම් වලදී, අළුතින් පිහිටුවන මායිම් ලක්ෂ්‍ය වල නිරවද්‍යතාවය	21
21.95.	මුල් වර්ග ප්‍රමාණයේ දෝෂයක් ඇතිවිට	21
21.96.	පිඹුරු වැඩ සඳහා අවසන් විස්තර ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රය	22
21.97.	දිස්ත්‍රික් ජ්‍යෙ. මි. අ. විසින් අවසන් විස්තර නිකුත් කිරීම	22
21.98.	පසුකාලීන මැනුම් සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තු	22
21.99.	පිඹුරු හා ඉ.වි.ලැ. මුද්‍රණය සඳහා භාවිතා කළ යුතු පත්‍ර	22
21.100.	පසුකාලීන මැනුම් වලදී මුල් පිඹුර හා ඉ.වි.ලැ. සංශෝධනය කිරීම	22
21.101.	පසුකාලීන මැනුම් පිඹුරු අංකිත දත්ත ගබඩා කිරීම	22
21.102.	අවසන් විස්තර ලබාගෙන සති දෙකක් ඇතුලත පිඹුරු භාර දීමට කටයුතු කළ යුතු බව	22
21.103.	අවසන් විස්තර ලබාගෙන සති දෙකක් ඇතුලත පිඹුරු භාර දීමට අපහසු අවස්ථාවකදී ක්‍රියා කළ යුතු ආකාරය	23
21.104.	දිස්ත්‍රික් ජ්‍යෙ. මි. අ. වෙත ලි.බ.මි. විසින් භාරදිය යුතු ලේඛන	23
21.105.	පිඹුරු පරීක්ෂා කිරීම හා ක්ෂේත්‍ර පරීක්ෂණ	23
21.106.	ජ්‍යෙ. මි. අ. විසින් පිඹුරෙහි හා ඉ.වි.ලැ. හි යොදන මුද්‍රාව	23
21.107.	21.83(2) (ii) යටතේ කරන ලද පිඹුරු පරීක්ෂා කිරීම	23
21.108.	මැනුමේ නිවැරදිතාවය සහ පිඹුරේ අන්තර්ගතය පිළිබඳව ලි.බ.මි. වගකිව යුතු බව	24
	[පිටපත් නිකුත් කිරීම සහ ගොනු පවත්වා ගෙන යෑම]	
21.109.	එක් පිටපතක් "ඉල්ලුම්කරුගේ පිටපත" ලෙස මුද්‍රා තැබීම	24
21.110.	පසුකාලීන මැනුම් පිඹුරු වල සහතික පිටපත් නිකුත් කිරීම	24
21.111.	ඉඩම් සඳහා හිමිකම් සහතික අංක ලැබීමෙන් පසු ලේඛන යථාවත් කිරීම	24
21.112.	මුල් කැඩැස්තර සිතියම යාවත්කාලීන කළ යුතු ආකාරය	24
	[පරිවර්තිථ කැඩැස්තර සිතියම් අනුසාරයෙන් රේඛා චිත්‍ර පිළියෙල කිරීම]	
21.113.	පරිවර්තිථ කැඩැස්තර සිතියම් අනුසාරයෙන් රේඛා චිත්‍ර පිළියෙල කිරීමේදී යොදන සටහන්	25
	ඇමුණුම්	
[ඇමුණුම 01]	කැඩැස්තර සිතියම් අංක නිකුත් කිරීමේ ලේඛනය	26
[ඇමුණුම 02]	මායිම් ගැටළු විසඳීමට කටයුතු කළ ආකාරය - ලේඛන ආකෘතිය	27
[ඇමුණුම 03]	මායිම් පෙන්වීම, ඉඩම් මැනීම,මනින ලද මායිම් බලාගැනීම දැක්වෙන ලේඛන ආකෘතිය	28
[ඇමුණුම 04]	කැඩැස්තර සිතියම් සඳහා දිස්ත්‍රික් අංක	29
[ඇමුණුම 05]	පරිවර්තිත කැඩැස්තර සිතියම් කැබලි අංක දක්වන ලේඛනය	30
[ඇමුණුම 06]	කැඩැස්තර මැනුම් සඳහා මිනින්දෝරුවරයාගේ වාර්තාව	31
[ඇමුණුම 07]	මිනින්දෝරු අධිකාරිගේ සහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ පරීක්ෂණ ලැයිස්තුව	33
[ඇමුණුම 08]	හිමිකම් සහතික නිකුත් කළ ඉඩම් අතුරු බෙදීම/ ඒකාබද්ධ කිරීම සඳහා මැනුම් කිරීමට ඉල්ලීම	34
[ඇමුණුම 09]	හිමිකම් සහතික නිකුත් නොකළ ඉඩම් අතුරු බෙදීම/ ඒකාබද්ධ කිරීම සඳහා මැනුම් කිරීමට ඉල්ලීම	36

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
ඇමුණුම 10	හවුල් අයිතිය ඇති නිරවුල් නොමැති බැවින් ඒකාබද්ධ කර මැන ඇති ඉඩම් අතුරු බෙදීම/ ඒකාබද්ධ කිරීම සඳහා මැනුම් කිරීමට ඉල්ලීම	38
ඇමුණුම 11	අංකිත දත්ත ඉල්ලුම් කිරීම	40
ඇමුණුම 12	අවසාන ඉඩම් විස්තර ලැයිස්තු/කැබලි විස්තර නිකුත් කිරීම	42
ඇමුණුම 13	කැඩැස්තර සිතියම්වල අඩංගු පිඹුරු විස්තර නිකුත් කිරීමේ ලේඛනය	43
ඇමුණුම 14	පසුකාලීන නව මැනුමට අදාළ පිඹුරක ආදර්ශය	44
ඇමුණුම 15	පසු කාලීනව කරනු ලබන කැඩැස්තර මැනුම් සඳහා මිනින්දෝරුවරයාගේ වාර්තාව	45
ඇමුණුම 16	කැඩැස්තර සිතියම් වල අනුබෙදීම් හා ඒකාබද්ධ කිරීම් සඳහා කරනු ලබන මැනුම් වලදී මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ සටහන් පත්‍රය	47
ඇමුණුම 17	ඉඩම් ඒකාබද්ධ කිරීම/අතුරු බෙදීම සඳහා ඉල්ලීම-ආකෘති පත්‍ර අංක 7	49

21 වැනි පරිච්ඡේදය

කැඩැස්තර මැනුම්

[කැඩැස්තර මැනුම් වලට අදාළ නිර්වචනයන්]

21.1 නිර්වචනයන්

මැනුම් පනත : සර්වේයර් ජනරාල්වරයාට අදාළ බලතල සහ කාර්ය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉඩම් මැනීම විධිමත් කිරීම සඳහා ද, මිනින්දෝරුවරුන්ගේ වෘත්තීමය ක්‍රියා පැවැත්ම විධිමත් කිරීම අරභයා ඉඩම් මැනුම් සභාවක් පිහිටුවීම සඳහාද, ඉඩම් මැනුම් ආඥාපනත සහ මිනින්දෝරු ආඥාපනත ඉවත් කිරීම සඳහාද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත : ඉඩම් කොටසක් පිළිබඳව හිමිකම් විමර්ශනය කිරීමේ හා ලියාපදිංචි කිරීම සඳහා ද, එසේ ලියාපදිංචි කරන ලද ඉඩම් කොටස්වලට අදාළ ගණුදෙනු විධිමත් කිරීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහාද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ප්‍රතීතන සහතිකලත් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා : 2002 අංක 17 දරණ මැනුම් පනතේ 11 වැනි වගන්තියෙන් නිර්වචනය කර ඇති පරිදි හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ කාර්ය සඳහා කැඩැස්තර මැනුම්කරණය කරගෙන යාම පිළිබඳව නිපුනතාව සම්බන්ධයෙන් ඇගයීම් ක්‍රියාවලියක් මඟින් සර්වේයර් ජනරාල්වරයා විසින් ප්‍රතීතන සහතිකලත් ලියාපදිංචි මිනින්දෝරු වරයෙකි.

පරිපාලන මායිම් : රජය විසින් වරින් වර ගැසට් පත්‍රයෙහි පල කරනු ලබන ශ්‍රී ලංකාවේ පරිපාලන භෞමික ඒකක, මායිම් මින් අදහස් කෙරේ.

අර්ථලාභීන්ගේ අයිතිවාසිකම් : මින් අදහස් වන්නේ නෛතික සම්බන්ධතාවයක් ඇති පාර්ශවයන්ගෙන් එක් පාර්ශවයකට නෛතික සිවිල් ගනුදෙනුවක් අත්සන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ බලයලත් රාජ්‍ය සංවිධානයක හෝ පළාත් පාලන ආයතනයක තීරණ පදනම් කරගෙන ඇති අර්ථලාභයක් ලැබීමට ඇති අයිතියයි.

අර්ථලාභී ඒකකය හෝ පුද්ගලයා : මින් අදහස් වන්නේ වෙනත් පුද්ගලයෙකුගේ හෝ ඉඩම් කොටසක උචිත වගකීම් භාරයන් මඟින් බැඳීමේ ප්‍රතිඵලයක් වශයෙන් ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය නොවන ස්වරූපයේ අර්ථලාභ භුක්ති විඳින ඉඩම් කොටස හෝ පුද්ගලයාය.

බැඳීමක් ආරෝපිත ඉඩම් කොටස : වෙනත් ඉඩම් කොටසකට අර්ථලාභයක් සැළසෙන අයිතිවාසිකමකට හෝ සම්බන්ධතාවයකට යටත්ව ඇති ඉඩම් කොටසකි.

කැඩැස්තර සිතියම : 2002 අංක 17 දරණ මැනුම් පනතේ නිර්වචනය කර ඇති පරිද්දෙනි. කැඩැස්තර සිතියමකට, 1973 අංක 11 දරණ බද්ද නිවාස අයිතිකම් පනත යටතේ පිළියෙල කරන ලද සභාධිපත්‍ය පිඹුරක්ද ඇතුලත් වේ.

කැඩැස්තර පිඹුර : කැඩැස්තර පිඹුරක් යනුවෙන්, 2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ නිර්වචනය කර ඇති කැඩැස්තර මැනුමක ප්‍රතිඵලයක් වශයෙන් ඉඩම් කොටසක් සඳහා වන පිඹුරක් අදහස් කෙරේ.
ඉඩම් කොටසක කැඩැස්තර පිඹුරක් මඟින්, එම ඉඩමේ කෙරුනු කැඩැස්තර මැනුමකින් බිහිවූ මායිම් සහ වර්ග ප්‍රමාණය පෙන්නුම් වේ.
කැඩැස්තර පිඹුරකට, 1973 අංක 11 දරණ බද්ද නිවාස අයිතිකම් පනත යටතේ පිළියෙල කරන ලද සභාධිපත්‍ය පිඹුරක්ද ඇතුලත් වේ.

දළ සටහන : පවත්නා ව්‍යවස්ථාපිත පිඹුරු, පවත්නා සහ යෝජිත පාලන මැනුම්, ගම් මායිම්, යාබද ගම් මායිම්, වෙනස් නොවන භූ ලක්ෂණාත්මක සලකුණු, ඉඩම් කොටස්වල මායිම් වැනි අත්‍යාවශ්‍ය කරුණු දැක්වෙන දළ සටහනකි.

කැඩැස්තර මැනුම : 2002 අංක 17 දරණ මැනුම් පනතේ නිර්වචනය කර ඇති පරිද්දෙනි.
කැඩැස්තර මැනුමක් වූ කලී ඉඩම් කොටසක මායිම් නිර්ණය කිරීම විස්තර කිරීම සහ ඒවායේ කෝණාස්‍ර සහ දිශාන්ත මිනුම් සිදු කිරීම සඳහා වන මැනුමකි. ඉඩම් කොටසෙහි ප්‍රමාණය ආගණනය කිරීම ද ඊට ඇතුලත් වේ.

කැඩැස්තරය : ශ්‍රී ලංකා කැඩැස්තර සංග්‍රහ වූ කලී මායිම් මැනුමක් පදනම් කර ගෙන එකිනෙකට විශේෂිත හඳුනාගැනීමේ අංකයක් දෙනු ලැබ ඇති ඉඩම් කොටස්/දේපළවල අයිතිය පිළිබඳ විස්තර ගැන නොතකා ක්‍රමානුකූලව පිළියෙල කරන ලද ඉන්වෙන්ටරියකි. ඒ අනුව ශ්‍රී ලංකා කැඩැස්තර අනිවාර්යයයෙන්ම ඉඩම් කොටස්/දේපළ පිළිබඳ ක්‍රමානුකූල විස්තරාවලියක් වන්නේය.

හිමිකම් සහතිකය : හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කර ඇති පරිදි ඉඩම් කොටසක් පිළිබඳ ලියාපදිංචි අයිතිවාසිකම්වල සම්පූර්ණ විස්තර දැක්වෙන හිමිකම් රෙජිස්ටරයෙන් උපුටා ගනු ලැබූ ලේඛනයක් මින් අදහස් කෙරේ.

ඉඩම් කොටසක් කෙරෙහි ඇති සම්බන්ධතාවය :	යම් ඉඩම් කොටසක සම්පූර්ණ අයිතියට වඩා අඩු යම් සම්බන්ධතාවක් අදහස් වන අතර, එයට යම් පරවශ්‍යතාවක් හෝ ඒ ඉඩම් කොටස විෂයෙහි බැඳීමක් ඇතුලත් වේ.
ඉඩම :	ජලයෙන් පිරුණු ඉඩමක් සහ යම් ඉඩමකින් උද්ගතවන යම් ප්‍රතිලාභයක්, පොළොවට සම්බන්ධ හෝ පොළොවට ස්ථිරව සවි කර ඇති සියළු දේ ඇතුලත් වේ.
ඉඩම් තොරතුරු පද්ධතිය :	ඉඩම් සහ ඒවා ප්‍රයෝජනයට යොදා ගැනීම, ඒවායේ අයිතිය සහ සංවර්ධනයට අදාළ දත්ත ග්‍රහණය කර ගැනීම, ගබඩා කිරීම, පිරික්සීම, ඒකාබද්ධ කිරීම හැසිරවීම, විශ්ලේෂනය කිරීම හා ප්‍රදර්ශනය කිරීම සඳහා වන පද්ධතියක් මින් අදහස් කෙරේ. (භූගෝලීය තොරතුරු පද්ධතිය ගැන කියවා බලන්න.) මෙහිදී ශ්‍රී ලංකාවේ ඉඩම් කොටස් පරිපාලනය කිරීම සඳහා පිහිටුවීමට නියමිත ඉඩම් කොටස් පාදක කොට ගත් ඉඩම් තොරතුරු පද්ධතියක් උදෙසා පදනම ගොඩනඟා ගැනීම පිණිස කැඩැස්තර සිතියම් භාවිතයට යොදා ගත හැකිය.
ඉඩම් කොටස :	කැඩැස්තර සිතියමේ වෙන්ව රූප රේඛණය කර ඇති ඉඩම් ප්‍රදේශයක් අදහස් වේ.
පළාත් පාලන ආයතනය :	මහ නගර සභාවත්, නගර සභාවත් සහ ප්‍රාදේශීය සභාවත් මින් අදහස් කෙරේ.
උකස්කරය :	උකස් පනතේ නිර්වචනය කර ඇති පරිද්දෙනි.
අයිතිකරු :	(අ) ඉඩම් කොටසට අදාළව නම්, එහි අයිතිකරු ලෙස හිමිකම් රෙජිස්ටරයේ නම් කරනු ලැබ ඇති පුද්ගලයා හෝ සංවිධානය ද (ආ) ඉඩම් කොටසකට ඇති සම්බන්ධතාවයට අදාළව නම්, ඉඩම් කොටසට ඇති සම්බන්ධතාව හිමිකම් රෙජිස්ටරයේ යම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් නමින් ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ ද එම පුද්ගලයා හෝ සංවිධානය මින් අදහස් කෙරේ.
පෞද්ගලික ඉඩම :	රජයේ නොවන ඕනෑම ඉඩමක් මින් අදහස් කෙරේ.
ලියාපදිංචි කරන ලද ඉඩම :	1998 අංක 21 දරණ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් ලියාපදිංචි කරනු ලැබ ඇති ඉඩමක් මින් අදහස් කෙරේ.
ලියාපදිංචි මිනින්දෝරුවරයා :	2002 අංක 17 දරණ මැනුම් පනතේ නිර්වචනය කර ඇති පරිද්දෙනි.

හිමිකම්පෑම : ඉඩම් කොටසක් පිළිබඳ වර්තමානයේ පවත්නා අයිතිවාසිකම් හඳුනාගැනීම සඳහා වන සහ ශක්‍යමාන අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ නම/නම් දැක්වෙන ලිඛිත ඉල්ලුම්පතක් මින් අදහස් කෙරේ.

හිමිකම්පාන්නා : හිමිකම්පෑමක් ඉදිරිපත් කරන පුද්ගලයා හෝ සංවිධානය මින් අදහස් කෙරේ.

හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා : 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ විධිමත් ලෙස පත් කරනු ලැබ ඇති පුද්ගලයෙකි. විධිමත් ලෙස පත් කරනු ලැබූ නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ බලතල, රාජකාරි සහ කාර්යයන් පවරා දෙනු ලැබ ඇති අතිරේක, නියෝජ්‍ය හෝ සහකාර කොමසාරිස්වරයෙකුද ඊට ඇතුලත් වේ.

සහකාර හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා : ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට සම්බන්ධ කාර්යයන් කරගෙනයාම සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් පත් කරන ලද නිලධාරියෙකු මින් අදහස් වේ.

ඔප්පු රෙජිස්ටරය : ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා මෙම පනත හැර වෙනත් කිසියම් පනතක් යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වා ගනු ලබන රෙජිස්ටරයක් මින් අදහස් කෙරේ.

බැඳීම් : ඉඩම් කොටසක් වෙනුවෙන් ඇති කළ හැකි හෝ ආරෝපිත කළ හැකි වීම නිසා 1998 හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කළ හැකි සම්බන්ධතා, අයිතිවාසිකම් සහ හෝ හිමිකම්පෑම් මින් අදහස් වේ.

භූගෝලිය තොරතුරු පද්ධතිය : පොළොව මතු පිට ඒ ඒ ස්ථානයන්ට අදාළ දත්ත ග්‍රහණය කර ගැනීම, ගබඩා කිරීම, පිරික්සීම, ඒකාබද්ධ කිරීම, හැසිරවීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා වන පද්ධතියක් මින් අදහස් කෙරේ. (ඉඩම් තොරතුරු පද්ධතිය ගැන කියවා බලන්න) ශ්‍රී ලංකාවේ ඉඩම් කොටස් පරිපාලනය සහ ඉඩම් සංවර්ධනය සහ පරිහරණය සැලසුම් කිරීම සඳහා පිහිටුවාලීමට නියමිත භූගෝලීය තොරතුරු පද්ධතිය පාදක කොට ගෙන ඉඩම් කොටසක් සඳහා පදනමක් සකසා ගැනීමට කැඩැස්තර සිතියම් භාවිතා කළ හැකිය.

සාධන පත්‍ර : යම් ඉඩම් කොටසක හිමිකම් හෝ එහි සම්බන්ධතා සමර්පණය කිරීමේ බලපෑම ඇති නියමිත ආකෘතියේ යම් ලේඛනයක් අදහස් වේ.

හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා :

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ විධිමත් ලෙස පත් කරන ලද පුද්ගලයා මින් අදහස් වන අතර විධිමත් ලෙස පත් කරන ලදුව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ බලතල, රාජකාරි සහ කාර්යයන් පවරාදෙනු ලැබ ඇති අතිරේක, නියෝජ්‍ය සහ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්ද ඊට ඇතුලත් වේ.

මූලික හිමිකම් උපලේඛනය/අවසාන හිමිකම් උපලේඛනය :

ඉඩම් කොටස් හා ආශ්‍රිත සියළුම සම්බන්ධතා, අයිතිවාසිකම් සහ තොරතුරුවල ලැයිස්තුවක් මින් අදහස් කෙරේ. අයිතිය පිළිබඳ සියළුම විස්තර, අයිතිය හා සම්බන්ධ ලිපිනයන් සහ දිනයන්ද ඊට ඇතුලත් වේ. එක් එක් කැඩැස්තර සිතියමක් සඳහා හිමිකම් පිළිබඳ උපලේඛන එකක් බැගින් ඇත.
එක් එක් ඉඩම් කොටසෙහි ක්ෂේත්‍ර පරීක්ෂණ චාරිකාවක යෙදීමෙන් අනතුරුව එය මුලින්ම සම්පාදනය කරනු ලබන්නේ ක්ෂේත්‍ර විමර්ශක සහ ක්ෂේත්‍ර මිනින්දෝරුවරයා විසිනි. රජයේ කාර්යාලවල විමර්ශන නිම කිරීමෙන් පසුව සහ නැවතත් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් හිමිකම්පෑම් භාර ගැනීමෙන් පසු එය යාවත්කාලීන කරනු ලැබේ. මෙය සාමාන්‍යයෙන් පවත්වා ගෙන යනු ලබන්නේ පරිගණක අංකිත (Digital) ස්වරූපයෙනි.

පරවශ්‍යතාවක් :

කිසියම් ඉඩම් කොටසකට වෙනත් පුද්ගලයෙකුට අයිති වෙනත් ඉඩම් කොටසක් කෙරෙහි ලැබී ඇති අයිතිවාසිකම් මින් අදහස් කෙරේ.

රජයේ ඉඩම් :

රජයේ ඉඩම් ආඥාපනතේ නිර්වචනය කර ඇති පරිද්දෙනි.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි :

සර්වේයර් ජනරාල් විසින් පවරා දුන් බලතල සහිතව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි තත්වයට පත් කරනු ලැබූ පුද්ගලයෙකු මින් අදහස් කෙරේ.

සර්වේයර් ජනරාල් :

2002 අංක 17 දරණ මැනුම් පනතෙහි නිර්වචනය කර ඇති පරිද්දෙනි. විධිමත් ලෙස පත්කරන ලදුව මැනුම් පනත යටතේ බලතල, රාජකාරි සහ කාර්යයන් පවරා දෙනු ලැබ ඇති ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස පත් කරන ලද වෙනත් යම් නිළධරයෙකු අදහස් වේ.

ක්‍රමානුකූල ඉඩම් ලියාපදිංචිය :

ඉඩම් කොටස් ලියාපදිංචිය, හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රමයට පරිවර්තනය කිරීම සහ /හෝ ඉඩම් කොටස් පිළිබඳ ප්‍රථම ලියාපදිංචිය සිදු කිරීම සඳහා රජයේ අනුග්‍රහය ලත් වැඩසටහන මින් අදහස් වේ.

හිමිකම් රෙජිස්ටරය :	1998 අංක 21 දරණ පනත යටතේ වන හිමිකම් රෙජිස්ටරය මින් අදහස් කෙරේ.
හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය :	ඉඩම් කොටස්වල හිමිකම් රෙජිස්ටර පවත්වා ගනු ලබන කාර්යාලයක් මින් අදහස් කෙරේ.
ස්වේච්ඡා විකිරණ ඉඩම් හිමිකම් ලියාපදිංචිය :	ඉඩම් කොටසක ලියාපදිංචිය හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රමයට පරිවර්තනය කරන ලෙස ඉඩම් කොටස් හිමියකු විසින් කෙරෙන අනාරාධිත ඉල්ලීමක් මෙයින් අදහස් කෙරේ.
ගම :	ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ගම ලෙස හඳුනාගන්නා ලද ප්‍රදේශයකි.

ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය

21.2 ශ්‍රී ලංකාවේ සියළුම ඉඩම් ග්‍රාම නිලධාරී කොට්ඨාශ/ ගම් මට්ටමින් මැන සෑම ඉඩම් කොටසකටම ඊට අනන්‍ය වූ අංකයක් ලබා දී එකී ඉඩම් කොටස්වල සැබෑ හිමිකරුවන් සොයා බලා ඒ අනුව ඉඩම් ලියාපදිංචි කිරීම, ඉඩම් කැබැල්ලක හිමිකම් ලියාපදිංචිය වේ.

21.3 ඉඩම් කැබැල්ලක හිමිකම ලියාපදිංචි කිරීම සඳහා කැඩැස්තර සිතියම් සකස් කිරීම යන්න 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 11 වන වගන්තියේ අවශ්‍යතාවයකි.
ඉහත සඳහන් කළ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව සෑම ඉඩම් කොටසක් සඳහාම හිමිකම් ලියාපදිංචි කිරීම සර්වේයර් ජනරාල්වරයා විසින් සකස් කරනු ලබන කැඩැස්තර සිතියමට අනුකූලව සිදු කළ යුතුවේ. එම මැනුම් කිරීම සඳහා හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 4, 10, 11, 23, 25, 36, 50, 51 සහ 58 වගන්ති අදාළ වන්නේය.

21.4 ඉඩම් විෂය භාර අමාත්‍යවරයා විසින් පළාත්, දිස්ත්‍රික්, හෝ ප්‍රාදේශීය හෝ වෙනත් පරිපාලන ඒකක මත ප්‍රදේශ තීරණය කර රජයේ ගැසට් පත්‍රයේ පල කර ඉඩම් හිමිකම් ලියාපදිංචිය කරගෙන යනු ලැබේ. එසේ තෝරාගත් ප්‍රදේශයක් සඳහා හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 11 වන වගන්තිය අනුව සර්වේයර් ජනරාල්වරයා එම ප්‍රදේශය ආවරණය වන පරිදි කැඩැස්තර සිතියම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

21.5 එසේ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශය හෝ එහි කොටසක කැඩැස්තර සිතියම් සකස් කොට අවසන් වූ පසු අදාළ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් විසින් එහි සහතික පිටපත් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත භාර දිය යුතුය. ඉන්පසුව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් සෑම ඉඩම් කැබැල්ලකටම හිමිකම් කැඳවීමෙන් පසුව සෑම ඉඩම් කැබැල්ලකම හිමිකම, වෙනත් නීතිමය අයිතිවාසිකම්, සහ පුද්ගලයන්ට ඇති නීතිමය අයිතිවාසිකම් පිළිබඳව තීරණය කරනු ලැබේ.

21.6 හිමිකම් ලියාපදිංචි කිරීමේ ප්‍රධාන පියවරවල්;

1. මහජනයා දැනුවත් කිරීම සහ ඉඩම් කැබලි පිළිබඳ තොරතුරු රැස් කිරීම
2. මූලික විමර්ශනය සහ ඉඩම් මැන කැඩැස්තර සිතියම් සකස් කිරීම
3. නීතිමය විමර්ශනය
4. ඉඩමට හිමිකම්/අයිතිවාසිකම් කැඳවීම සහ හිමිකම් නිර්දේශ කිරීම
5. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වැනි වගන්තියට අනුව ඉඩම්වල හිමිකම් පිළිබඳව අවසාන දැන්වීම ප්‍රසිද්ධ කිරීම
6. හිමිකම් ලියාපදිංචි කිරීම සහ හිමිකම් සහතික නිකුත් කිරීම

ඉහත 2 වන පියවර හැර අනෙකුත් පියවරවල් ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, ග්‍රාම නිලධාරී සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන හෙයින් එම පියවරවල් පිළිබඳව මෙම පරිච්ඡේදයේදී විස්තර නොකෙරේ.

21.7 හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් ඉහත 4 වන පියවරේ විමර්ශනයෙන් පසු, අතිරේක මැනුම් කළ යුතු බව තීරණය වූ විට පනතේ 23 වගන්තිය අනුව, කැඩැස්තර සිතියම සංශෝධනය කරන ලෙස සර්වේයර් ජනරාල්වරයාගෙන් ඉල්ලීමක් කළ යුතුය. එවැනි ඉල්ලීමක් ලද විට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් එවැනි සංශෝධන ඇතුලත් කරන ලද කැඩැස්තර සිතියමේ අදාළ පත්‍රවල සහතික පිටපත් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

මහජනයා දැනුවත් කිරීම සහ ඉඩම් කැබලි පිළිබඳ ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීම

21.8 ප්‍රාදේශීය මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් සංවිධානය කරනු ලබන අතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි/ මිනින්දෝරු අධිකාරි/ මිනින්දෝරුවරු එම දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගි විය යුතුය. ජාතික, පළාත්, සහ දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන පහත අ) - ඈ) කණ්ඩායම් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ඉඩම් අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබේ.

දැනුවත් කිරීම් සඳහා වූ ඉලක්ක කණ්ඩායම්;

අ) දේශපාලන සහ ප්‍රජා නායකයින්
ආ) පොදු මාධ්‍ය ආයතන
ඇ) වෘත්තීමය සංවිධාන (නොතාරිස්වරු, බැංකුකරුවන්, වාණිජ මණ්ඩල, කර්මාන්තකරුවන්, නීතිඥවරුන් සහ මිනින්දෝරුවරුන් ආදිය)
ඈ) රාජ්‍ය නොවන සංවිධාන
ඉ) දිස්ත්‍රික් මට්ටමේ රජයේ ආයතනවල සහ පළාත් පාලන ආයතනවල නිලධාරීන්
ඊ) ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල සහ අදාළ ආයතනවල කාර්ය මණ්ඩල
උ) තෝරා ගන්නා ලද ප්‍රදේශවල ප්‍රජාව

21.9 හිමිකම් ලියාපදිංචිය සඳහා තෝරා ගන්නා ලද ප්‍රදේශයේ ඉඩම් කැබලිවල මූලික තොරතුරු හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් රැස් කරනු ලැබේ. එසේ රැස් කරනු ලබන තොරතුරු හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් වර්ගීකරණය කර උපලේඛන ගත කර නියමිත නාමලේඛන සමඟ මැනුම් ඉල්ලීමක් මඟින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත එවනු ලබයි. ප්‍රදේශයේ මූලික විමර්ශනය පැවැත්වූ විමර්ශණ නිලධාරීන්ගේ නම් ද මැනුම් ඉල්ලීම් සමඟ ලැබෙනු ඇත.

දළ සටහන් සකස් කිරීම සහ කාර්යාල කටයුතු

21.10 කැඩැස්තර සිතියමක් සකස් කිරීම සඳහා ග්‍රාම නිලධාරී කොට්ඨාශය ඒකකයක් ලෙස සලකනු ලබනු අතර කැඩැස්තර සිතියම් ප්‍රදේශය ප්‍රකාශයට පත් වීමත් සමඟ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින්, ඉඩම් තොරතුරු පද්ධති අංශයෙන් ලබා ගත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංකිත සිතියමක් මත එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශය සඳහා කැඩැස්තර සිතියම් අංක යෙදීමට කටයුතු කළ යුතුය. මෙම අංකිත සිතියමේ පිටපතක් අදාළ මිනින්දෝරු අධිකාරි වෙත ලබා දිය යුතුය. මෙයට අමතරව මෙම කැඩැස්තර සිතියම් අංක නිකුත් කිරීමේ ලේඛනයක්ද **ඇමුණුම 01** හි දැක්වෙන පරිදි පවත්වාගෙන යායුතුය. අදාළ ප්‍රාදේශිය ලේකම් හා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා සමඟ එක්ව කැඩැස්තර මැනුම් කටයුතු කිරීමට යෝජිත ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කර ගැනීමට මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කළ යුතුය.

21.11 මිනින්දෝරු අධිකාරි විසින් කැඩැස්තර සිතියම් සකස් කිරීමට තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරී කොට්ඨාශය සඳහා කලාප සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය ලේඛන, සිතියම් හා අවශ්‍ය වන වෙනත් තොරතුරු රැස් කළ යුතුය. සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම කැඩැස්තර සිතියම් සකස් කිරීම සහතික වීම සඳහා ග්‍රාම නිලධාරී වසම් මායිම් නිවැරදිව හඳුනාගැනීම සහ ප්‍රදේශයේ විශාලත්වය සලකා බලා ග්‍රාම නිලධාරී වසම අවශ්‍ය පරිදි කලාප 2 කට හෝ ඊට වැඩි ගණනකට වෙන් කර ගැනීම මිනින්දෝරු අධිකාරිවරයාගේ වගකීමවේ. ග්‍රාම නිලධාරී වසම මූලික ඒකකය වන බැවින් මිනින්දෝරු අධිකාරි විසින් කලාපවල මායිම් තීරණය කිරීමේදී එක් කලාපයකට ගම් කිහිපයක් ඇතුලත් නොවන පරිදි කලාප වෙන් කළ යුතුය. එක් කලාපයක් හෙක්ටයාර 50ක් හෝ ඉඩම් කැබලි 100 ක් නොඉක්මවන සේ තෝරා ගැනීම සුදුසු වේ. කලාප මායිම් නිශ්චය කිරීමේදී හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා/ ග්‍රාම නිලධාරී සම්බන්ධ කර ගත යුතු අතර, කලාප මායිම් ලෙස වඩාත්ම සුදුසු වන්නේ ස්වභාවික මායිම් (ගංගා, ජල මාර්ග ආදිය) හෝ මිනිසා විසින් තනන ලද (ප්‍රධාන පාරවල්, දුම්රිය මාර්ග ආදිය) මායිම් යොදා ගැනීමය. ගම් මායිම් අවිනිශ්චිත අවස්ථාවලදී සහ සුළු වශයෙන් වෙනස් කළ යුතු අවස්ථාවලදී (ඉඩමක් ගම් මායිමක් මඟින් කොටස් වන අවස්ථාවක) ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කර ඒවා නිශ්චය කර ගත යුතුය. කැඩැස්තර සිතියමක් තුල ඇති කලාප, අංක 1 සිට අංක කළ යුතුය. එක් එක් ග්‍රාම නිලධාරී වසම් සඳහා කලාප වෙන්කර එහි පිටපතක් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා/ ග්‍රාම නිලධාරී වෙත යැවීමට මිනින්දෝරු අධිකාරි කටයුතු කළ යුතුය. තවද එහි අංකිත පිටපතක් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යැවිය යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් එක් ග්‍රාම නිලධාරී වසම් සඳහා පිළියෙල කරන කැඩැස්තර සිතියම් අංක, කලාප අංක, පත්‍ර අංක හා කැබලි අංක පිළිබඳ විස්තර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ලේඛනයක පවත්වා ගෙන යා යුතුය.

21.12 2002 අංක 17 දරණ මැනුම් පනතේ 10(2) (අ) සහ (ආ) වගන්ති අනුව කැඩැස්තර මැනුම් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මිනින්දෝරුවරයෙකු විසින් හෝ මැනුම් සභාවේ වාර්ෂික බලපත්‍ර ලාභී/ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙක් විසින් සිදු කළ යුතුය. තවද නිපුනතාවය සනාථ කිරීමට සර්වේයර් ජනරාල්වරයා නිකුත් කරන ලද ප්‍රතීතන සහතිකය තිබීමද අනිවාර්ය වේ.

21.13 හිමිකම් නිරවුල් කිරීමේ සහකාර කොමසාරිස් වෙතින් ලද මැනුම් ඉල්ලීම යොමු කළ මිනින්දෝරුවරයාගේ නම සහ දුරකථන අංකය, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් සහ ග්‍රාම නිලධාරී වෙත දන්වා යැවීමට මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කළ යුතුය. එක් කලාපයකට එක් මිනින්දෝරුවරයෙක් අනුයුක්ත කිරීම සුදුසු වන අතර ඔහු විසින් පවතින ව්‍යවස්ථාපිත මැනුම්, බලයලත් ලියාපදිංචි මිනින්දෝරුවරුන් විසින් සකස් කරන ලද පිඹුරු, පාලන මැනුම්, අනෙකුත් විස්තර සහ ඉඩම් කැබලිවල මායිම් ඇතුලත් වන සේ තමන්ට පවරන ලද කලාපය සඳහා පැහැදිලි පිරික්සුම් සටහනක් සකස් කළ යුතුය. පවතින සහ සැලසුම් කර ඇති පාලන ලක්ෂ්‍ය , පූර්ණමාන (Total Station) පරික්‍රමණ ආදියද මෙම පිරික්සුම් දළ සටහනට ඇතුලත් කළ යුතුය.

ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීම

21.14 මිනින්දෝරුවරයා සහ ක්ෂේත්‍ර විමර්ශන නිලධාරීන් එක් කණ්ඩායමක් වශයෙන් වැඩ කළ යුතු වුවත් සෑම අවස්ථාවකදීම එකට එක්ව ක්ෂේත්‍රයට යාම අවශ්‍ය නොවේ. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් වර්ගීකරණය කර නියමිත නාමලේඛන සමඟ එවනු ලබන ඉඩම් තොරතුරු අනුව ආරවුල් ඇති ඉඩම් සඳහා පමණක් විමර්ශන නිලධාරී සහ ග්‍රාම නිලධාරී සමඟ එක්ව ඒකාබද්ධ විමර්ශණයක් කළ යුතුය. එම ඉඩම්වල ආරවුල් තවදුරටත් ඇත්නම් ඒවා විසඳා ගැනීම මිනින්දෝරු අධිකාරී මඟින් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් වෙත වාර්තා කළ යුතුය. රජයේ ඉඩම් පවතින අවස්ථාවල රජයේ ඉඩම් බලධරයාගේ නියෝජිතයෙකු/ ග්‍රාම නිලධාරී සහභාගි කරවා ගත යුතුය. මායිම් බලා ගැනීම වැනි ඉඩම් හිමිකරු සමඟ කරන කටයුතු සඳහා කිසිවිටකත් මැනුම් ක්ෂේත්‍ර සහායකයින් පමණක් නොයෙදවිය යුතුය.

21.15 ඉඩමට අයිතිවාසිකම් කියන්නන්හට, නියමිත ආකෘති අත් පත්‍රිකාවක් මඟින් පූර්ව දැනුම්දීමකින් තොරව ක්ෂේත්‍ර මැනුම් කණ්ඩායම කිසිම ඉඩමකට ඇතුළු නොවිය යුතුය. ඉඩමේ අයිතිවාසිකම් කියන්නා හෝ ඔහු විසින් බලය පවරන අය විසින් ඉදිරිපත් කරන ලද ලේඛන පමණක් පරීක්ෂා කර හිමිකම සනාථ කර ගෙන සටහන් කර ගත යුතුය.
ඉඩමේ අයිතිකරු/අයිතිවාසිකම් කියන්නා වෙත අදාළ ඉඩම් කැබැල්ල පිළිබඳ කලින් මැන පිළියෙල කරන ලද පිඹුරක් හෝ උසාවියෙන් කොටස් කරන ලද පිඹුරක් තිබේදැයි මිනින්දෝරුවරයා විසින් විමසා එම පිඹුර පරීක්ෂා කර ක්ෂේත්‍රය සමඟ විශාල නොගැලපීම් තිබෙන බව දක්නට ලැබේ නම් ඒ බව ඉඩමේ අයිතිකරු/අයිතිවාසිකම් කියන්නා වෙත පැහැදිළි කර ඔහුගේ එකඟතාවයක් තිබේනම් පමණක් ඉදිරි කටයුතු කළ යුතුය. කලින් මැන පිළියෙල කරන ලද පිඹුරක් ඇත්නම් හිමිකරුගේ එකඟතාවය ඇතිව පිඹුරේ පිටපතක් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසුය.

21.16 මිනින්දෝරුවරයා විසින් ඉඩමට හිමිකම්පාන්නා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් පෙන්වනු ලබන මායිම් පරීක්ෂා කර බලා, යාබද ඉඩම් හිමියන්ගේ ද එකඟතාවය සහිතව මායිම් සලකුණු කළ යුතුය. පොදු මායිමට එකඟ නොවන අවස්ථාවලදී පොදු මායිම් සඳහා එකඟතාවයකට පැමිණීමට මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කළ යුතුය. තවදුරටත් ඔවුන් පොදු මායිමට එකඟ නොවන්නේ නම් විමර්ශන නිලධාරී/ ග්‍රාම නිලධාරී සමඟ ඒකාබද්ධව පොදු මායිම් එකඟතාවය ඇති කිරීමට උත්සාහ කළ යුතුය. එම ඒකාබද්ධ එකඟතාවය "මායිම් ගැටලු විසඳීමට කටයුතු කළ ආකාරය" දැක්වෙන ආකෘතිය අනුව තොරතුරු ලබා ගත යුතුය (ඇමුණුම 02), එසේ ද එකඟ නොවන අවස්ථා ඇත්නම් ගැටළුව සමඟි මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා මිනින්දෝරු අධිකාරී මඟින් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත දැන්විය යුතුය. එම මායිම් ආරවුල විසඳා ගන්නා තුරු එම ඉඩම් කොටස් පිළිබඳ කටයුතු පසුවට කල් තබා ඉඩම් කැබලි ඒකාබද්ධ කර මැනීම සිදු කළ යුතුය.

21.17 සෑම ඉඩමකම මායිම් 9.25 - 9.38 වැනි ඡේදයන්හි දක්වා ඇති පරිදි ස්ථිර සලකුණු වලින් හෝ මායිම්ගල් වලින් නියමිත ආකාරයට නිශ්චය කිරීමට මිනින්දෝරුවරයා වග බලා ගත යුතුය.

මායිම් සලකුණු කිරීමෙන් පසුව මිනින්දෝරුවරයා විසින් අදාළ ඉඩමේ පවත්නා මායිම් සහ යාබද ඉඩම් හිමියන්ගේ නම් පිරික්සුම් සටහනට ඇතුළත් කළ යුතුය. මායිම් පෙන්වන ලද බවට සහ බලාගත් බවට ඉඩමට අයිතිවාසිකම් කියන්නාගේ හෝ ඔහු විසින් බලය පවරන්නාගේ අත්සන් සහ විස්තර "මායිම් පෙන්වීම, ඉඩම් මැනීම, මනින ලද මායිම් බලා ගැනීම දැක්වෙන ලේඛනය" අනුව ලබා ගත යුතුය (ඇමුණුම 03). වගකිව යුතු කෙනෙකුගෙන් (විමර්ශන නිලධාරී, ග්‍රාම නිලධාරී, හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නියෝජිතයෙකු හෝ සමඟි මණ්ඩල නියෝජිතයෙකු) ඉඩමේ හිමිකරුගේ හෝ ඔහුගේ නියෝජිතයාගේ අත්සනට සාක්ෂි වශයෙන් අත්සන් ලබා ගත යුතුය. අයිතිකරුවෙකු අයිතිවාසිකම් කියන්නකු හඳුනා ගැනීම හෝ ඉදිරිපත් නොවන ඉඩම් කැබලි සඳහා එම තත්වය සටහන් කර ඒ සඳහා ග්‍රාම නිලධාරී සහ අදාළ විමර්ශණ නිලධාරියාගේ අත්සන් ලබා ගෙන එයද මැනුම් ඉල්ලීම් ගොනුවට ඇතුලත් කළ යුතුය.

මැනුම් කටයුතු

21.18 සියළුම කැඩැස්තර මැනුම් ජාතික මැනුම් පාලන පද්ධතියට (SLD 99) සම්බන්ධ කළ යුතුය. කැඩැස්තර සිතියම් පිළියෙල කිරීම සඳහා කලාප වලට බෙදන අවස්ථාවේදීම, ප්‍රමාණවත් නිරවද්‍යතාවයෙන් යුතු, දැනට පවතින පාලන ලක්ෂ්‍ය ද යොදා ගනිමින් මැනුම් වැඩ කරනු ලබන ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ/කලාපයේ විශාලත්වය අනුව අවශ්‍ය අමතර පාලන ලක්ෂ්‍ය පිළිබඳව මිනින්දෝරු අධිකාරී විසින් තීරණය කළ යුතුය. ගෝලීය පිහිටුම් පද්ධති (G.P.S.) හෝ පූර්ණමාන (Total Station) උපකරණ භාවිතයෙන් පාලන මැනුම් සිදු කළ යුතුය. කැඩැස්තර ප්‍රදේශ තුල පාලන මැනුම් අංකනය කිරීම කැඩැස්තර සිතියම් අංකයට සම්බන්ධ කළ යුතුය. (උදා- මපාල 110001/01,02,03.....ආදි වශයෙන්) සාමාන්‍යයෙන් පොළොව යට පිහිටුවන G.P.S. පාලන ලක්ෂ්‍ය වලට අමතරව, කලාපයක් තුල සුදුසු ස්ථානවල අවම වශයෙන් පොළොව මතුපිට පාලන ලක්ෂ්‍ය කට්ටල 4 ක් වත් පිහිටුවිය යුතුය. මෙම පාලන ලක්ෂ්‍ය වර්ගය 2 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි හා අදාළ නිරවද්‍යතාවය සහිතව පිහිටුවිය යුතුය. මෙම පාලන ලක්ෂ්‍ය යොදා ගනිමින් කලාපයේ වට මායිමේ දිවෙන පාලන පරික්‍රමණයන් 2 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති තෘතියික ගණයේ විය යුතුය.

21.19 ග්‍රාම නිලධාරී කොට්ඨාශයක/කලාපයක ඇති ඉඩම් කැබලි මැන කැඩැස්තර සිතියමේ දැක්විය යුත්තේ එම ඉඩමට හිමිකම් කියනු ලබන අය සහ යාබද ඉඩම් හිමියන් සමඟ පොදු එකඟතාවයකට පැමිණි මායිම්වලට අනුවය. එක් ඉඩම් කොටසක් සඳහා කිහිපදෙනෙකු අයිතිවාසිකම් කියනු ලබන අවස්ථාවක හෝ එක් එක් අයිතිකරුවන්ගේ මායිම් බිමෙහි නිශ්චිතව නොමැති අවස්ථාවක, ඒවා අයිතිවාසිකම් කියනු ලබන ආකාරයට මැනිය යුත්තේ එක් එක් අයිතිවාසිකම් කියන්නන්ගෙන් කැමැත්ත ප්‍රකාශ කළ ලිපි ලබාගැනීමෙන් පසුවය. එසේම මැනීම සඳහා හඳුනාගත් ඉඩම් සඳහා ස්ථිර මායිම් නොමැති අවස්ථා වල යාබද ඉඩම්ලාභීන්ගේ සහභාගීත්වය මත පොදු ස්ථිර මායිම් පිහිටුවා ගන්නා ලෙස අදාළ හිමිකරුවන් වෙත උපදෙස් ලබා දිය යුතුය.

21.20 මායිම් ආරවුල් පැවති ඉඩම්වල එම ආරවුල් අදාළ ඉඩම් හිමියන් විසින්, සමහි මණ්ඩල මඟින් හෝ උසාවිය මඟින්, එම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ /කලාපයේ මැනුම් කටයුතු සිදු කරන කාලය තුල විසඳා ගනු ලැබුවහොත් , එම ඉඩම් කැබලි මැන කැඩැස්තර සිතියමට ඇතුලත් කළ යුතුය.

21.21 ඉහත 21.16 ඡේදය අනුව මායිම් පිළිබඳ ආරවුල් විසඳිය නොහැකි අවස්ථාවලදී ආරවුල ඇති ඉඩම් ඒකාබද්ධ කර වට මායිම පමණක් මැන එක් ඉඩම් කැබැල්ලක් සේ කැඩැස්තර සිතියමේ දක්වා කැබලි අංක යෙදිය යුතුය. මුළු කලාපයම සඳහා කැඩැස්තර මැනුම සිදු කිරීම මෙම ක්‍රියාවලියේ මූලික පරමාර්ථය වේ. ආරවුල් සහිත හිමිකම් කියන්නන්ගේ නම් ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් කර එය ආරවුල් සහිත ඉඩමක් ලෙස පහසුවෙන් හඳුනාගැනීම සඳහා සටහන් යෙදිය යුතුය.

21.22 මනිනු ලබන කලාපය තුල, දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා සකස් කර ඇති ව්‍යවස්ථාපිත පිඹුරු සහ රාජ්‍ය ආයතන/ අර්ධ රාජ්‍ය ආයතන වලට ඉඩම් පැවරීම සඳහා සකස් කරන ලද මායිම්ගල් දමා මනිනු ලැබූ පිඹුරු ඇත්නම් එම පිඹුරු හිමිකම් ලියාපදිංචිය සඳහා පහත 21.36 ඡේදය අනුව කැඩැස්තර සිතියම් බවට පරිවර්තනය කළ යුතුය. කෙසේ වුවද එම පිඹුරුවල ඉඩම් හිමියන් භාවිතා කරන මායිම්, පිඹුරේ ඇති මායිම් වලට වඩා බොහෝ සෙයින් වෙනස් අවස්ථාවකදී අදාළ ඉඩම් බලධාරියාගේ උපදෙස් පරිදි නැවත මැනීම හෝ පරිවර්තනය කිරීම කළ යුතුය.

21.23 එක් ක්ෂෙත්‍ර පොතක් එක් කලාපයක් සඳහා පමණක් භාවිතා කළ යුතුය. එසේ වුවද එම ක්ෂෙත්‍ර පොත එම කලාපයේම පසුකාලීන මැනුම් සඳහා භාවිතා කළ හැකිය. කැඩැස්තර සිතියම් අංකය, කලාප අංකය, පත්‍ර අංකය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නම භාවිතයට ගනු ලබන සෑම ක්ෂෙත්‍ර පොතකම පිටකවරයේ පැහැදිලිව අතින් මුද්‍රණය කළ යුතුය.

කැඩැස්තර මැනුම් සඳහා ක්ෂෙත්‍ර පොත් තැබීම 11 සහ 22 වැනි පරිච්ඡේදවල උපදෙස් අනුව විය යුතුය. මෙවැනි ක්ෂෙත්‍ර සටහන් අධිකරණයේ සාක්ෂි සඳහා යොදා ගනු ලැබිය හැකි බැවින් එහි වැදගත්කම

වටහා ගත යුතුය. එම නිසා හිමිකම් කියන්නන්ගේ/පදිංචිකරුවන්ගේ/දැනුම්දෙන්නන්ගේ නම්, ඉඩමේ නම, ඉඩම් පරිහරණය, මායිම් විස්තර, මායිම්ගල් සහ මනින ලද දිනය වැනි දෑ පිළිබඳ සම්පූර්ණ විස්තර පැහැදිලිව ක්ෂෙත්‍ර පොත්වල සටහන් කළ යුතුය.

21.24 9 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි සියළුම විස්තර මැනීම් කළ යුතුය. මිනින්දෝරුවරයා විසින් කරන ලද ක්ෂෙත්‍ර මැනුම් කටයුතු, ක්ෂෙත්‍ර පොත් තැබීම, මායිම් ලක්ෂ්‍ය වල ඛණ්ඩාංක ගණනය කිරීම සහ බිම් ප්‍රමාණ ගණන් බැලීමේදී අදාළ දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසිවලට අනුව ප්‍රමාණවත් නිරවද්‍යතාවයක් ඇති බවට මිනින්දෝරු අධිකාරි සෑහීමකට පත්විය යුතුය. කෙසේ වුවද ක්ෂෙත්‍ර මැනුම් හා සම්බන්ධවන සියළු කටයුතු සඳහා අදාළ මිනින්දෝරුවරයා පෞද්ගලිකවම වගකිව යුතුය. මෙහිදී ඉඩම් අයිතිකාරිත්වය පිළිබඳ ඉඩම්ලාභීන්ගෙන් හොඳින් විමසීම් කර ඉඩමට අදාළ නිවැරදි මායිම් හඳුනා ගෙන පොළවේ පිහිටුවා ඇති හෝ පිහිටුවා ගනු ලබන හෝ මායිම් පමණක් මැනුම් සිදු කළ යුතුය.

21.25 මැනුම් කටයුතු කරනු ලබන ප්‍රදේශය තුල රජයේ ඉඩම් ඇති අවස්ථාවල, රජයේ ඉඩම්වල මායිම් කැඩැස්තර සිතියමේ පැහැදිලිව පෙන්වා ඇති බවට මිනින්දෝරුවරයා සෑහීමකට පත්විය යුතුය. රජයේ ඉඩම්වල වෙන්කළ බිම් 10 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි විය යුතුය. එක් එක් රජයේ ආයතනයන් විසින් භුක්ති විඳින ඉඩම් කැබලි වෙන් වෙන්ව දැක්විය යුතුය. දෙපාර්තමේන්තු පිඹුරුවල දැක්වෙන එහෙත් භාවිතයේ නොමැති අඩිපාර, පාර, වැව් ආදිය තව දුරටත් පවත්වාගෙන යා යුතු බවට රජයේ ඉඩම් බලධරයා තීරනය කරනු ලබයි නම් පමණක් ඒවා නව කැබලි අංක සහිතව කැඩැස්තර සිතියමේ දැක්විය යුතුය. එසේම පළාත් පාලන ආයතන වලට අයත් පාරවල් වල පළල සහ මාර්ග කෙලවර හැරවුම් ස්ථාන මෙන්ම ජලය බස්නා කාණු පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු අතර ඒවා පිළිබඳ අවශ්‍ය තොරතුරු අදාළ පළාත් පාලන ආයතන වලින් ලිඛිතව තහවුරු කර ගත යුතුය.

21.26 එක් ඉඩම් කැබැල්ලක් ඔප්පු කිහිපයකින් ආවරණය වන අවස්ථාවලදී, හිමිකරු විසින් ලිඛිත ඉල්ලීමක් කළ විට එය එක් ඉඩමක් ලෙස මැනිය යුතුය. වෙනත් ඉඩමකට පොදු ප්‍රවේශ මාර්ගයේ හෝ රථ හැරවුම් වලට අදාළ ගැටළු හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් වෙත අදාළ පාර්ශවකරුවන් විසින් ලිඛිතව දන්වා ගන්නා පොදු එකඟතාවය අනුව මැනිය යුතුය. එකඟතාවය ලබා ගැනීමට නොහැකි නම් "එකට මැන අයිතිය නිරවුල් නොකළ ඉඩමකි" යනුවෙන් ඉ.වි.ලැ. හි සඳහන් කළ යුතුය.

පිඹුරු වැඩ

21.27 12 සහ 22 වැනි පරිච්ඡේද වල දක්වා ඇති පිරිවිතරයන් හා උපදෙස් අනුව කැඩැස්තර සිතියම් පරිගණක භාවිතයෙන් සකස් කළ යුතුය.

කැඩැස්තර සිතියමක් පහත සඳහන් පරිදි අංක 6 කින් අංකනය කළ යුතුවේ.

- පළමු අංක දෙක අදාළ දිස්ත්‍රික්කය හඳුනා ගැනීම සඳහා **(ඇමුණුම 04)**
- ඊලග අංක 4 එම දිස්ත්‍රික්කයේ අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාශය හඳුනා ගැනීම සඳහා

සිතියමේ කලාපය හා ඉඩම් කැබැල්ල සඳහා පහත සඳහන් පරිදි අංක 6 කින් අංකනය කළ යුතුය.

- කලාපය සඳහා අංක 02 කින් අංක කිරීමටද
- අවසාන අංක 04 කැබලි සඳහාද වෙන් කළ යුතුය.

ඒ අනුව අවසානයේදී හිමිකම් සහතිකයේ ඉඩම් කැබැල්ල සඳහා අංක 12 කින් යුක්ත අනන්‍යතා අංකයක් ලැබේ.

21.28 කලාපයක ඇති සියළුම ඉඩම් කැබලි අංක 1 න් ආරම්භ කර අංක කරනු ලබන අතර භාග අංක හෝ අකුරු භාවිත නොකළ යුතුය. අළුතින් මනින ලද කැබලි වලට සහ කැඩැස්තර සිතියමට ඇතුලත් කරන ලද පැරණි සිතියම්වල කැබලි වලටද එකම ආකාරයට කැබලි අංක යෙදිය යුතුය.

21.29 අළුතින් කැඩැස්තර සිතියම් සකස් කරන අවස්ථාවේදී යාබද කලාප තුලට වැටෙන අඩිපාර, මාර්ග සහ ජලමාර්ග වැනි පැරණි කැබලි වල ශේෂ කොටස් සඳහා අළුතින් කැබලි අංක යෙදීම නොකළ යුතුය.

21.30 අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු සහ භූ ලක්ෂණාත්මක මුලික පිඹුරු තුල කැඩැස්තර සිතියම් සකස් කිරීමට පෙර එම වට මායිම සඳහා 12 වැනි පරිච්ඡේදය අනුව අතුරු පිඹුරක් සකස් කළ යුතුය.

21.31 කැඩැස්තර සිතියම් සකස් කරන අවස්ථාවේදී අදාළ සියළුම මැනුම් එයට ඇතුලත් කිරීමට මිනින්දෝරුවරයා සහ මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කළ යුතුය. මේ සඳහා කැඩැස්තර මැනුම් ආරම්භ කිරීමට පෙර අදාළ කලාප තුලට වැටෙන සියළුම පැරණි පිඹුරු පිළිබඳව සම්පූර්ණ ලැයිස්තුවක් මිනින්දෝරුවරයා විසින් පිළියෙල කළ යුතුය.

21.32 <u>කැඩැස්තර සිතියමක පරිමාණය</u> 1: 2,000 විය යුතුය. කෙසේ වුවද මෙම පරිමාණය සියළුම විස්තර දැක්වීමට ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී ඊට වඩා විශාල පරිමාණයක් භාවිතා කළ හැකිය. එසේම කැඩැස්තර සිතියමේ කොටසක් පමණක් එලෙස විශාල පරිමාණයෙන් ඇඳීමට සිදුවන අවස්ථාවලදී එම කොටස් දැක්වීමට අතුරු පිඹුරු සකස් කළ යුතුය.

21.33 වර්ග ප්‍රමාණ ගණන් බැලීම 13 වැනි පරිච්ඡේදය අනුව සිදු කළ යුතුය. කෙසේ වුවද සිතියමේ පරිමාණය ගැන සැලකිල්ලට නොගෙන ඉඩම් කැබලිවල වර්ග ප්‍රමාණයන් දශම ස්ථාන 4 කට හෙක්ටයාර් වලින් ඉඩම් විස්තර ලැයිස්තුවේ සටහන් කළ යුතුය. ඊට අමතරව වර්ග ප්‍රමාණය අක්කර-රූඩ්- පර්චස් වලින් වෙනත් කරුණු තීරයේ වරහන් තුල දැක්විය යුතු අතර එය ස්වයංකීයව මුද්‍රණය වීමේ පහසුකම TLDMS දත්ත පද්ධතිය මඟින් ලබා දී ඇත.

21.34 මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති මෘදුකාංග භාවිතයෙන් A3 ප්‍රමාණයේ ක්ෂේත්‍ර පත්‍ර මත කැඩැස්තර පිඹුරද, A3 ප්‍රමාණයේ මුද්‍රිත කඩදාසි මත ඉඩම් විස්තර ලැයිස්තුවද මුද්‍රණය කළ යුතුය. කැඩැස්තර සිතියම්වල අකුරු ඇඳීම, කෙටි යෙදුම්, සම්ප්‍රදායික යෙදුම් ආදිය 4, 9, 12 සහ 22 වැනි පරිච්ඡේදවල සඳහන් පරිදි විය යුතුය.

<u>කැඩැස්තර සිතියම් සකස් කරන අවස්ථාවේ දී එම ප්‍රදේශය තුල සිදු කරනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත මැනුම්</u>

21.35 කැඩැස්තර සිතියම් සකස් කරන අවස්ථාවේදී එම ප්‍රදේශය තුල සිදු කරනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත මැනුම් කැඩැස්තර සිතියම් හා සමගාමීව සිදු කළ යුතුය. එහෙත් හදිසියේ කළ යුතු ව්‍යවස්ථාපිත මැනුම් ඇත්නම් කැඩැස්තර සිතියම් සම්පූර්ණ කිරීමට පෙර එම මැනුම් සිදු කර පසුව කැඩැස්තර සිතියමට ඇතුලත් කළ යුතුය.

<u>පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු කැඩැස්තර සිතියම්වලට ඇතුලත් කිරීම</u>

21.36 කැඩැස්තර මැනුම් ප්‍රදේශයකට වැටෙන ඉඩම් ප්‍රදාන මැනුම් සඳහා කලින් පිළියෙල කර ඇති ව්‍යවස්ථාපිත පිඹුරුවල වට මායිම් පමණක් නව මැනුම්ට සම්බන්ධ කොට පොළොවේ පිහිටුවා මැන එය නව කැඩැස්තර සිතියමට ඇතුලත් කළ යුතු අතර එම කොටස සඳහා නව කැඩැස්තර සිතියමේ (අදාළ කලාපයේ) අනුයාත පත්‍ර අංකය ලබා දිය යුතුය. කැඩැස්තර සිතියමේ අදාළ කොටස තුල එම පත්‍ර අංකය සටහන් කර මුල් ව්‍යවස්ථාපිත පිඹුරු අංකය ද වරහන් තුල දැක්විය යුතුය.

උදා :- පත්‍ර අංක 2
(මුපි කු 2178)

පැරණි ව්‍යවස්ථාපිත පිඹුර කැඩැස්තර සිතියම් කිහිපයකට වැටේ නම්,
පත්‍ර අංක 2
(මුපි කු 2180 කොටසක්)

21.37 අදාළ පැරණි ව්‍යවස්ථාපිත පිඹුර, කැඩැස්තර සිතියමට ඇතුලත් කිරීම සහ ඒ තුල පසුකාලීන මැනුම් පහත ආකාරයට සිදු කළ යුතුය.
හැකි සෑම අවස්ථාවකදීම පැරණි ව්‍යවස්ථාපිත පිඹුර මඟින් ආවරණය වන ප්‍රදේශය නව කැඩැස්තර සිතියමේ කලාපයක් ලෙස තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. පිළියෙල කර ඇති පැරණි ව්‍යවස්ථාපිත පිඹුරෙන් ආවරණය වන වර්ග ප්‍රමාණය/කැබලි ගණන සැලකිල්ලට ගනිමින් ඒ සඳහා අළුතින් කලාප හෝ පත්‍ර සැකසීම සිදු කළ යුතුදැයි අවස්ථානුකූලව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් තීරණය කළ යුතුය.

21.38 පැරණි ව්‍යවස්ථාපිත පිඹුර, නව කැඩැස්තර සිතියමට ඇතුලත් කිරීමේදී, පැරණි ව්‍යවස්ථාපිත පිඹුරේ සියළුම කැබලි සඳහා කැඩැස්තර සිතියම් කැබලි අංක ලබා දිය යුතුය. ඒ සඳහා පැරණි ව්‍යවස්ථාපිත පිඹුරේ සියළුම කොටස් තුල (ඉඩම් විස්තර ලැයිස්තු ඇතුළුව) පහත සඳහන් පරිදි මුද්‍රාවක් පිළියෙල කර රතු පාටින් සටහන් තැබිය යුතුය.

“මෙය කැඩැස්තර සිතියම් අංක .....කලාප .....පත්‍ර..... බවට පරිවර්තනය කරන ලදි. පරිවර්තිත කැඩැස්තර සිතියම් කැබලි අංක සඳහා මෙයට අමුණා ඇති පරිවර්තිත කැඩැස්තර සිතියම් කැබලි අංක ලේඛනය බලන්න.”

21.39 අදාළ පැරණි ඉඩම් විස්තර ලැයිස්තුවේ පැරණි කැබලි අංකයට යටින් ඊට අනුරූපිත කැඩැස්තර සිතියම් කැබලි අංකය වරහන් තුල රතු පාටින් පැහැදිලිව මුද්‍රණය කළ යුතු අතර පැරණි ඉඩම් විස්තර ලැයිස්තුවේ පැරණි පිටු අංකයට යටින් අනුරූපිත කැඩැස්තර සිතියම් ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංකය වරහන් තුල රතු පාටින් පැහැදිලිව මුද්‍රණය කළ යුතුය. ඉන් පසු පරිවර්තිත කැඩැස්තර සිතියම් කැබලි අංක ලේඛනය **ඇමුණුම 05** ආකෘතිය පරිදි පිළියෙල කර පැරණි ව්‍යවස්ථාපිත පිඹුර අඩංගු මුල් ගොනුවෙහි ගොනු කළ යුතුය. මෙම ලේඛනය ලියාපදිංචි මිනින්දෝරුවරයකු සකස් කර මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අනුමත කළ යුතුය.

21.40 පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු තුල අංක නොයෙදූ කැබලි වේනම්, පිඹුර අපහැදිලි නොවන සේ ඒවා සඳහා කැඩැස්තර සිතියම් කැබලි අංක රතු පාටින් පහත පරිදි මුද්‍රණය කළ යුතුය.

කසි 11002401
256

මෙහි 110024 කැඩැස්තර සිතියම් අංකය සහ 01 කලාප අංකය වන අතර 256 කැඩැස්තර සිතියමට අදාළ කැබලි අංකයයි.

තවද එම කැබලි අඩංගු පැරණි ව්‍යවස්ථාපිත පිඹුරෙහි මුල් පිටුවේ පහත සඳහන් පරිදි මුද්‍රාවක් පිළියෙල කර රතු පාටින් සටහන් තැබිය යුතුය.

“මෙම පිඹුරේ අංක නොයෙදූ කැබලි සඳහා කැඩැස්තර සිතියම් කැබලි අංක රතු පාටින් යොදන ලදි. ”
තවද අංක නොයෙදූ කැබලි වල වර්ග ප්‍රමාණය ගණනය කර ඒවා සඳහා කැඩැස්තර සිතියම් ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කළ යුතුය.

21.41 පැරණි ව්‍යවස්ථාපිත පිඹුර මත භාග කැබලි අංක යොදා ඇති විට ඒවා සඳහා නව කැඩැස්තර සිතියමේ කැබලි අංක යෙදීමේදී අනුයාත පූර්ණ කැබලි අංක යෙදිය යුතුය. මෙසේ මෙම සිදුකරන සංශෝධන සියල්ලම ක්ෂෙත්‍ර පොත් වල සහ පිඹුරු වල දෙපාර්තමේන්තු රෙගුලාසි අනුව අදාළ සටහන් යොදා සහතික කළ යුතුය.

21.42 පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු තුල තනි රේඛාවකින් පෙන්වා ඇති ඇළක් හෝ අඩිපාරක් ඒ ආකාරයෙන්ම කැඩැස්තර සිතියම් වලට ගත යුතු අතර පසුව කෙරෙන මැනුම් වල දී ඒවායෙහි ඉවුරු දෙකම මැන කැඩැස්තර සිතියමේ නව පත්‍ර පිළියෙල කළ යුතුය.

21.43 පැරණි ව්‍යවස්ථාපිත පිඹුරෙහි කොටසක් සඳහා පසුව මැනීමක් කර නව ව්‍යවස්ථාපිත පිඹුරක් පිළියෙල කර ඇතිවිට, ඒ සඳහාද කැඩැස්තර සිතියමේ අනුයාත පත්‍ර අංකය ලබා දී කැඩැස්තර සිතියම් බවට පරිවර්තනය කළ යුතුය. මෙලෙස කැඩැස්තර සිතියම් බවට පරිවර්තිත ඉඩම් කැබලි සඳහා නැවත කටයුතු කිරීමකදී නව මැනීමකින් තොරව කටයුතු නොකළ යුතුය.

21.44 පැරණි ව්‍යවස්ථාපිත පිඹුර මඟින් ගම් කිහිපයක කොටස් ආවරණය වන විට කැඩැස්තර සිතියම් මායිම්, පැරණි ව්‍යවස්ථාපිත පිඹුරේ ගම් මායිම් අනුව තීරණය කළ යුතුය. එහිදී පරිවර්තිත කැඩැස්තර සිතියම් කැබලි අංක ලේඛන එක් එක් කැඩැස්තර සිතියමට වෙන වෙනම සකස් කර පැරණි ව්‍යවස්ථාපිත පිඹුර අඩංගු මුල් ගොනුවෙහි ඇතුලත් කළ යුතුය.

21.45 මෙසේ පරිවර්තනය කරනු ලබන පැරණි ව්‍යවස්ථාපිත පිඹුරු, ඉඩම් විස්තර ලැයිස්තු සහ පරිවර්තිත කැඩැස්තර සිතියම් කැබලි අංක ලේඛනවල සහතික පිටපත් අදාළ කැඩැස්තර සිතියම් වෙළුමට ඇතුලත් කළ යුතු අතර එම ලේඛන වල සහතික පිටපත් අදාළ ප්‍රාදේශීය ලේකම්, නිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්, නිමිකම් රෙජිස්ට්‍රාර් සහ සර්වේයර් ජනරාල් වෙත ඒ අවස්ථාවේදීම යැවිය යුතුය.

21.46 ඉහත ආකාරයට ක්‍රියාකළ ව්‍යස්ථාපිත පිඹුරු ප්‍රදේශ තුල පසුව සිදු කරනු ලබන සියළුම මැනුම් කැඩැස්තර මැනුමක් ලෙස කළ යුතු අතර, යොදා ගත යුතු පත්‍ර අංක සහ කැබලි අංක, ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක අදාළ කැඩැස්තර සිතියමට අනුව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙතින් ලබා ගත යුතුය.

21.47 කැඩැස්තර සිතියම් බවට පරිවර්තිත ව්‍යස්ථාපිත පිඹුරු තුල යොදනු ලබන පත්‍ර සඳහා භාවිතා කරන කැඩැස්තර සිතියම් කැබලි අංක, ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක ආදිය, මුල් කැඩැස්තර සිතියමට පිළියෙල කරනු ලබන සංශෝධන අනුරේඛනයේ පහත පරිදි සඳහන් කළ යුතුය.

කැඩැස්තර සිතියම් අංකය	කලාප අංකය	පත්‍ර අංකය	කැබලි ගණන	ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංකය
3100037	1	1	1-113	1-15
		2	114-118	16
		3	119-201	17-25

21.48 නව කැඩැස්තර මැනුමකදී කලින් මායිම්ගල් දමා මැන දීමනා පත්‍රපත්‍ර නිකුත් කළ ඉඩම් වල පැරණි වට මායිම් එලෙසම පවත්වාගෙන යායුතුය. පැරණි මායිම වෙනස් වී ඇත්නම් සහ එය නැවත පිහිටුවීමට බාධාවක් ඇත්නම් ඒ බව අදාළ රජයේ ඉඩම් බලධරයා වෙත ලිඛිතව දන්වා ඔහුගේ ලිඛිත උපදෙස් මත පමණක් කටයුතු කළ යුතුය.

කැඩැස්තර සිතියම් ප්‍රදේශ තුල අත්කර ගැනීමේ මැනුම්

21.49 කැඩැස්තර සිතියමේ දැක්වෙන ඉඩම් කැබැල්ලක් සම්පූර්ණයෙන්ම අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය අනුව අත්කර ගෙන ඇත්නම්, අදාළ කැබැල්ලේ මායිම් ක්ෂේත්‍රයේ හඳුනාගෙන අළුත් ඉඩම් විස්තර ලැයිස්තුවක් සකස් කිරීම ප්‍රමාණවත්වේ.

21.50 කැඩැස්තර සිතියමේ දැක්වෙන ඉඩම් කැබැල්ලක කොටසක් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ පවරා ගෙන ඇති අවස්ථාවක, හිමිකම් ලියාපදිංචිය සඳහා ඉඩමක් කොටස් කිරීමට පිඹුරක් සකස් කරනු ලබන ආකාරයට මුළු කැබැල්ල සඳහාම පිඹුරක් සකස් කළ යුතුය. එහිදී අත්කර ගන්නා ලද කොටසේ හිමිකරු 'රජය' ලෙසත්, ඉතිරි කොටසේ අයිතිකරු ලෙස ලියාපදිංචි අයිතිකරුගේ නමද සඳහන් කළ යුතුය.

21.51 කැඩැස්තර සිතියමක දැක්වෙන ඉඩම් කැබැල්ලක් සම්පූර්ණයෙන්ම අත්කර ගැනීමේ පනතේ 2 වැනි වගන්තිය යටතේ අත්කර ගැනීමට නියමිත විට, ඉඩම් කැබැල්ලේ මායිම් පරීක්ෂා කිරීමෙන් පසුව කැඩැස්තර සිතියමේ අදාළ ඉඩම් කැබැල්ල අනුරේඛනයට ගැනීමෙන් ප්‍රගමණ අනුරේඛනය සකස් කළ යුතුය. එවැනි ඉඩමක් සඳහා 6 වැනි වගන්තිය යටතේ පිඹුරු සකස් කිරීමේදී මායිම් පරීක්ෂා කිරීමෙන් පසුව පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවක් පමණක් ලිවීම ප්‍රමාණවත්වේ.

21.52 කැඩැස්තර සිතියමක දැක්වෙන ඉඩම් කැබැල්ලක කොටසක් පමණක් 2 වැනි වගන්තිය යටතේ අත්කරගැනීමට යෝජිත නම්, අළුත් මැනුමකින් පසුව ප්‍රගමණ අනුරේඛනයක් සකස් කළ යුතුවේ. 6 වැනි වගන්තිය යටතේ පිඹුරු සකස් කරන විට කැඩැස්තර සිතියමක ඉඩම් කැබැල්ලක් කොටස් කිරීම සඳහා පිඹුරක් සකස් කරන ආකාරයට පිඹුරු සකස් කළ යුතුවේ. එහිදී අත්කරගැනීමට යෝජිත කොටසේ සහ ඉතිරි කොටසේ යන දෙකේම අයිතිකරු ලෙස ලියාපදිංචි අයිතිකරුගේ නම ඇතුලත් කළ යුතුය.

21.53 ඉඩම් විස්තර ලැයිස්තුවල අනෙකුත් කරුණු ඇතුලත් කිරීමේදී 6 වැනි පරිච්ඡේදයෙහි උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

කැඩැස්තර සිතියම් ප්‍රදේශ තුල සහාධිපත්‍ය දේපළ මැනුම්

21.54 සහාධිපත්‍ය දේපළක් කැඩැස්තර සිතියමක එක් කැබැල්ලක් විය යුතුය. කැඩැස්තර මැනුම් ප්‍රදේශයක ඉඩම් කැබැලි තුල සහාධිපත්‍ය දේපළ අඩංගු අවස්ථාවලදී පළමුව එම දේපළ පිහිටි මුළු බිම් කොටස සඳහා සාමාන්‍ය පරිදි කැඩැස්තර සිතියම පිළියෙල කළ යුතු අතර ඉන් අනතුරුව එම සහාධිපත්‍ය දේපළ අඩංගු ඉඩම් කැබැලි සඳහා කැඩැස්තර සිතියම අනුව නව පත්‍ර යොදා ගනිමින් 18 වැනි පරිච්ඡේදය අනුව සහාධිපත්‍ය පිඹුරු පිළියෙල කළ යුතුය.

21.55 භූමියේ ඉදිකර නොමැති යෝජිත සහාධිපත්‍ය දේපළ සඳහා පිඹුරු පිළියෙල කළයුතු නොවේ. නමුත් මහල් කිහිපයකින් යුතු සහාධිපත්‍ය දේපළක පළමු මහල/මහල් කීපයක් පමණක් භූමියේ ඉදිකර ඇත්නම් එහි සියළු ඒකක සඳහා සහාධිපත්‍ය පිඹුරු පිළියෙළ කළ යුතුය. මෙහිදී භූමියේ ඉදිකර නොමැති ඒකක සඳහා දුඹුරු වර්ණය භාවිතා කළ යුතුය. ඒ අනුව සහාධිපත්‍ය පිඹුරු සඳහා නියමිත වර්ණ යෙදිය යුතු අතර මුද්‍රිත පිඹුරු පිටපත් නිකුත් කිරීමේදී ඉල්ලුම්කාර ආයතන වෙතද එම වර්ණ යොදා පිළියෙල කළ සහතික පිටපත් නිකුත් කළ යුතුය.

21.56 සහාධිපත්‍ය කොටස් අංකනය කිරීමේ දී **18.9 වැනි ඡේදය** අනුව කටයුතු කළ යුතුය.

21.57 18 වැනි පරිච්ඡේදය සහ එහි දක්වා ඇති ආදර්ශ අනුව ඉඩම් විස්තර ලැයිස්තු නිම කළ යුතු අතර ඒවා දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දී ඇති TLDMS මෘදුකාංග මඟින් පිළියෙල කළ යුතුය. සහාධිපත්‍ය

ඒකක වල ඉඩම් විස්තර ලැයිස්තු සඳහා 18 වැනි පරිච්ඡේදයෙහි ඇමුණුම 07 හි සඳහන් ආකාරයට පිළියෙල කළ යුතුය.

21.58 කැඩැස්තර මැනුම් ප්‍රදේශයක කලින් පිළියෙල කර ඇති පැරණි සභාධිපත්‍ය පිඹුරු මිනින්දෝරු අධිකාරිගේ අධීක්ෂණය යටතේ මිනින්දෝරුවරයා විසින් පරිලෝකන ක්‍රම උපයෝගි කර ගනිමින් අංකිත පිඹුරු පිළියෙල කළ යුතුය. එම අංකිත පිඹුරු අනුසාරයෙන් එක් එක් කොටස් සහ අතිරේක කොටස් සඳහා වෙන වෙනම කැඩැස්තර පිඹුරු සකස් කළ යුතුය.

21.59 පිඹුරු සකස් කිරීමේ සංකීර්ණභාවය නිසා සභාධිපත්‍ය කැඩැස්තර පිඹුරු ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

කැඩැස්තර සිතියම්වල වැඩ අවසන්කිරීමේදී වැදගත් වන කරුණු

21.60 අදාළ කලාපයෙන් වැඩි කොටසක් වැටෙන 1:10,000 භූ ලක්ෂණාත්මක සිතියම් අංකය ජාතික සිතියම් යොමු අංකය විය යුතුය.

21.61 කැඩැස්තර සිතියම්වල සෑම කොටසකටම, අවම වශයෙන් මුළු දෙකක ග්‍රිඩ් රේඛා ඡේදනයන් සෙන්ටිමීටර් 1 ක් දිග කළු ඉරිවලින් පෙන්වා එහි ඛණ්ඩාංක අගයන් කියවිය හැකි දිශාවට අගය වැඩිවන අයුරින් පූර්ණ අගයන් පමණක් කළු වර්ණයෙන් මුද්‍රණය කළ යුතුය.

21.62 කැඩැස්තර සිතියමේ සියළුම රේඛා ඇඳීම් දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි අනුව විය යුතුය. කෙසේ වුවද මැනුම් රේඛා, ග්‍රිඩ් රේඛා අංකිත පිටපතෙහි තිබිය යුතු නමුත් කැඩැස්තර සිතියම අවසන් මුද්‍රණයේ, මුද්‍රණය නොකළ යුතුය.

21.63 කැඩැස්තර සිතියමට යාබද ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල නම් සහ ඒවායේ කැඩැස්තර සිතියම් අංක, කලාප අංක පැහැදිලිව මුද්‍රණය කළ යුතුය.

21.64 කලාපය තුල ඇති සියළු මතුපිට පාලන ලක්ෂ්‍ය කැඩැස්තර සිතියමේ පෙන්විය යුතුය. මෙම ලක්ෂ්‍ය වල ඛණ්ඩාංක මීටර් දශම ස්ථාන තුනකට සිතියමේ සුදුසු ස්ථානයක මුද්‍රණය කළ යුතුය.

21.65 රජයේ දීමනා පත්‍ර නිකුත් කළ ඉඩම් පිළිබඳ කටයුතු කරනු ලබන ආයතනවල පහසුව සඳහා එම දීමනා පත්‍ර අංක ඉඩම් විස්තර ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ දැක්විය යුතුය.

21.66 කැඩැස්තර සිතියම් සියල්ල දැක්වෙන 1:10,000 සුචි සටහනක් දෘඪ සහ මෘදු පිටපත් ලෙස අදාළ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේද පවත්වාගෙන යා යුතුය. මෙම සුචි සටහන්වල දෘඩ සහ මෘදු පිටපත් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ද පවත්වාගෙන යාමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කළ යුතුය. දෘඪ පිටපත සඳහා 1:10,000 පරිමාණයට සකස් කරන ලද භූලක්ෂණ සිතියම්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (සිතියම්) ගෙන් ලබා ගත යුතුය. මෙතෙක් 1:10,000 ට භූලක්ෂණාත්මක පිඹුර සකස් කර නොමැති ප්‍රදේශ සඳහා නිවැරදි අංකය මුද්‍රණය කරන ලද නියමිත ආකෘතියේ හිස් පත්‍රයක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (සිතියම්) ගෙන් ලබා ගත යුතුය.

21.67 ඉහත දැක්වූ සුචි පත්‍රය යාවත්කාලීන කිරීම සඳහා කැඩැස්තර සිතියමේ (කලාපයේ) වට මායිම දැක්වෙන 1:10,000 පරිමාණයට වූ ග්‍රිඩ් සහිත සංශෝධන අනුරේඛනයක් සහ කලාප වට මායිමේ අංකිත පිටපතක් මිනින්දෝරුවරයා විසින් සකස් කළ යුතුය. මෙම කලාප වට මායිමේ අංකිත පිටපතක් පිඹුරු අනුමත කළ වහාම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සර්වේයර් ජනරාල් වෙත ද ඉදිරිපත් කළ යුතුය.

21.68 ග්‍රාම නිලධාරී කොට්ඨාශයකට අදාළ සියළුම කලාපවල වැඩ නිම කළ පසු කලාප වට මායිම සහ ඒවායේ අංක දැක්වෙන 1:10,000 පරිමාණයට සකස් කළ සුචි සටහනක් කැඩැස්තර සිතියමේ සෑම කලාපයකටම ගොනු කළ යුතුය. කැඩැස්තර සිතියමක සෑම කලාපයක් සඳහාම සකස් කරන ලද අංගුලික සිතියමක් (Digital Copy) හිමිකම් සහතික සකස් කිරීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතුය. මෙම සුචි සටහනේ පිටපතක් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් වෙතද යැවිය යුතුය. ඇමුණුම් 06 හි සඳහන් පරිදි සෑම කැඩැස්තර සිතියමක් සඳහාම මිනින්දෝරුවරයා විසින් වාර්තාවක් නියමිත පෝරමයේ සකස් කළ යුතුය.

21.69 සකස් කරන ලද කැඩැස්තර සිතියමට අදාළව හිමිකම් ලියාපදිංචි කළ හැකි සියළුම ඉඩම් කොටස් සඳහා යාබද විස්තර සහිතව සකස් කරන ලද කැඩැස්තර පිඹුරු මිනින්දෝරුවරයා විසින් සකස් කොට මිනින්දෝරු අධිකාරීගේ පරීක්ෂාවෙන් පසු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත වැඩ අවසන් කළ කැඩැස්තර සිතියම් සමඟ අනුමත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය. පිඹුරු අනුමත කරන ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිඹුරු අනුමත කළ පසු සියළු ලේඛන සහ අංකිත දත්ත දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒවා දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය තුල ලේඛනගත කොට පවත්වා ගෙන යා යුතුය.

21.70 කැඩැස්තර සිතියම් අනුමත කළ පසු එම තොරතුරු අනුව SRIMS දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේදී එහි බිම්සවිය යටතේ " √ " ලකුණ යෙදිය යුතු වේ. එවිට SRIMS දත්ත පද්ධතිය හරහා බිම්සවිය වාර්තා ස්වයංක්‍රියව සැකසෙන බැවින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් අත්සන් තබන ලද එම වාර්තා සෑම මාසයක් අවසානයේදීම හිමිකම් ලියාපදිංචි කිරීමේ අංශයට හා ඉඩම් තොරතුරු පද්ධති අංශයට යැවිය යුතුය.

පැරණි ලේඛන සංශෝධනය කිරීම

21.71 අදාළ ප්‍රදේශය සඳහා කැඩැස්තර සිතියම් සකස් කර අවසන් වූ පසු එම ප්‍රදේශයේ තව දුරටත් ඉතිරිව පවතින සියළුම පිඹුරුවල "කැඩැස්තර සිතියම් (අංක) න් ආවරණය වී ඇත" යනුවෙන් පැන්සලයෙන් ලකුණු කළ යුතුය.

21.72 කැඩැස්තර සිතියමේ වට මායිම දම්වැල් 16 රේඛා චිත්‍ර සටහනේ කොළ පාටින් ලකුණු කොට සංශෝධනය කළ යුතුය. පැරණි පිඹුරක කොටසක් පමණක් කැඩැස්තර සිතියමට ඇතුලත් වන අවස්ථාවලදී කැඩැස්තර සිතියමේ වට මායිම එම කොටසේ දක්වා ඉහත පරිදි පැන්සලෙන් සටහන් යෙදිය යුතුය. මුලික පිඹුරු පුදේශවල 1:4,000 මෙට්‍රික් සුචි පත්‍ර අවශ්‍ය පරිදි සංශෝධනය කළ යුතුය.

21.73 එලෙස සටහන් යොදන ලද පැරණි ලේඛනවල ලැයිස්තුවක් සහ කොටසක් පමණක් සංශෝධනය කරන ලද පිඹුරු දැක්වෙන අනුරේඛනයක්ද ඉහත ඡේදයේ සඳහන් පරිදි සකස් කරන ලද දම්වැල් 16 සංශෝධන අනුරේඛනයන්ද නිමකරන ලද කැඩැස්තර සිතියම සමඟ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ සහ සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් තම ලේඛන නිසි අයුරින් සංශෝධනය කර, සංශෝධනය කළ පැරණි පිඹුරු ලේඛන සහ අනුරේඛන සර්වේයර් ජනරාල් කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයේ ලේඛන සංශෝධනය සඳහා ඉදිරිපත් කළ යුතුය. 1:10,000 පත්‍රයද සංශෝධනය කළ යුතුය.

21.74 කැඩැස්තර සිතියමක ඇති ඉඩම් කැබලිවල හිමිකම පිළිබඳ අවසන් තීරණ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් කර එහි පිටපත් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙතද ලබා දෙනු ඇත. එම ගැසට් පත්‍ර පරීක්ෂා කර බලා තීරණ ප්‍රකාශයට පත් කොට ඇති කැබලිවලට අදාළ හිමිකරුවන්ගේ නම් ඉඩම් විස්තර ලැයිස්තුව සමඟ පරීක්ෂා කොට යම් වෙනස්කම් ඇත්නම් ගැසට් පත්‍රයට අනුව ඒවා රතු පාටින් ඉඩම් විස්තර ලැයිස්තුවල සංශෝධනය කර ඒ බවට සහතිකයක් ද යෙදීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් කටයුතු කළ යුතුය. ඉඩම් කැබලි රාශියක් එකවර

සංශෝධනය කරන්නේ නම් එක් සහතිකයක් ප්‍රමාණවත්ය. මෙම සංශෝධන අදාළ ස්ථානයේම සටහන් කිරීමට නොහැකිනම් පමණක් පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවක් පිළියෙල කළ යුතුය. තවද එසේ ගැසට් කරන ලද ඉඩම් කැබලිවලට අදාළ කැඩැස්තර පිඹුරු ගැසට් පත්‍රය ලැබී සති දෙකක් තුල හිමිකම් රෙජිස්ට්‍රාර් වෙත යැවීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කළ යුතුය.

21.75 කැඩැස්තර සිතියමක තිබෙන ඉඩම් කැබලි සඳහා හිමිකම් සහතික නිකුත් කළ පසු සෑම මාසයක් අවසානයේදීම හිමිකම් සහතික නිකුත් කළ කැබලි හා එම සහතික අංක පිළිබඳව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ජ්යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිට ලිඛිතව දන්වනු ඇත. එම විස්තර ලැබුනු පසු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අදාළ කැඩැස්තර සිතියමේ ඉඩම් විස්තර ලැයිස්තුවේ අදාළ කැබලි වලට අයත් වෙනත් කරුණු තීරයේ රතුපාටින් හිමිකම් සහතික අංක සටහන් කළ යුතුය. අදාළ ඉඩම් කැබැල්ල තුල පසුකාලීන මැනුම් කිරීමේදී මෙම විස්තර උපයෝගි වනු ඇත.

පිඹුරු පරීක්ෂා කිරීම හා අනුමත කිරීම

21.76 සියළුම මැනුම් වැඩ හා පාලන මැනුම් වැඩ දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි වලට අනුව සිදුවන බවට මිනින්දෝරු අධිකාරි විසින් වගබලා ගත යුතුය. එම නිසා කැඩැස්තර සිතියම් හා ඉඩම් විස්තර ලැයිස්තු අනුමත කිරීමට පෙර ඒවායේ නිවැරදි තත්වයන් සහ නිරවද්‍යතාවයන් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු මිනින්දෝරු අධිකාරි විසින් සිදු කළ යුතුය. මිනින්දෝරු අධිකාරි විසින් හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් කැඩැස්තර සිතියම් පරීක්ෂා කිරීම සඳහා යොදා ගත යුතු පරීක්ෂණ ලැයිස්තුව **ඇමුණුම 07** හි දක්වා ඇත.

21.77 මිනින්දෝරු අධිකාරිගෙන් කැඩැස්තර සිතියම් ලැබුණු විගස පරීක්ෂා කර සර්වේයර් ජනරාල් වෙනුවට ඒවා අනුමත කිරීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයාගේ වගකීමකි. පැරණි ලේඛන සංශෝධනය කළ බවට සහ සියළු රෙජිස්ටර් යථාවත් කළ බවට මිනින්දෝරු අධිකාරිවරුන්/ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් සෑහීමකට පත් විය යුතුය. එසේම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි අනුමත කරන සිතියමට අදාළ අංකිත දත්ත සිතියම අනුමත කරන අවස්ථාවේදීම ලබා ගැනීම එම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ වගකීමක් වන අතර එම අංකිත දත්ත හා කැඩැස්තර සිතියම්වල සහ ඉඩම් විස්තර ලැයිස්තු වල පිටපත් (අනුමත කළ දිනයේ සිට සතියක් ඇතුලත) පහත පරිදි යැවිය යුතුය.

නිලධාරියා	සිතියම් මුල් පිටපත සහ ඉඩම් මුල් පිටපත	සහතික කළ පිටපත්		සහතික නොකළ පිටපත්		අංකිත දත්ත	පිඹුරු කැඩැස්තර අංකිත දත්ත	අනුරේඛන කට්ටල	
		පිඹුරු	ඉ.ඩ.ලැ	පිඹුරු	ඉ.ඩ.ලැ			නගර හිමිකම් අනුරේඛන	සංශෝධන අනුරේඛන
ස.හි.නි.කො									
ස.ජ.(ලේ.ක.හා වෘ.ප්‍ර.අංශය)									
නි.ස.ජ.(ඉ.තො.ප/භූ .තො.ප)									
හිමිකම් රෙජිස්ට්‍රාර්									

ප්‍රාදේශීය ලේකම්									
දිස්.ජ්‍යෝ.මි.අ									
ප්‍රා.මි.කා									
ලි.බ.මි/ර.මි									
පළාත් ඉඩම් කොා.									
පළාත් පාලන ආයතන									

අංකිත පිටපත් ගොනු කිරීම

21.78 පහත පරිදි අංකිත පිටපත් ගොනු කළ යුතුය.

- නියමිත පරිදි ලේබල් කරන ලද කැඩැස්තර සිතියමේ එක් අංකිත පිටපතක් ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ගොනුවිය යුතුය.
- නියමිත පරිදි ලේබල් කරන ලද කැඩැස්තර සිතියමේ එක් අංකිත පිටපතක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගොනු විය යුතුය.
- සෑම කලාපයකම අදාළ වට මායිම් (Outer boundary) වල අංකිත දත්ත පිළියෙල කර හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් අංශයට යැවිය යුතුය.

මැනුම් ඉල්ලීම් ගොනුව හා අනෙකුත් ලේඛන

21.79 ග්‍රාම නිලධාරි කොට්ඨාශයක කලාපයක් සඳහා කැඩැස්තර මැනුම් ආරම්භ කළ විට මැනුම් ඉල්ලීම් ගොනු දෙකක් විවෘත කළ යුතුය. එම කලාපයේ මැනුම් පිළිබඳ විස්තර සහිතව ඉන් එකක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ද අනෙක ක්ෂෙත්‍ර කාර්යාලයේ ද පවත්වාගෙන යා යුතුය. අදාළ කලාපයේ කැඩැස්තර සිතියම් සකස් කිරීම අවසන් වූ පසු මෙම ලිපි ගොනු දෙක ඒකාබද්ධ ගොනුවක් ලෙස දිස්ත්‍රික් කාර්යාලයේ තබා ගත යුතුය. මෙම ලිපි ගොනුවේ, ක්ෂෙත්‍ර පිරික්සුම සටහන, පරික්‍රමණ දැක්වෙන සටහන් හෝ වෙනත් අදාළ ගොනුවලට යොමු කිරීම, බණ්ඩාංක පත්‍ර, ආගණන පත්‍ර, මිනින්දෝරුවරයාගේ වාර්තාව, මායිම් බලා ගැනීම /පෙන්වීමට අදාළ ලේඛන, ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වැනි වගන්තිය යටතේ ගැසට් පත්‍රය, එම කලාපයට අදාළ වැදගත් යැයි සලකනු ලබන සියළුම ලිපි හුවමාරු පිළිබඳ විස්තර, කලාප අංක පිළිබඳ විස්තරය, භාවිතා කරන ලද ඉඩම් කැබලි අංක සහ ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක ආදිය සහ වෙනත් වැදගත් කරුණු, අදාළ කලාපයේ මැනුම් කටයුතු සම්බන්ධ ලිපි හුවමාරු පිළිබඳ විස්තරද මෙම ගොනුවේම ගොනු කළ යුතුය.

21.80 පහත සඳහන් ලේඛනද දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගබඩා කළ යුතුය.

අ) මුල් කැඩැස්තර සිතියම, ඉඩම් විස්තර ලැයිස්තුවල මුද්‍රිත පිටපත් සහ ඒවායේ ඡායාස්ථිති පිටපතක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගබඩා කළ යුතුය. කිසි විටකත් මුල් පිටපත සහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ පිටපත ක්ෂෙත්‍රයට නිකුත් නොකළ යුතුය.

ආ) අදාළ කැඩැස්තර සිතියම, කැඩැස්තර පිඹුරු, ඉඩම් විස්තර ලැයිස්තුව සහ අදාළ අංකිත ගොනු පරිගණක දෘඩ තැටිවල ද එක් සංගත තැටියක ද ඇතුලත් කර ගබඩා කළ යුතුය. එම සංගත තැටියේ අනු පිටපතක් ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ගබඩා කිරීම සඳහා යැවිය යුතුය.

ඇ) සියළුම අංකිත දත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශ අනුව වෙන් කර හඳුනාගත හැකි වන පරිදි ගබඩා කළ යුතුය.

කැඩැස්තර සිතියම් ප්‍රදේශයක සිදු කරනු ලබන පසුකාලීන මැනුම්

21.81 කැඩැස්තර සිතියම් ප්‍රදේශයක පසුකාලීන මැනුම් සිදු කළ හැකි වනුයේ 2002 අංක 17 දරන මැනුම් පනතේ 11 වන ඡේදය පරිදි සර්වේයර් ජනරාල් විසින් ප්‍රතීතන සහතික නිකුත් කර ඇති ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට පමණි. ලියාපදිංචි මිනින්දෝරුවරයා විසින් අදාළ අණපනත්, මැනුම් රෙගුලාසි, තාක්ෂණික අවශ්‍යතාවන් සපුරාලන පරිදි පසුකාලීන මැනීම සිදු කළ යුතුය.

21.82 කැඩැස්තර සිතියම් ප්‍රදේශයක සිදු කරනු ලබන පසුකාලීන මැනුම් වලදී හඳුන්වා දී ඇති නියමිත ආකෘතිපත්‍ර භාවිතා කළ යුතුය. සියළුම ආකෘති පත්‍ර ආදර්ශයන්, මිනින්දෝරු දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙන් (www.survey.gov.lk) සහ සියළුම මිනින්දෝරු කාර්යාල වලින් ලබා දීමට කටයුතු කළ යුතුය.

21.83 කැඩැස්තර මැනුම් ප්‍රදේශ යනු කැඩැස්තර සිතියම් සකස් කර අවසන් වූ ප්‍රදේශ වන අතර එම ප්‍රදේශ තුල ඉඩම් කැබලි නැවත මැනීමේදී පහත උපදෙස් අනුගමනය කළ යුතුය. කැඩැස්තර සිතියමක් තුල පහත ආකාරයේ ඉඩම් කැබලි නැවත මැනීමට අවශ්‍යවනු ඇත.

1) කැඩැස්තර සිතියම් සකස් කර ඇති හිමිකම් සහතික නිකුත් කර ඇති ඉඩම්
2) කැඩැස්තර සිතියම් සකස් කර ඇති නමුත් මෙතෙක් හිමිකම් සහතික නිකුත් කර නැති ඉඩම්. මෙම කාණ්ඩයේ ඉඩම් පහත දෙවර්ගයට අයත් වේ.
   (i) තනි අයිතිය ඇති නමුත් මෙතෙක් හිමිකම් සහතික නිකුත් කර නැති ඉඩම්
   (ii) හවුල් අයිතිය ඇති නිරවුල් නොමැති බැවින් ඒකාබද්ධ කර මැන ඇති සහ මෙතෙක් හිමිකම් සහතික නිකුත් කර නැති ඉඩම්

21.84 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 23 සහ 36 වැනි වගන්තිය අනුව පසුකාලීන මැනුම් සිදු කර කැඩැස්තර සිතියම් සකස් කිරීමේදී හා ඒවා පවත්වාගෙන යාමේදී ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් පහත උපදෙස් අනුගමනය කළ යුතුය. ඊට අනුකූල නොවන සේ කටයුතු කර ඉදිරිපත් කරන කැඩැස්තර සිතියම් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් කැඩැස්තර සිතියම් සංශෝධනය සඳහා යොදා නොගත යුතුය.

21.85 ඉහත 21.83 (1) යටතේ වූ සියළු ඉල්ලීම්, ඉඩම් හිමිකරු(වන්) විසින් ආකෘති පත්‍ර අංක 1 **(ඇමුණුම 08)** අනුව සකස් කර හිමිකම් රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකයක් සහිතව ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා වෙත භාරදිය යුතුය. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා වෙත ඉඩම් හිමිකරු විසින් ඉදිරිපත් කරන ඉල්ලීමට අදාළ ඉඩම සඳහා නිකුත් කර ඇති හිමිකම් සහතිකය හා ඊට අදාළ ඉඩම් සම්බන්ධයෙන් පනවා ඇති සෑම බැඳීම්/ කොන්දේසි (උදා: ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ

හෝ පළාත් පාලන ආයතන වලින් හෝ උකස්කර හෝ වෙනත් බැදීම් හා අයිතිවාසිකම් ආදිය සඳහා වන කොන්දේසි) වලට අනුකූලව මැනුම් සිදු කළ යුතුය.

21.86 පසුකාලීන මැනුම් ඉල්ලීම අදාළ පළාත් පාලන ආයතනයේ කොන්දේසි වලට අනුකූල නොවන අවස්ථා ඇත්නම් ලියාපදිංචි මිනින්දෝරුවරයා විසින් ඒ පිළිබඳව ඉඩම් හිමිකරු/ඉල්ලුම්කරු දැනුවත් කළ යුතු අතර ඒ පිළිබඳව ඉඩම් හිමිකරු/ ඉල්ලුම්කරුගෙන් ලිපියක් ලබා ගත යුතුය.

21.87 ඉහත 21.83.(2) (i) යටතේ වූ සියළු ඉල්ලීම්, ඉඩම් හිමිකරු විසින් ආකෘති පත්‍ර අංක 2 **(ඇමුණුම 09)** අනුව සකස් කර හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ සහතිකයක් සහිතව ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු වෙත හෝ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත හෝ භාරදිය යුතුය.

21.88 ඉහත 21.83.(2) (ii) යටතේ වූ සියළු ඉල්ලීම්, ඉඩම් හිමිකරු(වන්) විසින් ආකෘති පත්‍ර අංක 3 **(ඇමුණුම 10)** අනුව සකස් කර හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ සහතිකයක් සහිතව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට භාරදිය යුතුය. පසුකාලීන කැඩැස්තර මැනුම් සඳහා ඇමුණුම 09 හි ආකෘති පත්‍ර 02 සහ ඇමුණුම 10 හි ආකෘති පත්‍ර 03 යටතේ ඉදිරිපත් වන ඉල්ලීම් හවුල් අයිතියක් හෝ නිරවුල් නොවූ නොබෙදූ අයිතියක් සහිත ඉඩමකට අදාළ වන්නේ නම් එම ඉල්ලීම අනිවාර්යයෙන්ම හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ විමර්ශණයට යැවිය යුතු අතර ඔහුගේ ඉල්ලීම / වාර්තාව ලැබූ පසුව කටයුතු කළ යුතුය.

21.89 මුල් මැනුමට අදාළ අංකිත දත්ත නොමැති විට අවශ්‍ය පැරණි පිඹුරු පිටපත්/ ක්ෂෙත්‍ර සටහන් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ලබා ගත යුතුය. මෙම දත්ත ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් වෙත ලබා දීමට අදාළ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි කටයුතු කළ යුතුය. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් මෙම දත්ත ඉල්ලුම් කිරීමේදී ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කරන ලද අදාළ ආකෘති පත්‍ර අංක 1 හෝ 2 හෝ 3 සමඟ ආකෘති පත්‍ර අංක 4 **(ඇමුණුම 11)** ඉදිරිපත් කළ යුතුය. එසේ ඉල්ලුම් කිරීමේදී ෆැක්ස් පනිවිඩ ක්‍රමය සහ විද්‍යුත් තැපෑල භාවිතා කළ හැක.

21.90 කැඩැස්තර සිතියම් සකස් කර, හිමිකම් සහතික නිකුත් කර ඇති ඉඩම් වෙනත් පන්තියක හිමිකම් සහතික නිකුත් කළ ඉඩමක්/ඉඩම් සමඟ හෝ මෙතෙක් හිමිකම් සහතික නිකුත් කර නැති ඉඩමක්/ඉඩම් සමඟ ඒකාබද්ධ කිරීම හෝ ඒකාබද්ධ කර අනුබෙදුම් කිරීම නොකළ යුතුය.

21.91 ලියාපදිංචි මිනින්දෝරුවරයා විසින් අදාළ බිම් කැබැල්ල පොළවේ නිවැරදිව හා පැහැදිලිව හඳුනාගෙන මැනුම් කටයුතු කළ යුතුය. මැනුමට අදාළ ඉඩමේ අයිතිකරු විසින් යාබද ඉඩමේ හෝ ඉඩම් වලින් යම් කොටසක් අනවසරයෙන් භුක්ති විඳින විට අනවසරයෙන් භුක්ති විඳින කොටස අතහැර මුල් වට මායිමට අදාළ කොටස පමණක් මැනීම කළ යුතුය. එසේ කිරීමට ඉල්ලුම් කරු එකඟතාවය පල නොකරයි නම් ඉදිරි කටයුතු නොකළ යුතුය.

21.92 යාබද ඉඩම් හිමියා විසින් මැනුමට අදාළ ඉඩමෙන් කොටසක් අනවසරයෙන් අල්ලාගෙන ඇති අවස්ථා වල ඒ පිළිබඳව යාබද කට්ටිකරුට පැහැදිලි කර දී මුල් මායිම නැවත පිහිටුවා පෙන්වා දිය යුතුය. අනවසරකරු විසින් එලෙස මායිම් නිවැරදි කර ගැනීමට අකමැති අවස්ථා වලදී එම අනවසර කොටස් මැන වෙනමම කැබලි අංක යොදා පිඹුරු සකස් කළ යුතු අතර එසේ කිරීමට ඉල්ලුම් කරු එකඟතාවය පළ නොකරයි නම් ඉදිරි කටයුතු නොකළ යුතුය.

21.93 කැඩැස්තර සිතියමෙහි ඇති ඉඩමකින් කුඩා ඉඩම් ප්‍රමාණයක් වෙන් කිරීම සඳහා ඉල්ලීමක් ලද විටක එම කුඩා ඉඩම් ප්‍රමාණය පමණක් මැනීම කළ යුතු අතර ඉඩමේ ඉතිරි කොටස ලබා දී ඇති අංකිත දත්ත අනුසාරයෙන් කැඩස්තර සිතියම් ගත කර වැඩ අවසන් කළ යුතුය. එවැනි අවස්ථාවකදී ඒ පිළිබඳව මිනින්දෝරු වාර්තාවේ සඳහන් කළ යුතුය.

21.94 අනුබෙදීම්/ඒකාබද්ධ කිරීම් වලදී, අලුතින් පිහිටුවන මායිම් ලක්ෂ්‍ය ස්ථිර මායිම් ලක්ෂ්‍ය විය යුතු අතර ඒවා අවම වශයෙන් සෙ.මී 5 ක නිරවද්‍යතාවයකින් මැනුම් කළ යුතුය. එම ස්ථිර මායිම් ලක්ෂ්‍ය ඉල්ලුම්කරු(වන්)ට පෙන්වා දී ඒවා බලා ගත් බවට අත්සන් ලබා ගත යුතු අතර එම අත්සන් සහිත ලිපිය ගොනුවට ඇතුලත් කළ යුතුය.

21.95 අනුබෙදීම් හා ඒකාබද්ධ කිරීම් යටතේ ලැබෙන නව කැබලි වල වර්ග ප්‍රමාණයන්ගේ එකතුව මුල් හිමිකම් සහතික වලට අදාළ මුළු වර්ගප්‍රමාණයට සමාන බවට සනාථ කර අදාළ නව කැබලි සඳහා කැඩැස්තර සිතියම් සකස් කළ යුතුය. මුල් වර්ග ප්‍රමාණයේ දෝෂයක් ඇතිනම්, නැවත පරීක්ෂා කර ඒ බව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත වාර්තා කළ යුතුය. මුල් මැනුමේ දෝෂයක් ඇත්නම් එය නිවැරදි කරවීම සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් නොපමාව කටයුතු කළ යුතුය.

21.96 ක්ෂේත්‍ර මැනුම් නිම කර පිඹුරු දළ පිටපතක් පිළියෙල කිරීමෙන් පසු නව කැඩැස්තර සිතියමට අදාළ නිශ්චිත කැබලි සංඛ්‍යාව සහ ඉ.වි.ලැ පිටු ගණන තීරණය කර අවශ්‍ය වන නව පත්‍ර අංක, කැබලි අංක, ඉ.වි.ලැ පිටු අංක ආදිය මිනින්දෝරු අධිකාරී මඟින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගෙන් ඉල්ලුම් කළ යුතුය. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් එසේ අවසන් විස්තර ඉල්ලුම් කිරීමේදී ආකෘති පත්‍ර අංක 5 (ඇමුණුම 12) භාවිතා කළ යුතුය. මෙම තොරතුරු හැකිතාක් දුරට විද්‍යුත් තැපෑල මඟින් ලබාදී සිදුවන ප්‍රමාදයන් අවම කරගත යුතුය.

21.97 කැඩැස්තර සිතියම් තුල පසුකාලීන මැනුම් සඳහා අළුත් ක්ෂේත්‍ර පත්‍ර භාවිතා කළ යුතුය. කිසිවිටකත් කැඩැස්තර සිතියම් සඳහා අතිරේක පිඹුරු අංක නිකුත් නොකළ යුතුය. ක්ෂේත්‍ර පත්‍ර අංක, කැබලි අංක සහ ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක ඒ ඒ කලාපය සඳහා භාවිතා කරන ලද අවසාන අංකයේ සිට පිළිවෙලට භාවිතා කළ යුතුය. අවසානයට භාවිතා කළ ක්ෂේත්‍ර පත්‍ර අංකය, කැබලි අංක, ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක නිකුත් කිරීම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් කළ යුතුය. නිකුත් කරන ලද කැඩැස්තර සිතියම් අංක, කලාප අංක, පත්‍ර අංක, ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක, ඉඩම් කැබලි අංක සඳහන් ලේඛනයක් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පවත්වාගෙන යා යුතුය. එම ලේඛනයේ එක් එක් කලාපයක් සඳහා වෙන වෙනම පිටු භාවිතා කළ යුතුය. (ඇමුණුම 13)

21.98 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මඟින් පසුකාලීන මැනුම් සිදුකරන විට, පරීක්ෂා කිරීමේ ගාස්තු වශයෙන් සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ලබන මුදල් අනුබෙදුම් කැබලි ගණන දහය ඉක්මවන පිඹුරු සඳහා ඉල්ලුම්කරු විසින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ගෙවිය යුතුය. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා විසින් අවසන් විස්තර ඉල්ලුම් කළ පසු අදාළ ගාස්තුව ගෙවන ලෙස ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාට පිටපත් සහිතව ඉල්ලුම්කරුට දැන්විය යුතුය.

21.99 ඉහත 21.83.(1) සහ 21.83.(2) (i) යටතේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් පසුකාලීන මැනුමක් සිදු කරන විට එම ප්‍රදේශයේ විශාලත්වය අනුව මැනුම් පිඹුරු සහ ඉඩම් විස්තර ලැයිස්තු සකස් කිරීමේදී පිළිවෙලින් GSM 110 සහ GSM 80 ට නොඅඩු ගණකමකින් හා ඉහල ප්‍රමිතියකින් යුත් A4/ A3 ප්‍රමාණයේ පත්‍ර භාවිතා කළ යුතුය.(ආදර්ශ පිඹුර සඳහා ඇමුණුම 14 බලන්න.) ඉඩම් විස්තර ලැයිස්තු සකස් කිරීමේදී දෙපාර්තමේන්තුවේ ඉඩම් විස්තර දත්ත පද්ධතිය අනිවාර්යයෙන්ම භාවිතා කළ යුතුය.

21.100 කැඩැස්තර සිතියම්වල පසුකාලීනව සිදුකරනු ලබන මැනුම්වලදී කැඩැස්තර සිතියම සහ අදාළ ඉඩම් විස්තර ලැයිස්තු අ.ග.පි. වල මෙන් 12.62– 12.65 වැනි ඡේදයන්හි දක්වා ඇති පරිදි සංශෝධනය කළ යුතුය.

21.101 දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් නිකුත් කරන අංකිත දත්ත, අඩංගු නියමිත දත්ත ස්ථර වලම, නව දත්ත ඇතුලත් කර පසුකාලීන මැනුම් පිඹුරු අංකිත දත්ත .dxf ගොනු දිගු මඟින්ද, ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම TLDMS භාවිතා කර සිදු කළ යුතුය. පසුකාලීන මැනුම් අංකිත දත්තද

කැඩැස්තර මුල් මැනුම් ආකාරයටම දිස්ත්‍රික් කාර්යාලයේදී 22.25 ඡේදය අනුව සකස් කර දත්ත SRIMS පද්ධතිය හරහා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ඉඩම් තොරතුරු පද්ධති අංශයට එවිය යුතුය.

21.102 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා විසින් අවසන් විස්තර ලබාගත් පසු පිඹුරු පිටපත් සහ ඊට අදාළ අංකිත දත්ත සති දෙකක් ඇතුලත දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත හෝ ඉඩම් පිහිටි දිස්ත්‍රික්කයේ ඇති ආසන්නතම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට භාර දිය යුතුවේ. ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය වෙත ලැබෙන පිඹුරු අදාළ මිනින්දෝරු අධිකාරි විසින් අනුපිළිවෙලට අංක කර, අනෙකුත් රාජකාරිද සමඟ සැලසුම් කර සතියේ වැඩ කරන දින දෙකක් ඇතුලත ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යැවීමට කටයුතු කළ යුතුය.

21.103 නොවැලැක්විය හැකි හේතුවක් මත, අවසන් විස්තර ලබාගෙන සති දෙකක් ඇතුලත පිඹුරු භාර දීමට අපහසු අවස්ථාවකදී නියමිත කාලය ඉක්ම යාමට ප්‍රථම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා විසින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි දැනුවත් කර දින දීර්ඝයක් ලබා ගත යුතුය.

21.104 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා විසින් පසුකාලීන මැනුමට අදාළ පහත ලේඛන දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත භාර දිය යුතු අතර එම ලේඛන වල පිටපත් ඇතුලත් අමතර ගොනුවක් ද තමා වෙත ආරක්ෂිතව පවත්වා ගෙන යා යුතුය.

- ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් (ආකෘති පත්‍ර අංක 1 හෝ 2 හෝ 3 පිලිවෙලින් **ඇමුණුම 08 හෝ ඇමුණුම 09 හෝ ඇමුණුම 10**)
- සෑම පිටුවකම අත්සන සහිතව පිඹුර සහ ඉ.වි. ලැයිස්තුව (ආකෘති පත්‍ර අංක 8 පිටපත් 2/ ආකෘති පත්‍ර අංක 9 පිටපත් 1) - **ඇමුණුම 14**
- ක්ෂේත්‍ර සටහන් (සහතික පිටපතක්)
- නව මැනුමට අදාළ සම්පූර්ණ පිඹුර, ඉ.වි.ලැයිස්තුව සහ එක් එක් කැබලි සඳහා වූ පිඹුරුවල අංකිත දත්ත ඇතුලත් සංගත තැටිය
- අවසන් විස්තර ලබා ගත් ලිපිය. (ආකෘති පත්‍ර අංක 5 - **ඇමුණුම 12**)
- සංශෝධන අනුරේඛන පිටපත් 2 යි
- ආගණන පත්‍ර
- අනුබෙදුම් පළාත් පාලන ආයතනයේ කොන්දේසි වලට අනුකූල නොවන විට ඒ සඳහා වූ ඉල්ලුම් කරුගෙන් ලබාගත් ලිපිය
- බණ්ඩාංක පත්‍ර
- ඉල්ලුම්කරු(වන්) මායිම් බලා ගත් බවට ලිපිය
- මිනින්දෝරු වාර්තාව (ආකෘති පත්‍ර අංක 6 -ඇමුණුම 15)

21.105 පසුකාලීන මැනුම් පිඹුරු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත ලැබෙන අනුපිළිවෙලට ලේඛන ගත කර, 21.104 ඡේදයෙහි සඳහන් ලේඛන සියල්ල පරීක්ෂා කර කැඩැස්තර සිතියම යාවත්කාලීන කිරීමට සුදුසු පරිදි නියමිත ප්‍රමිතීන්ට අනුකූලව පිඹුරු නිම කර ඇති බවට පරීක්ෂා කිරීම මිනින්දෝරු අධිකාරි (මූලස්ථාන) විසින් සිදු කළ යුතුය (ඇමුණුම 16). පිඹුරු පරීක්ෂා කිරීමේදී ක්ෂේත්‍ර පරීක්ෂණයක් කළ යුතු බවට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි තීරණය කළහොත් මිනින්දෝරු අධිකාරි (මූලස්ථාන) විසින් ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කර වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

21.106 ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි / මිනින්දෝරු අධිකාරි (මූලස්ථාන) විසින් ඉහත 21.83 (1) සහ 21.83 (2) (i) යටතේ වූ පසුකාලීන මැනුම් පරීක්ෂා කිරීම හා 21.112 ඡේදයෙහි පරිදි මුල් කැඩැස්තර සිතියමේ අවශ්‍ය සංශෝධන නිම කළ බවට තහවුරු කර ගත යුතුය. පහත විස්තර සහිතව සෙ.මී. 6 x සෙ.මී. 6 ප්‍රමාණයෙන් සකස් කරන ලද මුද්‍රාවක් පසුකාලීන මැනුම් පිඹුරේ සහ ඉඩම් විස්තර

ලැයිස්තුවේ සෑම කොටසකම මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සටහන සඳහා වන කොටසෙහි **(ආකෘති පත්‍ර අංක 8, 9)** තබා අත්සන් තැබිය යුතුය.

1. භාවිතා කර ඇති කැබලි අංක, පත්‍ර අංක සහ ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක නිවැරදිය.
2. මුල් කැඩැස්තර සිතියම සංශෝධනය කරන ලදි.

21.107 ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ඉහත 21.83.(2) (ii) යටතේ වූ පසුකාලීන මැනුම සර්වේයර් ජනරාල්ගේ පිඹුරු පරීක්ෂා කරන සහ අනුමත කරන ආකාරයටම සිදු කළ යුතුය.

21.108 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් සිදු කරනු ලබන පසුකාලීන මැනුමකට අදාළ ක්‍රියාදාමය, මැනුමේ නිවැරදිතාවය සහ පිඹුරේ අන්තර්ගතය පිළිබඳව අදාළ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා සම්පූර්ණයෙන් වගකිව යුතුය.

පිටපත් නිකුත් කිරීම සහ ගොනු පවත්වා ගෙන යෑම

21.109 ආකෘති පත්‍ර අංක 8 (ඇමුණුම 14) අනුව සකස් කරන ලද පසුකාලීන මැනුම් පිඹුරේ එක් පිටපතක් "ඉල්ලුම්කරුගේ පිටපත" ලෙස මුද්‍රාවකින් තබා ලියාපදිංචි මිනින්දෝරුවරයා වෙත ලබා දිය යුතුය. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා විසින් ඉදිරිපත් කරන ක්ෂෙත්‍ර සටහන් සහ මිනින්දෝරු වාර්තාව යන ලේඛන පමණක් පරිලෝකනය කර පිඹුරට අදාළ අංකිත දත්ත සමඟ සංගත තැටිගත කළ යුතුය. එම සංගත තැටිය ක.සි.අංකය/කලාප අංකය/පත්‍ර අංකය/කැබලි අංක ....සිට...දක්වා ලෙස අංකනය කර මුල් කැඩැස්තර සිතියමේ සංගත තැටි සමඟ ගොනු කළ යුතුය.

21.110 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් ඉහත 21.83(1), 21.83(2) (i) සහ 21.83(2) (ii) ගණයේ ඉඩම් සඳහා සකස් කළ පසුකාලීන මැනුම් පිඹුරු වල සහතික පිටපත් අදාළ දිස්ත්‍රික් හිමිකම් රෙජිස්ට්‍රාර් වෙත ද, 21.83 (2) (i) සහ 21.83(2) (ii) ගණයේ ඉඩම් සඳහා වූ පසුකාලීන මැනුම් පිඹුරුවල සහතික පිටපත් ඊට අමතර වශයෙන් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත ද යැවීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් කටයුතු කළ යුතුය. තවද එම පිඹුරේ සහතික පිටපත් ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයටත්, මුල් මැනුමේ අංකිත දත්ත ඇතුලත් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය බැවින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් SRIMS පද්ධතිය හරහා අංකිත දත්ත අනුමත ආකාරයට නම් කර ඉඩම් තොරතුරු පද්ධති අංශයටත් යැවිය යුතුය.

21.111 1998.10.21 දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන්, 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ නියෝග පරිදි හිමිකම් රෙජිස්ට්‍රාර් විසින් මෙම අළුත් ඉඩම් කොටස් ලියාපදිංචි කර එම ඉඩම් කොටස් වලට අදාළ හිමිකම් සහතික අංක දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ලැබීමෙන් අනතුරුව දිස්ත්‍රික් කාර්යාලයේ ලේඛන යථාවත් කළ යුතුය.

21.112 සියළුම පසු කාලීන කැඩැස්තර සිතියම් සඳහා පහත ක්‍රමවේදය අනුගමනය කරමින් මුල් කැඩැස්තර සිතියම යාවත්කාලීන කළ යුතුය.

(අ) අංකිත නොවන පිටපත්

1. කැඩැස්තර සිතියමට අදාළ මුල් පිටපත සහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි පිටපත සංශෝධනය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී අදාළ මිනින්දෝරුවරුන් විසින් කළ යුතුය.

2. පසු කාලීනව නිම කරන සියළුම මැනුම් වල වට මායිම අදාළ කැඩැස්තර සිතියමේ මුල් පිටපත මත පැන්සල් ඉරි මඟින් පෙන්වා නව පත්‍රයට යොමු සටහන් පැන්සලෙන් දැක්විය යුතුය.

3. කැඩැස්තර සිතියමෙහි ජ්‍යෂ්ඨ මිනින්දෝරු අධිකාරි පිටපත මත සහ ඉඩම් විස්තර ලැයිස්තුව මත සංශෝධන වලට අදාළ යොමු සටහන් තැබීම දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි වල දී ඇති උපදෙස් පරිදි කළ යුතුය.

4. පසු කාලීනව නිම කරන සියළුම නව පත්‍ර අදාළ කැඩැස්තර සිතියමෙහි අදාළ කලාපය සඳහා වන මුල් පිටපත සහිත ගොනුවේ ගොනු කළ යුතුය. ජ්‍යෙ.මි.අ. පිටපතද අදාළ කලාපය සහිත ගොනුවේ ගොනු කළ යුතුය.

5. පසු කාලීනව නිම කරන සියළුම කැඩැස්තර සිතියම් පත්‍රද පරිලෝකනය කර එම දත්ත පද්ධතිය පවත්වා ගෙන යාමට දිස්ත්‍රික් ජ්‍යෙ.මි.අ. විසින් කටයුතු යෙදිය යුතුය.

(ආ) අංකිත පිටපත්

කැඩැස්තර අංකිත සිතියමේ පිටපතක් ගෙන එහි වෙනම දත්ත ස්ථරයක පසු කාලීනව නිම කරන සියළුම නව පත්‍ර වල නව මායිම් රතු පාටින් ඇතුලත් කර දැක්විය යුතු අතර මුල් කැඩැස්තර සිතියම් කැබලි අංක / අංකය ඉවත් කර නව කැබලි අංක / අංකය රතු පාටින් දැක්විය යුතුය.

පරිවර්තිථ කැඩැස්තර සිතියම් අනුසාරයෙන් රේඛා චිත්‍ර පිළියෙල කිරීම

21.113 දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වලදී පරිවර්තිථ කැඩැස්තර සිතියම් අනුසාරයෙන් රේඛා චිත්‍ර පිළියෙල කිරීමේදී ඡායා පිටපතේ අදාළ කැබලි අංකය සහ යාබද කැබලි අංක රතු පාටින් කපා හැර නව කැඩැස්තර සිතියමේ කැබලි අංක රතු පාටින් දැක්වීම කළ යුතුය. මායිම් උපලේඛනය කැඩැස්තර සිතියමේ කැබලි වලට අනුව ලිවිය යුතුය. එමෙන්ම රේඛා චිත්‍ර සමඟ යොමු කරන ආවරන ලිපියේ හෝ රේඛා චිත්‍රයේ ‘‘මෙම පිඹුර කැඩැස්තර සිතියම් බවට පරිවර්තනය කර ඇත.’’ යන්න සඳහන් කළ යුතුය.

21.10 ඡේදය **ඇමුණුම 01**

කැඩැස්තර සිතියම් අංක නිකුත් කිරීමේ ලේඛනය

දිස්ත්‍රික්කය : .....

කැඩැස්තර සිතියම් අංකය	ප්‍රා.ලේ. කොට්ඨාශය	ගම/ග්‍රාම නිලධාරි කොට්ඨාශය	කලාප ගණන	මැනුම් ඉල්ලුම් අංකය	වෙනත්

21.16 ඡේදය **ඇමුණුම 02**



මායිම් ගැටලු විසඳීමට කටයුතු කළ ආකාරය - ලේඛන ආකෘතිය

අනු අංකය	මායිම් පෙන්වන ලේඛනයේ අනු අංකය	මායිම් ගැටලුව පිළිබඳව විස්තර	ගැටලුව විසඳූ ආකාරය	ඉඩම් කම්යාගේ අක්ෂර සහ ප්‍රා.ඇ.අංකය	විවර්ජන නිලධාරියාගේ නම හා අක්ෂර	ග්‍රාම නිලධාරියාගේ නම හා අක්ෂර	ර.මි/බ.මි.ගේ අක්ෂර

21.17 ඡේදය **ඇමුණුම 03**



මායිම් පෙන්වීම, ඉඩම් මැනීම, මහින ලද මායිම් බලාගැනීම දැක්වෙන ඡේදය ඇසුරිනි

අනු අංකය	ඒ ඒ ඡේදයන්ගේ ඇති අනු අංකය	ඉඩම් හිමියාගේ නම	ජා.හැ.අංකය	ඉඩම් හිමියන් විසින් සම්පූර්ණ කළ යුතුය						මැනීමට නොහැකි වී ඇත්නම් ඒ හේතුව සහ විසඳුම් සඳහා පිටුවට යොමුව
				මායිම් බලා ගැනීමට පැමිණෙන බවට එවූ ලිපිය ලද දිනය	නිවැරදිව මායිම් පෙන්වූ දින	ඉඩම් හිමිකරුගේ අත්සන	මැනීමට පැමිණෙන බවට එවූ ලිපිය ලද දිනය	මැනුම් කළ දිනය	මහින ලද මායිම් බලා ගත් බවට ඉඩම් හිමිකරුගේ අත්සන සහ ජා.හැ.අංකය	

කැඩැස්තර සිතියම් සඳහා දිස්ත්‍රික් අංක

ඌව	බදුල්ල	71
	මොනරාගල	72
දකුණ	ගාල්ල	81
	මාතර	82
	හම්බන්තොට	83
උතුරු	යාපනය	91
	කිළිනොච්චිය	92
	මුලතිව්	93
	මන්නාරම	94
	වවුනියා	95

21.39 ඡේදය ඇමුණුම 05

පරිවර්තිත කැඩැස්තර සිතියම් කැබලි අංක දක්වන ලේඛනය

ව්‍යවස්ථාපිත පිඹුරු අංකය	:	කැඩැස්තර සිතියම් අංකය	:
ගම	:	කලාප අංකය	:
ප්‍රාලේ කොට්ඨාශය	:	පත්‍ර අංකය	:
දිස්ත්‍රික්කය	:	ගම	:
පළාත	:	ප්‍රා.ලේ. කොට්ඨාශය	:
		ග්‍රා.නි. කොට්ඨාශය	:

පැරණි කැබලි අංකය	කැඩැස්තර සිතියම් කැබලි අංකය
1	251
2	252
3	253
4	254
$5\frac{1}{2}$	255
$5\frac{2}{2}$	256
6	257
7	258
8	259
9	260
10	261
අංක නොයෙදූ අඩි පාර	262
අංක නොයෙදූ ඇළ	263

පිළියෙළ කළේ:-
නම
ලියාපදිංචි මිනින්දෝරු
දිනය

පරීක්ෂා කළේ:-
නම
මිනින්දෝරු අධිකාරි
දිනය

අනුමත කළේ:-
නම
ජ්‍යෙ. මිනින්දෝරු අධිකාරි (..... දිස්ත්‍රික්කය)
සර්වේයර් ජනරාල් වෙනුවට
දිනය

21.68 ඡේදය ඇමුණුම 06

කැඩැස්තර මැනුම් සඳහා මිනින්දෝරුවරයාගේ වාර්තාව

1. කැඩැස්තර සිතියම් අංකය :
2. කලාප ..... න් ..... වෙනි කලාපය
3. පත්‍ර අංකය :
4. කොටස් ගණන:
5. කැබලි ගණන රජයේ : පුද්ගලික: එකතුව:
6. ප්‍රමාණය රජයේ : පුද්ගලික: එකතුව:
7. ඉ.වි. ලැයිස්තු පිටු ගණන:
8. ගම:
9. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:
10. දිස්ත්‍රික්කය:
11. පළාත
12. මිනින්දෝරුවරයාගේ නම:
13. මැනුම් ආරම්භ කළ දිනය :
14. ක්ෂේත්‍ර වැඩ සඳහා යෙදුණ දින ගණන:
15. පිඹුරු වැඩ සඳහා යෙදුණ දින ගණන :
16. ක්ෂේත්‍ර කටයුතු නිම කළ දිනය :
17. පිඹුර වැඩ නිම කළ දිනය :
18. මිනින්දෝරු අධිකාරිවරයාගේ නම :
19. මිනින්දෝරු අධිකාරි විසින් පිඹුර පරීක්ෂා කළ දිනය :
20. භාවිතා කරන ලද ක්ෂේත්‍ර පොත් අංක :
21. තහනම් කෙරුණු /සංශෝධිත සියළුම පිඹුරුවල ලැයිස්තුව අමුණා ඇත.
22. සංශෝධන අනුරේඛන පිළියෙල කළේද ? ඔව්/නැත
23. ජාතික සිතියම් යොමු අංකය :
24. ක්ෂේත්‍ර වැඩ සඳහා භාවිතා කළ උපකරණය :
25. ඛණ්ඩාංක කරන ලද මෘදුකාංගය :
26. පරිගණක දත්ත ලිපිගොනුවල නම් - මූලික ඛණ්ඩාංක .DAT, Index file – idx, Drawing file- dxf
27. මායිම් පෙන්වා දෙන ලද ග්‍රාම නිලධාරීන්ගේ නම සහ කොට්ඨාශය .....
    .....
28. භාවිතා කරන ලද මායිම්ගල් ගණන මායිම්ගල් ....., පිහිටි මායිම්ගල් .....
29. පොළොව මතු පිට පිහිටුවන ලද පාලන ලක්ෂ්‍ය සංඛ්‍යාව .....
30. වට මායිම මනින ලද්දේ උතුර .....
    නැගෙනහිර .....
    දකුණ .....
    බටහිර .....

31. වෙනත් වැදගත් කරුණු .....
32. පත්‍රදාර සහ පොදු මායිම් සැසඳීම කරන ලදි . ඔව්/නැත
33. මුළු මැනුම් වියදම:
34. ආරාවුල් වාර්තා වූ ඉඩම් කැබලිවල අංක :
35. ආගනනයන් පරීක්ෂා කළ ක්‍රමය :
36. මිනින්දෝරුවරයාගේ නම, අත්සන සහ දිනය .....

21.76 ඡේදය **ඇමුණුම 07**

මිනින්දෝරු අධිකාරිගේ සහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ පරීක්ෂණ ලැයිස්තුව :

1. ගමෙහි නමට ඉදිරියෙන් කැඩැස්තර සිතියම් අංකය සඳහන් කර තිබේද?
2. ගමෙහි මායිම්, යාබද ගම්වල මායිම් සමඟ සසඳා බැලීම
3. අවශ්‍ය නිරවද්‍යතාවයන් හා ප්‍රමිතීන් පවත්වා ඇත්ද?
4. සියළුම ඉඩම් කොටස් , කැඩැස්තර සිතියමේ සහ ක්ෂේත්‍ර පොතෙහි නිවැරදිව අංකනය කර ඇති බව
5. සියළුම ඉඩම් කොටස්වල, කැඩැස්තර සිතියමේ සහ ක්ෂේත්‍ර පොතෙහි පියවා ඇති බව
6. සියළුම මායිම් කැඩැස්තර සිතියමේ සහ ක්ෂේත්‍ර පොතෙහි නිර්ණය කොට විස්තර කර ඇති බව
7. පොළොව මතු පිට පාලන ලක්ෂ්‍ය ප්‍රමාණවත් සංඛ්‍යාවක් පිඹුරේ පෙන්වා ඇති බව
8. පැරණි මැනුම් අන්තර්ගත කිරීම නිවැරදිව කර ඇති බව
9. අළුතින් මනින ලද ප්‍රදේශ සහ පැරණි මැනුම් අන්තර්ගත කරන ලද ප්‍රදේශ අතර පරතරයන් සහ /හෝ අත්‍යක්‍රමනයවීම් නොමැති බව
10. පොළොව මතු පිට පාලන ලක්ෂ්‍ය සඳහා බණ්ඩාංක අගයන් දක්වා ඇති බව
11. සියළුම මායිම් ලක්ෂ්‍යයන්ගේ බණ්ඩාංකයන් ගණනය කොට, ක්ෂේත්‍ර පොතෙහි දක්වා ඇති බව
12. පරිගණක දත්ත ලිපිගොනු නිවැරදිව පිළියෙල කොට, නම් කර, ගබඩාගත කර ඇති බව
13. පත්‍ර දාර සැසඳීම
14. පැරණි ව්‍යවස්ථාපිත මැනුම් සහ දම්වැල් 16 රේඛා චිත්‍ර නිසි පරිදි යොමු සටහන් යොදා සංශෝධන අනුරේඛන පිළියෙල කර ඇති බව
15. 1:10000 දර්ශක සටහන විධිමත්ව පිළියෙල කර සහ සංශෝධනය කර සංශෝධිත අනුරේඛන පිළියෙල කර ඇති බව
16. ඉඩම් විස්තර ලැයිස්තුවේ දක්වා ඇති තොරතුරු ක්ෂේත්‍ර පොත හා සැසඳෙන බව සහ ඒවා කැඩැස්තර මැනුමේ අවශ්‍යතාවන්ට අනුකූල වන බව
17. දක්වා ඇති බිම් ප්‍රමාණයන් නිවැරදිව පරීක්ෂා කර ඇති බව
18. මිනින්දෝරුවරයාගේ වාර්තාවේ පරිපූර්ණ බව සහ නිරවද්‍යතාවය
19. පිරිවැය බිල නිවැරදිව සකස් කර ඇති බව
20. කාලය නිශ්චය කිරීම සහ ඒ අනුව කටයුතු සපුරා තිබීම (ප්‍රමාදයන් ඇත්නම් හේතු දැක්විය යුතුය)
21. පත්‍ර දාරවල ඛංඩාංක අගයන්
22. කැඩැස්තර සිතියමේ දෘඩ පිටපත, මෘදු පිටපත සහ එකඟ වන බව

21.85 ඡේදය **ඇමුණුම 08**

ආකෘති පත්‍ර අංක 1

හිමිකම් සහතික නිකුත් කළ ඉඩම් අතුරු බෙදීම/ ඒකාබද්ධ කිරීම සඳහා මැනුම් කිරීමට ඉල්ලීම

1. අයිතිකරුගේ/ අයිතිකරුවන්ගේ නම : .....
2. ජාතික හැඳුනුම්පත් අංකය/අංක : .....
3. ලිපිනය/ලිපිනයන්: .....
   .....
4. ඉල්ලීම අතුරු බෙදීමක්ද/ ඒකාබද්ධ කිරීමක්ද යන වග :
5. ඒකාබද්ධ කිරීමට/අතුරු බෙදීමට යෝජිත ඉඩම පිළිබඳ විස්තරය:
   (i) පිහිටීම: (අ). දිස්ත්‍රික්කය: .....
   (ආ). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: .....
   (ඇ). ග්‍රාම නිලධාරී කොට්ඨාශය: .....
   (ඈ). ග්‍රාමය හෝ නගරය: .....
   (ඉ). වීථිය හා වරිපනම් අංකය: .....
   (ii) කැඩැස්තර සිතියමේ අංකය: .....
   (iii) ඉඩම් කොටසේ /කොටස් වල කැබලි අංකය/අංක: .....
   (iv) ඉඩමේ ප්‍රමාණය/ප්‍රමාණ : .....
   (v) ඉඩම තුල ඇති ස්ථිර ඉදිකිරීම්, වගාවන් යනාදිය පිළිබඳ විස්තර: .....
   (vi) අතුරු බෙදීම/ඒකාබද්ධ කිරීම අවශ්‍ය ආකාරය : .....

6. හිමිකම් සහතිකයේ/සහතික වල අංක: ..... (පිටපත් අමුණා ඇත)
7. රජයෙන් ලබා දුන් දීමනා පත්‍ර ඇති ඉඩමක් නම්, අනුබෙදීම් සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය අමුණා ඇත/නැත.
8. ඒකාබද්ධ කිරීමක් නම්, සියළු හිමිකරුවන්ගේ එකඟතාවය අමුණා ඇත.
9. අදාළ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් අධිකරණයේ කිසිදු නඩු කටයුත්තක් නොමැති බවද සහතික කරමි/කරමු.
10. ඉඩමට අදාළ වෙනත් බැඳීම් හා කොන්දේසි : .....
11. මැනුම කරවා ගනු ලබන්නේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු මඟින් නම් ඔහු/ඇය ගේ නම සහ ලියාපදිංචි අංකය : .....
12. මැනුම සඳහා වන රජයේ ගාස්තුව ගෙවීමට එකඟ වෙමි/වෙමු.

....

දිනය අයිතිකරු/අයිතිකරුවන්ගේ අත්සන්

13. <u>ඉඩම පිහිටි පෘදේශයට අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් රෙජිස්ට්‍රාර්ගේ සටහන්</u>

මෙම ඉඩම ඒකාබද්ධ කිරීම/අතුරු බෙදීම සඳහා මැනුම් කිරීමට ..... මයා/ මිය විසින් කරන ලද ඉල්ලීම අනුව එම මැනුම සිදු කර පිඹුරු ඉදිරිපත් කරන තෙක් මෙම ඉඩමේ පසු ගනු දෙනු කටයුතු තාවකාලිකව නතර කරමි.

හිමිකම් රෙජිස්ට්‍රාර් ගේ නම : .....

අත්සන හා දිනය : .....

නිල මුද්‍රාව

21.87 ඡේදය ඇමුණුම 09

ආකෘති පත්‍ර අංක 2

හිමිකම් සහතික නිකුත් නොකළ ඉඩම් අතුරු බෙදීම/ ඒකාබද්ධ කිරීම සඳහා මැනුම් කිරීමට ඉල්ලීම

1. අයිතිකරුගේ නම : .....
2. ජාතික හැඳුනුම්පත් අංකය : .....
3. ලිපිනය: .....

.....

4. ඉල්ලීම අතුරු බෙදීමක්ද/ ඒකාබද්ධ කිරීමක්ද යන වග :
5. ඒකාබද්ධ කිරීමට/අතුරු බෙදීමට යෝජිත ඉඩම් පිළිබඳ විස්තරය:

(i) පිහිටීම: (අ). දිස්ත්‍රික්කය: .....

(ආ). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: .....

(ඇ). ග්‍රාම නිලධාරී කොට්ඨාශය: .....

(ඈ). ග්‍රාමය හෝ නගරය: .....

(ඉ). වීථිය හා වරිපනම් අංකය: .....

(ii) කැඩැස්තර සිතියමේ අංකය: .....

(iii) ඉඩම් කොටසේ /කොටස් වල කැබලි අංකය/අංක: .....

(iv) ඉඩමේ ප්‍රමාණය/ප්‍රමාණ : .....

(v) ඉඩම තුල ඇති ස්ථිර ඉදිකිරීම්, වගාවන් යනාදිය පිළිබඳ විස්තර

(vi) අතුරු බෙදීම/ඒකාබද්ධ කිරීම අවශ්‍ය ආකාරය : .....

6. රජයෙන් ලබා දුන් දීමනා පත්‍ර ඇති ඉඩමක් නම්, අනුබෙදීම් සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය අමුණා ඇත/නැත.
7. අදාළ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් උසාවියේ කිසිදු නඩු කටයුත්තක් නොමැති බවද සහතික කරමි/කරමු.
8. ඉඩමට අදාළ වෙනත් බැඳීම් හා කොන්දේසි : .....
9. මැනුම කරවා ගනු ලබන්නේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු මඟින් නම් ඔහු/ඇය ගේ නම සහ ලියාපදිංචි අංකය : .....
10. මැනුම සඳහා වන රජයේ ගාස්තුව ගෙවීමට එකඟ වෙමි/වෙමු.

....

දිනය අයිතිකරුගේ අත්සන

11. හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා කැඩැස්තර සිතියම් පිළියෙල කර හිමිකම් සහතික නිකුත් කිරීමට කටයුතු කෙරෙමින් ඇති ඉඩම් සඳහා වන අතුරු බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් **සඳහා පමණක් සම්පූර්ණ කරන්න.**

මෙම ඉඩම ඒකාබද්ධ කිරීම/අතුරු බෙදීම සඳහා මැනුම් කිරීමට..... මයා/ මිය විසින් කරන ලද ඉල්ලීම අනුව එම මැනුම සිදු කර පිඹුරු ඉදිරිපත් කරන තෙක් මෙම ඉඩමේ හිමිකම, ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු තාවකාලිකව නතර කරමි.

හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ නම : .....

අත්සන හා දිනය : .....

නිල මුද්‍රාව

ආකෘති පත්‍ර අංක 3

හවුල් අයිතිය ඇති නිරවුල් නොමැති බැවින් ඒකාබද්ධ කර මැන ඇති ඉඩම් අතුරු බෙදීම/ ඒකාබද්ධ කිරීම සඳහා මැනුම් කිරීමට ඉල්ලීම

1. ඉල්ලුම්කරුවන්ගේ නම්	2. ජාතික හැඳුනුම්පත් අංක	3. ලිපිනය

4. ඉල්ලීම අතුරු බෙදීමක්ද/ ඒකාබද්ධ කිරීමක්ද යන වග :
5. ඒකාබද්ධ කිරීමට/අතුරු බෙදීමට යෝජිත ඉඩම පිළිබඳ විස්තරය:

(i) පිහිටීම: (අ). දිස්ත්‍රික්කය: .....

(ආ). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: .....

(ඇ). ග්‍රාම නිලධාරී කොට්ඨාශය: .....

(ඈ). ග්‍රාමය හෝ නගරය: .....

(ඉ). වීථිය හා වරිපනම් අංකය: .....

(ii) කැඩැස්තර සිතියමේ අංකය: .....

(iii) ඉඩම් කොටසේ /කොටස් වල කැබලි අංකය/අංක: .....

(iv) ඉඩමේ ප්‍රමාණය/ප්‍රමාණ : .....

(v) ඉඩම තුල ඇති ස්ථිර ඉදිකිරීම්, වගාවන් යනාදිය පිළිබඳ විස්තර

(vi) අතුරු බෙදීම/ඒකාබද්ධ කිරීම අවශ්‍ය ආකාරය : .....

7. රජයේ ඉඩමක් නම්, අනුබෙදීම් සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය අමුණා තිබිය යුතුය.
8. අදාළ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් උසාවියේ කිසිදු නඩු කටයුත්තක් නොමැති බවද සහතික කරමි/කරමු.
9. ඉඩමට අදාළ වෙනත් බැඳීම් හා කොන්දේසි : .....
10. මැනීම කරවා ගනු ලබන්නේ සර්වේයර් ජනරාල්/ලියාපදිංචි බලයලත් මිනින්දෝරු වරයෙකු මගිනි.
11. මැනුම කරවා ගනු ලබන්නේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු මඟින් නම් ඔහු/ඇය ගේ නම සහ ලියාපදිංචි අංකය : .....
12. මැනුම සඳහා වන රජයේ ගාස්තුව ගෙවීමට එකඟ වෙමි/වෙමු.

ඉල්ලුම්කරුවන්ගේ නම්	අත්සන	දිනය

13. <u>හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ සටහන්</u>

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (.....දිස්ත්‍රික්කය)

මෙම ඉඩම(ම්) පිළිබඳ විමර්ශනය කරන ලදි. මේ සමඟ එවනු ලබන උපලේඛනයට අනුව ඉඩම් ඒකාබද්ධ කිරීම/අතුරු බෙදීම සඳහා මැනුම් කර කැඩැස්තර සිතියම් සකස් කිරීමට ..... මයා/ මිය විසින් කරන ලද ඉල්ලීම අනුව එම මැනුම සිදු කර පිඹුරු ඉදිරිපත් කරන තෙක් මෙම ඉඩමේ හිමිකම, ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු තාවකාලිකව නතර කරමි.

හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ නම : .....
අත්සන හා දිනය : .....
නිල මුද්‍රාව

21.89 ඡේදය ඇමුණුම 11

ආකෘති පත්‍ර අංක 4

(පිටපත් දෙකකින් යුතුව සම්පූර්ණ කළ යුතුය)

අංකිත දත්ත ඉල්ලුම් කිරීම

දිස්ත්‍රික් ඡෝ.මි.අ

ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ලේඛන වල මුල් පිටපත් පරීක්ෂා කර බලා අදාළ ඉල්ලුම්කරුගේ අනන්‍යතාවය පිළිබඳ සෑහීමකට පත් වී මැනුම සිදු කිරීමට එකඟත්වය පල කරමි.

අදාළ අංකිත දත්ත මා / අයදුම්කරු /පණිවිඩකරු/විද්‍යුත් තැපෑල වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි.

මෙම ඉල්ලීමට අනුකූලව ලබා ගෙන ඇති අංකිත දත්ත මෙම මැනුමට සහ/ හෝ එම ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් වන වෙනත් අවශ්‍යතාවයක් සඳහා වන මැනුමකට පමණක් භාවිතා කරන බව මෙයින් සහතික වෙමි. තවද, මේ සමඟ දත්ත පිටපත් කිරීමට සංගත තැටියක් ද ඉදිරිපත් කරමි.

....

දිනය ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාගේ නම හා අත්සන

වාර්ෂික බලපත්‍ර අංකය:

ප්‍රතිතන සහතික අංකය:

.....

දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

මැනුමෙහි යොමු අංකය :

අංකිත දත්ත නිකුත් කිරීම

අංකිත දත්ත නිකුත් කරන්න.

-

ඡෝ. මිනින්දෝරු අධිකාරි/ මිනින්දෝරු අධිකාරි (බිම්සවිය ඒකකය) ගේ අත්සන හා දිනය

<u>අංකිත දත්ත භාර ගැනීම</u>

අදාළ කැබලිවල අංකිත දත්ත සමන්විත සංගත තැටියක් පරීක්ෂා කර බලා භාරගතිමි.

දිනය භාරගත් අයගේ නම සහ අත්සන

21.96 ඡේදය ඇමුණුම 12

ආකෘති පත්‍ර අංක 5

අවසාන ඉඩම් විස්තර ලැයිස්තු/ කැබලි විස්තර නිකුත් කිරීම

(පිටපත් දෙකකින් සම්පූර්ණ කර ඉදිරිපත් කරන්න)

1. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල යොමු අංකය :

2. I. කැඩැස්තර සිතියමේ අංකය :
   II. කලාප අංකය :
   III. මුල් ඉඩමේ කොටසේ/කොටස් වල කැබලි අංකය/අංක :
   IV. මුල් ඉඩමේ ප්‍රමාණය/ප්‍රමාණ :
   V. නව පිඹුරේ කැබලි සංඛ්‍යාව :
   IV. නව ඉඩම් විස්තර ලැයිස්තු පිටු ගණන :

ඉහත යොමු අංක දරණ මැනුම සඳහා භාවිතා කිරීමට කැඩැස්තර සිතියම් අවසාන විස්තර සපයන ලෙස ඉල්ලමි.

.....

දිනය ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාගේ අත්සන

.....

සිතියම් විස්තර නිකුත් කිරීම

භාවිතා කළ යුතු පත්‍ර අංකය :
භාවිතා කළ යුතු කැබලි අංකයන් :
භාවිතා කළ යුතු ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංකයන් :

.....

දිනය ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අත්සන හා මුද්‍රාව

.....

21.97 ඡේදය ඇමුණුම 13

කැඩැස්තර සිතියම්වල අඩංගු පිඹුරු විස්තර නිකුත් කිරීමේ ලේඛනය

(සෑම කලාපයක් සඳහාම වෙනම ගොනු පවත්වා ගත යුතුය)

කැඩැස්තර සිතියම් අංකය: .....

කලාප අංකය : .....

ගම/ ග්‍රාම නිලධාරි කොට්ඨාශය : .....

පත්‍ර අංකය	ඉඩම් කැබලි අංකය	ඉඩම් විස්තර ලැයිස්තු පිටු අංක	මිනින්දෝරුවරයාගේ නම	වෙනත්	මි.අ. අත්සන

21.99 ඡේදය 21.109 ඡේදය ඇමුණුම 14

ආකෘති පත්‍ර අංක 8

කඩඉම් සිතියම් අංකය : 720005
කලාප අංකය : 07
පත්‍ර අංකය : 4

ලි.ඛ.මි. පිඹුරු අංකය : 1554
ඒ.බී.සී.පෙරේරා
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු,
කයිලගොඩ
බදුල්ල
දු.අ. : 0714442586
මූල පිටපත



යොමුව
ග : මායිම්ගල
ක : මායිම් කනුව
ප : පල මාර්ගය
මාර්ග(මා) : මාර්ගය(මාර්ගය දෙපාර්තමේන්තුව)

පරිමාණය : 1 : 2000

ගම : සියඹලාන්ඩුව
ග්‍රා.නි.කොට්ඨාශය : 123-D, ශ්‍රී විජිතපුර
ප්‍රා.ලේ.කොට්ඨාශය : සියඹලාන්ඩුව
දිස්ත්‍රික්කය : මොනරාගල
පළාත : ඌව

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සටහන්

ඒ.බී.සී.පෙරේරා
(ලියාපදිංචි අංකය : 19981277 / ප්‍රතිනත සහතික අංකය : 2002G631)
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
2019.02.09

ආකෘති පත්‍ර අංක 6

<u>පසු කාලීනව කරනු ලබන කැඩැස්තර මැනුම් සඳහා මිනින්දෝරුවරයාගේ වාර්තාව</u>

1. ගම/ග්‍රාම කොට්ඨාශය :
2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :
3. දිස්ත්‍රික්කය :
4. පළාත:
5. කැඩැස්තර සිතියම් අංකය : කලාප අංකය : පත්‍ර අංක :
   කොටස් ගණන :
6. මුල් කැබැල්ලේ අංක/අංකයන් ..... වර්ග ප්‍රමාණය .....
   එකතුව.....
7. නව කැබලි අංක/අංකයන් ..... වර්ග ප්‍රමාණය .....
   එකතුව.....
8. ඉ.වි.ලැ පිටු අංක:
9. භාවිතා කරන ලද ක්ෂේත්‍ර සටහන් වල සහතික පිටපත අමුණා ඇත.
   ගොනුවේ යොමු පිටු අංකය/අංක සිට දක්වා
10. මැනුම සිදු කළ දිනය/දිනයන් :
11. සංශෝධන අනුරේඛන අමුණා ඇත :
12. දිස්ත්‍රික් මැනුම් කාර්යාලයෙන් ලද මුල් දත්ත සඳහා වූ පරිගණක අංකිත දත්ත ලිපිගොනු වල නම්
    (I) Adjusted coordinate:- .....txt
    (II) Drawing:- .....dwg
13. දිස්ත්‍රික් මැනුම් කාර්යාලයට භාර දෙන ලද නව දත්ත සඳහා වූ පරිගණක අංකිත දත්ත ලිපිගොනු
    (I) coordinate:- .....txt
    (II) Drawing:- .....dxf
    (III) Tenement List:- .....xls/xlsx
    (IV) Cad Plans Drawings:- .....dxf
14. පිඹුරු වැඩ සඳහා නියමිත අංකිත දත්ත ස්තර භාවිතා කර ඇත.
15. ඉඩම් හිමිකරුවන්ගේ නම/නම් :
16. මායිම් පෙන්වා දෙන ලද අයගේ නම/නම් :
    මායිම් බලාගත් අයගේ නම/නම්
17. භාවිතා කරන ලද අළුත් මායිම්ගල් ගණන මායිම්ගල් .....
    පිහිටි මායිම්ගල් .....

නැවත පිහිටුවන ලද මායිම්ගල් ගණන මායිම්ගල් .....

18. ක්ෂෙත්‍ර සටහන් වල, නැවත පිහිටුවන ලද මායිම්ගල් පිළිබඳ නියමිත සටහන් යොදා ඇත.

19. වෙනත් කිවයුතු කරුණු :

අංක 1 සිට 18 දක්වා ඉදිරිපත් වී ඇති තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි.

අත්සන	:
ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ නම	:
ලියාපදිංචි අංකය	:
ප්‍රතීතන සහතික අංකය	:
දිනය	:

සටහන:

ඉහත තොරතුරු ඉදිරිපත් කිරීමේදී ඉඩකඩ ප්‍රමාණවත් නොවේනම් අදාළ අංකය යටතේ වෙනත් කොලයක ඇතුලත් කර සහතික කර මෙයට අමුණන්න.

21.105 ඡේදය **ඇමුණුම 16**

කැඩැස්තර සිතියම් වල අනුබෙදීම් හා ඒකාබද්ධ කිරීම් සඳහා කරනු ලබන මැනුම් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ සටහන්

කැඩැස්තර සිතියම් අංකය:- කලාප අංකය:- පත්‍ර අංකය:-

අනු අංකය	පරීක්ෂණය	සටහන්
01	3.15 ට අදාළ ලේඛන ලැබී ඇත.	
02	පිඹුරේ පත්‍ර අංකය සහ කැබලි අංක දි.මි.කා විසින් නිකුත් කළ ලිපිය සමඟ පරීක්ෂා කළා	
03	ක.සි අංකය, සහ කලාප අංකය, පත්‍ර අංකය, ඉ.වි. පිටු අංකය ලේඛන වල නිවැරදිව සටහන් කර ඇත. (පිඹුර, ඉඩම් විස්තර ලැයිස්තුව, ක්ෂේත්‍ර සටහන් සහ මිනින්දෝරු වාර්තාව ආදියෙහි)	
04	මිනින්දෝරුවරයාගේ වාර්තාව සමඟ පිඹුරේ සහ ඉඩම් විස්තර ලැයිස්තුවේ පහත විස්තර පරීක්ෂා කළා	
	i. ගම සහ ග්‍රාම නිලධාරි කොට්ඨාශය	
	ii. ප්‍රා.ලේ.කොට්ඨාශය	
	iii. දිස්ත්‍රික්කය	
	iv. පළාත	
05	නව මැනුම කැඩැස්තර සිතියමේ පැරණි කැබලිවල වට මායිම සහ ගැලපේ	
06	යාබද ඉඩම් විස්තර කැඩැස්තර සිතියම සමඟ ගැලපේ	
07	සංශෝධන අනුරේඛන නිවැරදිව පිළියෙල කර ඇත	
08	පිඹුරේ පහත අයිතමයන් නිවැරදිය	
	i. පරිමාණය	
	ii. උතුරු දිශා රේඛාව	
	iii. පත්‍රදාර ගැලපීම	
	iv. යාබද පත්‍රවලට යොමුව	
09	සියළුම කැබලි පහත අයිතමයන් සඳහා පරීක්ෂා කළා	
	i. මායිම් සඳහා ප්‍රමාණවත් පරිදි ස්ථිර මායිම් ලක්ෂ්‍ය යොදා ඇත	
	ii. පිඹුරේ සහ ක්ෂේත්‍ර සටහන් වල මායිම් සංවෘත වී ඇත	
	iii. අභ්‍යන්තර මායිම් සඳහා යා ලකුණ යොදා ඇත	
	iv. ක්ෂේත්‍ර සටහන් වල දක්වා ඇති මායිම් සිතියම හා ගැලපේ	
	v. ක්ෂේත්‍ර සටහන් වල දක්වා ඇති මායිම් විස්තර සිතියම හා ගැලපේ	
	vi. ක්ෂේත්‍ර සටහන් වල දක්වා ඇති කැබලි අංක සිතියම හා ගැලපේ	
	vii. සියලුම කැබලි නිවැරදිව අංකනය කර තිබේ	
10	නැවත ස්ථාපනය කළ මායිම්ගල් පිළිබඳව ක්ෂේත්‍ර සටහන් වල සටහන් යොදා ඇත	
11	ඉඩම් විස්තර ලැයිස්තුවේ පහත අයිතමයන් පිඹුර සමඟ පරීක්ෂා කළා	
	i. කැබලි අංක	
	ii. කැබලි වල වර්ග ප්‍රමාණය	
12	ඉඩම් විස්තර ලැයිස්තුවේ පහත අයිතමයන් ක්ෂේත්‍ර සටහන් සමඟ පරීක්ෂා කළා	
	i. කැබලි අංක	
	ii. ඉඩමේ නම	
	iii. ගොඩනැඟිලි පිළිබඳ විස්තර ආදිය	
	iv. හිමිකම් කියන්නන්ගේ නම්	
13	අංකිත දත්ත පරීක්ෂා කිරීම	
	i. නිවැරදි දත්ත ස්ථිර භාවිතා කර ඇත	
	ii. කැඩැස්තර සිතියම සහ අංකිත දත්ත ගැලපේ	
	iii. කැඩැස්තර පිඹුරු ගොනු නිවැරදිව අංකනය කර ඇත	
	iv. ජාතික බණ්ඩාංක පද්ධතියට සාපේක්ෂව බණ්ඩාංක නිවැරදිව භාවිතා කර ඇත	

14	එක් එක් කැබැල්ලට අදාළ කැඩැස්තර පිඹුරු නිවැරදිව සකස් කර ඇත	
15	පිඹුරේ, ඉඩම් විස්තර ලැයිස්තුවේ සහ වාර්තාවේ මිනින්දෝරුවරයාගේ නම සහ අත්සන පරීක්ෂා කළා	

ඉහත සඳහන් අයිතමයන් පරීක්ෂා කරන ලදි.

මිනින්දෝරු අධිකාරිවරයාගේ නම හා අත්සන

දිනය:

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයාගේ නම හා අත්සන

දිනය:

ඇමුණුම 17

ආකෘති පත්‍ර අංක 7

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ආකෘති පත්‍රයකි

ඉඩමක් ඒකාබද්ධ කිරීම/අතුරු බෙදීම සඳහා ඉල්ලීම - ආකෘති පත්‍ර අංක :7

1998 අංක 21දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (36 වන වගන්තිය)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.	
ලැබුණා දිනය : වේලාව : අංකය : ගාස්තු : හිමිකම් සහතිකයේ අංකය : ..... භාරගත් නිළධරයා	ලියාපදිංචි කළා කොට්ඨාශය : වෙළුම : පත්ඉරුව .... හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්

(ඉඩමේ ලියාපදිංචි කළ අයිතිකරු/ අයිතිකරුවන් විසින් පිටපත් දෙකකින් යුතුව සම්පූර්ණ කළ යුතුය.)

1. හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් වෙත,
   ..... දිස්ත්‍රික්කය

අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ නම/නම්	**ජාතික හැඳුනුම්පත් අංකය/අංක**	**ලිපිනය/ලිපිනයන්**

2. ඒකාබද්ධ කිරීමට/අතුරු බෙදීමට යෝජිත ඉඩම පිළිබඳ විස්තර :

(i) පිහිටීම -

(අ) දිස්ත්‍රික්කය :

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :

(ඇ) ග්‍රාම නිලධාරී කොට්ඨාශය :

(ඈ) ග්‍රාමය හෝ නගරය :

(ඉ) වීථිය සහ වරිපනම් අංකය :

(ii) කැඩැස්තර සිතියම් අංකය/අංක :

(iii) ඉඩම් කොටසේ /කොටස්වල අංකය/අංක :

(iv) ලියාපදිංචි කිරීමේ යොමු සටහන් :

(අ) ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය :

(ආ) වේළුමේ /වේළුම්වල අංකය /අංක :

(ඇ) පත් ඉරු අංකය /අංක :

(v) හිමිකම් සහතිකයේ /සහතිකවල අංකය /අංක :

(සහතිකය/ සහතික අමුණන්න.)

(vi) ඉඩමේ ප්‍රමාණය :

3. ඉඩම/ඉඩම් යටත් වන බැඳීම් :

බැඳීමේ ස්වභාවය	වලංගුවන කාලසීමාව

4. වෙනත් ඉඩම්වල අයිතිවාසිකම්
ඒකාබද්ධ කිරීම/ අතුරු බෙදීම සඳහා වූ සැලැස්ම (සැලැස්ම අමුණන්න.)

(i) මිනින්දෝරුවරයාගේ නම :
(ii) සැලැස්මේ අංකය :
(iii) සැලැස්මේ දිනය :

5. ලියාපදිංචි කිරීමේ ගාස්තුව :
බැංකු ලදු පතේ අංකය ලදුපත් අංකය :

6. ඉහත 3 වන ඡේදයේ විස්තර කොට ඇති බැඳීම්වලට යටත්වන සහ ඉහත 2 වන ඡේදයේ විස්තර කොට ඇති ඉඩම/ඉඩම්, 1998 අංක 21දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් රෙජිස්ටරයේ ලියාපදිංචි කොට ඇති බවත්, ඉහත 5 වන ඡේදයේ සඳහන් ගාස්තු ගෙවූ බවට නිකුත් කරන ලද බැංකු ලදු පත, ලදුපත් සහ අදාළ හිමිකම් සහතික සහ මිණුම් සැලැස්ම මීට අමුණා ඇති බවත් පහත අත්සන් කරන මම/අපි * මෙයින් ප්‍රකාශ කරමි. / කරමු. * ඉහත 4 වන ඡේදයේ සඳහන් මිනුම් සැලැස්මට අනුකූලව එම ඉඩම ඒකාබද්ධ කිරීම /අතුරු බෙදීම හිමිකම් රෙජිස්ටරයේ ලියාපදිංචි කරන ලෙස මම/අපි * ඉල්ලා සිටිමි/ සිටිමු. *

අයිතිකරුගේ /අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම/නම්	**අත්සන/අත්සන් සහ දිනය**

පිටපත් :

..... දිස්ත්‍රික්කයේ

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත

ශුද්ධි පත්‍රය

22 වැනි පරිච්ඡේදය

අංකිත දත්ත කළමනාකරණය

පටුන

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	හැඳින්වීම	
22.1.	අංකිත දත්ත කළමනාකරණය හැඳින්වීම	1
	අංකිත දත්ත රැස් කිරීම හා ඒ අනුසාරයෙන් නිම කළ යුතු කාර්යයන්	
22.2.	උපකරණ හා මෘදුකාංග භාවිතය	1
22.3.	අංකිත ඛණ්ඩාංක ගොනුව සකස් කිරීම	1
22.4.	අංකිත පිඹුරු ගොනු ආකෘති සහ ස්ථර	1
22.5.	ක්ෂේත්‍රඵලය ගණනය කිරීම	1
22.6.	ඉඩම් විස්තර ලැයිස්තුව අංකිත ආකාරයෙන් සකස් කිරීම	1
	අංකිත පිඹුරු වල භාවිතා කරන අකුරු වර්ග හා උස ප්‍රමාණයන්	
22.7.	මායිම් තොරතුරු සහ ඇතුලත අඩංගු කරුණු විස්තර කිරීම	2
	අංකිත පිඹුරු වල තත්ව පාලනය	
22.8.	පරික්‍රමණවල හා සකස්කිරීමේ (Adjustment) නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම	2
22.9.	මායිම් ලක්ෂ්‍යවල ඛණ්ඩාංක පරීක්ෂා කිරීම	2
22.10.	පිරිසැලසුම් පිඹුර (Layout plan) භාවිතයෙන් පිඹුරු මුද්‍රණය කිරීම	3
22.11.	නිවැරදි දත්ත ස්ථර හා වර්ගඵල ආගණනයන් පරීක්ෂා කිරීම	3
22.12.	පත්‍රදාර සංසන්දන අනුරේඛන පරීක්ෂා කිරීම	3
22.13.	නිරවද්‍ය පිඹුරක් සම්පූර්ණ කිරීම	3
	ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල දත්ත ගබඩා කිරීම	
22.14.	ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ දී දත්ත ආරක්ෂිතව ගබඩා කිරීම	3
22.15.	සියළුම මිනින්දෝරුවරුන් වෙනුවෙන් උපගොනු නම් කිරීම	3
22.16.	පිඹුරු දත්ත TLDMS දත්ත පද්ධතිය හරහා උඩුගත කිරීම	3
22.17.	මිනින්දෝරු අධිකාරි විසින් උඩුගත කරන ලද ඉඩම් විස්තර ලැයිස්තු හා පිඹුරු පරීක්ෂා කිරීම කළ යුතු බව	4
22.18.	මෙටා දත්ත ගොනුව	4
22.19.	මිනින්දෝරුවන්හට පිඹුරු සංශෝධන යැවීම හා පරීක්ෂා කළ පිඹුරු TLDMS දත්ත පද්ධතිය මඟින් යැවීම	4
22.20.	අනුමත කළ මැනුමට අදාළ දත්ත ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත උඩුගත කිරීම	4
	අංකිත දත්ත ගබඩා කිරීම හා ආරක්ෂාව	
22.21.	දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ දී දත්ත සංරක්ෂණය	4
22.22.	උපගොනුවල ගබඩා කළ යුතු දත්ත	4
	ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත දත්ත යැවීම	
22.23.	අනුමත කරන ලද පිඹුරු වල අංකිත දත්ත SRIMS භාවිතයෙන් යැවීම	6
22.24.	කැඩැස්තර සිතියම් දත්ත සැකසීම දිස්ත්‍රික් මට්ටමින් සිදු කළ යුතු බව	6
22.25.	දත්ත සැකසීමේ ක්‍රමවේදය	6
22.26.	සකසන ලද දත්ත ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත යැවීමේ ක්‍රමවේදය	6
22.27.	භූ දත්ත පද්ධති (Geodatabase) ගොනුව ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත යැවීමේ ක්‍රමවේදය	6
22.28.	සකසන ලද දත්තයන්හි ඇතුලත් විය යුතු අංකිත දත්ත ගොනු	7

දෙ.මැ.රෙ. යොමුව	විස්තරය	පිටුව
	මැනුම් ඉල්ලීමකින් පිඹුරු වර්ග කිහිපයක් පිළියෙල කර ඇති විට දත්ත යැවීම	
22.29.	මැනුම් ඉල්ලීමකින් පිඹුරු වර්ග කිහිපයක් පිළියෙල කර ඇති විට දත්ත යැවීම	7
	දත්ත ගොනු පසු ගබඩා කර තැබීම	
22.30.	දත්ත ගොනු පසු ගබඩා කළ හැකි ක්‍රම	7
22.31.	අංකිත දත්ත වල ආරක්ෂාව පිළිබඳව මිනින්දෝරුවරයාගේ වගකීම	7
22.32.	දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලවල හා ප්‍රධාන කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතින් අංශයෙහි දත්ත පසු ගබඩා කිරීම	7
22.33.	සංයුක්ත තැටි තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් දි.මි.කා. හි පවත්වා ගැනීම	8
22.34.	කැඩැස්තර සිතියම් පසුකාලීන මැනුම් අංකිත දත්ත සංයුක්ත තැටි භාවිතයෙන් ගබඩා කිරීම	8
22.35.	මුල් අංකිත දත්ත ගොණුවෙහි පසුකාලීන මැනුම් තොරතුරු සඳහා යොමුව දීම	8
22.36.	පසුකාලීන මැනුම්වල අංකිත දත්ත ඉ.තො.ප. අංශයට හා වෙනත් දෙපාර්තමේන්තු වලට යැවීම	8
	මැනුම් ඉල්ලීම් සඳහාවූ කළමනාකරණ දත්ත පද්ධතිය	
22.37.	මැනුම් ඉල්ලීම් කළමනාකරණ දත්ත පද්ධතියෙහි කාර්යයන්	8
	පැරණි කාලේ ක්ෂේත්‍ර පත්‍ර පරිලෝකනය කිරීම හා එම මෘදු පිටපත් භාවිතය	
22.38.	ක්ෂේත්‍ර පත්‍ර සහ ඉඩම් විස්තර ලැයිස්තු පරිලෝකනය කිරීම	8
22.39.	පරිලෝකනය කරන ලද මෘදු පිටපත් අංකනය කිරීම හා ගබඩා කිරීම	9
22.40.	පරිලෝකනය කරන ලද පිඹුරු වල මෘදු පිටපත් ගබඩා කර තැබීමට TLDMS මඟින් වෙනම දත්ත ගබඩාවක් පවත්වා ගැනීම	9
22.41.	පරිලෝකනය කරන ලද පිඹුරු පිටපත් බාහිර ආයතන සහ පුද්ගලයන්ට ලබා දීමේදී කටයුතු කිරීම	9
22.42.	සම්මත කරන ලද පිඹුරු වලට අදාළ පරිලෝකනය කරන ලද දත්ත SRIMS හරහා උඩුගත කිරීම	
22.43.	ජ්‍යෙ.මි. අ./මි.අ. (මූලස්ථාන) ගේ උපදෙස් අනුව පරිලෝකන දත්ත පද්ධතියේ හා ADITS මෘදුකාංගයේ සුචි පිටුව යාවත්කාලීන කිරීමේ වගකීම ලේඛනාගාරය භාර නිළධාරියා සතු බව	9
	පරිලෝකනය කරන ලද මෘදු පිටපත් භාවිතා කිරීම	
22.44.	පරිලෝකනය කරන ලද පිඹුරුවල දෝෂ හා ඒවායේ පිළිගත හැකි මට්ටම	9
	ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයෙහි පිඹුරු පරිලෝකනය කිරීම	
22.45.	පැරණි ක්ෂේත්‍ර පත්‍ර පරිලෝකනය කිරීම හා එහි මෘදු පිටපත් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට යැවීම	10
	ඇමුණුම්	
ඇමුණුම 01	අංකිත පිඹුරුවල පෙර දත්ත පත්‍රය (**Meta Data File**)	11
ඇමුණුම 02	අංකිත පිඹුරු සහ පෙර දත්ත පත්‍ර නම් කරන ආකාරය (Naming system for Digital Drawing Files and Meta Data Files)	12
ඇමුණුම 03	අංකිත දත්ත සැකසීමේ ක්‍රියාවලිය	14
ඇමුණුම 04(i)	අ.ග.පි . සඳහා අංකිත දත්ත සංයුක්ත තැටි ලෙජරයක පිටුවක ආදර්ශය	15
ඇමුණුම 04(ii)	මු.පි. සඳහා අංකිත දත්ත සංයුක්ත තැටි ලෙජරයක පිටුවක ආදර්ශය	16
ඇමුණුම 04(iii)	අ.භූ.පි. සඳහා අංකිත දත්ත සංයුක්ත තැටි ලෙජරයක පිටුවක ආදර්ශය	17
ඇමුණුම 04(iv)	අනුරේඛන, අධිකාරිපත්‍ර(උසාවි කොමිෂන්) සහ ඉංජිනේරු මැනුම් අංකිත දත්ත සඳහා සංයුක්ත තැටි ලෙජරයක පිටුවක ආදර්ශය	18
ඇමුණුම 05	පරිලෝකනය කරන ලද මෘදු පිටපත් අංකනය කිරීම (Image File Names for Quarter Field Sheets)	19
ඇමුණුම 06	පරිලෝකනය කළ පිඹුරු ඇතුලත් සංයුක්ත තැටි ලෙජරයේ ආදර්ශය	25

22 වැනි පරිච්ඡේදය

අංකිත දත්ත කළමනාකරණය

හැඳින්වීම

22.1. ක්ෂෙත්‍ර මැනුම්කරණයේදී නිපදවන අංකිත දත්ත භාවිතයෙන් ඉඩම් තොරතුරු පද්ධතියක් පිහිටුවීම වර්ෂ 2002 අංක 17 දරණ මැනුම් පනත මඟින් සර්වේයර් ජනරාල් වෙත පැවරී ඇති වගකීමක් බැවින් ඒවා විධිමත්ව රැස්කර නිසි පරිදි කළමනාකරණය කර ක්‍රමවත්ව සහ යථාවත්ව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කරුණකි. ඒ අනුව අංකිත මැනුම් පිඹුරු සියල්ලක්ම අංකිත දත්ත ආකාරයට සකස් කිරීම පහත සඳහන් කර ඇති උපදෙස් මාලාවන්ට අනුකූලව කළ යුතුය. මිනින්දෝරු අධිකාරි හා මිනින්දෝරුවරුන් විසින් මැනුම් පිඹුරු වලට අදාළ දත්ත අංකිත ආකාරයෙන් රැස්කර පරිගණක අනුසාරයෙන් දත්ත සැකසීමේ ක්‍රියාවලිය හා ඒ මඟින් අංකිත පිඹුරු පිළියෙල කිරීම හා ඉඩම් විස්තර දත්ත පද්ධතිය භාවිතා කිරීමට අවශ්‍ය වූ දැනුම ප්‍රගුණ කර ගත යුතුය.

මෙම පරිච්ඡේදයේ පහත සඳහන් කරුණු අන්තර්ගතය.

1. උපකරණ හා මෘදුකාංග
2. ක්ෂෙත්‍ර විමර්ශණය හා දත්ත රැස් කිරීම
3. අංකිත පිඹුරු සැකසීම
4. අංකිත පිඹුරු වල තත්ව පාලනය
5. දත්ත ගබඩාකිරීම, ආරක්ෂාව හා පසු ගබඩාකරණය (back up)
6. මැනුම් ඉල්ලීම් සම්බන්ධ දත්ත පද්ධතිය
7. පැරණි ක්ෂෙත්‍ර පත්ර පරිලෝකනය හා එම පරිලෝකිත ප්‍රතිමූර්ති භාවිතය

අංකිත දත්ත රැස් කිරීම හා ඒ අනුසාරයෙන් නිම කළ යුතු කාර්යයන්

22.2. අංකිත දත්ත රැස් කිරීම සඳහා භාවිතයට ගන්නා සියළු මැනුම් උපකරණ වාර්ෂිකව ක්‍රමාංකණය (Calibrate) කරන ලද හා මනා ක්‍රියාකාරී තත්වයේ ඒවා විය යුතුය.

අංකිත දත්ත රැස් කිරීම, දත්ත සැකසීමේ ක්‍රියාවලිය හා එමඟින් අංකිත පිඹුරු සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති මෘදුකාංග භාවිතා කළ යුතුය.

22.3. ක්ෂෙත්‍ර මැනුම් සඳහා පූර්ණමානය භාවිතා කරන ලද්දේ නම් අංකිත පිඹුරු සැකසීම සඳහා PNEZC අනුපිළිවෙලින් අංකිත ඛණ්ඩාංක ගොනුව සකස් කළ යුතුය. මැනුම් සඳහා පැරණි ක්‍රමවේදයන් භාවිතා කරන ලද්දේ නම් මුල් ක්ෂෙත්‍ර සටහන් භාවිතා කර පිඹුරු සැකසීම කළ යුතුය. මෙම අවස්ථා දෙකේ දීම PNEZC අනුපිළිවෙලින් අංකිත ඛණ්ඩාංක ගොනුව සැකසීම කළ යුතුය.

22.4. අංකිත පිඹුරු DXF Format වශයෙන් තිබිය යුතුය. සියළුම පිඹුරුවල මැනුම් විස්තර **11 වැනි පරිච්ඡේදයෙහි ඇමුණුම 10** හි දක්වා ඇති පරිදි අදාළ ස්ථරවල (Layers) සකස් කර තිබිය යුතුය.

22.5. ක්ෂෙත්‍රඵලය ගණනය කිරීම සවිස්තරාත්මකව 13 වැනි පරිච්ඡේදයෙහි දක්වා ඇත.

22.6. දෙපාර්තමේන්තුව මඟින් සපයා ඇති මෘදුකාංගය භාවිතා කර ඉඩම් විස්තර ලැයිස්තුව අංකිත දත්ත ආකාරයෙන් සැකසිය යුතුය. ඉඩම් විස්තර ලැයිස්තුවේ මුද්‍රිත පිටපත එම මෘදුකාංගය අනුසාරයෙන්ම ලබාගත යුතුය.

අංකිත පිඹුරු වල භාවිතා කරන අකුරු වර්ග හා උස ප්‍රමාණයන්

22.7. අංකිත පිඹුරු වල මායිම් තොරතුරු ලිවීමට සහ ඇතුලත අඩංගු කරුණු විස්තර කිරීම සඳහා පහත වගුවේ සඳහන් ඉංග්‍රීසි, සිංහල හා දෙමළ අකුරු පිළිවෙලින් Romans.shx , SD Sinhala.ttf හා SD Tamil.ttf යන අකුරු වර්ග සහ එම උස ප්‍රමාණයන් භාවිතා කළ යුතුය. 1:1,000 පරිමාණයට පිඹුර සකස් කරන විට භාවිතා කළ යුතු අකුරු වර්ග වල උස ප්‍රමාණයන් පහත වගුවේ දක්වා ඇති අතර, පිඹුර ඇඳීමට නියමිත පරිමාණය අනුව පරිමාණ සාධකයෙන් ගුණ කිරීම මඟින් අකුරුවල නියමිත උස යෙදිය යුතුය. සියළුම අකුරු සඳහා ආනත කෝණය අංශක 17ක් වශයෙන් තිබිය යුතුය.

ලක්ෂණය	අංකිත පිඹුරු සඳහා අකුරු උස 1:1000 පිඹුරු සඳහා		
	Romans.shx (Lower case)	SD Sinhala.ttf	SD Tamil.ttf
1. දිස්ත්‍රික්ක උද්ධෘතය, පිඹුරු අංක	4.5	3.5	3.5
2. අතිරේක අංකය පත්‍ර අංකය අතුරු පිඹුරු අංකය විශාල ඇළ මාර්ග පරිමාණය	3.3	2.5	2.5
3. ගම ප්‍රා.ලේ. කොට්ඨාශය දිස්ත්‍රික්කය පළාත යාබද ග්‍රාම නාම	3.8	2.5	2.5
4. කැබලි අංක වගා විස්තරය	2.4	2.0	2.0
5. මාර්ග සහ පාරවල් දිශාව	3.0	2.0	2.0
6. යාබද විස්තර හි.පි , මු.පි යොමුව කුඩා ඇළවල් ගොඩනැගිලි මායිම් සලකුණු	2.6	1.7	1.7
7. මායිම් විස්තර	2.0	1.4	1.4

අංකිත පිඹුරු වල තත්ව පාලනය

22.8. මිනින්දෝරු අධිකාරි විසින් ක්ෂෙත්‍ර සටහන් වලට අනුව පරික්‍රමණ වල සංවෘත තත්වය හා සකස් කිරීම් වල (Adjustment) නිරවද්‍යතාවය පරීක්ෂා කළ යුතුය. අංකිත පිඹුරේ සඳහන් පරික්‍රමණ වල දිග හා දිගාංශයන් අදාළ ක්ෂෙත්‍ර සටහන් සමඟ පරීක්ෂා කළ යුතුය.

22.9. පිඹුරු පරීක්ෂා කිරීමේදී මායිම් ලක්ෂ්‍ය වල බණ්ඩාංක (අඩු තරමින් 10% ක් වත්) ක්ෂෙත්‍ර පොතෙහි සඳහන් බණ්ඩාංක සමඟ සංසන්දනය කළ යුතුය. අංකිත පිඹුර පැරණි මැනුම් ක්‍රම භාවිතා කර සකස් කළේ නම් එකී අංකිත පිඹුර ක්ෂෙත්‍ර සටහන් සමඟ සංසන්දනය කළ යුතුය. තමා විසින් කරන ලද පරීක්ෂණය සම්බන්ධයෙන් මිනින්දෝරු අධිකාරි විසින් ක්ෂෙත්‍ර පොත් වල සටහන් තැබිය යුතුය.

22.10. පිඹුරක් පත්‍ර (කොටස්) කීපයකින් යුක්තව සකස් කරන්නේ නම් එක් එක් කොටස් සඳහා වෙන් වෙන් අංකිත පිඹුරු සකස් නොකළ යුතු අතර කොටස් මුද්‍රණය සඳහා පිරිසැලසුම් පිඹුර (Layout plan) යොදාගත යුතුය. කිහිප වාරයක් ලියන ලද කැබලි අංක, ඊ සලකුණ, මායිම් විස්තර, කොටස් රේඛා සහ අනෙකුත් විස්තර 11 වැනි පරිච්ඡේදයෙහි ඇමුණුම 10 හි දැක්වෙන පරිදි වෙනම ස්ථර (Layers) වල තැබිය යුතුය.

22.11. මිනින්දෝරු අධිකාරි විසින් අංකිත දත්ත ගොනුවේ ඇති දත්ත නිවැරදි දත්ත ස්ථර වල ඇති බවට හා වර්ගඵල ආගණනයෙන් ලබා ගන්නා ලද අගයන් ඉඩම් විස්තර දත්ත පද්ධතියට (TLDMS) නිවැරදිව ඇතුලත් කර ඇතිද යන්න පරීක්ෂා කර තහවුරු කර ගත යුතුය. මේ සඳහා දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති QGIS සහ CAD මෙවලම් භාවිතා කළ යුතු අතර එමඟින් ලැබෙන වාර්තා මැනුම් ඉල්ලීම් ගොනුවට ගොනු කළ යුතුය.

22.12. පත්‍රදාර සංසන්දන අනුරේඛන සකස් කළ යුතු අතර ඒවා මිනින්දෝරුවරයා විසින් සටහන් තබන ලදුව මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කර මැනුම් ඉල්ලීම් ලිපි ගොනුවේ ගොනු කර තැබිය යුතුය.

22.13. පිඹුර සම්පූර්ණ කිරීම හා නිරවද්‍යතාවය, දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසිවල උපදෙස් මාලාවට අනුව පරීක්ෂා කළ යුතුය. අවසාන අංකිත පිඹුර හා මෙටා දත්ත ගොනුව **ඇමුණුම 01** හි සඳහන් පරිදි නිවැරදිව නම් කළ යුතු අතර 22.14 සිට 22.22 දක්වා වන ඡේද අනුව කටයුතු කළ යුතු වන අතර මේ සම්බන්ධයෙන් මිනින්දෝරු අධිකාරි වග කිව යුතුය. මිනින්දෝරු අධිකාරි විසින් පෙන්වා දෙන ලද කිසියම් සංශෝධනයක් ඇත්නම් ඒවා අවසාන අංකිත පිඹුරෙහිම සිදු කළ යුතුය.

ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල දත්ත ගබඩා කිරීම

22.14. මැනුම් වලට අදාළ සියළුම අංකිත දත්ත පහත සඳහන් කර ඇති ආකාරයට ආරක්ෂිතව, පහසුවෙන් යොමුගත කළ හැකි පරිදි ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල ගබඩා කළ යුතුය. ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල ඇති පරිගණකයේ අභ්‍යන්තර දෘඩ තැටියේ 'D'කොටසේ < work in progress> , <Survey Work> හා <Completed work> වශයෙන් උප ගොනු 3 ක් සකස් කර දත්ත ගබඩා කිරීම සඳහා යොදාගත යුතුය.

22.15. මෙසේ දත්ත ගබඩා කිරීමේදී මිනින්දෝරුවරයා විසින් අභ්‍යන්තර දෘඩ තැටියේ 'D'කොටසේ < work in progress> උපගොනුව තුල මිනින්දෝරුවරයාගේ නමේ මුලකුරු භාවිතා කර උපගොනුවක් සකස් කරන්න (උදා:- HAAR- GS, PMS-LS ලෙස). එම උප ගොනුව තුල එක් එක් මැනුම් ඉල්ලීම යටතේ මිනින්දෝරුවරයාගේ මැනුම් දත්ත හා පිඹුර පිළියෙල කිරීමේදී ගබඩා කළ යුතු සියළුම දත්තයන් ගබඩා කිරීම සඳහා උපගොනු (Sub folders) දෙකක, දත්ත (Data) හා පිඹුරු (Drawings) වශයෙන් සකස් කර ඒවා තුල අදාළ දත්ත ගොනු ගබඩා කළ යුතුය. මෙහිදී ද දත්ත (Data) උපගොනුව තුලම නියමිත ආකාරයට නම්කරන ලද අධිස්ථාපිත දත්ත (Fixed Data)ද ගබඩා කළ යුතුය.

22.16. මිනින්දෝරුවරයා විසින් ව්‍යවස්ථාපිත මැනුම් සඳහා ඉඩම් විස්තර ලැයිස්තුව මිනින්දෝරු අධිකාරිවරයා වෙත යවන අවස්ථාවේදී <Survey Work> හි ඇති එක් එක් මැනුම් ඉල්ලීම සඳහා වූ උපගොනුව (Sub folders) තුල ඇති, දත්ත (Data) උපගොනුව තුල, මැනුම් දත්ත හා අධිස්ථාපිත දත්ත (Fixed Data)ද , පිඹුරු (Drawings) උපගොනුව තුල නිවැරදි ස්ථරවලට සකස් කරන ලද මැනුමේ dxf දත්ත ද ඇතුලත් කර එම දත්ත උපගොනු දෙකම එකවිට එක දත්ත ගොනුවක් මඟින් zip/rar ලෙස TLDMS හරහා උඩුගත කළ යුතුය. මෙම දත්ත ගොනුව dxf ගොනුව අංක කළ ආකාරයටම **ඇමුණුම 02** හි සඳහන් පරිදි නිවැරදිව නම් කළ යුතුය.

පරීක්ෂා කිරීමට ඉදිරිපත් කරනු ලබන පිඹුරට අදාළ අංකිත දත්ත මිනින්දෝරුවරයා විසින් QGIS 2.18 මෘදුකාංගය මඟින් plugin මෙනුව හරහා SL Cadastre මෙවලම භාවිතා කර අංකිත දත්ත වල නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතුය. එමඟින් ස්වයංක්‍රීයව පිළියෙල වන වාර්තාව (.txt) ඉහත කී දත්ත වලට අමතරව උඩුගත කළ යුතුය.

22.17. මිනින්දෝරු අධිකාරි විසින් ව්‍යවස්ථාපිත මැනුම්වලට අදාළ පිඹුරු හා ඉඩම් විස්තර දත්ත පරීක්ෂා කිරීමට TLDMS දත්ත පද්ධතියට උඩුගත කරන ලද දත්ත භාවිතා කළ යුතුය.

22.18. පිඹුරට අදාළ මෙටා දත්ත ගොනුව (Metadata file) ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතියේ (TLDMS) ඇති මූලික විස්තර මඟින් ජනනය කරනු ලැබේ. මෙහිදී TLDMS මඟින් ජනනය කිරීමට නොහැකි අමතර තොරතුරු මිනින්දෝරුවරයා විසින් TLDMS හි ඇති මෙම මෙටා දත්ත ගොනුවට ඇතුලත් කළ යුතුය. ඒ අනුව එක් එක් පිඹුරට අනුරූප මෙටා දත්ත TLDMS තුලම ගබඩා වේ.

22.19. ව්‍යවස්ථාපිත මැනුම්වලට අදාළ පිඹුරු හා ඉඩම් විස්තර ලැයිස්තු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සංශෝධන ඇත්නම් නැවත TLDMS දත්ත පද්ධතිය හරහාම මිනින්දෝරු අධිකාරි මඟින් මිනින්දෝරුවරයා වෙත එවීමට කටයුතු කළ යුතුය. සංශෝධන නිම කිරීමෙන් පසු අවසාන දත්ත මිනින්දෝරුවරයා විසින් TLDMS දත්ත පද්ධතිය තුලින්ම මිනින්දෝරු අධිකාරි හරහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත එවිය යුතුය.

22.20. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අදාළ මැනුම් ඉල්ලීම අනුමත කිරීමෙන් අනතුරුව මැනුමට අදාළ දත්ත අඩංගු zip/rar ගොනුව TLDMS පද්ධතිය මඟින් උඩුගත කළ යුතුය. එම උඩුගත කරනු ලැබූ ගොනුව පද්ධතිය වෙත ලද පසු නිශ්චිත ගොනු නමක් පද්ධතිය විසින්ම ලබාදෙනු ඇත. ඊට සමගාමීව මෙම අවසාන දත්ත දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වල ගබඩා කිරීමද අනිවාර්ය වේ.

අංකිත දත්ත ගබඩා කිරීම හා ආරක්ෂාව

22.21. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ දී දත්ත සංරක්ෂණය සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් <Data Archive> උප ගොනුව තුල වර්ෂය සඳහා උප ගොනුවක් සකස් කර ඒ තුල එක් එක් පිඹුරු වර්ගය සඳහා නව උප ගොනු පිළියෙල කළ යුතුය. පිඹුරු වර්ගය සඳහා වන උපගොනු තුල එක් එක් මැනුම් ඉල්ලීම යටතේ අනුමත කරන ලද මැනුමට අදාළ දත්ත අඩංගු zip/rar ගොනුව ගබඩා කළ යුතුය. උප ගොනු පිළියෙල කිරීමේ සම්මත ආකාරයන් 22.22 ඡේදයෙහි දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කළ යුතුය.

22.22. උපගොනු වල දත්ත ගබඩා කළ යුතු ආකාරය පහත පරිදි සිදු කළ යුතුය.

උප ගොනුවේ නම	**දත්ත / අන්තර්ගතය**
< work in progress/කරමින් පවතින වැඩ>	මිනින්දෝරුවරුන්ගේ නමින් පිළියෙල කරන ලද උපගොනු
<මැනුම් වැඩ/Survey Work>	එක් එක් මැනුම් ඉල්ලීම සඳහා උපගොනු පමණක් තිබිය යුතුය.
<දත්ත සංරක්ෂණ/ Data Archive >	වර්ෂය සඳහා උපගොනුවක් හා වර්ෂය දක්වන උපගොනුවේ එක් එක් පිඹුරු වර්ගය (Type of Plan) සඳහා උපගොනු පමණක් තිබිය යුතුය.
<පිඹුරු වර්ගය/ Plan Type > උදා:-<FVP><FTP > <Topo PP ><PP ><CM> <……>	එක් එක් මැනුම් ඉල්ලීම සඳහා පිළියෙල කළ උපගොනු පමණක් තිබිය යුතුය.
<මැනුම් ඉල්ලීම් අංක/ Requisition No> උදා:- දිස්ත්‍රික්කය/ප්‍රා.ලේ. කොට්ඨාශය/වසර/අනු අංකය Co /HMG/2011/235	සම්මත කරන ලද මැනුම් ඉල්ලීමට අදාළව TLDMS පද්ධතියෙන් බාගත කර ගන්නා zip/rar ගොනුව

උප ගොනුවේ නම	දත්ත / අන්තර්ගතය
<දත්ත ගොනුව/ Data Folder >	Folder Name : උදා:- 1.<Data_52PPlanCO3234> 2.<Data_52FVP14Sup23Sh24> (in Colombo District) ඇතුලත් කළ යුතු ගොනු වනුයේ, 1. පූර්ණමාන වලින් නිරීක්ෂණය කළ දත්ත සහ 2. එම නිරීක්ෂිත දත්ත SD CAD මෘදුකාංගය භාවිතා කර අනුකූලනය කිරීමෙන් පසු පිළියෙල වන දත්ත ගොනු හතර මෙම දත්ත ගොනු නම් කිරීමේදී පහත පරිදි මැනුම් ඉල්ලීම් අංකයද ඇතුලත් වනසේ නම් කළ යුතුය. උදා:- 2013/24 වැනි මැනුම් ඉල්ලීමට අදාළ වන 1 වන දත්ත ගොනුව නිරීක්ෂණය කළ විස්තර මැනීම් දත්ත සඳහා cod- requisition Number උදා :- cod_2013_24_1 පරික්‍රමණ (විස්තර පරික්‍රමණ ඇතුළුව) දත්ත සඳහා Trv- requisition Number උදා :-Trv_2013_24_1 පරික්‍රමණ අනුකූලනයේදී මෘදුකාංගයෙන් පිළියෙල වන දත්ත ගොනු හතර Trv_2013_24_1_Adjcoods-Trv&Pnts Trv_2013_24_1_AdjTrvCoods Trv_2013_24_1_Len&Obs.bearing Trv_2013_24_1_ObservedPt.coods 3. පැරණි මැනුම් සඳහා සකස් කරන ලද ගොනු (උදා :- OLD_2013_24_1 ආදී වශයෙන්) 4. අවසාන පිඹුරෙන් උපුටාගන්නා ලද බණ්ඩාංක ගොනුව (extracted coordinates) උදා :- 11FTP8In5Sh12.xls හෝ 11FTP8In5Sh12.csv හෝ 11FTP8In5Sh12.txt ආකාරයට විය යුතුය. 5. සියළුම අධිස්ථාපිත දත්ත සහිත පිඹුර (scan image අවශ්‍ය නොවේ.) උදා:- fix11FTP7In5Sh12.dxf සම්මත දත්ත ස්ථරවලට අමතරව එක් එක් පැරණි පිඹුරක් සඳහා වූ අධිස්ථාපිත දත්ත, ඊට අනුකූලව නව දත්ත ස්ථරයකට ඇතුලත් කරන්න. මෙම නව දත්ත ස්ථර වෙන වෙනම තැන්පත් කරන්න. උදා:- PPCO6575_Fixed data, CM52004bl1sh2_Fixed data ,.... ලෙස නම් කරන්න.

උප ගොනුවේ නම	දත්ත / අන්තර්ගතය
පිඹුරු <Drawings>	1. පිඹුරේ නම සඳහන් අවසාන පිඹුර (සම්මත දත්ත ස්ථර පමණක් ඇතුලත්) උදා :- 11FTP7In5Sh12.dxf (විස්තර සඳහා ඇමුණුම-2 බලන්න) 2. කැබලි වල ක්ෂෙත්‍රඵලයන් Extent11FTP8In5Sh12.txt 3. Cad Plans (කැඩැස්තර සිතියම් සඳහා පමණක්) 310015010013.xxx, 310015010014.xxx, 310015010015.xxx ආදී වශයෙන් (xxx - ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ඉල්ලුම් කරන format එකට පිළියෙල කරන්න. dxf/dwg.....) 4. 1:10,000 index diagram (කැඩැස්තර සිතියම් සඳහා පමණක්) 31001501sh1_10000.dxf 5. QGIS සහ CAD tools මඟින් පිඹුරු පරීක්ෂා කිරීමෙන් පසු ලැබෙන වාර්තා

ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත දත්ත යැවීම

22.23. ඉඩම් විස්තර ලැයිස්තුව TLDMS පද්ධතිය තුලදීම අනුමත කිරීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ වගකීමට යටත්ය. පිඹුර අනුමත කරන අවස්ථාවේදීම පිඹුරේ අංකිත දත්ත සහිත දත්ත ගොනු 22.16 ඡේදයෙහි පරිදි TLDMS පද්ධතිය වෙත උඩුගත කළ යුතුය. එසේ උඩුගත කරන ලද zip/rar ගොනුව SRIMS මඟින් ඉඩම් තොරතුරු පද්ධති අංශය විසින් බාගත යුතුය.

22.24. ඒ ඒ දිස්ත්‍රික්ක වල නිමකරනු ලබන කැඩැස්තර පිඹුරුවලට අදාළ අංකිත දත්ත ඉඩම් තොරතුරු පද්ධතියට එක් කිරීමට අවශ්‍ය වන පරිදි සැකසීම (Data Processing) දිස්ත්‍රික් මට්ටමින් සිදු කළ යුතුය.

22.25. දිස්ත්‍රික් කාර්යාල වෙත ලද පිඹුරු (xxxxxx.dxf) අංකිත දත්ත සැකසීම සඳහා සුදුසුවන පරිදි අපද්‍රව්‍ය (garbage) ඉවත්කර පවිත්‍ර කිරීමත් එමඟින් Geodatabase සහ shape file සැකසීමත් (Data Process) දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති මෘදුකාංග භාවිතයෙන් සිදු කළ යුතුය. එම දත්ත සැකසීම සඳහා අවශ්‍ය තාක්ෂණික පියවර ඇමුණුම 03 හි දක්වා ඇත.

22.26. මෙසේ සකසන ලද දත්ත ARC GIS Sever භාවිතයෙන් සහ SRIMS භාවිතයෙන් දෙආකාරයකට ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත යැවිය යුතුය.

22.27. සකස් කරන ලද Geodatabase ගොනුව ARC GIS Sever භාවිතයෙන් Feature Service හරහා ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත එවිය යුතුය.

22.28. පිළියෙල කරන ලද දත්තයන් (processed data) හි පහත සඳහන් දත්ත ඇතුලත් අංකිත දත්ත ගොනු, පිඹුර නමින් පිළියෙල කරනලද ගොනුවකට උදා: <52005613sh01> ඇතුලත් කර zip/rar කර SRIMS හරහා ඉඩම් තොරතුරු පද්ධති අංශය වෙත එවිය යුතුය.

- පිරිසිදු කරන ලද පිඹුර (Cleaned dxf)
  - උදා: (කොළඹ දිස්ත්‍රික්කය 52005613Sh01-cln.dxf)
- Geodatabase File (උදා: 52005613.gdb)
- Shape File Folder (උදා: 52005613)

අවසානයේදී සකස් කළ දත්ත (Processed Data) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වල ගබඩා කිරීමද අනිවාර්ය වේ.

මැනුම් ඉල්ලීමකින් පිඹුරු වර්ග කිහිපයක් පිළියෙල කර ඇති විට දත්ත යැවීම

22.29. එකම මැනුම් ඉල්ලීමක් යටතේ පිඹුරු වර්ග දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පිළියෙල කිරීමට සිදුවන අවස්ථාවලදී ඒ ඒ ඉඩම් විස්තර ලැයිස්තු වලට අදාළ අංකිත දත්ත TLDMS දත්ත පද්ධතිය හරහා උඩුගත කළ යුතු අතර කැඩැස්තර පිඹුරු පමණක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී බාගත කර ගෙන 22.25 ඡේදයට අනුව දත්ත සැකසීම (Data Process) කළ යුතුය.

දත්ත ගොනු පසු ගබඩා කර තැබීම

22.30. අංකිත දත්ත කළමනාකරණයේදී අංකිත ගොනු ක්‍රමවත්ව ගබඩා කිරීම් හා එම අංකිත ගොනුවල අමතර පිටපත් වෙනත් පරිගණක මාධ්‍යයක ආරක්ෂිතව ගබඩා කිරීම ඉතා වැදගත් වේ. පරිගණක මාධ්‍යය ක්ෂණිකව මැකී යා හැකි බැවින් ආරක්ෂිත අමතර පිටපත් විශ්වාසනීය මාධ්‍යයක් තුල ගබඩා කිරීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුතුය. මෙම අමතර පිටපත් නිවැරදි ලෙස නම් කර අනාගත භාවිතය සඳහා පහසුවෙන් පසුව සොයාගැනීමට හැකි වන පරිදි ලේඛනගත කර සුරක්ෂිතව ගබඩා කළ යුතුය.

තොරතුරු තාක්ෂණ අංශයේ වගකීමක් වන TLDMS දත්ත පද්ධතිය මඟින් ලබාගන්නා දත්ත සෑම දින දෙකකට වරක් පසුගබඩා (Backup) කිරීම නියමිත පරිදි සිදු කළ යුතුය.

22.31. පිඹුරේ වැඩ කටයුතු සම්පූර්ණ වන තුරු එකී පිඹුරේ සියළුම අංකිත දත්ත වල ආරක්ෂාව හා වගකීම අදාළ මිනින්දෝරුවරයා සතුය. මේ සඳහා පිඹුර සම්පූර්ණ කිරීමට පෙර තමා විසින් වැඩ කරන පරිගණකයට අමතරව, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ඇති වෙනත් පරිගණකයක් තුල හා විශ්වාසනීය බාහිර අංකිත මාධ්‍යයක් තුල අදාළ අංකිත දත්ත ආරක්ෂිත පසුගබඩා (Backup) වශයෙන් ගබඩා කිරීමට කටයුතු කළ යුතුය.

22.32. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් වගකීමෙන් පරිගණක දෘඩ තැටියට පිටපත් කරන සියළුම දත්ත ගොනු සංයුක්ත තැටි වලට පසුගබඩා කර තැබීම කළ යුතු අතර එම සංයුක්ත තැටි දිස්ත්‍රික් උද්ධෘතය යටතේ පිළිවෙලින් අංකනය කළ යුතුය (උදා :- Maha 23 SUR). එක් සංයුක්ත තැටියක වෙනස් වර්ගයේ පිඹුරු වල <FVP/FTP/CM > ගොනු ගබඩා කර තැබිය හැකිය. සංයුක්ත තැටියක් සම්පූර්ණයෙන් පිරුණු විට තවත් සංයුක්ත තැටියකට පිටපත් කර එය ප්‍රධාන කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය වෙත භාර දිය යුතුය. සංයුක්ත තැටිවලට අදාළ විස්තර සටහන් ලෙජරයක් **ඇමුණුම 04** ආකාරයට පවත්වා ගෙන යා යුතුය. අදාළ පිඹුරු වර්ගය අනුව අවසාන විස්තර ලබාදෙන ලෙජරයේත්, පිඹුරු සම්මත කරන ලෙජරයේත් සංයුක්ත තැටියේ අංකය සඳහන් කළ යුතුය.

22.33. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ දෘඩ තැටියේ තැන්පත් කර ඇති දත්ත ගොනු අමතර බාහිර දෘඩ තැටිවලද (external hard disk) තැන්පත් කර ආරක්ෂිතව තැබිය යුතුය. එක් එක් සංයුක්ත තැටිවලට අදාළ තොරතුරු (CD No, Requisition No, Plan Type, Plan No. යනාදී තොරතුරු) ඇතුලත් දත්ත පද්ධතියක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ පවත්වා ගත යුතුය. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිඹුරු පිටපත් නිකුත් කිරීමට පෙර අදාළ අංකිත දත්ත සංයුක්ත තැටිවලට පිටපත් කර ඇති බවට තහවුරු කර ගත යුතුය.

22.34. කැඩැස්තර සිතියම් තුල පසුකාලීන මැනුම් අධික වශයෙන් කිරීමට සිදුවන බැවින් එක් එක් කැඩැස්තර සිතියමට අදාළ සංයුක්ත තැටි ඒ ඒ සිතියමට අදාළව අංකනය කර සිතියම් අනුව වෙන් වෙන් වශයෙන් තබාගැනීම තුලින් පසු මැනුම් කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට හැකිවනු ඇත.

22.35. පසුකාලීන මැනුම් සිදු කරන ලද බිම් කැබැල්ල කුමක්ද යන්න මුල් අංකිත දත්ත වල සටහන් කිරීම සඳහා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පවත්වා ගෙන යන මුල් අංකිත ගොනුවෙහි (Drawing ගොනුවෙහි ඇති .dxf file) මුල් බිම් කැබැල්ල වර්ණ කිරීමක් සිදු කර නව දත්ත ගොනුවට අදාළ පත්‍ර අංකය TEXT-SUBS නමින් වූ නව දත්ත ස්ථරයක ලිවීමට කටයුතු කළ යුතුය. මෙම පසුකාලීන මැනුමෙහි වාරය හඳුනාගැනීම සඳහා TEXT-SUBS යන්නෙහි TEXT-SUBS1, TEXT-SUBS2 .....ආදී වශයෙන් අනුයුක්ත පසුකාලීන මැනුම් තොරතුරු තැන්පත් කිරීමට අදාළව දත්ත ස්ථර සෑදිය යුතුය. මෙමඟින් මුල් දත්ත අඩංගු පත්‍රය යථාවත් වීමක් සිදුවේ.

22.36. එසේම පසුකාලීන මැනුම්වල අංකිත දත්තද දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගබඩා කළ යුතුය. අදාළ මෘදුකාංගය මඟින් පිළියෙල කරන ලද ඉඩම් විස්තර ලැයිස්තුව ඉඩම් තොරතුරු පද්ධතියට සංප්‍රේරණය කළ යුතුය. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 36(3) ජේදය අනුව අනුමත කරන ලද සංශෝධිත මැනුම් පිඹුරේ පිටපත් හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා නිකුත් කළ යුතුය. සහතික කරන ලද පසුකාලීන මැනුම් අංකිත පිඹුර මේ කාර්යය සඳහා භාවිතා කළ යුතුය. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා සහ හිමිකම් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පිටපත් නිකුත් කළ යුත්තේද මෙම සහතික කරන ලද අංකිත පිඹුර ආධාරයෙනි.

මැනුම් ඉල්ලීම් සඳහාවූ කළමනාකරණ දත්ත පද්ධතිය

22.37. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයන් වෙත ලැබෙන සියළුම මැනුම් ඉල්ලීම් සඳහා අංක කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල වලට නිකුත් කිරීම, මිනින්දෝරුවරයා වෙත නිකුත් කිරීම, මැනුම් ඉල්ලීමෙහි වැඩ ප්‍රගතිය සටහන් කිරීම, අනුමත කරන ලද පිඹුරට අදාල අංකිත දත්ත උඩුගත කිරීම යනාදි සියළු කටයුතු මැනුම් ඉල්ලීම් කළමනාකරණ දත්ත පද්ධතිය (SRIMS) මඟින් සිදු කළ යුතුය. මේ පිළිබඳව විස්තරාත්මකව 4 වැනි පරිච්ඡේදයේ දක්වා ඇත.

පැරණි කාලේ ක්ෂේත්‍ර පත්‍ර පරිලෝකනය කිරීම හා එම මෘදු පිටපත් භාවිතය

22.38. දෙපාර්තුමේන්තුව මඟින් හඳුන්වා දී ඇති මෘදුකාංග භාවිතා කරමින් කාලේ ක්ෂේත්‍ර පත්‍ර වල සහ ඉඩම් විස්තර ලැයිස්තු වල මුල් පිටපත් පරිලෝකනය කිරීම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය තුල සිදු කළ යුතුය. පරිලෝකනය සඳහා ඡායා පිටපත් භාවිතා නොකළ යුතුය.

පරිලෝකනය කරන ලද මෘදු පිටපත් ඇමුණුම 05 හි සඳහන් ආකාරයට නම් කළ යුතුය (අදාළ ලේඛනය පරිලෝකනය කිරීමෙන් අනතුරුව එම මෘදු පිටපතේ නම ස්වයංක්‍රියව මෘදුකාංගය මඟින් ලබා දෙනු ඇත).

22.39. පරිලෝකනය කරන ලද මෘදු පිටපත් සංයුක්ත තැටිවලද ගබඩා කළ යුතු අතර එම සංයුක්ත තැටි දිස්ත්‍රික් උද්ධෘතය යටතේ අංක 1සිට ක්‍රමානුකූලව අංකනය කළ යුතුය.

උදා :- මහනුවර දිස්ත්‍රික්කයේ සංයුක්ත තැටි; මහ CD 1, මහ CD 2…ලෙස අංකනය කළ යුතුය.

මෙම සංයුක්ත තැටි දිස්ත්‍රික් කාර්යාල වල ගබඩා කළ යුතු අතර ඒ සඳහා වෙනම ලෙජරයක්ද සකස් කර පවත්වාගෙන යා යුතුය (ආදර්ශ ලෙජර් පිටු සඳහා ඇමුණුම් 06 බලන්න)

22.40. පරිලෝකනය කරන ලද පිඹුරු පිටපත් අඩංගු CD තැටි දෙපාර්තමේන්තුව සතු දේපළක් ලෙස සැලකිය යුතුය. මෙම තැටිවල පිටපත් බාහිර ආයතන සහ පුද්ගලයන්ට ලබා දීම සර්වේයර් ජනරාල් විසින් අනුමත කරන ලද උපදෙස් වලට අනුව පමණක් සිදු කළ යුතුය.

22.41. දෙපාර්තුමේන්තුව මඟින් හඳුන්වා දී ඇති TLDMS මෘදුකාංග භාවිතා කර පරිලෝකනය කරන ලද පිඹුරු වල මෘදු පිටපත් සඳහා වෙනම දත්ත පද්ධතියක්ද පවත්වාගෙන යා යුතුය. මෙම දත්ත පද්ධතියේ එක් එක් මෘදු පිටපත හා මෘදු පිටපත් අඩංගු සංයුක්ත තැටි පිළිබඳ විස්තර යනාදිය ගබඩා කර තැබිය යුතුය. මෙම තොරතුරු පද්ධතියේ පසු ගබඩා (Backup) සකස්කර ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයෙහි ආරක්ෂිතව තැබීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

22.42. සම්මත කරන ලද පිඹුරුවලට අදාළ පරිලෝකනය කරන ලද දත්තයන් SRIMS දත්ත පද්ධතිය හරහා උඩුගත කළ යුතුය.

22.43. අන්තර්ජාලය හරහා පරිලෝකනය කරන ලද පිඹුරු පරිශීලනයට සාමාන්‍ය ජනතාවට වරප්‍රසාද ලබා ගැනීම සඳහා දැනටමත් හඳුන්වා දී ඇති යාන්ත්‍රණය භාවිතා කිරීමට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් අවශ්‍ය පියවර ගත යුතුය. මෙම කාර්යය සඳහා මිනින්දෝරු අධිකාරී (මූලස්ථාන), ලේඛනාගාරය භාර නිලධාරී / තොරතුරු තාක්ෂණ නිලධාරියාගේ සහාය ලබා ගත යුතුය. සියළුම පිඹුරු පරිලෝකනය කරමින් දෙපාර්තමේන්තුව මඟින් සපයන ලද ADITS මෘදුකාංගයේ හා Scan Image දත්ත පද්ධතියේ සුචි යාවත්කාලීන කිරීමත් ඉතා වැදගත් වන හෙයින්, අන්තර්ජාලය හරහා බැලීමට හැකිවන පරිදි දත්ත පද්ධතිය පවත්වා ගෙන යාම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී /මිනින්දෝරු අධිකාරී (මූලස්ථාන) ගේ උපදෙස් මත ලේඛනාගාර භාර නිලධාරී/ තොරතුරු තාක්ෂණ නිලධාරී විසින් සිදු කිරීමද කළ යුතුය.

පරිලෝකනය කරන ලද මෘදු පිටපත් භාවිතා කිරීම

22.44. පරිලෝකනය කරන ලද මෘදු පිටපත් පරිලෝකන උපකරණයේ කැමරාවල තිබිය හැකි දෝෂයන් හේතුවෙන් ජ්‍යාමිතික දෝෂ වලට භාජනය විය හැකිය. මෙම පරිලෝකිත මෘදු පිටපත් වල ඉහත කී දෝෂයන් බොහොමයක් ඒකාකාරී ජ්‍යාමිතික දෝෂයන් වන අතර ඒවා සරළ සැකසීමකින් නිවැරදි කරගත හැකිය. එසේ වුවද නොගැලපෙන ජ්‍යාමිතික වෙනස්වීම් එකී සරළ ක්‍රමවේදයන් තුලින් නිවැරදි කළ නොහැකිය. මෙම ජ්‍යාමිතික දෝෂවල වෙනස්වීම් සහ ඒවායේ ප්‍රමාණයන් නිර්ණය කළ හැක්කේ නිවැරදි තත්වයන්ට පරිවර්තනය කිරීමෙන් පසුව පමණි. මෙම පරිවර්තනය කිරීම් පිළිගත හැකි නොවන අවස්ථා වලදී නව ආකාරයට පරිවර්තනය කිරීම් සිදු කළ යුතුය. එසේ පසුව කරන ලද පරිවර්තනය කිරීම්ද පිළිගත නොහැකි තත්වයක පවතින්නේ නම් අදාළ පිඹුරු නැවතත් පරිලෝකනය කළ යුතුය. එම නිසා මෙසේ පරිලෝකනය කරන ලද මෘදු පිටපත් ජ්‍යාමිතික නිවැරදි කිරීම් වලින් අනතුරුව ඕනෑම අරමුණක් සඳහා භාවිතා කළ හැකිය. පරිලෝකනය කරන ලද පිඹුරුවල නිවැරදි කිරීම් සඳහා වූ මෘදුකාංග දෙපාර්තුමේන්තුව විසින් සපයනු ලැබේ.

ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයෙහි පැරණි ක්ෂේත්‍ර පත්‍ර පරිලෝකනය කිරීම

22.45. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලවල ඇති A3 ප්‍රමාණයට වඩා විශාලිත වූ පැරණි ක්ෂේත්‍ර පත්‍ර පරිලෝකනය කිරීම ප්‍රධාන කාර්යාලයේ ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයෙන් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

ලේ.ක.හා වෘ. ප්‍ර. අංශයේ ඇති පැරණි පිඹුරුවල මුල් පිටපත්ද පරිලෝකනය කිරීම, එම අංශයේදීම සිදු කළ යුතු අතර ඒවායේ මෘදු පිටපත් අදාළ දිස්ත්‍රික් කාර්යාල වලට ලබා දිය යුතුය. මෙම පරිලෝකනය කරන ලද මෘදු පිටපත් සර්වේයර් ජනරාල්ගේ අවසරයකින් තොරව බාහිර ආයතන හෝ පුද්ගලයන්ට ලබාදීම සිදු නොකළ යුතුය. මෙසේ පරිලෝකනය කරන ලද සියළුම පිඹුරු දත්ත 22.39 ඡේදයෙහි සඳහන් පරිදි පසු ගබඩා කළ යුතුය.

22.13 ඡේදය ඇමුණුම 01

අංකිත පිඹුරුවල පෙර දත්ත පත්‍රය

Meta Data File for Digital Drawings

(Drawing file names given in annex-2 should be used for Meta data files will the extension.xls or .xlsx eg. 82FTP57sup31sh42.xls)

1. Main Information	
1.1 Survey Requisition No:	CO/DSO/2018/864
1.2 Purpose of survey:	මූලික පිඹුර කොා. 9724 කැබලි අංක 131 සංශෝධනය
1.3. Plan No:	Plan No : 9724
	Block No : 00
	Sheet No : 0000
	Inset No : 0000
	Sup No : 0000
1.4 Digital Drawing Name:	-
1.5 Folder Name:	-
2. Survey Information	
2.1 Period of Survey:	From 2019/3 To 2019/4
2.2 Method of Survey (Total Station, Conventional, etc;):	
2.3 Method used to convert old data/Plans (Scanning and digitizing, Recompilations etc;) :	
2.4 Coordinate System:	
2.5 Name of Survey:	ඒ.එස්.සිල්වා
2.6 Name of Supdt. Of Survey:	
3. Other Important Remarks	
3.1	
3.2 Meta Data File Created By:	Name: ඒ.එස්.සිල්වා
	Designation: ලියාපදිංචි රජයේ මිනින්දෝරු

22.16 ඡේදය ඇමුණුම 02

Naming system for Digital Drawing Files and Meta Data Files

Unique naming system has to be adopted for easy reference and manipulation of digital files. Following system will assign unique name for each digital drawing. Examples are also given for naming Digital drawings and related Meta data and TL database files.

1. Preliminary Plans

District Code	Plan Type	Plan Number
XX	PPlan	P. Plan number with district prefix

eg: PP CO 3234 in Colombo district

Drawing file name: 52PPlanCO3234.dxf
Meta data file name: 52PPlanCO3234.xls
TL data file name: 52PPlanCO3234.mdb

2. Cadastral Maps

District Code	CM No.	Block Number	Sheet No.
XX	XXXX	XX	sh+sheet number

eg: Sheet 4 of Block 3 in cadastral map 27 in Anuradhapura district

Drawing file name: 11002703sh4.dxf
Meta data file name: 11002703sh4.xls
TL data file name: 11002703sh4.mdb

3. Insets

District Code	Plan Type	Plan No.	Inset No.	Sheet No.
XX	FTP	.....	In+Inset number	sh+sheet number
XX	TopoPP	.....	In+Inset number	sh+sheet number

eg: Inset 5 (sheet12) of FTP 7 in Ratnapura district

Drawing file name: 62FTP7In5sh12.dxf
Meta data file name: 62FTP7In5sh12.xls
TL data file name: 62FTP7In5sh12.mdb

4. Supplements

District Code	Plan type	Plan No.	Sup No.	Sheet No.
XX	FVP	.....	sup+sup number	sh+sheet number
XX	FTP	.....	sup+sup number	sh+sheet number

eg: Supplement 31(sheet 42) of FTP 57 in Matara district

Drawing file name: 82FTP57sup31sh42.dxf
Meta data file name: 82FTP57sup31sh42.xls
TL data file name: 82FTP57sup31sh42.mdb

5. Court Commission surveys

District Code	Plan type	Requisition No.(Year-number)
XX	Court	Year+Requisition number

eg: Court commission surveys (Requisition no. 234 of 2007 in Kalutara district)
Drawing file name: 53Court2007234.dxf
Meta data file name: 53Court2007234.xls

6. Engineering Surveys

District Code	Plan type	Requisition No.(Year-number)
XX	Eng	Year+Requisition number

eg: Engineering survey (Requisition no. 512 of 2008 in Kalutara district)
Drawing file name: 53Eng2008512.dxf
Meta data file name: 53Eng2008512.xls

7. Tracings

District Code	Plan type	Requisition No.(Year-number)
XX	Tra	Year+Requisition number

eg: Tracings (Requisition no. 402 of 2007 in Puttlam district)
Drawing file name: 41Tra2007402.dxf
Meta data file name: 41Tra2007402.xls

District: District is defined with two digits. Code assigned to each district is given below.

North Central Province		**North Western Province**	
Anuradhapura	11	Puttalam	41
Polonnaruwa	12	Kurunegala	42
Northern Province		**Western Province**	
Jaffna	91	Gampaha	51
Killinochchi	92	Colombo	52
Mullaittivu	93	Kalutara	53
Mannar	94		
Vavuniya	95	**Sabaragamuwa Province**	
Eastern Province		Kegalle	61
Trincomalee	26	Ratnapura	62
Batticaloa	27	**Uva Province**	
Ampara	28	Badulla	71
Central Province		Monaragala	72
Matale	31	**Southern Province**	
Kandy	32	Galle	81
Nuwara Eliya	33	Matara	82
		Hambantota	83

22.25 ඡේදය ඇමුණුම 03

අංකිත දත්ත සැකසීමේ ක්‍රියාවලිය

- කැඩැස්තර පිඹුරේ ඛණ්ඩාංක නිවැරදි දැයි පරීක්ෂා කර බලා අක්ෂර 8 කින් save කර ගන්න. උදා:- 51189301.dxf

- ඉඩම් විස්තර ලැයිස්තුව (TLdb) අනුමත කර තිබිය යුතුය.

- Arcmap මෘදුකාංගය භාවිතා කර, එයට දිස්ත්‍රික්කයේ අද වන විට සම්පූර්ණ කර ඇති SHT_PG එකතු කර, එයටම පිළියෙල කරන ලද පිඹුරද (dxf) එකතු කර පිඹුරේ වට මායිම සහ පරණ SHT_PG අතර gaps සහ overlaps තිබේදැයි පරීක්ෂා කර බලන්න.

- 11 වැනි පරිච්ඡේදයේ ඇමුණුම 10 හි සඳහන් ස්ථර (layers) අනුව පිඹුර නැවත සකස් කරන්න.

- පිඹුරෙහි වට මායිම ඇළකින් හෝ මාර්ගයකින් අඩක් ලෙස වර්ගඵල ආගණනය සඳහා ගෙන ඇතිවිට එම මායිම යාබද පිඹුරෙන් ලබාගත යුතුය. එසේ නොමැති නම් VIR-CLOSELINE layer යටතේ ඇඳ සම්පූර්ණ කළ යුතුය.

- TEXT-LOT ස්ථරයේ ඇති සෑම කැබලි අංකයක්ම නව LOTNO ස්ථරයක් පිළියෙල කර එයටද පිටපත් කළ යුතු අතර, සෑම කැබලි අංකයක්ම කැබැල්ල තුල පිහිටන පරිදිද සකස් කළ යුතුය.

- පිඹුරේ සියළුම ස්ථර විවෘත(on) කර නිවැරදිව පිළියෙල කරන ලද පිඹුර DXF format එකෙන් save කරන්න.

- ඉඩම් තොරතුරු පද්ධති අංශයෙන් ලබාදී ඇති මෘදුකාංගය භාවිතා කර පිඹුර process කරන්න. මෙහිදී ඛණ්ඩාංක පද්ධතිය ලෙස SLD99SriLankaGrid 1999 භාවිතා කරන්න.

- Process කිරීමෙන් අනතුරුව CMXXXXXXXXline, CMXXXXXXXXpoint, CMXXXXXXXXPoly, KXXXXXXXXPoly සෑදී ඇත්දැයි පරීක්ෂා කර බලන්න. මීට අමතරව CMXXXXXXXXOBJline සහ CMXXXXXXXXOBJpoly ද සෑදිය හැක.

- Arc Map මෘදුකාංගය මඟින් Topology Rules භාවිතා කර එම Kpoly සහ පරණ දිස්ත්‍රික් SHT_PG අතර gaps සහ overlaps තිබේදැයි පරීක්ෂා කර බැලිය යුතුය.

- Unicode නොමැතිව පිළියෙල කරන ලද ඉඩම් විස්තර ලැයිස්තු පමණක් “Converter Tool “ මෘදුකාංගය මඟින් Unicode බවට පරිවර්තනය කළ යුතුය.

- Arc Catalog→ GIS Servers →Add ArcGIS Server මඟින් දිස්ත්‍රික් Username සහ Password භාවිතා කර Server Connection සාදා ගන්න.

- එහි LIS-DST හි දිස්ත්‍රික්කය සඳහා ඇති Feature service හි Local copy යක් create Local copy for editing tool මඟින් සාදා ගන්න. තමා විසින් process කිරීමෙන් සකස් කරන ලද දත්ත සහ පරිවර්තනය කරන ලද ඉඩම් විස්තර ලැයිස්තුව මෙයට load කරන්න.

- අවසාන වශයෙන් එය synchronize Local Edits with server tool එක මඟින් ඉඩම් තොරතුරු පද්ධතියේ server වෙත එවන්න.

22.32 ඡේදය ඇමුණුම 04(i)

අ.ග.පි. සඳහා අංකිත දත්ත සංයුක්ත තැටි ලෙජරයක පිටුවක ආදර්ශය

(එක් එක් අ.ග.පි. සඳහා වෙන වෙනම පිටු භාවිතා කරන්න.)

අ.ග.පි. අංක. : .....

මැනුම් ඉල්ලීම් අංක	පත්‍ර අංක	අතිරේක අංක	පිටු අංකය	සංයුක්ත තැටි අංක	විෂය භාර නිලධාරියාගේ අත්සන

ඇමුණුම 04(ii)

මූ.පි. සඳහා අංකිත දත්ත සංයුක්ත තැටි ලෙජරයක පිටුවක ආදර්ශය

මැනුම් ඉල්ලීම් අංක	පිඹුරු අංක	සංයුක්ත තැටි අංක	විෂය භාර නිලධාරියාගේ අත්සන

ඇමුණුම 04(iii)

අ.භූ.පි. සඳහා අංකිත දත්ත සංයුක්ත තැටි ලෙජරයක පිටුවක ආදර්ශය

(එක් එක් අ.භූ.පි සඳහා වෙන වෙනම පිටු භාවිතා කරන්න.)

අභූපි අංක.: .....

මැනුම් ඉල්ලීම් අංක	අතුරු පිඹුරු අංක	අතිරේක අංක	පිටු අංකය	සංයුක්ත තැටි අංක	විෂය භාර නිලධාරියාගේ අත්සන

ඇමුණුම 04(iv)

අනුරේඛන, අධිකාරිපත්‍ර(උසාවි කොමිෂන්), ඉංජිනේරු මැනුම් අංකිත දත්ත සඳහා සංයුක්ත තැටි ලෙජරයක පිටුවක ආදර්ශය

මැනුම් ඉල්ලීම් අංක	පිඹුරු අංක	සංයුක්ත තැටි අංක	විෂය භාර නිලධාරියාගේ අත්සන

22.38 ඡේදය ඇමුණුම 05

පරිලෝකනය කරන ලද මෘදු පිටපත් අංකනය කිරීම

(Image File Names for Quarter Field Sheets)

(*"SurveyImage"* software automatically creates these file names according to the values defined for Plan no., Inset no., Sup no. etc ;)

- **FVP, FVP Supplements and FVP Sheets :-**

FVP_< *District* >< *number* >_Sec<*number*>

FVP MAHA432

FVP MAHA432 Sec2

FVP_< *District* >< *number* >_Sup<*number*>_Sec<*number*>

FVP MAHA432 Sup3

FVP MAHA23 Sup27 Sec4

- **FVP TLs:-**

FVP_<*District*><*number*>_TL<*number*>

FVP MAHA23 TL46

- **FCP, FCP Supplements :-**

FCP_<*number*>_ Sec<*number*>

FCP MAHA25

FCP MAHA25 Sec5

FCP_<*number*>_Sup<*number*>_Sec<*number*>

FCP MAHA25 Sup12

FCP MAHA25 Sup12 Sec3

- **<u>FCP TLs</u>:-**

  FCP_<*number*>_TL<*number*>

  FCP MAHA25 TL56

- **<u>FUP and FUP Supplements</u> :-**

  FUP_<*number*>_ Sec<*number*>

  FUP MAHA25

  FUP MAHA25 Sec5

  FUP_<*number*>_Sup<*number*>_Sec<*number*>

  FUP MAHA25 Sup12

  FUP MAHA25 Sup12 Sec3

- **<u>FUP TLs</u>:-**

  FUP_<*number*>_TL<*number*>

  FUP MAHA25 TL56

- **<u>P. Plans</u>:-**

  PPlan_<*number*>_Sec<*number*>

  PPlan MAHA234

  PPlan MAHA345 Sec2

- **<u>P. Plan TLs</u>:-**

  PPlan_<*number*>_TL<*number*>

  PPlan CO345 TL23

- **<u>Topo PPs, Insets and Supplements</u>:-**

  TopoPP_<*District*><*number*>_ Sec<*number*>

  TopoPP GAM7

  TopoPP GAM7 Sec12

  TopoPP_<*District*><*number*>_Inset<*number*>_Sec<*number*>

  TopoPP GAM7 Inset6

  TopoPP GAM23 Inset6 Sec12

TopoPP_ *<District><number>*_Sup*<number>*_Sec*<number>*

TopoPP GAM23 Sup6

TopoPP GAM23 Sup6 Sec12

- **Topo PP TLs:-**

TopoPP_ *<District> <number>*_Inset*<number>*_TL*<number>*

TopoPP GAM23 Inset6 TL12

- **FTPs, Insets and Supplements:-**

FTP_ *<District><number>*_ Sec*<number>*

FTP PO7

FTP PO7 Sec2

FTP_ *<District >< number>*_Inset*<number>*_Sec*<number>*

FTP PO7 Inset3

FTP PO23 Inset6 Sec12

FTP_ *<District><number>*_Sup*<number>*_Sec*<number>*

FTP PO35 Sup23

FTP PO3 Sup6 Sec3

- **FTP TLs:-**

FTP_ *<District><number>*_TL*<number>*

FTP PO23 TL12

- **Cadastral Maps:-**

CM_ *<number>*_B*<number>*_Sh*<number>*_Sec*<number>*

CM 521234 B2 Sh4

CM 521234 B2 Sh4 Sec3

- **Cadastral Map TLs:-**

CM_ *<number>*_B*<number>*_Sh*<number>*_TL*<number>*

CM 521234 B2 Sh4 TL23

- **VP and VP Supplements :-**

VP_<*District*><*number*>_Sec<*number*>

VP PO432

VP PO432 Sec2

VP_<*District*><*number*>_Sup<*number*>_Sec<*number*>

VP PO432 Sup3

VP PO23 Sup27 Sec4

- **VP TLs:-**

VP_<*District*><*number*>_TL<*number*>

FVP PO23 TL46

- **FSPP and FSPP Supplements :-**

FSPP_<*District*><*number*>_Sec<*number*>

FSPP MAHA432

FSPP MAHA432 Sec2

FSPP_<*District*><*number*>_Sup<*number*>_Sec<*number*>

FSPP MAHA432 Sup3

FSPP MAHA23 Sup27 Sec4

- **FSPP TLs:-**

FSPP_<*District*><*number*>_TL<*number*>

FSPP MAHA23 TL46

- **FSP and FSP Supplements :-**

FSP_<*District*><*number*>_Sec<*number*>

FSP MAHA432

FSP MAHA432 Sec2

FSP_<*District*><*number*>_Sup<*number*>_Sec<*number*>

FSP MAHA432 Sup3

FSP MAHA23 Sup27 Sec4

- **FSP TLs:-**

  FSP_<*District*><*number*>_TL<*number*>

  FSP MAHA23 TL46

- **ISPP and ISPP Supplements :-**

  ISPP_<*District*><*number*>_Sec<*number*>

  ISPP MAHA432

  ISPP MAHA432 Sec2

  ISPP_<*District*><*number*>_Sup<*number*>_Sec<*number*>

  ISPP MAHA432 Sup3

  ISPP MAHA23 Sup27 Sec4

- **ISPP TLs:-**

  ISPP_<*District*><*number*>_TL<*number*>

  ISPP MAHA23 TL46

- **Colony Plans and CP Supplements :-**

  CP_< *number*>_Sec<*number*>

  CP MAHA432

  CP MAHA432 Sec2

  CP_< *number*>_Sup<*number*>_Sec<*number*>

  CP MAHA432 Sup3

  CP MAHA23 Sup27 Sec4

- **CP TLs:-**

  CP_< *number*>_TL<*number*>

  CP MAHA23 TL46

- **Misc Plans :-**

<*Plan Type*>_<*District*><*number*>_Sh<*Number*>_Sec<*number*>

XXXX GAM423 Sh12

XXXX GAM423 Sh12 Sec2

- **Misc plan TLs:-**

<*Plan Type*>_<*District*><*number*>_Sh<*Number*>_TL<*number*>

XXXX GAM23 Sh12 TL46

- **Coordinate Sheets :-**

<*Traverse Number*>_Sh<*Number*>

PT 23/1967 Sh12

- **If there is any plan only with Sheet number without Inset or Supplement numbers, then the image name may be defined as follows.**
    - **eg: FVP Sheets :-**

FVP_< *District*>< *number*>_Sh<*number*>_Sec<*number*>

FVP MAHA432 Sh3

FVP MAHA23 Sh27 Sec4

22.39 ඡේදය ඇමුණුම 06

පරිලෝකනය කළ පිඹුරු ඇතුලත් සංයුක්ත තැටි ලෙජරයේ ආදර්ශය

සංයුක්ත තැටි අංකය	දත්ත සකස් කළ දිනය	ජෝ.මී.අ/ මී.අ අත්සන
MAHA CD 1		
MAHA CD 2		

ශුද්ධි පත්‍රය